ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී අපේ විරෝධය පළ නොකර බැහැ, ගරු අගමැතිණිය මේ ගරු සභාවට පත් වී නොසිටීම ගැන. දැන් මේ ආණ්ඩුවට අවුරුද්දක් ගත වී තිබෙනවා. මේ ආණ්ඩුව පිහිටෙව්ව අවස්ථාවේදී ගරු අගමැතිණිය මේ සභාවට එන්නෙ නැත්තේ ඇයි යන ප්‍රශ්නය ඉදිරිපත් වූ විට ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් ඉතා තදින් ලැස්ති වී සිටියා, තමන්ගේ ආසනයෙන් ඉල්ලා අස් වී අගමැතිණියට ඒ ආසනය තරඟ කර මේ ගරු සභාවට එන්නට අවස්ථාවක් ලබා දීමට. ඒ ගරු මන්ත්‍රීවරුන් තවමත් ඒ අන්දමට ලැස්තිද කියා අපි දැන ගන්නට සතුටුයි. ඒ කෙසේ වුනත් අගමැතිණියට අවස්ථාවක් ලැබුනා, ඒ මන්ත්‍රීවරුන්ට කිසිම පිඬාවක් කරන්නෙ නැතිව—තමන්ගේ ආසනවලින් ඉල්ලා අස් වීමට අවස්ථාවක් සලසන්නෙ නැතිව—ආසනයක් තරඟ කර මේ ගරු සභාවට ඇතුළු වීමට. පසුගිය මහා මැතිවරණයේදී කුමන ආසනයක් හෝ තරඟ කළා නම් අගමැතිණියට එය දිනා ගන්න තුබුණු බව මගේ පෞද්ගලික අදහසයි. පසුගිය මහා මැතිවරණයට පසුවත් ආසනයක් තරඟ කිරීමට අවස්ථාව ලැබුණත්, එසේ කෙළේ නැහැ. කිසිම ආසනයකට තරඟ නොකළේ මන්දැයි අප නම් දන්නේ නැහැ. සමහර විට අමැතිණියගේ හිතේ ලොකු භයක් තිබෙන්නට පුළුවනි. මේ ගරු සභාවට එන්නට ලොකු භයක් තිබෙනවා වෙන්නට පුළුවනි. මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නවලට මුහුණ පාන්නට ඇති බිය නිසා නොවෙයි නම් ඇය මෙහි එන්නට අදහස් නොකරන්නේ මක් නිසාද? මේකෙ තේරුම් මොකක්ද? මේ ගරු සභාවට පැමිණීමට බියක් තිබෙනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමනී ජයසූරිය මයා.]

නම්, මේ රට ගැන, මේ රටේ ජනතාව ගැන, කල්පනා කර බලා ඇය සිය ධුරයෙන් ඉල්ලා අස් විය යුතුයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
මහජනයා එහෙම හිතන්නෙ නැහැ.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
නමුත් එය එතුමියගේ යුතුකමක්. රට කෙරෙහි ඇල්මක් තිබෙනවා නම් ඇය සිය ධුරයෙන් අස් විය යුතුයි. ඒ බව තමුන්නාන්සේලා පිළිගත යුතුයි. අගමැතිණිය මේ ගරු සභාවේ සිටිනවා නම් පසු ගිය දවස්වල ඇති වූ යම් යම් සිද්ධීන් ඇති නොවන බවයි, මා හිතන්නේ. සම්ප්‍රදාය සම්පූර්ණයෙන් මේ ගරු සභාවෙන් නැතිවී ගෙන යනවා. මේ ගරු සභාවෙහි නියම නායකයකු නැති වීමයි, ඊට හේතුව.

මේ සමඟම හදිසි නීතිය ගැනත් වචනයක් කියන්න ඕනෑ. හදිසි නීතිය පණවන අවස්ථාවේදී ඊට පක්ෂව ක්‍රියා කළ අය අද ඊට විරුද්ධව සිටින බව උඩුප්පිඩියේ ගරු මන්ත්‍රීවරයා (එම්. සිවසිතම්පරම් මයා.) විසින් ප්‍රකාශ කරන්නට යෙදුණා. අප ඒ බව පිළිගන්නවා. ඒ කාලයේ රටේ කලබල තුබුණු නිසා හදිසි නීතිය වුවමනා බව අප කල්පනා කළා. එදා හදිසි නීතිය වුවමනා වී තුබුණා. එහෙත් තවමත් ඒ හදිසි නීතිය තබාගෙන සිටීමට කිසිම වුවමනාවක් නැහැ. තව දුරටත් මෙම හදිසි තත්ත්වය පවත්වාගෙන යෑමට කිසිම හේතුවක් නැහැ. ආණ්ඩු පක්ෂයේ හැර අනෙක් සෑම පක්ෂයකම මහජනයා විසින් තෝරා ගන්න ලද ගරු මන්ත්‍රීන් ඉල්ලා සිටින්නේ හදිසි තත්ත්වය වහාම ඉවත් කරන ලෙසයි. මේකද නැසී ගිය බණ්ඩාරනායක මහතාගේ ප්‍රතිපත්තිය? එතුමා හිටියා නම් මෙවැනි දෙයක් වන්නට ඉඩ තබනවාද කියන එක ඇසිය යුතුයි.

තවත් එක කාරණයක් තිබෙනවා. දැනට මුතුර් ආසනය හිස් වී සෑහෙන කාලයක් වෙනවා. එහෙත් අතුරු මැතිවරණයක් පවත්වන්න තවමත් වැඩ පිළිවෙලක් යොදා නැහැ. මේ අන්දමට නීති කඩාකප්පල් කර දමා ප්‍රජාතන්ත්‍රවාදය නැති කිරීමට මෙම ආණ්ඩුවේ මන්ත්‍රීන් ලැස්තිදැයි ප්‍රශ්න කරන්න කැමතියි. හදිසි නීති පණවන ලද දවසේ සිට අද වන තුරු ඒ වෙනුවෙන් වැය වී ඇති මුදල කෙතෙක්දැයි අපට දන්වතොත් මුදල් ඇමතිවරයාට ස්තුතිවන්ත වෙනවා.

මා කලින් කීවාක් මෙන්, තවම මුතුර් අතුරු මැතිවරණය පවත්වන්න කටයුතු යොදා නැහැ. මෙය මැතිවරණ ගැන නොසලකා හැරීමේ ආරම්භයක් නම් සමහර විට කවරදාකවත් මැතිවරණ ඇති වන එකක් නැහැ. මෙම ආණ්ඩුව අද දින ක්‍රියා කර ගෙන යන ආකාරය අනුව අපට එසේ සිතන්න පුළුවනි. මේ තත්ත්වය ඉතාමත්ම භයානකයි. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීන් මැතිවරණ අවස්ථාවේදී කියා සිටියේ තමන් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයකට අයත් බවයි. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නේ මේ විධියටද? ආණ්ඩු පක්ෂයේ පිටුපස ආසනවල සිටින ගරු මන්ත්‍රීන් මේ ප්‍රශ්නය විශේෂයෙන් කල්පනාවට ගත යුතුයි.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
I would like, first of all, to add my own protests to the protests that have already been made by other hon. Members of this House at the needless extension of the state of Emergency. From time to time hon. Members have been asking the Government why this state of Emergency is being extended, and no satisfactory reply has been given. At one time we were told that there were still a few incidents. I do not think anybody can say that there is any danger of any incidents at this moment. There have not been any incidents and it is not at all likely that there will be any incidents. If any incidents do occur, there is sufficient power under the normal law of the land to deal with anything of that sort. There is no need whatever for these extraordinary powers to continue.

I should like to point out that practically none of the regulations made under the Emergency four months

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ago have been repealed. The longest Emergency we had to face, I think, was that of 1958. After that there was an Emergency when the hon. Member for Galle (Mr. W. Dahanayake) was the Caretaker Prime Minister. But even in those two Emergencies, as the situation eased more and more, regulations which had been made under the state of Emergency were withdrawn. If I remember correct, the late Mr. S. W. R. D. Bandaranaike eventually withdrew practically all the regulations but merely kept the state of Emergency in existence for some time and then withdrew that as well.

Why is the censorship of the press still continuing ? In practice, nobody takes any notice of this censorship, but that position still exists.

I asked for the withdrawal of the ban on strikes which was introduced four months ago. Why is it that this is still continuing ?

There have been some modifications of the curfew, and some of the persons who were held in detentions have been released, but, substantially, the whole mass of regulations which were imposed four months ago are still imposed. Although nobody seems to be taking any notice of them, they are still part of the law of the land. I therefore think that it is high time the regulations and the state of Emergency were withdrawn.

I wish also to protest at the prolonged detention of hon. Members of this House. Now that the situation that they created has eased, I see no reason whatever why these hon. Members should be kept under detention. If they have committed any offence against the normal laws of the land, let them be tried in the courts, but otherwise they should be released. I do not agree either with the Federal Party or with the hon. Member for Welimada (Mr. K. M. P. Rajaratna) and the hon. Member for Uva-Paranagama (Mrs. Kusuma Rajaratna), but I think all these hon. Members should be released and allowed to take part in the proceedings of this House. After all, you have released Mr. Chelvanayakam, the leader of the Federal Party, and he has gone to England for medical treatment. If you can release Mr. Chelvanayakam and if you can release the non-M. P. members of the Federal Party, why are you keeping the Federal Party Members of Parliament alone under detention ? What is the justification, the reason behind it ?

The hon. Member for Welimada and the hon. Member for Uva-Paranagama were taken into detention about the time that the hon. Member for Welimada was staging a hunger strike. That situation has now passed. I do not see why those two hon. Members should be kept under detention. As I said earlier, if they have broken the law of the land, then deal with them under the law of the land. You have got your courts, you have got your Attorney-General's Department, you have got your Police. If they have committed any offence, deal with them. If you are frightened in case they come out and create trouble, you have the normal laws of the land to deal with them. That is why I say that there is no justification for any further continuation of this state of Emergency.

අ. භා. 5.00

The second point that I wish to raise is this. The present Government which in its various regulations and orders restricted foreign travel is in danger of slipping into a position similar to that of the United National Party. I will explain myself. You will remember that one of the criticisms that was made against the U. N. P., particularly the U. N. P. Government that was headed by Sir John Kotelawala, was its political control over the travel of people of this country abroad. The late Mr. S. W. R. D. Bandaranaike made a particular point about that. My hon. Friend the Minister of Finance and the Government have imposed restrictions on currency and foreign exchange from the point of view of travel abroad. I do not object to it. That is a necessary thing. But there are also certain other aspects to this

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

question of people leaving the country about which I would like an explanation from the Government.

I can understand my hon. Friend saying as he is now saying—"If you have been abroad in the last 5 years you shall not get any foreign currency to go abroad." But there are whole classes of persons who have made available to them tickets which are paid for by money which does not come from Ceylon. International Organizations and persons make available these means of travel. Now an order has been made that even where tickets and means of travel have been made available from funds other than Ceylon funds the prior permission of the Ministry of External Affairs must be granted before these facilities can be used. Now I ask you, is that not a political restriction on travel abroad? I say that it is to the credit of the Government that as far as I am aware not a single application has been refused. If all applications are granted, what is the purpose of this restriction?

I can understand that the Government may not want certain persons to go abroad. There are undesirable characters—I am not talking only of people of different political views—people who are criminals or people who are discreditable characters who will bring discredit on the country or create serious embarrassment. But the Government can control the exit of those persons through the issue of passports. When a person applies for a passport the Government can control that type of person. The Government can say "You are not a fit person to have a passport". But after they have issued a passport authorizing a person to go, even where tickets are supplied by organizations of persons outside Ceylon and not one cent of Ceylon money is involved, what is the point of this new restriction? That restriction can easily develop into a position similar to the position that existed under Sir John Kotelawala and the U. N. P. Government of that time.

The Hon. Minister of Finance has always taken the position that as far as he is concerned he does not want to restrict travel abroad but that he has to conserve foreign exchange. That is an exchange control matter. If it is an exchange control matter, well and good; I agree. But I see no reason for the continuation of these restrictions and if these are allowed to exist a very much more serious position can develop.

Sir, the next point I wish to raise is this. At the time we debated the visa tax the Hon. Minister [*Interruption*]—because the visa tax is operated by the Hon. Prime Minister and her Ministry—not by the Hon. Finance Minister. [*Interruption.*] No Sir, we are on the Prime Minister's Vote now.

My hon. friend speaking for the Hon. Prime Minister promised by regulation to exclude certain classes of persons after consideration. That has not happened yet. I am asking whether that has happened? I am not only referring to the question of toddy tappers, there are a number of persons who are married to citizens of Ceylon who have applied to the Minister of Defence and External Affairs for this certificate of *prima facie* establishment or who have applied for registration as citizens by virtue of the fact that they are spouses of citizens and may with the permission of Government be registered as citizens.

Some of these things take a long time and these persons may be called upon to pay this tax not once but twice. I have a case in my constituency of a lady who is married to a citizen of Ceylon. She has applied to be registered as a citizen and the matter has been before the department for about 6 to 8 months. She has been paying up all her visa tax but when it comes to the end of this month if the Government has still not made a decision on that question she will have to pay another Rs. 400

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

and perhaps a month hence the Government will make a decision. From what I have found out the Government does not seem to be disposed to make a decision. I would ask that these regulations be framed as early as possible.

It is not fair also on this class of persons because you allow them certain facilities—facilities of sending money to India, going to and coming from India—by virtue of the fact that they have declared themselves to be citizens of India or some other country and are staying here at the discretion of the Government of Ceylon. As a matter of fact, until certain decisions are reached about who is going to be excluded and who is going to be included in this tax, the other concessions that you gave, including concessions under the earlier agreements with the Government of India, cannot in fact relate to this question. Therefore, I do ask that the matter be attended to. This is a matter that has to be done by the Hon. Prime Minister as the Minister who is in charge of this question.

I wonder whether my hon. friend will be able to tell us whether any discussions will be conducted in the near future on the Indo-Ceylon question. In the Throne Speech this year we had a repetition of what was said elsewhere, namely, that the Government intends to hold some discussions with the Government of India and try to reach some solution of matters which are outstanding between the two countries in respect to this question.

Is this an expression of an intention or is there some hard proposal for some discussion at an early date on this matter? I would be very glad to know that. I do not expect the Hon. Minister to make a detailed statement on this but we would like to know whether this is just a hope or whether there is a likelihood of such a discussion in the next few months and what steps are being taken.

There is one more matter about which I wish to comment. I am reliably informed that instructions have been sent to our representatives abroad that if an application is made for a visa to visit Ceylon from a person who is a citizen of a socialist country such an application must be referred to Ceylon for screening. If the Government has made such a rule in respect of all applications from everybody irrespective of the country of origin, we would certainly not object because all are being treated alike. But if you say you are following a foreign policy of neutrality, is it correct that in respect of certain persons—persons coming from certain countries—you issue instructions that all their applications must be sent here for screening and in the case of persons coming from capitalist countries, or non-socialist countries, our diplomats abroad are allowed to grant visas without reference to Ceylon? I understand tnere is something even more to this. Further instructions have been given that, if in the country concerned there is no representative of Ceylon, the British Embassy should be consulted.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

I will explain that.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keunemar)

It is a peculiar situation. We talk of being an independent country, and we have the British Embassy trying to inform us who should and who should not come to this country. I hope this type of vexatious order will be withdrawn——

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

I will explain that. There is some misunderstanding.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

——or else Government will see that uniform orders applying to everybody are established.

I would like to raise one last qestion. I have to ask you this question in this place because there is no other Head under which I can ask it, because the Hon. Prime Minister is the head of the Government. Are you or are you not going to introduce a Bill to give effect to your promise to take over the press? We would like to have a categorical answer. We have not had it so far. That can only be given by the Hon. Prime Minister or through her representative in this House. We have had backbenchers and various other people making statements. My Hon. Friend the Finance Minister in his Budget speech spoke about the press living on borrowed time. I hope it is a sign that they are going to be taken over——

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)
It is.

කෙන්මන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
I would like to have a categorical statement. If Government does not know or if some Members of Government had not known the tremendous wisdom of that proposal, the campaign that the monopolistic press are today waging against the Government should carry conviction. They are now organizing a political campaign against the Government. I just want to rub that home again. I know that there are many Hon. Ministers who realize the wisdom of the proposal; some apparently do not; but I want a categorical assurance in this House that that promise will in fact be implemented.

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்னயக்க)
(Mr. A. Ratnayake)
I would wish to refer to some of the speeches made by the Hon. Prime Minister at public functions. Very recently the Chairman of the People's Bank was good enough to give me a personal invitation to attend the opening of the Matale branch of the People's Bank. I believe he must have invited members of other parties as well.

You are aware that the establishment of the People's Bank was supported by us. Most Members of the Opposition gave their blessing to it and we hoped that it would be a very useful institution for the welfare of the masses. I was hoping to attend this function, but I am glad that I did not, because—I am only referring to a newspaper report of the speech made by the Hon. Prime Minister—at that function she made a political speech attacking the United National Party and making a personal reference to the hon. Leader of the Opposition (Mr. Dudley Senanayake).

යූ. බී. වීරසේකර මයා. (යටිනුවර)
(திரு. யூ. பி. வீரசேக்கர—யட்டினுவரை)
(Mr. U. B. Weerasekara—Yatinuwara)
He ran away in 1953.

අ. භා. 5.00

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்னயக்க)
(Mr. A. Ratnayake)
After all, not merely the People's Bank but no public institution belongs to any particular Party. In India the Five-Year Plans were discussed by all the parties and the Plan is the result of a decision of all the parties in India. Similarly, we here, when we decide to open some public institution like the People's Bank, we hope that institution will help all sections, all parties. Credit facilities will be available not only to a particular party or to a particular section of the community, but to all. All the speeches made on the occasion of the opening of this branch of the People's Bank were made by Members of the Government

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Party and no opportunity was given to anybody else to reply. This was done in the same way that Radio Ceylon is being used to attack other Parties without an opportunity being given to reply.

I would next like to raise a question which I have raised earlier; namely, the presence of the Hon. Prime Minister in this House. This question was raised when the Budget Estimates for last year were considered. In fact, there were many hon. Members in the Government Party who were willing to resign their seats—

යූ. බී. වීරසේකර මයා.
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

They are still willing to resign. They have not changed that position.

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்னாயக்க)
(Mr. A. Ratnayake)

The Hon. Minister of Finance himself said that he was always ready to offer his seat to the Hon. Prime Minister, and I think it was probably the Hon. Minister of Finance as well as the Leader of the House who said that that would be done whenever the Hon. Prime Minister felt like accepting it. Probably she has not felt like that yet.

From a constitutional point of view there is no precedent for the present practice. There is no country in the world—I am referring to the democratic countries—where the Prime Minister is not in the House of the elected representatives. The practice of having the Prime Minister in the Upper House is a very obsolete and ancient practice, abolished many many hundreds of years ago in England. We see the results of adopting that obsolete practice here; owing to the Prime Minister's absence from this House s has been reduced to a second-class debating society.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

With second class people in it ?

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்னாயக்க)
(Mr. A. Ratnayake)

Parliamentary democracy means discussion, and it sometimes means agreement and compromise. Sometimes the Government agrees to any reasonable suggestion made by the Opposition. But there is no Government here. The Government is not here. There is only an Acting Minister. I must compliment the Hon. Acting Minister of Labour and Nationalised Services for he is the one Minister whom I often see seated in that chair and listening to the speeches. Where are the other Ministers ? I must say that during the days of the State Council the late Sir Baron Jayatilleke never left his chair even for a single moment when he was the Leader of the House. Where is your Leader ?

That is why this House has lost its prestige, its importance and it has ceased to be the Government of Ceylon. And you have given a higher status to an unelected body like the Senate. The Government is in the other place. The Prime Minister is the Government of Ceylon. It is the Prime Minister who can appoint or dismiss any Minister. The Prime Minister can dissolve this Parliament. The Prime Minister is a democratic dictator. That is why I say that if this is the House of elected representatives of the people of Ceylon the Prime Minister of Ceylon must be in this House.

I would like here to repeat what the late Mr. Bandaranaike told me when he opposed the Soulbury Constitution. He said : " Ratnayake, this Constitution may be a democratic Constitution, but you shall have a Prime Minister with all the paraphernalia of democracy, but who will be a supreme dictator." That was what the late Prime Minister said. You see, Sir, how they are carrying on the Emergency in spite of the protests of their supporters. I do not know why they are continuing to support this Government, continuing to support the Emergency. The Communist Party vehemently

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. රත්නායක මයා.]

opposed the Emergency but when it comes to voting they put their hands up with the Government. They cannot form the Government.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

Nor can you.

ද අල්විස් මයා.
(திரு. டி. அல்விஸ்)
(Mr. de Alwis)

You formed a Government and you were kicked out.

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்னாயக்க)
(Mr. A. Ratnayake)

I am sorry the hon. Members of this Government Party do not realize the significance and importance of what I am stating, namely, that this is a travesty of Parliamentary Government—the absence of a Prime Minister here. With whom are we to discuss? Here, we are making speeches, we are making suggestions and asking questions of this Government but there is nobody to answer.

Parliamentary democracy, I repeat, is discussion, agreement, if agreement is possible, with the Opposition, and compromise, if compromise is possible, with the Opposition. That is happening daily in other democracies. Here, with whom are we to compromise? Here, where is the Government of Ceylon except for that acting Minister? Who is the Government of Ceylon? They are hiding their faces, they have not the courage to face the criticisms of the Opposition. They run away from their seats. That is a very unfortunate situation.

I am sure that if the Hon. Prime Minister were here—I know Hon. Ministers are mortally afraid of the Hon. Prime Minister although she is a woman—if she were here, all the Hon. Ministers would have been seated here. It is because of the absence of the Hon. Prime Minister that the Hon. Ministers are all over the country, some are travelling abroad and some—God knows where they are. There is nobody to answer a question.

Very, very serious criticisms were levelled against the Government with regard to this Emergency but there has been no reply because there is nobody to reply.

ගරු ද සොයිසා සිරිවර්ධන
(கௌரவ டி சொய்ஸா சிரிவர்தன)
(The Hon. de Zoysa Siriwardena)

The reply will come. The Hon. Minister of Finance will reply.

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்னாயக்க)
(Mr. A. Ratnayake)

How can he reply when he is not here to listen to the criticisms? There is an empty chair there, what is that empty chair doing there? Why cannot you fill that empty chair?

There were recently three by-elections. In fact, I told my Party, "let us allow her to come. We will not contest." In fact, I even went to the extent of suggesting that we should not contest the Matale seat, which we won, in order to help her to secure a seat in this House, because it is very important and vital from a constitutional point of view that she should be present in that chair. It is a serious omission; it is a travesty of democracy. I am sorry to say that with all my 28 years of experience of Parliamentary Government I have never seen a Government which runs away from its obvious duty. It is the duty of the Hon. Ministers to be here to answer questions. How can there be any discussion, any agreement, any compromise or how can we get together to govern this country if Hon. Ministers are not here, if the Hon. Prime Minister is not here? That is a very serious complaint I am making.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. சில்வா)
(Dr. W. D. de Silva)

ගරු සභාපතිතුමනි, මට මතක හැටියට මේ රටේ අද පවතින තත්ත්වය මේ රටේ 1953 දී තිබුණු තත්ත්වයට බෙහෙවින්ම සමාන බවයි, කියන්න තිබෙන්නේ. එදා අයවැය ලේඛනය ඉදිරිපත් කර මාස ගණනක් යන්ට පෙර ඊට විරුද්ධව විශාල මහජන මතයක් ඇති වුණා. එපමණක් නොව, ඒ කාලයේ සිටි වැඩ කරන පන්තියේ උදවිය—විශේෂයෙන්ම එම පන්තියේ සංවිධානය වූ උදවිය— එදා සම්මත කර ගත් අයවැය ලේඛනයට විරුද්ධව රට පුරාම විශාල උද්ඝෝෂණයක් ගෙන ගිය බව තමුන්නාන්සේට මතක ඇති. අදත් මේ රටේ පවතින්නේ ඒ හා සමාන තත්ත්වයක් බව ගරු අගමැතිනිය පිළිගන්න ඕනෑ. අද තිබෙන තත්ත්වයත් එහෙමමයි. මේ අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමෙන් පසු මේ රටේ ඇති වන ආර්ථික තත්ත්වයත් සමාජ තත්ත්වයත් එදා අයවැය ලේඛනය සම්මත වීමෙන් පසු ඇති වූ තත්ත්වයට සමාන කරන්න පුළුවන් බව එතුමිය පිළිගන්න ඕනෑ.

ආර්ථික තත්ත්වය ගැන සඳහන් කරන්න ප්‍රථමයෙන් එක්තරා වැදගත් කාරණයක් ගැන කියන්න ඕනෑ. මා කියන්නේ විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් දේශපාලන පක්ෂ නායකයන් අද දින මේ ගරු සභාව තුළ දකින්න නොලැබීම ගැනයි. ඒ පක්ෂ නායකයින්ගේ මෙන්ම ඒ පක්ෂවල දේශපාලන ප්‍රතිපත්ති අප පිළිගත්තත් නොපිළිගත්තත්, ඒ ගැන නොවෙයි මා කියන්නේ. විශේෂයෙන්ම එක්තරා වැදගත් පක්ෂයක නායකයෙක් අද මේ ගරු සභාවේ නැහැ. තමන් දරන අදහස් මේ ගරු සභාව ඉදිරියේ තැබීමට ඒ උදවියට යුතුකමක් තිබෙනවා. මහ ජනයා කෙරෙහි ඉටු විය යුතු ඒ යුතුකම ඉටු කිරීමේ අයිතිවාසිකමක් ඒ උදවියට තිබෙනවා. එහෙත් ඒ උදවිය මේ සභාවේ නොසිටීම ගැන ප්‍රථමයෙන්ම අප කනගාටු වන්න ඕනෑ. විශේෂයෙන්ම මහජන එක්සත් පෙරමුණේ නායක අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) දරන දේශපාලන අදහස් සමහර අවස්ථාවලදී අප නොපිළිගත්තත්, මේ රටේ වැදගත් දේශපාලන පක්ෂයක නායකත්වය දරන ඒ වගේම එඩිතර අවංක උතුම් ගතිගුණ ඇතිව වැඩ කරන, එතුමා දේශපාලනය අතින් යම්කිසි වැඩ පිළිවෙළක් අනුගමනය කරන තැනැත්තකු හැටියටත් අප සියලු දෙනාම පිළිගන්න ඕනෑ. එවැන්නන් මේ අවස්ථාවේ මේ ගරු සභාව තුළ දකින්න නොලැබීම ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ.

ෆෙඩරල් පක්ෂය ගැන කථා කළා. ඒ උදවියගේ දේශපාලන මත අප පිළිගන්නේ නැහැ. ඒ වගේම මිලිටරි ආණ්ඩුවක් සදාකාලිකව ගෙන යාමෙන් ඒ පළාත්වල ඉන්න පොහොසත් අයට වාසි වෙනවා විනා දුප්පත් අයට නම් වාසියක් නොවන බව අප පිළිගන්න ඕනෑ. ඒ වගේම උභය-පරණගම ගරු මන්ත්‍රීවරියත් (කුසුමා රාජරත්න මිය.) වැලිමඩ ගරු මන්ත්‍රීතුමාත් (කේ. එම්. පී. රාජරත්න මයා.) යන දෙපොළ දරන දේශපාලන මත සමඟ සමහර අවස්ථාවලදී අපේ මත ගැටෙන නමුත්, අප එම පක්ෂයේ මත නොපිළිගන්න නමුත්, මේ අවස්ථාවේ ඒ දෙදෙනාත් මේ සභාවේ සිටියා නම් වටින වායයි අප කල්පනා කරන්න ඕනෑ.

ඇත්ත වශයෙන්ම දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමා සෑම අවස්ථාවකදීම වැඩ කරන උදවියට විශාල වශයෙන් අනුකම්පාව දැක්වූ බවත්, ආධාර දුන් බවත්, ඒ වගේම සංවිධානය වී තමන්ගේ අනාගත ශුභසිද්ධිය සඳහා වැඩ පිළිවෙළ යොදන්න විශේෂයෙන් ධෛර්යය දී ආධාර දුන් බවත්, තමුන්නාන්සේ පිළිගන්න ඕනෑ. එහෙත් වර්තමාන තත්ත්වය දිහා බලන විට සමහර වෘත්තීය සමිතිවලට රැස්වීම් පවත්වන්නටත් අමාරු තත්ත්වයකුයි තිබෙන්නේ. සමහර වෘත්තීය සමිතිවලට ශබ්ද විකාශන යන්ත්‍ර යොදා ගැනීමට අවකාශයක් නැහැ. ඒ විධියේ තත්ත්වයකුයි අද තිබෙන්නේ. ඒ උදවියගේ ඉල්ලීම්, අයිතිවාසිකම්, අදහස්, එළිදරව් කරන්න පුළුවන් තත්ත්වයක් දැනට මේ රටේ නැති බව මේ ගරු සභාවේ සියලුදෙනාටම පැහැදිලිව පෙනී යනවා ඇති. ඒ නිසා අද තිබෙන තත්ත්වය දෙස බලන විට මේ ආණ්ඩුව දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමාගේ වැඩ පිළිවෙළ අනුව පවත්වා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා]

ගෙන යන ආණ්ඩුවක් හැටියට කාටවත් පිළිගන්න බැහැ. මේ අයවැය ලේඛනය වැඩ කරන උදවියට විරුද්ධ එකක් හැටියට පිළිගන්න ඕනෑ. අපට එහෙම කියන්න අයිතිවාසිකමක් නැත කියා සමහර උදවිය කියනවා ඇති. නමුත් ඕනෑම කෙනෙක් වැඩ කරන තැනැත්තකුගෙන් නැතහොත් සංවිධානය වී ඇති වෘත්තියක නියෝජිතයකුගෙන් ඇහුවොත් අද තිබෙන තත්ත්වය ගැන, ඒ අය දරන මතය ගැන දැන ගන්න පුළුවන් වෙනවා ඇති. හදිසි නීතිය නොතිබුණා නම්, සංවිධානය වූ වෘත්තීය සමිති සියල්ලක්ම ඒකරාශි වී 1953 අවුරුද්දේ කළා වගේම මේ වර්ෂයේදීත් මේ අයවැය ලේඛනයට විරුද්ධව විශාල සටනක් කරන බවට මට කිසිම සැකයක් නැහැ.

අ. භා. 5.30

එම නිසා අයවැය ලේඛනය ඉදිරිපත් කර ඇතත් අද පැනනැඟ තිබෙන තත්ත්වය වහාම වෙනස් කරන්ට ආණ්ඩුවටත් ඒ වගේම ගරු අගමැතිවරියටත් විශාල යුතුකමක් තිබෙනවා. මෙතෙක් බර උසුලා ගන්නට බැරිව සිටි වැඩ කරන දුප්පත් උදවියට තවත් විශාල බරක් මෙම අයවැය ලේඛනයෙන් පටවා තිබෙනවා. එක් අතකින් කෙලින්ම පඩි කපා තිබෙන අතර අනික් පැත්තෙන් අවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිලත් නංවා තිබෙනවා.

දිවංගත ගරු බණ්ඩාරනායක තුමාගේ ප්‍රතිපත්ති අනුව කටයුතු කරනවාය කියායි, පසුගිය මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මහජනයා ඉදිරියට ගියේ. එතුමා නම් කවදාවත් වැඩ කරන ජනතාවට විරුද්ධ වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යෙදුවේ නැහැ. එවැනි වැඩ පිළිවෙලක් සකස් වූවත් ඒ වැඩ පිළිවෙල ක්‍රියාවේ යෙදුවේ වැඩ කරන උදවියගේ අදහස් විමසීමෙන් පසුවයි. එම නිසා මේ ආණ්ඩුව විසින් ඇති කර තිබෙන මෙම වැඩ පිළිවෙල වෙනස් කරන්නට ගරු අගමැතිනියට විශාල යුතුකමක් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වගේම ජාතික ව්‍යාපාර සම්බන්ධයෙනුත් මේ රටේ තවත් වැදගත් තත්ත්වයක් ඇති වී තිබෙනවා. මේ රටේ ජාතික ව්‍යාපාර නඟා ලීමට විශාල වැයමක් දැරුවේ විශාල උනන්දුවක් දැක්වූයේ මේ රටේ සාමාන්‍ය වෙළෙන්දයි. එහෙත් මේ රටේ සාමාන්‍ය වෙළෙන්දට අද සමාජයේ තැනක් නැහැ.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Now we are discussing the Prime Minister's Vote.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. சில்வா)
(Dr. W. D. de Silva)

I am speaking on policy. The policy position is contrary to what was put before the people. [බාධාකිරීමක්]

අද සාමාන්‍ය වෙළෙන්දට තත්ත්වයක් නැහැ. අද තිබෙන සමාජ තත්ත්වය අනුව සාමාන්‍ය වෙළෙන්දට රටේ තැනක් නැහැ. මේ රටේ ජාතික ව්‍යාපාර ගැන විශාල උනන්දුවක් දක්වන, ඒවා නඟා ලීමට සෑම වැයමක්ම දරන, ඒ උදවියට සමාජයේ කැලලක් ඇති වන අන්දමේ වචන ආණ්ඩුව මඟින් පාවිච්චි නොකර, ඒ උදවියට සාධාරණ තැනක් ලබා දීම ආණ්ඩුවේත් අගමැතිවරියගේත් යුතුකමක්. දිවංගත බණ්ඩාරනායක තුමාගේ ප්‍රතිපත්ති තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති. වැඩ කරන ජනතාවට පමණක් නොව ජාතික ව්‍යාපාරවල යෙදී සිටින මේ රටේ වෙළෙන්දටත් වැදගත් තැනක් මේ රටේ තිබෙන බව එතුමා පිළිගත්තා. අද මේ ගෙන යන වැඩ පිළිවෙළ අනුව සමාජයේ වැදගත් තැනක් ලැබී තිබෙන්නේ මේ රටේ ජාතික වෙළඳුන්ට නොව විදේශීය වෙළඳුන්ට බව තමුන්නාන්සේට වැටහෙනවා ඇති.

අද ජාතික වෙළෙන්දාගේ තත්ත්වය කුමක්ද? අද ජාතික වෙළෙන්දා බිලැක් මාර්කට්කාරයකු ලෙස හංවඩු ගසා තිබෙනවා. ද්‍රව්‍යවල මිල උස්සන්නේ ජාතික වෙළෙන්දයයි හංවඩු ගසා තිබෙනවා. මේ රටේ ද්‍රව්‍යවල මිල උස්සන්නේ තොග වෙළෙන්දයි. ජාතික වෙළෙන්දට දෙස් කීම යුතුකමක් නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවන්නට විශාල ආධාරයක් දුන්නේ මේ රටේ සාමාන්‍ය වෙළෙන්දයි. එම නිසා විදේශීය වෙළෙන්දා ආරක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරගෙන ජාතික වෙළෙන්දට කැලැල් ඇති වන අන්දමින් කථා කිරීම ආණ්ඩුව සතු යුතුකමක් නොවෙයි.

සභාපතිතුමනි, ඒ වගේම හදිසි නීති තවදුරටත් දික් ගැස්සීම යුතුකමක් නොවෙයි. හදිසි නීති යොදවා තිබෙන්නේ ද්‍රවිඩ උදවිය මර්දනය කිරීමට නොවන බව අද පවතින තත්ත්වය අනුව කෙලින්ම පෙනී යනවා. හදිසි නීති යොදවා තිබෙන්නේ මහජන බල වේගය මර්දනය කිරීමටයි. මහජන බල වේගය මර්දනය කරන්නට පුළුවන් වන්නේ හදිසි නීති යෙදවීමෙන් නොව මහජනයාගේ කැමැත්ත අනුව කටයුතු කිරීමෙන් බව අගමැතිවරිය මෙන්ම ආණ්ඩු පක්ෂයේ සියලු දෙනාම පිළිගන්නට ඕනෑ.

අද මෙම ආණ්ඩුවට අප විරුඬ වන්නේ පෞද්ගලික කාරණාවන් උඩ නොව කෙලින්ම මේ ආණ්ඩුව ගෙන යන්නාවූ ජාතික විරෝධී වැඩ පිළිවෙළ නිසා බව පැහැදිලිව කියා දෙන්නට ඕනෑ. එමෙන්ම මේ රටේ වැඩ කරන දුප්පත් මහජනයාට විරුඬවද මෙම ආණ්ඩුව යම් යම් වැඩ පිළිවෙළවල් ගෙන යනවා. ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන යෝජනා වෙනස් කරන්නට බැරිය, වෙනස් කරන්නට අමාරුය, ලෝකයේ වෙන කවර රටක හෝ එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ නැත කියා ගරු මුදල් ඇමති තුමා කිව්වා. අධිකරණ ඇමති තුමාද එම අදහසම දරන වාලු. නමුත් මම එතුමන්ලාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්නේ අපේ රටේ දුප්පත් මහජනතාවගේ ඇඟ මත උසුලන්නට බැරි බර පටවන්නට එපාය කියායි. එමෙන්ම මේ රටේ වෙළෙන්දටද තැනක් ලබා දෙන මෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

මහජනයා මන්ත්‍රීවරුන් වශයෙන් අපව මෙම ස්ථානයට පත් කර එව්වේ කරවල බෙදන්නට නොවෙයි. මහජනතාව විඳින්නාවූ යම් යම් ප්‍රශ්න පිළිබඳව තමන්ගේ සැලකිල්ල යොමු කොට තමන්ට තිබෙන යුතුකම කිරීමටයි මන්ත්‍රීවරුන් වශයෙන් අපව පත්කර එව්වේ. ඒ නිසා අද දින මෙම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වෙළඳුන්ගේ තත්ත්වයට වෙනස් වීම—විශේෂයෙන් කරවල වෙළඳුන් වශයෙන් පත් වීම—යුක්ති සහගතද කියා ගරු අගමැතිණියගෙන් අසා සිටිනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)
කුණු කරෝල වෙළෙන්දෝ.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. சில்வா)
(Dr. W. D. de Silva)
එමෙන්ම ගරු සභාපතිතුමනි, අපට නොයෙක් විධියේ හිරිහැර කරදරවලට මුහුණ පා පුරුද්දක් තිබුණත් අපට හිරිහැර කිරීම යුතුකමක් නොවේය කියා මා ඉතා ආදරයෙන් මේ ආණ්ඩුවට කියා සිටිනවා. අපේ කම්කරු සමිතිවලට අයත් උදවිය ගමනා ගමන මණ්ඩලයේ සමිතිවලට අයත් උදවිය සමග සම්බන්ධ වීම වළක්වන විධියේ වැඩ පිළිවෙළක් මේ ඊයේ පෙරේදා යොදා තිබෙන බව මා මේ ගරු සභාවට කියන්නට ඕනෑ. මේ කාරණාව පිළිබඳ වැඩි විස්තර ගරු කම්කරු ඇමති තුමාගේ අමාත්‍යාංශය පිළිබඳව සාකච්ඡා කරන විට පැහැදිලි කර දෙන්නම්. නමුත් වැඩ කරන ජනතාවගේ බල වේගය මර්දනය කරන්නට කවදාවත් බැරි බව මේ අවස්ථාවේදී පැහැදිලිව කියන්නට ඕනෑ. 1953 දීද පොලිසියේ හා යුඬ හමුදාවේද ආධාරය ඇතිව මෙවැනි මර්දන ව්‍යාපාරයක් ඇරඹූ නමුත් එය සාර්ථක නොවූ බව මා මේ ගරු සභාවේදී කියන්නට ඕනෑ. ඒ නිසා ගරු සභාපති තුමනි, යුද්ධ හමුදාවේ සහ පොලිසියේ සිටින දුප්පත් අයගෙන් මම මේ ඉල්ලීම කෙළින්ම කරන්නට ඕනෑ. මෙම සංවිධාන දෙකේම වැඩි වශයෙන්ම සිටින්නේ දුප්පත් උදවියගේ දරුවන්. ඒ නිසා යම්කිසි ආර්ථික ප්‍රශ්නයක් උඩ ගෙන යනු ලබන්නාවූ මහජන වැඩ පිළිවෙළක් මර්දනය කිරීමේ අදහසින් මහජනයාට වෙඩි තබන්නටය කියා පොලිසියටත් යුද්ධ හමුදාවටත් රජය නියම කළොත් එසේ කරන්නට එපාය කියා මෙම ගරු සභාවට පත් කර එවා සිටින මහජන නියෝජිතයකු වශයෙන් මා මේ අවස්ථාවේදී ඒ අයගෙන් ඉල්ලා සිටින්නට කැමතියි.

අද රටේ තිබෙන තත්ත්වය සතුටුදායක නොවන බව මා මේ ගරු සභාවට මතක් කර දෙන්නට කැමතියි. මහජනයා මේ දවස්වල සිටින්නේ විමසිල්ලෙන් සහ බියෙනුයි. ආණ්ඩුවේ සේවකයන්ද අද කාලය ගත කරන්නේ ඉතාමත්ම කනගාටු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා]

වෙනුයි. අප පක්ෂයට ඡන්දය දුන් උදවිය කියන්නේ "අපි මේ පක්ෂය තෝරා යැව්වේ මේ විධියේ වැඩ කරන්නටද? මැතිවරණ කාලයේදී අපට මෙම කාරණා පැහැදිලි වශයෙන් නොකීවේ ඇයි?" කියායි. මේ ආදි දේ දැන් නිතර පාහේ මහජනතාව කියනවා. මේ රටේ ජීවත්වන සාමාන්‍ය වෙළෙන්දත් සිතන්නේ ඔය ආකාරයට මයි. ඔවුන් දන්නෙ නැහැ, හෙට අනිද්දට කුමක් සිදු වේද කියා. ඇතැම් ගැමියන් කල්පනා කරන්න පුළුවනි මන්ත්‍රීවරුන්ට පමණය සමාජමය සහනය තිබෙන්නේ කියා. මේ විධියේ වැඩ පිළිවෙළක් යොදවන ආණ්ඩුවකට අනාගතයක් තිබේය කියා මා සිතන්නේ නැහැ. මේ තත්ත්වය වහාම වෙනස් කර මේ රටේ සිටින සාමාන්‍ය වැඩ කරන ජනතාවට නියම අනාගතයක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. රටේ ජාතික ව්‍යාපාරවලට තැනක් දී ජාතික වෙළෙන්දට නිග්‍රහ නොකර කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනවා. බිය කිරීමෙන් වැඩ කරන අය මර්දනය කරන්න බැහැ. මිලිටේරිය නැති නම් පොලීසිය යොදවා වැඩ කරන ජනතාව මර්දනය කරන්න බැරි බව ආණ්ඩුවට මතක් කරන්න ඕනෑ. තාවකාලිකව මර්දනය කරන්න පුළුවන් වුණත්, සදාකාලිකව මර්දනය කරන්න කවදාවත් පුළුවන්කමක් ඇතිවන්නේ නැහැ. ලෝක ඉතිහාසයේ එවැනි තැනක් සඳහන්ව නැහැ.

විජයපාල මෙන්ඩිස් මයා. (කටාන)
(திரு. விஜயபால மெண்டிஸ்—கட்டான)
(Mr. Wijayapala Mendis—Katana)

ගරු අගමැතිතුමියගේ වැය ශීර්ෂය යටතේ අද සෑම පක්ෂයකින්ම පාහේ කථා කරන්න යෙදුණා. හදිසි නීතිය ගෙන යන ආකාරය ගැන ඔවුන් ආණ්ඩුවට චෝදනා කළා. මහජන අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට නොලැබෙන කරදරය පමණක් නොවෙයි මෙයින් පැන නැඟ තිබෙන්නේ. හදිසි අවස්ථාව අනුව එන්න එන්නම රට භයානක තත්ත්වයට වැටෙනවා. එක අතකින් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීන් කල්පනා කරනවා ඇති මේ හදිසි අවස්ථාව උඩ ආණ්ඩුව තල්ලු කරගෙන යා හැකිය කියා. නමුත් මහජනයාට ඒ මගින් ඉබේම පහර වල් රාශියක් වැදී තිබෙනවා.

නිදර්ශනයක් වශයෙන්, වැදී තිබෙන එවැනි පහරක් ගැන මා මේ අවස්ථාවේදී කියන්නම්. මගේ ආසනයේ ගිනිකෙළි කර්මාන්තයෙහි යෙදෙන පවුල් රාශියක් සිටිනවා. හදිසි අවස්ථාව නිසා ඔවුන්ට එම කර්මාන්තයෙහි යෙදීම දුෂ්කර වී තිබෙනවා. අකුරණ පළමුවන ගරු මන්ත්‍රීතුමා (සිරිසේන මයා.) පවා දන්නවා ඇති ඒ කර්මාන්තය ගැන. පසුගිය කාල සීමාව තුළදීත්, ඒ කියන්නේ බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාල සීමාව තුළදීත්, ඔවුන් මේ කරදරයට මුහුණපා සිටියා. හදිසි අවස්ථාව තිබෙන කාලයේ මෙවැනි රැකියාවන්හි යෙදෙන පවුල් රාශියකට රක්ෂා නැති වෙනවා.

ගරු ද සොයිසා සිරිවර්ධන
(கௌரவ டி சொய்ஸா சிரிவர்தன)
(The Hon. de Zoysa Siriwardena)
අප එසේ කර නැහැ.

මෙන්ඩිස් මයා.
(திரு. மெண்டிஸ்)
(Mr. Mendis)
මාස කියක් රක්ෂාව නවත්වා තිබුණාද? තමුන්නාන්සේ ඒ ගැන දන්නවාද?

ගරු ද සොයිසා සිරිවර්ධන
(கௌரவ டி சொய்ஸா சிரிவர்தன)
(The Hon. de Zoysa Siriwardena)
එක මාසයයි.

මෙන්ඩිස් මයා.
(திரு. மெண்டிஸ்)
(Mr. Mendis)
එක මාසයට කන්න දුන්නේ කවුද? තමුන්නාන්සේ කන්න දුන්නාද? මා ඉල්ලා සිටින්නේ මේ විධියේ අඩන්තේට්ටම් විදිමින් රක්ෂා නැතිව ගත කරන කාල සීමාව සඳහා ඔවුන්ට සහනාධාරයක් දෙන ලෙසයි. හදිසි අවස්ථාවක් ඇති කළ විට ඒ හේතුවෙන් ඇති වන වෙනත් කරදර ගැන කල්පනා නොකර ක්‍රියා කිරීම වැරදියි. යම් විධියකින් මේ පනවා තිබෙන හදිසි තත්ත්වය ඉවත් කර දැම්මාට පසුව මින් මත්තටත් මෙවැනි හදිසි අවස්ථාවක් යොදන්නට එහෙම මේ ආණ්ඩුව කල්පනා කරනවා නම්, අන්න එවැනි අවස්ථාවකදී මේවා ගැන කල්පනාව යොමු කර බලන්නය කියායි මා ඉල්ලා සිටින්නේ. මේ හදිසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවසථාව නිසා මගේ ආසනයේ විශේෂ කම්කරු කොටසකට රක්ෂාව නැති වී ගොස් තිබෙනවා. රක්ෂාව නැතිව ගිය කාල සීමාවේදී ඔවුන්ට ලැබෙන්න තිබුණු ආදාය මට සරිලන ආකාරයට ආණ්ඩුව මගින් වන්දි මුදලක් ගෙවන්න වැඩ කටයුතු සකස් කළයුතුය කියා මා කියා සිටිනවා.

අ. භා. 5.45

තවත් ප්‍රශ්නයක් තිබෙනවා. මේ වැය ශීර්ෂය යටතේ අගමැතිතුමියගේ පාර්ලිමේන්තු ලේකම්ටත් රුපියල් 12,000 ක පඩියක් දීමට මුදල් වෙන් කර තිබෙනවා. පාර්ලිමේන්තු ලේකම් මුදල් ඇමතිතුමා නිසා මුදල් ඇමති වශයෙන් එතුමා පඩියක් ගන්න අතර පාර්ලිමේන්තු ලේකම් වශයෙනුත් මේ වෙන් කර ඇති පඩිය ගන්නවාදැයි මම දැනගන්නට සතුටුයි.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

ගරු සභාපතිතුමනි, කොහොමද මේ ප්‍රශ්නවලට උත්තර දෙන්නේ? මුදල් ඇමතිතුමා මෙහි ඇත්තේ නැහැ.

චන්ද්‍රසේන මුණවීර මයා. (රත්තොට)
(திரு. சந்திரசேன முனவீர—ரத்தோட்டை)
(Mr. Chandrasena Munaweera—Rattota)

බය වෙන්න එපා ඒ ගැන, වෙලාවට එයි.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

ප්‍රශ්න අහන කොට මෙතැන නොඉඳ කොහොමද උත්තර දෙන්නේ? [බාධා කිරීමක්] — තමුන්නාන්සේ නොවෙයි උත්තර දෙන්නේ. උත්තර දෙන්න සුදුසු තැනැත්තා මෙතැන නැහැ. [බාධා කිරීම්] He must understand his position.

මුණවීර මයා.
(திரு. முனவீர)
(Mr. Munaweera)

You must understand yours.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

He said 22 meetings were held in his electorate. That is a deliberate lie.

මුණවීර මයා.
(திரு. முனவீர)
(Mr. Munaweera)

How do you know?

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

I am going to prove it.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Will the hon. Member for Bulathsinhala (Mr. Edmund Samarakkody) please withdraw that word?

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

Withdraw what?

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

He said that the hon. Member for Rattota (Mr. Munaweera) uttered a falsehood.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

It was not a reference to any statement made by him here today.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

I ask the hon. Member to withdraw that word.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

I am sorry, I cannot.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

If he does not withdraw that word I shall have to name him.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

There is nothing to withdraw. You can do what you like.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Order, please! The House will resume now.

මන්ත්‍රී මණ්ඩලය යළිත් එක්රැස් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

එඩ්මන්ඩ් සමරක්කොඩි මහතාව නම් කිරීම

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)

I name the hon. Member for Bulathsinhala (Mr. Edmund Samarakkody).

ගරු ඒ්ජ් ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

I move,

"That the hon. Member for Bulathsinhala (Mr. Edmund Samarakkody) be suspended from the service of the House."

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

I rise to a point of Order. According to Standing Orders a Member can be named only by Mr. Speaker.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)

The House has resumed and the Deputy-Speaker is in the Chair. The Deputy-Speaker in the Chair performs the functions of the Speaker.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

The Standing Order is that——

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)

Order, please. I have given my Ruling.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

I will not leave the Chamber. I have come here to do my duty, and I will not have myself thrown out in this way.

I have a very important duty to perform in this House. If these are the tactics you are trying to resort to, we will show this Government that they cannot throw out Members in this fashion. Let them do what they like.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

I think the procedure that is being adopted is incorrect.

සිරිල් මැතිව් මයා. (කොළොන්න)
(திரு. சிரில் மதியூ—கொலன்ன)
(Mr. Cyril Mathew—Kolonna)

I rise to a point of Order. Is it your intention to eliminate the Opposition one by one?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)

That is not a point of Order.

මැතිව් මයා.
(திரு. சிரில் மதியூ)
(Mr. Mathew)

It is. I am asking you a direct question.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

Sir, even now I appeal to you to regularize the position.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (දෙහිවල-ගල්කිස්ස)
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா—தெகிவலை-கல்கிசை)
(Dr. Colvin R. de Silva—Dehiwala-Mt. Lavinia)

I think, Sir, with respect, you should pay attention to Standing Order 82 (1) which states :

Whenever any member is named by Mr. Speaker immediately after the commission of the offence of disregarding the authority of the Chair, or of abusing the rules of the House by persistently and wilfully obstructing the business of the House, or otherwise, Mr. Speaker shall forthwith put the question, on a motion being made (no amendment, adjournment, or debate being allowed) that such member be suspended from the service of the House.

With all respect to you, you are not Mr. Speaker. You are, Sir, the occupant of the Chair for certain purposes. The Deputy-Speaker is not the Speaker.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)

I will read out to you Standing Order No. 135 :

Anything which by these Standing Orders may be done by Mr. Speaker may be done by the Deputy-Speaker or Deputy-Chairman of Committees presiding in the place of Mr. Speaker.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

I would still ask you to consider. An incident has happened in Committee. I am not discussing the incident. I was not listening really. I should imagine that most hon. Members do not know what the matter is. But you have now, I want to point out, adjourned the Committee Stage deliberately so that you may preside in the House in order to take a step. I am sorry, Sir——

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)

I will give my ruling on this matter.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

What is the Motion moved, Sir ?

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

That the hon. Member for Bulathsinhala (Mr. Edmund Samarakkody) be suspended from the service of the House.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)

For one week.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

You say it is one week, but he does not say it.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

Is not one even allowed to move a Motion on the question of the number of days ? One minute should do even if you are serious about this.

ප්‍රශ්නය විමසන ලදි.
කවහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

Divide by names.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පක්ෂව

ගරු ටී. බී. ඉලංගරත්න
ගරු එෆ්. ආර්. ඛයස් බණ්ඩාරනායක
ගරු ඩී. පී. ද සිල්වා
ගරු මෛත්‍රීපාල සේනානායක
ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන
ගරු ජේ. පී. ඕබේසේකර
ටී. බී. නෙන්නකෝන් මයා.
ඩී. ටී. පස්කුවල් මයා.
කේ. අබ්දුල් ජබාර් මයා.
ඒ. එල්. අබ්දුල් මජීඩ් මයා.
කේ. එච්. ජී. ඇල්බට් මයා.
ඩබ්ලිව්. ඒ. කරුණාසේන මයා.
අයි. ඒ. කාදර් මයා.
එස්. ඩී. ආර්. ජයරත්න මයා.
ටී. බී. ජයසුන්දර මයා.
එල්. බී. ඡායසේන මයා.
යූ. පී. වයි. ජිනදාස මයා.
ලක්ෂ්මන් ද සිල්වා මයා.
අයි. ද සොයිසා මයා.
ආර්. එස්. පෙරේරා මයා.
ආර්. එස්. වී. පෝලියර් මයා., ඕ.බී.ඊ.
ටී. විලියම් ප්‍රනාන්දු මයා.
එස්. ඩී. බණ්ඩාරනායක මයා.
පී. බී. බාලසූරිය මයා.
ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.
ටී. ආර්. රත්නායක මයා.
එස්. බී. ලේනව මයා.
ඊ. විජේසූරිය මයා.
ලීලානන්ද විරසිංහ මයා.
ජේ. ඩී. වීරසේකර මයා.
ඩී. එස්. සමරසිංහ මයා.
ජී. ඩබ්ලිව්. සමරසිංහ මයා.
ටී. බී. එම්. හේරත් මයා.

විරුද්ධව

පී. ජී. බී. කෙනමන් මයා
ජේ. ආර්. ජයවර්ධන මයා.
ඩී. මෙල්වන් ජයසිංහ මයා.
ටී. එම්. කේ. නෙන්නකෝන් මයා.
නිල් ද අල්විස් මයා.
ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
ඩබ්ලිව්. දහනායක මයා.
එම්. එච්. එම්. නසීනා මරික්කාර් මයා.
ශ්‍රීමත් ඇල්බට් එෆ්ප් පීරිස්, ඉක්.බී.ඊ.
ටී. ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා.
ඒ. එච්. මැකන්-මැකර් මයා.
සිරිල් මැතිව් මයා.
අනිල් මුනසිංහ මයා.
විජයපාල මෙන්ඩිස් මයා.
ඒ. රත්නායක මයා.
යූ. බී. වන්නිනායක මයා.
පර්සි වික්‍රමසිංහ මයා.
වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
එම්. ඕවසිතම්පරම් මයා.

මධ්‍යස්ථව

චන්ද්‍රසේන මුණසිංහ මයා.
එස්. නොන්ඛමන් මයා.

ඡන්ද ප්‍රතිඵල නිවේදනය කිරීමට පෙර—

අ. භා. 6

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

Before you announce this voting, even now, with the greatest respect and in all seriousness, I appeal to you and to the House. I say, if it is a question of withdrawing, that is not the point. That is a thing that could be easily done when tempers have cooled. But no amount of appeal to Section 135 can surely cover sub-section 5 of Section 82 which says—

If an offence of the kind described in the first paragraph of this Order . . . .

That is wilfully obstructing etc.

. . . . is committed in a Committee of the whole House, the Chairman shall forthwith suspend the proceedings of the Committee and report the circumstances to the House and Mr. Speaker shall on a motion being made thereupon put the same question without amendment, adjournment or debate, as if the offence had been committed in the House itself.

In the same section the distinction is drawn between the Chairman of the Committee and the Speaker of the House. That is a distinction which all law and reason observes. I appeal to you before you come to any decision on this matter and I appeal to this House, let this matter be ended in a simple way. I am ready in open House to appeal to the hon. Member for Bulathsinhala (Mr. Edmund Samarakkody) if necessary, to do whatever may seem proper. But again I appeal to the House that the House should not render itself futile. To amicably settle something when it emerges is a different matter.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)

I asked the hon. Member for Bulathsinhala to withdraw the offensive words but he did not.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கெர்ல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

I am not saying anything about that. But I beg of you, this procedure that we have accidentally fallen into—I do not want to blame anybody—is manifestly not proper and that—

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)

I maintain the procedure is quite correct in my view. I am in the hands of the House and if the House decides otherwise, I have no objection. I maintain the procedure is quite correct.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

May I know what the words objected to are ?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)

He said that the hon. Member for Rattota (Mr. Munaweera) uttered a falsehood, uttered a lie.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

You are asking that the hon. Member for Bulathsinhala withdraw those words ?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)

I asked him and he refused.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

Sir, at that time I do not think even he knew what exactly was objected to. I certainly did not. All I ask is, does the Government insist on going through with the motion ? Would you please ask him to withdraw those words ?

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

I do not know whether the hon. Member for Rattota is a liar or not, but I withdraw the statement that he uttered a falsehood.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

Thank you, Sir.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)

The mover must withdraw the Motion.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

In the circumstances that the Hon. Member for Bulathsinhala has withdrawn the words that the hon. Member for Rattota uttered a falsehood, I move to withdraw the Motion. But I must make it clear that I am not accepting any of the legal points put forward by the hon. Member for Dehiwala-Mt. Lavinia. (Dr. Colvin R. de Silva).

APPROPRIATION BILL, 1961-62
(කාරක සභාවෙහිදී)

නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

මෙන්ඩිස් මයා.
(திரு. மெண்டிஸ்)
(Mr. Mendis)

ගරු සභාපතිතුමනි, මා කථා කරගෙන යන අවස්ථාවේදී ඇති වුණ හදිසි අවස්ථාව නිසා මගේ කථාව සුළු වේලාවකට නවත්වන්නට සිද්ධ වුණා. විශෙෂයෙන්ම දැන් මේ ගරු සභාව ඇතුළේදීත් හදිසි අවස්ථාවක් ඇති වුණා. රටේ පමණක් නොවෙයි, මෙම සභාව ඇතුළේත්, දැන් හදිසි අවස්ථා ඇති වේගන යන බව තමුන්නාන්සේලාට පෙනී යනවා ඇති! මේ ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෙන්ඩිස් මයා.]

සභාවෙහිදී යම් කිසි ගරු මන්ත්‍රීවරයෙකු යම් කිසි වැදගත් ප්‍රශ්නයක් අසන්නේ නම්, ඒ සඳහා සෘජුව පිළිතුරක් දීමට මෙහි වගකියයුතු ඇමති කෙනකු සිටිය යුතු බව බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමාට (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) වැටහුණු නිසා, වගකියයුතු ඇමති කෙනකු මෙහි දැනට නැති බවයි, ඒ මන්ත්‍රීතුමා කියන්නට යෙදුණේ.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

Even now the Hon. Minister is not here. I am not raising a Point of Order. I am just pointing out to the House that the hon. Member is raising some matters to which the Hon. Minister must reply, but he is not here.

මෙන්ඩිස් මයා.
(திரு. மெண்டிஸ்)
(Mr. Mendis)

මම හිතන විධියට එතුමන්ලා ගෙදර ගිහින් ආපසු ඇවිත් උත්තර දේවි.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Nobody can compel hon. Members to be present in the House.

මෙන්ඩිස් මයා.
(திரு. மெண்டிஸ்)
(Mr. Mendis)

ඒක ඇත්තයි. අපිත් සෑමදාම ඉල්ලන වා මිසක් ඒ ඉල්ලීම් ඉටු වන්නේ නැහැ. අගමැතිනිය මෙතැන ඉන්න ඕනෑය කියා අපි ඉල්ලනවා. ඒ ඉල්ලීම අනුව, මෙතැනට එනවාය කියා අපට පොරොන්දුවකුත් දී තිබෙනවා. නමුත්, අද වන තුරුත් ආවේ නැහැ. කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අගමැති කෙනකු මෙතැන නැති නිසා වගකීමක් ඇතිව කිසිම ඇමති කෙනකු මෙතැන සිටින්නේ නැහැ. අර පාර්ලිමේන්තු ලේකම්තුමා පමණයි සෑම තිස්සේම මෙහි සිටින්නේ. ඒ, මගේ හිතේ එතුමා වැඩබලන ඇමති කෙනකු වශයෙන් සිටින නිසා වෙන්නට ඇති. නමුත්, එතුමාත් සම්පූර්ණ ඇමති කෙනකු වූ විට ඔය ආසනයේ ඉඳීද කියා මම දන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මා පැන නැඟූ ප්‍රශ්නය නම්, අග්‍රාමාත්‍යතුමිය යටතේ ඇති රාජ්‍යාරක්ෂක සහ විදේශ කටයුතු පිළිබඳ ඇමති අංශයේ පාර්ලිමේන්තු ලේකම්වරයාට රුපියල් 12,000ක් මෙම වැය ශීර්ෂයෙන් වෙන් කර තිබීම ගැනයි. එහි වැඩ බලන්නේ ගරු මුදල් ඇමතිතුමා බව අපට කාටත් රහසක් නොවෙයි. ඒ වාගේම මුදල් ඇමති වශයෙන් වෙනම රුපියල් 18,000කුත් මුදල් ඇමති අංශය යටතේ එතුමාට වෙන් කර තිබෙනවා. එම නිසා අපි අසන මේ ප්‍රශ්නයට පිළිතුරු එතුමාගෙන් ලබා ගන්නට පුළුවන් වේවිය කියා අපි බලාපොරොත්තු වෙනවා. අපි අසන ප්‍රශ්නය මේකයි. මේ විධියට වැටුප් දීමනා දෙකක් ලබා ගැනීමෙන් නීති විරෝධී වැඩක් කරනවාද නැද්ද යන්නයි. මෙය දැන ගැනීමට අපි කවුරුත් ඉතා ආශාවෙන් සිටින බව මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමතියි.

විශෙෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ සැලකිල්ල යොමු කළ යුතු තවත් කරුණක් තිබෙනවා. සෑම රාජාසන කථාවකදීම තමුන්නාන්සේලා ප්‍රකාශ කරනවා සමූහාණ්ඩුවක් ගැන. දැන් රාජාසන කථා දෙකකම ප්‍රකාශ කළා. නමුත්, එය මේ කපේදී සිදු වන දෙයක් බව නම් අපට පෙනෙන්නේ නැහැ. මට නම් පෙනෙන්නේ තමන්ගේ පෞද්ගලික නායකත්වය ආරක්ෂා කර ගැනීම පිණිස ඒ ප්‍රශ්නය ක්‍රමක්‍රමයෙන් අමතක කර දමන බවයි. ලංකාව ජන රජයක් නොහොත් සමූහාණ්ඩුවක් කළොත්, ජනාධිපති කෙනකු පත් කර ගැනීමට සිදු වෙනවා. එම නිසා ජනාධිපති විය යුත්තේ කවුද යන්න ගැන මා හිතන හැටියට ආණ්ඩු පක්ෂය තවම කල්පනා කරනවා ඇති. අගමැතිතුමිය එතැනට යනවාද, එසේ නැත් නම් ඉන්න එක්කෙනාටම එතැන සිටින්න ඉඩ දෙනවාද, අගමැතිනිය එතැනට යනවා නම් ඊළඟට අගමැති වන්නේ කවුද, යනාදී ප්‍රශ්න ගැන තවමත් තීරණය කර ගන්නට බැරුව සිටිනවා වෙන්නට පුළුවන්. [බාධාකිරීම්.] ඔය ආණ්ඩුව තිබෙන තුරු තමුන්නාන්සේට නම් අගමැති වෙන්න හම්බ වෙන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
කාටවත් අමාරු ඇයි?

මෙන්ඩිස් මයා.
(திரு. மெண்டிஸ்)
(Mr. Mendis)
ඇයි අමාරු නැත්තේ? මහජනයාටයි මේ ගැන අමාරුව තිබෙන්නේ. මීට කලින් කථා කළ සෑම ගරු මන්ත්‍රීවරයකුම වාගේ කිව්වේ, මෙහි කිසිම කෙනකු කිසිම වගකීමක් නැතිව කටයුතු කරන්නේ අගමැති කෙනකු මෙතැන නැති නිසාය කියායි. අපි කියා සිටින්නේ කවුරු හරි කෙනෙක් අගමැති වශයෙන් මෙම ස්ථානයෙහි සිටිය යුතු බවයි. එසේ නැත්නම් සෙනෙවි මන්ත්‍රී මණ්ඩලයෙන් අගමැතිනිය මෙම සභාවට කැඳවා මෙහි ආසනයක් පරිත්‍යාග කරන්නට ඕනෑ. දැනට කිසිම වගකීමක් නැතුව මේ රටේ පාලන කටයුතු ගෙන යන නිසා, අපට මේ ප්‍රශ්නය ගැන හැමදාම කිය කියා ඉන්නට සිද්ධවෙලයි තිබෙන්නේ.

මොල්ලිගොඩ මයා.
(திரு. மொல்லிகொட)
(Mr. Molligoda)
I rise to a point of order. The hon. Member for Katana (Mr. Mendis) is saying that the proceedings of this House are conducted without any responsibility. I feel that it is an insult to the dignity of this Assembly and the hon. Member should withdraw his statement, "without any responsibility"—
"කිසිම වගකීමක් නැතුව".

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)
It is not a point of Order.

මොල්ලිගොඩ මයා.
(திரு. மொல்லிகொட)
(Mr. Molligoda)
Certainly it is.

මෙන්ඩිස් මයා.
(திரு. மெண்டிஸ்)
(Mr. Mendis)
ඒ මන්ත්‍රීවරයා වගකීම කියන්නේ මොකක්ද කියා දන්නේ නැතුවා වගෙයි. දන්නවා නම්, ඔය වගේ පිස්සු කතා කථා කරන්නේ නැහැ.

මොල්ලිගොඩ මයා.
(திரு. மொல்லிகொட)
(Mr. Molligoda)
තමුන්නාන්සේට මට වැඩිය පිස්සු. කටානෙ මිනිසුන්ට පිස්සු නැත්නම් තමුන්නාන්සේලා වාගෙ අය එවන්නේ නෑ.

මෙන්ඩිස් මයා.
(திரு. மெண்டிஸ்)
(Mr. Mendis)
ගරු නිවිතිගල මන්ත්‍රීවරයා ගැන කියන්නට ඕනෑ නැහැ. නම නම් මොල්ලිගොඩ. එක මොල්ලියක් තියෙන කෙනෙකුට කියන්නේ මොකක්ද කියා අපි දන්නවා නේ. ඉතින් මොල්ලිගොඩක් තියෙන කෙනෙකුට කියන්නේ මොකක්ද කියා තවදුරටත් කියන්ට ඕනෑ නැහැ නේ.

මොල්ලිගොඩ මයා.
(திரு. மொல்லிகொட)
(Mr. Molligoda)
ඔටුවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)
Yours is not a point of Order.

මෙන්ඩිස් මයා.
(திரு. மெண்டிஸ்)
(Mr. Mendis)
ගරු සභාපතිතුමනි, අපි සෑම දෙම ප්‍රකාශ කළේ වගකීමක් නැතිව රටේ වැඩ කටයුතු ගෙනයන බවයි. මේ ආකාරයෙන් කටයුතු සිදුවන අවස්ථාවකදී, අපේ රටේ මුදල් නැතැයි කියා මහජනතාවට වුවමනා කරන මූලික ආහාර ද්‍රව්‍යවල පවා මිල ගණන් වැඩි කර තිබියදී, ඒ සම්බන්ධයෙන් මහජනතාව තුළ බලවත් උද්ඝෝෂණයක් ඇති වී තිබියදී, මේ සභාවට වගකිව නොහැකි අගමැති කෙනකු වෙනුවෙන් මෝටර් රථයක් මිළදී ගැනීම සඳහා මෙම අයවැය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෙන්ඩිස් මයා.]

ලේඛනයෙන් රුපියල් 28,000 ක්ම වෙන් කර තිබෙනවා. මෙය වෙඩි වදින්නේත් නැති රථයක්ලු. සාමාන්‍ය කෙනකු මේ විධියේ රථයකුත් මිළදී ගන්නවා නම්, රුපියල් ලක්ෂයක් පමණ ගෙවන්නට සිදු වන බව සමහර විට ගරු මන්ත්‍රීවරුන් නොදන්නවා ඇති.

ගරු සභාපතිතුමනි, එම නිසා මෙබඳු අවස්ථාවකදී, අපේ රටේ මහජනතාවගේ විසඳිය යුතු අත්‍යවශ්‍ය ප්‍රශ්න රාශියක්ම තිබිය දී, මෙතරම් විශාල මුදලක් මෝටර් රථයක් මිළ දී ගැනීම සඳහා වැය කිරීමට අදහස් කිරීම ගැන මගේ බලවත් කන ගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. මේ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කථා කරන්නට මා අදහස් කරන්නේ නැහැ.

මේ රටේ උතුරු හා නැගෙනහිර පළාත්වල කලබල ඇති වීමේ ප්‍රතිඵලයක් වශයෙන් හදිසි අවස්ථාව පැන වූ බව අපි දන්නවා. නුමුත් අද එබඳු තත්ත්වයක් ඒ පළාත්වල නැහැ. එසේ වුණත් ඒ පළාත්වල පමණක් නොවෙයි, දිවයිනේ සෑම පළාතක්ම හදිසි තත්ත්වය යටතේ සි, පාලනය වන්නේ. එපමණක් ද නොවෙයි. මෙබඳු වැදගත් වාද විවාද පවතිද්දී, මේ ගරු සභාවට පැමිණීමටත්, වැඩ කටයුතුවලට සහභාගිවීමටත්, ඌව-පරණගම ගරු මන්ත්‍රීවරියටත්, (කුසුමා රාජරත්න මිය.), වැලිමඩ ගරු මන්ත්‍රීවරයාටත් (කේ. එම්. පී. රාජරත්න මයා.) දීර්ඝ කාලයක් තිස්සේ ඉඩ සලසා දුන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, දැන් රටේ හදිසි තත්ත්වයක් පැනවීමට කිසිම හේතුවක් නැතුව තිබියදී තව තවත් හදිසි නීතිය දිගු කිරීමට තිබෙන්නේ මොන කාරණයක් නිසාදැයි මට නම් වැටහෙන්නේ නැහැ. එම නිසා මේ රට නියම ප්‍රජාතන්ත්‍රවාදය අනුව පාලනය කරගෙන යන්නට අදහස් කරනවා නම්, දැනට පනවා ඇති හදිසි නීතිය ඉවත් කර දමන ලෙස ඉල්ලමින් මගේ වචන සවලපය අවසන් කරනවා.

අනිල් මුණසිංහ මයා. (අගලවත්ත)
(திரு. அனில் முனசிங்ஹ—அகலவத்த)
(Mr. Anil Moonesinghe—Agalawatta)

ගරු සභාපතිතුමනි, ගරු අගමැතිනියගේ වැය ශීර්ෂය ගැන කථා කරන මේ අවස්ථාවේදී එතුමිය මේ ගරු සභාවට නොපැමිණීම ගැනත් වචන සවලපයක් සඳහන් කිරීම වැදගත් යයි මා කල්පනා කරනවා. මා හිතන හැටියට එතුමියට මාස තුනකටත් වඩා දීර්ඝ කාලයක් අප දුන්නා, වෙන සභාවකට හෝ ගිහින් ප්‍රශ්නවලට පිළිතුරු දීම ආදී කටයුතු පිළිබඳව හොඳට ඉගෙන ගෙන මේ සභාවට පැමිණෙන්නට. අපි—ලංකා සමසමාජ පක්ෂය—අසාධාරණ ලෙස කීවේ නැහැ, ගරු අගමැතිනිය වහාම මේ සභාවට පැමිණෙන්නට ඕනෑය කියා.

අ. භා. 6.15

මට හොඳට මතකයි, එවැනි අවස්ථාවලදී එක්සත් ජාතික පක්ෂයේ සහ මහජන එක්සත් පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළා, කවදාවත් සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට ගොස් මේ රටේ අගමැතිනිය හැටියට එතුමියට වැඩ කරන්න බැරි බව. අපි කවදාවත් එහෙම කීවේ නැහැ. විශෙෂයෙන්ම අගමැතිනිය ගැහැණු කෙනකු නිසා, දේශපාලනය පිළිබඳ දක්ෂතාවක් ඇති විරුද්ධ පාර්ශ්වයේ නායකයින් සිටින මේ ගරු සභාවට එක වරටම ඇවිත් මේ ගරු සභාවේ මතු වන ප්‍රශ්නවලට පිළිතුරු දී මේ රටේ දේශපාලන නායිකාවක් වශයෙන් වැඩ කරන්නට බැරි නිසා, එතුමියට ඒ සඳහා සූදානම් වීමට කාලසීමාවක් දිය යුතුයයි අපි කල්පනා කළා.

නමුත් දැන් අපට මොනවාද, පෙනෙන්නට තිබෙන්නේ? දැන් ඒ කාලසීමාව ඉක්ම ගොස් තිබෙනවා. අද වෙනම තර්කයක් ඉදිරිපත් කර තිබෙනවා. මේ ගරු සභාවට අගමැතිනිය පැමිණෙන්නට ඕනෑය කියන සම්ප්‍රදායයක්, වුවමනාවක්, නැති බව ගරු මුදල් ඇමතිතුමා කියනවා. එතුමියට වෙන නැනක ඉඳගෙන මේ රට ආණ්ඩු කරන්න පුළුවන් බව නොයෙක් අවස්ථාවලදී ගරු මුදල් ඇමතිතුමා මෙතැන ප්‍රකාශ කර තියෙනවා. මුදල් ඇමතිතුමාගේ අවශ්‍යතාව එය බවට මට කිසිම සැකයක් නැහැ. එම නිසා මුදල් ඇමතිතුමා එසේ ප්‍රකාශ කිරීම ගැන මම පුදුම වන්නේ නැහැ. එතුමාට එසේ සිදු වීම වුවමනායි. මෙතැන අගමැතිතුමා හැටියට වැඩ බලන්නේ එතුමායි. එතුමාට කිසිම වුවමනාවක් නැහැ, එතුමාගේ කිසිම කැමැත්තක් නැහැ, එතුමිය ව මේ ස්ථානයට ගෙන්වා ගන්න. ඒ බව මම මේ ගරු සභාවේ නිර්භයව ප්‍රකාශ කරන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සභාපතිතුමනි, විදේශීය රටවල පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන එතුමා හොඳට දන්නවා. වෙන රටවල පාර්ලිමේන්තු සම්ප්‍රදාය අ යන්න ආ යන්න ඉ යන්න ඊ යන්නටම මෙහි පිළිපදින්න ඕනෑයයි මම කියන්නේ නැහැ. නමුත් රටක අගමැති වරයෙකු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සිටිය යුතු බව වැදගත් හේතූන් උඩ, ජන සම්මතවාදී සම්ප්‍රදායයන් අනුවත් ඉතිහාස යෙනුත් පෙන්නුම් කර තිබෙනවා. එක් කාලයකදී එංගලන්තයේ රදල සාමිවරුන්ගේ සභාවේ අගමැතිවරයකු සිටි බව අපි දන්නවා. නමුත් ක්‍රමක්‍රමයෙන් මහජනයාගේ බලය වැඩි වන විට අගමැතිවරුන් ආවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයටයි. විශෙෂයෙන්ම සෙනෙට් සභාව නැති කළ යුතුය යන අදහස අපේ රටේ තදින් පිළිගැනී තිබෙනවා. එම නිසා මේ රටේ අගමැති තුමිය එවැනි සභාවක සිටීම බලවත් කනගාටුවට කරුණක් බව ප්‍රකාශ කරන්න ඕනෑ.

එපමණක් නොවෙයි, අගමැතිවරියක් වුණාම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සමග මෙන්ම විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් සමගත් සාකච්ඡා කරන්න එතුමියට අවස්ථාවක් තිබෙන්න ඕනෑ. මේ ගරු සභාවේ කියවෙන දේ ගැන තවත් කවුරුවත් කියන දේ අසාගෙන, මේ සභාවේ තත්ත්වය හා මේ සභාවේ ඇති වන ප්‍රශ්න ගැන හරි අවබෝධයක් නැතිව, රටට නියම නායකත්වයක් දෙන්න අගමැතිතුමියට පුළුවන් වේය කියා මම හිතන්නේ නැහැ. මේ ගරු සභාවේ සාමාන්‍ය මන්ත්‍රීවරුන් හමු වී සාකච්ඡා කරන්න එතුමියට අවස්ථාවක් නැහැ. එතුමිය මේ ගරු සභාවට එනවා නම්, අසවල් ප්‍රශ්න තිබෙන්නේ අසවල් තත්ත්වයකය යන්න එතුමියට පෙනෙනවා නේද කියා මම තමුන්නාන්සේගෙන් අහන්න කැමතියි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පමණක් නොව විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුනුත් හමු වී සාකච්ඡා කිරීමෙනුයි, එතුමියට නොයෙක් ප්‍රශ්නවල නියම තත්ත්වය මැන ගැනීමට පුළුවන් වන්නේ. නමුත් එතුමිය හරියට පුළුන්වල ඔතා ඉවත් කර තබන්නාක් මෙන් මෙතැනින් ඉවතට කර ගරු මුදල් ඇමතිතුමාගේ අදහස සාර්ථක කර ගන්න උත්සාහ කරන බව මට පෙනෙනවා.

අපේ මුදල් ඇමතිතුමා දෙමිපේ සමාජවාදය ගැන කථා කර තිබෙන බව මම මතක් කරන්න කැමතියි. සමාජවාදය ගැන කියන්න වුවමනාවක් නැහැ. ජනසම්මත වාදය ගැන කල්පනා කරනවා නම් මහජන ඡන්දයෙන් පත් කරන ලද මන්ත්‍රණ සභාවකට මේ යුගයේදී උසස් තැනක් දිය යුතුය යන්න ගරු මුදල් ඇමතිතුමා පිළිගන්නවා ඇති. ඒ අනුව මහජන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ගරු අගමැතිනිය පත් වී එන්න ඕනෑය යන අදහස එතුමා හොඳාකාර දන්නවා. අගමැතිනිය මේ සථානයට එන්න වුවමනා නැතැයි එතුමා කියනවා නම්, මා කියනවා එතුමාගේ ඒ වුවමනාව මේ රටේ මහජනයා තුළ තිබෙන වුවමනාවක් නොව එතුමා තුළ තිබෙන වුවමනාවක්ය කියා. ඒ අදහස නිර්භයව ප්‍රකාශ කරන්නට මා කැමතියි.

ගරු අගමැතිනියගේ කාර් එක ගැන කථානේ ගරු මන්ත්‍රීතුමා (විජයපාල මෙන්ඩිස් මයා.) කිවා. ඒ සඳහා යන වියදම ගැනයි එතුමා කීවේ. අදද මේවා මතක් වන්නේ? 1953 දී රටේ මුදල් තත්ත්වය අවදානම් අඩියක තිබුණාය කියා පාසැල් දරුවන්ට බෙදා දෙමින් තිබුණු බනිස් ගෙඩියට තට්ටු කළ අවස්ථාවේ තමුන්නාන්සේලා එවකට සිටි අගමැතිතුමාගේ පඩිය කැපුවදා? කාර් එකට ගිය වියදම් කැපුවාද? මේවා අද පමණක් මතක් වන්නේ මක්නිසාදැයි අහන්න කැමතියි. ඒ කාලයේ ආණ්ඩු බලය තිබුණු එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් ශ්‍රීමත් ජෝන් කොතලාවල අග්‍රාමාත්‍යතුමාගේ කැබිලැක් කාර් එක ගැන කථා නොකළේ ඇයි? සමහර විට බස් මුදලාලි මහත්වරුන්ගේ සහයෝගය තිබුණු ශ්‍රීමත් ජෝන් කොතලාවල අගමැතිතුමාගේ ආණ්ඩුව සම්බන්ධයෙන් ඒ ආකාරයට කථා කරන්නට අකමැති වුණා වෙන්න පුළුවනි. අද මේ ආණ්ඩුව මේ ආකාරයට මුදල් වියදම් කරනවාය කියා එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විරුද්ධත්වයක් දක්වනවා නම්, ඒ අනුව අදහස් ප්‍රකාශ කරනවා නම් කරුණාකර ඒ විධියට අදහස් ප්‍රකාශ කරන්නට එපා. අවංකව කල්පනා කරනවා නම් ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂයේ අයත් ඒ විධියටයි කළේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ. එච්. මකන්-මකර් මයා.

(ஜனப் ஏ. எச். மாக்கன் மாக்கர்)

(Mr. A. H. Macan Markar)

I think it is adding insult to injury for the Hon. lady Prime Minister, while not condescending to take a seat in this House, to act in a discriminatory manner. As hon. Members are aware, it is only the Members of the Government party who are being issued with "passports" to enable them to visit the Prime Minister at "Temple Trees" whereas we Members of the Opposition are being looked upon as outcasts and not worthy of receiving such passports. I trust in fairness to all hon. Members of the House, and in view of the fact that the Prime Minister is not only the Prime Minister of the Sri Lanka Freedom Party but the Prime Minister of the whole of Ceylon, that such passports or identity cards will be issued to all hon. Members of the House without discrimination.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක

(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)

(The Hon. F. R. Dias Bandaranaike)

To issue them to all illicit immigrants also?

ඒ. එච්. මකන්-මකර් මයා.

(ஜனப் ஏ. எச். மாக்கன் மாக்கர்)

(Mr. A. H. Macan Markar)

I do not think there are illicit immigrants in this House. Is that your inference?

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක

(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)

(The Hon. F. R. Dias Bandaranaike)

You were talking of passports. I was wondering.

ඒ. එච්. මකන්-මකර් මයා.

(ஜனப் ஏ. எச். மாக்கன் மாக்கர்)

(Mr. A. H. Macan Markar)

Sir, you will remember that the late Prime Minister was always willing to receive people whether they were Members of his party or Members of the Opposition at all hours of the day and night. Of course, I do not expect the same of the lady Prime Minister but I feel that Members of this House, whether they belong to the Opposition or not, should be given an equal opportunity, if they so desire, of seeing the Prime Minister during reasonable hours.

Then, a statement was made by the hon. Member for Agalawatta (Mr. Anil Moonesinghe) that the U. N. P. purchased a Cadillac car in 1953 when Sir John Kotelawala was the Prime Minister of this country. As far as I can remember, reading a newspaper report, it was said that it was proposed to utilize the sale proceeds of that particular car in order to finance in part the purchase of this new car. There was a news item in which it was said that though Rs. 18,000 was being budgeted for to buy a new car, which is to be used by V. I. Ps visiting this country and not by the Prime Minister, that the proceeds from the sale of that Cadillac car and also the sale of some other car were to be utilized to finance the purchase of the new car. Moreover, even though the Cadillac car in question was in use for nearly 8 years—in view of the present shortage of such powerful and luxurious cars—you would be able to get a much higher price than the original cost then. I am sure, the U. N. P. made a wise investment at that time.

මොල්ලිගොඩ මයා.

(திரு. மொல்லிகொட)

(Mr. Molligoda)

I was surprised when I listened to the speech of the hon. Member for Katana (Mr. Mendis). All of us in this House, without exception, have the greatest regard for the hon. Leader of the Opposition, the hon. First Member for Colombo South (Mr. J. R. Jayewardene) and the rest of the U. N. P. Front-benchers but never in the history of this House have these Front-benchers proclaimed so loudly that this House is acting irresponsibly, that Members of this House were acting without any responsibility; at least their eyes are now open.

The leaders of the United National Party thought that they could put that point of view forward at the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

elections. Just because they have pots of money they seem to think that they could come to this assembly and insult the dignity and decorum of this House. That very fact that because they had pots of money, because a man was a bus magnate and had a lot of money, was used as a criterion by the United National Party to nominate candidates to this House. Therefore, when I raised that point of Order, I did so because I felt that the dignity of this House was insulted. Mr. Chairman, I ask, in which august assembly in this country or in the world does an hon. Member of that very honourable assembly rise up in the course of a Debate and say that the House is acting irresponsibly ? I hope their eyes are open now.

Mr. Chairman, a thing that has been discussed most was the absence of the fair Hon. Prime Minister from this House.

ද අල්විස් මයා.
(திரு. டி. அல்விஸ்)
(Mr. de Alwis)

We all want to see her.

මොල්ලිගොඩ මයා.
(திரு. மொல்லிகொட)
(Mr. Molligoda)

Yes. The Sri Lanka Freedom Party was returned to this House to carry out the Bandaranaike policies of democratic socialism in this country and I do not think that the presence of the fair Prime Minister is so essential for us to implement those very policies of democratic socialism in this country.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Order, please ! Mr. Speaker will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසන යෙන් ඉවත් වූයෙන් කථානායකතුමා මූලාසනාරූඪ විය.

මොල්ලිගොඩ මයා.
(திரு. மொல்லிகொட)
(Mr. Molligoda)

My good and hon. Friend the Member for Agalawatta said a little while ago that the Hon. Minister of Finance was gradually taking over the powers of the hon. Fair Prime Minister of this country. But let me remind him—I am more than a Colleague, a friend of his—that we on this side of the House are not aware of any such moves by the Hon. Minister of Finance other than the fact that he is the Parliamentary Secretary to the Prime Minister and as such he represents her in all activities and business of this assembly.

The importance of this assembly was stressed by many an hon. Member of this House. Let me tell this House that we of the Sri Lanka Freedom Party would never govern this country without democracy ; we have the highest regard and respect for democracy as well as for parliamentary institutions in this country. I think it was the late Prime Minister Mr. Bandaranaike who at the opening of an international conference held at the University of Ceylon, Peradeniya, as far back as 1957, said that parliamentary democracy is by far yet the best form of Government that man has discovered. And we, Mr. Chairman, pledged to carry out the policies of the late Mr. Bandaranaike will never govern the country under the cover of an Emergency. The Emergency continues in this country today for the reason that democracy was abused. The Emergency was introduced in this country because the Federal Party was about to create a state within the State of Ceylon in the Northern and Eastern Provinces. The Leader of the Opposition himself sometime back on the Floor of the House said " How can the Government withdraw the Emergency when the hon. Member for Uduppiddy (Mr. M. Sivasithamparam) made a statement in this House that the moment the Emergency is withdrawn the Tamil speaking people will start riots against the Government ? "

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනිල් මුණසිංහ මයා.
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

Continue it for 20 years !

අ. භා. 6.30

මොල්ලිගොඩ මයා.
(திரு. மொல்லிகொட)
(Mr. Molligoda)

I do not think it will be continued for a long time. We on this side of the House want to bring about communal harmony in this country before long and, at that stage, I can assure hon. Members of this House, that the Emergency will be withdrawn.

The hon. Member for Katana (Mr. Mendis) spoke about the salary of Parliamentary Secretaries and cars of the Prime Minister. I should say that this is not the only country in the world where the Prime Minister has more than one car. Whether it be in a democratic country or in a capitalist country or in a socialist country you find the Head of State having more than one car for his conveyance, for the conveyance of V. I. Ps and distinguished persons. As such those arguments do not hold water.

I want to speak much more and answer most of the arguments put forward by hon. Members from that side but I think the Hon. Minister of Finance will adequately meet their arguments when he speaks.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

Mr. Chairman, I do not propose to enter once more into a discussion as to whether the Prime Minister should be here or not. We have before this occasion given expression to our views on that aspect of the matter. But, of course, the Hon. Minister of Finance is also the Parliamentary Secretary to the Prime Minister, and in passing I must remind him that it behoves him at least to be here when the Prime Minister is not here—

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

I have been here throughout the day.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

I have been here when you were not present.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

When the Speaker sent for me I had to be out.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

We were discussing the votes of the Prime Minister and the difficulty is that the Prime Minister is not here. Unfortunately the one who is her Parliamentary Secretary was also not here. The hon. Member for Bulathsinhala (Mr. Edmund Samarakkody) was making some very important points on the Prime Minister's Vote and at that time I saw that chair vacant. I remember many Budgets were discussed in this House and, if I remember something about other Finance Ministers, they were always here right through all the Budget estimates. I might mention that. However, that is in passing.

I too wish to take up this matter of the Emergency. It is true, as the hon. Member for Bulathsinhala stated, that we supported this Emergency when it was declared, unlike their party who opposed it from the very start. We felt that a situation did exist in the Northern and Eastern Provinces which necessitated the declaration of an Emergency. Well, I do not want to mention the reasons that precipated affairs in the Northern and Eastern Provinces but, however, a situation existed for the declaration of an Emergency. The fact that we

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

supported that does not mean that we would continue to support an indefinite Emergency of this nature. Judging from the remarks of the hon. Member for Niwitigala (Mr. Molligoda) it looks as if, as long as the Federal Party wants a separate state, there should be an Emergency. The hon. Member for Niwitigala reminded us that the Federal Party wants to set up a separate state and therefore we must have an Emergency. The Federal Party can have demands for a separate state but let us realise this fact. Today the Emergency does not exist for coping with the situation in the Northern and Eastern provinces. That is the fact. The fact that the hon. Member for Udupp ddy stated on a previous occasion that the moment the Emergency is lifted the people in the Northern and Eastern provinces will carry out their agitation does not mean that you are justified in continuing an Emergency. But according to him that statement is there in HANSARD. Then you are justified in having an Emergency for the full period of the life of the Parliament!

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That was the hon. Member for Niwitigala's implication.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)

We apprehended the fact and I believe Members of other Parties too stated that this state of Emergency will be used or abused for purposes other than those for which it was declared. I think the hon. Member for Dehiwala-Mt. Lavinia (Dr. Colvin R. de Silva) spoke about trade union activity. Consequent on the Budget there seems to be some unrest in the Government Parliamentary Group judging from a newspaper report of their meeting last night. If that report is correct the Hon. Minister of Finance is also having second thoughts about his own Budget. Within the secrecy of the Group meeting the Members of his Party must have appraised him of the situation in the country as regards the Budget proposals. He would do well to consider some of those views. However, I want to know definitely and categorically why you are continuing the Emergency today. What is your reason? Is it the situation in the Northern and Eastern Provinces? And if it is the situation there let us know what it is that is happening in the Northern and Eastern Provinces that compel you month after month to carry on an Emergency.

මුණසිංහ මයා.
(திரு. முனசிங்க)
(Mr. Munaweera)

ගරු සභාපතිතුමනි, නොබෝදා ගරු අගමැතිනිය මහජන බැංකුවේ ශාඛාවක් විවෘත කිරීම නිමිත්තෙන් මාතලේ නගරයට ගියා. එදාම සමුපකාර තොග වෙළඳ ආයතනයේ ශාඛාවකුත් විවෘත කරන්නට යෙදුණා. අද සුදනන් වන්නට උත්සාහ කරන එක්සත් ජාතික පක්ෂයේ උදවිය කොයි තරම් කෑ ගැහුවත් මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ආණ්ඩුවක් ගෙන යන මේ යුගයේදී මේ රටේ සිටින වෙළඳ මහත්වරුන්ගේ උපකාරයෙන් රට තුළ මහත් ආන්දෝලනයක් ඇති කරන්නට ඔවුන් උත්සාහ කරන වේලාවක ගරු අගමැතිනිය මාතලේ නගරය තුළ සමුපකාර තොග වෙළඳ ආයතනයේ ශාඛාවක් විවෘත කිරීම ගැන අප සන්තෝෂ වෙන්නට ඕනෑ. මහජන බැංකුවේ ශාඛාවක් විවෘත කිරීම හා සම්බන්ධ උත්සවයට සහභාගී වන ලෙස කළ ආරාධනය ගැන වත්තේගම ගරු මන්ත්‍රීතුමා (ඒ. රත්නායක මයා.) සංවිධායකයින්ට ස්තුති කළා. ඒ වගේම ඒ ගැන සන්තෝෂයට පත්වුණු බවත් කීවා. එවැනි අදහසක් ප්‍රකාශ කළ ඒ ගරු මන්ත්‍රීතුමා ඒ සමගම කියා සිටියා, එම උත්සවයට සහභාගි වන්නට තමන්ට නොලැබී යාම ගැන එතුමා සතුටු වෙනවා ය කියා. ඊට හේතුව වශයෙන් එතුමා කියා සිටියේ ගරු අගමැතිනිය ඒ ස්ථානයට ගොස් දේශපාලන කථාවක් කළාය යන්නයි. මා නියෝජනය කර සිටින රත්තොට ප්‍රදේශයට මාතලේ නගරයේ තුන් පැත්තක්ම අයිතියි. ඒ නිසා වත්තේගම ගරු මන්ත්‍රීතුමා නැගූ චෝදනාවලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුණසිංහ මයා.]

පිළිතුරු වශයෙන් එතුමාට මේ කාරණය මතක් කරන්න කැමතියි. ගරු අගමැතිනිය එදා ඒ රැස්වීමේදී ඒ තරම් ලොකු දෙයක් කීවේ නැහැ. හිත නරක් කර ගන්න තරම් දෙයක් එතුමිය ප්‍රකාශ කළේ නැහැ. එතුමිය කීවේ පිටි මිල වැඩි කළාය, සීනි මිල වැඩි කළාය, ගිනිපෙට්ටියේ මිල වැඩි කළාය, යනාදී වශයෙන් ආණ්ඩුවට විරුද්ධව කරුණු ඉදිරිපත් කරමින් එක්සත් ජාතික පක්ෂය වෙළෙන්දන්ගේ මාර්ගයෙන් කරවල ගිඟයක් ඇති කරනවාය; මහජනයා මත ලොකු බරක් දමන්නට ක්‍රියා කරනවාය; එහෙත් එක්සත් ජාතික පක්ෂයේ නායකයා සත 25ට තිබුණු හාල් සේරුවේ මිල 1953 දී සත 70 දක්වා වැඩි කර පැනලා ගියා වගේ මා පැන යන්නේ නැහැ කියායි. ඒ නිසා අවුරුදු 25කට වැඩි කාලයක් තුළ මේ රටේ දේශපාලනයෙහි නිරතව සිටි, ඒ මගින් ලබාගත් පළපුරුද්දක් ඇති වෘද්ධ දේශපාලනඥයකු වන වත්තේගම ගරු මන්ත්‍රීතුමා අපේ ගරු අගමැතිනිය පිළිබඳව මෙවැනි අදහසක් ඇති කර ගැනීම ගැන මා කනගාටු වෙනවා. නොයෙක් කාරණා ඉදිරිපත් කරමින් එක්සත් ජාතික පක්ෂයේ උදවිය බොහොම තදින් අප විවේචන කරනවා. ඒ වගේම රටේ නැති තත්ත්වයක් ඇති කර පෙන්වන්නට වෑයම් කරනවා.

පසුගිය මැතිවරණයෙන් පැරදුණු, ඊට පෙර වත්තේගම මන්ත්‍රීවරයා වශයෙන් පෙනී සිටි වීරකෝන් මහත්මයා නොබෝදා රත්තොටට ගියා. එතුමා ගියේ තරුණ පෙරමුණක් ඇති කරන්නටයි. තුන් හතර දෙනෙකු සමග රත්තොට ප්‍රදේශයට ගිය වීරකෝන් මහත්මයා එහිදී කීප දෙනකු එකතු කරගෙන රහස් සාකච්ඡාවක් ඇති කර තිබෙනවා. සීනි සහ පිටි වැනි ආහාර ද්‍රව්‍යවලත්, ගිනිපෙට්ටිවලත් මිල වෙනස් කිරීම උඩ මේ රටේ විප්ලවයක් ඇති කරන්නට පුළුවන් වේය කියා බලාපොරොත්තුවක් තිබෙනවා.

බොරැල්ලේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍ය චාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා) මේ ආණ්ඩුවට තදින් අවවාද කළා. මේ රටේ වැඩ කරන ජනතාවගේ බලවේගය තර්ජනයෙන් නවත්වන්නට බැරිය කියා එතුමා කීවා. වැඩ කරන ජනතාවගේ බලවේගය තර්ජනයෙන් නවත්වන්නට බැරි බව ගරු අගමැතිනිය දැන ගත යුතුයි කියා එතුමා කීවා. බොරැල්ලේ ගරු මන්ත්‍රීතුමා දැන් අසනීප යෙන් සිටින නිසා එතුමාගේ හිත රිද්දවන්නට අපට වුවමනාවක් නැහැ. එතුමා හිතන විධිය නිවැරදිය කියා එතුමා හිතනවා වෙන්නට පුළුවනි. එතුමා මොන විධියට හිතුවත් වැඩ කරන ජනතාවගේ බලය තර්ජනයෙන් මෙල්ල කිරීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව අනුගමනය කරන ප්‍රතිපත්තියක් නොවන බව ඉතාම පැහැදිලි ලෙස කාගේත් දැන ගැනීම පිණිස මතක් කර දෙන්නට කැමතියි. දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමා මහා මැතිවරණයකින් පසුව බලයට පත් වී පාර්ලිමේන්තුව උත්සවාකාරයෙන් විවෘත කරන අවස්ථාවේ මේ පාර්ලිමේන්තුව තුළට වැඩ කරන කම්කරුවකු ගෙන්වා වාඩි කළ අවස්ථාව මට මතකයි. ඒ සමගම එතුමාගේ පාලන සමයේදී කැළණි ගඟ හරහා අලුතින් දමන ලද පාලම විවෘත කිරීමේ ඓතිහාසික අවස්ථාවේදී එය විවෘත කිරීමේ කාර්යය තමන් වෙත පැවරී තිබුණු නමුත් ඒ වෙනුවට එම පාලම හැදී මේ නියුක්ත වූ කම්කරුවකු යොදවා, ඔහු ලවා රිබන් පටිය කැප්පවීමෙන් එය විවෘත කරවූ ආකාරයත් මට මතකයි. එතුමා මේ ආකාරයට ක්‍රියා කළේ විහිළු තහළු කරන්නට නොව උදාර පරමාර්ථයක් අනුව බව අප දන්නවා. මේ රටේ ලොකු ලොක්කන් ගෙන් පැවත එන අය අතින්ම සියල්ලක්ම සිදුවිය යුතුය යන පුහු අදහස එතුමා ඉවත් කර දැම්මා. ඒ බව එක්සත් ජාතික පක්ෂයට මතක් කරන්නට කැමතියි. දිවංගත බණ්ඩාරනායක ගරු අගමැතිතුමා 1956 මහා මැතිවරණයෙන් ජය ලබා ආණ්ඩුවක් පිහිටුවන්නට ඔන්න මෙන්න කියා තිබුණු අවස්ථාවේ සිදු වූ දෙයක් මට මතක් වෙනවා. ඒ වේලාවේ එතුමා හොරගොල්ලේ සිය නිවසේ සිටියා. එතුමා ආරක්ෂා කරන්නට එදා හොරගොල්ලට පොලීසියෙන් ආවා. "මොකද මේ තරම් විශාල පිරිසක්?" කියා එතුමා මවිතයෙන් ප්‍රශ්න කළා. "තමුන්නාන්සේ ආරක්ෂා කරන්නට පැමිණෙන ලෙස ගරුතර අග්‍රාණ්ඩුකාරතුමා අපට නියම කර තිබෙනවා" කීවා. ඒ අවස්ථාවේ ඒ අයට ගරු බණ්ඩාරනායක මැතිතුමා දුන් පිළිතුර මගේ කණට ඇහුණා. මාත් ඒ වේලාවට හොරගොල්ලට ඇවිත් හිටියා. දැන්ද මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආරක්ෂා කරන්නට හිතුවේ? මා ආරක්ෂා කරන්නට වුවමනාවක් නැහැ. මගේ ආරක්ෂාවට මේ රටේ ජනතාව ඉන්නවා," යනුවෙන් එතුමා කීවා. එතුමා දැරූ ප්‍රතිපත්ති අනුවයි අපේ ආණ්ඩුව වැඩ කර ගෙන යන්නේ. ඒ අනුව අපේ වැඩ කට යුතු හරියාකාර කරගෙන යන බවූ බොරැල්ලේ ගරු මන්ත්‍රීතුමාටත් එක්සත් ජාතික පක්ෂයටත් මතක් කරන්න කැමතියි.

අ. භා. 6.45

බඩු මිල ගැන කථා කරන විට, මිල වැඩි වූ දේවල් ගැන පමණක් කියන නමුත් පොල්තෙල්වල මිල 6 මාසයකට අවුරුද්දකට ඉස්සරවෙලා තිබුණ ගණනට සත 40 කින් පහළ බැස තිබෙන බව හෝ වෙනත් දේ සම්බන්ධයෙන් එවැනි තත්ත්වයක් තිබෙන බව හෝ කවුරුවත් කියන්නේ නැහැ. ඒ කරුණු ගැන මතක් කරන්නේ නැහැ. ඊයේ පෙරේදා "ජනතා" පත්‍රයක ලොකු සිරස් තලයක් පළ වී තිබුණා, "සියලුම සුළු වෙළෙන්දෝ කඩ වසා දමති" කියා. එහි පහළින් සඳහන් වී තිබුණා, භය නිසා කඩ වසා දමා තිබෙනවාය කියා. දැන් මාස ගණනක් තිස්සේ අධිකරණ ඇමතිතුමාටත් කැබිනට් මණ්ඩලයටත් අප කියා තිබෙනවා, මේ රටේ ජනතාවට සේවයක් කරන්නට වුවමනා නම් ධනපතියන්ට පන්දම් අල්ලන පත්‍ර ටික වහාම රජයට ගන්නට ඕනෑ බව. ඒ කාරණය ගරු අධිකරණ ඇමතිතුමාටත් කැබිනට් මණ්ඩලයටත් නැවතත් මතක් කරනවා. මේ ධනපතියන්ගේ පන්දම්කාර පත්‍ර මේ රටේ තිබෙන තුරු මෙරට සාමාන්‍ය ජනතාව ලෙහෙසියෙන් ආරක්ෂා කර ගන්නට පුළුවන් වේයයි මා හිතන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, අන්තිම මොහොතේදීත් බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) කියා සිටියා, "බොරු කාරයෙක්ද, බොරු කාරයෙක් නොවෙයිද කියා මා දන්නේ නැහැ, නමුත් මගේ වචන අස් කර ගන්නවා" කියා. එතුමා පැහැදිලි වශයෙන් කියා සිටියා, මගේ ආසනයේ මා රුස්වීම් 22ක් තිබ්බාය, මෙම අයවැය ලේඛන විවාදයේදී මා කීවේ බොරුවක්ය, කියා. ඒ ගැන මා කනගාටු වෙනවා. අයවැය ලේඛනය පිළිබඳ මුදල් ඇමතිතුමාගේ කථාවෙන් පසු මා මගේ ආසනයේ සෑම කොටසකටම වාගේ ගිහින් මගේ ආධාරකරුවන් රැස් කරගෙන "මේ කාරණය මෙහෙමයි, මේ කාරණයට මෙපමණ මුදල් වෙන් කර තිබෙනවා" යනුවෙන් කරුණු පැහැදිලි කර දුන්නා. යම් කිසි ද්‍රව්‍යයකට සතයක් වුණත් වැඩිපුර ගෙවන්නට සිදු වීම අපහසු කරුණක් බව මා පිළිගන්නා බවත්, මෙම අයවැය ලේඛනයට මා එකඟ වන්නේ මේ මේ කරුණු උඩ බවත් පැහැදිලි කර දුන්නා. මගේ ආසනයේ උඩසිය පත්තුව, මැදසිය පත්තුව, පල්ලේසිය පත්තුව, කෝන්සිය පත්තුව යනුවෙන් කොටස් හතරක් තිබෙනවා. කෝන්සිය පත්තුවේ මෙන්න මේ මේ වැඩ සඳහා මෙපමණ මුදලක් වියදම් කරන්නට ආණ්ඩුව ලැහැස්තිය, මැදසිය පත්තුවේ මේ මේ වැඩ කරන්නට ආණ්ඩුව අදහස් කරනවාය, අසුවල් පත්තුවේ මේ පාඨශාලාව සාදන්නට යනවාය, යනුවෙන් විස්තර වශයෙන් ඒ එක් එක් පත්තුවකට ගිහින් මා කරුණු පැහැදිලි කර දුන්නා. මේ පරිත්‍යාග ටික ආණ්ඩුව තමුන්නාන්සේලාට කරනවා නම්, ආණ්ඩුව මෙතෙක් කල් ගම්බද ජනතාවට නොදුන් දේවල් මගේ කොටසට මම මේ ආණ්ඩුවෙන් ලබා දෙනවා නම්, තමුන්නාන්සේලා ආණ්ඩුවට සත පහක් පරිත්‍යාග කරන්නට ඕනෑයයි මා කියා සිටි අවස්ථාවේදී ඒ රැස්වීම්වලට පැමිණ සිටි උදවිය අත්පොළසන් දී එය පිළිගත් බව බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමාට මා මතක් කරන්නට ඕනෑ: තමුන්නාන්සේලාට මුසාවාදයක් කියන්ට මට ඇති වුවමනාවක් නැහැ, රත්නොට ආසනයේ ඡන්දදායකයන් ඒ පිළිබඳව ලබන මැතිවරණයේදී තීරණයක් ගන්නවා ඇති. තමුන්නාන්සේලාට මා හිස නමා ගෞරව යෙන් කියන්නේ එපමණයි.

තවත් කරුණු කීපයක් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් සඳහන් කළ නමුත් මා ඒවාට පිළිතුරු දීමට කාලය ගත කරන්නේ නැහැ. මා හිතනවා ඒවාට සෑහෙන පිළිතුරු ගරු මුදල් ඇමතිතුමාගේ කථාවේදී ලැබේය කියා. මට විශේෂයෙන් සඳහන් කරන්නට වුවමනා කළේ මාතලේ සිද්ධිය ගැනයි. තමුන්නාන්සේට ස්තුති කරමින් මගේ වචන සඵල්පය මෙයින් අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

By his own words the hon. Member for Rattota (Mr. Munaweera) is condemning his Party and the action of the Prime Minister. He says the late Premier gave a status to the worker, did not want police protection, and walked the length and breadth of the land amid the loving applause of the people. In contrast, what do we see today ? The worker cannot see the Prime Minister any longer. The Prime Minister requires armed protection by not only the police but also the military. Is it not the position that not merely the Prime Minister, but all Ministers require armed protection today and have guards at their gates ? They have police and military guards in front and behind.

A statement was made by the Hon. Leader of the House on the 18th April 1961 giving the reasons for the declaration of the Emergency. What it amounted to was that, because the Government could not conduct normal business like distribution of food, payment of salaries and pensions and protecting the citizen from violence, in the Northern and Eastern Provinces, the Government with the unanimous support of the Government Party declared an Emergency. That was what the Hon. Leader of the House told us on the 18th of April. The hon. Parliamentary Secretary to the Minister of Defence and External Affairs has said, in much the same words, that there was reason for the declaration of the Emergency. Two lines of what he said I consider as very important. He asked the question, "Was not the Government under these circumstances justified in declaring an Emergency ?" Those were his very words, which I consider more important than all that was said by the Hon. Leader of the House.

Let us take the converse of it. Then what do these words mean ? They mean that if that position is no more, there is no justification for the Emergency. If your lines of argument was that those conditions justified the Emergency, the converse of it should be that if those conditions no longer exist, there is no justification for the Emergency.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

What about the obverse ?

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

You will see the obverse in the very near future.

I want to ask the hon. Parliamentary Secretary, who is also the Minister of Finance : what are the implications of the Emergency on the exchequer ? What is the amount that you are spending from day to day ? I understand that it is about Rs. 160,000. That is about Rs. 4,800,000 a month, and roughly Rs. 20 million to date. This is a very serious matter. The Hon. Prime Minister is telling the people that they must tighten their belts. The hon. Member for Rattota (Mr. Munaweera) says that the people must be prepared to make sacrifices. For what reason are they to make these sacrifices ? Is it to enable the Government to spend Rs. 20 million on the Emergency in four months ? I hope the Hon. Minister will not challenge my figures. When I give figures in particular I take the trouble to find out the true figures.

I ask the hon. Parliamentary Secretary whether he is aware of the difficulties that the ordinary citizen is encountering today under the Emergency. For the first time he is experiencing a sense of being harassed, a sense of being bound over, a sense of living under the dictatorship of somebody who can chop his head off at any moment.

I know the case of a particular person in my electorate who asked that he be allowed to use a loudspeaker at his home. His wedding

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

was to take place the following day. The Police said that under the Defence Regulations he could be given a loudspeaker for one day only, not for two days. I know that that is the position, but the people do not know it. The people are under the impression that they are being harassed by the Government under the cloak of the Emergency. People who wish to ask for their legitimate dues in salary and other conditions cannot voice their grievances. Whether it be Dompe socialism or any other kind of socialism, the principle of socialism is that people should be able to voice their grievances. Otherwise, it is no longer a democratic socialist state. Does a Dompe socialist state mean that everyone must pay *namaskaram* to the hon. Member for Dompe (Hon. F. R. Dias Bandaranaike) ? That is his idea of Dompe socialism.

I believe the hon. Parliamentary Secretary will be replying soon. I particularly want to tell him that we will not be beguiled nor satisfied by vague promises or by the statement that when the Government feels that the situation is right they will remove the Emergency. If you think that you have got to wait till the situation is right, I would ask you to tell us what the conditions are that make for the right situation.

පී. ආර්. රත්නායක මයා. (මාවනැල්ල)
(திரு. பீ. ஆர். ரத்நாயக்க—மாவனல்லை)
(Mr. P. R. Ratnayake—Mawanella)

ගරු සභාපතිතුමනි, වත්තල ගරු මන්ත්‍රීතුමා (ෂෙල්ටන් ජයසිංහ මයා.) කීවාක් මෙන් මාද කියන්නට කැමතියි මාත් මුලදී කථා කරන්නට අදහස් කර සිටියේ නැත කියා. එහෙත් වත්තල ගරු මන්ත්‍රීතුමාගේ කථාව ඇසුවාට පසුව වචන ස්වල්පයක් කථා කරන්න වුවමනාය කියා මට කල්පනා මුණා. හදිසි තත්ත්වය පවත්වා ගෙන යෑම සඳහා රජයට දරන්නට සිදු වී ඇති වියදම සම්බන්ධයෙන් වත්තල ගරු මන්ත්‍රීතුමා විස්තර නොකළාට හදිසි තත්ත්වය උඩ කොතරම් මුදල් ප්‍රමාණයක් වියදම් කරන්නට සිදු වුණාද කියන එක ගැන මේ ආණ්ඩුව දන්නවා. හදිසි නීතිය අස්කර අද රටේ පවතින තත්ත්වය අනුව ඊට වඩා වෙනස් දෙයක් ඇති කරන්න අප කල්පනා කරන්නේ නැහැ. හදිසි නීතිය පනවන අවස්ථාවේදී එය එසේ පැනවිය යුතුය කියා විරුද්ධ පාර්ශ්වයේ නායක තුමාද පිළිගත් බව ප්‍රකාශ වුණා. අප දන්නවා, එතුමන්ලාගේ අදහස් මොනවාද කියා. එදා මේ රටේ හදිසි නීතිය පැනවිය යුතුව තිබුණු බව එතුමන්ලාටද පෙනී ගියා. එතුමන්ලා එවැනි අදහස් ප්‍රකාශ කළත් නොකළත් එදා ඒ අවස්ථාවේදී හදිසි නීතිය ක්‍රියාවේ යෙදවෙන බව කවුරුත් පාහේ හොඳාකාර දැන සිටියා. නමුත් ෆෙඩරල් පක්ෂයත් සමග එක්සත් ජාතික පක්ෂය ඇති කර ගෙන තිබුණු සම්බන්ධකම් වසාගැනීම සඳහා එසේ ප්‍රකාශ කළ බව අද අපට පෙනී යනවා. අද එක්සත් ජාතික පක්ෂය පිළිගන්නවාලු, හදිසි නීතිය ඉතා ඉක්මණින් අස් කළ යුතුය කියා.

ගරු සභාපතිතුමනි, පිටි ආදියෙහි මිල වැඩි වීමෙන් ගම්බද සාමාන්‍ය මහජනයාට මෙන්ම නගරබද මහජනයාටද තරමක් අපහසු තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වී තිබෙන බව අප පිළිගන්නවා. රටේ සංවර්ධන කටයුතුවලට මුදල් අවශ්‍ය නිසා ආණ්ඩුව මේ විධියේ තීරණයක් ගත් බව අප දන්නවා. මේ හදිසි නීති ඉවත් කර ගත්තොත් එක්සත් ජාතික පක්ෂයට් මාස කීපයක් තුළදී ආණ්ඩුවක් පිහිටුවා ගන්නට පුළුවන්වේය කියා ඒ අය කල්පනා කරනවා ඇති. හදිසි නීති ඉවත් කර ගන්න ලෙස එක්සත් ජාතික පක්ෂය කියන්නේ ඒ අදහස උඩය කියා මා සිතනවා. හදිසි තත්ත්වය හැමදාම පවත්වාගෙන කටයුතු කරන්නට මේ ආණ්ඩුවට වුවමනාවක් නැහැ. එක්සත් ජාතික පක්ෂය ගෙන යන ව්‍යාපාරවලින් මේ ආණ්ඩුව පෙරළන්න පුළුවන්ය කියා මා සිතන්නේ නැහැ. මේ අවස්ථාවේ හැටියට හදිසි තත්ත්වය ඉවත් කළොත් රටේ තරමක කරදර ඇති වන්නට පුළුවන්කම තිබෙන නිසා තව ටික දිනක්වත් මේ තත්ත්වය තිබුණොත් හොඳය කියා අපට පේනවා. අප එසේ කියන්නේ මේ රටේ ජනතාවගේ යහපත පිණිසයි. අපේ ආරක්ෂාව සඳහා යුධ හමුදාවේ සහ පොලීසියේ බලය යොදවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. ආර්. රත්නායක මයා.]

ගන්න අපට වුවමනාවක් නැහැ. මහජනයාට බියෙන් මේ ආණ්ඩුව රටට මුහුණ දෙන්නේ නැත කියා එක්සත් ජාතික පක්ෂයේ අය කල්පනා කරනවා. මාව නැල්ලේ සිට මා එන්නේ බස් රියෙනුයි. මා එන්නේ පොලිස් ආරක්ෂාව ඇතිව නොවෙයි. කෑම ටිකක් කන්නට වුවමනා වූ විට පිටකොටුවට යනවා. අපි සාමාන්‍ය ජනතාව සමග ආශ්‍රය කරනවා. ඒ නිසා හදිසි නීතිවලින් ආරක්ෂා වන්නට අපට වුවමනා නැහැ.

අ. භා. 7

අගමැතිනියගේ වැය ශීර්ෂය ගැන එක්සත් ජාතික පක්ෂයේ "සියරට" පත්‍රයේ විස්තරයක් කර තිබුණා මම දැක්කා. මට ඒ පත්‍රය ගෙනෙන්නට බැරි වුණා. නමුත් එහි අගමැතිනියට අපහාස වන අන්දමින් නොයෙක් දේ කියා තිබුණා. ඒ පත්‍රය කිය වූ විට මට කොසොල් රජ්ජුරුවන් දැකපු හීනයක් පිළිබඳව මතක් වුණා. පැරණි කථා මා විශ්වාශ නොකර තත් "සියරට" පත්‍රය දුටු විට ඒවායේ යම්කිසි සත්‍යයක් තිබෙන බවත් මට පෙනී ගියා. කොසොල් රජ්ජුරුවෝ අශ්වයෙක් ඉස්සරහෙනුත් පස්සෙනුත් කනවා හීනෙන් දුටුවාලු. ඒ හා සමාන කථාවකුයි "සියරට" පත්‍රයෙන් පෙන්නා තිබුණේ. අගමැතිනියගේ කාර් ගැන, මල්වත්ත ගැන, පඩි ගැන, විස්තරයක් එහි කර තිබුණා. නමුත් එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු කරන කාලයේදීත් ඒවා එසේම තිබුණා. ඒ කාලයේදී ඒවා ගැන කල්පනා කළේ නැහැ. ඒ කාලයේදී මහජනයා ගැන අනුකම්පාවක් තිබුණේ නැහැ. මහජනයාගේ මුදල් වියදම් වීම ගැන අනුකම්පාවක් තිබුණේ නැහැ. නමුත් එදා තිබුණු වැයම අද තිබෙන විට, එදා නොකී දේ අද කියනවා. එදා එකක්; අද එකක්. ඒ නිසයි, කොසොල් රජ්ජුරුවන් දුටු ඒ සිහිනය මට මතක් වුණේ. ඒ පිළිබඳව ගරු මුදල් ඇමතිතුමා අපට වඩා හොඳින් පිළිතුරු දේවි.

ගරු මන්ත්‍රීතුමෙක් ප්‍රශ්නයක් කළා, අගමැතිනියගේ පාර්ලිමේන්තු ලේකම් හැටියට මුදල් ඇමතිතුමා තවත් පඩියක් ගන්නවාද කියා. මේ ගැන මා එතුමාගෙන් ප්‍රශ්න කළ විට එතුමා අගමැතිනියගේ පාර්ලිමේන්තු ලේකම් හැටියට සතයක්වත් මෙතෙක් ගෙන නැති බව කිව්වා. එසේ මුදල් වෙන් කර තිබෙන්නේ අගමැතිනියට වෙනත් පාර්ලිමේන්තු ලේකම්වරයෙක් පත් කරන්නට වුවමනා වුණොත් ඒ වෙනුවෙන් ගෙවීම සඳහා යයිද එතුමා කිව්වා. ඒ ගැනද එතුමා විස්තරයක් කරාවි. එහෙත් මේ වාගේ ප්‍රශ්නවලින් මහජනතාව මුළා කරන්නට බැරි බව මම කියන්නට ඕනෑ.

ගරු මුදල් ඇමතිතුමාගෙනුත් ගරු අගමැතිනියගෙනුත් මම ඉල්ලා සිටිනවා, ඉතා ඉක්මනින් මේ හදිසි තත්ත්වය ඉවත් කරන්නටය කියා, මේ ආණ්ඩුව පෙරළීමට එක්සත් ජාතික පක්ෂයට පුළුවන්ද කියා බැලීම පිණිස. එදාට සාමාන්‍ය ජනතාව එක්සත් ජාතික පක්ෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරක්ෂා කර ගන්නවාට මට කිසිම සැකයක් නැහැ.

ටී. ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා.
(திரு. ரீ. குவெண்டின் பெர்ணாண்டோ)
(Mr. T. Quentin Fernando)

I rise to enter my emphatic protest against the continuation of the Emergency Regulations. Several hon. Members have already spoken about the Emergency Regulations. They wanted to know the reason why the Emergency Regulations are being continued. No reason has been given still. This is not the first time that hon. Members have asked this question from the Hon. Minister of Finance. He has decided to be silent on this question while the whole country is anxious to know the reason why they are being continued. The Government says that it has been returned by the popular vote of the people of this country. But I should like to know why the Government is now curtailing the freedom of speech of those people who voted them into power. Why is the Government not allowing the people of this country to express freely their views on the Budget?

It is true, as it was pointed out by the Hon. Leader and other Members of the Opposition, that the Emergency Regulations were introduced at a time when they were needed. That is absolutely true. We agreed to an emergency being imposed. We

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

supported the Government in the introduction of these emergency regulations at a time when there were disturbances in the Northern and Eastern Provinces. That was the reason given by the Government for the introduction of the Emergency. They feared that there would be disturbances. They feared there would be riots in the Northern and Eastern Provinces and not in the rest of the Island. Why is it then that the Emergency is imposed on other parts of the country as well? No reason has been given so far. I hope that the Hon. Minister of Finance, in his reply, will give us the reasons today once and for all so that the whole country will know why they are continuing these emergency regulations.

The people of this country are very anxious to express their opinions on the Budget proposals. They wish to say what they think about the Budget but they are afraid to speak out because they expect that just as much as the Federal Party members and others have been detained they would also suffer the same fate. Even hon. Members of Parliament, perhaps, may not wish to express their personal views because—and I might say it straightaway—they think the Government is, perhaps, waiting for an opportunity to take them into custody. Their position will be much worse because they will not be able to cater to the needs of the people when they themselves are behind iron bars. I would, therefore, ask the Government to consider carefully and reasonably, decide to discontinue the state of emergency and give the people who returned them to power the freedom to express their views.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

Much has been said in regard to the Votes of the Hon. Prime Minister and as much of it amounts to a repetition of arguments in relation to the Emergency, the Hon. Prime Minister's absence from this House and general questions of that sort, perhaps, you will forgive me, if I come to those things last of all and deal with a few pertinent questions relating to other matters which were raised by hon. Members, particularly by the hon. Second Member for Colombo Central (Mr. Keuneman).

He too raised some general questions about the Emergency but apart from that he went on to deal with certain other specific questions under this Head and I should like to deal with them first and foremost. Firstly, he talked about the question whether our Government was following the tradition of Sir John Kotelawala in placing restrictions on foreign travel. In particular he wondered whether we were seeking to create some sort of political control—he said he was not talking of exchange control—and he wanted to know why the prior permission of the Ministry of Defence and External Affairs was necessary before people can accept invitations to visit foreign countries on tickets paid for abroad. That had nothing to do with exchange control restrictions, nor was it a protest against any of the measures which I have imposed from the 12th of August, 1960 onwards.

First and foremost, I think that all hon. Members will agree that it is vitally necessary that individual organisations of people in foreign countries, whether having operation centres in this country or not, should not be permitted, particularly in the sphere of Government Service, to make their selections of persons for purposes of being favoured with opportunities for foreign travel and particularly where, within the framework of the Government Service by means of different techniques, a group of followers can be expressly created. I do not think any hon. Member of this House will disagree with me in regard to that question. In other words, it has been a rather well known idea to offer scholarships, for example, to persons for some sort of training usually for a short or limited duration, to give them the opportunity

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක]

perhaps to spread their wings abroad and to gain a little experience of foreign countries. But the very basis of this selection very often is something in the nature of a political reward. That is something which this Government would never encourage, and I should like to make it quite clear that that is the sort of thing which this Government would like to discourage. Indeed it would be true for me to say that all Government servants' scholarships are now channelled through the Ministry of Defence and External Affairs. Offers must be made to the Government if it is an offer made in that respect, intended as a way of foreign aid, in which case the Government will be responsible for the selection.

Might I say that the same principle generally has been followed—the application of the same principle—in regard to tickets made available from abroad. And that is why the hon. Second Member for Colombo Central (Mr. Keuneman) himself was fair enough to point out that there has been no case that he is aware of where a Member who has been offered a ticket of that nature has been refused permission to go abroad. But I think in principle it should be speedily channelled through the Ministry of Defence and External Affairs for the reason that a practice of that sort unless checked is capable of abuse.

කෙනමන් මයා.

(திரு. கெனமன்)

(Mr. Keuneman)

Why do you not separate that from scholarships ?

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක

(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)

(The Hon. F. R. Dias Bandaranaike)

Might I put it this way. It is rather difficult to draw that distinction because very often these things can easily take a different shape and form according to the way one chooses to put these things. Is it not much better to exercise a degree of control that any Government must exercise, but without causing hardships and without using any discrimination about it, or without seeking for a single moment to stop a bona fide traveller who is offered a ticket in those circumstances ? And indeed I think the hon. Second Member for Colombo Central has drawn attention to the fact that there has been no abuse whatsoever, and all that he sounded was a note of warning and perhaps a note of curiosity to find out what was the strange motive behind the action of the Government.

කෙනමන් මයා.

(திரு. கெனமன்)

(Mr. Keuneman)

Is it not possible to give a decision in one or two days ?

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක

(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)

(The Hon. F. R. Dias Bandaranaike)

We will certainly try to get it as fast as we can, but if the wheels of the Government machinery require oiling and lubrication, I trust you will allow us the time to do that.

In regard to the visa tax the hon. Second Member for Colombo Central made a point that regulations are not made and that they will have to be made. I said then on the Floor of this House when dealing with that tax, that the regulations will be hurried up as soon as possible to avoid and mitigate any problems.

පොලීසියට විරුඬව කරන පැමිණිලි ගැන විභාග කරන්නේ මෙන්න මෙහෙමයි. අසවල් පොලිස් කාරයා අසවලාට ගැහුවාය, අඬන්තේවිටම් කළාය, කියා පැමිණිල්ලක් ඉදිරිපත් කළ විට ඒ ගැන විභාග කරන්නේ ඒ පොලිස්කාරයා සහ පැමිණිලිකාරයා ඉදිරිපිට නොවෙයි. පැමිණිලි කාරයාගෙන් කට උත්තර අරගෙන ඔහුට ගෙදර යන්න කියන්වා. ඊට පසු විත්තිකාරයා වන පොලිස්කාරයාගෙන් කට උත්තර අරගෙන අර පැමිණිලිකාරයාට ලියා යවනවා, පැමිණිල්ල ගැන විභාග කළාය, මීට වඩා දුරට ඒ කරුණ ගෙන යන්න ඕනෑ නැත, කියා. සාමාන්‍ය කාලයේදී පොලීසියට විරුඬව යම් කිසි චෝදනාවක් ඉදිරිපත් කළ විට විභාග කරන්නේ මෙසේ නම්, හදිසි තත්ත්වය තියෙන කාලයේ යුද්ධ හමුදාව විසින් කරන ලද වැරදි ගැන චෝදනා කළාම මොන විධියේ පරීක්ෂණ ඇති වෙනවාද කියා අපට සිතාගන්න පුළුවනි. තමුන්නාන්සේගේ සාක්ෂිකාරයන් සමග අසවල් දින අසවල් ස්ථානයට එන්නය, තමුන්නාන්සේ කියන හැටියට විත්තිකාරයන් මේ අයය, කියා පැමිණිලිකාරයන්ට දන්වා යවා ඒ දෙපක්ෂයම ඉදිරිපිට විභාගයක් පැවැත්තුවාද යන ප්‍රශ්නය මම නැවත නැවතත් අහනවා. උත්තරයක් දෙන්නේ නැහැ. මම මේ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් උත්තරයක් බලා පොරොත්තු වන්නේ නැහැ. සටහනක් තිබෙන්න ඕනෑ නිසයි, මහජනයා වෙනුවෙන් විරුඬත්වය ප්‍රකාශ කිරීමක් වශයෙනුයි, මම මේ ප්‍රශ්නය අහන්නේ. මහජනයාට මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති පෙන්වීමයි මගේ අදහස. මේ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන්වත් අනෙක් ඇමතිවරුන්ගෙන්වත් පිළිතුරක් මම බලාපොරොත්තු වුනෙත් නැහැ; බලාපොරොත්තු වන්නේත් නැහැ. අපට පැහැදිලි වන්නේ දක්ෂකමක් නැති නිසාවත්, නොදන්නකම නිසාවත්, පැහැදිලි පිළිතුරක් නොදෙන බව නොවෙයි; තමාගේ දක්ෂකම පාවිච්චි කර රටේ ජනතාව මුළා කරන්ට, මේ පාර්ලිමේන්තුව මුළා කරන්ට, ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා උත්සාහ කරන බවයි.

මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. සතුටු නම්, මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න. තමුන්නාන්සේගෙන් මම උත්තර බලාපොරොත්තු වන්නේ නැහැ; රටේ ජනතාවට දැන ගන්ටයි මේ කියන්නේ.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

I wonder whether the hon. Parliamentary Secretary to the Minister of Defence and External Affairs has any notion of what plans the late Hon. Prime Minister Mr. S. W. R. D. Bandaranaike had for the Army, the Navy and the Air Force. He had plans to expand the three Services not in a small way but in a large way. He wanted to increase the strength of the three forces by over 100 per cent. He wanted to do this gradually from year to year.

However we find in the Estimates before us that no notice whatever has been taken of any possible plans for expansion. The sanctioned strength of the three Forces in the coming year will be 9,287, which is an increase of only 4. You will thus see that the idea of expanding the three Services has been forgotten. Or is it that the S. W. R. D. Bandaranaike plan has been given up?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Furthermore it is evident that even the sanctioned strength is not completely filled. There are even now a few hundred vacancies in the sanctioned strength and I think I read in one of the newspapers that in the coming 12 months it was not proposed to recruit any new hands to the Army, Navy and the Air Force. We hope at least that the sanctioned strength would be fully filled. But if the Government does not propose even to do that, I think it may be said that this Government has completely forgotten the plan that the late Mr. Bandaranaike had for the Services.

I would like therefore to repeat the question that has been asked by other hon. Members, namely, what is the aim of the Government in regard to the three Forces?

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

I have answered that.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

I would like to have the official reply.

There is one other matter on which I wish to make a few comments and that is on the question of the treatment that has been accorded to Admiral Royce de Mel. As I was privileged to be the Prime Minister of this country for a brief period I think it is my duty to state that Admiral Royce de Mel was not found wanting in anything. He was throughout an officer of the highest merit and distinction. Therefore it is sad that this Government chose to disgrace him.

I feel very sorry about the matter and I am sure that most hon. Members share in that feeling of sorrow over the despicable treatment that was accorded to Admiral Royce de Mel.

අ. භා. 5.30

To begin with, when he was visiting another country he was called back in a rather peremptory manner and in such a way as to create suspicion against him. He was a sick man at that time. When he came back to Ceylon, instead of treating him in the normal way, there was a sword hanging over him for a number of months. It became apparent that the Government was playing for time because the period of office of Admiral Royce de Mel was slowly coming to an end and the Government waited for that period to terminate. Thereupon the Government gave him notice that his services would no longer be required. Thus the case against Admiral Royce de Mel was decided beforehand by the Government. I do not think any worse treatment could have been given to that officer. We had no objection to anybody, however high he may be in the Army Navy or the Air Force, being punished in the severest fashion if he were found guilty. But in the case of Admiral Royce de Mel it is apparent to everybody, except to the blind, that he had been treated in a mean and diabolical manner. I say at least the hon. Parliamentary Secretary to the Minister of Defence and External Affairs owes this House and the country an explanation as to why an officer of such merit and distinction was treated in such a diabolical manner.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)

Mr. Chairman, pertaining to this Vote I must say that there are a few things arising from our point of view also. I must say that I have violently disagreed with the previous speaker the hon. Member for Galle (Mr. W. Dahanayake) on the schools issue, and I think he should remember that for some time.

About the Army, Navy and Air Force, might I say that it is our duty and the duty of the Government to inform the rank and file of the Army, especially those who come from poor homes, to inform them fairly clearly, that their duty is not to shoot down

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා]

poor people at any time. At times members of the Armed Services, and the Police, too, act in a manner not worthy of human beings. Therefore, I say instruction classes should be held and the Army personnel, not only the rank and file but even officers —because sometimes these high officers come from different types of homes—should be taught how they should behave in given circumstances. All of them must be taught that it is inhuman to shoot poor workers, peasants and the average man in the street. I hope this lesson will be conveyed by my good and old Friend, the Hon. Minister of Finance, to the Army.

යූ. බී. වීරසේකර මයා.
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

Mr. Chairman, I do not wish to reply to the comments made by other hon. Members, but I was particularly struck by the dim picture painted by my good Friend the hon. Member for Bulathsinhala (Mr. Edmund Samarakkody). He painted a very gloomy picture of our Army as an imperialist army. That was the first premise of his argument. Secondly, he said that this Army was waging a mighty war in Jaffna against a foreign horde. Thirdly, he stated that to wage this war we have increased our Vote on ammunitions and stores by some odd million rupees. That was the whole burden of his argument.

I have always found that the hon. Member for Bulathsinhala cannot talk of the Police or the Army without mentioning the situation in Jaffna. He always attempts to show the people of this country that this Army of ours is being used to put down the masses of Jaffna. I think this argument has been made and replied to oft enough, but let us assure him again that we do not treat the people of Jaffna as people from a foreign country. If we had used the Army to maintain a certain amount of order and discipline in that part of the country it would be the same type of action that would be taken in a similar situation even in this part of the country.

The hon. Member for Bulathsinhala next quoted some figures from the Estimates under Vote 2, and he drew attention to the vote on arms, ammunitions and stores. There were two fallacies in his argument. In the first place he compared the figures of only 1959-60 with the figures of 1961-62 and very deliberately, the shrewd lawyer that he is—

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

I rise to a point of Order. He is—

යූ. බී. වීරසේකර මයා.
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

I am not imputing any motives.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

The hon. Member said that I am deliberately——

යූ. බී. වීරසේකර මයා.
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

No, no. I said, shrewd—as shrewd as a lawyer. Now, you will notice, Sir, that the expenditure for 1959-60 on arms, ammunition and stores is Rs. 2,615,995. The estimate for 1960-61 shot up to Rs. 5 million. In 1961-62—in the year of this great war against Jaffna—the vote has significantly come down to a figure of Rs. 3,242,000. So you will see that he has,—I would say shrewdly again—picked out this vote on ammunition to bolster up his argument about this war against Jaffna——

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

On a point of explanation, I did so deliberately because the figure under 1960-61 is an estimate and not the actual amount spent. We have the actual expenditure in 1959-60.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

Both are shrewd lawyers.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

Interrupted by another shrewd lawyer.

යූ. බී. වීරසේකර මයා.
(திரு. யூ. பி. வீரசேக்கர)
(Mr. U. B. Weerasekara)

Then, on that same argument the figure for 1961-62 is also an estimate. It may be that we might spend less. Certainly we cannot spend more than Rs. 3 million on the same argument.

I think there is nothing serious about the slight increase of a sum of Rs. 1 million between the figures for 1959-60 and 1961-62. Therefore, even if we spend on ammunitions, are there not occasions when replacements are necessary? We do not speak only of arms and ammunitions, we speak also of stores. It is very sad that the hon. Member for Bulathsinhala should have painted such a black picture on that increase in expenditure.

ජයසේන මයා.
(திரு. ஜயசேன)
(Mr. Jayasena)

ගරු සභාපතිතුමනි, යුද්ධ හමුදාව හා නාවුක හමුදාව පිළිබඳව තම අදහස් පළ කරමින් බුලත්සිංහල ගරු මන්ත්‍රීවරයා (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) කියා සිටියේ මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ඉදිරි ගමන වැළැක්වීමේ අදහසින් අප ආණ්ඩුව හමුදා තර කරගෙන යනවාය කියායි. යුද්ධ හමුදාවක් නොමැති රටක් ලෝකයේ කොතැනකවත් තිබෙනවාය කියා මා කල්පනා කරන්නේ නැහැ. යමෙක් යම්කිසි රටකට යුද්ධ හමුදාවක් අවශ්‍ය නැතැයි කියා හිතනවා නම්, එවැනි රටකට ආණ්ඩුවකුත් අවශ්‍ය නැතෙයි කියායි මම කල්පනා කරන්නේ. එවැනි අවස්ථාවකදී තම තමන්ගේ සිතැඟි පරිදි මහජනයාට ජීවත් වන්නට ඉඩ හරිනවා මිස මහජනයා එකතු වී ආණ්ඩුවක් සකස් කර ගන්ට වුවමනා වන්නේ නැහැ. රටක යුද්ධ හමුදාව, නාවුක හමුදාව සහ පොලීස් හමුදාව යන හමුදා 3 පවත්වාගෙන යනු ලබන්නේ රටේ මහජනතාවගේ විප්ලවයක් හෝ නැගී එන මහජන මතයක් හෝ යටපත් කර දැමීමට හෝ නොවේ. සාමාන්‍යයෙන් අපේ රට වැනි කුඩා රටවල මෙම හමුදා පවත්වාගෙන යනු ලබන්නේ රටේ සාමය පවත්වාගෙන යාමටයි.

අප රට වැනි කුඩා රටවල් අභ්‍යන්තරික සාමය රැක ගැනීමේ චේතනාවෙන් මෙම හමුදා පවත්වාගෙන යන අතර අපට වඩා බලවත් රටවල් තමන්ගේ ශක්තිය අනුව තම තමන්ගේ යුද්ධ හමුදා සකස් කර ගන්නට විධිවිධාන යොදනවා. යුද්ධ හමුදාවේ සහ අනෙක් හමුදාවලද සිටින භට පිරිස් වැඩි කරමින් හමුදා තර කර ගෙන විශේෂයෙන් උතුර සහ නැගෙනහිර යන පෙදෙස්වල වාසය කරන සහෝදර ජනතාවට හිරිහැර කිරීමේ චේතනාවෙන් වැඩ කටයුතු කරනවා යයි බුලත්සිංහල ගරු මන්ත්‍රීවරයා අපට චෝදනා කරන අතර, ගාල්ලේ ගරු මන්ත්‍රීවරයා (ඩබ්ලිව්. දහනායක මයා.) යුද්ධ හමුදාවේ තිබෙන් නාවූ ඇබෑර්තු පවා පුරවන්නේ නැති බවත්, යුද්ධ හමුදාවට වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය පවා වියදම් නොකර දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ ප්‍රතිපත්තිවලට පවා පහර ගසමින් ක්‍රියා කරනවාය කියන අපහ්‍රංශ කථාව මට නම් තේරෙන්නෙ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

ඒක එල්. පී. පී. එකේ අදහස.

ජයසේන මයා.
(திரு. ஜயசேன)
(Mr. Jayasena)

මොන පී. එක වුණත් අපට මේ අපහ්‍රංශ කථා තේරෙන්නේ නැහැ. ඒ නිසා මේ අදහස් දෙකම පිළිගන්නෙ නැති එකයි මගේ කල්පනාවෙ හැටියට කිය යුතුව තිබෙන්නේ. සමහර ප්‍රශ්නවලට දෙනු ලබන උත්තරවලට ලකුණු දෙන්නට බැරිය කියා සමහර ගරු මන්ත්‍රීන් කියනවා; නමුත් මෙවැනි කිසිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසේන මයා.]

තේරුමක් නැති වැදගැම්මකට නැති කථාවලට උත්තර දෙන්නට පුළුවන්ය කියා මා හිතන්නේ නැහැ.

උතුර සහ නැගෙනහිර යන පළාත්වල පටන් ගත් කැරැල්ලක් වැනි ව්‍යාපාරයක් මැඩපවත්වන්නට යුද්ධ හමුදාව යැවූ අවස්ථාවකදී ශීල ව්‍යාපාරයක් හසුරුවන්නට යැවූ අය මෙන් කරුණා මෛත්‍රියෙන් යුක්තව කටයුතු කිරීමක් ඇති වන්නේ නැහැ. කැරැල්ලක් මැඩ පවත්වන්නට ගිය අවස්ථාවකදී, ඒ පළාත්වල ජනතාව නොයෙක් විධියේ අවි ආයුධ රැගෙන පිළිස්සීම් ආදි කඩාකප්පල්කාරී වැඩවල යෙදෙන අවස්ථාවකදී එපමණක් නොව සමහර අවස්ථාවලදී යුද්ධ හමුදා භටයන්ගේ ජීවිත හානි වන තැනට පවා කටයුතු කරද්දී, ඒ අයට අත් පා පසෙක තබාගෙන සිල් ගත්තවුන් මෙන් ක්‍රියා කරන්නට පුළුවන් කමක් නැහැ. ඒ නිසා විරුද්ධ පාර්ශ්වයේ සමහර ගරු මන්ත්‍රීන් යුද්ධ හමුදාව වෙත එල්ල කළ චෝදනා සත්‍ය යයි අපට පිළිගන්නට බැහැ. මෙම ගරු මන්ත්‍රීන් කියන අන්දමේ දරුණු අන්දමට යුද්ධ හමුදාව හැසුරුණාය කියා ඒ පෙදෙස්වල ජනතාව වත් කියනවායයි අපි විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා විරුද්ධ පාර්ශ්වයේ සමහර මන්ත්‍රීවරුන් මේ අන්දමට කැක්කුමකින් යුක්තව කථා කිරීම ගැන මා පුදුමයට පත් වෙනවා.

සෑම රටකටම යුද්ධ හමුදාවක් අවශ්‍යයි. ඒ නිසා අප රට වැනි කුඩා රටවල පවත්වාගෙන යනු ලබන හමුදාවන් යොදවන්නේ අභ්‍යන්තරික සාමය ආරක්ෂා කිරීමටත් කැරැල්ලක් ඇති වූ විට එය මැඩ පැවැත්වීමටත් විනා, රටේ සාමාන්‍ය ජනතාවගේ අදහස් උදහස්වලට විරුද්ධව කටයුතු කිරීමට හෝ ඔවුන්ගේ දියුණුව සඳහා ගෙන යනු ලබන්නාවූ ව්‍යාපාර කඩාකප්පල් කිරීමට හෝ නොවෙයි. රටේ මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ගෙන යනු ලබන්නාවූ ව්‍යාපාර කඩාකප්පල් කිරීමට තැත් කරන්නාවූ සංවිධානවලට එම කාර්යයන් කිරීමට ඉඩ නොදීම සඳහායි යුද්ධ හමුදා පාවිච්චි කරන්නේ.

අ.භා. 5.45

කවරෙක් රට ආණ්ඩු කළත් තත්ත්වය මීය ආකාර වෙනවා. ගරු සභාපතිතුමනි, යුද හමුදාවේ සිටින උසස් නිලධාරීන් සම්බන්ධයෙන් මෙම පාර්ලිමේන්තු ලේකම් තුමාගේ අවධානය යොමු කරවන්නට මා කැමතියි. යුද හමුදාවේ තරමට වඩා එහි උසස් නිලධාරීන් සිටිනවා. උන්නැහේලා දරන තත්ත්වයට වැඩියි, උන්නැහේලාට ලැබෙන වේතනය. එසේම ගුවන් හමුදාවේද තරමට නොවෙයි එහි ප්‍රධාන නිලධාරීන්ගේ පඩිය. මෙවැනි අය "මෙඩ්ල්" සිය ගණන් තම පපුවල ගසාගෙන ඇමෙරිකාවේ නැති නම් රුසියාවේ යුද්ධ නායකයන්ටත් වඩා ආඩම්බර ලීලාවෙන්, මහේශාක්‍ය අන්දමින් යන හැටි මා දැක තිබෙනවා. එතරම් බර පතළ, එතරම් ඔරොත්තු නොදෙන, නිලධාරීන් අපේ හමුදාවට අවශ්‍ය වන්නේ නැහැ. ගුවන් හමුදාව දෙස බැලුවොත් එහි සේවය කරන එවැනි නිලධාරීන්ගේ තත්ත්වය කොහොමද කියන එක පාර්ලිමේන්තු ලේකම් තුමාට කල්පනා වෙනවා ඇති. අපේ රටට ගෝචර වන අන්දමට, අපේ රටට ඔරොත්තු දෙන අන්දමට, අප අපේ නිලධාරීන් සකස් කර ගත යුතුයි. ප්‍රබල යුද්ධ නායකයන් සිටින රාජ්‍යයන් සමඟ නිතර ගැටුම් ඇති කරගන්න අධි රාජ්‍යයන්හී යුද හමුදාවල සේවය කරන නිලධාරීන්ට ගෙවන තත්ත්වයේ පඩිනඩි ගෙවන්න අපට පුළුවන්කමක් නැහැ. එම නිසා අපේ රටේ තරමට මේ අයගේ පඩි ක්‍රමද සකස් කරනවා නම් එය අපේ රටේ ඉදිරි ගමනට ලොකු උපකාරයක් වෙනවා ඇති. ඒ ගැන පාර්ලිමේන්තු ලේකම්තුමාගේ කල්පනාව යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

යථොක්ත ප්‍රශ්නය වෙනුවෙන් මා මීට වඩා තර්ක කරන්නට අදහස් කරන්නේ නැහැ. නමුත් අවසාන වශයෙන් තව එකක් කියන්න කැමතියි. බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා අසන ප්‍රශ්නවලිනුත් අනිකුත් අය අසන ප්‍රශ්නවලිනුත් අන්තිමට චෝදනා එල්ල වන්නේ ආණ්ඩුවටයි. ඒ කියන්නේ චෝදනාව එහෙම නැති නම් නරක හරිය පැවරෙන්නේ ආණ්ඩුවටයි. නරක කොටස රජයට පවරනවා මිස ප්‍රශ්න විසඳන්නේ කොහොමද කියන එක විසඳා දෙන්නේ නැහැ. ඒ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන්ගේ කල්පනාව යොමු කරවමින් මගේ වචන සවල්පය අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ටී. විලියම් ප්‍රනාන්දු මයා. (නුවරඑළිය)
(திரு. ரி. வில்லியம் பெர்ணாண்டோ—நுவரெலியா)
(Mr. T. William Fernando—Nuwara Eliya)

ගරු සභාපතිතුමනි, යුද හමුදාව සම්බන්ධ වැය ශීර්ෂය ගැන කථා කරන අවසථාවේදී වචන සවලපයක් ප්‍රකාශ කිරීමට අදහසක් ඇති වුණා. අපේ ලංකාවේ ජාතික යුද හමුදාවක් තිබෙන්න ඕනෑ. එවැනි යුද හමුදාවක් නිතරම රජයේ සංවර්ධනයට උපකාර වනු පිණිස යොමු කරවනවා නම් අප ඒ අංශය වෙනුවෙන් වැය කරන විශාල මුදල අපේ රටේ සංවර්ධනය සඳහාම යොදවන එකක් හැටියට සලකන්න පුළුවනි. එම නිසා ජාතයාලය ඇතිව ඒ අන්දමට ඔවුන්ගෙන් වැඩ කොටසක් ඉටු කරවා ගන්නවා නම්, එය අපේ රට සවයං පෝෂිත කරගැනීමට මහෝපකාරී වනවා ඇති.

අපට නිතර නිතර යුද වැදෙන්නට සිදු වන්නේ නැහැ. මෙතෙක් වැඩි වශයෙන් යුද හමුදාව මෙහෙයවන්නට අපට සිදු වී තිබෙන්නේ අපේ රටේ ඉඳහිට ඇති වන සුළු සුළු වාද භේදවලදී සාමය ආරක්ෂා කර ගැනීම සඳහායි. අපේ රටට නිතර නිතර කල්ලතෝනීන් පැමිණෙන බව අප දන්නවා. ඔවුන්ගේ පැමිණීම වළක්වාලීම සඳහා වෙරළ දිගට යුද හමුදාව යොදවනවා නම් එය ජාතික සේවාවක් විය හැකි බව මේ අවසථාවේදී මතක් කරන්න කැමතියි. ඒ හේතුවෙන් රටේ ආරක්ෂාවද සැලසෙන බව කියන්න ඕනෑ. කුඩාරම්වලට වී අර්ථයක් නැතිව සිටින්ට ඔවුන්ට ඉඩ නොදී නියම ආකාරයට ඔවුන්ගෙන් ජාතික සේවයක් ඉටු කරගැනීම සඳහා අවධානය යොමු කරන ලෙස මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, අද සේවයෙහි යෙදෙන සෙබළුන් දෙස බලන විට මට පෙනී යන තත්ත්වය මේකයි. ඔවුන් සැරසී සිටින්නේ ඉතා කනගාටුදායක අන්දමේ ඇඳුමකින්. ඔවුන්ගේ ඇඳුම දෙස බලන විට අපට පෙනී යනවා තම පවුල්වල බාලම සහෝදරයන්ගේ කලිසම් වැරදීමකින් ඇඳගෙන සිටින්නාක් මෙන්. ඒ අය දෙස බලන විට අපට පෙනෙන්නේ නිකම්ම "හුලං බයියලා" වගෙයි. කලිසමේ තදබදය බොහොම වැඩියි. එපමණක් නොවෙයි, ඇඳගෙන සිටින කමිස දෙස බලන විට පෙනෙන්නේ පිටි කොට්ට උර හිර කරගත්තා වගෙයි. ඒවා ඇඳගෙන දෙඅත් දිගු කරගන්න බැහැ. ඒ අයගේ ඇඳුම් අරූප විධියේ එකක් බව මට පෙනෙනවා. වුවමනාවෙන්ම අපේ තරුණයන්ගේ කාය ශක්තිය අඩු කරන විධියේ ඇඳුමක් ලෙසයි මෙය පෙනෙන්නේ. අධිරාජ්‍යවාදීන්ගේ යම් යම් සැලැස්මවල් උඩ එසේ කෙරුණත්, නිදහස ලබා සිටින ජාතියක් වශයෙන් අප දැන් හැඩ ගැසෙන්නට ඕනෑ. අපට ආවේණික වූ සැලැස්මක් අනුව යුද හමුදාවේ ඇඳුමත් සකස් කර දීම හොඳ බව මතක් කරන්න කැමතියි. ඒ නිසා ශරීරය අනවශ්‍ය ලෙස වෙහෙසට පත් කරන්නාවූත්, දහඩියෙන් තම්බා ඔහොයෙක් විධියේ වෙනත් ආබාධවලට හොඳුරු කරන්නාවූත් ඇඳුම් නොදී ඒ වෙනුවට අපේ රටේ පරිසරයටත්, අපේ රටේ ජීවත්වන ජනයාගේ ශරීරයට ඔබින අන්දමටත් ඇඳුම් සකස් කර දෙන්නට වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයි. එසේ නොකර සේවයේ යෙදෙන සියලු දෙනාටම එකම මිම්මක් අනුව ඇඳුම් සකස් කිරීමට එක් කොන්ත්‍රාත්කරුවකුට භාර දීම සුදුසු නැහැ. තමන්ගේ ශරීරයට ගැලපෙන ආකාරයේ ඇඳුම් සකස් කර බෙදා දුන්නොත් ඒවා ඇඟ ලාගෙන යාම් ඊම් කරන විට සෙබළුන්ට අපහසුවක් ඇති වන්නේ නැහැ. වැරදි මිනුම් අනුව පිළියෙළ කරනු ලබන ඇඳුම් දීම නිසා ඇතැම් සෙබළුන්ට පය ඔසවා පය තබන්නට බැරි වෙනවා. එසේම බලවත් අමාරුවකින් පැත්තෙන් පැත්තට ගමන් කරන්නට සිදුවන විධියට සැලැස්වීම සුදුසු නැහැ. අපේ සොල්දාදුවන් හුළං බයියලා වගේ ගමන් කරවන්නේ නැතුව නියමවිධියේ ජාතික හමුදාවක් විධියට හෙළ හමුදාවක් ලෙස, සිංහලයාගේ විරෝදාර තේජස් බල වික්‍රමය කැපී පෙනෙන අන්දමින් ගමන් කරන්නට වුවමනා කරන නිදහස ඒ අයට ලබාදිය යුතුයි.

අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව යුද්ධ හමුදාවට ග්‍රේෂන් යෝජනා අනුව සහනයක් ලබාදී තිබෙන බව මට දැන ගන්නට ලැබුණා. ඒ බව මා ප්‍රීතියෙන් ප්‍රකාශ කරනවා. ඒ අයට දැනටමත් එවැනි සහනයක් ලබාදී තිබෙන බව අප විසින් කල්පනා කළ යුතුව තිබෙනවා. ඒ අතරම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. විලියම් ප්‍රනාන්දු මයා.]

යුද්ධ හමුදාවෙහි නියුක්ත වූවන්ගේ ඇඳුම් සම්බන්ධයෙන් තව දුරටත් කල්පනා කර බලා සුදුසු සැලැස්මක් අනුව ජාතික ක්‍රම යකට ඒ ඇඳුම් සකස් කරන්නට ඕනෑ. ජාතික ඇඳුමක් ඒ අයට වුවමනාය කියා මා කියන්නේ නැහැ. සෙබලෙකුට පහසු වෙන් ගමන් කරන්නට පුළුවන් අන්දමට ශ්‍රී ලංකාද්වීපයේ පරිසරයට ගැලපෙන අන්දමට ඇඳුම සකස් කර දෙන්නට ඕනෑ. ඒ අනුව පළඳනා සම්බන්ධයෙනුත් ක්‍රියා කරන්නට ඕනෑ. එසේ නැතිව කවු රුවත් දුන් දෙබල් අමුඩයම ගසාගෙන එන්න වුවමනාවක් නැහැ.

සුළු සේවකයන්ගේ දුක් ගැනවිලි සම්බන්ධයෙන් ඊළඟට කිව යුතුව තිබෙනවා. සුළු සේවකයන්ගේ දුක්ගැනවිලි දැන් පවත්නා ක්‍රමයේ හැටියට උසස් නිලධාරීන්ගේ මාර්ගයෙනුයි ඉදිරිපත් කරන්නට සිදු වී තිබෙන්නේ. එය සතුටුදායක මදි. ඒ නිසා තමන්ගේ දුක්ගැනවිලි කෙළින්ම අමාත්‍යාංශයට ඉදිරිපත් කරන්නට ඔවුන්ට නිදහසක් දෙන්නට ඕනෑ. එසේ නැතිව හැමදාම මේ විධියට ඔවුන් බැඳ තැබීම නිදහස් රටකට සුදුසු නොවන බව කියන්න කැමතියි. පොලීසිය හෝ වේවා, යුද්ධ හමුදාව හෝ වේවා, නාවික හමුදාව හෝ වේවා, අහස් හමුදාව හෝ වේවා, ඔය කොයි අංශයක වුවත් සේවය කරන අයගේ දුක්ගැනවිලි නියම අන්දමට රාජ්‍ය පාලනයේ යෙදී සිටින ප්‍රධානයන් වෙත පැමිණ කෙළින්ම ඉදිරිපත් කරන්නට තරම් නිදහසක් තිබෙන්නට ඕනෑ. එසේ නැතිව තැනින් තැන දුවන්න ඉඩ සැලැස් සුවොත් හොඳ නැහැ. ඒ අය ජීවත් වන්නේ කණස්සල්ලෙන්, වේදනාවෙන් සහ පසු තැවිල්ලෙන්. තමන්ගේ නියම අයිතිවාසි කම් සම්බන්ධයෙන් සහනයක් ලබාගැනීමට සෑම කම්කරුවකුටම නිදහසක් තිබෙන්නාක් මෙන්ම මේ හමුදාවල ඉන්නා අයටත් ඒ නිදහස තිබිය යුතුයි. ඊට අවහිර කිරීම සුදුසුයයි මා හිතන්නේ නැහැ. එය අප විසින් අපටම කරගන්නා අපකීර්තියක්. ඒ නිසා ඒ අයට නියම සහනයක් දෙන්නට ඕනෑ.

දැන් පාඨශාලාවලින් පිට වන තරුණයන්ට නියම අධ්‍යාපනයක් ලැබෙනවා. ඒ අධ්‍යාපනය ලැබී රටට සේවය කළ හැකි පිරිසක් ඉදිරියට එන තුරු, ඒ අයට රක්ෂා ලැබෙන තුරු, ජාතික සංවර්ධන හමුදාවක් මිළඟට ආරම්භ කළ යුතුයි. ජාතික සේවා වන් සඳහා ඔවුන් උපයෝගි කර ගන්නා අතර යුද හමුදාවක් වශයෙන්ම නොව රටේත් සමාජයේත් සාමය ආරක්ෂා කර ගන්නට සහ සංවර්ධන වැඩට යොදාගත හැකි ආකාරයට එය පිළියෙළ විය යුතුයි. ගංවතුර ගැලීම වැනි අකරතැබ්බයකට පත්වන අවස්ථාවක් ඇති වුණොත්, ගින්නක් ඇති වුණොත්, වෙනත් ආපදාවක් ඇති වුණොත්, කෙළින්ම බැහැලා නියම විධියට වැඩ කරන්නට පුළුවන් වෙනවා ඇති. එවැනි ජාතික සංවර්ධන හමුදාවක් ගොඩනැංවීමට අවස්ථාව එළඹ තිබෙනවා. ඒ නිසා පාසැල්වලින් පිට වන තරුණයන් පේවිමන්ට්වල නැවතී පාරේ යන කාර්වල නොම්මර බලමින් ඔට්ටු අල්ලන්නටත්, කපටි ව්‍යාපාරිකයන්ගේ අතකොළු බවට පත් වන්නටත් ඉඩ හැරියොත් එයින් සමාජය දූෂණය වෙනවා. එම නිසා ජාතික සංවර්ධනය සඳහා එවැනි භට හමුදාවක් සකස් කිරීමට දැන් කාලය පැමිණ තිබෙනවා. ජාතික අභිමානයක් ඇති, පෙරමුණ ගන්නා තරුණ පරපුර සංවිධානය කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

නොයෙක් සංවර්ධන කටයුතු කිරීමට අපට සිදු වී තිබෙනවා. එම නිසා ජාතික සංවර්ධනයේ ඒ ඒ කොටස් දැනට පවතින යුද්ධ හමුදාවට භාර දෙන්නට පුළුවනි. පාලම් තැනීම, පාරවල් තැනීම, වාරිමාර්ග කටයුතු ආදී නොයෙකුත් වැඩ යුද්ධ හමුදාවට භාර දෙන්නට පුළුවනි. අත හුරු වීමට මෙන්ම, පාර දිගේ සක්මන් කරනවාට වඩා එවැනි වැඩ කිරීම නියම ශරීර සෞඛ්‍යයටත් හේතු වෙනවා. ඔවුන්ගෙන් එවැනි සේවයක් ලබා ගන්නට පුළුවනි. නොයෙක් ක්‍රමයෙන් සංවර්ධන වැඩ කටයුතු සඳහා ඔවුන් යොදවා ගන්නට පුළුවනි. අපේ සංවර්ධන සැලැස්මේ යම්කිසි කොටසක් ජාතික හමුදාව මඟින් ඉටු කරවා ගන්නට බැරි කමක් නැහැ. එම නිසා ඒ සඳහා වැඩ පිළිවෙළක් යොදන ලෙස ඉල්ලා සිටිනවා. අපේ සොල්දාදුවන් නිකම් "හුළං බයියලා" වගේ නැත්නම් පඹයන් වගේ හිටියාට වැඩක් නැහැ. අසරණයන්ගෙන් ලබාගන්නා ආදායම් බද්දෙන් නඩත්තු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන ඔවුන්ගෙන් ඊට සරිලන සේවයක් සලස්වා ගත යුතු බව මතක් කරමින් මගේ වචන සවල්පය අවසන් කරනවා.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

ගරු සභාපති තුමනි, මා නැවත වරක් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් බිංගිරියේ ගරු මන්ත්‍රී තුමා (එල්. බී. ජයසේන මයා.) විසින් කියන ලද දෙයක් ගැන. වචන කීපයක් කථා කරන්නට කැමතියි.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

බිංගිරියේ ගරු මන්ත්‍රී තුමාටත් කථා කරන්නට ඕනෑ වෙයි.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

තවමත් කථා කිරීමේ අයිතිය තිබෙනවා යයි මා විශ්වාස කරනවා. ගරු සභාපති තුමනි, බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමාත්, ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාත් යුද්ධ හමුදාව ගැන ප්‍රකාශ කළ අදහස් අතර පරස්පර විරෝධයක් ඇති බව කියමින් එය විශාල විහිළුවක් වශයෙන් පෙන්වීමට බිංගිරියේ ගරු මන්ත්‍රීතුමා උත්සාහ කළා. අප පක්ෂයේ අදහස් ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ (ඩබ්ලිව්. දහනායක මයා.) අදහස්වලට නොගැලපීම ගැන අප ආඩම්බර වෙනවා. ඇතැම් ප්‍රශ්න පිළිබඳව යම් යම් දේශ පාලන පක්ෂ අතරේ මතභේද තිබෙනවා. ඇතැම් ප්‍රශ්න ගැන වෙනස් වූ අන්දම කින් ආණ්ඩුව ගෙන යන ප්‍රතිපත්තියට පහර වැදීම ගැන පුදුම වන්නට කරුණක් නැහැ. ඒ පිළිබඳව ඉදිරිපත් කරන ලද අදහස් විනෝදයට කරුණක් හැටියට සැලකීමට හේතුවක් නැහැ. මගේ කථාවෙන් පසු ගරු පාර්ලිමේන්තු ලේකම් තුමා ඇත්තටම මේ ප්‍රශ්න ගැන පිළිතුරු දීමට ඉදිරිපත් වෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. යුද්ධ හමුදාවේ සෙබළුන් සම්බන්ධව, විශේෂයෙන් පහළ ශ්‍රේණිවල සිටින කොටස් සම්බන්ධව අපේ නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලද අදහස් ඉතාමත් වැද ගත්යයි අප සලකනවා. අප කථා කළේත් ඒ කරුණු උඩයි. ඒ කොටස්වල තත්ත්වය නඟා සිටුවීමට වැඩ පිළිවෙළක් යෙදිය යුතුයි. වස්ත්‍රාභරණවලින් පමණක් නොව වෙන වෙන අයුරිනුත් ඒ අයට මුහුණ පාන්නට සිදු වී තිබෙන අමාරුකම් ගැන සලකා බලා එම අමාරුකම් ඉවත් කිරීමට කටයුතු සැලසීම අවශ්‍යය කියා කල්පනා කරන අතර අපේ බිංගිරියේ ගරු මන්ත්‍රීතුමා භයානක දේශපාලන ප්‍රතිපත්තියක්, මතයක්, ඉදිරිපත් කළ බව සඳහන් කරන්නට ඕනෑ.

යුද්ධ හමුදාව තර කිරීම සම්බන්ධයෙන් මෙන්ම යම් කිසි සේවාවක යෙදී සිටින සේවකයන්ගේ තත්ත්වය නඟා සිටුවිය යුතු බව අප කවදත් ප්‍රකාශ කළා. හමුදාව තර කිරීමේ අදහස, මේ රටේ ජනතාවට විරුද්ධව හමුදාව පාවිච්චි කිරීමද කියන තර්කයයි, බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද්දේ. ඒ තර්කය ඉදිරිපත් කරන ගමන්ම මේ මෑතකදී, පසුගිය මාස කීපය තුළදී මේ රටේ උතුරු පළාතේ සේවයේ යෙදුණු සමහර හමුදා කොටස් නොහොඹිනා පිළිවෙළට, ක්‍රෑර තර පිළිවෙළට ක්‍රියා කළ බවට චෝදනා කීපයක් ඉදිරිපත් වූ බවත් ඒ මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන්නට යෙදුණා. ඒ සම්බන්ධයෙන් අපේ බිංගිරියේ මන්ත්‍රීතුමා (ජයසේන මයා.) යම් අදහසක් ප්‍රකාශ කළා. එය ඉතාමත් භයානක අදහසක් හැටියටයි, මා පිළිගන්නේ. මන්ද? යම් කැරැල්ලක් මැඩලීමට යුද්ධ හමුදා යන අවස්ථාවේදී ජනතාවට සිනිබෝල කවන ආකාරයට, එසේ නැතිනම් කිසිම විධියක අඩන්තේට්ටමක් නොකෙරෙන ආකාරයට හමුදාවට හැසිරෙන්නට බැරිය; සන්නාහ සන්නද්ධ හමුදාවක් යම් පළාතකට ගිය විට ඔය විධියේ දේවල් සිද්ධ වීම ගැන අප බලාපොරොත්තු විය යුතුය කියා ඒ මන්ත්‍රීතුමා කිව්වා. ගරු සභාපති තුමනි, විසිවන ශත වර්ෂයේ 61 වන අවුරුද්දේදී—මෙපමණ කාලයක් නිස්සේ වහල් රටක් වශයෙන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් යටතේත්, ඊට පෙර වෙනත් විදේශීය පාලකයින් යටතේත් දුක් විඳ නිදහස ලැබුණා යයි ආඩම්බර වෙමින් ඒ ගැන කතා කරන මේ යුගයේදී මේ විධියේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

ම්ලේච්ඡ කථාවක් ගරු මන්ත්‍රීවරයකු ගෙන් අසන්න ලැබීම ගැන මම ඉතාමත් කනගාටු වෙනවා.

අ. භා. 6

1815 අවුරුද්දේදී මේ රටේ සිටි දුප්පත් ගැමියන් එදා සිටි අධිරාජ්‍යවාදී පාලකයින්ට විරුද්ධව නැගී සිටි අවස්ථාවේදී—කැරැල්ලක් මැඩ පැවැත්වීමට හමුදාව යොදවා සිය ගණන් ගැමියන් හමුදාව විසින් මරා දමන අවස්ථාවේදී—බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලකයින්ට ඒ ගැන ලාංකිකයින් විරුද්ධත්වය පළ කළ අවස්ථාවේදී මොකක්ද ඔවුන්ගෙන් අපට අසන්නට ලැබුණේ? කැරැල්ලක් මැඩ පැවැත්වීමේ දී ගණනක් නැති නොවන ආකාරයට එය මැඩ පවත්වන්නට බැරිය, එය ඒ තරම් කාරණයක් නොවේය, කියායි ටොරිංටන් ආණ්ඩුකාරයාගෙන් එදා අසන්නට ලැබුණේ. 1915 දී මේ රටේ කැරැල්ලක් ඇති වුණා. ඒ අවස්ථාවේදී එය මැඩ පැවැත්වීම සඳහා පිටරටින් මැරැටින් ගෙන්වා මේ රටේ දුප්පත් ජනතාව මරා දමන අවස්ථාවේදී—ජාති හිතෛෂීන් හැටියට අද සලකනු ලබන වීරයන් ඉදිරිපත් වී ආණ්ඩුවට දොස් කී අවස්ථාවේදී—මොන වචනද, අධිරාජ්‍යවාදීන්ගෙන් එදා අසන්නට ලැබුණේ? කැරැල්ලක් මැඩ පැවැත්වීම සඳහා යුද්ධ හමුදාව පාවිච්චි කරන විට මේ විධියේ දේ බලාපොරොත්තු වෙන්නට ඕනෑ නොවේද? යන වචනයි. එදා දෙශප්‍රේමියකු වශයෙන් සලකනු ලැබූ දැනට සෙනෙට් සභාවේ සභිකයකු වශයෙන් සිටින අප පක්ෂයේ සාමාජික ඩොරික් ද සූසා මහතාගේ පියා වන, ආමන් ද සූසා මහතා විසින් එදා ඇති වූ කැරැල්ල සම්බන්ධයෙන්—දවස් සියයක දී ඇති වූ අපරාධ සම්බන්ධයෙන්—ලියන ලද පොත පිළිබඳව අපි තවමත් එතුමාට ගෞරව කරනවා. අධිරාජ්‍යවාදීන්ට විරුඬව කිසිත් පැමිණිල්ලක් කරන්නට භයින් සිටි ඒ අවස්ථාවේදී ජනතාව වෙනුවෙන් වයිට්හෝල් මන්දිරයට තම සපත්තුව ඇතුළේ ලියවිල්ලක් බහාගෙන ගිය ඊ. ඩබ්ලිව්. පෙරේරා මහතාටත් අපි අද ගෞරව කරනවා. එසේ ගෞරව කරන අතර එදා ඒ වෙඩි උණ්ඩවලට ලක් වී මරණයට පත් වූ පේද්‍රිස් මහත්මයා අතුළු ඒ පවුලේ උදවිය ගැනත්, වල්ගම්පාය මහත්මයා ඇතුළු ඒ පවුලේ උදවිය ගැනත්, අපි තවමත් අපේ කනගාටුව පළ කරනවා.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)
ඇයි සේනානායක?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

ඔව්, සේනානායක මහත්මයාත්. කවරෙකුගේ නමක්වත් අත් හරින්නට මගේ බලාපොරොත්තුවක් නැහැ. එදා ඒ වෙඩි උණ්ඩවලට ලක් වී මැරුම් කෑ උදවිය ගැනත්, යුද්ධ හමුදාවෙන් පහර කෑ උදවිය ගැනත්, හිර ගෙවල දුක් විඳින්නට සිදු වූ අය ගැනත් අපි තවමත් සඳහන් කරන්නේ එදා සිටි පාලකයින්ට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සඳහායි.

මේ 20 වන ශත වර්ෂයේ මැද භාගයේදී එවැනි අත්දැකීම් රාශියක් ඇති ගරු මන්ත්‍රීවරයෙක් නැඟිට, හමුදාවක් යවන විට කිසිවකුටත් තුවාලයක් නොවනාකාරයෙන් ඔවුන්ට හැසිරෙන්නට බැරිය කියා, යම් යම් නොහොබිනා සිද්ධීන් ගැන කරන චෝදනාවන්ට පිළිතුරු වශයෙන් කීම ගැන අපි අපේ බලවත් කනගාටුව ප්‍රකාශ කරනවා. බිංගිරියේ මන්ත්‍රීතුමා දැන් මෙහි නැති නිසා මීට වඩා ඒ මන්ත්‍රීතුමාට තදින් පහර ගැසීමට මම අදහස් කරන්නේ නැහැ. නමුත් මීට වඩා තද වචන පාවිච්චි කරන්නටයි, මම බලාපොරොත්තුව සිටියේ. මේ විධියට ලක් වැස්සන්ගේ නිදහස දිනා ගැනීමේ ඉතිහාසය පිළිබඳව අත්දැකීම් ලබා සිටින—විශෙෂයෙන්ම දුප්පත් ගැමි ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නේ යයි කියන—මේ මන්ත්‍රීවරුන් 1958 අවුරුද්දේ හදිසි නීති යටතේ හමුදාව හැසුරුණේ කොයි විධියට ද යන්න ගැනත් අමතක නොකළ යුතුයි. ඒ අවස්ථාවේදී හමුදාව පහර දුන්නේ යාපනේ අයට නොවෙයි; මේ අය ඉතා ආඩම්බරයෙන් නියෝජනය කරන්නේ යයි කියන සිංහල ජනතාවටයි. තුවාලයක් නොකර සීනි බෝල කවන ජනකායක් විධියට හැසිරෙන්ට යුද්ධ හමුදාවක් යවන්න බැරිය කියන වචනයද ඒ කාරණය සම්බන්ධයෙන් එතුමා පාවිච්චි කරන්නෙ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැහැ, සභාපතිතුමනි, උතුරට එක තර්ක යක්; තවත් පළාතකට වෙනත් තර්ක යක්; 20 වෙනි ශත වර්ෂයට එක තර්ක යක්; 19 වෙනි ශත වර්ෂයට තවත් තර්ක යක්; මේ විධියේ පුහු කථා ඉදිරිපත් කිරීම කානගාටුවට කරුණක් බව මතක් කළ යුතුව තිබෙනවා. යුද්ධ හමුදාවක් තියෙන්නටත් පුළුවනි, නැති වන්නටත් පුළුවනි. මේ රටේ සාමය ආරක්ෂා කරන්ට යුධ හමුදාව නැතිවාට පොලීස් හමුදාව තිබෙනවා. එය චිරාගත ප්‍රතිපත්තියක්; ලියාපදිංචි වූ දෙයක්; දිව්‍යමය සත්‍යයක්; එසේ නැතිව අමුතුවෙන් සොයා ගැනීමට දෙයක් නොවෙයි. රටක් තිබෙනවා නම් හමුදාවක් තිබෙන්ට ඕනෑ. අද ලෝකයේ ඇති වී තිබෙන දියුණුව දෙස බලන විට මෙම තකර්ය ඉදිරිපත් කිරීම කනගාටු දායක බව කියන්ට ඕනෑ.

ගරු සභාපතිතුමනි, සාමය ඇති කිරීමට යුධ කළ අයත් සිටියා. නමුත් ඒ යුධ වලින් ඇති වුණේ සාමය නොවේ, ඊට වඩා භයානක ප්‍රතිඵලයි. සාමාන්‍ය දේශ පාලන න්‍යායයන් අනුව දේශපාලන දර්ශන වාදය අනුව සලකනවා නම්, මේ කාලයේදී මෙම කරුණු ගැන අමුතු විධියකින් කල්පනා කර බලන්ට ඕනෑය කියන තර්කයටයි, අපට බහින්නට සිදු වී තිබෙන්නේ. විශාල පඬිවරුන්, මහ ජාතීන්ගේ පාලකයන්, පවා ලෝකය ආරක්ෂා කරගන්නේ කෙසේද? යුධ උපකරණ තැනීම නතර කරන්නේ කෙසේද? යුධ හමුදා තර කිරීමට යොදවන මුදල් අඩු කරන්නේ කෙසේද? අපි සාමයට බහින්නේ කෙසේද? යනුවෙන් සාමය මෙනෙහි කරමින් සිටින මේ අවස් ථාවේදී බිංගිරියේ ගරු මන්ත්‍රීතුමා (ජයසේන මයා.) මේ පණ්ඩිතකම ප්‍රකාශ කිරීම කොයි අන්දමකින්වත් යහපත්යයි මා කල්පනා කරන්නේ නැහැ. සාමය ආරක්ෂා කිරීමට මේ රටේ පොලීස් හමුදා වක් තිබෙනවා. නුවරඑළියේ ගරු මන්ත්‍රී තුමා (විලියම් ප්‍රනාන්දු මයා.) ප්‍රකාශ කළ ආකාරයට සාමය ඇති කරන විධියේ යම් යම් කටයුතුවලට නම් හමුදා පාවිච්චි කිරීම ඉතා ඔබින දෙයක්ය, ඉතා සුදුසු දෙයක්ය, කියා අපිත් අනුමත කරනවා. රටක් තිබෙන පමණට හමුදාවක් ඕනෑය කියන විධියේ යුද සැරසිලි වැනි තර්ක හොඳ දේවල් හැටියට මේ ගරු සභාවේ මේ 20 වෙනි ශත වර්ෂයේ යම් කෙනකු ඉදිරිපත් කිරීම පුදුමයට කරුණක් බව මතක් කර මින් මුලින් අප ඉදිරිපත් කළ අදහස එනම්, සාමාන්‍ය සෙබළුන්ගේ තත්ත්වය දියුණු කළ යුතුයි; ඔවුන්ගේ දුක්ගැනවිලි ඉවත් කළ යුතුයි; ඒ හමුදාව සම්බන්ධව අමුතු විධියකට කල්පනා කළ යුතුයි; කියා මතක් කරමින්, මේවා ජනතාවට විරුද්ධව ඉදිරිපත් කරන ආයතන හැටියට වර්ධනය කිරීම හා යුධ උපකරණ සඳහා වැඩිපුර මුදලක් වැය කරන්ට යාම ගැන අපේ විරුද්ධත්වය නැවත වරක් ප්‍රකාශ කරමින්, මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

ශ්‍රීමත් රසික් fපරීඩ් (මැද කොළඹ පළමු වන මන්ත්‍රී)

(சேர் ராஸிக் பரீத்—கொழும்பு மத்தி முதலாம் அங்கத்தவர்)

(Sir Razik Fareed—First Colombo Central)

Mr. Chairman, I am rather surprised at the speech made just now by the hon. Second Member for Colombo South (Mr. Bernard Soysa) who represents me in Parliament. He talked of the 1915 riots, the facts of which I am sure he cannot be aware of because these occurred some 46 years ago. It was the Ceylon Moors who suffered most grievously in those riots but he spoke of the sufferings of one community only, and I am very unhappy about it.

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்ணட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

We, all of us, suffered.

ශ්‍රීමත් රසික් fපරීඩ්

(சேர் ராஸிக் பரீத்)

(Sir Razik Fareed)

We suffered the most. We lost 50,000 Ceylon Moors. We want to forget it. I am very unhappy that these things have been introduced into this Debate. At that time my own grandmother had, for three days, to live on leaves and eventually on grass. We had to give protection to the late Mr. D. S. Senanayake in those dark days of 1915. It was dark not only for the Sinhalese but also for the Ceylon

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රීමත් රසික් fපරිඬ්]

Moors. My hon. Friend has been tryi ng to draw a red herring across the trail in this Debate.

ආර්. ජී. සේනානායක මයා. (දඹදෙණිය)
(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)
(Mr. R. G. Senanayake—Dambadeniya).

ගරු සභාපතිතුමනි, කැරැල්ලක් ඇති වන විට යුද්ධ හමුදාව පාවිච්චි කිරීමේ ඇති අවශ්‍යතාව ගැන බිංගිරියේ ගරු මන්ත්‍රීතුමා (එල්. බී. ජයසේන මයා.) කථා කළා. යම් යම් අවස්ථාවලදී ඉතා තදින් ක්‍රියා කළ යුතු නමුත් යුද්ධ හමුදාවට සම්පූර්ණ බල යක් නැහැ, කැරැල්ලක් තිබුණු පලියට සීමාවක් නැතිව, අනුකම්පාවක් නැතිව, මහජනයාට වෙඩි තැබීමට. 1915 දී විදේ ශික අධිරාජ්‍යවාදී ආණ්ඩුවක් තියෙන අවස්ථාවේදී කැරැල්ලක් තිබුණාය යන අදහස අනුව සීමාවක් නැතිව, අනුකම්පා වක් නැතිව, මුස්ලිම් මිනිසුන්ය කියා බලන්නේ නැතිව, සිංහල මිනිසුන්ය කියා බලන්නේ නැතිව, එකාකාරයට වෙඩි තැබීම ගැන ලංකාවේ සෑමදෙනාම අදත් සිහි කරනවා. ජාතික අනුරාගයක් ඇති කරන්නට වුවමනා අවස්ථාවේදී 1915 දී වින්ද දුක ගැනයි සිහි කරන්නේ. දේශ පාලන සටන පවා පටන් ගන්නේ ඒ සිද් ධිය ගැන සිහි කරලයි. කැරැල්ලක් මැඩ පවත්වන අදහසින්ය කියායි ඒ අවස්ථා වේදී ක්‍රියා කළේ. නමුත් ඊ ළඟට ඒ අවස්ථා වේදී අසාධාරණ ලෙස කටයුතු කළ නිලධා රීන්ට විරුද්ධව ඉංග්‍රීසි ආණ්ඩුවට කරුණු පෙන්වා දීමට විශෙෂ කොමිසමක් පත් කර ඒ ගැන විභාගයක් ඇති කිරීමෙන් පසු අසාධාරණ පිළිවෙලට වැඩ කළ නිලධාරීන් මේ රටින් අස් කළ බව වාර්තාවල සඳහන් වී තිබෙනවා. අධිරාජ්‍යවාදීන්ගේ කාලයේදී එසේ සිදු වී තිබෙනවා නම් අපේ රටේම අපේ නිදහස් ආණ්ඩුවක් තියෙන කාලයේ දී යුධ හමුදාව අසාධාරණ විධියට බලය පාවිච්චි කළාය කියා චෝදනාවක් තිබෙ නවා නම්, ඒ නිලධාරීන් වෙඩි තැබුවේ යුක්තියක් අනුවද, නීතියක් අනුවද කියා සොයා බැලීමට යුතුකමක් තිබෙනවා නේද?

මොන්ට්‍රික්ස්ටෝ සිද්ධිය ගැන අද විභාග යක් ඇති කර තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. ආණ්ඩුවේ නිලධාරීන් නැත්නම් මිලිටරියේ ප්‍රධානීන් කටයුතු කර තිබෙන්නේ යුක්තියක් අනුවද, නීතියක් අනුවද, බලයක් අනුවද කියා සොයා බැලී මට, ඒ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂා කරගෙන යනවා. බලය පාවිච්චි කරන විට අනුගමනය කළ යුතු වැඩ පිළිවෙළක් තිබෙනවා. කැරැල්ලක් ඇති වුනාය කියා අමු අමුවේ වෙඩි තැබීමට පුළුවන්කමක් නැහැ. මොන්ට්‍රික්ස්ටෝ සිද්ධිය ගැන පරීක්ෂණයක් තිබෙනවා නම්, මේ සිද්ධිය ගැන පරීක්ෂණයක් නොපැවැත්වීමට ඇති හේතුව කුමක්ද? ඇත්ත වශයෙන්ම ඒ අවස්ථාවේදී කැරැල්ලක් තිබුණාද? ආණ්ඩු වට උපකාර වීමට ගිය අහිංසක ජනතාවට වෙඩි තැබූ බව සභානායක තුමා හිටියා නම් කියයි. මේ ආණ්ඩුවට උපකාර වීමට ඕනෑය කියා ඉදිරිපත් වූ අයට අමු අමුවේ වෙඩි තැබූ බව තමුන්නාන්සේත් දන්නවා. ඉතින් මොකද ඒ සිද්ධිය ගැන විභාගයක් නැත්තේ? 1915 දී අධිරාජ්‍යවාදීන් කළ වෙඩි තැබීම් ගැන ඒ අධිරාජ්‍ය වාදීන්ම විභාගයක් තැබුවා නම්, මොන්ට්‍රික්ස්ටෝ සිද්ධියට සම්බන්ධ මරණය ගැන මේ ආණ්ඩුව විසින්ම විභාගයක් කරනවා නම්, පදවියේ සිද්ධිය ගැන විභාගයක් නොපවත්වන්නේ කුමක් නිසාද කියන ප්‍රශ්නය මා අහන්නට කැමතියි.

අ. භා. 6.15

යූ. පී. වයි. ජිනදාස මයා. (කුණ්ඩසාලෙ)
(திரு. யூ. பீ. வை. ஜினதாஸ—குண்டசாலே)
(Mr. U. P. Y. Jinadasa—Kundasale)

ගරු සභාපතිතුමනි, යුද්ධ හමුදාව පිළි බඳ වැය ශීර්ෂය යටතේ කෙරෙන මේ සාකච්ඡාවේදී සමහර ගරු මන්ත්‍රීවරු ප්‍රකාශ කළා, ප්‍රයෝජනයක් නොමැතිව යුද්ධ හමුදාව සඳහා විශාල මුදලක් වියදම් කරන්නට සිදු වන බව. රටක් වුනොත් ඒ රටේ යුද්ධ හමුදාවක් තිබෙන්නට ඕනෑ. අභ්‍යන්තර ආරක්ෂාවට හෝ බාහිර ආරක්ෂාවට යුද්ධ හමුදාවක් තිබෙන්නට ඕනෑ. කල්ලතෝනින් රාශියක් දිනපතා, සතිපතා මේ රටට පැමිණෙනවා. ඒ අය ගෙන් මේ රට ආරක්ෂා කර ගැනීමට යුද්ධ හමුදාව ඕනෑ. එසේම උතුරු නැගෙනහිර පළාත්වල වෙනම ආණ්ඩුවක් ඇති කිරීමට කටයුතු කරගෙන යන විට සාමය ආරක්ෂා කිරීම සඳහා අපට යුද්ධ හමුදාව වුවමනා වෙනවා. ඝට්ටනයක් ඇති වුණාම හදිසි අවස්ථාවලදී යුධ හමුදාව වුවමනා බව අපි පිළිගන්නට ඕනෑ. නමුත් අසාධාරණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අන්දමින් අයුක්ති සහගත අන්දමින් යුඩ හමුදාව වෙඩි තැබීම් ආදිය කරනවා නම්, එසේ කිරීම සාධාරණය කියා මහජනතාව පිළිගන්නේ නැහැ. අපේ යුඩ හමුදාව උතුරු නැගෙනහිර පළාත්වල කළ වැඩ ඒ තරම් නරකය කියා අපට පිළිගන්නට බැහැ. අභ්‍යන්තර සාමය ආරක්ෂා කිරීමට කර්නල් උඩුගම මහතා දක්ෂ ලෙස කටයුතු කර තිබෙන බව උතුරේ මන්ත්‍රීවරු පවා ප්‍රකාශ කළා. ඕනෑම රටක සාමය ආරක්ෂා කරනු ලබන්නේ යුද්ධ හමුදාව මගින් බව මා විශ්වාස කරනවා. ඒ නිසා යුද්ධ හමුදාව අතින් යම් යම් දේවල් කෙරුණු විට ඊට දොස් පැවරීම සුදුසුය කියා මා හිතන්නේ නැහැ. සටන් කරන්නට දෙපැත්තක් වුව මනා කරනවා. එවැනි අවස්ථාවලදී එක් කෙනෙක් දෙන්නෙක් මැරෙන්නටත් පුළුවන්. ඒ නිසා මෙහෙම අවස්ථාවකදී යුද්ධ හමුදාවට දොස් පැවරීම සුදුසු නැහැ. මීට කලින් කථා කළ බිංගිරියේ ගරු මන්ත්‍රීවරයා (ජයසේන මයා.) උතුරු සහ නැගෙනහිර පළාත්වල අපේ භට හමුදාවන් ආරක්ෂක කටයුතුවල යෙදී සිටි අවස්ථාවල දී, යුද්ධ නිලධාරීන් ගිය පාරවල නොයෙක් අවහිරකම් යොදා තිබුණු බැවින් ඔවුන්ට තමන්ගේ ජීවිත බේරා ගැනීමේ චේතනා වෙන් සටන් කරන්නට සිදු වූ බව කීවා. බිංගිරියේ ගරු මන්ත්‍රීවරයා කී පරිදි ඔවුන් ඒ පළාතට ගියේ සිල් රකින්නට නොවෙයි. ඒ නිසා දකුණු කොළඹ දෙවන ගරු මන්ත්‍රීවරයා (බර්නාඩ් සොයිසා මයා.) යුද්ධ හමුදාව ගැන කළ ප්‍රකාශයන් ගැන අප කනගාටු වෙනවා. අභ්‍යන්තර සටනක් පැවති මෙවැනි අවස්ථාවකදී යම් යම් සිදු වීම් ඇති වීම වළක්වන්නට බැහැ.

ගරු සභාපතිතුමනි, 1915 ජාති භේද කෝලාහල ඇති වූ අවස්ථාවේදී සිංහල ප්‍රභූන් කීප දෙනකුම ප්‍රසිද්ධියේම වෙඩි තබා මැරූ බව අපි දන්නවා. එමෙන්ම 1953 දී හාල් මිල වැඩි කළ අවස්ථාවේදී මෙවැනි සිද්ධීන් ඇති වුණා. තවද 1958 දී ද පදවියේ මෙවැනි සිද්ධීන් ඇති වුණා. මෙම සිද්ධීන් ගැන අපි සියලුදෙනාම කනගාටු වෙනවා.

විශේෂයෙන්ම මේ රටේ අභ්‍යන්තර ආරක්ෂාව සඳහා වයස 18 ට වැඩි සෑම පාඨශාලා ශිෂ්‍යයකුටම අනිවාර්ය වශයෙන් යුද්ධ භටයකුගේ පුහුණුවක් දිය යුතුය කියා මා කල්පනා කරනවා. එය අපගේ රජයේ රජ දවසේ පැවතුණාක් මෙන් සිංහල සංස්කෘතියට ගැලපෙන පරිදි සංවිධානය කරනු ලැබුවොත් ඉතාමත් හොඳය කියාත් මා කල්පනා කරනවා. ගරු සභාපතිතුමනි, අපේ පැරණි සිංහල සංස්කෘතිය අනුව දවුල්, බෙර, තම්මැට්ටම් තූර්ය භාණ්ඩ ආදිය පාවිච්චි කිරීම පිළිබඳව පුහුණුවක් දිය යුතුයි. දැන් කලකට උඩදී අප යුද්ධ හමුදාවද බෙර වැයීම් ආදිය පටන්ගත් නමුත් මහනුවරදී මෙවර නිදහස් උත්සවය පැවැත්වූ අවස්ථාවේදී ඒවා අපිට දකින්නට ලැබුණේ නැහැ.

ගරු සභාපතිතුමනි, අපේ රට කුඩා රටක්. අපි අනික් රටවල් අල්ලන්නට යන්නේ නැහැ. නමුත් අපට යුද්ධයක් කරන්නට වුවමනා වුණොත් ඊටත් අපි ලෑස්තිව සිටින්නට ඕනෑ. පැරණි රජදරුවන්ගේ කාලවලදී පැවතුණාක් මෙන් රටේ ආරක්ෂාව පිණිස බලගතු යුද්ධ හමුදාවක් තබා ගන්නට ඕනෑ.

අ. භා. 6.17

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

කරුණා කර නිශ්ශබ්ද වන්න. දැන් ගරු නියෝජ්‍ය කථානායකතුමා මුලසුන භාර ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

ජිනදාස මයා.
(திரு. ஜினதாஸ)
(Mr. Jinadasa)

ගරු සභාපතිතුමනි, මා කියමින් සිටියේ අපේ රටේ අභ්‍යන්තර ආරක්ෂාව සඳහා හොඳ යුද්ධ හමුදාවක් තිබිය යුතු බවයි. ඒ සඳහා අවශ්‍යයෙන්ම කළ යුතු දෙයක් තමයි, සාමාන්‍ය යුද්ධ භටයින්ට හොඳ වැටුප් ගෙවීම. අද ඔවුන්ට දෙනු ලබන වැටුප් මදි. එමෙන්ම යුද්ධ හමුදාවේ උසස් නිලතලද එක්තරා පන්තියකටම පමණක් සීමා කර තිබෙන බව අප දන්නවා. ඒ නිසා එක කොටසකට පමණක් මෙවැනි බලතල ලැබෙන පරිදි දැන් සකස් වී තිබෙන පිළිවෙළද වෙනස් කළ යුතු බව මතක් කරන්නට කැමතියි. සමර්ථ කම තිබෙන, ක්‍රියා ශූරකම තිබෙන සෑම කෙනෙකුටම අවහිරයක් නැතිව උසස් තත්ත්වයට යාමට ඉඩ තබන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජිනදාස මයා.]

සමහර පවුල්වල අයට, සමහර පක්ෂවල අයට, සමහර අදහස් දරන අයට, සමහර ආගම් අදහන අයට, බලතල බෙදී ගොස් තිබෙන බව පේනවා. ඒ විධියේ නරක සිද්ධීන් ඇති වී තිබෙන නිසයි අප මෙසේ කියන්නේ.

රටකට යුද්ධ හමුදාවක් තිබිය යුතුයි. එහි පාලනය උසස් ආකාරයට ගෙන යා යුතුයි. හොඳ ආහාර මෙන්ම හොඳ වැටුප්ද ඔවුන්ට ලැබිය යුතු බව අප පිළිගන්නවා. එසේම අභ්‍යන්තර කටයුතුවලදීද ඒවාට අයුතු විධියට ඇඟිලි නොගසා ක්‍රියා කළ යුතුයි. ඒ අන්දමට කටයුතු කොට නිසියාකාර සාමය ආරක්ෂා වන විධියේ සාධාරණ යුද්ධ හමුදාවක් මේ රටේ බිහි කළ යුතුයි.

ජයසේන මයා.
(திரு. ஜயசேன)
(Mr. Jayasena)

ගරු සභාපතිතුමනි, දකුණු කොළඹ පළමුවන ගරු මන්ත්‍රීතුමාගේ වචනයකට පිළිතුරක් දිය යුතුව තිබෙනවා. දකුණු කොළඹ පළමුවන ගරු මන්ත්‍රීතුමාට (ජේ. ආර්. ජයවර්ධන මයා.) පමණක් නොවෙයි මේ රටේ සිටින සියලු දෙනාටම වුවමනායි මේ ලෝකයේ සමන්ත සාමය පහළ කිරීමට. එය මේ මනුෂ්‍ය සංහතිය පහළ වූ දා සිටම බලාපොරොත්තු වූ දෙයක්. සත්වයාගේ පරමාණූන් රසායනාගාරවල එක්කොට පරීක්ෂණ පවත්වා විශෙෂඥයන් විසින් පිළිගෙන තිබෙනවා, සත්ව ජීව පරමාණූන් දෙකක් එකට එක්වූ කළ ඒ දෙක එකට හැපෙන බව. ලෝකයේ කවරදා, කවුරුන් විසින්ද කියා තිබෙන්නේ අසුවල් යුගයේදී සත්වයාගේ ඝට්ටන සමථයකට පත්වෙන වාය කියා? ලෝකයේ සත්වයන් අතර, විශෙෂයෙන් මිනිස් සත්වයා අතර හට ගන්නා ඝට්ටන, අඬදබර, කල කෝලාහල ආදිය නැවැත්වීම සඳහායි වරින්වර ලෝක සාමය පිණිස නොයෙකුත් දර්ශනවාදීන් පහළ වී මනුෂ්‍ය සංහතියේ සාමය සඳහා ඔවුන්ගේ දර්ශනයට අනුව කටයුතු කරන්නට යන්නේ. කවර දර්ශනවාදියකුගේ දර්ශනය කවර අන්දමකට පැතිර ගියත් කවදාද මේ ලෝකයේ අඬදබර හා ඝට්ටන නැති වුනේ? සත්වයාගේ ගැටුම ජීව පරිනාම වාදයට එකඟයි. සත්ව සංහතියේ ජීව පරමාණූන්ගේ ඝට්ටන උඩ මිනිසුන් මෙලොව ඇති වී තිබීම ඊට මූලික හේතුවයි. එවැනි මිනිසුන් අතර අපට සාමයක් බලා පොරොත්තු වන්න පුළුවන්ද? ගත වුණු ඉතිහාසයේ කවදාවත් ඇති නොවුණු සමන්ත සාමයක්, සමන්ත සම්මුතියක්, එකාකාර මෛත්‍රියක් මේ ලොව ඉදිරියට ද ඇති වන්නට පුළුවනැයි බලාපොරොත්තු විය නොහැක්කේ ඒ නිසයි. එම නිසා අප රටේ සාමය රැක ගත යුතු නිසයි, අපට යුද්ධ හමුදාවක් අවශ්‍ය වී තිබෙන්නේ. දකුණු කොළඹ පළමුවන ගරු මන්ත්‍රීතුමා එය පිළි නොගන්නවා නම් ඒ ගැන නැවත වත් විකක් කල්පනා කර බලන්නය කියා මා මතක් කරන්න කැමතියි. මුලු ලොව මිනිස් සංහතිය සාමය උඩ එකම සහෝදර මිනිස් සංහතියක් බවට පැමිණෙන තුරු යම් රටක රජයක් වේද ඒ රටට යුද්ධ හමුදාවක්ද අවශ්‍යයයි. එය සිද්ධාන්ත සත්‍යයක් බව ප්‍රකාශ කරන්න කැමතියි.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What a pessimistic outlook the hon. Member for Bingiriya has for the future of humanity!

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

සිංහලෙන් කථා කරන්න.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I think I can do better in Sinhalese than you can!

ගරු සභාපතිතුමනි, මට අහන්න තිබෙන්නේ එක ප්‍රශ්නයයි. නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමාගේ (විලියම් ප්‍රනාන්දු මයා.) කථාව මම අහගෙන හිටියා. ඒ කථාවෙන් ප්‍රකාශ වුණු එක් කරුණක් සම්බන්ධයෙන් ගරු මුදල් ඇමතිතුමා අත්පොළසන් දුන්නා. ශ්‍රේෂ්ඨ වාර්තාව අනුව යම් යම් සහන දී තිබෙනවාය, පඩි වැඩි කර දී තිබෙනවාය, යනුවෙන් ඒ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ඒ ප්‍රකාශය කරන විට ගරු මුදල් ඇමතිතුමා බොහොම සන්තෝෂයෙන් අත්පොළසන් දුන්නා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ග්‍රේෂන් වාර්තාව පාර්ලිමේන්තුව ඉදිරිපිට නොතැබුවේ මන්ද කියා දැනගන්නට අපි කැමතියි. අද වන තුරු ග්‍රේෂන් වාර්තාව අපට නොදුන්නේ ඇයි? ග්‍රේෂන් වාර්තාව මේ ගරු සභාවට ඉදිරිපත් නොකළේ මන්දැයි මා ප්‍රශ්න කරන්නේ ඒ වාර්තාවෙන් නිර්දේශ කර තිබෙන්නේ පඩි වැඩි කිරීම සම්බන්ධයෙන් පමණක් නොවන නිසයි. ඒ වාර්තාවේ වෙනත් දේ සම්බන්ධයෙන් සෑහෙන තරම් අදහස් ප්‍රකාශ කර තිබෙනවා. ලොකු උන්නැහේලා ගැනත් එහි සඳහන් කර තිබෙනවා. බ්‍රිගේඩියර් වරුන්, මේජර්-ජෙනරාල්වරුන්, පත් කිරීම ගැනත් එහි සඳහන් කර තිබෙනවා.

පාර්ලිමේන්තුවට නොදන්වා පඩි වැඩි කළේ ඇයි? පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඒ සම්බන්ධ ප්‍රශ්නය නිරාකරණය කරන්නට කල්පනා නොකළේ ඇයි? පාර්ලිමේන්තුවෙන් පිටස්තරව රහසේ කිසිවෙකුටවත් නොකියා යුද හමුදාවට පමණක් පඩි වැඩි කළේ දහස් ගණන් අහිංසක සේවකයන් ආණ්ඩුවේ වෙනත් දෙපාර්තමේන්තුවල ඉන්න බව කල්පනා නොකර වෙන්න ඇති. ඒ අයටත් පඩි වැඩි කරන්න ඕනෑ. යුද්ධ හමුදාවේ අයට පමණක් නොවෙයි, වැඩි පඩි ගෙවිය යුතුව තිබෙන්නේ. ඔය කාරණය සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවට දන්වා මේ මේ හේතු නිසා මේ මේ කොටස්වලට දැනට ලැබෙන පඩි ප්‍රමාණය මදිය කියා අප කල්පනා කරන බැවින් ඒ අයගේ පඩි වැඩි කරන්න ඕනෑ, කියා නියම ආකාරයට ඒ ප්‍රශ්නය විසඳීමට මුදල් ඇමතිතුමාට යුතුකමක් තිබෙනවා. මේ ආකාරයට ක්‍රියා කිරීමෙන් සිද්ධ වන්නේ මෙපමණයි. මේ රටවත්, මේ පාර්ලිමේන්තුවවත්, දන්නේ නැහැ කාට කොයි අංශයට කොයි ආකාරයට පඩි වැඩි කරනවාද කියා. එහෙත් අනෙක් අයට කෙසේ වෙතත් උසස් නිලධාරීන්ට නම් වැඩියෙන්ම පඩි වැඩි කර තිබෙන බව මම කියනවා. සමහර අයට පඩි වැඩි කළා පමණක් නොවෙයි. පසුගිය මාස කීපය සඳහා රුපියල් විසි දාහ බැගින් පවා ලැබුණු අය උසස් නිලධාරීන් අතර ඉන්නවා. අප ඒවා ගැනවත් මතක් නොකරයි, ඉන්නේ. ඒ නිසා පාර්ලිමේන්තුව කෙරෙහි විශ්වාසයක් තිබෙනවා නම්, මෙ වැනි වැදගත් දෙයක් කරන විට ඒ ගැන පාර්ලිමේන්තුවට දැනුම් දෙන මෙන් මා ඉල්ලුම් කරනවා. දැනුත්,—මේ අවස්ථාවේත්, මේ මොහොතේත්—මා ඉල්ලා සිටිනවා, කරුණා කර ග්‍රේෂන් වාර්තාව ඉදිරිපත් කර මොන මොන කරණා නිසා මොන මොන අංශවලට මොන මොන විධියට පඩි වැඩි කළාද යන්න ගැන දැනුම් දෙන ලෙස. ග්‍රේෂන් වාර්තාවේ තිබෙන දේ සමහර අය නොදන්නවා විය හැකියි. අද්මිරාල් කෙනකු අපට වුවමනා කරන්නේ නැහැ කියා ග්‍රේෂන් වාර්තාවේ තිබෙනවා.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)
දැනටත් නැහැ.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
ඇයි, ඉන්නවා නේද?

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)
නැහැ.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
ඇයි නැත්තේ? කැප්ටන් කෙනෙක් ඉන්නවා—acting Captain of the forces.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)
No Admiral at all.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
එයා ස්ථිර කළාට පස්සේ ඒ තැනට එනවා ඇති. නතර කරන්න පුළුවන් කමක් නැහැ. ඒ තත්ත්වය පිළි අරන් අවසානයි. ඒ නිසා මේ නාවුක හමුදාවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

ලොකු තැනැත්තා අද්මිරාල් කෙනකු හැටියට පිළි අරන් අවසානයි. රොයිස් ඩි මෙල් තමයි, රියර් අද්මිරාල්. වෙන වෙන කාරණා නිසයි, එහෙම පිළිගත්තේ. නමුත් මා අහන්නේ පාර්ලිමේන්තුවට නොදන්වා මෙවැනි දේවල් කළේ ඇයි කියන එකයි. ඒ ගැනයි මා කතාකරන්නේ.

නොයෙක් ප්‍රශ්න තිබෙනවා. ඒ හැම එකක් ගැනම කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. එකක් කියන්න කැමතියි. ඔය කාරණය නිසා හමුදාවේ සෑම අංශයකම පාහේ සැහෙන තරම් නොසන්සුන් භාවයක් තිබෙනවා. පහළ ඉන්න අයට එක් ආකාරයකටත් ඉහළ අයට තවත් ආකාරයකටත් සැලකිලි දැක්වීම ගැන එවැනි තත්ත්වයක් පැන නැඟ තිබෙනවා. පාර්ලිමේන්තුවේදී මා සඳහන් කළේ ඔය කොමිසම ඉදිරිපිටට යන්න අවස්ථාවක් අවශෙෂ සෙබළුන්ට නොදීම ගැනයි. වාර්තාවක්වත් ඉදිරිපත් කරන්න බැරි වුණා. පුළුවන් වුණේ යම් යම් උසස් කොටස්වල කෑමැත්ත උඩ ඒ අයගේ මාර්ගයෙන් යම් අදහසක් දෙන්ට මිස කෙළින්ම ගොස් සෙබළුන් වශයෙන් කරුණු කියා පාන්නට නොවෙයි. ග්‍රේෂන් කොමිසම ඉදිරියට ගොස් අපේ දුක්ගැනවිලි මෙන්න මේවාය කියා ඉදිරිපත් කරන්නට ඉඩ දුන්නේ නැහැ. ඒ නිසා පුළුවන් තරම් ඉක්මනින් අපට මේ වාර්තාව දෙන්න. කොයි තරම් පඩි වැඩි කළත් ඒ වැඩි කළේ මොන මොන අංශවලටද මොන මොන හේතු නිසාද, මොන මොන ප්‍රමාණයටද, යන කරුණු දන්වන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

බිංගිරියේ ගරු මන්ත්‍රීවරයා (ජයසේන මයා.) ගැන කියන්න තිබෙන්නේ මෙන්න මේකයි. සිද්ධාන්තයක් වශයෙන් එතුමා පිළිගත්තේ මනුෂ්‍ය සංහතියට නිදහසක් ඇත්තේ නැහැ කියායි; කවදාවත් සහනයක් ඇත්තේ නැහැ, හැමදාම ඒ විධියටයි තිබෙන්නේ, ඒ නිසා මේ හමුදාව භාර අරන් වැඩ කරන්න ඕනෑ, කියායි. යුද හමුදාවක් නැති රටවල් දැනටමත් ලෝකයේ තිබෙනවා. ඇතැම් රටවල යුද හමුදාවක් නැහැ. ඩෙන්මාර්කය බොහෝම කාලයක සිට යුද හමුදාවක් නැතුවයි, වැඩ කරන්නේ. අපේ රටේ වගේ යුද්ධ හමුදාවක් කියුබා රටේ අදත් නැහැ.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

යුද්ධ මිසක් හමුදා නැහැ.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

No permanent army. බාහිර වෙලාවට මුළු ජාතියම හමුදාවක් වශයෙන් පෙනී සිටිනවා. නමුත් පඩි ගෙවමින් බැරක්කවල තබා ගෙන සිටින යුද්ධ හමුදාවක් නැහැ. බිංගිරියේ ගරු මන්ත්‍රී තුමාගේත්, නුවර එළියේ ගරු මන්ත්‍රීතුමාගේත් අදහසක් අප පිළිගන්නවා. යුද්ධ හමුදාව ගැන අප අමුතු විධියකට කල්පනා කරන්නට ඕනෑ. අවුරුදු 15කට පසුව අප දැන් ඒ ගැන අමුතු විධියකට කල්පනා කරන්නට ඕනෑ. කියුබා රටේ තුබුණු හමුදා බැරක්ක දැන් ස්කෝල වලට පරිවර්තනය කර තිබෙනවා. අපටත් ඒ විධියේ තත්ත්වයක් ඇති කර ගන්නට පුළුවනි. වෙනත් විධියකට කල්පනා කර රටේ සාමය ඇති කිරීම වෙනම ප්‍රශ්නයක්. යුද්ධ හමුදාවක් තබා ගන්නවා නම් එසේ තබා ගත යුත්තේ කුමන විධියේ හමුදාවක්ද කියන එක ගැන සාකච්ඡා කොට තීරණයකට බැස ක්‍රියා කළ යුතුයි. එම නිසා බිංගිරියේ ගරු මන්ත්‍රීතුමා ඒ විධියේ අදහස් ඉදිරිපත් කිරීම නුවණට හුරු නැත කියන එකයි මා කල්පනා කරන්නේ. නමුත් ගරු මුදල් ඇමති තුමා මේ ප්‍රශ්නයට පිළිතුරු දෙනවා ඇතැයි මා අදහස් කරනවා. එම පිළිතුර දැන ගැනීමට මා කැමතියි.

අ. භා. 6.30

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

ගරු සභාපති තුමනි, මේ අවස්ථාවේදී ප්‍රශ්න කීපයක් ඉදිරිපත් කර ඇති නිසා ඒ සියල්ලටම කෙටියෙන් පිළිතුරු දීමට මා කැමතියි. සමහර ප්‍රශ්නවලට අපේ ගරු මන්ත්‍රීවරුන් විසින්ම පිළිතුරු දෙන ලද නිසා ඒ පිළිතුරුවලට තවත් පිළිතුරු එක් කිරීමට මා අදහස් කරන්නේ නැහැ. ඒ පිළිතුරුවලට බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා ලකුණු කීපයක් දෙනවා ඇද්දැයි මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දන්නේ නැහැ. නමුත් ඒ ප්‍රශ්නවලට පිළිතුරු දෙන ලද ආකාරය ගැන සම්පූර්ණ ලකුණු දිය යුතු බව මා සලකනවා.

පළමුවෙන්ම ගුවන් හමුදාව ගැන ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නට යෙදුණා. විදේශික නිලධාරී මහතුන් හා යුද්ධ භටයන් අද වන තුරු මේ රටේ තබා ගෙන සිටීම පිළිබඳව දකුණු කොළඹ දෙවැනි ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා. පසුගිය අවුරුද්දේ නිලධාරී මහතුන් 13 දෙනකු හා යුද්ධ භටයන් 33 දෙනකු සිටි බව මා සඳහන් කරන්නට කැමතියි. ලබන අවුරුද්දේ ඒ ගණන අඩු වන බවත් ඒ සමගම කියන්නට කැමතියි. නිලධාරීන්ගේ ගණන 13 සිට 8 දක්වාත් සෙබළුන්ගේ ගණන 33 සිට 19 දක්වාත් අඩු වෙනවා ඇති. ඊට පසු තවත් දුරට අඩු වන බව ගරු මන්ත්‍රීවරුන්ට මතක් කරන්නට සතුටුයි.

තවත් ප්‍රශ්නයක් තිබෙනවා. යුද්ධ සේවා මාර්ගයෙන් සමහර සිවිල් සේවා කටයුතු කර ගන්නට අදහස් කරනවාද නැද්ද යනුයි, ඒ ප්‍රශ්නය. එසේ කිරීමට අදහස් කරන බව කියන්නට සතුටුයි. එපමණක් නොව, යුද්ධ සේවයේ යෙදී සිටින නිලධාරී මහතුන් මෙන්ම අනෙක් භටයන් පාරවල් සෑදීම, පාලම් සෑදීම ආදී නොයෙක් සංවර්ධන කටයුතුවල යෙදීම සිය කැමැත්තෙන්ම පිළිගන්නවා. ඒ කටයුතුවල යෙදීමට ඒ අය ලෑස්තිව සිටිනවා. අපේ යුද්ධ හමුදාවේ අනාගතය කුමක්ද යන්න බිංගිරියේ ගරු මන්ත්‍රීතුමාත්, බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමාත්, ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාත් අතරේ වැදගත් ප්‍රශ්නයක් වශයෙන් මේ ගරු සභාවේදී ඉදිරිපත් වී තිබෙනවා. යුද්ධ හමුදාව තව දුරටත් වැඩි කිරීමට අපේ අදහසක් තිබෙනවාද, එසේ නැත් නම් අඩු කිරීමට අදහසක් තිබෙනවාද, කියන ප්‍රශ්නත් ඒ මන්ත්‍රීවරුන්ගේ කථාවලින් මතු වුණා. පසු ගිය අවුරුදු දෙක ඇතුළත අප කිසිම අන්දමකින් හමුදාවේ පිරිස වැඩි නොකළ බව කියන්නට කැමතියි. 1959 සිට තවම කිසිම වැඩි කිරීමක් කළේ නැහැ. ඇබෑර්තු ස්වල්පයක් තිබෙන එක නම් ඇත්තයි. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා ඒ ගැන වචන ස්වල්පයක් ප්‍රකාශ කළා.

ඒ ඇබෑර්තු ඇති වී තිබෙන්නේ අවුරුදු 5 ක සේවයෙන් පසු බොහෝ යුද්ධ භටයින් අස් වන නිසාත්, තවත් නිලධාරී මහත්වරු සමහර විට විශ්‍රාම ගන්නා නිසාත්, "රිසර්ව් එකට" තවත් සමහරුන් ගන්නා නිසාත් බව මම ප්‍රකාශ කරන්නට කැමතියි. ඒ ඇබෑර්තු සියල්ලම පිරවීමට ආණ්ඩුව විසින් දැනටමත් ක්‍රියා කර ගෙන යන බව මම කියන්නට සතුටුයි.

තවත් ප්‍රශ්නයක් අසා තිබෙනවා. ආණ්ඩුවට පතරොම් ආදිය ගැනීම පිණිස මේ අවුරුද්දේ වැඩි පුර මුදලක් වෙන් කර තිබෙන්නේ මන්දැයි අසා තිබෙනවා. ඒ මුදල වෙන් කර තිබෙන්නේ කවුරුවත් මරන්නටවත්, කිසිම • කැරැල්ලක් ඇති කරන්නටවත්, ආණ්ඩුවේ අදහසක් ඇති නිසා නොවෙයි. ඒ මුදල වෙන් කර තිබෙන්නේ පසු ගිය මුදල් වර්ෂවලදී ණය වුම් කළ බඩු සඳහා මුදල් ගෙවීමට සිදු වී ඇති නිසයි. පතරොම්වලට පමණක් නොවෙයි, මේ වැය ශීර්ෂය යටතේ මුදල් ගෙවන්නට සිදු වන්නේ. තවත් නොයෙක් අවශ්‍ය බඩුවලට මුදල් ගෙවන්නට සිදු වෙනවා. විශෙෂයෙන්ම සෞඛ්‍ය කටයුතු සඳහා අවශ්‍ය බඩු වුවමනා වී තිබෙනවා. ඒ වාගේම ජලය සැපයීමට අවශ්‍ය බඩුද වුවමනා වී තිබෙනවා. තවත්, හමුදා පාලන වැඩ කටයුතුවලට විශෙෂයෙන්ම පාවිච්චි නොවන බඩුත් කීපයක් මේ වැය ශීර්ෂයට ඇතුළත් වෙනවා.

ග්‍රේෂන් කොමිෂන් සභා වාර්තාව සම්බන්ධයෙන් ගරු යටියන්තොට මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා (ටී. විලියම් ප්‍රනාන්දු මයා.) කථා කරන අවස්ථාවේදී මා අප්පුඩි ගැසුවේ යයි යටියන්තොට මන්ත්‍රීතුමා මා දෝෂාදර්ශනයට ලක් කළා. නමුත් ඒ කථාවට අප්පුඩි නොගැසිය යුතුද? නුවරඑළියේ මන්ත්‍රීතුමා කළ කථාව ගැන මම ඉතාමත් ප්‍රීති වෙනවා. කැබිනට් අනුකාරක සභාවක් මගින් ග්‍රේෂන් කොමිෂන් සභා වාර්තාව විභාග කර බැලුවා. ඊට පසුව ඒ සඳහා අතුරු වැය ශීර්ෂයක් ඉදිරිපත් කරන්නට මේ ආණ්ඩුවේ බලාපොරොත්තුවක් ඇති බව මම කියන්න සතුටුයි. මේ ගරු සභාවට අගෞරවයක් වශයෙන් නොවෙයි, ග්‍රේෂන් කොමිෂන් සභා වාර්තාව ක්‍රියාත්මක කිරීමට අපි අදහස් කළේ. පසු ගිය අයවැය විවාදයේ කාරක සභා අවස්ථාවේදී ගරු යටියන්තොට මන්ත්‍රීතුමාත්, එතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක]

මාගේ පක්ෂයේ තවත් මන්ත්‍රීවරුන් කීප දෙනකුත් කවදා ඒ වාර්තාව අනුව යුද්ධ හමුදාවට පඩි ගෙවනවාදැයි අපෙන් ප්‍රශ්න කළා. දැන් අපි නියමාකාරයට, කිසිම අගෞරවයක් මේ සභාවට නොකර අතුරු වැය ශීර්ෂයක් ඉදිරිපත් කරන්නටයි ක්‍රියා කරනු තිබෙන්නේ.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(ඩොක්ටර් එන්. එම්. පෙරේරා)
(Dr. N. M. Perera)

වැඩි පඩි ගෙවා තිබෙනවා, පාර්ලිමේන්තුවට එන්නට පෙර. ඒකයි නරක.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(කෞරව එප්. ආර්. ඩයස් පණ්ඩාර නායක්ක)
(The Hon. F. R. Dias Bandaranaike)

This is what has taken place in the Fort police station. This kind of persecution of constables who are alleged to be supporters of the S. L. F. P. still continues. I would ask the Hon. Minister of Finance to make his own private inquiries from the police constables who come to this House on duty and find out whether Mr. Hussain is still not harassing them because it is alleged that they are supporters of the S. L. F. P.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 8

The Chairman: Order, please. Business is now interrupted.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන්, මන්ත්‍රී මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපති මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 1961 අගෝස්තු 25 වන සිකුරාදා.

ගිනිපෙට්ටි රෙගුලාසිය

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

On behalf of the Minister of Industries, Home and Cultural Affairs, I move,

That the following Regulation made by the Minister of Industries, Home and Cultural Affairs by virtue of the powers vested in him by sub-section (2) of Section 10 of the Manufacture of Matches (Regulation) Ordinance (Cap. 131) be approved :—

Regulation

The Manufacture of Matches (Regulation) 1938, published in *Gazette Extraordinary* No. 8,418 of December 3, 1938, are hereby amended in regulation 47 (as amended by regulation published in *Gazette* No. 10,332 of December 21, 1951), by the substitution for the figures "59" occurring under the heading "Rs." of the figures '167'.

This is to raise the tax on matches from 3 1/2 cents to 5 cents. It has already been found that traders have raised the price and Government is losing revenue.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

අ. භා. 8.2

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

නියෝජ්‍ය කථානායකතුමනි, ගිනිපෙට්ටි සම්බන්ධයෙන් ඇති මෙම රෙගුලාසියට විරුද්ධව වචනයක් කියන්නේ නැතිව මෙය නිකම්ම යාමට ඉඩ දෙන්න බැහැ. මේ ගැන මම වැඩි යමක් කියන්නට බලා පොරොත්තු වන්නේ නැහැ. මිනිත්තු 5 කට වැඩිය මම කථා කරන්නේ නැහැ. නමුත් අපේ ගරු ඇමති මණ්ඩලය ගිනි පෙට්ටියක මිල සත දෙකහමාරකින් වැඩි කිරීම සුළු දෙයක් හැටියට කල්පනා කරනවා නම් එය ඉතාමත් වැරදි කල්පනා වක් බව මම කියන්න කැමතියි.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

One and half cents only.

ගරු ද සොයිසා සිරිවර්ධන
(கௌரவ டி சொய்ஸா சிரிவர்தன)
(The Hon. de Zoysa Siriwardena)

සත එකහමාරයි. තුට්ටුවයි.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

සත එකහමාරක් වැඩි කිරීම සුළු දෙයක් හැටියට සලකනවා නම් එය බොහොම වැර දියි. යමක් කමක් තිබෙන ධනපති අයට නම් ගිනිපෙට්ටි වුවමනා නැහැ. ඒ උදවියට සිගරට් පත්තු කිරීම පිණිස ලයිටර් තිබෙනවා. ඒ වගේම ලාම්පු වුවමනා නැහැ. ස්විච් එක දැමූ හැටියේ ලයිට් එක පත්තු වෙනවා. නමුත් පිටිසරබද දුප්පත් ජනතාව තමන්ගේ සියලුම වැඩ කටයුතු අවසාන කර රෑට බුදියගන්න පෙර අන්තිමට කරන දෙය තමයි, කොට්ටය යටට ගිනි පෙට්ටිය දමා ගැනීම. ඒ මන්ද? සර්පයෙක් ගෝනුස්සෙක් හෝ පත්තෑයෙක් නිසා වෙන්න පුළුවන්; කුණාටුවක් නද වර්ෂාවක් එහෙම නැත්නම් හොරෙක් නිසා වෙන්න පුළුවන්; ඒ මොන කරුණක් නිසා හෝ වේවා එක පාරටම ගිනි පෙට්ටිය අරගෙන කුප්පි ලාම්පුව පත්තු කරගෙනයි නැගිටින්නේ. එතකොට එයින් අපට පෙනෙනවා දුප්පත් ජනයාට ගිනි පෙට්ටියක් ඉතාමත් අවශ්‍ය බව. ගිනිපෙට්ටියේ මිල මෙසේ නැංවීමෙන් කිසි කෙනකුට හිරිහැරයක් වෙන්නේ නැත කියා සමහරවිට ගරු මුදල් ඇමතිතුමා කල්පනා කරන්න ඇති. නමුත් දුප්පත් ජනයාට මේ නිසා දෙවිධියකින් හිරිහැර ඇති වී තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමා මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ තර්කය නම්, දැනට ගිනිපෙට්ටියක් සත තුනහමාර බැගින් විකිණිය යුතුයයි මිල නියම කර තිබුණත් අපි සියලු දෙනාම ඊට සත 5 ක් ගෙවනවාය, ඒ නිසා අපි එය නීතියෙන්ම සත 5 ක් කරනවාය කියායි. එතකොට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මොකක්ද සිද්ධ වී තිබෙන්නේ? නීති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෙන් සත 5 කළ විට අද දවසේ ගිනිපෙට්ටියක් විකුණනු ලබන්නේ සත 7 ට බව ගරු මුදල් ඇමතිතුමා දන්නවාද?

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

දැන් එය බැස තිබෙනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)

මම අහනවා නියෝජ්‍ය කථානායකතුමනි, ගිනිපෙට්ටි බෙදා හරින මාර්ග ගැන සෝදිසි කරන්නේ නැතිව ඇයි මෙය කළේ කියා. ගරු ඇමතිතුමා දන්නවාද ගිනිපෙට්ටි බෙදා හරින කර්මාන්ත ශාලා මගින් සුළු වෙළෙන්දන්ට ගිනිපෙට්ටි නිකුත් කරන මිළ අනුව ඒවා සත 5 බැගින් විකිණීමට ඔවුන්ට පුළුවන්කමක් නැති බව? සිල්ලර වෙළෙන්දා නොහොත් සුළු වෙළෙන්දා කරන්නේ වෙළඳාමක් බව අපි පිළිගන්න ඕනෑ. එසේ නම් තමන්ගේ වෙළඳාමෙන් අලාභ අරගෙන ඇඟිලි ලෙව කන්ටද?

ඒ සිල්ලර වෙළෙන්දා තමන්ගේ දරු මල්ලන් හදා වඩා ගන්නට තමන් කරන ජාවාරමෙන්, රක්ෂාවෙන් ලාබ ලබාගන්නට ඕනෑ. එම නිසා මේ කටයුතු භාර ගරු කම්කරු ඇමතිතුමා මේ කාරණය ගැන විශේෂයෙන් සොයා බලා අඩු ගණනේ සත 4 කටවත් වෙළෙඳුන්ට ගිනි පෙට්ටි ලබා ගැනීමට ඉඩ සලසා දෙන්නට ඕනෑ.

ගරු ද සොයිසා සිරිවර්ධන
(கௌரவ டி. சொய்ஸா சிரிவர்தன)
(The Hon. de Zoysa Siriwardena)

ඇයි සත 5 ට ලබාගන්න පුළුවන්.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)

වෙළඳුන්ට ගිනිපෙට්ටි සත 5 ට දුන්නාම සත 5 ටම විකුණන්නේ කොහොමද? වෙළෙන්දා සමාජ සේවා දෙපාර්තමේන්තුවද? එම නිසා නියෝජ්‍ය කථානායකතුමනි, මම මුලින්ම අපේ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ වෙළෙඳුන්ට සත 4 ගණනේවත් ගිනිපෙට්ටි ලබා ගැනීමට වැඩ කටයුතු යොදන ලෙසයි. සත 4 ට ලබාගත් විට වෙළෙන්දා ඉතා සන්තෝෂයෙන් එය සත 5 ට විකුණාවි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙළෙන්දා අද සත 5 ට නැති නම් ඊට වඩා මුදලක් ගෙවා ගිනිපෙට්ටි ලබාගෙන ඒවා මහජනයාට විකුණන්නේ නැතිව හංගාගෙන ඉන්නවා. මන්ද? ඒ අය විකුණන්නට බයයි. ගිනි පෙට්ටියට සතයක් ලබාගන්නට ගිහිල්ලා සම්පූර්ණ ජීවිතයම ගිනි ගන්නට පුළුවනි. යම් විධියකින් ගිනිපෙට්ටියකට සතයක් වැඩිපුර ලබාගන්නට ගිහිල්ලා අසු වුනොත්, ඒ නිසා ලොකු දඩයක් ගෙවන්නට සිදු වුනොත්, සම්පූර්ණ ජාවාරම නැත්තටම නැතිවෙලා මුළු ජීවිතයම කාල කණ්ණි වෙන්නට පුළුවනි. එම නිසා ගරු කම්කරු ඇමතිතුමාගෙන් ඉතා කරුණාවෙන් නැවත වරක් මා ඉල්ලා සිටිනවා, මේ සිල්ලර වෙළඳුන්ට සත 4 ගණනේ ගිනිපෙට්ටි ලබාගැනීමට වැඩ කටයුතු සලස්සන්නටය කියා. මෙම මිල වැඩි කිරීම ගැන අප කිසි සේත් සන්තෝෂ වන්නේ නැහැ. සත තුනහමාරට ලබාගත් ගිනි පෙට්ටිය සත 5 ක් කිරීම ගැන අපට කිසි විධියකින් එකඟ වෙන්නට බැහැ. එම නිසා මේ යෝජනාවට මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

අ. භා. 8.8

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I should also take only five minutes. The reason given by the Hon. Minister of Finance for raising what he called the banderol tax on a box of matches is very surprising. The Hon. Minister said that although the controlled price of matches has been 3½ cents a box, he personally had never been able to buy it for less than 5 cents, and therefore he saw no reason why everybody should not pay 5 cents per box and the Government collect some revenue.

Of course, the real problem here is the shortage of matches. We are opposed to the increase in price and we will vote against the increase in price. But I still want to make the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

point that there is not only an artificial shortage as a result of hoarding, but there is also a real shortage as a result of a fall in production.

The hon. Member for Galle (Mr. W. Dahanayake)—I do not agree with some of his pleas on behalf of the traders—put his finger on one important point, namely, the need to take over the wholesale distribution. If my hon. Friend thinks that matches are freely available, he is making a mistake. In the City of Colombo, in the very area of Kollupitiya where he lives, matches are not freely available, and certainly not at the price of 3½ cents, which is, up to this moment, the legal price. It is not available even at 5 cents.

The other day we were looking for matches, and we had to come close to Mahanuge Gardens, where we found a place which was prepared to sell matches at seven cents a box. When they saw me, however, they decided not to do so. They had no matches, they said.

So you see, the first thing is that there must be some attempt by the Hon. Minister of Industries to improve the production of matches. If you can produce more matches and put them in the market, then your price will also come down.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

The Minister is going to produce more matches—Gal Oya matches.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

Let somebody produce the matches. All you have been doing is producing taxes on matches but not producing matches. I think there are about five companies producing matches, but only two of them are using any machinery to produce matches and the others are using extremely primitive methods of production. Therefore I do not think there is any reason for increasing the price.

The Hon. Minister is trying to get the benefit to the State of certain blackmarketing activities. What is likely to happen is that the price will continue to be 7 cents and he might come next year and say "People are paying 7 cents and I have always paid 7 cents, so why should I not make the price 7 cents?" Unless you also tackle the question of production of matches you will never meet this shortage. This is quite an unfair and unreasonable tax.

අ. භා. 8.11

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. சில்வா)
(Dr. W. D. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගිනි පෙට්ටියක මිළ ශත 5ට නැංවීම ගැන අය වැය ලේඛනය දෙවෙනි වර කියවීම පිළිබඳ විවාදයේදීත් මම විරුද්ධත්වය ප්‍රකාශ කළා. ඇතැම්විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හෝ වෙන ලොකු කෙනෙක් කඩේකට ගියාම නම් ගිනි පෙට්ටියක් ශත 5ට ලබා ගන්න පුළුවන් වේවි. පිට පළාත්වල නම් ශත 5ට ගිනි පෙට්ටියක් ගැනීමට කොහෙත්ම බැහැ. කොළඹ නගරයේ පවා ශත 5ට ගන්නට ඉතාමත් අමාරුයි. ඒ නිසයි, මා කියා සිටින්නේ හදිසියෙන්ම මෙවැනි බදු දමන්නට මත්තෙන් ඒවා යේ නිපදවීම වැඩිකරන්ට වැඩ පිළිවෙළක් යොදන්නට ගරු මුදල් ඇමතිතුමාට බලවත් යුතුකමක් තිබුණාය කියා. මෙවැනි බදු බර මේ රටේ දුප්පත් ජනතාව මත දැමීම සුදුසු නැති බව මා මීට කලින් ද නොයෙක් අවස්ථාවලදී කියා තිබෙනවා.

ගිනිපෙට්ටියක මිළ ශත 5 දක්වා වැඩි කර තිබීම—ශත 7ට අඩුවෙන් නම් කොතැනකින්වත් ගිනි පෙට්ටියක් ගන්නට බැහැ—කෙළින්ම දුප්පත් මහජනයා මත විශාල බරක් පැටවීමක්. මේ මගින් ආදායම් වශයෙන් ලබා ගන්නා වූ මුදලට වඩා වැඩි මුදලක් කෙළින්ම සුද්දන්ගේ ඇහ උඩ බද්දක් දැමීමා නම් ලබා ගන්නට තිබුණා. මහජනතාව බදු බර නිසාත් බඩු වල මිළ ඉහළ යාම නිසාත් බලවත් කර දර අවස්ථාවකට මුහුණපා සිටින අවධියක දී තව තවත් ඔවුන් මත බර පැටවීමට කිසිම යුතුකමක් නැති බව ආණ්ඩු පක්ෂයට මා මේ අවස්ථාවේදී මතක් කර දෙන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ නිසයි, මා නැවත වරක් කියන්නේ, පන්දාහක් පමණ මේ රටේ තිබෙන ඉංග්‍රීසි කාර කොම්පැණිවලින් බද්දක් අය කළ යුතුව තිබුණාය කියා. මේ සෑම කොම්පැණියක්ම ජනසතු කරන්නටය කියා මම කියන්නේ නැහැ. මා කියන්නේ දුප්පතාගේ ඇඟ උඩ වැටී තිබෙන බද්ද පොහොසතාගේ, විදේශිකයාගේ, සුද්දාගේ ඇඟ උඩ දමන්නය කියායි. එම කාරණය උඩයි නොයෙකුත් අවස්ථාවන්හිදී මා රජයසමඟ විරුද්ධ වුණේ. ඉඩ තිබෙනවා නම්, බලය තිබෙනවා නම්, කරන්නට පුළුවන් කම කුත් තිබෙනවා නම්, බර උහුලන්න පුළුවන් අයගේ ඇඟ උඩ මේ බර පැටවීම සමාජවාදී වැඩ පිළිවෙළක් අනුගමනය කරන අයගේ යුතුකමක්. ගිනිපෙට්ටි වැනි වැඩියෙන් පාවිච්චි වන ද්‍රව්‍ය බෙදා හැරීමේ වැඩ පිළිවෙළවල දුර්වලකම් අනුව මේ අය බදු බර පැටවෙන්නේ දුප්පතාගේ කර උඩයි. එම නිසා අප ගැවසෙන කොටස්වල පවතින තත්ත්වය අනුව මේ අයබදු වැඩ පිළිවෙළට මා විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

අ. භා. 8.13

ආචාර්ය එන්. එම්. පෙරේරා

(டொக்டர் என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

I would like to find out from the Hon. Minister how much he expects by way of revenue from this additional tax. At the present moment the amount he gets by way of tax is Rs. 1,800,000. That is the estimated amount. The actual revenue for 1959-60 was Rs. 1,613,115. At best he will be getting one or two millions more.

There are two reasons why I object to this. One is that this is a burden that will fall heaviest on the rural areas. They are the people who use matches most. Secondly, a reorganization of the whole match industry is vitally necessary, and he could have got all the money he wanted without raising a cent by way of tax on the matches. Do hon. Members know that we actually import matches today ? We imoprt matches today.

කෙනමන් මයා.

(திரு. கெனமன்)

(Mr. Keuneman)

Like salt.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(டொக்டர் என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

This is absurd. We have imposed a quota to prevent people from producing more matches and then we go on importing matches. The whole thing is utterly absurd. The Ministers will not sit down and think out their problems. That is what I am objecting to. A reorganization of this whole scheme is necessary. There is one factory, the Swedish Match Factory—if you like, the Ceylon Match Company Limited—at Kelaniya which can produce double the quota that has been allotted to them, at lower cost if they produce more ; so, they can still pay your extra tax and not raise the price.

What are we doing ? To whom are we giving quotas ? A large number are generally non-Ceylonese. Some of them are Nadars who are supposed to carry on these match factories. They do not produce a single match but sell their quota. Even those who are producing a small quota are exploiting the workers to the utmost. They do not give proper wages or regular employment. All those safeguards are there in the Ordinance—this was passed before—but the department says it is powerless to act, that there is no protection at all. I had occasion more than once to intervene in a number of strikes in these small match factories.

Instead of completely reorganizing this machinery and getting more matches and at less cost to the people, all that the Government is doing—they are doing the easy thing—is increasing the banderol charges. That is why I say that this kind of short-sighted policy will not pay at all. It is thoroughly inexcusable because we are importing all the time while we are having quotas here. The thing is just utterly stupid.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 8.20

සිරිල් මැතිව් මයා. (කොළොන්න)
(திரு. சிரில் மதியூ—கொலன்ன)
(Mr. Cyril Mathew—Kolonna)

While opposing this tax we must say this. It is a sad confession on the part of the Hon. Minister of Finance to have stated on the Floor of this House that he has never been able to purchase a box of matches at the controlled price. If a Finance Minister of the Government cannot purchase a box of matches at the controlled price, how do they expect to enforce the Price Control Orders that are rolled out of the printing press by the thousands every day almost? They go out to the country and say, "All articles are controlled, you can purchase them at the controlled rates," but here the Minister of Finance himself mentioned that he has been unable to purchase a box of matches at the controlled price. Whom are they trying to fool? They are only fooling themselves.

So we must say this: why should we think of huge steel rolling mills and other grandiose schemes when we cannot produce matches in sufficiently large quantities for use by the people of this country?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)
I shall now put the Question.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)
The hon. Member for Yatiyantota's question should be answered. How much does he expect to get?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)
Order, please!

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)
That is a very important question.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)
That was replied to in the Budget a long time ago.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
We are asking the Hon. Minister a simple question.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
The Hon. F. R. Dias Bandaranaike)
Well, you answered it yourself.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
He has become thoroughly piqued.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)
If the Hon. Minister does not want to reply, what can I do?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
The Minister is thoroughly piqued, instead of answering the question.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)
You asked a question and answered it yourself.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
Is the Hon. Minister of Finance saying that my figure is correct?

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)
I never did. I always thought that when I present the accounts they are supposed to be cooked but that when you present the accounts they are correct.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා

(டொக்டர் என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

I am coming to that under your Vote, that is separate. But at the moment I want to know the facts, that is all.

ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය ඔව් නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඩබ්ලිව්. දහනායක මයා.

(திரு. டப்ளியு. தகனுயக்க)

(Mr. W. Dahanayake)

Divide.

මන්ත්‍රී මණ්ඩලය 48 වන ස්ථාවර නියෝගය යටතේ—පක්ෂව 17; විරුද්ධව 8; යනුවෙන් බෙදුණේය.

දුම්කොළ බදු නියෝගය

මතු පළවන විෂය ඊළඟට න්‍යාය පත්‍රයෙහි තිබිණ:

3. The Minister of Finance to move:—"That the Order, made under sub-section (2) of section 2 of the Tobacco Tax Act, No. 27 of 1953, as amended by Act No. 10 of 1959, published in *Gazette Extraordinary* 12,558 of July 27, 1961, and set out in the Schedule hereto be approved:—

Schedule

THE TOBACCO TAX ACT No. 27 OF 1953

TOBACCO TAX NOTIFICATION No. 5

BY virtue of the powers vested in me under sub-section (2) of Section 2 of the Tobacco Tax Act, No. 27 of 1953, as amended by Act No. 10 of 1959, I, Felix Reginald Dias Bandaranaike, do by this order direct—

(*a*) that with effect from July 28, 1961, there shall be charged, levied and paid a tobacco tax at the rate of rupees twenty-eight per pound on all Ceylon tobacco leaf which is intended to be used in the manufacture of cigarettes or pipe tobacco in lieu of the tobacco tax of rupees twenty per pound imposed on such tobacco leaf by order published in *Gazette Extraordinary* No. 12,183, of August 12, and approved by the House of Representatives on September 6, 1960; and

(*b*) that Tobacco Tax Notification No. 4 published in *Gazette Extraordinary* No. 12,183 of August 12, 1960, be rescinded with effect from July 28, 1961.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක

(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)

(The Hon. F. R. Dias Bandaranaike)

This, Mr. Deputy-Speaker, is to give effect to the Budget proposals about an increase of prices in tobacco.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

අ. භා. 8.24

ඩබ්ලිව්. දහනායක මයා.

(திரு. டப்ளியு. தகனுயக்க)

(Mr. W. Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමා සාධාරණ අන්දමින් ක්‍රියා කරන්න කැමති නම් මේ යෝජනාව ඉල්ලා අස් කර ගනීවිය කියා මා සිතනවා. මුදල් ඇමතිතුමාගේ මෙම යෝජනාවේ පරමාර්ථය එක්තරා මුදලක් රජයේ ආදායමට එකතු කර ගන්න එකයි. නමුත් සිගරට් වලට සහ පයිප්ප දුම්කොළවලට අය කරන ගණන් වැඩි කිරීමට යාම නිසා ගිය අවුරුද්දේ ලැබුණු ආදායමට වඩා ඉදිරි කාල සීමාවේ ආදායම අඩු වෙනවාය කියන එකයි අපට කියන්නට තිබෙන්නේ. එම ආදායම අඩු වෙනවා මිසක් වැඩි වන්නේ නැත කියන එක සථිර වශයෙන්ම කියන්නට පුළුවනි. මේ අය වැය ඇස්තමේන්තුවල 8 වන පිටුවේ, දුම්කොළ බද්දෙන් මීට පෙර ලැබුණු ආදායම ගැන සඳහන් වෙනවා. ඇස්තමේන්තුවේ හැටියට ප්‍රථම කාලසීමාවට වඩා මෑත කාලසීමාවේ ආදායම අඩු වී තිබෙන බවයි පෙනෙන්නේ. එම අඩු වීම සිදු වී තිබෙන්නේ ඒ වායේ මිල වැඩි කිරීම උඩයි. සිගරට් තොග වශයෙන් සහ සිල්ලරට වෙළඳාම් කරන තැන්වලින් ලැබෙන ආරංචිවල හැටියට පෙනෙන්නේ දැන් එම වෙළඳාම සියයට හතළිහකින් පමණ පහත බැස තිබෙන බවයි. උසුලන්න බැරි තරමට සිගරට් මිල නැග තිබෙන නිසයි එසේ සිදු වී තිබෙන්නේ. සිගරට් එකකට ශත 14 ක් ගෙවන්න සිදු වෙනවා. ඒ අන්දමට සිගරට් 10 ක් පාවිච්චි කරන තැනැත්තා හාල් සේරු 5 ක මුදල් පුළුස්සා දමනවා. මේ නිසා අද දවසේ කම්කරු පන්තියටත් මධ්‍යම පන්තියටත් සිගරට් බොන්න බැරි තත්ත්වයක් පැනනැගී තිබෙනවා. එසේ හෙයින් අද වැඩි දෙනා සිගරට් බීම අත්හැර දමලයි තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டீ சில்வா)
(The Hon. C. P. de Silva)
ඒක බොහොම හොඳයි.

ගරු ද සොයිසා සිරිවර්ධන
(கௌரவ டீ சொய்ஸா சிரிவர்தன)
(The Hon. de Zoysa Siriwardena)
බීඩි බොනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanáyake)
සිගරට් බීම අතහැර දැමීම වෙනම ප්‍රශ්නයක්. මානම් සිගරට් බීම අත්හැර අවුරුදු හතරක් පහක් විතර වෙනවා. සිගරට් බීම අතහරින්නටය කියා මා කිසිවකුට බල කර කියන්නේ නැහැ. හාල් සේරුවේ මිල සත 25 නම් සිගරට් එකක මිල සත 14 ක් වීම ගරු මුදල් ඇමතිතුමා පාවිච්චි කළ "ඉම්බැලන්ස්" කියන වචනයට ඉතා මත්ම ලක්ෂණ නිදර්ශනයක් බව කියන්න කැමතියි. හාල් සේරුවක මිල සත 25 නම් සිගරට් එකක මිල සත පහක් වෙන්නටයි ඕනෑ. ඒ නිසා සිගරට්වල මිල පුළුවන් තරම් ඉක්මනින් අඩු කර සෑහෙන මිලකට දෙන්න ආණ්ඩුව උත්සාහ කරන්න ඕනෑ. සිගරට් එකක මිල සත 14 ක් වීමට කිසිම කරුණක් නැහැ. ඒක සම්පූර්ණ අයුත්තියක්. ඒක බරපතල අයුක්තියක්ය කියන්න පුළුවනි. ආදායමත් අඩු වෙනවා නම්, මෙය යුක්ති සහගත බද්දකුත් නොවෙයි නම්, ගරු මුදල් ඇමතිතුමා කෙළින්ම මේ බද්ද අස් නොකරන්නේ ඇයි කියා මම අහනවා.

තවත් එකක් කියන්න කැමතියි. මීට පෙර සිගරට් සහ පයිප්ප දුම්කොළ බදු නැඟපු අවස්ථාවලදී මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් එක් වැදගත් ප්‍රශ්නයක් මතු කළා. එනම් මේ බද්ද අය කරන විට කොපමණ ස්ටොක් තියෙනවාද කියා බලා මහජනයාට පාඩුවක් නොවන පිළිවෙළට වෙළඳාම් කිරීමට වෙළඳුන්ට අණ කිරීමේ ක්‍රියා මාර්ගයක් මේ ආණ්ඩුව ඇති කළාද යන්නයි. මා දන්නවා, දකුණු පළාතේ එක්තරා වෙළඳ මහත්තැන් කෙනෙක් ගරු මුදල් ඇමතිතුමා අයවැය කථාව කරන්න දවස් 4 කට 5 කට පෙර මුළු දකුණු පළාතේ ගාල්ල, මාතර, හම්බන්තොට, ආදී හැම නගරයකම තිබුණු කඩ සාප්පුවලින් සිගරට් වින් එකතු කළා, ඔහු වැඩි වැඩියෙන් සිගරට් වින් එකතු කර ස්ටොක් කරගෙන හිටියා, ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය කථාව පවත්වා ඉවරවන තුරු. මා කියන්නේ නැහැ මෙතන "බජට් ලීකේජ්" එකක් තිබෙන වාය, අයවැය ලේඛනය සම්බන්ධ රහස් පිට වුණාය, කියා. සාමාන්‍යයෙන් වෙළඳ මහත්වරු කල්පනා කරන්න ඇති මුදල් වැඩිපුර ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් මුදල් ඇමතිතුමා මෙවැනි දෙයක් කරාවි කියා.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)
"ඇන්ටිසිපේෂන්."

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)
තණ්හාව නිසා වැඩිපුර ආදායමක් ලබා ගැනීමේ අදහසින් වෙළෙන්දන් ඒ විධියට කල්පනා කර ක්‍රියා කිරීම ස්වභාවික දෙයක්: එය සිරිතක් වශයෙන් කෙරෙනවා. එසේ නම් සිගරට් වැනි ද්‍රව්‍යවල ස්ටොක් ගැනීමක් කෙරෙන්න ඕනෑ. මේ විධියේ බදු වැඩි කිරීමක් ගැන අදහස් කරන අවස්ථාවකදී ඒ විධියේ ස්ටොක් ගැනීමක් වුණේ නැහැ. එයින් සිදු වුණේ මොකක්ද? ගරු මුදල් ඇමතිතුමාගේ කථාවට තුන් හතර දවසකට පෙර සිගරට් එකක් ගන්න පුළුවන්කමක් කිසිම නගරයක තිබුණේ නැහැ. හැම කඩයකම වාගේ සිගරට් නැති වෙලා ගියා. අයවැය යෝජනා ඉදිරිපත් කිරීමෙන් පසු සිගරට් ඔක්කොම එළියට ආවා. හැබැයි ඒ ආවේ වැඩි මිලටයි.

ගරු මුදල් ඇමතිතුමා නියම විධියට ගණන් නොදීම ගැන මා කනගාටු වෙනවා. දුම්කොළ බද්ද ගැන මුලින් ඇසූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් අපට නියම ගණන් දෙන්න ඕනෑ. එයින් එතුමා බලාපොරොත්තු වන්නේ කොපමණද කියා අපට කියන්න ඕනෑ. දැනටමත් සති දෙකක් පමණ පසු වෙලා තියෙනවා. මුදල් ඇමතිතුමා කථා කළාට පසු ඇති වූ තත්ත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වය අනුව එතුමා බලාපොරොත්තු වූ තරම් ආදායමක් ලබා ගන්නට පුළුවන් වෙයිද? ගරු මුදල් ඇමතිතුමා බලාපොරොත්තු වන්නේ නැද්ද පුරාණ උපමා කථාවේ හැටියට "ඉට්ස් නෙවර් ටූ ලේට් ටු මෙන්ඩ්" කීවා වගේ, තමා කළ වරද හරිගස්සන්න ඕනෑම වෙලාවක ඉඩ තිබෙනවාය යන්න පිළිගැනීම නුවණට හුරු නිසා ඒ අනුව ක්‍රියා කරන්න? ඒ අවවාදය පිළි අරන් මේ බද්ද අස් කරගන්නවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

අ. භා. 8.33

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. சில்வா)
(Dr. W. D. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් ඇමතිතුමා අපට වඩා මුදල් ගැන දන්නවා ඇති. නමුත් මෙයින් ලබා ගැනීමට අදහස් කර තිබෙන මුදල ලබා ගන්නට බැරි බව කෙළින්ම කියන්නට පුළුවනි. වැඩපළවල සිටින වැඩකරන උදවියගේ ශත දෙක, බස් ඩ්‍රයිවර්ගේ සහ කොන්දොස්තරගේ ශත දෙක, හාබර් කම්කරුවන්ගේ ශත දෙක, සාමාන්‍ය උදවියගේ ශත දෙක කඩා ගැනීම සඳහා සකස් කර ඇති මෙම වැඩ පිළිවෙළ අපට පිළිගන්නට අමාරුයි. සිගරට් එකෙන් ශත දෙකක් අය කර ගැනීම අපට පිළිගන්නට බැහැ. මෙය සිගරට්වුවේ ප්‍රශ්නයක් පමණක් නොව, අයවැය ලේඛනයේ ස්වරූපය පිළිබඳ ප්‍රශ්නයක්. වැඩි වශයෙන්ම මුදල් ලබා ගන්නට තැත් කරන්නේ සාමාන්‍ය උදවිය පාවිච්චි කරන භාණ්ඩ වලිනුයි. ඒ නිසාමයි, මා ඊට විරුද්ධ වුණේ. මුළු අයවැය ලේඛනයේම ස්වරූපය මොකක්ද? එහි බර පටවා තිබෙන්නේ කා පිටද? අයවැය ලේඛනයේ මුළු බර පටවා තිබෙන්නේ සාමාන්‍ය ජනතාව පාවිච්චි කරන භාණ්ඩ මතයි. අද දින මේ ගැන විශාල උද්ඝෝෂණයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් අතරත් මේ ගැන උද්ඝෝෂණයක් තිබෙන බව මා දන්නවා. එසේ තිබියදීත් මේ අයවැය ලේඛනයේ ස්වරූපය මාරු කර නැත්තේ මන්දැයි මා ප්‍රශ්න කරන්නට කැමතියි. මෙම අයවැය ලේඛනයේ මූලික ස්වරූපය කුමක්ද? සාමාන්‍ය ජනතාව වෙත, දුප්පත් ජනතාව වෙත බර පැටවීමේ ස්වරූපයයි. සිගරට්වුවේ ශත දෙකේ බර පටවන්නේ සාමාන්‍ය ජනතාවගේ කරපිටද නැත්නම් පොහොසත් සුද්දන්ගේ කර පිටදැයි මා තවත් වරක් ප්‍රශ්න කරන්න සතුටුයි. මේක අහක් කරන්නට අදහස් කරන්නේ නැද්ද? ජාතික ව්‍යාපාරයක්, සමාජවාදී ව්‍යාපාරයක් පිළිගන්නවාය කියමින් ඒ බර දමන්නේ දුප්පතාගේ ඇඟ උඩද? එසේ නැත්නම් පොහොසතුන්ගේ ඇඟ උඩද?

තවත් කාරණයක් තිබෙනවා. සිගරට් කොම්පැනිවල වැඩ කරන කම්කරුවන් අස් කිරීමේ ව්‍යාපාරයක් දැන් ගෙන යන බව කියන්නට ඕනෑ. කම්කරුවන් අස් කරන්නට කොම්පැනිකාරයන් කුමන්ත්‍රණය කරන බවට මෙම ආණ්ඩුව පිහිටුවා දවස් දෙකකට පසු මා විදුලි පණිවුඩයක් යැවූ බව මට මතකයි. මෙම ආණ්ඩුව පිහිටෙව්වාසින් පසු කොම්පැනිකාරයන් කම්කරුවන් අස් කර තිබෙන බව මෙන්ම සමහර කොම්පැනි වසා දමා තිබෙන බවත් කියන්නට සිදු වී තිබෙනවා. අයිස් කොම්පැනියේ වැඩ කළ 170 දෙනෙක් එක වරම අස් කරනු ලැබුවා නේද? නමුත් ඒ ගැන කම්කරු දෙපාර්තමේන්තුවෙන් කිසිම සහනයක් නැහැ. මේ රටේ උසාවි තිබෙනත් එම උසාවිවලින් මීට කිසිම සහනයක් නැහැ. මේවා කම්කරු ඇමතිවරයා දන්නේ නැහැ. නියම තත්ත්වය එතුමා දන්නේ නැහැ. ඒ නිසා ටිකක් මේ කරුණු ගැන ඉගෙන ගත්තොත් හොඳයි. වැඩ කරන උදවියට උසාවිය මගින් හෝ කම්කරු දෙපාර්තමේන්තුව මගින් හෝ කිසිම සහනයක් නොලැබෙන බව කිව යුතුයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වාත්තිය සමිති සම්මේලනයට බැඳී සිටින සිගරට් කොම්පැනිවල සේවය කරන කම්කරුවන්ගේ වැඩ නැවැත්වීමට වැඩ පිළිවෙළක් යොදා ගෙන යනවා. මා මේවා කියන්නේ සමහර උදවිය මේවා ගැන නොදන්න නිසයි. අයවැය ලේඛන ඉදිරිපත් කළත් සමහර උදවිය මේවා ගැන දන්නේ නැහැ. අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමට ප්‍රථම රටේ තත්ත්වය දැනගත යුතුයි. මුදල් ලබා ගත යුත්තේ කාගෙන්ද, පහර දී තිබෙන්නේ කාටද, අයවැය ලේඛනයේ තිබෙන්නේ අකුරු විතරක්ද, කියන කාරණා ගැන කල්පනා කළ යුතු බව තමුන්නාන්සේලා පිළිගන්නට ඕනෑ.

අපේ ඇමතිවරු කියනවා, සිගරට් බොන්න බැරි නම් බීඩි බොන්නටය කියා. අද ඒ තත්ත්වය තමයි ඇති වී තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා]

මධ්‍යම පන්තියේ උදවියත් සිගරට් බොන්නට බැරිව දැන් බීඩි බොන්න පටන් ගෙන තිබෙනවා. එයින් වාසි වන්නේ ආණ්ඩුවට නොවෙයි; බීඩි සඳන කර්මාන්තකාරයාටයි. එවිට මේ බද්දෙන් වාසි වන්නේ ඒ කර්මාන්තකාරයාට නොවේද?

සිගරට් කර්මාන්තයේ යෙදී සිටින කම්කරුවන් මාස 3ක් ඇතුළතදී අස් කරන්නට වැඩ පිළිවෙළ යොදන බව මම සත්‍ය වශයෙන්ම දන්නවා. ඒ කර්මාන්තයෙහි යෙදී සිටින සුද්දන් එසේ කරන බව මා කියන්නේ ඒ සුද්දන් කියන දේ කිරීමට පුරුදු වී නැති බව දන්න නිසයි. ඒ උදවිය මේ රටට ඇවිත් තිබෙන්නේ මේ රටේ අභිවෘද්ධිය තකා නොවෙයි. ඒ උදවිය මෙහි ඇවිත් තිබෙන්නේ පුළුවන් තරම් මේ රටෙන් ලාභ සූරාගෙන තම මව් රටට ගෙන යෑමටයි. එම නිසා මේ අයබදු ක්‍රමයට මම කෙළින්ම විරුද්ධ වෙනවා. මේ අයවැය ලේඛනය මූලික වශයෙන්ම රෝස පාට සුද්දන්ට වාසි වන ආකාරයටයි, සාමාන්‍ය ජනතාව තවත් ප්‍රපාතයට දමන ආකාරයටයි, ඉදිරිපත් කර තිබෙන්නේ.

දුම්කොළ බද්ද සාමාන්‍ය ජනතාවට කෙලින්ම පහර ගසන එකක්. ඒ බද්ද සුදු කොම්පැනිකාරයන්ට දමන ලෙස මම කරුණාවෙන් ඉල්ලනවා. සුදු කොම්පැනි 5,000 ක් පමණ තවමත් ලංකාවේ තිබෙනවා. නිදහස ලැබුණාට පසුත් සුදු කොම්පැනි තමයි, මේ රටේ ආර්ථික සාරය උරා බිව්වේ. මේ රටේ කොම්පැනි පිහිටුවා විශාල ලාභ ගන්න අතර මේ සුද්දන් අයබදු දෙපාර්තමේන්තුවට අය විය යුතු බදු ගෙවන්නෙත් නැහැ. අද ඒ බදුවලින් මිරිකී සිටින්නේ මේ රටේ සාමාන්‍ය ජනතාවත් වැඩ කරන උදවියත් සාමාන්‍ය වෙළඳුනුත් බව තමුන්නාන්සේ පිළිගන්නට ඕනෑ. එම නිසා මේ අයවැය ලේඛනයේ ස්වරූපය මුලින්ම වෙනස් කරන්නටය කියා මම ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

මේ අයවැය ලේඛනයට විරුද්ධව ලොකු උද්ඝෝෂණයක් රට පුරා පවතින්නේ මෙහි යෝජනා කරන බදු බර වැඩ කරන සාමාන්‍ය ජනතාවගේ කර පිට පැටවෙන නිසයි. මේ අයවැය ලේඛනය පියවීමට අඩු ගත් කෝටියම සුද්දන්ගෙන් ගන්නට තිබෙන අවස්ථාවේදී සාමාන්‍ය ජනතාව ඉගෙන් ඒවා අය කර ගැනීමට මේ විධියේ වැඩ පිළිවෙලක් යෙදීම සමාජවාදී ගමනක් යන ආණ්ඩුවක යුතුකමක් නොවන බව මා ප්‍රකාශ කරනවා.

අ. භා. 8.41

ටී. විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. ரி. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දුම්කොළ බද්ද ගැන ඉතා වේගවත්ව බොරිල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ඩබ්ලිව්. ඩී. ද සිල්වා මයා.) මීට පෙර අධ්‍යාපන ඇමතිව සිට කලක් ලංකාවේ අගමැති කෙනකු වශයෙන් සිටි ගාල්ලේ මන්ත්‍රීතුමාත් (ඩබ්ලිව්. දහනායක මයා.) ප්‍රකාශ කළ අදහස් ගැන මම පුදුම වෙනවා. ලංකාවේ අද කාස රෝගීන් කොපමණ ඉන්නවාදැයි කල්පනා කර බලන්න. දුම් වැටි ඉරීම නිසා පිළිකා රෝගය වැළඳෙනවුන් කී දෙනෙක් ඉන්නවාදැයි කල්පනා කර බලන්න. අපේ පාසැල්වල සිටින කුඩා ළමයින් පවා දුම්වැටි උරා ඔවුන්ගේ පෙණහැලි නරක් කරගන්න බව දැන් රහසක් නොවෙයි. එවැනි අවස්ථාවක අනාගත පරපුරටවත් දුම් නොබීමට කට යුතු යෙදුනොත් නරකද? සිගරට් නොබී මිනිසුන්ට ජීවත් වන්නට බැරිද? අල බතල ටිකක් ඒ වෙනුවට තම්බාගෙන කන්නට බැරිද? නැතිනම් වට්ටක්කා ගෙඩියක් තම්බාගෙන කන්න බැරිද? දුම්වැටි ඉරීමේ මේ විකාරය පරදේශීන්ගෙන් ලැබුණු එක් දායාදයක් තමයි. ඒවා අයින් කිරීමට අප දැන්වත් හිතට ගත යුතුයි. කම්කරුවෙකු වශයෙන් මගේ නම් සිගරට් ගැන කිසිම තැකීමක් නැහැ. අපට පුළුවනි, ඒවා අත්හැර දමා ජීවත් වීමට. ඒ නිසා ලංකාවේ අනාගත දරුවන්ගේ අභිවෘද්ධිය ගැන අනුකම්පාවක් තිබේ නම් මේ දුම්කොළ බද්ද තවත් වැඩි කරන ලෙස මම ඉල්ලා සිටිනවා. එහෙම නොකළොත් පෙනහැලි චිකිත්සාගාර විශාල සංඛ්‍යාවක් ලංකාවේ පිහිටුවන්නට සිදු වේවි. අනාගත දරුවන් කාස රෝගයෙන් ආරක්ෂා කර ගන්නට නම්, සිගරට් හෙවත් දුම්වැටි ආදී විනාශකාරී දේවල් හැකි තරම් දුරට සීමා කරන්නට ඕනෑ. මෙවැනි විනාශකාරී මත් ද්‍රව්‍ය පාවිච්චි කරන්නට ඉඩ හැර අනාගතයේදී මේ රටේ කාස රෝගීන් වැඩි කරන්නටද කියන්නේ? කාස රෝගීන්, පෙනහැලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රෝගීන්; විශාල සංඛ්‍යාවක් ඇති වන විට සමාජ සේවා අංශයෙන් ඔවුන්ට ආධාර වැටුප් ගෙවන්නට සිදු වෙනවා නේද?

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
දොස්තරට ලාබයි.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)
ඔව්, දොස්තරවරුන්ට විශාල වශයෙන් මුදල් උපයාගන්න පුළුවන් ක්‍රමයක් නොවැ. මා හිතන්නේ, රෝගීන් වැඩිපුර අද්දවා ගැනීමට තමන්ට තිබුණු වාසියක් නැති වී යාම නිසා බොරැල්ලේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා) වේගවත් වන්නට ඇති.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)
ගරු මන්ත්‍රීවරයකුට විරුද්ධව පුද්ගලික චෝදනා ඉදිරිපත් කරන්නට බැහැ.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. சில்வா)
(Dr. W. D. de Silva)
මම දන් ඒව අත්හැරලා. වැඩියෙ බෙහෙත් කරන්නෙ නැහැ.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)
ඒක හොඳයි. අද ලංකාවේ අස්සක් මුල්ලක් නෑර පාසැල්වලට යන දරුවන් ගෙන් බොහෝ දෙනෙක් ගිනි පෙට්ටියත් සිගරට් කැල්ලත් ගෙන යනවා. පියා දුම් වැටි පැකට්ටුවක් ගෙදර ගෙනැවිත් තැබුවොත් ඉන් කීපයක් පුතා හොරකම් කර ගෙන පාසැල් යන ගමන් තවත් ළමයින් එකතු කරගෙන පාරේ බිබී යනවා. එවැනි විනාශකාරී දේවලින් සමාජය ආරක්ෂා කර ගැනීමට මෙවැනි පියවරක් නොගෙන ඒවා සතයකට දෙකකට දෙන්නට සැලැස්සුවොත් ගෙදර සිටින හාමිනෙත් සමඟර විට දුම්වැටියක් අදියි. අන්තිමේ සිදු වන්නේ මහා විනාශයක් නිසා එවැනි බාරදූර දෙයකින් රට ආරක්ෂා කර ගැනීමටත්, ජාතියේ සෞඛ්‍යය වර්ධනය කර ගැනීමටත්, මෙම විනාශකාරී දේවල මිළ තවත් වැඩි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

මාත් ඉස්සර සිගරට් බීපු කෙනෙක්. මා එය එක දවසින් නතර කර දැම්මේ කුමක් හේතුකොටගෙනද? 1957 ඇති වූ ගංවතුර නිසා මගේ ප්‍රදේශයේ කඳු කීපයකුත් ගෙවල් කීපයකුත් කඩා වැටුණු අවස්ථාවේදී ඒ නිසා අසරණ තත්ත්වයට පත් වුණු උදවියට, මට පුළුවන් පමණින් පාන් සීනි ටිකක් මා ගෙන ගොස් දුන්නා. සෑම රටවලින්ම වගේ ආධාර ගලාගෙන ආ ඒ අවස්ථාවේදී, සමාජයට මෙතරම් බාරදූර විනාශයක් සිදු වී තිබෙද්දී සිගරට් වෙනුවෙන් මුදල් වියදම් කිරීම අද සිට නවත්වා දමන්නට ඕනෑයයි අදහස් කර සිගරට් බීම අත්හැර දැම්මා. එදා සිට අද වනතුරු මා සිගරට් බීලා නැහැ. කාලයක සිට ලැහැස්ති වී කළ යුතු දෙයක් නොවෙයි, මෙය. මීට වුවමනා කරන්නේ හිත පමණයි. මා ඒ ගංවතුර අනාථයන් වෙනුවෙන් යම් මුදලක් වියදම් කළා නම්, ඒ මුදල් කැපී යන තුරු සිගරට් බීම නවත්වන්නට අදහස් කරගෙන සිටියත්, පුරුද්දක් වශයෙන් කරගෙන ආ සිගරට් බීම ඒ සිතුවිල්ල අනුව සම්පූර්ණයෙන්ම නතර වුණා.

සිගරට් බීම සඳහා වියදම් කරන මුදල් අප ඉතිරි කර ගන්නවා නම්, කුසගින්න නිවා ගැනීමට යමක් ගැනීමටත්, පිපාසයට බොන්නට යමක් ලබාගැනීමටත්, ඇඳුම් පැළඳුම් ආදිය ගැනීමටත්, ඒවගේම දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වැය කරන්නටත්, ඒ මුදල් යොදවන්නට පුළුවනි. මෙපමණ කාලයක් තුළ දුම්වැටි පුච්චා විනාශ කර දමන මුදල් එකතු කළොත් හාල් සේරු මෙපමණ ගන්නට පුළුවන්යයි කියා ගරු මන්ත්‍රීවරයෙක් සඳහන් කළා. මෙවැනි මෝඩ සිරිත් අනුගමනය කරන අයට අනුබල දෙන විධියේ වචන මේ ගරු සභාවේදී පාවිච්චි නොකරන මෙන් ගරු මන්ත්‍රීවරුන්ගෙන් මා ඉතා බැගෑපත්ව ඉල්ලනවා.

මේ රජයෙන් කරන හැම දෙයක්ම මහ ජනයාට වේදනා ගෙන දෙන්ට කරන දේවල් හැටියට පෙන්වීමට පැත්තක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

ගෙන කථා කරන්නට වුවමනා නැහැ. යුක්තියක්, ධර්මයක්, සාධාරණයක්, තියෙනවා. ඒ අනුව කල්පනා කර කථා කරන්නට ඕනෑ. එසේ නැතිව තමන් විරුද්ධ පාර්ශ්වයේ වාඩි වූ පලියට, ඒ පැත්තෙන් කථා කරන්නට වුවමනා පලියට, මහජනයා රවටන්නට වුවමනා පලියට, ඒ වගේම නිකම් කට තිබුණු පලියට, වුවමනා නැති දේවල්—බින්න—දෙසා බෑම වුවමනා නැහැ. සිගරට් බීම අවශ්‍ය කෙනකුට, තමන් දැනට සිගරට් පැකට් එකක් බොනවා නම්, යටත් පිරිසෙයින් සීමාවක් ඇති කර ඉන් බාගයක් බිව්වාම මොකද? කලන්තෙ හැදෙනවද? හාමත් වෙනවද?

මේ කුඩා රටේ උසස් ජාතියක් වශයෙන් ජීවත් වන්නට නම් මෙවැනි අවැඩ දායක දේවලට අනුබල දෙන්ට හොඳ නැහැ. වැඩක් නැති පුහු කථාකර මහ ජනයා තුරුල් කර ගැනීමට—ඡන්දදායකයන් එකතු කර ගැනීමට—තමන්ගේ දිරාපත් වුණු බලය නැවත තහවුරු කර ගන්නට මෙවැනි දේවල් ආයුධ කර ගන්නට එපායයි කියමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 8.48

මොන්ටේගු ජයවික්‍රම මයා. (වැලිගම)
(திரு. மொண்டெகு ஜயவிக்ரம—வெலிகம)
(Mr. Montague Jayewickreme—Weligama)

ගරු නියෝජ්‍ය කථානායක තුමනි, නුවර එළියේ ගරු මන්ත්‍රීතුමාගේ (විලියම් ප්‍රනාන්දු මයා) කථාවෙන් පස්සෙ මට වැටහුනා, දුම්කොළ බද්ද ගැන වචන ස්වල්පයක් කථා කළ යුතු බව. මෑත කාලයේදී කෝච්චියේ ගරු මන්ත්‍රීතුමා (ස්ටැන්ලි තිලකරත්න මයා.) විසින් රැස්වීම්වලදී කියන්නට යෙදුනා, මුදල් ඇමතිතුමා ඉතාමත්ම හොඳින් බදු අය කරනවාය, මේ තරම් හොඳ අයවැය ලේඛනයක් මෙයට කලින් ඉදිරිපත් කළේ නැත, කියා.

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)
ඒක වැරදියි. ඒක වැරදියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர்)
(Mr. Deputy-Speaker)
Is the hon. Member for Weligama giving way?

මොන්ටේගු ජයවික්‍රම මයා.
(திரு. மொண்டெகு ஜயவிக்ரம)
(Mr. Montague Jayewickreme)
No, Sir, I am not giving way.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට වැටහුණ හැටියට නම්, අපේ කොමියුනිස්ට් පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මේ ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය යෝජනාවලට පක්ෂව ඡන්දය දුන්නේ ගරු මුදල් ඇමතිතුමාගේ ක්‍රියා පටිපාටියට සතුටු නිසයි. එසේ නැත්නම් අයවැය ලේඛනයට පක්ෂව ඡන්දය නොදෙන බව අපි පිළිගන්නවා. කොමියුනිස්ට් පක්ෂය හැර විපක්ෂයේ අනෙක් සියලුම පක්ෂ, ලංකා සමසමාජ පක්ෂයත්, ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාත්, එක්සත් ජාතික පක්ෂයත් මහජන එක්සත් පෙරමුණත්, මුදල් ඇමතිතුමාගේ යෝජනාවලට විරුද්ධව ඡන්දය දුන්නා. විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් කොමියුනිස්ට් පක්ෂයේ මන්ත්‍රීවරුන් පමණයි අයබදු වැඩි කිරීමට පක්ෂව ආණ්ඩුව සමග ඡන්දය දුන්නේ. ඒ බව මම මතක් කරන්නට සතුටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නුවර එළියේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසු තමයි මට හිතුනේ දුම්කොළ බද්ද ගැන වචන ස්වල්පයක් කථා කරන්නට. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා කවදාවත් දුම් නොබිව් කෙනකු හැටියට අපි පිළිගන්නවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
හරියට බිව්වා.

ජයවික්‍රම මයා.
(திரு. ஜயவிக்ரம)
(Mr. Jayewickreme)
සම්පූර්ණයෙන්ම පසුගිය අවුරුදු තුන මුළුල්ලේ ඒ මන්ත්‍රීතුමා සිගරට්, සුරුට්ටු, බීඩි ආදි කිසිවක් පාවිච්චි නොකළ බව අපි දන්නවා. ඊළඟට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම්තුමා නේද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දැන් ටිකකට පෙර කථා කළේ? ඒ බොරැල්ලේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍ය චායර්‍ ඩබ්ලිව්. ඩී. ද සිල්වා) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් ධුරය දරන—

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

හිටපු ලේකම්.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

දැනුත්.

ජයවික්‍රම මයා.
(திரு. ஜயவிக்ரம)
(Mr. Jayewickreme)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින වෙලා තියෙන්නෙ මේකයි. බොරැල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් කියන්නට යෙදුනා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ධුරය දරන්නෙත් නැත කියා. එසේම අද බොරැල්ලේ මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් කෙනකු හැටියට පමණක් නොව වෘත්තීය සංගම්වල නායකයකු හැටියටත් ඉන්නවා. [බාධා කිරීමක්] අද සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ධුරය දරන්නෙත් නැත, එක්කෙනෙක් කිව්වාට මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් ධුරයෙන් අස්වන්නෙත් නැත, කියා බොරැල්ලේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරනවා. දැන් නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් අපට අවබෝධ වුනේ ගරු මුදල් ඇමතිතුමා මහජනයාගේ පෙණහැල්ල බලා ඒ පෙණහැල්ල ආරක්ෂා කරන්නට ගරු සෞඛ්‍ය ඇමතිතුමා සමග සාකච්ඡා කර මේ දුම්කොළ බද්ද ගෙනා බවයි. ඒ මන්ත්‍රීතුමාගේ කථාවේ සාරාංශය ගැන කල්පනා කළාම අපට පැහැදිලි වන්නේ එයයි. මුදල් ඇමතිතුමා සෞඛ්‍ය ඇමතිතුමා සමග සාකච්ඡා කර, සෞඛ්‍ය නිලධාරීන් සමග සාකච්ඡා කර, මහජනයාට තිබෙන ආදරය නිසාම දුම් බීම නතර කරවන්නට සිගරට් එකක මිල ශත දෙකින් වැඩි කළ බව නුවරවළියේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් අපට හොඳට තේරෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඇත්ත ගැන කල්පනා කරමු. ලංකාවේ පමණක් නොව මුළු ලෝකයේම කම්කරු පිරිස අද දුම් බීම සිරිතක් හැටියට කර නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව කොයි තරම් තීරුබදු දැම්මත් ඒ කම්කරු පිරිස දුම් බීම නතර කරන්නෙ නැති බව අපි හොඳාකාර දන්නවා. එම නිසා මහජනයාගේ සෞඛ්‍යය ගැන කල්පනා කර මේ බද්ද පැනෙව්වාය කියා නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා කියනවා නම්, ගරු මුදල් ඇමතිතුමා පිළිතුරු දෙන විට කියාවී මේ බද්ද දැම්මේ ඒ අදහස අනුව නොවේය කියා. නමුත් දිනෙන් දින මෙවැනි බදු පැනවීම නිසා මහජනයාට විඳින්නට සිදු වී ඇති කරදර රාශිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මේ මුදල් ඇමතිතුමා නම් දන්නෙ නැහැ. අද මහජනයාට තිබෙන අමාරුකම් දන්නෙ අපියි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු දන්නෙ නැහැ. මහජනයාට තිබෙන අමාරුකම්. මුදල් ඇමතිතුමා ඒ අමාරුකම් දන්නවා නම් මහජනයා තව තවත් දුක්ඛිත තත්ත්වයකට පත් කරන මෙවැනි බදු පනවන්නෙ නැති බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 8.55

කෙනෙමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

Mr. Deputy-Speaker, when I listened to the speech of the hon. Member for Weligama, I could not help feeling that I should criticize the Hon. Minister of Finance for not increasing the price of whisky by another Rs. 10.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(අකුරැස්ස)
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)
(Dr. S. A. Wickremasinghe—Akuressa)

Whisky speaking!

ජයවික්‍රම මයා.
(திரு. ஜயவிக்ரம)
(Mr. Jayewickreme)

What about *kasippu*?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I am not at this late stage trying to enlighten the hon. Member for Weligama on the policy of the Communist Party. It is very difficult to describe light to the blind. We made ourselves very clear. We support the general structure of the Budget, its development aspects and certain progressive measures. We were opposed to certain taxes and we said so then. We voted against them. We think that those taxes might have been justified if the Government had taken action against foreign capital, but in the light of the Government's failure to take that action we cannot support those particular taxes.

The hon. Member for Nuwara Eliya (Mr. T. William Fernando) made a very eloquent speech in the anti-smoking cause. He warned against lung cancer and so on. I myself am a very heavy smoker. I have read publications by members of the medical profession against smoking and I have also consulted the opinion of my Party leader. They frightened me so much that I immediately gave up reading these publications and I do not read any more on this subject.

I am personally very badly hit by this tax. To make matters worse, after the announcement of this tobacco tax I happened to go out of this Chamber with the Hon. Minister of Finance who promptly asked me to lend him a cigarette. That is adding insult to injury! Apart from putting up the price of my cigarettes he even borrowed a cigarette from me.

Although I am one affected by this tax I still do not think that any reasonable person can object to it. But what I do object to is this. Now that you are following the policy of taxing cigarettes, please consider taking over the Ceylon Tobacco Company and making the manufacture of cigarettes a state monopoly. I pointed out that the Ceylon Tobacco Company which is virtually monopolising the manufacture of cigarettes today is making large profits. Last year their gross profit was Rs. 20 million and their nett profit was a little over Rs. 7 million. I do not see why this Government cannot take over the manufacture of cigarettes.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)
And run at a loss!

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
No, Sir, you cannot help but make profits in this venture. In wholesale trade the Government is establishing certain monopolies, and also in the matter of arrack. I do not see why the Government cannot establish a monopoly in the production and sale of cigarettes, because every attempt by Ceylonese to enter into the production of cigarettes had to come up against the Ceylon Tobacco Company and they have all gone to the wall. [බාධා කිරීම්.] For the last two months most of these companies have stopped production.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)
Aberdeen is dying!

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
This is an old fight from the days of Mr. A. E. Goonesinha.

This increase is completely justified if you take over the Ceylonese Tobacco Company and establish a State monopoly in the production and sale of cigarettes. I ask that that should be done, but I do not think anybody can in conscience vote against an increase in the price of cigarettes.

The hon. Member for Weligama (Mr. Jayewickreme) is now talking of responsiveness to the people. I

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

suppose he objects to the ceiling on incomes at Rs. 3,000 as a big blow on the people. I suppose he might even object to the increase in the price of whisky by Rs. 5 a bottle as a big blow on the people.

After all, even when the U. N. P. was in power I think they increased the price of cigarettes. Cigarettes have been fair game for all Governments. Do not try and pretend that this is the only Government that increased the price of cigarettes.

අ. භා. 9

ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)
(திரு. ரி. பி. எம். ஹெரத்—வளப்பனை)
(Mr. T. B. M. Herath—Walapane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දුම්කොළ බද්ද ගැන වැදගත් සාකච්ඡාවක් කරන මේ වේලාවේදී මටද ඊට සහභාගි වීමට සුළු කාලයක් දෙන ලෙස තමුන්නාන්සේගෙන් ඉල්ලනවා. දුම්කොළ බද්ද වැඩි කිරීමෙන් බලාපොරොත්තු වන්නේ යම් කිසි ආදායමක් රජයට ලබා ගැනීමයි. ඇත්ත වශයෙන්ම සෞඛ්‍ය තත්ත්වය ටත් හානියක් කර ගනිමින් කිසිම වුවමනාවක් නැතිව නිරපරාදේ යම්කිසි පිරිසක් විසින් දුම් පානය කරනවා නම් ඒ අය ගෙන් රටට ප්‍රයෝජනවත් වැඩ කටයුතු සඳහා යම්කිසි බද්දක් අය කිරීම අසාධාරණ යයි අපට පෙනෙන්නේ නැහැ. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) වැනි කෙනෙක් මීට විරුද්ධ වීම ගැන මම පුදුම වෙනවා. වුවමනාවට වැඩියෙන් නාස්ති කරනු ලබන මුදල්වලින් රටට ප්‍රයෝජනවත් වැඩ කටයුතු සඳහා යම්කිසි මුදලක් ඉතිරි කර ගැනීමට දැන් අපට අවශ්‍ය වී තිබෙනවා. ඒ අනුව එක අතකින් රටට ප්‍රයෝජනවත් වැඩ කටයුතු සඳහා මුදලක් ලබා ගන්න අතර අනෙක් අතින් මෙය රටවැසි ජනතාව ධුම පානයෙන් ආරක්ෂා කර ගැනීම පිණිස ගත් පියවරක් වන බව අපි විශ්වාස කරනවා. එංගලන්තය ආදී ශීතාධික රටවල උදවිය ඒ ශීතල දේශගුණය ඉවසා ගැනීමට අපහසු නිසා ධුම පානය කළත් අපේ ලංකාව වැනි සර්ම කලාපික රටවල උදවියට ධුම පානය අත්‍යවශ්‍ය යයි අපට පිළිගන්නට පුළුවන්

[ටී. බී. එම්. හේරත් මයා.]

කමක් නැහැ. කෙසේ වුවත් එංගලන්තයේ විධියට අදිමින් පළදිමින්, කමින් බොමින්, ජීවත්වන්නට උත්සාහ කරන වැලිගම ගරු මන්ත්‍රීතුමා (මොන්ටේගු ජයවික්‍රම මයා.) වැනි උදවියට නම් දුම්බීම වුවමනා කරනවා ඇති. නමුත් ලංකාවේ හැටියට ජීවත් වීමට අදහස් කරන උදවියට සිගරට් නොබී ඕනෑ හැටියේ ජීවත්වන්න පුළුවන්.

ජයවික්‍රම මයා.
(திரு. ஜயவிக்ரம)
(Mr. Jayewickreme)

පගා අරගෙන ජීවත්වන්න පුළුවන්.

හේරත් මයා.
(திரு. ஹெரத்)
(Mr. Herath)

පගා නොවෙයි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඊටත් වඩා දූෂණ වැඩ කළ බව මේ රටේ මහජනතාව දන්නවා. ඒ හේතු කොටගෙන එදා තමුන්නාන්සේලාව අටට බැස්සෙව්ව බව අමතක වීම පුදුමයක්. අද කඩදාසි කූට්ටමේ අටේ කොලයට කියන්නේ යු.එන්.පී. කොලේ බව තමුන්නාන්සේලා දන්නවාද?

මෙහිදී විශෙෂයෙන් සඳහන් කළ යුතු වැදගත් කරුණක් තිබෙනවා. ඒ කරුණු විශෙෂයෙන් මුදල් ඇමතිතුමාගේ සැල කිල්ලට යොමුවනු ඇත කියා මම බලාපොරොත්තු වෙනවා. මේ දුම්කොළ බද්ද වැඩි කිරීමෙන් අප බලාපොරොත්තු වන ආදායම ලබා ගැනීමට නම් හරියාකාර වැඩ පිළිවෙලක් ඒ සම්බන්ධයෙන් ඇති කරන්න ඕනෑ. අද මේ බද්ද වැඩි කිරීම නිසා දුම්කොළ සමාගම් අමුතු ව්‍යාපාරයක් ගෙන යන බව දුම්කොළ වවන ප්‍රදේශයක සිට එන මන්ත්‍රීවරයකු හැටියට මම හොඳින්ම දන්නවා. මීට කලින් මොන තරම් විශාල ප්‍රමාණයක් දුම්කොළ වැව්වත් කිසිම ප්‍රශ්නයක් නැතිව ඒ සියලුම දුම්කොළ, දුම්කොළ සමාගම් විසින් මිලට ගන්නට යෙදුණා. විකිණීම සඳහා ගෙන ගිය තරම් සියල්ලම ගත්තා. නමුත් අද එක ගබඩාවකින් ගන්නේ දුම්කොළ රාත්තල් 3,000ක් පමණයි. ඒ ගබඩාව හිමි ගොවීන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හේරත් මයා.]

අක්කර 8ක පමණක් දුම්කොළ වවන්නය කියා නියෝග කර තිබෙනවා. ගබඩා නැති ඊට පිටස්තර කිසිම කෙනකුට දුම්කොළ වවන්න එපාය කියා නියම කර තිබෙනවා. එම නිසා පිටස්තර අය දුම්කොළ යැවිවත් ඒවා අර ගබඩාව මගින් මිලයට ගන්නේ නැහැ. දුම්කොළ රාත්තල් හාර ලක්ෂයක් පමණ නිපදවූ මගේ කොට්ඨාශයට දැන් මේ අළුත් නියෝගය නිසා දුම්කොළ රාත්තල් ලක්ෂයකට වැඩිය නිපදවන්නට පුළුවන්කමක් නැහැ. එතකොට ලක්ෂ තුනකට ලැබෙන්නට තිබුණ බදු මුදල සම්පූර්ණයෙන්ම නැතිව ගිය බව ගරු මුදල් ඇමතිතුමාට පෙනෙනවා ඇති.

සමහර විට මෙය ඒකාධිකාරී කුමන්ත්‍රණයක් වෙන්න පුළුවන්. එම නිසා ඒ කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙල කඩා බිඳ දමා දුම්කොළ වවන ගොවීන්ට නියම විධියට ඒවා වැවීමටත් අලෙවි කර ගැනීමටත් අවස්ථාවක් ඇති කරන්න ඕනෑ. එසේ නොකොළොත් අප බලාපොරොත්තු වන ආදායම කවදාවත් ලබා ගන්නට බැරි බව ගරු මුදල් ඇමතිතුමාට දන්වන්න කැමතියි. එක අතකින් ආදායම නොලැබෙන අතර අනික් අතින් ගොවියා අමාරුවේ වැටෙනවා. එම නිසා මෑද කොළඹ දෙවන ගරු මන්ත්‍රීතුමා (කේනමන් මයා.) කිව්වා වාගේ ඒ දුම්කොළ සමාගම් සමග සටනක් කර අපේ දුම්කොළ වවන ගොවියාත් එයින් ලැබෙන ආදායමත් ආරක්ෂා කර ගැනීම පිණිස යම්කිසි පියවරක් ගැනීමට අපි දැන් ලෑස්ති වන්න ඕනෑ. එසේ නොකොළොත් දුම්කොළ වවන ගොවියා අමාරුවේ වැටෙන අතර, රජයට ලැබෙන ආදායමක් නැතිව යනවා. රජය පෙරළන්නට ලෑස්ති වී සිටින උදවියත් දුම්කොළ සමාගම්වල ඒ කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙලට අනුබල දෙන බවක් අපට දැන ගන්නට ලැබී තිබෙනවා. එම නිසා ඒ වැඩ පිළිවෙල කඩා බිඳ දමා දුම්කොළ වවන ගොවියා ආරක්ෂා කර ගැනීමටත්, දුම්කොළවලින් රජයට ලැබිය යුතු බද්ද ලබා ගැනීමටත් ඉතාමත් ඉක්මනින් යම්කිසි ක්‍රියා මාර්ගයක් ගත යුතු යයි ඉල්ලා සිටින අතර පනවා ඇති මේ දුම්කොළ බද්ද ගැන අපේ සාමාන්‍ය මහජනතාව වෙනුවෙන් අපේ එකඟත්වය ප්‍රකාශ කරනවා.

අ. භා. 9.5

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

We agreed not to debate this, but having debated thus far, I only wish to deal with one or two particular points. I do not propose for a single moment to re-debate the Budget all over again or to go into the rights and wrongs of the taxes which have been imposed. I wish to say this: The hon. Member for Weligama (Mr. Jayewickreme) thought that he had made a very clever point in replying to the hon. Member for Nuwara Eliya (Mr. T. William Fernando) with regard to what he calls his health question. He asked whether one should not conduct a lung examination before one started to impose taxes in regard to tobacco. May I riposte with the very obvious remark that I do not think that my counterpart, the hon. First Member for Colombo South (Mr. J. R. Jayewardene), when he was Minister of Finance here, conducted a stomach examination before he increased the price of rice.

ප්‍රශ්නය විමසන ලදී.

කට හඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகநாயக்க)
(Mr. W. Dahanayake)

Divide !

48 වන ස්ථාවර නියෝගය යටතේ මන්ත්‍රී මණ්ඩලය—පක්ෂව 19; විරුද්ධව 5; යනුවෙන් —බෙදුණේ ය:

කල්තැබීම

48 වන ස්ථාවර නියෝගය යටතේ මන්ත්‍රී මණ්ඩලය—පක්ෂව 19; විරුද්ධව 5; යනුවෙන් —බෙදුණේ ය.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 9.7 ට, 1961 අගෝස්තු 16 වන දින සභාසම්මතිය අනුව, 1961 අගෝස්තු 25 වන සිකුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

කම්කරු විනිශ්චය සභාවල වැඩ ඉක්මන් කරවීම

195/61

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා (බොරැල්ල)

(டொக்டர் டப்ளியு. டீ. சில்வா—பொறல்ல)

(Dr. W. D. de Silva—Borella)

කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) යම්කිසි සේවකයෙක් ස්වාමි පක්ෂය විසින් සේවයෙන් අස් කළ විට දැනට නිබෙන කම්කරු නීති රීති අනුව සේවකයාගේ අසිතිවාසිකම් ලබාගැනීමට කරුණු ඉදිරි පත් කළ යුත්තේ "ලේබර් ට්‍රිබියුනල්" නමැති කාර්මික උසාවිවලට බව එතුමා දන්නවාද? (ආ) කම්කරුවන්ට මෙම කාර්මික උසාවියෙන් තීරණයක් ලබාගැනීමට මාස හයකටත් අධික කාලයක් ගත වන බවත්, මෙම කාලය ගත වීම නිසා සේවකයින්ට හා කම්කරු සමිතිවලට විශාල කරදර සිදු වන බවත්, එතුමා දන්නේද? (ඉ) මේ උසාවිවල කටයුතු ඉක්මන් කරවීමටත්, තීරණයක් ඉතාමත් ඉක්මනින් ලබා දී සේවකයින්ගේ හා කම්කරු සමිතිවල කරදර නැති කිරීමටත්, එතුමා ක්‍රියා කරනවාද? එසේ කරන්නේ කවදාද?

ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන (කම්කරු හා ජනසතු සේවා පිළිබඳ වැඩ බලන ඇමති)

(கௌரவ எம். பீ. டி சொய்ஸா சிரிவர்தன—தொழில், தேசியமய சேவைகள் அமைச்சர்)

(The Hon. M. P. de Zoysa Siriwardena—Acting Minister of Labour and Nationalized Services)

(අ) සේවයෙන් පහ කළ දින සිට මසක් ඇතුළතදී සේවයෙන් පහ කරනු ලැබූ කම්කරුවකුට සහනය පතා කම්කරු විනිශ්චය සභා වෙත ඉල්ලීමක් කිරීමට කාර්මික ආරාවුල් පනත යටතේ ඉඩකඩ ඇත. (ආ) සමහර අවස්ථාවලදී කම්කරු විනිශ්චය සභා මගින් නියෝගයක් ලබා ගැනීම පිණිස සමසකට අධික කාලයක් සිටීමට සේවකයන්ට සිදු වී තිබේ. (ඉ) කාර්මික ආරාවුල් රෙගුලාසි සංශෝධන කිරීමෙන් සහ අතිරේක කම්කරු විනිශ්චය සභා පත් කිරීමෙන් යන දෙමගින්ම කම්කරු විනිශ්චය සභා ඉදිරියේ ඇති ඉල්ලීම් ගැන කඩිනමින් කටයුතු නිම කිරීම සඳහා දැනටමත් ක්‍රියා කර ඇත.

(*a*) It is open to any worker who is dismissed from service in terms of the Industrial Disputes Act to make application for relief or redress to a Labour Tribunal within three months of his dismissal. (*b*) In some cases employees have had to wait for more than six months to get an order from the Labour Tribunal. (*c*) Steps have already been taken to expedite the disposal of applications before Labour Tribunals both by amending the Industrial Disputes Regulations with regard to procedure and by the appointment of additional Labour Tribunals.

ලංගම රියැදුරු හා කොන්දොස්තර බල පත්‍ර

196/61

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා

(டொக்டர் டப்ளியு. டீ. சில்வா)

(Dr. W. D. de Silva)

කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංගමයේ රියැදුරන්ගෙන් හා කොන්දොස්තර වරුන්ගෙන් තම රියැදුරු හා කොන්දොස්තර බලපත්‍ර අවුරුදුපතා අළුත් කිරීමේ ක්‍රමයක් ක්‍රියාවේ යෙදවීමට අදහස් කරන බවත්, ඒ සඳහා රියැදුරෙකු විසින් රුපියල් 15ක හා කොන්දොස්තර කෙනෙකු විසින් රුපියල් 5ක මුදලක් අවුරුදු පතා ගෙවීමට නියම කිරීම අයුක්තියක් බවත්, එතුමා දන්නවාද? (ආ) මෙය වහාම නතර කිරීමට ක්‍රියා කරනවාද? එසේනම් කවදාද?

ගරු ද සොයිසා සිරිවර්ධන

(கௌரவ டீ சொய்ஸா சிரிவர்தன)

(The Hon. de Zoysa Siriwardena)

(අ) නැත. (ආ) මේ ප්‍රශ්නය පැන නොනගී.

(*a*) No. (*b*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලිඛිත පිළිතුරු

ලංගම ජනසතු සේවය කඩාකප්පල් කිරීමට දරන ප්‍රයත්න

197/61

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)

කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංගම ජනසතු සේවය කඩාකප්පල් කිරීමට සමහර නිලධාරීන් ක්‍රියා කරන බව එතුමා දන්නේද? (ආ) එසේ නම් එය වළක්වා

ලිඛිත පිළිතුරු

ලීමට ගන්න ක්‍රියා මාර්ගය කුමක්ද? කවදාද?

ගරු ද සොයිසා සිරිවර්ධන
(கௌரவ டி சொய்ஸா சிரிவர்தன)
(The Hon. de Zoysa Siriwardena)

(අ) නැත. (ආ) එහෙත්, නියත වශයෙන් එවැනි කිසියම් අවස්ථාවක් පෙන්වා දුනහොත්, ඒ ගැන සුදුසු ලෙස ක්‍රියා කරනු ලැබේ.

(*a*) No. (*b*) If, however, any specific instances are cited, appropriate action will be taken.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

1961 අගෝස්තු 25 වන සිකුරාදා

Take the question of police housing. There has been a little improvement in Colombo, but generally speaking even in Colombo, and outside Colombo, the most abyssmal conditions exist, and even though we often clash with the police we are sorry to see the conditions under which they have to live. Very often when an officer is transferred from one place to another he has to go in search of a house and find there is none, and his children find no accommodation in schools. There are certain married quarters attached to police stations but they are nothing more than glorified hostels and in the case of bachelors they all have to live together in a dormitory. This is the position even in the heart of Colombo. It is terrible that officers who are called upon to work at all hours and called out at all hours should have to live under these conditions.

Then again, why is it that there is so much corruption in the police ? The reason is that the police force is chronically in debt. I made a survey of a number of police stations including the Depot Police in my area, and talked to police officers of all ranks from constables up to inspectors, and I can say that 85 per cent of them are heavily in debt, not merely because they are trying to live at false standards but because they find it very difficult to manage with the money they get. When you have a police force chronically in debt, when you do not have a system even of assisting them through governmental organizations corresponding to the Lady Lochore Fund, to solve the problem of debt, do you wonder that they try to solve the problem through these racketeers, gangsters, bootleggers and various other criminal, undesirable elements ?

There is also the question of police training. The structure, the administration, the training of the force, their pay—all these matters—have to be gone into, and it is for that purpose that we need a commission. If we are able to clean up the mess there, then I feel we will have a better force and better relations between the force and the public.

Secondly, let us have a better machinery for dealing with complaints against the police. And thirdly let us have better administration from the point of view of controlling the conduct of police officers.

Most people think that what we want is another commission to go into all these complaints all over again. I do not see any purpose in that unless of course there is some terrible, glaring thing like that case which arose in the Matara Police Station, which was raised some years ago by my Friend the Member for Akuressa (Dr. S. A. Wickremasinghe), where certain police officers were guilty of serious crime. If

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

there is a glaring outrage, a commission is needed, but otherwise there need only be stronger administrative measures and a reorganization of the force. It is useless having inquiries years afterwards.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. சில்வா)
(Dr. W. D. de Silva)

There have been police excesses, but I must say that the lower rungs and the inspectorate are doing a fairly good job of work. Although there have been cases where constables and inspectors have assaulted the public, the general rank and file and the inspectorate are trying to do a good job of work. I remember a certain period in history when a certain Minister went to the extent of calling the Police, "පොලිස් බල්ලෝ." You may remember the occasion. Later the police objected. There was a rumpus, and the Minister had to withdraw those words. But I must bring this point clearly into view, and that is that the policemen and the inspectors are not paid a decent wage. You cannot expect an officer to do a good job of work continuously and for a long stretch, sometimes in an outstation, if he does not receive a decent wage. In the present society an officer has to maintain his respect and upkeep his house and family. All those family matters have to be looked into. His mind is also engaged in the affairs of his home. If those conditions are not fully satisfied—I will not say, fully satisfied ; I will say, fairly satisfied—then it is not fair for us to expect that man to do his work efficiently. That is the first point I make.

My second point is that the rank and file of the police force should be allowed to form themselves into organized trade union bodies. Some people will think that this is an extraordinary request that I am making, but the position today is that police officers cannot organize themselves into a trade union. You will appreciate that society today is not the same as it was in colonial times. In colonial times the English considered the Army and the Police Force as units to be used against the people. The English allowed them special rights and special facilities, but did not give them the right to organize themselves. The position today is different. The Government has declared that it is progressing on socialist lines. As such you will appreciate that the police will come into closer contact—and friendly contact—with the people. Police officers should, therefore, enjoy the same rights that other Government servants enjoy. One of the basic rights that other Government servants enjoy, one of the basic rights of workers is to get together and organize themselves, to discuss their affairs collectively and, if necessary, even to take action collectively. That right is not enjoyed by police officers. As they do not enjoy that right, they are unable to agitate for better wages and conditions of service. I can tell you that there is much dissatisfaction in the rank and file of the police force in regard to this question.

The third point that I want to make is this. Certain people blame the rank and file of the police force for their actions. I would say that some of them are forced to act because of pressure from the top or pressure from outside. I can point to a case where I myself was concerned.

Before I came to Parliament this week, a police officer came to me one day and told me that a statement had been made against me at the Maradana police station. This was after I had crossed over to this side of the House. The statement recorded was that I had taken somebody's photograph—I will not mention the person's name—by force, and that I had tried to molest that person, who had resisted. This particular photograph had been taken by me about two weeks before I crossed over. I was not aware of the Budget proposals at that time, as the Hon. Minister of Finance will appreciate. I had taken this particular photograph for a meeting, at

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

which I exhibited the photographs of important personages. But after I had crossed over, a certain dried fish *mudalali*, who has very important connections—his name is Moulana—had persuaded this poor old woman, whom I had helped for a long time, to go to the police station and make a complaint. The police had no alternative but to record my statement. It was well and good that I was a Member of Parliament and I knew what I was about but the average man might have fared badly in the circumstances.

I must, however, place on record the fact that, so far, the Inspector-General of Police has been acting fairly. I am not saying this because the Inspector-General of Police happens to be here. I do not know how he will act in the future. There was an incident at Bandarawela, I think, where the workers were being harassed by the police officers concerned because the superintendent of the estate opposed their organizing themselves into a trade union. I telephoned the Inspector-General of Police immediately and he took the necessary steps. I think the position there has improved. I must say that, so far, the Inspector-General of Police has acted fairly. I hope he will not give us cause to criticize him in the future. I hope he will take these comments seriously and advise the Government to maintain a much better police force.

පී. ද එස්. කුලරත්න මයා. (අම්බලන්ගොඩ)

(திரு. பீ. டி எஸ். குலரத்ன—அம்பலாங்கொட)

(Mr. P. de S. Kularatne—Ambalangoda)

I feel it my duty to place before this House an incident that took place at the Ambalangoda police station. I wish, especially, to draw the attention of the hon. Parliamentary Secretary and the Hon. Prime Minister to this incident.

Some months ago—I believe it was on the 30th June 1960—some people had come in a van to the police station to make a statement. This was about midnight. At the same time, the police station had received information that the officer-in-charge of the Meethiyagoda Police Station had been assaulted by certain people. The people who were in the police station were suspected of this assault, and the police detained the whole party in the Ambalangoda Police Station. The van and its driver were also detained.

The important facts are these : On the morning of the 1st July, the police found it necessary to take a number of these people to the Balapitiya Hospital because they had been assaulted by someone. They had been very badly assaulted. The doctors in charge found it necessary to ask the police to take one of these people who had suffered from assault, to the Galle Hospital. The man died on the way to the hospital.

I ask the hon. Parliamentary Secretary whether it is not clear that a murder has been committed at the Police Station, Ambalangoda. These people were in the custody of the police when this incident took place. The police took action. They prosecuted the men whom they suspected of this murder. All these men were acquitted. I say that if the police of this country cannot bring to book the people who were responsible for an assault which took place inside a police station, what can we expect of police officers when murders take place outside ? The man was assaulted and murdered by somebody. Was it by a ghost that the man was assaulted, or was it by the officers in charge ?

I ask the hon. Parliamentary Secretary to appoint a committee of inquiry to find out the circumstances under which this man met with his death. I must say that I regret very much that even the relatives of the deceased have taken no interest in the matter. I do not want to make allegations about this conduct, but I found it difficult to get a copy of the magisterial proceedings from a brother of the deceased. They are very silent. There is something hush-hush about this matter.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කුලරත්න මයා.]

I am, therefore asking the hon. Parliamentary Secretary to see that an impartial committee of inquiry is appointed, not a committee of police officers. I believe it is quite possible that superior officers in the police may have inquired into the matter, but no action has been taken except to transfer from the Ambalangoda Police Station the constables and officers who were there at that time. That is all the action that has been taken. by the police. Apparently, they cannot take any other action for lack of evidence or whatever other reason. I think if a committee is appointed it will be able to inquire into this matter carefully and report to us the circumstances under which this man met with his death.

I appeal to the hon. Parliamentary Secretary to take necessary action in this matter.

පූ. හා. 11.30

ටී. ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා. (මීගමුව)
(திரு. ரி. குவெண்டின் பெர்ணண்டோ—நீர் கொழும்பு)
(Mr. T. Quentin Fernando—Negombo)

There was a time—I believe it was the "Dowbiggin period"—when promotions in the police fosce depended on the number of prosecutions ; that is, the officer who secured the largest number of convictions was the man to be promoted. As a matter of fact we know that that state of affairs continued for a long time and I am glad to say that that is not happening now. A man to be promoted in the police force now has to give a good account of himself, and his services to the country are considered before he is promoted.

The present I.G.P. too has not failed in his duty in the matter of considering what is most important for promotion. It is not the number of convictions that an officer secures in a court of law. During former days it often happened that the Magistrate or Judge easily detected police officers who brought cases before courts having coached witnesses to give false evidence for the purpose of securing convictions. The police officers considered that to be very good because by that means they expected to secure promotion in the force. Things have changed completely now and I am very happy to say that the present police officers are not of that type.

I am only worried about one thing. We all know the amount of work a police officer is expected to carry out. His duties are arduous and he has got to be at the "beat" in the sun and rain for a number of hours a day. But what is the salary that he is getting now ? It is very inadequate, indeed. I think the police force is one that is being poorly paid—specially the constables, sergeants and some of the inspectors. I would strongly urge, therefore, that there should be a revision of salaries in the case of police officers specially in the lower rungs.

I also feel that the attitude of members of the police force has improved much.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

During the S. L. F. P. regime.

ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා.
(திரு. குவெண்டின் பெர்ணண்டோ)
(Mr. Quentin Fernando)

They are very polite in dealing with the public ; but I do like to point out that there are some black-sheep too in the force who do not treat the people as they should be treated. They are very arrogant ; a few of them do not know even how to speak to people and they treat them like dirt. However these are very few cases which could be looked into by the I. G. P. and matters remedied.

I would like to mention a very common occurrence. When a policeman contacts a member of the public and the member of the public finds fault with him for certain actions, the policeman thinks that he is not treated properly. He seems to think that every action of the member of the public causes obstruction to him and that person is taken to the police

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

station and charged with obstruction. I do not think that that is the correct attitude for members of the force—I am not talking of those in the lower rungs—to take. They should be more considerate and they should not rush to conclusions and think that according to their conceptions of the law those persons have caused obstruction to the police. Obstruction is a very wide term, no doubt, but they do not understand what it means. I believe if the I. G. P. sends a circular to the A. S. Ps and Inspectors that they should remedy their ways of behaviour towards the public it would be very welcome.

Another matter to which I should like to refer is this. An year ago, during the last Budget Debate, I pointed out the fact that the premises in which police constables are expected to live were not at all satisfactory. I believe, at that time, I pointed out the fact that in my constituency the bachelors' quarters of policemen consisted of a cadjan shed. These police officers are surely not expected to live huddled together in cadjan sheds ?

During the time of Sir Richard Aluvihare a number of buildings were put up for the police force. For instance, in the Maradana Police Station you find a set of new flats to provide quarters for the police force. During the time of the present I. G. P. some police stations have been constructed and new buildings have come up. But my point is this : that the I. G. P. must make an attempt to get the necessary funds from Government to put up new buildings where there are no quarters. It is absolutely essential and I press for it.

For one long year I have been agitating for a new building to house policemen in Negombo. Nothing has been done. I know that there are policemen who are compelled to live outside the police station premises. They are expected to come at the dead of night or in the early hours of the morning to the police station to take up duties. This is not a satisfactory state of affairs, I should think. Therefore I do urge that the Government should be more considerate towards these poor Policemen who have no quarters to live in. Even in the case of married people I do not think it is satisfactory to allow them to live in congested premises.

I hope that this time, after one year has elapsed, the I. G. P. would take the necessary steps to put up buildings in the Negombo Police Station premises to house the policemen and sergeants. I do not say that it should only be done in Negombo. He should look into the matter carefully and wherever he finds that there are no quarters provided for policemen it is absolutely necessary that they should be put up. I would insist that the I. G. P. should put up some quarters at the Negombo Police Station premises during the course of the year.

විජයබාහු විජයසිංහ මයා. (මීරිගම)
(திரு. விஜயபாஹு விஜயசிங்ஹ—மீரிகம)
(Mr. Wijayabahu Wijayasinha—Mirigama)

I would like to say just a few words on the question of housing for policemen. I strongly support the hon. Member for Negombo in that matter. If police officers are not provided with quarters, specially in outstations areas, they have to live in rented houses. Often complaints are made that landlords influence the policemen in the performance of their duties and as such it is very necessary that housing should be provided for policemen particularly in the outstations. In my own constituency Mirigama, the Mirigama Police Station has not sufficient or adequate quarters for the policemen, and in consequence, a large number of them have to live outside. The barracks for police constables at the Mirigama Police Station are very old, and I would strongly urge that the Inspector-General of Police be requested to consider the construction of proper quarters for the policemen at Mirigama. There is sufficient Crown land available. There is also a Government building scheme in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයබාහු විජයසිංහ මයා.]

progress, and I trust this matter will receive attention.

I would like to mention another matter that affects specially constables and sergeants, the ranks below that of Inspector. These men have to serve long hours of duty, particularly when they are sent from the Depot to places where various functions take place, for example during Poson to Anuradhapura and during the season to Kataragama. The Depot Police provides the personnel, but these men are not paid overtime and they have to work sometimes for fifteen to twenty hours at a stretch. I would like that matter also to receive attention.

The hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena) mentioned about the Katunayake Airport. I think the Royal Ceylon Air Force is also at the moment occupying that airport. But those buildings have been lent to us by the Royal Air Force, and as a civilian airport I do not think the Civil Aviation Department could possibly occupy all those buildings. I think the Royal Ceylon Air Force should also be there. At the same time as a Member of the Government party I can tell the hon. Member for Avissawella—I had a discussion recently with the Hon. Minister of Transport and Works regarding the Katunayake Airport and he too assured me—that within twelve months Katunayake would be the best international airport in the East, and will be able to accommodate the latest and the biggest planes in the world. [*Interruption*]. I say that as a Member of the Government party. I know that plans have already been approved, and with the help of loans and grants from the United States of America the construction of the airport will commence very soon, and when completed it would take a worthy place as the best airport in the East, of which we should be very proud.

Next, I would strongly support the hon. Member for Avissawella in his appeal for the release of the Members of the Federal Party. As a Member of Government I say I do trust this matter will receive its attention. Whatever may have happened, this is a national issue. Therefore, we will get together, irrespective of party inclinations, and settle this problem once and for all and release the Members of the Federal Party and all others from the North who are now in prison or under detention. Let us bring the Members back to the House so that this House will have representatives of all the people of this country.

ඒ. රත්නායක මයා. (වත්තේගම)
(திரு. ஏ. ரத்னயக்க—வத்தேகம)
(Mr. A. Ratnayake—Wattegama)

I would like to refer to a matter to which I referred last year also; and that is, the serious increase of crime in this country. From 1956 the number of murder cases reported has been on the increase. From 477 in 1956, the figure went up to 527 in 1957, and 703 in 1958. The year 1959 must have been a record year. I do not think there are figures available. It may have been more than 2,000 with the communal riots in that year. The position is similar with regard to attempted murder and other serious crimes.

There was a movement—I am glad the Inspector-General of Police is here—some time ago there was a movement to enable the police to work in close co-operation with the rural organizations, like rural development societies, community centres and the like, and take a very keen interest in the suppression of crime. I remember it started in a village in Kegalle and it was very successful. They started sports clubs and organized various games; there were volley-ball clubs and clubs for rural development activities, and the movement was spreading.

பு. ப. 11.45

I am sorry to say that that same degree of enthusiasm for the education of the rural people is now absent. I do not blame the police officers, for the simple reason that they are today suffering from a sense of frustration. Some of them feel that if there is a very grave crime committed and if some action is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

taken, political forces get to work and instead of allowing the course of justice to proceed the police are compelled to take no action. Therefore, there is that sense of frustration, which I would wish to bring to the notice of the hon. Parliamentary Secretary.

For instance, in the year 1958 there had been these various rural organizations. There were conciliation boards settling minor disputes in the villages. They had settled 40,731 cases in 1958. In the following year the figure dropped to about 1000-odd. It does not mean that there were no serious or small disputes in the villages within that year, but the fact is that the police officers are suffering from a sense of frustration. I think the department should inquire into these matters and give a new sense of direction. After all, as hon. Members have pointed out, it is not only a matter of suppression of crime but also a matter of re-education of the people, and if the police officers come in close contact with the rural people I think this serious increase of crime in this country can be arrested.

One of the things I have noticed in the villages is the large number of illicit liquor booths. I am sorry to say that in certain villages where there was not a single booth of this type, there are about ten or twelve today. The police feel utterly helpless to deal with these cases, because these places are also political centres. The police feel that they are utterly helpless to deal with that situation also.

I feel that this movement which was organized some years ago, namely, the movement to enable the police to come into intimate contact with the rural people in various ways, through rural development societies, village community centres, and the like, should be resumed under the leadership of the Inspector-General of Police. In this way we might probably be able to arrest the serious increase of crime in this country.

අනිල් මුණසිංහ මයා. (අගලවත්ත)
(திரு. அனில் முனசிங்ஹ—அகலவத்த)
(Mr. Anil Moonesinghe—Agalawatta)

ගරු සභාපතිතුමනි, පොලීසිය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට වුවමනායි. සෑම වර්ෂයක්ම පාසාම මේ ගරු සභාවේදී පොලීසිය ගැන නොයෙකුත් පැමිණිලි කර තිබෙනවා. ඇත්තෙන්ම පසුගිය වජීය පමණ පොලිස් දෙපාර්තමේන්තුවට විරුද්ධව විවේචන එල්ල වූ තවත් වර්ෂයක් නැති තරමැයි කියන්නට පුළුවනි. එයින් යම් යම් ප්‍රතිඵල ලැබී තිබෙන බවත් ඇත්තයි. ප්‍රතිඵල ලැබී නැතැයි කියන්නේ නැහැ. නමුත් එක්සත් ජාතික පක්ෂයේ පාලන යුගයේදී පිහිටුවන ලද අර විශේෂ පොලිස් හමුදාව තවමත් තබාගෙන සිටින බව මට කියන්නට පුළුවනි. යම් යම් අවස්ථාවලදී ඒ විශෙෂ පොලිස් භට හමුදාව කැඳවා ගැම් ප්‍රදේශවල කටයුතු කිරීමට භාර දෙනවා. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව තම හිතවතුන් මෙම විශේෂ පොලිස් හමුදාවට බඳවා ගත්තා. දැනටත් එම පක්ෂයේ පතාක යෝධයන් කෙළින්ම ඉදිරිපත් නොවෙතත්, ලොකු රදළ පවුල්වල අය කෙසේ හෝ මෙම පොලීසියට බඳවා ගන්නවා. මේ අයගේ බලතල නැති කර දමන ලෙසයි, පසුගිය වාරයේදීත් අප ඉල්ලා සිටියේ. කළුතර ප්‍රාදේශීය කොමිටියේදී අප මේ ගැන සාකච්ඡා කළා. පසුව, මෙම විශෙෂ පොලීසිය නැති කර දැමිය යුතුයැයි එම කොමිටිය ඒකච්ඡන්දයෙන් තීරණය කළා. එයින් පසු අපෙන් ඒ ගැන ප්‍රශ්න වගයකුත් අසා එවා තිබුණා. අප ඒ ප්‍රශ්නවලට පිළිතුරු දුන්නා. නමුත් අද වන තුරු ඒ ගැන කිසිම වෙනසක් කර නැහැ.

තවත් කාරණයක් කිව යුතුව තිබෙනවා. පොලිස්පතිතුමා ඒ ගැන සලකා බලනවා ඇතැයි කල්පනා කරනවා. ගැම් ප්‍රදේශවලට යවන පොලිස් නිලධාරීන් ඒ ඒ ප්‍රදේශවල සිටින ලොකු උදවියත් සමඟ හිත මිත්‍ර කම් ඇති කර ගන්නවා. සමහර විට මෙය වළක්වන්නට ටිකක් අමාරු විය හැකියි. ඒ උදවියත් ඉදිරිපත් වී සිටින්නේ එහි කොටසක් වශයෙනුයි. මේ තත්ත්වය නිසා ගමේ ආරාවුලක් ඇතිවූ විට ප්‍රභූවරයා කියන ආකාරයටයි, පොලිස් ස්ථානාධිපතිවරයා ක්‍රියා කරන්නේ. ඇහුම්කන් දෙන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනිල් මුණසිංහ මයා.]

ප්‍රභූවරයා කියන දෙයටයි. මේ නිසා පළාතේ උදවියට හිරිහැර සිදු වෙනවා. හිරිහැර කරන්නට ඉඩ තිබෙනවා. මේ සඳහා නිදර්ශනයක් ඉදිරිපත් කරන්නට පුළුවනි. දැනට අවුරුදු එක හමාරකට පමණ පෙර අපේ ප්‍රදේශයේ දුප්පත් මහලු මවක් බස් එකකින් බසිද්දී වැටීම නිසා ඇගේ අත බස් රථයේ රෝදයට අසුවුණා. එහෙයින් දවස් ගණනක් ආරොග්‍ය ශාලාවේ සිටින්නට ඇයට සිදු වුණා. මේ පිළිබඳව ලංගමයට පැමිණිලි කළා. නමුත් ලංගම යෙන් ලැබුණු උත්තරය නම් එම මහලු අම්මා පොලීසියට දී තිබෙන පැමිණිල්ල ප්‍රමාණවත් මදිය කියායි. මේ කාරණය පිළිබඳව අප තවත් දුරට සෝදිසි කර බැලුවාම පෙනී ගියේ, එම බස් රථයේ රියැදුරු මහතා පොලීසියට ගොසින් එහි සමහර නිලධාරීන් හමු වී ඔහුට වුවමනා අන්දමට කට උත්තර පිළියෙළ කර දුන් බවයි. මෙවැනි දේවල් නොයෙක් විට අපේ පළාත්වල සිදු වෙනවා. ඒ නිසා මේවා නැති කර දමන්නට අප ක්‍රම සලස්වන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, වත්තේගම ගරු මන්ත්‍රීවරයා (ඒ. රත්නායක මයා.) පොලීසිය ගැන කථා කරමින් ඒ ඒ පළාත්වල තිබෙන ග්‍රාම සංවර්ධන සමිති සමග පොලීසි කිට්ටු සම්බන්ධකමක් ඇති කරගෙන වැඩ කරන්නට සැලැස්විය යුතුය කීවා. ග්‍රාම සංවර්ධන සමිති නියම වශයෙන්ම මහජනයාගේ සමිති නම් එම ක්‍රමයෙන් විශාල ප්‍රයෝජනයක් සැලසෙන බව අප පිළිගන්නට ඕනෑ. සමහර ග්‍රාම සංවර්ධන සමිතිවල වැඩ කටයුතු සීමා වී තිබෙන්නේ පොතට පමණයි. සමහර ප්‍රදේශවල මෙම සමිති අල්ලාගෙන සිටින උදවිය ඒවා පෞද්ගලික ආයතන හැටියට පවත්වා ගෙන යනවා. එවැනි අවස්ථාවලදී වත්තේගම ගරු මන්ත්‍රීවරයා කී පරිදි සම්බන්ධකමක් ඇති කර ගැනීමෙන් මහජනයාට ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. සමාජවාදය බලපවත්වන්නාවූ යම් යම් නරක දේවල් පොලිස් දෙපාර්තමේන්තුවට ඇතුල් වන්නට ඉඩ නොදී එය ඇත් කර ගන්නට අපි පුළුවන් සෑම උත්සාහයක්ම ගන්නට ඕනෑ.

පොලීසියට යන කවර තැනැත්තෙකුට හෝ වේවා කථා කළ යුතු අන්දම, සැලකිය යුතු අන්දම, පිළිබඳ විස්තර නොයෙක් නිවේදන මගින් පොලිස් ස්ථානවලට යවන බව එම නිවේදන දැන්වීම් පුවරුවල එල්ලා තිබීමෙන්ම පෙනෙනවා ඇති. මහජනයා පොලිස් ස්ථානවලට පැමිණියාම හොඳිනුත් ශීලාචාර අන්දමිනුත් ඔවුන්ට කථා කළ යුතුය කියා පොලිස්පතිතුමාගේ එම නිවේදනවල සඳහන් කර තිබෙනවා. නමුත් සාමාන්‍ය කෙනෙකු පොලිස් ස්ථානයට ගිය විට කථා කරන්නේ මොන අන්දමටද? පලයන්, වරෙන්, යනාදී වචනවලට වඩා පරුෂ වචනත් පොලිස් ස්ථානවල පාවිච්චි කරන බව අපි දන්නවා. ඒ නිසා මේ විධියට කථා කරන්නට ඉඩ නොදීමට මේ කාලය තුළ දීම අප තීරණය කළ යුතුයයි මා කල්පනා කරනවා. එසේ කථා කරන අයට දඬුවම් කරන්න පොලිස් දෙපාර්තමේන්තුව තීරණය කළ යුතුයි. ඒ අය ඒ විධියට කථා කරනවා නම් ඒ අයගේ සැලකිල්ල කොහොමද කියා අපට හිතා ගන්න පුළුවන් වේවි. ගැමි පළාත්වලින් අපට ලැබෙන එක් පැමිණිල්ලක් තමා මේ. ඒවා ගැන අප වරින් වර දැනුම් දෙනවා. සමාජයේ තිබෙන යම් යම් දුර්වලකම් පොලීසියෙත් තිබෙනවා. සමාජයේ දුර්වලකම් පොලීසියටත් බලපානවා. මේවා පොලීසියට ඉබේම ඇති වූ දුර්වලකම් නොවෙයි. සමාජයේ නැති ඒවාම නොවෙයි පොලීසියේ තිබෙන්නේ. අප යන්නේ සමාජවාදී ගමනක් නම් ඒ සම්බන්ධයෙන් නියම වැඩ පිළිවෙලක් ආරම්භ කරන්න ඕනෑ. පළමුවෙන්ම සමාජ තත්ත්වය දියුණු කිරීමේ වැඩ පිළිවෙලක් ඇති කරන්න ඕනෑ. අප ආරම්භ කළ සමාජවාදී ගමන අවසානය තෙක් නොනවත්වා යන්නට අප කවුරුත් බලා පොරොත්තු වෙනවා. පොලීසියේ අඩුපාඩු මහහරවා ගැනීම එහි එක් පියවරක් විය යුතුයි. මාක්ස්වාදියකු හැටියට මා ඒ බව පිළිගන්නවා. පොලීසිය ඇති වුණේ ධනපති ක්‍රමයේ එක් අංශයක් හැටියටයි. ධනපති ක්‍රමයේ තිබෙන නරක දේවල් පොලීසියටත් බලපානවා. සමාජවාදී පාලනයක් මේ රටේ පිහිටුවා ගන්නට කල්පනා කරනවා නම් ඒ කාර්යය පොලිස් දෙපාර්තමේන්තුවෙන් ආරම්භ කරන ලෙස මා ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා. පොලීසියේත් සුරාබදු දෙපාර්තමේන්තුවේත් උසස් නිලධාරී පක්ෂයෙන් මහජනයාට හිරිහැර කරදර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇති වෙනවා. අන්න ඒ මහත්වරුන් ගෙන් තමයි, ගැමි ජනතාවට වැඩිපුරම හිංසා පීඩා සිදු වන්නේ. ඒවා නැති කරන්නට ආණ්ඩු පක්ෂයේ තමුන්නාන්සේලා ගෙන් සහයෝගය ලැබෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

මුණවීර මයා. (රත්තොට)
(திரு. முனவீர—ரத்தோட்டை)
(Mr. Munaweera—Rattota)

ගරු සභාපතිතුමනි, පොලීසිය ගැන වචන ස්වල්පයක් කථා කරන්නට මා මේ අවස්ථාවේ අදහස් කරනවා. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු කිහිප දෙනකු විසින් පොලීසිය පිළිබඳව කරන ලද ප්‍රකාශවලින් සෑහෙන කොටසක් අප පිළි ගන්නවා. ඒවා ඒ විධියටම සංශෝධනය විය යුතු බවත් අප පිළිගන්නවා.

අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (අනිල් මුණසිංහ මයා.) පොලීසියේ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් විස්තරයක් කළා. අවුරුදු 7-8 කට උඩදී මේ රටේ තිබුණු පොලීසිය මේ රටේ මහජනතාව කෙරෙහි පැවතුණු ආකාරය ගැන කල්පනා කර බලන විට ඉකුත් වූ කාලය තුළ ඒහි සෑහෙන දියුණුවක් ලබා තිබෙන බව අප විසින් අමතක නොකළ යුතු බවත් මේ අවස්ථාවේ මේ ගරු සභාවට මතක් කර දෙන්න ඕනෑ. පොලීසිය සම්බන්ධයෙන් දියුණු කළ යුතු තවත් කොතෙකුත් දේ තිබෙනවා. පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නට පොලීසියට ගියාම සත 50ක් හෝ රුපියලක් දෙනතුරු පැමිණිල්ල පොතේ සටහන් කර ගන්නේ නැතුව පොලීසියේ බංකුවක් මත හෝ එහි අගුවක නැත්නම් මුල්ලක හෝ දුප්පත් ගැමියන් දවසේ පැය 24 ම වාඩි කරවූ අවස්ථා ගැන අපට කොතෙකුත් අසන්නට ලැබී තිබෙනවා. ඒ එදා පැවති තත්ත්වයයි. අද ඊට වඩා වෙනස් තත්ත්වයක්—ඊට වඩා හොඳට මහජනයාට සැලකිල්ලක් දක්වා උනන්දු වෙන් රාජකාරිය කරන තත්ත්වයක්—තිබෙනවා. එහෙත් මේ රට සමාජවාදය කරා යන ගමනක් ආරම්භ කරනවා නම් අපට තවමත් පොලීසිය සම්බන්ධයෙන් සැනසෙන්නටම පුළුවන් තත්ත්වයක් නැති බව ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා.

පොලීසිය ගැන කථා කරන විට මා දන්න හැටියට පොලීසියේ සාමාන්‍ය නිලධාරීන්ට—කොස්තාපල් වරුන්ට, සාජන්ට් වරුන්ට—නීතියෙන්ම අවහිරයක් තිබෙනවා, තමන් රාජකාරිය කරන ප්‍රදේශයේ හෝ වෙන කොහේ හෝ සමිති සමාගම් වලට බැඳී මහජනයා සමග වැඩ කටයුතු කරන්නට නිදහසක් නැති තත්ත්වයක් තිබෙනවා. පොලීසිය නීතියේ දණ්ඩෙන් යටත් කර පාලනය කරන පොලිස්පති වරයා තුළත් උසස් පෙළේ නිලධාරීන් තුළත් ඇත්ත වශයෙන්ම පවතින තත්ත්වය පෙනී යනවා ඇති. එය එසේම නම් එහෙම නීතියක් තිබෙනවා නම් ඒ අනුව පොලීසිය පාලනය කිරීම බොහොම හොඳයි. රටක තිබිය යුතු ඉතා වැදගත් දෙයක් නම් නීති ගරුකත්වය රැක ගැනීම බව කවුරුත් පිළිගන්නවා ඇති. එය රැක ගන්නේ නැතිව සමාජවාදය ඔස්සේ හෝ වෙන යම්කිසි මාර්ගයක් ඔස්සේ හෝ රටක් දියුණු කරන්නට ලැබෙන්නේ නැහැ. පොලීසිය රටක නීති ගරුකත්වය රැකීම සඳහා තිබෙන වැදගත් ආයතනයක්. ඒ නිසා සාමාන්‍ය මහජනයා ගෙන් ඈතට තල්ලු කර දමා ඔවුන් බිය ගන්වා කටයුතු කරන විධියේ හමුදාවක් පොලීසිය යන නමින් මේ රටේ පවත්වා ගෙන යාම අවශ්‍ය යයි හිතනවා නම් එය වැරදි සිතිවිල්ලක් බව පිළිගන්න ඕනෑ.

අධිරාජ්‍යවාදී යුගයේදී මෙන්ම යූ. එන්. පී. කාරයන්ගේ කාලයේදීත් පොලීසිය පාවිච්චි කළේ මොන මොන දේ ආරක්ෂා කරන්නටදැයි ඒ අයත් අපත් කවුරුත් දන්නවා. අද ඒ ගතිගුණ සම්පූර්ණයෙන් සෝදා දමන්නට ඕනෑ. ඒ බව නොයෙක් අවස්ථාවල ඇති වූ නොයෙක් සිද්ධීන් දෙස බලන විට අපට පෙනී යනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

ගරු මන්ත්‍රීතුමා තව කොපමණ වේලාවක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුණසීර මයා.
(திரு. முனவீர)
(Mr. Munaweera)
මට තවත් මිනිත්තු 5ක් විතර ඕනෑ.

ගරු සභාපතිතුමනි, වේලාව ගත වන නිසා මා ඉතා කෙටියෙන් කථා කරන්නයි බලාපොරොත්තු වන්නේ. මා නියෝජනය කරන රත්තොට ප්‍රදේශයේ තිබෙන එකම පොලිස් ස්ථානයේ සිදු වූ සිද්ධියක් නිදර්ශනයක් වශයෙන් ඉදිරිපත් කරන්න කැමතියි. දැන් විරුද්ධ පාර්ශ්වයේ නායක හැටියට ඉන්න ඩඩ්ලි සේනානායක මහත්මයා මීට කලකට පෙර විශාල රැස්වීමක් සඳහා පැමිණෙන බව පල කරන දැන්වීමක් එක්සත් ජාතික පක්ෂයෙන් සකස් කර තිබුණා. "කිරි පැණියෙන් රට උතුරවන්න ඕනෑ නම් නැවත යූ. එන්. පීයට රට භාර දෙන්න" කියා එහි තිබුණා.

ඩඞ්ලි සේනානායක මයා.
(திரு. டட்ளி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)
ඒ ඉකායි කාලයේද?

මුණසීර මයා.
(திரு. முனவீர)
(Mr. Munaweera)
දැනට අවුරුදු ගණනකට ඉස්සර වෙලා වුණු සිද්ධියක්.

ඩඞ්ලි සේනානායක මයා.
(திரு. டட்ளி சேனநாயக்க)
(Mr. Dudley Senanayake)
කොයි කාලයේ සිද්ධියක්ද?

මුණසීර මයා.
(திரு. முனவீர)
(Mr. Munaweera)
දැනට අවුරුදු ගණනකට පෙර ඇතිවුණු සිද්ධියක්. යූ. එන්. පී. එකට විරුද්ධ අපේ වෙළෙන්දෙක් මේ දැන්වීම බලා ප්‍රසිද්ධියේ කිවා, "ඩඩ්ලි උන්නැහේ කිරි පැණි දෙන්නට එනවා, අපි කිරි පැණි කන්නට ලෑස්ති වෙමු" කියා. මේ කථාව අහගෙන හිටපු ලොකු යූ. ඇන්. පී. කාරයන් දෙතුන් දෙනෙක් පොලීසිය සමඟ තිබුණු සම්බන්ධකම නිසා එක්තරා වැඩ පිළිවෙළක් යෙදුවා. ඒ අනුව ඊට පැය 24 කට පස්සේ අර වෙළෙන්දාට පොලීසියෙන් ඇවිත් මහා පාරෙදි ගැහුවා. ඔහුත් පිට කොන්ද තියෙන කෙළින් මිනිහෙක් නිසා ආපහු හැරිලා පොලිස් නිලධාරීන්ට ගැහුවා, තමන්ගේ ආත්ම ගෞරවය ආරක්ෂා කර ගන්නට. ඒ නිසා විශාල ඝට්ටනයක් ඇති වුණා. අන්තිමේදී මේ මනුෂ්‍යයාව පොලිසියට අරගෙන ගිහින් එළිවන තෙක් පොලිසියේදී පහර දුන්නා. අන්තිමේදී මේ මනුෂ්‍යයාව පොලිසියේ බාවා අරක්කු පොවා ඔහුගේ යටි පතුල් පැලෙන තුරු බැටන් පොලුවලින් ගැහුවා. මා එදා හිටියේ ගම්පොලයි. මට පණිවුඩය ඇවිත් මා යන විට ඒ මනුෂ්‍යයාව රිමාන්ඩ් භාරයේ බෝගම්බර හිර ගෙදරට ගෙන ගොස් අවසානයි. ඔහුව බෝගම්බර හිර ගෙදර ඇතුලේ ආරෝග්‍යශාලාවට ඇතුළුකර කකුල් දෙක උඩට සිටින සේ ඇඳ උඩ දමා තිබුණා. එදා රෑ හේමපාල අලහකෝන් කියන මේ මනුෂ්‍යයා පොලීසියේ මරහඬ දි දී කෑ ගැහුවා. නමුත් ඒ පොලීසිය අහලකටවත් එදා අපේ ජනතා වගෙන් කිසි කෙනෙකුට යන්නට දුන්නේ නැහැ. කවුරු හරි ආවොත් මරණ වාය කියා, ගහලා දොරට දමනවාය කියා, පොලීසිය තර්ජනය කළා.

මෙන්න මේ විධියේ අමානුෂික තත්ත්වයක් පොලිසියේ යම් යම් තැන්වල තියෙනවා. ඒ තත්ත්වය නැති කළ යුතුයි. ඒ තත්ත්වය ඇති වීමට තිබෙන හේතු වහාම නැති කළ යුතුයි. මා ගිය අවුරුද්දේ පොලීසිය ගැන කථා කරන විට රත්තොට පොලීසිය දැනට තිබෙන තැනින් වහාම වෙනස් කළ යුතු බව. එසේ වෙනස් කරන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ගෙනුත් කැබිනට් මණ්ඩලයෙනුත් මා ඉල්ලා සිටියා. අද වන තුරු ඒ ගැන පොලිස් දෙපාර්තමේන්තුව කිසිම පියවරක් ගෙන තිබෙනවාද යන්න මම දැන ගන්නට සතුටුයි. රත්තොට නගරයේ පොලීසිය පිහිටා තිබෙන ගොඩනැගිල්ලේ බිත්ති මහ ගංවතුර කාලයේදී පුපුරා යන නිසා පොලීසිය එතැනින් ඉවත් කරන්නය යයි කී විට එවකට හිටි පොලිස් පතිතුමාත් එවකට ඒ පළාතේ සිටි ලොකු මනුෂ්‍යයකුත් අතර තිබුණු සම්බන්ධකම උඩ රත්තොට පොලීසිය රත්තොට නගරයේ සිට හැතැප්මක් ඈත මහා කන්දක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුදුනේ තිබෙන විශාල මන්දිරයකට අර ගෙන ගියා. අද කාර්, බාර් තියෙන ලොකු උන්නැහෙලාට පොලීසියට යන්නට බොහොම ලේසියි. ඒ හැර ටෙලිපෝන් වලින් කථා කරන්නත් පුළුවන. සාමාන්‍ය කෙනෙක් පොලීසියට යන්නට හැතැප්මක් කන්ද නගින්නට ඕනෑ. පොලීසියේ වැඩ කරන සාමාන්‍ය කොස්තාපල් මහත්වරු නගරයට එන්නට හැතැප්මක් පහළට බහින්නට ඕනෑ. අපි මේ පිළිබඳව කොතෙකුත් කරුණු කීවා. රත්තොට ආසනයේ මහජනයාට පොලිස් දෙපාර්තමේන්තුවෙන් යම්කිසි සැලකිල්ලක් දක්වනවා නම්, නගරයේ මහජනයාගේ ශුභ සිද්ධිය සඳහා නගරයේ ආසන්න ස්ථානයකට පොලීසිය ගෙන යාමට වහාම කටයුතු සලස්වන ලෙස අපි ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටින්නට සතුටුයි.

එම පොලීසියේ තිබෙන ඒ තත්ත්වය නිසා අර හේමපාල අලහකෝන් නමැති මනුෂ්‍යයාට අසාධාරණ ලෙස පොලීසියේ බැටන් පොලු වලින් පහර කා මාස ගණනක් බෝගම්බර හිරගෙදර ඇතුළේ ආරෝග්‍යශාලාවේ දුක් විඳින්නට සිදු වුණා. අදත් ඒ මනුෂ්‍යයාගේ අඩිය බිම තියන්නට බැහැ. ඒ මනුෂ්‍යයාගේ ඇකුල්වල අමාරුව අද වන තුරුත් තියෙනවා. නීතියේ රැහැන වැරදි අතට පාවිච්චි කරන නිලධාරීන් නිසා—මා කියන්නේ නැහැ උසාවිය බොරුවක්, වැරැද්දක් කළාය කියා—ඒ අවාසනාවන්ත මනුෂ්‍යයාට හිර ගෙදරට පවා යන්නට සිදු වුණා.

මේ විධියයි තත්ත්වය. මාතලේ පොලීසිය ගැන මා දන්නවා. විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් කලින් මතක් කළාක් මෙන්, ඒ පොලීසියේ නිලධාරීන් විශාල පිරිසක් සිටිනවා. ඒ පොලීසියේ රාජකාරිය කරන කොස්තාපල් මහත්වරුන් හුඟ දෙනකුට ඉන්නට තැනක් නැති බව මම කියන්නට කැමතියි. තැන් තැන්වල ගෙවල් කුලියට අරගෙන ජීවත් වන මේ නිලධාරීන්ට සෑම වේලාවේම නීතිය පිළිබඳව අනුන්ගේ දේවල් සම්බන්ධයෙන් කටයුතු කිරීමට යන්නට සිදු වන නිසා, ඒ ප්‍රදේශයේ යම් කෙනකුගේ නඩුවකදී පැමිණිල්ල වෙනුවෙන් හෝ විත්තිය වෙනුවෙන් හෝ කොයි විධියට වැඩ කළත් තව පැත්තක් ඒ අය සමග තරහ වෙනවා. මේ ළඟදී මාතලේ නාගොල්ලේ පදිංචිවෙලා ඉන්න කොස්තාපල් මහත්මයකුගේ ගෙදරට මිනිසුන් රැ ගල් ගසා නොයෙක් කොලොප්පම් ඇති කර ඒ කොස්තාපල් මහත්මයාගේ භාර්යාවට පවා ගමේ ඉන්නට බැරි තත්ත්වයක් ඇති කළ බව මම දන්නවා. එවැනි තත්ත්වයක් ඇති කළේ තවත් කාටද උදව් කළාය කියායි. නඩුව කදී කොහොම වැඩ කළත් එක පැත්තක් ඒ අය සමග තරහ වෙනවා. ඒ තරහ වෙන පැත්ත වැරදි ලෙස දුප්පත් කොස්තාපල් වරුන්ගෙන් පළි ගන්නට වෑයම් කරනවා. එම නිසා කාමර දෙක දෙකවත් තනා, පොලිස් දෙපාර්තමේන්තුව ඒ පොලිස් නිලධාරීන්ට පදිංචි වන්නට ස්ථාන සපයා දිය යුතු බව මතක් කරන්නට සතුටුයි. පොලීසියට හිතන්නට අවස්ථාව සලසා දෙන්නට ඕනෑ. විශෙෂයෙන් 1956 අවුරුද්දට පස්සේ, මේ රටේ ජනතාව වෙනුවෙන් සෑම දෙපාර්තමේන්තුවකම වැඩ කරන පියන් මහතාගේ සිට සිවිල් නිලධාරියා දක්වා—ඒ වාගේම අධ්‍යක්ෂවරුන්, කොමසාරිස්වරුන්—මේ රටේ මහජනතාවගේ සේවකයන් බව හිතා ගන්නට ඉඩ තිබුණත්, පොලිස් දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් නම් ඒ ආකාරයෙන් සිතාගන්නට බැරි බව මේ අවස්ථාවේදී තමුන්නාන්සේට මතක් කර දෙන්නට කැමැතියි.

ගරු සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන සමිතියක සාමාජිකත්වයක් පොලීසියට ලබාගන්නට බැහැ. ගමේ බෞද්ධ සමිතියක සාමාජිකත්වයක් පොලීසියට ලබාගන්නට බැහැ. මේ ආදී ගමේ හොඳ වැඩ කරන්නට—ගමක් දියුණු කරන්නට පිහිටුවා ගන්නා ලද සමිති සමාගම්වල සාමාජිකත්වයක් දැරීමට පොලීසියට බැහැ. නමුත් ගමේ හොර සුරාපලක් තිබෙනවා නම්, කසිප්පු ජාවාරමක් තිබෙනවා නම්, අන්න ඒ ස්ථානවල යාවජීව සාමාජිකත්වය දැරීමට පොලිස් දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරීන් මැළි නොවන බව නම් අපට බොහෝ අවස්ථාවලදී පෙනී ගොස් තිබෙනවා. ඒ වාගේම ගමේ "ක්ලබ් එකක්" තිබෙනවා නම්, හොර සූදු පොලක් තිබෙනවා නම්, බොහෝ පොලිස් නිලධාරීන් ඒ ස්ථාන සමග හුඟක් සම්බන්ධකම් පවත්වනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුණසිංහ මයා.]

ගරු සභාපතිතුමනි, පොලීස් දෙපාර්තමේන්තුවේ මෙතෙක් පැවතුණු මුහුණුවර සම්පූර්ණයෙන්ම වෙනස් කළ යුතුව තිබෙනවා. අපේ ගරු පාර්ලිමේන්තු ලේකම් තුමාට මා කියා සිටිනවා, මෙතෙක් පැවැතුණු මුහුණුවර සියයට සියයකින්ම වෙනස් කිරීමට කටයුතු පිළියෙළ කරන්නටය කියා. පොලිස් දෙපාර්තමේන්තුවේ සෑම නිලධාරියෙකුම සෑම මොහොතේදීම මන්ත්‍රයක් ජප කරන්නා වාගේ සිතන්නට ඕනෑ, ඔවුන් මේ රටේ මහජනතාවගේ සේවකයන් බව. එමෙන්ම මහජනතාවගේ විනයගරුකත්වය ආරක්ෂා කරන්නට යෙදී සිටින උදවිය බව. එම නිසා මහජනතාව සමග සහෝදරයන් වාගේ ජීවත් වන්නට, ඒ වාගේම සහෝදරයන් වාගේ කටයුතු කරනවායයි හැඟීමක් ඇති වන ආකාරයෙන් කටයුතු කරන්නට, කල්පනා කරන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මා නැවත වරක් රත්තොට පොලිස් මධ්‍යස්ථානය සුදුසු ස්ථානයකට ගෙන යන්නට කටයුතු යොදන ලෙස ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

රැස්වීම අ. භා. 2 වනතුරු තාවකාලිකව අත්හිටවනවා. නැවත පටන් ගන්න විට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇත.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 2ට නියෝජ්‍ය කථානායක තැන්පත් හියු ප්‍රනාන්දු මහතාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)
(திரு. பேர்சி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

පොලීස් වැය ශීර්ෂය සම්බන්ධයෙන් වඩා දීර්ඝ ලෙස කථා කිරීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මැද කොළඹ දෙවන ගරු මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) එය යටතේ විස්තර සහිත කථාවක් කර තිබෙනවා. ගිය වර්ෂයේද පොලීස් වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරන විට පොලීසිය මහජනයා සමග මිත්‍ර ලීලාවෙන් හැසිරිය යුතුය කියන කියමන කවුරුන් විසිනුත් කියන්ට යෙදුණා. නමුත් අදත් පොලීසිය ක්‍රියා කරන්නේ එදා ක්‍රියා කළ තත්ත්වයෙන්ම බව මතක් කරන්නට ඕනෑ. අදත් පොලීසිය මහජනයා සමග මිත්‍ර ලීලාවෙන් ක්‍රියා කරන්නේ නැහැ. රජය බලාපොරොත්තු වන තරමට පොලීස් සේවකයන් ගෙන් එම මෙහෙය ක්‍රියාවට යෙදෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, පොලීස් කොස්තාපල්වරුන් නොයෙකුත් අන්දමේ දුෂණ ක්‍රියාවලට මැදිහත් වෙනවාය කියා ඔවුන්ට විරුද්ධව බොහෝ දෙනා චෝදනා නගනව. ඔවුන් මෙවැනි ඉරණමකට මුහුණ පා සිටින්නේ, ඔවුන් මෙවැනි චෝදනාවලට ගොදුරු වී සිටින්නේ, ඔවුන්ට ලැබෙන වැටුප ඔවුන්ගේ ජීවත්වීමටවත් ප්‍රමාණවත් වන්නේ නැති නිසයි. පොලීස් අංශයෙහි සිටින සේවකයන්ගෙන් රටට ඉතා වැදගත් සේවයක් කෙරෙන්නේ පොලීස් කොස්තාපල්වරුන්ගෙන් සහ පොලීස් සාජන්ට්වරුන්ගෙනුයි. එවැනි සේවයක් ඔවුන්ගෙන් සිදු වන නමුත් ඔවුන්ට ජීවත්වීමටවත් සෑහෙන වේතනයක් ලැබෙන්නෙ නැහැ. මීගමුවේ ගරු මන්ත්‍රීතුමා (ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා.) ප්‍රකාශ කළාක් මෙන්, ඔවුන්ට වාසය කිරීමට සුදුසු ගොඩනැගිලිවත් ලැබී නැහැ. මගේ පළාතේ හක්මන පොලීස් ගොඩනැගිල්ල කොයි වේලේ කඩා වැටේද කියන්න අමාරු තරමයි. ඒක හරියට හරක් ගාලක් වගෙයි. කොස්තාපල්වරුන්ට තබා නිරීසනුන්ටවත් එවැනි සථානයක ජීවත් විය හැකිද යනු සැක සහිතයි. කඹුරුපිටියේද තවත් පොලීස් මධ්‍යස්ථානයක් තිබෙනවා. එම පොලීස් මධ්‍යස්ථානයේ නිලධාරීන්ට ගමන් කිරීම සඳහා නියම විධියේ ජීප් රථයක්වත් නැහැ. මාතර දිස්ත්‍රික්කයේ පොලීස් මධ්‍යස්ථානයන්හි පාවිච්චි කරන ජීප් රථවලින් ඉතාම අඩලන් වෙච්ච ජීප් රථය තිබෙන්නේ එම පොලීස් මධ්‍යස්ථානයේය කියන්න පුළුවනි. එවැනි තත්ත්වයක සිටින පොලීස් නිලධාරීන්ගෙන් කෙසේද නියම සේවයක් සිදු වන්නේ?

ගරු සභාපතිතුමනි, මහජනයාට දුකක් කරදරයක් ඇති වුණාම ඔවුන් තමන්ගේ හිදහස ලබාගැනීම සඳහා දිව යන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පොලීස් මධ්‍යස්ථානය කරුයි. නමුත් එහි ගිය විට ඔවුන්ට ලැබෙන්නේ කුමන අන්දමේ සංග්‍රහයක්ද? මහජනයා කරන පැමිණිලි අනුව අපට පේනවා වැඩි හරියක් පොලීස් මධ්‍යස්ථානවල නිලධාරීන් මහජනයා අමතන්නේ කැත නින්දිත භාෂාවකින් බව. පොලීසියේ පවා දැන් වීම් නම් ගසා තිබෙනවා ශීලාචාර භාෂාවෙන් කථා කරන්නය හොඳට හැසිරෙන්නය, ආදී වශයෙන්. නමුත් එහිම සේවය කරන නිලධාරීන්ගේ භාෂාව වැදගත් සභාවක ප්‍රකාශ කරන්න පවා අමාරුයි. මවයි දුවයි ඉදිරිපිටදී, තාත්තයි පුතයි ඉදිරිපිටදී, සහෝදරයන් දෙදෙනෙකු ඉදිරිපිටදී, යනාදී වශයෙන් හොඳ භාෂාවකින් කථා කළ යුතු විශෙෂ තැන්වලදී පවා නොයෙකුත් පොලිස් නිලධාරීන් ඉතා කැත නින්දිත වචන පාවිච්චි කරන බව පේනවා. එවැනි තත්ත්වයක් පවතිද්දී පොලීසියට නියම මහජන සහයෝගයක් ලැබෙන්නේ කොහොමද? තමන්ගේ සහෝදර සහෝදරියන් ඉදිරිපිට කැත වචන කීම තමන්ට පහර ගසනවාට වඩා වේදනාවට කාරණයක් කියා ගම්බද මහජනයා කියනවා. ඇතැම් පොලීස් ස්ථාන එවැනි තත්ත්වයක පැවතීම ඉතාම කණගාටුදායක කාරණයක්. ගමේ යම් තැනක බූරුවා සෙල්ලම් කරනවා නම්, රා ටිකක් විකුණනවා නම්, ඉතා දක්ෂ ලෙස එම ස්ථානය වටලා මිනිසුන් අල්ලා ඔවුන්ට නඩු පවරා අච්චු කරන්න පොලිස් නිලධාරීන් දක්ෂයි. පසුගිය දවස්වල මාතර මගේ කොට්ඨාශයේ බන්ඩත්තර කියන ප්‍රදේශයේ නිල්වලා ගඟේ මිනියක් පා වුණා. ඒ මිනිය දෙපැත්තේ කළුගල් ගෝනි දෙකක් එල්ලා තිබුණා. කව්රුන් විසින් හෝ මරා ගඟට දමා තිබෙනවාය කියා මේ ගැන ඒ ප්‍රදේශය සෑම තැනම ආරංචි වී තිබුණා. පාවෙමින් තිබුණේ අවුරුදු විස්සක පමණ තරුණියකගේ මිනියක්. නමුත් ඒ විධියේ දරුණු අපරාධයක් කළේ කව්ද කියා සොයා ගැනීමට පොලීසියට පුළුවන් කමක් ඇති වුණේ නැහැ. ඒ වාගේම පසුගිය දවසක ගෙදරක මෙහෙකාර සේවිකාවකගේ මිනියක් නිල්වලා ගඟේ පාවුණා. ඒත් තරුණ ස්ත්‍රියක්. නමුත් අද වන තුරු ඒ ගැනත් කිසිවක් සොයා ගන්න පුළුවන් කමක් ඇති වී නැහැ. හැබැයි මේ සියල්ල ටිළි හරියන්න දොස්තර වාතීාවක් දෙනවා. අර කළුගල් දෙපැත්තේ එල්ලා පාවෙමින් තිබුණු මිනිය ගැන දොස්තර වාර්තාවේ සඳහන් වී තිබුණෙත් එය ඉඹේටම සිදුවූ මරණයක් කියායි. හුස්ම හිර වීමෙන් සිදු වූ මරණයක් කියායි. වතුරේ ගිලුණාට පසු හුස්ම හිර වී මැරෙන බව අපි කවුරුත් දන්නවා. නමුත් වතුරේ ගිලීමට හේතුවූයේ කුමක්ද කියා පරීක්ෂා කර බැලිය යුතු නේද? දොස්තර වාර්තාව ඒ විධියට ලැබුණු නිසා ඊට පසුව ඒ ගැන පරීක්ෂණ පවත්වන්නේ නැතුව නිකම් ඉන්නවා. ඔය විධියේ දරුණු අපරාධ සිදුවන විට මහජනතාව ජීවත්වන්නේ කොහොමද? හදිසි මරණ පරීක්ෂකවරයාගේ වාතීාව ඒ විධියට දුන්නාට පසුව ඉන් එහාට ක්‍රියා කරන්න බැරිලු. හොඳයි නීතිය ඒ විධියට තිබෙනවා නම්, ඒ විධියේ නීති වෙනස් කළ යුතු නොවේද? එසේ කර මේ විධියට අපරාධ කරන දරුණු අපරාධ කරුවන් අත් අඩංගුවට ගෙන ඔවුන්ට නිසි දඬුවම් ලබා දිය යුතු නොවේද? නමුත් පොලීසියෙන් කරන්නේ කොහේ හෝ සූදු පොළකට ගොස් මිනිහෙක් අල්ලාගෙන ඇවිත් දඩ ගැසීමයි. ඒක නොවෙයි හපන්කම, රටේ අපරාධ නැති කිරීම පිණිස තමන්ගේ ශක්තිය හා දක්ෂතාවය මෙහෙයවා කටයුතු කිරීමයි.

පොලීසිවල සිටින සුළු නිලධාරීන්ට බල පවත්වන තවත් කරුණක් තිබෙනවා. යම් කිසි කොස්තාපල් කෙනෙකු හෝ සාජන්ට් වරයකු හෝ යම්කිසි නියමිත නඩු ප්‍රමාණයක් අදිරිපත් නොකළොත් එය ඔහුගේ තත්ත්වයට මදි කමක්. එම නිසා බොරු නඩු හෝ පටලවා ඔවුන්ගේ තත්ත්වය උසස් කර ගන්නවා. ඒ විධියේ තත්ත්වයක් දැනුත් පොලිස් දෙපාර්තමේන්තුවේ තිබෙන බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. එය ඇත්තද නැත්තද කියා මම දන්නේ නැහැ.

පොලිස් කොස්තාපල්වරුන්ට "හෙල් මව්" කියා තොප්පි වර්ගයක් දී තිබෙනවා. එකම තොප්පියයි ඔවුන්ට දී තිබෙන්නේ. ඒ තොප්පිය නිතරම දා ගෙන සිටින්නට ඕනෑ. සමහර තොප්පි පරණ වී දිරා තිබෙන නිසා වෂා වේලාවට තෙමෙනවා. ඒවාගේම කොයිම අවස්ථාවකවත් ඒවා ගළවන්න බැහැ. ගැළෙව්වොත් නීති විරෝධයි. මේ හේතුකොටගෙන ඔවුන්ට පීනස් අමාරුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

හැදෙනවා. පීනසය හැදුණාම ඊට ප්‍රතිකාර ගැනීම පිණිස වෛද්‍යවරයා ළඟට යාමට උසස් නිලධාරියාගෙන් අවසර ගන්න ඕනෑ. ඒ සඳහා උසස් නිලධාරියාගෙන් කාඩ් පතක් ලබාගත යුතුයි. යම් විධියකින් උසස් නිලධාරියා ඒ කාඩ් පත නොදුන් නොත් පීනසයට බෙහෙත් කර අවසානයි. මේ විධියේ ඉතාමත් දුඃඛිත තත්ත්වයක තමයි පොලිස් කොස්තාපල් වරුන්ටත් සාජන්ට්වරුන්ටත් සේවය කිරීමට සිදු වී තිබෙන්නේ.

එපමණක් නොවෙයි, සමහර පොලිස් කොස්තාපල්වරුනුත් සාජන්ට්වරුනුත් සේවය කරන ස්ථානවල තමන් සිටින කාමරයේ බණ්ඩාරනායක අගමැතිතුමාගේ පින්තූරයක් එසේ නැත්නම් තමන්ගේ ආගම අනුව යම්කිසි බෞද්ධ පින්තූර ආදියක් තිබෙනවා නම්, උසස් නිලධාරියෙක් ඒ ස්ථානයට යන විට ඒවා තිබෙන්නට බැහැ. මේවා අපට සාමාන්‍ය ජනතාව ගෙන් ලැබෙන පැමිණිලියි. අනික් කොයි එක නැති වුණත් ආගමේ නිදහස තිබෙන්නට ඕනෑ නොවේද කියා මම අහන්න කැමතියි. යම්කිසි සුළු පොලිස් නිලධාරියෙක් බෞද්ධයෙක් නම් තමන්ගේ ආගම අනුව බුදුරජාණන් වහන්සේගේ පින්තූරය තමන් සිටින කාමරයේ එල්ලා ගැනීමට ඉඩ දෙන්නෙ නැත්නම් එය කොතරම් අයුක්ති සහගතද? ආගමේ නිදහස ඔවුන්ට ලැබෙන්නේ නැහැ නොවේද?

තමන්ගේ අයිතිවාසිකම් ලබාගැනීම සඳහා පොලිස් කොස්තාපල් වරුන්ට දී තිබුණු සංගමයත් පසුගිය දවස්වල නැති කර දැම්මා. දැන් ඔවුන්ගේ අයිතිවාසිකම් කියා පාන්නට ඔවුනට පුළුවන් කමක් නැහැ. කොස්තාපල්වරුන්ටත් සාජන්ට් වරුන්ටත් සමිති පවත්වන්නට බැහැ. ඔය විධියට සම්පූර්ණයෙන්ම ඔවුන්ගේ නිදසට අවහිර තත්ත්වයකුයි අද තිබෙන්නේ.

මේ විධියට බලන කොට උසස් නිලධාරීන්ගෙන් බේරී ආගමේ නිදහස රැක ගන්නටත් බැහැ. තෙමීම නිසා ඇතිවන අසනීපවලට බෙහෙත් ගන්නටත් බැහැ. ඒ සියල්ලටම වැඩියෙන් ඔවුන්ට ලැබෙන පඩියත් ඉතා අඩු පඩියක්. ඒ වාගේම යකඩයාගේත් මදාවියාගේත් පිහි පාරට පපුව දෙන්නටත් ඕනෑ. ඉතින්, සභාපති තුමනි, පොලීසියේ සිටින සුළු නිලධාරි පක්ෂය ජීවත් වන්නේ මෙවැනි තත්ත්වයක නම්, ඔවුන් නොයෙකුත් දූෂණ ක්‍රියාවලට ගොදුරු වන එක පුදුම යක්ද?

තවත් වැදගත් කරුණක් නම්, සමහර පොලිස් මධ්‍යස්ථානවල ඉන්ස්පෙක්ටර් මහත්වරුන් අවුරුදු පහ හය දිගටම තබා ගෙන සිටීමයි. එය සම්පූර්ණයෙන්ම වැරදියි. අවුරුද්දකින් හෝ දෙකකින් ඔවුන් මාරු කර යැවීමේ වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. එක තැනකම මුල් බැසගෙන සිටීමට ඉඩ දීමෙන්, කලින් මන්ත්‍රීතුමා කීවා වාගේ, ඒ ගමේ සිටින ලොකු උදවිය සමග එක්කාසු වී ක්ලබ්වලට ඇබ්බැහි වී නොයෙක් විධියේ අයුතුකම්වලට මග පෑදෙනවා. එම නිසා උසස් නිලධාරීන් අවුරුද්දකින් හෝ දෙකකින් වෙනත් වෙනත් ස්ථානවලට මාරු කර යැවීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ.

අවසාන වශයෙන් මට තවත් කාරණයක් කියන්නට තිබෙනවා. මහජනයා පොලිස් නිලධාරියකුට විරුද්ධව පැමිණිල්ලක් කළොත් එය විභාග කරන්නට එන්නේ එහිම සිටින පොලිස් නිලධාරියෙක්මයි. ඒක හරියට හොරාගෙ අම්මගෙන් පේන අහනවා වගෙයි. වැඩි දවසක් නොවෙයි, පෙරේදා මාතර පොලීසියට ඉඩම් හබයක් සම්බන්ධයෙන් ගිය කෙනකුට පොලීසියේදී ගසන ලද පහර නිසා නළලත් පැළුණා. පළාතේ මන්ත්‍රීවරයා වශයෙන් මේ කාරණය මට කී විට මම ඒ පිළිබඳව ඒ.එස්.පී. මහත්මයාගෙන් ඇහුවා. ඔහුගේ පිළිතුර වූයේ ඒ තැනැත්තා බිත්තියේ ඔලුව හප්පාගෙන තිබෙනවාය කියායි. බලන්න සභාපතිතුමනි, එතකොට වැරදි කාරයා බිත්තියයි. එසේ නැතිව පොලීසියට ගිය කෙනෙක් නිකම් බිත්තියේ ඔලුව හප්පා ගැනීමේ සිරිතක් තිබේ යයි මට නම් කියන්න බැහැ. යම්කිසි පැමිණිල්ලක් කළ විට ඒ පිළිබඳව පොලිස් නිලධාරීන්ගේ නිගමනයම පිළිගන්ට වීම සුදුසු තත්ත්වයක් නොවෙයි. එවැනි පැමිණිලි සඳහා සාධාරණ විභාගයක් පවත් වන්න ඕනෑ. එසේ නැතුව පොලීසියට විරුද්ධව කරන පැමිණිල්ලක් එම පොලීසියේම සිටින නිලධාරීන් විසින් විභාග කිරීමෙන් කවදාවත් පොලීසියෙන් කරන වැරදි හෙළි වෙයිද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම නිසා පොලීසියට විරුඬව කරන පැමිණිලි විභාග කිරීම සඳහා වෙනම මණ්ඩලයක් පත් කොට ඒ කාර්යය ඊට භාර දුන් නොත් මීට වඩා මහජනයාට සහනයක් ලැබෙන්නට පුළුවනි. එසේ නැතුව දැන් තිබෙන අන්දමට කොයි තරම් පොලීසියට විරුද්ධව පැමිණිලි කළත් වැරදි කළවුන් වැරදි කරුවන් වන්නේ ඉතාමත් කලාතුරකිනුයි. සමහර විට සියයට 1 කට වඩා වැරදි කළවුන් වරද කරුවන් වන්නේ නැහැ. පොලිස් දෙපාර්තමේන්තුවේ කට යුතු මේ විධියට දිගටම කරගෙන යනවාද කියායි මා අහන්නේ ?

මේ රජය සමාජවාදය කරා ගමන් කරනවා යයි ප්‍රකාශ කර තිබෙනවා. මේ විධියේ පොලීසියක් තබාගෙන සමාජවාදී ලංකාවක් ඇති කරන්න පුළුවන් දැයි මම අහනවා. පොලීසියේ තිබෙන මිලිටරි ස්වරූපය ඉවත් කරන්නේ නැතුව නම් කවදාවත් මහජනතාවට ඉන් ලැබිය යුතු සේවය ලැබෙන්නේ නැහැ. මේ වැය ශීර්ෂය යටතේ මීට වඩා යමක් කිමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මගේ ප්‍රදේශයේ ඇති ඒ පොලිස් ස්ථානවලට නියම තත්ත්වයක් ලබා දෙන මෙන් මම නැවත වරක් ඉල්ලා සිටිනවා.

සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (මහියංගන)

(திரு. சீ. பீ. ஜே. செனவிரத்ன—மஹியங்கணை)

(Mr. C. P. J. Seneviratne—Mahiyangana)

සභාපතිතුමනි, පොලිස් දෙපාර්තමේන්තුව රටක ඉතාමත් වැදගත්, භාර දූර, වගකිය යුතු තත්ත්වයක් උසුලන දෙපාර්තමේන්තුවක්. එවැනි දෙපාර්තමේන්තුවක් ක්‍රියා කරගෙන යා යුත්තේ මෙවැනි ගරු සභාවක් මගින් නිගමනය කරනු ලබන නීති රීතිවලට අනුකූලවයි. එසේ නැතිව එතරම් වගකිව යුතු දෙපාර්තමේන්තුවක් තුළ යම් යම් දේශපාලන බලපෑම් ඇතිවුවොත් එම දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරිය නිසියාකාර ඉටු කරන්න පුළුවන් වෙයයි මා සිතන්නේ නැහැ. දැනට මාස කිපයකට පෙර බණ්ඩාරවෙල ඇති වූ සිද්ධියක් පිළිබඳව තමුන්නාන්සේ දන්නවා ඇති. එහි සිටි ප්‍රධාන නිලධාරියෙක් කිසිවකුගෙන් කිසි ඇහිල්ලක් බැලිල්ලක් නැතිව කොළඹින්ම කළ නියමයක් අනුව වෙනත් පළාතකට මාරු කළා. ඒ මාරු කිරීම ගැන මුළු ඌවේම පොලිස් නිලධාරීනුත්, සාජන්ට් සහ කොස්තාපල් මහත්වරුනුත්, විරුද්ධත්වය ප්‍රකාශ කර තිබුණු බව පත්‍ර මාර්ගයෙන් අපි දැක්කා. ඇත්තෙන්ම ඔවුන් උපවාසයක යෙදෙන තරම් තත්ත්වයක් ඇති වුණා. ඒ අය දින ගණනක් කෑම නවත්වා සිටියා. බොහෝ දෙනෙක් අසනීපයෙන්ය කියා රාජකාරියට නොපැමිණ හැරියා. ඒ පොලිස් නිලධාරි මාරුව ගැන බණ්ඩාරවෙල හෝ ඌවේ හෝ උසස් පොලිස් නිලධාරි තුමන්වත් දන්නේ නැහැ. ඒ විධියේ තත්ත්වයක් ඇති වුණාට පසු කොළඹින් කරන ලද පළමු තීරණය වෙනස් කළා. ඉන් පසු ඌව පළාතේ, හෙවත් බණ්ඩාරවෙල පළාතේ පොලිස් සේවා තත්ත්වය යථා තත්ත්වයට පැමිණුනා. පොලීසිය විසින් එදිනෙදා කර ගෙන යන රාජකාරියට දේශපාලන බලපෑම්, ඇඟිලි ගැසීම් ආදිය ඇති වෙනවා නම් ඒ දෙපාර්තමේන්තුව විසින් රටේ පවත්වා ගෙන යා යුතු විනය ආරක්ෂා කර ගැනීමට නොහැකි වන බව එයින් අපට පෙනී යනවා. එදා ඌව පළාතේ ඇති වුණේ ඉතා කනගාටුදායක තත්ත්වයක්.

අ. භා. 2.15

අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (අනිල් මුනසිංහ මයා.) ප්‍රකාශ කළා, මුදල් තිබෙන වැදගත් උසස් පන්තියේ ළමයින් පොලිස් දෙපාර්තමේන්තුවට බඳවා ගන්න නිසා එවැනි අය රාජකාරියට යන සෑම ගමකම ඔවුන්ගේ බලපෑම් අනුව බලකායවල් සාදා ගන්නවාය, යන විධියේ අදහසක්. අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාටත්, ඒ වගේම රත්නොට ගරු මන්ත්‍රීතුමාටත් (චන්ද්‍රසේන මුණවීර මයා.) ඒ මන්ත්‍රීවරුන්ගේ අදහස්වලට පිළිතුරක් වශයෙන් මා එක් කාරණයක් මතක් කර දෙන්නට කැමතියි. මෙරටට නිදහස ලැබෙන්නට පෙර, එනම් 1948 ට පෙර, මේ රටේ අධිරාජ්‍යවාදී පාලනයක් තිබුණු කාලයේදී "ඩව්බිගින්" නම් පොලිස් ඉන්ස්පෙක්ටර් ජෙනරාල් කෙනෙක් සිටියා. 1948 න් පසු මේ රටේ බලයට පත් වුණු එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව විසින් ගත් පළමු වන පියවර ඒ ඉංග්‍රීසිකාර ඉන්ස්පෙක්ටර් ජෙනරාල්ව අස් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

සිංහල පොලිස් පති කෙනෙක් පත් කිරීමයි. එපමණක් නොවෙයි, මේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් බොහෝ දෙනකු දන්නේ නැතුව ඇති, ඒ කාලයේ කොළඹ පළාතේ සිටියා, "යුරෝපියන් සාජන්ට්" නම් එංගලන්තයෙන් ගෙන්වන ලද කොස්තාපල් තත්ත්වයේ පිරිසක්. එහෙත් ඒ අයට විශේෂ බලතල දී තිබුණා. 1948 න් පසු ඒ නිලය ලංකාවේ උපන් ලාංකිකයන්ට භාර කළා. මා ඒ කාලයේ තරුණයකු නිසා මට මතකයි, 1930 ටත් 37 ටත් අතර කාලයේදී කණිෂ්ඨ විභාගය සමත් ලාංකිකයන් දහස් ගණනක් පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණු බව. ඒ තරුණයන් කවුද? රටේ මධ්‍යම පන්තියෙනුත්, ඒ වාගේම දුප්පත් ගැමි ජනතාවගෙනුත් තෝරා ගත් අධ්‍යාපනයක් ලැබූ තරුණයනුයි. ඒ කාලයේදී කණිෂ්ඨ විභාගයෙන් සමත්ව පොලීසියට බැඳුණු ළමයින්ගෙන් බොහෝ දෙනෙකු තමයි, අද ඒ. එස්. පී., එස්. පී. සහ ඉනස්පෙක්ටර්ලා වී සිටින්නේ. ඒ අය දැන් ධනපතීන්ද කියන්නට මා දන්නේ නැහැ. මා කියන්නේ එදා තත්ත්වයයි.

රටේ අවශ්‍යතා අනුව අද පොලීසිය ඉතා හොඳ තත්ත්වයකට ඇවිත් තිබෙන බව අප දන්නවා. එය කලින් කලට ක්‍රියාත්මක වන දෙයක්. පොලීසිය කරන සේවයට අප ප්‍රසාදය පළ කරන අතර අප්‍රසාදය පළ කළ යුතු කරුණුත් ඔවුන්ගෙන් කෙරෙනවා.

සභාපතිතුමනි, "අන් පොලිස්ඩ් ඒරියාස්" කියා පොලීසිය මගින් පාලනය නොවන ප්‍රදේශ ලංකාවේ තිබෙනවා. එවැනි ප්‍රදේශ පාලනය කරන්නේ ආදායම් පාලක නිලධාරීන් මාගීයෙනුයි. පොලීසිය මගින් ඒ පළාත් පාලනය නොකරන්නේ ඒවා දුෂ්කර ප්‍රදේශ වශයෙන් සලකන නිසයි. එවැනි පළාත්වල වැඩි වශයෙන් වාසය කරන්නේ ඉතා දුප්පත්, අහිංසක, එමෙන්ම අධ්‍යාපනය අතින් ද දුර්වල තත්ත්වයක සිටින අයයි. දැනුත් එවැනි ප්‍රදේශවලට පොලීසියෙන් පැන නීති විරෝධී ලෙස ක්‍රියා කරන අවස්ථා තිබෙනවා. එය ඉතා කනගාටුදායක කරුණක්. රා හෝ වෙනත් සුරා වර්ගයක් හෝ ඇල්ලීමට එසේ නැත්නම් බේබි කැපීමක් ඇල්ලීමට එවැනි ප්‍රදේශයකට පොලීසිය යනවා නම් ඔවුන්ට යුතුකමක් තිබෙනවා, පළාතේ ආදායම් පාලක නිලධාරීතුමාට දන්වන්නට බැරි නම්, අඩු වශයෙන් ගමේ ගම් මුළාදැනියාටවත් දන්වන්න. හොරා කවුද, හොඳ මිනිහා කවුද, නොදැනුවත් කමින් වැරදි කරන මිනිහා කවුද යන කරුණු ගැන හොඳින් දන්නේ ඔහුයි. එවැනි පළාත්වලට ගොස් ඒ ගම්වල සිටින දුප්පත් ජනයාට අඩන්තේට්ටම් කිරීම ගැන පොලීසිය කෙරෙහි මගේ අප්‍රසාදය පළකරනවා.

සභාපතිතුමනි, මතක් කළ යුතු තවත් වැදගත් කරුණක් තිබෙනවා. මහියංගන ආසනයට පොලිස් ස්ථාන දෙකක් ලබා ගන්නට දැන් අවුරුදු තුනක් තිස්සේ කථා බහ කර තිබෙනවා. බත්මැඩිල්ලටත් මහියංගනයටත් පොලිස් ස්ථාන දෙකක් වුවමනා බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කොමිටිය විසිනුත් පිළිගෙන තිබෙනවා. එහෙත් තවමත් එම ප්‍රදේශවලට පොලිස් ස්ථාන ලැබී නැති බව කනගාටුවෙන් සඳහන් කළ යුතුව තිබෙනවා. මේ කාරණය ගැන වැඩි දුර කල්පනා කර බලා හැකිතාක් ඉක්මනින් අඩු වශයෙන් පොලිස් සාජන්ට් කෙනකුගේ ප්‍රධානත්වයෙන් යුත් පොලිස් ස්ථානයක් බැගින්වත් මේ කොට්ඨාශවලට ලබා දෙන මෙන් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලන අතර, ඊට එතුමාගේ අවධානය යොමු කරන්නට සතුටුයි. මේ ශීර්ෂය යටතේ කථා කරන්නට බොහෝ ගරු මන්ත්‍රීන් බලාපොරොත්තුවෙන් සිටින නිසා මීට වඩා යමක් මේ අවස්ථාවේ කියන්නට මා බලාපොරොත්තු වන්නෙ නැහැ.

ඩී. පී. ආර්. වීරසේකර මයා. (රත්නපුරය)

(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—இரத்தினபுரி)

(Mr. D. P. R. Weerasekera—Ratnapura)

ගරු සභාපතිතුමනි, මාත් මේ අවස්ථාවේ කරුණු දෙක තුනක් ඉදිරිපත් කරන්නට අදහස් කරනවා. පොලිස් දෙපාර්තමේන්තුව ගැන ගිය අවුරුද්දේ මා යම් යම් කරුණු ඉදිරිපත් කරමින් විවේචන කළ බව තමුන්නාන්සේට මතක ඇති. එහෙත් අපේ අලුත් පොලිස්පතිතුමාගේ උනන්දුව හේතුකොටගෙන එතුමාගේ නායකත්වය යටතේ පොලීසිය දැන් ඒ අඩුපාඩු බොහොමයක්ම මගහරවා තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසා එය සතුටුදායක තත්ත්වයක පවත්නා බව අද මට සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්න පුළුවනි. අබේකෝන් මහත්මයා පොලීසියේ නායකත්වයට පත් කළායින් පසු සුළු වශයෙන්වත් පොලීසිය පෙර තිබුණාට වඩා හොඳ අතට පැමිණ තිබෙන බව අපට පිළිගන්න පුළුවනි. මා මේ නිගමනයට බැස්සේ ලංකාවේ වෙනත් කොට්ඨාශවල පවතින තත්ත්වය අනුව නොව රත්නපුරා පොලීසියේ තත්ත්වය අනුවයි. එදා ඉදිරිපත් කළ චෝදනාවල ප්‍රතිඵලයක් වශයෙන් දූෂණ සහ මැරවර කම් කළ නිලධාරීන් අයින් කර අපට හොඳ නිලධාරී මණ්ඩලයක් ලබා දුන්නා යින් පසු රත්නපුර කොට්ඨාශය තුළ සිටින මහජනයා රත්නපුර පොලීසිය ගැන පැහැදී සිටින බව ආඩම්බරයෙන් කියන්නට කැමතියි.

එය මතක් කරන අතරම ඉතා කනගාටු වෙන් සඳහන් කළ යුතු සිද්ධියක් තියෙනවා. කුරුවිට ප්‍රදේශයේ නම් එවැනි සතුටු දායක තත්ත්වයක් නැහැ. එහි ඇති වූ සිද්ධීන් දෙකක් ගැන මා මතක් කරන්නේ ඉතාමත් කනගාටුවෙනුයි. කුරුවිට පොලීසියේ දුර්වලකමක් ගැනයි මා සඳහන් කරන්නට බලාපොරොත්තු වන්නේ. මේ ප්‍රදේශයේ කසිප්පු පෙරන ගෙවල් තියෙනවා. නොයෙක් විධියේ නොපණත්කම් කරන අය ඉන්නවා. වැරදි ජාවාරම් කරන අය ඉන්නවා. සූදු ක්‍රීඩාව ගෙයක් ගෙයක් ගානේම කෙරෙන තැන් තියෙනවා. නමුත් ඒ ගැන කටයුතු කරන්නේ නැහැ. මේ පොලීසියේ අය එම වැසිකිය තුළ යම් ගෙයක මඟුල් උත්සවයක් ඇති වුණොත් ඒ ස්ථානයට නම් කිසිම සැකයක් නැතිව කඩා පනිනවා. මෙවැනි අවස්ථාවල ඔවුන් කිසිම අනුකම්පාවක් දක්වන්නේ නැහැ. මීට මාස දෙකකට පමණ පෙර සිත් කම්පා කරවන සිද්ධියක් ඇතිවුණා. ගොවි ජනපදයක වැඩ කරන කෙනෙකුගේ ගෙදරක මංගල්‍ය උත්සවයක් තිබුණා. මාත් එහාට උදේ වරුවේ ගියා. රාත්‍රී කාලයේ පොලීසියෙන් පැමිණ ඒ ගෙදර සන්තෝෂයෙන් කාලය ගත කරමින් සිටි පිරිස වටලා ඇල්ලුවා. ඒ ස්ථානයේ වැරදි දේවල් කෙරෙන්න ඇති. සමහරවිට මිනිසුන් එකතු වී කාඩ් ගහන්න ඇති. බූරුවා ගහන්නත් ඇති. මත්පැන් බොන්නත් ඇති. ඒක මා පිළිගන්නවා. නැතැයි කියන්නේ නැහැ. ලොකු ලොකු තැන්වල, සමාජ ශාලාවල, ක්ලබ්වල, දොස්තර මහත්වරුන්ගේ ලොකු බංගලාවල, දහස් ගණන් ඔට්ටු අල්ලා සූදු කෙළින බව අපි දන්නවා. නමුත් මඟුල් ගෙයක් ඇති වන විට පමණක් ඒවාට කඩා පැනීම සතුටුදායකයයි කියන්න බැහැ.

ඊටත් වඩා කනගාටුදායක දෙයක් ළඟදී සිදු වුණා. කුරුවිට දුප්පත් මඟුල් ගෙයක් තිබුණා. පාන්දර තරුණයාගේ පවුලේ නෑදෑ පිරිස ආදී විශාල කණ්ඩායමක් එතැනට රැස් වුණා. ඒ ගෙදර පොල් අතු සෙවිලි කරන ලද පැලක්. මිනිසුන් නිදා ගත්තාට පසු රෑ අටට විතර පොලීසියෙන් ගිහින් ඒ ස්ථානය වටලා අර බැඳපු ජෝඩුව පාරට අරන් ගිහින් මහජනයා බලාගෙන ඉන්දදීම තරුණයාගේ රෙදි ලිහා දැම්මා.

ඩී. ජී. එච්. සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)

(திரு. டீ. ஜீ. எச். சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)

(Mr. D. G. H. Sirisena—First Akurana)

පොලීසියෙන්ද?

ඩී. පී. ආර්. වීරසේකර මයා.

(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)

(Mr. D. P. R. Weerasekera)

පොලීසියේ නිලධාරීන් 8 දෙනෙක් සිටියා. මේ ගැන තමුන්නාන්සේලා පුදුම වෙනවා ඇති. ඊටත් වඩා පුදුම වේවි, මේ ටිකත් ඇහුවොත්. ඔහුගේ පියාට තර්ජන කරන විට, මගේ පියා කවදාවත් සූදු වලට මැදිහත් වන කෙනෙක් නොවේය, 304 නම් සෙල්ලම් කරනවාය කියා තරුණයා වැදලා කිව්වා. එතැනදී මේ තරුණයා ඇදලා අරන් ඔහුගේ ගෑහැණි ඉදිරිපිටම රෙදි කැඩුවා. ඉලන්දාරියාට කොයි තරම් ලජ්ජා හිතෙන්න ඇත්ද? මෙය අහන තමුන්නාන්සේලා කොයි තරම් දුක් වෙනවා ඇත්ද? මේ සිද්ධිය වුණු දාට පසුවදා අර අසරණ ඉලන්දාරියා ගඟේ පැනලා දිවි නසා ගත්තා. ලැජ්ජාව ඉවසා ගන්න බැරුවයි එහෙම කෙරුවේ.

මා මේ කාරණය සඳහන් කරන්නේ බලවත් සිත් තැවුලක් නිසා ලොකු වේගය කිනුයි. මෙවැනි අවස්ථාවලදී පොලීසිය ටිකක් කල්පනා කරන්න ඕනෑ. ඒ නිසයි, මේ ගැන සඳහන් කරන්නේ. නීතිය තිබුණත් මේ විධියේ දේ කිරීම වැරදියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. වීරසේකර මයා]

පොලීසිය මඟුල් උත්සව වැනි වැදගත් අවස්ථාවලදී මේ ආකාරයට කටයුතු කිරීම කොහෙත්ම හොඳ නැහැ. අල්ලන්ට ඕනෑ තරම් සූදු පොළවල් තියෙනවා. පළාතේ මන්ත්‍රීවරයා හැටියට මා මේ කාරණය ඉතා කනගාටුවෙන් ඉදිරිපත් කරන අතර, ඒ ගැන විභාගයක් පවත්වා සුදුසු පරිදි කට යුතු කරන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ සමගම තවත් කරුණක් කිව යුතුව තිබෙනවා. හොර හරක් මරා පොලීසියේ සුළු සේවකයන් සමග ඒවා භුක්ති විඳිනවා කියා ඒ පොලිස් නිලධාරියාට විරුද්ධව චෝදනා තිබෙනවා. ඒ විධියේ චෝදනා තිබෙන පොලිස් නිලධාරියෙක් තමයි අර මඟුල් ගෙදරට ගිහින් අහිංසක මිනිහකුගේ මරණය සිදු වන තැනට කටයුතු කළේ.

ගරු සභාපතිතුමනි, වචනයක් කිවොත් ඒ වචනය ඒ ලෙසම ඉටු කිරීමේ මහත්ම ගතියක් පොලීසියේ තියෙන්නට ඕනෑ. පෙරේරා නමැති හෙඩ් ක්වාටර් ඉන්ස්පෙක්ටර් මහත්මයකුට විරුද්ධව ගිය අවුරුද්දේ මා චෝදනාවක් කළ බව තමුන්නාන්සේට මතක ඇති. ඒ චෝදනාව නම් දුප්පත් මිනිහකුව පොලිසියට අරගෙන ගිහින් මා ඉදිරිපිටම තැලුවාය යන්නයි. ඒ ගැන කුමක්ද කළේ? සාකච්ඡාවක් ඇති කරලා පොලීසිය සමග මිත්‍රත්වයෙන් කටයුතු කළොත් හොඳය කියන අදහසින් අපි 'ජෙන්ට්ල්මන්ස් ඇග්‍රීමන්ට්' එකක් හැටියට තීරණයකට බැස්සා. [බාධා කිරීමක්.] අළුත් මන්ත්‍රීවරයකු හැටියට මම ඊට කැමති වුණා. හේද වැඩි කරන්නේ නැතිව සාමදානයෙන් වැඩ කරන්නට පුළුවන් වේය කියා මම බලාපොරොත්තු වුණා. ඇග්‍රීමන්ට් එක මේකයි. ගුටි කාපු තැනැත්තාට විරුද්ධව පොලීසියෙන් දමා තිබුණු බොරු චෝදනාව ඉල්ලා අස්කර ගන්නට ඕනෑ. ගුටි කාපු තැනැත්තාත් කැමති වුණා "මට පොලීසිය එක්ක හැප්පිලා වැඩක් නැත, සමහර විට මේකෙන් මම දිනුවත් පස්සේ මට ගුටි කන්නට වෙයි" කියා තමාගේ නඩුවත් අයින් කර ගන්නට. ඊට පසු පාර්ලිමේන්තුවේ කටයුතු නිසා මට සති දෙකක් කොළඹ නවතින්නට සිදු වුණා. ආපසු රත්නපුරයට ගියාම මේ මිනිහා පෙනෙන්නට හිටියේ නැහැ. සුමාන 6 කට පසු රත්නපුරේ ප්‍රසිද්ධ පිටිටනියේ රැස්වීමකදී කථා කරන විට—ගරු මහානාම සමරවීර ඇමතිතුමාත් එහි හිටියා —මේ මිනිහා ළඟට ආවා. මෙච්චර කල් තමුසේ කොහේ ගිහින් හිටියාද කියා මා ඇහුවම ඒ මිනිහා කිව්වා, "ඇයි වුණ වැඩේ මන්ත්‍රීතුමා දන්නේ නැද්ද මගේ නඩුව මා අයින්කර ගත්තම පොලීසියෙන් නඩුව ඉදිරියට අරගෙන මාව සුමාන 6 කට හිරයට ඇරියාය"ය කියා. ගරු පාර්ලිමේන්තු ලේකම් තුමනි, මා කණගාටුවෙන් ප්‍රශ්න කරන්නේ මේ පිළිවෙළට අපේ තත්ත්වය කුමක්ද කියායි. සාමදානයෙන් බේරන්නට අපේ මිනිහට අපි නඩුව අස් කර ගන්නට කිවා. නමුත් පෙරේරා ඉන්ස්පෙක්ටර් ඇවිත් විශේෂයෙන්ම පොලිස්පතිට කියා මේ නඩුව ඉදිරියට අරගෙන අර ගුටි කාපු අහිංසක මිනිහාව හිරේට ඇරිය. පෙරේරා එච්. කිව්. වයි.ට මොකක්ද ඒකට ලැබුණු දඩුවම? ප්‍රමෝෂන් එකක් ලැබුණා. දැන් ඔහු මරදාන පොලීසියේයි ඉන්නේ. මට ආරංචියි, මැද කොළඹ දෙවැනි මන්ත්‍රීතුමාට (කෙනමන් මයා.) ඔහු නිසා ඇති වන බර දැනටම දැනී තිබෙනවාය කියා. තව වැරදි දෙක තුනක් කළොත්, ඇල්. අයි. ද සිල්වා මහතා ඩී.අයි.ජී. වුණා වාගේ, පෙරේරා එච්. කිව්. වයි. කවදා හරි ඩී. අයි. ජී. කෙනෙක් වෙයි. පඩියෙන් පඩිය නැගීමේ පිළිවෙළ මට දැන් පෙනෙනවා. වැරැද්දක් කළොත් ප්‍රමෝෂන් එකක් ලැබෙනවා. පොලීසියට නින්දා කරන ඩී. අයි. ජී. මහත්මයෙක් ඉන්නවා නම් ඒ. එල්. අයි. ද සිල්වා මහත්මයා බව මම එදත් ප්‍රකාශ කළා; අදත් ප්‍රකාශ කරනවා.

ඒ සමගම කහවත්තේ පොලීසියේ සිදු වූ තවත් කණගාටුදායක දෙයක් ගැන මතක් කරන්න කැමතියි. පොලීසියට විරුද්ධව මහජනයා චෝදනා ඉදිරිපත් කළාම ඒ චෝදනා විභාග කිරීම පොලීසියටම භාර දීම සුදුසු නැහැ. වත්තක අහිංසක කම්කරු මහත්මයෙක් පොලීස් කොස්තාපල් මහත්මයකුට විරුද්ධව කොළඹට පැමිණිල්ලක් එව්වා. ඒ පැමිණිල්ල ඇරියා, රත්නපුරයේ පොලිස් දෙපාර්තමේන්තුවට. එතැනින් ඒක ඇරියා කහවත්තේ ඉන්ස්පෙක්ටර් මහත්මයාට. මොකක්ද ඉන්ස්පෙක්ටර් මහත්මයා කළේ? ඒ මිනිහාව පොලීසියට ගෙන්වා කසයෙන් ගැහුවා. ඔහුගේ කොන්දේ කස පාරවල් 8ක් තිබුණා. මේක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මට කාගෙන්වත් ඇහුණ දෙයක් නොවෙයි. ඒ මිනිහව ඉස්පිරිතාලයට අරගනෙ ගිහින් මමම ඩී. එම්. ඕ. මහත්මයාට පෙන්වා රපෝර්තුවක් අරගෙන ඒ අනුව පරීක්ෂණ යක් පවත්වාගෙන යන නිසයි මම ප්‍රකාශ කරන්නේ. පොලිස් කොස්තාපල් මහත් මයකුට චෝදනාවක් කළාය කියන වැරැද්දට ඔහු කසයෙන් තැලුවා. ඔහුගේ කොන්දේ කස පහර 8ක් තිබුණා. එක කස පහරක් අඟල් 13 ක් දිගයි. පොලීසියේදී මයි ඔහුට තැලුවේ.

ගරු සභාපතිතුමනි, මෙවැනි තත්ත්වයක් තියෙන විට පොලීසියේ වැඩ සාර්ථක කර ගන්නට බැහැ. අබේකෝන් මහත්මයාව මම අදත් වර්ණනා කරනවා. උන්නැහේ කොච්චර මහන්සි වුණත්, අනික් හොඳ නිලධාරීන් කොච්චර මහන්සි වුණත් පොලීසිය කෙරෙහි මහජනයා තුළ සෑම දාම බයක් පවතිනවා.

ඒ සමගම තවත් වැදගත් කරුණක් ගැන මම ගරු පාර්ලිමේන්තු ලේකම් තුමාගේ සැලකිල්ලට යොමු කරන්නට කැමතියි. කරුණා කර පොලීස් නිලධාරීන්ට අවුරුදු ගණනක් එකම පොලීස් ස්ථානයේ ඉන්නට ඉඩ දෙන්නට එපා. පොලීස් නිලධාරීන් අවුරුදු 9, 10, එකම ස්ථානයේ බින්න බැස්සා වගේ සිටීම නිසා නොයෙක් වැරදි සිදු වන බව අප කවුරුත් පිළිගත යුතුයි.

අ. භා. 2.30

පොලීසියට විරුද්ධව ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) විසින් ඉදිරිපත් කරන ලද චෝදනාවට මට නම් එකඟ විය නොහැකියි. චෝදනා කළ යුතුව ඇති කරුණු තිබෙන බව ඇත්තයි. එහෙත් රේස් පොත පිළිබඳව නම් පොලීසියට දෙස් කීම ගැන මට එකඟ වන්නට බැහැ. රේස් පොත් මුද්‍රණය කිරීම තහනම් කරනු සඳහා නීතියක් පණවා ඇතත්, එම නීතියේ අඩුපාඩුවක් නිසා එය ක්‍රියාවේ නොයෙදවිය හැකිව තිබෙනවා. ඒ ගැන පොලීසියට දෙස් කීම ගැන අපට එකඟ විය නොහැකියි. විශේෂයෙන්ම ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා ඒ ගැන දෙස් කීම ගැන එකඟ විය නොහැකියි. පුරවැසි පණතේ කුඩා හිලක් සොයාගෙන නුවරඑළියේ බුචර් මහතකුටත් පුරවැසිකම දුන් කෙනකු මේ විධියට චෝදනාවක් කිරීම වැරදියි.

අවසාන වශයෙන්, පොලිස් දෙපාර්තමේන්තුවේ කටයුතු එන්නටම දියුණු වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

I would like to inform the House that it has been agreed at a conference of leaders of parties to the Question on this Vote being put at 3 o'clock.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා. (බුලත්සිංහල)
(திரு. எட்மன் சமரக்கொடி—புலத்சிங்ஹள)
(Mr. Edmund Samarakkody—Bulathsinhala)

I do not think we can agree to that.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Order, please! It has been agreed to by leaders of parties. I am only informing the House of the arrangement.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

I will not be able to agree to that arrangement. There has been no such agreement. I am just learning that from you.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Order, please! I am bringing this to the notice of hon. Members of the House. I am told that there was an agreement at a conference of leaders of parties.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Not that I know of. I was not informed. This is the first information I have.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

The hon. First Member for Colombo South might be able to enlighten us on this subject.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

All I can say is that all leaders of parties were present at a conference with Mr. Speaker when a time schedule was drawn up. This was drawn up according to last year's programme, and we thought if the schedule time is exceeded we might go at least an hour beyond.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

It is the time schedule.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

Otherwise we will eat into the time allocated for other Ministries and some Ministries may not even be considered. For the Prime Minister's Votes I think the time limit was 12 noon today. We have exceeded the time by about half an hour. After one hour we decided to put the Votes to the House. This was purely a voluntary agreement. The point was that we wanted every Ministry discussed.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

I have no objection to your going on even after 3 o'clock. I only wanted to bring to the notice of the House an agreement that has been reached.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

We cannot agree.

ස්ටැන්ලි තිලකරත්න මයා. (කෝට්ටේ)
(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)
(Mr. Stanley Tillekeratne—Kotte)

Mr. Chairman, there are one or two matters I wish to mention regarding the Police Vote. We know about three years back in the midst of internecine warfare between the D. I. Gs, the late Mr. Bandaranaike settled this question as to who should be the Inspector-General of Police by appointing Mr. Abeykoon to the post of Inspector-General of Police, and he has been working in that position for the last three years——

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. சில்வா)
(Dr. W. D. de Silva)

After great protest.

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

After great protest he had been brought in. But I would wish to protest also on a different plane altogether today.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. சில்வா)
(Dr. W. D. de Silva)

There was a march to Kataragama against his appointment.

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

Mr. Chairman, three years have passed. I am just wondering after three years of repeated criticism of the police on the Floor of this House, what is it that Mr. Abeykoon can tell us about the definite and positive changes that have taken place in the police force.

In point of fact I am quite aware that Mr. Abeykoon entered this high office of Inspector-General of Police with the maximum amount of goodwill of the public and of this House. And we thought his was a very difficult task, his would be a very tiring task, and he would have to clean this

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Augean stable where dirt had been accumulating for so many years. He is a very well-intentioned gentleman, I agree; I agree with some of the sentiments expressed by the hon. Member for Ratnapura (Mr. D. P. R. Weerasekera). But three years after this well-intentioned gentleman had been brought into the police force, has the structure, the attitude and the way that the police get about on various matters, changed even a little?

If we have to frame an issue as to yes or no, I must, with due respect to the Inspector-General of Police, say that the police force today has not changed appreciably even for us to get up on the Floor of this House and say: "At least we appreciate the good effort of the Inspector-General of Police." It is with a note of regret I have to say this.

I know what is taking pace in the police stations. Of course, I am with the rank and file of the police force with regard to their difficulties. I know the difficulties they have in matters of promotion. If you are an honest police constable you do not get promoted; if you are an honest police sergeant you will never become a sub-inspector; if you are an honest sub-inspector, you do not become an inspector; and if you are an inspector, you will never become an A. S. P. unless you stooge. That has been how promotions have been earned in the police force. If an ordinary police constable, sergeant or sub-inspector stood up to the A. S. P. or S. P. or even, as a matter of fact, to the D. I. G., I can assure you that even the Inspector-General of Police will not recommend his promotion. That has been the sorry state.

I am glad that the hon. Member for Ratnapura mentioned the phenomenal rise of L. I. de Silva—he is "LIE" de Silva—"lie" de Silva—the phenomenal rise of a man who has been brought up to position because he knew the way in which he had to rise.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
Holding *pandan* to the U. N. P.

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)
He was used by them in order to get a boost in Ratnapura. During the last days of the Maduwanwala Walauwa they got the police to do it. L. I de Silva was brought to Ratnapura by the United National Party. That was how some of them came up to that position.—[*Interruption*]. Yes, that Maduwanwala lady, that old lady who was a cripple, was asked to sign under police pressure and later she was declared insane also. When the police report had to be got, well the Maduwanwala Walauwa were holding important positions in this Chamber, gentlemen who had married from those families were holding positions of Permanent Secretaries in various departments. The United National Party is here. But that of course is an epoch of the past.

Let us come to the present. The present has not improved one iota to receive commendation on the Floor of this House. The police have not yet given up their third rate tactics. I agree with the statement made by hon. Members on the Floor of this House that an ordinary man fears to go to the police station even to make a statement fearing that the police would use their third rate tactics to ill-treat him.

After all seeing the incidents that have taken place down South where even one hon. Member of this House has been involved, I have taken up the position that I would not go into a police station after 9 o'clock—to play safe. After 9 o'clock if I were to go I would take about two or three other people to be my witnesses.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. சில்வா)
(Dr. W. D. de Silva)
The police will not be safe with you.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

That is one matter. What happens ? If one goes to the police station, you see the Inspector of Police making a statement that the M. P. of the area came to the police station and held the reserve sergeant by his strap and was just pulling him down. Another policeman will say : " I had gone on my patrol rounds and just returned and I saw the M. P. for Kotte pulling the officer down ". Some other policeman will say, " Yes, I saw, and I just parted these two people ". Where are my witnesses ? People are today frightened to go to the police station. There may be all those slogans written on the board : " Once you enter this cell your rights are guaranteed ". That is the place where peace officers work ! I know how skilful these peace officers are.

Today the police have openly become touts in the courts. I have a mandate from a number of lawyers to speak on this. Police constables and police officers are getting a tip or a certain cut from certain lawyers for touting cases for them, and you will be surprised that they are not only retaining lawyers for the prosecution but are also retaining them for the defence and at the end of the month they get their cut from certain lawyers. The police force has come to that miserable position.

What is happening with the police force ? Look at the position. About inquiries against police officers, I should like to say that during the election period in my constituency there was a particular officer, an Inspector by the name of Sagayam. Really, I do not know whether he was an unofficial member of the U. N. P. but he was working for the United National Party openly. He was the person put on duty on a day when some U. N. P. processionists attacked one of the leading bakeries there. He was responsible for organizing the U. N. P. meetings for them and not only that. The police versions were presented regarding the attack on the Baptist bakery : one police officer has given a clear description as to how the processionists came and attacked the bakery and this inspector deliberately made a report with the connivance of the United National Party supporters and gave a different story altogether. He has been threatening people and a number of inquiries were held. He was in charge of the Kirillapone police depot and now he has been brought to my A. S. P's office. Of course, he gets about in civil clothes but still he is carrying on his same propaganda against the Government and the Members of Parliament in those areas. That is not the only thing.

I have a number of police stations in my area. The last time I was very careful in the remarks I made because I wanted to give them an opportunity of mending their ways. I thought with this Government in office and with the appointment of the new Inspector-General, Mr. Abeykoon, probably things will become much better but, I am sorry to say, things have not turned out one bit better.

I have got a police station at Welikada. The Welikada police station, I must say, has become one of the most rotten police stations in my area : thuggery, lawlessness, and every other thing in that area goes unchecked.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)
They nearly attacked me.

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)
Not only that. The vice squads have to operate from another police area in order to detect offences in that area. The vice squad in Mirihana has to come to Welikada in order to bring illicit manufacturers of liquor to book. The Wellampitiya police had to be brought via Kirillapone in order to raid these places in the Welikada area.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Not only that. Recently, there have been allegations of bribery and corruption against certain police officers at Welikada. They have been brought to the notice of the Inspector-General of Police and the Parliamentary Secretary, but what action have they taken ? Not only that, recently there were incidents in that area, and I cannot possibly give a certificate to the Inspector-General on these matters. Whatever it may be, we need a completely new police service in this country, not force but service must be the motive of the police.

Recently, there were incidents in my area. I have got a good inspector in Welikada. I have nothing against him personally. But what has happened to him ? His relations are lawless people in the area and whenever an incident occurs this poor gentleman is so helpless that he takes the line of least resistance and goes on leave. He goes about his business as usual till the other inspectors and officers complete their inquiries. Some of the police officers at Welikada, including sergeants and constables are found drinking from morning till evening in the illicit manufactories of the area. They are in the pay of local thugs and I make bold to press these allegations that some of the police stations in my area are being paid heavily and monthly by the unlawful manufacturers of liquor.

I personally know of a case which I am willing to place before the Inspector-General of Police. I know it personally because I am a lawyer and I appear in these cases. Very recently there was a haul of 4 cars and a large quantity of unlawfully manufactured arrack, which was given so much press publicity, detected not by the Welikada police in the Welikada police area but detected by the Mirihana vice squad, a police station for which I have a very good word. I give the devil his due. If a police constable is good I always give him his due. The vice squad had to come all the way from Mirihana to Welikada and raid these people and a large quantity of unlawfully manufactured arrack was brought to court, and some of them who were arrested came to me and said—

"පොලීසිය හරි කුපාඩි වැඩේ නොවැ කරන්නේ."

"ඒ මොකද ?"

"මේ පොලීසියට සල්ලි දීලා යන්තම් බේරී ඉන්නවා. නමුත් අරෙහෙන් ඇවිත් අල්ල ගන්නවා."

"කොච්චර දෙනවද ?"

"හැම මාසෙම රුපියල් 1,250 ක් දෙනවා."

They get as much as Rs. 1,250 a month. If you want to be a real police inspector you have only to get a transfer to Welikada and in one or two years you can easily buy a car, a house and property, give your daughters in marriage and retire with a very good bank account for yourself.

අ. භා. 2.45

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා

(டொக்டர் டப்ளியு. டீ. சில்வா)

(Dr. W. D. de Silva)

Welikada is hell !

ස්ටැන්ලි තිලකරත්න මයා.

(திரு. ஸ்டான்லி திலக்கரத்ன)

(Mr. Stanley Tillekeratne)

අ. භා. 2.45

Yes, I agree with the hon. Member for Borella, Welikada is hell.

There was an incident about two weeks back when two political factions had a fight. As a Member of Parliament I remained out of it. What happened ? The next day the sergeant who was in charge of the inquiry was found drinking till 2 o'clock in the house of the other party and I have got evidence to establish it.

This is the police force. I am not going to give a recommendation on the Floor of the House to a police force that is even stinking today as it was stinking in the past. Now you will see, Sir, young police constables, good, well-intentioned village boys, are being brought and trained, men

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ.වැන්ලි තිලකරත්න මයා.]

who really want to serve the country. What happens to them ? They go to a police station and remain there only for 6 months. What happens ? In 6 months the older police boys rub on the young police boys and tell them how things should be done. Yes, rub on them and tell them exactly how things should be done and in 6 months these poor boys cannot be taken out again because they have got into a mess completely.

I have another police station at Maharagama. We write petitions and we are told the matter will be looked into. If we write petitions against them, what do we get ? We get a reply either from the Inspector-General or from the D. I. G. or from the S. P. or the A. S. P. saying "We are looking into the matter" or "the matter is being looked into" but the matter is not looked into after that.

The Maharagama police ! My hon. Friend the Member for Kesbewa (Mr. Chandrasiri) is here and he will tell you how the Maharagama police functions—another police station the reputation of which is stinking in the entire Kesbewa and Kotte electorates. I make these charges with a sense of responsibility. I have never made such charges on the Floor of the House until I had attempted to clean things through letters and correspondence. I will try to clear up matters or expose what the police are doing in my area.

I have a very good police station, Sir—I hope the Inspector-General will make a note of good people also —at Mirihana, manned by a very good officer and against which station I have not yet got a single complaint. The Mirihana Police Station has been doing a very good job. The Headquarters Inspector, the sub-inspectors, inspectors and the entire constabulary have been doing a very good job. The Nugegoda Police Depot is another example of a good police station, another good example of a very good police station that is trying to handle its job very well, and today some people have come and told me that Nugegoda and Mirihana Police Stations are two ideal police stations in my electorate.

Mr. Chairman, we make charges on the Floor of this House today. You try to make inquiries and see what will happen in two or three months, the same situation will go on. Sometimes the A. S. P. does not want to take the responsibility of throwing out a few fellows, why ?—the police loyalty has to be maintained *esprit de corps ;* the S. P. does not want to take action because he feels that the unity of the police should be maintained ; the D. I. G. does not want to do so because the police morale has to be kept up ; and the Inspector-General also feels that the morale has to be kept up.

Mr. Chairman, this police force has to change ; it is not a service but a force. I am very perturbed about the difficulties of the rank and file. I know at the Nugegoda Police Station, the police constables have not got a decent place to sleep, not even a decent police mess. The same difficulties are present at Mirihana. I want the Inspector-General of Police to take up some of these matters and ask for a report on the activities of the Maharagama police and the Welikada police.

Now, a week back a lady was taken to the police station at Maharagama. This lady was taken behind the police station and I got information that a sergeant and two constables outraged her modesty in the backyard of the Maharagama Police Station. If representations are made to the I. G. P. I know what will happen—there will be no evidence to bring the culprits to book. This is the police force we have to defend. This is a shameless police service which I cannot defend on the Floor of the House.

The system of punishing police officers has to change. We have repeatedly been asking that the system be revised. Why has not the I. G. P. taken steps to completely revise the system by which police officers are brought to book ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Look at the panels appointed to go into charges against police officers. Those on the panels are all police officers. I must give the hon. Leader of the Opposition due credit because he suggested at one stage that panels of responsible citizens with a certain amount of position and standing in the area should be established in order to try allegations against police officers.

We have to get rid of those sections of the police force that are today corrupting it more and more. The police force has not improved in the last few years. It has become worse in certain areas.

I insist that the I. G. P. do give immediate instructions to the Superintendent of Police of my area to go into the history of the police personnel both at Maharagama and Welikade and if there is any man there who has served for more than four years he be transferred and if there is any man there against whom allegations have been made by local residents action be taken against him, so that I may get rid of the stench although I know somebody else will create the stench thereafter.

Every year we have been criticizing the police. Every year the same process continues. Every year the panels before whom these people are tried return the same verdict because they say they have not enough evidence. I know that the I. G. P. is a gentleman of good intentions. I hope this gentleman of good intentions will buckle himself down to the task. Then we will have better words for him next time. I hope the I. G. P. will pass his fifty-fifth year and carry on till he is sixty. During his time let him cleanse his house and put it in order. Let him re-organize the police force, change the system of recruitment, the system of trying charges against police officers and so on, then we will rise on the Floor of the House and say, "Yes, you have done a splendid job of work; you deserve a bouquet". These are matters he must pay attention to and if he does so he will earn our compliments.

ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස් (නාත්තන්ඩිය)

(சேர் அல்பட் எப். பீரிஸ்—நாத்தாண்டிய)

(Sir Albert F. Peries—Nattandiya)

ගරු සභාපතිතුමනි, මා නියෝජනය කරන නාත්තන්ඩිය කොට්ඨාශය ගැන වචනයක් දෙකක් කථා කරන්නට අදහස් කරනවා. එහෙත් වැඩි වේලාවක් ගන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. නාත්තන්ඩිය හලාවත දිස්ත්‍රික්කයේ තිබෙන විශාල නගරයක්. මා විසින් මෙන්ම ඒ පළාතේ තිබෙන නොයෙකුත් සමාගම් මණ්ඩුත් නාත්තන්ඩියට පොලීස් ස්ථානයක් වුවමනා බවට නොයෙක් වර යෝජනා ඉදිරිපත් කරන්නට යෙදුණා. නමුත් අද වන තුරු ඒ යෝජනා ගැන සතුටුදායක පිළිතුරක් ලැබී නැහැ.

නාත්තන්ඩිය පොළ ගැන කල්පනා කරමු. එය ලංකාවේ තිබෙන පොළවල් අතර විශාල එකක්. ඒ පළාතේ සෑම තැනම සිටින අය බඩු ගැනීමට එන්නේ නාත්තන්ඩියේ කඩ පොළටයි. නොයෙක් විධියේ කලකෝලාහල ඒ උදවිය අතරේ ඇති වෙනවා. මේ ළඟදී මිනී මැරුම් දෙකක් සිද්ධවුණා. මෙතැන පොලිස් ස්ථානයක් තිබෙනවා නම් ඔය විධියේ දේ බොහෝ දුරට මර්දනය වන්නට පුළුවන් බව මේ අවස්ථාවේදී කියන්න සතුටුයි. පොලිස් ස්ථානයක් පිහිටු වීමට බැරි නම් සුළු "ගාඩ් රූම්" එකක් වැනි ස්ථානයක් වත් වහාම පිහිටුවනු ලැබුවහොත් ඒ නගරයේ සහ ඒ අවට ගම්වල ඇති වන ආරාවුල් බොහෝ දුරට විසඳා ගන්න පුළුවන් වන නිසා එමගින් විශාල සේවයක් සිදු වන්නට පුළුවන් බව මම කල්පනා කරනවා. මාරාවිල පොලීස් ස්ථානය තිබෙන්නේ හැතැප්ම ගණනාවක් දුරින්. එම නිසා මා තදින්ම කියා සිටිනවා, පොලීස් මධ්‍යස්ථානයක් මේ ස්ථානයේ පිහිටු වීම ඉතාමත් වැදගත් බව.

ගරු සභාපතිතුමනි, දැනට කොස්වත්ත සහ මාරාවිල පොලිස් ස්ථාන දෙකක් පිහිටුවා තිබෙනවා. එහෙත් මෙහි ගොඩනැගිලි ඉතාමත් අබලන් තත්ත්වයකයි, පවතින්නේ. ඒ ගොඩනැගිලි, මෙම පොලීස් ස්ථානවල සේවය කරන නිලධාරීන්ගේ සැප පහසුවට ප්‍රමාණවත් වන්නේ නැහැ. ඒ වායේ ඉඩකඩ මදිවා පමණක් නොවෙයි,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්]

ඒ ගොඩනැගිලි ඉතාමත් දිරා ගිය තත්ත්වයකයි තිබෙන්නේ. විශෙෂයෙන්ම කොස්වත්ත පොලිස් මධ්‍යස්ථානය පිහිටුවා තිබෙන්නේ කුලියට ගෙන තිබෙන ගොඩනැගිල්ලකයි. එම නිසා එම පළාතෙන් ඉඩම් කැබැල්ලක් අරගෙන ගොඩනැගිලි තනා පොලීසියේ කටයුතු පහසු අන්දමට ගෙන යන්නට වැඩ කටයුතු සලසන ලෙස මම ඉල්ලා සිටිනවා. ඇත්ත වශයෙන්ම බොහෝ දෙනෙක් මේ කාරණය ගැන මට දන්වා තිබෙනවා. අවසාන වශයෙන් මා ඉදිරිපත් කරන ලද කාරණා වැඩි කල් නොයවාම—මේ අවුරුද්ද තුළදීම—ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

ගරු සභාපති තුමනි, මෙම වැය ශීර්ෂයේ යටතේ වැදගත් කාරනා කීපයක් මෙම ගරු සභාවට මතක් කර දීමට මම බලා පොරොත්තු වෙනවා. ආණ්ඩු පක්ෂයේ මෙන්ම විරුඛ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කිහ පොළක්ම ගිය අවුරුද්දේදී නැඟූ චෝදනාම—සමහර විට ඊටත් වඩා ඛර පතළ චෝදනා—මේ අවුරුද්දේත් නැඟුවා. ඒ බව තමුන්නාන්සේට හොඳින්ම පැහැදිලි වෙන්නට ඇතැයි මා කල්පනා කරනවා. ගිය අවුරුද්දේදී දවස් දෙකක් පමණ කාලයක් තිස්සේ මේ ගරු සභාව ඉදිරියේ තබන ලද වැදගත් කාරණාවලින් එක් කරුණක් ගැන නැවතත් විශේෂයෙන් මතක් කර සිටිනවා. එදා මේ ගරු සභාවේදී පෙන්වා දුන්නා, පොලීසිය මහජනතාවගේ විරුඛකාරයෝය, එසේ නැතිනම් මහජනතාව පොලීසියේ විරුඛ කාරයෝය යන හැඟීමක් ඇති වී තිබෙන බව. එම නිසා මේ හැඟීම මහජනතාව කෙරෙන් ඇත් කිරීමට කටයුතු යෙදීම ඉතා වැදගත් බව කියා සිටියා. නමුත් ඒ සම්බන්ධයෙන් මේ දක්වාත් අමුතු විධියේ වැඩ පිළිවෙළක් ගෙන තිබෙනවාද යන්න සලකා බැලිය යුතු දෙයක්. ඇත්ත වශයෙන් එබන්දක් අපට නම් පෙනෙන්නට නැහැ.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් තමුන්නාන්සේටත් මතක් කරන්නට සතුටුයි. එදා එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවට විරුඛව මහජනතාවගේ කෝපය වැඩි වන්නට හේතු වූ ප්‍රධාන කරුණ මොකක්ද කියා. පොලීසියෙන් මහජනතාවට සෑම අතින්ම ඇති වුණු හිරිහැර කරදර ඉවසා ගන්නට බැරුව මහජනතාව ඒ ආකාරයෙන් කටයුතු කළාය කියායි අපට පිළිගන්නට පුළුවන් වන්නේ. අන්න ඒ කාරණය ඉතාමත් වැදගත් දෙයක් හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව පිළිගන්නට ඕනෑ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
සම්පූර්ණ ඇත්ත.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් එය පිළිගන්නවා නම්, මම ඉතාමත්ම සතුටු වෙනවා. මෙහිදී මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට—විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට—එක්තරා වැදගත් ප්‍රශ්නයකට මුහුණ දීමට සිදු වෙනවා. එදා එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවට විරුඛව නැගී සිටි මහජනතාවගේ මූලික බලාපොරොත්තුව වූයේ පොලීසියෙන් ඒ අයට විඳින්නට වන අනන්ත අප්‍රමාණ හිරිහැර කරදරවලට යම්කිසි සහනයක් ලැබේය කියායි, ඒවා විසඳා දෙන්න රජය කටයුතු කරයි කියායි. නමුත් එදා තිබුණු තත්ත්වයේ වෙනසක් කිරීමට මේ වන තුරුවත් මේ රජයට පුළුවන් වුණාද කියා මම අහන්නට කැමතියි.

අ. භා. 3.

ගරු සභාපතිතුමනි, නොයෙක් නොයෙක් විධියෙන් මේ සභාව ඉදිරියේ අපේ ගරු මන්ත්‍රීවරුන් ගිය අවුරුද්දේදී ද මේ කාරණය ගැන කථා කළා. ඇත්ත වශයෙන්ම එදා ආණ්ඩුව පෙන්වා දෙන්න උත්සාහ කළා, එක්සත් ජාතික පක්ෂය විසින් ගෙන ගිය වැඩ පිළිවෙළට වඩා වෙනස් ස්වරූපයකින්, අමුතු විධියකින්, වැඩ පිළිවෙලවල් සකස් කරනවාය කියා. අපට මතකයි ඒ අවස්ථාවේදී නොයෙක් විධියේ වාද විවාද මේ ගරු සභාවේදී සිදු වූ බව. නමුත් මේ අවස්ථාවේදී ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියන්න පුළුවන්ද, 1956 සිට 1959 දක්වා වූ ඒ කාල පරිවේඡදය තුළත්, ඊට පසුවත්, මේ දක්වාත් මුලින් ගෙන ගිය වැඩ පිළිවෙළෙහි තමුන්නාන්සේලා වෙනසක් ඇති කර තිබෙනවාද කියා. පොලීසියෙන් මහජනතාවට විඳින්නට වූ හිරිහැර කරදර අඩු කිරීමට තමුන්නාන්සේ ගෙන තිබෙන පියවර මොකක්ද කියා මම ප්‍රශ්න කරන්නට කැමතියි. එප මණක් නොව, පොලීසිය කියන ආය තනය අමුතු පිළිවෙළකට හැඩගැස්වීමට නම් කොයි ආකාරයෙන් ක්‍රියා කළ යුතුද කියා බලා ඊට නිසි වැඩ පිළිවෙළක් ලැස්ති කළාද? ඒ ප්‍රශ්නයත් ඉතාමත් වැදගත් ප්‍රශ්නයක්. පසුගිය අවුරුද්දේ ඇති වුණු චෝදනා අතර විශේෂයෙන්ම මගේ මිත්‍ර දකුණු කොළඹ දෙවන මන්ත්‍රී තුමා (බර්නාඩ් සොයිසා මයා.) තරයේම ඉල්ලා සිටි එක් දෙයක් නම් පොලිස් කොමිෂන් සභාවක් අවශ්‍ය බවයි. එක් කරුණක් දෙකක් ගැන පමණක් නොව, පොලීසියේ සෑම අංශ යක්ම අළුත්වැඩියා කර, අළුත් වැඩ පිළිවෙළක් ගෙන යා යුත්තේ කොයි ආකාරයටද කියන ප්‍රශ්නය ඉතා ලෙහෙසි ප්‍රශ්නයක් නොවන බව අප පිළිගන්නවා. ඒ වගේම මහජනතාවත් පොලීසියත් අතර මීට පෙර තිබුණ තත්ත්වයට වඩා අමුතු තත්ත්වයක් ඇති කර ගන්නේ කොයි ආකාරයටද යන ප්‍රශ්නය විසඳා ගැනීම පිණිස නොයෙක් නොයෙක් අයගේ අදහස් විමසා බැලිය යුතුයි. ඒ වාගේම පොලීසියේ මාගීයෙන් අපරාධ මර්දනය කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්නේ කෙසේද යනු සොයා බැලීමටත් කොමිෂන් සභාවක් ප්‍රයෝජනවත් වන බව අපි සලකන්න ඕනෑ. පොලීසියට විරුඬව ජනතාව ගෙන එන යම් යම් චෝදනා සාධාරණ පිළිවෙළට විසඳීමට පිරිසුදු විභාග ක්‍රමයක් ඇති කරන්නේ කොයි ආකාරයටද කියා සොයා බැලීම පිණිස ප්‍රශ්න මාලාවකුත් වැදගත් වෙනවා ඇති. එසේ කළ විට කාගේත් යුතු අයුතුකම් බලා හරි විභාගයක් තිබ්බාය කියා අවසානයේදී දෙපක්ෂයටම සතුටු වෙන්ට ඉඩ තිබෙනවා.

ඒ වාගේම පොලිස් නිලධාරීන්ට ඇති නොයෙකුත් හිරිහැර කරදර ගැන ගරු මන්ත්‍රීවරුන් විසින් කරුණු ඉදිරිපත් කරන්නට යෙදුණා. ඒ ගැන ක්‍රියා කරන්නේ කෙසේද යනු සොයා බැලීමත් ඉතා වැදගත් ප්‍රශ්නයක්. පොලීසියේ සිටින කොස්තාපල්වරුනුත්, සාජන්ට්වරුනුත්, ඒ වාගේම ඉන්ස්පෙක්ටර්, ඒ.එස්.පී., එස්.පී., අයි.ජී.පී. තත්ත්වයට යන තුරු සිටින සියලු දෙනාම තම තමන්ගේ රාජකාරිය හරියාකාර කිරීමට නම්, ඒ අයගේ පඩි නඩි නියමාකාරයට සකස් කිරීමේ ප්‍රශ්නයත් වැදගත් නිසා එයද කොමිෂන් සභාවක් මගින් හුඟාක් දුරට විසඳන්නට අපට ලෙහෙසි වේවිය කියා අප බලාපොරොත්තු වෙනවා.

පසුගිය අවුරුද්දේ මෙම වැය සම්මතය ගැන සාකච්ඡා කරන විට මට මතකයි, ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මේ ගරු සභාවේදී කී දේවල්. එතුමා කිව්වා, "මම කොමිෂන් සභාවකට විරුද්ධය කියා සමහර ගරු මන්ත්‍රීවරු කිව්වා, නමුත් මම ඊට කිසි සේත් විරුද්ධ නැත; ඒ වාගේම කොමිෂන් සභාවක් පත් කිරීමට ඕනෑම වේලාවක මම ලැස්තිය" කියා. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා නොයෙක් විධියට කථා කරලා තිබෙනවා. මම දවල් ඒ කථාව කියෙව්වා. කොමිෂන් සභාවකට කැමතිය, විරුද්ධ නැත කියා එතුමා ප්‍රකාශ කළේ කථාවේ මැද හරියේදියි. නමුත් අවසාන යේදී කිව්වේ මොකක්ද? "කොමිෂන් සභා ගැන අපි කථා කරන විට අප විශෙෂයෙන් බැලිය යුත්තේ එයින් යම්කිසි ප්‍රතිඵලයක් ලැබෙනවාද නැද්ද" යන බවයි. ප්‍රතිඵල ඇතත් නැතත් කොමිෂන් සභාවක් වුව මනාය කියා ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) විසින් කියන්නට යෙදුණා. ඊට පිළිතුරු වශයෙන් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා කීවේ කුමක්ද? "අප නම් පිළිගන්නේ නැහැ, ප්‍රතිඵල නොමැති කොමිෂන් සභා වුවමනාය කියා." එයයි එතුමා කීවේ. ප්‍රතිපත්තියක් වශයෙන් අප පොලිස් කොමිෂන් සභාවකට විරුද්ධ නැත කියා මුළු ලෝකයටම හඬගා කියන නමුත් උන්නැහේලාගේ හිත් ඇතුලේ නම් එවැනි අදහසක් කිසි සේත්ම නැත කියන එක ඒ අනුව මට කියන්න පුළුවනි. මගේ කියමන වැරදි නම් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට එය හරිගස්සන්න පුළුවනි. නමුත් ඇත්ත ඒකයි. අවුරුද්දක් ගතවෙලත් එවැනි පොලිස් කොමිෂන් සභාවක් පත් කළාද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.]

කියන එකයි මා අහන්නේ ? එහෙම එකක් පත් කළේ නැහැ. ගරු සභාපතිතුමනි, මම කියන්නම් මේකේ රහස. ගිය අවුරුද්දේ කියන ලද කරුණු ගැන සලකා බලා පොලිස්පතිතුමා ඇයි නියම වැඩ පිළිවෙළක් සකස් නොකළේ කියන ප්‍රශ්නය ගරු මන්ත්‍රීන් කීප පොළක් විසින් අසන්නට යෙදුණා. පොලිස්පතිතුමාට ලොකු වගකීමක් පැවරී තිබෙනවා. ඒ බව අප අමතක කරන්න නරකයි. ඒ නිසා එතුමා නිසි අන්දමට ක්‍රියා කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ජනතාවට පොලීසියෙන් ඇති වන කරදර නැතිකර දමා අළුත් වැඩ පිළිවෙළක් අනුව කටයුතු කරන්න ආණ්ඩුවට වුවමනාද ? ජනතාවට හිරිහැර නොකරන, අළුත් වැඩ පිළිවෙළක් අනුව කටයුතු කරන, ආයතනයක් බවට පොලිස් අංශය හරවන්න ආණ්ඩුවට වුවමනාද ? ඔන්න ඔය ප්‍රශ්නයට උත්තරයක් ලැබිය යුතුයි. ඔය ප්‍රශ්නයට ලැබෙන පිළිතුර මොකක්ද කියා මෙන්න මේ නිදර්ශනයෙන් හිතාගන්න පුළුවනි. පොලීසිය සම්බන්ධව ගිය අවුරුද්දේ මෙහි ඇතිවුණ විවාදයට මාස හතර පහකට පසුව සිදු වුණු සිද්ධියකුයි මා මේ කියන්නට යන්නේ. ගරු සභාපතිතුමනි, කළුතර පොලීසියේ ලොකු උත්සවයක් තිබුණා. එම උත්සවයට ගරු අගමැතිනියත් සහභාගි වුණා. එම උත්සවයේ තෑගි බෙදීමේ වැඩ පිළිවෙළකුත් යොදා තිබුණා. එම අවස්ථාවේදී නොයෙකුත් අන්දමේ දක්ෂතාවන් වෙනුවෙන් තෑගි ලබාගත් පොලීස් සේවකයන් සිටියා. දක්ෂකම් පාන ලද එක්තරා පොලීස් භටයකුට එම අවස්ථාවේදී ගරු අගමැතිනිය ප්‍රසිද්ධියේම දුන් තෑග්ග මොකක්ද ? කාටත් දැක බලාගන්න මේ බව පත්‍රවල පින්තූර සහිතව පළ වී තිබුණා. ගරු අගමැතිනිය එම පොලීස් කොස්තාපල් වරයාට තෑග්ගක් වශයෙන් දුන්නේ බැටන් පොල්ලකුයි. මා දන්නේ නැහැ බැටන් පොල්ල හඳුන්වන්න සිංහලෙන් පාවිච්චි කරන නියම වචනය මොකක්ද කියා.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
තඩි බාන පොල්ල.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

හොඳයි, අපි බැටන් පොල්ලය කියා කියමු. එය මොකටද පාවිච්චි කරන්නේ ? ඒක පාවිච්චි කරන්නේ ගෙදර ගෙනිහින් අටුවේ තබා ගන්න නොවෙයි. හොඳට පාවිච්චි කරන්නයි.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)
කවුද කිව්වෙ ?

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

ගරු අගමැතිනිය එම පොලීස් භටයාට බැටන් පොල්ලක් තෑගි කළේ කුමන අදහසක් උඩද ? ජනතාවට තඩි බාන එක ගැන, කරදර හිරිහැර කරන එක ගැන අප මෙතැන සාකච්ඡාකොට මාස හතරක් පහක් යන්නටත් පෙර හොඳට පාවිච්චි කරන්නය කියා ගරු අගමැතිනිය පොලීස් භටයකුට බැටන් පොල්ලක් දුන්නා. ගමේ ගොඩේ අය හැන්දෑ කාලයට කාරිය කියන පුංචි සින්දුවක් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. එම සින්දුවට මගෙනුත් වචනයක් දෙකක් දමා කියන්න මා මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා. තමුන්නාන්සේ එම සින්දුව මෙහිදී තාලයකට අනුව කියන්න අවසර නොදෙන නිසා මා එය වචන මාලාවක් හැටියට කියන්නම්. මා සින්දු කියන්න දක්ෂ කෙනෙකුත් නොවෙයි. ඒ සින්දුව මෙහෙමයි : "ගහපල්ලා, කොටපල්ලා, ජෝලි කරපල්ලා, අද මැරුණත් සිතට සැපයි, මිනී මරපල්ලා." අගමැතිනිය පොලීසියට බැටන් පොලු දී ඉගැන්නුවේ ඔය සින්දුවයි. මම මේවා නිකම් විහිළු වශයෙන් කියන ඒවා නොවෙයි. මා මේවා කියන්නේ යමක් පෙන්නුම් කර දීමටයි. ගිය අවුරුද්දේ ඒ තරම් චෝදනා කර එළිපිට කරුණු ඉදිරිපත් කොටත්, ඊළඟට කළේ බැටන් පොලු දීමයි.

ගරු සභාපතිතුමනි, පොලීසිය විසින් එක්තරා පවුලකට කළ ඉතා දරුණු අපරාධයක් ගැන රත්නපුරේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. වීරසේකර මයා.) කියා සිටියා. ඒ පවුලට කළ දරුණු අපරාධය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසා ඒ පවුලේ නායකයාට ජීවත් වීම එපා වී ඔහු ගඟට පැන මැරුණු බවත් සඳහන් කළා. මේවා සිදු වන්නේ ඇයි? මේවා නවත්වන්නට ආණ්ඩුවට වුවමනා වක් නැති නිසයි. පොලීසියේ උදවියට පාවිච්චි කරන්නට බැටන් පොලු දෙනවා නම්, ඔන්න ඒවා පාවිච්චි කරන හැටි! රත්නපුරේ කුරුවිට පොලීසිය ඒ ප්‍රදේශය පාලනය කරන්නේ බැටන් පොල්ලේ බලයෙන් බව ගරු මන්ත්‍රීවරුන්ටත් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාටත් මතක් කරන්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, මෙම ප්‍රශ්නය ගැන කථා කරන විට මා හිතන්නේ නැහැ මේවා වෙනස් කරයි කියා. ඊට හේතුව ආණ්ඩුවට වුවමනා වී තිබෙනවා, පොලීස් හමුදාවත් යුද්ධ හමුදාවත් මාඊයෙන් මේ රට පාලනය කරන්නට. 1956 සිට 1959 දක්වා ගෙන ගිය මහජන එක්සත් පෙරමුණු ආණ්ඩු කාලයේදී අපට එළිපිටම දැන ගන්නට ලැබුණා, ඒ බව. ආණ්ඩු පැත්තේ ගරු මන්ත්‍රීවරුන් පොලීසියට චෝදනා නැඟුවා. මා ඒ ගැන සතුටු වෙනවා. දැන් පොලීසිවල එවැනි ක්‍රියා අඩු බවත් සමහර මන්ත්‍රීවරුන් සඳහන් කළා. පොලීසිය ආණ්ඩුව ආරක්ෂා කරන මිත්‍රයකු හැටියට සලකා ඒ අයගේ බලය කිසිම විධියකින් සීමා නොකර ඒ අයගේ මාර්ගයෙන් රට රක්ෂා කරන්නට, පලනය කරන්නට, බලාපොරොත්තු වන නිසයි, පොලීසිය මහජනයට කරන කරදර අඩු කරන්නට ආණ්ඩුවට බැරිව ගොස් තිබෙන්නේ. පොලීස්පතිතුමාටම දොස් කියා මේ ප්‍රශ්නය විසඳන්නට බැරි බව මා තමුන්නාන්සේට මතක් කරන්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, මේ පොලිස් විභාග සම්බන්ධයෙනනුත් වචනයක් දෙකක් මා කියන්න කැමතියි. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීවරයෙක් බණ්ඩාරවෙල සිදු වූ එක්තරා සිද්ධියක් ගැන සඳහන් කළා. ගරු මන්ත්‍රීන් යම් යම් අවස්ථාවලදී තම තමන්ගේ කොට්ඨාශවල තිබෙන පොලීසි වලින් කෙරෙන වැරදි ගැන පැමිණිලි කළ විට ඒවා ගැන සොයා බලා පැය 24 ක් ඇතුළත වුවත් ඒ ගැන නිසි ලෙස ආණ්ඩුව ක්‍රියා කරනවා නම් මා සන්තෝෂ වෙනවා. ගරු මන්ත්‍රීවරයකු විසින් තමාගේ වගකීමක් වශයෙන් ආණ්ඩුවට කියන වනම් "මගේ ප්‍රදේශයේ මේ විධියේ අපරාධයක් පොලීසිය කළා" කියා, පැය 24 ක් තුළදී වුවත් ඊට නිසි කටයුතු කරන්නට ආණ්ඩුව සූදානම් වෙනවා නම් එය යුක්ති සහගත බව මම කියනවා. ඊට තර්ජනයක් වශයෙන් පොලීසිය ස්ථිරයිකි කළත් එය කළ යුතුයි. ඇයි? අපට වුවමනා කරන්නේ වැරදි නවත්වන්ට නිසයි. බණ්ඩාරවෙලට විතරද ඒ ප්‍රශ්නය අයිති? බණ්ඩාරවෙල ගරු මන්ත්‍රීතුමා (ජේ. ජී. ගුණසේකර මයා.) ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. මා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නොවෙයි. මගේ ආසනය බුලත්සිංහලයි. ඒ කොට්ඨාශයේ ඇති ප්‍රශ්න මාලාවක් ගැන ගිය අවුරුද්දේදී මා සඳහන් කළා. මගේ කාර්‍ය්‍යකට බුලත්සිංහල පොලීසියෙන් ගල් ගැසූ බවත් මා එදා ප්‍රකාශ කළා. මා කළ චෝදනා උඩ විභාගයක් පවත්වා තවත් දෙදෙනකුටත් තර්ජනය කළ බව එදා පාර්ලිමේන්තුවේදී මා කියා සිටියා. මා කියා සිටියා බුලත්සිංහල පොලීසියේ වැඩ පිළිවෙල බොහෝම අසතුටුදායකයි, ඒ නිසා ඒ අය මාරු කරනවා නම් බොහෝම හොඳය කියා. අපේ හඬ ජනතාවගේ හඬයි. නමුත් තමුන්නාන්සේලා ක්‍රියා කරන්නේ තමුන්නාන්සේලාගේ පක්ෂයේ ප්‍රයෝජනය සඳහා පමණක් බවයි, අපට පෙනෙන්නේ. අනික් කොට්ඨාශවල ජනතාවට හිරිහැර කරන පොලිස් නිලධාරීන් නැද්ද? බණ්ඩාරවෙල පමණක් නොවෙයි, අනික් ප්‍රදේශවල ගරු මන්ත්‍රීවරුන්ගේත් ප්‍රශ්න විසඳීමට තමුන්නාන්සේලා සූදානම් වී සිටිය යුතුයි. නමුත් එසේ කරාවියයි මට නම් කිසි විශ්වාසයක් නැහැ.

අ. භා. 3.15

පොලිස් නිලධාරියෙක් යම් කිසි මන්ත්‍රීවරයකු සමග යම් හිත් අමනාපයක් ඇති වුවහොත් එය එතැනින් අවසන් වන්නේ නැහැ. මට එවැනි දෙයක් වුවොත් මම එය බේරා ගන්නවා. නමුත් අප සමග සිටින අනික් සාමාන්‍ය අයට පහර ගැසීමට අප සමග ක්‍රෝධ බැඳගත් පොලිස් නිලධාරීන් උත්සාහ දරනවා. පානදුර පොලීසියේ ඒ. එස්. පී. ප්‍රෙඩ් ද සේරම් මහත්මයාට විරුද්ධව මා පැමිණිල්ලක් කළා. අඟුරුවාතොට පොලීසියේ වූ යම් කිසි කරදරයක් නිසයි, මම ඔහුට විරුද්ධව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.]

පැමිණිලි කළේ. ඊට මාසයකට පමණ පසු පානදුරේ සාමාන්‍ය දුප්පත් කෙනෙක් පානදුරේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ළඟ ටත් ගොස්, ඊට පසු මා ළඟටත් පැමිණියා. ඔහු බයිසිකලයක් පැදගෙන යද්දී කාර් එකක් අවුත් හැප්පීම නිසා බයිසිකලයට බොහෝ තුවාල වූ නමුත් ඒ කාරණය ගැන පොලීසිය හරියට ක්‍රියා කළේ නැතැයි ඔහු කිව්වා. ඒ සම්බන්ධයෙන් පොලීසිය නඩු වක් දැම්මේ නැත කිව්වා. සමහර විට පොලී සියට සෑහෙන තරම් කරුණු නැතුව ඇති. නමුත් මේ කාරණය ගැන සොයා බලා නඩු වක් දැමීමට පුළුවන්දැයි බලන ලෙස ඉල්ලා මම ඒ. එස්. පී. මහත්මයාට ලියුමක් යැව්වා. පානදුරේ මන්ත්‍රීතුමාත් ලියුමක් යවා තිබෙනවා. මොකක්ද, ඒ සුපිරින් ටෙන්ඩන්ට් මහත්මයා කළේ? මොහුට හොඳ පාඩමක් උගන්වන්නම් කියා වරද ඔහුගේ යසි ඔහුට විරුද්ධව නඩුවක් පැව රුවා. පානදුරේ උසාවියේ පවරන ලද ඒ නඩුවෙන් ඔහු නිදහස් වුණා. ඇත්ත වශ යෙන්ම ඔහුට විරුද්ධව නඩු දෙකක් පවරා තිබුණා. ඒ නඩු දෙකෙන්ම ඔහු නිදහස් වුණා. බලන්න සභාපතිතුමනි, ඒ පොලිස් නිලධාරියා පලි ගත් හැටි. මන්ත්‍රීවරුන් ගෙන් පලිගන්නවා නම් එය වරදක් නොවෙයි. නමුත් සාමාන්‍ය ජනතාවගෙන් පලි ගැනීමයි වරද.

මගේ කොට්ඨාශයේ එක් පැමිණිල්ලක් සම්බන්ධයෙන් විභාගයක් ඇති වුණා. පැමිණිල්ලක් වුණාම විභාග කරන්නේ කොහොමද? විභාගයක් පවත්වන්න ඕනෑ, විත්තිකාරයාත් ඉදිරිපිට. නමුත් මේ විභාගය පවත්වා තිබෙන්නේ කොහොමද? පැමිණිල්ල කළ මහත්මයා මෙන්න මේ විධියට කිව්වේ:

මගේ කට උත්තරය ලියාගෙන මට යන්න කිවා. ඔන්න බලන්න විභාගය කරපු හැටි. පොලීසියේ නිලධාරියකුට විරුද්ධව පැමිණිල්ලක් කළාම ඒ ගැන විභාගයක් පවත්වනවා නම් ඔය විධියටද එය කරන්න ඕනෑ? ඒ නිලධාරියාවත් නැහැ. සාක්ෂිකාරයාට එන්න කියා විභාග යක් පවත්වනවා. වුවමනා නම් මේ ගැන තවත් විස්තර දෙන්න පුළුවනි. කාට කියන්නද? පලක් නැහැ, පලක් නැහැ.

තවත් එක වැදගත් ප්‍රශ්නයක් තියෙනවා. ගිය අවුරුද්දේදීත් ඊට පෙර අවුරුද්දේදීත් අවුරුදු ගණනාවක්ම මේ ගැන කියා තිබෙනවා. බණ්ඩාරනායක අගමැතිතුමා ඉන්න කාලයේදීත් මේ ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙනවා. කොස්තාපල් මහත්වරුන්ට සහ සාජන්ට් මහත්වරුන්ට තමන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා වෘත්තිය සමිති ඇති කර ගැනීමට බලය දෙන්න ඕනෑය කියන එකයි ඉල්ලීම. බණ්ඩාරනායක මහත්මයා ටත් ඒ ගැන දැනුම් දී තියෙනවා. ඒ මහත් මයාත් ඒක වරින් වර කල් දැම්මා. ඒ ගැන කෙළින්ම වචනයක් දුන්නේ නැහැ. ඒ ප්‍රතිපත්තියම අනුගමනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවත් තවම කෙලින්ම වචනයක් දුන්නේ නැහැ. ගිය අවුරුද්දේත් මේ ගැන කිව්වා. මේක වැද ගත් ප්‍රශ්නයක් තමයි කියා කිව්වා. මේ ප්‍රශ්නය ගැන කථා කරන විට පොලීසිය ගැන පමණක් නොව, යුද්ධ හමුදාව ගැන පමණක් නොව, ආණ්ඩුවේ අනිකුත් නිල ධාරීන්ගේ අයිතිවාසිකම් සියල්ලක්ම ගැනත් කල්පනා කරගෙන තමයි, මේ ගැනත් තීරණයක් ගන්න තිබෙන්නේ කියා කිව්වා. ඒක වඩා හොඳයි. "තමුන් නාන්සේලාට මොන වෘත්තිය අයිතිවාසි කම්ද? දෙන්න බැහැ" කියනවා නම් ඒක වඩා හොඳයි. මා උත්තරයක් බලා පොරොත්තු වන්නේ නැහැ. නමුත් මෙය ඉතාමත් කනගාටුදායක තත්ත්වයක් බව කියන්න ඕනෑ. ඉන්ස්පෙක්ටර් මහත් වරුන්ටත්, ඒ. එස්. පී. මහත්වරුන්ටත් වෘත්තිය සමිති මාර්ගයෙන් තමන්ගේ අයිතිවාසිකම් ඉදිරිපත් කරන්නට පුළුවන් නම්, කොස්තාපල් මහත්වරුන්ටත්, සාජන්ට් මහත්වරුන්ටත් එසේ කරන්න බැරි ඇයි කියා අහන්න කැමතියි. ඇයි ඒ උදවිය ඉහළ තත්ත්වයේ ඉන්න අය නිසාද? මේ අය පහළ තත්ත්වයේ ඉන්න නිසාද? තමුන්නාන්සේලා සමාජවාදය කියන්නේ මේකටද කියා අහන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, මගේ කථාව අවසන් කරන්නට පෙර පොලිස් දෙපාර්තමේන්තුවේ දුක සේ කාලය ගත කරන එක්තරා කොටසකගේ වැදගත් ප්‍රශ්නයක් මතු කරන්න බලාපොරොත්තු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනවා. පොලිස් ඩිරයිවර්වරුන් නමින් හඳුන්වන පන්සියයටත් අට සියයටත් අතර වූ සේවක පිරිසක් පොලිස් දෙපාර්තමේන්තුවේ ඉන්නවා. ඒ අයගේ තත්ත්වය මෙහෙමයි. ඒ අයට කියන්නේ පොලිස් ඩිරයිවර්ලා කියලයි. පොලීසියේ ඉන්න අනෙකුත් අයට කියන්නේ පොලිස් ඔපිසර්ලා කියායි. නමුත් මේ පොලිස් ඩිරයිවර් මහත්වරුන්ට කියන්නේ පොලිස් ඩිරයිවර්ලා කියායි. එහි වරදක් තිබෙනවාය කියන්නේ නැහැ. එක්කෝ පොලිස් දෙපාර්තමේන්තුව මේ අය පොලීසියට අයිති පිරිසක් හැටියට සලකන්න ඕනෑ. පොලීසියේ තිබෙන්නේ අමුතු වැඩ පිළිවෙලක්. ආණ්ඩුවේ සාමාන්‍ය නිලධාරීන් වශයෙන් නොවෙයි විශෙෂ වැඩ කොටසක් තිබෙන අය හැටියටයි, පොලිස් නිලධාරීන් හඳුන්වන්නේ. අනෙක් අයට දෙන අයිති වාසිකම් අඩු නොකර දෙන වැඩ පිළිවෙලක් තමයි, බලාපොරොත්තු වන්නේ. නමුත් මේ අයගේ අයිතිවාසිකම් නොයෙක් නොයෙක් විධියට වෙනස් වෙලා තිබෙනවා. ආණ්ඩුවේ වෙනත් දෙපාර්තමේන්තුවලත් වාහන එලවන ඩිරයිවර් මහත්වරුන් ඉන්නවා. ඒ අයට දෙන දීමනා සහ අයිතීවාසිකම් මේ අයට දෙන්නේ නැහැ. එසේ නම් පොලීසියට අයිති වාහනවල වැඩ කරන ඩිරයිවර් මහත්වරුන්ට විශෙෂ සැලකිලි දෙන්න ඕනෑ. සාමාන්‍ය පොලිස් කොස්තාපල් මහත්මයකුට ලැබෙන පඩි තත්ත්වය නැතත් සාමාන්‍ය අයිතිවාසිකම් ලැබෙනවා. නමුත් ඒ අයට පොලීසියේ ඉන්න සාමාන්‍ය කොස්තාපල් වරයකුට ලැබෙන අයිතිවාසිකම් සියල්ලම ලැබෙන්නේ නැහැ. ආණ්ඩුවේ වාහන එලවන ඩිරයිවර් මහත්වරුන්ට ලැබෙන අයිතිවාසිකම් ලැබෙන්නේ නැහැ. මේවා එකිනෙක අරන් කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මා කියනවා, පොලිස්පතිතුමාටත් ගරු පාර්ලිමේන්තු ලේකම් තුමාටත් මේ සම්බන්ධයෙන් ප්‍රශ්න මාලාවක් ඉදිරිපත් කර තිබෙන බව. එකිනෙක අරන් කථා කරන්න ගියොත් කාලය නාස්ති වන නිසා වුවමනාවට වඩා කල් ගන්න මා සතුටු නැහැ. නමුත් මා කියනවා, ආණ්ඩුවේ ඩිරයිවර් මහත්වරුන්ගේ පඩි තත්ත්වයත්, පොලීසියේ ඩිරයිවර් මහත්වරුන්ගේ පඩි තත්වයත් සසඳා බලන විට ඒවා අතර ලොකු පරතරයක් තිබෙන බව. ඇයි ඒ අයටත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල වාහන එලවන ඩිරයිවර් මහත්වරුන්ට දෙන පඩි නඩි දෙන්න බැරිද? ඔවර්ටයිම් දෙන්නට බැරි, එලවන්ස් දෙන්නට බැරි, මක්නිසාද කියා මම අහන්න සතුටුයි.

ගරු සභාපතිතුමනි, තවත් කාරණයක් මතක් කරන්ට තිබෙනවා. ඩිරයිවර්, ඩිරයිවර්, කියා තමන්ගේ වෘත්තිය නිතරම මුහුණේ ඇතිල්ලීම ගැන ඒ මහත්වරුන්ගේ ලොකු කැක්කුමක් තිබෙනවා. කුලී කාර් එලවන මහත්වරුන්ට බලපත්‍ර දීමේදී "හයිරිං කාර් ඩිරයිවර්" යනුවෙන් බැජ් එකක් දෙන්ට කලින් අදහසක් තිබුණා. මේ වෘත්තිය හැම තිස්සේම අපේ මූණෙ අතුල්ලන්නට ඕනෑ නෑ කියා ඒ මහත්වරු ඒ ගැන විරුද්ධත්වය ප්‍රකාශ කළා. මෝටර් රථ දෙපාර්තමේන්තුව ඒ අදහස පිළිගෙන කටයුතු කළා. දැන් පොලිස් ඩිරයිවර්වරුන්ට බැජ් එකක් දී තිබෙනවා ඩිරයිවර්ය කියා. ඒ මහත්වරුන්ගේ ඉල්ලීමක් තිබෙනවා ඒ බැජ් එක වෙනස් කරන්ටය කියා. එසේ ඉල්ලීමක් තිබෙනවා නම් එය වෙනස් කිරීමේ කිසිම වැරැද්දක් නැති බව මම කියන්න කැමතියි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I want to bring one matter to your notice. Last week Mr. Speaker held a concerence in his room. I was present and I think the hon. First Member for Colombo South (Mr. J. R. Jayewardene), the hon. Member for Panadura (Mr. Leslie Goonewardene), and the hon. Second Member for Colombo Central (Mr. P. G. B. Keuneman) were also present.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

The hon. Member for Galle (Mr. W. Dahanayake) too.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

And the hon. Member for Galle too was present.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

It was agreed by the Opposition parties at that meeting that we keep to this programme which I believe was prepared on the directions of Mr. Speaker. Mr. Speaker said that he would allow one hour more for any Ministry if the Debate at the time of closing was at an interesting stage. I want to bring this matter to your notice and ask you whether you are applying it.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

The agreement was denied by some of the members present here on behalf of their parties.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

We were not aware of any agreement.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

As a matter of fact when I got up the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) was here and he was not aware of it. Thereafter the hon. Member for Panadura (Mr. Leslie Goonewardane) came and he too was not aware of it. I think there has been some misunderstanding. I think what has been agreed is to generally conform to this schedule but I do not think there would have been an agreement which would be considered as absolute. So far as our party is concerned you will have our co-operation, but sometimes when there are important Ministries, we will have to go on a little longer.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

The general agreement was to finish the Votes of this Ministry by 3 P.M.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Even if one hour more was given, according to the schedule we should have finished by 12 noon today.

ඒ. එච්. මාකන්-මාකර් මයා. *(මඩකලපුව දෙවන මන්ත්‍රී)*
(ஜனுப் ஏ. எச். மாக்கன் மாக்கர்—மட்டக்களப்பு இரண்டாம் அங்கத்தவர்)
(Mr. A. H. Macan Markar—Second Batticaloa)

There are departments like the Tourist Bureau and National Planning which have not yet been considered. Are we going to skip all those?

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

If you adhere to the agreement you will have to.

ඒ. එච්. මාකන්-මාකර් මයා.
(ஜனுப் ஏ. எச். மாக்கன் மாக்கர்)
(Mr. A. H. Macan Markar)

On the Tourist Bureau I would like to speak for 5 or 10 minutes. If you are going to prevent me——

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

You cannot have it both ways. You must adhere to the agreement or repudiate it.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

The schedule was prepared by Mr. Speaker, I believe, after consulting Opposition parties.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

Cannot we put off this matter? We can discuss the matter at 4 P.M. and clarify the position.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

In that case we must finish this part of the Votes at any rate at 4 P.M. I will not take long; if I am given 10 minutes I will be content.

මාකන්-මාකර් මයා.
(ஜனுப் மாக்கன் மாக்கர்)
(Mr. Macan Markar)

We would like to discuss the question of the Planning Department at least for some time.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

I am not seeking to curtail the time. I would suggest that we take up any remaining departments under the Finance Ministry Votes which is the Ministry which has the longest allocation of time. I am merely trying to finish this Ministry on schedule.

අ. භා. 3.30

කුසුමා රාජරත්න මිය. (ඌව-පරණගම)
(திருமதி குஸுமா ராஜரத்ன—ஊவ-பரணகம)
(Mrs. Kusuma Rajaratna—Uva-Paranagama)

ගරු සභාපතිතුමනි, මාස දෙකකුත් දින ගණනක් තිස්සේ කිසිම හේතුවක් නොමැතිව ගරු අගමැතිනියගේ සථාවර ලේකම්තුමාගේ නියෝගය උඩ, පොලිස් බලතල පාවිච්චි කරමින් මා නිරපරාධයේ නිවාස හිර අඩස්සියේ තබා අද උදේ 9.15 ට නිදහස් කළාට පසු මගේ මූලික යුතුකම හැටියට මා ප්‍රථමයෙන්ම හිරභාරයේ සිටින මගේ ආදරණීය ස්වාමි පුරුෂයා දකින්ට ගොස් එතැනින් මා කෙළින්ම ආවේ මේ ගරු සභාවටයි. මේ අවස්ථාවේදී මට ඉතාමත්ම සන්තෝෂයි, මේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කරන්ට අවස්ථාව ලැබීම ගැන. මා නිවාස හිර අඩස්සියේ තැබුවේ මගේම කැමැත්තෙන්ය කියා ගරු අගමැතිනියගේ පාර්ලිමේන්තු ලේකම්තුමා පසුගිය මස 22 වැනිදා මේ මැති සබයේදී ප්‍රකාශයක් කර තිබීම ගැන මා පළමුවෙන්ම මගේ බලවත් සංවේගය පළ කරන්න කැමතියි.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)
අදත් කීවා

කුසුමා රාජරත්න මිය.
(திருமதி குஸுமா ராஜரத்ன)
(Mrs. Kusuma Rajaratna)

මගේ කැමැත්ත උඩ මා නිවාස හිර අඩස්සියේ තැබුවාය කියා ප්‍රකාශ කර තිබෙනවා. මේ පාර්ලිමේන්තු ලේකම් තුමාගෙන් හෝ පොලිස්පති තුමාගෙන් හෝ අගමැතිනියගේ සථාවර ලේකම් තුමාගෙන් හෝ කිසිම කෙනකුගෙන් එවැනි ඉල්ලීමක් මා කළේ නැහැ. මෙම ගරු සභාවට කරන ලද එම ප්‍රකාශය පත්‍රයේ පළ වී තිබෙනු දැකීමෙන් මා ඉතාමත් පුදුමයට පත්වුණා. විශේෂයෙන් මෙවැනි වගකීමක් ඇති, විශාල දැනීමක් ඇති, බුද්ධියක් ඇති, පාර්ලිමේන්තු ලේකම්තුමකු එවැනි ප්‍රකාශයක් කිරීම ගැන ඇත්තවශයෙන්ම මම කනගාටු වෙනවා. මේ අවස්ථාවේදී මම නිර්භීතව එඩිතරව කියා සිටින්නේ මා නිවාස අඩස්සියේ තබන්ටය කියා ඉල්ලීමක් කළේ නැති බවයි. ඒ සමගම මේ ගරු සභාවත් මේ රටේ මහජනතාවත් මුළා කිරීම පිණිස කරන ලද එම ප්‍රකාශය ගැන මාගේ බලවත් කනගාටුව මේ අවස්ථාවේදී මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා. ඇත්තවශයෙන්ම ගරු සභාපතිතුමනි, පණ ඇති මොළේ ඇති පුද්ගලයකු තමන්ව හිර අඩස්සියේ තබන්ටය කියා ඉල්ලීමක් කරනවාද කියා තමුන්නාන්සේගෙන් මා අහන්න කැමතියි. එවැනි ඉල්ලීමක් කිසිවිටෙකවත් මොළයක් ඇති පුද්ගලයකු ඉල්ලන්නේ නැති බව මේ අවස්ථාවේදී ගරු සභාවට මතක් කර සිටිනවා.

ගරු සභාපති තුමනි, පාර්ලිමේන්තු ලේකම්තුමකු වශයෙනුත් මුදල් ඇමතිතුමකු වශයෙනුත් ඉතා දක්ෂ අන්දමින් වැඩ කටයුතු කිරීමට එතුමාට පුළුවන්කමක් තිබෙන නිසා මම හැම අවස්ථාවේදීම එතුමාට ගෞරව කරනවා. නමුත් මහජනතාවත් මේ ගරු සභාවත් මුළාවෙන මේ විධියේ ප්‍රකාශන මින් පසුවවත් නොකරන හැටියට තමුන්නාන්සේගේ මාර්ගයෙන් මම ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කුසුමා රාජරත්න මිය.]

මේ සමගම පොලීසිය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට මා අදහස් කරනවා. ඇත්ත වශයෙන්ම අද පොලීසිය තිබෙන්නේ මහජනතාව ආරක්ෂා කරන්න නොවෙයි. අද පොලීසිය කටයුතු කරන්නේ මහජනතාවට තාඩන පීඩන ඇති කර ඔවුන් අන්තිම ප්‍රපාතයේ හෙළීමටයි. මේ ගරු සභාවෙන් පොලිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන් දහස් ගණනින් වැය ශීර්ෂ යන් සම්මත කර ගන්නවා. නමුත් උසස් නිලධාරියාගේ පටන් පහත් නිලධාරියා දක්වා පොලිස් සේවයේ යෙදී සිටින සෑම පුද්ගලයෙක්ම උත්සාහ කරන්නේ මහ ජනතාව තලා පෙළා දමන්නටයි.

මට මේ අවස්ථාවේදී ඉතාමත් කනගාටු වෙන් මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. මේ මාසයේ 3 වැනිදා රාජ රත්න මහතා බදුල්ලේ උසාවියට ඉදිරි පත් කරන ලෙසටයි, බදුල්ලේ දිස්ත්‍රික් උසාවියේ නඩුකාර උන්නාන්සේ නියෝග කෙළේ. නමුත් හදිසි නීති බලතල ප්‍රයෝජනයට ගනිමින් රාජරත්න මහතා බදුල්ලේ උසාවියට ඉදිරිපත් නොකර කොළඹ උසාවියට ඉදිරිපත් කළා. පොලීස් දෙපාර්තමේන්තුවේ ඉහළම නිලධාරියාගේ සිට පහළම නිලධාරියා දක්වා සිටින සෑම කෙනකුටම මානසික විඳාහව පිළිබඳ පාඩම් ටිකක් "සයිකොලොජී" ටිකක් කියා දිය යුතු බව අගමැතිනිය වෙනුවෙන් මෙහි පෙනී සිටින ගරු පාර්ලිමේන්තු ලේකම් තුමාට මතක් කරන්නට කැමතියි. අප බලාපොරොත්තු වුණේ රාජරත්න මහතා බදුලු උසාවියට ඉදිරිපත් කරනවා ඇත කියායි. තමන්ගේ මන්ත්‍රීවරයා හිරගෙට යන අවස්ථාවේදී වැලිමඩ ජනතාවට ඔහු දැක ගැනීමට සැලැස්වීම යුතුකමක්. එදා වැලිමඩ පමණක් නොව, උඟව-පරණගම ජනතාවත්, ඒ වගේම උඟව පළාතේ ජන තාවත්, හිරගෙට යන රාජරත්න මන්ත්‍රී තුමා දැකගැනීම සඳහා බලා සිටියා. නමුත් ඔවුන්ගේ බලාපොරොත්තු සුන් වුණා. හදිසි නීති පාවිච්චි කරමින් රාජරත්න මන්ත්‍රීතුමා කොළඹ උසාවියට ඉදිරිපත් කරනු ලැබූ බව තමුන්නාන්සේ දන්නවා ඇති.

පොලිස් නිලධාරි මහතුන් කීප දෙනකු ගැනත් මතක් කළ යුතුයි. විශේෂයෙන්ම කොළඹ කොටුවේ පොලීසියේ කේ. අයි. පෙරේරා නමැති පොලිස් නිලධාරියා පසු ගිය 3 වැනිදා අපගේ ගෙදරට අවුත් "මෙන්න සිතාසියක්" යයි බොහොම සැරෙන් කථා කළා. රාජරත්න මහත්මයා හිරගෙට යවන්නට හදන බව ඔහු හොඳ ටම දන්නවා. ඒ නිසා වන්නට ඇති ඒ විධියට සැරෙන් කථා කෙළේ. සිතාසියක් භාර දෙන විට පිස්කල් හෝ වේවා, පොලිස් නිලධාරියකු හෝ වේවා, ඒක තම පොතේ සටහන් කරගන්නට ඕනෑ. තමාට සිතාසිය ලැබුණේ උදේ 9.20 ට බව සටහන් කර ගන්න ලෙස රාජරත්න මහත්මයා කියා සිටියා. එහෙත් කේ. අයි. පෙරේරා පොලිස් නිලධාරියා එය ප්‍රතික්ෂේප කළා. එදා උදේ 9.20 ට සිතාසිය ලැබුණු හැටියට සටහන් කරගත නොහැකි බව ඔහු ප්‍රකාශ කළා. අප නිවාස අඩස්සියේ සිටියේ මිරි හාන පොලීසිය යටතේයි. එහි පොලිස් නිල ධාරියකුට ඉහත කී සිතාසිය ලැබුණු වේලාව සටහන් කර ගන්නටයයි රාජ රත්න මහතා දෙවනුව කීවා. ඒ අවස්ථා වේදී කලබල වුණු කේ. අයි. පෙරේරා ඉහත කී විධියට සටහනක් කර ගත්තා. කරුණා කර මේ සිතාසිය භාර ගන්නැයි කීවා නම් කොතරම් හොඳද? රාජරත්න මහත්මයා හිරගෙට දමන්නට ගෙන යන බව ඔහු හොඳටම දන්නවා. ඇයි ඔහුට හොඳින් කථා කරන්න නරකද? ඒ නිසා මා තමුන්නාන්සේ මගින් ගරු පාර්ලි මේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටින්නේ පොලිස් දෙපාර්තමේන්තුවේ සිටින උසස්ම නිලධාරියාගේ සිට පහත්ම නිලධාරියා දක්වා සියලු දෙනාටම මාන සික විඳාහව ඉගැන්විය යුතු බවයි. හිර ගෙට යවන තුරුම රාජරත්න මහතා මන්ත්‍රීවරයෙක්; ඔහු වැලිමඩ ගරු මන්ත්‍රී වරයා. නමුත් එදා ඔහුට කථා කළේ වැලි මඩ ගරු මන්ත්‍රීවරයාට කථා කරන ආකාර යට නොවෙයි. සිතාසිය නිකුත් කෙළේ දෙවැනිදා නම් එදින රාත්‍රී හෝ එය රාජ රත්න මහතාට දැන්වීමට යුතුකමක් තුබුණා නේද? රාජරත්න මහතා ලංකා වෙන් පැනලා යනවා ඇතැයි සිතුවාද? නැහැ අප යම් සටනකට යන්නේ නිර්භී තවයි; එඩිතරවයි. ඒ බව රාජරත්න මහත්මයා වෙනුවෙන් මේ අවස්ථාවේදී ඉතා ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්නට කැමතියි. එම නිසා මා නැවතත් කියා සිටින්නේ ලොකු නිලධාරියාගේ සිට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පොඩි නිලධාරියා දක්වාම පොලිස් නිලධාරීන් පිළිබඳ සංශොධනයක් කළ යුතු බවයි.

ගරු සභාපතිතුමනි, මේ අයට මානසික විද්‍යාව කියන එක තේරෙන්නේ නැද්ද? කොතරම් නිර්භීතකමකින් යම් කෙනෙක් සිරයට ගියත් එම අවස්ථාවේදී ඔහුට ඇති වන අදහස් මොනවාද කියන එක කාට වත් කියන්න බැහැ. රාජරත්න මහත්මයා තමන්ගේ භාර්‍යාවත් දරුවනුත් කියන සියලුදෙනාම අතහැර තබා අවුරුදු එක හමාරක් සිර දඬුවම් විඳීම සඳහා ගිය කෙනෙක්. එතුමාට කථා කළ යුත්තේ මේ අන්දමටද? ගරු අගමැතිනිය වෙනුවෙන් මෙහි පෙනී සිටින මෙම පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා ඉල්ලා සිටිනවා මේ ගැන සොයා බලන ලෙස. මා එම ඉල්ලීම ඉතා බැගෑපත් ආකාරයෙන් ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, පොලීසිය මගින් නඩුවක් දැම්මොත් කරපු දේවල් නොවෙයි ඉදිරිපත් කරන්නේ. පොලීසිය මගින් අමූලික බොරු චෝදනායි ඉදිරිපත් කරන්නේ. එවැනි සිද්ධියකටයි වැලිමඩ හිටපු ගරු මන්ත්‍රීතුමාටත් මුහුණ පාන්නට සිදු වුණේ. පොලීසිය මගින් එතුමාට විරුද්ධව අමූලික බොරු චෝදනා ඉදිරිපත් කරලයි එතුමා එවැනි තත්ත්වයකට පත් කළේ.

එපමණක් නොවෙයි ගරු සභාපතිතුමනි, මට තවත් කරුණක් කියන්න තිබෙනවා. කොයි මොහොතේ පාර්ලිමේන්තුවට එන්න මට ඉඩ ලැබේද කියා මා පුල පුලා බලාගෙනයි සිටියේ. රාජරත්න මහතා නිවාස අඩස්සියෙන් සිරිභාරයට ගෙන ගිය හැටියේම මේ ආණ්ඩුවට යුතුකමක් තිබුණා මාව නිදහස් කරන්න. නමුත් මාස දෙක කුත් දවස් ගණනක් මාව සිර අඩස්සියේ තබන්න ඇති යුතුකම මොකක්ද කියන එක මට තවමත් තේරෙන්නේ නැහැ. මගේ ස්වාමිපුරුෂයා වූ රාජරත්න මහතා සිරභාරයට ගත්තාට පසුව පොලිස් භටයන් මගේ නිවසින් ඉවත් කරන්න මේ ආණ්ඩුවට යුතුකමක් තිබුණා. මා ඒ සම්බන්ධයෙන් ගරු අගමැතිනියට විදුලි පුවත් පවා යැව්වා. බදුල්ලට ගෙන යාමට තිබුණු දවසෙත් මා විදුලි පුවතක් යැව්වා. නමුත් මට පිළිතුරු ලැබුණේ නැහැ.

මා ඊට පසුව ඉල්ලා සිටියා මගේ රැකවල් සඳහා පොලිස් භටයන් නොයොදවා ඒ වෙනුවට පොලිස් කාන්තාවන් යොදවන්නය කියා. මාව මේ ආණ්ඩුවට තව දුරටත් සිර අඩස්සියේ තබන්නම වුවමනා කරනවා නම් ඒ විධියට මගේ රැකවරණයට පොලිස් කාන්තාවන් යොදවන ලෙස මා මේ ආණ්ඩුවට කියා සිටියා. නමුත් මට කනගාටුයි ගරු සභාපතිතුමනි, පොලිස් කාන්තාවන් වෙනුවට එව්වේ පොලිස් මේට්‍රන්ලායි. පොලිස් මේට්‍රන්ලා දෙන්නෙක් එව්වා. උදේට එක්කෙනයි, සවසට එක්කෙනයි, වශයෙන් දෙන්නෙක් පැමිණුනා. අවුරුදු හැත්තෑවටත් අසූවටත් අතර තරමේ වයසකය කියන්න පුළුවන් තත්ත්වයේ සිටින පොලිස් මේට්‍රන්ලායි ආවේ. පොලිස් මේට්‍රන්ලාය කියන්නේ කුමන විධියේ සේවයක් කරන අයද කියන එක තමුන්නාන්සේටවත්, මෙම ගරු සභාවටත් විස්තර කරන්න වුවමනා නැහැ. පොලිස් මේට්‍රන්ලා ලවා ආරක්ෂා කරවන්නේ කුමන අන්දමේ අයද කියන එක කියන්න වුවමනා නැහැ. දෙශපාලන භූමියේදී හෝ වේවා, පුද්ගලික ජීවිතයේදී හෝ වේවා, මගේ ආදරණීය ස්වාමිපුරුෂයාගේත් මගේ නැසීගිය දෙමව්පියන්ගේත් මා නියෝජනය කරන උගව-පරණගම කොඳාශයේ සියල්ලන්ගේත් ආත්ම ගෞරවය ආරක්ෂා කරගෙනයි මා ජීවත් වන්නේ. ඒ බව මා ඉතා ආඩම්බරයෙන් කියන්න කැමතියි. ස්ථාවර ලේකම්තුමාගේ නියෝගය පිට මේ විධියට පොලිස් මේට්‍රන්ලා දෙන්නෙක් එව්වේ කුමන හේතුවක් නිසාද කියා මා ප්‍රශ්න කළා. ඒ අය මා යන යන තැන යනවා. මා කාමරයට ගියත් පොලිස් මේට්‍රන්ලා මා පස්සෙන් යනවා. මොකක්ද ගරු සභාපතිතුමනි මා කළ වරද මේ විධියට මාව මුර කරන්න? හෙඩ්ක්වෝටර් ඉන්ස්පෙක්ටර් මිස්ටර් අමරසිංහ බොහොම හොඳ මහත්මයෙක්. මා එතුමාගෙන් ඇහුවා, මොකක්ද මේකෙ තේරුම, කියා. අඩු වශයෙන් මා මල් පිත පූජා කරන්න ගියත් මා පස්සෙන්. පොලිස් මේට්‍රන්ලා හැටියට ඒ අය මෙපමණ කාලයක් බලාගෙන සිටියේ කුමන අන්දමේ අයද කියන එක මා කියන්න වුවමනා නැහැ. මම මල් පූජා කරන්න යන විට පොලිස් මේට්‍රන් මගේ පිටිපස්සෙන් එනවා. මේ ගැන එව්. කැප්. අයි. මහත්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කුසුමා රාජරත්න මිය.]

යාට දැන්නුවාම ඒ මහතා කනගාටු වී මට කිව්වා, "මම මොනවා කරන්නද? මේ අපේ ස්ථාවර ලේකම් මට දී ඇති නියෝගයයි" කියා. එය ගරු අගමැතිනියගේ ස්ථාවර ලේකම්ගේ නියෝගයක්ය කියා මට ආරංචි වුණා. එතකොට ස්ථාවර ලේකම්තුමාත්, මේ ආණ්ඩුවත් ඇත්ත වශයෙන්ම මට කර තිබෙන්නේ නිගාවක් නොවේද කියා මම අහන්න කැමතියි. මෙම පාර්ලිමේන්තු ලේකම්තුමා නොවේද අගමැතිනිය වෙනුවෙන් කටයුතු කරන්නේ. අගමැතිනිය වෙනුවෙන් මේ ගරු සභාවේ සෑම වැඩක්ම කරන්නේ එතුමා නොවෙයිද? [බාධා කිරීම්] අගමැතිනිය වෙනුවෙන් සෑම දෙයක්ම කරන්නේ තමුන්නාන්සේ නොවේද? [බාධා කිරීම්] එහෙනම් කව්ද?

අ. භා. 3.45

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

පස්සේ පිළිතුරු දෙන්නම්.

කුසුමා රාජරත්න මිය.
(திருமதி குஸுமா ராஜரத்ன)
(Mrs. Kusuma Rajaratna)

දෙන්නම් පස්සේ? හොඳයි ඒකට කමක් නැහැ. තමුන්නාන්සේ දක්ෂයෙක් බව අපි පිළිගන්නවා.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

ඒත් ඇති.

කුසුමා රාජරත්න මිය.
(திருமதி குஸுமா ராஜரத்ன)
(Mrs. Kusuma Rajaratna)

ඒ නිසා තමුන්නාන්සේ තමයි, මේ වැඩ කටයුතු කරන්නේ. මෙසේ කිරීමෙන් සම්පූර්ණයෙන්ම මට කර තිබෙන්නේ අගෞරවයක් නොවෙයිද? පොලිස් කාන්තාවන් එවන්නේ නැතිව පොලිස් මේට්‍රන්ලා එව්වා. එවැනි දෙයක් කිරීමෙන් ස්ථාවර ලේකම්තුමා මට අගෞරව කිරීම ගැන ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා හොඳට කල්පනා කර බලා කරුණු සොයා බලනවා ඇත කියා මම බලාපොරොත්තු වෙනවා.

තවත් වැදගත් කරුණක් නම්, දැන් වැලිමඩ කොට්ඨාශයේ මහජනතාවට එහි පොලීසියෙන් ලැබෙන තාඩන පීඩන බොහෝ දුරට වැඩි වී තිබෙනවා. යම්කිසි අරගලයකදී පැමිණිල්ලක් කිරීම සඳහා වැලිමඩ කොට්ඨාශයේ කෙනෙක් පොලීසියට ගියොත් ඔහුට හිරි හැර කර 'උඹ රාජරත්නගේ මිනිහෙක් නොවේද?" කියා අසා ඒ අයට කම්මුල් පහරක් ගසා එළවා දමනවා. පොලීසියේ නිලධාරීන් සේවය කළ යුත්තේ ඒ ආකාරයටද කියා මම අහන්න කැමතියි. මේ සභාවේ ගරු මන්ත්‍රීන් බොහෝ දෙනෙක්ම මේ විධියේ පැමිණිලි ඉදිරිපත් කළා. පාර්ලිමේන්තු ලේකම්තුමා මේවාට පිළිතුරු වශයෙන්, "මේවා ගැන සොයා බලනවා" ය කියා එතැනින් නවත්වන්නේ නැතිව මේ කරුණු සියල්ලක් ගැනම සොයා බලන ලෙස මම ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනවා. ආණ්ඩු පක්ෂයෙනුත් විරුද්ධ පක්ෂයෙනුත් නොයෙකුත් චෝදනා ඉදිරිපත් කරන්නට යෙදුණා. ඒ සෑම චෝදනාවක්ම ඇත්තද, නැත්තද කියා සොයා බලා ඒ ගැන විභාග කරන හැටියට මම නැවතත් පාර්ලිමේන්තු ලේකම්තුමාට මතක් කරනවා.

අවසාන වශයෙන් තවත් කරුණක් සඳහන් කිරීමට බලාපොරොත්තු වෙනවා. එදා රාජරත්න මහතා උපවාස කරන අවස්ථාවේදී මම පාර්ලිමේන්තුවට එන විට වැන්ඩවෝල් මහතා මගේ ඒම වැළැක්කුවා. ඒ සම්බන්ධයෙන් මවිසින් කරනු ලැබූ පැමිණිල්ලක් අනුව පවත්වනු ලැබූ පරීක්ෂණයේදී එවැන්නක් සිදු වූයේ නැත කියා ගරු කථානායකතුමා ප්‍රකාශ කළා. ගරු සභාපතිතුමනි, පොලිස් නිලධාරියෙක් නොහොත් ඒ වැන්ඩවෝල් උන්නැහේ කී වචනය මේ ආණ්ඩුව පිළිගන්නා. නමුත් මම කළ පැමිණිල්ල පිළිගන්නේ නැහැ. එය සිදු වුණේ කෙසේද කියා මම දන්නවා. වැන්ඩවෝල් මහතාට පක්ෂව මේ පාර්ලිමේන්තුවේම එක්තරා පුද්ගලයන් දෙදනකු වැඩ කළ නිසයි මා කී දේ සම්පූර්ණයෙන්ම බොරු හැටියට පිළිගත්තේ.

එපමණක් නොව, උපවාස කරන අවස්ථාවේදී සංඝයා වහන්සේලාත් නොයෙකුත් තාඩන පීඩන කළා. සංඝ රත්නය කියන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නේ කුමන කොටසක්ද යන වග තමුන්නාන්සේ දන්නවාද? සංඝ රත්නය නැතිව අපට රටේ වැඩ කටයුතු කර ගෙන යන්නට බැහැ. සිංහල ජාතියත් බෞද්ධ සංස්කෘතියත් ආරක්ෂා වුණේ සංඝ රත්නය නිසා නොවේද? එවැනි සංඝ රත්නයක් කෙරෙහි එදා පොලීසිය ක්‍රියා කළේ කුමන ආකාරයකටද කියා තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ නිසා මම ඉදිරිපත් කළ මේ පැමිණිලි සියල්ලම සම්බන්ධයෙන් විභාගයක් පවත්වා සාධාරණ විධියට වැඩ කටයුතු කරන ලෙස පාර්ලිමේන්තු ලේකම් තුමා මාර්ගයෙන් ගරු අගමැතිනියගෙන් ඉල්ලමින් මගේ කථාව අවසාන කරන අතර මේ සුළු වේලාව මට ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

Mr. Chairman, I am not seeking to curtail the speeches. If anyone wishes to speak after I speak certainly he could do so. I will not take more than ten minutes.

I do not propose to make a very long speech on the police votes on this occasion, nor do I propose to take up the time of this House by going into individual instances which have been cited, from the *kassippu* kings referred to by the hon. Member for Galle (Mr. W. Dahanayake) down to other instances referred to by the hon. Member for Bulathsinhala (Mr. Edmund Samarakkody). As far as this type of discussion is concerned no useful purpose will be served by my going into details in regard to each and every instance cited and the nature of the investigation conducted by the police. Whether my answers will satisfy hon. Members I am in no position to say.

The principal criticisms that have been put forward in relation to the police force, apart from the last speech made by the hon. Member for Uva-Paranagama (Mrs. Kusuma Rajaratna) with which I shall deal last of all, amount to no more than this. There is still a very substantial amount of improvement that is possible within the framework of the existing police department. That is an issue on which I will not join with any hon. Member of this House in controversy.

But, Mr. Chairman, you will recall the discussions we had last year in the course of the Budget Debate in regard to the police votes. When those matters were taken up and discussed you will recall how we were almost in an atmosphere of hysteria in dealing with these matters. That was at a time when the Catholic schools issue was still pending, the question of *satyagraha* and all other possible consequences and the opposition of the Federal Party to the language policy of the Government had not been resolved in any manner whatsoever. At that stage I well recall how hon. Members stood up one by one and made complaints against individual police officers some of whom were alleged to be harassing Catholics in Catholic areas, Tamils in Tamil-speaking areas, and alleged to be partial to the U. N. P. in certain instances shortly after the elections.

Those were complaints we had and you will recall the line of argument I adopted at that time. I indicated that if the hon. Members of this House wanted a police commission the Government would be prepared to appoint a police commission—I think I said so in answer to the hon. Second Member for Colombo South (Mr. Bernard Soysa). I also indicated then that in my view the appointment of such a police commission would not be the answer to such problems but still the Government was quite prepared to appoint one.

I am inclined to agree with the attitude expressed today by the hon. Second Member for Colombo Central (Mr. Keuneman) and the hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena) when they pointed out that it is not a police commission that is going to solve these problems but that it is an administrative change. What is necessary is an administrative change and the establishment of procedures by means of which confidence can be inculcated in the police force,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක]

by means of which the elements which require to be rooted out of the police force can be rooted out, and all this can be achieved without the damaging consequences on their morale. I do not think that what is necessary is a complete elimination of the existing police force, as visualized by the hon. Member for Kotte (Mr. Stanley Tillekeratne), and the substitution of it by a new force.

We are all agreed that there are problems. These problems are a legacy left to us from British times, from the days of Mr. Dowbiggin, one of the earliest Inspectors-General of Police and we have still got a tradition in the police force by which officers have still not come to regard themselves as our friends, as friends of the people and to win their confidence rather than to fear a loss of their authority. I do not make this charge against the majority of the officers. Indeed, even the hon. Member for Kotte (Mr. Stanley Tillekeratne) had occasion to praise some of them. He singled out the Inspector in charge of the Mirihana Police Station to speak well of him. That goes to prove the point I am making, namely, that we have weaknesses in our administration, weaknesses which require correction, and I assure this House that this Government is willing and ready and most anxious to correct them. At the same time I cannot justify the general assumptsion that everything is wrong with the police force and therefore that it must be rooted out lock, stock and barrel and started all over again in the interests of good Government.

I agree with the hon. Member for Uva-Paranagama (Mrs. Kusuma Rajaratna) when she says that the solution may be a new psychology. A new psychology is not something that can be inculcated into the police force overnight. Changes have occurred in the course of the last year.

කුසුමා රාජරත්න මිය.

(திருமதி குஸுமா ராஜரத்ன)

(Mrs. Kusuma Rajaratna)

ක්‍රම ක්‍රමයෙන්—Gradually.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක

(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)

(The Hon. F. R. Dias Bandaranaike)

ක්‍රමානුකූලව තමයි, අපේ ආණ්ඩුව ඒ අදහස ඉටු කරන්නේ.

I quite agree that these things cannot be done overnight and we have a period of one year of our administration in which to judge the consequences of the measure of our success or failure. I do not say that we have succeeded completely in rooting out all the corrupt elements that exist. Of course, there is much more to be done. The hon. Member for Kotte referred to the Welikade Police Station as an instance and the hon. Member for Avissawella referred to examples of particular police officers who are in league with criminals and thugs. I am only giving examples, I have not investigated any of those cases. I must say that there is substantial truth in some of these allegations, at any rate in regard to some officials. There is obviously no use presenting an argument in the abstract on the assumption that such things do not happen. They do. It is clearly our duty to take the necessary corrective action to set those matters right.

In the course of one year hon. Members referred on the Floor of this House to the improvement in relations between members of the public themselves, the representatives of the public and the police force. If you examine the facts, I agree that, perhaps, the follow-up action was not adequate. I completely agree that if the members of the police force had followed the directions issued to them a little more literally and a little more accurately and not visited the Members of Parliament merely as a routine visit that had to be paid, matters would have been more satisfactory.

I remember the hon. Member for Welimade (Mr. K. M. P. Rajaratna) telling me this instance when he was seated in the House. He said that the officers in his area had not visited him at all and he brought

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

that fact to my notice only about six months after the order had been given, so much so that I had occasion to issue an express order that the directive be carried out. In that instance that particular police officer's explanation was that he thought it might be wrong for him to establish contact with the hon. Member for Welimada because there was a pending trial or pending appeal against him.

We are making an effort and we believe that the co-operation of the public and Members of Parliament is also required to a large extent in the matter of bringing about better relations between the public and the police force. I am proud to say that in very good measure, in solid measure, that degree of co-operation has been forthcoming. I recall an instance when I was inspecting the Avissawella police station, the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) was good enough to attend the inspection and he even addressed the members of the police there and he was good enough to assist me in that inspection. I wrote to other Members of Parliament and I am proud to say that many Members of Parliament including those on our back-benches were kind enough to assist me in my inspections. With this kind of co-operation I believe it will be possible to achieve the gradual re-orientation or the change of psychology referred to by the hon. Member for Uva-Paranagama, that is necessary in the police force.

I do not know whether this forum is one where we are called upon to pay compliments to the I. G. P. It has never been my habit to pay compliments to public officers here or hurl criticism at them. It is not early to decide whether by the joint effort of the Government, the I. G. P. and other officers, we will succeed or fail. We have made an effort in the course of the last year in the midst of trials and tribulations of a very high order where the Government had to face a challenge to its authority from the Catholics during the schools take-over and also from particular political parties and in spite of all these things the police department has sought to do a job of work as well as it could posibly be expected to do in the circumstances.

අ. භා. 4

May I have your permission to continue for a few moments longer, before tea? Five minutes is all I need.

I should like to deal with one or two points made by the hon. Member for Uva-Paranagama (Mrs. Kusuma Rajaratna). I was under the impression that at the time the hon. Member for Welimada (Mr. K. M. P. Rajaratna) was taken into custody, when he was fasting under the steps of this House, it was the express wish of the hon. Member for Uva-Paranagama, not that she should be taken into house detention——

කුසුමා රාජරත්න මිය.
(திருமதி குஸுமா ராஜரத்ன)
(Mrs. Kusuma Rajaratna)

ඒක බොරු. වලිමඩ ගරු මන්ත්‍රීතුමා උප වාසයේ යෙදී සිටි අවස්ථාවෙහි එතුමාගේ භාර්‍යාව වශයෙන් මාත් එහි සිටියා. එසේ සිටියදී 15 වනදා දවල් 10 ට පමණ රාජ රත්න මහත්මයා ආරෝග්‍යශාලාවට ගෙන යන්නටයයි ගිලන් රථයකුත් අරගෙන පොලිස් නිලධාරීන් කණ්ඩායමක් ආවා. එපමණක් නොවෙයි. රාජරත්න මහත්ම යාත් මාත් හිර අඩස්සියේ තබන්නටයයි නියෝගයක් දැම්මා. එවිට මම ඇහුවා, ගරු කථානායකතුමාගෙන් ඒ සඳහා අවසරයක් ලබා ගත්තාද කියා. ඒ අවස්ථාවේදී කථා නායකතුමාගේ අවසරයක් ඔවුන් ළඟ තිබුණේ නැහැ. ඒ නිසා ඒ වෙලාවෙදී ඔවුන් ආපසු ගියා. ඊට පසු මහ රාත්‍රී ගම් පළට ගිහින් කථානායකතුමාගේ අවසර යක් අරගෙනවුත් 'ඩිටෙන්ෂන් ඕඩර්' එකක් මට භාර දී තමයි, අප ගෙන ගියේ. කථානායකතුමාට පමණයි, ඒ අවස්ථා වේදී අප ගෙන යන්ට බලය දෙන්නට පුළු වන්කම තිබුණේ.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

The hon. Member for Uva-Paranagama contradicts me when I say that I was under the impression that

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක]

she had consented, at the stage when the hon. Member for Welimada was lying under the steps of the House, to be taken into custody. She cannot contradict me on the question that I was under the impression. She can contradict me on the facts but, as to what my impressions were, only I can say.

May I give the grounds on which I formed that impression? I was informed that in the circumstances, having regard to his state of health at the time, she had expressed the wish—it might be true or false; I am only stating the reasons why I was under that impression—to accompany her husband at that stage. Those are the circumstances in which the orders were issued.

In regard to the legality of the Speaker's action——

කුසුමා රාජරත්න මිය.
(திருமதி குஸுமா ராஜரத்ன)
(Mrs. Kusama Rajaratna)

ඒක අමූලික බොරුවක්. මට 'ඩිටෙන්ෂන් ඕඩර්' එක දුන්නේ මේ පාර්ලිමේන්තුවේ සීමාව තුළදීයි.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

No one can possibly contradict me with regard to the impression I was, rightly or wrongly, under. I am giving the circumstances under which I was under that impression. I am prepared to accept the facts stated by the hon. Member for Uva-Paranagama.

I must also say this. Yesterday, at the request of the hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena), I saw the brother of the hon. Member for Uva-Paranagama in my office, notwithstanding that it was a public holiday, and having gone into the facts of the complaint he had to make as to how the hon. Member for Uva-Paranagama felt—she felt she was being persecuted and harassed by the presence of a Police Matron in her house; the Police Matron apparently interpreted her functions as one amounting to following the hon. Member for Uva-Paranagama as Mary followed the little lamb or vice versa, according to the instructions given her—I communicated with the hon. Member for Avissawella, as he will confirm, at about 3 o'clock in the afternoon; not only that, I indicated to the brother of the hon. Member for Uva-Paranagama that the cause for the complaint she had to make about all these matters would be speedily removed. And today orders were given that the nuisance she complained of was to cease forthwith.

I must say that although she ascribes to me all the actions, thoughts and conduct of the Hon. Prime Minister, neither the Hon. Prime Minister nor I was aware of these activities of the Police Matron and, as I said, as soon as the matter was brought to our notice, those orders were set aside.

කුසුමා රාජරත්න මිය.
(திருமதி குஸுமா ராஜரத்ன)
(Mrs. Kusama Rajjaratna)

අද උදේ. පොලිස් මේට්‍රන් ගියේ අද උදෙසි.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

I am talking of the order to take away the Police Matron. It was given by me and communicated to the hon. Member for Avissawella, the person who spoke to me on this matter, and I also indicated to him that very soon an order would be made in regard to the hon. Member for Uva-Paranagama. I am glad to say that in consequence of my activities she is here with us now, and in a position to discuss the Police Votes. So the assumption and argument that this is a Government of persecutors who are concerned with trying to cause trouble is completely erroneous. I am not objecting to her remarks about the over-officiousness of the officers. I can assure you that the Government had no intention whatsoever of causing any insult, any sort of disgrace, to attach to the fair name

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

of the hon. Member for Uva-Paranagama, or to cause her the slighest inconvenience. I thank you for your patience.

අ. භා. 4.10

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

රැස්වීම විනාඩි 30 කට තාවකාලිකව නවත්වනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සටුවන ලදින්, අ. භා. 4.40 ට නැවත පවත්වන ලදි.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

I would like to inform hon. Members that we had agreed in Chambers that we should finish this Ministry's votes one hour after the scheduled time. I think we are now very far behind time. Can we not finish them within one hour from now? It will help if hon. Members will curtail their speeches and not go over and over the same ground.

පී. සී. ඉඹුලාන මයා. (රුවන්වැල්ල)
(திரு. பீ. ஸீ. இம்புலான—ரூவான்வல்ல)
(Mr. P. C. Imbulana—Ruwanwella)

ගරු සභාපතිතුමනි, පොලිස් වැය ශීර්ෂය සම්බන්ධයෙන් බොහෝ වේලාවක් මෙම ගරු සභාව මිඩංගු කර තිබෙන හෙයින් මාද සංක්ෂේප වශයෙන් අදහස් සවලපයක් ප්‍රකාශ කරන්නටයි බලා පොරොත්තු වන්නේ. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු කළ කථාවලින් අපට පෙනී ගියේ අද ආණ්ඩු බලයේ සිටින පක්ෂය බල යට ආවායින් පසුව, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව බලයේ සිටි කාලයේදී වූ සේවයට වඩා හොඳ සේවයක් පොලිස් දෙපාර්තමේන්තුවෙන් මහජනයාට ලැබී තිබෙන බවයි. එසේ කී අතරම දැනට පොලීසියෙන් කෙරෙන්නාවූ අයුතු වැඩ රාශියක් ගැනද එතුමන්ලා සඳහන් කරන්නට යෙදුණා. ඒ නිසා මේ තර්ක දෙක එකට ගෙනෙන්නට ටිකක් අමාරු බව කාහටත් පෙනී යනවා ඇති. මගේ පෞද්ගලික අදහස නම් පසුගිය පස් අවුරුදු කාලය තුළදී පොලීසියෙන් මේ රටට වැඩි සේවයක් සිදු වී නැති බවයි.

පොලීස් සේවයේ සිටින කොස්තාපල් මහත්වරුන් සහ සාජන්ට්වරුන් යන සුළු නිලධාරි මහතුන්ට නියම නිවාස ක්‍රමය කුත් පඩි ක්‍රමයකුත් සකස් කර දෙන තුරු ඔවුන්ගෙන් මහජන යාට ඉටු විය යුතු විශිෂ්ට සේවය මහජනයාට ලැබෙන්නේ නැති බව මා කියන්නට ඕනෑ. දැන් පොලීස් සේවයේ යෙදී සිටින උදවියට ගෙවන පඩි ඉතාමත් අඩු බව කාටත් පෙනී යනවා ඇති. පොලීසියේ සිටින නිලධාරීන් විසින් කළ යුතුව තිබෙන රාජකාරි අතුරෙන් පැට්රෝල් යාම නොහොත් අපරාධ වැළැක්වීමේ අදහසින් පොලීස් නිලධාරීන් ගම්වල සංචාරය කිරීම ඉතාමත්ම වැදගත් කාර්‍යයක් හැටියට සැලකිය හැකියි. නමුත් මෙම වැය ශීර්ෂය යටතේ කලින් අවුරුදුවලදී වෙන් කළ මුදල් ප්‍රමාණයට වඩා අඩු මුදල් ප්‍රමාණයක් මේ වර්ෂය තුළදී වියදම් කරන්නට වෙන් කර තිබීමෙන් පෙනී යන්නේ මෙපමණ කල් එක්තරා විධියකට පවත්වාගෙන ආ මෙම සේවය මීට පසු ඒ අන්දමටම පවත්වාගෙන නොයන බවයි.

කරවනැල්ලේ තිබෙන පොලීස් ස්ථානය වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙන්නේ මෙසේයි. එම පොලීසියේ ජීප් ආදී රථ වාහන පාවිච්චි කිරීම පිණිස මීට කලින් අවුරුදුවල මසකට පැට්රල් ගැලුම් 30ක් පමණ වෙන්කර තිබුණ නමුත් මේ අවුරුද්දේ එම ගණන ගැලුම් 10 දක්වා අඩු කර දමා තිබෙනවා. කොටින්ම කියනවා නම්, මෙයින් පෙනී යන්නේ රථ වාහන මගින් කරනු ලබන පැට්රෝල් යෑම් ආදි සේවාවන් කලින් අවුරුදුවල සිදු කළ ප්‍රමාණයෙන් තුනෙන් දෙපංගුවක් අඩු කර තිබෙන බවයි. මෙම පොලීස් ස්ථානය වෙනුවෙන් බයිසිකල් 6 ක් ගැනීමටද මුදල වෙන් කර තිබෙනවා. නමුත් ගරු සභාපතිතුමනි, දැනට මෙම පොලීස් ස්ථානයේ තිබෙන බයිසිකල් වලින් 3 ක් පමණ සෑම වේලේම පාහේ පාවිච්චි කරන්ට බැරි තත්ත්වයකයි තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, පොලීසියට විරුද්ධව කරනු ලබන පැමිණිලි නිදහස් කොමිසමක් මගින් පරීක්ෂා කර බලනවාය කියා පසුගිය අවුරුද්දේ අයවැය විවාදයේදී ගරු මුදල් ඇමතිතුමා අපට කීවා. ගිය අවුරුද්දේ සිට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉඹුලාන මයා.]

එම පැමිණිලි කියක් විභාග කර තිබෙන බැවැයි ගරු මුදල් ඇමතිතුමාගෙන් අසන්නට සතුටුයි.

අ. භා. 4.45

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)
ලැබුණු ඒවා ඔක්කොම විභාග කළා.

ඉඹුලාන මයා.
(திரு. இம்புலான)
(Mr. Imbulana)

එසේ විභාග කරන ලද පැමිණිලිවල ප්‍රතිඵලත් අප දැනගන්න කැමතියි. එවැනි විභාගවලදී යම් යම් පොලීසිවලට පක්ෂව ක්‍රියා කළ අවස්ථා රාශියක් තිබෙනවා. පොලීසියට සම්බන්ධකමක් නැති නිදහස් මණ්ඩලයකින් පොලීසියට විරුද්ධව තිබෙන පැමිණිලි විභාග කළ යුතුයයි අප කියන්නේ ඒ නිසයි. පොලීසිය සම්බන්ධයෙන් කොතරම් "ඇඩ්මිනිස්ට්‍රේටිව් චාර්ජස්" තුබුණත් එවැනි නිදහස් මණ්ඩලයකින් පරීක්ෂා කරන තුරු පොලීසිය දියුණු වන්නේ නැහැ. එවැනි නිදහස් මණ්ඩලවලින් පරීක්ෂණ පැවැත්වුණාදැයි අප දන්නේ නැහැ. සමහර විට පොලීසියේ නිලධාරීන්ට විරුද්ධව තිබෙන පැමිණිලි විභාග කරනු ලබන්නේ ඊට වඩා උසස් පොලීස් නිලධාරීන් විසින් විය හැකියි. එහෙත් ඉන්ඩිපෙන්ඩන්ට් කියන නිදහස් මණ්ඩලයකින් එම විභාග පවත්වනවා නම් වඩා වැදගත් බව තේරුම් යන්නට ඕනෑ. වග කිවයුතු විශිෂ්ට සේවා කර ඇති ආණ්ඩුවේ නිලධාරීන් විසින් හෝ වේවා නොඑසේ නම් වෙනත් එවැනි උදවිය විසින් හෝ වේවා එම පැමිණිලි විභාග කරනු ලබනවා නම්, පොලීස් සේවාව මීට වඩා දියුණු කළ හැකි බවයි, මගේ කල්පනාව.

තව එක කාරණයක් පමණක් මතක් කරන්නට සතුටුයි. අද දින ලංකාවේ කාන්වල් කීයක් තිබෙනවාද? සූදුවලට විරුද්ධව, ජැක්පොට්වලට විරුද්ධව නීති රාශියක් පැනෙව්ව බව අප දන්නවා. නමුත් ඒ නීති ක්‍රියාවේ යෙදෙනවාදැයි දැන ගන්නට කැමතියි. අදත් කොළඹ කාන්වල් රාශියක් තිබෙන බව අප දන්නවා. ඒවා අතර සූදු නැති කාන්වල් එක කුමක්දැයි කරුණා කර කියන්න. සූදු නැති කාන්වල් නැහැ. සූදු නැතිව, ජැක්පොට් නැතිව කාන්වල් කරන්න බැරි බව අප අසා තිබෙනවා. සූදු නැති කිරීම සඳහා මේ ගරු සභාවෙන් සම්මත කරනලද නීති ක්‍රියාත්මක නොකරන්නේ මන්ද? ජැක්පොට් අයිතිකාරයන්ගේ සංගමයේ නියෝජිත මණ්ඩල ඇමතිවරුන් මුණ ගැසීමට පැමිණියාට පසුව තව දුරටත් එම සූදුව පවත්වා ගෙන යෑම සඳහා සහනයක් ලැබී ඇති බවට කථා තිබෙනවා. මේවා ඇත්තදැයි අප දන්නේ නැහැ. නමුත් හැම කාන්වල් එකකම සූදු තිබෙන බවත්, සමහර විට උසස් පොලීස් නිලධාරීන් පවා එම සූදුවලට සහභාගි වනු අප දැක ඇති බවත් කියයුතුයි. කාන්වල් වල අයුතු වැඩ කෙරෙන බව අප දන්නවා. එවැනි තත්ත්වයක් තිබියදී පොලීසිය නිශ්ශබ්දව සිටින්නේ ඇයි? මේක වැදගත් ප්‍රශ්නයක්.

මා වැඩි වේලා ගන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මා මුලින් කීවාක් මෙන් පොලීසියෙන් නියම සේවයක් ඉටු වන්නට නම් පොලීසියට විරුද්ධව කෙරෙන පැමිණිලි ගැන නිදහස් මණ්ඩලයකින් විභාග පැවැත්විය යුතුයි. ඒ වගේම, පොලීසියේ මුහුණුවර වෙනස් විය යුතුයි. මේ බව පසුගිය වර්ෂයේදීත් මතක් කළා. එහි මුහුණුවර වෙනස් වී දැනට වඩා පොලීසියත් මහජනයාත් අතර සම්බන්ධකම දියුණු විය යුතුයි. යූ. එන්. පී. කාලයේ මෙසේ තුබුණාය යනාදී වශයෙන් දෙස් කීවාට මදි. එක්සත් ජාතික පක්ෂය නරක විධියට කළාය කීමෙන් වැඩක් නැහැ. තමුන්නාන්සේලාගේ යුතුකම වන්නේ හරි හැටි ක්‍රියා කිරීමයි. එවැනි කීම් මහජනයා පිළිගන්නේ නැහැ. තවමත් පොලීස් ස්ථානවල තිබෙන්නේ ඒ යූ. එන්. පී. ආණ්ඩු කාලයේ තිබුණු බංකුවමයි. හැම ඉරිදම හැම පොලිස් ස්ථානයකටම සිය ගණන් ජනයා පැමිණෙනවා. ඒවාට යන මහජනයාට තවමත් ඉද ගන්නට සිදු වී තිබෙන්නේ පිල් අඟුවලයි. එකම බංකුවයි, තිබෙන්නේ. ඒකෙත් සීට් ඉරිලා. ඒ වාගේම ඒකේ ඉද ගන්නට දෙන්නේත් ලොකු කෙනෙකු පොලීසියට ගියාම විතරයි. [බාධා කිරීම්.]

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
ඒ රුවන්වැල්ලේ වෙන්න ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
කරුණා කර නිශ්ශබ්ද වන්න.

ඉඹුලාන මයා.
(திரு. இம்புலான)
(Mr. Imbulana)
නැහැ, ලංකාවේ හැම තැනම එක වගෙයි. එම නිසා තමුන්නාන්සේලාට තිබෙන්නේ අනික් පක්ෂවලටවත් කලින් තිබුණු ආණ්ඩුවලටවත් දෝෂාරෝපණය කිරීම නොවෙයි. මේ ආණ්ඩුව විසින් කළ යුතුව තිබෙන්නේ මහජනයාට ගැලපෙන පරිදි මහජනයාගේ ප්‍රයෝජනය සඳහා ආණ්ඩුවේ ආයතනවල පරිවර්තනයක් ඇති කිරීමයි. එවැනි පරිවර්තනයක් ඇති කරනවා ඇතැයි විශ්වාස කරමින් මගේ වචන සවලපය මා අවසාන කරනවා.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)
(Dr. S. A. Wickremasinghe—Akuressa)

I do not want to repeat the charges that have been made against the police. I only want to endorse the fact that most of the grave accusations that have been made against the police have very sound foundations. And I appeal to the Government to devise immediately some machinery whereby the public can be protected from criminal assaults by the police. This is a very serious matter. The police are expected to protect the interests of the people but police stations have now become dens of criminal assaults on harmless and innocent people. I will not say that of all police stations. Some police stations have become places where people's lives are not safe. I want to give one or two examples so that the magnitude of this grave problem will be realized by the Government.

There was an instance in Akuressa where the Inspector was resorting to terrorist activities and assaulting people indiscriminately in a most outrageous manner. After repeated complaints an inquiry was held and the charges were proved. The superior officer found that there were sufficient grounds to file a plaint against him for grave criminal offences, but what was the result? Probably to satisfy me and appease me they thought the best thing would be to transfer the officer. I appealed to his superior officer and told him that rather than be a party to inflicting this criminal officer on another town I would let him remain in my area if they were not going to interdict him. He was not interdicted but transferred to another station.

What happened to the Akuressa Police Station? A criminally minded officer who was unwanted in Passara was transferred to Akuressa. Both these men carried on their nefarious activities of assaulting people and extorting bribes from innocent people in a much worse fashion. The man who was transferred from my area became so encouraged to continue his criminal activities that he was finally caught in attempting to suppress evidence in a murder case and is now interdicted! After allowing him to run riot for several years they have now got sufficient facts to put the case before the P. S. C.

Another case was mentioned by the hon. Member for Kamburupitiya (Mr. Percy Wickremasinghe) about an incident in the Matara Police Station. This incident indicates the utter callousness of police officers and the irresponsible way in which they behave in the police station. The Matara Police Station is next to the Urban Council and in the heart of the town. A man was served notice to come to the Matara Police Station for an inquiry with regard to a civil matter. After the inquiry the other people who had come with him were asked to leave and this man was taken and locked up without any justification whatsoever. After placing this man before a wall the Inspector gave him a hard blow and his forehead struck the wall and was injured. The man was stunned

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. විකුමසිංහ]

and fell down. Two constables raised him up, dragged him to the "lock-up" and assaulted him again.

There were two eye-witnesses to this incident and they came and complained to me. At about 10 o'clock I telephoned the Superintendent of Police and told him that the police officers had been guilty of a criminal assault on an innocent person. He said that he would telephone the police station and find out. Then some time afterwards the police telephoned me and told me that there was a man in the police station who had run riot and had struck his forehead against a wall. They said that he could be released and that if I would send somebody he would be released immediately.

The fact that he could be released immediately showed that the police had no right to retain him. There is *prima facie* evidence that this man was put in the "lock-up" without any justification whatsoever. That evidence was there if it was proposed to take action against the officer concerned. But nothing has happened. They say the man was injured by running riot. Will any sensible person believe such a story—that a man hits his head against a wall so hard that his skull cracks ?

Recently a man whose house was burgled came to me. He said that he had been to the Police Station, Akuressa, but no action had been taken. I informed the police myself but no action was taken. When still no action was taken he petitioned the Superintendent of Police, Matara. Subsequently when the man came to see me again, as still no action was taken, I gave him a letter and asked him to go to the Akuressa Police Station. He said that he feared to go because he would be assaulted. I said that I could not believe that and wanted him to take my letter and go to the police station. The man went to the police station and was assaulted. Moreover they delayed inquiring into the burglary for over two weeks to take revenge on him because he had petitioned the Superintendent of Police.

There was another incident connected with a tractor driver at the Tissamaharama Police Station. I know this tractor driver personally. He saw a Government school teacher being assaulted by the Inspector. He had the courage and the sense of duty to offer to give evidence of the facts and he gave evidence at the inquiry held by the A. S. P. Subsequently this man was taken to the police station and was most brutally assaulted.

I will not delay the House by mentioning further incidents of this type but I can mention other incidents of this nature which are known to me personally and are absolutely true. From the I. G. P. right down everyone knows that these are true. I also know that the main agents in the area of a large number of Inspectors are *kassippu* dealers who are a source of income to them. With the assistance of these *kassippu* dealers these police officers terrorize, assault and inflict untold injury on innocent people causing permanent injury to their health sometimes.

Commissions are useless. We must immediately set up machinery whereby a case is investigated and, if it is proved that an officer is guilty of any assault, a criminal action should be instituted against him. I wish also to mention that the most obscene language which could be used by any human being in Ceylon is used by these police officers. They do not use decent language. Whenever they open their mouths they use very foul language. The hon. Member for Uva-Paranagama (Mrs. Kusuma Rajaratna) very correctly spoke about a new psychological approach. I must say that a large section of the police force only know obscene language. In that position you undermine the morale of the people. You speak of the morale of the police force. What you have to maintain is not the morale of the police force but the morale of the people, of the entire country.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

What I would like to suggest is, when a *prima facie* case has been made against a police officer that case must not be investigated by a superior police officer, because such an officer is afraid to inquire into the activities of inspectors. It will be useless therefore to ask a superior police officer to find out the faults of those in the lower ranks at the police stations. There must be an independent body to inquire into these matters. And immediately a *prima facie* case is proved against an officer, that officer must not be transferred but interdicted and then dismissed. The replacement of a police officer is not a difficult thing. It is not similar to the replacement of an engineer or a person in a technical job. You can get decent men to replace a police officer. I would not suggest a commission to inquire into any complaints made against police officers because these commissions take years and years, and when they submit a report, it takes another two or three years for it to be published. There should be a body of independent people, and machinery must be established to deal with these matters immediately——

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
Like the C. T. B. Commission.

වෛද්‍යාචාර්ය එස් ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
No, not a commission, but an executive body which can take evidence. It must be clearly stated that the use of offensive or abusive language is a sufficient cause for the interdiction of an officer, and if proved, will warrant even dismissal. They do not know how to treat people with decency, the ordinary people who come to the police stations. It is a pathetic admission, it is a shame for us to realize the level to which the police has degenerated in many places. I do say there are decent police officers ; I do agree with the hon. Parliamentary Secretary that there are good police officers ; but that is not a reason for tolerating some of the worst criminal elements in the force.

Recently the Inspector of Police, Akuressa, assaulted and abused a village committee member of one of the village committees in my area. Charges have been framed against the previous Inspector—and they are yet under investigation. Subsequently at the other station to which he had been transferred he has been interdicted. I thought if I made charges against this officer it would result in his being inflicted on somebody else. This man was unwanted and passed on to Akuressa, and if he is not wanted in Akuressa he would be sent somewhere else and people there would have to suffer under him. I am disgusted of making charges although I have sufficient evidence. He came and apologised. He said he was sorry, that there had been a misunderstanding, that he did not know who the person was, and that he would not do this sort of thing again. I spoke to the Superintendent of Police and did not pursue the matter. A few weeks later when a man went with a letter from me to make a complaint that his house had been burgled and that an inquiry be made, he was brutally assaulted.

Some of these men are mentally unfit to be in the police force. There are a large number of such men in the police. Therefore we must have some machinery immediately to deal with the police force and see that they maintain a standard of decency in dealing with the public. Every police officer who attends to the public must maintain a standard of behaviour and address people in a language befitting of a public officer, and, unless under grave provocation and in self defence, they should not touch any person or brutally assault people as they are doing at the present time.

ස්ටැන්ලි මොල්ලිගොඩ මයා. (නිවිතිගල)
(திரு. ஸ்டான்லி மொல்லிகொட—நிவிதிகல)
(Mr. Stanley Molligoda—Niwitigala)
උපදෙසක් අනුවද? එසේ නැත්නම් කාගේ හෝ උපදෙසක් තිබෙන්නට එපායැ. කාගේවත් උපදෙස් නැතිව, වාර්තාව කියවා කල්පනා කරන්නේත් නැතිව, කිසිම හේතුවක් නැතිව වයස අවුරුදු 55දී සියල්ලන්ටම පිටවන්නටය කියා නියම කර තිබෙන නිසා ඒ අය අද දවසේ මහත් අසන්තෝෂයකින් සිටිනවා. මන්ද? ඒ අය කල්පනා කරගෙන සිටියේ අවුරුදු 60 වන තුරු සේවය කර "කම්යුටඩ් පෙන්ෂන්" එක හෝ අරමුදල හෝ එක විටම මුදලක් ලබාගෙන විශ්‍රාම ලැබීමෙන් පසුව යම්කිසි ව්‍යාපාරයක් ආරම්භ කරන්නටයි. ඒ විධියට කල්පනා කළ අයගේ බලා පොරොත්තු සුන් වී ගියා. මේ නිසා තමන් විසින් පෞද්ගලික වශයෙන් සකස් කරන ලද වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම සුන් වී යනවා. එපමණක් නොව, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල වැඩ කරන දක්ෂ නිලධාරීන්, අවුරුදු 56 සිට 60 දක්වා වයස් වූ දක්ෂ නිලධාරීන්, අස් වී ගිය විට එම දෙපාර්තමේන්තුවල වැඩ කටයුතු බොහොම දුර්වල වෙනවාට කිසිම සැකයක් නැති බව කනගාටුවෙන් කිව යුතුව තිබෙනවා.

අ. භා. 3.30

සභාපතිතුමනි, මා මෙහිදී එක්තරා කරුණක් කියන්ට කැමතියි. අවුරුදු 60 ක් වයස් වීම නිසා සේවයෙන් විශ්‍රාම ගත් විශේෂඥ ගුරුවරුන් ආපසු සේවයට බඳවා ගත යුතු බවට අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටියදී මා අධ්‍යාපන දෙපාර්තමේන්තුවට නියෝග කළා. ඒ ඇයි? 1956 සිට ආරම්භ වූයේ විශේෂ වැදගත්කමක් ඇති පරිවර්තන යුගයක්. එම නිසා දක්ෂ ගුරුවරුන් පිට නොකර තව දුරටත් තබා ගැනීමටත් ඔවුන්ට ධෛර්‍ය දීමටත් කට යුතු යොදවන්නට මා නියම කළා; අවුරුදු 60 ඉක්මවූ අයත් සේවයට බඳවා ගන්න ලෙස නියම කළා. භෞතික විද්‍යාව, උසස් ගණිතය, ඉංග්‍රීසි භාෂාව, ඉතිහාසය, භූගෝල විද්‍යාව, වැනි විශේෂ විෂයයන් ඉගැන්වීම සඳහා සිටින දක්ෂ ගුරුවරුන් මේ රටේ බොහොම අඩුයි. සෙන්ට් ජෝශප් විද්‍යාලයේ හිටි ඉතාමත් දක්ෂ ගුරුවරුන්, ගණිතය සහ වෙනත් විද්‍යා විෂයයන් සඳහා ඉතාමත් දක්ෂ ගුරුවරුන්, 5 දෙනෙක් පසු ගිය මාස 12 ඇතුළතදී ලංකාවෙන් පිට වී ගියා. ඒ පිට වී යෑම නවත්වා ගැනීමට පුළුවන් වුණා නම් මේ රටට ලොකු සේවයක් සැලසෙනවා නේද? යම්කිසි විශේෂ වැටුප් ක්‍රමයක් යටතේ හෝ ඔවුන් නවත්වා ගන්නට පුළුවන් වුණා නම් කොතරම් හොඳද? එසේ නම් මේ පරිවර්තන යුගයේදී තමුන්නාන්සේලා විසින් සකස් කරනු ලබන ජාතික අධ්‍යාපන ක්‍රමයට විශාල උදව්වක් වෙනවා.

ගුරුවරුන් සඳහා මෙම අවුරුදු 55 රෙගුලාසිය ක්‍රියාත්මක කිරීම ගැන මා නම් සම්පූර්ණයෙන්ම විරුද්ධයි. තමුන්නාන්සේලා මගේ අදහස පිළිගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා. මෙම නීතිය ගුරුවරුන් සඳහා ක්‍රියාවේ යෙදවුවහොත් පාඨශාලාවල උසස් පන්තිවලට සුදුසු ගුරුවරුන් සොයා ගැනීම අමාරු වෙනවා ඇති. එම නිසා මෙම වයස 55 පිළිබඳ රෙගුලාසිය ගුරුවරුන්ගෙන් ඉවත් කරන ලෙස ඉල්ලා සිටිනවා. ලබන ඔක්තෝබර් මාසය වන විට අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ වයස අවුරුදු 59 යි. ඊළඟ ඔක්තෝබර් මාසයේදී 60 යි. එම නිසා ඒ මහතාට විශ්‍රාම ගැනීමට සිදු වී තිබෙනවා. ඒ වගේම අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ තවත් උසස් නිලධාරීන් 14 දෙනකුට විශ්‍රාම ගැනීමට සිදු වී තිබෙනවා. කිසිම කෙනකුගේ පෞද්ගලික කරුණක් ගැන කියන්නට නොවෙයි, මා අදහස් කරන්නේ. යම්කිසි විධියකින් දෙපාර්තමේන්තුවක් පාලනය කිරීමට හවුල් වන උසස් නිලධාරීන් හුඟ දෙනකු එක වර පිට කරනවා නම්, එම දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම දුර්වල වී යනවා ඇති. පාලනයෙහි දුර්වලතාවන් ඇති වෙන්නට පුළුවනි. එම නිසා වයස 55 දී රජයේ සේවකයන් විශ්‍රාම ගත යුතුයයි කැබිනට් මණ්ඩලය තීරණය කළා නම්, තවත් ටිකක් ඒ ගැන කල්පනා කර බලන්නැයි මා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට මතක් කරනවා. මේ පඩි වාර්තාවේ කියා තිබෙන කරුණු ගැන සෝදිසි කර බලන්න.. කැබිනට් තීන්දු ක්‍රියාත්මක කිරීමට පෙර ඒ ගැන සෝදිසි කර බැලීම සුදුසුයි. දැන් වයස 55 දී "ඔප්ෂනල් රිටයමන්ට්" එකක් ලබා ගන්නට පුළුවනි; කැමැත්තෙන් විශ්‍රාම ගන්නට පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

එසේ නැත්නම් 55 පසු වී ගියාට පසු 60 දක්වාම, අවුරුද්දෙන් අවුරුද්ද තමන්ගේ සේවය දීර්ඝ කරන ලෙස ඉල්ලමින් අයදුම් පත් යවන්නට පුළුවනි. ඒ ඉල්ලුම් පත්‍ර යැවීමාම ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හිතනවා නම් එම නිලධාරියාගේ වැඩ කටයුතු සතුටුදායක නැත කියා, එම නිලධාරියාට මාසයෙන් අස් වන්නටයයි කියන්න පුළුවනි. දැනට තිබෙන රෙගුලාසිය ඒකයි. වයස 55-60 අතරේ අසතුටුදායක සේවකයන් ඉන්නවා නම්, ඒ අයව පිට කිරීමට දැනට තිබෙන රෙගුලාසිය තමුන්නාන්සේලාට මදිද? මොකටද මේ අවුරුදු 55 කින් විශ්‍රාම ගන්වන්නට අළුත් දරුණු නීතියක් ඇති කළේ?

ගරු සභාපතිතුමනි, මේ අළුත් නීතිය ඇති කිරීමට හේතුව කුමක්ද කියා මම දන්නේ නැහැ. කලින් ප්‍රවෘත්ති පත්‍රවල පළ වී තිබුණා මේ වයස 55 නීතිය ඉදිරිපත් කරන්නේ රැකීරක්ෂා ප්‍රශ්නය එක්තරා පිළිවෙළකට විසඳීම පිණිස කියා. 55 නීතිය අනුව හුඟ දෙනකු අස් වුනාම ඒ ප්‍රමාණයට ගණනක් අළුතෙන් ඇතුළු වන නිසා රැකීරක්ෂා ප්‍රශ්නය තරමක් විසඳෙනවාය කියන අදහසක් කලින් ප්‍රවෘත්ති පත්‍රවල පළ වී තිබුණා. නමුත් ඊට පසු තවත් අදහසක් පැතුරුණා. ඒ අදහස නම්, මේ 55 නීතිය අනුව හුඟ දෙනකු විශ්‍රාම ගත්තත් ඒ වෙනුවට අළුතෙන් අය බඳවා ගන්නේ නැත යන්නයි. මේ අළුත් නීතිය අනුව පන්දාහකටත් දහදාහකටත් අතර ගණනක් සේවයෙන් අස් වුණාම ඒ සමාන ගණනක් අළුතෙන් ගන්නේ නැත කියන අදහසක් අද තිබෙනවා. එසේ නම්, මේ වයස 55 නීතිය ඉදිරිපත් කළේ මොන කරුණක් නිසාද කියා මට තේරුම් ගන්නට බැහැ. මේ නීතිය ඉදිරිපත් කළේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට නොවෙයි. මෙය වැඩිදුර කල්පනා නොකර ඉක්මන් කමින් කළ වැරදි තීරණයක්ය කියා මම කල්පනා කරනවා. කැබිනට් මණ්ඩලය වැරදි තීරණයක් කළා නම්, කරුණා කර ඒ වැරදි තීරණය අස් කර ගන්න. මේ නීතිය අනුව සේවකයන් අස් කරන විට "කොමියුටඩ් පෙන්ෂන්" මුදලක්—විශ්‍රාම වැටුප්වලින් එකතු කළ ලොකු මුදලක්—දෙන්නට සිදු වෙනවා. ඒ සේවකයන් සියලු දෙනාටම "කොමියුටඩ් පෙන්ෂන්" දෙනවාද නැද්ද යන ප්‍රශ්නය මම කෙළින්ම අහනවා. දෙනවාය, එහෙම නැත්නම් දෙන්නේ නැත, කියා එක වචනයකින් උත්තරයක් දෙන්න. එක වචනයකින් උත්තරයක් දෙනවා නම්, මම වාඩි වෙන්නම්. මේ 55 රෙගුලාසිය යටතේ අස් කරන්නට යන පන්දාහත් දහදාහත් අතර පිරිසට "කොමියුටඩ් පෙන්ෂන්" දෙනවාද? නැද්ද? උත්තර නැහැ.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)

උත්තර දෙන වෙලාවට උත්තර දෙන්නම්.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

මේක ගැටලු ප්‍රශ්නයක් නිසා උත්තර නැහැ. "කොමියුටඩ් පෙන්ෂන්" දෙනවා නම්, ඒ සඳහා ආණ්ඩුවට රුපියල් ලක්ෂ සියයකට වැඩි මුදලක් වියදම් කරන්නට වෙනවා. දැන් හක්මන ගරු මන්ත්‍රීතුමා (රෝයි රාජපක්ෂ මයා.) ප්‍රකාශ කළා මුදල් තත්ත්වය නරකය කියා. එසේ නම්, "කොමියුටඩ් පෙන්ෂන්" වශයෙන් රුපියල් ලක්ෂ සියයකට වැඩි මුදලක් දෙන්නේ කොහොමද? තමුන්නාන්සේගේ අදහසක් තියෙනවාද "කොමියුටඩ් පෙන්ෂන්" එක නොදී ඉන්ට? දෙයියෝ සාක්කි, "කොමියුටඩ් පෙන්ෂන්" එක නොදෙනවා නම් ඒක බරපතල හෙනගහන දරුණු අපරාධයක්. ආණ්ඩුවේ සේවකයන්ට "කොමියුටඩ් පෙන්ෂන්" එක නොදෙන වාය කීම හිතන්නටවත් බැරි අපරාධයක්.

ගරු සභාපතිතුමනි, මේවා වැදගත් ප්‍රශ්න. මා දෙන අවවාදය, කැබිනට් මණ්ඩලය වැරදි තීරණයක් කළා නම්, දැන් ඒ පඩි වාර්තාවේ තිබෙන කරුණු අනුව කරුණා කර ඒ වැරදි තීරණය අස් කර ගත යුතු බවයි. කරුණා කර ඒ වැරදි නීන්දුව අස් කරගෙන දැන් තිබෙන නීතිය අනුව අවුරුදු 55 සිට 60 දක්වා වයස් වන අයගේ සේවය ගැන අවුරුදුපතා පරීක්ෂා කර බලා අසතුටුදායක අයට යන්න කියන්න. තවද මේ පඩි කොමිෂන් සභා වාර්තාවේ කියා තිබෙන හැටියට අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස 62 යයි පිළිගන්න. ඒ අතරතුර ගුරුවරුන්ට 60 පසු වූවාට පසු වැඩ කිරීමට මේ පරිවර්තන යුගයේදී බලය දෙන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මීළඟට මම තවත් කරුණක් ගරු උප ඇමතිතුමාට මතක් කරනවා. මේ රටේ වැඩි පුර කර්මාන්ත නැති බව අපි පිළිගන්නට ඕනෑ. ලංකාවේ තිබෙන ලොකුම ලොකු කර්මාන්තය ආණ්ඩුවේ සේවයයි. Government service is the chief industry in Ceylon. ඒක අපි පිළිගන්නවා. දැන් අවුරුද්දකට වරක් ආණ්ඩුවේ සේවකයින් කණ්ඩායමක් සේවයට බඳවා ගන්නවා. 3,000 ක් 4,000 ක් වෙන්න පුළුවනි. ආණ්ඩුවේ සේවකයින් අළුතෙන් බඳවා ගැනීම තාවකාලිකව තහනම් කර තිබෙයයි කියන්නේ ඇත්තද? අවුරුද්දකට වරක් ලිපිකරු විභාගයක් පවත්වනවා. අවුරුද්දකට වරක් ලඝු ලේඛකයින්ගේ විභාගයක් පවත්වනවා. අවුරුද්දකට වරක් තැපැල් සේවකයින් සඳහා විභාගයක් පවත්වනවා. ඒ විභාග 1962 දී පවත්වනවාද? නවත්වනවාද? නියම විධියට ඒවා පවත්වන්නට ඕනෑ. මුදල් හානියක් තිබේය කියා එක පැත්තකින් බදු බර වැඩි කරනවා, අනික් පැත්තෙන් සේවක සංඛ්‍යාව අඩු කරනවා. ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මොකක්දැයි මට නම් තේරෙන්නේ නැහැ. ආණ්ඩු කරනවාද? නොකරනවාද? ආණ්ඩුවක් හැටියට ක්‍රියා කරනවාද? නැතිනම් ආණ්ඩුවක් නැති හැටියට ඉන්නවාද? අවුරුදුපතා බඳවාගන්න සේවකයින් නවත්වන්නේ නැතිව බඳවාගන්න ඕනෑ. අවුරුදුපතා පවත්වන විභාග නවත්වනවා නම් එය රටට කරන අයුක්තියක්. රැකීරක්ෂා බලා පොරොත්තු වන තරුණ තරුණියන්ට කරන අයුක්තියක් පමණක් නොවෙයි, ඒ දෙපාර්තමේන්තුවලින් ඉටු විය යුතු සේවය නිසියාකාර නො කිරීමට රුකුල් දීමක්ද වෙනවා.

සභාපතිතුමනි, අද තිබෙන තත්ත්වය අනුව මේ ආණ්ඩුව ඉදිරියට අළුතින් සේවකයින් බඳවා ගැනීම නවත්වනවා පමණක් නොවෙයි, දැනට සිටින සේවකයින්ගේ සංඛ්‍යාවත් අඩු කරන්නටයි යන්නේ. ආණ්ඩුව අනුමත කළ 'sanctioned strength' කියන සේවක සංඛ්‍යාවක් තිබෙනවා. ඒවාගේම 'actual strength' කියන දැනට ඉන්න සේවක සංඛ්‍යාවක් තිබෙනවා. මෙන්න භාණ්ඩාගාරය ගිය අවුරුද්දේ නිකුත් කළ වාර්තාව.

අ. භා. 3.45

මහා භාණ්ඩාගාරයේ ලේකම්වර එච්. ඊ. පීරිස් මහත්මයා විසින් 1960 නොවැම්බර් මාසයේදී නිකුත් කරන ලද, 1959 වර්ෂය සඳහා වූ පරිපාලන වාර්තාවේ එච් 67 සහ එච් 68 දරණ පිටුවල මේ ආකාරයට සඳහන් කර තිබෙනවා:

ලඝු ලේඛක සේවයේ නියමිත සේවක යන් සංඛ්‍යාවට වඩා 153 දෙනෙක් අඩුවයි ඉන්නෙ. ටයිප්කරුවන්ගේ සේවයේ නියමිත සංඛ්‍යාවට වඩා 534 දෙනෙක් අඩුවයි ඉන්නෙ. දිස්ත්‍රික් ලිපිකරු සේවයේ නියමිත සංඛ්‍යාවට වඩා 921 දෙනෙක් අඩුවයි ඉන්නෙ. භාෂා පරිවර්තකයින්ගේ සේවයේ නියමිත සංඛ්‍යාවට වඩා 27 දෙනෙක් අඩුවයි ඉන්නෙ.

දැන් මා සේවාවන් 4ක් සම්බන්ධයෙන් තමුන්නාන්සේට කරුණු පෙන්වා දුන්නා. මේ පාර්ලිමේන්තුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර දී තිබෙන නමුත් ඒ මුදල් සම්පූර්ණයෙන් වැය කර වුවමනා තරම් සේවකයන් පත් කරන්නෙ නැහැ. කොයි තරම් පිරිසක් අඩුවෙන්ද සිටින්නේ යන්න මේ සංඛ්‍යා ලේඛනවලින් හොඳාකාර පෙනී යනවා ඇති. ඇයි මේ තරම් ලඝු ලේඛක පිරිසක් අඩුවෙන් ඉන්නෙ? ඇයි ලඝු ලේඛකයින් 153 දෙනෙක් අඩුව වැඩ කරන්නෙ? අද බොහෝ දෙනෙක් සිංහල ලඝුලේඛනය ඉගෙන ගන්නවා. ඒ අය රක්ෂාවල් බලාපොරොත්තුවෙන් පොරකකා ඉන්නවා. ලඝු ලේඛකයින් තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන පරීක්ෂණයකට ඉල්ලුම්කරුවන් කී දෙනෙක් පෙනී සිටිනවාද? මේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සේවය කිරීම සඳහා හැන්සාඩ් වාර්තාකරුවන් තෝරා ගැනීමට පසුගිය දා පැවැත්වූ පරීක්ෂණයට කී දෙනෙක් ඉල්ලුම් කළාද? එයින් කී දෙනෙක් තෝරා ගත්තාද? ආණ්ඩුවේ ඒ ඒ දෙපාර්තමේන්තුවල සේවය කිරීම සඳහා ලඝු ලේඛකයින් 10 දෙනකු, නැත්නම් 15 දෙනකු තෝරා ගැනීමට විභාගයක් පවත්වන විට ඒ සඳහා 300කටත් වැඩි පිරිසක් ඉල්ලුම් කරනවා. සිංහල ලඝුලේඛනය ඉගෙන ගන්නා උදවියට රක්ෂාවල් නොදෙන්නෙ ඇයි? වුවමනා සංඛ්‍යාවෙන් 153 දෙනකුම අරගෙන නැහැ. මේ පිරිසට ලඝුලේඛකයින් වශයෙන් රක්ෂාව නොදෙන්නෙ ඇයි? හැම පළාතකම වාගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලඝු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

ලේඛනය පමණක් නොව ටයිප් ගැසීමටත් ඉගෙන ගන්නවා. කී දෙනෙක් එම විෂයය ඉගෙන ගැනීමෙන් පසුව රක්ෂාවල් නැතිව ඉන්නවාද? 534 දෙනකුට රක්ෂාව දීම සඳහා පාර්ලිමේන්තුවෙන් මුදල් පාස් කරවා ගත්තෙ ඇයි, ඒ අය පත් නොකර ඉන්න බලාපොරොත්තු වෙනවා නම්? සේවයට අලුතින් බඳවා ගැනීම මේ ආණ්ඩුව නතර කර තිබෙන බවට ආරංචියක් තිබෙනවා. නියම සේවක සංඛ්‍යාව ගන්නෙ නැතිලු. එහෙමද මේ ආණ්ඩුව ආණ්ඩුවේ සේවය ශක්තිමත් කරන්නෙ? ගරු මුදල් ඇමතිතුමා නම් ගම්භීර ලෙස කියා ගෙන ගියා. ඇඩ්මිනිස්ට්‍රේටිව් ඇෆිෂන්සි කියන එක වැඩි කරන්න ඕනෑ කියා. ඉතින් ඔය විධියටද සේවයේ කාර්යක්ෂමතාව පවත්වා ගෙන යන්න බලාපොරොත්තු වන්නෙ? සේවකයන් අඩු කිරීමෙන්ද සේවයේ කාර්යක්ෂමභාවය රැක ගන්න යන්නෙ? රජයේ සේවයෙහි දක්ෂකම වැඩි කරන්නේ කොහොමද කියා එතුමා දන්නේ නැහැ. සමහර රජයේ සේවකයන්ට වුවමනාවට වඩා වැඩ දෙනවා නම් දක්ෂකම ගෙන යන්න පුළුවන්ද? [බාධා කිරීමක්.] මා ඇමතිවරයකු වශයෙන් අවුරුදු හතරක් සේවය කළාය කියන එක ඇත්ත තමයි. ඒක ඇත්ත වෙන්න පුළුවනි. සමහර අය අඩුවෙන් වැඩ කරන එකත් ඇත්තයි. තවත් සමහර අය ඉන්නවා, ඒ අය තමන්ට නියමිත ප්‍රමාණයට වඩා වැඩියෙන් වැඩ කරනවා. තමුන්නාන්සේ පරීක්ෂා නොකර ඔය විධියට තීරණයක් දෙන එක වැරදියි. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වැඩ කරන එක් ලිපිකරුවකුට fපයිල් දෙදහක් පමණ භාරව වැඩ කරන්නට සිදු වී තිබෙනවා. එක ලිපිකරුවෙක් එතරම් වැඩ ප්‍රමාණයක් කරන්නේ කෙසේද? 1956න් පසු ගුරුවරුන් 30,000ක පමණ සංඛ්‍යාවක් වැඩි වී සිටිනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව දැන් පස් ගුණයකින් පමණ වැඩි වී තිබෙනවා. දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු මේ අන්දමට පුළුල් වී යන විට ඇයි තමුන්නාන්සේලා මෙම දෙපාර්තමේන්තුවට වැඩිපුර සේවක සංඛ්‍යාවක් බඳවා නොගන්නෙ? මෙම ප්‍රශ්නයේ දෙපැත්තක් තිබෙනවා? වැඩ වැඩි වන ප්‍රමාණය අනුව සේවක සංඛ්‍යාවද වැඩි කරන්න ඕනෑ. එසේ නැත්නම් වැඩ ප්‍රමාද වීම වළක්වන්න බැහැ. අපි සෑම දෙනාම පාහේ දන්නවා ලියුම්වලට පිළිතුරු ලැබෙන්නේ ප්‍රමාද වී බව. ඒ තත්ත්වයට ආණ්ඩුවේ සේවකයාට පමණක් වැරදි කියන්නට බැහැ. ඒ නිසා මා කරණා දෙකක් පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලන්නට කැමතියි. තමුන්නාන්සේලා පවත්වා ගෙන යන රෙක්රූට්මන්ට් විභාග නොකඩවාම පවත්වාගෙන යන්න ඕනෑ. ඒ සමගම සැන්ෂන්ඩ් ස්ට්‍රෙන්ත් එක නිතරම පුරවා තබන්නට වැඩ කටයුතු සලස්වන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, ජීවන වියදම් ප්‍රශ්නය සම්බන්ධයෙන්ද මෙම පඩි වාර්තාවේ කරුණු සඳහන් වී තිබෙන නිසා මට මේ සම්බන්ධයෙන්ද වැදගත් කරුණු කීපයක් සඳහන් කරන්න තිබෙනවා. ජීවන වියදම් ප්‍රශ්නය සම්බන්ධයෙන් විභාග කර බැලීමට නැසී ගිය ගරු බණ්ඩාරනායක අගමැතිතුමා 1957 දී විශෙෂ කොමිටියක් පත් කළ බව තමුන්නාන්සේලාට මතක ඇති. තමුන්නාන්සේලා නම් දැන් එතුමාගේ ප්‍රතිපත්තීනුත් අමතක කර දමලයි තිබෙන්නේ. ඒවා කොතරම් දුරට අමතක වී ගොස් තිබෙනවාද කිවහොත් මේ පැත්තේ ඉදගෙනයි, අපට බණ්ඩාරනායක ප්‍රතිපත්තීන් තමුන්නාන්සේලාට මතක් කරන්නට සිදු වී තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, 1957 දී පත් කරනු ලැබූ මෙම කොමිටිය මගින් නිකුත් කළ වාර්තාවේ තිබෙන එක් කොටසක් මා දැන් ඉංග්‍රීසියෙන් කියවනවා. එය මෙසේයි:

Report of the Committee to revise the Cost of Living Index.

Terms of reference

We were appointed a Committee on 30th November 1957 to revise the Cost of Living Index. Our terms of reference were:

(1) to decide on and supervise the execution of the surveys necessary to prepare a realistic Cost of Living index or indices of the middle or lower income group.

(2) to consider the necessity of separate indices more appropriately to reflect the cost of living in particular areas and to prepare such indices after carrying out such surveys as may be necessary. Subsequently it was made clear to us that our investigations were to be confined to the urban areas.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම වාර්තාව නිකුත් කරනු ලැබුවේ 1959 ජූලි මාසයේදීයි. මෙම වාර්තාව නිකුත් කොට දැනට අවුරුදු දෙකක් ගත වී තිබෙන නමුත් එහි අඩංගු යෝජනා කිසිවක් ක්‍රියා වේ යොදවා නැහැ. ගරු සභාපතිතුමනි, ගරු බණ්ඩාරනායක අගමැතිතුමා මේ විධියට විශෙෂ කොමිටියක් එදා පත් කළේ මොන හේතුවක් නිසාද කියා අපි කල්පනා කරන්න ඕනෑ. ජීවන අංකය පිළියෙළ කරන්නට පටන් ගත් කාලයේ පටන්ම එය හැඳින් වූයේ "කොස්ට් ඔf ලිවිං ඉන්ඩෙක්ස්" කියායි. නමුත් 1958 වන විට එය කෙතරම් විහිළුවට භාජන වූවාද කිව හොත් එය හැඳින්වනු ලැබුවේ "කොස්ට් ඔf ලයිං ඉන්ඩෙක්ස්" කියායි. ජීවන අංකය පිළිබඳ විස්තර සපයනු ලබන මෙම ලේඛනය බොරු ගොඩකින් සමන්විත වූ ලේඛනයක් හැටියටයි, විශෙෂයෙන් රජයේ සේවකයින් හැඳින් වූයේ. මේ තත්ත්වයට ප්‍රතිකර්මයක් යෙදීමක් වශයෙනුයි, දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමා 1957 දී මෙම විශෙෂ කොමිටිය පත් කළේ.

එම වාර්තාවේ හතරවන පිටුවේ මෙසේත් සඳහන් කර තිබෙනවා:

Reasons for revising the index.

Cost of living indices are liable to get out of date. Changes in consumption habits and in the availability of goods and services take place over a period, and it is therefore necessary to revise from time to time the base on which the indices are compiled. The last family budget in Ceylon on which the current index is based was conducted in 1949-50. Since then there have been many important changes in the social and economic conditions in the Island, which are likely to have influenced the pattern of consumption of different sections of the population. An index based on the 1949-50 pattern of expenditure may, therefore, not be representative.

මෙයින් කියා තිබෙන්නේ කුමක්ද? අවුරුද්දෙන් අවුරුද්ද ජීවන අංකය වෙනස් වෙනවාය, ඒ වාගේම අවුරුදු ගණනාවක් යන විට මහජනයාගේ පළපුරුදුකම් පවා වෙනස් වෙනවාය, 1949-50 දී තිබුණු තත්ත්වයට වඩා 1957 වර්ෂයේ ජීවන වියදම් අංශයෙන් විශාල අන්දමේ වෙනස් වීම් ඇති වී තිබෙනවාය, එම නිසා අළුත් වැඩ පිළිවෙළක් අනුව ක්‍රියා කළ යුතුව තිබෙනවාය, යනාදී වශයෙන් වැදගත් කාරක සභාවක් මගින් වාර්තා කර තිබෙන බවයි මෙයින් පෙනෙන්නේ. මේ වාර්තාව පිළියෙල කළේ එච්. ඊ. පීරිස්, එස්. මානික්ක ඉඩයික්කාඩර්, ඊ. ඩී. බෙනට්, එච්. එම්. ගුණරත්න සහ ජී. ඩී. ලෝස් කියන මහතුන් විසිනුයි. අර අතන නිලධාරීන්ට අයිති ස්ථානයේ වාඩි ගෙන සිටින්නේත් ලෝස් කියන ලේකම් මහතායි. 1959 මාර්තුවේදීයි මේ වාර්තාව ඉදිරිපත් කළේ.

ගරු සභාපතිතුමනි, මේ වාර්තාව මගින් ඉතා වැදගත් රෙකමදාරුවක් කර තිබෙන බව පෙනෙනවා. එසේ නම් මේ වාර්තාවෙන් ඉදිරිපත් කර තිබෙන ඒ රෙකමදාරුව පිළි නොගන්නේ මන්ද කියා මා ප්‍රශ්න කරනවා. මෙන්න එක කොටසක්:

There should be two indices, one for the working class and one for the middle income group.

ජීවන අංක දෙකක් ඇති කරන ලෙස කියනවා. ඒ සඳහා තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරනවා. එකක් කම්කරු පන්තියටයි. අනික මධ්‍යම පන්තියටයි. ගරු මුදල් ඇමතිතුමා මේ රෙකමදාරුව ගැන සොයා බැලුවාද? අද දවසේ ඉදිරිපත් කර තිබෙන අයබදු ක්‍රම ක්‍රියාවේ යෙදවීම නිසා මධ්‍යම පන්තිය නැති වී යන්න ඉඩ තිබෙනවා. නැසීගිය එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාණන්ට මේ බව තේරුම් ගිහින් කොමිටියක් පත් කළා. අන්න ඒ කොමිටිය මගින් මීට දැවුරුද්දකට පෙර කියා තිබෙනවා මධ්‍යම පන්තියට අළුත් ජීවන අංකයක් නියම කරන්න කියා. එසේ කටයුතු කරන්න තමුන්නාන්සේලා උත්සාහ කළාද? එසේ දීම සඳහා තමුන්නාන්සේලා කල්පනා කළාද? ඒ සඳහා තමුන්නාන්සේලා කර තිබෙන්නේ කුමක්ද?

ගරු සභාපතිතුමනි, මුදල් ඇමති අංශය ජීවන වියදම් ප්‍රශ්නය සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය ගැන මා කනගාටු වෙනවා. මුදල් ඇමති අංශය ඒ ප්‍රශ්නය අමතක කර දමා තිබෙනවා. මා ඒ කියමන ඔප්පු කරන්නම්. තමුන්නාන්සේ ගේ ඇමති අංශයට අයිතියි ජන ලෙඛන සහ සංඛ්‍යා ලෙඛන දෙපාර්තමේන්තුව. ජීවන අංකය සකස් කිරීම පිළිබඳ භාරය පැවරී තිබෙන්නේ එම දෙපාර්තමේන්තුවටයි. එම දෙපාර්තමේන්තුව මගින් පිළිගෙන තිබෙන වාර්තාව මා ඉදිරිපිට තිබෙනවා. දැන් මේ ජීවන අංකය සකස් කරන ක්‍රියා පිළිවෙළ වැරදියි කියා එම දෙපාර්තමේන්තුවද පිළි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

ගෙන තිබෙනවා නම් ඇයි තමුන්නාන්සේලා ඒ විධියට ක්‍රියා කරන්න උත්සාහ නොගන්නේ ?

ගරු සභාපතිතුමනි, මා අළුත් කරුණකට බහින්න කැමතියි. ඒ සඳහා ඉඩ දෙනවාද ?

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

රැස්වීම විනාඩි 30 කට තාවකාලිකව නවත්වනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

ගරු සභාපතිතුමනි, මම පෙන්වා දුන්නා 1959 දී ජීවන අංක දෙකක් සකස් කරන්නය කියා ආණ්ඩුවේ වාර්තාවකින් උපදෙස් දී ඇති බව. ඒ ජීවන අංක දෙකෙන් එකක් කම්කරු පංක්තියටයි. අනෙක මධ්‍යම පංක්තියටයි. නමුත් ඒ ඉතාමත්ම වැදගත් ඉතාමත්ම අවශ්‍ය යෝජනාව ක්‍රියාවේ යෙදුවේ නැහැ. දැන් අවුරුදු 2ක් ගත වී අවසානයි. ඒ විධියට කම්කරු පංක්තියට වෙනම ජීවන අංකයකුත්, මධ්‍යම පංක්තියට වෙනම ජීවන අංකයකුත් සකස් කර නැති නිසා මධ්‍යම පංක්තියට තිබෙන හිරිහැර මධ්‍යයේ තවත් හිරිහැරයක් වී තිබෙන්නේ ජීවන අංකයට අනුව ඔවුන්ට වැටුප් නොලැබීමයි. දැනට අවුරුදු දෙකක් ප්‍රමාද වී තිබුණේ වී නමුත්, 1959 ජූලි මාසයේ ඉදිරිපත් කළ ඒ වාර්තාව මගින් ඉදිරිපත් කර ඇති ඒ ජීවන අංක දෙක අනුව ආණ්ඩුවේ සේවකයන්ට සහ අනිකුත් සේවකයන්ටත් වැටුප් ගෙවීම විශෙෂයෙන් මුදල් ඇමති අංශයේ පරම යුතුකමක්ව තිබෙනවා. එසේම එම වාර්තාවෙන් පෙන්වා දුන් තවත් වැදගත් කරුණක් තමයි, ජීවන අංකය සකස් කිරීමේ වැඩ පිළිවෙළ වැරදි යයි කීම. ජීවන අංකය සකස් කරන පිළිවෙළ පිළිබඳව ඇති සියලුම වැඩ කටයුතු වැරදිය කියා එයින් පෙන්වා දී තිබෙනවා. එන්. මානික්ක ඉඩෙයිකාඩර් මහතාගේ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂතුමාගේ—1960 පිළිබඳ වාර්තාවේ මෙන්න මෙහෙම කරුණක් සඳහන් කර තිබෙනවා :

No significant changes were effected in the method of collecting prices and in the making of test purchases during the year under review. Important changes will, however, be made in the pricing system in the computation of the proposed price index number.

"මේ අවුරුද්දේ කිසිම වෙනසක් කෙළේ නැත. භාණ්ඩවලට යන වියදම පරීක්ෂා කර බැලීමේ ක්‍රමය පිළිබඳව 1959 දී කිසිම වෙනසක් කළේ නැත. නමුත් ඉදිරියේදී ඒ ක්‍රමය වෙනස් කරනවාය" කියා එහි සඳහන් කර තිබෙනවා. ඊළඟට 1960 වාර්තාවේ එම මහත්මයාම තමන්ගෙ වාර්තාව ඉදිරිපත් කරමින් මෙන්න මෙහෙම කියා තිබෙනවා :

The method of collecting prices, making test purchases, and the computation index were the same as in the previous year.

අවුරුද්දකට පසුව කියනවා, "මෙම ජීවන අංකය සකස් කරන ක්‍රමයත්, භාණ්ඩ මිළදී ගැනීමත්, ඒවා ගණන් බැලීමත්, කලින් අවුරුද්දේ වගේමය කිසිම වෙනසක් නැත" කියා.

1959 අවුරුද්දේදී අදහසක් තිබුණා මෙය වෙනස් කරන්න. 1960 දී ඒ අදහස සම්පූර්ණයෙන්ම අත්හැර දමා, මා තමුන්නාන්සේට පෙන්වා දුන් අර "Report of the committee appointed to revise the Living Index" හෙවත් ජීවන අංකය වෙනස් කිරීමට පත් කරන ලද කොමිටිය සැපයූ වාර්තාව සම්පූර්ණයෙන්ම අමතක කර දමා, නැතිනම් අයින්කර දමා, මුදල් අමාත්‍යාංශය කිසිවක් කරන්නේ නැතිව ඔහේ නිකම් ඉඳලා තිබෙනවා.

එපමණක් නොවෙයි, ගරු සභාපතිතුමනි, බොහෝම කණගාටුයි කියන්නට, මේ සංඛ්‍යාලේඛණ හා ජන ලේඛණ අධ්‍යක්ෂ වරයා අවුරුදු දහයක්-පහළොවක් තිස්සේ නීත්‍යානුකූලව ඉදිරිපත් කළ කොළඹ පාරිභෝගිකයන්ගේ ලේඛණය අප්‍රියෙල් මාසයේ සිට ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම නවත්වා දමා තිබෙනවා. මෙය බොහෝම බරපතල වැරැද්දක්. මාසයකට වරක් "Consumers Price Index" හෙවත් පාරිභෝගිකයින්ගේ මිල ගණන් අංකය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන්නට ඕනෑ. සෑම මාසයකම අන්තිම දවසේ පිට වන ගැසට් පත්‍රයේ "Colombo Consumers Price Index" කියන මිල ගණන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අංකය ප්‍රසිද්ධ කරන්නට ඕනෑ. මේ ආකාරයෙන් අවුරුදු දහයකට වැඩි කාලයක් තිස්සේ ප්‍රසිද්ධ කළා. එසේ ප්‍රසිද්ධ කරන්නේ නීතිය අනුවයි.

The Colombo Consumers' Price Index number forms the basis for the payment of special allowances for increases in the cost of living.

ඒ අංකය අනුවයි ආණ්ඩුවේ සේවකයින්ට විශෙෂ ජීවනාධාර මුදල් ආදිය ගෙවන්නේ. එවිට ඕනෑ කෙනෙකුට ඒ ලේඛනය පරීක්ෂා කර බලා නියම විධියට ඒ ලේඛණය අනුව, ඒ අංකය අනුව විශෙෂ වැටුප් ගෙවා තිබෙනවාද කියා හොඳින්ම බලා ගන්නට පුළුවනි. අපදන්නවා අවුරුදු දහයකට වැඩි කාලයක් තිස්සේම මේ විධියට ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ බව. නමුත් අප්‍රියෙල් මාසයේ සිට හිටිගමන්ම මෙසේ ප්‍රසිද්ධ කිරීම නවත්වා දැමීමට හේතු වුණේ මොකක්ද කියා, මොන කාරණයක් නිසා මෙසේ කළාද කියා, මම අහනවා. මම ජනලේඛණ සහ සංඛ්‍යාලේඛණ අධ්‍යක්ෂවරයාගේ දෙපාර්තමේන්තුවේ නිලධාරි මහතකුගෙන් ඇහැව්වා, අප්‍රියෙල් මාසයේ සිට මෙසේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම නැවැත්තුවේ මොන කාරණයක් නිසාද, කාගේ අණක් පිටද කියා. ඇත්ත වශයෙන්, ගරු සභාපතිතුමනි, එසේ ප්‍රසිද්ධ කරනවා නම් තමයි අපට ඒ වායේ හරි වැරදි මේ ගරු සභාවේ පෙන්වා දෙන්නට පුළුවන් වෙන්නේ.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)
ඒ වා භාරකාර ආණ්ඩුව කාලෙදි කළාද?

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)
මේ ලංකාවේ තියෙන සියළුම අවුල් විය වුල් භාරකාර ආණ්ඩුවේ කරපිට පටවා තමුන්නාන්සේට සන්තෝෂ වෙන්නට පුළුවන් නම් ඒ විධියට තැබුවාට මගේ ඇති විරුද්ධත්වයක් නැහැ.

ගරු සභාපතිතුමනි, මම ජනලේඛණ සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් මේ ගැන ප්‍රශ්න කළා. මම ඇහැව්වෙ මැයි මාසෙ නැතිනම් ජූනි මාසෙදිසි. මම පුස්තකාලයකට ගිහිල්ලා හැම ගැසට් එකක්ම පෙරළා බැලුවා "Colombo Consumers Price Index" එක නමුත් පළ වී තිබුණේ නැති නිසා මම ඒ ගැන දැනගැනීමටයි ඇසුවේ. මම ඒ සම්බන්ධයෙන් ටිකක් තදින් කථා කරන කොට එතැන සිටි කවුදෝ හිමින් කථා කරනවා මට ඇහුණා. "It has been stopped on instructions" කියනවා මට ඇහුණා. කාගේ හරි අණක් උඩ එය ප්‍රසිද්ධ කිරීම නවත්වන්ට යෙදුණාය කියන එකයි මට දැනගන්නට ලැබුණෙ.

ගරු සභාපතිතුමනි, මම පැමිණිල්ලක් වශයෙන් කියනවා, ඒ ආකාරයෙන් ගැසට් පත්‍රයේ පළ නොකිරීමෙන් මුදල් අමාත්‍යාංශය කර තිබෙන්නේ වරදක්ය කියා. එම නිසා මෙය සෑම මාසයකම ප්‍රසිද්ධ කිරීමට කල්පනා කළ යුතුයයි මම තරයේම කියා සිටිනවා. ඒ වගේම ඒ අංකය ප්‍රසිද්ධ කරන්නට එපාය කීම කුට උපක්‍රමයක් බව ප්‍රකාශ කරන්නට මට සිදු වී තිබෙනවා. මෙසේ කිරීමෙන් ඇත්ත ඇති සැටියේ ප්‍රකාශ නොකර කරුණු සඟවන්නට උත්සාහ ගෙන තිබෙනවායයි මම කියනවා. අවුරුදු දහයක් පමණ කාලයක් තිස්සේ ප්‍රසිද්ධ කළා නම් හදිසියේ මෙසේ නතර කර දැම්මේ ඇයිදැයි මම ප්‍රශ්න කරනවා. කරුණාකර මේවාට පිළිතුරු සපයන්න.

එම නිසා ගරු සභාපතිතුමනි, මා ඉතා ඕනෑ කමින් ඉල්ලා සිටිනවා නැවත වරක් පාරිභෝගිකයන්ගේ අංකය ප්‍රසිද්ධ කරන්ටය කියා. මේවා අර නාත්තන්ඩියේ ගරු මන්ත්‍රීවරයා (ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්) කීවාක් මෙන් කොළේ වහගෙන ගහන්න බැහැ. කොළේ වහගෙන ගැහැව්වොත් එය පොම්මේ ගැහිල්ලකුයි වෙන්නේ. අද ආණ්ඩුවේ සේවකයින්ට පොම්මේ ගැහිල්ලටත් වඩා අන්ත වැඩ පිළිවෙළක් ආණ්ඩුව විසින් ගෙන යනවා. එම නිසා වැඩ බලන ගරු මුදල් ඇමතිතුමා දැනට විනාඩි දහයකට විතර උඩදිසි එතුමා මුදල් ඇමතිධුරයේ වැඩ බැලීමට භාරගත්තේ—මම ප්‍රාර්ථනා කරනවා—[බාධාකිරීමක්].

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)
නවම නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகநாயக்க)
(Mr. W. Dahanayake)

අළුත් වැඩ බලන මුදල් ඇමතිතුමා වශයෙන් මේ කාරණය ගැන සොයා බලා ආණ්ඩු සේවකයන්ට විරුද්ධව කරන මේ "පොම්මෙ ගැහිල්ල" නවත්වන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටින්නට කැමතියි. ජීවන අංකය ගැන කථා කිරීම පැත්තකින් තබා තවත් එක කාරණයක් තමුන්නාන්සේට පෙන්වා දෙන්නට මා අදහස් කරනවා. එයත් ආණ්ඩුවේ සේවකයන්ට කරන වැරැද්දක්, විශෙෂයෙන් තමුන්නාන්සේලා සුළු සේවකයින්ට කරන වැරැද්දක්.

මේ ගරු සභාවේ දෙපැත්තේම මන්ත්‍රීතුමන්ලා විසින් නොයෙක් අවස්ථාවලදී මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙනවා. වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සුළු සේවකයන්ට කිසි සහනයක් අද ඇත්තේ නැහැ. මුදල් ඇමතිතුමාට නොයෙක් අවස්ථාවලදී අප කියා තිබෙනවා, මීට සහනයක් ලබා දෙන්නය කියා. දිවංගත ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක තුමාගේ ආණ්ඩුව මෙම කාරණය ගැන කල්පනා කර බලා නියමයක් කළා, ආයුර්වේද වෛද්‍ය සහතික පිළිගන්නය කියා. එහෙත් තමුන්නාන්සේට මතක් කරන්න කනගාටුයි, අද ආයුර්වේද සහතික සමහර අවස්ථාවලදී පිළිගන්නේ නැති බව. ආයුර්වේද වෛද්‍ය සහතික පිළිගන්නය කියා කැබිනට් තීන්දුවකුත් තිබෙනවා. එහෙත් සමහර අවස්ථාවලදී ඒවා පිළිගන්නේ නැහැ. සාමාන්‍ය සුළු අසනීපයක් සඳහා නම් ආයුර්වේද වෛද්‍ය සහතිකය පිළිගන්නවා. අසනීපය සෑදී සති දෙකක් පසු වුණොත් ආයුර්වේද සහතිකය පිළිගන්න බැරි යයි දෙපාර්තමේන්තු ප්‍රධානින් කියනවා. ඒ මන්ද? මේ කරුණ අනුව ආණ්ඩුවේ සේවකයන්ට සිදු වී තිබෙන විපත්තිය මා දන්නවා. ඇතැම් සේවකයින් තමන්ට අසනීපයක් සෑදුණු විට සති දෙකක් සඳහා සිංහල වෙද මහත්මයකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් දෙනවා. එය පිළිගත්නාට පසු තවත් සති 3 ක් 4 ක් අසනීපයෙන් ඔහු පසු වුණා නම්, සිදු වන්නේ කුමක්ද? කලින් සහතිකය දුන් වෙද මහත්මයාගේ සහතිකය භාර ගන්නට බැරිය කියා දෙපාර්තමේන්තු ප්‍රධානියා අණ කරනවා, බටහිර දොස්තර මහත්මයකුගෙන් වෛද්‍ය සහතිකයක් ගෙනෙන්නය කියා. එවිට ඒ ආණ්ඩුවේ සුළු සේවකයා බටහිර ක්‍රමය අනුව ඉගෙන පුහුණු වූ දොස්තර කෙනකු ළඟට ගියාම සිදු වන්නේ කුමක්ද? "පලයන් මිනිහෝ, මම උඹව අසනීප කාලයෙදී බැලුවයැ? මම උඹට බෙහෙත් දුන්නයැ? අසනීපය සම්බන්ධයෙන් මා මොකක්ද කියන්නේ? මට සහතිකයක් දෙන්නට බැහැ, උඹේ අසනීපය ගැන මා දන්නෙ නැහැ" කියා එළවා ගන්නවා. අන්තිමේදී ඒ සුළු සේවකයාට වෛද්‍ය සහතිකයක් ලබා ගන්නට බැරි වීම නිසා ඔහුගේ රක්ෂාව නැති වී යනවා. ඒ විධියේ කරුණු ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසිනුත්, විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් විසිනුත් නොයෙක් අවස්ථාවලදී ඉදිරිපත් කර තිබෙන නමුත් තමුන්නාන්සේගේ ඇමති අංශය මේ කාරණය ගැන ඇහුම්කන් නොදීම නිසා දැන් අවුරුදු ගණනාවක් තිස්සේ ඒ වරද එසේම තිබෙනවා. ඒක වදින්නේ සුළු සේවකයාටයි. එම නිසා මා ඉතා ඕනෑකමින් තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, එවැනි වරදක් සුළු සේවකයින්ට නොකරන ලෙස.

සමහරුන් සිතනවා, සිංහල වෛද්‍ය වරුන් බොරු සහතික දෙනවා කියා. ඉංග්‍රීසි වෛද්‍යවරුන් අතරත් බොරු සහතික දෙන අය ඇති. වැරදි කරන මිනිසුන් ආයුර්වේද වෛද්‍යවරුන් අතරත් ඉංග්‍රීසි වෛද්‍යවරුන් අතරත්, දෙගොල්ල අතරම ඇති. එම නිසා සියළුම ආයුර්වේද වෛද්‍ය වරුන්ට නරක නාමයක් දීම වැරදියි. ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ප්‍රධානින් විසින් සිංහල ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සහතික සති 2 කට වඩා වැඩි කාලයක් සඳහා පිළිගන්නට බැරියයි කීම ඒ වෛද්‍ය වරුන්ට කරන ලොකු අවනම්බුවක්, ඒ වගේම සේවකයන්ට කරන විශාල හිරිහැරයක්. එම නිසා තවත් අයවැය ලේඛන සාකච්ඡාවකදී මෙම කාරණය ගැන නැවතත් කියන්ට ඉඩ නොතබා සුළු සේවකයන්ට කරදර නොවන පරිදි සිංහල වෛද්‍යවරුන්ගේ සහතික පිළිගැනීමේ ක්‍රමයක් ඇති කරන ලෙසත්, මේ නිසා දැනට යමෙක් අමාරුවට පත් වී සිටිනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නමේ ඒ තැනැත්තන්ට සහනයක් සලසා දෙන ලෙසත් කරුණාවෙන් මතක් කරන්න කැමතියි.

අ. භා. 4.45

අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ගැන දීර්ඝ විවේචනයක් කළා. මා තමුන්නාන්සේට එක කරුණක් පෙන්වා දෙන්ට කැමතියි. මේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් "පර්සනල් ටැක්ස්" නම් වූ පෞද්ගලික බද්ද පුදුම විධියකට අය කරනවා. මා තමුන්නාන්සේට ලිපි ගොනුවක නොම්මරයක් කියන්නට කැමතියි. අංක 88/8 ජේ. ජී. එස්. පී. දරණ fපයිල් එක අයිති තැනැත්තා කනංකේ පෝරඹ නමැති ගමට විද්‍යාගාරයක් සහිත ලොකු පාඨශාලා ගොඩනැඟිල්ලක් සදා දුන්නා. 1960 සැප්තැම්බර් මාසයේදී කරන ලද මෙම පරිත්‍යාගය නිසා ඔහුට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට රුපියල් 240 ක බද්දක් ගෙවන්ට සිදු වුණා. තැග්ග වෙනුවෙන් රුපියල් 240 ක් ගෙවන්ට සිදු වුණා.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

පාඨශාලාව හදන්ට සල්ලි කොහෙන්ද?

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

ඒක වෙනම ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය විසඳුවාට මට කමක් නැහැ. නමුත් පරිත්‍යාගය සඳහා සදන ලද ගොඩනැඟිල්ලේ වටිනාකම ගැන ප්‍රශ්න කරමින්, "මේ ගොඩනැඟිල්ලට කොපමණ මුදලක් වියදම් කළාද?" කියා අසා ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ලිපියක් එවා තිබුණා. එයට පිළිතුරු වශයෙන්, වැඩ කරවන ලද්දේ තමා විසින්ම බවත්, රුපියල් 10,000ක් පමණ වියදම් වූ බවත්, ලියා යවන්නට යෙදුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට රුපියල් 240ක ආදායම් බද්දක් ගෙවන්නට සිදු වුණා. මේ මහතා ගේ නම සී. ඒ. සමරසිංහ. ලිපිනය අංක 124, මාතර පාර, ගාල්ල.

මෙවැනි පරිත්‍යාග කරන අයගෙන් ඒ පරිත්‍යාග වෙනුවෙන් බදු ගන්නවා නම්, පාඨශාලා හදා දෙන්නැයි අධ්‍යාපන ඇමතිවරයා, මහජනයාට කොපමණ කීවත් ඒ ඉල්ලීම ඉෂ්ට වෙනවාද? පාඨශාලාවක් හදා බදිටද්දීන් මහ්මූද් අධ්‍යාපන ඇමතිවරයා ගෙන්වා මල්මාලයක් පළඳවා අතට අත දී ඔහු පිළිගෙන පාඨශාලාව භාර දෙනවා. මෙහි පින්තූර ප්‍රවෘත්ති පත්‍රවල පළ වූ විට අපේ ආදායම් බදු දෙපාර්තමේන්තුව මේ ගැන ප්‍රශ්න කරන්න පටන් ගත්තා. "කොහොමද වියදම් කෙළේ? කොතරම් වියදම් කළාද?" යනාදී ප්‍රශ්න අහනවා. පසුගිය 1960 සැප්තැම්බර් මාසයේ දී කනංකේ පෝරඹ පාඨශාලාව අයිතිව තුබුණේ පරම විඤ්ඤාර්ථ බෞද්ධ සමාගම ටයි. ඊට දෙමාසයකට පසු ඒ පාසල ආණ්ඩුවට ගත්තා. නීතියක් තිබෙන්නට ඕනෑ, එසේ නැත්නම් මුදල් ඇමතිතුමා නීතියක් හදන්නට ඕනෑ, යම්කිසි මහජන කටයුත්තකට මුදල් වියදම් කරනවා නම්—පාඨශාලාවක් හදන්න, ළිඳක් හදන්න, පාරක් හදන්න ඒ විධියේ වැදගත් වෙන වැඩකට මුදල් වියදම් කරනවා නම්—ඒ මුදල ආදායම් බද්දට ගණන් ගන්නේ නැති බවට. එසේ නොකළොත් ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ ඉල්ලීම කාටවත් ඉටු කරන්න බැහැ. ගරු අධ්‍යාපන ඇමතිතුමා මහජනයාගෙන් ඉල්ලීමක් කරලා තියෙනවා පාඨශාලා සෑදීම සඳහා ඉදිරිපත් වී උපකාර කරන්නය කියා. ඒ විධියේ පින් සිද්ධ වෙන වැඩ ඉදිරියට කෙරෙන්නේ නැහැ, මේ විධියේ බද්දක් අය කරන විට. ඒ මක්නිසාද? අවුරුදු පතා මේ විධියේ පින් සිද්ධ වෙන වැඩ කළාම ඉන්කම් ටැක්ස් දෙපාර්තමේන්තුවෙන් ඒ මිනිසුන්ව අල්ලා ගන්නවා. ඒ විධියට, මිනිසුන්ට නිවන් දකින්න බැරි කරනවා. පින් සිද්ධ වෙන වැඩ කරන්න එපාය කියා ඉන්කම්ටැක්ස් දෙපාර්තමේන්තුව ඉල්ලනවා. තමුන්නාන්සේ මේ කාරණාව ගැන පරීක්ෂා කර මෙය හරිගස්සනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, තවත් වැදගත් කරුණක් කියන්නට කැමතියි. තමුන්නාන්සේලා සෑම තිස්සේම කියනවා, දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමා ගේ අඩි පාරේ ගමන් කරනවාය කියා. නමුත් තමුන්නාන්සේලා ඒ අගමැතිතුමා ගේ ක්‍රියා මාර්ගය අමතක කර තිබෙන බවට මම එක කරුණක් පෙන්වා දෙන්නට කැමතියි. උප තැපැල්පතිවරුන් ගැන දැන් තිබෙන නීතිය කුමක්ද? ඒ උප තැපැල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

පතිවරුන් සම්බන්ධයෙන් දැනට තිබෙන නීතිය ගැන මේ විධියේ චෝදනා ඉදිරිපත් වී තිබෙනවා. "Sub-postmasters say Government is ungrateful." මොකද මෙහෙම කියන්නේ? මේ ආණ්ඩුවේ කෙළෙහිගුණ සැලකීමක් නැත කියා උප තැපැල්පතිවරු කියනවා. 1958 දී පමණ මේ උප තැපැල්පතිවරු සන්දේශයක් ඉදිරිපත් කළා. ඒ අනුව ගරු බණ්ඩාරනායක අගමැතිතුමාගේ කැබිනට් මණ්ඩලය තීරණයක් කළා, උප තැපැල්පතිවරුන්ට නියම විධියේ විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කළ යුතු බවට. ඒ කැබිනට් තීන්දුවට මොනවා වුනාද? ඒ කැබිනට් තීන්දුව වළලා තිබෙන්නේ කුමක් නිසාද? තමුන්නාන්සේ ඒ කැබිනට් තීන්දුව අයින් කර දමා අවුරුදු විස්ස, තිහ වැඩ කළ උප තැපැල්පතිවරුන්ව අස්කර දැම්මා, විශ්‍රාම වැටුප් හැටියට සතයක්වත්, දොයිතුවක්වත්, ගෙවන්නේ නැතුව. ඒක යුක්තියක්ද? සමාජවාදය කරා ගමන් කරන වාය කියන මේ ආණ්ඩුවට එවැනි වැඩක් කරන්නට සැහෙනවාද?

උප තැපැල්පතිවරුන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කරන්නය කියා 1958 දී කැබිනට් මණ්ඩලය තීරණයක් කළා. එවැනි තීරණයක් ගෙන අවුරුදු දෙක තුනකට පසු තමුන්නාන්සේලාට සැහෙනවාද විශ්‍රාම වැටුප් හැටියට දොයිතුවක්වත් දෙන්නේ නැතිව ඒ උප තැපැල්පතිවරුන් පන්නා දැමීමට? වහාම මේ ප්‍රශ්නය ගැන සලකා බලා ඒ අස් කළ උප තැපැල්පතිවරුන්ටත්, ඉදිරියට අස් කරන්නට සිටින උප තැපැල්පතිවරුන්ටත් යන දෙකොටසටම නියම විධියේ පැන්ෂන් ක්‍රමයක් ඇති කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, පෙන්ෂන් පඩි ගැන මතක් කළ යුතු තවත් වැදගත් කරුණක් තිබෙනවා. සහතික නොලත් ගුරුවරුන්ට 1954 සිට පෙන්ෂන් දෙනවාය කියා ඊයේ පෙරේදා නීතියක් සම්මත කළ බව තමුන්නාන්සේට මතක ඇති. ඇමතිවරුන් තුන් හතර දෙනකු අවුරුදු 7ක් පමණ කාලයක් තිස්සේ උත්සාහ කිරීමෙන් පසුව මේ නීතිය ඊයේ පෙරේදා මේ ගරු සභාවෙන් සම්මත වුණා. ඒ අනුව ඔවුන්ට පෙන්ෂන් පඩිය දෙන්නට පටන් ගත් විට තමුන්නාන්සේගේ භාණ්ඩාගාරය මොකක්ද කළේ? ඒ පෙන්ෂන් පඩියට ගෙවිය යුතු කන්ට්‍රිබියුෂන් එක ගෙවන්නෙක් ඒ පෙන්ෂන් පඩිය දෙන්නට බැරිලු. මේ ගුරුවරුන්ට ඒ කන්ට්‍රිබියුෂන් එක හැටියට විශාල මුදලක් දෙන්නට වෙනවා. රුපියල් දෙදහක් දෙන්නට තියෙනවා නම්, මේ රුපියල් දෙදහ මාස් පතා පඩියෙන් අඩු කරගෙන තව අවුරුදු දෙකක් ගිය විට ඒ පෙන්ෂන් එක දෙන වාය කියනවා. ඒ කාලය වනකොට ඒ මිනිසුන් වළ පල්ලට ගිහින්.

මේ ආණ්ඩුව සහතික නොලත් ගුරුවරුන්ට පෙන්ෂන් ගෙවන්නේ ඒ අය මැරුණාට පසුවද? මුදල් ඇමතිතුමා මොන තැපැල් මාර්ගයෙන්ද ඒ අයගේ පෙන්ෂන් පඩි දිව්‍ය ලෝකයට නැති නම් නිර්වාණයට යවන්නේ? එම නිසා මේ කාරණා ගැන සොයා බලා පෙන්ෂන් දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු නියම අන්දමින් සකස් කළ යුතුයි.

මේ ගරු සභාවේදී ගරු මන්ත්‍රීන් නොයෙක් අවස්ථාවලදී මුදල් ඇමතිතුමාට කියා තිබෙනවා, නොයෙක් අයගේ විශ්‍රාම වැටුප් ප්‍රමාදවීම ගැන. ආණ්ඩුව විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාද කරනවා. සමහර විට අවුරුද්ද දෙකේත් ප්‍රමාද කරනවා. මෙය දැනට අවුරුදු 10ක් 15ක් තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. මම හිතන්නේ යූ. එන්. පී. ආණ්ඩු කාලයේදී—දකුණු කොළඹ පළමුවන මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) මුදල් ඇමතිව සිටින කාලයේදී—ඉක්මනින් විශ්‍රාම වැටුප් දෙන්න බැරි නිසා "Alimentary Allowance" කියන සුළු මාසික මුදලක් දුන්නා. මේ තාවකාලික පෙන්ෂන් පඩිය සමහර අවස්ථාවලදී අවුරුදු 3 ක් පමණ දී තිබෙනවා. තාවකාලිකය කී විට මාස දෙක තුනක් නැත්නම් 4 ක් 5 ක් පමණයි, ගැණෙන්නේ. නමුත් මේ තාවකාලික වියදම අවුරුදු 3 ක් පමණ ලැබූ අය ගැන මම දන්නවා. එම නිසා පෙන්ෂන් දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු මහජනයාට ප්‍රයෝජනවත් වන විධියට මීට වඩා විධිමත් අන්දමින් සකස් කරන මෙන් මම ඉල්ලා සිටිනවා. තමුන්නාන්සේට ස්තුතියි.

ඒ. රත්නායක මයා. (වත්තේගම)
(திரு. எ. ரத்நாயக்க—வத்தேகம)
(Mr. A. Ratnayake—Wattegama)

I want to refer to the Public Debt that is accumulating. If you look at

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

page 119 of the Estimates you will find that we are providing for Rs. 130 million, that is, for the payment of interest on Sterling loans, sinking fund, and interest on I. B. R. D. loans and various other loans which we have been receiving from both foreign countries and locally.

The interest on Ceylon Government Treasury Bills comes to about Rs. 18 million, the interest on Rupee loans, Rs. 48 million, and so on ; the annual payments on those items alone amount to Rs. 130 million. I am simply amazed at this for the simple reason that when I first entered the State Council, the total amount of the Budget was not even Rs. 100 million but today we are setting apart as sinking fund, interest, and so on, this enormous sum of Rs. 130 million.

Then, Sir, I also want to point out to you that during the last 4 or 5 years our Public Debt has been mounting by leaps and bounds. If you look at the figures you will find that in 1956 the Public Debt stood at Rs. 1,169 million. In that connection I want to say this : in 1937 the Public Debt was not even Rs. 13 million. The first big loan that was raised in the year 1937 was a loan of Rs. 100 million. And there was this—that is a point to which I wish to invite your attention and the attention of hon. Members—namely, that if we raised a loan at that time that loan was intended for some particular purpose.

අ. භා. 5

Now if you look at the Budget prior to 1947 you will find that there is a Loan Ordinance mentioning the specific objects for which loans were raised. There was the Colombo Harbour Loan Ordinance, Trincomalee Railway Ordinance and so on. There were separate funds. We knew exactly that the total amount of loan was going to be used for a particular object and for nothing else. We knew that the loan for Colombo Harbour would be used to improve and re-build the Colombo Harbour. As I said, the biggest loan was raised in 1937 and, at that time, all the objects were specified. For instance Law Courts, Rs. 1 million ; Aerodrome at Ratmalana, Rs. 400,000 ; Training School at Wathupitiwala, Rs. 480,000 ; State Council and Secretariat Building, Rs. 3 million ; High Level Road, Rs. 2,600,000 ; Widening of Colombo Roads, Rs. 5 million ; Improvements to Colombo Port Oil Dock and Deep Water Quay, Rs. 12 million ; Hydro-Electric Scheme, Rs. 24 million—all those specific objectives were mentioned with the respective figures shown against them. The money allocated for each particular scheme was used on that particular scheme and on nothing else.

Now, the method of budgeting has been altered since 1948. I think we are now in the era of what is called "Deficit Budgeting". We are very free about the use of these loans. We are not at all worried about deficits. In the olden days if a deficit of Rs. 1 million was recorded the Government would have crashed. But today we have deficits running up to Rs. 700 million and yet the Government is very cheerful ! We have been raising loans ever since 1956. We have been doing them before. But look at the consequences. Look at the increase in the Public Debt of this country : From Rs. 1,069 million in 1954 it went up to Rs. 1,145 million. Next year it was Rs. 1,363 million. In the following years the figures for Public Debt were Rs. 1,495 million, Rs. 1,837 million and Rs. 2,230 million. In other words, during the last 5 years public debt has increased by more than Rs. 1,100 million.

I do not say that the Budget Estimates do not specify certain objectives for which these loans are to be used. I do not say that. But I am rather sceptical. I really do not know—[*Interruption*]. Yes, our external assets have also gone down from Rs. 1,100 million to nearly Rs. 480 million. You have drawn about Rs. 800 million. I do not say that all of it was used for public purposes but certainly a certain fraction of it went for public purposes. The enormous sum of Rs. 1,400 million has been spent or should have been spent on various nation building projects, various enterprises which would have helped to solve problems

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. රත්නායක මයා.]

of our living standards, unemployment and so on. An enormous sum like that would have gone a long way in solving these problems. But what I am asking the hon. Members is this. Apart from the figures supplied in the Estimates do they see anything visible, anything substantial to show that something concrete has been done with all this money ?

I would just take last year's figures. Provision was made for various schemes. I am referring to Votes 6 and 7. Amounts were set apart for capital expenditure, or what used to be called Loan Fund Expenditure, on various projects, enterprises and so on. I want to know how you have been spending this money. Or did you spend this money at all ? We are certainly glad that the Minister of Finance issued this year a White Paper explaining certain aspects of the Budget. It is a very useful document. I say it is useful because it explains away—the Minister of Finance himself said it is a confession of—their failure to do certain things and it is a statement of their plans and hopes of what they proposed to do in the future. But I would have liked it if the Minister of Finance in that White Paper had proceeded to tell us what fraction of this Rs. 427 million provided for—items which normally would have gone under Loan Fund Expenditure—was spent during the last 10 or 11 months. I know it would be difficult to give particulars but certainly we would be very pleased to have a statement from the Government on that subject. I can show you so many such items in last year's Budget. Provision has been made for various things. As far as I am concerned I do not see any money has been spent.

I will give you one instance. A sum of Rs. 40 million was provided against the P. W. D. This was not for current expenditure, for payment of staff, maintenance and so on. It was for new works, buildings roads and so on. The Government says they are very just, that when they distribute this money on these works they make no distinction between Government party constituencies and other constituencies. In which case they should have spent this year at least Rs. 350,000 in my constituency. Provision was made for Rs. 40 million. At least Rs. 350,000 should have been spent this year in my constituency or in neighbouring constituencies of Kundasale or Teldeniya. In fact, in each constituency they should have spent at least Rs. 350,000 on roads.

As you know, our areas are very badly roaded. In fact, the Kandyan Peasantry Commission pointed out that in these areas roads are very badly needed. But, in spite of that sum of money provided, certain villages are just inaccessible during the rainy weather. In these areas people are crying for roads. There is a very great need for roads. Yet, although Rs. 40 million was provided in these Estimates what has happened ? We have been asking for a particular road—just two miles which would have cost only Rs. 40,000. This project was in the Estimates for 1959. It is still in the Estimates for 1960. When I was elected I was told : " everything is ready for the construction of this road, please meet the Executive Engineer, he will attend to the job. " But, believe me, in September the Executive Engineer told me that he was short of staff. He said : " Please Mr. Ratnayake speak to the Director of Public Works and ask him to send us engineers ". But what happened ? He said, " All right we are just now short of engineers but we will during the next few weeks send you the engineers to survey the place. " It was merely for a survey. Between a survey and the construction of a road there is a big time lag. September, October, November, December, January and February passed. Then I was ill for some time. Thereafter I wrote and asked whether the survey had been done. Up to date no survey has been done. In fact, some people had gone and made some inquiries and said they would come again for the survey.

I want to know from Members of the Government parliamentary party, what have you done with this Rs. 40

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

million ? Where is this money ? Did you get Rs. 400,000 worth of roads in your constituencies or even Rs. 200,000 worth of roads or even Rs. 100,000 worth of roads ?

In my area there is a desperate need for just one mile of road and the department has by-passed me in this way. You have been providing like this for the last six years in the Budget millions of rupees. You have been raising the Public Debt from Rs. 1,100 million to Rs. 2,200 million. Please show us what you have done with this enormous amount of money. Is there anything visible ? I do not want to compare what you have done with what the U. N. P. has done. You are the Government. You have seventy-five Members. In fact, we were glad that you have seventy-five Members because we thought there will be an efficient Government, because we thought there will be a good Government. It is your duty to ask your Ministers what they are doing with this money ?

You say you are not making a distinction between Government party constituencies and other constituencies. If that is so, where has this vast sum of money amounting to Rs. 40 million gone ? Can you show a Gal Oya, can you show a Minipe, can you show fifty Central Schools like the Royal College ? I want to see them with my eyes, I want to hear you say that you have such and such a huge scheme coming up in such and such an area ?

පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)
(திரு. பேர்சி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

There is a map !

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்னயக்க)
(Mr. A. Ratnayake)

The 1956 Bandaranaike Government was described as සොයා බලන ආණ්ඩුව. Any problem they promised to investigate ! Even today they are investigating the Nilwala-ganga and the Mahaweli-ganga. Those schemes are to be completed in 25 years when most of us will be dead. The problems of our country are crying for solution. I have been repeating this *ad nauseam*. The Cost of Living Committee Report which has been issued as a Sessional Paper states that an urban worker needs Rs. 290 a month—that was in 1959—for his subsistence. What is the condition of the villager ? 90 per cent. of them are unemployed or under-employed and live on land akin to a postage stamp in size or looking after a kitul tree. There are thousands of people getting incomes less than Rs. 100 a month. There are families getting less than Rs. 10 a month. When conditions are like that what are you doing about the unemployment problem ? It is the most serious problem today—the problem of unemployment, the problem of under-employment, the problem of poverty in the rural areas particularly. You must find an immediate solution to this problem. Your plans must be based on this problem.

I ask this Government, what have you done for the last six years with this Rs. 1,400 million ? You have been raising local and foreign loans.

අ. භා. 5.15

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

Where were your plans ?

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்னயக்க)
(Mr. A. Ratnayake)

Never mind about the U. N. P. We are defeated and we are on this side. You have been running the Government for the last six years. For six years you have been planning. සොයා බලනවා, සැමදාම සොයා බලනවා ! [බාධා කිරීම්]. You have wasted Rs. 1,500 million. Where is that money ? When we are speaking on behalf of the poor, when we are speaking on behalf of the unrepresented voiceless people, Government Members must not disturb us. We are only stating a fact. We are stating the truth. I ask hon. Members of the Government : why do you not ask your Ministers where all this money has

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. රත්නායක මයා.]

gone? I have not seen the Ministers coming here. It may be that the Prime Minister is going to Belgrade in order to solve world problems but our problems are crying for solution in this country. Where are the Ministers? I am glad that the hon. Parliamentary Secretary is here but where are the other Parliamentary Secretaries? Hon. Members are making brilliant speeches, but who is going to take note of these speeches? Parliamentary democracy is rapidly becoming a farce. Parliament is becoming a second class debating society. Ministers are not taking note of the remarks. made here.

I was referring to the Public Debt. The accumulated Public Debt for the last five years increased from Rs. 1,100 million to narly Rs. 2,200 million. Can you show us any visible signs and say, "this is what we have done"? Can you show us anything for the enormous sums of money you have spent in this way? That is why you are today facing a very serious financial situation. You are facing this crisis today because the Government Members were not critical, were not inquiring from their Ministers what they were doing with this vast sum of money voted from time to time.

Vast sums have been voted for agriculture and land development, but what have you done? I am bearing personal testimony to what I say. There are hundreds and thousands of unemployed young people asking for jobs. I am so desperate, I go to everyone and say, please give five jobs, ten jobs to various people, but up to date not one single person has received a job. All avenues of employment are closing. That is the stark fact you are facing today.

Now by this Finance Bill which has been passed you have torpedoed the late Prime Minister Bandaranaike's Ten-Year Plan. There is no Ten-Year Plan now. You were hoping to solve the unemployment problem through the Ten-Year Plan. The Ten-Year Plan has ceased to exist. You were hoping that the private sector will contribute out of the Rs. 13,000 million provided for in the plan at least about Rs. 4,000 million, but with one stroke of the pen you have completely destroyed the private sector. That is the present situation. I appeal to hon. Members, particularly Members of the Government party, because Hon. Ministers are seldom or never in the House to listen to us and I am absolutely certain that they will not read HANSARD. Hon. Members of the Government have a chance of meeting the Ministers in the Government group. Please ask them what they are doing with this money. Are they going to continue to waste this money in this way and put the poor people of this country into this terrible predicament.

බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ දෙවන මන්ත්‍රී)

(திரு. பெர்னாட் சொய்ஸா—கொழும்புத் தெற்கு இரண்டாம் அங்கத்தவர்)

(Mr. Bernard Soysa—Second Colombo South)

ගරු සභාපතිතුමනි, මුදල් කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් තැන මෙම වැය ශීර්ෂය යටතේ අප ඉදිරිපත් කරන ප්‍රශ්න ගැන අමනාප නොවී මේ කරුණු ගැන වැඩි පුර පහර දීම එතුමාට කරන විශෙෂ සැලකිල්ලක් හැටියට පිළිගන්නවා ඇතැයි මා විශ්වාස කරන්වා. ගරු මුදල් ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ අප මතු කරන ප්‍රශ්න අතුරින් ඇත්තෙන්ම ප්‍රධාන වශයෙන් සැලකෙන්නේ රාජ්‍ය සේවාව පිළිබඳව මතුවන ප්‍රශ්න ගණනාවක්. එයින් ප්‍රධාන කොටස වන රජයේ සේවකයන්ගේ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නය තවමත් විසඳී නැති බව කවුරුත් දන්නා දෙයක්. මේ කරුණ ගැන එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව තිබුණු කාලයේදී පටන් රටේ විශෙෂ උද්ඝොෂණයක් තිබෙනවා. රජයේ සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් දිය යුතුය යන ප්‍රශ්නය සහ ඒ පිළිබඳ ඉල්ලීම් ඒ කාලයේ සිටම කෙරෙනවා. මේ රටේ මෑත ඉතිහාසය දන්නා කවුරුත් විශෙෂයෙන් මතක තබාගන්නාවූත්, නිතර පාහේ සිහිපත් කරන්නාවූත් කාරණයක් තමයි, 1947 වර්ෂයේදී රාජ්‍ය සේවයේ ඇතිවූ මහා වැඩ නැවැත්වීම. ඒ වැඩ නැවැත්වීමේදී දේශපාලන සහ වෘත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තීය අයිතිවාසිකම් ඉල්ලමින් ඉදිරිපත් වූ ඒ රජයේ සේවකයන්ගේ සටනේ විශෙෂ අංගයක් වශයෙන් අර කොළොන්නාවේ තිබෙන රාළහාමිගේ වත්ත කියන පිට්ටනියකට ගොස් රැස්වීමක් පවත්වන්නට අද හස් කරගෙන ගමන් කළ රජයේ සේවකයන්ට වෙඩි තැබීම කරණකොටගෙන කන්දසාමි නමැති ඒ ලිපිකාර මහත්මයාගේ ජීවිතය නැති වුණු හැටි කාටත් මතක ඇති. රජයේ සේවකයන්ට තමන්ගේ අයිතිවාසිකම් ලබා දීම සඳහා සිය දිවි පිදූ ඒ කන්දසාමි මහත්මයාගේ නම තවමත් රජයේ සේවකයන් සිහිපත් කරනවා; ගෞරවයෙන් මතක් කරනවා. එදා ඒ කන්දසාමි මහත්මයා යම් දෙයක් වෙනුවෙන් සිය දිවි පිදුවාද, යම් සටනක් මගින් යම් දෙයක් සාර්ථක කර ගැනීමට බලාපොරොත්තු වුණාද, ඒ බලාපොරොත්තුව තවමත් සාර්ථක වුණේ නැති බවත්, ඒ නිසා තවමත් ඒ සටන නතර වුණේ නැති බවත්, කාටත් පිළිගන්නට පුළුවනි. වෘත්තීය අයිතිවාසිකම් පිළිබඳව නම්, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව බලයට පත් වන්නට මත්තෙන් තමයි, කන්දසාමි මරා දැම්මේ. ඒ මරා දැමීම සිදු වුණේ 1947 දීයි. බලයට පත් වූවාට පසුව, පළමුවෙනි පාර්ලිමේන්තුවේදී—1948 දී—වෘත්තීය සමිති පණත සංශෝධනය කිරීමේ පණතක් ඉදිරිපත් කළා. එයින් බලාපොරොත්තු වූයේ රජයේ සේවකයන්ට වෘත්තීය සමිති අයිතිවාසිකම් දෙන්නටයි. එහෙත් ඇත්තෙන්ම සිදු වුණේ කුමක්ද? එයින් සිදු වුණේ වෘත්තීය සමිති අයිතිවාසිකම්, යම් සීමිත ප්‍රමාණයකට රජයේ සේවකයන්ට දෙන ඒ සම්පූර්ණ වෘත්තීය අයිතිවාසිකම්, නැති කර දැමීමයි. දේශපාලන අයිතිවාසිකම් තහනම් කළා. මේ රටේ රජයේ සේවකයන් අධිරාජ්‍ය යුගයේ සිට මේ රටේ ජීවත් වුණ අයිතිවාසිකම් නැති අඩු කොටසක් හැටියට, පහළ පෙළේ කොටසක් හැටියට, සිටියා. ඒ පුද්ගලයන්ට සිදු වුණේ ඒ නායකයන්ගේ පරිපාලන රෙගුලාසි අනුව, වෘත්තීය සමිති සංශෝධන පණත අනුව තව දුරටත් ලාංකිකයන්ගේම ආණ්ඩුයටතේ අර්ධ වහල් භාවයේ සිටීමටයි. ඇත්තෙන්ම එදා සිට අද වන තුරු 1948 දී සංශෝධනය කරන ලද වෘත්තීය සමිති පනත අහෝසි කර දමන මෙන් ඉදිරිපත් කළ ඉල්ලීම් සාර්ථක වුනේ නැහැ.

දිවංගත ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ ආණ්ඩුව පැවැති කාලයේදී මුහුණ පාන්නට වූ ප්‍රශ්න සම්බන්ධයෙන් දෙවිධියකට ක්‍රියා කළා. වෘත්තීය සමිතිවලට කලින් තිබුණාට වඩා යම් යම් අයිතිවාසිකම් එක් පැත්තකින් දුන්නා; වෘත්තීය සමිති ව්‍යාපාරය වැඩි දියුණු කිරීමට ආණ්ඩුව බලාපොරොත්තු වෙනවාය කියා එදා එම ආණ්ඩුව කර තිබුණු ප්‍රකාශනය අනුව යම් යම් සහනත් ලැබුණා. කලින් තිබූ ආණ්ඩුවල නම් ආණ්ඩුවේ යම්කිසි වැඩපොළක කම්කරුවන් සංවිධානය වී වෘත්තීය සමිතියක් වශයෙන් සකස් වූ වහාම එහි නිලධාරීන් මාරු කිරීමේ සිරිතක් තිබුණා. 1948 වන අවුරුද්දේ දුම්රිය දෙපාර්තමේන්තුවේ "රතින් ෂෙඩ්" වශයෙන් හඳුන්වන දෙමටගොඩ තිබෙන ඛාවන අංශයේ සේවයේ නියුක්ත වී සිටින කම්කරුවන් වෘත්තීය සමිතියක් වශයෙන් සංවිධානය වූ වහාම එහි ලේකම්තැන මාරු කරනු ලැබුවා. උප ලේකම් මහතා ලේකම් ධුරයේ වැඩ කටයුතු කරන්න පටන් ගත් වහාම ඒ මහතාත් තලේමන්නාරමට මාරු කරනු ලැබුවා. ඊට පසුව තවත් කෙනකු ලේකම් ධුරයට පත් කරගෙන වැඩ කටයුතු කරන්යන්නට පටන් ගත් අවස්ථාවේදී ඔහුත් කන්කසන්තුරේට මාරු කරනු ලැබුවා.

තම වෘත්තීය සමිතියේ නිලධාරීන් මේ විධියේ අයුතු අන්දමට මාරු කරනු ලැබීම ගැන එම සමිතිය එදා තිබූ ආණ්ඩුවෙන් ප්‍රශ්න කළ විට පිළිතුරු වශයෙන් ලැබුනේ, දුම්රිය දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවන් උඩ එම මාරුකිරීම් කරන්න යෙදුන බවයි. එම වෘත්තීය සමිතියේ ලේකම් මහතාගේ සහාය නැතිව දුම්රිය දෙපාර්තමේන්තුවේ කන්කසන්තුරේ තිබෙන ශාඛාවේ ඛාවන අංශයේ කටයුතු කරන්න බැරි බවයි එදා ආණ්ඩුව පිළිතුරු වශයෙන් දුන්නේ. මේ අන්දමටයි එදා පැවැති ආණ්ඩුව කටයුතු කළේ. ඒ නිසා 1956 බලයට පත් වූ මෙම ආණ්ඩුව ඔය තත්ත්වයෙන් රජයේ සේවකයන් ගොඩ නැංවූ බව අප සඳහන් කරන්නේ කෘතඥ භාවයෙන් යුක්තවයි. මෙම ආණ්ඩුව බලයට පත් වූවාසින් පසුව ඒ විධියේ පහර දීමේ මාරු කිරීම් නතර කර දැම්මා. වෘත්තීය සමිතිවල නිලතල දරන්නන් මාරු කරන්න බැරි පිළිවෙළට භාණ්ඩාගාරයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

ෂදපාර්තමේන්තු ප්‍රධානීන්ට චක්‍ර ලේඛන මඟින් නියෝග කළා. හැබැයි, සේවයේ අවශ්‍යතාවන් උඩ නිලධාරීන් මාරු කිරීමේ බලය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට තිබුනා; නමුත් පුළුවන් තරම් දුරට එවැනි මාරු කිරීම් නැති කරන මෙන් බල කිරීමක් තිබුණා.

එපමණක් නොව, යම් යම් කොටස් වැඩ නැවැත්වීම් ආදි ව්‍යාපාරවල යෙදුණු සෑම අවස්ථාවකදීම පාහේ නැසීගිය ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ තීන්දුව වූයේ ඒ අයගේ ඉල්ලීම්වලින් කොටසක් හෝ දී ඔවුන් තෘප්තිමත් කළ යුතුය කියායි. රජයේ වෙන අනෙක් අවශ්‍යතාවන් ගැනද කල්පනා කොට නිලධාරීන්ගේ කැමැත්ත අකැමැත්ත ගැනද කල්පනා කර බලා වැඩ කටයුතු කළ නිසා එම ඉල්ලීම් හරියාකාර සම්පූර්ණ කිරීමට ලෑස්ති වුනේ නැහැ. එමෙන්ම එසේ වැඩ නැවැත්වූ සේවකයන්ට සම්පූර්ණයෙන්ම පහර ගසා ඔවුන් අසතුටට පත් කොට යැවීමටත් එතුමා ලෑස්ති වුනේ නැහැ. ඒ නිසා මේ විධියේ අන්ත දෙකට මැදින් ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ඉල්ලීම්වලින් කොටසක් දෙමින් ඒ අය සතුටු කරන්න අදහස් කළා. ඒ කාරණාව නිසා, යම් යම් දේවල් ලැබුණ නිසා, විශෙෂයෙන් ඒ කාල යේදී වැඩ නැවැත්වීම් රාශියක් ඇති වුණා. අවුරුදු ගණනාවක් තිස්සේ තම දුක් ගැනවිලි පිළිබඳව විසඳීමක්, සහනයක්, ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් සිටි අය එය ප්‍රමාද වන විට වැඩ නැවැත්වීමේ මාර්ගයෙන් යම් යම් සහන ලබාගන්න උත්සාහ කළා. එමෙන්ම සුළු සහන කීපයක්ද ලැබුනා. ඒ සමගම කලින් තුබුනාට වඩා වෘත්තීය සමිතිවලට නිදහසක් ලැබුණු බවද අප පිළිගන්නට ඕනෑ. නමුත් දේශපාලන අසිතිවාසිකම් සහ ඊට වඩා පුළුල් වූ වෘත්තීය සමිති සම්මේලන වශයෙන් ඒ කරුණු වී දේශපාලන අරමුණු ඇති කරගෙන කටයුතු කිරීමේ අසිනිවාසිකමද ලැබුනේ නැහැ. දෙශපාලන කටයුතුවලට සහභාගි වීමේ අසිතියද ලැබුණේ නැහැ. මේ ප්‍රශ්න ගැන එදා හිටපු ගරු මුදල් ඇමතිතුමා වන ස්ටැන්ලි ද සොයිසා මහතා සමග සාකච්ඡා කර මේවා කල් දමාගැනීමේ මාර්ගයක් යොදා ගත් බව කියන්න කැමතියි. එදා මේ ප්‍රශ්නය විසඳීම උදෙසා අවංකව උත්සාහ ගත් කෙනෙක් තමා එවකට මුදල් අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු ලේකම් වරයකුව සිටි නිමල් කරුණාතිලක මහතා. ඒ මහතාට මෙය භාර දුන්නා. ඒ පාර්ලිමේන්තු ලේකම්තුමා මේ ගැන විභාගයක් පවත්වා වාර්තාවක් ද ඉදිරිපත් කළ බව අප දන්නවා. ඒක ප්‍රසිද්ධ කළ වාර්තාවක් නොවෙයි. කෙසේ වෙතත් ඒ ප්‍රශ්නය නියම අන්දමට විසඳුණේ නැති බව කියන්නට ඕනෑ. එම ප්‍රශ්නය සහ ඊට අයිති අනිකුත් කරුණු විශාල දායාදයක් හැටියට ගෙන ඒ මඟින් ප්‍රයෝජන ගත්තේ අද මේ ආණ්ඩු කරන පක්ෂයයි. මැතිවරණ කාලයේ දී මේ ප්‍රශ්න ඉදිරිපත් කරන විට යමක් කරන්න බැරි වුණත් පසුව මේ ප්‍රශ්න විසඳා ඒ මඟින් තමන්ට යම් යම් සහන ලබා දෙන්නටය කියා රජයේ සේවකයන්, 1960 මැතිවරණය සඳහා ඉදිරිපත් වුණු සෑම පක්ෂයකින්ම වාගේ ඉල්ලා සිටියා. ඒ අන්දමට ප්‍රශ්න විසඳා දෙන්නේ කවුරුන්ද, විසඳා නොදෙන්නේ කවුරුන්ද කියන එක රජයේ සේවකයන් සොයා බැලුවා. කෙසේ වෙතත්, අද මේ ප්‍රශ්නය විසඳීම පිළිබඳ වගකීම පැවරී තිබෙන්නේ අද රජය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටයි. මේ ආණ්ඩුව මේ වන තුරු ඒ ගැන යමක් කර නැහැ. "වෘත්තීය සමිති සංශොධන පණත" නමින් කෙටුම්පත් පණතක් තිබෙන බව අප දන්නවා. 1956 සිට 1959 දක්වා සිටි ඇමතිවරුන් එය ඉදිරිපත් කරන්න සූදානම් වුණ එක ඇත්තයි. නමුත් ඒ අවස්ථාවේදී අප ඊට විරුද්ධ වුණා. ඒ පණතින් බලාපොරොත්තු වුණා යම්කිසි අසිතියක් දීම සඳහා සම්මේලන ඇති කිරීමට. නමුත් ඇති කරන්න යන සම්මේලනවලට නැති නම් සමිතිවලට යම් යම් බාධා ඇතිවන්නට ඉඩ තිබුණු නිසා, ඒ කියන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ ඇති වුණු බාධාවන් ඒවාට ඇතුළු වන්නට ඉඩ තිබුණු නිසා, අප ඊට විරුද්ධ වුණා. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) අගමැතිව සිටි කාලයේදී එතුමා පවා ඒ පණත කොහොමහරි සම්මත කර ගන්න සූදානම් වුණා. රෑ 9.30 පසු වන තුරු කථා කර නමුත් ඒ පණත සම්මත කරගන්න එතුමාගේ කල්පනාව තිබුණා. එතුමා හදිසියේම ඒ පණත ඉදිරිපත් කර සම්මත කර ගන්න තැත් කළා. එදා අප ඊට විරුද්ධ වුණා. අප විරුද්ධ වන්නේ මන්ද කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා. අප කීවා "විරුද්ධයි" කියා. දේශපාලන අසිති වාසිකම් නොදීමේ ප්‍රතිපත්තිය ඒ පණතේ තිබෙනවා. ඒ දුර්වලකම තිබෙන නිසාත් අපට එය පිළිගන්නට බැරි බව අප කියා සිටියා. එදා අස් කර ගත්තාට පස්සේ තවම ඒ කෙටුම්පත් පණත ගත්තේ නැහැ. නමුත් අදත් කම්කරු අමාත්‍යාංශයේ ඒ කෙටුම්පත් පණත තැන්පත් කර ඇති බව ආරංචියි. අප ඉතා ඕනෑකමින් කියා සිටිනවා ඒ ආකාරයෙන්ම නම් නැවත වරක් එම පණත මෙම ගරු සභාවට නොගෙනෙන ලෙස. එම පණත පළමු තිබුණ ආකාරයටම නොගෙනෙන ලෙස අප කියා සිටිනවා. නමුත් එම පණත සංශොධනය කර දුර්වල තැන් හරිගස්සා නැවත වරක් හැකි ඉක්මනින් ඉදිරිපත් කරන ලෙස වැඩ බලන කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමා ගෙන් මා ඉල්ලා සිටිනවා.

රජයේ සේවකයන්ට දේශපාලන අසිති වාසිකම් දීමේ ප්‍රශ්නය ගැන කීප වතාවක් මේ ගරු සභාවේ කථා කර තිබෙනවා. ඒ විෂයය යටතේ අපේ පානදුරේ ගරු මන්ත්‍රීතුමාත් (ලෙස්ලි ගුණවර්ධන මයා.) බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමාත් (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්‍ය්‍ය එන්. එම්. පෙරේරා) මැද කොළඹ දෙවන ගරු මන්ත්‍රීතුමාත් (කෙනමන් මයා.) විශෙෂයෙන් කථා කර තිබෙනවා. ගත වුණු කාල සීමාවක බදුල්ලේ ගරු මන්ත්‍රීවරයා වශයෙන් පෙනී සිටි ජේ. සී. ටී. කොතලාවල මහතාත් මේ ගැන කථා කර තිබෙනවා. පසුගිය කාල සීමාවක නාවලපිටියේ ගරු මන්ත්‍රීවරයා වශයෙන් පෙනී සිටි මැතිතුමාද මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් එදා සිදු වූ දේ කියන්න පවා කනගාටුයි. එදා ගෙනා යෝජනාවට විරුද්ධව ඡන්දය දෙන්න එවකට පැවති ආණ්ඩු පක්ෂයේ අයටම සිදු වුණා. කෙසේ වෙතත්, එම ප්‍රතිපත්තිය පිළිගන්නවාය කියන තීන්දුව අනුවයි ඒ විධියට ඒ අය ඡන්දය පාවිච්චි කර තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, අද මේ ප්‍රශ්නය ඉතා බැරෑරුම් තත්ත්වයකට පැමිණ තිබෙනවා. ආණ්ඩුවේ සේවකයන්ට දෙශපාලන අසිතිවාසිකම් නොදීමේ ප්‍රතිපත්තිය ආණ්ඩුව විසින්ම අනුගමනය කරන නිසා ආණ්ඩුව විසින් ආරම්භ කරන සංයුක්ත මණ්ඩලවල පාලක නිලධාරීන්ද එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නට තැත් කරන බව පෙනෙනවා. ලංගම ය එවැනි තීරණයක් ගත්බව අප දන්නවා. එම නිසා වරාය සංයුක්ත මණ්ඩලයත් එවැනි තීරණයකට බැස්සා. තවත් සංයුක්ත මණ්ඩල කීපයක් එවැනි තීරණ අරගෙන තිබෙනවා. ඇයි? ඒ අයත් ආණ්ඩුවේම යයි කියන පිරිසක් නිසා සංයුක්ත මණ්ඩලයක් වශයෙන් එම ප්‍රතිපත්තියම අනුගමනය කළ යුතුය යන තර්කය උඩයි. ඉදිරිපත් කළ තර්කය ඒකයි. මොරටුවේ පළාත් ආණ්ඩු සභාවේ නියෝජිතයකු හැටියට සිටි කෙනකු ආපසු රක්ෂාවට ගන්නේ නැතුව යුක්ති සහගත නොවන විධියට අස් කරන්නට යෙදුණා. ආපසු රක්ෂාව දෙන්නය කියා අපි ඉදිරිපත් කළ ඉල්ලීමට කාලයක් ගියාට පසුව, 1959 අවුරුද්දේදී, රජය ඉඩ දුන්නා. එසේ ආපසු රක්ෂාවට ගැනීමට එකඟ වුණාට පසුව බාධාවකට පෙනුණේ මෙම කම්කරුවා සමසමාජ පක්ෂයේ නියෝජිතයකු හැටියට ඒ පළාත් ආණ්ඩු සභාවේ නියෝජිතත්වයක් දැරුවාය කියන කරුණයි. කරුණු මේ විධියට කෙරී ගෙන යනවා නම් සංයුක්ත මණ්ඩල නොහොත් වැඩි වැඩියෙන් ජනසතු කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වෙනවාත් සමගම මේ රටේ ජනතාවගෙන් වැඩි කොටසකට දේශපාලන අසිතිවාසිකම් නැතිව යන්න පුළුවනි.

මම මෙම කරුණු මතක් කළේ අපගේ ඡන්දයත් ඇතිව සම්මත කරගත් පාසැල් පණත යටතේ ආධාර ලබන පාඨශාලා රජයට ගැනීමත් සමගම ඒවායේ නියුක්තව සිටි ගුරු මහත්වරුන්ට දේශපාලන අසිතිවාසිකම් තිබෙනවාද නැද්ද කියන ප්‍රශ්නය ගැන ඇත්ත වශයෙන්ම අද අවුලක් ඇති වී තිබෙන නිසයි. මෙම ප්‍රශ්නය ගැන මම අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් විමසුවා. ප්‍රශ්නයට නියම උත්තරයක් ලබා ගන්න බැරි වුණ නිසා අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් මම මේ ගැන කරුණු ඇසුවා. ඒ ඇසූ අවස්ථාවේදී එතුමා දුන් පිළිතුර මෙසේයි. "මෙම පාඨශාලා අධ්‍යාපන අධ්‍යක්ෂක තුමාගේ පාලනය යටතට ගත් හැටියේම ඒවා රජයට අසිති වන්නේ නැහැ, එම නිසා අධ්‍යක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

පාලනය යටතේ තිබෙන පාඨශාලා ගුරුවරුන්ට, කලින් මෙන්ම ඒ අයිතිවාසිකම් තිබෙනවා" ය කියායි. නමුත් රජයේ පාඨශාලාවල සිටින ගුරුවරයන්ට එදා තිබුණේත් නැහැ, අද ඇත්තෙත් නැහැ. එතකොට මම ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඇසුවා——

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

May I point out to the hon. Member that we are already behind schedule? We should have finished the discussion on two other Ministries by this time.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I am always prepared to abide by your Ruling.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

I am not giving a Ruling; it is only a reminder.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I shall try to be as brief as possible. If the party leader who preceded me had been conscious of the decision to which he himself seems to have been a party, there might have been a little more time available for us. I am not denying his right to speak, but we should also have the opportunity of ventilating cur views under these Votes.

ගරු සභාපතිතුමනි, ගුරුවරයන්ගේ ප්‍රශ්නය ගැන අද ඇති වී තිබෙන අවුල් තත්ත්වය ඔය විධියයි. විශෙෂ නියෝග යටතේ, අධ්‍යක්ෂ පාලනය යටතේ තිබුණු පාඨශාලා කීපයක්ද රජය සතු වුණ නිසා ඒ ගුරුවරුන් රජයේ සේවකයන් හැටියට පත් වුණා. රජයේ සේවකයන් හැටියට දේශපාලන අයිතිවාසිකම් නැති වී ගොස් තිබෙනවා; කලින් තිබුණු දේශපාලන අයිතිවාසිකම් සම්පූර්ණයෙන්ම අහෝසි වී ගොස් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම මේ සම්බන්ධයෙන් පසුගිය සැසි වාරය හමාර වෙන්නට ප්‍රථම ගරු මුදල් ඇමතිතුමාගෙන් ප්‍රශ්න කළා. මා ඇසුවා, පළාත් ආණ්ඩු සභා තරඟවලට ඉදිරිපත් වීමට බලාපොරොත්තු වී සිටින විවිධ දේශපාලන පක්ෂවලට අයත්—ඒ කීවේ එක්සත් ජාතික පක්ෂයේ අනුගාමිකයන් සිටින්නට පුළුවනි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අනුගාමිකයන් සිටින්නට පුළුවනි, ඒ වාගේම සම සමාජ පක්ෂයේ අනුගාමිකයන් සිටින්නට පුළුවනි—ගුරුවරුන් ආදී උදවියට මෙතෙක් ඒ අයිතිවාසිකම් ඉදිරියටත් ලබා දෙනවාද කියා. ගරු මුදල් ඇමතිතුමා එයට පිළිතුරු වශයෙන් කීවේ, එතුමාගේ කල්පනාවේ හැටියට නම් මේ ඇති වූ පරිවර්තනයෙන් ඔවුන් එතෙක් භුක්ති වින්ද දේශපාලන අයිතිවාසිකම් නැති වන්නේ නැත කියායි. නමුත් කලින් දේශපාලන අයිතිවාසිකම් නොතිබුණු රජයේ සේවකයින්ට, රජයේ ගුරුවරුන්ට, එබඳු අයිතිවාසිකමක් ලැබෙන්නේ නැතැයි ද ප්‍රකාශ කළා. අළුතින් පැණවූ අණ පණත් අනුව රජයේ සේවයට ඇතුළත් වන අළුත් සේවකයින්ගේ අයිතිවාසිකම් නැති කරන්නේ නැත කියා එදා ගරු මුදල් ඇමතිතුමා තව දුරටත් ප්‍රකාශ කළා. එසේ ගරු මුදල් ඇමතිතුමාගේ පොරොන්දුවක් ලැබී තිබිය දීත්, ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඒ ආකාරයට දේශපාලන අයිතිවාසිකම් නැති කරන්නේ නැත කියා පොරොන්දුවක් ලැබී තිබියදීත්, පුදුම සිඩියකට අපට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, සමහර පළාත්වල මේ විධියේ තරඟවලට ඉදිරිපත් වුණු ඇතැම් ගුරු මහතුන්ගෙන් ප්‍රශ්න කරලා තිබෙනවා, චෝදනා පත්‍ර යවා තිබෙනවා, තමන් රජයේ සේවකයින් වශයෙන් සිටියදී මෙවැනි තරඟවලට ඉදිරිපත් වුණා නම් තමන් දැනට සිටින රජයේ සේවයෙන් පහ නොකිරීමට හේතු දක්වන්නටය කියා. ගරු සභාපතිතුමනි, ඇත්තවශයෙන්ම මෙය ඉතාමත්ම අවුල් සහගත, ඒ වාගේම කණගාටුදායක, සිඩියක්. මේ ගැට ලුව ලිහන්න, මේ තත්ත්වය විසඳන්න, ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට බලය තිබෙනවා. එම නිසා වැඩ බලන ගරු ඇමතිතුමාගෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා, වැඩ කටයුතු භාර ගත්තාත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමගම මේ ගැටලුව ලිහන්ට, මෙයින් සහනයක් ලබා දෙන්ට, කටයුතු සලස් වන්නය කියා. මෙය දැන්ම විසඳුවේ නැති නම් මෙයට වඩා පුළුල් ප්‍රශ්නයකටයි මුහුණ දෙන්ට සිදු වන්නේ.

ගරු සභාපතිතුමනි, මේ රටේ බොහොම යක් ව්‍යාපාර රජයේ ව්‍යාපාර බවට පරි වර්තනය වීගෙන යනවා. එසේ කරන්න කරන්න වැඩි වැඩියෙන් රජයේ සේවක යින් ඇති වෙනවා. එවිට මේ අයටත්, මේ අයගේ භාර්යාවන්ටත්—මේ ආකාරයෙන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම—මේ රටේ දේශ පාලන අයිතිවාසිකම් නැති වී යාමෙන්, අහිමි වීමෙන්, විශාල ජනකායකට සිදු වන්නේ වහල් ජීවිතයක් ගත කිරීමටයි, කිසිම අයිතිවාසිකමක් නැති වහල් තත්ත්වයට පත් වීමටයි. නමුත් ව්‍යාපාර ජනසතු කිරීමෙන් අදහස් කරන්නේ මෙවැනි තත්ත්වයක් නොවෙයි. ජනසතු කිරීමෙන් ජනතාවගේ අයිතිවාසිකම් තව තවත් වැඩි කිරීමට බලාපොරොත්තු වෙනවා මිස ඒ අයිතිවාසිකම් නැත්තටම නැති කර දැමීමට නොවෙයි අදහස් කරන්නේ. එම නිසා මේ ප්‍රශ්නය ගැන ඉතා ඕනෑකමින් සලකා බලා ඉක්මනින් මේ සම්බන්ධයෙන් නියම සහනයක් ලබා දෙන්නය කියා ඉල්ලා සිටින අතර මේ කාරණය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන සන්දේශය ගැනද වචනයක් සඳහන් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, එහි ඉදිරිපත් කර තිබෙන සෑම තර්කයක්ම ගැන කරුණු පැහැදිලි කර දීම අවශ්‍යයයි මා කල්පනා කරන්නේ නැහැ. නමුත් රජයේ සේවක යින්ට දේශපාලන අයිතිවාසිකම් නොදීමට එක් තර්කයක් වශයෙන් කවදත් ඉදිරිපත් කරන්නේ පරිපාලන කටයුතු සම්බන්ධ යෙන් ඒ අය කෙරෙහි වගකීමක් පැවරෙන වාය යන්නයි. අප කථා කරන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් ගැනවත්, එසේ නැතිනම් මේ වැටුප් කොමි ෂන් සභා වාර්තාවෙන් අහෝසි කරන්න අදහස් කරන ස්ථාවර ලේකම්වරුන් ගැන වත්, නොවෙයි. අප කථා කරන්නේ ඊට වඩා පහළ පෙළේ සිටින, කෙලින්ම පරි පාලන කටයුතුවලට සම්බන්ධ නැති, අඩු ගණනේ තීන්දුවක්වත් ගන්න සිදු නොවන, රජයේ සේවකයින් ගැනයි. ඇත්ත වශයෙන් ඒ උදවියට දේශපාලන අයිතිවාසිකම් නොදීමට කිසිම හේතුවක් නැහැ. රත්මලානේ දුම්රිය වැඩපොළේ සේවය කරන කම්මල් කරුවා, වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ට්‍රැක්ටර් ධාවනය කරවන රියැදුරා, වරාය කොමිෂන් සභාව යටතේ වඩු වැඩ කරන වඩු කර්මාන්ත ශිල්පියා යන මේ අය පරිපාලන කටයුතුවල යෙදෙනවා යයි කීම විහිළුවක්. ඇයි මේ අයට දේශපාලන අයිතිවාසිකම් නොදෙන්නේ? මේ පුළුල් ප්‍රශ්නය ගැන කල්පනාව යොමු කර වහාම සහනයක් ලබා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

සභාපතිතුමනි, දැනට තිබෙන පරිපාලන රෙගුලාසි වෙනස් කරන ලෙස 1956 සිටම මා ඉල්ලා සිටිය. නැති වී ගිය යුගයකට අයිති රෙගුලාසි මාලාවක් වූ, අධිරාජ්‍ය යුග යේ නෂ්ටාවශේෂයක් හැටියට තවමත් ඉතිරි වී තිබෙන මේ පරිපාලන රෙගුලාසි පොත හෙවත් මුදල් රෙගුලාසි පොත, විශේෂයෙන් නැති කර දැමිය යුතු දෙයක් හැටියට සලකන්නට පුළුවනි. මෙය සම් පූර්ණයෙන් සංශෝධනය කරනවාය, නව රජයට නව රෙගුලාසි මාලාවක් වුවමනාය, නියම ප්‍රතිපත්තියක් අනුගමනය කරන සංවර්ධන කටයුතුවල යෙදෙන්නට බලා පොරොත්තු වන රජයකට අමුතු විධියක රෙගුලාසි මාලාවක් වුවමනාය යනාදී කථා 1956 සිටම මේ ආණ්ඩුවේ ගරු ඇමතිවරුන්ගෙන් අපට අසන්නට ලැබී තිබෙනවා. එහෙත් විටින් විට රෙගු ලාසියක් දෙකක් වෙනස් කරනවා, නැත් නම් සංශොධනය කරනවා. එපමණයි කරන්නෙ. වැඩි වශයෙන්ම එම සංශෝධ නයන් කෙරෙන්නේ මේ පැත්තෙන් කෙරෙන පැමිණිලි අනුව හෝ සේවකයන් ගෙන් ලැබෙන පැමිණිලි අනුව හෝ නොව රාජ්‍ය සේවා කොමිසන් සභාවට යම්කිසි අමාරුවකට මුහුණ පාන්නට සිදු වුණු අවස්ථාවක පල්ලෙහාට නියෝගයක් එවූ විටයි. මට ඒ සම්බන්ධයෙන් කියන්නට තිබෙන්නේ එපමණයි. ස්ටැන්ලි ද සොයිසා මහතා මුදල් ඇමති වශයෙන් සිටි යදී අංක 191 සහ 194 දරණ රෙගුලාසි වෙනස් කළ හැටි මතක් කරන්නට පවා ලැජ්ජයි. මේවා පැරණි යුගයකට අයත් ඒවා බවට මට කරුණු පෙන්වන්නට පුළු වනි. අධිරාජ්‍යවාදීන් මෙරට පාලනය කළ කාලයේදී කෙලින්ම ආණ්ඩුවත් සමග ඒ ඒ පළාත්වල පාලන කටයුතු කිරීමට එකතු කරගත් රටේ මහත්වරු, ගම්මුලා දැනි මහත්වරු වැනි උදවියට විශෙෂ බල

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

තල දී, රජයේ සේවකයන්ට අමුතු විධියේ පාලනය පිළිබඳ බලතල දී තිබුණු නිසා ඔවුන්ගේ දේශපාලන අයිතිවාසිකම් නැති කර තිබුණා. සාමාන්‍ය ජනතාවගේ කරපිට තැබූ විශාල අකරතැබ්බයක් හැටියට පැවති ඒ රාජ්‍ය සේවයට ඔබින රෙගුලාසි මාලාවයි, මේ. අපට මතකයි, ඒ කාලවලදී අපේ රටේ ජනතාව ඔවුන්ගේ ප්‍රභූවරුන් වශයෙන් සැලකූ රදල පැලැන්තියේ අයට සැලකුවේ කෙසේද කියා.

සභාපතිතුමනි, 19 වෙනි ශත වර්ෂයේදී ශාන්තිකර සාගරයේ දූපත් සොයා ගිය කැප්ටන් කුක් ලියූ පොතේ තිබෙනවා, සාමාන්‍යයෙන් ඒ දූපත්වල වාසය කළ උදවිය සහ ඒ ඒ කණ්ඩායම්වල නායක යන් මුහුණු පාට කරගෙන සර්වාංගයෙහි පාට තවරාගෙන වැදි තත්ත්වයටත් අයිති නොවන ආකාරයේ ම්ලේච්ඡ තත්ත්වයක ජීවත් වූ බව. අධිරාජ්‍යවාදීන් මොවුන්ව සැලකුවේ තමන්ගේ සූරා කෑමට යට කර ගන්නට පුළුවන් පිරිසක් හැටියටයි. එහේත් අද නවීන විද්‍යාවන් දියුණුවීමත් සමග කරන ලද පර්යේෂණ අනුව ඒ විධියේ ම්ලේච්ඡ තත්ත්වයේ සිටියාය කියන අය අතරේත් යුරෝපීය ජාතිකයන්ට වඩා ගුණ ධර්ම පිළිපැදීම් අනුව උසස් ශිෂ්ටාචාරයක් තිබුණු බව සොයාගෙන තිබෙනවා. එදා දූපත් සොයාගෙන ගිය අධිරාජ්‍යවාදීන්ට ඒ දූපත්වල මිනිසුන් සැලකුවේ කෙසේද? අන්න ඒ අනුව තමයි, අපේ රදළ පැලැන්තියේ උදවිය එදා සුදු පාලකයින්ට සැලකුවේ. ඒ වචනම තමයි, යෙදුවේ. ආණ්ඩුවේ දිසාපතිවරුන් ඒ ඒ පළාත් වලට යන විට ඔවුන්ට යම් යම් භාණ්ඩ තෑගි වශයෙන් ගෙනැවිත් දීමේ සිරිතක් එකල තිබුණා. රජයේ නියෝජිතයකු පැමිණි විට, තමන්ගේ රාජපාක්ෂිකභාවය පෙන්වීමේ අදහසිනුත්, විශේෂයෙන්ම අනුග්‍රහයක් ලබා ගැනීමේ අටියෙනුත් රට වැසියා විසින් යම් යම් භාණ්ඩ ඔහුට පරිත්‍යාග කරන්නට යෙදුණා. මෑතක් වන තුරු එවැනි කාලයක් තුබුණු බව අපට මතකයි. මඩුවන්වල දිසාවගේ කාලයේදී බලංගොඩින් එහා සිදු වූ දෙයක් මේ ගරු සභාවේ මතක් කරන්නට යෙදුණා. ඒ විධියට පාලම් සාදා ගැනීමත්, වෙනත් අයිතිවාසිකම් ලබා ගැනීමත් සිදු වුණා. මඩුවන්වල දිසාව තුමාට යම් දෙයක් ලබා ගන්නට බැරි වුණා. එම නිසා ඒ පළාත බලන්නට පැමිණි ඒජන්ත තුමාට කළ දෙයක් පිළිබඳව තවමත් කථා පවතිනවා. ප්‍රදේශය බැලීමට පැමිණි ඒජන්තතුමා දෝලාවක තබාගෙන වලවේ ගඟ හරහා ගෙන යන්නට යෙදුණා. අපේ නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා (ටී. විලියම් ප්‍රනාන්දු මයා.) කීවාක් මෙන්, පපුව හරහා ඉඩ නැති වන ආකාරයට රන් පදක්කම් ගසා ගෙන සිටි ඒජන්තතුමා දෝලාවේ තබා ගෙන යද්දී "බාපියෝ" යි දිසාපතිතුමා කිව්වාම දෝලාව උසුලාගෙන ගිය උදවිය ඒජන්ත තුමා ගඟට බැවා. ගඟ හරහා පාලමක් අවශ්‍ය බව ඒ අවස්ථාවේදී ඒජන්තතුමාට පෙනී ගියා. ඒ අවශ්‍යතාවය පිළිබඳ හැඟීමක් ඔහුට ඇති වන පරිදිසි, ඔහු ගඟට බානු ලැබුයේ. එවැනි යුගයක ඇති වුණු පරිපාලන රෙගුලාසි තමයි, තවමත් තිබෙන්නේ.

ආර්. එස්. වී. පෝලියර් මයා. (පත් කරන ලද මන්ත්‍රී)

(திரு. ஆர். எஸ். வீ. போலியர்—நியமன அங்கத்தவர்)

(Mr. R. S. V. Poulier—Appointed Member)

They were carried on crossed hands, not on palanquins, and the hands were loosened.

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

ගරු සභාපතිතුමනි, අපේ පත් කරන ලද පෝලියර් මන්ත්‍රීතුමා ඒ කථාව මට වඩා හොඳට විස්තර සහිතව රසවත් විධියට කිසියම් දවසක මේ ගරු සභාවේදී කියනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

මේ පරිපාලන රෙගුලාසි අයිති එවැනි යුගයකටයි. මේ 282 වැනි රෙගුලාසිය කියවා බලන්න. මේ ගැන කීප වරක්ම මතක් කර ඇති. එහෙත් තවමත් සංශෝධනය කර නැහැ. එදා තුබුණු වචනමයි, තවමත් තිබෙන්නේ. මේ තෑගි භාර ගැනීම පිළිබඳ රෙගුලාසියයි.

Presents from chiefs or other persons, which cannot be refused without giving offence, must be handed over to the Permanent Secretary to the Ministry.

කලින් සඳහන් කර තුබුණේ ආණ්ඩුවේ ප්‍රධාන ලේකම් තැනට දෙන ලෙසයි. නමුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සෝල්බරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් පසුව ස්ථාවර ලේකම්තුමාට දෙන ලෙස සඳහන් කර තිබෙනවා. වචනයක් පමණයි, වෙනස් කර තිබෙන්නේ. නමුත් රජයේ නිලධාරීන්ට තෑගි භාර ගැනීම ගැන සාමාන්‍ය තහනමක් තිබෙනවා. මෙහි "චීfජ්ස්" කියා තිබෙන වචනයේ තේරුම මොකක්ද?

Presents from chiefs or other persons which cannot be refused without giving offence.....

මේ පිළිවෙල කැප්ටන් කුක්ගේ කාලයට අයිතියි. 19 වැනි ශත වර්ෂයේදී "චීfජ්ස්" කියන වචනය පාවිච්චි කෙළේ ඒ විධියටයි. අධිරාජ්‍ය යුගයෙන් ලැබී තිබෙන මෙම ග්‍රන්ථය වහාම වෙනස් කළ යුතුයි. 1956 සිට මෙය කරන බවට එදා තුබුණු රජය භාර ගත්තා. නමුත් අතරින් පතර යම් යම් වගන්ති වෙනස් කරමින් තවමත් මෙය තබා ගෙන යනවා. මේ නිසා ආණ්ඩුවේ සේවකයන් දුකින් පෙළෙනවා.

ගරු සභාපතිතුමනි, වරින්වර වෙනස් කළ දේවල් අතර පඩි සහිත වෛද්‍ය නිවාඩු පිළිබඳ කාරණයද එකක්. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා ආයුර්වේද වෛද්‍ය සහතික පිළිගැනීම පිළිබඳව විස්තර සහිතව කරුණු ප්‍රකාශ කළා. ආයුර්වේද වෛද්‍ය සහතිකයක් වලංගු වන්නේ දින 14ට පමණයි. ඊට වැඩි කාලයකට වලංගු නැහැ. මෙසේ කර ඇත්තේ මොන කාරණයක්ද කියා මට තේරෙන්නේ නැහැ. ආයුර්වේද වෛද්‍යවරයන්ගේ දැනුම දවස් 14 ට පමණක් සීමා වී තිබෙන හෙයින්ද මෙසේ කර තිබෙන්නේ? එසේ නැත්නම් දින 14 ට සීමා වුණු අසනීප විශේෂයක් තිබෙන හෙයින්ද? ඒ අසනීප විශේෂය ගැන පමණද ආයුර්වේද සහතික බලපවත්නේ? මේ තීරණයට බැස්සේ කොහොමද? දකුණු කොළඹ පළමුවැනි ගරු මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) මුදල් ඇමති නිලය දැරූ කාලයේදී, සහනයක් දෙනවායයි කියමින් දුන් දෙය තමයි, මේ. ආයුර්වේද වෛද්‍ය සහතික භාර ගැනීමට කළ ඉල්ලීම අනුව දින 14 ට පමණක් එම සහතික වලංගු කොට එම ඉල්ලීම ඉටු කළා. තවමත් තබාගෙන තිබෙන්නේ ඒකයි. මේක පැහැදිලි කර ආණ්ඩුවේ සෑම දෙපාර්තමේන්තු ප්‍රධානයකුටම දන්වන ලෙස මම මේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා. අසනීප සඳහා පඩි සහිත නිවාඩු වශයෙන් ගන්න පුළුවන් දින ගණනක් තිබෙනවා. ඒ දින ගණන අවසන් වුණාට පසු ඇත්ත වශයෙන්ම තව දුරටත් අසනීපයෙන් ගෙදර සිටින්න සිදු වෙනවා නම්, පඩි බාගයක් ඇතිව නිවාඩු ගන්න පුළුවන් දින ගණනක් තිබෙනවා. ඒ කාල සීමාවත් ඉක්මවා ගෙදර සිටිනවා නම්, ඇත්ත වශයෙන්ම අසනීපයකුත් තිබෙනවා නම්, පඩි නැතිව නිවාඩු දෙනවා. නමුත් අපේ නිලධාරි මහත්වරු මොකක්ද කරන්නේ? දින 14 ක් පැන්නට පසු— එසේ නැත්නම් පඩි සහිත නිවාඩු දෙන්න වුවමනාය කියන විධියේ වෛද්‍ය සහතිකයක් නොලැබුනොත්—තමන්ගේ කැමැත්තෙන්ම තමන්ගේ නිලය අත්හැර ගියාය යන නිගමනයටයි බහින්නේ.

දින 14 කට ආයුර්වේද වෛද්‍ය සහතිකයක් දෙනවා. රජයේ සේවයෙක් රෝගාතුරව දින 21 ක් ගෙදර සිටියායයි සිතමු. එසින් දින 14 කට ආයුර්වේද වෛද්‍ය සහතිකයක් දුන්නා. ඉතිරි දින 7 ට ආයුර්වේද වෛද්‍ය සහතිකයක් දුන්නත් පිළිගන්නෙ නැහැ. ඇත්තටම ඒ තැනැත්තා ඒ දින 7 ඇතුළත අසනීපයෙන් සිටියාද යන්න සලකන්නෙ නැතිව, ඔහු නිලයෙන් ඉල්ලා අස් වුණු හැටියට සලකනවා. මේක යටගිය දවස බරණැස් නුවර සිදු වුණු සිද්ධියක් නොවෙයි. මේ ලංකාවේ අද සිදු වන දෙයක්.

මේ කාසල් වීදියේ ආරෝග්‍යශාලාවේ හෙදියක් මා හමුවීමට ආවා. ඇට සිදු වී තිබුණේ කොළඹ නගර සභාවේ ආයුර්වේද වෛද්‍යවරයකුගෙන් වෛද්‍ය සහතිකයක් අරගෙන සථානය භාර නිලධාරි තැනට දීමටයි. ඈ මාසයක් අසනීපයෙන් සිටියා. ඒ මාසය කෙළවර වූ පසු දින 4 කට වෛද්‍ය සහතිකයක් ලැබුණේ නැහැ. ඇය ඒ නාගරික බෙහෙත් ශාලාවෙන් නොව වෙන පෞද්ගලික වෛද්‍යවරයකුගෙන් ඒ වෛද්‍ය සහතිකය ලබාගෙන භාර දුන්නා. ඊට පසු ඈ මහා ආරෝග්‍යශාලාවේ චිකිත්සාගාරයට ගොස් පෙනී සිටි විට එහි සිටි හෘදයාබාධ පිළිබඳ විශේෂඥයා මේ හෙදිය පරීක්ෂා කර බලා මැය ගර්භනී අවස්ථාවක සිටිනවා ය, හෘදයාබාධයකින් පෙළෙනවාය, ඒ නිසා මම ඇයට තව මාසයක් නිවාඩු දෙනවාය කියා ලියා යැව්වා. ඒ ලියමන ලැබෙන්ට මත්තෙන් මේ හෙදිය රක්ෂාවෙන් ඉල්ලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා]

අස් වූ හැටියට සලකන බව දන්වා රක්ෂා වෙන් පහ කිරීමේ නියෝගයක් යවා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ ගැන මා වෛද්‍ය දෙපාර්තමේන්තුවෙන් ඇසුවාම කීවේ මාස යක් නිවාඩු දී එවූ සහතික පත්‍රය වලංගු නැත, මෙය ලැබෙන විට ඇය සේවයෙන් අස් කර අවසානය, කියායි. ඒ වෛද්‍ය සහතිකය අනුව මේ දුප්පත් ස්ත්‍රියට කලිනුත් අසනීප සහිත තත්ත්වයක් තිබුණු බව පිළිගන්න බැරිද, ඒ නිගමනයට බැසීමට මේ වෛද්‍ය සහතිකය ප්‍රමාණවත් නැද්ද, කියා මම ප්‍රශ්න කළා. ඒ නිගමනයට බහින්න බැරි නම් තමුන්නාන්සේ කියන්නේ අර දුප්පත් සත්‍රිය විශෙෂඥ මහත්මයාගේ කාමරයට ගිය වෙලාවේ ගර්භනී බවට පැමුණුනාය යන්නද, කියා මම ප්‍රශ්න කළා. එවැනි නිගමනයකට බහින්නවා නම් මිස නිවාඩු දෙන්න බැරි ය කියන්නේ කෙසේදැයි මා ඇසූ විට, ඒ වැරැද්ද හරි ගස්සා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වුණු බව මම කියන්න සතුටුයි. සමහර විට වැරැද්දක් සිදු වුණාම හරිගස්සා ගන්න පුළුවන් තත්ත්වයක් අද තිබෙනවා. ඒ හෙදියට ආපසු රක්ෂාව දී තිබෙන බව ආරංචියි.

නමුත් මේ විධියට මේ කරුණ ගැන සලකා බලන්න කී දෙනෙකුට පුළුවන්ද? සමිති සමාගම් තිබෙන බව ඇත්තයි. සමිති යකින් මේවා ඉදිරිපත් කළ විට සලකන්නේ නැහැ. එවිට කියන්නේ පෞද්ගලික ප්‍රශ්න ගැන සමිතියකට ඉදිරිපත් වන්න බැරි බවයි. සමහර දෙපාර්තමේන්තු නිලධාරීන් පරණ හන මිටිකාර අදහස් තමයි තවමත් දරන්නේ. පෞද්ගලික කරුණු ගැන විනයානුකූල කරුණු ගැන, සමිතියකට ඉදිරිපත් වන්ට අයිතියක් නැතිලු. මේ පොත ඉක්මනටම පුලුස්සා දැමූ තරමට සහනයක් ලැබෙනවායයි අප කියන්නේ ඒනිසයි. ඒ වෙනුවට අමුතු රෙගුලාසි මාලාවක් සදන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, එපමණක් නොවෙයි, මුදල් රෙගුලාසි ගැනත් සඳහන් කළ යුතුයි. අපේ විරුද්ධ පාර්ශ්වයේ ගරු නායකතුමාගේ පියා අගමැති නිලය දැරූ කාලයේදී භාණ්ඩාගාරයේ නිලධාරී මහත්මයකු ගැන එතුමා කී කරුණක් මට මතකයි. යමකුට යමක් දෙන්න ඕනෑ වුණාම ඒ නිලධාරී මහත්මයා වම් සැක්කේ ලාච්චුව ඇරලා එය දිය යුතු බවට මීට පෙර සිදු වූ යම් සිද්ධියකින් සාක්ෂි ඔප්පු කර නවාලු. යම් දෙයක් නොදෙන්න වුවමනා නම් දකුණු පැත්තේ ලාච්චුව ඇර ඒ පැත්තෙන් එය නොදීමට නීතියක් ගෙන පෙන් වන්න පුළුවනි. මේ විධියට දෙපැත්තෙන්ම පෙන්වන්න පුළුවන් ආකාරයේ නීන්දු තිබෙනවා; රෙගුලාසි තිබෙනවා. ඇත්තෙන්ම මේවා තෝරා බේරා ගැනීම වනාන් තරයක් මැදින් පාරක් සොයා ගැනීමටත් වඩා අමාරුයි.

ගරු මුදල් ඇමතිතුමා කිව්වා—අපි ඊට කලින් කියා තිබෙනවා—අද තිබෙන ආදායම් බදු පිළිබඳව.

අ. භා. 6

සභාපතිතුමා

(அக்கிராசனர்)

(The Chairman)

දැන් කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

සභාපතිතුමනි, ආදායම් බදු නීතියට නොයෙක් වර එකතු කරන ලද සංශෝධන අණ පනත් හා නීති කැබලි නිසා කෙනකු ගෙවිය යුතු බද්ද කොපමණදැයි සොයා ගැනීම දැන් ඉතා අමාරුයි. ඊටත් වඩා අන්තයි, මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍ර ලේඛන. පෙන්ෂන් අයිතිවාසිකම් පිළිබඳව තිබෙන ලේඛනයත් ඒ වාගේමයි. මේවා සියල්ලම බලා නිගමනයකට බසින විට ඕනෑම රජයේ සේවකයෙක් පිස්සෙක් වෙනවා. ඒ සම්බන්ධයෙන් ඊට වඩා යමක් මා කියන්ට යන්නේ නැහැ.

වහාම සලකා බැලිය යුතු විශෙෂ කරුණු කීපයක් තිබෙනවා. අස්පිර තත්ත්වයේ සිටින අනියම් සේවකයින්ට සහනයක් දෙන්ටයයි ආණ්ඩුවේ කම්කරු සමිති සම්මේලනය 1956 අවුරුද්දේ සිට ඉල්ලීම් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අවුරුද්දේදී ඒ පිළිබඳව ආණ්ඩුවට කන්නලව්වක් ඉදිරිපත් කළ නමුත් ඉන් සහනයක් නොලැබුණු නිසා 1957 නොවැම්බර් මාසයේදී ආණ්ඩුවේ කම්කරු සමිති සම්මේලනයේ නායකත්වයෙන් විශාල වැඩ වර්ජනයක් ඇති කළා. ඊට පසු ගරු අගමැතිතුමා ඔවුන් සාකච්ඡාවකට කැඳෙව්වා. කැඳවා ඒ සම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බන්ධයෙන් සහනයක් දෙනවායයි කිව්වා. ඒ පොරොන්දුව අනුව 1957 දෙසැම්බර් මාසයේදී අංක 421 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය නිකුත් කළා. 361 වන චක්‍ර ලේඛය සංශෝධනය කළා. ඒ අනුව තාවකාලික සේවයේ සිටි අනියම් සේවකයින්ට ස්ථිර තත්ත්වයක් ලබාගන්න පුළුවන් සහනයක් ලැබුණා. 421 වන චක්‍ර ලේඛයෙන් කම්කරු කොටස්වලටත් එම සහනය දුන්නා. ඒ අනුව හය මාසයක සේවයක් තුබුණු අය තාවකාලික මාසික පඩි ලබන තත්ත්වයට මාරු කළා. ඉන් පසු පස් අවුරුද්දක සේවයක් තිබෙනවා නම් ස්ථිර තත්ත්වයක් දෙනවායයි කිව්වා. නමුත් ඒ ස්ථිර තත්ත්වය ලැබෙන්නේ පෙන්ෂන් අයිතිවාසිකම් ඇතිව නොවෙයි. මේ පිළිබඳව එදා සිටි මුදල් ඇමති ස්ටැන්ලි ද සොයිසා මහත්මයා ආණ්ඩුවේ කම්කරු සමිති සම්මේලනය සමඟ දෙසැම්බර් 19 වැනිදා කළ සාකච්ඡාවකදී ප්‍රකාශ කළා, ඒ පස් අවුරුද්ද ඉකුත් වන විට පෙන්ෂන් අයිතිවාසිකම් දෙනවාය කියා. ඊට පසු ඒ පොරොන්දුව කැඩුවා. "මා ඒ පොරොන්දුව දුන්නේ භාණ්ඩාගාරයත් සමඟ සාකච්ඡා නොකරයි; ඒ නිසා ඒ පොරොන්දුවට මා බැඳ තබන්න කිසිම විධියකින් තැත් කරන්න එපා" යයි මුදල් ඇමතිතුමා කම්කරු සමිති සම්මේලනයට කියා සිටියා. මුදල් ඇමතිතුමකු ඒ විධියේ තත්ත්වයකට වැටීම ඉතාමත් කනගාටුදායකයි. මේ පිළිබඳව කරුණු ඔප්පු කරන්න වුවමනා නම් අවශ්‍ය වාර්තා තවමත් ඒ සමිතිය සතුව තිබෙනවා.

පෙන්ෂන් අයිතිවාසිකම් ගැන එදා දිවංගත අගමැතිතුමාට කියාගෙන එන අතරයි, අපේ ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) අගමැති වූයේ. මොකක්ද එතුමා කළේ? අද නම් රජයේ සේවකයන් ගැන බොහෝම විශාල අනුකම්පාවක් දක්වා, හිතේ තෙත් ගතියක් දක්වා, ඇස් දෙකෙහිද තෙත් ගතියක් ඇතිව, කථා කරනවා. නමුත් 1959 නිකුත් කළ 508 වන භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් 421 වන චක්‍ර ලේඛයෙන් යමක් දුන්නා නම් ඒ සියල්ලම සම්පූර්ණයෙන්ම නැති කර දැම්මා. ඒ නිසා යම් වැඩකටයුතු කියා ගත් සේවකයින්ට අවුරුදු 10 ක් ගත වුවත්, මේ 421 වන චක්‍ර ලේඛය වලංගු වන්නේ නැහැ. ඒ ලේඛය යටතේවත් සමඟම දෙපා තීමේන්තුවල ප්‍රධානීන්ට කීවා, අස්ථිර කම්කරුවන් සිටිනවා නම් ඒ අය හය මාසය සම්පූර්ණ කරන්න පෙර, දවසකින්වත් හය මාසය පනින්ට ඉඩ නොදී ඔවුන්ගේ සේවය කඩන්නය කියා. එයින් සිදු වුණේ හය මාසයක සේවය අවසන් කර මාස් පඩි ලබන තාවකාලික සේවකයන්ගේ තත්ත්වයට පරිවර්තනය වන්නට සිටි අය ඊට පෙර අස් කර දමනු ලැබීමයි. මෙය වංචාවක් නොවේදැයි මා අහනවා.

දැන් මේ දෙපාර්තමේන්තුවල සිටින එම සේවකයන්ට එවැනි සහනයක්වත් ලැබෙන්නේ නැහැ. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කම්කරුවන් අස් කරනවා. ඔවුන් අස් කරන්නේ වැඩ නැති නිසාය කියන නමුත් තිබෙන වැඩ කොන්ත්‍රාත් කරුවන්ට දෙනවා. මේ සම්බන්ධයෙන් මා ගරු මුදල් ඇමතිතුමාගෙන් ඇසුවාම එතුමා කීවේ මොකක්ද? අප මීට කලින් ඉදිරිපත් කළ ඉල්ලීමක් ඉටු කරන්න යනවාය කියා කළේ කුමක්ද? කැඳුවල් හැටියට ඉන්න කම්කරුවන්ගේ විශේෂ හමුදාවක් ඇති කර ඒ අයට රක්ෂාව දෙනවාය කියනවා. එසේ කළාට පමණක් මදි. ඒ අය රක්ෂාවක් ලැබෙන තුරු ජීවත් වන්නේ කොහොමද? "ස්ටැන්ඩ්බයි" පඩිය කියා වරායේ දෙන ක්‍රමයට ජීවත් වීම සඳහා අඩුම වැටුපක් දෙන තුරු මේ වැඩ හරි යන්නේ නැහැ. මා මේ කරුණු විශේෂයෙන්ම මතක් කර සිටින නමුත් ඒ සම්බන්ධයෙන් වහාම සහනයක් දෙන බවට ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මේ අවස්ථාවේ හැටියට කෙළින් පිළිතුරක් බලාපොරොත්තු වන්නේ නැහැ. එය ආණ්ඩුවේ පුළුල් ප්‍රතිපත්තියක් හැටියට සලකා අනෙකුත් ගරු ඇමතිවරුන් සමඟ සාකච්ඡා කර කළ යුතු දෙයක් නිසා ඒ සම්බන්ධයෙන් වහාම සහනයක් දෙන බවට පොරොන්දුවක් බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් එකක් බලාපොරොත්තු වෙනවා. මේ කරුණු සම්බන්ධයෙන් වහාම සහනයක් ලබා දෙන පිණිස කැබිනට් මණ්ඩලය තුළ සටනක් ගෙන යනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

ඇත්තෙන්ම වෘත්තීය සමිතිවලට ගරු දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා දකුණු අතින් යමක් දුන්නා නම්, මේ ආණ්ඩුව වම් අතින් ඒ දෙය ආපසු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොසිසා මයා.]

ඔන්න ආකාරයට ක්‍රියා කරගෙන යන බව පෙනෙනවා. සාකච්ඡාවලට කැඳවූවාම මට ඒ සම්බන්ධයෙන් කරුණු පෙන්වන්න පුළුවනි. ඊට පෙර ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ගැන වචනයක් කියන්න ඕනෑ. එතුමා නම්, වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරන්න කවදත් ලැස්තියි. යම් යම් දුක්ගැනවිලි ගැන මතක් කළ අවස්ථාවලදී දෙපාර්තමේන්තුවලින් කැඳවන්නේ නැත්නම් මම කැඳවන්නම්, යනුවෙන් එතුමා ප්‍රකාශ කළ බව මතක් කරමිනුයි මා මෙය කියන්නේ.

වෘත්තීය සමිති නියෝජිතයන් සමඟ සාකච්ඡා පැවැත්වීම සම්බන්ධයෙන් අද ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල දැඩි විරුද්ධත්වයක් තිබෙනවා. අපේ ඉඩම් ඇමතිතුමා යටතේ තිබෙන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සමිති කීපයක් සම්බන්ධව මට දොස් කියා තිබෙනවා. විදුලි බල දෙපාර්තමේන්තුවේ සාකච්ඡාවලට ඉඩ දෙන්නේ නැහැ. ජනසතු සේවා අමාත්‍යාංශය යටතේ තිබෙන පෝට් කොමිෂන් හෙවත් වරාය කොමිෂන් සභාවේ ප්‍රධානීන් මේ සම්බන්ධයෙන් විශාල මැළිකමක් දක්වනවා. කලින් නියම කරගත් දේවල් ඉෂ්ට කරන්න බැහැ කියනවා. එපමණක් නොවෙයි, තවත් ආයතන තිබෙනවා. විශේෂයෙන්ම ඉඩම් ඇමතිතුමා එතුමාගේ දෙපාර්තමේන්තුවල සිටින නිලධාරීන් පිළිබඳව ඒ අයට මුහුණ පාන්ට සිද්ධ වී තිබෙන අමාරුකම් ගැන සැලකිල්ලක් දක්වනවාය කියන කරුණ උඩ සමහර නිලධාරීන් අයුතු ප්‍රයෝජනයක් ගන්නවා. ඒ අය දැන් කම්කරුවන්ටයි පහර දෙන්න පටන් අරන් තිබෙන්නේ.

සෞඛ්‍ය අංශයේ පාර්ලිමේන්තු ලේකම්තුමාට මේ කරුණ විශේෂයෙන් කියන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් එතුමාගේ අමාත්‍යාංශය අමුතු ප්‍රතිපත්තියක් යොදා ගත්තා. හරියට ක්‍රියාවේ යෙදෙනවා නම් බොහොම හොඳයි. වෘත්තීය සමිති සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න විශේෂ නිලධාරියකු පත් කළා. පෙර ඒ නිලධාරි මහත්මයා පසු කරගෙනයි ගරු ඇමතිතුමා වෙත යා යුතුව තිබෙන්නේ. මේ නිලධාරියා තමයි මේ ආණ්ඩුව වෙනුවෙන් පිළිතුරු දෙන්නෙ. දක්ෂ කෙනකු පත් කරනවා නම් කමක් නැහැ. පත් කරනු ලැබ සිටින ඒ නිලධාරියාගේ රක්ෂාව නැති කරන ලෙස මා කියනවා නොවෙයි. මොනම විධියකින්වත් කොයිම නිලධාරියකුගේවත් රක්ෂාව නැති වී යනවා දකින්න මා කැමති නැහැ. එහෙත් එක් උදාහරණයක් පමණක් ඉදිරිපත් කරන්න කැමතියි. හෙදි අධ්‍යාපනයේ යෙදී සිටින එම කොටස එම නිලධාරි මහතා සමඟ සාකච්ඡා කළා. ඒ අවස්ථාවේදී දෙපාර්තමේන්තුවේ තිබෙන්නාවූ යම් යම් අක්‍රමිකතාවන් පෙන්නුම් කර දුන්නා. නිලධාරීන් මාරු කිරීම්, ඉහළ තත්ත්වයට පත් කිරීම්, යනාදි නොයෙක් දේ පිළිබඳව කරුණු ඉදිරිපත් කළ අවස්ථාවේදී ලැබුණු පිළිතුර කුමක්ද? "මේවා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නියම කර තිබෙන දේවල්. ඒ නිසා අපි කොහොමද මේවාට වග කියන්නේ?" කියා එම නිලධාරියා ඇසුවා. ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තු ලේකම්තුමා මෙන්ම අපද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කටයුතු කෙරෙන්නේ කොයි ආකාරයටද කියා හොඳාකාර ලෙස දන්නවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාව යම්කිසි දෙයක් පිළිබඳව තීරණයකට බසින්නේ ඇමතිතුමාගේ මෙන්ම දෙපාර්තමේන්තුවේද අදහස් ස්ථිර ලේකම්තුමාගේ මාර්ගයෙන් දැන ගැනීමෙන් පසුව නොවේද? එසේ නම් කලින් මේ මේ විධියට කටයුතු කරන්නය කියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට දැනුම් දී ඊට පසුව, ඒ අන්දමට ක්‍රියා කළායින් පසුව, යම් යම් පැතිවලින් පහර වදින විට "අපේ වැරැද්දක් නෙමෙයි; මේක රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වරදක්" කියා කියන්නේ කොහොමද?

ගරු සභාපතිතුමනි, මම පාර්ලිමේන්තු ලේකම්තුමාට දොස් කියන්නේ නැහැ. මේ ක්‍රමයේ තිබෙන වරදයි මා පෙන්වා දෙන්නේ. ඔකත් වෘත්තීය සමිතියකට දිය යුතු පිළිතුරක්ද? ඒ විධියේ පිළිතුරු දී ඔවුන්ගේ ඕත් කැඩී ගොස්, කලකිරීමට පත් වුණායින් පසුව, ඔවුන් කලින් තමන්ගේ සේවය කෙරෙහි දැක්වූ උනන්දුව නැති වී යාම ගැන ඔවුන්ට දොස් පවරන්නට පුළුවන්ද? මේ විධියේ කරුණු 24 කට වඩා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට මට දැනුම් දෙන්න පුළුවන්. ආණ්ඩුවේ කම්කරු සමිති සම්මේලනය යටතේ සංවිධානය වී තිබෙන සමිති මගින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සාකච්ඡාවක් කිරීමේ අවස්ථාවක් ඉල්ලා සිටි නමුත් තවමත් එය ලැබුණේ නැහැ. ඒ නිසා මේ ආදී කාරණා ගැන ඔවුන් කලකිරීමට පත් වූවායින් පසුව ඔවුන්ගේ සේවය කෙරෙහි ඔවුන් උනන්දුවක් දක්වාවිය කියා බලාපොරොත්තු විය හැකිද?

ඔන්න ඔය තත්ත්වයටයි අද දින ආණ්ඩුවේ සේවකයන් වැටී සිටින්නේ. බඩු මිළ ඉහළ යාම නිසා, ලැබුණු දහහතහමාරද කිසිම වැදගම්මකට නැති තත්ත්වයක් ඇති වී තිබෙනවා. එවැනි තත්ත්වයකට වැටී සිටින සේවකයන්ට, දේශපාලන අයිතිවාසිකම් නොමැතිව සිටින සේවකයන්ට පඩි කොමිෂන් සභාවෙන් සහනයක් ලැබෙවිය යන බලාපොරොත්තුවෙන් සිට එයද නොලැබුණු ආණ්ඩුවේ සේවකයින්ට, මේ ගරු සභාවේ සිටින සමහර ගරු මැති ඇමතිවරුන් ඒ අය කම්මැලියන්ය, රජයේ සේවකයන්ගේ පඩි නඩි සඳහා ආණ්ඩුවේ ආදායමෙන් වැඩි කොටසක් අපට වැය කරන්නට බැරිය, යන චෝදනා එල්ල කරනවා නම් එය බරපතළ අපරාධයක් නොවේද කියා මා තමුන්නාන්සේලාගෙන් ප්‍රශ්න කර සිටිනවා.

ගරු සභාපතිතුමනි, කුමන දේශපාලන පක්ෂයක් හෝ අපි අනුගාමිකයන් සොයා ගෙන අසුවල් කොටස වෙත යනවාය යන ප්‍රතිපත්තිය උඩ වැඩ කිරීම ගැන, තමන්ගේ දේශපාලන පක්ෂ තර කිරීමට කටයුතු යෙදීම ගැන, අපි විරුඬ වන්නේ නැහැ. එය ඒ ඒ දේශපාලන පක්ෂවලට අයත් ප්‍රශ්නයක්. නමුත් ආණ්ඩුවක් වශයෙන්, ජනතාවගේ අසුවල් කොටස දෙස අප බලන්නේ නැත, අසුවල් කොටස බලා ගන්නවාය කියා කියනවා නම් එවැනි ආණ්ඩුවකට යුක්ති සහගතව ක්‍රියා කරන්නවායයි අපට කියන්නට පුළුවන්ද? ගැමි ජනතාව කෙරෙහි අප තුළ කිසිම ඊර්ෂ්‍යාවක් නැහැ. බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශත වර්ෂාධික කාලයක් තිස්සේ ගැමි ජනතාවට බලවත් දුක් විඳින්නට සිදු වූ බව ඇත්ත තමයි. නමුත් ඉන් පසුව කුමක්ද සිදු වුණේ? මේ රටට සර්වජන ඡන්දය ලැබීමෙන් පසුව සෑම ආණ්ඩුවක්ම ක්‍රියා කළේ ගැමි ජනතාවගේ ප්‍රශ්න නියමාකාරයකට විසඳන්නට නොව, ඔවුන්ව ඡන්ද වාරය තුළදී තාවකාලික තෘප්තියකට පමුණුවා, පිට ඔප වැටෙන යම් යම් කාරණා පමණක් පෙන්වා, එවැනි මායාවලින් ගැමි ජනතාව රවටා ඡන්දය ලබා ගැනීමටයි. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවත් අවුරුදු 9ක් තිස්සේ ගැමි ජනතාව කෙරෙහි විශාල අනුකම්පාවක් දක්වමින් කටයුතු කළා. එප මණක් නොව එම පක්ෂයේ ආදී කතීෘවරයා වූ ඩී. එස්. සේනානායක මහතා කීවේ කුමක්ද? "ගැමි ජනතාව මගේම පිරිසක් හැටියටයි, මා සලකන්නේ" කියායි එදා එතුමා කීවේ. මාත් ගැමියන්ගේ පැත්තටමයි වැඩ කරන්නේ කියා කථා කළාට මොකද කළේ? මධ්‍යම පාඨශාලා කීපයක් දුන්නා. ආරෝග්‍යශාලා කීපයක් දුන්නා. බඩු අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් වැඩිපුර මුදලක් ගෙවා එලවළු අරගෙන ඒවා ඊට අඩු මිලට ඇතැම් ස්ථානවලට දීමට කටයුතු සලස්වා ආණ්ඩුවට පාඩුවක් කළා. මේ විධියේ දෙවලින් දුප්පත් ගැමි ජනතාව සතුටු කරන්න බැහැ. ගැමියාට මුහුණපාන්නට සිදු වී ඇති මූලික ප්‍රශ්නයි විසඳන්න වුවමනා කරන්නේ. ඔවුන් දරිද්‍රතාවයෙන් මුදවා ගන්න පුළුවන් අන්දමේ වැඩයි කරන්න වුවමනා කරන්නේ. අස්වැන්න වැඩි කෙරෙන ආකාරයට වැඩ කිරීම සඳහා ගැමියාට ඉඩම් පිළිබඳව නියම අයිතියක් දෙන්න ඕනෑය කියා කල්පනා කළාද? ගොවිතැන් වැනි කටයුතු කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය කරන උපකරණ ආදිය සපයා දීම වැනි ආඩාර කිරීමට කල්පනා කළාද? ගැමියා ණයගැති භාවයෙන් බේරා ගැනීමට කල්පනා කළාද? නැහැ. ගම්වල රක්ෂා නැතිකම තදින් බලපානවා. සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ රක්ෂා නැතිකම විසඳන්නට වුවමනා කරන සංවර්ධන වැඩ පිළිවෙළවල් ක්‍රියාවේ යොදවන්න කල්පනා කළාද? නැහැ. ඒවා ගේම ගැමියන් අතර කාර්මික දියුණුවක් ඇති කිරීම සඳහා නියම වැඩ පිළිවෙළක් ආරම්භ කළේ නැහැ. එසේ නොකොට දුප්පත් ගැමියන් එම තත්ත්වයෙන්ම තියාගෙන ඔවුන්ගේ දුප්පත්කම තර්කයක් හැටියට පාවිච්චි කර රජයේ සේවකයන්ට නියම ආකාරයට පඩි නොගෙවන්න තීරණය කිරීම අසීලාචාර වැඩක් නේද කියා මා ප්‍රශ්න කරනවා.

ගැමි ජනතාවගේ දුප්පත්කම තර්කයක් හැටියට පාවිච්චි කර කථා කරන්න තරකයි. රජයේ සේවකයන්ට ගෙවන්නේ පිං

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

පඩියි කියා සිතනවාද? ඉහළ සිට පහළ දක්වා සිටින සෑම සේවකයෙක්ම පිං පඩිය ලබන්නේ, ඔවුන් වැඩ කරන්නේ නැද්ද, ඔවුන් කරන වැඩවල වටිනාකම මොකක්ද, ඒ ගැන නියම විධියට තක්සේරු කර බලා තිබෙනවාද, රටේ ආදායම වැඩියෙන් ඇති කරන්නේ කුමන කොටස්ද, මේ ධනය බිහිවන්නේ කොහෙන්ද, යනාදී කරුණු ගැන සොයා බැලුවාද? අප නියම විධියට කියනවා නම් මේ ධනය වැඩි වශයෙන් නිපදවන්නේ වතු කම්කරුවන් විසිනුයි. වැඩි වශයෙන් ඔවුන් අතිනුයි ධනය බිහි වන්නේ. එම ධනයෙන් කොටසක්වත් ඔවුන්ට ලැබෙනවාද? එවැනි ධනයකින් කොටසක් ලැබෙනවා තබා එවැනි ධනයක් නිපදවන කොටසකට ලැබිය යුතු වරප්‍රසාද වලින් කොටසක්වත් ඔවුන්ට නොලැබෙන බව කියන්නට ඕනෑ. වතු කම්කරුවන් සිටිනුයේද වහල් භාවයට පත්වෙලයි.

ගරු සභාපතිතුමනි, රටක් දියුණු කිරීම සඳහා දේශීය ආදායම් යොදවන විට එක්තරා කොටසක් දෙසම බලා ගෙන නොවෙයි කටයුතු කළ යුත්තේ. දියුණු කළහැකි ව්‍යාපාර ගැන සොයා බලා ඒ මගින් රට දියුණු කර කාටත් සුභසිද්ධියක් ඇති වන ආකාරයට වැඩ පිළිවෙළ සකස් කළ යුතුයි. එසේ නැතිව දෙශපාලන වශයෙන් තමන්ට ප්‍රයෝජන ලැබෙන කොටස්ම තර කරනවාය, අනික් කොටස් දෙස බලන්නේවත් නැත, කියන හැඟීම උඩ කිරීම නියම ප්‍රතිපත්තිය වන්නේ නැහැ. ගැමියන් ගැන ඊර්ෂ්‍යාවට පත් වන්න කාටවත් වුවමනාවක් නැහැ. ගැමි ජනතාව තවමත් දුඃඛිත භාවයෙන් පෙළෙනවා. එවැනි ගැමි ජනතාවකට සීනි බෝල කවා ඡන්ද ලබා ගන්න වැඩ කිරීම වැරදියි. ඉම හත් දුඃඛිත භාවයෙන් පෙළෙන ගැමි ජනතාව තමන්ගේ නිරෝගි භාවය ආරක්ෂා කර ගන්න බැරිකමින් පෙළෙනවා. තමන්ගේ බඩගිනි ප්‍රශ්නය විසඳාගන්න බැරිකමින් පෙළෙනවා. තම දරුවන්ගේ අනාගතය විසඳාගන්න බැරිකමින් පෙළෙනවා. එවැනි ජනතාවක් කෙරෙහි කවුරුවත් ඊර්ෂ්‍යාවට පත්වන්නේ නැහැ. නමුත් ඇත්තටම දුප්පත්කමින් ඔවුන් ගොඩ ගන්න වැයම් කිරීම සෑම ආණ්ඩුවක් කෙරෙහිම පැවරී තිබෙන යුතුකමක්. එවැනි දුප්පත්කමක් තර්කයක් හැටියට පාවිච්චි කර එවැන්නන්ට දිය යුතු අයිතිවාසිකම් නොදී සිටීම අශිලාචාරකමක්. අන්න ඒ අශිලාචාරකමින් බේරී කටයුතු කරන්නය කියා මා මෙම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

ගරු මන්ත්‍රීතුමාට වචනයක් කියන්න කැමතියි. මේ වැය ශීර්ෂය වෙනුවෙන් පැය ගණනාවක් ගත වී තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

ගරු සභාපතිතුමනි, පක්ෂ නායකයෙක් පැය එක හමාරක් කථා කළා. ඒ ගාල්ලේ ගරු මන්ත්‍රීතුමායි.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

ඒක තමුන්නාන්සේලාගේ කැමැත්තක්. මා මේ කාරණය මතක් කළේ තමුන්නාන්සේලාගේ දැන ගැනීම සඳහායි. මේ ගැන කොයි තරම් කථා කළත් කමක් නැහැ. නමුත් සම්මත කරගන්නට තිබෙන්නේ එකම වැය ශීර්ෂයක් පමණක් නොවන බව කල්පනාවට ගත යුතුයි.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ ඇත්තටම මෙම ගරු සභාවේ සිටින මන්ත්‍රීවරුන්ට දක්වන ආදරය නිසා එසේ කථා කරනවාය කියා මම බලාපොරොත්තු වෙනවා. තමුන්නාන්සේ කාටත් අනුකම්පාවෙන් සෑම ගරු මන්ත්‍රීවරයකුගේම කථා කිරීමේ නිදහස ආරක්ෂා කර දීම පිණිස එවැනි නියෝගයක් දුන්නාය කියා මම භාර ගන්නවා. එම නිසා මගේ කථාව මම ඉතාමත්ම කෙටි කරන්න බලා පොරොත්තු වෙනවා.

මෙම වැය ශීර්ෂය යටතේ කියන්න තිබෙන කරුණුවලින් වැඩි කොටසක් මම විස්තර කර අවසානයි. අන්තිම වශයෙන් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලිය යුතු ඉල්ලීමක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම මෙම පඩි වාර්තාවේ තත්ත්වය ඉතාමත්ම කනගාටු දායකයි. එම කොමි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉන් සභාවෙන් බලාපොරොත්තු වූ අයුරින් පඩි වැඩි වීමක් සිදු වී නැහැ. දෙන්න බලාපොරොත්තු වූ දේ පවා ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ අද තිබෙන මුදල් තත්ත්වය අනුව දෙන්න බැරිය කියන වචනයක් ගරු මුදල් ඇමතිතුමාගෙන් පිට වුණා. ඒ නිසා එක පැත්තකින් ජීවන වියදම ඉහළ ගොස් තිබෙනවා. අනික් පැත්තෙන් බලාපොරොත්තු වූ පරිදි පඩි වැඩිවීමක් ලැබී නැහැ. මෙසේ ඔය අන්ත දෙකට මැදි වී නද වී සිටින රජයේ සේවකයන් කර පිට දැන් අමුතු බදු බරකුත් දමා තිබෙනවා. එම නිසා මේ කරුණු ගැන කල්පනා කර, ඒ සේවකයන් ගැන අනුකම්පා කර, ඔවුන්ගේ තත්ත්වය නඟා සිටුවීම පිණිස අවශ්‍ය පරිදි ක්‍රියා කළ යුතුව තිබෙනවා. රජයේ සේවකයන්ගෙන් නියම සේවයක් බලාපොරොත්තු වන්න නම්, උනන්දුවෙන් යුක්තව කරන සේවයක් බලාපොරොත්තු වන්ට නම්, මේ තිබෙන තත්ත්වයෙන් ඔවුන් ගොඩ ගැනීමට ඉක්මනින් වැඩ කළ යුතුය කියා ගරු පාර්ලිමේන්තු ලේකම් තුමාට මම නැවත වරක් මතක් කරන්න කැමතියි.

මීට වැඩි දෙයක් මේ අවස්ථාවේදී මම කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් තමුන්නාන්සේගේ මාර්ගයෙන් ගරු මන්ත්‍රීන්ට මතක් කළ යුතු තවත් විශෙෂ කරුණක් තිබෙනවා. අපේ ඉතිහාසයේ සඳහන්ව ඇති පරිදි, එදා නිදහස තකා දිවි පුදා වැඩ කළ කැප්පෙටිපොළ, පුරන් අප්පු, ගොන්ගාලේගොඩ බණ්ඩා, වැනි අයගෙන් පැවතෙමින්, මෙම වත්මන් යුගයේත් කම්කරු අයිතිවාසිකම් ලබා දීම සඳහා දිවි පුදා වෘත්තීය සමිති ව්‍යාපාරයේ යෙදෙමින් කම්කරුවන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියා කළ ගෝවින්දන්, වැනි අයත්, ඊට පසු කාලයේදී රජයේ සේවකයන්ට වෘත්තීය අයිතිවාසිකම් ලබා දීම සඳහා දිවි පුදා සටන් කළ කන්දසාමි වැනි අයත් මතක් කරමින්, මෑතදී බත්පත බේරා ගැනීම පිණිස දිවි පිදූ ඒ සම සමාජ වීරයන් 9 දෙනත් මතක් කරමින්, එම වීරයන්ගේ නාමයෙන් මේ කම්කරු කොටසටත් රාජ්‍ය සේවක කොටසටත් දිය යුතු අයිතිවාසිකම් පඩි නඩි ආදිය ලබා දීමට කටයුතු කර, මේ රටේ නියම සංවර්ධන යක් ඇති කර, සමාජවාදී ක්‍රමයක් කරා රට යොමුකිරීම පිණිස පියවරක් ගන්නය කියා ඉල්ලා සිටිමින් මගේ කථාව සමාප්ත කරනවා.

පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)
(திரு. பேர்சி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

සභාපතිතුමනි, රජයේ සේවකයන් සම්බන්ධව වැඩි වශයෙන් මේ අවස්ථාවේදී කරුණු කීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ මන්ද? මට ප්‍රථමයෙන් කථා කළ මගේ මිත්‍ර මන්ත්‍රීතුමා ඒ සම්බන්ධයෙන් දීර්ඝ දේශනයක් කළා. ඒ එක්කම අපේ වැඩ බලන ගරු මුදල් ඇමතිතුමා ඒ සියලුම කරුණු අනුව කල්පනා කර බලා රජයේ සේවකයන්ට නියම විධියට සහනයක් සලසා දෙනු ඇත කියා අපි විශ්වාස කරනවා.

මෙම වැය ශීර්ෂය යටතේ මුදල් ඇමතිතුමා කථා කරද්දී රජයේ ගබඩාව—Government Stores—ගැන වචනයක් ප්‍රකාශ කරන්ට යෙදුණා. එම රජයේ ගබඩාව පාලනය කෙරෙන පිළිවෙළ ගැන එතුමා තුළ වැඩි සතුටක් නැති බව එතුමාගෙන් ප්‍රකාශ වුණා. මේ සම්බන්ධයෙන් දැනට කොමිෂන් සභාවක් පත් කර තිබෙනවා. ඒ ගැන විභාග කිරීමට පත් කර තිබෙන එම කොමිෂන් සභාවේ කොමසාරිස්වරයා හැටියට පත් කළ මන්ත්‍රී පෝලියර් මහතා පත්වී සිටිනවා. එහි වාර්තාව තවම ඉදිරිපත් කර නැහැ. එය ඉදිරිපත් කළාට පසුව රජයේ ගබඩාවේ තිබෙන තත්ත්වය වෙනස් කිරීමට මුදල් ඇමතිතුමා බලාපොරොත්තු වන බව ප්‍රකාශ කළා. කෙසේ වෙතත්, ඒ වාර්තාව සම්බන්ධයෙන් කෙරෙන යෝජනා ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වෙනවා නම්, ගබඩාව සම්බන්ධයෙන් දැනට තිබෙන තත්ත්වය ගැන පරීක්ෂණයක් ඉක්මනින්ම පවත්වා එය හැකි තරම් ඉක්මනින් යහපත් කරන හැටියට අපි රජයෙන් ඉල්ලා සිටිනවා. මෙම රජයේ ගබඩාවට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී නියෝජිතයන්ගේ මාර්ගයෙන් පිටරටවලින් අවුරුද්දකට රුපියල් පන්කෝටි හත් ලක්ෂයක පමණ බඩු බාහිරාදිය ගෙන්වනවා. මෙරටින් තුන්කෝටි නව ලක්ෂයක පමණ බඩු බාහිරාදිය මිළදී ගන්නවා. මේ තරම් විශාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

ව්‍යාපාරයක් මෙම ආණ්ඩුවේ ගබඩාවෙන් කර ගෙනයනවා. නමුත් මෙම බඩු ගබඩාවට සම්බන්ධ පුද්ගලයින්ට විරුද්ධව නොයෙකුත් විධියේ චෝදනා එල්ල වී තිබෙනවා. මේ චෝදනා ගැන රජය කරන්නට යන්නේ කුමක්ද? මෙම ගබඩාව ඇතුළේ කතෝලිකයන්ගේ විශාල ජාවාරමක් ගෙන යන බව තමුන්නාන්සේ දන්නවාද? මට ඒ බව ඇතැම් කාරණා වලින් ඔප්පු කරන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි, මෙම ගබඩාවේ උසස් ස්ථානාන්තර ගණනාවක්ම හිමි වී තිබෙන්නේ කතෝලිකයන්ටයි. යම්කිසි තනතුරකට ඇබෑර්තුවක් ඇති වූ විට එතැනට කතෝලිකයකු පත් කර ගැනීම ටයි වෑයම් කරන්නේ. මේ සම්බන්ධයෙන් හොඳ උදාහරණයක් මට පෙන්වන්නට පුළුවනි. මෙම රජයේ ගබඩාවේ සුපිරින්ටෙන්ඩන්ට් නැතිනම් පාලක තනතුර ඉසිලූ නිලධාරියා විශ්‍රාම ගත් නිසා තනතුර හිස් වුණා. ඊළඟට එතෙක් නියෝජ්‍ය පාලක ධුරය ඉසිලූ නිලධාරියා ඒ තනතුරේ වැඩ බැලීමට පත් වුණා. නමුත් මේ අන්දමට එම ධුරයේ වැඩ බලන්නට ඉඩ ලැබුණේ ටික දවසයි. හදිසියේම ඒ මහතා භාණ්ඩාගාරයට මාරු කරලා ඒ වෙනුවට රජයේ ගබඩාවේ වැඩ බලන පරිපාලකයා හැටියට කතෝලිකයකු පත්කර ගත්තා. මම මෙයින් පෙන්නුම් කරන්නට අදහස් කළේ රජයේ ගබඩාවේ එක්තරා කතෝලික ජාවාරමක් තිබෙන බවයි. මෙම රජයේ ගබඩාවේ සහකාර පරිපාලක තැනද කතෝලිකයෙක්. කම්කරු පරීක්ෂක තැනද කතෝලිකයෙක්. රජයේ ගෙවල් සම්බන්ධව කටයුතු කරන පාලක තැනද කතෝලිකයෙක්. ඊළඟට මේ භයානක ද්‍රව්‍ය, වෙඩි බෙහෙත් ආදී පුපුරන ද්‍රව්‍ය තිබෙන ගබඩාව පාලනය කරන්නේත් කතෝලිකයෙක්. එපමණක් නොවෙයි, එහි තවත් හොඳ වැඩක් කෙරෙනවා. යම් කෙනෙක් සේවයෙන් විශ්‍රාම ගත්තාම ඇති වන පුරප්පාඩුවට පත් කරන්නේ කතෝලිකයෙක්. මේ අන්දමින් රජයේ ගබඩාව තුළ ගෙන යන කතෝලික ව්‍යාපාරය දිහා බලන්න. මේවා ගැන තමුන්නාන්සේ පරීක්ෂා කර බලනවාද? මේවා ගැන ජනතාවට කියන්නේ මොන වාද? ගරු සභාපතිතුමනි, මේ කරුණු හේතුකොට ගෙන අද රජයේ ගබඩාවෙහි සේවය කරන සේවක මණ්ඩලය අතර විශාල මතභේද පැන නැඟී තිබෙනවා. එසේ මතභේද තිබෙද්දී මෙම ගබඩාවේ සේවකයන්ට තම වැඩ කටයුතු නිසියාකාර, හරියාකාර කරන්නට පුළුවන්ද කියා තමුන්නාන්සේ කල්පනා කර බලන්න.

ගරු සභාපතිතුමනි, මා මුලින්ම සඳහන් කළා මෙම ගබඩාවේ විශාල කතෝලික ජාවාරමක් ගෙන යන බව. අප මේවා ගැන කරන්නට බලාපොරොත්තු වන්නේ මොකක්ද? මෙම ගබඩාවේ දෙවසකට රුපියල් ලක්ෂයක පමණ ජාවාරමක් කෙරෙනවා. සාමාන්‍යයෙන් රජයේ ගබඩාව කරන්නේ වෙළඳ කටයුතු තමයි. එම නිසායි, මෙතැන අල්ලා ගෙන ඉන්නට ඇතැම් උදවියට වුවමනා කරන්නේ. එපමණක් නොවෙයි, මා ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා, මෙම ගබඩාවට බඩු සපයන කොන්ත්‍රාත්කරු වන්නේ ලැයිස්තුව දිහා බලන්නට කියා. ඒ මන්ද? මෙම ලැයිස්තුවේ ඇති කොන්ත්‍රාත්කරුවන් ගෙන් වැඩි දෙනෙක් කතෝලිකයෝයි. එම නිසා කොන්ත්‍රාත් දෙන්නේ මොන ආකාරයටද, මොන පිළිවෙළටද, මොන ප්‍රතිපත්තියක් උඩද කියන එක පරීක්ෂා කර බලන්නට ඕනෑ. බඩු එහා මෙහා ගෙන යාමේ කොන්ත්‍රාත්තු හෙවත් "ට්‍රාන්ස්පෝට් කන්ට්‍රැක්ට්" සම්බන්ධයෙන් විශෙෂ පරීක්ෂණයක් පවත්වන මෙන් මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. එසේ මා ඉල්ලා සිටින්නේ ඇයි? මේ දෙපාර්තමේන්තුවේ සේවකයන්ගේ පඩි සඳහා වැය වන්නේත් රුපියල් ලක්ෂ 16යි. එහෙත් බඩු එහා මෙහා ගෙන යාමට පමණක් රුපියල් ලක්ෂ 13ක් වියදම් වී තිබෙනවා. පඩි ගෙවීම සඳහා වියදම් වන මුදල මෙන්ම මුදලක් බඩු එහා මෙහා ගෙන යාමටත් වියදම් වෙනවා. එපමණක් නොවෙයි, මේ කාරණය ගැන කියන විට පාර්ලිමේන්තු ලේකම්තුමා කල්පනා කරයි, කොමියුනිස්ට් පක්ෂයේ මන්ත්‍රීවරයකුට ඇමරිකාව ගැන ටිකක්වත් සඳහන් නොකර කථා කරන්න බැරිය කියා. එහෙත් මේ ගැන ටිකක් පරීක්ෂා කර බලන ලෙස මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. "ඉන්ටර් නැෂනල් කෝඔපරේෂන් ඇඩ්මිනිස්ට්‍රේෂන්" හෙවත් අයි. සී. ඒ. කියා ඇමරිකන් සංවිධානයක් මේ රටේ තිබෙනවා. ඒ ඇමරිකන් සංවිධානය මගින් මෙම ගබඩාවේ සේවකයන් 4 දෙනකුට ශිෂ්‍යත්ව 4ක් දී තිබෙනවා. මෙම සංවිධානයට රජයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාලක ස්ථානවලට ඇඟිලි ගැසීමට මොන අයිතියක් තිබෙනවාදැයි මා අහනවා. ශිෂ්‍යත්ව දෙනවා, ඒ වගේම කතෝලික යින් එහි උසස් ස්ථාන අල්ලාගෙන සිටිනවා, බඩු එහා මෙහා ගෙන යාමේ කොන්ත්‍රාත්තු කතෝලිකයන්ට භාර දී තිබෙනවා. මේවාට හේතු මොනවාද?

සභාපතිතුමනි, "ඇස්ෆල්ට් කන්ට්‍රැක්ට්" සඳහා රුපියල් 4,85,707 ක් වියදම් කර තිබෙනවා. සිමෙන්ති ආදිය එහා මෙහා ගෙන යාමට රුපියල් 1,09,000 ක් පමණ වියදම් කර තිබෙනවා. මේ ඉලක්කම් අප විසින් පෙන්වා දෙන්නේ පාර්ලිමේන්තු ලේකම්තුමා මේවා ගැන පරීක්ෂා කර බලනවා ඇතැයි විශ්වාස කරමින්. මෙම කරුණු පරීක්ෂා කිරීමට පත් කර සිටින විශෙෂ කොමසාරිස් වන පත් කරන ලද මන්ත්‍රීතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, මා කියන්ට යෙදුණු කරුණු සම්බන්ධයෙන් විශෙෂ සැලකිල්ලක් දක්වා එම වාර්තාව ඉදිරිපත් කරන්න පෙර රජයේ ගබඩාවේ පවතින කතෝලික ජාවාරම් ගැනත් විශෙෂයෙන් පරීක්ෂා කර මනජන මුදල් ඒ කතෝලික ජාවාරම්කාරයින්ගේ සාක්කුවලට ඇදී යන අන්දම ගැන මේ ගරු සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන්නය කියා. ඒ අතරතුර මෙම ජාවාරම් වැළැක්වීම සඳහා රජයට අද අදම ගන්න පුළුවන් ක්‍රියාමාර්ගයක් ඇත් නම් එය ගන්නය කියාත් මා ඉල්ලා සිටිනවා. විශෙෂයෙන්ම මේ අන්දමින් අපතේ යන මුදල් නැවැත්වීමට වැඩ පිළිවෙළක් යොදන ලෙස මා ඉල්ලා සිටින්නේ, දැනට මේ ගබඩා සේවකයින් අතර මේ පිළිබඳව විශාල නොසන්සුන් තත්ත්වයක් ඇති වී තිබෙන නිසයි. එය උග්‍ර වන්ට පෙර මේ කරුණු ගැන සොයා බැලීමට රජයට යුතුකමක් තිබෙන බව මතක් කරන්න කැමතියි. රජයේ ගබඩාව සම්බන්ධයෙන් මීට වඩා යමක් මා කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

මේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කථා කරන විට මතක් කළ යුතු තවත් වැදගත් කරුණක් තිබෙනවා. අද පඩි කොමිෂන් සභා වාර්තාව අපේ ගෙවලට තැපැල් කළා ලු. අප නම් සිටින්නේ මෙහෙයි. ඒ කෙසේ වෙතත්, මේ අවුරුද්දේ පෙබරවාරි මාසයේ දී මුදල් ඇමතිවරයා විසින් මේ ගරු සභාවේ දී ඒ පඩි කොමිෂන් සභා වාර්තාව ක්‍රියාත්මක කරනවාය කියා පොරොන්දු වූ බව අමතක නොකරන ලෙස මා ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. මගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙනුයි, ඒ පොරොන්දුව දුන්නේ. එදා මා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ගරු මුදල් ඇමතිතුමා මේ ගරු සභාවට පොරොන්දුවක් දුන්නා. 1961 පෙබරවාරි මාසයේ **හැන්සාඩ්** වාර්තාවක එය සඳහන් වී තිබෙනවා. එදා ඒ ප්‍රශ්නය මතු කෙළේ මාසි. මුදල් ඇමතිතුමාගේ පොරොන්දුව ගුවන් විදුලිය මඟිනුත් ප්‍රචාරය වුණා. ඒ අනුව වැටුප් කොමිෂන් සභාවේ වාර්තාව ක්‍රියාත්මක කරනවා ඇතැයි රජයේ සේවකයන් බලාගෙන සිටියා. [බාධාකිරීමක්] ක්‍රියාත්මක කරන බව හෝ නොකරන බව හෝ කියන්න. ක්‍රියාත්මක කරනවා නම් කවදා ක්‍රියාත්මක කරනවා දැයි කියන්න.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)
සල්ලි ලැබුණාම.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்சி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
ඇයි ඉතින් ඒක නොකියන්නේ? මුදල් ලැබුණු හැටියේම ක්‍රියාත්මක කරන බව කියන්නෙ, 1963 දී හෝ ක්‍රියාත්මක කරන වාදැයි කියන්න. ඒ ගැන කිසිත් නොකියා බදු අය කිරීමට යෑම හොඳ නැහැ. බණ්ඩාරනායක අගමැතිතුමා සිටියදී රජයේ සේවකයින්ගේ අමාරුකම් එතුමාට ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් 17.50ක තාවකාලික වැඩි කිරීමක් ඇති කළා. රජයේ සේවකයින්ගේ දුක්ගැනවිලි පිළිගත් නිසයි, බණ්ඩාරනායක අගමැතිතුමා එවැනි තීරණයකට බැස්සේ. නමුත් දැන් සංවර්ධන බද්දක්ය කියමින් සියයට හතරක් කපන්න යනවා. මොන අන්දමට කීවත් මෙය පඩි කැපීමක්. හොඳයි, දැන් ඒක එහෙම වෙච්චාවේ. මේ පැත්තෙන් සියයට හතරක් කපනවා නම් අනෙක් පැත්තෙන් පඩිය ටිකක් වැඩි කිරීම අවශ්‍යයි. ඒ අතර අර 17.50 ට තව 5 ක් එකතු කරන්න. රජයේ සේවකයන්ගේ ආධාරය නැතිව සංවර්ධනය ඉදිරියට ගෙන යා නොහැකියි. "හදිසි නීතිය නිසා අප දැන් ස්ට්‍රයික් කරන්නේ නැහැ; නමුත් 'ගෝ ස්ලෝ' ක්‍රමය අනුව වැඩ කරනවා" යි දැන් රජයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

සේවකයන් කියනවා. රජයේ සේවකයන් ගේ ආධාරය නැතිව කවරදාකවත් සංවර්ධන යක් ඉදිරියට ගෙන යා නොහැකියි. සංවර්ධනය සඳහා රජයේ සේවකයන්ගේ ආධාරය ලබා ගන්න ඕනෑ. මේක වැදගත් ප්‍රශ්නයක්. මෙම ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා වැඩ බලන ඇමතිතුමා කටයුතු කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ස්ටැන්ලි තිලකරත්න මයා. (කෝට්ටේ)
(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)
(Mr. Stanley Tillekeratne—Kotte)

I wish to make a few observations, Mr. Chairman. In point of fact year in and year out, after our Independence, we have been thinking of this question of the complete reorganization of the Treasury. Year in and year out we have urged on the Floor of this House that the Treasury, the organization of which was designed to suit the colonial governments of the past, should be modified, remodelled and streamlined in order to meet the present situation in this country. Year in and year out this criticism has been made on the Floor of this House, but yet it has not achieved any results. As a matter of fact, this time we are repeating the same thing. I hope the Hon. Minister of Finance will seriously go into this question of the reorganization of the Treasury—the one bottleneck, the one obstructive source that has always been criticized on the Floor of this House.

I do not wish to say much on this matter, but I must at the outset congratulate the Hon. Minister of Finance on his suspending the operation of the Civil Service Minute though in point of fact we were not satisfied with that suspension alone. During the last few years there has been repeated agitation that the Civil Service should be scrapped. There has been repeated agitation that there must be a centralized administrative service, indications of which are very vaguely put in the Throne Speech this time. This has been long overdue.

There is one thing I must tell the Hon. Minister of Finance or even the hon. Parliamentary Secretary to the Minister of Finance. It is good to suspend the operation of the Civil Service Minute if its purpose is to put in place of Civil Servants experienced officers, men who have been trained in various departments, men who have been recruited in various staff capacities and have the necessary training to fill the posts which were only given to Civil Servants. If that is the principle we have no grudge, we commend the action of the Hon. Minister of Finance. But this Government must be cautious.

The suspension of the Civil Service Minute does not mean that sycophants and stooges and close friends of this Government should be appointed in place of Civil Servants. This Government has some very good friends of a very dubious character hanging round "Temple Trees", political public servants who are doing propaganda. Beware of them! If it is desired to put in such men we have to oppose this move and we have to tell this Government to be careful.

The suspension of the Civil Service Minute does not mean that you have got a fine opportunity to put in your own men, men who have been hanging round you. Yours must be a careful choice. You must consider for appointment men who have been working in various departments. We have got Assistant Commissioners, we have got Elections Officers, we have got Assistant Commissioners of Labour, we have got men of that type who were not put into the Civil Service posts because this Minute prevented that being done. We congratulate the Government, but we must also caution the Government that they must be careful in appointing persons in the future.

Recently there have been a number of matters that have been agitating the minds of public servants. When appointments are made you must consider the merits of particular persons and their suitability for particular posts. Sometimes there

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

may be persons whom the Government may not like because they are not their stooges. The Government may not like them because of differences of community. The Government may not like them because of their religion. But if such men are the most deserving to fill these posts as a result of the suspension of the Civil Service Minute then the Government should make it a point to do that because if appointments are based on favour that is going to undermine the morale of the entire service.

The Hon. Minister of Finance has to take away the halo round the Civil Servant's head. In the early days it was the intention of a father to get a Civil Servant as his son-in-law.

රෝයි රාජපක්ෂ මයා.
(திரு. ரோய் ராஜபக்ஸ)
(Mr. Roy Rajapakse)

Then you have no chance!

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanly Tillekeratne)

I got married long ago—unless my hon. Friend suggests that I should commit bigamy at this stage. He may be quite capable of that but I cannot do that in accordance with our Marriage Registration Ordinance.

Whatever that is, I entirely agree that the Civil Service has to be scrapped because it is an old colonial instrument. From the lowest level of the Clerical Service up to the top grade of the Civil Service there must be a co-ordinated Public Service, a Public Service which should enjoy political rights in this country.

අ. භා. 6.45

There is another question. What is the general line of development in aeronautics today? It is for vertical take-off. If you study the development of aeronautics today, you will find that the tendency is towards vertical take-off. Even jet planes may soon take-off like helicopters. If that is the development for the next ten years, then what will be the value of your new scheme? I am not saying that that will be the development, but I think that vertical take-off will come fairly soon. So, it seems to me that all these matters must be considered before my hon. Friends rush into schemes of this nature. And he must be able to convince us that he has done so. To talk grandly of an International Airport is all very well but that alone will not take us very far. From the point of view of economic return, this scheme will not get you very far. It must either get us more money or help the development of our own air communications. How is this scheme going to help us in these respects? These are practical questions which must be answered. You might find yourself saddled with much more than you expect to pay.

අ. භා. 11.30

The last point I want to mention is this. I want to ask the Hon. Minister what the present position is in regard to the future of Air Ceylon International? Air Ceylon International has had a very bad experience. First of all, we had a link-up with A. N. A. under which we had the privilege of having our name on the aircraft. They ran the service and made the money. They did not train Ceylonese not even an air hostess. Then everyone criticized them and said we must give Air Ceylon over to K. L. M. Although we owned about 5 per cent. of the aircraft, the same charge can be made against K. L. M. How many pilots and engineers have been trained by them? How many technical personnal? As far as I know, only one pilot has been trained. We are in a very unfortunate position in regard to civil aviation. Some of our best people in civil aviation have already left this country and gone abroad where they are paid much better. One such person who is a first class engineer is Mr. Arthur Fernando. He has got a big job somewhere in the U. S. He is a very experienced man, but we have lost his services. We have Ceylonese pilots but they are not flying in Ceylon. They are flying in India. The reason is that they are better paid and there is greater scope in countries other than Ceylon. So, what is the point in talking about Pan-American and BOAC and helping us to run Air Ceylon. Are we going to repeat the same old story of what happened with A N. A. and K. L. M.? If you are going to have an International Airline why do you

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

not think seriously of purchasing your own aircraft and framing your own personnel ?

I see that the Hon. Minister has given an assurance that employees of Air Ceylon who are discontinued as a result of K. L. M. pulling out will be given jobs in other corporations if possible. But we should look at the problem of how we should develop our own independent airline. I am not against the idea of concentrating on our regional services. I think that is correct. But if we must keep our name in the International Airways, we must at least see that Air Ceylon is Air Ceylon and not a name and a flag on an aircraft owned and operated by someone else. I do hope the Hon. Minister will make a pronouncement on this. I wish to stress the need for re-examining the two so-called development schemes which the Hon. Minister's Ministry has put forward in the White Paper.

ටී. බී. ජයසුන්දර මයා.
(திரு. ரீ. பி. ஜயசுந்தர)
(Mr. T. B. Jayasundera)

ගරු සභාපතිතුමනි, මෙම වැය ශීර්ෂය යටතේ මටත් වචන සවලාපයක් කථා කරන්න තිබෙනවා. රජයේ වැඩ පිළිබඳ ගරු ඇමතිතුමා පසුගිය පෙබරවාරි මාසයේ 28 වැනිදා මහනුවර කච්චේරියට පැමිණ උඩු නුවර ප්‍රදේශය ඇතුළු මහනුවර දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශවල රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් කෙරෙන වැඩ කටයුතු ගැන සාකච්ඡාවක් පැවැත් වූ බව පළමුවෙන් මා මතක් කරන්න කැමතියි. ඒ පළාත්වල පාරවල් දියුණු කිරීම්, බෝක්කු අළුත්වැඩියා කිරීම්, ආදි අවශ්‍ය කටයුතු ඉක්මන් කිරීම සඳහායි, ඒ සාකච්ඡාව පැවැත් වූයේ, ඒ සාකච්ඡාව ඇති කළායින් පසු රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් ඒ පළාතට කිසිම වැඩක් කෙරී නැති බවත්, ඒ වගේම ඒ දෙපාර්තමේන්තුවෙන් අපට ලියුමක්වත් ලැබී නැති බවත් කියන්න මා කනගාටු වෙනවා. දැන් අවුරුදු 5 කින් 6 කින් මගේ කොට්ඨාශයේ පාරක් අළුත්වැඩියා කර හෝ සාදා හෝ නැහැ. ඒ පළාතේ තිබෙන පාරවල් අළුත් වැඩියා නොකර එම පාරවල බස් රථ

කරවන්න බැරි නිසා පාරවල් අළුත්වැඩියා නොකළොත් ලබන අවුරුද්දේ බස් සේවය නවත්වා දමන බව ලංගමය දැන් කියාගෙන යනවා. මෙම කරුණු ගැන උදෙසාගයෙන් ක්‍රියා කර රජයේ වැඩ දෙපාර්තමේන්තුව ලවා ඒ පළාත්වල තිබෙන පාරවල් පාලම් ආදිය සාදා දෙන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

සභාපතිතුමනි, ගෙලිඔය තිබෙන දුම්රිය පොළ ගැන ඊළඟට මා කියන්න කැමතියි. ඒ දුම්රිය පොළ දුම්රිය දෙපාර්තමේන්තුවට ලජ්ජාවට කරුණක්. ඒ මන්ද? එය සාදා තිබෙන්නේ ඔයක් උඩයි. ඊට ගොඩ වන්නට ගොස් වැටී මගීන් හතර පස් දෙනකුට දැනටමත් තුවාල සිදු වී තිබෙනවා. එම දුම්රිය ස්ථානය එම තත්ත්වයෙන් තිබීම අපේ කොට්ඨාශයට නින්දාවක් නිසා ඉතා ඉක්මනින් ඒ ගැන ක්‍රියා කර එය සුදුසු තත්ත්වයකට පත් කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

සභාපතිතුමනි, ගුවන් සේවය දියුණු කරන්නට ගරු ඇමතිතුමා දැනට කටයුතු කරගෙන යනවා. අනුරාධපුරයේත් ගුවන් තොටුපලක් ඇති කළා. බදුල්ලටත් ගුවන් සේවයක් ඇති කරන්න යන බව පත්‍ර මාගීයෙන් දැනගන්න ලැබුණා. එම නිසා නුවරට නැත්නම් සෙංකඩගලට ගුවන් තොටුපළක් ලබා දෙන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඇස් ටිකක් අරවා එහි ඉංජිනේරු මහත්වරුන්ට ටිකක් උනන්දුවෙන් වැඩ කරන්නය කියා දන්වන ලෙසත් ගරු ඇමතිතුමාට මතක් කරන අතර මීට වඩා වැඩි සේවයක් ඒ පළාතට ලබා දෙන ලෙස ඉල්ලමින් මගේ වචන සවල්පය මෙයින් අවසාන කරනවා.

පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)
(திரு. பேர்சி விக்கிரமசிங்க—கம்புறுப்பிட்டிய)
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

මෙම වැය ශීර්ෂය යටතේ මටත් වචන සවලාපයක් ප්‍රකාශ කරන්න තිබෙනවා. ගරු ඇමතිතුමා යටතේ තිබෙන රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කටයුතු කරන්නේ පුදුම ආකාරයටයි. මුදල් වර්ෂය අවසාන වන විට කෙසේ හෝ වවුචර් දමා මුදල් ලබා ගන්න වැඩ පිළිවෙළක් ඔවුන් යොදන බව මා හිතන්නේ ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇමතිතුමා දන්නවා ඇති. දැනට මාස 2 කට පමණ පෙර මා මෙම කරුණ ගැන සොයා බැලුවා. කඹුරුපිටිය ප්‍රදේශයේ පාර වල් තැනීම සඳහා වෙන් කර තිබෙන මුදලින් තුනෙන් එකක් පමණ වියදම් කර තිබෙන අතර අනික් මුදල් එහෙමම තිබෙන්න ඉඩ හැර තිබෙනවා. මා ඇමතිතුමාටත් මේ ගැන කියා සිටියා. වර්ෂය අවසාන වන විට නම් මුදල් ටිකක් වැය කර නවා. එසින් පෙනී යන්නේ වැඩ ආරම්භ කිරීමට මුදල් වර්ෂය අවසාන වනතුරු සිටින බවයි. මෙම වැය ශීර්ෂය ගැන සාකච්ඡා කරන විට දෙපාර්තමේන්තු ප්‍රධානීන් මෙම ස්ථානයේ සිටින නිසා මෙම කරුණු ඒ නිලධාරීන්ගේ සැලකිල්ලට යොමු වේයයි මා සිතනවා. රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයත් පාරවල් ගම්සභාවලට අයත් පාරවල් වලට වඩා නරක තත්ත්වයකයි අද තිබෙන්නේ. කිරින්ද-කඹුරුපිටිය පාර වාහනයක් ගෙන යන්න පුළුවන් තත්ත්වයක නැහැ. ඒ වගේම අනික් පාරවලත් අයිනේ තිබෙන ගැටි නිසා ඒවායේ වාහන වලට ගමන් කරන්න අමාරුයි. ඇමතිතුමනි, නිල්වලා ගඟ හරහා වැටී තිබෙන මාලිම්බඩ-කද්දුව ප්‍රසිද්ධ පාලම අවුරුදු ගණනාවක් තිස්සේ අබලන්ව තිබෙනවා. මෙම පාලම වෙනුවට කොන්ක්‍රීට් පාලමක් ලබා දෙන ලෙස මට ප්‍රථම සිටි මන්ත්‍රීවරුන් පවා මේ ගරු සභාවේදී ඉල්ලා සිටියා. එහෙත් අද වනතුරු ඒ සම්බන්ධයෙන් කුමන වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවාදැයි මා දන්නේ නැහැ. මේ වර්ෂයේදීවත් එය ආරම්භ කරනවාදැයි ගරු ඇමතිතුමාගෙන් මා දැන ගන්න සතුටුයි. තවත් කාරණයක් මෙම දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් මට මතක් කරන්න තිබෙනවා.

දැනට කඹුරුපිටිය ආසනයෙන් කොටසක් කලින් අයිතිව තිබුණේ මාතර ආසනයටයි. මෙම ආසන බෙදා වෙන් කිරීමට කලින් එහි මන්ත්‍රීවරයාව සිටියේ අද පළාත් පාලන ඇමති ධුරය දරණ මහානාම සමරවීර මහත්මයායි. මාතර මන්ත්‍රීවරයා වශයෙන් එතුමා මෙම කරුණ සම්බන්ධයෙන් විශාල උද්ඝෝෂණයක් ඇති කළා. එතුමාගෙන් පසු කඹුරුපිටිය ආසනයේ මන්ත්‍රීවරයා වශයෙන් මෙම දෙපාර්තමේන්තුවට මා පළමුවෙන් ඉදිරිපත් කළ කරුණත් මේකයි. මගේ කොට්ඨාශයේ තිබෙන ග්‍රාම සංවර්ධන සමිති මාර්ගයෙන් දෙපාර්තමේන්තුවේද ආධාරය ඇතිව සාදා තිබෙන කද්දුව-සකරදරුවත්ත නමැති පාරේ තිබෙන අබලන් පාලම් දෙක නිසියාකාර තැනීමේ අවශ්‍යතාව පිළිබඳව දෙපාර්තමේන්තුවට නොයෙකුත් අවස්ථාවන්හිදී කරුණු ඉදිරිපත් කර තිබෙන නමුත් තවම කටයුතු ඉටු වී නැහැ. මේ පාලම් දෙක සඳහා ඇස්තමේන්තු පිළියෙළ කරනවාය කියා රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශ කරන ලද නමුත් තවම එම කාර්යය ඉටු වී නැහැ. මේ පාලම් දෙකම සකස් කර තිබෙන්නේ පුවක් ගස් දැමීමෙනුයි. මේ අබලම් පාලම්වල ගමන් කරන්නට හිහින් ගැබිණි මව්වරුන් පවා වැටී මැරී තිබෙනවා. ඒ වාගේම ඇතැම් අවස්ථාවන්හිදී පාසැල් ශිෂ්‍යයන් පවා වැටී ජීවිත නැති වී තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයේ ගම්මානයක් මැදින් වැටී තිබෙන වැදගත් පාරක් වන කද්දුව-සකරදරුවත්ත පාරේ සාදා ඇති පාලම් දෙකේ තත්ත්වය ඔය ආකාරයි. පසුගිය දිනවල මගේ ඉල්ලීමක් අනුව දිසා පතිවරයා රජයේ වැඩ දෙපාර්තමේන්තුවට දැනුම් දුන්නා, අඩු වශයෙන් මේ පාලම් ලෑලි පාලම් බවටවත් පත් කරන්නය කියා. නමුත් ලෑලි පාලම් දමන්නවත්, කොන්ක්‍රීට් පාලම් දමන්නවත් ඇස්තමේන්තුවක් සකස් කළේ නැහැ. අවුරුදු ගණනාවක පටන් පවතින තත්ත්වය මේකයි. දෙපාර්තමේන්තුව මේ අන්දමට වැඩ කරන විට මන්ත්‍රීවරුන් වශයෙන් අප මුහුණ දෙන්නේ කෙසේද?

ගරු සභාපතිතුමනි, මේ කාරණය සම්බන්ධව මා නොයෙකුත් අවස්ථාවන්හිදී කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ගමනා ගමනය සම්බන්ධයෙන් පත්ව සිටින ගරු ඇමතිතුමාට, පොත් බල බලා සිටින්නේ නැතිව කෙලින්ම රෙගුලාසියක් දෙන්න නියෝගයක් කරන්න පුළුවන්කමක් තිබෙනවාය කියා මා ප්‍රකාශ කරනවා. එම නිසා කද්දුව-සකරදරුවත්ත පාරේ පිහිටි පාලම් දෙක කොන්ක්‍රීට්වලින් සාදන්න බැරි නම් ලෑලිවලින්වත් සාදන්නය කියා නියෝගයක් නිකුත් කරන හැටියට මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, දකුණු පළාතේ තිබෙන රේල්වේ සේවය ගැන යමක් කියන්න කැමතියි. කොළඹ සිට මාතර දක්වා දුවන රේල්වේ තිබෙනවා. සවස හත රට පමණ කොළඹින් පිටත් වී මාතර බලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

ගිහින් පසුව දා උදේ හයයි කාලට පමණ මාතරින් පිටත් වී කොළඹ බලා එන "රුහුණු කුමාරි" නමැති රේල්ලුව අපට තිබෙනවා. මහජනයා ඉල්ලා සිටිනවා තවත් රේල්ලුවක් දමන්නය කියා. මාතර සිට කොළඹ බලා තවත් සීඝ්‍රගාමී රේල්ලුවක් දුවවන ලෙස මහජනයා ඉල්ලා සිටිනවා. සවස දෙකටත් එකක් දුවවන බව අප දන්නවා. ඒ අය ඉල්ලන්නේ සවස හතරට පමණ මාතර සිට කොළඹ බලා එන්නට සීඝ්‍රගාමී දුම්රියක් යොදවන ලෙසයි.

තවත් කාරණයක් කියන්නට කැමතියි, රේල්ලු සම්බන්ධව. මේවායේ මැදිරිවල වාඩි වුණොත් ගන්න දෙයක් නැහැ. දුම්රිය මැදිරිවල පවතින්නේ ඉතාම අපිරිසිදු තත්ත්වයක්. පළමුවන පන්තියත් ඉතාම අපිරිසිදුයි. පළමුවන පන්තිය එහෙම නම් දෙවන තුන්වන පන්ති කොහොම තත්ත්වයක ඇතිදැයි කල්පනා කර බලන්න. ඒ ප්‍රදෙශයේ දුවන රේල්ලු සඳහා සකස් කර ඇති කාල සටහන් වෙනස් කරන්න දැන් කාලය පැමිණ තිබෙනවා. මහජනයාගේ ප්‍රයෝජනයට ඉවහල් වන අන්දමින් කාල සටහන් සකස් කළ යුතුව තිබෙනවා.

අවසාන වශයෙන් තමුන්නාන්සේගේ පාලනය යටතේ පවත්නා කාර්මික විද්‍යාලය සම්බන්ධයෙන් වචනයක් කියන්න කැමතියි. පසුගිය මාසයේ රත්මලාන කාර්මික විද්‍යාලයට ළමයින් ඇතුළත් කර ගැනීම සඳහා පවත්වන ලද විභාගය සතුටුදායක ලෙස පැවැත් වූයේ නැත කියා බොහෝ දෙනා චෝදනා කර තිබෙනවා. ඒ ගැන සැලකිල්ල යොමු කර පරීක්ෂණයක් පවත්වන ලෙස මා ඉල්ලා සිටිනවා. අනිකුත් ප්‍රසිද්ධ විභාග පැවැත්වීමේ වගකීම අධ්‍යාපන දෙපාර්තමේන්තුවට භාර දෙන්නාක් මෙන් මින් පසුව මේ විභාගය පැවැත්වීමේ වගකීමත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට භාර දෙන මෙන් මා ඉල්ලා සිටිනවා. මෙම විභාගය පැවැත්වීමේ සම්පූර්ණ බලය දෙපාර්තමේන්තුවේ සිටින ප්‍රධාන නිලධාරී මහතකුට පවරා තිබීමෙන් නියම අන්දමට, සාධාරණ අන්දමට, සතුටුදායක අන්දමට කටයුතු නොකෙරෙන බවට පැමිණිලි ලැබී තිබෙනවා. දැනට පවතින ක්‍රමය අනුව එහි විභාග පවත්වන්නේ ප්‍රධාන ඉංජිනේරු මහත්මයායි. අනිකුත් විභාග වාගේ නොවෙයි, ළමයින් තෝරා ගන්නේ ඒ මහත්මයාමයි. එම නිසා මහජන මුදලින් පවත්වාගෙන යන කාර්මික විද්‍යාලයට ශිෂ්‍යයින් බඳවා ගැනීමේ විභාගය මෙයට වඩා සාධාරණ විධියට පැවැත්විය යුතුයයි මා කියා සිටිනවා. විශෙෂයෙන්ම මේ විභාගයත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පවත්වන අනිකුත් විභාග වාගේම පැවැත්වීමට කටයුතු සලසන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ කාරණය සම්බන්ධයෙන් කියන්න ඇත්තේ එපමණයි.

පූ. භා. 11.45

ගරු සභාපතිතුමනි, අවුරුදු ගණනාවක් තිස්සේම අපේ ගම්බද ජනතාව වෙනුවෙන් කරන ඉල්ලීමක් තමයි, මෙම ප්‍රදේශයට ටෙලිෆෝන් සේවයක් ලබා දෙන්නටය කීම. තමුන්නාන්සේ දන්නවා, කඹුරුපිටියේ ප්‍රදේශයේ යටියන කියන ස්ථානයේ විශාල උළු කර්මාන්ත ශාලාවක් තනා ගෙන යන බව. අපේ ගමනාගමනය පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා ඒ ප්‍රදේශයට ගිහිල්ලා තිබෙනවා. මෙතරම් විශාල කර්මාන්ත ශාලාවක් තනාගෙන යන ප්‍රදේශයේ උප තැපැල් කන්තෝරුවට ටෙලිෆෝන් සේවයක් ලබා දුන්නා නම් ඒ කර්මාන්ත ශාලාවේ වැඩ කටයුතු කර ගැනීම ඉතාමත් පහසු වෙනවා. ඒ වාගේම ඒ පළාතේ ජනතාවට විශාල සේවයක් එසින් ඉටු වෙනවා. එම නිසා අප ප්‍රදේශයේ ජනතාව අවුරුදු ගණනාවක් තිස්සේම කරන ඉල්ලීම ඉටු කරන මෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමා දැනටමත් මේ සම්බන්ධයෙන් කටයුතු කරගෙන යනවායයි අපට දැන ගන්ට ලැබුණා. එම නිසා මේ අවුරුද්ද අවසන් වන්නට පෙර මෙම සේවය ලැබේවිය කියා මා විශ්වාස කරනවා.

දැනට ටෙලිෆෝන් පණිවුඩ හුවමාරු කරන මධ්‍යස්ථානය තිබෙන්නේ මාතර. එම නිසා මාතර ටෙලිෆෝන් පණිවුඩ හුවමාරු මධ්‍යස්ථානයේ සිට හක්මනට ටෙලිෆෝන් පණිවුඩයක් යවන්න උවමනා වුණොත් පළමුව මාතර සිට කඹුරුපිටියේ ටෙලිෆෝන් පණිවුඩ හුවමාරු කරන ස්ථානයටත්, ඉන් පසු කඹුරුපිටියේ සිට හක්මන ටෙලිෆෝන් මධ්‍යස්ථානයටත් යවන්න ඕනෑ. මේ නිසා විශාල රවුමක් යන්න වෙනවා. මෙය කෙටි කරන්න පුළුවනි. කෙලින්ම

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

මාතර ටෙලිෆෝන් පණිවුඩ හුවමාරු කරන මධ්‍යස්ථානයක් සමග සම්බන්ධ කළොත් මෙයට වඩා ඉක්මනිනුත් පහසු වෙනුත් පණිවුඩ හුවමාරු කර ගැනීමට ජනතාවට ඉඩ ලැබෙනවා ඇතැයි මම විශ්වාස කරනවා.

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்னாயக்க)
(Mr. A. Ratnayake)

ගරු සභාපතිතුමනි, මෙම ගරු සභාවට අප පත් වුණු අවදියේදී, තම තමන්ගේ පළාත්වල තැපැල් සේවය සම්බන්ධයෙන් ඇති අඩුපාඩුකම් මොනවාද කියා දන්වා එවන ලෙස ගරු ඇමතිතුමා සෑම ගරු මන්ත්‍රීවරයකුටම ලියුම් යවා තිබෙනවා. ඇත්ත වශයෙන් අපි ඉතා සන්තෝෂයෙන් අපේ පළාත්වල ඇති අඩුපාඩුකම් මේ මෙයයි විස්තර කර ලියුමක් යැව්වා. විශෙෂයෙන්ම අපේ පළාතට උප තැපැල් කන්තෝරු අවශ්‍ය බව මා දන්වා යැව්වා. අපට මහ තැපැල් කාර්යාල උවමනා කරන්නේ නැහැ. එම නිසා මා විශ්වාස කරනවා මේ අවුරුද්ද අවසන් වෙන්නට පෙර අප පළාතට උප තැපැල් කාර්යාල පිහිටුවන්න ගරු ඇමතිතුමා කටයුතු කරාවිය කියා. මගේ කල්පනාවේ හැටියට මඩොල්කැලේ සුළු නගර සභා කොට්ඨාශයට එක උප තැපැල් කන්තෝරුවක් අවශ්‍ය වී තිබෙනවා. එම නිසා මේ කාරණා ගැනද ගරු ඇමතිතුමාගේ සැලකිල්ල විශෙෂයෙන් යොමු වේයයි මම කල්පනා කරනවා.

ඊළඟට සභාපතිතුමනි, පාරවල් සම්බන්ධයෙන්ද වචනයක් කියන්නට කැමතියි. මේ සම්බන්ධයෙන් මීට පෙර මා දීර්ඝ කථාවක් කළ නිසා වැඩි විස්තර කිරීමට මේ අවස්ථාවේ මම අදහස් කරන්නේ නැහැ. පාරවල් සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙන නමුත් මෙයින් වැඩි වැඩක් කෙරෙන්නේ නැහැ. ඒ බව අනිකුත් ගරු මන්ත්‍රීන් විසින් කරන ලද කථාවලින් හොඳටම පැහැදිලි වෙන්න ඇති. මගේ පළාතේ දොරගමුවේ සිට වත්තේගම දක්වා පාරක් තැනීම සඳහා මුදල් වෙන් කර අවුරුදු ගණනාවක්ම ගත වී තිබෙනවා. මේ ගැන ප්‍රශ්න කළාම කියන්නේ තවම මැනලා නැත, මෙය මනින්න ඕනෑය, කියායි. ඒ පළාතේ සිටින විධායක ඉංජිනේරු තැන පොරොන්දු වුණා සැප්තැම්බර මාසයේදී මිනින්දෝරුවන් යැවීමට. මාසයකට වරක් සෑමදාම ඒ ගැන ප්‍රශ්න කළාම කියනවා, වහාම එවනවාය කියා. අද වන තුරුවත් මිනින්දෝරුවන් ඇවිත් ඒ වැඩ කටයුතු ආරම්භ කරලා නැහැ. නමුත් මට පසුගියදා දැනගන්න ලැබුණා කවුදෝ මහත්වරුන් දෙන්නෙක් ඒ පැත්තට ඇවිත් ගියාය කියා.

එසේ ගමට ඇවිත් යෑම මැනිල්ලක් නොවෙයි. කොළඹටත් මේ ගැන දැන් නුවා. ඒ කියන්නේ අධ්‍යක්ෂ තුමාට දැන්නුවා. නමුත් අද වන තුරු කිසි වැඩක් කෙරී නැහැ. දොරගමුවේ සිට වත්තේගම දක්වා වැටී ඇති මේ පාරේ දුර ප්‍රමාණය හැතැප්ම $1\frac{1}{2}$ ක්වත් නැහැ. මෙම පාර සඳහා අවුරුදු පහා මුදල් වෙන් කර තිබෙනවා. නමුත් අද වන තුරු එහි වැඩ ආරම්භ කර නොතිබීම ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඇමතිතුමා මේ ගැන වහාම ක්‍රියා කරනවා ඇත කියා අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට කියන්න තිබෙන කරුණ නම් පසුගිය පාර්ලිමේන්තු වාරයේදී මා විසින් ඉදිරිපත් කර තිබුණු යෝජනාවක් ගැනයි. පාර්ලිමේන්තු වාරය අවසන් වනවාත් සමගම ඒ යෝජනාව අහෝසි වීම නිසා මට නැවතත් ඒ යෝජනාව ඉදිරිපත් කරන්නට තවම බැරි වුණා. එම යෝජනාව ඉදිරිපත් කළාට පසු එය පිළිගන්න බවට ගරු ඇමතිතුමාත් උප ඇමතිතුමාත් මට පොරොන්දුවක් දී තිබෙනවා. ඒ යෝජනා වෙන් කියන පාර නම් දොරගමුවේ සිට යටවර දක්වා යන පාරයි. දොරගමුවේ සිට ඇත්ගල පාරෙන් යටවරට යන විට ඒ ගම් දෙක බෙදී තිබෙන විශාල ගඟක් දකින්ට ලැබෙනවා. සවලප වශයෙන්වත් වර්ෂාවක් ඇති වුණොත් ඒ ගඟ ගැලීම නිසා යටවර ගමේ සිට කිසිම කෙනකුට වත්තේ ගම නගරයට එන්ට විධියක් නැහැ. එසේ වැස්සොත් දවස් කීපයක් ඒ තත්ත්වය පවතිනවා. ඒ නිසා ඒ ගමේ පොදු ජනතාව කෙරෙහි අනුකම්පා කර ගරු ඇමතිතුමා එම යෝජනාව පිළිගන්නවා ඇත කියා අපි බලාපොරොත්තු වෙනවා. ඒ පාරත් බොහෝම කෙටි පාරක්. හැතැප්මයක් ඇති නැති තරම් දුර ප්‍රමාණයක් නිසා එය ඉටු කර දෙන හැටියට අපි ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. රත්නායක මයා.]

තුන්වෙනි කාරණය වශයෙන් මතක් කරන්නට තිබෙන්නේ මගේ ප්‍රදේශයේ ටෙලිෆෝන් සේවය බොහෝම දුර්වල තත්ත්වයක තිබෙන බවයි. ටෙලිෆෝනය ඔයල් කර පැය භාගයක් ඇහුම්කන් දී ගෙන සිටියත් එක්ස්චේන්ජ් එකෙන් ඊට පිළිතුරු ලැබෙන්නේ නැහැ. කටුගස්තොට ටෙලිෆෝන් 50ක් වත් නැහැ. ඒ ටෙලිෆෝන්වලින් නුවරට පමණයි, වැඩි වශයෙන් කථා කරන්නට වුවමනා වන්නේ. නමුත් නුවරට සම්බන්ධ කරවා ගැනීමට පැය භාගයකට වැඩි වේලාවක් අල්ලා ගෙන ඉන්න ඕනෑ. එසේ කාලය ගත වන නිසා ටෙලිෆෝන් කථා කරන වාට වඩා ඉක්මනින් නුවරට ගිහින් ඒ කටයුත්ත කර ගන්න පුළුවනි. නැපැල් අධ්‍යක්ෂතුමාගෙන් මේ ගැන විමසූ අවස්ථාවේදී ඒ මහත්මයා දුන් පිළිතුර නම් ටෙලිෆෝන් ඉල්ලූ සෑම කෙනකුටම මරික්කාර් ඇමතිතුමාගේ කාලයේදී ටෙලිෆෝන් දුන් නිසා දැන් කාටවත් ටෙලිෆෝන් පනිවුඩයක් ගැනීමට බැරි වී තිබෙනවාය යන්නයි. කටුගස්තොට හා වත්තේගම යන නගර දෙකෙන්ම මොන විධියකින්වත් නුවර ටෙලිෆෝන් හුවමාරු මධ්‍යස්ථානය ගන්නට බැරි වී තිබීම ගැන කරුණා කර ගරු ඇමතිතුමා සොයා බලා ඉක්මනින් ඒ සඳහා පිළියමක් යොදන ලෙස මම ඉල්ලා සිටිනවා.

තමුන්නාන්සේලාගේ ටෙලිෆෝන් සේවය සම්බන්ධව ප්‍රසිද්ධ කර ඇති වාර්තාවේ කියා තිබෙනවා, ටෙලිෆෝන් සේවයෙන් අවුරුද්දකට රුපියල් 12 ලක්ෂයක පමණ පාඩුවක් තිබෙනවාය කියා. ලෝකය මුළුල්ලේම ටෙලිෆෝන් සේවය රජය සතු සේවයක් බව අපි කවුරුත් දන්නවා. පෞද්ගලික වශයෙන් වෙන කෙනකුට ටෙලිෆෝන් සේවයක් පවත් වන්නට බැහැ. ලෝකයේ සෑම රටකම ටෙලිෆෝන් සේවයෙන් විශාල ලාභ තිබෙනවා. එම නිසා ලංකාවේ පමණක් මෙසේ පාඩු වන්නේ කුමන හේතුවක් නිසාද කියා අපට තේරුම් ගන්නට බැහැ. ඒ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවිය කියා අපි බලාපොරොත්තු වෙනවා.

මෑද කොළඹ දෙවන මන්ත්‍රීතුමා පී. ජී. බී. කේනමන් මයා. දීර්ඝ විවේචනයක් කළා. එතුමා කී සෑම දෙයකටම මම එකඟ වන්නේ නැහැ. එංගලන්තයෙන් සල්ලි ටිකක් ලැබුනොත් ඒ සල්ලිවලට අත ගහන්න එපාය කියන අදහසයි, එතුමා ප්‍රකාශ කළේ. එංගලන්තයෙන් ලැබුණත්, දිල්ලියෙන් ලැබුණත්, පිම්බක්ටුවෙන් ලැබුනත් ඒ මුදල් අපේ ප්‍රයෝජනයට ගැනීමට අප බිය වීමට වුවමනා නැහැ. උන්නැහේගේ තර්කය වූයේ රුසියාවෙන් පමණක් ආධාර ගත යුතු බවයි. එංගලන්තයෙන් ආධාර වුවමනාත් නැත, සම්බන්ධ කමක් වුවමනාත් නැත කියා එතුමා තර්ක කළා. ඒ අදහස්වලට අපි එකඟ වන්නේ නැහැ. ලෝකයේ කොයි රටින් ආධාර ලැබුණත් ඒ ආධාර මේ රටේ ප්‍රයෝජනය සඳහා ගන්නා ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා. අන්තිම වශයෙන් කටුගස්තොටත් වත්තේගමත් ටෙලිෆෝන් සේවයෙහි ඇති දුර්වල තත්ත්වය මහ හරවා දෙන ලෙස ඉතා කරුණාවෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

එම්. අයි. එම්. අබ්දුල් මජීඩ් මයා. (නින්තාවූර්)

(ஜனாப் எம். ஐ. எம். அப்துல் மஜீத்—நிந்தாவூர்)

(Mr. M. I. M. Abdul Majeed—Nintavur)

May I take this opportunity of thanking the Hon. Minister of Transport for inviting proposals from me regarding requirements in my constituency. In response to such a request I did submit a list of works that needed urgent attention. I am happy today to state that the Minister has made provision for the construction of a bridge in my constituency. I am sorry, however, that two items have been left out. I say I am sorry because, in keeping with the financial state of the country, I submitted a list of items which, though important, are not I am sure going to cost the Government much.

My good Friend the hon. Member for Galle (Mr. W. Dahanayake) when he was Prime Minister visited this area regarding a bridge that was required at Konawatta in Addalachchenai. This is a bridge to bridge the Konawatta settlement and the main

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

land. People, expectant mothers and so on, had to wade through for medical aid. The hon. Member for Galle, when he was Prime Minister, was convinced about the urgency and necessity for such a structure. I understand that he promised to attend to this early. I think it is the duty of the Government that has succeeded to see that our Premier's promise is kept. I am sure the Hon. Minister will definitely look into this soon after his return from his tour.

Then there is another bridge, that is the Panangkadu Bridge which is also a wooden structure. Its period of usefulness appears to be over. It is over 20 years old. This bridge occupies a very important position on the trunk road—between the mainland and the agricultural area. Not only that. It serves as the only link for Panankalai area during the rainy season when the causeway in Sinna Mohatwaram and other places goes under water. It serves as the only link even for the transport of essential commodities in the Panama area. I would therefore request the Hon. Minister to get this bridge examined. I doubt that it has even been surveyed. During the rainy season all sorts of difficulties will arise.

I would kindly ask him to take this out of the Ten-Year Plan. They have included this in the Ten-Year Plan. But these small works do not deserve a place in the Ten-Year Plan. They are really very small structures. I would appeal to the Hon. Minister to take these out of the Ten-Year Plan and bring them under his priority list.

Then there are these postal needs, normal requirements which concern a Member of Parliament. With regard to sub-post offices my requirements are three sub-post offices. One of them has already been approved. As for the other two, we require one at the new settlement in Akkaraipattu, Division No. 1 and the other at Alayadirempu. I will take these items up independently. Another item we require, so far as the Postal Department is concerned, is an outo-exchange at Akkaraipattu Post Office. I understand that the land has already been acquired, that it was acquired, some time ago. I shall be thankful if you would please put this into operation at the earliest opportunity.

I now come to the last item which even my predecessor fought for—an express train to Batticaloa. Even before the "baby" was born I hear they christened the baby. Several names were suggested. Some suggested "Singing Fish". Others suggested "Mariam Beebee" and "Fathima Beebee." It is not that I love names like "Mariam Beebee" "Fathima Beebee" or "Singing Fish" less, but may I suggest a name acceptable to all namely "Eastern Mother" or "ஈழத்தாய்". I would earnestly urge the Hon. Minister to definitely look into the the requirements of my constituency which has been neglected for long.

ස්ටැන්ලි මොල්ලිගොඩ මයා. (නිවිතිගල)
(திரு. ஸ்டான்லி மொல்லிகொட—நிவிதிகல)
(Mr. Stanley Molligoda—Niwitigala)

I wish to make a few observations on behalf of my constituency. At the very outset I wish to thank the Hon. Minister of Transport and Works for giving us a certain number of sub-post offices and roads. But I would like to bring to the notice of the Hon. Minister that these areas constitute one of the most backward and undeveloped areas in this country, particularly one part of my electorate near Nawagam Korale, Pallepattu, This particular area was never touched in the past. My predecessor in Parliament has not even visited this area and as such it has been altogether neglected.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

රැස්වීම අ. භා. 2 වනතුරු තාවකාලිකව අත්හිටවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින් අ. භා. 2ට නැවත පටන්ගන්න ලදී.

ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.
(திரு. ஸ்டான்லி மொல்லிகொட)
(Mr. Stanley Molligoda)

Mr. Chairman, I was pointing out before lunch that my electorate is one of the most under-developed in the

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.]

country. Within the electorate itself there are certain areas which are more under-developed than others, particularly Navadun Korale, Palle Pattu and Atakalan Korale, Palle pattu, where the villagers have no road and transport facilities worth talking about. The few roads you have there are estate roads which have been taken over by the P. W. D. It is only this year that the Hon. Minister of Transport was gracious enough to give us two miles of P. W. D. roads. No new work of any kind had been done in this area in the past.

There is a mountain area in my electorate, Atakalan Korale, Palle Pattu, and places like Panniya, Godakumbura and so on, with a population of over 7,000 are without any road facilities at all. The people have to trudge through jungle footpaths in order to get to their villages. They told me that as long ago as 1943, at a by-election for the Balangoda seat, a former Speaker of this House, Sir Francis Molamure, promised them that when he came to canvass their votes again there would be motorable roads in the area and that he would be using a car. Even with such a promise made by so powerful a personality in Ceylon politics at that time the people are still without decent roads. I would beg of the Hon. Minister to ask the P. W. D. to extend the road from Rakwana, through Gangoda to Pannila linking it with the existing estate roads so that the people may get about more conveniently.

In Navadun Korale, Palle Pattu, on the left bank of the Kaluganga, there is a large tract of land without road facilities of any kind. It is impossible for the people in this area to use even the existing road-tracks. There is one important route from Palawila on which buses ply. It is difficult even to walk on that route, and the people say that it is no wonder that the C. T. B. has to foot a big bill on account of repairs to the buses using this route. I would ask the Hon. Minister to direct the department to do some work on this route.

Another important road in Navadun Korale, Palle Pattu that requires immediate attention is the Kotapolla road. There is a bridge also that needs attention, four miles from the junction. It is only a foot-bridge and no vehicular traffic can pass it. People have to come by car and walk across it. This bridge has to be widened and modernized as early as possible. I have impressed on the Minister the importance of this bridge on more than one occasion.

These are only a few of the urgent public work's needs of my area. There are so many others which are as urgent and important. I know that the financial position of the Government is not too good, but we must not forget that no development of the under-developed areas of the country —mine is one of the most under-developed areas as I said at the beginning—is possible without transport facilities. I appeal to the Hon. Minister to take serious note of these requirements.

As I said earlier, the bridge at Ginihiriya is only a foot-bridge and even the stretch of road across this foot-bridge is P. W. D. road. The people have to come to the foot bridge, get down from their vehicles and walk across the bridge.

Then with regard to estate roads, some of them are supposed to be grant--in-aid roads. I am very happy that the Hon. Minister has decided to take over the Watapota-Haupe road. I hope that that road would be maintained in a much better conditon than was done by the estate, or at least in the same condition.

About the Endane Estate road I should like to state that it is a very good road and well maintained by the Endane Estate Company. But there is a barrier and a gate where people have to pay a toll when passing or bringing goods through that gate. Therefore I would appeal to the Hon. Minister to give instructions at once to his officials to remove this barrier on this estate road, for I do not think that in this age, barriers are necessary. Moreover, this is perhaps the only road linking so many villages.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

You know that most of these villages are in tea and rubber growing areas and people have to go to their villages along estate roads, and there should be no barriers and gates along these estate roads because there is no other access at all for them to their villages. As you know, these are very backward areas inhabited by poor villagers. The only transport facilities available to them are through the estate roads and if there is going to be a gate on these estates roads, I wonder how these poor people can go through.

I would also like to mention that even on the existing P. W. D. roads the bridges are in a very dilapidated condition. They are virtually in the stage of collapse. In particular, I wish to mention the Nivitigala-Watapota road. There are four bridges all of which are in a very very dilapidated condition. I hope the Minister will take serious notice of this matter and instruct his officials immediately to repair the bridges. Otherwise, he will find one day that a bus or a lorry has gone down with a bridge.

Another thing I would like to mention is that along the Kotamulla-Karanagoda-Dambuluwewa Road, the trees have so overgrown on either side that even people who travel by bus cannot go safely because they are hit by the branches. That road is not at all maintained well by the P. W. D.

Then with regard to postal facilities in my electorate I do not want to mention a long list, but I should like to say that telephone facilities are essential to some of the sub-post offices in my area. In some remote areas like Panapitiya which is about 14 miles from Kahawatta, Kolombagama which is about 8 miles from Nivitigala, Delwala, Hangomuwa, Karanagoda, there are no telephone facilities at all, particularly at the post office at Karangoda which feeds the colonists at Pallepattu in Medalengamuwa areas. The Land Development Department has recently opened up new land but no telephone or telegraph facilities at all are available particularly at Medalegamuwa sub-post office which feeds the entire colony of 700 acres. I hope that during this financial year the Minister will put all these things right. Telephone facilities are indeed essential for whatever development it may be.

I understand that the Hon. Minister of Industries is about to start industrial projects in my electorate, in Pallepattu, an area which can be fed by Hongamuwa and Karangoda sub-post offices. If there are no telephone facilities, all those development schemes would come to nothing at all.

Not only do they lack telephone facilities, but in some of the sub-post offices there are no delivery facilities as well. People from remote areas have to come to the sub-post office to collect the letters. People have to come from Delwala, Pannila, Wattehena to Kolombogama and collect their letters. I appealed to the Hon. Minister and the Post Master General on several occasions to give at least a delivery peon or messenger for those areas, but I regret to say that no attention has been paid yet and this is indeed so important particularly for an under-developed area like Sabaragamuwa.

Then, in passing, I wish to refer to the C. G. R. The Kelani Valley train has aptly been described by the people of my electorate as " Sabaragamuwa *heminserey* ". So I think that if we can at least put an express train along the K. V. Line running from Colombo to Opanaike, even if it can reach Opanaike in four hours, I think there will be many people to patronise the train. The whole trouble is that even the goods wagons are attached to these trains so that they are slower than usual. So let us at least experiment and see whether an express train would be a success. The most important thing regarding the K.V. Line is that both the Kelani Valley and the Ratnapura District are plantation areas and I hope that during the period of the S. L. F. P. Government we will have a broad gauge train along the K.V. Line so that the transport facilities would be as efficient as those in the Coastal or Main Lines.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.]

I do not want to make a long speech and take the time of this House, but I finally wish to say to the Hon. Minister that it is areas like ours that should be developed first for, during centuries of colonial rule, they were the areas most exploited. With the coming of the plantation economy the people lost the lands that they had; and they were deprived of transport facilities whatsoever. The estate companies did not give them any roads to enable them to have access to their villages. Let us at least now put things right. I therefore hope that more attention will be paid by he P. W. D. to the undeveloped and under-developed areas of this country than in the past.

යූ. පී. වයි. ජිනදාස මයා. (කුණ්ඩසාලෙ)
(திரு. யூ. பீ. வை. ஜினதாஸ—குண்டசாலே)
(Mr. U. P. Y. Jinadasa—Kundasale)

ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශය යටතේ මටද වචන කීපයක් කියන්න තිබෙනවා. කඳු හෙල්, ඇළ දෙළ ආදියෙන් පිරී තිබෙන අපේ ප්‍රදේශවල ඇතැම් පාර වල් කපා අවුරුදු 10 ක් 15 ක් වෙනත් ඒ වායේ පාලම් නැතිකමින් ඒ ප්‍රදේශ වාසීන් මහත් කරදර රාශියකට පත් වී සිටිනවා. උඩගම-වාහින්න පාර කපා දැනට අවුරුදු 20 ක් පමණ වෙනත්, ඔයවල් දෙකක් හරහා වැටී ඇති එම පාරේ ඒ ස්ථානවල පාලම් නොමැතිකම නිසා වර්ෂා කාලයට මිනිසුන්ට එගොඩ මෙගොඩ වන්න බැරි වෙනවා. ඒ වාගේම සිරිමල්වත්ත-පිටිවල පාරෙහිද පාලමක් ඇත්තේ නැහැ. අවුරුදු 25 ක් තිස්සේ අඩි පාරක් වශයෙ නුයි, එය ඒ නිසා පවතින්නේ. මෙයින් ඒ ප්‍රදේශවාසීන්ට මහත් දුෂ්කර තාවක් ඇති වී තිබෙනවා. දෙපැත්තේම තාර දමා තිබෙනත් පාලමක් නොමැති නිසා වාහන ගමනාගමනය කිරීමට ක්‍රම යක් ඇත්තේ නැහැ. ඒ වාගේමයි, තිල් දෙණිය-පන්විල පාර. ඒ ප්‍රදේශවල වාසය කරන්නේ එලවලු ආදී ගොවිතැනින් ජීවත් වන ගොවියනුයි. එහි පාරවල් නොමැති නිසා රථවාහන ගෙන යන්න බැරි හෙයින් ඔවුන්ගේ නිෂ්පාදන මහනුවර වැනි නගර වලට ගෙන ඒමට ක්‍රමයක් ඇත්තේ නැහැ. මා නියෝජනය කරන කොට්ඨාශයේ නිෂ්පාදන අඩු වේගන යන නිසා ඒ සම්බන්ධ යෙන් වැඩි සැලකිල්ලක් දක්වන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

තැපැල් පහසුකම් අතින් කල්පනා කර බලන විට අලුතින් මන්ත්‍රී ආසන බෙදීමේ ප්‍රතිඵලයක් වශයෙන් කුණ්ඩසාලේ ප්‍රදේශ යට දැන් තිබෙන්නෙ උප තැපැල් කන් තෝරු කීපයක් පමණයි. මැණික්හින්න, හුරිකඩුව වැනි උප තැපැල් කාර්යාලයන් කිහිපයක් පමණයි මගේ කොට්ඨා ශයේ තිබෙන්නේ. මේ උප තැපැල් කන් තෝරුවලට කිට්ටුව ආරෝග්‍ය ශාලාවකුත්, ප්‍රාථමික පාඨශාලා රාශියකුත්, මධ්‍ය මහා විද්‍යාලයකුත්, එවැනි මහජන පොදු ආය තන ගණනාවක් තිබෙන නිසා ඒවාට තැපැල් පහසුකම් විශෙෂයෙන්ම අවශ්‍ය බව කල්පනාවට ගෙන ඒවායේ ගනුදෙනු වඩාත් පහසු කිරීම සඳහා කටයුතු කරන්න ඕනෑ. ඒ ඒ ආයතනවලට වුවමනා තැපැල් පහසුකම් නැති නිසා විශාල කරදරවලට මුහුණ පාන්ට සිදු වෙනවා. ඒ ගැන ගරු ඇමතිතුමාගේ විශෙෂ අවධානය යොමු කරන හැටියට ඉල්ලා සිටිනවා. හුරිකඩුව උප තැපැල් කාර්යාලය හැකිතාක් ඉක්ම නින් විශෙෂ තැපැල් කාර්යාලයක් බවට පරිවර්තනය විය යුතුයි. මේ ප්‍රදේශයේ ගමනාගමන පහසුකම් ආදිය සම්බන්ධ යෙන් මේ තරම් අඩුපාඩුකම් පවතින්ට ප්‍රධාන වශයෙන්ම හේතු වී තිබෙන්නේ කඳු බහුලව තිබීමයි. එහි ඇළ, දෙළ, ගංගා, ආදිය බෙහෙවින් තිබෙන නිසා පාරවල් අඩුයි. ඒ වගේම තැපැල් කන්තෝරුත් අඩුයි. තෙල්දෙණිය, වත්තේගම, මහනුවර වැනි තැන්වල තැපැල් කන්තෝරු තිබෙන නමුත් ඒවාට හැතැප්ම දහය, දෙළහ යන්න ඕනෑ. ඒ තැපැල් කන්තෝරුවලට ගියත් ඒවායින් වැඩ කටයුතු කර ගැනීමට විශාල වශයෙන් මහජනයා පැමිණෙන නිසා මගේ ප්‍රදේශයේ ජනයාට ඒ තරම් දුරක් ගෙවා ගියත් නොයෙක් විධියේ හිරිහැර කරදරවලට මුහුණ පාන්න සිදු වෙනවා. කලට වේලාවට තමන්ගේ කටයුතු කරවා ගන්න එසින් අපහසු නිසා කරුණා කර හැකි තාක් ඉක්මනින් සහනයක් සලසා දෙන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

1960-61 ආදායම් වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද මුදල් මගේ කොට්ඨාශයේ අඩුපාඩුකම් පිරිමසාලීමට යොදා තිබෙනවාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියන්න බැහැ. ඒ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියා මාර්ගයක් ගෙන තිබෙනවාය කියා වත්, ආරම්භ කර තිබෙනවාය කියාවත්, හිතන්න බැහැ. ඒ ගැන සඳහන් කරන්න සිදු වීම කනගාටුදායකයි. දිස්ත්‍රික්කය භාර ඉන්ජිනේරු මහත්මයා මුණගැසී ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කළාම ඒ මහත්මයා කියන්නේ සැලැස්ම පිළියෙළ කර නැත, ඇස්තමේන්තු පිළියෙළ කර නැත, ආදි වශයෙනුයි. සමහරවිට කණ්ණාඩි නැත කියනවා. ඉල්ලුවාම කැඩුණු ඒවා ලැබෙන වාලු. එතකොට ඒවා ආපසු යවනවාලු. ඔය ආකාරයට මහා කාර්යාලයට දෙස් කියනවා. එසේ ප්‍රධාන කාර්යාලයට දෙස් පැවරීමෙන් වැඩක් සිදු වන්නේ නැහැ.

ඊළඟට දුම්රිය පහසුකම් සම්බන්ධයෙනුත් වචනයක් දෙකක් කියන්න ඕනෑ. මා හැමදාම පාහේ කොළඹට ගමන් කරන්නේත්, කොළඹින් ආපසු මගේ ප්‍රදේශයට ගමන් කරන්නේත්, දුම්රියෙනුයි. දුම්රියේ පහසුකම් මදි. එහි බොහොම අඩුපාඩුකම් තිබෙනවා. නොයෙක් අවහිරකම්වලට මුහුණ පාන්න සිදු වෙනවා. දුම්රියේ පංක්ති භේදය ගැන මා කියන්නේ පුළුවන් තරම් දුරට දුම්රියේ පංක්ති භේදය අඩු කළ යුතුය කියායි. එය ඉතා වැදගත් දෙයක්. දැනට වැඩි වශයෙන්ම පළමුවැනි පංක්තියේ ගමන් කරන්නේ රජයේ සේවකයන් බව කියන්න පුළුවනි. ඇත්ත වශයෙන්ම පළමුවන පංක්තියේ ගමන් කරන්නේ රජයේ සේවකයන් පමණයි කියන්න පුළුවන් තරමයි. ඒ නිසා හුඟ දෙනෙකුට පහසුකම් ලබා දිය හැකි වනු පිණිස දුම්රියේ දැනට පවත්නා පංක්ති භේදය නැති කර දමන මෙන් ඉල්ලා සිටිනවා.

මට කලින් කථා කළ උඩුනුවර ගරු මන්ත්‍රීතුමා (ටී. බී. ජයසුන්දර මයා.) ගුවන් සේවය ගැන කීවා. මුළු ලෝකයේම ප්‍රසිද්ධියක් උසුලන මහනුවරට ගුවන් තොටුපළක් අවශ්‍ය බව කියන්න ඕනෑ. ලෝකයේම ප්‍රසිද්ධ අති ශ්‍රේෂ්ඨ දළදා වහන්සේ වැඩ සිටින මහනුවරට ලංකාවේ නොයෙක් ප්‍රදේශවලින් පමණක් නොව ලෝකයේ නොයෙක් රටවලින් පවා මහ ජනයා එනවා. ඒ නිසා ගුවන් තොටුපළක් ඇති කිරීම සම්බන්ධයෙන් සලකා බලනවා නම් හොඳයි. ඒ සඳහා පල්ලෙකැලේ ප්‍රදේශයෙන් වුවමනා කරන භූමි භාගය ලබා ගැනීම අමාරු නැහැ. තැනිතලා ප්‍රදේශයක් එහි තිබෙනවා. එය ඉක්මනින් ආරම්භ කරන මෙන් ඉල්ලා සිටිනවා. හැම දෙම නෙයෙක් දේ ගැන මතක් කරමින් කරදර කරන්න පුළුවන්කමක් නැහැ. නොයෙක් විධියේ අඩුපාඩු තිබෙන නිසා ඒ හැම එකක් ගැනම කල්පනා කර බලා වුව මනා කරන මුදල් ලබාගෙන එම වැඩ කට යුතු කර දෙන මෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලමින් මගේ වචන සවලපය අවසන් කරනවා.

ආර්. ඩබ්ලිව්. තෙන්නකෝන් මයා. (මිනිපෙ)

(திரு. ஆர். டப்ளியு. தென்னகூன்—மினிப்பே)

(Mr. R. W. Tennekoon—Minipe)

There is just one matter which I wish to bring to the notice of the Hon. Minister and that is the work pertaining to the Kandyan Peasantry Rehabilitation Organization. I should like to emphasize that this organization is doing very good work in regard to roads and erection of buildings, such as schools and hospitals, but the snag at the moment is that the organization is badly handicapped by the lack of adequate staff. At the moment, as far as I was able to ascertain, in Kandy there is only one engineer, a junior officer from the P. W. D. The Superintending Engineer of the Central Province is now acting as the Chief Construction Engineer of the Kandyan Peasantry Rehabilitation Organization.

The work on the roads so far taken over is proceeding fairly satisfactorily I should think, but I should like to ask the Hon. Minister if, side by side with the provision of adequate staff to man that office, he could take on more roads in the various areas, both in the Kandy District and in the Uva Province. If that is done, I have no doubt that the provision of adequate road facilities to most of the inaccessible places in Minipe, Teldeniya and various other electorates, could be hastened.

Quite apart from that, I think there was a letter sent by the Hon. Minister some time ago, asking us to state the roads which we wanted done in a certain order of priority. We supplied that information, and we should

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ඩබ්ලිව්. තෙන්නකෝන් මයා.]

like to know from the Hon. Minister whether he is in a position to take up as many roads as possible from each of these electorates.

ටී. බී. ඇම්. හේරත් මයා. (වලපනේ)
(*திரு. ரி. பி. எம். ஹெரத்—வளப்பனே*)
(Mr. T. B. M. Herath—Walapane)

ගරු සභාපතිතුමනි, ප්‍රවාහණ හා රජයේ වැඩ දෙපාර්තමේන්තුව පිළිබඳ මේ වැය ශීර්ෂය යටතේ මා වචන දෙකක් තුනක් කථා කරන්න අදහස් කරන්නේ ගමනාගමනය අතින් ඉතාමත් දුෂ්කර ප්‍රදේශයක තිබෙන කොට්ඨාශයක් වෙනුවෙනුයි. පසුගිය අවුරුද්දේ සෑහෙන උනන්දුවක් දක්වා මේ කොට්ඨාශයට ගමනාගමන පහසුකම් ලබා දීමට උත්සාහ කර තිබීම ගැන මා විශේෂයෙන්ම ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ශත වර්ෂ ගණනාවක් තිස්සේ, එහෙම නැත්නම් ලංකාව ඇති වූ දා සිට මේ දක්වාම මොනම විධියකින්වත් සැල කිල්ලක් නොලත් මේ ප්‍රදේශයට පසුගිය අවුරුද්දේ යම්කිසි ප්‍රමාණයක සතුටුදායක තත්ත්වයක් ඇති කර දීම ගැන ඒ කොට්ඨාශයේ ජනතාවගේ අවංක, හෘදයංගම ස්තුතිය ඒ ඇමතිතුමාට පිළිගන්වන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, ගමනාගමන ඇමතිතුමාත් එම අමාත්‍යාංශයත් දක්වන උනන්දුවේ තරමට ගමනාගමන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් උනන්දුවක් දක්වන්නේ නැහැ. අමාත්‍යාංශය දක්වන තරමේ උනන්දුවක් දෙපාර්තමේන්තුවත් දක්වනවා නම් අපට මීට වඩා සන්තෝෂයෙන් මහජනයාගේ ප්‍රශ්න විසඳීමට පුළුවන්කම ලැබෙනවා. ඇමතිතුමා විසින් යම් යම් නියෝග කරනු ලැබෙතත්, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එම නියෝග ක්‍රියාත්මක කරනු වෙනුවට ඒවා ක්‍රියාත්මක නොකිරීමට කරුණු සෙවීම සඳහා කාලය යොදනවා. මීට පෙර ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකු විසින් ප්‍රකාශ කරන ලද පරිදිම මේ කාරණය මෙසේමයි. අප මේ ගැන ඉතාමත්ම කනගාටු වෙනවා. නිදර්ශනයක් වශයෙන් මා නියෝජනය කරන කොට්ඨාශයේ මුංවත්ත-ලියන්වල පාර ගැන සඳහන් කළ හැකියි. මෙම පාර කැපීමට ඇමතිවරයා විසින් නියෝග කරන ලද නමුත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඊට බාධා කළා. එහි වැඩ පටන් ගැනීමට බාධා ඇති කළා. ඊට පසුව ඇමති තුමා නියෝග කළ පාර වෙනුවට වෙනත් පාරක් කපන්ට පටන් ගත්තා. මේ පිළිබඳව ඇමතිවරයාට කරුණු පෙන්වා දීමෙන් පසුව, ඇමතිවරයා විසින් එම පාර කැපීම නවත්වා දමන්න යෙදුණා. නැවත නියම පැත්තෙන් පාර කපන්න නියෝග කළා. එහෙත් එය සම්පූර්ණයෙන්ම නොසලකා හරින ලද බව කිව යුතුයි. විරුද්ධ පක්ෂයේ නායක තුමා මෙයට මැදිහත් වන්න ඇත්තේ සමහර විට කරුණු හරිහැටි නොදන්න විය හැකියි. මා එතුමාට චෝදනා කරනවා නොවෙයි. නමුත් වැඩි ප්‍රයෝජනයක් සැලසෙන පරිදි කපන්න අදහස් කරන ලද පාර කපා ගන්න බාධා ඇති වුණා. ආණ්ඩුවේ නිලධාරීන්ට වුවමනා කරන්නේ මොන විධියට හෝ වැඩ ප්‍රමාද කිරීම නම්, විරුද්ධ පක්ෂයේ නායක තුමා තබා පිදුරු ගහක් හරහට හිටියත් එහි එල්ලී එම වැඩ ප්‍රමාද කිරීම සිරිතයි. වැඩ ප්‍රමාද කිරීම සඳහා ඕනෑම පිදුරු ගහක එල්ලෙනවා.

ගරු සභාපති තුමනි, රජය විසින් වියදම් කරනු ලබන මුදලට සරිලන පරිදි ප්‍රයෝජන නොසැලසෙන බව අපට කියන්න සිදු වී තිබෙනවා. දුර බැහැර පිටිසර ප්‍රදේශවල සිදු වන දේ පිළිබඳව කරුණු දැක්වීම අපේ යුතුකමයි. ඩී. ආර්. සී. පාරවල් පවත්වා ගෙන යෑම සඳහා ඒවායේ දිග ප්‍රමාණය අනුව රුපියල් 500, 1,000, ආදී වශයෙන් මෙම අයවැය ලේඛනයෙන් මුදල් වෙන්කර තිබෙන බව තමුන්නාන්සේලා දන්නවා. එහෙත් කනගාටුවෙන් කිවයුතු කරුණක් තිබෙනවා. අවුරුදු පහකට වරක්වත් එක හිඟුරු අත්තක්වත් කපන්නේ නැතිව, සෑම අවුරුද්දක් අවසානයේදීම එම මුදල් ලබා ගන්න අවස්ථා තිබෙනවා. මේවා ගැන පරීක්ෂා කර බැලීම සඳහා යෑමේ අපහසුව ප්‍රයෝජනයට ගෙන මෙසේ වංචනිකව ක්‍රියා කරනවා. නිදර්ශනයක් වශයෙන් හැතැප්ම 10ක් පමණ යන්නට තිබෙන පන්නල පහළ බදුලු පාර ගැන කියන්නට පුළුවනි. ඒ වගේම තෙරිපැහැ අරුක්වත්ත පාරත් සම්පූර්ණයෙන්ම පසින් යන්ට තිබෙන පාරක්. මේ තෙරිපැහැ අරුක්වත්ත පාර පවත්වාගෙන යාමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවුරුද්දකට රුපියල් 1,700 ක් වෙන් කර තිබෙනවා. නමුත් පසුගිය අවුරුදු පහට හයටම ඒ පාරට සතයක්වත් වියදම් කළේ නැහැ. වියදම් නොකළත් ඒ මුදල් පාවිච්චි වී තිබෙන බව මට දැනගන්න ලැබී තිබෙනවා. ඔය විධියට මහජනයාගේ සල්ලි නාස්ති කරන ව්‍යාපාරයක්, එක්තරා විධියක ඒකාධිකාරී වැඩ පිළිවෙළක්, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ යම් යම් ස්ථානවල තිබෙන බව මට කනගාටුවෙන් කියන්නට සිදු වී තිබෙනවා.

අ. භා. 2.30

ඊයෙ පෙරෙයිදා ආණ්ඩු පක්ෂයේ රැස්වීමේදී මම පැමිණිල්ලක් කළා, කිසිම හේතුවක් නැතිව රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ සමහර ඕවර්සියර් මහත්වරුන්ට සිමෙන්ති වගයක් සපයා තිබෙන බවට. ඇමතිතුමාට කළ ඒ පැමිණිල්ල ගැන දැන් විභාග කරගෙන යනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. නම් වශයෙනුත් මම සඳහන් කරන්න කැමතියි. කෙකිල්ලගස්කඩ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් තැන්පත් අබේසිංහ බණ්ඩා මහත්මයාට කිසිම වුව මනාවක් නැතිව, ඒ මහත්මයාගේ කිසිම ඉල්ලීමක් නැතිව, සිමෙන්ති කොට්ට 65ක් නිතුත් කර තිබෙනවා, නුවරඑළියේ ඉංජිනේරු තැන විසින්. ඒ මොන හේතුවක් නිසාද කියා ඒ මහත්මයා දන්නෙත් නැහැ. මේ විධියට රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ මුදල් අපතේ යවන ක්‍රම රාශියක් තිබෙනවා.

සමහර ස්ථානවල පාරක් මතින්නේ වත් නැතිව ඒ පාර කැපීමට කම්කරුවන් යෙදුවාය කියා, චෙක්රෝල්වල කුලී කරුවන්ගේ නම් සඳහන් කර, ඔවුන්ට වැටුප් ගෙව්වාය කියා අයුතු විධියට මුදල් ලබාගත් අවස්ථා කීපයක් ගැන මම ඇමතිතුමාට පැමිණිලි කර තිබෙනවා. මේ විධියේ සිද්ධීන් ගැන පරීක්ෂණ පවත්වන අවස්ථාවේදී ඒ පරීක්ෂණ පවත්වන්ට යන නිලධාරීනුත් අවංකව නියම විධියට වැඩ කරන්නේ නැති බවට මට චෝදනා කරන්න සිදු වී තිබෙනවා. පසුගිය සතියේ මා සඳහන් කළ සිමෙන්ති පිළිබඳව පරීක්ෂා කරන්ට ගිය නිලධාරියා අබේසිංහ බණ්ඩා කියන මහත්මයාව හමු වන්නවත් ගියේ නැහැ. ඒ මහත්මයා ලැහැස්තියි කිසිම හේතුවක් නැතිව තමාට සිමෙන්ති කොට්ට 65 ක් එවා තිබෙන බවට සාක්ෂි දීමට. නමුත් ඒ ගැන පරීක්ෂා කිරීමට ගිය නිලධාරියා ඒ මහත්මයාව හමු වීමට නොගොස් වෙන රවුමකින් ආපසු කොළඹ පැමිණ ඇති බව අපට දැනගන්න ලැබී තියෙනවා.

රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් වියදම් කරන මුදල්වලින් අපේ ප්‍රදේශවල යම් යම් වැඩ කිරීම මිස ඒවා සිමෙන්ති මාඟියෙන් හෝ කළු ගල් මාඟියෙන් හෝ වැලි මාඟියෙන් හෝ සල්ලි බවට හරවා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් මහත්වරුන්ට විශාල මන්දිර සදන්න දීම නොවෙයි, අපට වුවමනා කරන්නේ. එම නිසා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් මහත්වරුන් ආරක්ෂා කිරීමට අපට වුවමනාවක් නැති බව මම ප්‍රකාශ කරන්න කැමතියි. වෙනත් දෙපාර්තමේන්තු ගැන කෙසේ වෙතත්, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ සේවයෙහි යෙදී සිටින්නාවූ නිලධාරීන් ගැන පරීක්ෂණයක් පැවැත්වීමට වහාම කොමිෂන් සභාවක් පත් කර ඔවුන්ගේ වත්කම් පිළිබඳව සොයා බැලීමට වහාම සුදුර පියවරක් ගන්න ලෙස මම ඉල්ලා සිටිනවා. අපේ පාරවලට සල්ලි වියදම් වී තිබෙනවාද, එසේ නැත්නම් ලංකාවේ උතුරේ හෝ දකුණේ හෝ යම් යම් ප්‍රදේශවල විශාල ගොඩනැගිලිවලට මේ සල්ලි වියදම් වී තිබෙනවාද, යන්න එදාට දැන ගන්න පුළුවන් වේවි.

ගරු සභාපතිතුමනි, තවත් එක කරුණක් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමා පසුගිය අවුරුද්දේ සමිතිවලටත් පාරවල සහ ගොඩනැගිලිවල වැඩ දෙන්නය කියා නියම කළා. ඒ අනුව යම් යම් වැඩ සමිතිවලට දුන්නා. නමුත් සමිතිවලට ඒ වැඩ කරන්න බැරි විධියට නොයෙක් විධියේ බාධා ඇති කරනවා. ඒ සඳහා එක නිදර්ශනයක් මම පෙන්වන්නම්. එක්තරා ස්ථානයක වතුර ටැංකියක් සවි කරන්න ඇස්තමේන්තුවක් හැදුවා. ලංකාවේ කොයිම තැනකින්වත් ඒ ටැංකිය රුපියල් 450 කට අඩුවෙන් ගන්න බැහැ. නමුත් ඒ ඇස්තමේන්තුවේ සඳහන් කර තිබුණේ රුපියල් 150 යි. සමිතියට වැඩ කරන්න බැරිය කියා පෙන්වා පරණ පුරුදු ජාවාරමම වෙන විධියකට කරන්න ඒ ඇස්තමේන්තුව සාදා තිබෙන බව අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. ඇම්. හේරත් මයා.]

පැහැදිලිව පෙනෙනවා. එසේම නොයෙක් විධියේ බොරු වාර්තාත් ඉදිරිපත් කරන බව පේනවා. සමහරවිට සැතැප්මක්වත් දිග නැති පාරක් සැතැප්ම තුනක් හතරක් දිගය කියා වාර්තා කරන බව අපි දන්නවා.

ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාශයේ පාරවල් සම්බන්ධව නම්, ඉතාම ශීඝ්‍ර දියුණුවක් අවශ්‍යයි. අඩි 3,000, 4,000, 5,000 උස කඳුවල හැතැප්ම 20, 25 දිග ඇති පාරවල මිනිසුන් පයින් යන ප්‍රදේශයක් මේ ලංකාවේ වලපනේ හැර වෙන කොහේවත් නැහැ. මෙම කොට්ඨාශයේ මේ තරම් විශාල ගමනාගමන අමාරුකම් තිබියදී අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර පාවිච්චි කිරීමට නිලධාරීන් කැමති නැහැ. මේ ගැන සොයා බැලුවාම අපට පෙනී යන්නේ යන්ත්‍ර සූත්‍ර පාවිච්චි කළාම ඔවුන්ට ඒ ප්‍රදේශයෙන් මුදල් ගරා ගැනීමට ටිකක් අමාරු ඇති වන බවයි. එම නිසා යන්ත්‍ර සූත්‍ර පාවිච්චි කිරීම නැවැත්වීමට නිලධාරීන් සෑම ප්‍රයත්නයක්ම දරනවා. එම නිසා මොන අමාත්‍යාංශයකට අයිතිව හෝ, ගල්ඔය හෝ වෙන කොහේ හෝ සථානයක යන්ත්‍ර සූත්‍ර තිබෙනවා නම් ඒවාවත් මෙම ප්‍රදේශයේ වැඩවලට යොදවා පුළුවන් තරම් ඉක්මණින් ප්‍රදේශය සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කිරීම යුතුකමක් බව මම පෙන්වා දෙන්න කැමතියි.

විදුලි පණිවුඩ සහ ටෙලිෆෝන් සේවය නොහොත් දුරකථනය පිළිබඳව වචනයක් දෙකක් කියන්න ඕනෑ. සිංහලය රාජ්‍ය භාෂාව කළ හැටියේම නම් බොහෝම ලොකු උනන්දුවකින් සිංහලෙන් වැඩ කර ගෙන ගිය බව අපට දැනගන්න ලැබුණා. නමුත් අද ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම මඟ හැරී තිබෙනවා. එම නිසා දෙපාර්තමේන්තුව සිංහලයෙන් වැඩ නොකිරීමට ඇති හේතු සොයා බලා සිංහලයට නියම තැන ලබා දීමට කටයුතු කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, පාරවල් සම්බන්ධයෙන් වචනයක් දෙකක් කියන්න ඕනෑ. උඩරට ගැමි සංවර්ධන ක්‍රමය යටතේ පිළියෙල කරන ලද පාරවල් තුනක් මගේ කොට්ඨාශයේ තිබෙනවා. උඩරට ගැමි පාරවල් සඳහා පසු ගිය අවුරුද්දේ රුපියල් ලක්ෂ 30ක පමණ මුදලක් වෙන් කර තිබුණා. මගේ කොට්ඨාශයටත් එයින් සෑහෙන මුදලක් වෙන් වී තිබුණා. නමුත් ඉතාම සුළු ප්‍රමාණයක් පමණයි ගිය අවුරුද්දේ වැඩ කෙරී තිබෙන්නේ. ඉලක්කම්වලින් නම් සැතපුම් තුන හතර කපන්න බලා පොරොත්තුවුණා, නමුත් වැඩ කෙරුණේ නැහැ. එමනිසා මේ පාරවල වැඩ නොකිරීමට ඇති හේතු සොයා බලා ඉතාම ශීඝ්‍ර යෙන් ඒ වැඩ කරන්න සලස්වන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා.

විශෙෂයෙන්ම පන්නල-සෑරසුම්තැන්න පාර මේ අවුරුද්දේ අඟලක්වත් කපන්න රජයේ වැඩ දෙපාර්තමේන්තුවට පුළුවන් වුණේ නැහැ. ඕනෑ තරම් මුදල් වෙන් කර තිබුණත් වැඩ කෙරී නැහැ. ඒ වාගේම නිල්දණ්ඩාහින්න-ගල්කැටිවෙල පාර සම්බන්ධයෙන් වැඩ කෙරී තිබෙන්නේ සැතපුම් භාගයක පමණ පස් කැපීමක් පමණයි. අවුරුද්දකට සැතපුම් භාගයයි. සැතපුම් 15ක් 20ක් පමණ දිග පාරකින් අවුරුද්දකට සැතපුම් භාගයක පස් කැපීමක් පමණක් නම් කරන්නේ, වලපනේ ජනතාව තව කොපමණ අවුරුදු ගණනක් තවලම්වලින් බඩු අදිනවා දකින්න අප බලාපොරොත්තු වෙනවාද කියා මම අහන්න කැමතියි. ඒ වාගේම දණහිස්වලට අත දී දී කඳු නැගීමට තව කොපමණ කාලයක් ඔවුන්ට සිදු වේවිද කියා මම අහන්න කැමතියි. අද ජනතාව තුළ පවතින ශාරීරික සෞඛ්‍ය තත්ත්වය අනුව පයින් යාමට බැරි තරම් දුර්වල තැනක ඔවුන් සිටියදී පාරවල් නැතිකමින් ඔවුන්ට කොතරම් කරදරයකට මුහුණ පාන්න සිදු වෙනවාද කියා මම විස්තර නොකළාට තමුන්නාන්සේට අවබෝධ වෙනවා ඇති. ඒ තරම් දුෂ්කර ප්‍රදේශයක් වෙනුවෙන් නිලධාරීන්ගෙන් මීට වඩා විශෙෂ සැලකිල්ලක් ලැබෙන්න වුවමනා බව මම අවධාරණයෙන් ප්‍රකාශ කරන්න කැමතියි. ගරු ඇමතිතුමා මේවා සම්බන්ධයෙන් කොතෙක් නියෝග කළත් බිරි අලින්ට වීණා ගායනා කරන්නා වාගේ ඒවා ගැන කිසිම සැලකිල්ලක් නොදක්වා නිසොල්මන්ව පරණ පුරුදු විධියට පංකා යටට වී, පරණ පුරුදු විධියට කඩදාසිවලට අත්සන් කිරීමට පමණක් නිලධාරීන් බලා ගෙන සිටින තුරු මේ රටේ සංවර්ධනයක් ඇතිකරන්ට බැහැ.

රාසිංගොල්ල-බොලගන්දවල නමැති පාර ගැන කියන්න තිබෙන්නේ ඒ කරුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මයි. රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් මෙතෙක් කල් කරගෙන ගිය සමහර පාරවල වැඩත් මේ අවුරුද්දේ ඇතහිට තිබෙනවා. විශෙෂයෙන් රපහන පාරේ වැඩ ඇතහිට තිබෙනවා. ඒ වාගේම මා කලින් සඳහන් කළ මුංවත්ත-ලියන්වල පාර සම්බන්ධයෙන් නම් විශාල කලබැගෑනියක් කළාට පසුව යම්තම් ගිය සතියේ වැඩ පටන්ගෙන තිබෙනවා. නමුත් තවම දම්වැලකවත් වැඩ කෙරී නැහැ. ඒකත් කොතැන නවතීවිද කියා අපට කියන්න බැහැ. අපට දැනගන්න තිබෙන්නේ මේවායේ වැඩ කිරීමට මුදල් නැති බවයි. නමුත් සිමෙන්ති සපයාගන්න සල්ලි තිබෙනවා. හේතුවක් නැතුව සිමෙන්ති කොට්ට හැටපහවල් සපයන්න සල්ලි තිබෙනවා, නමුත් ඉතාමත් අවශ්‍ය මේ පාරවල් පිළිබඳ වැඩවලට අවශ්‍ය සිමෙන්ති ගැනීමට මුදල් නැත කියා ප්‍රකාශ කිරීමට තරම් අපේ නිලධාරීන් හැඩගැසී ඇති බව ඉතාම කනගාටුවෙන් මතක් කරන්න සිදු වී තිබෙනවා. ඒ වගේම මඩුල්ල පාර, මතුරට-පදියපැලැල්ල පාර, වතුමුල්ල-නිල්දණ්ඩාහින්න පාර, යන පාරවල් ඉතාමත් ඉක්මනින්ම දියුණු කළ යුතුව තිබෙන පාරවල් බව මම වැඩි දුරටත් සඳහන් කරන්න කැමතියි.

මීළඟට තැපැල් කාර්යාල සම්බන්ධයෙන් කරුණු කීපයක් සඳහන් කරන්න ඕනෑ. හැතැප්ම 22ක් පමණ පයින් යන්න තිබෙන අරුක්වත්ත වැනි තැනකට, ඒ වාගේම හැතැප්ම 7ක් පයින් යන්න තිබෙන උඩමාදුර වැනි තැනකට, තැපැල් කාර්යාලයක් නැතිකමින් එහි වැසි ජනතාව කොපමණ දුක් විඳිනවාද කියා අමුතුවෙන් මෙම ගරු සභාවට මතක් කරන්න ඕනෑ නැහැ. ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේලාට කරුණු තේරෙනවා ඇත කියා මා කල්පනා කරනවා. එම නිසා විශෙෂයෙන්ම උඩමාදුර, අරුක්වත්ත, ලියන්වල, අඹන්වැල්ල වැනි බොහෝ දුර පයින් යා යුතු සථානවලට ඉතාමත් ඉක්මනින් තැපැල් කාර්යාල පහසුකම් සලසා දෙන හැටියට මම ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලනවා.

ඒ වාගේම ටෙලිෆෝන් සේවය ඉතාමත් අවශ්‍ය සථාන කීපයක් වලපනේ ප්‍රදේශයේ තිබෙනවා. විශෙෂයෙන්ම කාලාන්තරයක් තිස්සේ ප්‍රශ්න ගොඩ ගැසී නොවිසඳී තිබුණු වලපනේ කොට්ඨාශය වැනි කොට්ඨාශයක සියලුම ප්‍රශ්න එක අවුරුද්දකින් විසඳන්න බැරි බව අපි කවුරුත් පිළිගන්නවා. නමුත් හැකි තාක් ඉක්මනටම මුංවත්ත, කුරුපනාවෙලා, තෙරිපැහැ, මඩුල්ල, වැනි හැතැප්ම පහළොව විස්ස තරම් දුර පයින් යෑමට සිදු වී ඇති සථානවලට, පාරවල් ප්‍රමාද වුණත්, අඩුම ගණනේ ඉතාමත් ඉක්මනින් විදුලි පණිවුඩ පහසුකම්වත් ලබාදීම පිණිස අමාත්‍යාංශයේ සැලකිල්ල යොමු වේවිය කියා මම විශ්වාස කරනවා.

දුම්රිය දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් ඇති කරුණක්ද විශෙෂයෙන් සඳහන් කරන්න තිබෙනවා. නුවරඑළිය-රාගල දුම්රිය පාර, දැනට දුම්රිය දෙපාර්තමේන්තුව විසින් අත්හැර දමා තිබෙන නිසා දුම්රිය දෙපාර්තමේන්තුවට අයිතිව තිබූ ඉඩම් සහ ගොඩනැගිලි රාශියක් කිසිම කෙනකුගේ සැලකිල්ල යොමු වන්නේ නැතිව අත්හැර දමා තිබෙන බව කනගාටුවෙන් සඳහන් කරන්ට සිඩ වී තිබෙනවා. මෙහි ලයින් කාමර කීපයක් ගම් සභාවට භාර දී තිබෙනවා. එහෙත් ඒවායේ සම්පූර්ණ අයිතිවාසිකම් ගම් සභාවට පවරා දී නැහැ. ගම් සභාව මගිනුත් රුපියල් 2.50 කට, 3.00 කට නැත්නම් 5.00 කට ඒවා කුලියට දී තිබෙනවා. නමුත් ඒ ගොඩනැගිලි ගැන කිසිම කෙනකු සැලකිල්ල නොදක්වන නිසා දැන් ඒවා තිබෙන්නේ කඩා වැටීමේ තර්ජනයට මුහුණ පායි. එක්කෝ මේ ගොඩනැගිලි සම්පූර්ණයෙන්ම ගම් සභාවට පවරා දී ගම් සභාව මගින් මුදල් වියදම් කර ඒවා නඩත්තු කිරීමට සලස්වා මහජනයාට ප්‍රයෝජනයක් ලබා ගන්න සැලැස්විය යුතුයි. එසේ නැත්නම් දුම්රිය දෙපාර්තමේන්තුව මගින්වත් එය කිරීමෙන් මහජනයාට ප්‍රයෝජනයක් ලබා දිය යුතුයි.

ඒ වාගේම මෙම දුම්රිය පාරට අයිති ඉඩම් රාශියක් තිබෙනවා. ඒ ඉඩම් යම් යම් පෞද්ගලික බලපෑම් උඩ යම් යම් උදවියට බදු දෙනවා. එම නිසා දුම්රිය දෙපාර්තමේන්තුවට ප්‍රයෝජනයක් නැති ඉඩම් තිබෙනවා නම් ඒවා දිසාපතිවරයාට භාර දී ඒ ප්‍රදේශයේ ඉඩම් නැති උදවියට සුළු කොටස් වශයෙන් එම ඉඩම් බෙදා දීමට සලස්වන ලෙස මම රජයෙන් ඉල්ලීමක් කරන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. බී. ඇම්. හේරත් මයා.]

මීට වඩා දීර්ඝ වශයෙන් කථා කිරීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන් කිසිම වැඩක් නොකෙරී තිබුණු ප්‍රදේශයකට සෑහෙන වැඩ කොටසක් රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් පසුගිය අවුරුද්දේ කෙරී තිබෙනවාය කියන තුති පැසසුම නැවතත් කරමින්, නිලධාරීන්ගේ උදාසීනත්වය හා දුෂණකාරී වැඩ පිළිවෙල නැවැත්වීම සඳහා නියම ක්‍රියා මාර්ගයක් ඇති කිරීම පිණිස ඇමතිතුමා මීට වඩා මහන්සි වුවහොත් එතුමා දැන් ගන්න මහන්සියේ ප්‍රතිඵල මීට වඩා සිය දහස් ගුණයකින් වැඩි වන බවද ප්‍රකාශ කරමින්, ඒ වාගේම එසේ වැඩ කිරීමට එතුමාට ශක්තිය ලැබේවායිද ප්‍රාර්ථනා කරමින්, මම නවතිනවා.

ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්
(சேர் அல்பேட் எப். பீரிஸ்)
(Sir Albert F. Peries)

ගරු සභාපතිතුමනි, දීර්ඝ කථාවක් කිරීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ මන්ද? සෑම පැත්තකින්ම වාගේ ගරු මන්ත්‍රීවරු තමන්ගේ ප්‍රදේශවල ඇති අමාරුකම් ඉදිරිපත් කිරීම පිණිස නැගිටින බව මට පෙනෙනවා. අපි හුඟක් කරුණු ඉවු කර දෙන ලෙස ඉල්ලනවා. ඒ වාගේම අපේ ඇමතිතුමාත් ඒවා සියල්ලක්ම අපට සලසා දෙන්න බොහෝම ආසාවෙන් සිටින බව අපි දන්නවා. අපේ කොට්ඨාශවලට අවශ්‍ය මොන මොනවාද කියා අසා අපට ලියවිල්ලක් එවා තිබෙන නිසා ඇමතිතුමා කොතරම් දුරට ඒ සඳහා ආශාවක් හා උනන්දුවක් දක්වනවාද කියා අපට හොඳින් වැටහෙනවා. ඒ ලියවිල්ලට පිළිතුරු වශයෙන් පාරවල නම් මාලාවක් අපි ලියා යැව්වා. නමුත් අද තිබෙන මුදල් තත්ත්වය නිසා ඒ සෑම දෙයක්ම කරන්න ආණ්ඩුවට බැරි බව අපි දන්නවා. එම නිසා මම මේ අවස්ථාවේදී ඉතාමත්ම වැදගත් කරුණු දෙක තුනක් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමතියි. ගරු ඇමතිතුමා ඒවා ලියාගෙන ඉතාමත් අවශ්‍ය වන ඒ ඉල්ලීම් වහාම ක්‍රියාවේ යෙදෙව්වොත් ඒ ප්‍රදේශයේ ජනතාවට විශාල සහනයක් ලැබෙනවා ඇති.

විශේෂයෙන්ම මගේ කොට්ඨාශයේ යට කළත් පත්තුව කියා ප්‍රදේශයක් තිබෙනවා. ඒ ප්‍රදේශයේ පාරවල තත්ත්වය ඉතාම නරකයි. ඒවා කොපමණ නරක් වුණත් එහි ඇති සෑම පාරක්ම සදන්නය කියා මම ඉල්ලන්නේ නැහැ. නමුත් එහි ඇති පාරකට දෙකකට පමණක් තාර දමා දෙන්නය කියා මම ඉල්ලනවා. මගේ පළාතේ ඉහළ කොට්ටාමුල්ල-මාරාවිල නමැති රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයිති පාර දැන් ගමන් කරන්න බැරි තත්ත්වයකට පත් වී තිබෙනවා. කරත්තයක් යන්නත් බැහැ, කාර් එකක් යන්නත් බැහැ. පාලමක් කැඩී දැන් අවුරුද්දක් පමණ වෙනවා. නමුත් ඒ පාර ප්‍රතිසංස්කරණය කිරීමට මුදල් නැතිලු. මේ ගැන නොයෙක් හැටියට කරුණු කිව්වා. මේ හේතුකොටගෙන එහි වැසි ජනතාවට විශාල අවහිරකම්වලට මුහුණ පාන්න සිදු වී තිබෙනවා. ඒ පාර සම්බන්ධයෙන් දැනට මත් සැලැස්මක් පිළියෙල කරලයි, තිබෙන්නේ. එම නිසා ඒ සඳහා මුදල් ටිකක් වෙන් කළොත්, එම සැලැස්ම වහාම ක්‍රියාත්මක කර ඒ ප්‍රදේශයේ මහජනයාට විශාල ප්‍රයෝජනයක් අත් කර දීමට පුළුවන් වෙනවා ඇති. එය ඉටු කර දෙන හැටියට ගරු ඇමතිතුමාගෙන් ඉතාමත් ඕනෑකමින් සහ කරුණාවෙන් මම ඉල්ලා සිටිනවා.

දුම්රිය දෙපාර්තමේන්තුව සම්බන්ධතවත් වැදගත් කරුණක් ඉදිරිපත් කරන්න තිබෙනවා. වලාපිටියේ දුම්රිය ස්ථානයේ ගොඩනැගිල්ල බොහෝම දුර්වල තත්ත්වයකයි දැන් තිබෙන්නේ. එහි දුම්රිය ස්ථානය වශයෙන් තිබෙන්නේ එක දුම්රිය මැදිරියක් පමණයි. එය බොහෝ රත් වන නිසා කාටවත් එය තුළ සිටින්න බැහැ. ඒක සෙවිලි කර තිබෙන්නේ තහඩු වලින්. එම නිසා ඒ ගැනත් කල්පනා කර බලා පොඩි ගොඩනැගිල්ලක් සදා හෝ එසේ නැතිනම් ඒ වහලෙහි වෙනසක් හෝ කර දුන්නොත් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

අ. භා. 2.45

ටෙලිෆෝන් සේවය සම්බන්ධයෙනුත් බොහෝම දුර්වලතා ඇති නමුත් වැදගත් වශයෙන් එක් කරුණක් ඉදිරිපත් කරන්න කැමතියි. ඒ මොකක්ද? නාත්තන්ඩියේ සිට මාරාවිල දක්වා ඇති දුර ප්‍රමාණය සැතපුම් දෙකහමාරක් පමණයි. මාරාවිල සිටින කෙනකුට නාත්තන්ඩියට ටෙලිෆෝන් මගින් කථා කරන්න වුවමනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නම් මීගමුව තැපැල් කන්තෝරුව හරහා කථා කරන්න ඕනෑ. එසේ කිරීම ඉතාමත් අවහිර බව තමුන්නාන්සේට වැටහෙනවා ඇති. එම නිසා කෙළින්ම නාත්තන්ඩියේ සිට මාරාවිලට කථා කරන්ට ක්‍රමයක් සලස්වා දෙනවා නම් ඇමතිතුමාට කෘතඥ වෙනවා. එසේ නොකලොත් සැතපුම් දෙක හමාරක දුර ප්‍රමාණයකට කථා කිරීම සඳහා පැය එකහමාරක් දෙකක් පමණ ගත වෙනවා.

වඩා අමාරු කාරණා මම මෙහි ඉල්ලා නැහැ. කරන්න පුළුවන් දේවලුයි මම ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ වාගේම පාරවල් සම්බන්ධයෙන් මේ පළාතේ පමණක් නොව අනෙක් බොහෝ ප්‍රදේශවලත් අමාරු තත්ත්වයකුයි තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කරාවිය කියා මම බලාපොරොත්තු වෙනවා.

අ. භා. 2.45

බී. එච්. බණ්ඩාර මයා. (බදුල්ල)
(திரு. பி. எச். பண்டார—பதுளை)
(Mr. B. H. Bandara—Badulla)

සභාපතිතුමනි, ගමනාගමන හා රජයේ වැඩ පිළිබඳ ඇමති අංශය යටතේ ඇති මෙම වැය ශීර්ෂය ගැන මටත් කරුණු කීපයක් සඳහන් කරන්නට තිබෙනවා. පසුගිය වර්ෂයේදී ආණ්ඩු පක්ෂයේ පමණක් නොව විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගෙනුත්—විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන්ගෙන්—ගරු ඇමතිතුමා ප්‍රශංසා ලැබූ බව ප්‍රවෘත්ති පත්‍රවල පළ වූ වාර්තාවලින් අපට පෙනී ගියා. ඒ ගැන මා සන්තෝෂ වෙනවා. ඊට හේතුව ආණ්ඩු පක්ෂය හා විරුද්ධ පාර්ශ්වය කියා පක්ෂ භේදයක් නොසලකා ඇමතිතුමා විසින් ලංකාවේ සෑම තැනකටම අවශ්‍ය පාරවල්, උපතැපැල් කන්තෝරු, ටෙලිෆෝන් ආදී එම ඇමති අංශයෙන් ලබා දිය යුතු සෑම දෙයක් ලබා දීමට කටයුතු කිරීමයි. තවත් ඉතා වැදගත් දෙයක් එතුමා විසින් කරන්නට යෙදුණා. එනම්, ඒ ඒ පළාත්වල නොයෙකුත් අංශවල මන්ත්‍රීවරුන් දිසාපතිවරුන් ආදීන් කැඳවා ඒ ඒ පළාත්වලට අවශ්‍ය පාරවල් ආදී කරුණු පිළිබඳව සාකච්ඡා කර, එහිදී ඉතා අවශ්‍යයයි පෙනී ගිය දේවල් ඒ වර්ෂයේම කළ යුතු බවට නියෝග කළා. ඇමතිතුමාගේ ඒ ක්‍රියා පිළිවෙල නිසා මගේ පළාතේ අවශ්‍ය පාරවල් කීපයක් සකස් කර ගන්නට පුළුවන්කම ලැබුණා. මේ වර්ෂයේදී ඊටත් වඩා උසස් සේවයක් කරන්නට පුළුවන් වේවාසි අප ප්‍රාර්ථනා කරනවා. ඇමතිතුමා මෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීනුත් උදාසීනකම් අත්හැර දමා උනන්දු වී, වැඩ කරන්නට ඕනෑය යන හැඟීමකින් යුතුව කටයුතු කළොත්, මීට වඩා සන්තෝෂ වන්නට අවසථාවක් ඉදිරියෙහිදී ඇතිවෙනවාට කිසිම අනුමානයක් නැහැ.

සභාපතිතුමනි, අද බදුළු ප්‍රදේශයේ පාරවල් ඇත්තේ නැහැ. වතු කාරයින් සකස් කර ගත් පාරවල් වලිනුයි, අද සෑහෙන ප්‍රයෝජනයක්වත් ඒ පළාත්වල ගම්වාසීන්ට සැලසී තිබෙන්නේ. එහෙත් ඒවා සිනුත් අද මහජනයාට විශාල කරදරයක් ඇති වී තිබෙනවා. වතු අයිතිකරුවන් විසින් එම වතු පාරවල ගේට්ටු හරස් කර ගෙන සිටින නිසා ඒවායේ වාහන ගෙන යන්නට පුළුවන්කමක් නැතිව ගොස් තිබෙනවා. ඒවාසින් ඇතුළු වීමට නම් සුපිරින්ටැන්ඩන්ට්ගෙන් අවසර ලබා ගන්න ඕනෑ. මේ ගේට්ටු නිසා විශාල කරදරයක් ඒ පළාතේ ගම්වාසීන්ට සිදු වී තිබෙන බව මා ගිය අවුරුද්දේත් කියා සිටියා. මගේ ප්‍රදේශයෙත් කැන්දගොල්ල නම් ගමේ එක්තරා වතු පාරක තිබුණු ගේට්ටුවක් අස් කර ගැනීමට අවුරුද්දක් විතර ගත වුණා. නොයෙක් තැන්වලට ගොස් කන් කෙදිරි ගැමෙන් පසුව බොහොම අමාරුවෙන් එය අස් කරවා ගන්නට පුළුවන් වුණා. අප මේවා එක එක කරන්නට ගියොත් බොහෝ කාලයක් ගත වන නිසා, අවශ්‍ය බල තල ලබාගෙන මේ ගේට්ටු සහ මුලින්ම නැති කර දමන්නට වැඩ පිළිවෙළක් සකස් කිරීම ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නට මා අදහස් කරනවා.

උඟව පළාතේ පාරවල් පිළිබඳ ප්‍රශ්නය ඉතා උග්‍ර තත්ත්වයක පවතින බව මා මතක් කරන්නට කැමතියි. හැතැප්ම 30, 40 දුර ගම්වලට යාමට පවා පාරවල් ඇත්තේ නැහැ. එම නිසා ඒ පළාත්වල මහජනයාට සිදු වී තිබෙන්නේ පයින්ම හැතැප්ම ගණන් ගමන් කිරීමටයි. පාරවල් බොහෝ ගණනක් තිබෙන කොළඹ වැනි ප්‍රදේශවලට වඩා අපේ දුෂ්කර පළාත්වලට මීට වඩා සැලකිය යුතු අන්දමින් ක්‍රියා කළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එච්. බණ්ඩාර මයා.]

යුතු බව මා ඇමතිතුමාට මතක් කරනවා. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව අතට පාර වල් අළුතෙන් පවරා ගන්නට එපාය කියා නියෝගයක් කර තිබෙන බව මට දැන ගන්නට ලැබී තිබෙනවා. ඒ නියෝගය අත් හැර අපේ ප්‍රදේශවල තිබෙන අවශ්‍යම පාරවල් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට භාර ගෙන ඒවා ඉතා ඉක්මණින් සකස් කර දිය යුතු බව මා මතක් කරනවා. බදුල්ලට ගුවන් සේවාවක් ඇති කරනවාය කියා තිබෙනවා. මහනුවරටත් ගුවන් සේවා වක් ඉල්ලා සිටි බව මට මතකයි. විශේෂ යෙන් මගේ ප්‍රදේශයට සැලකිය යුතු සේව යක් කෙරී නැති බව කියන්නට ඕනෑ. එම නිසා මගේ ප්‍රදේශයේ ගුවන් සේවාවක් ඇතිකරන ලෙස මා ඉල්ලා සිටිනවා. ගුවන් සේවාවක් ඇති කරනවාය කියා පොරොන්දු වුණාට පමණක් මදි. නිසි විධියේ වැඩ පිළි වෙළක් සකස් කරන්නට ඕනෑ. ඌව ප්‍රදේ ශය තේ වතු බහුල ප්‍රදේශයක්. එම ප්‍රදේ ශයෙන් රජයට විශාල ආදායමක් ලැබෙන වා. පසුගිය ආණ්ඩුවලින් වත් එම ප්‍රදේශ යට සැලකියයුතු සේවයක් සිදු වී නැති නිසා මේ පත් වී සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවෙන් වත් සැලකිය යුතු සේවයක් ඉටු කර දෙන මෙන් මා ඉල්ලා සිටිනවා. එම සේවය මේ රජයට සහාය දුන් ඌව පළාත් වාසීන් වෙනුවෙන් කරන සේවයක් වෙනවා ඇති.

ගරු සභාපතිතුමනි, දුම්රිය දෙපාර්ත මේන්තුව සම්බන්ධයෙන් යමක් කියන්නට මා කැමතියි. දුම්රිය දෙපාර්තමේන්තු වෙන් සෑමදාම පාඩු සිදු වෙනවාය කියන එක අපි දන්නවා. සෑමදාම පාඩු සිදු වෙනවාය කිය කියා සිටීමෙන් වැඩක් වන්නේ නෑ, එම පාඩු මඟ හරවා ගැනීමට සැලකිල්ලක් නොදක්වනවා නම් පාඩු සිදු වන්නේ කෙසේද, පාඩු සිදු වන්නේ කොතැනින්ද කියන කරුණු ගැන සොයා නොබැලීම වැරදි වැඩක්. නිතරම පාඩු සිදුවන තැන් සහ පාඩු සිදු වන අන්දම ගැන විමසිලිමත්ව සොයා බලා කටයුතු කළයුතුව තිබෙනවා. එසේ නොකර සෑම දාම පාඩු සිදුවෙනවාය කිය කියා සිටියාට දුම්රිය සේවයෙන් කවදාවත් ලාබ ගන්න හම්බ වෙන්නේ නැහැ. අප නිතරම වාගේ දුම්රියෙන් ගමන් කරනවා. යම් යම් අය සමඟ දුම්රිය සේවය ගැන සාකච්ඡා කරන විට අපට පේනවා, දුම්රිය සේවයෙන් අලාභ සිදු වන්නේ කුමන හේතූන් නිසාද කියා. දුම්රිය දෙපාර්තමේන්තුවේ ගොඩ නැගිලි අංශය මුදල් මකබා කරන, නාස්ති කරන අංශයක් හැටියට හඳුන්වන්නට පුළුවනි. මා දන්නවා දුම්රිය දෙපාර්ත මේන්තුවේ කම්කරුවන් විශාල සංඛ්‍යාවක් වාසය කරන එක්තරා ස්ථානයක් ගැන. එම වාසස්ථානයේ වහළයේ උළුකැටයක් කැඩුණු අවස්ථාවේ එය සෑදීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් සේවකයන් 6 දෙනෙකු යොදවන්න සිදු වුණා. මුදල් නාස්ති වන්නේ අන්න එවැනි ක්‍රියා නිසයි. දුම්රිය දෙපාර්තමේන්තුවේ ගොඩ නැගිලි අංශයේ සේවය කරන නිලධාරීන් ගෙන් ඇතැම් දෙනා ලක්ෂ ගණන් වටිනා වතුපිටි මිල දී ගෙන තිබෙනවා. ඒ අන්දමට කටයුතු කරන්නට ඔවුන්ට වත්කම ලැබී තිබෙන්නේ කුමන ආකාරයකටද කියා සොයා බලන්න ඕනෑ. විශාල ගොඩනැගිලි සාදාගෙන විශාල අන්දමේ වැඩ කරන්නට ඔවුන් සමත් වී සිටින්නේ කුමන කාරණ යක් නිසාදැයි කියා සොයා බලන්නට ඕනෑ. එසේ කොට දුම්රිය දෙපාර්ත මේන්තුවට පාඩු සිදු වන අන්දම ගැන කරුණු දැන ගැනීම සඳහා අවධානය යොමු කළ යුතුව තිබෙනවා. ගරු ඇමතිතුමාගේ සැලකිල්ල ඒ සඳහා විශෙෂයෙන් යොමු විය යුතුව තිබෙනවා.

ගරු සභාපතිතුමනි, උප තැපැල් කන්තෝරු ප්‍රශ්නය ගැනද මේ අවස්ථාවේදී කරුණු ස්වල්පයක් කථා කරන්නට කැමතියි. බදුල්ල ප්‍රදේශයේ එම අංශය කෙරෙහි ගරු ඇමතිතුමාගේ විශෙෂ අවධානය පසුගිය වර්ෂයේදී යොමු කර තිබෙන බව ස්තුති පූර්වකව සඳහන් කරන්නට කැමතියි. මගේ කොට්ඨාශයේ උඩවෙල කියන ප්‍රදේශයට උප තැපැල් කන්තෝරුවක් අවශ්‍ය බව මා මතක් කර තිබෙනවා. ඒ ගැන නැවත සළකා බලන මෙන් මේ අවස්ථාවේදීද මතක් කරනවා. ඒ වගේම මයිලගස්තැන්න, පුවක්ගොඩ මුල්ල, රිල්පල, මැදගම, කැන්දගොල්ල ආදී වශයෙන් නම් කළ හැකි අනිකුත් උප තැපැල් කාර්යාලවලටද ටෙලිෆෝන්වල අවශ්‍යතාව තදින් බලපානවා. එක ටෙලිෆෝනයක් සවිකරන්න රුපියල් එකසිය තිස් හතකුත් ගණනයි වියදම් වන්නෙ. ඒක සුළු වියදමක්. ඒ සුළු වියදම දරා ඒ පළාතේ උප තැපැල් කාර්යාලවලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිය යුතු ටෙලිෆෝන් පහසුව ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. මේ කටයුත්ත ඉක්මන් කිරීම සඳහා ගරු ඇමතිතුමා ගේ අවධානය ඉක්මණින්ම යොමු වේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඒ නිසා, ගරු සභාපතිතුමනි, අපේ නොදියුණු පළාත්වල තිබෙන්නා වූ පාරවල් දියුණු කිරීම මෙන්ම අවශ්‍ය තැපැල් කන්තෝරු ආදිය පිහිටුවා ටෙලිෆෝන් සේවාවන්ද දියුණු කිරීමේ කටයුතු සඳහා පසුගිය වර්ෂයේදී දැක්වූවාට වඩා විශේෂ සැලකිල්ලක් දක්වා ක්‍රියා කොට තිබෙන්නා වූ අඩුපාඩු කම් හරිගස්සා දෙනවා ඇතැයි බලා පොරොත්තු වෙමින් මගේ කථාව අවසාන කරනවා.

පී. සී. ඉඹුලාන මයා. (රුවන්වැල්ල)
(திரு. பீ. சீ. இம்புலான—ரூவான்வல்ல)
(Mr. P. C. Imbulana—Ruwanwella)

ගරු සභාපතිතුමනි, අපේ පළාත්වල විශෙෂයෙන් පාරවල් සම්බන්ධයෙන් තිබෙන්නා වූ අඩුපාඩුකම් රාශියක් සංක්ෂෙප වශයෙන් මේ අවස්ථාවේදී මතක් කර සිටින්නේ ගරු ඇමතිතුමාගේ විශෙෂ සැලකිල්ල එම ප්‍රශ්නය කෙරෙහි යොමු කොට යම්කිසි සතුටුදායක ක්‍රියා මාර්ගයක් ඇති කරවා ගැනීමේ අදහසිනුයි. ගම් දියුණු කිරීමේ කාර්‍යයට පාරවල් දියුණු කිරීම කෙතරම් අවශ්‍යද යන්න මා අමුතුවෙන් කිවයුතු ය කියා කල්පනා කරන්නේ නැහැ. ගම්වල තිබෙන්නාවූ පාරවල් වැඩි හරියක නඩත්තුව අද දින අනුගමනය කරන ප්‍රතිපත්තියේ හැටියට භාර දී තිබෙන්නේ ඒ ඒ පළාත්වල තිබෙන ගම් කාර්‍යසභාවන්ටයි. අද තිබෙන අළුත් ආඥා පණතේ හැටියට ගම්කාර්‍යසභාවන්ට බදු වලින් ලැබෙන ආදායම තරමක් දුරට වැඩි වී තිබෙනවා. නමුත් පාරවල් නඩත්තු කිරීමට විශාල මුදල් ප්‍රමාණයක් යන නිසා ගම්කාර්‍යසභාවන්ට මේවායේ නඩත්තුව හරියාකාර ගෙන යන්නට බැහැ. එසේ සිදු වන්නේ ගම්කාර්‍යසභාවල ඇති වරදක් නිසා නොව ඒවාට ලැබෙන ආදායම අඩු නිසයි. එහෙයින් මා මේ කාරණය ආණ්ඩුවේ සැලකිල්ලට විශෙෂයෙන් යොමු කරන්නට කැමතියි.

දැනට ගම්කාර්‍යසභාවන් මගින් නඩත්තු කර ගෙන යනු ලබන පාරවලින් එක්තරා ප්‍රමාණයක් ඒ කියන්නේ සෑම ගමකින්ම සැතපුම් කීපයක පාරවල්—අවුරුදු පතා මහා ආණ්ඩුව වෙත පවරාගෙන රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් ඒවායේ නඩත්තු කරගෙන යාමේ වැඩ පිළිවෙළක් අරඹන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මෙය ඉතාමත්ම වැදගත් ප්‍රශ්නයක් නිසා ප්‍රතිපත්තියක් වශයෙන් මා මේ කී අදහස ගැන කල්පනා කර බලා යම්කිසි වැඩ පිළිවෙළක් යොදන මෙන් මා නැවතත් ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

මේ රටේ තිබෙන්නාවූ බොහෝ පාරවල් සහ බෝක්කු, ඒවායේ නඩත්තුව භාරව සිටින ගම්කාර්‍යසභාවන්ට සෑහෙන ආදායමක් නොලැබෙන නිසා, ඉතාමත්ම අබලන් තත්ත්වයකයි පවතින්නේ. සමහර විශාල පාරවල පාලම් සහ බෝක්කු කඩා වැටුණු තත්ත්වයකයි, තිබෙන්නේ. ඒ නිසා වහාම මේවායේ නඩත්තු ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව අතට ගත්තේ නැත්නම් මේවා පාවිච්චි කරන්නට බැරි තත්ත්වයකට නුදුරු අනාගතයේදී පත් වන්නට පුළුවනි.

මීළඟට, ගරු සභාපතිතුමනි, වතු පාරවල් ගැනද කරුණු කීපයක් සඳහන් කරන්න ඕනෑ. විශෙෂයෙන් කැළණිවැලි ප්‍රදේශයේ වතු පාරවල් ගම්වල දියුණුව සඳහා බොහෝ උපකාර වී තිබෙනවා. මේ පාරවල් ගම්මුන් ගේ ප්‍රයෝජනය සඳහා යෙදීම ගැන මේ පළාත්වල වතු අයිතිකරුවන් සහ කළමණාකරුවන් වැඩි විරුද්ධත්වයක් දක්වා නැහැ. එවැනි කරදර තිබෙනවා නම් තිබෙන්නේ වතු සවලාසයක පමණයි. ඒ ගේට්ටු වසා තැබීමෙන් රථ ධාවනයට බාධා වන්නට පුළුවනි. දැනට ඒ ප්‍රශ්නය නිරාකරණය කරගෙන යනවා. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේ මාර්ගයෙන් මෙම අවහිරකම් මහහරවා ගැනීමට පුළුවන් වේයයි මම විශ්වාස කරනවා. ගරු සභාපතිතුමනි, සමහර විට ගරු ඇමතිතුමා කියන්න පුළුවනි, මෙම වතුවලට යන පාරවල් නඩත්තු කිරීම සඳහා පී. ඩබ්ලිව්. ඩී. එකට නැතිනම් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට විශාල මුදලක් වියදම් කරන්න සිදු වෙනවාය කියා. එසේ කියනවා නම් මම ගරු ඇමතිතුමාට මතක් කරනවා, මෙම පාරවල් නඩත්තු කිරීම ඒ වතු පාලකයන්ට භාර දෙන්නටය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3

ඩී. ජී. එච්. සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)

(திரு. டீ. ஜீ. எச். சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)

(Mr. D. G. H. Sirisena—First Akurana)

අපට ඕනෑ කරන්නේ මේ වතු පාරවල මහජනයාට ගමන් කිරීමට පහසුකම් ලබා දෙන්නටයි. [බාධාකිරීම්]

සභාපතිතුමා

(அக்கிராசனர்)

(The Chairman)

ගරු මන්ත්‍රීවරයා කරුණා කර වාඩි වෙන්න.

ඉඹුලාන මයා.

(திரு. இம்புலான)

(Mr. Imbulana)

මෙම අයවැය ලේඛනයේ මේ සඳහා වෙන් කර තිබෙන මුදල මුළු ලංකාවේ ඇති කොට්ඨාශ අනුව බෙදනවා නම්, මම හිතනවා එක කොට්ඨාශයකට රුපියල් ලක්ෂ තුන හමාරක් පමණ වියදම් කරන්න බලාපොරොත්තු වෙනවාය කියා. ඒ ආකාරයෙන් ආණ්ඩුව කටයුතු කරන වායයි මා නම් හිතන්නේ නැහැ. නමුත් ප්‍රතිපත්තියක් වශයෙන්වත් ඒ අන්දමින් කළොත්, සෑම ගරු මන්ත්‍රීවරයකුටම පෙනේවී තම කොට්ඨාශය වෙනුවෙන් මේ ආණ්ඩුව කටයුතු කර තිබෙනවා කියා. එය මණක් නොවෙයි, වැය කරන විශාල මුදලින් අපේ පළාත් දියුණු කර තිබෙනවා යයි කාටත් සෑහීමට පත් වෙන්න පුළුවනි.

ගරු සභාපතිතුමනි, මා මෙතෙක් කථා කළේ වතු පාරවල් ගැනයි. ගම් සභාපති කෙනෙකු වශයෙන් සිටියදී, අපේ පළාතේ වතුවල පාලකයින් සමග සාකච්ඡා කොට යම්කිසි ගිවිසුමකට බහින්න මට පුළුවන් වුණා. රථවාහන ගමනාගමනයට ඉඩ නොදෙමින්, ගම්බද ජනතාව ඒ පාරවලින් ප්‍රයෝජන ගැනීමට අවහිර වන අන්දමින්, වතු පාලකයින් එතෙක් ගෙන ගිය වැඩ පිළිවෙළ වෙනස් කරවා ගැනීමට මට පුළුවන් වුණා. එම නිසා කොපමණ මුදලක් වෙන් කළත් මේ පාරවල් නඩත්තු කරන්න ආණ්ඩුවට මුදල් නැතැයි කියනවා නම්, මේවා නඩත්තු කිරීම ඒ වතුවල පාලකයින්ටම නැතිනම් ඒ වතුවල ඒජන්තවරුන්ටම පවරන්ට යයි මා කියා සිටිනවා. මා හිතනවා, මේ අය සමග සාකච්ඡා කළොත්, මහජන ප්‍රයෝජනය සඳහා මේ පාරවල රථවාහන ධාවනය කිරීමට සම්පූර්ණයෙන්ම ඉඩ සලසා දෙන්න පුළුවනිය කියා. සමහරවිට මේ පාරවල බරකරත්ත ධාවනයට ඉඩ නොදෙන්න පුළුවනි. ඒ මන්ද? එසේ ඉඩ දුන්නොත් ඒ පාරවල් ඉකමනින් අබලන් වෙන්න පුළුවනි. එම නිසා සුළු ගණනක් ගෙවා හෝ කුලී මෝටර් රථයකින් ගමන් කිරීම අපහසු වන එකක් නැහැ, නමුත් එයින් විශාල යහපතක් සැලසෙන බව අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. මේ පාරවල් රජයෙන් නඩත්තු කරන්න බැරිනම් වතු පාලකයින්ටම පැවරීමෙන් වඩා ඵලදායක වැඩක් වෙනවායයි මා කල්පනා කරනවා.

ගරු මන්ත්‍රීවරයෙක්

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

ඇයි යූ.එන්.පී. කාලෙදී කරවා ගත්තෙ නැත්තෙ?

ඉඹුලාන මයා.

(திரு. இம்புலான)

(Mr. Imbulana)

යූ. එන්. පී. ආණ්ඩු කාලෙදි මම මේ ගරු සභාවෙ හිටියේ නැහැ. ගරු සභාපතිතුමනි මා ගරු ඇමතිතුමාට පෙන්වා දුන්නේ දෙපාර්තමේන්තුවෙන් මුදල් වියදම් නොකර මේ වැඩ කටයුතු කරන ආකාරය ගැනයි. විශෙෂයෙන්ම මෙතරම් කාලයක් තිස්සේ අපේ රටේ ධනය සූරා ගත් මේ වතු පාලකයින්ට යුතුකමක් තිබෙනවා, අපේ ගම්බද ජනතාවට එම පාරවල් ප්‍රයෝජනය ගැනීමට ඉඩකඩ සලසා දීමට. [බාධා කිරීමක්]

ගරු සභාපතිතුමනි, දැනට රථ වාහන ගමනාගමනයට අපහසු නුසුදුසු තත්ත්වයක ඇති ගම්බද පාරවල්, අඩු ගණනේ අවුරුද්දකට හැතැප්ම හතරක පහක නැති නම් දෙහෙක තුනකවත් තාර දමා බස් රථ ගමනාගමනයට සුදුසු වන අන්දමට සකස් කර දීමට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මා ඉතා ඕනෑකමින් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සභාපතිතුමනි, කොයි තරම් හොඳට ගම්කාර්ය සභා මගින් පාරවල් සකස් කර තිබුණත් ඒ පාරවල බස්රථ ධාවනය කිරීමට ගමනාගමන මණ්ඩලය මැළිකමක් දක්වනවා. මන්ද? ඒ පාරවල් තාර දමා සකස් කර නැතිහෙයින් බස්රථ ධාවනයට ඒවා සුදුසු නැති නිසයි. සමහරවිට ඒ කථාවෙත් ඇත්තක් තිබෙනවා. තාර දමා නැති පාරවල් ඉක්මනට රථවාහන ගමනාගමනයට නුසුදුසු තත්ත්වයකට පත් වෙනවා පමණක් නොවෙයි, ඉතා ඉක්මණින්ම ඒ බස්රථ අබලන් වී යනවා. විශෙෂයෙන්ම වර්ෂා කාලයට පාරවල් මඩ වී ගමනා ගමනයට නුසුදුසු තත්ත්වයක් ඇති වෙනවා. පායන කාලයට ඒ පාරවල දූලි නැගෙනවා. මෙන්න මේ කාරණා නිසා තාර දමා සකස් නොකරන ලද පාරවල බස් ගමනා ගමනය කරන්න ඉඩ දෙන්න බැහැයි ලංගමය කියනවා. මෙය සත්‍යයක් බව අපට පිළිගන්ට සිදුවී තිබෙනවා. අපේ ගම්බද ප්‍රදේශවල තිබෙන සියලුම පාරවල ඒ විධියට තාර දැමීමට කටයුතු යෙදෙවොත් ලංගමයෙනුත් මීට වඩා ලාභයක් ලබාගන්න පුළුවන් වෙනවා. සැතපුම් දහය පහළොව දිග බස් යා නොහැකි පාරවල් එහි තිබෙනවා. ඒ නිසා ඒවායේ තාර දැමීමට යම් කිසි ක්‍රමයක් යොදන මෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව ගැනත් වචනයක් දෙකක් කියන්න තිබෙනවා. අවිස්සාවේල්ලේ ටෙලිෆෝන් හුවමාරු මධ්‍යස්ථානයේ කරදර රාශියක් තිබෙනවා. ඒ ස්ථානයේ දැනට සිටින්නේ මීට අවුරුදු 10 කට පමණ කලින් සිටි නිලධාරි සංඛ්‍යාව පමණ යයි මට දැන ගන්න ලැබී තිබෙනවා. ඒ මාරු පොළෙන් නුවරට ලයින් දෙකකුත් කොළඹට 4 කුත් කෑගල්ලට 2 කුත් දමා තිබෙනවා. ඒ සියල් ලෙහිම කටයුතු කරන්න සිටින්නේ මීට අවුරුදු 10 කට කලින් සිටි නිලධාරීන් සංඛ්‍යාව පමණයි. ඒ නිසා මම ඇමතිතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, අඩු වශයෙන් තව ටෙලිෆෝන් ඔපරේටර් වරුන් දෙදෙනකුවත් අවිස්සාවේල්ලේ ටෙලිෆෝන් හුවමාරු මධ්‍යස්ථානයට පත් කරන්නය කියා.

උප තැපැල් කන්තෝරු පිළිබඳවත් මෙ නයක් කියන්න තිබෙනවා. කෑගල්ල ප්‍රදේශයේ නම් උප තැපැල් කන්තෝරු බොහොමයක් විවෘත කර තිබෙන බව අපට දැනගන්න තිබෙනවා. අල්ලපු ආසනයේ සිටින අපටත් ඒ වරප්‍රසාදය ලබා දෙනවා නම් අපට සතුටු විය හැකියි. සමහර විට කෑගල්ලට අවශ්‍ය නිසා වෙන්නට ඇති ඒවා දෙන්න ඇත්තෙ. අපේ ප්‍රදේශවලට ආසන අනුව උප තැපැල් කන්තෝරු දෙන්න නොහැකි නම් දිස්ත්‍රික්ක අනුවත් දෙන මෙන් මම ඇමතිතුමාගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. ආසන වශයෙන් නොසලකා අවශ්‍ය ප්‍රදේශවලට දිස්ත්‍රික්ක වශයෙන්වත් එක්තරා සාධාරණ ක්‍රමයක් අනුව උප තැපැල් කන්තෝරු සෑහෙන ප්‍රමාණයක් දෙනවා නම් මහජනයාට එයින් විශාල සේවයක් සිදු වෙනවා.

තැපැල් කන්තෝරු සම්බන්ධව මෙන්ම උප තැපැල් මහත්වරුන් පත් කිරීම සම්බන්ධයෙනුත් රටේ නොයෙකුත් රාවයන් පවතිනවා. එම නිසා උප තැපැල් මහත්වරුන් පත් කිරීමේදී ඉතා කල්පනාකාරී ලෙස වැඩ කළ යුතු බව මම ඇමතිතුමාට මතක් කර සිටිනවා. උප තැපැල් මහත්වරුන් පත් කිරීම පිළිබඳව මහජනයා නොයෙක් අන්දමේ කථා කියනවා. වැඩියක්ම දොස් පවරන්නේ ආණ්ඩුවටයි. එම නිසා ඒ පත්වීම් යුක්ති සහගත ලෙස නීතිය අනුව නියම විධියට දෙන්ටයයි දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට නියම කරන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ආණ්ඩුවේ කටයුතුවලදී පක්ෂ භේදයෙන් තොරව ක්‍රියා කළ යුතු. [බාධා කිරීම්] විදුලි පණිවුඩ සන්දේශ සේවය සම්බන්ධයෙන් කිය යුතුව තිබෙන්නේ නගරවලට මෙන්ම දුෂ්කර පළාත්වලටද ඒ සේවය ඉතා අවශ්‍ය බවයි.

පී. ඩබ්ලිව්. දෙපාර්තමේන්තුවට ඉස්සර හොඳ නමක් දී තිබුණා, "පබ්ලික් වේස්ට් ඩිපාට්මන්ට්" ය කියා.

නීල් ද අල්විස් මයා.
(நிரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)
ඒ. යු. එන්. පී. කාලයේදීයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉඹුලාන මයා.
(திரு. இம்புலான)
(Mr. Imbulana)

එසේ කියා තිබෙන්නේ ඒ දෙපාර්ත මේන්තුවෙන් කෝටි ගණන් මුදල් නාස්ති වූ නිසයි. විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවත් දැන් කටයුතු කරන්නේ ඒ විධියටයි.

ළඟදී ගරු ඇමති තුමාගේ මාර්ගයෙන් මේ දෙපාර්තමේන්තුවෙන් මා ඉල්ලීමක් කළා. බදු වැඩි කිරීම නිසා ගලවන ලද ටෙලිෆෝන් ලයින් එකක් තිබෙනවා. එහි සිට සැතැප්මක් එහා තැනක උප තැපැල් කන්තෝරුවකට විදුලි පණිවුඩ සේවය ලබා දෙන ලෙස මා කීවා. ඒ සඳහා වුවමනා කරන ක්‍රොස් බාර් 17 ටත් ඉන්සියුලේටර් 34 ටත් කොපර් වයර් වලටත් අමුතුවෙන් වියදමක් යන්නේ නැහැ. ඒවා දැනටමත් එහි තිබෙනවා. කම්කරුවන් 4 දෙනෙක් දවස් 2 ක් වැඩ කළොත් වැඩේ ඉවර කරන්න පුළුවනි. මේ කටයුත්තට රුපියල් 4,800 ක ඇස්තමේන්තුවක් පිළියෙළ කර තිබෙනවා. වුවමනා කරන්නේ කොපර්වයර් පමණයි. ඒ නිසා ගරු ඇමතිතුමා මේ ගැන කල්පනාවෙන් ඉන්න ලෙස ඉල්ලනවා. සමහර විට රජයේ වැඩ දෙපාර්තමේන්තුවත් තැපැල් දෙපාර්ත මේන්තුවත් එකතු වී ක්‍රියා කරනවාද දන්නෙ නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමා සෝදිසියෙන් සිටියොත් එයින් හොඳක් සිදු වන්න පුළුවනි. දුර බැහැර පළාත් වලට ටෙලිෆෝන් සේවය අවශ්‍යයි. ඒ නිසා ප්‍රතිපත්තියක් හැටියට එක් මැතිවරණ කොට්ඨාශයකට එකක් දෙකක් බැගින් හෝ තැපැල් කන්තෝරු දෙන්නට බලා පොරොත්තු වෙනවා නම් යෙහෙකියි කියන්න කැමතියි.

උඩරට ගැමි කොමිසමට සබරගමුවත් ඇතුළත් කළාය කියා ආරංචියි. සබරගමුවේ මැතිවරණ කොට්ඨාශවල මොන මොන වැඩ කරන්න රජයේ වැඩ දෙපාර්තමේන්තුව කල්පනා කරනවාදැයි ගරු ඇමතිතුමාගෙන් අහනවා. දැනටමත් අවුරුද්දක් ගෙවී ගොස් තිබෙනවා. ඉදිරියට කුමක්ද කරන්න යන්නෙ? උඩරට පළාත්වල ඉඩකඩම් විදේශීන් අත්පත් කර ගැනීම නිසා ඒ ප්‍රදේශවල ජනයාට පීඩන විඳින්නට වුණා. අදත් ඒ තත්ත්වය පවතිනවා. සබරගමු පළාතත් මේ ගණයට ඇතුළත් වෙනවා. උඩරට ගැමි කොමිසමේ නිර්දේශ යන් ක්‍රියාත්මක කරන විට පාර්ලිමේන්තු ආසන වශයෙන් හෝ දිස්ත්‍රික්ක වශයෙන් හෝ සලකා සබරගමු පළාතටත් මුදල් වෙන් කර කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා. උඩරට ගැමි කොමිසමෙන් නිර්දේශ කර තිබෙන වැඩ හරියාකාර නොකෙරෙනවාය කියා ආරංචියක් තිබෙනවා. හොඳ වැඩ ගණනාවක් කර තිබෙනවාය කියා මිනිසේ ගරු මන්ත්‍රීතුමා (ආර්. ඩබ්ලිව්. තෙන්නකෝන් මයා.) කීවා. නමුත් නිලධාරීන් කරන්නේ බැඳපු අශ්වයින් වගේ හොඳට වැඩ නොකරන බවට මට ආරංචියක් ලැබී තිබෙනවා. ඒ නිසා හොඳ වැඩ කොටසක් කරන්නට බලාපොරොත්තු වෙනවා නම් ඒ ගැන සෝදිසියෙන් බලා පිළියමක් යොදන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ගුවන් සේවය ගැන කුණ්ඩසාලේත්, වලපනේත්, බදුල්ලේත් ගරු මන්ත්‍රීවරුන් සඳහන් කළාය කියා මා හිතනවා. එහෙත් ඊට වඩා ලොකු වැඩක් කෙරෙන්න තිබෙනවා. මා අදහස් කළේ අලුතින් පාරවල් හැදීමත්, තිබෙන පාරවල් ප්‍රතිසංස්කරණය කිරීමත් ගැනයි. දැන් තිබෙන තත්ත්වයේ හැටියට ගුවන් සේවයක් අරඹනවාට වඩා එය වැදගත් කටයුත්තක් සේ සලකන්න ඕනෑ. කුලී මෝටර් රථයකින් හෝ අපේ ගමේ පළාත්වලට යාමට හොඳ පාරවල් අපට ඕනෑ. ඒ වුවමනාව ඉටු වූවාසින් පස්සේ අපට ගුවන් සේවය ගැන හිතන්නට පුළුවනි. අහස් තොටු පළක් විවෘත කිරීමට රුපියල් 38,000 බැගින් වියදම් කරන්න ගියොත් එයින් හොඳ නම නරක් වෙනවා ඇති. ඒ නිසා පාලම්, බෝක්කු ටිකවත් දැනට හදා දෙන මෙන් ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

අ. භා. 3.15

ඊළඟට, නිවිතිගල ගරු මන්ත්‍රීතුමා (ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.) කැළණි වැලි දුම්රිය ගැන මතක් කළා. මෙම දුම්රිය දියුණු තත්ත්වයකට පත් කරන ලෙස දීර්ඝ කාලයක සිට විශාල උද්ඝෝෂණයක් පවතිනවා. මෙම දුම්රිය ධාවනය වන අවස්ථාවේදී, මෝටර් රථය නවත්වා බලා ගෙන සිටි මට පෙනී ගියේ එහි එක පෙට්ටියකවත් මගීන් නැති බවයි. එහි සිටියේ ඩ්‍රයිවර් සහ ගාඩ්වරු පමණයි. එම නිසා එය බඩු ගෙන යන දුම්රියක් යයි සිතුනමුත් එසේ නොවන බවත් පෙනී ගියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කැළණිවැලි දුම්රිය එක් කාලයකදී විශාල ආදායමක් ලබා දුන් බව අප අසා තිබෙනවා. වතුවල ආදායම හොඳට තුබුණු කාලයේ විශාල ආදායමක් ලබා දුන් බව අසා තිබෙනවා. එහෙත් ලොරි ධාවනය ඇති වීම නිසාත්, දුම්රිය මාර්ගය පටු නිසාත් එන්න එන්නම එම ආදායම නැති වී යන්න ඇති. දුම්රිය මාර්ගය පටු නිසා ගමන ප්‍රමාදයි. ඒ අතර ලොරි ධාවනයත් ඇති වුණා. මෙම කරුණු දෙක නිසා කැළණිවැලි දුම්රියෙන් ආදායමක් නැතිව ගියා. දැන් තිබෙන ප්‍රශ්නය නම් තව දුරටත් කැළණිවැලි දුම්රිය පවත්වාගෙන යනවාද, එසේ පවත්වා ගෙන යනවා නම් එය දියුණු කරන්නේ කෙසේද කියන එකයි. මගේ කල්පනාව නම් "බ්‍රෝඩ් ගේජ්" ඇතිව ලක්ෂපාන විදුලි බලයෙන් කැළණිවැලි දුම්රිය ධාවනය කරවුවහොත් මීට වඩා හොඳ ආදායමක් ලබා ගන්න පුළුවන් වෙනවා ඇත කියායි. කැළණිවැලි දුම්රිය ගමනාගමනය දියුණු කිරීමට නම් මෙසේ කිරීම අවශ්‍යයි.

ගරු සභාපතිතුමනි, මා ගමනාගමන ඇමතිවරයාට දොස් කීවේ නැහැ. එතුමාගේ අමාත්‍යාංශය යටතේ ඇති යම් යම් දේ දියුණු කිරීම සඳහා අවශ්‍යයයි හැඟෙන යෝජනා ඉදිරිපත් කිරීමයි, මා විසින් කරන ලද්දේ. එම යෝජනා ගැනද කල්පනා කර බලා ගම්බද ජනතාවගේ දියුණුව සඳහා ක්‍රියා කරනවා ඇතැයි විශ්වාස කරමින් මගේ කථාව අවසන් කරනවා.

පී. ආර්. රත්නායක මයා. (මාවනැල්ල)
(திரு. பீ. ஆர். ரத்நாயக்க—மாவனல்லை)
(Mr. P. R. Ratnayake—Mawanella)

ගරු සභාපතිතුමනි, අපේ ගරු ගමනා ගමන ඇමතිවරයාට විරුද්ධ පක්ෂයෙන් පවා ප්‍රශංසා ලැබුණා. එම නිසා මා එතුමාට ස්තුති කිරීම සඳහා කාලය ගත කරන්නට නොයතත්, පසු ගිය කාලය තුළ එතුමා විසින් කරන ලද කටයුතු සම්බන්ධව, විශේෂයෙන්ම රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ තුබුණු දූෂණ නැති කර දමා එය නියම මහජන සේවයක් සලසන දෙපාර්තමේන්තුවක් බවට පත් කිරීම සඳහා විශාල මහන්සියක් ගැනීම ගැන එතුමාට ප්‍රශංසා නොකරම බැහැ.

ගරු සභාපතිතුමනි, සුළු කරුණු කීපයක් සම්බන්ධයෙන් ගරු ඇමතිවරයාගේ සැලකිල්ල යොමු කරවන්නට කැමතියි. ගමනාගමනය අතින් තිබෙන අපහසුකම් නිසා අද දින ගම්බද ජනතාව විශාල පීඩාවක් ලබනවා. අධිරාජ්‍යවාදී යුගයේදී මේ රටේ පාරවල් සාදන ලද්දේ මහජනයාගේ ප්‍රයෝජනය ගැන සලකා බලා නොවෙයි. මහජනතාව ජීවත් වන හා නොවන පළාත් ගැන සලකා බලා නොවෙයි, එදා මේ රටේ පාරවල් සාදන ලද්දේ. අධිරාජ්‍යවාදීන්ගේ අදහස වූයේ තම වතුවල දියුණුව සඳහා පාරවල් ඇති කිරීමයි. එම නිසා ගරු සභාපතිතුමනි, අප දැන්වත් ඒ ප්‍රතිපත්තිය ටිකක් දුරට වෙනස් කර අපේ ගම්බද ප්‍රදේශවල මහජනයාට ගමනාගමන පහසුකම් ඇති කිරීම සඳහා ඒ ගම්බද ප්‍රදේශවල පාරවල් දියුණු කිරීම පිණිස වැඩි මුදලක් වියදම් කළ යුතු බව මම ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. ගරු ඇමතිතුමා හොඳින් දන්න නිසා අපේ පළාත් පිළිබඳව එතුමාට විස්තර කරන්න වුවමනා නැහැ. කෑගලු දිස්ත්‍රික්කයේ, විශේෂයෙන් අපේ ආසනවල, මහජනතාවට ගමනා ගමනය සඳහා සුදුසු පාරවල් නැති නිසා කොයි තරම් අමාරුකම් ඇති වී තිබෙනවාද යන්න ගරු ඇමතිතුමා දන්නවා. පාරවල් නැති නිසා සිදු වී තිබෙන්නේ ගමන් කිරීමට අපහසු වීම පමණක් නොවෙයි, පාරවල් නැති නිසා ඒ ප්‍රදේශවල මහජනතාවගේ ආර්ථික තත්ත්වය පවා ඉතාමත් පිරිහුණු අඩියක තිබෙන බව අප සලකන්නට ඕනෑ. ඒ ප්‍රදේශවල පාරවල් දියුණු කිරීමට අප වැඩ කරනවා නම් එයින් පාරවල් දියුණු වන අතරම ඒ ප්‍රදේශවල ජනතාවගේ රැකී රක්ෂා ප්‍රශ්නයත් සැහෙන තරම් දුරට විසඳීමට එය මාර්ගයක් වෙනවා.

පාරවල් නැතිකම නිසා මගේ ප්‍රදේශයේ ගොවිතැන් කරන අයට, විශේෂයෙන් හේන් ගොවිතැන් කරන අයට, තමන් ඉතා වෙහෙස මහන්සියෙන් උපදවන බෝග වර්ග නියම මිලකට විකුණා ගන්නට බැරි වී තිබෙනවා. ගමනාගමන පහසුකම් තිබෙන ප්‍රදේශයක රුපියල් දෙකකට විකුණා ගන්නට පුළුවන් කෙසෙල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ආර්. රත්නායක මයා.]

කැනක් පාරවල් නැති ඒ ප්‍රදේශයේ හේන් ගොවීන්ට විකුණන්නට සිදු වී තිබෙන්නේ සත 50 ටයි. හේනේ සිට එය උස්සාගෙන යන තැනැත්තාට රුපියලක් ගෙවන්නට සිදු වී තිබෙන නිසයි එවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නේ. එසේම අළුත් රබර් වගාව සඳහා රබර් ගස් ගලවන අවස්ථාවේදී ඒ රබර් ගස් දර වශයෙන් විකිණීමට ගෙන ඒමට පාරවල් නැති නිසා පුළුස්සා දැමීමට සිදු වී තිබෙනවා. මේ ආදි වශයෙන් නොයෙකුත් කරුණු ගැන බලන විට පාරවල් නැතිකම නිසා ගම්බද ප්‍රදේශවල ජනතාවට විශාල කරදරයකට මුහුණ පාන්නට සිදු වී තිබෙන බව පෙනෙනවා.

ගරු සභාපතිතුමනි, රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් දැනට තිබෙන පාරවල් දියුණු කිරීම සඳහා, නගරවල පාරවල් වැඩි දියුණු කිරීම සඳහා, විශාල මුදලක් වියදම් කරනවා. නගරවල පාරවල් පළල් කර ඒවා නියම විධියට දියුණු කිරීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. නමුත් ආණ්ඩුවට මුදල් නැත්නම් දැනට නගරවල සෑහෙන තරමටවත් වාහන ගමනාගමනය සඳහා පහසුකම් තිබෙන නිසා ඒ නගරබද පාරවල් දියුණු කිරීම සඳහා මුදල් වෙන් කරන්නේ නැතිව, නගරබද පාරවල් සඳහා වියදම් කිරීම තාවකාලිකව නවත්වා, තිබෙන මුදල් ගම්බද පාරවල් සඳහා වියදම් කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

රුවන්වැල්ලේ ගරු මන්ත්‍රීතුමාත්, (පී. සී. ඉඹුලාන මයා.) එසේම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු කීප දෙනකුත් ගුවන් සේවය පිළිබඳව සඳහන් කළා. ඇත්ත වශයෙන්ම ගුවන් සේවය දියුණු කිරීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ගුවන් සේවය දියුණු කරන්නට ඕනෑ. නමුත් අනික් ප්‍රශ්න ගැන කල්පනා කිරීමෙන් පසුවයි අප ගුවන් සේවය ගැන කල්පනා කළ යුත්තේ. අපේ ජනතාවට ගමන් කිරීමට පවා සුදුසු පාරවල් නැති අවස්ථාවේදී ගුවන් සේවා ඇති කිරීම නවත්වා, තිබෙන මුදල් පාරවල් වැඩි දියුණු කිරීම සඳහා යොදවා අඩු වශයෙන් ඒ ප්‍රශ්නයවත් ඉක්මණින් විසඳන ලෙස මම ඉල්ලා සිටිනවා. මුදල් තිබෙනවා නම් නුවරඑළියේ නොවෙයි, මහනුවර නොවෙයි, මාවනැල්ලේ වුණත් ගුවන් සේවයක් ඇති කරනවා නම් ඒ ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. නමුත් එවැනි දේ සඳහා වියදම් කිරීමට අපේ මුදල් තත්ත්වය සතුටුදායක වන්නට ඕනෑ. විසඳාගත යුතු අපේ අනෙක් ප්‍රශ්න විසඳා ගන්නට ඕනෑ. ඉක්මණින්ම එවැනි තත්ත්වයක් ඇති වේවායි අපි ප්‍රාර්ථනා කරනවා. පාරවල වාහනයක් ගෙන යන්නට පවා බැරි තත්ත්වයක් තිබෙද්දී මෙවැනි දේවල් සඳහා මුදල් වියදම් නොකරන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සභාපතිතුමනි, වර්ෂා කාලවලදී අපේ පළාත්වල ඇති පාරවල වාහන ගෙන යාමට අපහසු නිසා ලෙඩකුට බෙහෙතක් ගැනීමට ඉස්පිරිතාලයකටවත් යන්නට පුළුවන් කමක් නැහැ. ඒ විධියට ඉස්පිරිතාලයට යන්නට නොහැකි වීම නිසා කීප දෙනෙක් මරු මුවට පවා පත් වුණා. ගම් කාර්ය සභාව මගින් පාරවල් කීපයක් ඇති කර තිබෙන නමුත් ඒ සෑම පාරකටම වගේ පාලම් වුව මනා කරනවා. විශේෂයෙන්ම එවැනි පාලම් වුවමනා වී තිබෙන්නේ මහ ඔය, කුඩා ඔය කියන දිය පාරවල් දෙක ඒ කොට්ඨාශයේ දෙපැත්තකින් ගලා යන නිසයි. යම්කිසි ස්ථානයකට පාලමක් දමන්නටයයි කිව්වාම රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නිලධාරින් ඇවිත් ඇස්තමේන්තුවක් හදනවා. පැන්නුම් පාලමක් හෙවත් "කෝස්වේ" එකක් දමා ඉතා සුළුවෙන් කර ගන්නට පුළුවන් වැඩවලට ලක්ෂ ගණන්වල ඇස්තමේන්තු සාදනවා. මුදල් නැතිකම නිසා ලක්ෂ ගණන් වියදම් කර පාලම් හදන්නට පුළුවන්කමක් නැති නිසා ඒවා අයින් කර දැමීමට සිදු වෙනවා. එම නිසා පැන්නුම් පාලම් ආදිය දැමීමෙන්වත් ඒ පාරවල රථවාහන ගෙන යාමට කටයුතු සලස්වන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්.] පැන්නුම් පාලම් දැමීමෙන් මුදල් නාස්ති වන්නේ නැහැ. ගම්සභාපති වශයෙන් මා පැන්නුම් පාලම් කීපයක් ඒ පළාතේ ඇති කර තිබෙනවා. ඒවා ඉතා සාර්ථක වී තිබෙන අතර ඒවායින් මහජනයාට විශාල ප්‍රයෝජනයක් ලැබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1947න් පසු මගේ කොට්ඨාශයේ එකම ගම්සභා පාරක්වත් රජයට ගෙන නැති බව මතක් කළ යුතුව තිබෙනවා. මේ ලඟදී ගරු ඇමතිතුමා හොඳ හැටි කල්පනා කර බලා ඉතා වැදගත් පාරක් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට පවරා ගත්තා. ඒ ගැන මා විශේෂයෙන් එතුමාට ස්තුති වන්ත වෙනවා. අද මාවනැල්ල ආසනයේ හෙම්මාතගම නගරයේ සිටින කෙනකුට අරණායකට එන්නට හැතැප්ම 20ක් පමණ එන්න සිදු වී තිබෙනවා. එහෙත් අපේ ගම්සභාව මගින් සාදා තිබෙන දිප්පිටිය-හෙම්මාතගම පාර සෑදුවොත් ඒ ගමන හැතැප්ම 4 කින් එන්න පුළුවනි. එහෙත් ඒ පාරට මාඔය හරහා පාලමක් දැමීමට සිදු වී තිබෙනවා. පාරේ අනික් කටයුතු අවසාන කර තිබෙන නිසා එම පාර රජයේ වැඩ දෙපාතීමේන්තුව යටතට ගෙන පාලමක් දමා දුන්නොත් දැනට හතැප්ම 20ක් මග ගෙවා හෙම්මාතගම සිට අරණායකට පැමිණෙන මහජනයාට හැතැප්ම 4කින් ඒ ගමන එන්නට පුළුවන්කම ලැබෙනවා. ඒ දුර ප්‍රමාණය ඇතුළත ප්‍රදේශයේ ජනගහනය 20,000ක් 30,000ක් පමණ වෙනවා. ඒක විශාල ගම්මානයක්. එම නිසා ඒ පාර රජයේ වැඩ දෙපාර්තමේන්තුවට භාර ගෙන දියුණු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. කෑගල්ල දිස්ත්‍රික්කයේ සාකච්ඡා සභාවේදී මා ඉල්ලා සිටියා මගේ ආසනයේ පිහිටි පාරවල් සියල්ලම අළුත්වැඩියා කරන්න දැනට තිබෙන මුදල් ප්‍රමාණවත් නොවනවා නම් ඒ මුදල් ප්‍රමාණය එක් වැඩක් සඳහාවත් යොදවන්නය කියා. අඹගැටවත්ත කියන ස්ථානයේ පැන්නුම් පාලමක් දමන ලෙස ඒ අනුව මා කියා සිටියා. නමුත් අද දක්වාම මගේ එම ඉල්ලීම ඉටු වී නැති බවයි පෙනෙන්නේ. ඒ බව ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. මගේ කොට්ඨාශයේ ඇතැම් පාරවල් අළුත් වැඩියා කිරීම සඳහා වෙන් කර තිබෙන මුදල්වලින් ඒ වැඩ නිසියාකාරයෙන් කර නැති බව පේනවා. නමුත් මේ අරගෙන තිබෙන අළුත් වැඩ පිළිවෙළ අනුව අපේ පළාත්වල පිහිටි පාරවල් දියුණු කරන්න පුළුවන් වේය කියා මා විශ්වාස කරනවා. මෙතුවක් කල් රජයේ වැඩ දෙපාතීමේන්තුවට අයිති ඔවර්සියර්වරුන්ට යම් යම් කොන්ත්‍රාත් දීමේ වැඩ පිළිවෙළ වෙනස් කොට ඒ ඒ පළාත්වල තිබෙන ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති, ආදියට භාර දීමට යෑමෙන් වැඩි ප්‍රතිඵල ලැබේය කියා මා විශ්වාස කරනවා. එවැනි මහජන සමිතිවලට මේ වැඩ භාරදීමෙන් මේවාට වඩවඩාත් මහජන සහයෝගය ලැබෙන නිසා මේවා ඉතා හොඳින් කරගෙන යන්නට පුළුවන් වෙනවා ඇති.

යම් යම් පාරවල් සඳහා වෙන් කර තිබෙන මුදල් පවා ඒවාට නිසිපරිදි වියදම් කරන්න බැරි වී තිබෙන්නේ ඔවර්සියර් ක්‍රමයේ තිබෙන වරද නිසා බව ගරු ඇමතිතුමාද පිළිගන්නවා ඇති. ඔවර්සියර්වරුන්ට කරන්ට පුළුවන් පමණට වඩා වැඩ භාරදී තිබෙනවා. ඔවුන් නිතරම උත්සාහ කරන්නේ වෙන් කර තිබෙන මුදල්වලින් හැකි තරම් ප්‍රමාණයක් තමන්ගේ ප්‍රයෝජනය සඳහා යොදා ගන්නයි. මා නිදර්ශනයක් වශයෙන් එක්තරා කාරණයක් මතක් කරන්න කැමතියි. අරණායක-අම්බලකන්ද කියන පාර අළුත්වැඩියා කිරීම සඳහා 1960 අවුරුද්දේ මුදල් වෙන් කර තිබුණා. ඒ වැඩය කරන්න භාර දී තිබුණු ඔවර්සියර් මහතා 1960 වර්ෂය අවසාන වන විට එම වැඩය නිම කර තිබුණේ නැහැ. 1961 අවුරුද්දෙනුත් මාස කිපයක් ගත වුණා. ඊට පසුව කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉංජිනේරු මහතාගෙන් දැනගන්නට ලැබුණා, යට කියන ලද ඔවර්සියර් මහතා විසින් දන්වා එවා තිබෙන එක්තරා කාරණයක් ගැන. අම්බලකන්ද පාර සෑදීම සඳහා වුවමනා කරන ගල් එම ප්‍රදේශයෙන් සොයා ගන්න පුළුවන්කමක් නැත කියා එම ගල් අඹේ පුස්සෙන් ගෙන ඒමට ඔහු අවසර ඉල්ලා තිබුණු බව දැනගන්නට ලැබුණා. එසේ අවසර ඉල්ලීමෙන් ඔහු බලාපොරොත්තු වී තිබෙන්නේ එම කටයුත්තට අවශ්‍ය කරන ගල් අඹේපුස්සෙන් ගෙන ඒම සඳහා වැඩි මුදලක් ලබා ගැනීමටයි. ඔවර්සියර් ක්‍රමයේ තිබෙන ගසාකෑමේ වැඩ පිළිවෙළට අනුව එම ඔවර්සියර් මහත්මයාද ක්‍රියා කර තිබෙන බව පේනවා. පසුව එම වැඩය ගරු ඇමතිතුමාගේ නියෝගයක් අනුව අම්බලකන්ද ග්‍රාම සංවර්ධන සමිතියට භාර දුන්නා. එතැන් සිට එම වැඩ කටයුතු ඉතා හොඳින් කරගෙන යාමට පුළුවන්කම ලැබී තිබෙනවා. ඔවුන්ට එම පාරට අවශ්‍ය කරන ගල් අම්බලකන්ද ප්‍රදේශයෙන්ම ලබා ගැනීමට හැකි වුණා. යටකී විධියේ නොයෙකුත් වැරදි ක්‍රියා පිළිවෙළවල් නැති කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. ආර්. රත්නායක මයා.]

ගැනීමෙන් අපේ ගම්බද පාරවල් වැඩි දියුණු කිරීමට පුළුවන්වේය කියා මා හිත නවා.

ගරු සභාපතිතුමනි, තැපැල් දෙපාර්ත මේන්තුවේ වැඩ කටයුතු ගැනද වචන සවල්පයක් ප්‍රකාශ කරන්න කැමතියි. වල පනේ ගරු මන්ත්‍රීතුමාද (ටී. බී. එම්. හේරත් මයා.) තැපැල් දෙපාර්තමේන්තුව ගැන කරුණු ඉදිරිපත් කළ බව මා දන්න වා. එතුමා කීවා සිංහලෙන් වැඩ කරන්න පටන්ගත් මුල් අවස්ථාවේදී තැපැල් දෙපාර්තමේන්තුවේ ටෙලිෆෝන් සේවයේ යෙදී සිටි අය සිංහලට මුල් තැන දී කට යුතු කළ නමුත් අද එම ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම වාගේ අයින් කර තිබෙන වාය කියා. මේ අවස්ථාවේදී මා එක්තරා සිද්ධියක් ගරු ඇමතිතුමා ඉදිරියේ තබන්න කැමතියි. මනම්පිටිය තැපැල් කාර්යාලයට කිට්ටුව පිහිටි ගොවි ජනපද යක—මට ගොවි ජනපදයේ නම දැන් මතක නැහැ.—ඉන්න ඡන්දදායකයකුට මා එක්තරා අවස්ථාවක විදුලි පුවතක් යැව්වා, ඉතා ඉක්මනින් මාව මුණගැසීම සඳහා පැමිණෙන්නය කියා. මනම්පිටියේ තැපැල් මධ්‍යස්ථානයෙන් සී. ආර්. ප්‍රේම චන්ද්‍ර නමැති තැනැත්තෙකුටයි එම විදුලි පුවත යවා තිබුණේ. මෙහි ලිපිනය ලියා තිබුණේ මහා පුදුමාකාර පිළිවෙළකටයි. සී. ආර්. යන අකුරු දෙක පමණක් ඉංග්‍රීසි යෙන් ලියා තිබුණු අතර ප්‍රේමචන්ද්‍ර යන නමත් ලිපිනයත් දෙමළෙනුයි ලියා තිබුණේ. කෙසේ හෝ වේවා ගොවිපළේ දෙමළ භාෂාව දත් අය නොසිටි නිසා සී. ආර්. ප්‍රේමචන්ද්‍ර මහතාට විදුලි පණිවුඩය ලැබුණේ දවස් තුනක් ගතවීමෙන් පසුවයි. එහෙත්, ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව විස්තර සහිතව මා ගරු ඇමතිතුමාට පැමිණිලි කළ නමුත් මේ දක්වා විභාගයක් පැවැත්වූයේ නැති බව සඳහන් කරන්නේ ඉතාමත්ම කණගාටුවෙනුයි. හිතාමතා සිංහල භාෂාවට විරුද්ධව වැඩ කටයුතු කර ගෙන යන නිලධාරී පිරිසක් මනම්පිටියේ තැපැල් කාර්යාලයේ සිටින බව මේ සිද්ධියෙන් තමුන්නාන්සේලාට හොඳාකාර පෙනී යනවා ඇතැයි මා හිතනවා. එවැනි දේ සිදු වන්නේ සිංහල භාෂාව නොදත් අය සිටින නිසා නොව ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට විරුද්ධව කෙලින්ම ක්‍රියා කරන නිලධාරී පිරිසක් සිටින නිසයි.

ලේඛරල් පක්ෂයට හිතවත් නිලධාරීන් විශාල සංඛ්‍යාවක් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේද සිටින නිසා රජයේ ප්‍රතිපත්තිවලට විරුද්ධව වැඩ රාශියක් එහිද කෙරෙනවා. ඒ නිසා මෙම දෙපාර්තමේන්තු දෙකේම ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට විරුද්ධව ක්‍රියා කරන රජයේ නිලධාරීන්ට නොපැකිලිව නියම දඬුවම් දෙන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

දුම්රිය දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන්ද වචන ස්වල්පයක් කියන්නට තිබෙනවා. පළමුවෙන්ම, අද දින දුම්රියේ පවතින්නාවූ පංති භේදය පුළුවන් තරම් ඉක්මනින් නැති කර දමන මෙන් මා ඉල්ලා සිටිනවා. මෙම වැඩ පිළිවෙළ ක්‍රියාවේ යෙදවීමට අළුතෙන් මුදල් වුවමනා කරන්නේ නැහැ. තුන්වැනි පන්තියේ කාමරවල තද බදය කෙතෙරම්ද කිවහොත් හුස්ම ගැනීමට පවා අමාරුවෙන් සිය ගණන් මගීන් ඒවායේ ගමන් කරද්දී පළමුවන සහ දෙවන පන්තිවල ගමන් කරන්නේ දෙතුන්දෙනකු පමණි. මෙම පන්ති කාමර හිස්ව යන අවස්ථාද සමහර විට තිබෙනවා. ඒ නිසා මේ පන්ති භේදය ඉවත් කිරීම ගැන ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන මෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, රුවල්වැල්ලේ ගරු මන්ත්‍රීවරයා (පී. සී. ඉඹුලාන මයා.) කථා කරමින් එතුමා එම පළාතේ ගම්කාර්ය සභාවේ සභාපති වශයෙන් වැඩ කළ කාලයේදී ඒ පළාතේ සිටින්නාවූ වතු හිමියන් සමග සාකච්ඡා පවත්වා වතු පාරවල් ගම්මුන්ගේ ප්‍රයෝජනය සඳහා යොදාගත් බව කියන්නට යෙදුණා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු වන එතුමා වතු හිමියන්ගේ ද හිතවතකු නිසා එම ප්‍රශ්නය ඒ අන්දමට විසඳාගත්තා වෙන්නට පුළුවනි. නමුත් අපේ පළාත්වල සිටින වතු පාලකයන් සමග සාකච්ඡා පවත්වා මෙම ප්‍රශ්නය විසඳා ගන්නට නම් පුළුවන් කමක් නැහැ.

ගරු සභාපතිතුමනි, වතු හිමියන් නැති නම් වතු පාලකයින් සමග සාකච්ඡා කරන්න යන්න අපට උවමනාකමක් නැහැ. ඔවුන්ට පන්දම් අල්ලන්න වුවමනාවක් නැහැ. අපේ යුතුකමක් තිබෙනවා ගරු ඇමතිතුමාගේ බලතල අනුව, ආණ්ඩුවේ ප්‍රතිපත්ති අනුව, නීතියෙන් මේ ප්‍රශ්න විසඳා ගැනීමට. වතු පාරවල් පමණක් නො

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

වෙයි, සෑම පාරක්ම රජයට ගෙන ඒ පාර වල් මහජනතාවගේ ගමනාගමන පහසුකම් සඳහා සකස් කර දීම ගරු ඇමතිතුමාගේ යුතුකමක්ව තිබෙන බව මතක් කර දෙන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, මගේ පළාතේ අසරණ ජනතාවකට බරපතල ප්‍රශ්නයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. මගේ ආසනයෙන් දුම්රිය මාර්ගය වැටී තිබෙන ප්‍රදේශයට සුළු කොටසක් අසු වෙනවා. දුම්රිය මාර්ගය අසළ තිබෙන, දුම්රිය දෙපාර්තමේන්තුවට අයත්, සමහර ඉඩම් ඒ ජනතාවට බදු දී තිබෙනවා. ඒ ඉඩම් කොටස් වෙනුවෙන් අය බදු වශයෙන් මුලින්ම රුපියල් දෙකක් ගෙව්වා. අවුරුදු පතා මේ බදු මුදල ටිකින් ටික වැඩි කළා. ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ දන්නවා ඇති, මේ ඉඩම්වල කිසිම අන්දමක ස්ථිර වගාවක් කරන්න බැරි බව. ඒ වාගේම මේ ඉඩම් කැබලිවල පැල්පත් තනාගෙනයි මෙතෙක් කාලයක් ඒ අය ජීවත් වුණේ. අවුරුදු පතා මේ බදු මුදල වැඩි කිරීම නිසා මගේ පළාතේ සිටින ඒ අහිංසක ජනයාට විශාල ප්‍රශ්නයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. අවුරුදු දහයකට පහළොවකට ඉස්සර රුපියල් දෙකක් බදු ගෙවා ලබාගත් ඉඩම් කැබැල්ලකට අද බදු වශයෙන් සමහර අයට රුපියල් විස්සක් පමණ ගෙවන්න සිදු වී තිබෙනවා. මෙසේ ගෙවන්න සිදු වී තිබෙන්නේ අවුරුදු පතා බදු මුදල වැඩි කිරීමේ වැඩ පිළිවෙළ නිසයි.

ගරු සභාපතිතුමනි, මේ ඉඩම් කැබලිවලින් කිසිම ආදායමක් ලැබෙන්නේ නැත්නම්, ඒ අය පදිංචි වී සිටින පමණින් ම එතරම් විශාල බදු මුදලක් ගෙවන්නට සිදු වීම අසාධාරණයක්. ඒ නිසා ඒ අසරණ ජනතාව අද අමාරු තත්ත්වයකට වැටී සිටිනවා. ඒ බදු මුදල් නොගෙවූ අය ගෙවලින් ඉවත් කරන්න දැනටම දුම්රිය දෙපාර්තමේන්තුව නඩු පවරා තිබෙනවා. මේ කාරණය ගැන ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන අතර විශේෂයෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් ලබාගෙන පදිංචිව සිටින අසරණ ජනතාව ගැන අනුකම්පා කර සාධාරණ බදු මුදලක් ගෙවීමට වැඩ පිළිවෙළක් සකස් කර දෙන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන සුළු කම්කරුවන්ට නොයෙකුත් අමාරුකම්වලට මුහුණ දෙන්නට සිදු වෙනවා. මාරුවීමක් ලබාගැනීම වැනි සුළු ප්‍රශ්නවලදී පවා උසස් නිලධාරීන්ගෙන් මහත් හිරිහැර විඳින්නට සිදු වී තිබෙනවා. සමහර සුළු සේවකයන්ට, තමන් කොයි විධියේ දුක්ගැනවිලි ඉදිරිපත් කළත්, දුම්රිය දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන්ගෙන් කිසිම සහනයක් ලබා ගන්න පුළුවන්කමක් නැහැ. මේ අන්දමට දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන උසස් නිලධාරීන්ගෙන් සුළු සේවකයන්ට විඳින්න වන අප්‍රමාණ දුක් ගැහැට හා ඒ අයට සිදු වන අසාධාරණකම් ගැන විධිමත් පරීක්ෂණයක් කර නියම විධියේ සහනයක් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රදේශයේ අලගල්ලේ දුම්රිය ස්ථානයක් තිබෙනවා. මෙම ස්ථානයේ දුම්රිය නැවතුම් පොළ පිහිටුවා අවුරුදු 20 ක් 25 ක් ගත වුණත් තවමත් දුම්රියෙන් ගමන් කරන්නන් සඳහා වේදිකාවක් තනා නැහැ. මම ඒ දුම්රිය ස්ථානයේ සිටින විට මට පෙණුනා දුම්රියෙන් බසින උදවියට බහින්නට සිදු වන්නේ එතැන තිබෙන කාණුවකට බව. දුම්රියෙන් බහින ගමන් කීප දෙනෙක්ම ඒ කාණුවේම වැටෙනවා මම දැක්කා. මේ කාරණය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට මා කරුණු ඉදිරිපත් කළ බව ගරු ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. නමුත් ඒ දෙපාර්තමේන්තුවල ඉංජිනේරු මහත්වරුන් ඒ ප්‍රශ්නය ගැන වැඩි සැලකිල්ලක් දක්වන්නේ නැහැ. මම ඒ ගැන ප්‍රශ්න කළාම මට දැනගන්න ලැබුණා රුපියල් දහකින් මේ වේදිකාව තනන්න පුළුවන් බව. ගරු සභාපතිතුමනි, මෙවැනි කටයුතු ගැන කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැති නිලධාරීන් නිසා මහජනතාවට කරදරවලට මුහුණපාන්න වෙනවා.

මේ සමගම එක්තරා වැදගත් කාරණයක් තමුන්නාන්සේට පෙන්වා දෙන්න කැමතියි. මාකේවිට වෙල්යායට වතුර ලබා ගැනීම සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ටැංකියක් තනා තිබෙනවා. අලගල්ල දුම්රිය ස්ථානයේ සිටින කිසිම සේවක මහත්මයෙක් වතුර ජල නල සවි කරන්නට යයි කිසිම දවසක ඉල්ලා නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ආර්. රත්නායක මයා.]

ඒ බව මා අසා දැන ගත්තා. එහි වැඩ කරන මහත්වරුන්ට වුවමනා ජලය ලබා ගැනීම සඳහා දුම්රිය පොළ අවට ළිං හතරක්ම තිබෙනවා. නමුත් මාකේවෙල වෙල්යායට වතුර සැපයීම සඳහා තිබුණු අමුණෙන් වේල්ලක් බැඳ ඒ වෙල්යායට වතුර ගැනීමද වළක්වා රුපියල් 6,000ක් වියදම් කොට ඒ දුම්රිය පොළට වතුර සැපයීම සඳහා ජල නල සවි කර තිබෙනවා. මේ නිසා ගොවීන්ටත් මහත් කරදරයක් සිදු වුණා. එම නිසා මම ඊට විරුද්ධව ඇමති තුමාට කරුණු ඉදිරිපත් කළ පසු පසුවදම විභාගයක් තබන්න යයි එතුමා නියම කළා. ඒ අවස්ථාවේදී එහි පැමිණි ඉංජිනේරු මහත්මයා පිළිගත්තා, එය කිසිවකුගේ ඉල්ලීමක් නැතිව කළ කිසිම වුවමනාවක් නැති වැඩක් බව. ඊට පසුව මම කරුණු සොයා බැලූ විට මට දැනගන්න ලැබුණා, ඒ අංශය භාර ඉංජිනේරු මහත්මයා එහි සිටින කොන්ත්‍රාත්කරුට මුදල් උපයා ගැනීම සඳහා මෙය කිරීමට භාර දී තිබෙන බව. ඒ විභාගයෙන් පසු ඒ ජල නල සවි කිරීම වැරදි වැඩක් බව තීරණය කොට ඒවා ඉවත් කිරීමට නියම කළා. ඒ ජල නල සවි කිරීම සඳහා ඇත්ත වශයෙන්ම ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අවසරයක් ගත යුතුව තිබුණා. නමුත් ඒ අවසරයවත් අරගෙන නොවෙයි, මේ කට යුත්ත කර තිබෙන්නේ.

මේ විධියේ අනවශ්‍ය දේ කරමින් මහ ජන මුදල් කාබාසිනියා කරන ව්‍යාපාරයි, දුම්රිය දෙපාර්තමේන්තුවෙන් කර ගෙන යන්නේ. ඒ සඳහා වියදම් කළ රුපියල් 6,000 න් තුට්ටුවක ප්‍රයෝජනයක් ලැබුණේ නැහැ. ඉන් රුපියල් 1,000ක් වියදම් කළා නම් දුම්රිය ස්ථානයට වේදිකාවක් තනන්න තිබුණා. නමුත් එය කළේ නැහැ. බොහොම කාලයක් තිස්සේ ඉල්ලූ එකක් තමයි, ඒ. ඒ අවස්ථාවේදී එය ඉතා වැදගත් ඉල්ලීමක් බව පිළිගෙන ඉක්ම නින්ම කරන බවට පොරොන්දුවක් වූ නමුත් අද දක්වාත් එය ඉටු කර නැහැ. ඒ නිසා මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ නිලධාරීන් පිළිබඳව පරිස්සමින් කට යුතු කරන ලෙස. මේ දෙපාර්තමේන්තුවේ පමණක් නොවෙයි, ලංකාවේ තිබෙන අනික් සෑම දෙපාර්තමේන්තුවකත් තත්ත්වය එහෙමයි.

මම ඊයේ භාණ්ඩාගාරයේ නිලධාරීන් පිළිබඳව කරන ලද විවේචනවලට ඇහුම් කන් දුන්නා. ඇමතිවරු පත් වූ විට වට වී නොයෙක් විධියේ දේ කියා ඇමතිතුමන් සන්තෝෂ කර තමන් කරගෙන යන ව්‍යාපාර දිගටම කරගෙන යෑම නිලධාරීන්ගේ සිරිතයි. ඒවාට නොරිවෙන ලෙස මම ඇමති තුමාගෙන් ඉල්ලා සිටිනවා. එතුමා දැන් කරන්නාක් මෙන්ම ඉදිරියටත් නිලධාරීන්ගේ සුදු හුණු ගෑම්වලට නොරිවැටෙන බව මගේ විශ්වාසයයි. ඔවුන් කියන දේ පිළිගත්තොත් ආණ්ඩුවේ ව්‍යාපාර සම්පූර්ණයෙන් කඩාකප්පල් වන්න පුළුවනි. සමහර විට මේ මේ විධියට කරන්න යයි සමහරුන් ආණ්ඩුවේ වැඩ නොමඟ හරින්න පුළුවනි. එම නිසා ඔවුන්ගේ වචන විශ්වාස නොකර සෝදිසි කර බලාම කටයුතු කරනවා ඇතැයි මම බලා පොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මා එසේ කියන්නේ දෙපාර්තමේන්තුවල ආණ්ඩුවේ වැඩ කඩාකප්පල් කිරීමට උත්සාහ ගන්න ෆ්පඩරල් පක්ෂයේ කුමන්ත්‍රණකාරී නිලධාරීන් සිටින බව දන්න නිසයි. ඒ නිසා මේ පිළිබඳව පරීක්ෂණයක් කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් විශෙෂයෙන් ඉල්ලා සිටිනවා. ජල නළ මඟින් අලගල්ලට ජලය ලබා ගැනීම සම්බන්ධයෙන් රුපියල් 6,000 ක් වියදම් කර ඉන් පසු ඒ වැඩ පිළිවෙළ අත් හැර දැම්මා නම් එවැනි වැඩ කරන නිලධාරීන් දෙපාර්තමේන්තුවෙන් අස් කර දමන්නට වැඩ කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මෙවැනි වැරැද්දක් සුළු සේවකයකු අතින් සිදු වුණා නම් ඔහුට එක දවසක්වත් දෙපාර්තමේන්තුවේ ඉන්න ඉඩක් ලැබෙන්නෙ නැහැ. ලක්ෂ ගණන් මුදල් කාබාසිනියා කර දමන නිලධාරීන් සම්බන්ධයෙන් මේ දක්වා කර තිබෙන්නේ කුමක්ද? ඒ අයට මේ දක්වා දඬුවම් ලැබී නැහැ.

දුම්රිය දෙපාර්තමේන්තුවේ ඇතැම් රක්ෂාවල් සඳහා බදවා ගැනීමේදී දැනට එම දෙපාර්තමේන්තුවේ සේවය කරන්නන්ගේ දරුවන් පමණක් ගන්නා සිරිතක් තිබෙනවාලු. අධිරාජ්‍යවාදී පාලන යුගයේදී නම් නිලධාරීන්ගේ බලපෑම් උඩ තම තමන්ගේම දරුවන්ට රක්ෂාව ලැබෙන හැටියට එවැනි වැඩ පිළිවෙළක් තිබීම ගැන අපට පුදුම වන්න කාරණයක් නැහැ. එහෙත් එවැනි වැඩ පිළිවෙළක් දැනුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිබිය යුතුද? ඇත්ත වශයෙන්ම මේ දෙපාර්තමේන්තුවේ වැඩ කරන සේවකයන් ගැන මගේ හිතේ කිසිම ඊර්ෂ්‍යාවක් නැහැ. මා විරුද්ධ වන්නේ නැහැ සාධාරණ වැඩ පිළිවෙළක් අනුගමනය කරන්න. එහෙත් ඒ සේවකයන්ගේ දරුවන්ට පමණක් එහි පදවි සීමා කළ යුතුය කියනවා නම් එවැනි ප්‍රතිපත්තියක් දිගටම නිබීම සුදුසු නැහැ කියා මා කියනවා. ඒ නිසා ඒ ඒ තනතුරු සම්බන්ධයෙන් දක්ෂ කම් තිබෙන කාටත් ඒවා ලබා ගැනීමට පුළුවන් වන විධියේ වැඩ පිළිවෙලක් සකස් කරන මෙන් මේ අවස්ථාවේ මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නට මා අදහස් කරන්නේ නැහැ. අපේ ගරු ඇමතිතුමා විශෙෂයෙන් උනන්දු වී වැඩ කරන තරුණ ඇමතිවරයකු හැටියට සඳහන් කරන්නට පුළුවනි. එතුමා උද්යෝගිමත් ලෙස තමන් සතු වැඩ කොටස කර ගෙන යාම ගැන මා ඉතාමත් සන්තෝෂ වෙනවා. එතුමාට විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් පවා ප්‍රශංසා ලැබී තිබෙන නිසා මගේ කියමන කොයි තරම් දුරට සාධාරණද කියා තමුන්නාන්සේට පෙනී යනවා ඇති. අවසාන වශයෙන් මා එතුමාගෙන් එක් ඉල්ලීමක් කරන්නට කැමතියි. සෑම දෙපාර්තමේන්තුවකම පාහේ දක්ෂ නිලධාරීන් මෙන්ම අදක්ෂයින්ද සිටින බවත්, අවංක නිලධාරීන් මෙන්ම අවංකය කියන්නට බැරි තත්ත්වයේ අයත් සිටින බවත් කල්පනාවට ගෙන සෑම දෙපාර්තමේන්තුවකින්ම අපට නියම ප්‍රයෝජනය ලැබිය හැකි ආකාරයට ඉවසිලිමත්ව ක්‍රියා කරන අතරම අසාධාරණ ලෙස වැඩ කරන නිලධාරීන්ට විරුද්ධව නිසි පරිදි ක්‍රියා කරන්නට පසුබට නොවිය යුතුයි. ඒ මගින් වඩාත් උසස් සේවයක් ලබා දෙන මෙන් ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා.

(ஜனாப் எம். ஏ. அப்துல் மஜீது)

(Mr. M. A. Abdul Majeed)

Mr. Chairman, permit me to say thank you to the Hon. Minister for the construction of the Arugam Bay bridge in my electorate. The people of Panama and Pottuvil had been agitating for this bridge for decades, and the lack of this bridge created a real bottleneck that prevented the development of that part of my electorate round about Panama. It is a very rich agricultural area and with the construction of this bridge that section of our land will also become part of the granary of the Batticaloa District.

I think I must also thank the young and personable Minister for curbing the activities of the P. W. D. overseers. I am told that in the matrimonial market, at least in Jaffna, they raise their fees so high that they almost come next to the P. W. D. Engineers. That would give us an indication of what they have been about.

I am also happy that the Hon. Minister has decided to end the one-sided link-up we had with K. L. M. I would suggest that before the Hon. Minister decides to tie up with the Pan American Airways [*Interruption.*]—I read in the papers ; I found that out from the newspapers—I would suggest that we explore the possibility of coming to a workable and mutually beneficial agreement with Air India.

I would next come to the needs of my electorate. I would just like to spotlight two or three items. There is a rickety old wooden bridge on the Pottuvil-Panama road. That bridge is also in a continuous state of repair and by continuing to keep it in that state we are, I think, only helping the overseer in charge to make a little money.

There is a genuine feeling among the people of Panama village—and they are Sinhalese—that they have been neglected by successive governments. They told me that my predecessor just went once to get their votes and thereafter he never turned up that way. They are almost living in the good old Kandyan days and I do hope that you will take up this matter and see that a bridge is provided immediately. Because of the lack of this bridge the people of Panama are unable to use the services of the C. T. B. They have to come ten miles to Pottuvil. Now there is a rickety van and that van charges almost Re. 1.50 for that ten-mile journey.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා.]

There is also another wooden structure, a small bridge that connects Lahugala road with the main Pottuvil-Moneragala road. That is also a small bridge. Because it is rickety they have dismantled the structure and have left it at that. Nothing further has been done. During floods the people of Lahugala are really marooned.

I sincerely hope that immediate action will be taken to provide these two bridges, two items that are not very big.

I have one matter to raise with regard to the Sammanturai Post Office. I wrote to the Postmaster-General regarding the provision of an automatic exchange and I have received a reply that an exchange would be provided in 1961-62.

There is a sub-post office in the village called Thambilively, a village with a population of 6,000. It has telephone facilities, but all the same it has no delivery facilities. I hope the Postal Department will take immediate action to provide delivery facilities.

The Mahawatte Post Office is in the heart of the colonized area in the Gal Oya Valley. This post office is in Unit 26, and the other old villages round about that area have no telephone facilities. I do appeal that early action be taken to provide telephone facilities for that place.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

රැස්වීම අ. භා. 4.30 වනතුරු තාවකාලිකව අත්හිටවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින් අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.

ස්ටැන්ලි තිලකරත්න මයා. *(කෝට්ටෙ)*
(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)
(Mr. Stanley Tillekeratne—Kotte)

There are one or two matters I wish to mention at this stage of the discussion. One particular matter, which was also mentioned by the hon. Member for Ruwanwella (Mr. Imbulana), is the complete re-organisation of the entire Kelani Villey Railway. The history of this railway shows the folly of a past Governor of this country; and the present folly is that this railway is yet being maintained in spite of the fact that the losses suffered by the Department on this line appear to be colossal. The suggestion was put forward at one time that the Kelani Valley Railway passenger traffic should be suspended and the road transport service should be improved; that this railway track should only be used for the transport of goods and other railway traffic. I do not know whether the Ministry has decided on the future of this line. This is a very rich area. It has vast possibilities of development. It is an estate area where there is a very large population. I think that early steps should be taken by the Ministry to consider whether the Kelani Valley Railway passenger traffic should be suspended and the road transport service improved or whether this line should be put on the broad gauge track.

The hon. Second Member for Colombo Central (Mr. Keuneman) brought to the notice of the Hon. Minister the question whether the Katunayake Airport or the Ratmalana Airport should be developed. I have held the opinion even before that hon. Member, even before I became a Member of this honourable House, that it is much better to develop Ratmalana than develop Katunayake. In point of fact, the estimate before the House is Rs. 23 million for the development of Katunayake, of which the American Government is to give us Rs. 14 million. But the other aspects of this matter have not been placed before the House. Seventeen miles of road have to be widened, one-way traffic has to be arranged for and—even going on the very P. W. D. estimate—the Government has to utilize a sum of nearly Rs. 50 million if the Katunayake-Colombo stretch of road is to be developed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

If there is a difficulty at Ratmalana as regards the air strip going into the interior, the alternative has been suggested that Galle Road can be tunnelled under and the rail track could go more to the coast. Of course, a few houses will have to be demolished, but alternative accommodation could be provided. This improvement will save nearly Rs. 50 million from the point of view of road development which has to come as the logical consequence of the development of the Katunayake Airport. For Rs. 14 million of American aid, we have to utilize another Rs. 50 million for the development of the road and also another Rs. 9 million approximately really for the development of the terminal and putting up a few more houses for the resident staff at the Katunayake Airport.

I commend the suggestion of putting Galle Road under the track. This is not a big problem. It is not a very big engineering feat. You have Galle Road which is really a two-track road and you could have one way traffic. You need not spend very much on the road. It is a ready-made road. And Ratmalana should really be the future international airport that should be developed.

In the last few days due to an " airline divorce " that we had, Air Ceylon and the Hon. Minister seem to be getting a little isolated on this question. But there are other possibilities of linking up. I do not think that there need be isolation on this question. There was a certain proposal some time back, but I really do not know what happened thereafter. The Soviet Government was prepared to loan to us some " Illushyn " aircraft, one of which quite recently, at a very auspicious moment, came here bringing the relics from China. An offer was made by the Soviet Government to the Hon. Minister that Soviet " Illushyn " aircraft could be loaned to the Government of Ceylon on a long-term basis. If we are going to accept that offer, then we have to run our own independent airlines.

ඒ කරුණු එකිනෙක ගෙන විග්‍රහ කරන්නට ගියොත් මේ දෙපාර්තමේන්තු ගැන සතියක් වුනත් කරුණු කියන්නට පුළුවනි. තමුන්නාන්සේලා සියලු දෙනාම වගේ දන්නවා, මෙම අමාත්‍යාංශය ව්‍යවසථාදායක මන්ත්‍රණ සභා කාලයේ සිට පැවතුණේ කා අත යටතේද කියා. නිදහස ලැබෙන්නටත් ඉස්සර සිටම මෙම අමාත්‍යාංශය තිබුණේ සාමාන්‍ය ජනතාව ගෙන් බැහැරව සිටි එක්තරා විනෝදකාමී, ඒ වගේම අධිරාජ්‍ය යුගයේ කකුලක් තබා ගෙන සිටින සර් ජෝන් කොතලාවල ශ්‍රීමතාගේ අත යටතේයි. ඒ කාලයේ පිළියෙල කළ අධිරාජ්‍ය ක්‍රමය උඩ සකස් වුණු පීලි ඔස්සේ තවමත් ගමන් කරන ඒ ඇමති අංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල තත්ත්වය ඇමතිවරයකු හෝ ආණ්ඩුවක් හෝ මාරුවීමෙන් වෙනස් වුණේ නැහැ. තවමත් ඒවා දුවන්නේ ඒ පරණ පීලි උඩමයි. අපි සමාජවාදී ගමනක් ගැන කථා කරනවා. සමාජවාදය ගැන කථා කරනවා වගේම නියම අන්දමින් ක්‍රියා කරන්නටත් ඕනෑ. අධිරාජ්‍යවාදීන්ට ගැතිකම් කළ ඇට්ටැඹියන් විසින් සකස් කරන ලද පීලි ඔස්සේ තවමත් දුවද්දී, පාර පුරා තිබෙන තාර බාල්දි උණු වෙවී කානු දිගේ ගලා යද්දී, දුම්රිය දෙපාර්තමේන්තුවේ සිදු වන අක්‍රමිකතා නිසා

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

ගරු සභාපතිතුමනි, දැන් මේ සාකච්ඡාවට භාජනය වී තිබෙන්නේ රුපියල් 33,66,88,635ක් වූ විශාල මුදලක් වෙන් කොට ඇති ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ ඇමති අංශයයි. මේ තරම් විශාල වැයක් සඳහා මුදල් ලබා ගන්නේ කොහෙන්ද? ධනවතා ගෙන් මෙන්ම දුප්පතාගෙනුත්, ලිපිකරුවා ගෙනුත් ආදී වශයෙන් සෑම කොටසකින්ම එකතු කර ගනු ලබන බදු මුදල් වලින් කොටසකුයි, මේ අමාත්‍යාංශය සඳහා වෙන් කර තිබෙන්නේ. එවැනි මුදලක් වියදම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මහජන ඛහදිය මහන්සියෙන් උපයන මුදල් විනාශ වී යද්දී මා ඉල්ලා සිටින්නේ මෙපමණයි. කුඩා වෙළෙන්දාගෙනුත්, අහිංසක කම්කරුවාගෙනුත්, ගොවියා ගෙනුත් ඒ වගේම සාමාන්‍ය ලිපිකරුවා ගෙනුත් සම්මාදම් කර ගත් මෙම මුදල් නියම අන්දමින් යොදවන ලෙසයි, මා ඉල්ලා සිටින්නේ. වැඩි දේවල් ගැන මා පෙන්වන්නට අදහස් කරන්නේ නැහැ. අධිරාජ්‍ය යුගයේ සිට පැවත එන නෂ්ටාවශේෂයන්ගෙන් එකක් පමණක් මා පෙන්වා දෙන්නම්. මේ දෙපාර්තමේන්තු ගැන පරීක්ෂණයක් පවත්වා ඒවායේ සිටින පීරි යක්ෂයින්ට දුම්මල ගසා එලවන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මෙන්න එදා අධිරාජ්‍ය යුගයේදී සර් ජෝන් කොතලාවල ඇමතිතුමා විසින් පිළියෙල කළ රත්මලානේ මූලික කාර්මික අභ්‍යාස ආයතනයෙන් සිදු වන එක දෙයක්. එහි පසුගිය වර්ෂයේ වාර්තාවෙන් මා කරුණු පෙන්වා දෙන්නම්. මේ අනුව කල්පනා කරන විට දුම්රිය දෙපාර්තමේන්තුවේත්, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේත් වැඩ කටයුතු කෙරෙන අන්දම පැහැදිලි වෙනවා ඇති. ඒ පාලන වාර්තාව මා දැන් කියවන්නම්. මම මේ කියවන්නේ 1960 වර්ෂය තුළ වැඩි දුරටත් පුහුණුවීම සඳහා පත් කළවුන්ගේ ලේඛනයයි.

"මෙම වර්ෂය තුළ සම්පූර්ණ වශයෙන් ගැටවර යන් 150 දෙනකු ඇතුළත් කර ගත් අතර, තව දුරටත් පුහුණුව සඳහා පුහුණු වූවන් 181 දෙනකුට පත්වීම් ලබා දුනිමි. පුරුදු ප්‍රකාර දුම්රිය දෙපාර්තමේන්තුවට ඉතා වැඩිම සංඛ්‍යාවක් බඳවා ගන්නා ලදී."

රුපියල් ලක්ෂ තුනක් වියදම් කර ළමයින් 181 දෙනකුට යම්තම් පීර උලන්න පුරුදු කර එළියට දැම්මා. අසරණ කම්කරු දරුවන්ගේ නාමයෙන් විශාල ධනස්කන්දයක් උරා බොන පීරි යකුන් කොටසක් එහි සිටින බව මා දැන් මෙම පාලන වාර්තාවෙන් පෙන්නා දෙන්නම්. යන්තම් පීර අතුල්ලන්න ඉගෙනගත් අර්ධ පුහුණු කම්කරුවන් 78 දෙනෙක් ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවටද, 11 දෙනෙක් රජයේ පැක්ටේරියටද, 20 දෙනෙක් ප්‍රධාන විදුලි පණිවුඩ කාර්යාලයටද, 25 දෙනෙක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවටද, එක් අයෙක් ලංකා රාජකීය නාවුක හමුදාවටද, දෙන්නෙක් වරාය සංයුක්ත මණ්ඩලයටද, 39 දෙනෙක් රජයේ විදුලි දෙපාර්තමේන්තුවටද, 4 දෙනෙක් ලංකා විද්‍යාත්මික කාර්මික පර්යේෂණායතනයටද, තවත් එක්කෙනෙක් ජෙනරල් මෙවිල් සමාගමටද යනාදී වශයෙන් 181 දෙනෙකු තව දුරටත් පුහුණුව සඳහා බඳවාගෙන තිබෙනවා. මේ අය යන්තම් පීර ගාගන්න, නැතිනම් යකඩ කැල්ලක් නවා ගන්න තරම පුළුවන්කම තිබෙන අයයි. මේ අය තවත් තැනක අවුරුදු හතරක් පමණ පුහුණුව ලබන්න ඕනෑ.

මේ පාලන වාර්තාවේ "බෑන්ඩ් මාස්ටර්ලා" ගැනත් සඳහන් වෙනවා. මෙන්න සභාපතිතුමනි, පරිපාලන වාර්තාවෙන් තවත් කොටසක්:

1959 වර්ෂයේදී පසු පුහුණුව සඳහා ආධුනිකයින් අනිකුත් දෙපාර්තමේන්තුවලට බඳවාගැනීමේ ශීඝ්‍ර වේගය 1960 වර්ෂයේදී ද අඛණ්ඩව කෙරීගෙන ගිය අතර එම වර්ෂයේ අවසාන මාසවල එය එලෙසම නොවීය. වරාය කොමිසමට අවසාන වරට ආධුනික යන් බඳවා ගනු ලැබුයේ 1959 දෙසැම්බර් මාසයේ වුවද, ඔවුන්ගේ ඉල්ලීම සඳහා පත්වීම් බලාපොරොත්තුවෙන් සිටින්නාවූ පුහුණු වූ ආධුනිකයින් සමහර දෙනෙක් දැනුදු රක්ෂා බලාපොරොත්තුවන්නන්ගේ ලැයිස්තුවේ ඉතිරිව සිටිති.

ගරු සභාපතිතුමනි, රක්ෂා නැතිකමින් පෝලිමේ ඉන්න යන මේ අය වෙනුවෙන් උත්සවයක්ද පවත්වා තිබෙනවා. මෙන්න ඒ ගැන සඳහන්වන කොටස:

"අළුයම ශාරීරික අභ්‍යාස පුහුණුව ද සන්ධ්‍යා අනිවාර්‍ය ක්‍රීඩා ද ඉතා උනන්දුවෙන් කරගෙන යනු ලැබේ. නිවාසාන්තර මුෂ්ටි ප්‍රහාරක තරඟය පුළුල් නව ප්‍රබෝධයක් ලත් අතර ජූනි 28 වෙනිදා පවත්වන ලද ක්‍රීඩා උත්සවයට සමස්ත ලංකා ආධුනික මුෂ්ටි ප්‍රහාරක සංගමයේ සභාපති ඇතුළු එම නිලධාරීන් කීපදෙනෙක්ද කරුණා පෙරදැරිව සහභාගි වූහ. සම්ප්‍රදායානුකූල කුසලාන, පලිහ සහ සහතික පත්‍ර එම සභාපතිතුමා විසින්ම ප්‍රදානය කරන ලදී. අපේ ඔලිම්පික් තරඟකරුවන් ඇතුළු ලංකාවේ සුප්‍රසිද්ධ මුෂ්ටි ප්‍රහාරක ශූරයින් සමහරෙක් ඉතා සතුටින් ප්‍රදර්ශක තරඟ පැවැත්වීමට සිය කැමැත්තෙන්ම ඉදිරිපත්වීම ගැන ඔවුනටද අපි ඉතාමත් කෘතඥ වෙමු.

1960 දෙසැම්බර් 15 වන දින මෙම ආයතනයේ තූර්‍ය වාදක කණ්ඩායම සහිතව සරඹ ප්‍රදර්ශනයට සම්බන්ධකර පැවැත්වූ පිටව යෑමේ පෙළපාලිය රජයේ චිත්‍රපටි අංශය මඟින් චිත්‍රපටි ගතකරන ලදී. යහෝක්ත චිත්‍රපටිය සහ වෙනත් ප්‍රයෝජනවත් චිත්‍රපටි සහ "ගමනක අවසානය" නමැති චිත්‍රපටියද මෙම ආයතනයෙහි පෙන්වීමෙන් ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව දක්වූ කාරුණිකභාවය අපි ඉතා අගයකොට සලකමු."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

181 දෙනෙක් පුහුණු වී පිටව යන අවස්ථාවේදී පවත්වන ලද උත්සවයක් තමා මේක. මේ සඳහා වියදම් කර තිබෙන මුදල රුපියල් දෙලක්ෂ අසූහත්දහස් හාරසිය තිස් එකක් පමණ වෙනවා. වර්ෂයකට එක ළමයකු සඳහා රුපියල් 1,624 ක් වියදම් වන බව අපට පේනවා. ඒ අනුව මසකට රුපියල් 135 ක් පමණ තබන්න පුළුවනි. අවුරුදු එක හමාරක් අර්ධ පුහුණුව ලැබීම සඳහා ළමයකුට රුපියල් 2,436 ක් වියදම් වෙනවා. නමුත් මොවුන්ට උගන්වන්නේ පිරිගෑම, විදීම සහ යකඩ තැලීම යනාදී සුළු සුළු වැඩ පමණයි. වෙනත් පෞද්ගලික ගරාජයක මාස තුනක් පමණ පුහුණුව ලබා පිට වන ළමයකුට මීට වඩා දැනුමක් තිබෙනවා, තවත් තැනකට ගිහින් බය නැතුව රක්ෂාවක යෙදෙන්න. නමුත් මේ තරම් විශාල මුදලක් අර අහිංසක දරුවන්ගේ නාමයෙන් මේ නිලධාරීන්ගේ බඩවියත රැක ගැනීමට දෙන්නේ මොන කාරණයක් නිසාදැයි කල්පනා කර බලන්න. ගරු සභාපතිතුමනි, සර් ජෝන් කොතලාවල මහතා ගමනාගමන සහ රජයේ වැඩ පිළිබඳ ඇමතිව සිටින කාලයේදී මෙම ආයතනයට පත් කළ නිලධාරි මහතුන් එදා සිට අද වනතුරුත් මළපෙරේතයන් අල්ලා ගත්ත වගේ එම ස්ථානයෙන් හෙල්ලෙන්නේවත් නැතිව රැඳී සිටිනවා. දුප්පත් ජනතාවගෙන් ලබාගන්න මුදලින් යැපෙමින් සවර්ග රාජ්‍යයක් ඇති කරගෙන තිබෙනවා.

මෙම ස්ථානයේ පුහුණුව ලැබූ ළමයින් 181 දෙනා වෙනුවෙන් කොපමණ නිලධාරි සංඛ්‍යාවක් සිටිනවාද කියා විස්තර කර දෙන්න කැමතියි. ගරු සභාපතිතුමනි, එදා කොතලාවල මහතා ඇමතිතුමා වශයෙන් සිටි කාලයේදී මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කළා. එකල ඔහුගේ හිතවතුන්ට සුඛෝපභෝගී ජීවිත ගෙන යෑමට රක්ෂා සැපයුනු ක්ෂේම භූමියක් මේක. මේ ආණ්ඩුව යටතේද මේ අන්දමට එය පැවතීම ගැන මම පුදුම වෙනවා. එබැවින් මහජන මුදලින් පාලනය වන මහජන ආයතනයක් වන මෙය පාලනය වන අයුරු සහ එහි ඇති දුෂණ සහ විශාල මුදල් නාස්තියෙන් බිඳක් දැන් මම දක්වනවා.

මෙය පිහිටුවීමේ පරමාර්ථය ළමයින්ට මූලික අධ්‍යාපනයක් ලබා දීමයි. මෙයට බඳවා ගන්න අයගේ වයස් ප්‍රමාණය අවුරුදු 15 ටත් 16 ටත් අතර විය යුතුයි. දැනට මෙම ආයතනයේ පුහුණුව ලබන අයගේ සංඛ්‍යාව 257 දෙනයි. ප්‍රධාන ඉංජිනේරුවෙක් ඉන්නවා. පිරි ගාන්න, යකඩ නවන්න, ඉංජිනේරුවෙක් උවමනා කරන්නේ මොන කාරණයක් නිසාදැයි මම දන්නේ නැහැ. මගේ යටතේ වැඩ කළ, මගෙන් පුහුණු වූ අය අද දක්ෂ කර්මාන්ත කාරයන් වී සිටින නමුත්, මේ ඉංජිනේරුවන් යටතේ පුහුණු වූ අයට රක්ෂා නැතිවලත වෙන්න සිදු වෙලා තිබෙනවා. මෙම ආයතනයේ ප්‍රධාන ඉංජිනේරු තැන හැරුණු විට සහකාර ඉංජිනේරුවෙක් ඉන්නවා, ෆෝර්මන් කෙනෙක්, කර්මාන්තශාලා අධිකාරි කෙනෙක්, නේවාස භාර නිලධාරීන් තුන් දෙනෙක්, යනුවෙන් විශේෂ පන්තියේ නිලධාරීන් හත් දෙනෙක් සිටිනවා.

ඊළඟට එහි කාර්ය මණ්ඩලය ගැනද කල්පනා කර බලමු. මෙය අංග සම්පූර්ණ කාර්යාලයක් හැටියට සකස් වී තිබෙනවා. මෙහි ප්‍රධාන ලිපිකරු දෙවැනි ශ්‍රේණියේ පඩි ලබන අතර ඔහුගේ සහායට ලිපිකරුවන් හතර දෙනෙක්ද සිටිනවා. ඒ හැර ටයිම්කීපර්වරුන් දෙදෙනෙක් සේවය කරනවා. ගරු සභාපතිතුමනි, ටයිම්කීපර්වරුන් මෙම ස්ථානයට වුවමනා කරන්නේ මොකටද? එම ස්ථානයේම නැවතී සිටින ශිෂ්‍යයින් සඳහා ටයිම්කීපර්වරුන් අවශ්‍ය වන්නේ මොන කාරණයක් නිසාදැයි මට තේරෙන්නේ නැහැ. මට නම් වැටහෙන්නේ මේ දරුවන්ගේ නාමයෙන් මේ අයද යැපෙන බවයි. මේ හැර ගබඩාකරුවන් තුන් දෙනයි, පියන්වරු දෙදෙනයි, ශාරීරික අභ්‍යාස උපදේශකවරයයි, බෑන්ඩ් මාස්ටර් එක්කෙනයි. සංගීතයත් මෙතැන තිබෙනවා. උන්නැහේ වැඩ කරන්නේ පැය බාගයක් පමණයි. නමුත් පැය අටක පඩියක් ලැබෙනවා. බෑන්ඩ් ගහනවා—ගහන්නේ පඩික්කන් බෑන්ඩ්.

ගරු සභාපතිතුමනි, කර්මාන්ත ශාලාවේ ඉගැන්වීමට උපදේශක යන පටබැඳි නාමයෙන් හැඳින්වෙන පුහුණු වූ කම්කරුවන් 20 දෙනෙක් සිටිනවා. මේ විධියේ පිරිසක් නම් මේ විසි දෙනා හොඳටම ප්‍රමාණවත් වෙනවා. යකඩ විදීමට, නැවීමට, කැපීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මට, කියා දීම සඳහා ඉංජිනේරුවන් උවමනා කරන්නේ නැහැ. එම නිසා මෙහි සේවය කරන අනිකුත් අය සඳහා වැය කරන මුදල අපතේ යැවීමක් සේ පෙන්වා දෙන්න පුළුවනි. මේ හැර පත පොතට පමණක් සීමා වූ ඉගැන්වීමක් දෙන උප දේශකවරුන් තුන් දෙනයි, වැන් රියැදුරයි වතුර පොම්ප කරන කම්කරුවෙකුයි, ගිලන්හල් සේවකයන් දෙදෙනයි, අරක්කැමියන් අට දෙනයි, මුරකරුවන් තුන් දෙනයි, කම්කරුවන් එකළොස් දෙනයි. මේ ආදී වශයෙන් සම්පූර්ණ සේවක සංඛ්‍යාව 66 දෙනයි. ළමයින් 250 දෙනෙකුට මූලික කාර්මික අධ්‍යාපනයක් දෙන කුඩා කර්මාන්ත පාසැලක කාර්ය මණ්ඩලය සඳහා 66 දෙනෙකු සිටීමෙන්ම මහජන මුදල් නාස්තිය ගැන විස්තර වුව මනා නැති බව පෙනෙනවා. මේ අනුව සලකා බලන විට ඇත්ත වශයෙන්ම ළමයින් හතර දෙනකුට එක්කෙනා බැගින් වැටෙනවා. මහජන මුදල් නාස්ති වීම ගැන විස්තර කිරීමට වුවමනාවක් නැහැ. රට ප්‍රපාතයට හෙලීමට මෙවැනි ආයතන තවත් කීපයක් තිබුණොත් අපට ඒ ඇති. මේ විධියට මුදල් ලබා ගෙන අසාධාරණයේ ගලා යන්නට ඉඩ දෙනවා නම් මෙන්න මේ වාගේ තවත් ආයතන කීපයක් තිබුණොත් ඇති. මේ දෙපාර්තමේන්තුවේ අනික් ඒවාත් ඔය විධියයි. ළමයින් 4 දෙනාට මාස්ටර්ලා නැත්නම් උපදේශක යන් එක්කෙනා බැගින් වැටෙනවා. නමුත් අපේ ඉස්කෝලවල නම් ළමයින් 27 කුට එක් ගුරුවරයකු පමණයි නියම කර තිබෙන්නේ. නමුත් මෙතැන බලන්න. අනවශ්‍ය සේවකයන් කොයි තරම් ඉන්නවාද? ඉංජිනේරුවන් දෙන්නකු තබා එක්කෙනකුවත් ඕනෑ කරන්නේ මොකටද? මෙතැන දහස් ගණන් පඩි ගිල දමමින් සිටින නමුත් කිසිම දෙයක් ලැබෙනවාදැයි පරීක්ෂා කර බලන්න.

ගබඩාකාරයන් 3 දෙනෙක්. එක්කෙනෙක් හෝ දෙන්නෙක් හිටියාම මදිද? මේ අයට අයිති වැඩ මොනවාද? ටෙම් කිපර්ලා දෙන්නෙක් ඉන්නවා, දිනකට පැය භාගයක් වත් වැඩ තිබෙනවාදැයි සොයා බලන්න. නේවාස භාර නිලධාරීන් 3ක් ඉන්නවා. අභ්‍යාස විද්‍යාලයකට වුවත් ඇත්ත වශයෙන්ම මේ තරම් වුවමනාද? 300 කට වඩා සිටින නවාතැන්වලට අද ලැබෙන්නේ නැති තරම් නේවාසිකාගාර භාර නිලධාරීන් මෙහි ඉන්නවා. 300 කට වඩා ඉන්න අභ්‍යාස විද්‍යාලවලටත්, ඉන්නේ දෙතුන් දෙනෙක් පමණයි. සරඹ උගන්වන තැනැත්තාටත් පැය 8 සේවයක් කරන කෙනකුට ලැබෙන වැටුපක් ලැබෙනවා. මොහු පැය 8ක් තුළ කරන්නේ මොන සේවයක්ද කියා කල්පනා කර බලන්න. ඩිරිල් කරනවාය කියා කරන්නේ මොකක්ද? ඒ ඒ වෙලාවේ විධියට ඉන්ජිනේරුවකුටවත් පොඩ්ඩක් ඇවිත් අත පය එහාට මෙහාට කරන විධිය කියා දෙන්න බැරිද? අසරණ දරුවන්ගේ නාමයෙන් මේ විධියට මුදල් සූරා ගන්නවා. මේ අය නෙරපා දමන ලෙසයි මා ඉල්ලා සිටින්නේ. බෑන්ඩ් මාස්ටර් මිනිත්තු 15යි වැඩ කරන්නේ. පැය භාගයක්වත් වැඩ කරන්නේ නැහැ. විනාඩි 15ක් වැඩ කර උන්නැහේ පැය 8ක වැටුප් ලබා යැපෙනවා. බඩ හෝදා ගන්න ඔය විධියට පැය 8ක් මොනවා කරනවාද මා දන්නේ නැහැ. සමහර විට ලොකු අයගේ කාර් හෝ මොන මොන දේ හෝ රෙපයාර් කරලා අතිරේක වශයෙන් යමක් හොයා ගන්නවා. ඉතින් මේ දෙන්නාම පරණ කොතලාවල මහත්මයාගේ හමුදාවේ හිටපු යුධ සෙබළුන් වෙන්න ඇති; ඒ හමුදාවේ නෂ්ටාවශේෂ වෙන්න ඇති. මේ ක්‍රමයට බෑන්ඩ් වාදනය කිරීමේ අදහස කුමක්ද? ශාරීරික අභ්‍යාස උපදේශක කෙනෙකුත් බෑන්ඩ් මාස්ටර් හෙවත් බෑන්ඩ් නායක යන දෙදෙනකුගේ සේවය මේ ස්ථානයට මොකටද? දෙන්නෙක්ම අවශ්‍යද? නේවාසිකාගාර නිලධාරීන් අතුරෙන් සුදුස්සකු ශාරීරික අභ්‍යාස වැඩට දැනුමක් තිබෙනවා නම්, ඒ අයට කිසිම වැඩක් නැත්නම්, ඇයි උදේ සවස මේ රාජකාරිය ඒ එක්කෙනෙකු ලවා කරවා ගන්න බැරිද? මේවා නිකම් පඩි ගිලීමට තිබෙන රක්ෂාවල් දෙකක් බව නොපෙනේද?

ගරු සභාපතිතුමනි, මේ මහා විද්‍යාල නිසා මේ වර්ෂය තුළ මුදල් වෙන් කර තිබෙන ප්‍රමාණය මම පෙන්වා දෙන්නම්. ගරු සභාපතිතුමනි, 166 වන ශීර්ෂය යටතේ මූලික කාර්මික ආයතනයක් වෙනුවෙන් රුපියල් තුන්ලක්ෂ දහසය දහස් ගණනක් වෙන් කර තිබෙනවා. නමුත් කාර්මික පුහුණුවක් ලබා දෙන තවත් වෙන ආයතනද රජය මගින් පවත්වාගෙන යනවා. රජය මගින් පවත්වාගෙන යනු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

ලබන ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවටද රුපියල් 40,00,000ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ නිසා මා කියා සිටින්නේ මෙම ආයතන සියල්ලම එක් රැස් කොට එක පාලනයක් යටතේ පවත්වාගෙන යන්න පුළුවන් බවයි.

අ. භා. 6.15

1958-59 වර්ෂය සඳහා ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පාලන වාර්තාවෙන් කොටසක් මා දැන් කියවනවා. එය මෙසේයි :

ලංකා කාර්මික විද්‍යාලය 1942 වර්ෂයේදී අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් වෙන් කරන විට අදහස් කළේ දෙපාර්තමේන්තු අභ්‍යාස ක්‍රම හා සම්බන්ධ සියලුම සෛද්ධාන්තික ඉගැන්වීම් කාර්මික විද්‍යාලයෙහි මධ්‍යගත කිරීමය. කෙසේ වුවත් එවැනි ඉගැන්වීම් රජයේ දෙපාර්තමේන්තු විසින් කරගෙන යන බවත් ඒ සඳහා අළුතෙන්ම දෙපාර්තමේන්තු පිහිටුවා ඇති බවත් පෙනී යයි. අනෙකුත් ආයතන කාර්මික අධ්‍යාපනය භාරගෙන තිබේ. උදාහරණයක් වශයෙන් ගල්ඔය සංවර්ධන කාර්මිකයන් පුහුණු කිරීම සඳහා අම්පාරේ කාර්මික ආයතනයක් පිහිටුවා තිබේ. මූලික කාර්මික අභ්‍යාස ආයතනය, ප්‍රවාහන සහ ප්‍රසිද්ධ වැඩ පිළිබඳ අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනයක් වන අතර එය වෘත්තීය ආධුනිකයන්ට ප්‍රාවෘත්තීය වැඩ පිළිබඳ පුහුණුවක් ලබා දීමේ කාර්යය භාරව සිටි . . . . කාර්මික අධ්‍යාපන ක්‍රමයට අදාළ දිවයිනේ සියලුම කරුණු ගණන් ගෙන, ඒවා සොයා බලා රෙකමදරු කිරීමට විධිමත් කොමිසමක් පත් කිරීමට දැන් කාලය එළඹ තිබේ.

ලංකා කාර්මික විද්‍යාලයීය දෙපාර්තමේන්තුවත් රත්මලානේ පිහිටා තිබෙන කාර්මික යන් පුහුණු කරන ආයතනයත් යන ආයතන දෙක එකට සම්බන්ධ කිරීම සුදුසුයයි මා කල්පනා කරනවා. ඒ අන්දමට එක් අංශයක් යටතේ පාලනය ගෙන යනවා නම්, අපට වුවමනා කරන කාර්මික යන් පුහුණු කර ගන්න පුළුවන් වෙනවා ඇති. මෙම ආයතන සඳහා අපි ලක්ෂ ගණන් මුදල් වියදම් කළත් මොනවද අපට ලැබෙන්නෙ? මෙම ස්ථානවල දින පතා කපා දමන, විද දමන, යකඩ කැලි අවසානයේදී වළලා දමනවා. මේවායේ ඉගෙනගන්නාවූ ශිෂ්‍යයින්ට ඉගෙනීමක් ලබා දෙන අතර රටට ආදායමක් ලැබෙන භාණ්ඩ නිපදවීමට අප සෑම උත්සාහයක්ම දරන්නට ඕනෑ. අපරාදේ වළලා දමන යකඩවලින් අපට විකුණා ගත හැකි නොයෙක් උපකරණ ආදිය සදන්න පුළුවන්. පුහුණු වීමේදී අද දින වන නාස්තිය තව දුරටත් කරගෙන යාමට තරම් අප රට සාරවත්ද කියා මා තමුන්නාන්සේලාගෙන් අහනවා. මෙවැනි මෝඩ ක්‍රියා තව දුරටත් කිරීමට ඉඩ නොතබා යම්කිසි පරීක්ෂණයක් පවත්වා මෙය එකම මණ්ඩලයකින් සකස් කරන්න ඕනෑ. මේක සම්පූර්ණ හොර ගුහාවක් වෙලා තියෙනවා. සර් ජෝන් කොතලාවලගේ කාලයේ සිට අද දක්වාම එක්තරා නිලධාරි පිරිසක් එතැන බින්න බැහලා ඉන්නවා. අන්න ඒ අය තමන් කරන දේ එතැනදීම වසා ගන්නට කටයුතු කරනවා.

ගරු සභාපතිතුමනි, මේ දෙපාර්තමේන්තුවේ වැඩ කොයි තරම් අසතුටුදායකද කීවොත් එතැන සිංහලයෙන් වැඩ කිරීම නිසා එක්තරා නිලධාරියකුට මහා අතවරයකට මුහුණ පාන්න සිදු වී තිබෙනවා. ඒ ස්ථානයේ වැඩ කළ කෙනෙක් එක්තරා චක්‍ර ලේඛනයක් අනුව තම මාතෘ භාෂාව කෙරෙහි ප්‍රේමයෙන්, ජාතික භාෂාවට තැනැක් දීම අවශ්‍යය යන හැඟීමෙන්, යම් වැඩ කොටසක් කළ නිසා එදා සිට ඔහුට නොයෙකුත් අතවරවලට මුහුණ පාන්න සිදු වී තිබෙන බව ඔහු ලියා ඇති ලිපියෙන් පේනවා. මෙන්න ඒ ලිපිය මම සංක්ෂේපයෙන් කියවනවා :

සිංහල මාධ්‍යයට පරිවර්තනය කිරීම

ඒ. සී./64—6.9.1960 ලිපිය ගැනයි.

ප්‍රධාන ඉංජිනේරුතුමනි,

ඒ. සී./64—15.8.59 දිනද "රාජ්‍ය භාෂා භාවිතය" යන මැයෙන් එවන ලද ලිපියට අනුකූලතා දක්වමින් ලොග් පොතේ මා සිංහලෙන් සටහන් තැබීම ඇරඹීමි. එහෙත් සම්පූර්ණයෙන් සිංහලෙන් වැඩ කරන තුරු එසේ කිරීම නවතන ලෙස සහකාර ඉංජිනේරු තුමා 18.8.59 ලොග් පොතෙහි නියෝගයක් කර තිබේ.

කරුණු මෙසේ හෙයින් අවනත විය යුත්තේ කාගේ කවර නියෝගයකටද යනු දන්වා එවනු මැනවි.

නේ. භා. නි. එච්. ටී. ඊ. කාරියවසම්

සිංහලයෙන් කරුණු සටහන් කිරීම ගැන මේ මහත්මයාට එවූ ලිපියකට පිළිතුරු වශයෙන් මේ මහත්මයා යවා තිබෙන ලිපියකුයි, මා කියෙව්වේ. ගිලන් හල් ලේඛනය සිංහලයෙන් ලිවීමේ ප්‍රශ්නය උඩයි, මෙය පැන නැඟුනේ. මේ ලියුම් සියල්ලම කිය වන්න වෙලා නැති නිසා මම ගරු ඇමතිතුමාට ඉදිපත් කර නවා, ඒවා පරීක්ෂා කර බැලීමට. සිංහල

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

භාෂාවෙන් වැඩ කිරීමට කැමති අවංක සේවකයකුට එහි තැනක් නැහැ. එදා සිට මේ නිලධාරියාට හිරි හැර කර ඔහු එතැනින් තල්ලු කර දැමීමට එතැන සිටි අනික් නිලධාරීන් උත්සාහ කරනවා.

ගරු සභාපතිතුමනි, අලි පෙරළියක් පිළිබඳ වාර්තාවක් පසුගිය දවස්වල පත්‍රයේ තිබුණා තමුන්නාන්සේ දකින්න ඇති. එක් දවසක් සර් ජෝන් කොතලාවල මහතාගේ අලියා ඇවිත් මේ ස්ථානයේ කොස් ගහක අත්තක් කඩා ගෙන කාලා තියෙනවා. ඒ පක්ෂයට නැකම් කියන අලියා කොස් අත්තක් කඩා ගෙන කෑවාම ඒ ගැන නිදහසට කරුණු කියන ලෙස මේ නිලධාරියාට නියම කර තිබෙනවා.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

කොයි කාලයේද?

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

මා මේ කියන්නේ තමුන්නාන්සේලා කවුරුවත් ගැන නොවෙයි. ඒ ස්ථානයේ සිදු වුණු දෙයක්. කොස් අත්ත කාලා තියෙන්නේ සර්. ජෝන් කොතලාවල මහතාගේ අලියයි. ඒ කොස් ගහ කාර්මික ආයතන භූමියට අයිති එකක්. මේ සම්බන්ධයෙන් පත්‍රවලත් විස්තරයක් තිබුණා.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

කොයි කාලයේද මේක සිදු වෙලා තිබෙන්නේ?

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

මෙන්න මම ඒ ලිපිය සම්පූර්ණයෙන් කියවන්නම්. එවිට දැන ගන්න පුළුවන් වෙයි.

"මගේ අංකය ඒ.ඒ. 51—61.6.5
එච්. ටී. ඊ. කාරියවසම් මහතා,
නේ. භා. නි.

මෙම ආයතනයට අයත් කොස් ගසකින් අතු කඩා කෑ අලියා පිළිබඳ මුරකරුගේ ලිපිය 61.5.23 වැනිදා ඔබ වෙත එවන ලද මුත්, මේ වන තෙක් ඒ පිළිබඳ ඔබේ රපෝර්තුව එවා නොමැත. එබැවින් එම ලිපියත් සමඟ ඔබේ රපෝර්තුව අප්‍රමාදව ඉදිරිපත් කළ යුතුයි.

.....
වැඩ බලන ඉන්ජිනේරු/වෙ.
මූලික කාර්මික අභ්‍යාස ආයතනය, රත්මලාන.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

ඔක සිද්ධවුණේ අලියා පැරදුනාට පස්සෙද, පරදින්න ඉස්සෙල්ලද?

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

මම හිතන්නේ පැරදුනාට පස්සේ කියලයි. තවමත් පොඩ්ඩ පොඩ්ඩ අලි හොල්මන් කරනවා.

දැන් ඔසින් මෙසින් මේ අලි පොරය අවසාන වෙන්න යන්නේ කොහොමද? එක්කෝ මේ අලියාගේ හොඩය බැඳ තබන්න ඕනෑ. එහෙම නැත්නම් ඊට වැට කම්බි ගහන්න ඕනෑ. මිළඟට මෙන්න අනික් ලිපිය.

"මගේ අංකය ඒ.පී. 107—61.8.7.
එච්. ටී. ඊ. කාරියවසම් මහතා,
නේ. භා. නි.

පඩි වැඩිකිරීම අත්හිටුවීම."

මෙන්න ගහන පාර.

"1961 වර්ෂය සඳහා ඔබගේ පඩි වැඩි කිරීම 1961.6.1 වැනි දින සිට මාස 6 කට, පහත දැක්වෙන කරුණු උඩ අත්හිට වූ බව මෙයින් දන්වමි. මේ හා සම්බන්ධව මගේ අංක ඉ/2886 සහ 61.3.6, මාගේ අංක ඒ.ඒ. 51 ඒ.—61.4.19, එල්.ජී. 1 සහ 61.3.15, ඒ.පී. 107—61.5.20 සහ ඉ/2786/61.3.28 වැනි ලිපි බලන්න.

තවද මෙම කාලය තුළ ඔබගේ රාජකාරියේ අවශ්‍ය දියුණුවක් නොදැක්වුවහොත් මීට වඩා දැඩි පියවරක් ගැනීමට සිදු වනු ඇත.

.....
වැඩ බලන ප්‍රධාන ඉන්ජිනේරු තැන,
මූලික කාර්මික අභ්‍යාස ආයතනය, රත්මලාන.

1960 ජූනි මස 4 වන දින ලංකාදීප පත්‍රයේත් මේ අලි රපෝර්තුව ඉල්ලා සිටීම පිළිබඳව විස්තර පළ වී තිබෙනවා. මෙන්න මේ විධියට එහි සඳහන් වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

"රත්මලානේ කොතලාවලපුරයේ මූලික කාර්මික විද්‍යාලයේ කොස් ගසක අත්තක්, හිටපු අගමැති වරයකුවූ සර් ජෝන් කොතලාවල මහතාට අයත් අලියකු විසින් කඩාගෙන කෑම නිසා කාර්මික විද්‍යාලයේ ප්‍රධානියකු විසින් සුළු නිලධාරියකුගෙන් අලි සිද්ධිය ගැන සම්පූර්ණ රපෝර්තුවක් වහාම එවන්නැයි ඉල්ලා තිබේ. මෙම අලි වැඩය නිසා අද කාර්මික විද්‍යාලය තුළ පොඩි කලබලයක් ඇති වී ඇති අතර අලියා කොස් ගහේ අතු කඩාගෙන කෑම සම්බන්ධ සම්පූර්ණ රාජකාරි රපෝර්තුවක් එම සිද්ධිය වූ දවසේම ස්ථානයේ මුරකරු විසින් යවා ඇත."

තවත් දුරට මෙහි—වගතුගේද වටපිටේ ද මං දන්නේ නැහැ—කොස් ගස ගැන හුගාක් දුරට කියා තිබෙනවා. ඒ සියල්ලම කියවන්නට යාමෙන් මම මේ සභාවේ කාලය ගන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. එම නිසා ඊරි යකුන් වැනි මෙවැනි නිලධාරීන් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට ආරූඪ වී සිටින බව හොඳටම පැහැදිලියි. මහජන මුදල් නාස්ති කරමින් ඊරි බිබී සිටින මහජන මුදල් අපතේ හරින—මේ ඊරි යකුන් ඉවත් කර දැමීමට දැන් කාලය එළඹී තිබෙනවා. තවද ඔය විධියේ විනාශ කාරී විධියට මහජන මුදල් නාස්ති කරන, ගිල දමන, ඔය විධියේ අසාධාරණ කාල කණ්ණින් තව දුරටත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල තබාගතහොත් මේ රට කවදාවත් ප්‍රගතිය කරා ගෙන යන්නට ලැබෙන්නේ නැහැ. මේ රට පාලනය කරන ඔය කාලකණ්ණි හැතිකරය තියාගෙන කවදාවත් රටේ දියුණුවක් ලබාගන්නට බැරි බව මම තදින්ම කියන්නට කැමතියි. ඒ නිලධාරීන්ට වහල් වී, එවැනි පෙරේතයන්ට ආරූඪ වී, ඔය විධියේ වැරදි වැඩ කරන්ට ඉඩ දී ඇමතිවරුන් බලාගෙන ඉන්නේ නැතිව මේවා ගැන වහාම පරීක්ෂා කර බලා අසරණ අපේ දුප්පත් ජනතාව බේරා ගත යුතු කාලය දැන් පැමිණ තිබෙන බව මම අපේ ඇමති මණ්ඩලයට මතක් කරන්න කැමතියි. ඔවුන් මේ නාස්ති කරන්නේ දුප්පත් ජනතාවගේ රුධිර මහන්සියෙන් උපයන මුදලුයි. ඒ නිසා වහාම මේවා ප්‍රතිසංවිධානය කර මේ පෙරේතයන් එළවා, මෙම ස්ථාන පවිත්‍ර කර, මහජන මුදල් සතයක්වත් විනාශ නොවන හැටියට වග බලා ගැනීම භාර ගන්නා ලෙස මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ නොකළොත් අනාගතයේ දී අපේ අසරණ ජනතාවට සිද්ධ වන්නේ දවසින් දවස මහා භයානක තත්ත්වයකට ඇද වැටීමටයි.

මීළඟට දුම්රිය ගැන පොඩි විස්තරයක් කරන්න ඕනෑ. තමුන්නාන්සේ නානුඔය දුම්රියපොළට ගොස් බලන්න. මගින්ගේ ප්‍රයෝජනය සඳහා එහි විවේක කාමරයක් නැහැ. එම නිසා සීතලේ වෙවුල වෙවුලා සිටින්ටයි, මඟින්ට සිදු වී තිබෙන්නේ. ඒ ප්‍රදේශයේ කාලගුණය ඒ විධියට තිබෙද්දීත් විවේක කාමරයක් සදා නැහැ. නමුත් ඒ ප්‍රදේශයේ වැඩ කරන උසස් නිලධාරීන්ට බදාගෙන නැටීම සඳහා රුපියල් ලක්ෂයක් පමණ වියදම් කොට සමාජ ශාලාවක් සාදා තිබෙනවා. මේවාට මුදල් කොහෙන්ද? මේවා කාගේ මුදල්ද?

ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.
(திரு. ஸ்டான்லி மொல்லிகொட)
(Mr. Stanley Molligoda)
කවුද හැදුවේ?

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

පසුගිය අවුරුද්දෙයි මේක හදල තිබෙන්නෙ. කම්කරුවන් ලවා රෑ දවල් දෙකේ වැඩ ගෙන රුපියල් ලක්ෂ ගණනක් වියදම් කොට සමාජ ශාලාවක් සදා තිබෙනවා. මේ ගැන පරීක්ෂා කර බලන්න. මෙය මෙසේ වුණත් දුප්පත් කම්කරුවන්ට ඉන්න තැනක් නැහැ. පස් කණ්ඩි කඩා හැළෙනවා. කුඩා ගෙයි ලිපි මෙළවූ විට ඇඳුම් ටික දුම් ගැසී යනවා. පොත් පාඩම් කරන දරුවන්ගේ ඇස්වලට දුම් වැදීම නිසා ඒ ඇස් අඳුරු වෙනවා. කම්කරුවන් ජීවත් වන්නේ මෙවැනි තත්ත්වයකයි. මෙසේ තිබියදී කාලකණ්නි පිරිසකට නැවීම සඳහා සමාජ ශාලාවක් සෑදීමට රුපියල් ලක්ෂ ගණනක් නාස්ති කර තිබෙනවා. එම සමාජ ශාලාව විවෘත කරන ලද්දේ පසුගිය පාස්කු දිනයේදීයි. මේවා පරීක්ෂා කර බලන්න ඕනෑ. කුම්භකර්ණයන් වගේ සිටියාට වැඩක් නැහැ. මේ කරුණු ගැන මා අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා). සමඟ එකඟ වෙනවා. එතුමා කී දේවල් ඇත්තයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මන්ත්‍රීවරයෙක්

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

ගෝලයෙක් නේ.

විලියම් ප්‍රනාන්දු මයා.

(திரு. வில்லியம் பெர்ணாண்டோ)

(Mr. William Fernando)

දෙපාර්තමේන්තු රාශියක වැඩ කිරීමට එක ඇමතිවරයකුට බැහැ. තමන් නියෝජනය කරන කොට්ඨාශයේ වැඩ කිරීමටත් එතුමාට තිබෙනවා. එසේ තිබියදී දෙපාර්තමේන්තු රාශියක වැඩ බදාගෙන කරන්නේ කොහොමද? දැනට තිබෙන අමාත්‍යාංශ ගණන මදි බව පෙනී යනවා. සමහරු ගරු මන්ත්‍රීන් ඒ පිළිබඳව කරුණු ප්‍රකාශ කළා. මා එ්වා ගැන එකඟ වෙනවා. ප්‍රවාහණ, දුම්රිය, තැපැල්, අහස් නැව්, ආදී මේ සියල්ල කම වැඩ කරන්න ගිය විට අවුරුද්දකට එක අංශයක එක පයිල් එකකට වඩා බලන්න ලැබෙන්නේ නැහැ. කොහොමද මේ ඔක්කොම කරන්නේ? අන්තිමට වැඩ කෙරෙන්නේ නිලධාරීන්ට වුවමනා විධියටයි. ඉදහිට එක වැඩක් උස්සා තැබූ වත් පසුව එය කෙරෙන්නේ පැරණි විධියටමයි. එම නිසා මේ අමාත්‍යාංශයේ කිසියම් සංශෝධනයක් ඇති විය යුතුයි. ඇත්ත වශයෙන්ම ප්‍රවාහණ අංශය ඒකාබද්ධ කළ යුතුයි. එක් කෙනකුට බස් ටිකත්, තව කෙනකුට කෝච්චි ටිකත්, තවත් කෙනකුට නැව් ටිකත්, වෙනත් කෙනකුට අහස් යාත්‍රා ටිකත් භාර දී වැඩ කරන්න බැහැ. ඒ වගේම නියම කාර්යක්ෂම සේවයක් සැලසීමට නම් ඇමති අංශ ගණන 16 ක් නොව 26 ක් කළත් කමක් නැහැ. රට දියුණු කිරීම සඳහා නියම වේගයකින් වැඩ කරන්න එහෙම නැතිව බැහැ. මේ අන්දමට නිලධාරීන් කියන කියන දේ අනුමත කරමින් සිටියොත් වැඩක් වන්නේ නැහැ. එම නිසා නියම විධියට වැඩ කරනවා නම් ඇමතිවරුන්ගේ ගණන වැඩි කළ යුතුයි. මහජනයාගෙන් ලබාගන්න බදු මුදල් නියම ආකාරයට වියදම් කිරීම සඳහා, නාස්ති කිරීමක් නැතිව වියදම් කිරීම සඳහා, වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ මයි.

විරුද්ධ පාර්ශ්වයේ ගරු නායකතුමා පිට තට නොගොස් තව ටිකක් ඉන්න. මා නුවරඑළියට අහස් යාත්‍රාංගනයක් ඉල්ලා සිටියේ මගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා නොවෙයි.

ඩඩ්ලි සේනානායක මයා.

(திரு. டட்லி சேனநாயக்க)

(Mr. Dudley Senanayake)

අප විරුද්ධ වුණේ නැහැ.

විලියම් ප්‍රනාන්දු මයා.

(திரு. வில்லியம் பெர்ணாண்டோ)

(Mr. William Fernando)

ලංකාවේ පිහිටීම අනුව බලන විට නුවර එළිය ස්වාභාවික සෞන්දර්යයෙන් පිරි අත්‍යාලංකාර වූ නගරයක්; ජාත්‍යන්තර නගරයක්; පෞරාණික රාජධානියක්. රාවණ රජු දඬුමොනරයෙන් ඉන්දියාවට ගොස් සීතා දේවිය පැහැර ගෙන ආවේ නුවරඑළියටයි. එතුමා ගියේ නුවරඑළියේ සිටයි. ඒ කාලයේ ලෝකයේ කිසිම රටක අහස් යාත්‍රා තුබුණේ නැහැ. මේ ශ්‍රී ලංකා ද්වීපයේ කඳු මුදුනක අදත් තිබෙනවා, සීතා ප්‍රමේශ්වරියගේ ස්ථානයක්.

ලංකාවේ දේශ සංචාරක අංශයත් තිබෙන්නේ මේ අමාත්‍යාංශය යටතේයි. කොළඹට නැව්වලින් පැමිණ ගොඩ නොබසින විශාල පිරිසක් සිටිනවා. ඒ ඇයි? බැහැල මොනවා බලන්නද? මෙහි තිබෙන දර්ශනීය ස්ථාන ආදිය ගැන ඔවුන් දන්නේ නැහැ. එම නිසා නුවර එළියේ දේශ ගුණය ආදිය ගැන ඔවුන්ට විස්තර දෙනවා නම්, ඒ වගේම පැය කීපයකින් එහි ළඟා වීමට ගුවන් ගමන් පහසුකම් ඇති කර තිබෙනවා නම්, නැවට තෙල්, වතුර, ආහාර ආදිය ගබඩා කර ගැනීමට ගත වන දවස් කීපයේදී ඔවුන්ට ඒ ස්ථාන නැරඹීම සඳහා යන්න පුළුවනි. තේ පිළිබඳ විශාල පර්යේෂණාගාරයක් එහි තිබෙනවා, ස්වභාව ධර්මයෙන් අපට ලැබුණු විශාල මල්වත්තක් හග්ගල තිබෙනවා, ඒ වගේ තවත් බොහෝ දර්ශනීය ස්ථාන තිබෙනවා, මේවා නැරඹීමෙන් ඔවුන් අපේ ලංකාව ගැන යම් කිසි තොරතුරක් දැනගෙන යන අතර ඔවුන්ගේ සාක්කුවල තිබෙන විදේශ ධනයෙන් ටිකක් අපට ලැබෙනවා.

ග්‍රෑන්ඩ් හෝටලයේ සේවකයන්ට වැටුප් ගෙවන්නනටත් බැරි තත්ත්වයක් ඇති වී තිබෙන බව එහි වාර්තාවලින් පෙනී යනවා. ස්වීඩනය ගැන කල්පනා කර බලන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

එරට ජාතික ආදායමින් වැඩි කොටසක් ලැබෙන්නේ දේශ සංචාරක අංශයෙනුයි. තමුන්නාන්සේ හෝ ලංකාවේ සිටින අමර සූරිය මහත්මයා වැනි ධනපතියෙක් මේ ස්ථානයේ සිට නුවර එළියට ගියාම ලැබෙන්නේ අපේ ලංකාවේ මුදල්මයි. විදේශ ධනවතකු මෙරටට ගොඩ බැස ටැක්සියකට ගෙව්වත් ලැබෙන්නේ විදේශ ධනයක්, ගෙදර තිබෙන සල්ලි පොට්ටනි යෙන් නොවෙයි. විදේශ සංචාරකයින් අපේ රට තුළ සංචාරය කරන විට යම් තැනක නවාතැන් ගැනීමේදී, ටැක්සි ආදිය පාවිච්චි කිරීමේදී අපට ලැබෙන්නේ විදේශ ධනයක් බව කල්පනා කරන්න ඕනෑ. තේ ප්‍රචාරය කිරීම සඳහා ලංකාව කොපමණ මුදලක් වියදම් කරනවාද? මේ සංචාරයේ යෙදෙන අය ලංකාවේ තේ සැම්පල් පැකැට් ගෙන ඔවුන්ගේ රටවලට යාමෙන් අපට කොතරම් ප්‍රයෝජනයක් ලැබෙනවාද?

සභාපතිතුමනි, ලංකාවේ ගුවන් ගමන් වලට ජාත්‍යන්තර සම්බන්ධතාවක් අවශ්‍ය යයි අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) ප්‍රකාශ කළ අදහස මා අනුමත කරනවා. ඒ විධියේ යෝධ ගුවන් ගමන්වල යෙදීමේදී පිට රටවල් ඔස්සේ ගමන් කරනවාට වඩා මේ ලංකාව ඔස්සේම ගමන් කරනවා නම් යම් කිසි සේවයක් ඇතිවන්නට ඉඩ තිබෙනවා. ඒ අවස්ථාවල රට ඇතුළතින් ගමන් කරනවා නම් ලංකාවේ දර්ශනීය ස්ථාන ඔවුන්ට නරඹන්නට පුළුවන්කම ලැබෙනවා. එහෙත් අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාට එක වචනයක් කියන්නට තිබෙනවා. අපේ පැරණි අනුරාධපුර රාජධානියේ ගුවන්තොටුපොළක් ඇති කිරීම ගැන එතුමා විරුද්ධ වුණා. ඒ ගුවන් තොටුපොළ ඇති කළේ අපේ ඇමතිතුමකුගේ—"මෛත්‍රී බුදුන්ගේ"—ප්‍රයෝජන සඳහාය කියාත් එතුමා කියා සිටියා. එතුමාගේ මතය සම්පූර්ණයෙන්ම වැරදි බව මා කියනවා. එදා ඒ ප්‍රදේශයේ වීරෝදාර සිංහලයින් සිටියා. ගුවන් පහසුකම් තිබෙනවා නම්, ඒ රාජධානිය නැරඹීම සඳහා එන ජාත්‍යන්තර විදේශිකයන්ට අපේ ලංකා ඉතිහාසය ගැන වටිනා පාඩම් මාලාවක් ඉගෙන ගන්නට පුළුවනි. අනුරාධපුරය, පොළොන්නරුව ආදී ප්‍රදේශ නැරඹීමෙන් එදා වීරෝදාර සිංහලයින් විසින් ගල් කුළුණු කෙලින් කර වඩා ගෙවල් සාදා තිබෙන හැටිත්, මහා සමුද්‍රය වැනි ජලාශ සාදා තිබෙන හැටිත්, වැව් අමුණු ආදි වාරි මාර්ග ක්‍රම ඇති කර තිබෙන අන්දමත් ගැන අවබෝධයක් ලබා ගන්නට පුළුවනි. අප සරණ සොයා යන, අද ලෝකයේ දියුණුයයි සැලකෙන, රටවල් පවා හානි යුගයක පැවති කාලයේයි සිංහලයින් මේ වීරෝදාර වැඩ කර තිබෙන්නේ. එවැනි ඉතිහාසයක් ඇති නගරයකට ගුවන් සේවයක් ඇති කිරීම ඇමතිවරයාගේ ප්‍රයෝජන සඳහා කළ වැඩක් බව එදා මල්ලි කිව්වා, අද අයියත් කියනවා. මේ අරුම කථා මට පුදුමයට කරුණක් නොවෙයි. එවැනි නගරයකට ගමන් කිරීමට ඇති පහසුකම් සුළු කොට සැලකුවා. වවුනියාවටත් ගුවනින් ගොස් බස්ස වන්නයයි එතුමා ප්‍රකාශ කළා. ඒ ගැනත් මා පුදුම වන්නේ නැහැ. එම නිසා හැකිතාක් ඉක්මනින් මගේ ප්‍රදේශයටත් ගුවන් ගමන් පහසුව ඇති කළොත් මේ රටේ සැලකිය යුතු ජාතික ධනයක් ඉතිරි කර ගන්න අපට මාර්ගය සැලසෙනවා ඇති.

ගරු සභාපතිතුමනි, දුම්රිය සේවාවේ තිබෙන අයථා වැඩ පිළිවෙළවල් ගැන මා එකින් එක විස්තර කරන්න යන්නේ නැහැ. නමුත් නුවරඑළිය ප්‍රදේශයේ නානුඔය දුම්රිය ස්ථානයේ තිබෙන අසතුටුදායක තත්ත්වය ගැන යමක් කියන්න කැමතියි. එම දුම්රිය ස්ථානයට යන එන අයට නියම විධියට ඉන්න කියන්න තැනක් නැහැ. සීතලේ වෙව්ල වෙව්ලා ඉන්න ඕනෑ. නමුත් එහි ඉන්න උසස් නිලධාරීන්ට විනෝදවීම සඳහා සමාජ ශාලාවක් නම් සාදා තිබෙනවා. ඒ සමාජ ශාලාවට වියදම් කළේ කාගේ මුදල්ද? ඒ ගැන පරීක්ෂා කර බලන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, නානුඔය ස්ටේෂන් එක ළඟ පස් පුරවන්න වුවමනා වී තිබෙනවා. ඒ සඳහා ඒ අසලම පස් තිබෙන බව අප දන්නවා. නමුත් එතැනින් පස් කපා ගන්නේ නැහැ. එතැනින් කපාගන්න පස් කෝච්චිවලට පුරවාගෙන වටගොඩ, කොට ගල වැනි ප්‍රදේශවලට ගෙනගිහින්, නානුඔය දුම්රියපළ සකස් කිරීම සඳහා අවශ්‍ය පස් අඹේවෙලින් පුරවාගෙන එනවා. මේවා විනාශකාරී වැඩ බව කියන්න ඕනෑ. මේවා ගැන සොයා බලන්න ඕනෑ. මේ විනාශකාරී වැඩ කටයුතු දකින විට මගේ රට වෙනු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙන් මගේ ලේ උණුවෙනවා. පාන් රාත්තලේ සහ පිටි රාත්තලේ මිල වැඩි කර අසරණයොගෙන් ගන්න අයබදුවලින් නිසියාකාර ලෙස වැඩ කරන්න ඕනෑ. ඒ මුදල් විනාශය කරා යනවා නම් ඊට විරුඬව කටයුතු කිරීම සඳහා මේ පපුව පලා ලේ දෙන්න වුවත් මා ලෑස්තියි. සිංහලයෙකු හැටියට ඉදිරියට එන්න මා ලෑස්තියි. නිදා ඉන්නේ නැතිව අවදි වෙන්නය කියා මා ඉල්ලා සිටින්නේ ඒ නිසයි. තමුන්නාන්සේලා වැටුප් වශයෙන් ලබන්නේ මහජන මුදල් බව කියන්න ඕනෑ. මහජන මුදලින් යැපෙන තමුන්නාන්සේලා—

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
ඔය පැත්තට කියන්න.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)
—මේ ගැන හොඳින් කල්පනා කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මගේ කථාවේදී යම්කිසි ප්‍රමාදයක් ඇති වුණා නම් ඒ ගැන සමාවෙන්න. තත්ත්වය දෙස බලන විට පෙනී යන්නේ ඔන්න ඔය ආකාරයටයි. නානුඔයේ තිබෙන පස් වෙන තැන්වලට ගෙනගොස් නානුඔයට පස් වුවමනා වන විට අඬේවෙලින් ගෙන එනවා. එමෙන්ම, නානුඔය දුම්රිය ස්ථානය පුළුල් කිරීම සඳහා ඒ අවට තිබෙන ගොඩනැගිලි කීපයක් කඩා දමනු ලැබුවා. කඩා දමනු ලැබූ ගොඩනැගිලිවල තිබුණු බඩුවලට සිදු වුණේ කුමක්ද කියා සොයා බලන ලෙස මා ඉල්ලා සිටිනවා. එතැනින් ඉවත් කර ගන්නා ලද දැව දඬු සහ වෙනත් භාණ්ඩ වලට සිදු වුණේ මොකක්ද? ඒ ගැන පරීක්ෂා කර බලන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නොසැලකිල්ල නිසා යම් යම් දේ අපතේ යන හැටි මා පෙන්වා දෙන්න කැමතියි. රජයේ වැඩ දෙපාර්ත මේන්තුව මගින් තාර පීප්ප ගෙන ගිහින් කාණු අයිනේ දමා තිබෙනවා. ඒවා හිල් වෙලා තාර කාණු දිගේ ගලාගෙන යනවා. ඔවර්සියර්ලාත් ඉංජිනේරුවනුත් වෙනත් ප්‍රධානීනුත් තාර ගලාගෙන යනවා බල බලා නිකම් ඉන්නවා. ඒ ගොල්ලො පැත්තකට වෙලා එක්කෝ දේශපාලනය ගැන කථා කරනවා, එහෙම නැතිනම් පාසැල් ප්‍රශ්නය ගැන කථා කරනවා; එහෙමත් නැත්නම් ෆේපඩරල් වාදය ගැන කථා කරනවා. අර පීප්පවල තාර, නැතිනම් මහජන මුදල්, කාණු දිගේ ගලාගෙන යනවා. ඔන්න ඕකයි අද තිබෙන තත්ත්වය. මේවා ගැන කල්පනා කර බලා, අනාගතය ගැන හොඳ හැඟීමක් ඇතිව, නියම ඉලක්කයක් අනුව ගමන් කර, මතු පරම්පරාවට මේ රට භාර දෙන්න කල්පනා කළ යුතුයි. ලෝකයේ අනිකුත් ජාතීන් ගව් ගණනින් දියුණුව කරා යද්දී අපි අඩි ගණනකින්වත් දියුණුව කරා යන්නට උත්සාහ කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අද සෑම දෙපාර්ත මේන්තුවකම වාගේ ඕවර්ටයිම් වැඩ, ඒ කියන්නේ අති කාල දීමනා ගෙවන වැඩ, තිබෙන බව පේනවා. අපේ රටේ රැකී රක්ෂා නැති අය දහස් ගණනින් සිටිනවා. ඔවුන් සේවයට බඳවා නොගෙන රක්ෂා තිබෙන අයටම ඇයි අතිකාල වැටුප් ගෙවන්නේ? මෙය කල්පනා කළ යුතු ප්‍රශ්නයක් බව කියන්න ඕනෑ. රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්න වුවමනා නම් රක්ෂා තිබෙන අයට අතිකාල දීමනා ගෙවන්නේ නැතුව ඒ වැඩි වැඩ කොටස් කර දීම සඳහා අළුතින් සේවකයන් බඳවා ගන්න ඕනෑ. ඒ අයට නියමිත වැඩ කොටස කරන්න ඉඩ දී අතිරේක වැඩ කොටස් තිබෙනවා නම් ඒ සඳහා සෑම දෙපාර්ත මේන්තුවකටම අමතර සේවකයන් බඳවා ගැනීමට ආණ්ඩුව කල්පනා කරන්න ඕනෑ. එසේ කිරීමෙන් රැකීරක්ෂා නැති අය විශාල සංඛ්‍යාවක් සේවයේ යොදවන්න පුළුවන් වෙනවා. මේ කාරණය ගැන ගරු ඇමතිතුමාගේ සැලකිල්ල විශේෂයෙන් යොමු වන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රදේශයේ ජනතාව මාර්ග පහසුකම් නොමැති කමින් අපමණ දුක් ගැහැට විඳිනවා. පාර්ලිමේන්තු කොට්ඨාශ දෙකහමාරක පමණ ප්‍රදේශයක් අද එක කොට්ඨාශයට ඇතුළත් වී තිබෙනවා. එදා තලවකැලේ කොටගල, නුවර එළිය, ආදි වශයෙන් වෙන් වශයෙන් පාර්ලිමේන්තු කොට්ඨාශ පිහිටා තිබුණත් දැන් ඒ සියලුම ප්‍රදේශ එකට එකතුකොට එකම කොට්ඨාශයක් බවට පරිවර්තනය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

කර තිබෙනවා. මෙසේ කර තිබෙන්නේ ලාංකික ඡන්ද දායකයන් එම ප්‍රදේශයේ අඩු නිසා වෙන්න පුළුවනි. කොටගල, වට ගොඩ, ගලබොඩ, ග්‍රේට් වෙස්ටර්න්, තලවකැලේ, නානුඔය, අඹේවෙල, පට්ටිපොළ, මේ ආදි දුම්රිය ස්ථාන අසුවන සියලුම ප්‍රදේශ මගේ කොට්ඨාශයට ඇතුළත් වෙනවා.

ගරු සභාපතිතුමනි, මා මුලින් පෙන්වා දුන් කරුණු ගැන කල්පනා කර බලන විට මූදල් පරිහාණියකට හේතු වන්නේ කුමන කාරණාදැයි අපට පැහැදිලි වෙනවා. නමුත් අපේ රටට පමණක් නොවෙයි, ලෝකයේ වෙනත් බොහෝ රටවල්වලට මූදල් ප්‍රශ්නය සම්බන්ධයෙන් නොයෙකුත් දුෂ්කරතාවන්ට මුහුණ දෙන්නට සිදු වෙනවා. එම නිසා අපට ලැබෙන සුළු ආදායමෙන් නියම විධියට, නියම ප්‍රතිඵල ලබා ගැනීමට පුළුවන් වන ආකාරයට, වැඩ කටයුතු සකස් කිරීමට කල්පනා කරන්න ඕනෑ. එසේ කරන්නේ මොන ආකාර යෙන්ද කියා පෙන්වා දෙන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රදේශයේ ආගරපතන, හෝටන් තැන්නේ, අඹේවෙල දුම්රිය පොළට යාබදව, විශාල ගව පට්ටියක් තිබෙනවා. ඒවාගේම බෝපත්තලාවේද විශාල ගව පට්ටියක් තිබෙනවා. මේ ස්ථාන දෙක අතර පාරවල් දෙකක් වැටී තිබෙනවා. මෙයින් එක පාරක් නත්බෝර් කියන ස්ථානය දක්වා වතු උඩින් වැටී තිබෙනවා. අනෙක් පාර නත්බෝර් කියන ස්ථානයේ සිට අඹේවෙල දක්වා වැටී තිබෙනවා. මේ පාර වල් දෙක සම්බන්ධ කිරීමට හැතැප්ම 3ක පමණ ප්‍රමාණයයි ඇත්තේ. මේ හැතැප්ම 3 ක පමණ ප්‍රමාණය පාරක් තනා ඒ පාරවල් දෙක සම්බන්ධ කළොත් ඇත්ත වශයෙන් දැනට වැය වන විශාල මුදලක් ඉතුරු කර ගන්න පුළුවන් වෙනවා.

ගරු සභාපතිතුමනි, අද බෝපත්තලාවේ කිරි මධ්‍යස්ථානයේ කිරි හැතැප්ම 21ක් පමණ දුර තලවාකැලේ දුම්රිය ස්ථානයට ගෙනෙන්නට ඕනෑ. නමුත් මම යෝජනා කළ මේ මාර්ග දෙක එකට සම්බන්ධ කරන්නට පුළුවන් නම් හැතැප්ම 12ක් පමණ දුර ඇති අඹේවෙල දුම්රිය ස්ථාන යට මෙම කිරි ගෙනෙන්නට පුළුවන. අඹේවෙල කිරි මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ ද දුම්රිය ස්ථානයට යාබදවයි. එම නිසා මේ පාරවල් දෙක සම්බන්ධ කිරීමට ගරු ඇමතිතුමා උනන්දුවක් දක්වන ලෙස මා ඉතා ඕනෑ කමින් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ඊළඟට තලවාකැලේ තැපැල් කාර්යාලය ගැනත් වචනයක් සඳහන් කරන්න ඕනෑ. මෙම ගොඩ නැගිල්ල පිහිටා ඇත්තේ නැගීමට අමාරු අඩි තුන්සියක් පමණ උස් ස්ථානයකයි. මෙම ස්ථානයට යන්න ඕනෑ විශාල පඩි පෙළක් නැගිමෙනුයි. විශෙෂයෙන් මහලු උදවියට විශ්‍රාම වැටුප් ගැනීමට, පින් පඩි ලබාගැනීමට, මෙම ස්ථානයට යන්න වන්නේ දෝලාවක් වැනි දෙයකිනුයි. ඒ උදවියට මේ පඩි පෙළ නගින්නට පුළුවන් කමක් නැහැ. මෙම තැපැල් කාර්යාලය පවත්වා ගෙන එන්නේ වික්‍රමසූරිය මහතා ගේ බංගලාවේයි. එම නිසා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ තැපැල් කාර්යාලය පවත්වා ගැනීමට සුදුසු ගොඩ නැගිල්ලක් ලබා දෙන ලෙසටයි. මෙයට පෙර තැපැල් කාර්යාලය සඳහා ගොඩ නැගිල්ලක් තැනීමට ප්ලෑන් ආදිය සකස් කළා. ඇස්තමේන්තු හැදුවා. මරික්කාර් මහතා තැපැල් ඇමතිවරයා වශයෙන් සිටි කාලයේදීයි මෙසේ සකස් කළේ. නමුත් අද වනතුරුවත් ඒවා ක්‍රියාත්මක වුණේ නැහැ. කලින් රෙස්ට් හවුස් එක වශයෙන් පාවිච්චි කළ ගොඩනැගිල්ල දැන් හිස්ව තිබෙනවා. එම ගොඩනැගිල්ල තැපැල් කාර්යාලය බවට පරිවර්තනය කරන්න පුළුවනි. එසේ කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, බෝපත්තලාවේ වතු විස්සකට පමණ තැපැල් මලු බෙදා හරිමින් තිබුණු, ඒවාගේම විශාල ගොවිපළකට තැපැල් බෙදා හැරිය, එමෙන්ම පළාතේ ජනතාවට තැපැල් මධ්‍යස්ථානයක් වශයෙන් විශාල සේවයක් ඉටුවුණු ආගරපතනේ තැපැල් කාර්යාලය එය පිහිටා තිබුණු ගොඩනැගිල්ලේ ඉඩ කඩ මදිකම නිසා අවුරුදු ගණනාවකට පෙර වසා දමන්නට යෙදුණා. මේ නිසා පළාතේ ජනතාවට මෙන්ම එයින් විශාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රයෝජනයක් සැලසුණු ඒ වතුවල සේවය කරන උදවියටද බලවත් හිරිහැර කරදර වලට මුහුණ දෙන්නට සිදු වෙනවා. එම නිසා මගේ පළාතේ ඡන්දදායකයින් ඉල්ලා සිටිනවා, කලින් තිබුණු තත්ත්වයටත් ඒ තැපැල් කාර්යාලය පවත්වන්නය කියා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

ගරු මන්ත්‍රීවරයා කරුණා කර පුළුවන් තරම් කථාව කෙටි කරන්න. තවත් ගරු මන්ත්‍රීවරුන් කථා කරන්න සිටිනවා.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

ගරු සභාපතිතුමනි, අපේ පළාතේ ජනතාවගේ දුක්ගැනවිලි අප කියා සිටින්න ඕනෑ. එසේ නැතිනම් ඡන්දදායකයින් අප මෙම ස්ථානයට එවා තිබීමේ තේරුමක් නැහැ.

ගරු සභාපතිතුමනි, එම නිසා මගේ කොට්ඨාශයේ ආගරපතනේ තැපැල් කාර්යාලය කලින් තිබුණු තත්ත්වයෙන්ම පවත්වා ගෙන යන ලෙස මා ඉතා කරුණාවෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එයින් විශාල සේවයක් පළාතේ ජනතාවට සිදු වුණා.

තලවකැලේ සිට අගරපතන දක්වා විදුලි පණිවුඩ යැවීම කරන්නේ වෝකර් ඇන්ඩ් ග්‍රිග් පෞද්ගලික සමාගම මගිණුයි. එය වහාම නතර කොට ඒ වෙනුවට අනික් තැන්වලට ඇති විදුලි පණිවුඩ සේවයම ඒ ප්‍රදේශයටත් ලැබෙන්නට සැලැස් විය යුතුයි. නුවරඑළිය නගරය වර්ෂාව අධික ඉතා දුෂ්කර ප්‍රදේශයක්. එහි සිටින තැපැල් සේවක මහත්වරුන්ට එහා මෙහා ගමන් කිරීම ඉතා අපහසුයි. ඒ අයට කලින් තිබුණු පහසුකම් දැන් ඇත්තේ නැහැ. නුවරඑළියේ තැපැල් බෙදීම කොළඹ වාගේ පහසු නැහැ. නුවරඑළිය ශීතාධික ප්‍රදේශයක් නිසා, එහි සිටින තැපැල් පියන් මහත්වරුන්ට පාවහන් සඳහා දී ගෙන ආ දීමනා දැන් නතර කර තිබෙනවා. ඒ වාගේම ඇඳුම් කට්ටලවලට දුන් දීමනාත් දැන් කපා හැර තිබෙනවා. ඔවුන්ගේ දුක් ගැන විලි ගැන කල්පනා කර බලන්න ඕනෑ. ඒ වාගේම විදුලි කම්බි අදින්නන්ගේ දුක් ගැනවිලි ගැනද සලකා බලන්නට ඕනෑ. ඒ දුෂ්කර ප්‍රදේශයේ සේවය කරන අයගේ දුක් ගැනවිලි බලා ඔවුන්ට සහනයක් දෙන්න ඕනෑ.

දැන් කොළඹ තැපැල් ගෙන යෑම සඳහා වෑන් පාවිච්චි කරනවා, ඒ වාගේම වෙනත් නගරවලට බස්වලින් තැපැල් මලු යවනවා. එම නිසා නානුඔය සිට හැතැප්ම 6 ක් පමණ තැපැල් බෙදා හැරීම සඳහාද වෑන් පහසුකම් සලසා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. එසේ කළොත් ඒ ප්‍රදේශයේ දුප්පත්තුන්ට කලට වේලාවට ඔවුන්ගේ ලියුම් ලබා ගන්න පුළුවන් වෙනවා.

ගමනාගමනය අතින් කල්පනා කර බැලුවත් කඳුකර ප්‍රදේශයට නොයෙකුත් දුෂ්කරතාවන් තිබෙන බව පෙනෙනවා ඇති. රම්බඩ මහ කන්දේ මුදුනට නැග අනෙක් පැත්තට බහින්න ඕනෑ. එතැනින් ගලක් පෙරළුනොත් මාස ගණනක් ඒ පාර අවහිර වෙනවා. අනෙක් පැත්තෙන් බහින්නේ බදුල්ලටයි. ඔය පාරේ කොයි පැත්තෙන් වුවත් අවහිරයක් ඇති වුණොත් මහත් කරදරයක් ඇති වන්න පුළුවනි. බදුලු මිටියාවෙතේ පාරක් සකස් කර තිබෙනවා. කලින් නුවරඑළියේ දිසා පතිව සිටි ගුණවර්ධන මහත්මයා—දැනට බදුල්ලේ දිසාපතිතුමා—හාරගම සිට බදුල්ලට හැතැප්ම 55 කින් යන්නට පුළුවන් මහවැලි ගඟ ඔස්සේ යන බොහොම පහසු මඟක් සකස් කළා. එහි කිසිම පාලමක් නැහැ. එදා පැරණි රජ කාලයේදී පාවිච්චි කළ පාර පළල් කොට වාහන පහසුව සැලසීම සඳහා සැලැස්මක් සකස් කර තිබුණා. ඒ ගැන කල්පනා කොට බලා එය දියුණු කර දෙන මෙන් මම ඉල්ලා සිටිනවා. දැනට කොළඹ සිට බදුල්ලට යන විට අඩි 6300ක් කඳු මුදුන් නැඟ නැවත පහළට බසින්න සිදු වෙනවා. සම භූමියේ යන පාරක් ඇතොත් මේ කඳු නැඟීමට යන තෙල් කොපමණ ඉතුරු වෙයිද? එම නිසා ඒ සම බිම ඔස්සේ යන පාර පිළිබඳව නෙත් යොමු කළ යුතුව තිබෙනවා. ගරු ඇමතිතුමාට ඒ වැඩ පිළිබඳව සටහනක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

මා එවා තිබෙන නිසා වැඩි විස්තර කරන්නට යන්නේ නැහැ. ඒ ගැන කල්පනා කර බලා එය දියුණු කර දෙන මෙන් මම ඉල්ලා සිටිනවා.

රත්මලානේ කාර්මික පාසැලේ සිදු වන අයථා වැඩ ගැන වහාම පරීක්ෂාකර බලා ඒ පාසැල කාර්මික පාසැල් දෙපාර්තමේන්තුවට මාරු කර එහි නැංගුරම් දමා ගෙන, බින්න බැහැගෙන සිටින නිලධාරීන් තැනින් තැනට මාරු කර යවන ලෙස මම ඉල්ලා සිටිනවා. දැන් එහි අලි පෙරලි ඇති වී නොයෙක් විධියේ කරදර තිබෙන බව අපට ආරංචියි. එම නිසා එහි සේවකයින්ට ආරක්ෂාව සලසා දෙන්නට ඕනෑ. සමහර විට අද මේ අදහස් මෙහි ප්‍රකාශ වූ නිසා ඔවුන්ගෙන් පලි ගැනීමට වැඩ කරන්න පුළුවනි. එම නිසා ගරු ඇමතිතුමාගේ ආදරය සහ කරුණාව ඒ සේවකයින්ට ලබාදෙන ලෙස මම ඉල්ලා සිටිනවා. ඔවුන්ට නියම යුක්තිය සහ සාධාරණය ඉටු වන්නට ඕනෑ.

විරුද්ධ පක්ෂයේ නායකතුමා ජලාශ්‍රිත ගුවන් සේවයක් ඇති කරන්නට යයි කිව්වා. ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා එය පහසුවෙන් ක්‍රියාත්මක කරන්නට පුළුවන් නම් දැනට ලංකාවේ ඇති බොහෝ ජලාශ ප්‍රයෝජනයට ගෙන ගමන් පහසු ඇති කරන්නට පුළුවන්. එවැනි අහස් යානා ගමන් සේවයක් ඇති කරන්නට පුළුවන් නම් නුවර එළියේද ජලාශ දෙකක් තිබෙනවා. මහා එළිය වැව තිබෙනවා. නුවර එළිය ටවුමේත් වැවක් තිබෙනවා. ඒ ස්ථාන දෙකට අහස්යාත්‍රා බස්සවන්න බැරිද? බදුල්ලේ හැම තැනම, මහනුවර හැමතැනම බස්සවන්න පුළුවනි. ඒ නිසා එවැනි ගුවන් සේවයක් ඇති කරන ලෙස මම ඉල්ලනවා. විරුද්ධ පාර්ශවයෙන් වුවත් හොඳ අදහස් එවනවා නම් ඒවා මල්පොකුරු මෙන් භාර ගන්නත් විරුද්ධවාදි අදහස් එවනවා නම් ඒවා ගල් කැබලි මෙන් සලකා පෙරලා ඉවත් කරන්නත් ඕනෑ. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ අදහස් හොඳයි. ඒ හොඳ අදහස් අපි අනුමත කරනවා. අමාත්‍යාංශ වෙන් වෙන් වශයෙන් කඩන්නේ නැතුව එකම විධියේ වැඩ කොටස් එකම අමාත්‍යාංශයකට පැවරෙන ආකාරයට ඒවා සකස් කරන්න ඕනෑ. ගබඩාකරුවන්, ටයිම්කීපර්වරුන්, ලිපිකරුවන් ආදීන්ගේ වැඩ ඒකරාශි කර එකම සංවිධානයකට ගෙන වැඩ කරන්න පුළුවනි. ඒ නිසා බස් සේවය එක්කෙනකුටත්, දුම්රිය සේවය තවත් කෙනකුටත්, ගුවන් සේවය වෙනත් කෙනකුටත් යනාදි වශයෙන් එකම කාර්යය 4 දෙනකුට බෙදා හරින්න වුවමනාවක් නැහැ. ඒ නිසා නවීන යුගයට ගැලපෙන පරිදි නියම විධියට වේගයෙන් ගමන් කරන්න නම් තව තවත් අමාත්‍යාංශ වැඩි කරන්න ඕනෑ. දැනට තිබෙනවාට වඩා අමාත්‍යාංශ ගණන වැඩි කරන්න පසුබට වන්න ඕනෑ නැහැ. අමාත්‍යාංශ සම්බන්ධයෙන් මුදල් වැය කරන්න. එයින් පසුතැවිලි වන්න සිදු වන්නේ නැහැ. දෙපාර්තමේන්තු ගණනාවක් එකම ඇමතිවරයකු භාරයේ තිබෙන විට වැඩ කරන්න බැහැ. දුක්ගැනවිලි ගොඩ ගැහෙනවා. හුස්ම ගන්න බැරි තරම් වැඩ ගොඩ ගැහෙනවා ඇති. අපේ ගරු ඇමතිතුමාටත් තිබෙන්නේ අපේ වගේම පංචස්කන්ධයක්. එතුමාටත් දිව්‍ය ස්වරූපයක් ලැබී නැහැ. ඒ නිසා මනුෂ්‍යයකුට කරන්ට පුළුවන් දෙයක් තමයි, එතුමාටත් කරන්නට පුළුවන්. ඒ ගැන කල්පනා කර, කරන්න බැරි තරම් හුඟක් වැඩ බදාගන්නේ නැතුව ඉක්මනින් සහ වේගයෙන් වැඩ කරන්න පුළුවන් ප්‍රමාණයක් භාර ගෙන ලෝකයේ දියුණු වූ ජාතීන් සමග අත්වැල් බැඳගෙන වැඩ කරන මෙන් ඉල්ලමින් මගේ කථාව මෙයින් සමාප්ත කරමි.

වෛද්‍යාචාර්‍ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)

(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)

(Dr. S. A. Wickremasinghe—Akuressa)

ගරු සභාපතිතුමනි, පැය ගණන් ගුවනේ ගමන් කරන මේ අවස්ථාවේ දීර්ඝ කාලයක් ගත වී නමුත් නුවර එළියේ මන්ත්‍රීතුමා පොළව මතුපිට තිබෙන ප්‍රශ්න ගැන අපේ සිත් යොමු කිරීම ගැන එතුමාට අපේ කෘතඥතාවය දක්වන්න ඕනෑ. මේ වැය ශීර්ෂය මේ අවස්ථාවේ සාකච්ඡාවට ගන්න හේතුව හැටියට මා කල්පනා කරන්නේ අපේ ඇමතිතුමාට ගුවන් ගමන් සම්බන්ධව ලංකාවෙන් පිට වී යාමට සිදු වී තිබීම වෙන්න ඇති කියායි. ගුවන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්න ගැන කල්පනා කරන්න පෙර ගරු ඇමතිතුමාටත් ආණ්ඩු පක්ෂයටත් ඉතා මත් අවශ්‍ය කරුණු කිහිපයක් ගැන මත කරන්න බලාපොරොත්තු වෙනවා.

දෙවැනි සිමෙන්ති කම්හලක් සෑදීමේ අවශ්‍යතාවය සම්බන්ධව වාර්තා ගත වී තිබෙනවා. එය අවශ්‍ය බව ආණ්ඩුව පිළි ගෙන තිබෙනවා. පුත්තලමේ සිමෙන්ති කර්මාන්ත ශාලාවක් පිහිටුවන්නට පෙර පුත්තලම දක්වා නැවතත් දුම්රිය මාර්ගය දීර්ඝ කරන්නට යන බව දැන ගන්නට ලැබී තිබෙනවා. එය අවශ්‍ය බව අප පිළි ගන්නවා. මට ලැබුණු ආරංචියේ හැටියට අද තිබෙන දක්ෂකම් අනුව, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේත් දුම්රිය දෙපාර්තමේන්තුවේත් හැකියාවන් අනුව, තිබෙන උපකරණ අනුව මේ සඳහා අවුරුදු තුන හතරක් ගත වේවි. එවැනි තත්ත්වයක් තිබියදී සිමෙන්ති කම්හල පමණක් නොව ටයර් ටියුබ්, පේෂකර්ම, පිටි ආදී කර්මාන්ත ශාලා ගණනාවක්ම පිහිටුවන්නට පෙර දුම්රිය පහසුකම් ඇති කිරීම අවශ්‍යයයි. මේ අතර, ටුවරිස්ට්ස් හෙවත් සංචාරී ගමන් කරන්නන් ලංකාව කෙරෙහි යොමු කරවීමෙන් ලංකාවට විශාල ආදායමක් ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් වෙනුවෙන් රුපියල් කෝටි ගණන් වියදම් කර අන්තර්ජාතික ගුවන් පොළක් කටුනායක, ඇතිකිරීම සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. සිය ගණන් ගෙවල් කැඩීමටත් අළුතින් පාරවල් කැපීමටත් අපේ රටේ සිටින්නා වූ ඉංජිනේරුවන් යොදවන්නට සිදු වෙනවා. ඒ නිසා තමයි, මා ගරු ඇමතිතුමාට කියා සිටින්නේ මෙය අවශ්‍යයෙන්ම කළ යුතු දෙයක් හැටියට ආණ්ඩුව කල්පනා කරනවාද යන ප්‍රශ්නය පළමුවෙන් ඉතාමත් ඕනෑකමින් සලකා බලන්නය කියා. ලෝකයේ වෙන අනෙක් රටකට දෙවන නොවන අන්දමේ ගුවන් තොටුපළක් මේ රටේද තිබීම ගැන අපිත් ආඩම්බර වෙනවා. නමුත් අද අපේ රටේ පවතින තත්ත්වය අනුව මුදල් ණයට ඉරගෙන මේ රටේ සංවර්ධන කටයුතු වලට යෙදවිය යුතුව තිබෙන කාර්මිකයන් යොදවා මෙවැනි වැඩක් පටන් ගැනීම රටට මූලික වශයෙන් අවශ්‍ය දෙයක්ය කියා තමුන්නාන්සේලා කල්පනා කරන වාද? ලංකාවට අද දින පවත්නා තත්ත්වයේ හැටියට සිමෙන්ති කම්හලක් තැනීම ඉතාමත්ම අවශ්‍යයයි කියන්නට පුළුවන්. ඇයි එවැනි කර්මාන්තයක් සඳහා මුදල් වැය නොකරන්නේ? පුත්තලම දක්වා රේලි පීලි දැමීමට තව අවුරුදු තුන හතරක් ගතවේවි. එවැනි කායර්යක් තුන් හාර මාසයක් ඇතුළතදී කර ගන්නට පුළුවන් වන පරිදි පිටරටවලින් ආධාර ලබාගන්න පුළුවන්. මේ අවස්ථාවේදී රටට අවශ්‍යව තිබෙන එවැනි දේ සම්බන්ධයෙන් නිරත වීම රටට මීට වඩා ප්‍රයෝජනවත් නේද? රටේ සංවර්ධන කටයුතු දියුණු කිරීම සඳහා මෙවැනි දේ අවශ්‍යයෙන්ම කළ යුතු නේද? මේ ප්‍රශ්න කෙරෙහි ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන මෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

අ. භා. 7

එතරම් අංග සම්පූර්ණ නැතිවුවත් ලංකාවට පිරිමැසෙන තරමේ ගුවන් තොටුපළක් රත්මලානේ තිබෙනවා. තරමක විශාල අහස් යාත්‍රාවකට වුවත් මේ ස්ථානයේ දී බිමට බසින්නට පුළුවන්. කටුනායක අහස් තොටුපළ මීට වඩා විශාල වන්නට පුළුවන්. එය මීට වඩා දියුණු කරන්නට ඉඩ තිබෙනවා වෙන්නට පුළුවන්. නමුත් නොම්මර එකේ අහස් තොටුපළක් ලංකාවට නැති වුණාය කියා ඒ තරම් විශාල හානියක් මේ රටට වෙයිද? මේ කාරණය නිසායි ගරු සභාපතිතුමනි, මා ඉතා බැගෑපත්ව ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ රටේ තිබෙන්නාවූ අවශ්‍යතාවන් අනුව වැඩ කටයුතු කළ යුතුය කියා. රත්මලානේ අහස් තොටුපළ වුවත් තව ටිකක් විශාල කරන්නට වුවමනා නම් වැඩි අමාරුවක් නැතිව, වියදමක් නැතුව, එය කරන්නට පුළුවන්. ගාලු පාර හරහා මහ මුහුද තෙක් එය පුළුල් කොට, ගාලු පාර සැතපුම් කාලක හෝ භාගයක හෝ දුර ප්‍රමාණයක් ගුවන් තොටුපළ යටින් යන පිළිවෙළට කැපුවොත්, එය ඒ තරම් අමාරු කායර්යක් වෙන්නේ නැහැ.

මේ ළඟදී තමුන්නාන්සේ එංගලන්තයට යන නිසා ලන්ඩන් සහ ලිවර්පූල් අතර තිබෙන මර්සි නමැති ගඟ යටින් දමා තිබෙන හැතැප්ම දෙකක් පමණ දිග මර්සි ටනල් එක ටිකක් පරීක්ෂාකාරීව බලන මෙන් මා ඉල්ලා සිටිනවා. මෙම විශාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

ගංගාව යටින් දමා තිබෙන මෙම පාර ඒ තරම් පුදුම, විශ්මය ඵළවන කාර්‍යයක් නොවන බව තමුන්නාන්සේට එවිට පෙනී යාවි. රත්මලානේද එවැනි වැඩ පිළිවෙළක යෙදුවොත් විශාල මුදලක් ඉතිරි වනවා පමණක් නොව අපේ රටේ සිටින ඉංජිනේරුවරුන් සහ කාර්මිකයන්ද අනෙක් අවශ්‍ය කටයුතුවල යොදවන්නට පුළුවන් වේවි. ඇමෙරිකන් කොම්පැනි වලින් මවා පාන විශාල ව්‍යාපාර ගැන ඒ තරම් රැවටෙන්නෙ නැතිව මේ ගැන කල්පනා කරන ලෙස මම ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, එක ඇමති අංශයකට භාර විය යුතු වැඩ එක එක ඇමති අංශවලට බෙදී තිබීම ගැන ගරු මන්ත්‍රීවරු කීප දෙනෙක් සඳහන් කළා. කාල වේලා නැති නිසා මම තමුන්නාන්සේට එක ප්‍රශ්නයක් ගැන මතක් කරන්න බලා පොරොත්තු වෙනවා. හෝමාගම වානේ කර්මාන්ත ශාලාව ගැන අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) මතක් කළා.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
ඔරුවල.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
හෝමාගම සිට නොම්මර කීයක් දුරද?

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
නොම්මර 4 ක් විතර ඇති.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
හෝමගම ගඟ අයිනේ.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
හෝමගම ගඟක් නැහැ.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
හෝමාගම, කැලණි ගඟ.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
කැලණි ගඟ එහෙ නොවෙයි.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
නොම්මර කීයක් තියෙනවාද?

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
නොම්මර 6 ක් 7 ක් තියෙනවා. ගංගාවල් තියෙන දිහාවල් දැනගෙන කථා කරන්න ඕනෑ. ගිං ගඟ, නිල්වලා ගඟ නම් දන්නවා.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
කොළඹ වරායේ සිට වානේ සෑදීමට අමු ද්‍රව්‍ය කැලණි ගඟ දිගේ ගෙන යෑමට කැලණි ගඟ ගැඹුරු කර හදා ගත හැකි බව මේ වානේ කර්මාන්ත ශාලාව පිහිටුවන තැන ගැන තීරණය කිරීමට කලින් කල්පනා කරන්ට තිබුණා. ජලධාවනය සම්බන්ධයෙන් වග කියන්න අපේ ආණ්ඩුවේ කිසිම ඇමතිවරයෙක් නැහැ. ඒ නිසා ධාවනය සම්බන්ධයෙන් ගඟ පාවිච්චි කිරීමට කිසි වැඩ පිළිවෙළක් යෙදෙන්නේ නැහැ.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
ඔරුවල යකඩ කර්මාන්ත ශාලාව හැදීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ, එතැන සුදුසුය කියා විශෙෂඥයන් කියනවා නම්. මම විශෙෂඥයෙක් නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

මා කියන්නේ ඒ කර්මාන්ත ශාලාව තව නොම්මර 4 ක් 5 ක් ගඟ ඉවුර ළඟට ගන්න පුළුවන්කම තිබෙනවා නම්——

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
ගඟ ඉවුරටම ගන්න පුළුවන්.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

එසේ නොගන්න හේතුව ජලධාවනය කියා ක්‍රමයක් තිබෙන බව ලංකාව නොපිළිගැනීමයි. අද බොහොම රටවල් නියම කාර්මික දියුණුවක් ඇති කරන්නේ ජලධාවනයේ ආධාරයෙන්. මේ සම්බන්ධයෙන් හොඳ නිදර්ශනයක් වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ගැන කථා කරන විට මහවැලි ගඟ යෝජනා ක්‍රමය යටතේ පැහැදිලි කිරීමට මම බලාපොරොත්තු වෙනවා. මේ අමාත්‍යාංශයටත් බල පාන ප්‍රශ්නයක් නිසයි මා කියන්නේ. ලෝකයේ තිබෙන විශාලම වරාය වලින් එකක් ත්‍රිකුණාමලයයි. ලංකාවේ තිබෙන විශාලම ගඟ ගලා බසින්නේ ත්‍රිකුණාමලයටයි. ත්‍රිකුණාමලයේ සිට මිනිපේ දක්වා නොම්මර 70 ක් 80 ක් පමණ විශාල ප්‍රදේශයක් ජලධාවනය යොදවා දියුණු කරන්න පුළුවන්. ඒ ජලධාවනයෙන් ප්‍රයෝජන ගෙන ගඟ දිගේ බඩු ගෙන ගොස් විශාල කර්මාන්ත ශාලා ඇති කර ඒ ප්‍රදේශය සංවර්ධනය කරන්න පුළුවන්. කර්මාන්ත ශාලාවේ සිට ජලධාවනය මාර්ගයෙන් බඩු ගෙන යෑමට පුළුවන් වන විට අඩු වියදමින් කටයුතු කරන්න පුළුවන් තත්ත්වයක් තිබීම සම්බන්ධව අද වන තෙක් කල්පනා කරලාවත් නැහැ. මහවැලි ගඟේ ඉස ගසා දැමීමට වතුර ටික හරවන්න නොම්මර 120 ක ඇළක් කපන්නයි, යෝජනා කරන්නේ.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඒ ගැන කථා කරන්න ඕනෑ. මේ ශීර්ෂය ගැනම කථා කරන්න.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

ගරු සභාපතිතුමනි, මා අහන්නේ ජලධාවනය සම්බන්ධ අයිතිකාරයා මේ ඇමතිවරයා නොවෙයි නම් කවිද කියායි. ධාවනය සම්බන්ධ ඇමතිවරයා අද වන තෙක් ජලධාවනය සම්බන්ධව හිත යොමු කර නැහැ. ඒ නිසයි, මා කියන්නේ. ආණ්ඩුව ඒ ගැන කල්පනා කරන්නට ඕනෑ. එසේ කල්පනා කළා නම් ජලධාවනය පාවිච්චි කර කොළඹ වරායේ සිට මේ පැක්ටේරිය ළඟටම, අඩු වියදමින් යකඩ සෑදීම සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ගෙන්වා ගන්න පුළුවන් වෙනවා. අලුතෙන් දුම්රිය පාරක් හදන්න ඕනෑ නැහැ. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඇමති අංශයෙන් ඉටු විය යුතු යුතුකම් ඉටු වී නැහැ. මම මේ ගැන ගරු ඇමතිතුමාට දොස් කියන්නේ නැහැ.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

ඒ කරුණු ගැන කෘෂිකර්ම ඇමතිවරයාගේ ශීර්ෂයේදී කථා කරන්න පුළුවනි.

ගරු පී. බී. ජී. කලුගල්ල (ප්‍රවාහන හා රජයේ වැඩ පිළිබඳ ඇමති)
(கௌரவ பீ. பி. ஜீ. கலுகல்ல—போக்குவரத்து, கட்டுவேலை அமைச்சர்)
(The Hon. P. B. G. Kalugalla—Minister of Transport and Works)

ඔව්, මට අයිති නැහැ.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

මේවාත් අයිති කරගන්න ඕනෑ. ධාවනය සම්බන්ධ සියලුම ප්‍රශ්න ඔය ඇමතිතුමා අතේ‍ය තිබිය යුත්තේ. කෘෂිකර්ම ඇමතිවරයාගේ ශීර්ෂයේදී ජල ධාවනය ගැන කථා කරන්නට යන විට කියාවි, එය අයිති වන්නේ "ට්‍රාන්ස්පෝර්ට් ඇන්ඩ් වර්ක්ස්" එකටයි කියා. අන්තිමට බලන කොට මේකට වගකියන්න කෙනෙක් නැහැ. එම නිසා මේ ජල ධාවනයත් තමුන්නාන්සේම අයිති කරගන්න ඕනෑ.

මීට වඩා මම ඒ ප්‍රශ්නය ගැන කථා කරන්න යන්නේ නැහැ. ජලධාවනයත්, දුම්රිය ධාවනය සහ ලොරි ධාවනය වාගේම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

ඒ සම්බන්ධ කටයුතුවලට බලපාන වැඩ පිළිවෙළක් බව කල්පනා කරන්නය කියා මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට තවත් කාරණයක් තිබෙනවා. මෙය පොදු කාරණාවක් නොවෙයි. මාතර සිට සාමාන්‍යයෙන් කොළඹට ඒම සඳහා උදේට නම් පහසු ගමනාගමන ක්‍රමයක් තිබෙනවා, "රුහුණු කුමාරි" යනුවෙන් ඉක්මනින් ගමන් කරන දුම්රියක් තිබෙනවා. නමුත් කොළඹ සිට මාතරට යන්නට පැය 6ක් ගත වෙනවා. මාතර සිට කොළඹට එන්න අර ඉක්මනින් ගමන් කරන දුම්රියට ගත වන්නේ පැය 3යි. එම නිසා උදේ කාලයටත් කොළඹ සිට මාතර බලා යෑමට ඉක්මනින් ගමන් කරන දුම්රියක් යෙදවීම ඉතාමත් සුදුසු කටයුත්තක්ය කියා මම අදහස් කරනවා. යම් යම් වැඩ සඳහා කොළඹට පැමිණෙන අයට සවසට මාතර බලා යෑමට තිබෙනවා වාගේම යම් යම් වැඩ සඳහා උදේ කොළඹ සිට මාතරට යෑමට වුවමනා කරන උදවියත් සිටිනවා. එම නිසා ඒ විධියේ ඉක්මන් ගමනාගමන පහසුකමක් සැලැස්සුවොත් එය ඉතාමත් ප්‍රයෝජනවත් වෙනවා ඇති. එවැනි ගමන් පහසුවක් යොදන හැටියට මම ඇමතිතුමා ගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) මතක් කළා වාගේ— අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) මේ ගැන හොඳට දන්නවා—නිල්වලා ගඟේ අවුරුදු 15ක සිට ලී පාලමක් තිබෙනවා. මෙම අවුරුදු 15 තුළ ඒ ලී පාලම නොයෙකුත් අවස්ථාවලදී අලුත්වැඩියා කිරීම පිණිස රුපියල් ලක්ෂ එකහමාරකට වඩා වියදම් වී තිබෙනවා. සථිර සැලැස්මක් ඒ කාලය ඇතුළත පිළියෙල කොට ක්‍රියාවේ යෙදෙව්වා නම් මේ ලී පාලම අලුත්වැඩියා කිරීමට වියදම් වූ ලක්ෂ එකහමාරක මුදල ඉතුරු කර ගන්න තිබුණා. මට මතක ඇති කාලය ඇතුළත එය හතරවෙනි වතාවටත් අලුත් වැඩියා කළ නමුත් දැන් එය නැවත කඩා වැටෙන තත්ත්වයට පත් වී තිබෙනවා. එම නිසා මෙම පාලම කඩා වැටෙන්නට මත් තෙන්, ගරු ඇමතිතුමා එය සාදා දීමට පොරොන්දු වීම ගැන මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ලද්දුවට ගඟ හරහා සථිර පාලමක් සාදා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)

සභාපතිතුමනි, ඉතාමත් වැදගත් කරුණු දෙකක් මතක් කරන්නට තිබෙනවා. මැද කොළඹ දෙවන මන්ත්‍රීතුමා (පී. ජී. බී. කෙනමන් මයා.) ප්‍රවාහන ඇමතිතුමාට විරුද්ධව චෝදනා දෙකක් ඉදිරිපත් කළා. ඒ චෝදනා දෙකෙන් එකකට පිළිතුරු දී තිබෙනවා. අනික් චෝදනාව නම් එංගලන්තයෙන් දුන් රුපියල් කෝටි 4½ක ණයක් අයුතු පිළිවෙළට—වැරදි විධියට—වියදම් කිරීමට වැඩ කටයුතු සලස්වාගත යන බවයි. මෙම කාරණාව ගැන සභාපතිතුමනි, සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කිරීමට දැන් වෙලාවක් නැහැ. නමුත් කරුණු සම්පූර්ණයෙන් සෝදිසි කර බලන කෙනකු, ප්‍රවාහණ ඇමතිතුමා නිවැරදි කාරයෙක් හැටියට තීන්දු කරනවා පමණක් නොව ඒ ඇමතිතුමා හරි අවංක තීන්දුවක් ගත්තාය කියා පිළිගන්නවා ඇති. 1959 ජනවාරි මාසයේ සහ මාර්තු මාසයේදී ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති කැබිනට් මණ්ඩලය මගින් එංගලන්තයෙන් දෙන්නට ගිය ණය ගැන සම්පූර්ණයෙන් සාකච්ඡා කර බලා ඒ ණය ලබා ගැනීමට තීන්දු කළා. එක වරක් පමණක් නොව දෙවරක්ම මේ ගැන කියා සිටියා. ඊට පසුව එවකට සිටි තැපැල් ඇමතිවරයා—මරික්කාර් මහතා—මේ පිළිබඳව තව දුරටත් කරුණු සෝදිසි කර බැලිය යුතු බව ප්‍රකාශ කරමින් ජපානයට යන්න කල්පනා කළ බව තමුන්නාන්සේට මතක ඇති. නමුත් මරික්කාර් මහතා ජපන් රටට යෑමට අදහස් කළ ගමන අගමැතිතුමා නැවැත්තුවේ, ඉතාමත්ම හොඳ ක්‍රමයක් ඉදිරිපත් කර තිබෙන හෙයින් තව දුරටත් ලෝකය වටේ යෑමේ අවශ්‍යතාවක් නැති නිසයි. ඉදිරිපත් කර ඇති වැඩ පිළිවෙල පිළිගෙන ඉක්මනට ක්‍රියාත්මක කරන ලෙස බණ්ඩාරනායක මහතා මරික්කාර් මහතාට තීන්දුවක් දුන්නා. මට භාණ්ඩාගාරයේ ලියකියවිලි ලබා ගන්න බැහැ; නමුත් මීට අදාළ ලියකියවිලි බැලුවහොත්, 1959 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කිප විටක්ම මේ කාරණය ගැන බණ්ඩාරනායක මහතා මරික්කාර් මහතාට බල කළ බව පෙනී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යනවා ඇති. දැන් සිටින ඇමතිවරයාට ඒ ලියකියවිලි බලන්නට ලැබුණු බවට සැකයක් නැහැ. යම්කිසි විධියකින් නැසී ගිය බණ්ඩාරනායක අගමැතිතුමා වැරදි තීන්දුවක් දුන් බවට වැටහීමක් තුබුණා නම් එය ප්‍රතික්ෂේප කිරීමට මෙම ඇමතිතුමාට පුළුවන්කම තිබෙනවා. නමුත් මෙය පිළිගත යුතු බවට කරුණු තිබෙන නිසා ගරු ඇමතිතුමා මෙය පිළිගෙන ඇති බව අපේ විශ්වාසයයි.

අ. භා. 7.15

තමුන්නාන්සේ තම දෙපාර්තමේන්තුවේ විශේෂඥයන්ගේ අදහස් විශ්වාස කළා. එංගලන්තයෙන් ඉදිරිපත් කරන ලද ණය දීමේ ක්‍රමයත් ඒ අනුව ක්‍රියා කළ යුතු ආකාරයත් ගැන සම්පූර්ණයෙන් පරීක්ෂා කර බලා වාර්තා කළ විශේෂඥයන් ගැන ඇමතිවරයා විශ්වාසය තැබුවා. මේක වැදගත් ගැඹුරු ප්‍රශ්නයක්. අප වැනි සාමාන්‍ය මිනිසුන්ට සමහර කරුණු තේරෙන්නේ නැහැ. එම නිසා තමන්ගේ දෙපාර්තමේන්තුවේ විශේෂඥයන් මෙම කාරණය ගැන පරීක්ෂා කිරීමේ කටයුතුවලට යොදවන්න සිදු වුණා. විශේෂඥයන් විසින් දැන ගන්නා ලද කරුණු මොනවාද කියා විස්තර කරන්න මට දැන් වේලාවක් නැහැ. නමුත් එංගලන්තයෙන් ඉදිරිපත් කරන ලද ණය දීමේ ක්‍රමය පිළිගන්න ලෙස එම විශෙෂඥයන් අවවාද කළ බව මතක් කරන්න කැමතියි. මේ අනුව දැන් සිටින ඇමතිවරයා බණ්ඩාරනායක අගමැතිතුමාගේ නියමය පමණක් නොව, 1959 කැබිනට් මණ්ඩලයේ තීරණය පමණක් නොව, තමාගේ දෙපාර්තමේන්තුවේ විශේෂඥයන්ගේ උපදෙස්ද සලකා බලා මෙම ණය දීමේ ක්‍රමය භාර ගන්න අදහස් කළා. එම නිසා මෙම ඇමතිතුමා මේ සම්බන්ධ කිසිම චෝදනාවකට වැරදිකරුවෙක් නොවෙයි. 1957 දී දෙන බව කී රුපියල් භාර කෝටියේ ණය මුදල පිළිගැනීමටත් ඒ අනුව වැඩ කටයුතු පටන් ගැනීමටත් වර්තමාන ගරු ඇමතිවරයා වහාම කටයුතු යෙදීම ගැන අප සියලු දෙනාම එතුමාට ප්‍රශංසා කරන්න ඕනෑ. ආරම්භ කරන ලද මෙම වැඩ කටයුතු සාර්ථක වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

මේ අතර කිව යුතු කාරණයක් තිබෙනවා. පිළිගෙන ඇති සංවර්ධන ක්‍රමය ගැන මැද කොළඹ ගරු දෙවැනි මන්ත්‍රීතුමා (කේනමන් මයා.) වැරදි අදහස් ප්‍රකාශ කළා. පිළිගෙන තිබෙන්නේ ඉතා මත් අසතුටුදායක යල් පැනපු ක්‍රමයක් බවයි, එතුමා කීවේ. එය ඇත්තක් නොවෙයි. පිළිගෙන තිබෙන්නේ නවීන වූත් හොඳ වූත් ක්‍රමයක්. ලෝකයේ එක එක රටවල එක එක විධියේ ටෙලිපෝන් ක්‍රම තිබෙන්න පුළුවනි. එංගලන්තයේ තිබෙන ටෙලිෆෝන් ක්‍රමය යල් පැනපු එපා වුණු එකක් නොවෙයි.

එම ක්‍රමය නවීන එමෙන්ම බොහෝ කාලයක් තබා ගත හැකි ක්‍රමයක් බව ඒ සියලුම වාර්තාවලින් අපට හැඟී යනවා. මේ පිළිබඳව එක් සුළු කාරණයක් මට මතක් කරන්න තිබෙනවා. වටිනා ටෙලිෆෝන් ක්‍රමයක් මුදල් නැතිව සකස් කරන්නට පුළුවන් කමක් නැහැ. "ග්‍රේටර් කලම්බු" ක්‍රමය පමණක් නොව, කොළඹ සහ අවට ප්‍රදේශවල ඇති කරන්නට බලාපොරොත්තු වන මේ ක්‍රමයේ දෙවැනි කොටසක් හැටියට ලංකාවේ අනිකුත් ප්‍රදේශවලටත් ඉතා ඉක්මනින් කථා කරන්නට පුළුවන් විධියේ ටෙලිෆෝන් ක්‍රමයක් ගැන සොයා බලා ඒ විධියේ ක්‍රමයක් ගරු ඇමතිවරයා ඇති කළොත්, වෙන කිසිම වැඩක් නොකළත් එසින්ම මේ ඇමතිවරයාගේ නම රන් අකුරින් ලියවෙනවා ඇති. ගාල්ලේ සිට කොළඹට ටෙලිෆෝන් කෝල් එකක් ගන්න පැය 9 ක් විතර ගත වන බව අප හැමදාම කියනවා. හැම අවුරුද්දේම වගේ අපි කියනවා, ඉක්මනින් කථා කළ හැකි විධියට සාදා දෙන්න කියා. නමුත් කෙරෙන්නේ නැහැ. නවීන ක්‍රමයක් අනුව ක්‍රමවත් ටෙලිෆෝන් ක්‍රමයක් ඇති කර දෙන ලෙස ගරු ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදීත් මා ඉල්ලා සිටිනවා. අනික් මන්ත්‍රීවරුන්ටත් කථා කිරීමට තව වැඩි කාලයක් නැති නිසා තවත් එක වැදගත් කරුණක් ගැන පමණක් ගරු ඇමතිතුමාට මතක් කරන්නට මා අදහස් කරනවා.

සභාපතිතුමනි, අපේ රටට පාරවල් පිළිබඳ නියම ක්‍රියා මාර්ගයක් හෙවත් "රෝඩ් පොලිසි" එකක් වුවමනා කරනවා. ගරු ඇමතිතුමා විසින් මේ අවුරුද්ද සඳහා වැය කරන්න රුපියල් කෝටි 9 ක මුදලක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

වෙන් කරවා ගෙන තිබෙනවා. මීට පෙර 1959-60 රජයේ වැඩ දෙපාර්තමේන්තුවට වෙන් කර තිබුණේ රුපියල් කෝටි 4 ක් පමණයි. නමුත්, රුපියල් කෝටි හතරේ වැඩ ටිකවත් කරන්න බැරිවූ දෙපාර්තමේන්තුවකට කෝටි 9 ක වැඩ කරන්න පුළුවන්ද? බොහෝම උනන්දුවෙන් තමුන්නාන්සේ නිලධාරීන්ගේ පිටු පස සිට වැඩ කිරීමට කියා නිලධාරීන් තල්ලු කරන බව මා දන්නවා.

ඒ උනන්දුව අනුව මේ රටට අවශ්‍ය "රෝඩ් පොලිසි" එකක් තමුන්නාන්සේ ඇති කරාවි යයි මා බලාපොරොත්තු වෙනවා. නිදහස ලබාගෙන අවුරුදු 13 ක් ගත වී තිබෙන නමුත් අපට මේ දක්වා "රෝඩ් පොලිසි" එකක් නැහැ. ගම්බද ජනතාව පාවිච්චි කරන අඩි පාර උසස් තත්ත්වයක පාරක් කරන ක්‍රමයක් ගැන අවබෝධයක් ඒ ගම්බද ජනතාවට ලබා දී නැහැ. අපට අවශ්‍ය දේවල් රාශියක් තිබෙනවා. පාඨශාලා ඕනෑ, දිස්පැන්සරි ඕනෑ, ගෙවල් දොරවල් ඕනෑ, ඉඩ කඩම් ඕනෑ, ඒ සියල්ලටම වඩා ප්‍රමුඛස්ථානයක් ගන්නවා, අපට පාරවල් ඕනෑ කියන එක. එම නිසා මුලින්ම පාරවල් දෙන්න. ඊට පසු අනික් සියළු දේම නියම විධියට හැඩගස්වා ගන්න පුළුවනි. තමුන්නාන්සේගේ කාලයේදී නියම "රෝඩ් පොලිසි" එකක් ආරම්භ කරනවා ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. මෙම වෙන් කර තිබෙන රුපියල් කෝටි 9 න් සියයට 75ක් වත් ලබන මාස 12 ඇතුළතදී ගරු ඇමතිතුමා වියදම් කර වැඩ කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් සහ තමුන්නාන්සේට ස්තුති කරමින් මගේ කථාව අවසාන කරනවා.

කේ. එච්. ජී. ඇල්බට් මයා. (බෙන්තර-ඇල්පිටිය)

(திரு. கே. எச். ஜீ. அல்பேட்—பெந்தர-எல்பிட்டிய)

(Mr. K. H. G. Albert—Bentara-Elpitiya)

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී විශෙෂයෙන් මතක් කළ යුතුව තිබෙන්නේ දීර්ඝ කාලයක සිට ජනවාස ප්‍රදේශයක්ව පවතින ගාලු දිස්ත්‍රික්කය අද සාමාන්‍ය යෙන් නොසලකා හැරි ප්‍රදේශයක් බවට පත් වී තිබෙන බවයි. පාරවල් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී ඒ ප්‍රදේශය නොසලකා හැර තිබෙන බව පෙනී යනවා. මෙම පාරවල් ගැන නොසලකා හැරීම නිසා පසුගිය අවුරුද්ද දෙක පමණ කාලය තුළ සාදන ලද පාරවල් සියල්ලකම පාහේ රථ වාහන ගමන් කිරීමට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඒ වගේම කාණු ආදිය ශුද්ධ නොකිරීම නිසා සම්පූර්ණයෙන්ම පාරවල් මඩ වගුරු බවට පත් වී තිබෙන අතර සියළුම පාලම් දිරාපත් වී ගොස් තිබෙනවා. විශෙෂයෙන්ම මා කියන්නේ මගේ කොට්ඨාශයේ බෝක්කු අබලන් තත්ත්වයකට පත් වී තිබෙන නිසා ඒ පළාතේ පාරවල් බොහොමයක රථවාහන ගමන් කරවීමට නොහැකි තත්ත්වයක් ඇති වී තිබෙන බවයි. මා නියෝජනය කර සිටින ප්‍රදේශය වැඩි ජනගහනයක් ඇති ඉතා විශාල ප්‍රදේශයක්. එම ප්‍රදේශයේ ජනගහනය හතළිස් දෙදහසක් පමණ වෙනවා. නමුත් එම කොට්ඨාශයේ ඇති පාරවල් ඉතා දුර්වලයි. කෙසේ වෙතත් ගරු ඇමතිතුමා ඉතා උද්‍යොගයෙන් කටයුතු කරන බව අපි දන්නවා. පසුගිය කාලයේ ගරු ඇමතිතුමා මන්ත්‍රීවරුන් කැඳවා ඒ ඒ අයට තිබෙන දුෂ්කරතාවන් ගැන විමසා සිටි අවස්ථාවේදී මාද මට තිබෙන දුෂ්කරතාවන් ගැන කරුණු ඉදිරිපත් කර තිබෙනවා. මා ඒ අවස්ථාවේදී විශෙෂයෙන් කියා සිටියා, සම්පූර්ණයෙන්ම වාගේ පොදු ජන සමාජයෙන් වෙන් වුණ කොටසක් මගේ ප්‍රදේශයේ තිබෙන බව. එම ප්‍රදේශයේ ජනයාගේ ප්‍රයෝජනය පිණිස පාරක් දමන ලෙස මා ඉල්ලා සිටියා. එවේලේ ගරු ඇමතිතුමා ඒ ගැන වහාම රපෝර්තුවක් එවන ලෙස ඉංජිනේරු අංශයට දන්වා සිටියා. දැන් එසේ නියෝග කොට මාස ගණනක් ගත වී ඇතත් මේ දක්වා ඒ ගැන කිසිවක් කෙරී නැහැ. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවය නිසා එසේ සිදු වෙනවායයි මා සිතනවා. මෙවැනි තත්ත්වයක් තව දුරටත් තබාගත්තොත් කෙසේද අපේ ඉදිරි ගමන සාර්ථක වන්නේ?

මගේ කොට්ඨාශයට අවශ්‍ය පාරවල් සහ පාලම් ගැන මා කීප විටක්ම කියා තිබෙනවා. විශාල වශයෙන් රථවාහන ගමන් කරන එම ප්‍රදේශයේ වැඩි වශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇත්තේ ලී පාලම් බව කියන්න ඕනෑ. මගේ කොට්ඨාශයට අයත් ප්‍රදේශ පිහිටා තිබෙන්නේ ගිං ගඟටත් බෙන්තර ගඟ ටත් අතරයි. එම නිසා මගේ ප්‍රදේශයට අනිකුත් ප්‍රදේශ සමග යා වන්නට විශාල පාලම් අවශ්‍ය කරනවා. ඒවා ඉක්මනින් සෑදීම එම ප්‍රදේශයේ දියුණුවට හේතුවක් වෙනවා. නිරිත දිග මෝසම් සුළඟේ පීඩා වලට අසුවන මගේ ප්‍රදේශය නිතර නිතර වැස්සට ගොදුරුවෙනවා, එසේම ජලයෙන් ද යටවෙනවා. එම නිසා ඒ ප්‍රදේශයට ශක්තිමත් පාලම් අවශ්‍ය කරනවා. එම අඩු පාඩු සම්පූර්ණ කළහොත් විශාල ලෙස අමුද්‍රව්‍ය නිපදවන මගේ ප්‍රදේශයේ ඉම හත් දියුණුවක් ඇති වන්නට පුළුවනි.

ගරු සභාපතිතුමනි, තොටගමුවේ ශ්‍රී රාහුල හිමි නමැති ප්‍රසිද්ධ තෙරුන් වහන්සේ වාසය කළ අම්බන කියන ප්‍රදේශය පිහිටියේ මගේ කොට්ඨාශයේයි. එම ප්‍රදේශයට බසිසිකලයකින්වත් යාම දුෂ්කරයි. එම ප්‍රදේශය හරහා ප්‍රසිද්ධ පාරක් දමන්න යෝජනා කළ නමුත් තවමත් ඉටුවී නැහැ. අධික ජනගහනයක් සිටින එම ප්‍රදේශයට පාරක් දැමීම සඳහා මග කපන්න සූදානම් කර ඇතත්, තවම පාර වැටී නැහැ. එම මාර්ගය වහාම සකස් කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. ඉතිහාස ගත වටිනාකමක්ද තිබෙන එම ප්‍රදේශයට පාරක් දීම සුදුසුයි.

ඊළඟට මගේ කොට්ඨාශයේ තිබෙන වතු පාරවල් ගැන යමක් කියන්න කැමතියි. ඒ ප්‍රදේශයේ වතු අයිතිකරුවන් වාසය කරන්නේ ප්‍රදේශ රජවරුන් වාගේයි. ඇල්පිටියේ අලිකැහේන කියා වත්තක් තිබෙනවා. මේ වත්තේ එක කොටසක, මෙතෙක් කල් පළාතේ ජනතාව ගමන් කළ පාර තේ වගාවක් දමා බලහත්කාර යෙන්ම එම වත්ත අයිතිකාරයා විසා දමා තිබෙනවා. මේ නිසා එක හැතැප්මක දුර ප්‍රමාණය තිබුණු ගමන දැන් හැතැප්ම 5 කින් පමණ කරන්න සිදු වී තිබෙනවා. මේ අන්දමට මහජනයා පාවිච්චි කරන මාර්ග විසා දමනවා. එමනිසා මේ පාර පමණක් නොවෙයි, සෑම පාරක්ම මහජනතාවගේ ප්‍රයෝජනය පිණිස ගරු ඇමතිතුමාගේ බල තල යොදා හෝ ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

අ. භා. 7.30

ගරු සභාපතිතුමනි, ගිය වර්ෂය තුළදී මගේ ප්‍රදේශයට විශාල වශයෙන් තැපැල් සහ විදුලි පණිවුඩ පහසුකම් ලබා දීම ගැන මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත් මෙයට පෙර සිටි ඇමතිවරයකු එක පළාතට තැපැල් කන්තෝරු තුන බැගින් ලබා දී තිබෙනවා. එසේ කළේ කුමන කාරණයක් නිසාදැයි මම දන්නේ නැහැ. එහෙත් යම් යම් ස්ථානවල අලුතින් තැපැල් කන්තෝරු විවෘත කිරීමේදී නොයෙකුත් අන්දමේ දුෂණ ක්‍රියා සිදු වූ බව අපට අසන්ට ලැබුණා. එවැනි දූෂණ ක්‍රියා ඇති වන්න ඉඩ නොදී අවශ්‍ය තැන්වලට පමණක් තැපැල් කාර්යාල සපයන්න තමුන්නාන්සේ වැඩ කටයුතු සලස්වනවා නම් අපේ මුදල් හුඟක් දුරට ඉතිරි කරගන්න පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මගේ කොට්ඨාශය තුළ ඉතාමත් අවශ්‍යයයි හැඟෙන ස්ථානවලට තැපැල් කාර්යාල පිහිටුවීමට ගරු ඇමතිතුමා කට යුතු කරනවා ඇතැයි මම විශ්වාස කරනවා.

ඊළඟට එක්තරා වැදගත් කාරණයක් තමුන්නාන්සේට මතක් කර දෙන්න කැමතියි. මේ රටේ සෑම පළාතකම වාගේ ගුවන් තොටුපළවල් පිහිටුවන්නය කියා බොහෝ දෙනෙක් ඉල්ලා සිටියා. සමහර ගරු මන්ත්‍රීන් කීවා අම්පාරේ වාගේ තවත් ස්ථානවලට ගුවන් තොටුපළවල් වුවමනා කරනවාය කියා. නුමුත් මේ රටේ ප්‍රසිද්ධ ගුවන් තොටුපළක්ව තිබුණු කොග්ගල ගැන නොසලකා හැර තිබෙන්නේ කුමන කාරණයක් නිසාදැයි මම දැන ගන්න සතුටුයි. විශාල ජලාශයක් අද්දර පිහිටා තිබෙන මෙම තොටුපළ ඓතිහාසික වැදගත්කමක් උසුලනවා. බ්‍රිතාන්‍යයන් ලංකාවට පැමිණියාට පසුව ගාල්ල ලංකාවේ අගනුවරක් වශයෙන් සැලකුවේ එය පිහිටා ඇති ස්ථානය පිළිබඳ වැදගත්කම නිසයි. විශේෂයෙන් මෙම ගුවන් තොටුපළ නිසා ගාලු නගරය ඉතාමත් වැදගත් ස්ථානයක් හැටියට සලකන්න පුළුවනි. ඒ වාගේම දකුණු පළාතේ ඇති ගාලු වරාය ගැනද ගුවන් තොටුපළ වාගේම සැලකිල්ලක් දක්වා නැහැ. එම නිසා විශාල කීර්තියක් ඇති දක්ෂ කාර්මිකයන් ඇති රුහුණු ප්‍රදේශය දියුණු කළ හැකි වන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එව්. ජී. ඇල්බට් මයා.]

ගාලු වරාය හා මෙම ගුවන් තොටුපළ ප්‍රකෘතිමත් කිරීමෙන් බව තමුන්නාන්සේට කියන්න කැමතියි. මේ රටේ ඇති ස්වාභාවික ගුවන් තොටුපළක් වන කොග්ගල ගුවන් තොටුපළ හා ගාලු වරාය නැවත වරක් ප්‍රකෘතිමත් කිරීමෙන් ඒ ප්‍රදේශයේ ජනතාවට විශාල ආලෝකයක්, දියුණුවක්, ලබා දෙන්න පුළුවන් වේයයි මම විශ්වාස කරනවා. මා සඳහන් කළ මේ කාරණාවලට ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන සේ ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

අමරනන්ද රත්නායක මයා. (පස්සර)
(திரு. அமரானந்த ரத்னாயக்க—பஸ்ஸறை)
(Mr. Amarananda Ratnayake—Passara)

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මා නැගී සිටින්නේ විශේෂයෙන්ම මගේ කොට්ඨාශය සම්බන්ධයෙන් වැදගත් කාරණා කීපයක් ගැන පමණක් සඳහන් කිරීමටයි. මේ අවස්ථාවේදී මා කියා සිටින්න කැමතියි, මුළු ලංකාවටම ප්‍රයෝජනවත් වන පාරවල් සම්බන්ධ යෝජනාවක් අපේ ගරු ඇමතිතුමා බදුල්ලේ කච්චේරියට පැමිණි අවස්ථාවේදී එතුමාට මා මතක් කර සිටි බව. සමහරවිට මා ඉදිරිපත් කළ ඒ යෝජනාව එතුමා පිළි නොගන්න ඇති. සමහරවිට අපි ගොඩේ පැත්තේ මන්ත්‍රීන් නිසා ඒ අදහස් පිළි නොගන්නවා ඇතැයි මට සැකයක් තිබෙනවා.

මේ රටේ පාරවල් සම්බන්ධයෙන් වැඩ කෙරෙන ආකාරය දෙස බලන විට මගේ යෝජනාව ක්‍රියාත්මක කළහොත් පාරවල් සම්බන්ධ වැඩ මීට වඩා හොඳින් කර ගෙන යාමට පුළුවන් බව මට පෙනී යනවා. මෙතෙක් කල් පාරවල් සම්බන්ධයෙන් ගෙන ගිය වැඩ පිළිවෙළ යහපත් යයි අපට පිළිගන්න බැහැ. මෙපමණ කල් ලංකාවේ පාරවල් සම්බන්ධයෙන් වියදම් කොට ඇති මුදල නියම ආකාරයෙන් වියදම් කළේ නම් ලංකාවේ ඇති සියලුම පාරවල වැඩ සම්පූර්ණ කරන්නට තිබුණ බව අපේ හැඟීමයි. පාරවල් සෑදීම සම්බන්ධයෙන් මීට කලින් තිබුණු වැඩ පිළිවෙළ අනුව වෙන් කරන ලද මුදල් වැඩි වශයෙන්ම ගියේ ඒ ඒ අයගේ සාක්කුවලටයි. ඒ පිළිවෙළටම මුදල් වෙන් කොට ඔවුන් ලවා වැඩකරවා ගන්නට ගොස් ඔවුන් විවේචනය කිරීමෙන් අපට සහනයක් ලැබෙන්නේ නැහැ. ඒ මුදලෙන් නියම ප්‍රයෝජන ගන්නට ලැබෙන්නේත් නැහැ. එම නිසා පාරවල් නියම අන්දමින් සකස් කිරීමට ක්‍රමයක් ඇති කරන්නට ඕනෑ.

මගේ යෝජනාව තවමත් ක්‍රියාත්මක කළ හැකි බව මම නැවතත් මතක් කර සිටිනවා. රජයෙන් පාරවල් සඳහා විශාල මුදලක් වැය කරන නිසා ඒ පිළිබඳව වෙනම දෙපාර්තමේන්තුවක් තිබිය යුතුයි. දැනට ගම්කාර්ය සභා මගින් පාරවල් හදනවා. ග්‍රාම සංවර්ධන සමිති මගින් පාරවල් හදනවා. රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් පාරවල් හදනවා. උඩරට ගැමි කොමිෂන් සභා වාර්තාව අනුව පාරවල් හදනවා. මා යෝජනා කරන අන්දමට පාරවල් සම්බන්ධයෙන් වෙනම දෙපාර්තමේන්තුවක් ඇති කළොත් මේ සියලුම ආයතනවල වැඩ ඒකාබද්ධ කොට, ඒ ඒ ප්‍රදේශයන්ට අවශ්‍ය පාරවල් මේවායයි සැලැස්මක් පිළියෙළ කොට, ඒවා නියම ක්‍රමයක් අනුව හදන්නට පුළුවන් වෙනවා. කුමන ආයතනයකින් පාරවල් හැදුවත් කවදා හෝ ඒවා රජයේ වැඩ දෙපාර්තමේන්තුවට පැවරෙනවා. ඒ ඒ කොට්ඨාශවල තිබෙන ගම්කාර්ය සභා, ග්‍රාම සංවර්ධන සමිති ආදිය මේ මේ පාරවල් මේ මේ ප්‍රදේශවලට අවශ්‍ය යයි කියා සිටිනවා. ගම්කාර්ය සභා මගින් යෝජනා ඉදිරිපත් කරමින් කියනවා, අපට වුවමනා කරන්නෙ මේ පාර නොවෙයි, අනෙක් පාරය කියා. ඒ අතර උඩරට ගැමි කොමිෂන් සභාවේ වාර්තාවෙන් නිර්දේශ කර තිබෙන්නේ වෙනත් පාරක් අවශ්‍ය බවයි. මේ තත්ත්වය දිගින් දිගටම පවත්වාගෙන යන්න ඉඩ දුන්නොත් විශාල අවහිරකම් ඇති වන්න ඉඩ තිබෙනවා. ඒ නිසා පාරවල් සම්බන්ධයෙන් කටයුතු කිරීමට විශෙෂ දෙපාර්තමේන්තුවක් තිබිය යුතුයි. ඒ ඒ ගමට අවශ්‍ය පාරවල් මේවාය යනාදි වශයෙන් කල් තබා තීරණය කරන්න එසින් පුළුවන්කම ලැබෙනවා පමණක් නොව මේ ගම අනෙක් ගම හා සම්බන්ධ කරන්න තිබෙන්නේ මේ පාරෙන්ය කියාත් කල් තබා දැන ගන්න පුළුවන් වෙනවා. ඒ ආකාරයට කල් තබා ඒ ඒ කොට්ඨාශයේ ඇති කළ යුතු පාරවල් වෙන් වෙන් වශයෙන් ලකුණු කර තැබුවොත් ග්‍රාම සංවර්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ධන සමිති මාර්ගයෙන් හෝ, ශ්‍රමදාන ව්‍යාපාරය වැනි සංවිධානවල මාර්ගයෙන් හෝ, ඉතිරි වැඩ කටයුතු සම්පූර්ණ කරන්න පුළුවන් වෙනවා. ඉදි කරන්න බලාපොරොත්තු වන පාරවල් කල් තබා දැන ගන්න ලැබුණොත් ඉන් පසු එම පාරට අයත් වන භූමියේ ගොඩනැගිලි ඉදි කරන්න හෝ වෙනත් කල් පවතින ගොවි තැන් ආදියක් අරඹන්න හෝ ඉඩ නොදී තබා ගන්නත් පුළුවන් වෙනවා. රථ වාහන ගමන් කරවියහැකි අන්දමේ පාරක් අද හෝ හෙට හෝ තව අවුරුදු දහයකින් හෝ හදන්න බලාපොරොත්තු වන්නේ මෙන්න මේ භූමිය දිගේය කියා සීමාව නියම කළොත් ඒ සීමාව තුළ කිසිවකුට ගෙදරක් හදන්න හෝ වෙනත් ස්ථිර ගොඩනැගිලි ආදියක් ඉදි කරන්න හෝ ඉඩ නොදී හැකි තාක් ඉක්මනින් පාර හැදීමේ වැඩ ග්‍රාම සංවර්ධන සමිති මගින් හෝ ශ්‍රමදාන ව්‍යාපාරය යටතේ හෝ පටන් ගත හැකියි. ගම්වාසීන් පාර සෑදීමේ කටයුත්ත ඒ ආකාරයට කරනවා නම් පාලම්, බෝක්කු ආදිය සෑදීම අපි කර දෙනවාය කියන්නත් පුළුවනි. සමහර විට ග්‍රාම සංවර්ධන සමිති එක් විධියකටත්, ගම්කාර්ය සමිති තවත් විධියකටත්, රජයේ වැඩ දෙපාර්තමේන්තුව තවත් විධියකටත් මේ වැඩ කරන්න හිතනවා වෙන්න පුළුවන්. ඒ විධියට නොයෙක් අයගේ හිතේ හැටියට වැඩ කිරීමෙන් අන් තිමේදී ඒ පාරවල් දෙස බැලුවාම රථවාහන නොවෙයි, අහස්යානාවලට යන්නවත් බැරි විධියට තිබෙන බව පෙනී යනවා ඇති. ඒ නිසා මා යෝජනා කරන්නේ රජයේ වැඩ දෙපාර්තමේන්තුව යටතේ පාරවල් සම්බන්ධයෙන් වෙනම දෙපාර්තමේන්තුවක් ඇති කළ යුතුය කියායි. එවැනි දෙපාර්තමේන්තුවක් මගින් ලංකාවේ ඒ ඒ ප්‍රදේශවල තිබිය යුතු පාරවල් කල්තබා සටහන් කර දුන්නොත් ඒ පාරවල් කවදා හෝ සකස් කළ යුතුය කියන හැඟීම ඇති කරගෙන ඒ ප්‍රදෙශවාසීන්ට තම තමන්ගේ සංවිධාන මගින් ඒවා හැදීමේ වැඩ පටන් ගත හැකියි. ඒ නිසා රජයේ වැඩ දෙපාර්තමේන්තුව යටතේ පාරවල් සෑදීම සම්බන්ධයෙන් වෙනම දෙපාර්තමේන්තුවක් ඇති කරන මෙන් නැවතත් මා ගරු ඇමතිතුමාට ආරාධනා කරනවා. රජයේ වැඩ පොර්තමේන්තුව තුළ ඇති කරනු ලබන ඒ අභිනව දෙපාර්තමේන්තුවේ කාර්යය විය යුත්තේ ඒ ඒ ප්‍රදේශයට වුවමනා කරන පාරවල් සම්බන්ධයෙන් සැලැස්මක් පිළියෙළ කර ඉන්පසු ඒවා මහජනයාට දැන ගන්න සලස්වා අවුරුදු දහයකින් හෝ ඒවා සකස් කිරීමට වැඩ පිළිවෙළක් සකස් කිරීමයි. එසේ කළොත් ඒ ඒ ප්‍රදේශයේ තිබෙන මහජන සංවිධාන වලටත් ඒ සම්බන්ධයෙන් තම තමන්ගේ වැඩ පිළිවෙළවල් සකස් කරන්නත් පුළුවන් වෙනවා ඇති.

ගාලු පාර පළල් කිරීම ගැන කල්පනාකර බලමු. මුල් කාලයේදී ඒ ගැන කල්පනා කර, යම් දවසක මේ පාර පළල් කරන්නට බලාපොරොත්තු වෙනවාය යනුවෙන් නියමයක් කර තිබුණා නම් ඒ පාරට ඇතුළත් විය යුතු කොටසේ විශාල සථිර ගොඩනැගිලි ඉදි කිරීම වළක්වා ගන්න ඉඩ තිබුණා. එවැන්නක් එදා නොකළ නිසා දැන් ඒ ගොඩනැගිලි කැඩීමට පෙර වන්දි වශයෙන් විශාල මුදලක් වැය කරන්නට අපට සිදු වී තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට මතක් කරන්න කැමතියි, අද එතුමන්ලා කරන යෝජනාව ගැන එතුමන්ලා බලයේ සිටි කාලයේදී කල්පනා කළා නම්, මේ පාර කවදා හෝ පළල් කරන්න සිදු වෙනවාය කියා හිතුවා නම්, ඒ අනුව වැඩ පිළියෙළ කර තිබුණා නම්, ගොඩනැගිලි කැඩීම වෙනුවෙන් දැන් වැය කරන ලක්ෂ සංඛ්‍යාත මුදල් ප්‍රමාණය ඉතිරි කර ගන්න තිබුණු බව කල්පනා කරන ලෙස.

රෝයි රාජපක්ෂ මයා. (හක්මණ)
(திரு. ரோய் ராஜபக்ஷ—ஹக்மணை)
(Mr. Roy Rajapakse—Hakmana)
සැලැස්මක් තියෙන්න ඕනෑ.

අමරනන්ද රත්නායක මයා.
(திரு. அமரானந்த ரத்நாயக்க)
(Mr. Amarananda Ratnayake)

ඔව්, සැලැස්මක් තියෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ ඔර්ලෝසුව දෙස බලන්නේ මා හුඟක් වේලා කථා කරනවාය කියා හිතාගෙන වෙන්න ඇති. තමුන්නාන්සේ කොච්චර ඔර්ලෝසුව දිහා බැලුවත් මට කියන්න තියෙන දේ කියලා අවසන් වී මිස මගේ කථා මා නවත්වන්නේ නැහැ. අපි කථා කරන්නෙ ඉතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරනන්ද රත්නායක මයා.]

මත් කලාතුරකිනුයි. තමුන්නාන්සේටත් හොඳට පෙනෙන්නෙ තමුන්නාන්සේගේ වයසේ ඉන්න අය පමණයි.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

කරුණාකර ඒ කියමන ඉල්ලා අස් කරගන්න.

අමරනන්ද රත්නායක මයා.
(திரு. அமரானந்த ரத்னாயக்க)
(Mr. Amarananda Ratnayake)

ඒක මම ඉල්ලා අස් කර ගන්නවා. තමුන්නාන්සේ මට සමා වෙන්න. මා කියන්න අදහස් කළ කාරණයත් ඔයින් මෙයින් මට අමතක වුණා.

අ.භා. 7.45.

මා කියමින් සිටියේ ගම්බද පාරවල් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම පිණිස ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව යටතේ විශේෂ අංශයක් ඇති කළ යුතු බවයි. දියුණු වන පාරවල් සම්බන්ධයෙන් එවැනි වැඩ පිළිවෙළක් අනුව ක්‍රියා කළා නම් ඉඩම් මිලට ගැනීම සඳහාත් කඩා දමන්නට තිබෙන ගොඩනැගිලි සඳහාත් මෙතරම් විශාල මුදලක් වියදම් කරන්නට සිදු වන්නේ නැහැ.

ගම්කායිසභා මගින් පාරවල් සාදන්න ගියාම කොන්ත්‍රාත්කරුවන්ගේ සාක්කුවලට කොතරම් මුදල් යනවාද කියා අපි කල්පනා කර බලන්න ඕනෑ. වැඩිම වුණොත් අඩි 3ක් නැත්නම් 4ක් පමණ පළල ඇති පාරවලුයි, පළාත් පාලන ආයතන මගින් පළමුවෙන් කපන්නේ. ඡන්ද දායකයන් එදිනෙදා සතුටු කිරීමේ චේතනාවෙන් මෙවැනි පාරවල් ගම්කායිසභා මගින් සාදන නමුත් මේවායේ කිසිම රථවාහනයක් ගෙන යන්නට බැහැ. පසු කලකදී ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට මෙම පාරවල් භාර දුන්නාම කලින් තිබූ කුඩා බෝක්කු කඩා දමා විශාල මුදලක් යොදවමින් අළුතින් විශාල බෝක්කු තනන්නට සිදු වෙනවා. මෙවැනි වැඩ පිළිවෙළක් ගෙන යාමේදී සිදුවන මුදල් නාස්තිය කෙතරම් විශාලද කියා සලකා බලන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

මී ළඟට රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ පිළිවෙළක් ගැන ගරු ඇමතිතුමාට දන්වන්න කැමතියි. මෙහි වැඩ කරන ඕවර්සියර් මහත්වරුන්, අර පරණ ක්‍රමයටම තවමත් සිමෙන්ති කොට්ට සහ තාර පිප්ප ගැනීම කරගෙන යන බව කන ගාටුවෙන් වුවද සඳහන් කරන්න සිද්ධ වී තිබෙනවා. එපමණක් නොවෙයි, මේ වැඩ පිළිවෙළට සහාය දෙන උදවියත් සිටිනවා. මම කලින් රජයේ නිලධාරියෙක් හැටියට වැඩ කර තිබෙන නිසා මේ අවස්ථාවේදී රජයේ නිලධාරීන් විවේචනය කිරීමට මම කැමති නැහැ. ඒ මන්ද? මෙහිදී පිළිතුරු දීමට අවස්ථාවක් ඔවුන්ට නැති නිසයි. ඒ වාගේම, හොඳ නිලධාරීන් මෙන්ම නරක නිලධාරීන්ද රජයේ සේවයේ සිටින බව අපි හොඳාකාර දන්නවා. ආණ්ඩුව ගැන විශෙෂ උනන්දුවක් දක්වා වැඩ කරන අයත් සිටිනවා. ඔවුන්ගේ කැමැත්ත අනුව වැඩ කිරීමට අපේ ඇමතිතුමාත් විශෙෂ උනන්දුවක් දක්වනවා. එම නිසා, එතුමාගේ අධිෂ්ඨානය ඉටු කර ගැනීමට විශෙෂයෙන් උනන්දු වී වැඩ කරන හැටියට මම රජයේ නිලධාරී මහත්වරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

මගේ කොට්ඨාශය සම්බන්ධවත් මේ අවස්ථාවේදී වචන දෙක තුනක් කිය යුතුව තිබෙනවා. සමහර වැඩ මින් ඉදිරියට කරගෙන යන්න පුළුවන්කමක් නැත කියා දිස්ත්‍රික්ක සම්බන්ධ කරන කොමිටියෙන් මට දැන ගන්න ලැබී තිබෙනවා. විශෙෂයෙන්ම ප්‍රමාද වී තිබෙන වැඩ දෙක තුනක් ගැන මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ. ඒ මන්ද? ඒ දෙපාර්තමේන්තුවේ නිලධාරී මහතුන් දැන් මෙහි සිටින නිසයි.

සභාපතිතුමනි, බිබිලේගම තැපැල් කාර්යාලයට තවමත් ටෙලිෆෝන් යන්ත්‍රයක් ලැබී නැති බව ගරු ඇමතිතුමාට දැනුම් දෙන්න ඕනෑ. ගරු ඇමතිතුමා වෙත ගොස් ටෙලිෆෝනයක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළ අවස්ථාවේදී එතුමා එවේලේම ඒ සම්බන්ධයෙන් නියෝගයක් කිරීම ගැන මම එතුමාට ස්තුති කරනවා. ටෙලිෆෝන් යන්ත්‍රයක් බිබිලේගම තැපැල් කාර්යාලයට සවි කරන්නය කියා නියෝග කළ නමුත්, අමාත්‍යාංශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෙක් මට දැනගන්න ලැබුණා ඒ සඳහා මුදල් නැති බව. පසුගිය වර්ෂයේ, ඉතා දුර බැහැර පළාත් වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරුන් සඳහා ටෙලිෆෝන් යන්ත්‍ර සවි කිරීමට සිදු වූ නිසා ඊට වෙන්කර තිබූ මුදල් වියදම් වුන බව අපි පිළිගන්නවා. නමුත් ඊයේ පෙරෙයිදා ග්‍රාම සංවර්ධන සමිතියක් මගින්—මගේ උපදෙස් පිට—මම තනියම වැඩ කරන්නේ නැහැ, යම් යම් සමිති මගින් යම් යම් උපක්‍රමත් යොදනවා—බිබිලේගම තැපැල් කාර්යාලයට ටෙලිෆෝන් යන්ත්‍රයක් ඉල්ලා එවූ අවස්ථාවේදීත් දැන ගන්න ලැබුණේ ඒ සඳහා මුදල් වෙන්කර නැති බවයි. මෙය ඉතාමත්ම කනගාටුවට කාරණයක්. ඇමතිතුමා මම කරුණු ඉදිරිපත් කළ දවසේම නියෝගයක් කළා, බිබිලේගමට ටෙලිෆෝනයක් දෙන්නය කියා. නමුත් ඒ සඳහා තවමත් මුදල් වෙන් නොකිරීම කනගාටුවට කාරණයක් නොවේද?

බිබිලේගම තැපැල් කාර්යාලයට ටෙලිෆෝනයක් ඉල්ලන්නේ විශෙෂ කරුණු කීපයක් උඩයි. ඒ ගමේ මාතෘ නිවාසයක් තිබෙනවා. නමුත් එහි ඇම්බියුලන්ස් රථයක් නැහැ. හදිසියේ මාතාවකට අමාරුවක් ඇති වුණොත් ඇම්බියුලන්ස් රථයක් ගෙන්වා ගැනීමට ටෙලිෆෝන් මාර්ගයෙන් දන්වන්න ක්‍රමයක් නැහැ. ඒ ස්ථානයේ ජ්‍යෙෂ්ඨ පාඨශාලාවකුත් තිබෙනවා. ඒ වාගේම එය ඉතාමත් ශීඝ්‍ර යෙන් දියුණු වේගෙන යන ප්‍රදේශයක් නමුත් හදිසි පණිවුඩයක් දීමට ක්‍රමයක් නැහැ. ඒ තැපැල් කාර්යාලයේ තත්ත්වය උසස් කර දැන් බොහෝ කාලයක් වෙනවා. එම නිසා ලබන ජනවාරි මාසයට කලින් ටෙලිෆෝන් යන්ත්‍රයක් ඒ තැපැල් කන්තෝරුවට ලබාදෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

කහතුඩුවේ තැපැල් කාර්යාලයටද ටෙලිෆෝන් මාර්ගයක් සකස් කිරීම පිණිස රුපියල් 37,000ක් වෙන් කර තිබෙනවා. එහි වැඩද ඉක්මනින් පටන් ගන්නවා ඇත කියා මම බලාපොරොත්තු වෙනවා. යම්කිසි අවස්ථාවකදී ලෙඩකුට හදිසි අමාරුවක් ඇති වුණොත් ඒ ලෙඩා ඔසවා ගෙන සැතපුම් 3-4ක් පයින් එන්න ඕනෑ. එතැන සිට ඇති වතු පාරේ නම් කාර් ගමන් කරන්න පුළුවනි. නමුත් ටෙලිෆෝනයක් නැතිකම නිසා එතැනටවත් කාර් එකක් ගෙන්වා ගැනීමට පුළුවන්කමක් නැහැ. ජනතාවගේ ඡන්දය ගැනීම පමණක් මදි. ඔවුන්ට අප දී ඇති පොරොන්දුද අප විසින් ඉටු කරන්න ඕනෑ. විශේෂයෙන්ම ඒ ස්ථාන දෙකට ටෙලිෆෝන් දෙකක් අවශ්‍යයි. බිබිලේ ගමට රුපියල් 10,000කුත් කහතුඩුවට රුපියල් 37,000කුත් වෙන්කර තිබෙන නිසා ජනවාරි මාසය අවසන් වන්න කලින් ඒ තැපැල් කාර්යාලවලට ටෙලිෆෝන් සවි කිරීම පිණිස කටයුතු කරන ලෙස මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ඊළඟට මැටිගහතැන්න උප තැපැල් කාර්යාලය සම්බන්ධවත් කරුණක් මතක් කරන්න තිබෙනවා. මේ සම්බන්ධයෙන් මම ගරු උප ඇමති තැන්පත් ටී. බී. තේන්නකෝන් මන්ත්‍රීතුමාත් ඒ ස්ථානයට එක්කර ගෙන ගොස් පෙන්නුවා. දැනට ඒ උප තැපැල් කාර්යාලය පිහිටා තිබෙන්නේ ගමේ මධ්‍යස්ථානයක නොවෙයි. ඒ සඳහා ස්ථානයක් දැනට ලෑස්ති කර තිබෙනවා. මේ දෙපාර්තමේන්තුව ඒ ස්ථානයට ඒ තැපැල් කාර්යාලය ගෙන යන්නේ නැති බව කනගාටුවෙන් මතක් කරන්න සිදු වී තිබෙනවා. මා ඉදිරිපිටදී ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ඒ තැපැල් කන්තෝරුව ඒ ස්ථානයට ඉක්මනින් ගෙන යා යුතු බවට නියෝගයක් කළා. මෙය සිදු වූයේ දැනට මාස තුනකට පමණ පෙරයි. මගේ ඇස් ඉදිරිපිට කරන ලද මෙම නියෝගය අනුව ක්‍රියා නොකළ බව දැන් පෙනී යනවා. තවමත් ඒ පිළිබඳව වැඩ සකස් කර නැහැ.

ගරු සභාපතිතුමනි, ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ලුණුගල පිහිටුවා තිබෙන රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයට ගොස් එහි අපතේ යන වතුර පයිප්ප මගින් වෙනත් ටැන්කියකට ලබා ගැනීමට අවසර දෙන ලෙස ලිපියක් සකස් කොට එයට තම අත්සන යොදා මා ඉදිරිපිටම එම කාර්යාලයට භාර දුන්නා. ලුණුගල පළාත්පාලන ආයතනයට මේ සඳහා අවසර දීම පමණයි, දෙපාර්තමේන්තුවට කරන්න තිබුණේ; නමුත් තවමත් ඉන් වැඩක් වී නැහැ. මේ අනුව පෙනී යන්නේ අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරනන්ද රත්නායක මයා.]

ගරු ඇමතිවරුන් කොපමණ වැඩ කළත්, කොපමණ නියෝග දුන්නත්, ඒ අනුව වැඩ කිරීමට නිලධාරීන් ලෑස්ති නැති බවයි. ඊට නිදර්ශන වශයෙන් මගේ ඇස් ඉදිරිපිට සිදු වූ ඉහත සඳහන් කරුණු දෙක සඳහන් කළ හැකියි. ඇමතිවරුන්, පාර්ලිමේන්තු ලේකම්වරුන්, අපේ යෝජනා අනුව වැඩ කිරීමට ලෑස්ති වී සිටියත් නිලධාරීන් තුළ එවැනි ලෑස්තියක් නැති නිසයි මේ අන්දමට විවේචනය කරන්න සිදු වී තිබෙන්නේ.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
කරුණාකර නිශ්ශබ්ද වන්න.

කල් තැබීම

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන්, **මන්ත්‍රී මණ්ඩලයට** ප්‍රගතිය වාර්තා කරනු පිණිස **සභාපති** මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; **නැවත රැස්වීම 1961 අගෝස්තු 31 බ්‍රහස්පතින්දා.**

කල්තැබීම

මතු පළ වන යෝජනාව සභාසම්මත විය:

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු පී. ජී. බී. කළුගල්ල]

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.1 ට, 1961 අගෝස්තු 28 වන දින සභාසම්මතිය අනුව 1961 අගෝස්තු 31 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

1961 අගෝස්තු 31 වන බ්‍රහස්පතින්දා

පූ. භා. 10ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු ආර්. එස්. පැල්පොල] මූලාසනාරූඪ විය.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

මින්නේරිය, මැදවච්චිය සහ තිඹුල්කැටිය යන තැන්වල තිබෙන රජයේ ලී මෝල්වල වැඩ පිළිබඳ විස්තර

1. **ඩබ්ලිව්. දහනායක මයා.** (ගාල්ල)
(திரு. டப்ளியு. தகனயக்க—காலி)
(Mr. W. Dahanayake—Galle)

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය:
(අ) මින්නේරිය, මැදවච්චිය සහ තිඹුල් කැටිය රජයේ ලී මෝල්වල දිනපතා ලී ඉරීමේ ප්‍රමාණය කොපමණද? (ආ) එක් එක් මෝලක දිනකට දැව ඝන අඩි 400 ක් පමණ ඉරිය හැකිව තිබියදී, මේ එක් එක් මෝලක දිනකට ඉරන්නේ ඝන අඩි 75 ක පමණ සාමාන්‍ය ප්‍රමාණයක් පමණක් බව එතුමා දන්නවාද? (ඉ) මුළු වටිනාකම රුපියල් 800 ක් පමණ වන අත්කියත් ජෝඩු 4 කින් දිනකට ඝන අඩි 100 ක් පමණ දැව ඉරිය හැකි බව එතුමා දන්නවාද? (ඊ) මේ එක් එක් මෝලක ඇති උපකරණවල වටිනාකම කොපමණද?

ගරු සී. පී. ද සිල්වා (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති, සභානායක සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(கௌரவ சீ. பீ. டி. சில்வா—கமத்தொழில், காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும் சபை முதல் வரும்)
(The Hon. C. P. de Silva—Minister of Agriculture, Land, Irrigation and Power, Parliamentary Secretary to the Minister of Defence and External Affairs and Leader of the House)

(*a*) Hitherto the Saw Mills have been used to train the staff and for experimental sawing by them. The rates of daily experimental conversion on this basis at each of the Mills at Minneriya, Medawachchiya and Timbolketiya are approximately 27.5 ; 29 ; and 52.5 cu. ft. of sawn timber respectively. The Mills are not fully equipped as yet. The conveyor-belts for moving timber from one Saw Bench to another and equipment for mechanically feeding logs are still on order.

(*b*) The average output is even less than 75 cu. ft. per day as indicated in (*a*) above as the mills are yet working on an experimental basis. The output of sawn timber depends upon the sizes of the logs sawn and the cross-section of the scantlings produced. It is correct that the rated output is much higher. (*c*) The volume of timber converted by hand saws also depends on the size of the logs and the scantlings produced. When the mills are under full production after mechanical feeding equipment is installed the sawing will be much faster than hand sawing. (*d*) Rs. 297,200.

මින්නේරිය, මැදවච්චිය සහ තිඹුල්කැටිය යන තැන්වල තිබෙන ලී ඉරන මෝල්වල සිටින කාර්මික පිරිස් බලය සහ ඇබෑර්තු පිළිබඳ විස්තර

2. **ඩබ්ලිව්. දහනායක මයා.**
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය:
(අ) පහත සඳහන් ලී ඉරන මෝල්වල කාර්මික පිරිස් බලය කොපමණද?

(i) මින්නේරිය, (ii) මැදවච්චිය, (iii) තිඹුල්කැටිය. (ආ) රජයේ ගැසට් පත්‍රයේ සතර වරක්ම ප්‍රසිද්ධ කරනු ලැබූ වැටුප් පේපාමන් කළමනාකරුවන් සඳහා වූ ඇබෑර්තු 4ට කුමක් වීද? (ඉ) ඉල්ලුම්කරුවන් කී දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට භාජන කළේද? එයින් කී දෙනෙකු තෝරා ගත්තේද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

(*a*) 11 technical personnel at each mill. (*b*) The 3 posts of Foremen Managers could not be filled as no suitable applicants were available. The only Foreman Manager who was appointed had to be discontinued as he was found to have furnished incorrect information in his application for the post and was also reported to be unsuitable for training. (*c*) 19 applicants were interviewed and only 2 were selected. One applicant refused appointment.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

As the Hon. Minister has admitted that all is not well with these Mills, will he call for investigations to be made with a view to bringing the mills into some sort of working order ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

As I said earlier, the mills are not fully equipped as yet. The equipment is still on the way. Once the conveyor-belts to take the sawn timber from one saw to the other and the mechanical feeder are installed in the course of the financial year, the work will be all right. Meanwhile I will ask the engineer who installed the machinery—I believe he is from Colombo Commercial Co.—to check up and let me have a report. They are the only people who are competent to check up mills like these.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

Is he aware that, as things are, the value of the timber sawn per day is only about a third of the total wages that have to be paid for a day ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

We are still training the personnel. There is no other place in Ceylon where personnel can be trained. If we are to supply sufficient timber for the building trade, such training of personnel has to be done, and this is the only way in which an underdeveloped country like ours can do it.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

When does he hope to get the three mills working to full capacity ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

About three months after the equipment is installed fully and the men are trained.

APPROPRIATION BILL, 1961-62

කාරක සභාවෙහිදී සලකා බලන ලදි—[ප්‍රගතිය, අගෝස්තු 30.]

[කථානායකතුමා මූලාසනාරූඪ විය.]

Head 163.—Minister of Transport and Works

Vote No. 1.—Salaries and expenses of the Office of Minister of Transport and Works, Rs. 484,300

Sub-head 1.—Cadre and salaries, Rs. 295,000

ඉදිරිපත් කරන ලද සංශෝධනය [අගෝස්තු 30]—

"That the Vote be reduced by Rs. 10 in respect of Sub-head 1, item 'Minister. ." [පී. ජී. බී. කෙනමන් මයා.]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Before we continue the discussion under this Head, I wish to remind you that we agreed to finish it within a certain time limit, and we have

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

only half an hour left under this Head. I would beg of you to see that we keep to the schedule agreed on.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා. (අවිස්සාවේල්ල)
(திரு. டீ. பீ. ஆர். குணவர்தன—அவிசாவளை)
(Mr. D. P. R. Gunawardena—Avissawella)

I must point out that Government Members are not co-operating. They are wasting too much of our time. So we find it extremely difficult to keep to our undertaking. So far as we are concerned we want to abide by the schedule. We want to keep to it.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)

I am not forcing an issue.

ඒ. එච්. මාකන්-මාකර් මයා. (මඩකලපුව දෙවන මන්ත්‍රී)
(ஜனப் ஏ. எச். மாக்கன் மாக்கர்—மட்டக்களப்பு இரண்டாம் அங்கத்தவர்)
(Mr. A. H. Macan Markar—Second Batticaloa)

I would request that the Opposition be given an opportunity to say a few words more on these Votes.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

The hon. Member for Passara was on his feet.

අමරනන්ද රත්නායක මයා. (පස්සර)
(திரு. அமரானந்த ரத்நாயக்க—பஸ்ஸறை)
(Mr. Amarananda Ratnayake—Passara)

ගරු සභාපතිතුමනි,—

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

කරුණා කර කිය යුතු දේ කෙටියෙන් කියන්න.

අමරනන්ද රත්නායක මයා.
(திரு. அமரானந்த ரத்நாயக்க)
(Mr. Amarananda Ratnayake)

ඔබතුමාට අද දවස සුභ දවසක් වේවායි පතන අතර මට මේ අවස්ථාව දීම ගැන මම ඔබතුමාට ස්තුති කරනවා. මගේ කොට්ඨාශය සම්බන්ධයෙන් තවත් වචන ස්වල්පයක් කීමටයි, මා දැන් බලා පොරොත්තු වන්නේ.

ප්‍රථමයෙන්ම මා නියෝජනය කරන කොට්ඨාශයේ පාරවල් ගැන මතක් කරන්න කැමතියි. පාරවල් නැතිකම නිසා ඒ ප්‍රදේශයේ ගැමි ජනතාවට දුක්බර ජීවිත ගත කරන්න සිදු වී තිබෙනවා. දැනට මත් පාරවල් කීපයක් ගැන යෝජනා ඉදිරි පත් කර තිබෙනවා. එම යෝජනා අනුව වැඩ පටන් ගැනීමට ගරු ඇමතිතුමා දැනට මත් නියෝග කර තිබීම ගැන කෘතඥ වන අතර, එම වැඩ ඉක්මනින්ම කිරීමට විධි විධාන යොදන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ලුණුගල පල්ලෙකිරුළ හරහා මැදගමට පාරක් නැති හෙයින් ඒ ප්‍රදේශයේ සිටින ජනතාවට සිල්ලර ටිකක් ගැනීමට යෑමටත් ඉතාමත්ම අමාරුයි. රෝගියකු ආරොග්‍ය ශාලාවට ගෙන යන්න විධියක් නැහැ. සම හර විට රෝගියා ගෙන යන විට අතර මගදීම ඔහු මරණයට පත් වෙනවා. විශේෂයෙන්ම, මේ මෑතකදී පොල් වගා කිරීම පිණිස එක් කෙනෙකුට අක්කර තුන බැගින් ඒ ප්‍රදේශයේ අක්කර 250 ක් බෙදා දී තිබෙනවා. ඉඩම් සංවර්ධනය යටතේ බෙදා දෙන ලද මෙම ඉඩම්වල වැවිලි කටයුතුවල දියුණුව සඳහා මෙම පාර සදා දීම අවශ්‍යයි. මෙම පාර සදා දුනහෝත් එම වැවිලිවලට විශාල සේවයක් සිදු වෙනවා.

ඒ වගේම බදුල්ල-කෝබෝ-කහටරුප්ප-මැටිගහතැන්න පාර සදා දීමටද ආඩාර කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑ කමින් ඉල්ලා සිටිනවා. දැනට මැටි ගහතැන්නේ සිට බදුල්ලට යෑම සඳහා හැතැප්ම අටක් පයින් ගමන් කරන්න වුවමනායි. මෙම පාර යෝජනා කර දැන් බොහෝ කල් වෙනවා. එම නිසා ඉක්මනින් මෙම පාර සාදා දෙන ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලනවා. බදුල්ල පැත්තෙන් නම් දැන් වැඩ ආරම්භ කර තිබෙනවා. මට ප්‍රථම කථා කළ ගරු මන්ත්‍රීවරයකු ප්‍රකාශ කළාක් මෙන්, ට්‍රැක්ටර් වැනි මැෂින් උපයෝගි කර ගෙන වහාම මෙම පාර කපා දෙන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරනන්ද රත්නායක මයා.]

මේ සමගම බිබිලේගම-මාඋස්සාගොල්ල පාරේ වැඩද ඉක්මනින් ආරම්භ කරන ලෙස ඉල්ලා සිටිනවා. හොඳට තාර දමා මෙම පාර සාදා දුනහොත් බිබිලේ ගමට බස් රථ ධාවනයක් ඇති කිරීමට ලංගමය පොරොන්දු වී සිටිනවා.

ලුණුගල-වැදිවෙල-එලමල්පොල-මැටිගහ තැන්න පාරත් සදා දෙන ලෙස මතක් කරන්න කැමතියි.

තවත් කරුණක් කියන්ට තිබෙනවා. පස්සරට දුම්රිය "ගුඩ් ෂෙඩ්" එකක් අවශ්‍යයි. මොනරාගල එවැනි ගබඩාවක් තිබෙන නිසා පස්සරට දිය නොහැකි බව දෙපාර්තමේන්තුවෙන් කියා තිබෙනවා. මොනරාගලට ගබඩාවක් දුන්නාට පස්සරට දෙන්න බැරි ඇයි? අවශ්‍යය මොකක්ද? වතුකරයේ පිහිටි පස්සරට ගබඩාවක් ලබා දුනහොත් එයින් විශාල ආදායමක් ලබා ගන්න පුළුවන් වෙනවා ඇති. එසේ නැත්නම් පස්සර ප්‍රදේශයේ වතුවලට ගෙන යන බඩු බාහිරාදිය දුම්රියෙන් බදුල්ලට ගෙන ගොස් නැවත වෙනත් විධියට පස්සර ප්‍රදේශයට ගෙන එන්ට සිදු වෙනවා. මා නියෝජනය කරන කොට්ඨාශයට පසුගිය වර්ෂයේදී උපතැපැල් කන්තෝරු තුනක් දී තිබෙනවා. මේ අවුරුද්දේත් තවත් තුනක්වත් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. පසුගිය අවුරුදු 9 ක පමණ කාලයක් තිස්සේ ඒ ඡන්ද කොට්ඨාශය භාරව සිටි අය කිසිම උනන්දුවක් නොදැක්වූ නිසා එය ඉතාම නොදියුණු තත්ත්වයකයි, තිබෙන්නේ. එම නිසා ඒ කොට්ඨාශයේ පාරවල් ගැන විශේෂ සැලකිල්ලක් දක්වන ලෙස මම ඉල්ලා සිටිනවා.

ලංකාවට අවශ්‍ය පාරවල් සම්බන්ධව සටහනක් හදා ඒ පාරවල් ලකුණු කර දුන්නොත් අපට පුළුවන්, ගම්බද ජනතාව ගේ ශ්‍රම ශක්තියෙන් ඒ පාරවල් කප්පවන්න. එසේ කළොත් රජයට විශාල මුදලක් ඉතිරි කර ගැනීමට පුළුවන් වෙනවා. එසේ ම පාරවල් මාසිම්කර තිබුනොත් ඒ මායිම් ඇතුළත ගොඩනැගිලි සෑදීමට ඉඩ නොදී—

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

ගරු මන්ත්‍රීතුමා ඊයේ ඒ ගැන හොඳ විස්තරයක් කළා. ඒ නිසා අළුතෙන් කියන්නට තියෙන දේ බොහොම කෙටි යෙන් කියන්න.

අමරනන්ද රත්නායක මයා.
(திரு. அமரானந்த ரத்ணயக்க)
(Mr. Amarananda Ratnayake)

ගරු සභාපතිතුමනි, එසේ කිරීමෙන් රජයට විශාල මුදලක් ඉතිරි කර ගන්න පුළුවන් බව ප්‍රකාශ කරමින්, තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

පූ. භා. 10.15

සිරිල් මැතිව් මයා. (කොළොන්න)
(திரு. சிரில் மதியூ—கொலன்ன)
(Mr. Cyril Mathew—Kolonna)

There are a few matters that I wish to bring to the notice of the Hon. Minister, particularly matters pertaining to my electorate. It is a very backward electorate.

I wish to bring to his notice the state of the Bulutota-Kolonna-Embilipitiya road. There is a vote of Rs. 18,000 for the last three years but we have not seen any improvement done to that particular road. The culverts have to be widened. There is one bridge that has to be redecked and widened. I hope the Hon. Minister will be able to have that road widened this year at least. For the last three years a certain amount of money has been set apart but no work has been done.

Coming to the matter of sub-post offices, the Hon. Minister will remember that on November 1, 1960, I asked him a question regarding the Boraluwegeayine Receiving Post Office. This appears in HANSARD, Volume 41. The question was as to why the upgrading of the post office had been postponed. In replying the Hon. Minister said :

"Not only in the case of this sub-post office but also in regard to several other sub-post offices applications were called

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

for, candidates were selected and their appointments suspended. I am examining the question whether those sub-post offices should be allowed."

This appears in HANSARD, Volume 41, column 12.

You will notice, as I read, that according to the Report of the Parliamentary Bribery Commission, this very same thing was done during the regime of the notorious Mr. Marikkar.

Mr. Jayewickreme then asked a supplementary question :

"What prompts the Hon. Minister to say that when appointments are made they will be suspended ? Does he make the appointments?"

In reply the Hon. Kalugalla said :

"No. During the U.N.P. Caretaker Government, they opened sub-post offices for political reasons. Representations were made by the elected representatives and members of various societies that the U. N. P. Caretaker Government had selected their stooges for these posts. I am examining the whole question."

This was the particular type of examination that Mr. Marikkar also conducted.

I shall now go on to representations that have been made to us regarding the appointment of sub-postmasters. In regard to Bengamuwa Post Office, Mr. H. Wanigasekera has been selected for the post of sub-postmaster, Bengamuwa, in preference to the registered substitute who has been working there since 1959. Mr. Wanigasekera has no qualification whatsoever in Sinhala. Mr. Wanigasekera has been there for four years while the registered substitute had been there from the date of his birth. The building that Mr. Wanigasekera is providing is away from the road, while the building provided by the registered substitute is much more accessible.

The next case is regarding the sub-postmaster of Alawatugoda. Mr. D. J. S. Jayagoda had been retired from the post of sub-postmaster Alawatugoda. His daughter Miss K. Jayagoda, who was a registered substitute for over five years has not been appointed in his place, and a person from a village two miles away has been appointed to fill the vacancy.

I would give a third case. This refers to Elwitiya, Kumarakattuwa. Mr. N. M. Appuhamy was an applicant for the post of sub-postmaster of Kumarakattuwa, which was advertised in September, 1959. The person who is presently in charge of this post office and five others including himself was interviewed on 28th December, 1959. The Postmaster-General informed him by letter dated 7th July, 1960, that he had been selected as the most eligible candidate for appointment to the post. He then deposited as security a sum of Rs. 1,000 as required and he underwent a course of training after a test that was held by the Postmaster, Chilaw. On completion of the period of training the Divisional Superintendent by his letter No. 79/3260 of 4th October, 1960, informed him that he would be placed in charge of the post office on 17th October, 1960, at 9 a.m. Nevertheless the Divisional Superintendent informed him by telegram dated 14th October, 1960, that the appointment had been cancelled.

The next case is in regard to the Nannapurawa sub-post office. We understand that candidates were interviewed some months back and a man selected for the post, but no appointment was made from that batch of candidates. Subsequently a second interview was held and Mr. H. A. Ariyaratne, a close relative of Mr. D. M. Gunasekera, M.P. for Bibile was selected. We are informed that Mr. H. A. Ariyaratne is also manager of the Wegam Pattu Multi-purpose Co-operative Society, where a shortage of Rs. 25,000 had been reported. It is said that Mr. Ariyaratne had been appointed sub-postmaster even before enquiries into the shortage had been completed because of the intervention of Mr. D. M. Gunasekere, M.P. for Bibile. It is further alleged that the interview of the candidates was held in Mr. Ariyaratne's house itself.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිල් මැතිව් මයා.]

There is another case regarding the Thihagoda sub-post office. This is in the Matara District. Mr. Gunaratne was the postmaster to retire, and applications were called. There were nine applicants who were interviewed by the D. S., Galle. Three had been selected, namely, Mr. Dissanayake, Mr. Silva and another. But the gentleman who was placed 7th, Mr. Keerthisinghe—he may be related to the M.P. for Matara—was appointed. And he got the appointment by wire. That, too, may be on the orders of the Minister. The Selection Board and the P.M.G. have been ignored. There have been many petitions against this appointment, but nothing has been done as yet.

Another matter I wish to mention is with regard to the delay in the payment of telephone bills due to the Central Telegraph Office. I am informed that there are 125 defaulters who owe sums totalling over Rs. 60,000 ! Many names have been submitted to me. They include James T. Rutnam, Rs. 10,966 ; R. E. Jayatilleke, Rs. 1,081 ; Mahanama Samaraweera, Rs. 1,228 ; C. R. Beligammana Rs. 483 ; Mrs. Dora de Silva, former wife of Stanley de Zoysa, Rs. 1,182 ; S. L. F. P. Office Rs. 1,087 ; and so on. There is also the case of Mrs. J. G. Wickremasinghe who was provided with a telephone at Union Place on 3rd July 1959, but no ledger account was opened till July 1961. No bills were tendered, and the amount due is Rs. 5,000 ! These matters were brought up to the Postal Clerical Service Union at a General Meeting held on 30th June 1961, and it passed a resolution that the state of affairs of the Office of the Superintendent, Telecommunications, which handled the above cases was most unsatisfactory and urged that the P.M.G. should appoint a commission of inquiry to probe into the work of this office.

There is still another matter with regard to sub-post offices, and in this connection I would quote from page 65, paragraph 15 of the Report of the Parliamentary Bribery Commission, 1959-60 :

"We found a similar malpractice which went deeper and wider in the Department of Posts and Telecommunications in the appointment of Sub-Postmasters and Sub-Postmistresses. The Constitution has vested power over all appointments in the Public Service Commission. The Public Service Commission has delegated their power to make certain specified appointments to the Head of the Department, because otherwise the Commission would be overwhelmed with work. This devolution could have a good effect in strengthening authority and discipline in the Department. But we find that when Mr. C. A. S. Marikkar was the Minister of Posts and Telecommunications, it was he and not the Postmaster-General who in fact exercised the power delegated by the Public Service Commission. The Postmaster-General says he found himself snowed under with representations by Members of Parliament and others and called upon to make so many reports to the Minister, that he ceased to make any appointments to Sub-Post Offices without consulting the Minister. Then he usually found that if the applicant chosen for appointment by him was someone other than the one recommended by Mr. Marikkar, the creation of a new Sub-Post Office or the upgrading of an existing Sub-Post Office would be cancelled or postponed . . . ."——

You will note, Mr. Chairman, that this type of cancellation or postponement of the establishment of new sub-post offices or upgrading of existing sub-post offices has been going on all along ; it is going on even today.

The Report goes on to say :

"He says that Mr. Marikkar never made him appoint any particular candidate, and that he took sole responsibility for the appointment . . . . "

I wish to repeat that sentence.

The reference is to the Postmaster-General. The Report adds :

"He says that Mr. Marikkar never made him appoint any particular candidate and that he took sole responsibility for the appointments but that was only on paper. In the result the man preferred by Mr. Marikkar was ordinarily appointed."

The Report also states that sub-postmasters were allowed to take part in politics.—[*Interruption.*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 10.30

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

The lights have failed!

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

Where is the Minister in charge of electricity?

මැතිව් මයා.
(திரு. மதியூ)
(Mr. Mathew)

He has disappeared! So have the lights!

ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස් (නාත්තාන්ඩිය)
(சேர் அல்பேட் எப். பீரிஸ்—நாத்தாண்டிய)
(Sir Albert F. Peries—Nattandiya)

Even electricity has got a shock when these dark deeds are mentioned!

මැතිව් මයා.
(திரு. மதியூ)
(Mr. Mathew)

Now, I will bring to the notice of the House a most glaring incident of political patronage of an unprecedented nature. It is in regard to the appointment of a sub-postmaster for the new Kandy Market sub-post office. I believe it is in the constituency of my Friend the hon. Member for Kandy—[*Interruption*] —I am sorry, Sir, my Friend the hon. Member for Minipe (Mr. R. W. Tennekoon) states that the sub-post office is in the constituency of the hon. Member for Senkadagala (Mr. S. Ranaraja). Representations have been made to us. Possibly, it is felt that there is no point in making representations to the M.P. of the area, the hon. Member for Senkadagala, because what could he do? The most he could do is to make representations to the Hon. Prime Minister and that will only bring about a situation similar to the one contemplated in the famous Sinhalese saying—"හොරගෙ අම්මාගෙන් පේන අහනව වගේ"

Representations have been made to us so that through us this honourable House and the country can know what is happening. The complaint is that a number of applicants with suitable qualifications applied for the post of sub-postmaster but the person least qualified has been appointed and this person is the son of the Parliamentary Secretary to the Minister of Transport and Works—the son of Mr. T. B. Tennakoon. This candidate has had the least qualifications for the post. And what is worse. These representations have been made to us by an erstwhile supporter of the S. L. F. P., Mr. K. G. Dodanwela.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

The hon. Parilamentary Secretary is just coming in.

ජේ. ආර්. ජයවර්ධන මයා. (දකුණු කොළඹ පළමුවන මන්ත්‍රී)
(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்பு தெற்கு முதலாம் அங்கத்தவர்)
(Mr. J. R. Jayewardene—First Colombo South)

Repeat that again.

මැතිව් මයා.
(திரு. மதியூ)
(Mr. Mathew)

The complaint is that the applicant with the least qualifications has been appointed to the post and he is the son of Mr. T. B. Tennakoon, the Parliamentary Secretary to the Minister of Transport and Works.

ඩී. ජී. එච්. සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)
(திரு. டீ. ஜீ. எச். சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)
(Mr. D. G. H. Sirisena—First Akurana)

සුදුසුකම් තිබෙනවා නම් කවුරු වුණත් කමක් නැහැ.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

සුදුසුකම් නැතිව?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැතිව් මයා.

(திரு. மதியூ)

(Mr. Mathew)

තමුන්නාන්සේට ඇහුනෙ නැති එක මගේ වරදක් නොවෙයි. ලයිට් නැතිව ගියා සින් තමුන්නාන්සේට තේරුම් ගන්ට බැරි වුණා.

We regret to note that the Hon. Minister of Transport and Works, having ascended the craggy heights to Ministerial office is now dangerously treading the slippery, if not oily, path that Mr. C. A. S. Marikkar trod some years ago. We regret that this kind of political patronage did not cease after the searching inquiry and carefully considered Report of the Parliamentary Bribery Commission. We regret to have to state that it is continuing even today and we hope that a fresh inquiry will be held by an independent body of people who would fearlessly give their true and just verdict. We also hope that those who give their verdict will not be put on trial in the well of this House.

මොන්ටේගු ජයවික්‍රම මයා. (වැලිගම)

(திரு. மொண்டெகு ஜயவிக்ரம—வெலிகம)

(Mr. Montague Jayewickreme—Weligama)

Assuming that the allegations of my hon. Friend (Mr. Mathew) are true there is not the slightest doubt that the Hon. Minister of Transport and Works has out-beaten the former Minister, Mr. Marikkar.

We would like to get a categorical statement from the Hon. Minister because allegations of a very serious nature have been made to warrant the appointment of an independent Commission to look into the corrupt practices of the Hon. Minister and his hirelings. I think, in view of the serious nature of the allegations where his own Parliamentary Secretary's son has been appointed to a post and various other instances within my knowledge, I strongly urge that a Commission be appointed to verify whether these allegations are true.

If nothing else, we expect a sense of fairplay in these matters. The qualifications of so many candidates have been thrown overboard because of political patronage. The normal procedure would have been to allow the Postmaster-General to attend to this matter.

We know the pathetic case of Mr. Marikkar. It was rumoured that Mr. Marikkar was taking bribes. Anybody and everybody in the market place complained that Mr. Marikkar was taking money. Mr. S. W. R. D. Bandaranaike stoutly defended Mr. Marikkar and said that people indulged in these rumours because they were his political opponents. Finally, we had the sad conclusion of the Parliamentary Bribery Commission that all those rumours were not unfounded. He was found guilty of bribery and corruption. We sincerely hope that the hon. Minister will not suffer the same fate as Mr. Marikkar. No government worthy of the name can tolerate this type of maladministration and political patronage.

The hon. Member for Kolonna gave us a list of some instances of glaring political patronage and favoured treatment. There were other instances mentioned yesterday. In my own constituency too a number of improper things have been happening which I feel justified in saying will be far in excess of the malpractices and corruption of the former Minister.

We expect the Hon. Minister of Transport and Works to make a statement on the Floor of the House.

ගරු පී. බී. ජී. කලුගල්ල (ප්‍රවාහන හා රජයේ වැඩ පිළිබඳ ඇමති)

(கௌரவ பீ. பி. ஜீ. கலுகல்ல—போக்குவரத்து, கட்டுவேலை அமைச்சர்)

(The Hon. P. B. G. Kalugalla—Minister of Transport and Works)

I will make a statement.

ජයවික්‍රම මයා.

(திரு. ஜயவிக்ரம)

(Mr. Jayewickreme)

We want a categorical and authoritative statement. Apart from the doings in regard to the postal department, I should like to find out from the Hon. Minister whether the story that is being widely circulated is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

correct, namely, that he has an intention of appointing the Chief Architect as Director of Public Works. There is a widespread rumour that the Director of Public Works when he terminates his period as Director is to be succeeded by the Chief Architect. I want to know whether that is the Hon. Minister's intention or whether there is a change of policy and whether the Hon. Minister feels that an Architect could run the Public Works Department. It is very important because provision in a sum of Rs. 90 million has been made in the Estimates for the Public Works Department. Can an architect function effectively as the Director of Public Works ? If it is a matter of policy and the Hon. Minister decides to appoint him, he can do so. But still I should like to have a statement from the Hon. Minister that it is a matter of policy. It may be completely untrue but still it is important to know, because my own view is that an architect can never under any circumstances be a substitute for the Director of Public Works.

Look at some of our roads. Obviously, the Director of Public Works or his officers are not to be blamed because the money vote available to the Public Works Department has dwindled from 1956. If the Hon. Minister would only look at the Votes in the Estimates he would find that every year there has been a cut on the Vote provided for maintenance and construction of roads.

Take the new Kelani Bridge. The original intention was to run a road up to Attidiya, by-passing Colombo so that those who want to travel to Puttalam, Anuradhapura and Jaffna from the southern areas of Colombo need not go through the City of Colombo. But what has happened ? The bridge has been built, and that is all. I could see a culvert or a small bridge next to the main Kelani Bridge being tinkered with but what attempts have been made to build the Attidiya by-pass ? The main purpose in having a bridge like the Kelani Bridge, on which we have spent something like Rs. 10 million, was to avoid bottlenecks on both sides. For a matter of half a mile one is able to use that highway but immediately you pass beyond that half mile you run into a bottleneck. In other words there is no planning and there cannot be any planning if there is no money. The same thing, the same problem, arises all over the country. Hon. Members from both sides of the House, on this side as well as the other, are complaining bitterly that the roads are deteriorating.

I will give another instance. Take the Boosa bridge. The firm Gammons completed the bridge a couple of months ago but the approach roads have not been built. One expects to see that at least the Public Works Department co-ordinates its work with the contractors. I travel often from the Southern Province and I can say, therefore, that we still have to use the old bridge. The new bridge, as I said, was completed a couple of months ago but the approach roads have not been completed. This type of thing shows inefficiency on the part of the Hon. Minister for not taking to task the officers concerned. I read the other day that the Ambalangoda bridge was completed 5 years ago but that the approach roads have not been completed. The whole thing savours of inefficiency and mismanagement. I think the Hon. Minister, instead of making appointments to the grade of sub-postmasters, could make himself useful by travelling round the country with the Director of Public Works and his Permanent Secretary and seeing for himself what is happening in the country.

No, Sir. It is not good enough. I think the Hon. Minister should realize that he is in charge of a very important portfolio, an extremely important portfolio, and that he has a duty by the country to go ahead with his work and see to it that it is done properly.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩබ්ලිව්. ජී. එම්. ඇල්බට් සිල්වා මයා. (මොනරාගල)

(திரு. டப்ளியு. ஜீ. எம். அல்பேட் சில்வா—மொனராகல)

(Mr. W. G. M. Albert Silva—Monaragala)

ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාශයට පමණක් සීමා වී ඇති කරුණු ගැන පමණක් නොවෙයි, මා මේ අවස්ථාවේදී කථා කරන්න බලාපොරොත්තු වන්නේ. මගේ පළාතේ කෙරීගෙන යන නොයෙකුත් වැඩ කටයුතු ගැන කියන විට කියන්න තිබෙන්නේ ඒවා ඉතාම ප්‍රමාද වෙවී කෙරීගෙන යන බවයි.

පූ. භා. 10.45

ගරු සභාපතිතුමනි, මේ ඉදිරිපත් කර තිබෙන වැය ශීර්ෂය භාර ගරු ඇමතිතුමා දන්නවා ඇති කොළඹ සිට මාතර දක්වා පමණක් දුම්රිය දුවන බව. එසේම එතුමා දන්නවා ඇති, මාතර තිස්සමහාරාමය කතරගම වැනි පූජ්‍ය ස්ථානවලට වන්දනා සමයන්හිදී රටේ ජනතාව වැඩි වශයෙන් ගමන් කරන බව. උත්සව කාල සීමාවන් හිදී පමණක් නොවෙයි, අනිකුත් දිනවලත් ඒ ප්‍රදේශවලට යන එන්නන්ගේ සංඛ්‍යාව වැඩියි. නමුත් එම පළාත්වල බස් සේවාව දුර්වලයි. එක බස් රථයක් යන විට වැන් රථ වැනි කුලී වාහන දහයක් පමණ යනවා, කතරගම-තිස්ස පාරේ. මීට ප්‍රථම කාරක සභා අවස්ථාවන්හිදීත් මා මේ ගැන කියා තිබෙනවා. මා අදත් විශේෂයෙන් කියා සිටිනවා, මාතර සිට කතරගම දක්වා දුම්රිය සේවයක් අරඹන්නය කියා. ඒ අන්ද මටම වැඩ කරනවා නම් දුම්රිය දෙපාර්තමේන්තුවට විශාල ආදායමක් ලබාගන්න පුළුවන් වෙනවා ඇති. මේ කාරණය ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වෙනවා ඇත කියා මා විශ්වාස කරනවා. එම ප්‍රදේශයද තැනිතලා ප්‍රදේශයක් නිසා බෝහොම ලේසියෙන් දුම්රිය සේවයක් ආරම්භ කරන්න පුළුවනි.

ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාශයේ වැඩ කටයුතු රාශියක් ප්‍රමාද වෙමින් පවතිනවා. විශේෂයෙන් මේ අවස්ථාවේදී බුත්තල-අලුපොත පාර ගැන කියන්න කැමතියි. අවුරුදු 6 ක වේලේ පටන් මෙම පාරේ වැඩ කරනවා. මුළු දිග ප්‍රමාණය සැතපුම් 10 ක් පමණ වන මෙම පාරේ වැඩ කට යුතුවලින් මේ දක්වා කරන්න පුළුවන් වී තිබෙන්නේ සැතපුම් 5 ක පමණ වැඩ කට යුතු පමණයි. තවත් සැතපුම් 5 ක පමණ වැඩ ඉතිරිව තිබෙනවා.

බුත්තල-කතරගම පාර ගැනත් යමක් කියන්න ඕනෑ. බුත්තල සිට කතරගමට සැතපුම් 25 කට වඩා නැහැ. බුත්තල සහ කතරගම අතර පාර සකස් කළොත් බුත්තල සිට මාතර දක්වා ගමන බොහොම කෙටි වෙනවා. දැන් ඒ ගමනට සැතපුම් 78 ක පමණ දුර ප්‍රමාණයක් ඇති රවුමක් ඇවිදින්න වී තිබෙනවා. මේ පාර හැදුවාම සැතපුම් 25 කින් පමණ දුර ප්‍රමාණය අඩු වෙනවා. වන්දනා කාලයන්හිදී කතරගම යන වන්දනාකරුවන්ට එය විශේෂ ප්‍රයෝජනයක් වෙනවා ඇති. මීට අවුරුදු දෙක කට පමණ පෙර බුත්තල-කතරගම පාර වෙනුවෙන් රුපියල් ලක්ෂයක පමණ මුදලක් වෙන් කළාය කියා දැනගන්න ලැබුණා. නමුත් කළ යුතු වැඩ කෙරී නැහැ. සැතපුම් 2 ක පමණ දුරක පස් නම් කපා දමා තිබෙනවා. ගිය අවුරුද්දේත් රුපියල් පණස් දහසක් පමණ වෙන් කර තිබෙනවාය කී නමුත් වැඩ පටන්ගෙන ඇති බවක් පෙනෙන්ට නැහැ.

ඒ වාගේම තණමල්විල-හම්බේගමුව පාර ගැන යමක් කියන්න කැමතියි. හම්බේගමුව ප්‍රදේශය බොහොම ප්‍රසිද්ධ හරියක්. ඒ ප්‍රසිද්ධ හරියට පාරක් ඉතාම අවශ්‍යයි. එම නිසා තණමල්විල-හම්බේගමුව පාර නියම විධියට සකස් කළ යුතුව තිබෙනවා. උඩරට ගැමි කොමිෂන් සභාව මගිනුත් මේ පාර සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙන බව අප දන්නවා. අවුරුදු 6 ක් තිස්සේ කරලත්, මෙම පාරේ වැඩ කටයුතුවලින් හැතපුම් දෙකකට වඩා නිම කරන්න ලැබී නැහැ. මේ අත පසු වී ඇති වැඩ කටයුතු ඉතා ඉක්මනින් කර දෙන හැටියට මා ඉල්ලා සිටිනවා. මොන මොන හේතූන් නිසා මේ වැඩ කට යුතු ප්‍රමාද වෙනවාද කියන්න මා දන්නේ නැහැ. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ඕවර්සියර්වරුන්ගේ නොසැලකිලිමත්කම නැතිනම් අකාර්යක්ෂමතාව නිසා වන්නට පුළුවනි.

ගරු සභාපතිතුමනි, කුඹුක්කන-ඔක්කම් පිටිය පාර අයිති වාරිමාර්ග දෙපාර්තමේන්තුවටයි. බදුල්ල දිස්ත්‍රික්කයට ගිය ගරු ඇමතිතුමාට මේ පාර ඉතා අවශ්‍ය පාරක්ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා මා මතක් කර සිටියා. මේ පාර ඉතා අවශ්‍ය පාරක් වන හෙයින් මෙය නොප මාව රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ගන් නැයි මා කියා සිටියා. නමුත් ගරු ඇමති තුමා කීවා ඊට බලයක් නැත කියා. වාරි මාර්ග දෙපාර්තමේන්තුවට අයිති ඒ පාර රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ගන්න බැරි මොකද කියා මම අහනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් පාරවල් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අරගෙන ඒවා රථවාහන ගමනාගමනයට සුදුසු පරිදි සකස් කරන්නට ගරු ඇමතිතුමාට පුළුවන්කම තිබෙන්න ඕනෑ. අද ඔක්කන් පිටිය ප්‍රදේශයේ විශාල ගොවිජනපද ව්‍යාපාරයක් ඇති කර තිබෙනවා. විසිදහසක් පමණ ගොවි ජනයා මේ ප්‍රදේශයේ ඉන්නවා. නුමුත් මෙම පළාතේ ඇති පාරවල් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ගෙන නැති නිසා මේවායේ රථවාහන ගමනාගමනයට, විශෙෂයෙන් බස් රථ ගමනාගමනයට අවසර දෙන්නේ නැහැ. ගමනා ගමන මණ්ඩලයෙන් මේ ගැන ප්‍රශ්න කළාම කියනවා, රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ගන්නා තුරු ඒ මාගීවල බස් රථ ගමනාගමනය කරන්නට පුළුවන්කමක් නැතැයි කියා. එමෙන්ම මේ මාගී වල සීමාසහිත බරක් ඇති රථවාහනවලට පමණයි, ගමන් කිරීමට ඉඩ දී ඇත්තේ. එම නිසා බස් ධාවනය කරන්නට කොහෙත්ම පුළුවන්කමක් නැතැයි කියනවා.

ගරු සභාපතිතුමනි, මහඔය පාලමේ වැඩ පටන් අරගෙන දැනට අවුරුදු 11 ක් පමණ ගත වී තිබෙනවා. නුමුත් මේ වන තෙක් එහි වැඩ කටයුතු රජයේ දෙපාර්තමේන්තුව මගින් අවසන් කරලා නැහැ. එමනිසා මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා, මේ වාගේ අවුරුදු හතර, පහ, හත, අට, දහය, පහළොව ප්‍රමාද වී තිබෙන වැඩ කටයුතු ඉතා ඉක්මනින් කිරීමට රජයේ වැඩ දෙපාර්තමේන්තුවට නියෝග කරන්නය කියා.

ගරු සභාපතිතුමනි, බිබිලේ උප සමුපකාර සංවර්ධන කාර්යාලයක් තිබෙනවා. මෙම කාර්යාලය අලුත් ස්ථානයකට මාරු කර දැන් හය මාසයක් පමණ ගත වී තිබෙනවා. මෙම අලුත් ස්ථානයට පැමිණීමට පෙර එම කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා සවිකර තිබුණු ටෙලිපෝනය අලුත් කාර්යාලයට ගොස් මෙතෙක් කලක් ගත වී තිබියදීත් සවිකර නොතිබීම නිසා බොහෝ අපහසුකම්වලට මුහුණ පාන්නට වී තිබෙනවා. මෙම ප්‍රදේශය මොණරාගල සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමාට අයිති ප්‍රදේශයක්. එතුමාගේ කාර්යාලයට හැතැප්ම 25 ක් පමණ දුර තිබෙනවා. එතුමාට නිතරම හමුවීමට යෑමට ඇති අපහසුකම් නිසා මේ ටෙලිපෝනය පාවිච්චි කරනවා. එහෙත් අලුත් ස්ථානයේ මෙම ටෙලිපෝනය සවි කර නොතිබීම නිසා සමුපකාර සංවර්ධන නිලධාරීන්ට කච්චේරියට සහ ආදායම් පාලක තැනට නොයෙකුත් රාජකාරි කටයුතු සඳහා කථා කිරීමට මෙන්ම අනිකුත් වැඩ කටයුතු කර ගැනීමට විශාල බාධාවක් වී තිබෙනවා. මම අහනවා, පරණ කාර්යාලයේ තිබුණු ටෙලිපෝන් එක දැන් මාස 6ක් ගත වී තිබෙද්දී අලුත් කාර්යාලයේ සවි කිරීමට බැරි වුණේ මොන කාරණයක් නිසාද කියා. මේ ගැන නිලධාරීන්ගෙන් ප්‍රශ්න කළාම කියනවා, "අපි කොපමණ ලියුම් ලීවත් ඒවාට පිළිතුරු ලැබෙන්නේ නැහැ" කියා. ගරු සභාපතිතුමනි, මේ පහසුකම් ලබා දීමට මෙතෙක් ප්‍රමාද වීම ගැන මම ඉතාම කණගාටුවෙනවා.

ගරු සභාපතිතුමනි, මා විශෙෂයෙන්ම අවුරුදු කීපයක් තිස්සේම ඉල්ලා සිටියා, වැල්ලවාය-තනමල්විල ටෙලිපෝන් සේවය සම්බන්ධ කරන්නය කියා. හැතැප්ම 22ක දුර ප්‍රමාණයක් පමණයි තිබෙන්නේ. මෙසේ සම්බන්ධ කරනවා නම් අද දිගටම තිස්සමහාරාමය, කතරගම ආදී ප්‍රදේශවලට පහසුවෙන්ම කථා කිරීමට පුළුවන්කම ලැබෙනවා. අද කතරගමට කථා කරන්නට ඕනෑවුණොත් විදුලි පණිවුඩ මාර්ගය කොළඹට සම්බන්ධ කරලා ඊට පසුවයි, කතරගමට ඒ පණිවුඩය යවන්නට පුළුවන් වන්නේ. නුමුත් හැතැප්ම 22ක් දුර ප්‍රමාණය තිබෙන මෙම ස්ථානයට බොහෝම ලෙහෙසියෙන් කථා කරන්නට පුළුවනි. මා කලින් සඳහන් කළ ආකාරයට සම්බන්ධ කරනවා නම්. අනෙක් කාරණය, බොහෝ විට මොණරාගල සිට ටෙලිපෝන් පණිවුඩයක් යවන්නට වුවමනා වූවිට හැමදාම කියනවා, ටෙලිපෝන් කම්බි කැඩිලාය කියා. යම් විධියකින් මා සඳහන් කළ ආකාරයට සම්බන්ධ කර තිබෙනවා නම්, ඒ අපහසුවට මුහුණ දෙන්නට ඕනෑ නැහැ. ඒ නිසා රජයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. ජී. එම්. ඇල්බට් සිල්වා මයා.]

කටයුතුවලට පමණක් නොවෙයි, මහජන තාවටද නොයෙකුත් විධියේ වැඩ කටයුතු කර ගැනීමට මෙය බලවත් පහසුවක් වෙනවා.

ගරු සභාපතිතුමනි, මොණරාගල තැපැල් කාර්‍යාලය ගැනද වචනයක් කියන්නට කැමතියි. දැනට මෙම තැපැල් කාර්‍යාලය පිහිටා ඇත්තේ ඉතාම කුඩා ගොඩනැගිල්ලකයි. අළුත් ගොඩනැගිල්ලක් තනා දැන් අවුරුද්දක් පමණ ගත වී තිබෙනවා. නමුත් මෙතෙක් ඒ ගොඩනැගිල්ල විවෘත කරලා නැහැ. අළුතින් ඉදි කළ ඒ ගොඩනැගිල්ල ඉතා කුඩා එකක්. මොණරාගල අද පවතින දියුණු තත්ත්වයේ හැටියට ඒ ගොඩනැගිල්ල කොහෙත්ම ප්‍රමාණවත් වන්නේ නැහැ. ඒ නිසා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මොණරාගල නගරයේ හැටියට, මොණරාගල ජනගහණයේ හැටියට,—දැනට විශාල කච්චේරියක් තිබෙනවා; හෙට අනිද්දා උසාවියක් ඇති කරන්නට පුළුවනි—නගරයට ගැලපෙන, සෑහෙන ගොඩනැගිල්ලක් ඉදි කර දෙන්නය කියා.

ටී. බී. තෙන්නකෝන් මයා. (ප්‍රවාහන හා රජයේ වැඩ පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. ரி. பி. தென்னகூன்—போக்குவரத்து, கட்டுவேலை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. T. B. Tennekoon—Parliamentary Secretary to the Minister of Transport and Works)

ගරු සභාපතිතුමනි, මා ගැන පෞද්ගලිකව චෝදනාවක් මේ ගරු සභාවේ මතු කර තිබෙන නිසා වචනයකින් දෙකකින් හෝ ඊට පිළිතුරු දිය යුතුය කියා මා කල්පනා කරනවා. කොලොන්නේ ගරු මන්ත්‍රීතුමාත් (සිරිල් මැතිව් මයා.) වැලිගම ගරු මන්ත්‍රීතුමාත් (මොන්වේගු ජයවික්‍රම මයා.) මට විරුද්ධව එල්ල කළ ඒ චෝදනාව නම් මගේ එක් පුතෙක් මහනුවර උප තැපැල් කාර්‍යාලයකට පත් කර ගනු ලැබීම සඳහා තෝරා ගෙන තිබෙනවාය යන්නයි. ඒ විධියේ චෝදනාවක් ඉදිරිපත් කිරීම ගැන මා කනගාටු වෙනවා. ඒ තනතුරට මගේ පුතා තෝරා ගනු ලැබීම සම්බන්ධයෙන් දූෂණ ක්‍රියාවක් ඇත්ත වශයෙන්ම සිදු වී තිබෙනවාය යන ඒ චෝදනාව කවරෙකු විසින් හෝ ඔප්පු කරනු ලැබුවොත් ඊට පසුව පාර්ලිමේන්තු ලේකම්වරයෙකු වශයෙන් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් හෝ මා මේ ගරු සභාවේ සිටින්නෙ නැති බව සෘජුවම කියන්න කැමතියි. එසේ ප්‍රකාශ කරන ගමන්ම මා ඉතා කරුණාවෙන් ප්‍රශ්න කරනවා, යම් ගරු මන්ත්‍රීවරයකුට විසිඑක් අවුරුද්දකට වැඩි වයසේ දරුවකු ඉන්නවා නම් ඒ දරුවා තමන් ලබා සිටින සුදුසුකම් අනුව තැපැල් කාර්‍යාලයක හෝ වේවා වෙනත් දෙපාර්තමේන්තුවකට අයත් ආයතනයක හෝ වේවා රක්ෂාවක් බලාපොරොත්තු වීම වැරදිද කියා. ඒ වගේම එවැනි රක්ෂාවක් සඳහා ඉල්ලුම් කළ එවැන්නකුගේ පියා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පාර්ලිමේන්තු ලේකම්වරයකු හෝ වීම ගැන සලකා අනෙකුත් සුදුසුකම් අමතක කර දැමීම සාධාරණද කියාත් මා ප්‍රශ්න කරනවා. මන්ත්‍රීවරයකුගේ පුතකු රජයේ ආයතනයක රක්ෂාවක් සඳහා ඉල්ලුම් කිරීම වළක්වන්න පුළුවන්ද? එසේ වළක්වනවා නම් එසේ කිරීම සාධාරණද කියා කරුණාකර කල්පනා කරන්න.

මගේ වැඩි මහල් ළමයා මාතලේ පාර්ලිමේන්තු ආසනය සඳහා තරඟ කරන්න අවශ්‍ය බව කියමින් පසුගියදා කියා සිටියා. ආසනයක් වෙනුවෙන් ඉදිරිපත් වන්න ඔහුට ඕනෑ කළා. මගේ පුතා එසේ කිරීම වරදක්ය කියන්න බැහැ. නමුත් මා එය නවත්වන්න උත්සාහ කළා. එසේ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇත්තෙන්ම මගේ පුතාගේ හිත රිදවන්නටත් මට සිදු වුණා. ඒ දරුවා සමග අහිතවත් වන්න, එසේ නැත්නම් ඔහු තුළ මා කෙරෙහි පැවති හිතවත්කම හීන වන්න කරුණු යෙදුණා. මාතලේ ආසනය වෙනුවෙන් තරඟ කරන්න ඔහුට ඉඩක් ලැබුණේ නැති නිසා ඔහුගේ අහිතවත්කම ලබන්නටත් මට සිද්ධ වුණා. මගේ පුතා වැඩ කරන්නෙ ගුරුවරයකු වශයෙනුයි. ගුරුවරයකු වශයෙන් වැඩ කරන ගමන් දේශපාලන කටයුතුවලත් නිරත වෙනවාය කියා ඔහුට විරුද්ධව විරුද්ධ පාර්ශ්වයේ ගරු නායකතුමා පෙත්සමකුත් යවා තිබෙනවා. ඔහු අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් දොට්ට දමන්න හිතාගෙනයි එහෙම කරන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇත්තෙ. වාසනාවකට මෙන් මගේ පුතා ආධාර ලබන පාඨශාලාවක ගුරුවරයකු වශයෙන් සේවය කළ නිසා ඔහුට ඔහුගේ රක්ෂාව යන්තම් බේරා ගන්න පුළුවන් වුණා.

මගේ දෙවන ළමයා දුම්රිය දෙපාර්ත මේන්තුව යටතේ රක්ෂාවක් බලා පොරොත්තුවෙන් තුන් හතර වාරයක් ඉල්ලුම් පත්‍ර යවා තිබෙන නමුත් ඔහුට රක්ෂාවක් ලැබුණේ නැහැ. මහනුවර උප තැපැල් කාර්යාලයේ සේවය සඳහා මගේ පුතා තෝරා ගනු ලැබුවේ එම පදවිය සඳහා ඉල්ලුම්පත්‍ර එවූ අනෙක් අය අතුරින් ඉතා මත් සුදුස්සා ඔහු වූ නිසා වෙන්න ඇති. ඔහු තෝරාගෙන තිබෙන්නේ අමාත්‍යාංශයේ කිසිම ඇඟිලි ගැසීමක් ඇතිවය කියා ඔප්පු කළොත් ඒ පත්වීමට පසින් ගහලා මගේ දරුවාට යන්න කියනවා පමණක් නොවෙයි, මගේ මේ පාර්ලිමේන්තු ලේකම් ධුරයටත් ආයුබෝවන් කියලා යන්නෙ ඊටත් ඉස්සර වෙලා බව මේ අවස්ථාවේ කියන්න කැමතියි. මොකක්ද මේ අපරාධය? සුදුසුකම් කොතෙක් තිබුණත් මන්ත්‍රීවරයකුගේ දරුවකු වීම නිසා රජයේ රක්ෂාවක් ලබා ගන්න බැරි නම් ඒක අපරාධයක් නේද?

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මා පත් වී දැන් අවුරුදු හයක පමණ වෙනවා. මීට හය අවුරුද්දකට ඉස්සර— පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන්නට කලින්—මගේ ගෙදර තිබුණු පුටු කිහිපය වෙනුවට අලුතින් පුටු කීපයක්වත් ගන්න පසුගිය කාලය තුළ මට පුළුවන් වුණේ නැහැ. මන්ත්‍රීවරයකු වන්නට ඉස්සර මගේ ගෙයි තිබුණේ පුටු හතරක් නම් ඒ පුටු හතර පමණයි මගේ ගෙදර අදත් තිබෙන්නෙ. මට වෙන කිසිම දෙයක් නැහැ. මගේ දරුවන් තම තමන්ගේ දක්ෂකම් අනුව රැකීරක්ෂා ලබා ගන්නවා නම් එසේ කිරීම නතර කරන්න මට පුළුවන්ද? රක්ෂාවල් කරන්න එපා කියන්න මට පුළුවන්ද? මා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට හෝ පාර්ලිමේන්තු ලේකම්වරයකු හැටියට හෝ මෙතෙක් කල් කිසිම දූෂණ ක්‍රියාවකට සහභාගි වී නැහැ. මගේ ජීවිතයේදීවත් මා එවැන්නක් කරන්නෙත් නැහැ. එහෙත් මම එකක් කියන්න ඕනෑ. අපේ ළමයින්ට ඒ අයගේ පුරවැසි අයිතිවාසිකම් අනුව මේ රටේ වෙනත් අයට ලබා ගතහැකි තනතුරු ලබා ගැනීමට අපේ මන්ත්‍රීකම හෝ පාර්ලිමේන්තු ලේකම්කම හෝ අවහිරයක් හැටියට තිබෙනවා නම් මම දැන් වුණත් එළියට යන්න ලෑස්තියි.

ඒ නිසා අභූත, අසත්‍ය, අසාධාරණ, කිසිම යුක්තියකට අදාළ නොවන, බොරු චෝදනා ඉදිරිපත් කරන්න එපාය කියා ඉතා ගෞරවයෙන් කියන ගමන්ම එවැනි චෝදනාවක් තිබෙනවා නම් එය ඉදිරිපත් කරන්ට. ඉල්ලුම්කරුවන් සියලුදෙනාම කැඳවා ඒ අය ඉදිරිපිට ඕනෑම විධියක විභාගයක් කරන්ට. එසේ කර මගේ ළමයා නුසුදුසුය කියා තීරණය කරන්ට. එසේ කර ඔහුගේ කලින් පත්වීමට මගේ බලපෑමක් වූ බව ඔප්පු කරන්න. එහෙම කළ හැටියේම ළමයා පමණක් නොවෙයි, මමත් මෙතනින් එළියට යන බව කියනවා. ඊට වඩා මේ ගැන මට කියන්ට දෙයක් නැහැ.

පූ. භා. 11

බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ දෙවන මන්ත්‍රී)

(திரு. பெர்னாட் சொய்ஸா—கொழும்புத் தெற்கு இரண்டாம் அங்கத்தவர்)

(Mr. Bernard Soysa—Second Colombo South)

We have been discussing for one whole allotted day the Hon. Minister's vote. Various members—

ඒ. යූ. රොමානිස් මයා. (දෙඩන්ගස්ලන්ද)

(திரு. ஏ. யூ. ரொமானிஸ்—தொடங்கஸ்லந்தை)

(Mr. A. U. Romanis—Dodangaslanda)

ගරු සභාපතිතුමනි,——

සභාපතිතුමා

(அக்கிராசனர்)

(The Chairman)

මන්ත්‍රීතුමකු කථා කරනවා. **කරුණාකර** වාඩි වෙන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රොමානිස් මයා.
(திரு. ரொமானிஸ்)
(Mr. Romanis)
මට නීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)
The hon. Member is raising a point of Order.

රොමානිස් මයා.
(திரு. ரொமானிஸ்)
(Mr. Romanis)
අපට කථාවල පරිවර්තනයක් දිය යුතුය කියා සභාවේ නීතියක් තිබෙනවා. එම නිසා කථා පරිවර්තනයක් නැතිව මේ සභාව පැවැත්වීම සුදුසුද කියා මා ප්‍රශ්න කරනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)
විදුලි බලය නැවතී තිබෙන නිසා පරිවර්තනයක් ලබා දීමට පුළුවන්කමක් නැහැ. සභාව නැවැත්තුවොත් වැඩ අතපසු වෙනවා.

රොමානිස් මයා.
(திரு. ரொமானிஸ்)
(Mr. Romanis)
පරිවර්තනයක් නැතිව ඉංග්‍රීසියෙන් කරන කථා අපට තේරුම් ගන්න බැහැ.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
සභාපතිතුමනි, ඇත්තෙන්ම ඒ ගරු මන්ත්‍රීතුමාට ඉංග්‍රීසි භාෂාවෙන් කරන කථා තේරෙන්නේ නැතැයි කීම ගැන මා කනගාටු වෙනවා. එසේ නොතේරෙනවාය කියා විදුලි බලයකට මුවා වී ඊති ප්‍රශ්නයක් මතු කළ නමුත් මන්ත්‍රීවරයකුට කැමති භාෂාවකින් කථා කරන්න තිබෙන නිදහස මා මේ අවස්ථාවේ පාවිච්චි නොකර ඒ මන්ත්‍රීතුමාගේ ඉල්ලීම අනුව සිංහලෙන් කථා කරනවා.

සභාපතිතුමනි, සම්පූර්ණ දවසක් තිස්සේ මේ වැය ශීර්ෂීය සාකච්ඡාවට භාජන වුණා. යම් යම් පාර්ලිමේන්තු කොට්ඨාශ වලට පාරවල් වුවමනාය, පාලම් වුවමනාය, ගුවන් තොටුපොළක් වුවමනාය, යන විධියේ ඉල්ලීම් රාශියක් ඉදිරිපත් වුණා. මට කල්පනා වුණේ අජටාකාශයට යවන රොකට් ඉදි කිරීමේ ස්ථානයක් මගේ කොට්ඨාශයේ ඇති කරන ලෙස ඉල්ලා සිටීමටයි. මේ කොයි දේ ඉල්ලුවත් එකා කාරයි. ලබන වර්ෂයේ කරන්න බලා පොරොත්තු වන වැඩ කටයුතු ගැන ඇස්තමේන්තුවක් සඳ, තිබෙනවා. එම වැය ශීර්ෂය සම්පූර්ණකර ඉදිරිපත් කළායින් පසු අසුවල් ගඟ හරහා පාලමක් වුවමනාය, අසුවල් ස්ථානයේ පාරක් දියුණු කළ යුතුය, කියා කීවත්, මෙම වැය ශීර්ෂයට ඒවා ඇතුළත් නොවී තිබෙනවා නම් ඒ ගැන මෙතැන කථා කිරීමෙන් කුමන ප්‍රයෝජනයක්ද? එක ප්‍රයෝජනයක් නම් සිදු වෙනවා. හැන්සාඩ් වාර්තාවේ ඒ වචන පළ වෙනවා. ඒ වචන හැන්සාඩ් වාර්තාවේ පළ වුණායින් පසු ඒවා පෙන්වා අපේ කොට්ඨාශ වල ඡන්දදායකයින් තෘප්තියට පමුණුවන්න පුළුවන්ය යන අදහස් නම් ඇතිවන්න ඉඩ තිබෙනවා. මේ විධියට කාලය වියදම් කරන්නේ නැතිව මෙම අයවැය ඇස්තමේන්තු මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්න මත්තෙන් ඒ කරුණු ගැන සාකච්ඡා කළ යුතුයි. රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයත් ජ්ලාශ අංශය, පාරවල් අංශය, ආදිය ගැනත් මන්ත්‍රීවරුන් සමග සාකච්ඡා කර ඒ මන්ත්‍රීවරුන්ගේ මත අනුව මෙම ඇස්තමේන්තු පිළියෙළ කරන්න පුළුවනි. ඒ විධියේ වැඩ පිළිවෙළක් යොදනවා නම් මේ ස්ථානයට ඇවිත් පාරවල් පාලම් ආදිය ඉල්ලා සිටින්න වුවමනාවක් නැහැ. දැනට පිහිටුවා තිබෙන දිසාපති දිස්ත්‍රික්කවල ඇති කාරක සභාවලදී සාකච්ඡා කර මෙම කරුණු ඉදිරිපත් කළත් ඒවා දෙපාර්තමේන්තුව මාඝීයෙන් ඇමතිතුමාගේ සැලකිල්ලට යොමු කරවන්නට පුළුවනි. කල් වේලා ඇතිව ගරු ඇමතිවරයාට ඒ කරුණු ගැන දැනුම් දෙනවා නම්, ඉදිරි වර්ෂය තුළ අසුවල් අසුවල් කටයුතු සඳහා වියදම් කරන්න තිබෙන මුදල මෙපමණයි, ඒ වර්ෂය තුළ මේ සම්බන්ධයෙන් මට කරන්න පුළුවන්කම තිබෙන්නේ මෙපමණයි, යනුවෙන් ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ත්‍රීවරුන්ට කරුණු පැහැදිලි කර දෙන්න පුළුවනි. මේ ස්ථානයේදී නොව වෙනත් මාර්ගයකින් ගරු මන්ත්‍රීවරුන් සමග සාකච්ඡා කර ඒ විධියේ වැඩ පිළිවෙළක් සකස් කර ගත යුතුයි.

අපේ වෙළඳ ඇමතිතුමා ප්‍රදේශ වශයෙන් ගරු මන්ත්‍රීවරුන් කැඳවා සාකච්ඡා කිරීමට පිළිවෙළක් යොදා ගෙන තිබෙනවා. මේ සඳහාත් එවැනි පිළිවෙළක් යොදා ගත හොත් මේ විධියට කාලය ගත කරන්නට සිද්ධ වන්නේ නැහැ. මම ටිකක් බලා ගෙන සිටින්නේ මෙම වැය ශීර්ෂය ගැන සභාවේ සියළු දෙනා විසින්ම ඉදිරිපත් කරන ලද කරුණු ගැන ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්නේ කෙසේද කියා දැන ගැනීමටයි. හැබැයි, එතුමා දෙන එක පිළිතුරක් නම් මම දන්නවා. "ගරු මන්ත්‍රීවරු ඉතා වැදගත් අදහස් ඉදිරිපත් කර තිබෙනවා. ඉදිරි වර්ෂයේ ඒවා සැලකිල්ලට ගෙන කටයුතු කරන්න මහන්සි ගන්නවා" ය කියාවි. ඒ හැර වෙන විධියකින් පිළිතුරක් ලබා ගන්නට පුළුවන්ද කියා මට නම් සැක සහිතයි.

කෙසේ හෝ වේවා, ගරු ඇමතිතුමාගේ භාරයේ තිබෙන දෙපාර්තමේන්තු යටතේ මතුවන ප්‍රශ්න ස්වල්පයක් තිබෙනවා. ප්‍රථමයෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුව ගැන කරුණු කිපයක් කියන්න තිබෙනවා. දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන්ගේ වරදක් නිසාද, එසේ නැත හොත් ගරු ඇමතිතුමාගේ කාර්යාලයේ සිටින නිලධාරි මහත්වරුන්ගේ වරදක් නිසාද කියා මම දන්නේ නැහැ, මීට පෙර වෘත්තීය සමිතිවලට තිබුණු සැලකිල්ල දැන් බොහෝ දුරට අඩු වී තිබෙනවා. මම දන්නවා යම් යම් ප්‍රශ්න ගැන ඒ වෘත්තීය සමිති සමග සාකච්ඡා කරන බව. වෘත්තීය සමිතිවලින් ගොස් ඉදිරිපත් කරන කරුණු දැන් සාකච්ඡා කරන්නේ පාර්ලිමේන්තු ලේකම්තුමා සමගයි. එසේ වැඩ බෙදා ගෙන කිරීම ගැන මම දොස් කියන්නේ නැහැ. නමුත් ඒ ස්ථානයේදී ගන්න තීරණ ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒක කොහොම සිදුවන දෙයක්ද කියා මම දන්නේ නැහැ. නමුත් ක්‍රියාත්මක වන්නේ නැහැ. නිදර්ශනයක් වශයෙන් මම එක කරුණක් ඉදිරිපත් කරන්නම්. රත්මලානේ දුම්රිය වැඩ පොළේ තිබෙන වෘත්තීය සමිති මාර්ගයෙන් එක් කරුණක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඒ මොකක්ද? එහි වැඩ කරන කම්කරුවන් ඇතැම් අවස්ථාවලදී පඩි ගන්නට ගිය විට, ගණන් බලන අවස්ථාවේදී සිදු වන වැරදි නිසා පඩි හිඟව ලැබෙනවා. නමුත් ඒ හිඟ පඩිය ලබා ගැනීම ඉතාමත්ම අමාරුයි. එය ලබා ගැනීමට බොහෝ කාලයක් ගත වන අතර ඒ කම්කරුවන්ට දුෂ්කරතා රාශියකට මුහුණ පාන්නට සිද්ධ වෙනවා. ඒ දුප්පත් කම්කරුවන් හම්බ කළ මුදලේ ඉතිරි කොටස පවා ලබා ගැනීමට පුළුවන් වන්නේ ඔය විධියේ දුෂ්කර මධ්‍යයේ කාලයක් ගත වුණාට පසුවයි. මේ ගැන ඒ ස්ථානයේ ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු මහතාගෙන් විමසූ අවස්ථාවේදී එතුමා ප්‍රකාශ කළේ මේ හිඟ පඩි ගෙවීමට එතුමාට බලයක් නැති බවයි. ඒ බලය ලබා ගත යුත්තේ කාගෙන්ද කියා ඇසූ ප්‍රශ්නයට ලැබුණ පිළිතුර නම් සාමාන්‍යාධිකාරිතුමාගෙන් ඒ බලය ලබා ගත යුතු බවයි. එදා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා සමග ඒ සමිතිය කළ සාකච්ඡාවේදී හිඟ පඩි ගෙවීමේ බලය රත්මලානේ යාන්ත්‍රික ඉංජිනේරු මහතාට පැවරිය යුතුය කියා තීරණයක් කර ගත්තා. නමුත් තවම ඒ හිඟ පඩි ගෙවීම සතුටුදායක ලෙස කෙරී නැහැ. ඒ නිසයි, මම කිව්වේ මෙම ආයතනය මීට කලින් වෘත්තීය සමිතිවලට අනුකම්පාවක් දැක්වූවා නම් — කාගේ වරදක්ද මම දන්නේ නැහැ — දැන් ඒ අනුකම්පාව ටිකක් ඇහිරී ගොස් තිබෙන බව.

දුම්රිය දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් කරුණු විමසා බැලීමට කොමිෂන් සභාවක් පත් කළ යුතුය කියා දැන් ඉල්ලීමක් තිබෙනවා. මෙවැනි කොමිෂන් සභාවක් ඉල්ලන්නේ සාමාන්‍යාධිකාරිතුමාට විරුද්ධව හෝ වෙනත් කෙනකුට විරුද්ධව හෝ චෝදනා ඉදිරිපත් කිරීමට නොවෙයි. දුම්රිය දෙපාර්තමේන්තුව සාමාන්‍යයෙන් හැමදාම කියන කථාවක් තමයි, විශාල පාඩුවක් විඳ ගෙන මේ දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු ගෙන යන්නට සිද්ධ වී තිබෙනවාය යන්න. ඒ නිසා එවැනි පාඩු සිදු වීමට ඇති හේතු සොයා බලා ඒවා හරි ගස්සා නියම වැඩ පිළිවෙළක් යොදා ගැනීමට කොමිෂන් සභාවක් අවශ්‍යයි. එවැනි කොමිෂන් සභා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

වක් පත් කළ විට පාලක පක්ෂයත්, සේවක පක්ෂයත් දෙගොල්ලන්ම එක් කාසු වී ඒ දෙගොල්ලන්ගේම සහාය ඇතිව පහසුවෙන් කරුණු ඉදිරිපත් කර මේ වැරදි හරි ගස්සා ගන්නට පුළුවන් වෙනවා ඇති. එම නිසා කොමිෂන් සභාවක් ඉල්ලා තිබෙන්නේ අන්න ඒ කරුණු සාකච්ඡා කර ගැනීමටයි. නමුත් කොමිෂන් සභාවක් පත් කර ගැනීම පිණිස යම්කිසි ක්‍රියා මාර්ගයක් ගත්තාය කියා තවම ආරංචි යක් නැහැ.

දුම්රිය ආයතනයට අයිති දෙමටගොඩ රන්ින්ෂෙඩ් වැඩ පොළේ ඉල්ලීම් කීපයක් තිබුණා. විශෙෂයෙන්ම එතැන වැඩ කරන කාර්මික අංශයේ කම්කරුවන්ට විඳින්ට සිදුවී තිබුණු අමාරුවක් ගැනයි ඒ. ඒ ප්‍රශ්නය වෙන තැන්වලට වඩා තදින් ඒ වැඩ පොළට බලපානවා. එහි සිටින කම්කරුවන්ගේ ශ්‍රේඩ් ක්‍රමය අනුව එක ශ්‍රේණියකින් ඉහළට යෑමට අවහිරකමක් තිබෙනවා. ඒ නිසා පඩියේ ඊ ළඟ පියවර නැඟීමට පෙර පඩි වැඩි වීමක් නැතිව අවුරුදු ගණනක් එක තැන නැවති සිටීමට සිදු වෙනවා.

එයෝවෘද්ධ, විශ්‍රාම වැටුප් ලබා ගන්න බලාපොරොත්තුවෙන් සිටින, කම්කරුවන් විශ්‍රාම යන්න කලින් ඉහළ ශ්‍රේණියකට යන්න ඉඩ පහසුකම් ඉල්ලා සිටින්නේ ඒ මගින් තරමක වැඩි මුදලක් විශ්‍රාම වැටුප් වශයෙන් ලබා ගන්න පුළුවන් නිසයි. කම්කරුවන්ව පස් වන ශ්‍රේණියේ නතර නොකරන බවට පොරොන්දුවක් දී තිබෙනවා. පුහුණු ශ්‍රේණියේ දෙවන වර්ගයේ ඇති වන ඇබෑර්තුවලින් තුනෙන් එකක් ශ්‍රේඩ් 5 අර්ධ පුහුණු සේවයේ සිටින කම්කරුවන්ට ලබා දෙනවාය කියා දෙපාර්තමේන්තුව පොරොන්දුවක් දී තිබෙනමුත්, තවම එය ක්‍රියාත්මක කර නැහැ. දුන්නාවූ පොරොන්දු මදිය කියා එක් අතකින් කම්කරුවන් පැමිණිලි කරන අතර අනික් අතින් දුන්නාවූ පොරොන්දු දෙපාර්තමේන්තු මගින් තවමත් ක්‍රියාත්මක කර නැහැ.

මෙම කම්කරුවන්ගේ නිවාස අවශ්‍යතාවන් ගැනද මා සඳහා කරන්නේ මෙම ප්‍රශ්නය ඒ අයගේ වෘත්තීය සමිති මගින් ඉදිරිපත් කර තිබෙන නිසයි. දෙමටගොඩ, නාවලපිටිය, යනාදි සථානවල කම්කරු නිවාස සැපයීමට මෙම වැය ශීර්ෂයේ මුදල් වෙන්කර තිබෙනවා දැක මා සතුටු වුණා. තමන්ගේ වැඩපොළවල් අසලම කම් කරුවන් පදිංචි විය යුතුයයි දෙපාර්ත මේන්තුව ඉල්ලීමක් කර තිබෙන නිසා කම් කරුවන්ගේ නිවාස සැපයීම පිළිබඳව කට යුතු කිරීමට දෙපාර්තමේන්තුවට යුතු කමක් තිබෙනවා. මේ වෙන්කර තිබෙන මුදල්වලින් කරන්න බලාපොරොත්තු වන්නේ කුමක්ද කියා දැන් අපි කල්පනා කර බලමු. එක ගෙයකට රුපියල් 10,000ක් පමණ වියදම් වන පිළිවෙලට ප්ලැට්ස් දෙකක නිවාස 250ක් තැනීමට දෙපාර්ත මේන්තුව බලාපොරොත්තු වෙනවා. මේ ප්‍රමාණයෙන් ලබන අවුරුද්ද තුළදී සාදන්නට බලාපොරොත්තු වන්නේ නිවාස 25ක් පමණයි. මේ අන්දමට නම් දෙමටගොඩ දුම්රිය සේවකයන්ගේ නිවාස ප්‍රශ්නය කොයි විධියකින්වත් විසඳේවියයි මට හිතා ගන්න අමාරුයි. මේ ක්‍රමය අනුව එක් නිවාසයකට රුපියල් 10,000ක් පමණ වැය වෙනවා. මේ නිසා මීට වඩා අඩු මුදලකට නිවාස සාදා ගන්න පුළුවන් ක්‍රමයක් සකස් කර ගන්න බැරිද කියා මම ඇමති තුමාගෙන් අසන්න කැමතියි. ඇතැම් විට මෙතරම් මුදල් වියදම් කර මෙම ප්ලැට්ස් සාදන්නේ අවුරුදු සිය ගණනක් තබා ගැනීමේ බලාපොරොත්තුවෙන් වෙන්න පුළුවන්. නමුත් අද ප්‍රශ්නය උග්‍ර වී තිබෙන නිසා මේ තරම් මුදල් වියදම් නොකර නිවාස සාදන්න බැරිද කියා මා ගරු ඇමති තුමාගෙන් අසන්න කැමතියි.

දෙමටගොඩ පාර සහ කැළණිවැලි දුම්රිය මාර්ගය අතර කම්කරු නිවාස පන්ති 2ක් තිබෙනවා. මේ කම්කරු නිවාසවල පදිංචිව සිටින අයට දුම්රිය මාර්ගය හරහා බේස් ලයින් පාරට එන්න තිබෙන ඉඩමේයි, දුම්රිය දෙපාර්තමේන්තුවේ ෆෝමන්ලාගේ නිවාස තනා තිබෙන්නේ. මේ අයගේ ගෙවල මිදුලෙනුයි කම්කරුවන්ට ගමන් කරන්න සිදු වී තිබෙන්නේ. ඒ නිසා ඒ ඉඩවිය ඊට වැඩි කැමැත්තක් දක්වන්නේ නැහැ. අනෙක් පැත්තෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති බඩු මුට්ටු සොරාගෙන පිට කරන්නේ මේ වත්ත හරහාය කියා චෝදනාවක්ද තිබෙනවා. එවැනි චෝදනාවක් කෙසේ ඔප්පු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්න පුළුවන්ද කියා මා දන්නේ නැහැ. බඩු සොරකම් කරනවා නම් ඒවා ලෙහෙසියෙන් බේස්ලයින් මාවතෙන් ගෙන යන්න පුළුවන්. මේ මාර්ගය ඔස්සේ ගමන් කිරීමට ඕනෑම වේලාවක ඕනෑම කෙනකුට සම්පූර්ණයෙන් ඉඩ තිබෙනවා. මෙම මාර්ගයෙන් වුවමනා වේලාවක මගින්ට එහා මෙහා යන්න ඉඩ දී තිබියදී වත්තේ පදිංචි සිටින අය දෙපාර්තමේන්තුවේ බඩු මුට්ටු සොරාගෙන යනවාය කියන චෝදනාව එල්ල කරන්නේ කෙසේද කියා මට නම් හිතාගන්න අමාරුයි. ඇත්තෙන්ම මීට පිළිවෙළක් යොදා ගැනීම අමාරු නැහැ. ඉංජිනේරු මහත්මයෙක් සමඟ ගියොත් මට පෙන්වන්නට පුළුවනි, පහසුවෙන් මේ ප්‍රශ්නය විසඳා ගත හැකි ආකාරය. දැන් මේ නිවාස ඉතා අශෝභන තත්ත්වයකයි තිබෙන්නේ. ඒවාට අවශ්‍ය අළුත්වැඩියාවන් කර නැහැ. සාමාන්‍යයෙන් මනුෂ්‍ය වාසස්ථානයකට නුසුදුසු තත්ත්වයකයි ඒවා තිබෙන්නේ. ජල පහසුකම් ආදී කිසිම පහසුකමක් ඇත්තේ නැහැ. මේවා සකස් නොකර ප්ලැට් 25ක් ඉදි කිරීමෙන් මේ ප්‍රශ්නය විසඳන්නට පුළුවන් යයි හිතන්න අමාරුයි.

පූ. භා. 11.15

රජයේ වැඩ දෙපර්තමේන්තුව පිළිබඳව මීට පෙරත් මා විසින් කියන ලද කරුණක් නැවතත් කියන්නට සිදු වී තිබෙනවා. දුර පළාත්වල පාලම්වල වැඩ කරන කම්කරුවන්ට ඒ ස්ථාන භාර මහත්වරුන්ගේ යම් යම් අකටයුතුවලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. ඒ අකටයුතු පිළිබඳව සමිතියක් මගින් පැමිණිලි ඉදිරිපත් කළ අවස්ථාවේදී රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන් එක්තරා ක්‍රියා පරිපාටියක් අනුගමනය කළා, ඊට වඩා සතුටුදායක තත්ත්වයක් ඇති කිරීමට. එයින් යම් ප්‍රයෝජන ඇති වී තිබෙනවා. නමුත් තවමත් සමහර තැන්වල මහත්වරු කම්කරුවන්ට අයිති නිවාඩු දීමට විශාල මැළිකමක් දක්වනවා. එය රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ එක් අංශයක් පිළිබඳව ඇති ප්‍රශ්නයකුයි.

අනෙක් කාරණය රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ කරන කම්කරුවන්ට දියුණු වීමට මාවතක් නොමැතිවීමයි. එම නිසා ඔවුන් සඳහා ඉහළ ශ්‍රේණිවල නිල කීපයක් ඇති කරන ලෙස ඔවුන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ කරුණු ඉදිරිපත් කළ සමාගමේ උත්සවයකට පවා ඇමතිතුමා ගොස් ඉතා වැදගත් කථාවක්ද කර තිබෙනවා. නමුත් ඒ ඉහළ ශ්‍රේණිවල නිල කීපයක් ඇති කිරීම පිළිබඳව—සේවක සංඛ්‍යාව පුළුල් කිරීම පිළිබඳව—දෙපාර්තමේන්තුව දුන් පොරොන්දුව තවමත් ඉටු කර නැහැ.

තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව පිළිබඳව කියන්නට තිබෙන්නේ මා මීට පෙර මේ ගරු සභාවේදී මතු කරන ලද කාරණයකුයි. මෙම දෙපාර්තමේන්තුවේ පුහුණු ශ්‍රේණියේ පළමුවන වර්ගයේ සේවක පිරිසක් සිටිනවා, දෙපාර්තමේන්තුව විසින් 'රේඩියෝ ටෙක්නීෂන්ස්' නමින් නම් කරන ලද. වෙනත් දෙපාර්තමේන්තුවලත් මේ නාමය දරන සේවකයන් සිටිනවා. මේ පුහුණු ශ්‍රේණියේ පළමුවන වර්ගයේ අය ඔවුන්ගේ පඩිය වැඩි කරන ලෙස ඉල්ලූ නමුත් දෙන්නට බැරියයි කිව්වා. නමුත් ඒ සේවකයින් පඩි විෂමතා කොමිෂන් සභාව ඉදිරිපිටට ගොස් කරුණු ඉදිරිපත් කළ අවස්ථාවේදී දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහත්මයකුත් සමඟ ක්‍රිස්ටෝපර් මහත්මයා දීර්ඝ විභාගයක් පැවැත්තුවා. ඊට පසුව ක්‍රිස්ටෝපර් මහත්මයා නියම කළා, වෙනත් දෙපාර්තමේන්තුවල රේඩියෝ ටෙක්නීෂන්ස් මහත්වරුන්ට ගෙවන පඩියම මේ අයටත් ගෙවිය යුතුය කියා. එය කොමිෂන් සභාවේ වාර්තාවේ ලිය වී තිබෙනවා. දැන් දෙපාර්තමේන්තුව මොකක්ද කියන්නේ? වරදකුයි සිදුවී තිබෙන්නේ; මේ සේවකයින් කොමිෂන් සභාවේ අදහස් නොමඟ යැවීමට බොරු සාක්ෂි දී තිබෙනවා; ඒ නිසා එය ක්‍රියාත්මක කරන්නට බැරිය' කියනවා. නමුත් ක්‍රිස්ටෝපර් මහත්මයා ඉදිරියේ මොවුන් සාක්ෂි දුන් අවස්ථාවේදී දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහත්මයකුත් ඇවිත් සිටි නමුත් එවැනි වචනයක්වත් ඒ අවස්ථාවේදී අපට අසන්නට ලැබුණේ නැහැ. එම කොමිෂන් සභාව නියම කළ පඩිය දෙන්නට යන අවස්ථාවේදී දෙපාර්තමේන්තුවෙන් අසන්නට ලැබෙන්නේ කොමිෂන් සභාවේ අදහස් නොමඟ යැවීමට බොරු සාක්ෂි දී තිබෙනවාය කියායය. එසේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

වුවත් මේ දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින සේවකයින්ගේ හා මේ සේවකයින්ගේම නම දරන අනෙක් දෙපාර්තමේන්තුවල—පොලීස් දෙපාර්තමේන්තුවේ පවා—සේවය කරන සේවකයින්ගේ වැඩ එකට සසඳා බලන විට කිසිම වෙනසක් නොමැති බව පෙනී යනවා ඇති. එම නිසා පහළ පඩියක් ගෙවමින් ඉතාමත් ඉහළ ශ්‍රේණියක වැඩක් මෙම සේවකයින්ගෙන් ගැනීමේ නුසුදුසුතාව ගැන ගරු ඇමතිවරයාගේ සැලකිල්ල යොමු කරවන්න කැමතියි. එම දෙපාර්තමේන්තුවේ මුදල් ඉතිරි කිරීමේ ප්‍රශ්නයක් තිබෙනවා. සේවකයන් ගෙන් කොටසක්, දවසෙන් භාගයක් ගණන් බැලීමේ යන්ත්‍රවල වැඩ කරන අතර අනෙක් භාගය ලිපිකරුවන් වශයෙන් වැඩ කරනවා. නමුත් මේ අයට ගෙවන්නේ ලිපිකරුවන්ගේ පඩියයි. ලිපිකරුවන් සඳහා ඉහළ ශ්‍රේණියට උසස් වීමේ මාවතක් තිබෙතත් මේ අයට එවැන්නක් නැහැ; දියුණු වීමේ මාවතක් නැහැ. මේ කාරණය ගැන විශේෂයෙන් කල්පනා කර බැලිය යුතුයි.

මුදල් ඇමතිවරයාගේ අවධානය යොමු කළ යුතු තවත් ප්‍රශ්නයක් තිබෙනවා. නමුත් මෙය මෙම ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ මතු කරන්නේ මෙම ඇමතිතුමාගේ කටයුතුවලටත් මෙය අවභිරයක් වී තිබෙන නිසයි. ගමන් ගාස්තු සඳහා දෙන අතිරේක දීමනාව කපා දමන්න මෑත කදී භාණ්ඩාගාරය තීරණයක් කළා. නොයෙකුත් අවශ්‍ය වැඩ සඳහා දුර බැහැර පළාත්වලට යෑමට නිලධාරීන්ට සිදු වෙනවා. නමුත් අර ගමන් වියදම් දීමනාව කපා හැර තිබෙන හෙයින් අවශ්‍ය ගමන් නතර කර දමන්නයි, දැන් සිදු වී තිබෙන්නේ. "ට්‍රැවලින් එලවන්ස්" කපා දමා ඇති හෙයින් අවශ්‍ය ගමන් නතර කරන්න සිදු වී තිබෙනවා. සමහර විට මෙයින් වුවමනාවට වඩා ප්‍රයෝජන ගන්න නිලධාරීන් සිටින බව අප දන්නවා. එම නිසා අවශ්‍ය තරමට වඩා වැඩිපුර මුදලක් වියදම් වෙනවාත් ඇති. එහෙත් අපතේ යන මුදල් නතර කර ගැනීම සඳහා දැනට වඩා රෙගුලාසි ඇතිව, පරීක්ෂණයක් ඇතිව ඒ වාගේම සේවකයන්ගේ අවංකභාවය පිළිබඳව වැඩිපුර විශ්වාසයක් තබන ආකාරයට වැඩ පිළිවෙළක් යොදා ගන්න ඕනෑ. නොඑසේව වැය කරන්න නියම වූ මුදල් කපා හැරීමෙන් සිදු වන්නේ භාර ගත් වැඩ පවා ප්‍රමාද වීමයි. එයින් ඇති වන පාඩුව අතිරේක දීමනාව අපතේ යෑමෙන් ඇති වන පාඩුවට වැඩියි.

ගරු සභාපතිතුමනි, කොට්ඨාශ වශයෙන් ද කරුණු ඉදිරිපත් කර තිබෙන නිසා සහනයක් ලැබීමේ බලාපොරොත්තුවෙන් යම්කිසි කාරණයකට ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරවන්න කැමතියි. දකුණු කොළඹ මැතිවරණ කොට්ඨාශය තුළ ඇති නාරාහේන්පිට-කිරුළපන පාලමත්, කොහුවල පාලමත්, විහාර පටු මාවතේ පාලමත් අප්‍රමාදව සාදා ගැනීම අවශ්‍යයි. නාරාහේන්පිට-කිරුළපන පාලම සඳහා පසුගිය අවුරුද්දේ එක්තරා මුදලක් වෙන්කර තුබුණා. වෙන් කර තුබුණු එම මුදල වැය වුණේ නැහැ. නමුත් මෙම අවුරුද්දේ එම වැය ශීර්ෂය අතුරු දහන් වී තිබෙනවා. මෙය සිදු වී ඇත්තේ කොළඹ නගර සභාවෙන් මේ සඳහා දිය යුතු වූ මුදල නුදුන් හෙයින් බවට ආරංචියක් පවතිනවා. ඇත්තෙන්ම නගර සභාවෙන් ලබාගත යුතු මුදල් කොටස ලබා ගැනීමට බැරි නැහැ. මේ පාලම සෑදීම ඉතාමත් අවශ්‍යයි. එම නිසා මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙම පාලම සඳහා නැවත වරක් මුදල් වෙන් කරන ලෙසයි; එය සෑදීම සඳහා අවශ්‍ය කටයුතු යොදන ලෙසයි. කොහුවල පාරේ තිබෙන පාමංකඩ පාලමේ වැඩ පටන් ගත්තායයි ආරංචි වුණා. ඒ ගැන ඇමතිතුමාට කෘතඥ වෙනවා. විහාර පටු මාවතට ශ්‍රී සරණංකර පාර එකතු කිරීම සඳහා දැමිය යුතු පාලම ගැන කොළඹ නගර සභාවත් දෙහිවල-ගල්කිස්ස නගර සභාවත් අතරේ මතභේදයක් තිබෙනවායයි ආරංචියි. මේ ප්‍රශ්නය ගැන පළාත් පාලන ඇමතිවරයාට කරදර කරන්න වුවමනාවක් නැහැ. ඒ නගර සභා දෙකේ සභාපතිවරුන් දෙදෙනා කැඳවා මේ ප්‍රශ්නය සමථයකට පත් කිරීමට කටයුතු යොදන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ, නමුත් මේ කරුණු සවල්පය ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරනවා. මේ පිළිබඳව මේ අවුරුද්ද තුළ දීම යම්කිසි සහනයක් ලැබෙනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන සඵලපය අවසාන කරනවා.

ඊ. විජේසූරිය මයා. (මස්කෙළිය)
(திரு. ஈ. விஜேசூரிய—மஸ்கெலிய)
(Mr. E. Wijesuriya—Maskeliya)

ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ මමත් වචන සඵලපයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. මගේ මස්කෙළි කොට්ඨාශයේ ජනතාව ඉතා දුකසේ ජීවත් වන බව මා පළමුවෙන්ම තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ. ගරු ඇමතිතුමා ඒ ජනතාව ගැන අනුකම්පා සහිතව කල්පනා කර බලා ඒ අයගේ අඩුපාඩු ඉතා ඉක්මනින් සම්පූර්ණ කර දෙනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා. පාරක් තොටක් නැති නිසා, ලෙඩක් දුකක් ඇති වූ අවස්ථාවලදී ඒ ගම්බද ජනතාවට නොයෙකුත් විධියේ හිරිහැර කරදර විඳින්න සිදු වෙනවා. ලෙඩකු රෝහලකට ගෙන යාමට වුවමනා වූවිට ඒ ලෙඩා පොලු දෙකක බඳින ලද ගෝනියක දමාගෙන මිනිසුන් හත් අට දෙනකු එකතු වෙලා කරගහගෙන හැතැප්ම 10 ක් 12 ක් ඇතින් තිබෙන රෝහලට ගෙන යන්ට ඕනෑ. මේ විධියට ගෙන යන ලෙඩා බොහෝ අවස්ථාවලදී ඒ රෝහලට ළඟා වන විට අවසාන හුස්ම ටිකත් හෙළා අවසානයි. එම නිසා ඒ අය ගැන අනුකම්පා කර ඉතා ඉක්මනින් ඔවුන්ට සහනයක් ලබා දෙන ලෙස මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. වෙන් කර තිබෙන මුදල් සියල්ලම මගේ කොට්ඨාශය වෙනුවෙන් වියදම් කරන්නය කියා මම ඉල්ලන්නේ නැහැ. නමුත් ඉතාම අවශ්‍ය පාරවල් ගැන විශේෂ සැලකිල්ලක් දක්වන්න ඕනෑ. ගිනිගත්හේනේ සිට ඇල්ල උඩට යන පාර හැතැප්ම දෙකහමාරක් පමණ දුර කපා සම්පූර්ණ කර තිබෙනවා. මා ඉල්ලා සිටින්නේ ඉතාමත් සාධාරණ විධියටයි. මේ මුදල් වර්ෂය තුළදී ඒ පාරේ තව හැතැප්මක් දුරටවත් වැඩ සම්පූර්ණ කර දෙන හැටියට මම ඉල්ලා සිටිනවා. එසේම ගිනිගත්හේනේ සිට තිනියාගලට යන පාර අද පාලනය වන්නේ ගම්කාර්ය සභා වෙනුයි. නමුත් ඒ පිළිබඳ කටයුතු හරියා කාර නොකෙරෙන නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා, ඒ පාරත් මේ දෙපාර්තමේන්තුවට අරගෙන එය දියුණු කර ඒ ප්‍රදේශයේ ජීවත් වන දුප්පත් ජනතාවට සහායක් සැලසෙන අයුරින් කටයුතු කරන ලෙස.

ගරු සභාපතිතුමනි, ඒ ප්‍රදේශයට තිබෙන තැපැල් පහසුකම් කොහෙත්ම ප්‍රමාණවත් නැහැ. ඇල්ල උඩ ප්‍රදේශයට උප තැපැල් කන්තෝරුවක් ඉතා අවශ්‍යයි. එම නිසා මේ කාරණයට ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වේවායි මම ප්‍රාර්ථනා කරනවා.

මොරහේනේ ගම දැනට තිබෙන උප තැපැල් කාර්යාලයට මම ටෙලිෆෝන් එකක් ඉල්ලා සිටියා. එය ඉතාමත් අවශ්‍ය බව ගරු ඇමතිතුමාට මතක් කරන්ට කැමතියි. එම නිසා අප්‍රමාදවම මොරහේනේ ගම උප තැපැල් කාර්යාලයට ටෙලිෆෝන් එකක් ලබා දීමට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා. එසේම පොල්පිටිය සහ සඟරාපිටිය යන ප්‍රදේශවලටත් ටෙලිෆෝන් පහසුකම් නැහැ. අඩුම ගණනේ පොල්පිටිය උප තැපැල් කාර්යාලය උසස් කර ඒ ස්ථානයටත් ටෙලිෆෝන් එකක් දෙන ලෙස මම තමුන්නාන්සේගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. එම පළාත්වල ජීවත්වන්නන්ට හදිසි පණිවුඩයක් යවාගන්න සිදු වුණු අවස්ථාවන්හිදී බොහෝ අමාරුකම්වලට මුහුණ පාන්නට සිදුවෙනවා. ඒ පළාතේ සිටින කෙනෙකුට මරණයක් සම්බන්ධයෙන් යවන විදුලි පුවතක් වැනි හදිසි විදුලි පුවතක් ගියොත් එය ලැබෙන්නට දවස් දෙක තුනක් පමණ ගතවෙනවා. කරුණු මෙසේ හෙයින් එම තැපැල් කාර්යාලයේ අනිකුත් සුදුසුකම් ගැන වැඩිදුර සොයා නොබලා පළාතේ ජීවත්වන දුප්පත් ජනතාවගේ තත්ත්වය ගැන අනුකම්පා උපදවා ඉතා ඉක්මනින් මේ අඩුපාඩු සම්පූර්ණ කර දෙන හැටියට මා ඉල්ලා සිටිනවා.

පූ. භා. 11.30

ගරු සභාපතිතුමනි, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නොයෙකුත් දූෂණ ක්‍රියා කෙරෙන බව බොහෝ දෙනා විසින් කියන්නට යෙදුණා. එම ප්‍රකාශයන් අප විසිනුත් අනුමත කරනවා. එම නිසා මුදල් අපතේ නොයන ආකාරයට වැඩ පිළිවෙල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේසූරිය මයා.]

සකස් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. දූෂණ ඇති නොවන ආකාරයට වැඩ කරන්න ඕනෑ. අපේ ප්‍රදේශයේ නොයෙකුත් වැඩ කටයුතු සම්බන්ධයෙන් අනවශ්‍ය ප්‍රමාදවීම් ඇති වෙනවා. එසේ වන්නේ කුමන හේතුවක් නිසාද කියා මා දන්නේ නැහැ. ගිනිගත්හේන රෝහලට යාම සඳහා පාරක් වුවමනා බව මා කියා සිටියා. එම ප්‍රදෙශයේ ඉංජිනේරුවන්ද සමග ගොස් ඒ ගැන පරීක්ෂා කර බලා එය ඉතා ඉක්මනින් වුවමනා කරන පාරක්ය කියා මා දන්වා සිටියා. මහපාරේ සිට රෝහලට සැතපුම් $\frac{1}{8}$ කට වඩා දුර නැහැ. පාර වුවමනා කරන්නේ ඒ ටික දුරටයි. නමුත් අද වනතුරුත් ඒ වැඩය කර ගන්න බැරි වී තිබෙනවා. ඒ ගැන ඉක්මනින් විභාග කරන ලෙස මා කියා සිටිනවා. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ "ඩිසෙන්ට්‍රලයිස්" කිරීමේ ක්‍රමය යටතේ කළොත් හොඳයි. ඒ අනුව නුවර ටත් උප අධ්‍යක්ෂවරයෙක් පත්කොට එතුමාගේ භාරයටත් යම්කිසි වැඩ කොටසක් පැවරුවොත් මේ වැඩ කටයුතු වඩා ඉක්මනින් කෙරෙනවා ඇති. හොඳ පිළිවෙලක් අනුව එම වැඩ කටයුතු කරන්න එය එක් මාර්ගයක් වෙනවා ඇති. නුවර කාර්යාලයට උප අධ්‍යක්ෂවරයෙක් පත් කර, භාරදූර වැඩ කොළඹ කාර්යාලයෙන් කරන අතර අනිකුත් වැඩ එම අධ්‍යක්ෂවරයා යටතට පත් කළොත් මේ ඇති වී තිබෙන ප්‍රමාදාදිය නැති කර ගන්නට පුළුවන් වේවි. එම නිසා මේ කාරණය ගැන අපේ ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. ඉතාමත් නොදියුණු තත්ත්වයක තිබෙන අපේ ප්‍රදේශය ගැන විශෙෂ සැලකිල්ලක් දක්වා, අවුරුදු ගණනාවක් තිස්සේ ඒවායේ දුක් විඳිමින් ජීවත්වන අසරණ ගැමි ජනතාවට සහනයක් ලබා දෙන ලෙස මම තමුන්නාන්සේගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මේ සමගම කියන්න කැමතියි, බගවන්තලාවේ සිට පින්නවල දක්වා දැනට මාගීයක් කපා ගෙන යන බව. නමුත් එහි කටයුතු වුව මනාවට වැඩියෙන් ප්‍රමාද වී තිබෙනවා. මේ මාගීය සැතපුම් තුනකට, තුනහමාරකට වඩා දිග නැහැ. නමුත් මේ මාගීයේ වැඩ කටයුතු ඉක්මනින් සම්පූර්ණ කරන්නට පුළුවන් වුණොත් සබරගමු පළාතත් මධ්‍යම පළාතත් සම්බන්ධ කරන්න පුළුවන් වෙනවා. මෙයින් නොයෙකුත් අන්ද මේ ප්‍රයෝජන පළාතේ ජනතාවට ඇති වන බව මා ප්‍රකාශ කරන්න සතුටුයි. මගේ කාලය සීමා වී තිබෙන නිසා මීට වඩා දීර්ඝ ලෙස කථා කරන්න මම බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් තවත් එක් වැදගත් කරුණක් ගැන පමණක් සඳහන් කරන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, කොළොන්නේ ගරු මන්ත්‍රීතුමා (සිරිල් මැතිව් මයා.) මෙම අමාත්‍යාංශයේ වැඩ කටයුතු භාර ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට බරපතළ චෝදනාවක් එල්ල කළා. ඒ සම්බන්ධයෙන් වැඩි යමක් කියන්න මා අදහස් නොකරන්නේ එතුමා එයට නිසි පිළිතුර දුන් නිසයි. ඒ මන්ත්‍රීවරයා චෝදනා නැගුවේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගේ පුත්‍ර රත්නයට උප තැපැල් කාර්යාලයක පත්වීමක් දුන්නාය කියායි. එසේ පත්වීම ලබා දී තිබෙන්නේ එතුමාගේ පුත්‍රයා ඊට සුදුසුකම් ලබා තිබෙන නිසයි. නමුත් අවාසනාවකට වාගේ—කොළොන්නේ ගරු මන්ත්‍රීවරයා කියන විධියට—ඒ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගේ පුත්‍රයා වී සිටීමයි ඔහුට තිබෙන එකම නුසුදුසුකම. මේ විධියේ අයුතු චෝදනා එල්ල කරන තමුන්නාන්සේලාගෙන් මම අහන්න කැමතියි, තමුන්නාන්සේලාගේ පක්ෂයේ නායකයන් අතින්, ඔයිට වඩා බරපතළ චෝදනා නගන්නට පුළුවන් වැඩ සිදු වී නැද්ද කියා.

ගරු සභාපතිතුමනි, මම කිසිම අවස්ථාවක කිසිම පුද්ගලයෙකු හෙළා තලා කථා කළේ නැහැ. එබඳු වැඩ පිළිවෙළක් කවදාවත් ගෙන ගියේ නැහැ. නමුත් තමුන්නාන්සේට කියන්න කැමතියි, අද චෝදනා එල්ල කරන මන්ත්‍රීවරුන්ගේ පක්ෂයෙන් මෙයට වඩා බරපතළ දේවල් සිදු වී තිබෙන බව. [බාධා කිරීම්] මම ඔය පැත්තේ සිටි කෙනෙකු හැටියට, මෑතක් වනතුරු ම ඉතා මත් කිට්ටුවෙන් ඔය පැත්තේ උදව්ය ආශ්‍රය කළ කෙනකු හැටියට, කියන්න පුළුවන්—

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர் குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

මස්සිනා ගැනද කියන්නේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විජේසූරිය මයා.
(திரு. விஜேசூரிய)
(Mr. Wijesuriya)

අවුරුද්දක් පමණ ගත වුණා. නමුත් මෙතෙක් කල් කිසිවකුට චෝදනා සහිතව කිසිවක් කීවේ නැහැ. කිසිම කෙනකුට චෝදනා නොකිරීම මගේ ප්‍රතිපත්තියක් නිසා මේ විධියේ පොඩි දේවල් අල්ලාගෙන අපේ ගරු ඇමතිවරුන්ටත්, පාර්ලිමේන්තු ලේකම් වරුන්ටත්, මන්ත්‍රීවරුන්ටත් චෝදනා එල්ල කිරීම ගැන වචනයක් දෙකක්වත් නොකියා ඉන්න බැරි නිසයි මේ කරුණු පිකවත් ප්‍රකාශ කරන්න කල්පනා කළේ. අවසාන වශයෙන් මා සඳහන් කළ කරුණු ගැන සලකා මගේ කොට්ඨාශයේ ජීවත් වන දුප්පත් අහිංසක ගැමි ජනතාව ගැන විශේෂ ඇල්මක්, විශෙෂ ආදරයක්, ඇති කරගෙන ඒ අඩුපාඩු කම් මඟ හරවා දුන්නොත් ඒ මිනිසුන් අපේ ගරු ඇමතිතුමාට ජාති ජාතිත් කෘතඥ වෙනවාට කිසිම අනුමානයක් නැති බව කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

මාකන්-මාකර් මයා.
(ஜனாப் மாக்கன் மாக்கர்)
(Mr. Macan Markar)

I would like to say a few words in regard to the Public Works Department. There was a one-man Commission of enquiry held about two years ago with regard to allegations of bribery and corruption against certain engineers and subordinate officers of the Public Works Department. While I have nothing to say against the Commission as such, I am of opinion that the line of approach with regard to that enquiry was not quite correct inasmuch as certain of the findings of that Commission have been based on the uncorroborated testimony of contractors. After all, contractors are likely to come up with such evidence only when they cannot get along with engineers. The proper method of approach would have been for the Commission to have found out which of the P. W. D. buildings have been badly constructed, and the enquiry should have commenced from that point to see why certain of the buildings have not been constructed up to specifications or have collapsed within a short time after construction. Instead of taking this line of approach and tracking the engineers responsible for such negligence, to base findings on the evidence of contractors is, I believe, not quite the correct method. However, I am glad that these unfortunate individuals have been given an opportunity of clearing themselves before another tribunal that has been appointed.

Next, I would like to draw the attention of the Hon. Minister to a somewhat invidious comparison that has arisen as a result of the construction of the Aluthnuwara-Padiyatalawa road *vis-a-vis* the Padavia-Pulmootai road. In the case of the Padavia-Pulmootai road, this was done solely by the P. W. D. without outside intervention. The extent of that road is about 18 miles, and though it was estimated to cost Rs. 2 million the actual cost was in the region of Rs. 4 million and the work was completed within two years. On the other hand, in regard to the Aluthnuwara-Padiyatalawa road, which work was done with the contribution made by the United States Operation Mission in the form of machinery, the work was estimated to cost Rs. 4 million but the expenditure has already exceeded Rs. 11 million and the work has not yet been completed, though a period of four years has elapsed since its commencement. I should therefore like to know from the Hon. Minister the reason why there should have been such heavy expenditure on this particular road, and also the long period of time that is being taken over its completion.

ප්‍රූ. භා. 11.45

There was, I think during the time Mr. Henry Abeywickrema was Minister of Transport and Works, a proposal for the decentralization of the functions of the Public Works Department, and to have three separate departments, one for highways, one for water works and the other for buildings. I find that that scheme has been shelved and there is instead one unified department. I feel that what is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෘකන්-මෘකර් මයා.]

more urgent is to see that decentralization of a regional nature takes place. There is undue delay because of the bottleneck that occurs when orders have to be taken from Colombo for the smallest item of work, even for items costing about Rs. 1,000 or Rs. 2,000. Every item in an estimate has to be submitted to Colombo, and it is only when that is approved that the work has to be undertaken. Further, I feel that sufficient stocks of stores should be kept in the regional or district headquarters so that instead of calling for tenders to purchase material from time to time, work could be started without unnecessary delay.

With regard to delays in the telecommunication and postal services, I do not know whether any hon. Member here could give the answer correctly. But it is said that this is due to the misuse of official telephone calls which result in telephone wires getting so clogged that the ordinary subscriber is unable to get through his call. That is the opinion of the All-Ceylon Postmasters Union. We are also told that owing to the number of official letters that are being sent, the postal services are unable to cope with the deliveries ; similarly, official telegrams have a tendency to be too lengthy, and, as a result, there is delay in the transmission of telegrams. However, though we as Members of Parliament are being blamed for making official calls or sending official letters and telegrams, yet I cannot really see that there had been any improvement in these services during the period of the Caretaker regime, that is, when we were not Members of Parliament, when we were fighting elections, and when we had not the privilege of sending official calls or official letters. I do not think there was any substantial improvement of the services then, and I do not think it is fair for the Postmasters' Union or any other union to blame Members of Parliament for the inefficient service that these officers are providing.

With regard to the recruitment of minor staff to the postal departments, it is my feeling that there has been insufficient screening with the result that all sorts of characters are recruited without any regard for their past. You yourself would have noticed the reports in the papers of the number of registered packets, moneys and other valuables that are being lost in the post, stolen or pilfered. I think greater care should be exercised in the recuitment of subordinate officers and I also feel that there should be a greater measure of discipline among these subordinate officers.

The question was raised with regard to an international air service. I do not think it would be advisable for us to actively participate in international air lines. I find that these lines are generally run at a loss. This country can ill-afford to subsidize such a service. However, I feel that once the international airport at Katunayake is completed, steps should be taken to encourage all foreign air lines to touch at Katunayake, so that in course of time we would have a truly international air service and passengers from Colombo would be able to go direct to Leningrad, Vladivostock or New York. I think it would be best to encourage as many air lines to ply services to Colombo from the respective countries rather than for us to participate in any such enterprise. But at the same time we should take every possible step to develop our internal air services.

With regard to the Railway, I must say that I have always received very prompt and satisfactory replies from the department whenever I made any request ; and I have been lucky not to have those requests turned down. I only wish to point out that steps should be taken to ensure that most of the trains run to schedule. In case it is found that the trains are unable to run to schedule, the time table should be so revised as to make sure that the trains reach their destination at the appointed time.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Finally, I must thank the Hon. Minister for sending us a personal letter requesting us to let him know our requirements with regard to postal and telecommunication facilities and other P. W. D. work. I trust that in the course of the financial year he will treat all our requests fairly and squarely.

විජයබාහු විජයසිංහ මයා. (මීරිගම)
(திரு. விஜயபாஹு விஜயசிங்ஹ—மீரிகம)
(Mr. Wijayabahu Wijayasinha—Mirigama)

පසුගිය අවුරුද්ද තුළ මගේ කොට්ඨාශයේ අඩුපාඩුකම් බොහෝ දුරට නැති කිරීම ගැන ගරු ඇමතිතුමාට මා ප්‍රශංසා කරනවා. විශාල උනන්දුවක් දක්වා වැඩ කිරීමෙන් එතුමා ගරු මන්ත්‍රීන් වැඩි දෙන කුගේ හිත් දිනාගෙන සිටින බව ඉතා ගෞරවයෙන් කියන්න කැමතියි. ඒ අතරම එතුමාගේ සැලකිල්ල යොමු වීම සඳහා තවත් කරුණු දෙක තුනක් ඉදිරි පත් කරන්න ඕනෑ.

කොළඹ-නුවර පාරේ අලුත් පාලමක් හදා තිබෙනවා. අවුරුදු සියයකටත් කලින් තැනූ ඒ පාරේ ඒ කාලයේ ගමන් කළ රථ වාහන ගණන මෙන් කිප ගුණයක් දැන් ගමන් කරනවා. කොළඹ සිට මහනුවරට පමණක් නොව කුරුණෑගල, අනුරාධපුරය යාපනය ආදි බොහෝ ස්ථානවලට යන්නේ නුවර පාරේ නිසා පාරේ පටු තැන් පළල් කර දෙන මෙන් ගෞරවයෙන් ඉල්ලනවා. ඒ පාරේ 4 වන 5 වන සැතපුම් කණු අතර කොටස බොහොම පටුයි. තට්ටු දෙකේ බස් මෙන්ම විශාල ලොරිත් මෙහි ගමන් කරන නිසා තවත් පළල් කිරීම අවශ්‍යයි. පසුගිය අවුරුදු පහ තුළ 27 වන හැතැප්ම කණුවටත් 28 වන කණුවටත් අතර කොටසේ හදිසි අනතුරු රාශියක් වුණා. ඊට හේතුව පාරේ පළල අඩි 20 කට 25 කට වඩා නොති බීමයි. කොළඹ සිට මොරටුව දක්වා ගාලු පාර පළල් කර තිබෙන්නාක් මෙන් කොළඹ-මහනුවර පාරේත් වැඩි වශයෙන් රථවාහන ගමන් කරන කොටස පළල් කිරීමට වැඩ පිළිවෙළක් ආරම්භ කර මේ අවුරුද්දේ පුළුවන් තරම් ඉක්මනින් වැඩ පටන් ගන්න ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගම්බද ප්‍රදේශවල තිබෙන රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයත් ඩී. ආර්. සී. සහ පී. ආර්. සී. යන පාරවල් බොහොමයකට ගල් සහ තාර ආදිය දමා සෑදිය යුතුව තිබෙනවා. ගම් රටවල් දියුණු වන්ට දියුණු වන්ට පාරවල් වුවමනායි. එම නිසා එවැනි පාරවලට සෑහෙන මුදලක් යොදා කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනවා. ගම්බද පාරවලට ගල් සහ තාර ආදිය දැමීම සඳහා රුපියල් ලක්ෂ 3 ක පමණ මුදලක් වෙන් කර තිබෙන බව මට ආරංචියි. ඒ වගේම ගම්බද පාරවල් දියුණු කිරීම සඳහා අමෙරිකන් ආණ්ඩුවෙන් තෑග්ගක් වශයෙන් රුපියල් ලක්ෂ 30 මුදලක් ලැබෙන්නට යන බවත් ආරංචියි. එම නිසා ගම්බද පාරවල් ගැන ටිකක් උනන්දුවෙන් කටයුතු කරන ලෙස මා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාශයේ තිබෙන පල්ලෙවෙල දුම්රිය නැවතුම් පොළේ සිට දවසකට මිනිස්සු හාර පන්සියයක් රක්ෂා සඳහා කොළඹට ගමන් කරනවා. මෙම දුම්රිය පොළට බොහොම පහසුවෙන් විදුලිය සැපයීමට පුළුවන්කම තිබෙන නමුත් මේ දක්වා එම ස්ථානයට ලයිට් දමා නැහැ. පල්ලෙවෙල දුම්රිය පොළ ළඟටම විදුලි කම්බි ඇද තිබෙනවා. ඒ වගේම එම දුම්රිය ස්ථානයේ එක් පැත්තක සිට අනික් පැත්තට මාරු වන්නට පාලමක් නැති නිසා රේල් පාර හරහා පනින්නට ඕනෑ. එම නිසා රේල් පාර උඩින් පාලමක් දමා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ වගේම මීරිගම දුම්රිය පොළට ටෙලිපෝන් එකක් නැහැ. බොහෝ දෙනකු දිනපතා ගමන් කරන ඒ ස්ථානයට ටෙලිපෝනයක් ලබා දීම ගැනත් කල්පනා කර බලන ලෙස මා මතක් කර සිටිනවා.

ගුවන් සේවය ගැනත් බොහෝ දුර සාකච්ඡා ඇති වුණා. කොළඹ සිට අම්පාරේ ගුවන් තොටුපළ බලා ගමන් කරන ගුවන් යානයක් කොළඹින් හැතැප්ම 50ක් ඈත් වුණාට පසු, ඒ ගුවන් යානයේ සිට කොළඹ ගුවන් තොටුපොළටවත්, අම්පාරේ ගුවන් තොටුපොළටවත් කථා කරන්නට පුළුවන් කමක් නැහැ. ඊට හේතුව ඒ වායේ සවි කර තිබෙන රේඩියෝ යන්ත්‍රවල බලය අඩු වීමයි. එම නිසා වළාකුළු ඉතා තදින් තිබෙන නුවරඑළිය වැනි ප්‍රදේශ උඩින් ගුවන් යානය පදවද්දී ඒවා පදවන නිලධාරීන්ට ඉතා අනතුරුදායක තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. ඊට හේතුව දැනට තිබෙන රේඩියෝ යන්ත්‍රවලින් දෙපැත්තටම ඒ ප්‍රදේශයේ සිට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයබාහු විජයසිංහ මයා.]

කථා කරන්නට නොහැකිවීමයි. ඒ අන තුරුදායක තත්ත්වය මඟ හැර වීම සඳහා ඒවාට අවශ්‍ය රේඩියෝ උපකරණ ලබා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

ටික දිනකට උඩදී මගේ ප්‍රදේශයේ පිහිටි දෙබහැර කියන ගමට උප තැපැල් කන්තෝරුවක් දීමට තීරණය කළා. ඒ සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවා දැන් මාස ගණනක් ගත වී තිබෙන නිසා එය ඉතා ඉක්මනින් ලබා දෙන ලෙස මතක් කරමින් සහ තමුන්නාන්සේට ස්තුති කරමින් මගේ කථාව නවත්වනවා.

විජයපාල මෙන්ඩිස් මයා. (කටාන)
(திரு. விஜயபால மெண்டிஸ்—கட்டான)
(Mr. Wijayapala Mendis—Katana)

ගරු සභාපතිතුමනි, මා නැඟී සිටියේ මෙම අමාත්‍යාංශය ගැන වචන ස්වල්පයක් කථා කිරීමටයි. අමාත්‍යාංශ අතර මෙම අමාත්‍යාංශය ඉතා වැදගත් අමාත්‍යාංශයක් වශයෙන් අපට සලකන්නට සිදු වී තිබෙන බව කවුරුත් වගේ දන්නවා. විශාල දෙපාර්තමේන්තු රාශියක් මෙම අමාත්‍යාංශය යටතේ තිබෙන නිසා මෙම අමාත්‍යාංශය අන් සෑම අමාත්‍යාංශයකට මත් අවශ්‍යයි. මොන විධියේ උනන්දුවක් ඇමතිතුමා තුළ තිබුණත් එම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු ගණන වැඩි නිසා වන්නට ඇති, ඒ එකක්වත් හරියාකාර ක්‍රියාත්මක කරවන්නට බැරිව ගොස් තිබෙන්නේ. පුළුවන්කමක් තිබෙනවා නම් ඒ අමාත්‍යාංශය යටතේ තිබෙන දෙපාර්තමේන්තුවල වැඩ කටයුතු අනිකුත් ඇමතිවරුන් අතර බෙදා දෙන ලෙස මා පළමුවෙන්ම ඉල්ලා සිටිනවා. එසේ නැත්නම් පුළුවන් විධියකට අනිකුත් දෙපාර්තමේන්තුවලට මේ වැඩ කටයුතු බෙදා දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

රැස්වීම අ. භා. 2 වන තුරු තාවකාලිකව අත්සිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 2 ට නැවත පවත්වන ලදී.

මෙන්ඩිස් මයා.
(திரு. மெண்டிஸ்)
(Mr. Mendis)

ගරු සභාපතිතුමනි, දිවා භෝජනයට කලින් මම මතක් කෙළේ ගමනාගමන ඇමතිතුමාගේ අමාත්‍යාංශය ඉතාමත් විශාල අමාත්‍යාංශයක් හැටියට අපි කවුරුත් සලකන බවයි. දෙපාර්තමේන්තු රාශියක්ම එම අමාත්‍යාංශය යටතේ තිබෙනවා. විශේෂයෙන්ම අපේ කොට්ඨාශය ගැන කල්පනා කර බලන විට ඇහැට කණට පෙනෙන්න, මහජනයාට පෙනෙන්න, මහජනයාට නියම ප්‍රයෝජනයක් ලැබෙන විධියේ වැඩ රාශියක් කරන්න පුළුවන් අමාත්‍යාංශයකුයි මේ ගරු ඇමතිතුමා යටතේ තිබෙන්නේ. එම අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු රාශියක් තිබෙන නිසා සෑම කොට්ඨාශයකටම වුවමනා කරන සෑම අවශ්‍ය කටයුත්තක්ම හරියාකාර යුහු සුලුව ඉක්මනින් කර ගන්න අමාරු බවක් අපට පෙනෙනවා.

අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) ඉතා වැදගත් ප්‍රශ්නයක් මතු කළා. මේ සම්බන්ධයෙන් අපි සෑමදාම කච්චේරිවල ප්‍රාදේශීය කෘත්‍යාධිකාරි මණ්ඩලවල සාකච්ඡා කරනවා. දුම්රිය දෙපාර්තමේන්තුව මගින් කෙරිය යුතු විශාල වැදගත් කටයුත්තක් තමයි, දුම්රිය පාරවල් හරහා තිබෙන මහා මාර්ගවලට රේල් ගේට්ටු දැමීම. ප්‍රසිද්ධ මාර්ගවල අවශ්‍ය තැන්වලට රේල් ගේට්ටු නොදැමීම නිසා මේ රටේ ඉතාමත් භයානක අනතුරු රාශියක් සිද්ධ වී තිබෙන බව අපි දන්නවා. එවැනි ගේට්ටුවක් විශේෂයෙන්ම අවශ්‍ය ස්ථානයක් මීගමුවේ නගරයේ තිබෙනවා. "සෙරමික්" fපැක්ටරිය අසලින් මහ මාගීය හරහා දුම්රිය පාර තිබෙනවා. ඒ ස්ථානයේ පාසැල් ළමයින් රාශියක් නිතරම එහා මෙහා යනවා. මේ ස්ථානයේ අනතුරු රාශියක්ම සිද්ධ වී තිබෙනවා. පසුගිය දීර්ඝ කාලය තිස්සේ එම ස්ථානයට රේල් ගේට්ටුවක් සවි කර දෙන්නය කියා අපි ඉල්ලා සිටියා. නමුත් සෑහෙන නියම පිළිතුරක් අපට ලබුණේ නැහැ. එම නිසා දුම්රිය දෙපාර්තමේන්තුව කොපමණ පාඩු වින්දත්, නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා (විලියම් ප්‍රනාන්දු මයා.) කිව්වා වගේ, ඊරි යකා මුදල් කනවා පමණක් නොව මේ විධියේ අනතුරු මහජන ජීවිතවලටත් කරන නිසා,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(Mr. D P. R. Weerasekera)

That is a bigger elephant. A young and trained tusker was bought by the head priest of the Bellanwilla temple for Rs. 7,000 when there was an immediate offer by one Mr. Ratwatte for a higher amount.

I trust that at least now the Hon. Minister—I am not making any allegation against him : he is guided by the answers given him by the Director—will realize that there is something in what I say. I am not making any wild allegations. I will show you documents which will prove that the value of a Ceylon elephant in Europe is Rs. 18,000. I am ready to prove that these elephants did reach the Torrino dealer. I am also ready to prove that while we have associations with some of the world's recognized zoos, we are dealing with a Torrino dealer who is nominally a proprietor of a zoo but has only a few cages. He is just a middle man. I went to Torrino myself because I wanted to prove my point. There is no zoo belonging to that gentleman. He merely arranges to transport the animals to another and makes a profit on the transaction. He does not even take the risk of keeping the animals.

I also wish to say a word about the victimization of the staff at the Dehiwala Zoo. I think the hon. Member for Bulathsinhala (Mr. Edmund Samarakkody) knows about it, because the staff first brought the matter before him. They came to me as well. I attended one of their meetings. Merely because they had invited a Government M.P. to their

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. වීරසේකර මයා.]

meeting, they were victimized. When they came to see me with the complaint that they were victimized, I was foolish enough to advise them to see the Hon. Minister. I brought three of them to meet the Hon. Minister and handed their petition to him. That very day they were called to give an explanation for having gone to see the Hon. Minister without the Director's permission. They had taken leave during their off-time to go and see the Hon. Minister. I do not think there is anything wrong in their going to see the Hon. Minister personally and explaining their difficulties. I do trust that something will be done about the victimization that is going on there.

There is one other point I wish to clarify. I have sometimes criticised people rather severely. I understand that one of the U. N. P. members has made various allegations about my having made those criticisms. I intend coming into the open next week and criticising certain individuals of the Tourist Board. I shall put it on paper in order that it may not be alleged that I am hiding behind Parliament. If what I am saying is wrong they can sue me. That is a different question. I made the allegation that the Director of the Zoo is up to shady business, and, if necessary, I will put it on paper. As a matter of fact, I made certain allegations at a public meeting held in connection with the municipal elections. If I had made any false allegations, I wonder why the Director did not sue me. There were thousands of people who heard me making those allegations.

An allegation was made against a Junior Minister. I wish to state quite categorically that we, on this side of the House, too, welcome an inquiry. I assure you that if this allegation is proved to be well founded, we ourselves will bring pressure to bear on our Junior Minister to resign. We are not going to tolerate—personally I will not—any fraud or corruption on the part of any Member be he, on this or that side of the House. It does not matter to us whether it is a Minister or Member of our party who is found guilty: we will see that he resigns. I am glad that the hon. Member for Senkadagala (Mr. Ranaraja) expressed his views on this subject. We will not hesitate to do our best to bring pressure to bear on those who are found guilty. As he said, we will see that the name of our Government and our party is cleared.

I now wish to make a few remarks about my electorate. I am thankful to the Hon. Minister for taking steps to provide a road to Theppanawa. That was a request that had been made by this electorate to Members of Parliament for the last 15 years. There is a population of 8,000 people there, and the closest road is about four miles away. I have myself walked that distance. There is no other access at all. There is plenty of land there, but nothing can be developed without this road. I am also glad that the Hon. Minister has promised to give priority to the Eratne road, work on which is in progress. I thank him for that.

As regards the provision of telephone facilities to Theppanawa, the Hon. Minister will remember that he promised to get the work done in this connection two months ago. But there has been some delay. I hope that he will look into this question and see that the matter is expedited.

As a Backbencher of the Government, I must express what I feel is the view of my Colleagues on the back benches. The one Minister who can do most to solve the unemployment problem and develop this country is the Hon. Minister of Transport and Works. I assure him that, if there is anything we can do to help him, we will do it, and we expect in turn that he will do his best to develop this country.

There is one matter I would like to mention on the Floor of this House. I understand that a foreign Government has offered Rs. 6 million for the development of our rural roads. I learn that, acting on the opinion of some high-ups in the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Government or some Hon. Ministers —I do not know who they are— there is a move to see that this money is utilized to bridge the Budget deficit. I earnestly appeal to the Government and the Hon. Ministers to see that this Rs. 6 million is used for the development of our rural roads and for no other purpose. We, as Backbenchers, will do all that is in our power to see that this money is used by the Hon. Minister of Transport and Works and by no one else.

රොමානිස් මයා.
(திரு. ரொமானிஸ்)
(Mr. Romanis)

ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ මාත් වචන ස්වල්පයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. ගම්බද පාරවල් දියුණු කිරීමෙන් රටේ ආර්ථික සංවර්ධනයට රුකුලක් ලැබෙනවා. බොහෝ සෙයින්ම ගම්බද පළාත් නොදියුණු තත්ත්වයක පවතින්නේ ගමනාගමන පහසුකම් නැති නිසයි. ගම්වල නිපදවන ද්‍රව්‍ය වෙනත් ප්‍රදේශවලට ගෙන ගොස් විකුණා ගැනීමට හොඳ පාරවල් ඕනෑමයි.

අ. භා. 3.30

ගරු ඇමතිතුමා කුරුණෑගලට ගිය අවස්ථාවේ ඒ ඒ ජන්දදායක කොට්ඨාශවල අඩු පාඩු එතුමාට පෙන්වා දුන්නා. ඒ අවස්ථාවේ එතුමාගෙන් අපට ලැබුණු පිළිතුරේ හැටියට එතුමා කිව්වෙ 1960-61 ආදායම් වර්ෂය තුළ ඒවා කර දෙන්න වුවමනා මුදල් වෙන් කර නැති බවයි. 1961-62 වර්ෂය සම්බන්ධයෙනුත් ඒ විධියටම කියන්න ඉඩ නොතබන මෙන් මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. මා නියෝජනය කරන කොට්ඨාශයේ වැඩි දියුණු කළ යුතු පාරවල් කිහිපයක්ම තිබෙන නමුත් පසු ගිය කාලවලදී යම් යම් හේතු නිසා ඒවා සකස් කිරීම අතපසු වී ගොස් තිබෙනවා. රා ගෙදර-බඳුරාගොඩ පාර රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් භාර ගන්නා ලෙස මා ඉල්ලුවා. නැවතත් ඒ ඉල්ලීම අලුත් කරන්න කැමතියි. ගම් 20 ක පමණ සිටින 5,000 ක් පමණ ජනකායකට මේ පාරෙන් විශාල සෙතක් ඇති වෙනවා. මෙවැනි පාරක් දියුණු නොකර තිබීම ආණ්ඩුවටත් නින්දාවක් බව කියන්න පුළුවනි. එසේ කියන්නේ මේ ගම්වල ජනයාට පාවිච්චි කරන්න තිබෙන එකම පාර මෙය නිසයි. මේ පාර හැදීම ඒ තරම් අමාරු නැහැ. අවුරුද්දකට හැතැප්මක් බැගින් හෝ වැඩි දියුණු කරන ලෙස මා ඉල්ලනවා. කවිසිගොමුව-මල්ලියගොඩ පාර 15,000 ක ජනගහනයකට ප්‍රයෝජනවත් වන පාරක්. ඒ පාර සඳහා රජයේ වැඩ දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු පිළියෙළ කර දැන් අවුරුදු 4 ත් වැඩි කාලයක් වෙනවා. නමුත් තවමත් මුදල් වෙන් කර නැති නිසා වැඩ කරන්න බැරි බවයි, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමා කියන්නෙ. සෑම දවසකම මේ මුදල් නැති ප්‍රශ්නයම ඉදිරිපත් කරමින් මෙම සංවර්ධන කටයුතු නොකර හැරීම ආණ්ඩුව කෙරෙහි පැවතුණ මහජන ප්‍රසාදය නැති වීමට හේතුවක් වෙනවා. ඒ පළාත්වල මිනිසුන් කියන්නේ මේ ආණ්ඩුව අලුත් ක්‍රමයකට දැන් පාරවලට පොල් ලෙලි දමා සාදනවාය කියායි. ඉස්සර නම් ගලුයි, තාරයි දැම්මාය, මේ ආණ්ඩුව ආවාට පස්සේ පාරවල් හදන්නේ පොල් ලෙලි දැමීමෙන්ය, කියා කියනවා.

ඩී. පී. ආර්. වීරසේකර මයා.
(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)
(Mr. D P. R. Weerasekera)

ඇයි පැපොල්වලින් ?

රොමානිස් මයා.
(திரு. ரொமானிஸ்)
(Mr. Romanis)

පැපොල්වලින් කරන එකවත් තමුන්නාන්සේ දන්නේ නැහැ, පැපොල් කන්න මිසක්. එපමණයි, තමුන්නාන්සේ දන්නේ. මම නම් දන්නවා, පැපොල්වලින් සල්ලිවත් හම්බ කර ගන්න. තමුන්නාන්සේ දන්නේ කන්න විතරයි.

අපට වුවමනා කරන්නේ එක එක පක්ෂයට කෑ ගැසීම නොවෙයි. අප විසින් කළ යුත්තේ අප කවුරුත් එකතු වී රටේ සංවර්ධනය උදෙසා වැඩ පිළිවෙළක් සකස් කිරීමයි. සෑම වැඩකටම තමුන්නාන්සේලා යූ. එන්. පීයට දෙස් කියනවා. කක්කුස්සියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රොමානිස් මයා.]

ගිහින් එළිය යන්න ටිකක් අමාරු වුණාම තමුන්නාන්සේලා ඒකටත් දොස් කියන්නේ යු. එන්. පී. එකටයි. ඒක නොවෙයි ප්‍රශ්නය. රටට වුවමනා කරන, ඒවාගේම මහජනයාට වුවමනා කරන යම් කිසි සංවර්ධන වැඩක් තිබෙනවා නම් අපි සෑම දෙනාම සාකච්ඡා කර එය සපුරා ලීමට කටයුතු කිරීමයි, අප විසින් කළ යුත්තේ. එසේ නැතිව එක එක පක්ෂයට පහර ගැසීමෙන් රටේ සංවර්ධනයක් ඇති වන්නේ නැහැ. තමුන්නාන්සේලාට වාගේම විරුද්ධ පක්ෂයටත් අයිතිවාසිකමක් තිබෙනවා, තම තමන්ගේ ප්‍රදේශවල තිබෙන අඩුපාඩු පෙන්වා දීමට. ඒ අඩුපාඩු ගැනයි, මම මේ කරුණ ඉදිරිපත් කරන්නෙ. එවැනි අවස්ථාවකදී තමුන්නාන්සේලා විසින් කළ යුත්තේ ඊට සමව් වල් කිරීම නොවෙයි. අපි අපේ පෞද්ගලික කරුණු ගැන කථා කරනවා නම් අපට එළියට ගිහින් කථා කරන්න පුළුවනි.

එක කථාවක් තිබෙනවා, ලිහලා බැලුවොත් කොයි බුලත් පයිවලත් හුණු කැට තිබෙනවාය කියා. ඒ නිසා ඒවා ලිහන්න අපට වුවමනාවක් නැහැ. තම තමන්ට වුවමනා දේවල් ගැන පමණක් අපිත් කථා කරන්න බලාපොරොත්තු වනවා මිසක් අපි එක එක්කෙනාට පහර ගසන්නට සූදානම් වන්නේ නැහැ. නමුත් අපට පහරක් ගැසුවොත් ඊට ප්‍රති පහරවල් ගසන්න අපටත් පුළුවන් බව මම කියන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, කවිසිගමුව-මල්ලිය ගොඩ පාර අද තිබෙන්නේ ඉතාමත්ම දුර්වල තත්ත්වයක බව ගරු ඇමතිතුමාට මතක් කරන්නට සිදු වී තිබෙනවා. මට නම් ඒ පැත්තේ යන්නත් බැහැ. ඇත්ත වශයෙන්ම ඡන්ද කාලයේදී කාර් එකෙන් ගියත් මඩවළවල් නිසා දැන් පයින් මිසක් ඒ පාරේ වාහනයකින් යන්න බැහැ. ඒ පාර බස් ධාවනය කිරීමට ඉතා මත් අවශ්‍ය පාරක්. එවැනි පාරවල් දියුණු කර දීම තමුන්නාන්සේලා කරන්නේ මහජනතාවටයි. ගමන් පහසුකම් සලැස්වීම මහජනතාවට කරන සේවයක් මිස යු. එන්.පීයට කරන සේවයක් නොවෙයි. මම ඉල්ලා සිටින්නේ මගේ පෞද්ගලික දෙයක් නොවෙයි. එම නිසා කවිසිගමුව-මල්ලියගොඩ පාර අඩු වශයෙන් සැතපුම් දෙකක්වත් මෙම ආදායම් වර්ෂය තුළ ප්‍රතිසංස්කරණය කිරීමට මුදල් වෙන් කර දෙන හැටියට මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. තමුන්නාන්සේගේ පාර්ලිමේන්තු ලේකම්තුමා මගේ ඡන්ද කොට්ඨාශයේ තිබෙන තැපැල් කන්තෝරු දෙකක් විවෘත කරන්න හෙට එනවා. තමුන්නාන්සේ සාධාරණව වැඩ කටයුතු කරන කෙනෙක් යයි මා තුළ හැඟීමක් තිබෙනවා. [බාධාකිරීමක්]. කල් යාමේදී එය කොයි අතට හැරේවිද කියා මම දන්නේ නැහැ. ඒ නිසා ඉදිරි වර්ෂය තුළ තමුන්නාන්සේ කරන වැඩ ටික බලා ප්‍රශංසා කරනවා නම් හොඳය කියා මා කල්පනා කරනවා.

විශේෂයෙන් එක් කාරණයක් තමුන්නාන්සේට මට මතක් කරන්න තිබෙනවා. උප තැපැල් කන්තෝරුවක් පිළිබඳව කලකට උඩදී මා තමුන්නාන්සේ සමග සාකච්ඡා පැවැත්වූ වේලාවේදී කන දෙණියාවල තැපැල් කන්තෝරුවක් පිහිටුවීමට ඉල්ලුම් පත් කැඳවා තිබෙන බවත් වුවමනා නම් අළුතෙන් ඉල්ලුම් පත්‍ර කැඳවන්න පුළුවන් බවත් කීවා. මට කරදර කරන්නේ නැතිව කැඳවා තිබෙන ඉල්ලුම් පත්වලින්ම තෝරා ගන්නය කියා මා තමුන්නාන්සේට කිව්වා. මා මේ කියන්නේ පැමිණිල්ලක් වශයෙන් නොවෙයි. හෙට විවෘත කරනු ලබන්නේ එදා ඉල්ලුම් පත් කැඳවා තිබූ කනදෙණියාවල තැපැල් කන්තෝරුව නොවෙයි. ඒ නිසා මෙය මෙතරම් කල් ප්‍රමාද වන්න ඇති හේතුව කුමක්ද කියා සෝදිසි කර බලන මෙන් තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

අපේ දුම්රිය සේවයේ තිබෙන දුර්වලකම් පිළිබඳව මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම කරුණු සඳහන් කරන්න යෙදුණා. දුම්රිය සේවයේ දුර්වලතාවන් කීපයක්ම තිබෙන බව මාද පිළිගන්න නිසා එම අදහස් සම්පූර්ණයෙන්ම අනුමත කරනවා. දුම්රිය සේවය මහජන මුදල් නාස්ති කරන සුදු අලියෙක් වී තිබෙනවා. එන්ට එන්ටම මෙම සේවය ජනප්‍රියතාවයෙන් ඈත් වී යන බව තමුන්නාන්සේට වැටහෙන්න ඕනෑ. මෙම ජාතික ව්‍යාපාරය කඩාකප්පල් වී යන්න පුළුවන් තරම් විශාල පාඩුවක් මෙයින් සිදු වන බව මට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහන් කරන්න වී තිබෙන්නේ ඉතාමත් ම සංවේගයෙනුයි. දුම්රිය මැදිරිවල තිබෙන අපිරිසිදු භාවය නිසාත් කාල සටහන අනුව දුම්රිය ධාවනය නොකිරීම නිසාත් බොහෝ දෙනා අද දින දුම්රියෙන් ගමන් කරන්න මැළි වන බව පැහැදිලි කරුණක්. අතිකාල දීමනා සම්බන්ධයෙන්ද තමුන්නාන්සේලා මතක් කරන්න යෙදුණා. දුම්රිය සේවකයින්ට පමණක් නොව බස් සේවයේ යෙදී සිටින අයටද අතිකාල දීමනා වශයෙන් රුපියල් ලක්ෂ ගණනක් වියදම් කරන්න සිදු වෙනවා. ඒ නිසා අතිකාල දීමනා දීමේ ක්‍රමය නතර කොට අළුතෙන් සේවකයන් බඳවා ගනු ලැබුවහොත් කීප දෙනකුට හෝ රක්ෂාවක් සපයන්ට පුළුවන් වේවි. ඒ නිසා මේ කාරණා කෙරෙහිද තමුන්නාන්සේගේ අවධානය යොමු කරන හැටියට මා ඉල්ලා සිටිනවා. රටක් දියුණු කිරීමේදී ගමනාගමන පහසුකම් සැලසීම ආණ්ඩුවක් සතු විශාල යුතුකමක්. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු පෙනී සිටින කොට්ඨාශයකට තමුන්නාන්සේලා වෙනස්කමක් කොට, "යූ. එන්. පී. කාලයේදී ඒ අය කළේ මේ අන්දමටයි; ඒ නිසා අපිත් කරනවා" ය කියා කීම තමුන්නාන්සේලාගේ නිදහසට කාරණයක් නොවෙයි. තමුන්නාන්සේලාගේ සාධාරණත්වය පෙන්වීමට නම් ඊට ප්‍රතිවිරුද්ධව තමුන්නාන්සේලා ක්‍රියා කරන හැටියට මා ඉතා ගෞරවයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසාන කරනවා.

ඩී. ටී. පස්කුවල් මයා. (පළාත් පාලනය හා නිවාස කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. டீ. ரி. பஸ்குவல்—உள்ளூராட்சி, வீட மைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)

(Mr. D. T. Pasqual—Parliamentary Secretary to the Minister of Local Government and Housing)

ගරු සභාපතිතුමනි, මා නැගිට සිටියේ වැඩි දීර්ඝ කථාවක් කරන්නට නොවෙයි. මා අදහස් කරන්නේ ගරු ඇමතිතුමා යටතේ තිබෙන රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් කළ යුතු, කාලයක් තිස්සේ අතපසු වී තිබෙන වැඩ කටයුතු කීපයක් ගැන ගරු ඇමතිතුමාට මතක් කරන්නටයි. බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) විසින් සඳහන් කරන්නට යෙදුණු කලවැල්ලාව පාලම සම්බන්ධයෙන් කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන්ගේ සම්බන්ධතා කාරක සභාවේදී ගරු මන්ත්‍රීවරු කවුරුත් වගේ පිළිගත්තා, එය ඉතා අවශ්‍ය වැඩක් වශයෙන් සලකා කළුතර දිස්ත්‍රික්කයේ පාලම් තැනීමේදී පළමුවෙන් ම ඒ ගැන ක්‍රියා කළ යුතු බව. ඒ ගැන විශේෂ සැලකිල්ලක් දක්වන ලෙස මාත් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මතුගම හරහා යන ප්‍රසිද්ධ පාර නාගොඩ-කලවැල්ලාව පාරයි. ඒ පාරේ මතුගම නගරය තුළින් ගමන් කරන කොටස ඇතුළත අවුරුදු සියයකටත් අධික කාලයක පටන් තිබෙන රජයට අයත් ඉඩම් තීර දෙකක් පාර දෙපස තිබෙනවා. අඩි 80 ක විතර පළල් පාරක් සෑදීම සඳහා ඈත කාලයේදී "රිසර්වේෂන්" බිම් තීරයක් පාර දෙපස ඉතුරු කර තිබෙනවා. එහෙත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් හෝ දිසාපතිතුමාගෙන් හෝ නගර සභාවෙන් හෝ එම ඉඩම් පාලනය වන නියමිත වැඩ පිළිවෙලක් නැතිකම නිසා නිරන්තරයෙන්ම එම ඉඩම් එක එක්කෙනාගේ ඕනෑ එපාකම් අනුව ගොඩනැගිලි සෑදීමට හා වැවිලි ඇති කිරීමට යොදා තිබෙනවා. එම නිසා නගර සභාවට විශාල කරදරයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. පසුගිය දවස්වල ඩිපියුටි සොලිසිටර් ජෙනරල් ධුරය දැරූ අමීර් මහතාගේ පියා විසින් දැන් ඒ ආරක්ෂිත බිම් තීරය අසුවන පරිදි ගොඩනැගිලි පේළියක් සදාගෙන යනවා. ඒ වගේම මතුගම කතෝලික පල්ලියත් ඒ පාරට අයිති ඉඩම් තීරය අල්ලාගෙන තිබෙන අතර, එහි කාර් නතර කිරීමට කාර් පාර්ක් එකක් සෑදීමටවත් ඉඩ දෙන්නේ නැහැ. පුළුවන් අය එසේ කරද්දී දැනට අවුරුදු 60 ක 70 ක සිට දුප්පත් අය විසින් වවාගෙන ආ පොල් ගස්, දෙල් ගස්, කොස් ගස් ආදිය රජයේ නිලධාරීන් විසින් හිතුමතේ කප්පවා දමා තිබෙනවා. ඔවුන්ට කිසිම වන්දියක් ඒ සඳහා දුන්නේ නැහැ. ධනවතුන්ට හිතුමතේ ගොඩනැගිලි සදන්නට ඉඩ දී තිබෙන අතර දුප්පතුන්ගේ දේ කොල්ලකා ගැනීමට ඉඩ දී තිබීම ඉතා කනගාටුදායකයි.

මතුගම හරහා ගොස් තිබෙන උදවිය දන්නවා ඇති, එය හතර මංසන්ධියක් බව. ඉරිදා දිනවල විශාල ජනකායක් රැස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පස්කුවල් මයා.]

වන පොළක් එහි තිබෙනවා. ඒ නගරය ඇතුළත බස් රියකට හෝ වෙන යම් මෝටර් රථයකට අසු වී කෙනකුට තුවාල නොවන එකම සතියක්වත් නැහැ. මෙම පාර පළල් කළ යුතු බව ඒ පළාතේ පොලිස් අධිකාරිතුමාත් කියා තිබෙනවා, අපිත් ඉල්ලා තිබෙනවා. දිසාපතිවරුන් සතියකට පමණ වරක් පැමිණ සාකච්ඡා කර බලන නමුත් කිසි තීරණයක් ගන්නේ නැහැ. ඒ වගේම එම රිසවේෂන් එක ඇතුළත ගොඩනැගිලි සෑදීම සඳහා ඉදිරිපත් කරන සැලැස්මවල් ප්‍රමාද කරන්නට නගර සභාවට සිදු වී තිබෙනවා. එම නිසා නගර වැසියන්ගෙන් අය කරන අයබදු මුදල් නීතිය සම්බන්ධයෙන් වියදම් කරන්නට සිදු වී තිබෙනවා. තව දුරටත් මෙම කරුණු ප්‍රමාද වන්නට ඉඩ නොතබා ඉතා අවශ්‍ය දෙයක් හැටියට සලකා සීඝ්‍රයෙන් දියුණු වෙගන යන මෙම නගරය තද බදය අඩු වන අයුරු යාම් ඊම් පහසුකම් ඇති වන සේ මතුගම නගරය ඇතුළත හැතැප්ම භාගයක පමණ ඒ ප්‍රමාණය නියමිත පළලට සකස් කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ඒ වගේම හොරණ-අලුත්ගම පාරේ මූණමල්වත්ත ඇළ හරහා යොදා තිබුණු පාලම දැන් මාස 5 කට පමණ උඩ දී ප්‍රතිසංස්කරණය කිරීමට ගැලෙව්වා. මාස තුනකින් එහි ප්‍රතිසංස්කරණ වැඩ අවසාන කරන අදහසිනුයි, එසේ ගැලෙව්වේ. පාලම ගැලෙව්වායින් පසු අලුත්ගම සිට ඇලේ එක් පැත්තකට බස් එකක් ගමන් කරනවා. එතැන සිට තවත් බස් එකක් මතුගම දක්වා ගමන් කරනවා. පාලම ගැලවුවාට පසු මගීන්ට කරදරයක් සිදු වුණු නිසා වන්නට ඇති—අලුත්ගම සිට මතුගමට කලින් බස් ගාස්තුව අය කළේ ශත පණහයි. දැන් සත දහයක් වැඩියෙන් අය කරන්නේ. බස් දෙකකින් යද්දී එක බසයකින් යද්දිට වඩා වැඩි මුදලක් ගෙවන්නට සිදු වී තිබෙනවා.

අ. භා. 3.45

නිලධාරීන් නොසැලකිලිමත් අන්දමට කටයුතු කරන නිසා මහජනයා දෙස් කියන්නේ ආණ්ඩුවටයි. තුන් මාසයකින් සඳනවාය කී පාලම අඩු ගණනේ හය මාසයකින්වත් සඳනවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා. සිරිකඳුර ඇළ හරහා ඇති පාලමත් කඩිත්තමංකඩ පාලමත් දැන් දුර්වල වී තිබෙනවා. එක පාලමක් සදා ඉවර වූ හැටියේම ගළවා හැළුණා. මේ විධියට දැන් තුන් වැනි වරටත් කඩා වැටී තිබෙනවා. කලවැල්ලාව-නාගොඩ පාරේ 11 වැනි සැතපුමෙහි මැණික්ගොඩ ඇලේ පාලමෙහි අඩිතාලමේ දෝෂයක් නිසා දැන් ඇළ කණ්ඩිය දෙපැත්තෙන්ම කඩාගෙන ගොස් ගේ දොරට ගහ කොළට විශාල ලෙස හානි වී තිබෙන බව කිව යුතුයි. මේ කාරණය ගැන විධායක නිලධාරිතුමාටත් මතක් කළා. එහෙත් කැඩීගෙන යන අංශය ශක්තිමත් කිරීම සඳහා තවම කටයුතු යොදා නැහැ.

මීට අවුරුදු දෙක තුනකට පෙර රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ගැනීමට කටයුතු පිළියෙල කරන ලද මතුගම-බෝපිටිය පාරත්, පාන්තිය-වෙල්ලත පාරත් තවම එම දෙපාර්තමේන්තුවට භාර නොගෙන තිබීම ගැන ගරු ඇමතිවරයා පරීක්ෂා කර බලනවා ඇතැයි මා කල්පනා කරනවා. 1957-58 කාලයේදී අවුරුද්දකට හැතැප්ම තුනක් ගැනීමේ ප්‍රතිපත්තිය උඩ මෙම පාරවල් දෙක වැඩ දෙපාර්තමේන්තුවට දෙන්නට කටයුතු පිළියෙල කරන්න යෙදුණා. එහෙත් තවමත් දිග පළල හොයනවා මිස මෙම පාරවල් දෙක පවරාගෙන නැහැ.

නාගොඩ-තෙබුවන පාරේ බෝඹුවල කඩ මණ්ඩිය අසල ලොකු තදබදයක් තිබෙනවා. එහි පාර පටුයි. එහෙත් තවමත් මෙය මේ සේම පවතින්ට ඉඩ හැර තිබෙනවා.

මතුගම තැපැල් කන්තෝරුව පවතින්නේ ඉතාමත් නුසුදුසු තත්ත්වයක. ගොඩ නැගිල්ල ඉතා කුඩායි. නිලධාරීන්ටත් සේවකයන්ටත් වැඩ කිරීම සඳහා ආලෝකයක් නැහැ. මතුගම විදුලි ආලෝකය ලැබී ඇති ප්‍රදේශයක් වුණත්, මෙම තැපැල් කාර්යාලයට තවම විදුලි ආලෝකය නැහැ. මේ තැපැල් කාර්යාලය තිබෙන්නේත් පෞද්ගලික ගොඩනැගිල්ලක. ගොඩනැගිල්ලක් සෑදීම සඳහා ඉඩමක් ගැනීමට අවුරුදු හතරක පහක සිට කල්පනා කළත්, සාකච්ඡා කළත්, තවම එය ඉටු වී නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ වර්ෂය තුළදීවත් ඉඩමක් ලබාගෙන ගොඩනැගිල්ල තනා දෙනවා ඇතැයි බලා පොරොත්තු වෙනවා.

මීගම, රෙමුණාගොඩ, ගමගොඩ, කිරන් තිඩිය-කාලවිල යන උපතැපැල් කාර්යාල වලට තවම ටෙලිෆෝන් පහසුකම් සලසා නැහැ. වැඩිපුර ගාස්තු ගෙවීමට සිදු වීම නිසා ටෙලිෆෝන් පහසුකම් ලබාගෙන තුබුණු උදවිය බොහෝ දෙනකු එම පහසු කම් අතහැර දමා තිබෙන හෙයින් මෙම උපතැපැල් කන්තෝරුවලට දැන් ටෙලි ෆෝන් පහසුකම් සලස්වන්ට පුළුවනි. ඒ නිසා එසේ කරන ලෙස ඉල්ලා සිටිනවා.

1951 සිටම මතුගම තැපැල් කාර්යාලයේ ටෙලිෆෝන් පහසුකම් වැඩි කරන ලෙස අප ඉල්ලා සිටියා. නමුත් "ස්විච් බෝඩ්" එක ඉඩකඩ මදි බව කියා එම පහසුකම් ප්‍රමාද කළා. එසේ වෙතත්, දැන් සමහර පෞද්ගලික ටෙලිෆෝන් අත්හැර දමා තිබෙන නිසා එම පහසුකම් ඇති කළ හැකියි. එහෙයින් ඉක්මන් කර එම පහසු කම් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. කාර්යාලයක එක තැනක සිට තවත් කාමර යකට ටෙලිෆෝන් පහසුකම් දීමේදී වුණත් "වේටිං ලිස්ට්" එකේ හැටියට මිස නොදිය හැකි බව කියනවා. මම දන්නේ නැහැ. පාරි භෝගිකයකු වශයෙන් සිටින පුද්ගලයෙක් තම කාර්යාලයේ තවත් අංශයකට ටෙලි ෆෝන් දික්කර ගැනීමේදී එවැනි ප්‍රමාද යන් කිරීම සුදුසුද කියා.

රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් පාලනය වන, විශේෂයෙන්ම නගර තුළ ඇති, පාරවල කානු හැරීම හා දෙපස සෝදා යෑම වැළැක්වීම ආදී නඩත්තු කිරීම් ඒ ඒ පළාත් පාලන ආයතනවලට භාර දී, මේ අමාත්‍යාංශයෙන් දැනට ග්‍රාම සංවර්ධන සමිතිවලටත් සමුපකාර සමිතිවලටත් ආධාර දී කරවන්නාක් මෙන්, කරවන්ට බැරි මන්දැයි මම දැන ගන්නට සතුටුයි. කොළඹ නගරයට තමුන්නාන්සේ ආධාර දෙන්නාක් මෙන් සුළු නගර සභාවලටත් අනිකුත් පළාත් පාලන ආයතනවලටත් තම ප්‍රදේශ සීමාව තුළ තිබෙන අඩු ගණනේ රජයේ වැඩ දෙපාර්තමේන්තු වෙන් පාලනය වන පාරවලවත් කානු පිරිසිදු කිරීම හා දෙපස සකස් කිරීම ආදී වැඩ සඳහා ආධාර දෙනවා නම් දැනට වඩා ඉක්මනින් ඒ කටයුතු කිරීමටත් පාරවල් හොඳින් පවත්වා ගැනීමටත් පුළුවන් වෙනවා.

මීට වඩා කථා කිරීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් පාරවල් සම්බන්ධයෙන් මතක් කළ යුතු තවත් කරුණක් තිබෙනවා. අපි බලාපොරොත්තු වුණා, පළාතෙට-කෙත්හේන පාර ගංවතුරට යටවීමෙන් වැළැක්වීම සඳහා බැම්මක් බඳිය කියා. නමුත් ඒ බැම්මේ වැඩ නොකෙරුණු නිසා ඒ බස් යන පාර දැනට ගංවතුරට යට වෙනවා. උක්වත්තේ පාලමේ සහ බොලොස්සගම පාලමේ තවමත් තිබෙන්නේ ලෑලියි. ඒවා නියම විධියට සකස් කොට ගංවතුරට යට වන ප්‍රදේශ උස්කර ගමනාගමන පහසුකම් ඇති කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. சில்வா)
(Dr. W. D. de Silva)

ගරු සභාපතිතුමනි, දොඩන්ගස්ලන්දේ ගරු මන්ත්‍රීතුමා (ඒ. යූ. රොමානිස් මයා.) කථා කරන විට මම ටිකක් කනගාටුවට පත් වුණා. ඒ මහත්මයාගේ දේශපාලන අදහස් අපි නොපිළිගත්තත් ඒ මහත්මයා වැනි උදවිය පාර්ලිමේන්තුවේ වැදගත් අදහස් ඉදිරිපත් කිරීම මම ඉතා අගේ කොට සලකනවා. මේ රට සංවර්ධනය කිරීම සඳහා යොදවන ව්‍යාපාරයක් වශයෙන් විශේෂයෙන්ම පැපොල් කර්මාන්තය දියුණු කිරීම සඳහා ඒ මන්ත්‍රී තුමා විශාල වෑයමක් දරා තිබෙනවා. මේ රටේ සාමාන්‍ය වෙළඳ මහත්මයකුගේ අදහස් හැටියට ඒ අදහස් පිළිබඳව සමච්චල් කිරීම හොඳ නැහැ. මටත් ඒ විධියට සමච්චල් කරනවා. මම දෙවතාවක් ඉස්පිරිතාලයට ගියාය, දෙවතාවේම අස් කළායයි ලියුම් දමා තිබෙනවා. මේ වාරයේත් අස් කළායයි ලිපියක් දමා තිබෙනවා. ඒ නිසයි මට ඉස්පිරිතාලයෙන් එළියට එන්න සිද්ද වුණේ. එක වරම බෙල්ල කපා දමනවා නම් ඒ විධියේ සමච්චල් කරනවාට වඩා හොඳයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා]

පාරවල ඇති පාලම් ගැන වචනයක් කිය යුතුව තිබෙනවා. රත්නපුරයේ මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. වීරසේකර මයා.) අලි ගැන කථා කළා. අලි ගැන ඇසීමට මම බොහොම සතුටුයි. මා ඉදිරියේ සිටින්නේ ඔක්කොම අලි. මේ වැලිගම මන්ත්‍රීතුමා (මොන්ටේගු ජයවික්‍රම මයා.) ගමනාගමන ඇමති වශයෙන් සිටි කාලයේදී කළ අලි වැඩ ගැන අපි දන්නවා. මා රත්නපුර මන්ත්‍රීතුමාට දොස් කියනවා නොවෙයි. [බාධාකිරීමක්] බලපිටියේ මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ද සිල්වා මයා.) මාත් යන්නේ එක කෝච්චියේ. ගරු සභාපතිතුමනි, බලපිටියේ ගරු මන්ත්‍රීතුමාට උගන් වන්නට ඕනෑ මට සමච්චල් නොකරන්න. ඒ මන්ත්‍රීතුමා සඳහන් කළ දුම්රිය නැවතුම් පොළ තිබෙන්නේ අපේ ගේ ළඟයි. ඒ දුම්රිය නැවතුම් පොළ ඉක්මනින් සකස් කරන ලෙස මම ගරු ගමනාගමන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මම පාලම් ගැනයි කථාකරමින් සිටියේ. ඒ ගැන තව වචන සවලපයක් කියන්නට ඕනෑ. දොම්පේ-අවිස්සාවේල්ලේ පාලමටත් මම විරුද්ධ වන්නේ නැහැ. දොම්පේ උදවිය සහ අවිස්සාවේල්ලේ උදවිය සටන්කාමී අය බව අපි දන්නවා; එසේම බුලත්සිංහල-අඟල වත්ත පාලමටත් මම විරුද්ධ වන්නේ නැහැ. පාලම් හැදුවත් නැතත් දේශපාලන අතින් ඒ අයගේ වෙනසක් නැහැ [බාධා කිරීමක්.] ඔය පැත්තේ සිට මේ පැත්තට පාලමක් හැදුවත් මම විරුද්ධ වන්නේ නැහැ. නමුත් ඇමතිතුමා රත්මලානේ සිට නිව්යෝර්ක් නගරයට පාලමක් හදන්නට ලෑස්ති වෙනවා නම් මම ඒකට විරුද්ධයි.

පහළොස් දෙනකු අස් කරන්නට කළ තීරණය සැප්තැම්බර් මාසය වන තෙක් කල් දමන්නය කියා ගුවන් නියමුවන් දවස් 11ක් තිස්සේ ගෙන ගිය සටන ගැන ගරු ඇමතිතුමා දන්නවා. එදා සිට හෙන්රි අබේවික්‍රම මහත්මයා නියෝගයක් කළා, මා සමග මිට පසු සාකච්ඡා කරන්නේ නැත කියා. ඒ මහත්මයා විදේශීය අධිරාජ්‍ය වාදීන්ට පක්ෂව අපට බැට දුන්නත් දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමා හොරගොල්ලේ වලව්වේදී අප සමග සාකච්ඡා කර ඉතා වැදගත් තීරණ රාශියක් දුන්නා. එයින් එක තීරණයක් තමයි, එක සුද්දකුව පැය 24 කදී මේ රටෙන් නෙරපන බවට කළ තීරණය. ඒ තීරණය එසේම ඉටු කළා. ඒ සාකච්ඡාවේදී එතුමා දුන් පොරොන්දු අව්වු ගහලා එතුමාගේ අත්සන සහිතව අප ළඟ තිබෙනවා. ඒ සිද්ධිය ගැන අපේ ගරු ගමනාගමන ඇමතිතුමාගේ හිත යොමු කරවමින් මා ඉල්ලා සිටින්නේ, මොන විධියේ වැඩ පිළිවෙලක් යෙදුවත් ඒ සුද්දන් ගැන විශ්වාසයක් තබන්න එපාය කියායි. උඩින් මොන විධියේ වැඩ පිළිවෙලක් යෙදුවත් යටින් නම් ඔවුන් යම්කිසි උගුලක් අට වනවාට කිසිම සැකයක් නැහැ. දැන් ඒ උදවිය ආසියාවේ මහා කුමන්ත්‍රණයක් යොදා ගෙන යනවා.

ගරු සභාපතිතුමනි, ගුවන් සේවය අවශ්‍ය දෙයක්. එය සංවර්ධනය කරන්නට පුළුවන්. දුම්රිය සහ බස්රිය වගේම අවශ්‍ය දෙයක් ගුවන් සේවයත්. සමහර සමාජවාදී රටවල් මේ රටට අහස්යාත්‍රා දෙන්නට පොරොන්දු වෙලා තිබෙනවා. ඒවා අරගෙන ජාතික සේවයක් සකස් කරන අතරම අධිරාජ්‍යවාදී වැඩ පිළිවෙලට විරුද්ධ විය යුතු බව මම ප්‍රකාශ කරන්න කැමතියි. එසේ කරමින් දිවංගත ගරු අගමැතිතුමාගේ නාමයට ගෞරව වන පරිදි ජාතික වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යොදවන ලෙස ආදරයෙන් ඉල්ලමින් මගේ වචන සවලපය අවසාන කරනවා.

අ. භා. 4

සභාපතිතුමා :
(அக்கிராசனர்)
(The Chairman)

රැස්වීම විනාඩි 30කට තාවකාලිකව නවත්වනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු පී. බී. ජී. කලුගල්ල
(கௌரவ பீ. பி. ஜீ. கலுகல்ல)
(The Hon. P. B. G. Kalugalla)

ගරු සභාපතිතුමනි, මේ විවාදය සඳහා දීර්ඝ වේලාවක් ගත වී තිබෙන නිසා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද සෑම කාරණයකටම උත්තර දෙන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. ඉදිරිපත් කරන ලද සෑම කාරණයක්ම වාර්තා ගත වී තිබෙන නිසා ඒවා හොඳින් කියවා බලා සුදුසු පරිදි කටයුතු කරන්න මා බලාපොරොත්තු වෙනවා.

මගේ අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු දෙකක් පිළිබඳව මෑත කොළඹ දෙවන මන්ත්‍රීතුමා (කෙනමන් මයා.) චෝදනා මුඛයෙන් කථා කළා. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ඩබ්ලිව්. දහනායක මයා.) සිය කථාවලදී ඊට ගැලපෙන අන්දමට පිළිතුරු දී තිබෙනවා. එම නිසා මා බලාපොරොත්තු වන්නේ නැහැ ඒ සඳහා දීර්ඝ වශයෙන් පිළිතුරු සපයන්නට. ඒ මන්ත්‍රීතුමා විශෙෂයෙන් ටෙලිෆෝන් සේවාව සම්බන්ධයෙන් කථා කරමින් එංගලන්තය සමග අප ඇති කරගෙන තිබෙන ගිවිසුමක් පිළිබඳව චෝදනා රාශියක් ඉදිරිපත් කළා. ඒ චෝදනාවලට පිළිතුරු ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් ලැබී තිබෙනවා. කොළඹ ක්‍රමය යටතේ එංගලන්තයෙන් ලංකාවට දුන් ණය මුදල් අරගෙන ටෙලිෆෝන් සේවාව සකස් කිරීම සුදුසුය කියා අගමැතිවරුන් දෙපොළක් විසින් අනුමත කර තිබෙනවා. ඒ අගමැතිවරුන් දෙපොළ තමයි දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා සහ කලක් අගමැතිව සිටි ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා. අද ලංකාවේ තිබෙන්නේ "Scrouger-Step-by-Step" නමින් හඳුන්වන ක්‍රමයයි. මේ ක්‍රමය ඇති කළේ 1936 වර්ෂයේදීයි. ලෝකයේ බොහෝ රටවල් මේ ක්‍රමය පිළිගෙන තිබෙනවා. ඇමෙරිකාව, එංගලන්තය, ඉන්දියාව, ජපන් රට යනාදී රටවල් විශෙෂයෙන් මේ ක්‍රමය අනුගමනය කර තිබෙනවා. රුසියාවේ සහ චීනයේ තිබෙන්නේත් මීට සමාන ක්‍රමයකුයි. ලෝකයේ රටවල් අතුරින් තුනෙන් දෙකොටසකම වාගේ ටෙලිෆෝන් සේවය සංවිධානය කර තිබෙන්නේ මේ ක්‍රමය උඩයි. මෑත කොළඹ දෙවැනි ගරු මන්ත්‍රීවරයා මෙය පැරණි ක්‍රමයක්, මේ ක්‍රමය අනුගමනය කිරීම මෝඩකමක්ය කියමින් අපට චෝදනා කළා. මම කියන්න කැමතියි, අපි මිලදී ගැනීමට යන්නේ විශේෂයෙන් "Scrouger—Step-by-step" ක්‍රමයේ නවීන උපකරණ බව. ඒ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් මම කථා කරන්න යන්නේ නැහැ. විශෙෂයෙන් මේ සම්බන්ධයෙන් ගාල්ලේ ගරු මන්ත්‍රීවරයා (ඩබ්ලිව්. දහනායක මයා.) කථා කළ නිසාත්, මෙම තීරණය නිවැරදි බව මට පෙනී යන නිසාත් හැකි තරම් ඉක්මනට මෙම සේවය මහජනතාවට ලබා දීමට අපි වැඩ කටයුතු කරගෙන යනවා. මේ ක්‍රමය නිසා මගේ කල්පනාවේ හැටියට හැතැප්ම 15ක සීමාව ඇතුළත සිටින ඕනෑම කෙනකුට 'ඉන්ටර් ඩයලින්-එක්ස්චේන්ජ්' එකක් නැතිව කථා කරන්න පුළුවන් වෙනවා. අද අපේ රටේ අලුතින් ටෙලිෆෝන් සේවය ලබා ගැනීමට බලාපොරොත්තු වී සිටින සංඛ්‍යාව 5,000ක් පමණ වෙනවා. නමුත් අලුතින් ටෙලිෆෝන් සේවය ලබා දීම දැනට අත්හිටුවා තිබෙනවා. ඒ මක්නිසාද, දැනට එසේ දෙන්න පිළිවෙලක් නැහැ. එම නිසා මගේ දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්වරුන් ඉතා උනන්දුවෙන් හා උද්‍යෝගයෙන් යුක්තව මෙම වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට වැඩ කරගෙන යනවා. මෙම ක්‍රමය සකස් කළායින් පසුව 55,000කට පමණ ටෙලිෆෝන් සේවය ලබා දෙන්න පුළුවන් වෙයයි මම කල්පනා කරනවා. ඒ වාගේම මෙය සාර්ථක වීමෙන් පසු අඩු මුදලකට ලියන මහත්වරුන්ට ඉස්කෝල මහත්වරුන්ට කම්කරුවන්ට පවා ටෙලිෆෝන් පහසුකම් ලබා ගන්න පුළුවන් වෙයයි මම විශ්වාස කරනවා. මෑත කොළඹ දෙවෙනි ගරු මන්ත්‍රීවරයා මේ ක්‍රමය ගැන විරුද්ධ වන්නේ එංගලන්තයෙන් කරන නිසාද කියා මා දන්නේ නැහැ. අද මුළු ලෝකයේ ටෙලිෆෝන් පාවිච්චි කරන ජනතාවගෙන් තුනෙන් දෙකක් පමණ පාවිච්චි කරන්නේ මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු කලුගල්ල]

ක්‍රමයයි. එමෙන්ම මෙම ක්‍රමය ඇති කිරීමෙන් පසු අපට අවශ්‍ය උපකරණ ඉන්දියාවෙන් ලබා ගැනීමටත් පුළුවන්කම තිබෙනවා. දැනට ඉන්දියාවේ කර්මාන්ත ශාලා ඉදි කරගෙන යනවා. මේ ක්‍රමය ඇමෙරිකාව, ජපානය, එංගලන්තය ආදි රටවල දැනට භාවිතා කරනවා. එම නිසා උපකරණ ලබා ගැනීමේදී අපට එක රටකට පමණක් සීමා වන්නට වුවමනාවක් ඇති වන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මේ හැරෙන්නට තවත් නොයෙකුත් ක්‍රම තිබෙනවා. මා දන්නවා, මරික්කාර් මහතා ඇමතිවරයකු වශයෙන් සිටියදී වරක් මේ සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීම පිණිස ජපානයට හා ජර්මනියට යන්නට සූදානම් වුණා. නමුත් දිවංගත ගරු අගමැතිතුමා එයට ඉඩ දුන්නේ නැහැ. ජර්මනියේ භාවිතා කරන ක්‍රමය අපේ රටේත් භාවිතා කළා නම් අපට උපකරණ ආදිය ලබා ගන්න සිදු වන්නේ ජර්මනියෙන් පමණයි. බෙල්ජියන් ක්‍රමයත් තිබෙනවා. වෙනත් රටවල වෙනත් ක්‍රම තිබෙනවා. ඒවා ගත්තා නම් අමතර කොටස් ගන්න සිදු වන්නෙත් ඒ රට වලින්මයි. ඒ නිසා ඒවා එංගලන්තයෙන් ගැනීමට අප ගත් තීරණය හරි තීරණයක් හැටියට මේ ගරු සභාව අනුමත කරනවා ඇතැයි මා කල්පනා කරනවා. ටෙලිෆෝන් ක්‍රමය සාර්ථක කර ගැනීමට උනන්දුවෙන් සහ උද්‌යෝගයෙන් ක්‍රියා කරන නිලධාරීන්ට ප්‍රශංසා කරන්න ඕනෑ. අයි.ටී.යූ. ආයතනයෙන් විශේෂඥ පිරිසක් පත් කරන්න යනවා, කොළඹින් පිට අනෙක් ප්‍රදේශවලට මොන විධියේ ක්‍රමයක් ඇති කළ යුතුද කියා වාර්තා කිරීමට. ඒ වාර්තාව ලැබුණු වහාම ලෝක බැංකුවෙන්වත් මුදලක් ණයට ගෙන හෝ ඒ වාර්තාවේ යෝජනා අනුව සාර්ථක ලෙස වැඩ කරන්නට පුළුවන් වේවි.

කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ පිහිටුවීම ගැන ඊළඟට කියන්න කැමතියි. දකුණු කොළඹ දෙවන ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) ඒ ගැන විරෝධය පළ කරමින් කොළඹ සිට කටුනායකට ඇති දුර ගැන සලකන විට අහස් යානාවකින් කටුනායකට ආ කෙනකුට එතැනින් කොළඹට එන්න පැය ගණනක් යන නිසා එය වෙනස් කළ යුතුය කීවා. බොම්බායේ ගුවන් තොටුපළ තිබෙන්නේ හැතැප්ම 20 ක් ඇතිනුයි. යන්න තිබෙන්නෙත් පටු පාරකිනුයි. මොස්කව් ගුවන් තොටුපළ තිබෙන්නෙ හැතැප්ම 15 ක් ඇතිනුයි. පීකින් තොටුපළ සැතැප්ම 20 ක් ඇතිනුයි තිබෙන්නේ. අද ලෝකයේ ප්‍රධාන නගර හා සම්බන්ධ ගුවන් තොටුපළවල් තිබෙන්නෙ හැතැප්ම 15 ක් 20 ක් ඇතිනුයි. ඒ නිසා කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සෑදීමට ගත් තීරණය සම්පූර්ණයෙන්ම හොඳ තීරණයක් බව මා පිළිගන්නවා. ඒ ගැන වෙන යමක් කියන්න යන්නෙ නැහැ. ජාත්‍යන්තර ගුවන් තොටුපළ සම්බන්ධ මූලික වැඩ දැන් කර ගෙන යනවා. 1963 අවුරුද්ද අවසන් වන්නට පෙර එය විවෘත කරන්නට උත්සාහ කරනවා.

අද ලෝකයේ ලොකු අහස් යානා කොළඹට එන්නෙ නැහැ. ඒවා කොළඹ බහින්නෙ නැතිව පියාඹා යනවා. එයින් අපට පාඩුයි. විදේශික සංචාරකයින්ගේ පැමිණීම අඩු වෙනවා. නොයෙක් රටවල් සමග තිබිය යුතු අපේ සම්බන්ධකම් තහවුරු කර ගැනීම අමාරු වෙනවා. මේ අහිත කර තත්ත්වය මගහරවා ගැනීම සඳහා තමයි කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හැකිතාක් ඉක්මනින් සෑදීමට තීරණය කළේ. මගේ දෙපාර්තමේන්තුව මගින් සංවර්ධනය සම්බන්ධයෙන් ඇති කළ ප්‍රධාන වැඩ දෙක තමයි ඒ.

ඒ පැත්තේත්, මේ පැත්තේත් ගරු මන්ත්‍රීන් තම තමන්ගේ කොට්ඨාශවල අඩුපාඩු ගැන සඳහන් කළා. හැම මන්ත්‍රීවරයෙක්ම පාහේ ඉතාමත් මිත්‍ර ලීලාවකින් ඉතාමත් සහයෝගයෙන් කටයුතු කිරීම ගැන මා බොහොම සන්තෝෂ වෙනවා. මා ගිය අවුරුද්දේ වැඩ කරගෙන ගිය ආකාරය හොඳය යනුවෙන් හැම දෙනෙක්ම පාහේ ප්‍රකාශ කළා. මේ අමාත්‍යාංශය භාර ගත්තායින් පසු හැම දෙශ පාලන පක්ෂයකටම අයත් ගරු මන්ත්‍රීන් සමග සාකච්ඡා කර මේ මේ වැඩ මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවුරුද්ද තුළ කරන්න බලාපොරොත්තු වෙනවාය කියා දැනුම් දුන්නා. ඒ හැම දෙයක්ම කරන්නට බැරි වී ඇතත්, ගරු මන්ත්‍රීවරුන් සඳහන් කළ කරුණු ඒ ඒ අංශවල නිලධාරීන් සටහන් කරගෙන තිබෙන නිසාත්, ඒ අය දන්නා නිසාත් ඒවා ඉතා ශීඝ්‍රව කර දෙන්නට උත්සාහ කරනවාට සැකයක් නැහැ. ඒ වාගේම සභාපතිතුමනි, මා යටතේ තිබෙන දෙපාර්තමේන්තු කලින් දූෂණවලින් පිරී තිබුණු දෙපාර්තමේන්තු බව තමුන්නාන්සේ දන්නවා ඇති. තැපැල් දෙපාර්තමේන්තුවත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවත් යන දෙකම දූෂණ වලින් පිරී තිබුණු දෙපාර්තමේන්තු බව මම පිළිගන්නවා. ඒ දූෂණ සම්බන්ධව විභාග කිරීමට අල්ලස් කොමිෂන් සභාවක් පත් කළා. දූෂණවලට අසු වූ සමහර නිලධාරීන්ගේ වැඩ තහනම් කර තිබෙන අතර රජයේ සේවා කොමිසභාව මගින් ඒ නිලධාරීන් ගැන තව දුරටත් කරුණු සොයා ගෙන යනවා. නිලධාරීන් කීප දෙනක් අල්ලස් කොමිෂන් සභාවට පවා අසු වුණ නිසා මම ඉතාමත් කල්පනාකාරීව වැඩ කරන්න ඕනෑ. එම නිසා තමයි, එය පවිත්‍ර කිරීමට මම නොයෙක් තීරණ ගත්තේ. ඕවර්සියර් ක්‍රමය සම්පූර්ණයෙන්ම නැති කරන්න ඕනෑ යකියා මම තීරණයක් ගත්තේ විශෙෂයෙන් දූෂණ නැති කිරීමටයි. අද සාමාන්‍යයෙන් පාරවල් නඩත්තු කිරීම ග්‍රාම සංවර්ධන සමිතිවලටත් කම්කරු සමිතිවලටත් මම භාර දී තිබෙනවා. ඒ වාගේම අපේ දෙපාර්තමේන්තුවෙන් දෙන කොන්ත්‍රාත් පවා ගම්වල සමිතිවලට දීමට මම නියෝග කර තිබෙනවා. සමිති මගින් මේ වැඩ කටයුතු හුඟක් දුරට කරගෙන යන බව මම සන්තෝෂයෙන් කියන්න කැමතියි. ඕවර්සියර්වරු මේ කටයුත්තට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. එම නිසා මම ආණ්ඩු පක්ෂයේත් විරුඬ පක්ෂයේත් මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නේ මේ කටයුත්ත සාර්ථක කර ගැනීමට සහාය දෙන ලෙසයි. එවිට ගම්වල පවතින රැකීරක්ෂා හිඟය විසඳීමටද එය මහත් උදව්වක් වෙනවා ඇති. මෙයට උදව් දෙන්නය කියා මම කීප වතාවක් පාර්ලිමේන්තුවේදී කියා සිටියා. මෙම ක්‍රමය සාර්ථක කර ගැනීම සඳහා සමහර ගරු මන්ත්‍රීවරුන් අද ඉතා උනන්දුවෙන් වැඩ කරනවා. සමහර කොට්ඨාශවල දැන් ඕවර්සියර්වරු නැහැ. ඒ සෑම දෙයක්ම ගම්වල ඇති සමිතිවලට සහ කම්කරු සංවිධානවලට භාර දීලයි තිබෙන්නේ.

අ. භා. 4.45

මන්ත්‍රීවරුන් බොහෝ දෙනකුම වතු පාරවල් ගැන කථා කළා. අද තිබෙන නීතිය අනුව Conversion of Estate Roads Act නමැති පනත අනුව ඇමතිවරයාට තිබෙන්නේ සීමා සහිත බලයක් පමණයි. ඒ සීමා සහිත බලය වුණත් මම ඇමති ධුරයට පත් වන්නට ප්‍රථම පාවිච්චි කර තිබුණේ නැහැ. නමුත් මම පත් වුණාට පස්සේ ඒ බල තල අනුව එබඳු පාරවල් හුඟක් අරගෙන ගේට්ටු සම්බන්ධයෙන් තිබුණු අවහිරකම් මග හරවා දුන්නා. දැනට තිබෙන්නේ සීමා සහිත බලයක් නිසා ඊට වඩා පුළුල් බල තල ලබා ගැනීම පිණිස ළඟදීම පාර්ලිමේන්තුවට ඒ පිළිබඳව පණතක් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. අද වතු පාරවල් ගැනීම කෙරෙන්නේ ඉතාමත් හෙමිහුයි. නමුත් ඉක්මන් කරන ලෙස මන්ත්‍රීවරු උදෙස්ෂණය කරනවා. එමනිසා ළඟදීම පණතක් ඉදිරිපත් කර ඒ අවහිරකම් මග හැරවීමට මම බලාපොරොත්තු වෙනවා.

සභාපතිතුමනි, මට ලැබී තිබෙන මුදල් ප්‍රමාණය අනුවයි, මේ වැඩ මට කරන්න සිදු වී තිබෙන්නේ. මුදල් මදිවීම ගැන මම මුදල් ඇමතිතුමාට දොස් කියන්නේ නැහැ. ගිය අවුරුද්දේ ලැබුණු මුදල් ප්‍රමාණය හොඳටම මදි. ඒ කෙසේ වී නමුත්—

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்ணயக்க)
(Mr. A. Ratnaike)

ගිය අවුරුද්දේ ලැබුණු මුදල කොපමණද?

ගරු කලුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalle)

රුපියල් හැට ලක්ෂයක් ලැබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු කලුගල්ල]

ලැබෙන මුදල් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශවලට පමණක් නොව විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් පෙනී සිටින කොට්ඨාශවලටත් වියදම් කරන්නට මම සූදානමින් සිටිනවා. පාරවල් සම්බන්ධයෙන් තම තමන්ගේ කොට්ඨාශවල තිබෙන්නාවූ අවශ්‍යතාවන් පිළිබඳ විස්තර අමාත්‍යාංශයට දැනුම් දෙන්නය කියා සෑම ගරු මන්ත්‍රීවරයකුටම ලියා යවා තිබෙනවා. ඒවාට පිළිතුරු ලැබුණායින් පසු මෙහි වෙන් කර තිබෙන මුදල් සෑම සතයක්ම ලබන අවුරුද්දේ මාර්තු මාස යට කලින් වියදම් කරන්නය කියා මගේ ඡදපාර්තමේන්තුවේ නිලධාරීන්ට නියෝග කර තිබෙනවා. ඊට පසුව පාර්ලිමේන්තු කණ්ඩායමටත් ගරු මුදල් ඇමතිතුමාටත් කරුණු විස්තර කර දී කැබිනට් මණ්ඩලයෙන් තව මුදල් ලබා ගන්නට බලා පොරොත්තු වෙනවා.

මගේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නීති රීතිවලට අනුව ඉතා උනන්දුවෙන් වැඩ කරන නිසා ඔවුන් වෙත සමහර ගරු මන්ත්‍රීවරුන් චෝදනා එල්ල කිරීම ගැන මම කණගාටු වෙනවා. චෝදනා වැඩි වශයෙන් එල්ල කළේ අපේ පැත්තේ සිටින ගරු මන්ත්‍රීවරුනුයි. ඇතැම් විට අළුතෙන් පාර්ලිමේන්තුවට පැමිණි ගරු මන්ත්‍රීවරු තමන්ගේ ගම් පළාත්වලට වුවමනා කරන පාරවල් අඩු පාඩු සකස් කර ගැනීම පුළුවන් තරම් ඉක්මනින් කරවා ගන්න බලවත් උනන්දුවක් දක්වන නිසා වෙන්නට පුළුවනි, නොවැළැක්විය හැකි ප්‍රමාදයන්ට සමහර විට නිලධාරීන්ට දෙස් කියන්නෙ. කෙසේ හෝ වේවා, ගරු සභාපතිතුමනි, සෑම ඡන්දදායක කොට්ඨාශයකටම මගේ දෙපාර්තමේන්තුවෙන් විය යුතු සේවය මගේ කාලය තුළදී සම්පූර්ණයෙන් කර දීමට මම පොරොන්දු වී තිබෙනවා.

පසුගිය අවුරුද්ද තුළදී උප තැපැල් කන්තෝරු වුවමනාය කියා මා ඉල්ලා ගත්තේ නැහැ. උප තැපැල් කන්තෝරුවලට පත්වීම් කරන්නට ගියාම මහ හිස රදයක් ඇති වෙනවා ගරු සභාපතිතුමනි. 1958-59 අවුරුද්ද තුළදී නම් මරික්කාර් ඇමතිතුමා උප තැපැල් කන්තෝරු 300ක් පමණ ඉල්ලා ගත්තා. එතුමාගේ කාල සීමාව තුළදී ගන්නට බැරිව ඉතුරු වූ 150ක් පමණ උප තැපැල් කන්තෝරු ඉතා සාධාරණ අන්දමින් විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ ඡන්ද කොට්ඨාශවලටත් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ ඡන්ද කොට්ඨාශවලටත් ලැබෙන අන්දමට බෙදා දුන්නා.

පසුගිය පූර්ලි මැතිවරණයෙන් පසුව උප තැපැල් කන්තෝරු හැට හැත්තෑවකට පමණ කර තිබෙන පත්වීම් සම්බන්ධයෙන් සමහර පළාත්වල ගරු මන්ත්‍රීවරුන් මෙන්ම සමහර සංවිධාන මගින්ද, දේශපාලන බලපෑම් අනුව එම පත්වීම් කළාය, යන චෝදනාව ඉදිරිපත් කරන්නට යෙදුණා. මෙම පැමිණිලි මට ඉදිරිපත් කළ අවස්ථාවේදී ඒවා සෝදිසි කිරීම සඳහා පොදු සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්නය කියා මා කීවා. එම පත්වීම් වලින් සියයට 85ක් පමණ සාධාරණ ඒවා බව පොදු කොමිෂන් සභාව නිගමනය කළ බව සන්තෝෂයෙන් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි. එම නිසා මෙම පත්වීම් පිළිබඳව දේශපාලන ඇඟිලි ගැසීමක් නිබුණාය කියා මම කාගටවත් චෝදනා කරන්නේ නැහැ. විරුද්ධ පක්ෂයේ නායකතුමාගේ කොට්ඨාශයේත් උප තැපැල් කන්තෝරුවල පත්වීම් පිළිබඳව යම් යම් චෝදනා නිබුණු නමුත් එකක් හැරුණු විට අනික් ඒවා සියල්ලම අනුමත කර තිබුණා. එම තැපැල් කන්තෝරුව සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍ර ආදිය එවන පිළිවෙළ නියම විධියට ප්‍රකාශ කර තිබුණේ නැතැයි කියා සමහර සමිති සමාගම්වලින් කියා සිටියා. ඒ කරුණු උඩ පොදු සේවා කොමිෂන් සභාව විසින් නැවතත් ඉල්ලුම් පත්‍ර කැඳවා තිබෙනවා. එය වරදක් නොවෙයි.

අපට තැපැල් කන්තෝරු වුවමනා නැහැ කියා සමහර මන්ත්‍රීවරුන් කියා සිටි අවස්ථාවලදී මම ඒවා අවලංගු කර දැම්මා. පත්වීම් ගැන මා ඇඟිලි ගසන්නේ නැති බව මා විශේෂයෙන් මතක් කරන්න කැමතියි. පත්වීම් දෙන විට, අසුවලා සුදුසුය කියා, කොයි දේශපාලන පක්ෂයකට අයත් වුණත් යම් මන්ත්‍රීවරයකු විසින් ලියුමක් එවා තිබුණොත් එවැනි ලියුම් කුණු කූඩයට නොදමා ඒවා ගැන සලකා බලන ලෙස මා නිලධාරීන්ට උපදෙස් දී තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ සිටියත්, විරුද්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාර්ශ්වයේ සිටියත්, මන්ත්‍රීවරුන් ඒ පළාත්වල සිටින ජනප්‍රිය පුද්ගලයින් බව මා දන්නවා. එවැනි ජනප්‍රිය පුද්ගලයින් යමකු සුදුසුය කියා ලියමනක් දෙනවා. ඒ දෙන්නේ ඉතාම සුදුස්සෙකුටයි. එවැනි ලියමනක් ලැබුණු විට ඒ සම්බන්ධයෙන් විශේෂයෙන් සලකා බලන ලෙස තේරීම් මණ්ඩලයට මා උපදෙස් දී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ පැත්තේ කිසිම මන්ත්‍රීවරයකුගෙන් අද මට චෝදනාවක් නැහැ; සමසමාජ පක්ෂයෙන් අද මට චෝදනාවක් නැහැ; කොමියුනිස්ට් පක්ෂයෙන් අද මට චෝදනාවක් නැහැ; ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙන් (ඩබ්ලිව්. දහනායක මයා.) මට අද චෝදනාවක් නැහැ; මහජන එක්සත් පෙරමුණේ මන්ත්‍රීවරුන්ගෙන් මට අද චෝදනාවක් නැහැ; මට චෝදනාවක් තිබෙන්නේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාගෙන් පමණයි.

විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා විසින් මතු කළ කාරණය සම්බන්ධයෙන් එතුමාගේ දේශපාලන විරුද්ධකාරයින් ඇවිත් ඒ පත්වීම් සියල්ලම අවලංගු කර දමන්නය කියා මගෙන් ඉල්ලා සිටි අවස්ථාවේදී මා කියා සිටියේ කුමක්ද? "මට එහෙම කරන්න බැහැ, මම කරන්නේ නැහැ, මට එහෙම කරන්නට පුළුවන්කමක් නැහැ, මම ඒවා සියල්ලම කොමිෂන් සභාව ඉදිරියට දමනවා" කියායි මා ප්‍රකාශ කළේ. අන්තිමේදී ඒවායින් වැඩි හරියක් අනුමත වුණු අතර එකක් සම්බන්ධයෙන් නැවත ඉල්ලුම් පත්‍ර කැඳවන්නට තීරණය වුණා. නොයෙක් විධියේ දේශපාලන බලපෑම් මට ආවත් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් පත් වූ ආසනවල අපේ පක්ෂයට ආධාර කළ ඒ මන්ත්‍රීවරුන්ගේ විරුද්ධකාරයින් එක්කෙනෙක්වත් යම් කිසි ස්ථානයකට පත් කර නැහැ. යම්කිසි තැපැල් කන්තෝරුවක එහෙම පත්වීමක් කර තිබෙනවා නම් කියන්න, මම එම තැපැල් කන්තෝරුව අවලංගු කර දමන්න ලැහැස්තියි. මන්ත්‍රීවරයාගේ ආශිර්වාදය නැතිව යම් පුද්ගලයකු පත් කළොත්, එම තැපැල් කාර්යාලය පවත්වා ගෙන යාමට බාධා ඇති වෙනවා. විශේෂයෙන් නිලධාරි මහත්වරුන්ගේ මතවලට වඩා මහජන ඡන්දයෙන් පත් වූ මන්ත්‍රීවරුන්ගේ ලියුම්වලට මුල් තැනක් දී ක්‍රියා කරන ලෙස මා උපදෙස් දී තිබෙනවා. එය වරදක්ද, සභාපතිතුමනි? අසුවල් තැපැල් කන්තෝරුවේ දූෂණයක් සිදු වී තිබෙනවා යයි යම් විධියකින් ගරු මන්ත්‍රීවරයෙක් පෙන්වා දෙනවා නම්, ඒ මන්ත්‍රීවරයා කියන හැටියට පරීක්ෂණයක් පවත්වා එවැනි දෙයක් ඔප්පු වුණොත් වහාම එය වසා දැමීමට වුණත් ක්‍රියා කරනවා.

මා 1956 සිට පාර්ලිමේන්තු ලේකම්වරයකු වශයෙනුත්, ඇමතිවරයකු වශයෙනුත් කටයුතු කර තිබෙනවා. දූෂණය වී තිබෙන දෙපාර්තමේන්තු දෙකක් භාරව සිටින නිසා මා දැන් කටයුතු කරන්නේ ඉතා කල්පනාකාරීවයි. මට තිබෙන එකම වස්තුව අවංකකමයි. අල්ලස් කොමිෂන් සභාව පත් කළ අවස්ථාවේ මගේ දේශපාලන හතුරකු හෝ මට විරුද්ධව පෙත්සමක් ඉදිරිපත් නොකිරීම ගැන විශේෂයෙන්ම මා සන්තෝෂ වෙනවා. එය තමයි, මට තිබෙන ලොකුම වත්කම. මේ විධියේ පියවරක් ගෙන තිබෙන්නේ ඒ නිසයි. මගේ දේශපාලන පක්ෂයේ උදවිය පත් කරනවාය කියන්න කුමන මන්ත්‍රීවරයකුට වත් බැහැ. මා එහෙම කරන්න සූදානම් නැහැ. පක්ෂපාත විධියට කටයුතු සිදු වී තිබෙනවා නම්, පත්වීම් දී තිබෙනවා නම්, ඒවා අවලංගු කර දමන්න මා ලැස්තියි.

අ. භා. 5

මගේ පාර්ලිමේන්තු ලේකම්තුමා වෙත චෝදනා එල්ල කරන්න යෙදුණා. එසේ කරන්න ඇත්තේ කරුණු නොදැන වන්නට පුළුවනි. චෝදනා එල්ල වූ හැටියේම ඊට ඉලක්ක වූ කරුණ සම්බන්ධ fපයිල් එක ගෙනෙන ලෙස මා දන්වා සිටියා. දැන් එය මා ළඟ තිබෙනවා. නුවර මාර්කට් එකේ තැපැල් කන්තෝරුවේ ඒ තනතුර සඳහා අපේ පාර්ලිමේන්තු ලේකම්තුමාගේ පුතාත් අයදුම් පතක් එවිවා. මේ පත්වීම පිළිබඳව දෝෂාරෝපණ එල්ල විය හැකි හෙයින් ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන ලෙස සෙංකඩගල ගරු මන්ත්‍රීවරයා (ෂෙල්ටන් රණරාජ මයා.) විසින් මට දන්වන්නට යෙදුණා. මේ පත් කිරීම සම්බන්ධයෙන් චෝදනා ඇති නොවන ආකාරයට ක්‍රියා කරන ලෙස දෙපාර්තමේන්තුවට මම නියෝග කළා. නියම සුදුස්සා පත් කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු කලුගල්ල]

ළඟස මා කියා සිටියා. උප තැපැල් සථානාධිපති කෙනකු වීම සඳහා අධ්‍යාපන සුදුසුකම් හැටියට හත් වැනි පන්තිය සමත් වී තිබිය යුතුයි. ඒ අතර වයස 21 ට වැඩි විය යුතුයි. තැපැල් කන්තෝරුව පිහිටුවා ගැනීමට ස්ථානයක් තිබිය යුතුයි. ඒ වගේම වත් කමක් තිබීම අවශ්‍යයි. එහෙත් මෙකියන ලද සුදුසුකම්වලට වඩා හුඟක් සුදුසුකම් ඇති අය ඉදිරිපත් වී සිටියා. ඉදිරිපත් වුණු මුළු ගණන 13 යි. මේ 13 දෙනා අතර අපේ පාර්ලිමේන්තු ලේකම්තුමාගේ පුතාට ලැබුණේ දෙවැනි තැනයි. පළමුවැනි තැනට තේරුණු කේ. කුමාරසිංහ මහතා පත් කළ යුතු බවට මහනුවර ඩී. එස්. තුමා රෙකම දාරු කර තුබුණා. මේක "බී" ග්‍රේඩ් තැපැල් කන්තෝරුවක්. කුමාරසිංහ මහතා පත් කරන ලද නමුත් තමන් ඉල්ලා අස්වන බවට ඔහුගෙන් ලිපියක් ලැබූ තිබෙනවා. ඒ නිසා දෙවැනියාට තේරුණු එම්. බී. තෙන්න කෝන් මහතා පත් කරන ලද බව මතක් කරන්න කැමතියි. මෙහි වරද මොකක්ද? එම්. බී. තෙන්නකෝන් මහතා ප්‍රථමයෙන්ම පත් කරන්න තුබුණු නමුත් එසේ කෙළේ නැහැ. එම නිසා මේ විධියේ දෝෂාරෝපණ කිරීම වැරදියි. එම්. බී. තෙන්න කෝන් මහතාගේ පියා පාර්ලිමේන්තු ලේකම්වරයකු නිසා උප තැපැල් සථානාධිපතිවරයකු වීමට ඔහු නුසුදුසුද? නුසුදුසුයි යමකු කියනවා නම් එය ඉතාමත්ම වැරදියි. එහෙයින් පාර්ලිමේන්තු ලේකම්තුමාට එල්ල කළ චෝදනා අස් කර ගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා. මේ ගැන මීට වඩා කියන්නේ නැහැ.

මගේ අමාත්‍යාංශයේ වැඩ ගෙන යෑමට විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනකු පසුගිය වාරයේදී සහයෝගය දුන්නා. කුමන ජාතියේ නිලධාරීන් සිටියත් ඒ නිලධාරී මහතුන් මට සහයෝගය දුන්නා.

නොයෙක් ද්‍රවිඩ නිලධාරී මහතුන්ට චෝදනා කළා, ෆෙඩරල් පක්ෂයේ උදවිය ය කියා. සිංහල නිලධාරී මහතුන්ට චෝදනා කළා, යූ. එන්. පී. කාරයන්ය කියා. ඒ චෝදනා සම්පූර්ණයෙන්ම වැරදියි. මගේ දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරී මහත්වරු හැමදෙනාම ආණ්ඩුවේ ප්‍රතිපත්ති අනුව වැඩ කර ගෙන යනවා.

ජයවික්‍රම මයා.
(திரு. ஜயவிக்ரம)
(Mr. Jayewickreme)

Mr. Chairman, may I suggest to the Hon. Minister that he tables the file, or at least the portion relating to the selection of the 13 candidates, the letter sent by Mr. Kumarasinghe withdrawing his application, and the qualifications of the others. Will he kindly table that?

ගරු කලුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)

සභාපතිතුමනි, මා කියන දේ පිළි ගන්නේ නැතිනම් මම මෙය සභා මේසය මත තබන්නට සූදානම් නැහැ.

ජයවික්‍රම මයා.
(திரு. ஜயவிக்ரம)
(Mr. Jayewickreme)

I think if the Hon. Minister says that he had a letter from Mr. Kumarasinghe withdrawing—

ගරු කලුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)

I did not have a letter.

ජයවික්‍රම මයා.
(திரு. ஜயவிக்ரம)
(Mr. Jayewickreme)

Did you or did you not receive a letter from one Kumarasinghe withdrawing his application?

ගරු කලුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)

From the file I find that Mr. Kumarasinghe has withdrawn his application.

ජයවික්‍රම මයා.
(திரு. ஜயவிக்ரம)
(Mr. Jayewickreme)

That is not the point. It is very relevant to the allegation made by the hon. Member for Senkadagala (Mr. Shelton Ranaraja), his own S. L. F. P. Member, in which he said

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

that the hon. Parliamentary Secretary's son was not a suitable person for appointment. Now the Hon. Minister says that this applicant came second in the list and the first candidate withdrew his application. We would like to know whether that letter is in the file. And if it is in the file, will the Hon. Minister table it ?

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

Might I suggest this. We are very happy that the Hon. Minister brought this file, and I think he has brought it to acquaint the hon. Members of the correct position. I think it is logical now for the hon. Members to be given an opportunity of looking into this file. I do not think any hon. Member in this House would question what the Hon. Minister has said so far. But we know now that this particular person came second. So, from the application forms which are there it would be possible for us to find out whether he correctly came second.

ගරු කලුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)

මම කිව්වෙ fපයිල් එකේ තිබෙන දේයි. fපයිල් එකේ තිබෙන්නේ මෙහෙමයි.

"Candidate No. 9 has withdrawn"—No. 9 is Kumarasinghe. "We recommend No. 7, M. B. Tennekoon".

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

Are there any marks given ?

ජයවික්‍රම මයා.
(திரு. ஜயவிக்ரம)
(Mr. Jayewickreme)

We cannot accept that statement. The Hon. Minister says that somebody has made a minute.

ගරු කලුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)

It is the P. M. G.

ජයවික්‍රම මයා.
(திரு. ஜயவிக்ரம)
(Mr. Jayewickreme)

"Candidate No. 9 has withdrawn"—that may mean anything. Let us know ?

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

When a test is given each candidate is given certain marks. If there were ten or twelve candidates, I believe the marks that each candidate got will be available in the file.

ගරු කලුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)

මෙය මා විසින් කරන ලද පත්වීමක් නොවෙයි. තැපැල් පති තුමායි, පත්වීම් කරන්නේ.

මැතිව් මයා.
(திரு. மதியூ)
(Mr. Mathew)

If you will bear with me for a moment, Sir. The Hon. Minister said that he got the file down to prove his case—

ගරු කලුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)

I have told you what the position is from reference to the file. You may believe me or not believe me. I am not concerned.

මැතිව් මයා.
(திரு. மதியூ)
(Mr. Mathew)

Then, do not produce the file. Why do you want to produce the file ? Throw it away !

ගරු කලුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)

මා කියන දේ පිළිගන්නේ නැතිනම් මට කරන්න දෙයක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැතිව් මයා.
(திரு. மதியூ)
(Mr. Mathew)
You need not read the file at all. Why do you want to refer to that?

ගරු කලුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)
තැපැල්පතිතුමා විසින් කරන ලද පත්වීම්වලට මම ඇඟිලි ගහන්නේ නැහැ. ඒවායේ යම් වරදක් තිබෙනවා නම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඇපෑලක් ඉදිරිපත් කරන්න පුළුවනි. ඒ සඳහා තවමත් කාලය තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු කාලයේදී—

මැතිව් මයා.
(திரு. மதியூ)
(Mr. Mathew)
ඒවා කියන්න වුවමනාවක් නැහැ, දැන්.

ගරු කලුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඒ විධියේ ඇපැල් ගත්තා. නමුත් ඉන් බොහොම යකදීම මුල් පත්වීම අනුමත කළා. නමුත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඒ පත්වීම්වලින් ඉතා වැඩි කොටසක්—සියයට 85ක් පමණ—අනුමත කළා. එයින් අපට පැහැදිලි වන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව අපක්ෂපාතව වැඩ කරන බවයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පවා මම ඇඟිලි ගැහුවා නම් ඒ පත්වීම් අවලංගු කරන්නට ඉඩ තිබුනා. ඒ නිසයි, මා එක්සත් ජාතික පක්ෂයට දොස් කියන්නෙ නැත්තෙ. එක්සත් ජාතික පක්ෂය ඒ අවධියේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඇඟිලි ගැහුවාය කියා මම දොස් කියන්නෙ නැහැ.

ගරු සභාපතිතුමනි, උප තැපැල් සථානාධිපතිවරයකු වීමට වුවමනා කරන්නේ හත්වැනි ප්‍රමාණය සමත් වීම පමණයි. මේ මහත්මයා සුදුසු බව සෙංකඩගල මන්ත්‍රීතුමා (ෂෙල්ටන් රණරාජා මයා.) මෙහි රෙක්මන් කර තිබෙනවා.

"Recommended by Mr. S. Godage, M. P. fur Anuradhapura, Mr. S. Ranaraja, M. P. for Senkadagala, and Mr. R. B. Ratnamalala, M.P., for Kalawewa."

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
Recommended whom?

ගරු කලුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)
Mr. Tennekoon, the son of the hon. Parliamentary Secretary.—[*Interruption*]—I am prepared to give an opportunity to hon. Members of the Opposition to make their observations.

පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)
(திரு. பேர்சி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)
ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමාගෙන් එක කාරණාවක් දැනගන්නට තිබෙනවා. පළමු වැනි ඉල්ලුම්කරු අස්වුණාය කියා මිනිවි එක දමා තිබෙන්නේ පෝස්ට් මාස්ටර් ජෙනරාල්තුමාද?

ගරු කලුගල්ල
(கௌரவ கலுகல்ல)
(The Hon. Kalugalla)
ඔව්. මේ තේරීම් කරන්නේ තුන් දෙනකුගෙන් යුක්ත මණ්ඩලයකිනුයි. මේ ලිය විලි සියල්ලම වුවමනා නම් පක්ෂවල නායකයන්ට පරීක්ෂා කර බැලීම සඳහා දෙන්නට මම ලෑස්තියි, මෙය අවසාන වුණායින් පස්සෙ. නමුත් මේ ගැන රටට ප්‍රකාශ කරන්නට මම කැමති නැහැ. තැපැල්පතිතුමා ඉතාමත්ම අපක්ෂපාතව එතුමාගේ වැඩ කරන නිසා මම එතුමාට දොස් කියන්නට කැමති වන්නේ නැහැ. ඒ ගැන එපමණයි, මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ.

ඇස්තමේන්තු අනුව, තිබෙන වැඩ ගැන මගේ කාල සීමාව තුළදී ඉතා උනන්දුවෙන් කටයුතු කරන්නට මම බලාපොරොත්තු වෙනවා. නිතරම අපේ දෙපාර්තමේන්තුවට දොස් කියන්නේ වැඩවලට වෙන් කරන මුදල් ඒ සඳහා වියදම් කරන්නේ නැත කියායි. දෙන මුදල්වලටත් වඩා වැඩියෙන් මේ වර වියදම් කිරීමට ලෑස්ති බව මම ප්‍රකාශ කරන්න කැමතියි. එසේම මගේ නිලධාරි මහත්වරුන් වැඩ කිරීමට ඉතා සූදානමින් සිටිනවා. මගේ වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හොඳින් ගෙන යාමට ගිය අවුරුද්දේ මෙන්ම සම්පූර්ණ සහයෝගය දෙන මෙන් විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලමින් මගේ වචන සවලපය අවසාන කරනවා.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.

(திரு. எட்மன் சமரக்கொடி)

(Mr. Edmund Samarakkody)

Arising out of the remarks made by the Hon. Minister, I should like to make a few observations. I will not take more than two minutes of your time. In the interests of everybody, I think we have to clear up the question of this particular appointment to the Sub-Post Office in Kandy. What I say should not in any way be interpreted to mean that the Hon. Minister had anything to do with this appointment which can be questioned. He has told us briefly that there had been 13 applicants and that out of these the person who came first was Mr. X. The person who came second was Mr. Tennekoon, the son of the hon. Parliamentary Secretary to the Minister of Transport and Works. As a result of Mr. X resigning, Mr. Tennakoon was appointed.

Now, we have a right to ask whether there was a file and, if so, whether the Hon. Minister looked into it in order to satisfy himself on this point. The P. M. G. will have a record of the marks given to each applicant. Either he has more than one file or there is only one file. If he has more than one file, they should all be here. If there is only one file, then it should contain all the documents. All I ask the Hon. Minister is, if the marks given to each applicant are in that file, to please show us the marks. If the marks are not there, and if the P. M. G. merely says "Well, we have chosen So-and-so as No. 2," then the time has come for us to go further and state that things are not quite all right with regard to the selection of candidates. If it is merely left to the P. M. G., or some committee to say, "We like So-and-so", then I say we are just acting in the dark. that there is no policy or principle. People are appointed, I take it, on the authority of the Public Service Commission. The Public Service Commission delegates its authority to the P. M. G. who, in turn, instructs a committee to look into the applications. Finally, when the appointment is made, the responsibility is on the Public Service Commission.

Now, we have taken it for granted up to date that when people are appointed to any post the selection is made on the results of some test. There must be some record as to whether the test has actually taken place. For instance, I know that in the case of a certain appointment in my electorate there were two candidates who applied; one candidate came to me after the selection was made and complained to me that he was not satisfied with the test for the reason that two different test papers were given to the two candidates. Thereupon I told him that he should send a petition to the Public Service Commission. The Hon. Minister is himself aware of this case, and I do not propose to go into details. I am merely saying that there should be, for purpose of record, the various test papers and answer papers on which marks had been given by the Divisional Officer concerned. If these papers are in the file they should be available to us. If they are not, then there is something wrong; in which case the whole matter has to be gone into with a view to cancelling the present appointment and calling for fresh applications.

අ. භා. 5.15

ගරු කලුගල්ල

(கௌரவ கலுகல்ல)

(The Hon. Kalugalla)

I think there is something in what the hon. Member has just said. All these applications are with the Divisional Superintendent of Post Offices, Kandy. I do not find a single application in this file, although 15 applications had been made. So, I presume that there is a file with that Divisional Superintendent. In the file which I have there is only the recommendation of the P. M. G. But

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු කලුගල්ල]

හදිසි මරණ පරීක්ෂකයන් ගැන මට කියන්න තිබෙන්නේ, ඒ අයට දී තිබෙන බලයේ හැටියට එම පදවි උසුලන තැනැත්තන් සාධාරණ අය නම් ගැමියන්ට අනවශ්‍ය කරදරවලට මුහුණපාන්න සිදු නොවෙතත් ඇතැම් අවස්ථාවල නරක පුද්ගලයන් නිසා කරදර සිදු වන බවයි. අපේ පළාතේ මරණ පරීක්ෂකවරයෙක් ඉන්නවා. පොල් ගහකින් වැටී එතනම මැරුණු පුද්ගලයෙක් සම්බන්ධයෙන් වුවත් ඒ තැනැත්තා කරන පරීක්ෂණයෙන් පස්සෙ දවස් දෙක තුනක් ගත වනතුරු මිනිය වළලන්න දෙන්නෙ නැහැ; ප්‍රමාද කරනවා. මාතර සිට අධිකරණ වෛද්‍යවරයා එනතුරු මිනිය ගහ ළඟ තියාගෙන ඉන්නවා. එයින් මහජනයාට කරදරයි. රාජකාරිය කළ යුත්තේ සාමාන්‍ය මහජනයාට පහසුවක් වනු පිණිස යි. නීති නිබුණු පලියටම දරදඬු ලෙස ක්‍රියා කරන නිලධාරීන්ගෙන් මහජනයාට ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා සාධාරණ අන්දමට ක්‍රියා කරන්න ඕනෑ. මීට වඩා යමක් කියන්න අදහස් කරන්නෙ නැහැ. ස්තුතියි.

රොමානිස් මයා.
(திரு. ரொமானிஸ்)
(Mr. Romanis)

ගරු සභාපතිතුමනි, අධිකරණය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට මම මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා. මහජනතාවගේ නඩු හබවලදී නීතිඥයන් මාර්ගයෙන් කරුණු ඉදිරිපත් කරන්ට වී තිබීම ගම්බද මහා ජනතාවට අද මුහුණ පාන්ට වී තිබෙන විශාලම කරදරයයි. මීට හේතුව අන්කිසි දෙයක් නොව, උසාවිවල කටයුතු ස්වභාෂාවෙන් කිරීමට ප්‍රමාද වීමයි. මෙය ලොකුම කරදරයක්ය කියා මම විශ්වාස කරනවා. මැතිවරණ කාලවලදී නම් ස්වභාෂාවෙන් වැඩ කිරීම කොයි පක්ෂවලිනුත් ලොකුවට කෙරෙනවා. නමුත් මැතිවරණයෙන් පස්සේ එය ඉදිරියට ගෙන යනවා වෙනුවට ටිකින් ටික තල්ලු කර දමනවා. මේ සභාවේ වුණත් මට හොඳට මතකයි, සිංහල භාෂා උද්‍යෝගයක් කලින් තිබුණ බව. ඒ කාලයේ තිබුණ සිංහල භාෂා උද්‍යෝගය දැන් බොහෝ දුරට අඩු වේගන එනවා. මෙය බොහොම කනගාටුවට කාරණයක්.

සිරිසේන මයා.
(திரு. சிரிசேன)
(Mr. Sirisena)

ඔය පැත්තෙනුයි අඩු වී තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රොමානිස් මයා.
(திரு. ரொமானிஸ்)
(Mr. Romanis)

ඔව්, තමුන්නාන්සේලාගේ පැත්තෙනුත් දැන් ටික ටික අඩුවේගෙන යනවා. යම්කිසි දුක්ගැනවිල්ලක් ගැන දක්ෂ ලෙස කරුණු ඉදිරිපත් කරන්න පුළුවන් දක්ෂ අය ගම්බද ප්‍රදේශවල සිටිනවා. තමන් වෙනුවෙන්ම තමන්ගේ නිදහසට කරුණු ප්‍රකාශ කළ හැකි පුද්ගලයන් සිටිනවා. නමුත් එය ප්‍රකාශ කිරීමට ඔවුන්ට ශක්තිය තිබෙන්නේ තමන්ගේ මව් භාෂාවෙන් පමණයි. එවැනි දක්ෂ පුද්ගලයන්ට එවැනි අවස්ථාවලින් ප්‍රයෝජන ගන්න උසාවිවල ඉඩක් නැත්තේ තවමත් අධිරාජ්‍යවාදී ක්‍රමය මේ රටේ මුල් බැස ගෙන තිබෙන නිසයි. කොයි ආණ්ඩුවකට බලය ගියත් ඒ තත්ත්වය වෙනස් වී නැහැ. එය එහෙමම පවත්වා ගෙන යන්නයි, බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසයි, වැඩි වශයෙන් මහ ජනතාවට මේ විධියේ කරදර විඳින්න සිදු වී තිබෙන්නේ.

පසුගිය සිංහල අවුරුදු කාලයේදී අපේ ප්‍රදේශයේ — මම පදිංචි ගමේම — සුළු කෝලාහලයක් වී ඒ හා සම්බන්ධ නඩුවක් තිබුණා. ඒ නඩුව අවසානයකට පත් වුණේ ඊයේයි. දින 21ක් නඩුව කථා කළාට පසුවයි, ඊයේ ඒ ගැන අවසාන තීරණයක් ලැබුණේ. සභාපතිතුමනි, තමුන්නාන්සේ විකක් හිතා බලන්න, ගම්බද දුප්පත් කෙනකුට ඒ නඩුව සඳහා යන්න සිදු වුණු දින 21ට, එක් දිනකට අඩුම ගණනේ රුපියල් 10 බැගින් ගෙව්වත්, කොපමණ මුදලක් වියදම් වෙනවාද කියා. නීතිඥ මහත්මයා ඒ සඳහා දෙසිය ගණනක් අර ගෙන තිබෙනවා. පළමුවැනි වතාවට රුපියල් 50කුත් ඊ ළඟ එක් එක් දිනය සඳහා රුපියල් 10 බැගිනුත් දෙන්න සිදු වී තිබෙනවා. නමුත් අවසානයේදී මොකක්ද සිද්ධ වුණේ? "වැරදිකාරයාය කියාපන්, නැත්නම් උඹට දඩුවම් කරනවා" කියන එකයි අවසානයේදී නීතිඥයා කීවේ. නඩුවට කථා කළේත් නැහැ. පළමුවැනි වතාවට රුපියල් 50කුත් ඊ ළඟ දින 20ට රුපියල් 10 බැගින් සම්පූර්ණයෙන්ම රුපියල් 250ක්, අරගෙන අවසානයේදී කිව්වේ, "වැරදිකාරයා කිව්වේ නැත්නම් දඩුවම් කරාවි; මට කරන්න දෙයක් නැහැ; වැරදිකාරයා කියා සමාවක් ඉල්ලපන්" කියලයි. ඔන්න දින 21ට පසු සිදු වුණ දේ.

මෙවැනි තත්ත්වයක් තිබෙන විට විශේෂයෙන්ම ඔය විධියට නඩු ප්‍රමාද වීම නිසා දුගී ජනතාවට කොතරම් කරදරයකට මුහුණ පාන්න සිදු වී තිබෙනවාද? ගම්බද මිනිසුන් නඩුවක් ඇති කර ගන්නේ ආසාවට නොවෙයි. යම්කිසි අරගලයක් ඇති වූ විට, එය නිරාකරණය කර ගැනීමට බැරි වූ තැනදී තමයි නඩුවකට බසින්නේ. නමුත් ඔවුන්ට දඩුවම් දෙන්නේ උසාවිය මගින් නොවෙයි. එසේ නම් කව්ද? ඔවුන්ට දඩුවම් දෙන්නේ නීතිඥ මහත්වරුයි. එම නිසා මේ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. මෙය වෙනස් කිරීමට මොනම අන්දමකින්වත් අධිකරණයේ නීතිඥ මණ්ඩලවලින් නම් උපදෙස් ලැබෙන්නේ නැහැ. තමන්ගේ බත් පතේ වැලි දමා ගැනීමට ඒ මහත්වරු සූදානම් වේවිය කියා මම විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා මෙයින් කරදර වන්නේ ගම්බද දුප්පත් මහජනතාවටයි. වඩාමත් කරදරය වී තිබෙන්නේ ස්වකීය භාෂාවෙන් නිදහසට කරුණු ඉදිරිපත් කිරීමේ නිදහස මේ රටේ උසාවිවල නැති නිසයි. නිදහස ලැබී මෙපමණ අවුරුදු ගණනක් ගත වී තිබියදීත් ස්වභාෂාවෙන් නඩු විසඳීමට ක්‍රමයක් නොයොදා තිබීමයි, මීට ප්‍රධාන හේතුව.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

රාජ්‍ය භාෂාව ගැන යු. එන්. පී කාලයේදී කටයුතු නොකළ වරද නිසයි, තවමත් ඒ තත්ත්වය විසඳා ගන්න බැරිව තිබෙන්නේ.

රොමානිස් මයා.
(திரு. ரொமானிஸ்)
(Mr. Romanis)

හැම තිස්සේමත් තමුන්නාන්සේලා දොස් කියන්නේ යු. එන්. පියටයි. මම ඉස්සෙල්ලාත් ඒ බව කිව්වා. හැම ප්‍රශ්නයකටම ලෙහෙසියෙන් දෙන උත්තරය තමයි, "යු. එන්. පී කාලයේ කර තිබෙන වැරදි නිසා" ය කීම. ඒ වැරදි හරි ගස්සන්නයි, මහජනයා තමුන්නාන්සේලාට බලය දුන්නේ. ඒ වැරැද්දම තමුන්නාන්සේලාත් කර කර අනික් මිනිස්සු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළාය කියන එකද් නිදහසට කාරණය? ඕවාද තමුන්නාන්සේලාගේ නිදහසට පෙන්වන්නේ? මෙපමණ කල් මහජන තාව මුලා කරගෙන හිටියා ඇති. දැන්වත් තමුන්නාන්සේලා වැඩ කරන්න සූදානම් වෙන්න ඕනෑ. "යූ. එන්. පීය කරපු දේවල්" කිය කියා සැමදාම කීවාට මහ ජනයා රැවටෙන්නේ නැහැ. ඒවා පිළි ගනීද කියා බලන්න මහජනයා ඉදිරියට ගොසින් දැන් ඕන ඕවා කියන්න.

ගරු සභාපතිතුමනි, මා වාගේ ගම්බද පරිසරයක හැදුණු වැඩුණු කෙනකුට තමයි, මේ අමාරු නියම අන්දමට තේරෙන්නේ. අධිකරණ ඇමතිතුමන්ලා වැනි උදවිය උපන්දා පටන්ම වාගේ යුරෝපීය පරිසර යක හැදී වැඩී පසුව එංගලන්ත ආදී රට වල තිබෙන විශ්ව විද්‍යාලවලට ගොසින් ඉගෙනගෙනයි මෙතැනට ඇවිත් සිටින්නේ. ඒ නිසා, භාෂාව නිසා සාමාන්‍ය ගම් බද ජනයාට මුහුණ පාන්න තිබෙන අමාරු කම් පිළිබඳව කිසිවක් තමුන්නාන්සේලාට තේරෙන්නේ නැහැ. ඉංග්‍රීසි භාෂාව හොඳ හැටි නොතේරෙන උදවියට උසාවි වලදී විදින්න සිදු වන කරදර ගැන කිසිම අවබෝධයක් තමුන්නාන්සේලාට ලබා ගන්න බැහැ. ඉංග්‍රීසි භාෂාව නොදන්න කෙනකු උසාවියට ගියාම සිතාසියක් යැවීමට පවා කී දෙනකුට පගා දෙන්න සිදු වී තිබෙනවාද කියා තමුන්නාන්සේලා සෝදිසි කර බලන්න ඕනෑ. ඒවා රහස් නොවේ. යූ. එන්. පී. කාලයේදී නම් මේවා අල්ලස් දූෂණවලින් පිරී තිබුණාය කියායි, තමුන් නාන්සේලා කීවේ. නමුත් දැන් එය තිබුණාට වඩා දස ගුණයකින් එම දූෂණ කට යුතු වැඩි වී තිබෙන බව උසාවියට යන ඕනෑම කෙනකුට පෙනී යනවා ඇති. ඒ නිසා මේවායින් මහජනයාව මුදවා ගැනීමට උසාවිවල වැඩ කිරීම සිංහලෙන්ම පුළුවන් ඉක්මනින් පටන් ගන්න. හැබැයි පත්‍රවලින් නොවෙයි. පත්‍රවලින් වේදිකා වලින් නම් බොහොම වැඩ කෙරෙනවා. ඔවුන් නියම අන්දමට ස්වභාෂා ප්‍රතිපත්තිය උසාවිවල ක්‍රියාවේ යොදවන්න ගරු අධිකරණ ඇමතිතුමාට උපදෙස් දෙන්නය කියා පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව සමාප්ත කරනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகநாயக்க)
(Mr. W. Dahanayake)

ගරු සභාපතිතුමනි, නඩු සම්බන්ධයෙන් උසාවිවලට යන දුප්පත් ජනතාවට දැනට වඩා සහනයක් ලැබෙන වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යොදවන්නය කියා අධිකරණ ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. "ලීගල් ඒඩ් ස්කීම්" නමින් හඳුන්වන නීතිඥ මහතුන්ගේ උපදෙස් නොමිළයේ ලබාදෙන ක්‍රමයක් දැනට පවතිනවා. මේ ක්‍රමය ගැන මේ රටේ වැඩි දෙනෙක් නොදන්නවා පමණක් නොව සෑම උසාවියකම එම ක්‍රමය ක්‍රියාවේ යොදවන්නේ නැහැ. මෙම මණ්ඩලයේ වැඩ කටයුතු දියුණු කිරීමට මුදල් අවශ්‍ය බව අප පිළිගන්නවා. ඒ නිසා එහි නියම දියුණුවක් ඇති කිරීමට වුවමනා කරන මුදල් අධිකරණ අමාත්‍යාංශයෙන් සපයනවා නම් නොමිළයේ නීතිඥයින්ගේ උපදෙස් ලබා ගැනීමේ ක්‍රමය මීට වඩා දියුණු කර ගන්න පුළුවන්. දකුණු පළාතේ කොතැනකවත් මෙම ක්‍රමය ක්‍රියාවේ යෙදවෙන්නේ නැහැ. බලපිටිය, ගාල්ල, උඩුගම, මාතර, හම්බන්තොට, තංගල්ල ආදි නගරවල තිබෙන උසාවිවල පොහොසතුන් විසින් දුප්පතුන්ට නොයෙක් හිරිහැර කර ඔවුන්ට විරුද්ධව නඩු දමා තිබෙන බව අපි දන්නවා. තමන්ගේ පැල්පත්වලින්, තමන්ගේ ඉඩමෙන්, නඩු පවරා එළවා දමනවා. පරම්පරා පහක් —හයක්, එසේ නැතිනම් අවුරුදු සිය ගණනක් නොකඩවාම පදිංචි වී සිටි ඉඩමෙන් හෝ පැල්පතෙත් මොකක් හෝ නීති ප්‍රශ්නයක් මතු කර ගෙන උසාවියේ මාර්ගයෙන් දුප්පත් උදවිය එළවා දමන්නට ධනවත් අයට වඩා ඉඩ ප්‍රස්ථාව ලැබෙනවා. නුමුත් අර දුප්පත් මනුෂ්‍යයාට තමන්ට ඇති නීත්‍යානුකූල අයිතිය ඔප්පු කර ගන්නට පුළුවන්කමක් නැහැ. යම් විධියකින් රුපියල් 25 ක් හෝ 50 ක් ගෙවා නීතිඥයකුගේ සහාය ලබා ගන්නට පුළුවන් වුණත්, නඩුව විටින් විට කල් යනවා. අවස්ථා දෙක තුනක් එසේ නීතිඥයකු නඩුවට පෙනී සිටීමෙන් පසුව මුදල් ගෙවන්නට බැරිකම නිසා ඉන්පසු නීතිඥයකු ඉදිරිපත් වෙන්නේ නැහැ. මේ නිසා ඒ දුප්පත් මනුෂ්‍යයයින්ට විරුද්ධව නඩුව ඉබේම තීන්දු වෙනවා. ඊට පසුව නීතිය අනුව පිස්කල්වරුන් ඇවිත් බඩු මුට්ටු එළි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

යට දමා පරම්පරා ගණනක් පදිංචි වී සිටි ගෙවල්වලින් එළවා දමනවා. ඔය විධියේ සිද්ධීන් දකුණු පළාතේ නිතරම සිදු වෙනවා. මේ දුප්පත් මනුෂ්‍යයන් නිතරම මන්ත්‍රීවරුන් හමුවෙලා තමන්ගේ දුක් ගැනවිලි කියනවා. නුමුත් මන්ත්‍රීවරුන්ට සහනයක් ලබාදෙන්නට පිළිවෙළක් නැහැ. එම නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ අයට 'ලීගල් ඒඩ්' හෙවත් නීතිඥයන්ගේ උපදෙස් නොමිලේම ලබා දීමට වැඩ කටයුතු සලස්වන්නටය කියා. වුවමනා නම් ඒ සඳහා වැයවන මුදල් මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලුවාම ඉල්ලන ප්‍රමාණයක් දෙන්නට කැමතියි.

අ. භා. 7.30

ගරු සභාපතිතුමනි, ගරු අධිකරණ ඇමතිතුමාගේ අමාත්‍යාංශයට අළුතින් මණ්ඩලයක් පත් කර තිබෙනවා, 'Debt Conciliation Board' හෙවත් ණය බේරීමේ මණ්ඩලය කියා. නුමුත් මම කියන්නට කණගාටුයි, මේ මණ්ඩලයේ වැඩ කටයුතු කිසිසේත් සතුටුදායක නැහැ. ඒ මණ්ඩලයේ පරමාර්ථය විය යුතු වන්නේ නැති බැරි අයට, දුප්පත් අයට, සහනයක් සලසා දීමයි. නුමුත් මේ මණ්ඩලයෙන් කට යුතු කෙරෙන්නේ පොහොසත් අයගේ පැත්ත අරගෙන දුප්පත් අයට කිසිම සහනයක් නොදෙන ආකාරයට බව මේ අවුරුද්දේ ජූලි 27 වැනි දා මා ඉදිරිපත් කළ එක් නිදර්ශනයක් ගරු අධිකරණ ඇමතිතුමාට ඔප්පු කර පෙන්වන්නට පුළුවනි. ජූලි 27 වැනිදා **හැන්සාඩ්** වාර්තාවේ 888 වන තීරුවේ මෙන්න මේ ආකාරයට සඳහන් කරලා තිබෙනවා. ගෝනපිනුවල කේ. එස්. පේමාවතී මහත්මිය විසින් පවරා තිබුණු ණය බේරීමේ නඩුව ගැන එහි සඳහන් වෙනවා. ඒ මහත්මිය කීවා මාස්පතා ඉතා අමාරුවෙන් රුපියල් 75 ක් ගෙවන්නට පුළුවන්ය; තමන්ගේ පරම්පරාවෙන් තමාට හිමි වූ ඉඩම බේරා දෙන්නටය කියා. නමුත් දොළොස් මාසයකින් රුපියල් 4,000 ක් ගෙවන්නට ණය බේරීමේ මණ්ඩලය ඒ මහත්මියට නියම කළා. ඇත්ත වශයෙන්ම මෙය කරන්න පුළුවන්ද කියා කල්පනා කර බලන්න. මෙයින් සිදු වන්නේ ඒ මහත්මියට ඉඩම නැති වී යාමයි. එම නිසා මෙය ණය බේරන මණ්ඩලයටත් මේ දුප්පත් ජනතාවගේ ඉඩම් බේරාගන්න පුළුවන් පිළිවෙලට බලතල පවරන්න ඕනෑ. යම්කිසි විධියකින් අධිකරණ ඇමතිතුමාට මේ කාරණය සම්බන්ධයෙන් සම්පූර්ණ ක්‍රියා මාර්ගයක් යොදවන්න බැරි වෙන්න පුළුවනි. එසේනම් ඇත්ත ඇමතිවරයකු සමග කථා බහ කරලා, දුප්පත් අය ඉඩම් උගස් තියනවා නම් එසේ උගසට බැඳිය යුත්තේ ආණ්ඩුවේ උගස් බැංකුවකය කියා නීතියක් පැණෙව්වොත්, එමගින් ඒ අයට යම් කිසි සහනයක් සළසා දුන්නොත්, අපි ඒ ගැන සතුටු වෙනවා. කොහොම වුණත් මේ ණය බේරීමේ මණ්ඩලයෙන් දුප්පත් ජනතාවට සහනයක් ලැබෙන්නට ඕනෑ.

අපේ කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) සාම මණ්ඩල ගැන මතක් කළා. මෙම සාම මණ්ඩල ව්‍යාපාරය නැසී ගිය එම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා මහතාගේ ඉතාම ශ්‍රේෂ්ඨ සේවයක් සේ සැලකිය හැකියි. තමන්ගේ දරුවකු ඇති දැඩි කරන ආකාරයට එතුමා මෙම සාම මණ්ඩල ඇති කරගෙන ගියා. නමුත් වර්තමාන අධිකරණ ඇමති අංශය මෙම සාම මණ්ඩල බොක්කට තල්ලු කර දමා තිබෙන බව කනගාටුවෙන් සඳහන් කළ යුතුව තිබෙනවා. ඒවා ගැන සැලකිල්ලක් නැහැ. දැන් සාම මණ්ඩල කොපමණ තිබෙනවාද? පසුගිය වර්ෂය ඇතුළත කොපමණ ගණනක් පිහිටුවා තිබෙනවාද? ලබන අවුරුද්දේ නම් එකක්වත් වැඩි කිරීමට මුදල් ඉල්ලා නැහැ. පසුගිය 12 මාසයේ තුබුණු මුදල්වලට වැඩි මුදලක් ඒ සඳහා ඉල්ලා නැති බව අපට පේනවා. එහි අදහස මෙම සාම මණ්ඩල දියුණු කිරීමට තමුන්නාන්සේලාගේ අදහසක් නැති බවයි. මෙය ඉතාමත්ම වැදගත් අංශයක් හෙයින් ලබන 12 මාසය ඇතුළත අළුතින් පුළුවන් තරම් සාම මණ්ඩල පිහිටුවන්න. එසේ කළහොත් ලොකු සේවයක් සැලසෙනවා. උසාවියට නොගොස් බොහෝ ආරාවුල් බේරා ගන්නට පුළුවන් වෙනවා ඇති. අළුතින් සාම මණ්ඩල පිහිටුවීම ගැන සෑම මන්ත්‍රීවරයකුම සන්තෝෂ වෙනවා නොඅනුමානයි; උදව් දෙනවා නොඅනුමානයි. සාම මණ්ඩල මඟින් නඩු යෑම් වළක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්නට පුළුවනි. එයින් ජනතාවට සහනයක් සැලසෙනවා. එම නිසා විශේෂ උනන්දුවක් ගෙන තවත් මුදල් යොදවා ලබන වර්ෂයේදී සාම මණ්ඩල බොහෝ ගණනක් පිහිටුවීමට කටයුතු කරන්න. සාම මණ්ඩලවල සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කරන්න.

උසාවිවල සිංහලෙන් නඩු ඇසීම ගැනත් මතක් නොකර බැහැ. මේ පිළිබඳව මීට හය මාසයකට පෙර තුබුණු උනන්දුව අද නැති වී ගොස් තිබෙන බව කනගාටුවෙන් මතක් කළ යුතුයි. දැනට හය මාසයකට පෙර සමහර උසාවිවල සිංහලෙන් නඩු ඇසූ බව අප දන්නවා. නමුත් මෙම ගරු සභාවේ සිදු වන්නාක් මෙන් එය නිකම් ලිස්සා යවා ආයෙමත් ඉංග්‍රීසියටම බැස තිබෙනවා. දැනට හය මාසයකට පමණ පෙර උසාවිවල සිංහලෙන් නඩු ඇසීම සඳහා ගරු අධිකරණ ඇමතිතුමාට අප බලයක් දුන්නා. එහෙත් අද උසාවි කීයක සිංහලෙන් නඩු අසනවා දැයි තමුන්නාන්සේට කියන්නට පුළුවන්ද? සිංහලෙන් නඩු අසන උසාවි ගණන වැඩි වුණාද? හරි විස්තර දැන ගන්නට අප කැමතියි. සමහර උසාවිවල සිංහලෙන් නඩු ඇසීම කන්දෙන් පටන් ගෙන කෙන්දට වැටීමේ තත්ත්වයට පත් වී තිබෙනවා; පරණ පුරුදු ඉංග්‍රීසියටම බැස තිබෙනවා. උසාවිවල නම් කියවන්නට මට වුවමනාවක් නැහැ. ඉංග්‍රීසියෙන් නඩු අසනවා වෙනුවට ලබන 12 මාසයේදී කොතරම් උසාවි ගණනක සිංහලෙන් නඩු ඇසීමට අදහස් කරනවාද?

ඊළඟට, තමුන්නාන්සේ භාරයේ පවතින ඕ. එල්. ඩී. කියන රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුව ගැනත් වචනයක් කියන්නට ඕනෑ. ලබන වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව මගින් මොන විධියේ දියුණුවක් සැලසීමට තමුන්නාන්සේ බලාපොරොත්තු වෙනවාද? මීට කලිනුත් මෙම ගරු සභාවේදී මතක් කරන ලද කාරණයක් නැවත මතක් කිරීමට මා කැමතියි. සිංහල පමණක් උගත් තරුණයකුට තවම පෙරකදෝරු විභාගය ගන්නට බැහැ. එසේ නම් උසාවිවල සම්පූර්ණයෙන්ම සිංහලෙන් නඩු ඇසීමට අප කටයුතු යොදන්නේ කොහොමද? පෙරකදෝරු විභාගයට ඇතුළු වීම සඳහා තිබෙන ප්‍රවේශ පරීක්ෂණයට, "ඇඩ්මිෂන් ටෙස්ට්" එකට ඉංග්‍රීසිත් වුවමනායි. ඉංග්‍රීසි විෂය නැතිව සිංහල ජ්‍යෙෂ්ඨය සමත් වුණාට එම පරීක්ෂණයට පෙනී සිටින්නට බැහැ. හැම එකකටම ඉංග්‍රීසි වුවමනා කරනවා. මේ මොකදැයි මට නම් තේරෙන්නේ නැහැ. ගම්බද පාඨශාලාවල ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ට ජ්‍යෙෂ්ඨ විභාගයේදී ඉංග්‍රීසි භාෂාව විෂයයක් හැටියට ගෙන සමත් වීම ඉතාමත්ම අමාරු බවට හතර අවුරුද්දක් තුළ අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් සිටි මා අධිකරණ ඇමති අංශයට සාක්ෂි දෙනවා. ඉංග්‍රීසිය වැදගත් භාෂාවක්. තිබෙන්නේ ක්‍රමයේ දුර්වලකමයි. ඒ නිසා ඉංග්‍රීසියෙන් අනිවාර්ය විෂයයක් හැටියට සමත් විය යුතු යයි නියම කිරීම ලොකුම ලොකු වරදක්. මෙය මම ගිය අවුරුද්දේ කිව්වා. දැන් මේ අවුරුද්දේ නැවත වරක් කිව්වා. ලබන අවුරුද්දේත් කියන්නද? මම අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඉංග්‍රීසි භාෂාව විෂයයක් හැටියට නොගෙන සිංහලෙන් සමත් වූ අයටත් පෙරකදෝරු විභාගය සඳහා ඉගෙනීමට අවසර දෙන්න කියා. පෙරකදෝරු විභාගය සඳහා ඉංග්‍රීසි හා ලැටින් වුවමනා කරන්නේ නැහැ. ඒ ඔක්කොම භාෂාවලට වඩා මහජනයාගේ ඕනෑ එපාකම් ගැන, ඔවුන්ගේ දුක් කරදර ගැන, සාමාන්‍ය දැනීමක් තිබෙනවා නම් නීතිය පිළිබඳ කරුණු දුප්පත් ජනතාව වෙනුවෙන් පෙන්නා දෙන්න පුළුවනි. එම නිසා මේ ලබන 12 මාසය ඇතුළතදී මගේ ඉල්ලීම ඉටු කරනවාය කියනවා නම් අධිකරණ අමාත්‍යාංශයේ කිසිම වැය ශීර්ෂයකට මම විරුද්ධ වන්නේ නැහැ. ඉංග්‍රීසි භාෂාව විෂයයක් හැටියට නොගෙන සිංහල භාෂාවෙන් සමත් වූ අයට පෙරකදෝරු විභාගය සඳහා ඉගෙන ගැනීමට නීති විද්‍යාලයට ඇතුළත් වන්න ඉඩ දෙන්න. එසේ කළොත් අපි සියලු දෙනාම ඉතා සන්තෝෂ වී ඒ ගැන අපි තමුන්නාන්සේට පින් දෙනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

The hon. Leader of the House now wishes to make a statement.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I wish to make some observations on the remarks made by certain Members on the question of the prerogative. The Government had no intention of changing the position. The principles were announced on 1st August, 1957—column 444 of the HANSARD of 1st August, 1957—namely the following of the English practice of publishing every year the statistics relating to crime and cognate matters.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

What is that book ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Our HANSARD of 1st August, 1957—column 444.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

Whose speech is that ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

The Parliamentary Secretary, made with the approval of the then Prime Minister.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

What did he say ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

He said that we were announcing the statistics of the exercise of the prerogative as in England where the Home Minister publishes the information. Beyond that no undertaking has been given to furnish the reasons which prompts the Minister of Justice to advise the Governor-General in a particular case. That is the practice in England and the statement made here shows that we are following the same practice.

In fact, I might also say that the Hon. the Minister of Justice, having gone through the case and certain other evidence which he had, had considered in his discretion to advice the Governor-General to do what he wished. But we will publish all the information available as in England.

Then there is the other matter about the Vote of No Confidence on the Government referred to by the hon. Member for Bulathsinhala (Mr. Edmund Samarakkody). There are many things. Agnes Nona's case is only one.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)

What is the position ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

It is not the practice in England. The late Prime Minister did not undertake to give the reasons in each case, but only the statistics.

Then about the Joint Select Committee, all I wish to say is this. As you know, this House passed a Motion. A Message was sent to the Senate but a similar Motion has not yet been passed by the Senate probably—

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

Why ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

—probably because it has not yet met. When it is passed this House will be informed and we shall, as soon as we can bring the Motion to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

elect the Members to the Joint Select Committee. Then I believe the procedure is to send again a Message to the Senate, and when it is approved, the Select Committee will come into being. That is the position. The Senate has not yet passed the corresponding Resolution, and the Message has not yet been received by this House to that effect. We are therefore unable to take the next step, namely of bringing in a Motion to elect a Joint Select Committee. That is our difficulty.

අ. භා. 7.45

ජේ. ආර්. ජයවර්ධන මයා.

(திரு. ஜே. ஆர். ஜயவர்தன)

(Mr. J. R. Jayewardene)

With reference to the statement made by the Hon. Leader, I would like to draw his attention and that of the hon. Parliamentary Secretary to the Minister of Justice to the HANSARD 22nd June, 1961, when there was a Debate on the Emergency and the question of the fast of the hon. Member for Welimada came up.

The hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena) said that he had met the Hon. Minister of Justice and discussed with him the question of the fast, the appeal to the Privy Council and the question of pardon of the hon. Member for Welimada. This is what the hon. Member for Avissawella stated :

"Did not the Minister of Justice tell me that he went through the record and he found certain alterations in the record and that from his reading of the record he was in a position to recommend a pardon ? "

That is in column 7995 of HANSARD. The Hon. Minister of Finance was speaking at the time the interruption was made but he said that he did not know about this matter. He said :

"If the Hon. Minister of Justice reads the record and finds that there is a case for pardon, I have no doubt that he is going to give it at the proper time and at the proper stage."

but that their hands were tied because the hon. Member for Welimada was then appealing to the Privy Council ; he had asked for certain time to deposit money and his lawyers were discussing with the Government Members ; secondly, he was undergoing a fast and they did not wish to yield to pressure. But the Hon. Minister of Justice had read through the record and had made a statement to the hon. Member for Avissawella that he was in a position to recommend a pardon.

Now there is no fast, there is no appeal to the Privy Council. Why then, we want to know, has the pardon not been granted ? Why only a remission of sentence ? There is a categorical statement here, uncontradicted in this House and in the Senate, that the Hon. Minister of Justice told a Member of this House that having read through the record he was in a position to recommend the pardon. That is the question that I ask.

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சீ. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

It can be contradicted only by the Hon. Minister of Justice who is not here.

එම්. සිවසිතම්පරම් මයා.

(திரு. எம். சிவசிதம்பரம்)

(Mr. M. Sivasithamparam)

I wish to make a few comments on two or three questions under the Votes of the Minister of Justice.

The Hon. Minister brought in a very desirable amendment sometime ago to dispense with the attendance of doctors and medical officers and so on to give evidence in courts of law, because these people had much more responsible work to do and their time was being unnecessarily spent in giving evidence in trivial cases. Although the amendment was passed, the practice continues and doctors have to come into Court and wait for more than two or three hours on certain occasions even in Section 314 matters, where medical evidence is not very necessary. I think the Hon. Minister should, by circular, inform the Police officers of the amendment to the law and the necessity for not

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. සිවසිතම්පරම් මයා.]

summoning the doctors in trivial cases. I think if that is done the Police would not in all cases summon doctors, particularly in outstations where the D. M. O. is also the chief medical officer of a hospital and his time has to be spent in courts.

The other matter is regarding the codification of our law. Even a trained lawyer has to go into a large number of books before finding out exactly what the legal position is in regard to a certain matter. Even in regard to our statutes, with so many amendments made at different times and appearing in different volumes of subsidiary legislation, one is not sure as to what the exact position is with regard to the law. I think it is time that the Hon. Minister turned his attention to the task of codifying the law, so that even a layman can very easily find out what the legal position is in regard to any particular matter.

Having said that, I wish to make a few comments on the functioning of the Official Language Department. At the very outset I want to say that the Official Language Department is not carrying out the Government's own policy on language as far as the Tamil Language (Special Provisions) Bill is concerned. It is the accepted policy of this Government that for certain prescribed administrative purposes Tamil shall be the language of administration in the North and the East. It is accepted that when a person communicates with the Government in Tamil, the reply shall be given in Tamil. It is accepted that the medium of instruction from the kindergarten up to the university shall be in Tamil. These are three accepted principles in the language policy of the Government. The Official Language Department exists to implement this policy, not only in regard to Sinhala being the only official language, but also in regard to Tamil being a regional language and the medium of instruction from the kindergarten to the university.

It is interesting to note that the Estimates in regard to the Official Language Department are divided into three apportionments. Apportionment 1 is to deal with the transaction of business in the official language. Apportionment 2 is to deal with publications in the official language. Apportionment 3 is to deal with publications connected with the use of Tamil for certain prescribed purposes. The description of Apportionment 2 as "Publications in the official language", is a new term which has been used in place of the older one "Educational publications". As the hon. Parliamentary Secretary will admit, this department deals not only with translation and publication in Sinhala but also with translation and publication in Tamil. I do not think, therefore, that the description of this apportionment as "Publications in the official language" is correct.

This matter was raised in 1959 on the Floor of this House by the late hon. Member for Kopay. The Hon. Prime Minister, in whose charge this department was in 1959, made this reply :

> Then my hon. Friend came to the actual Estimates. There he raised a number of detailed points. I am very grateful to him because some of them are of some importance. The first point he raised was regarding the title of Vote No. 2—"Publications in the Official Language." Under this Vote the textbooks for schools and educational institutions are prepared both in Sinhalese and Tamil. Therefore I quite agree with him that the title, "Publications in the Official Language" is somewhat incorrect. I am grateful to him for having pointed that out. Vote No. 2 is not merely for Sinhalese, as you will see from the staff and cadre provided. It is true that the title is not very correct. —[OFFICIAL REPORT, 11th August, 1959; Vol. 36, c. 871-872.]

That was what the late Hon. Prime Minister said when this matter was raised in 1959. I am sorry to see that the same mistake—if it is a mistake—has been repeated this year, although this matter was pointedly brought to the notice of the Government more than once. This is typical of the way in which the powers that be in this department are dealing with the Tamil section of the Official Language Department. Whatever good intentions of the Government are being nullified by over-enthusiastic officers

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

in this department who from time to time have been reducing the staff of this department. The hon. Parliamentary Secretary should know that since 1959, particularly after the death of the late Hon. Prime Minister, two officers have been transferred out of this department.

I have also this very reliable information that a recommendation has been made to the Public Service Commission that the post of Chief Tamil Research Officer be suppressed. I am sure the hon. Parliamentary Secretary will appreciate the fact that with the suppression of the post of Chief Tamil Research Officer, the Tamil section of this department will come to a halt and no further work will be done in regard to translation or publication. I do not know whether the Public Service Commission will act on this recommendation. I would appeal to the hon. Parliamentary Secretary to look into this matter and to see to it that, if there is any such recommendation, it is withdrawn.

The cadre provided under Apportionment 3, that is, the unit dealing with the Tamil Language (Special Provisions) Act, consists of one Research Officer, two Superintendents of Translations, two Translators and one Research Assistant. The funds in respect of all these officers are provided under Apportionment 3, that is, the unit dealing with the Tamil section. In actual fact, however, one Superintendent of Translations, one Translator and the Research Officer himself are not functioning in the unit which deals with the administration of the Tamil language. Instead, they are working in the Publications section, which is under an entirely different Apportionment and has nothing to do with this unit which deals with the administration of Tamil.

It is curious that, while officers working in this unit are being transferred to other sections and asked to work there, when heads of departments write to this department and ask for translations of forms and other documents, they are informed that the work cannot be undertaken for lack of adequate staff. I am personally aware of more than one instance where heads of departments have written in, asking for translations of forms, and the reply has been: "We are sorry, we cannot undertake this work because we do not have adequate staff". While this reply is being sent to heads of departments, officers whose salaries are paid out of the funds for this unit, have been transferred to the Publication section. I shall give one instance. Income tax return forms are not available in Tamil. A number of Tamils have written to the Inland Revenue Department with the request that they should be furnished with forms in Tamil. The reply has been that the official language section is unable to undertake the translation of income tax return forms because it does not have adequate staff.

As a result of this type of disorganised work and as a result of officers being kept in two different units, although paid from one vote, today we find that the Tamil section of the department is lagging far behind. I am not complaining. I think it is only right that greater emphasis should be placed on the Sinhala section, as Sinhala is the only official language. But there should be some proportion in the work that is being done.

You will see that, while only one volume of the glossary has been published in Tamil, five volumes, I believe, have been published in Sinhala. Medical terms in Sinhala have been published, but medical terms in Tamil have not been published. A number of textbooks on Medicine have been translated into Sinhala and published, but not a single textbook on Medicine has been published in Tamil. Of course, the reply might be that in South India there is a large number of textbooks on these subjects; therefore what is the necessity for duplicating this work? I think it has been pointed out that the Tamil spoken in South

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

[එම්. සිවසිතම්පරම් මයා.]

India is not the same Tamil that we speak in these provinces. Quite apart from that, there should be standardized textbooks. If you have one textbook in Sinhala, then you should have the same textbook in Tamil. Otherwise, students will be handicapped by their having to study different textbooks on the same subject.

I would also like to make a few comments on the question of stenography and typewriting. If the Government's intention is that every Tamil who writes to the Government in Tamil should receive a reply in Tamil, then it is necessary to develop Tamil stenography and typewriting. But what has happened in this Department? One instructor in Tamil stenography has been discontinued. He has been transferred out of this Department. And out of two instructors in Tamil typewriting, one has been transferred out and only one is left. In 1959 a number of candidates were selected for training in Tamil stenography and typewriting, but up to date no training has been given to those people who have been selected.

අ. භා. 8

I do not wish to take any more time. May I appeal to the Hon. Minister—these are matters which sometimes make people feel bitter about the entire functioning of the Department—to personally see whether some of the things I have raised on the Floor of this House are factually correct or not, and to see that some remedy is afforded.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන්, ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපති මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 1961 සැප්තැම්බර් 1 වන සිකුරාදා.

කල්තැබීම

යෝජනාව ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී: "මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය"—[ගරු සී. පී. ද සිල්වා]

කල් තැබීම

ඩබ්ලිව්. දහනායක මයා

(திரு. டப்ளியு. தகனுயக்க)

(Mr. W. Dahanayake)

Mr. Deputy Speaker, there is an extremely important item of news in the "Daily Mirror" of today's date which I would wish to bring to the notice of the Hon. Minister of Education. According to this item of news, next year the University at Peradeniya will not be able to admit the normal intake of 1,000 internal students. Instead, the University will be compelled to cut down the number of internal students to an intake of 400 for the year.

This is a very serious situation. When this House passed legislation that external students should be taken to the Universities it was intended that the external students should be counted over and above the normal intake of internal students. For this purpose the Education authorities must set about to start new Faculties preferably in Colombo.

I would appeal to the Hon. Minister of Education not to postpone this question but to set about at once to set up a new Faculty of Arts in Colombo. It should also be possible to permit some of the better secondary schools to start degree classes. That was also one of the steps we had in mind when we asked the Universities to admit external students. Some of our better schools should be affiliated to the University so that degree classes can be conducted in those schools.

If the Hon. Minister of Education would take immediate steps on the lines. I have suggested, by the time that the Universities have to enroll new students next year it will be possible to take in a large number of external students. Otherwise, if the Hon. Minister of Education does not take steps to carry out this scheme now itself, I am afraid that the University will be faced with an impossible problem next year.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I want to bring to the notice of the Hon. Acting Minister of Health a new circular that has been sent out by the Director of Health Services. It deals with leave conditions and medical certificates. According to the terms of this new circular, certificates from ayurvedic physicians are to be permitted for illnesses that do not exceed a fortnight. The new circular further states that if an employee offers a certificate from an ayurvedic physician for an illness that goes beyond a period of 14 days, the employee concerned should support the ayurvedic physician's certificate with a further certificate from a Western medical practitioner.

This new circular sets at naught one of the principles that had been enunciated in 1956 or 1957 by the S. W. R. D. Bandaranaike Government. How can an employee who gets a medical certificate from an ayurvedic medical practitioner for an illness that goes beyond 14 days support such an illness later on with an additional certificate from a Western medical practitioner ? The Western medical practitioner will tell him. "I did not treat you for your illness. I cannot give you a certificate."

I would ask the Hon. Acting Minister to look carefully into this matmatter, withdraw this new circular and grant relief to the employees so that medical certificates from registered ayurvedic physicians can be offered for illnesses that go beyond 14 days, without being supported by an additional medical certificate from a Western practitioner.

අ. භා. 8.8

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

I have two matters to raise. The first is with the Hon. Minister of Local Government and Housing. He is not here at the moment, but I hope the hon. Parliamentary Secretary will bring the matter to his notice and see that something is done. It concerns the operation of the Rent Restriction Act, as we adopted it recently, and the functioning of the Colombo Rent Control Board. The new Rent Restriction Act provides for something which had already been there earlier, namely, for the Board to take the rents where the landlords have some dispute with the tenants, and it was possible for the tenants to be victimized by the landlords by the non-acceptance of rents which would enable the landlords to take the tenants before the Board requesting for an order of ejectment. The new provisions were a little more liberal and made it possible also for local authorities to accept these rents.

What is the use of providing for an Amendment of the law which is going to give some relief to the tenants if you do not operate it ? If there is one local authority in the Island that can operate the rent law in that way, it is the Colombo Municipal Council. But there is one snag in this matter. Under the Act, the monies required for the implementation of the rent law cannot be voted out of the municipal funds but must be provided by the Hon. Minister, that is, by this House. I pointed that out to the Hon. Minister when we were discussing the amendment of the Act. I also pointed that out to the Hon. Minister of Finance. They both gave a very favourable indication that they would provide such monies. But that is not being done. The Colombo Municipal Council has asked for the necessary funds to set up the Rent Control Department but that money has not been provided.

The authorized officer under the Act, if he is to function properly, requires to know what the assessed value of premises is in order to calculate the authorized rent.

Those documents are available in the Colombo Municipal Council. They are not available to the authorized officer of the Rent Control Board. I must say that the officer is trying to do his best in the circumstances. But

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

how can he function under the circumstances? Besides, he has not been given the proper equipment. He has a small office in the Fort and the office is crowded everyday. There is not enough furniture and not enough clerks. Another aspect of the matter is the functioning of the Rent Board itself. Once before I complained against the Chairman. That Chairman is not there now but the Rent Board is not functioning properly.

Here is a news item which has been published on the basis of a Government decision itself. The Minister of Local Government and Housing, Mr. Mahanama Samaraweera, yesterday sent out instructions to the Rent Control Board to ask all tenants who felt that their landlords were charging exorbitant rents to pay their rents to the Rent Control Board. Mr. Samaraweera had told officials of the Board that he had decided to enforce rigorously the provisions of the Rent Control (Amendment) Act. He therefore wanted the Board to co-operate with him by ensuring that his instructions in regard to the implementation of the Rent Act were carried out.

That was on the 22nd August.

It was as a result of representations made by a body called the Rent Payers' Association of Colombo which had been agitating for arrangements for the payment of rent to the Board because of a dispute that had arisen in regard to some house known as "Thalakotuwa" in the Kirulaponne area. They wanted to pay the authorized rent to the Board. The Board refused to accept and then they went to the Minister. The Minister authorized the officer to accept the rent. They accepted the rent and issued a receipt. On this receipt you find these words printed: "Temporary acknowledgement—not a valid receipt". That is what the Rent Board has done. When the poor tenant goes and pays his rent there and gets a cyclostyled form for a receipt on which it is said: "Not a valid receipt", he has no confidence that the Rent Board accepted the money and that he has the protection of the law. Of course, we know that this safeguard is put there for the Board to be protected from the provisions of the Stamp Ordinance because there is no stamp on this receipt. They have created a safeguard for themselves. That is the most charitable interpretation I can give. It says: "Temporary acknowledgment—not a valid receipt". The person who gets this receipt will not have the protection of the law. In the Moratuwa Urban Council there is a Rent Board and there they issue a valid receipt. I do not see any reason why the Colombo Rent Control Board cannot function in the same way. Of course, I must say that the Colombo Rent Control Board moves in a mysterious way its wonders to perform. The other day it converted a man into a woman. One Mr. M. A. P. Seneviratne complained to the Board that the landlord was in collusion with Mrs. Seneviratne.

අ. භා. 8.15

The landlord had some person, who was interested in his behalf to function in some capacity in regard to this Board; I do not know in what capacity. When the matter came up for hearing the application had been changed from Mr. Seneviratne to Mrs. Seneviratne, making the lady, who apparently was not on the best of terms with her husband—who was in collusion with the landlord—the applicant in the case. The poor tenant who had made the application was told, "You had made no application, we cannot hear you."

ඩබ්ලිව්. දහනායක මයා
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

The landlord stole his wife?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

He had not gone so far but he was certainly trying to rob the tenant of various other things. The Chairman of the Board said, "I cannot hear you." The lady was there in court and she said, "I made no application."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

There was observed from the attached copy of the original application that was secured by the applicant that the name there was correct and the signature there was correctly entered in the application. Now how did the gentleman become a lady by the time the matter came up for hearing? That is why I said the Rent Control Board of Colombo moves in a mysterious way its wonders to perform. It is time that this matter was looked into and corrected.

The second matter, I will not take more than two minutes, is this. I did not raise it under the Votes of the Minister of Justice because this is a matter which really concerns the Minister of Justice and the Minister of Finance and, therefore, I would like the Hon. Leader of the House to raise this matter as a policy matter with the Government and see that some redress is given. Public officers who are unable to comply with Government's Official Language policy have been given the right to retire and a certain scheme of compensatory retirement has been worked out. Treasury Circular No. 526 lays down those conditions. In short, if a person retired, 5 years will be added to his period of service for the purpose of computing pension. That is the compensatory retirement scheme.

This was what was allowed to any officer who retired when there was a change of Constitution. When the Donoughmore Constitution was imposed officers retired under it and when the Soulbury Constitution replaced the Donoughmore Constitution officers retired under this, and when Sir John Kotelawala was the Prime Minister he told the public servants, "If you are not prepared to serve under my Government, you can get out." He gave them the option of retiring in this way.

The Official Language policy affected a number of public servants. They joined the public service at a time when the study of Sinhalese and Tamil was not encouraged in this country. They received their education in English and they joined the public service in the hope of being able to perform their duties in English. With the best will in the world, some of them will not be able to pick up the language in time and, therefore, some of them hoped to retire and go away. Why cannot you treat them a little more generously instead of treating them in this way—the change that has taken place is more far-reaching than a mere change of administration—and retire them as if there were a change of Constitution, because the administrative apparatus has changed and their terms and conditions of service may change under that? Since there was a change of one contracting partner the other partner too should be allowed to retire and go away. That is the presumption. But this is a more far-reaching change. Why cannot you treat them a little more generously? I ask this Government, through the Hon. Leader of the House, to withdraw this Treasury Circular 526 and to see that something more generous is done in the way of compensatory retirement.

පී. සී. ඉඹුලාන මයා. (රුවන්වැල්ල)
(திரு. பீ. சீ. இம்புலான—ரூவான்வல்ல)
(Mr. P. C. Imbulana—Ruwanwella)

ගරු උප කථානායකතුමනි වැඩ බලන ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ දැනගැනීම සඳහාත්, සුදුසු යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහාත්, අපේ කොට්ඨාශයේ තිබෙන කරවනැල්ල ආරෝග්‍යශාලාව සම්බන්ධයෙන් කරුණු දෙක තුනක් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. මේ ආරෝග්‍ය ශාලාව සම්බන්ධයෙන් මෙම ගරු සභාවේදී මීට පෙර සෞඛ්‍ය කටයුතු පිළිබඳ වැඩ බලන ගරු ඇමතිතුමාගෙන් මම ප්‍රශ්න රාශියක් ඇහුවා. ඒ ස්ථානයේ තිබෙන දන්තාගාරය ගැන ප්‍රශ්න කීපයක් ඇහුවා. ඒ දන්තාගාරයේ වහල කඩා වැටෙන තත්ත්වයක තිබෙනවා. කොයි වේලාවේ එය කඩා වැටේද කියන්න බැහැ. ඒ ත්ත්ත්වය නිසා මහජනයාට විශාල පාඩුවක් වී තිබෙන බව කියමින් ප්‍රශ්න රාශියක් මම ඉදිරිපත් කළා. ඒ ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් කීවේ, වහල අලුත්වැඩියා කිරීම සඳහා දැනටමත් ඇස්තමේන්තු පිළියෙළ කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉඹුලාන මයා.]

තිබෙනවාය කියායි. එසේ කියා මාස 5 ක් 6 ක් ගත වී ඇතත්, මේ වැඩේ තවම ආරම්භ කර නැති බව කියන්න සිදු වී තිබෙනවා. එම නිසා ඉතා ඉක්මනින් එම වැඩේ කරන සැටියට මම ඉල්ලා සිටිනවා.

එම ආරෝග්‍යශාලාවේම ජල නළ ක්‍රම යෙන් වතුර සැපයීම තවම නිසි පරිදි හරි ගස්සා නැහැ. මේ වැඩෙන් දෙකෙන් පංගුවක් යම්කිසි කොන්ත්‍රාත්කාරයකු ලවා කරවා තිබෙනවා. ඉතිරි දෙකෙන් පංගුව සම්පූර්ණයෙන්ම අත්හිටවා තිබෙනවා. ඒ මොන හේතුවක් නිසාද කියා මම දන්නේ නැහැ. එම නිසා තවත් ප්‍රමාද නොකර හැකි ඉක්මනින්ම එය කර දෙන ලෙස මම වැඩ බලන ගරු සෞඛ්‍ය ඇමති තුමාගෙන් ඉල්ලා සිටිනවා.

එසේම ඒ කරවනැල්ල ආරෝග්‍යශාලා වේ හෙදියන්ගේ නිවාසය කඩා දමා තිබෙනවා. එය ගොඩනැඟීම සඳහා යම්කිසි වැඩ පිළිවෙලක් ඇති කර නැහැ. එක්තරා කොන්ත්‍රාත්කාරයෙක් වැඩේ භාරගෙන තිබෙනවාය කියා අපට ආරංචි වුණ නමුත් ඒ ගොඩනැඟිල්ල ඉදි කිරීම සඳහා මූලික පියවරවත් අරගෙන නැහැ. එබැවින් එම වැඩේ ඉක්මනින් කිරීමට වැඩ පිළිවෙළක් යොදන ලෙසත් මම ඉල්ලා සිටිනවා.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාරි මාර්ග දෙපාර්තමේන්තුව මෑතක සිට පොඩි ලෙඩක් පටන් ගෙන තිබෙනවා. එනම්, ස්ථිර සේවකයන්ට මාසයක් කල් දී අස් කරන්නට පටන් ගෙන තිබෙනවා. ඒ ගැන ගරු ඉඩම් ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරවන්න කැමතියි. මේ අස් කිරීම පටන් ගෙන තිබෙන්නේ දැන් මාස කීපයකට පෙර සිටයි. කවුඩුල්ල ව්‍යාපාරයේ සේවය කළ කම්කරුවන් 300 ක් පමණ අස් කළ අවස්ථාවේදී වහාම නැවතත් එම සේවකයින් බඳවා ගන්නා ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුවට නියෝග කිරීම ගැන මා ඉඩම් ඇමතිතුමාට ප්‍රශංසා කරන්නට කැමැතියි. මගේ ආසනයේත් අස් කර දමන ලද කම්කරුවන් 50 දෙනකු මා අද සවස එතුමාට ඉදිරිපත් කළා. ඒ කම්කරුවන් මේ අවස්ථාවේදීත් එළියේ සිටිනවා. ඒ කම්කරුවන්ටත් යම්කිසි සහනයක් ලබා දීමට එතුමා පියවරක් ගැනීම ගැනත් මා සන්තෝෂ වෙනවා. ඒ වගේම මින් ඉදිරියට මේ විධියට කම්කරුවන් අස් කර දමන්ට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ඉඩ නොතබන ලෙස මා එතුමාගෙන් ඉල්ලා සිටින්න කැමතියි. මෙය කම්කරුවන්ගේ වැරදි නිසා ගෙන යන ප්‍රතිපත්තියක් නොවෙයි. කම්කරුවන්ට වැඩ දීමට දෙපාර්තමේන්තුවේ මුදල් නැතැයි කීම අපට පිළිගන්න පුළුවන්කමක් නැහැ. දෙපාර්තමේන්තුවේ මුදලුත් තිබෙනවා, වැඩත් තිබෙනවා. මහියංගනයට නුදුරු මිණිපේ ආසනයට අයත් කොටසේ විශාල වාරිමාර්ග වැඩ කොටසක් පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට දී තිබෙනවා. එම වැඩ පුද්ගලික කොන්ත්‍රාත් කරුවන්ට දෙන්න පෙර වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් කල්පනා කරන්න ඕනෑ, ස්ථිර කම්කරුවන් විශාල පිරිසක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ සිටින බව. අනික් කාරණය, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කම්කරුවන් යොදා කරවන වැඩවලින් පාඩු විඳින්නට සිදු වෙනවායයි කියා සිටියත්, එසේ සිදු වන්නේ කම්කරුවන්ගේ වරදින් නොවෙයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් අත්තම් ක්‍රමයට වැඩ ගෙවල්වලට භාර දී පාඩු නොවන ආකාරයට ඉතා ලක්ෂණ වැඩ කොටසක් ගෙන යනවා. ඇයි, ඒ ක්‍රමය වාරි මාර්ග දෙපාර්තමේන්තුවටත් අනුගමනය කරන්න බැරි? මේ විධියට කම්කරුවන් රස්තියාදු නොකර වෂී 8, 10 සේවය කර තිබෙන ඉතා හොඳට වැඩ කරන්න පුළුවන් පුහුණු කම්කරුවන් නිකරුණේ අස් කර නොදමා ඒ අයට සහනයක් ලබා දෙන ලෙස ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ලක්ෂ්මන් ද සිල්වා මයා. (බලපිටිය)
(திரு. லக்ஷ்மன் டி சில்வா—பலப்பிட்டிய)
(Mr. Lakshman de Silva—Balapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මාසයේ 24 වැනිදා බලපිටිය ආරෝග්‍යශාලාවේ සිදුවූ එක්තරා සිද්ධියක් ගැනයි මට ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙන්නේ. මෙම කරුණ ගැන අපේ වැඩ බලන සෞඛ්‍ය ඇමතිතුමාටත්, ඒ වගේම ගාල්ලේ සෞඛ්‍ය නිලධාරිතුමාටත්, සෞඛ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යක්ෂකතුමාටත් විදුලි පණිවුඩ මගින් දැනුම් දුන්නා. එහෙත් ඒ සම්බන්ධයෙන් මේ දක්වා කිසිම විභාගයක් පවත්වා නැහැ. ඒ සිද්ධිය මේකයි: එදා මා ඒ ආරෝග්‍යශාලාව ඉදිරියෙන් කාර් එකකින් ගමන් කරද්දී ලේ ගලමින් ලොරියක් ඇතුලේ සිටින ලෙඩකු දැක්කා. ඒ ලොරිය ඇතුලේ දෙතුන් දෙනකු සිටි අතර ලොරිය අසලත් කීප දෙනෙක් සිටියා. ඒ සිද්ධිය දැක්ක මා කාර් එක ආරෝග්‍යශාලාවේ වත්තට ඇතුළු කර දෙස්තර මහත්මයාගේ කාමරය බලා ගියා. මා එහි යන විට දෙස්තර එහි සිටියේ නැහැ, සාත්තු සේවිකාවක් නර්ස් සහ ඇපොතිකරි කෙනෙක් පමණක් එතැන සිටියා. කවුද මේ වෙලාවට වැඩ බලන දෙස්තර මහත්මයා කියා මා ඔවුන්ගෙන් ඇසුවාම ඔවුන් ඊට උත්තර යක් දුන්නේ නැහැ. අර ලොරියේ සිටින ලෙඩා ගෙන එන්න ස්ට්‍රෙචර් එකක් යවන්නේ නැද්ද කියා මා ඇසුවාම විකකට පසු ඉස්පිරිතාලයේ දෙරටුව ළඟට පමණක් ස්ට්‍රෙචර් එක ගෙන ගියා. එම නිසා ලොරියේ සිට ඒ දෙරටුව ළඟට ලෙඩා ඔසවාගෙන එන්නට සිදු වුණා. ඊට පසුවයි, ස්ට්‍රෙචර් එකේ ලෙඩා තබාගෙන ඇතුළට ගෙන ගියේ. මේ තුවාලය සිදු වී තිබෙන්නේ පොල් ගසකින් වැටෙද්දී උල් කර තිබෙන දම්වැල් කණුවක් උඩට ඇද වැටී මෙනුයි. එම දම්වැල් කණුවක් ඔහුගේ බඩේ එක් පැත්තක සිට අනික් පැත්ත දක්වා පසාකරගෙන ගොස් කණුවේ රියන් එකහමාර එකහමාර පමණ කොටස් දෙකක් බඩ දෙපැත්තෙන් එළියට දික් වී තිබුණා. ටික වේලාවකට පසු මා කලින් කී නර්සුත්, ඇපෝතිකරිත්, දෙස්තර මහත්මයාගේ නිවාසය බලා ගියා. ඔවුන් යද්දී මාත් ඔවුන් දෙදෙනාගේ පසු පසින් ගියා. ඒ වෙලාවේ වැඩ බැලූ දෙස්තර විජේවර්ධන මහත්මයා මා ටිකක් හඳුනනවා. මාත්, මා කලින් කී දෙදෙනාත් විනාඩි 10 ක් 15 ක් පමණ දොස්තර මහත්මයාගේ දොරට තට්ටු කළා. එහෙත් පැය භාගයක් විතර යන තුරු ඒ දොස්තර මහත්මයාට එම කාමරයෙන් එළියට එන්නට පුළුවන් වුණේ නැහැ. ඒ අතර ඒ අසල කාමරයක සිටි වෙනත් දොස්තර මහත්මයකු දොර ඇරගෙන එළියට ආවා. "තමුන්නාන්සේත් මනුෂ්‍යයකු නිසා මේ මනුෂ්‍ය ජීවිතය ගැන කල්පනා කර බලා දැන් තමුන්නාන්සේගේ ඩියුටි වෙලාව වුණත් නොවුණත් මෙම ලෙඩාට ප්‍රතිකාර කර වහාම ගාල්ලේ ආරෝග්‍යශාලාවට ගෙන යන්න"ය කියා මා ඔහුට කියා සිටියා. උන්නැහේ ඒ අවස්ථාවේදී කියා සිටියා, "මේවා දෙපාර්තමේන්තුවේ වැරදි, දෙපාර්තමේන්තුවේ වැරදිවලට අපි මොනවා කරන්නද?" කියා. පැය භාගයක් විතර ගියාට පසු ඒ වෙලාවේ වැඩ බැලූ විජයවර්ධන දොස්තර මහත්මයා ආවා. මා එවෙලේ සිටියේ "කොරිඩෝර්" එකෙයි. දොස්තර මහත්මයා මා ළඟට ඇවිත් මොකද කියා ඇසුවාම මා එතුමාට කියා සිටියා, "මේ මා සමඟ කථා කර කර ඉන්න වේලාව නොවෙයි, වහාම ගිහින් අර ලෙඩා බලා ප්‍රතිකාර කරන්න"ය කියා. එම අවස්ථාවේදී මා උන්නැහේට ටිකක් තර්ජනාත්මක විධියට කථා කළ එක ඇත්තයි. ඊට පසුව උන්නැහේ ගිහින් අර කම්බි ගලවා වෙන්කර ගිලන් රථය ගැන සොයා බැලුවා. ඒ වේලාවේ එතන ගිලන් රථයක් තිබුණේ නැහැ. තිබුණු ගිලන් රථය වෙනින් ලෙඩෙක් අරගෙන ගාල්ලට ගිහින්. ඒ පාර කළේ පුද්ගලික වෑන් රථයක දමා ලෙඩාව ගාල්ලේ ආරෝග්‍යශාලාව කරා පිටත් කරවීමයි. ඉන් පසුව මාත් එම ලෙඩා ගෙනයන වෑන්රථය පිටුපසින් ගියා. තෙල්වත්ත හරියට යන විට, ඒ කියන්නේ බලපිටියේ ඉඳලා සැතපුම් අටක් නවයක් තරම දුරට යනවිට, අර ලෙඩා මියගියා. මේ කාරණය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් කිසිම විභාගයක් පවත්වා නැහැ. ඒ බව මා ප්‍රකාශ කරන්නේ කනගාටුවෙනුයි. මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා ඒ ගැන වහාම පරීක්ෂණයක් පවත්වන ලෙස. මේ විධියේ දොස්තරවරුන් දෙපාර්තමේන්තුවේ තබාගත යුතු නැහැ. එවැනි වැඩ කරන දොස්තර මහත්වරුන් ඔළුව නරක් වෙච්ච කොටසක් හැටියට මා විශ්වාස කරනවා. මේ විධියේ වැඩ කරන නිලධාරීන් වහාම දෙපාර්තමේන්තුවෙන් දොට්ට දමන ලෙස මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சீ. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.), දකුණු කොළඹ දෙවන මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.), රුවන්වැල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඉඹුලාන මයා.), මාවනැල්ලේ ගරු මන්ත්‍රීතුමා (පී. ආර්. රත්නායක මයා.), සහ බලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ද සිල්වා මයා.) ආදී ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු ඒ ඒ අමාත්‍යාංශ

කල් තැබීම

භාර ගරු ඇමතිවරුන්ට මා දන්වනවා. මහියංගනයේ ගරු මන්ත්‍රීතුමාට (සී. පී. ජේ. සෙනෙවිරත්න මයා.) පිළිතුරු වශයෙන් කියන්නට තිබෙන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කම්කරුවන්ට රක්ෂා දෙන්නය කියා මා දෙපාර්තමේන්තුවට නියම කරන බවයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 8.29 ට, 1961 අගෝස්තු 28 වන දින සභාසම්මතිය අනුව, 1961 සැප්තැම්බර් 1 වන සිකුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

1961 සැප්තැම්බර් 1 වන සිකුරාදා

පූ. භා. 10.00 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු ආර්. එස්. පැල්පොල] මූලාසනාරූඪ විය.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

1960-61 අංක 66 දරණ පරිපූරක ඇස්තමේන්තුව.—[වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු ද සොයිසා සිරිවර්ධන.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1960-61 අංක 65 දරණ පරිපූරක ඇස්තමේන්තුව.—[අධ්‍යාපන හා ගුවන් විදුලි කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු ද සොයිසා සිරිවර්ධන.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

(1) 1947 අංක 29 දරණ නාගරික සභා ආඥාපනත යටතේ සම්පාදනය කරන ලද අතුරු ව්‍යවස්ථා මාලාවක්.

(2) 1939 අංක 61 දරණ පළාත් ආණ්ඩු සභා ආඥාපනත යටතේ සම්පාදනය කරන ලද අතුරු ව්‍යවස්ථා මාලා දෙකක්.

(3) 1946 අංක 3 දරණ සුළු නගර සභා ආඥාපනත යටතේ සම්පාදනය කරනලද අතුරු ව්‍යවස්ථා මාලා දෙකක්.—[පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු ද සොයිසා සිරිවර්ධන.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

මහා භාරකාර ආඥාපනත (73 වන පරිච්ඡේදය) යටතේ සම්පාදනය කරන ලද රෙගුලාසියක්.—[කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු ද සොයිසා සිරිවර්ධන.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ගා/ඕපාත බෞද්ධ පාසැලේ ගුරු මණ්ඩලය

1. **ඩබ්ලිව්. දහනායක මයා.** (ගාල්ල)
(திரு. டப்ளியு. தகநாயக்க—காலி)
(Mr. W. Dahanayake—Galle)

අධ්‍යාපන හා ගුවන් විදුලි කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1960 නොවැම්බර් මාසයේ රජයට භාර දුන් අවස්ථාවේ ගා/ඕපාත බෞද්ධ පාසැලේ ගුරුවරුන් නව දෙනෙකු සිටි නමුත් දැන් සිටින්නේ හය දෙනෙකු පමණක් බව එතුමා දන්නවාද? (ආ) මේ පාසැල රජයට ගැනීමට පෙර සාමාන්‍ය පැමිණීම කොපමණද? දැන් සාමාන්‍ය පැමිණීම කොපමණද? (ඉ) මේ පාසැලේ ප්‍රධානාචාර්යවරයාට විරුද්ධව අඩු ගණනේ පෙත්සම් අටක් යවා ඇති බව එතුමා දන්නවාද? (ඊ) වෙන ප්‍රධානාචාර්යවරයෙක් පත් කිරීමෙන් මේ පාසැල දියුණු කිරීමට කටයුතු නොකරන්නේ මන්ද?

වී. ටී. ජී. කරුණාරත්න මයා. (අධ්‍යාපන හා ගුවන් විදුලි කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. வீ. ரி. ஜீ. கருணாரத்ன—கல்வி, ஒலி பரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)
(Mr. V. T. G. Karunaratne—Parliamentary Secretary to the Minister of Education and Broadcasting)

(අ) 1960 නොවැම්බර් මාසයේ මේ පාසැලේ ගුරුවරුන් 8 දෙනෙක් සිටියහ. දැනට සදෙනෙක් සිටිති. සාමාන්‍ය ගණන් අනුව ගුරුවරුන් සදෙනකුට වඩා ලැබීමට මේ පාසැලට හිමිකමක් නැත. (ආ) (i) රජයට ගැනීමට පෙර සාමාන්‍ය ගණන 142.35 කි. (ii) රජයට ගැනීමෙන් පසු සාමාන්‍ය ගණන 149.5 කි. (ඉ) මුල්ගුරුවරයාට විරුද්ධව පෙත්සම් 6 ක් සහ පැමිණිලි ලැබී ඒවා විභාග කරන ලදුව චෝදනා සත්‍ය නොවූ බව ඔප්පු විය. (ඊ) මුල්ගුරුවරයා මාරු කිරීමට අවශ්‍යතාවක් නැත.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகநாயக்க)
(Mr. W. Dahanayake)

මෙම මුල් ගුරුවරයා ගුරු මණ්ඩලයේ අනෙක් සියලු දෙනාටම විරුද්ධව චෝදනා නගා තිබෙන බව ගරු උප ඇමතිතුමා දන්නවාද?

වී. ටී. ජී. කරුණාරත්න මයා.
(திரு. வீ. ரி. ஜீ. கருணாரத்ன)
(Mr. V. T. G. Karunaratne)

මේ සම්බන්ධයෙන් පෙත්සම් වගයක් ලැබුණා. ඒ පෙත්සම් ගැන විභාග කර බැලූ නමුත්, ඉදිරිපත් කර තිබූ චෝදනා ඔප්පු වුණේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

මෙම කාරණාව ගැන උප ඇමතිතුමා තව දුරටත් පරීක්ෂා කර බලනවාද? මන්ද මම දන්න තරමින් උප ඇමතිතුමා දැන් ඉදිරිපත් කළ කාරණා සත්‍ය නොවන නිසයි.

වී. ටී. ජී. කරුණාරත්න මයා.
(திரு. வீ. ரி. ஜீ. கருணாரத்ன)
(Mr. V. T. G. Karunaratne)

ඒ ගැන පරීක්ෂණයක් පවත්වා බලන්නම්.

පේරාදෙනි විශ්ව විද්‍යාලයේ බාහිර සිසුන්ට නේවාසිකාගාර පහසුකම්

2. **වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා** (බොරැල්ල)
(டொக்டர் டப்ளியு. டீ. சில்வா—பொறல்ல)
(Dr. W. D. de Silva—Borella)

අධ්‍යාපන හා ගුවන් විදුලි කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පේරාදෙනි විශ්ව විද්‍යාලයට 1961/62 වර්ෂය වෙනුවෙන් නේවාසික ශිෂ්‍යයින් 416 දෙනෙකුත්, බාහිර ශිෂ්‍යයින් 600 දෙනෙකුත් පමණ ඇතුළත් වූ බව එතුමා දන්නවාද? (ආ) දැනට ඇති නේවාසිකාගාරවල ඉඩ පහසු ඇතත් බාහිර සිසුන්ට එහි ඇතුලත්වීමට අවස්ථාව සලසා නොමැති බව එතුමා දන්නවාද? (ඉ) එමෙන්ම නේවාසික සිසුන්ට "බර්සරීස්" නමැති ආධාර මුදල් දෙන අතර බාහිර සිසුන්ට එවැනි ආධාර මුදලක් නොගෙවන බව එතුමා දන්නේද? (ඊ) එනිසා බාහිර සිසුන්ට ඉඩ පහසු ඇති නේවාසිකාගාරවලට ඇතුල්වීමට හෝ ආධාර මුදලක් දීමට එතුමා ක්‍රියා කරනවාද? (උ) එසේ නම් කවදාද? ක්‍රියා මාර්ගය කුමක්ද?

වී. ටී. ජී. කරුණාරත්න මයා.
(திரு. வீ. ரி. ஜீ. கருணாரத்ன)
(Mr. V. T. G. Karunaratne)

(අ) මේ වර්ෂයේ අළුතෙන් නේවාසික සිසුන් 415 දෙනෙක් ඇතුල් කර ගන්නා ලදි. බාහිර ශිෂ්‍යයින් වශයෙන් ලියා පදිංචි වී ඇති ශිෂ්‍යයින් 700 ක් පමණ වලට පැමිණේ. (ආ) බාහිර සිසුන්ට නේවාසිකාගාරවල ඉඩකඩ නොමැත. (ඉ) සුදුසු කම් ඇති නේවාසික සිසුන්ට "බර්සරීස්" ආධාර මුදල් දෙනු ලැබේ. සියලුම නේවාසික සිසුන්ට ආධාර මුදල් දෙනු නොලැබේ. බාහිර සිසුන්ට ආධාර මුදල් දෙනු නොලැබේ. (ඊ) මේ සම්බන්ධව ක්‍රියා කරගෙන යනු ලැබේ. (උ) මේ සම්බන්ධව ක්‍රියා කරගෙන යනු ලැබේ.

කළුතෙල් වාහන බද්ද—ලොරිහිමියන්ගේ හිඟ මුදල්

3. **පී. ජී. බී. කෙනමන් මයා.** (මෑද කොළඹ දෙවන මන්ත්‍රී)
(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி இரண்டாம் அங்கத்தவர்)
(Mr. P. G. B. Keuneman—Second Colombo Central)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මුල් නීතිය දෝෂ සහිත බැවින් 1959 අගෝස්තු සිට ලොරි හිමියන්ගෙන් කළුතෙල් භාවිතා කරන වාහනවලින් අය කරන බද්ද ආණ්ඩුවේ දිසාපතිවරුන් විසින් අයකර නැති බව එතුමා දන්නවාද? (ආ) 1961 අංක 20 දරණ (සංශෝධිත) කළුතෙල් වාහන පනත සම්මත වූවාට පසු, හිඟ ආදායම් බදු මසක් ඇතුළත දී ගෙවීමට ලොරි හිමියන්ට නියම කළ බව එතුමා දන්නවාද? (ඉ) ලොරියක් හෝ දෙකක් ඇති ලොරි හිමියන්ට මෙම හදිසි හිඟ අයබදු ගෙවීම ඉතා විශාල බරක් හෙයින්, එවැනි අය සම්බන්ධයෙන් මෙම හිඟ මුදල් ගෙවීම අත්හැරීමට හෝ සාධාරණ වාරමුදල් ක්‍රමය අනුව ගෙවීමට කටයුතු පිළියෙල කිරීමට එතුමා සලකා බලනවාද?

ගරු ජෝර්ජ් රාජපක්ෂ (මැඩ බලන මුදල් ඇමති)
(கௌரவ ஜோர்ஜ் ராஜபக்ஸ—பதில் நிதி யமைச்சர்)
(The Hon. George Rajapaksa—Acting Minister of Finance)

(*a*) Yes. (*b*) No. The Government Agents have been circularized by the Permanent Secretary to the Ministry of Industries, Home and Cultural Affairs to give owners reasonable time to pay up the arrears. (*c*) The arrears cannot be waived nor can

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

instalments be allowed. By way of relief, however, it is proposed to allow further time till 31st December, 1961.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I thank the Hon. Minister for granting time till the 31st December, 1961, but this is really too short a time for persons who own a single lorry to pay up the tax for three years. I hope that at the end of that period the Hon. Minister will review that decision.

ගරු ජෝර්ජ් රාජපක්ෂ
(கௌரவ ஜோர்ஜ் ராஜபக்ஸ)
(The Hon. George Rajapaksa)

I shall take steps to have the decision reviewed at the end of that period.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ වෘත්තීය සංගමයෙන් ඉදිරිපත් කරන ලද සංදේශය

5. ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)
(திரு. லெஸ்லி குணவர்தன—பாணந் துறை)
(Mr. Leslie Goonewardene—Panadura)

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ආහාර හා කෘෂිකර්ම, සංවර්ධනය පිළිබඳ විවිධ අංශවලට යොමු කරවමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෘත්තීය සංගම් 33 කින් සමන්විත ඒකාබද්ධ සංගමයෙන් 1960.10.10 දින දරණ සංදේශයක් එතුමාට ලැබුණේ ද? (ආ) මෙම සංදේශයේ ප්‍රතිඵලයක් වශයෙන් ඉහත සඳහන් ඒකාබද්ධ සංගමයේ නියෝජිතයන් පස් දෙනෙකු විසින් 1961.4.21 දා සිට 1961.6.23 වනදා දක්වා දින 9ක් කෘෂිකර්ම අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සිව්දෙනෙකු හා පර්යේෂණ අංශ සහ යෝජනා ක්‍රම ප්‍රධානීන් ඉදිරියේ, සාක්ෂි ඉදිරිපත් කරන ලද්දේ ද? (ඉ) ඒකාබද්ධ සංගමය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි, ට්‍රොපිකල් ඇග්‍රිකල්චරිස්ට්, පස් අවුරුදු වැඩ පිළිවෙල, දස අවුරුදු වැඩ පිළිවෙල හා පරිපාලන වාර්තා වැනි කාර්යාලයීය රපෝර්තුවලින් ලබාගත් ලියවිලි සාක්ෂිවලින් තහවුරු කර තිබුණේ ද? (ඊ) ඉහත සඳහන් කරුණු මහජන වැදගත්කමක් ඇති ඒවා හෙයින් සම්පූර්ණ සාක්ෂි වාර්තාව නිලධාරීන්ගේ රපෝර්තුවත් සමග මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම සඳහා එතුමා වහාම ඉදිරිපත් කරන්වාද?

ගරු සී. පී. ද සිල්වා (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති, සභා නායක හා අගමැතිගේත් රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් වැඩ බලන පාර්ලිමේන්තු ලේකම්)
(கௌரவ சி. பீ. டி சில்வா—கமத் தொழில், காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும் பிரதம அமைச்சரினதும் பாதுகாப்பு அமைச்சரினதும் பதிற் பாராளுமன்றக் காரியதரிசி)

(The Hon. C. P. de Silva—Minister of Agriculture, Land, Irrigation and Power, Leader of the House and Acting Parliamentary Secretary to the Prime Minister and Minister of Defence and External Affairs)

(අ) ඔව්. (ආ) අධ්‍යක්ෂතැන හා අනිකුත් නිලධාරීන් හමු වීමට නියෝජිතයන් 5 දෙනෙකුට අවස්ථාවක් ලබා දුනි. ඔවුහු 9 දිනක්ම හමු වූ බව සත්‍යයකි. (ඇ) නොයෙකුත් ප්‍රකාශනයන්ගෙන් කොටස් කියවූ බව ඇත්තය. (ඈ) මේ ඉදිරිපත් කර ඇති කරුණු ඒ ඒ කොට්ඨාශ භාර ප්‍රධානීන් හා පර්යේෂණ නිලධාරීන් විසින් පරීක්ෂා කර බලා වාර්තා කළ යුතුව ඇත. මේ වාර්තා කාර්යාලීය විශ්වාසය මත මට ලැබිය යුතු ඒවාය. එම වාර්තා ලැබුණු විට කුමන කටයුතු මේ කරුණ සම්බන්ධයෙන් කළ යුතු දැයි මම සළකා බලන්නෙමි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

වැඩි කාලයක් ගත වෙන්නට පෙර මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම පිණිස මේ වාර්තාවල් ඉදිරිපත් කරන්න පුළුවන්ද කියා මා ගරු ඇමතිතුමාගෙන් අහනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டீ சில்வா)
(The Hon. C. P. de Silva)

මම ගරු මන්ත්‍රීවරයාට කිවේ, මේ වාතී කාර්යාලයීය විශ්වාසය මත මට ලැබිය යුතු ඒවා බවයි. ගරු මන්ත්‍රීවරයාට එය බැලීමට ඉඩ ප්‍රස්තාවක් දෙන්නට පුළුවන්ද කියා මම බලන්නම්.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරස්ස)
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குறஸ்ஸ)
(Dr. S. A. Wickremasinghe—Akuressa)

අමාත්‍යාංශයේ වැඩ කටයුතු ගැන වාද විවාද වන අවස්ථාවේදී මේ ගරු සභාවේ අනිකුත් මන්ත්‍රීවරුන්ටත් එසේ බලාගැනීමට ඉඩ ලබාදෙනවාදැයි ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டீ சில்வா)
(The Hon. C. P. de Silva)
මට නවමත් ලැබී නැහැ.

"බ්‍රැකොන්ගලර්" සහ "මේපල් ලීෆ්" යාත්‍රා දෙකේ ආදායම සහ වියදම

7. කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) 1951 සිට 1960 දක්වා "බ්‍රැකොන්ගලර්" නමැති ට්‍රෝලර් නැව හා 1952 සිට 1960 දක්වා "මේපල් ලීෆ්" නමැති යාත්‍රා දෙක සංචාරක මෙහෙයුම්වලින් ලත් ආදායමත් (ii) එම යාත්‍රා දෙක අලුත්වැඩියා කිරීමට වැය වූ මුදලත් කොපමණද? (ආ) මේ අවුරුදු තුළ මේ එක් එක් යාත්‍රාවක් අලුත්වැඩියා කිරීම සඳහා මාස කීයකට නවතා තිබුයේද? (ඉ) 1960 නොවැම්බර් සිට අද දක්වා "බ්‍රැකොන්ගලර්" ට්‍රෝලර් නැව අලුත්වැඩියා කරන බව එතුමා දන්නවාද? (ඊ) මේ තත්ත්වය ගැන එතුමා පරීක්ෂණයක් පවත්වනවාද? නොඑසේනම් ඇයි?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டீ சில்வா)
(The Hon. C. P. de Silva)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට පිළිතුරු මට මෙතෙක් ලැබී නැහැ.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
When will the Hon. Minister be in a position to answer that question?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டீ சில்வா)
(The Hon. C. P. de Silva)
In fact I have asked the office to send it as quickly as possible.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
If the Hon. Minister would like it, I will supply him with that information. It reveals a shocking state of affairs. That is the reason why we are not getting fish. All our trawlers are being held up without functioning at all. I hope the Hon. Minister will not only get a report but investigate the matter.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டீ சில்வா)
(The Hon. C. P. de Silva)
I know. I am not satisfied with the position myself.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

වනසත්ව දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ

8. කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වන සත්ව දෙපාර්තමේන්තුවේ භාර කරු හා ඔහුගේ සහායකයින් විසින් 1959 ඔක්තෝබර් 1 වැ සිට අද දක්වා දෙපාර්තමේන්තු පරීක්ෂණ කීයක් පවත්වා තිබේද? (ආ) අද දක්වා පවත්වන ලද එවැනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරීක්ෂණ සඳහා වියදම් කරන ලද මුදල කොතෙක්ද? (ඉ) පරීක්ෂණ කියකදී එම පරීක්ෂණවලට භාජනවූ නිලධාරීන් නිදෙස් කරනු ලැබීද? (ඊ) පරීක්ෂණ කියක් සම්බන්ධයෙන් තවමත් කටයුතු කළ යුතුව තිබේද?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

(*a*) Since October 1, 1959, to date, only one inquiry has been held and that by the Assistant Warden. (*b*) The amount spent on the inquiry is approximately Rs. 104. (*c*) The inquiry referred to has not yet been completed and the Government Agent, Vavuniya, has been requested to hold the final inquiry in this connection.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

Has the Hon. Minister personally satisfied himself that the reply furnished by the department is correct?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I have not checked the veracity of this report.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I think it will be a very good idea if the Hon. Minister asks the Warden, Department of Wild Llfe, what he considers to be an inquiry. I am personally aware that far more than one inquiry has been held.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

As you are aware, the reply to a question comes from the head of the department.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

But I presume you take administrative responsibility for it. I do not blame the Hon. Minister for reading the reply. I would ask the Hon. Minister to please look into this matter and check personally whether the report given to him is correct.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I shall do so.

කේ. ජේමිස් සිංඤෝ මහතා සේවයෙන් පහකිරීම

10. **ගාමනී ජයසූරිය මයා.** (හෝමාගම)
(திரு. காமனி ஜயசூரிய—ஹோமாகம)
(Mr. Gamani Jayasuriya—Homagama)

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1957 මැයි 2 වෙනි දින, වාරිමාර්ග ඉංජිනේරු අංශයේ, කොළඹ උප කොට්ඨාසික තාවකාලික කම්කරුවකු වශයෙන් සේවයට බැඳුණු වෙනිවැල්කොල කේ. ජේමිස් සිංඤෝ නැමැත්තා 1959 මැයි මස 1 වෙනි දින සිට සේවයෙන් පහකරනු ලැබූ බව එතුමා දන්නේද? (ආ) හෙතෙම සේවයට පත්ව සය මසක ඇවෑමෙන් ඔහුට අර්ථ සාධක අරමුදල්, ගෙවල් කුලී දීමනා, වාර්ෂික දුම්රිය සහන ප්‍රවේශපත්‍ර ආදියත් ඇතුළු රජයේ සේවකයන්ට හිමි හැම පහසු කම්ම දී තිබියදීත්, හෙතෙම සේවයෙන් පහකිරීමට හේතුව කවරේදැයි එතුමා දන්නේද? (ඉ) මොහු පහකිරීමෙන් අනතුරුව එකී අංශයට කම්කරුවන් බඳවා ගනු ලැබුවේද? එසේ නම්, ඒ අවස්ථාවේදී මොහුට කැඳවීමක් නොකිරීමට හේතුව කුමක්ද? (ඊ) මේ තැනැත්තාට යළිත් පත් වීමක් දෙන්නෙහිද?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

(*a*) He was recruited on 1.5.57 on a casual basis for a specific job. As a result of the application of Treasury Circular No. 421 of 12.12.57 he became

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

a temporary labourer and his salary was converted to monthly pay. He was discontinued on 1.5.59 with 20 other fellow workers recruited in the same year in the Colombo Sub-division. (b) Yes—He enjoyed these facilities as a result of the conversion of his salary to monthly pay, but his status as a temporary employee had not altered. He continued to remain a temporary employee and according to Treasury Circular No. 344/14 /120 (ET/DE) 537 of 23rd June, 1951, such an employee could be discontinued when the necessity for employing him ceases although he might be on monthly pay and is enjoying the concessions accruing from such status. (c) No new labour was recruited to the section of work from where he was discontinued but 11 labourers with over 5 years service and who were found to be surplus on other works in the Department were transferred to this place as it would have been unfair to discontinue them and retain the services of men with only 2 years service. (d) He will be considered for employment when the occasion to recruit labour again arises and if he is sent to the department by the employment exchange which is now the source of recruitment of labour.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

According to the information I have received, there were not 20 labourers who were discontinued, but only one labourer. This person was the only labourer discontinued from that particular section. For a department like the Irrigation Department to discontinue one labourer is I think really not necessary. They could have easily kept him on. I would like the Hon. Minister to kindly look into it and see if this person could be given back his job.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I would get this specific point inquired into. I am told by the Department of Irrigation that they have to give up this type of labour and they must find work for them.

ඒ. ඒ. ගුණරත්න මහත්මියට ගෙවිය යුතු ගමන් වියදම්

12. **ඩබ්ලිව්. දහනායක මයා.**
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගාල්ලේ කඩවත් සතරේ බෝපේ මහජන සෞඛ්‍ය සාත්තු සේවිකා ඒ. ඒ. ගුණරත්න මහත්මියට ගෙවිය යුතු, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැන විසින් අනුමත කරන ලද, 1959 ජූලි සිට ඔක්තෝබර් දක්වා මාස හතරක අනියම් ගමන් වියදම්, කිසිම හේතුවක් නැතිව නොගෙවන ලද බව එතුමා දන්නවාද? (ආ) ඊට විකල්පව මේ මාස හතරට මාසික සථිර ගමන් වියදම් හෝ ගෙවා නැති බව එතුමා දන්නවාද? (ඉ) එතුමා වහාම මේ කාරණය නිරාකරණය කරනවාද?

ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන (කම්කරු හා ජනසතු සේවා පිළිබඳ වැඩ බලන ඇමති—සෞඛ්‍ය කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති වෙනුවට)
(கௌரவ எம். பீ. டி சொய்ஸா சிரிவர்தன —தொழில், தேசியமய சேவைகள் பதில் அமைச்சர்)
(The Hon. M. P. de Zoysa Siriwardena —Acting Minister of Labour and Nationalized Services)

(a) Yes. Casual travelling claims sent in by Mrs. A. A. Guneratne were finally turned down by the Treasury. The case was not a straightforward one and the Treasury had to be consulted in the matter. (b) Yes. She was not paid an alternative fixed monthly travelling allowance as she was not in possession of a car and was expected by the Department to do her visits along with the other Public Health Nurse in the area. This other Public Health Nurse had been paid a commuted travelling allowance and was in possession of a car. (c) It is doubtful what the Ministry could do in view of the Treasury ruling.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

ඩබ්ලිව්. දහනායක මයා.

(திரு. டப்ளியு. தகனுயக்க)

(Mr. W. Dahanayake)

As the Treasury ruling obviously creates a hardship, will the Hon. Acting Minister of Health please look into this matter again ?

ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන

(கௌரவ எம். பீ. டி சொய்ஸா சிரிவர்தன)

(The Hon. M. P. de Zoysa Siriwardena)

I shall bring it to the notice of the hon. Acting Minister of Health.

සමුපකාර තොග වෙළඳ ආයතනයේ රියැදුරන්ට හා ක්ලීනර්වරුන්ට ගෙවිය යුතු අතිකාල දීමනා

14. **ජයසූරිය මයා.**

(திரு. ஜயசூரிய)

(Mr. Jayasuriya)

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සමුපකාර තොග වෙළඳ ආයතනයේ රියැදුරන් හා ක්ලීනර්වරුන් හැර අනෙක් සෑම සේවකයකුටම 1958 සිට ගෙවිය යුතුව ඇති සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි අතිකාල දීමනා ගෙවා ඇතත්, ඒ දිනයන් වෙනුවට නිවාඩු නොලැබූ රියැදුරන් හා ක්ලීනර්වරුන්ට එකී හිඟ මුදල් ගෙවා නැති බව එතුමා දන්නවාද? (ආ) මෙම ආයතනයේම සේවය කරන රියැදුරන් දෙදෙනකුට පමණක්, අනෙක් රියැදුරන්ට පෙර, මෙම හිඟ මුදල් ගෙවූයේ කවර නම් හේතුවක් නිසාද? (ඉ) රියැදුරන්ට හා ක්ලීනර්වරුන්ට මෙම හිඟ මුදල් කවදා ගෙවීමට එතුමා අදහස් කරන්නේද?

ගරු ඩී. පී. ද සිල්වා—(වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති වෙනුවට)

(கௌரவ சீ. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

The answers are not ready. On behalf of the Hon. Minister concerned, I would like to ask for time to answer the Questions.

වාචික පිළිතුරු

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදි.

රාජ්‍ය භාෂාව හා රජයේ කාර්යාලවල ප්‍රධාන නිලධාරීන්

4. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (පී. බී. විජය සුන්දර මයා. වෙනුවට)

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රජයේ කාර්යාලවල ප්‍රධාන නිලධාරීන් බොහෝ දෙනෙක් ඔවුන්ට රාජ්‍ය භාෂාවෙන් ලැබෙන ලියකියවිලිවල සහ ඔවුන් රාජ්‍ය භාෂාවෙන් යවන ලියකියවිලිවල අනුවාද ලිපිකරුවන්ගෙන් ඉල්ලන බව එතුමා දන්නවාද? (ආ) බොහෝ කාර්යාලවල රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමටත් අනුවාද සැපයීමටත් සෑහෙන කාර්යී මණ්ඩල සහ යතුරු ලියන යන්ත්‍ර නොමැති බව එතුමා දන්නවාද? (ඉ) මෙකී හේතුව නිසා බොහෝ කාර්යාලවල ලිපිකරුවන් අතිකාල දීමනා පවා නොලැබ අතිකාල වැඩ කරන බව එතුමා දන්නවාද? (ඊ) මෙකී දුෂ්කර තත්ත්වය නැති කිරීමට එතුමා ක්‍රියා කිරීමට බලාපොරොත්තු වෙනවාද?

ගරු ජෝර්ජ් රාජපක්ෂ

(கௌரவ ஜோர்ஜ் ராஜபக்ஸ)

(The Hon. George Rajapaksa)

(අ) රාජ්‍ය භාෂාවෙහි ප්‍රවීණත්වය නොමැති නිලධාරීන්ට තුන් අවුරුදු කාලයකට ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමට ඉඩ දිය හැකි බවට හා එවැනි නිලධාරීන්ට ඉංග්‍රීසි පරිවර්තන සැපයිය යුතු බවටද ආණ්ඩුව තීරණය කර ඇත. මෙය ඉංග්‍රීසියේ සිට රාජ්‍ය භාෂාව වූ සිංහලයට පහසුවෙන් සංක්‍රමණය වීම වගබලාගන්නා අයුරු වූ ආණ්ඩුවේ ප්‍රතිපත්තියට අනුකූලවය. (ආ) කාර්යී මණ්ඩල, යතුරු ලියන යන්ත්‍ර හා අනිකුත් උපකරණ සඳහා භාණ්ඩාගාරය වෙත ලැබෙන අයදුම් විභාග කර බලා සෑහෙන පමණ කාර්යී මණ්ඩල හා උපකරණ සඳහා විධිවිධාන යොදා ඇත. භාණ්ඩාගාරය විසින් අනුමත කරනු ලබන කාර්යී මණ්ඩල සහ/හෝ උපකරණ ප්‍රමාණවත් නොවන බව දෙපාර්තමේන්තුවලට පෙනී ගිය විට එම දෙපාර්තමේන්තු අතිරේක කාර්යී මණ්ඩල හෝ උපකරණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජෝර්ජ් රාජපක්ෂ]

සඳහා ඉල්ලුම් කරයි. එවැනි ඉල්ලීම් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හා එක්ව පරීක්ෂා කරනු ලැබේ. මෙම තීරණ දෙපාර්තමේන්තු වැඩි ගණනාවක් විසින්ම පිළිගනු ලැබේ. එබැවින් කායික්‍ෂමල බොහෝ ගණනකට සෑහෙන ප්‍රමාණයක කායික්‍ෂම මණ්ඩල හා යතුරු ලියන යන්ත්‍ර නොමැති බවක් ගැන මම නොදනිමි. (ඉ) නැත. (ඊ) කායික්‍ෂම මණ්ඩල හා උපකරණ සඳහා දෙපාර්තමේන්තුවලින් තනි අයදුම් ලැබුණ විට අවශ්‍ය තන්හි රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ආධාරයද ඇතිව ඒවා පරීක්ෂා කර බලා, මුදල් සම්බන්ධවද නියම සැලකිල්ල දක්වා, සෑහෙන පරිදි විධිවිධාන යොදනු ලැබේ.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
9 වන ප්‍රශ්නය.

ගාමනී ජයසූරිය මයා.
(திரு. காமனி ஜயசூரிய)
(Mr. Gamani Jayasuriya)
My Question, Sir? Question No. 14.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
The Hon. Minister wants time to answer it.

ලක්ෂ්මන් රාජපක්ෂ මයා. (තිස්සමහාරාමය)
(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ—திஸ்ஸமஹாராம)
(Mr. Lakshman Rajapaksa—Tissamaharama)
What about Question No. 6?

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
The hon. Member has not authorized anybody—[*Interruption*]—No, he has not.—[*Interruption*]—He has written to me and said he has not authorized—[*Interruption*]. Will the hon. Member please take my Order?

ලක්ෂ්මන් රාජපක්ෂ මයා.
(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)
(Mr. Lakshman Rajapaksa)
You ask for some other people's letters. But I have come from hospital—

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
Order, please! Will the hon. Member take my Order?

ලක්ෂ්මන් රාජපක්ෂ මයා.
(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)
(Mr. Lakshman Rajapaksa)
You are a funny man.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
Will you please withdraw that?—[*Interruption*]—Will you withdraw from the House?

ලක්ෂ්මන් රාජපක්ෂ මයා.
(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)
(Mr. Lakshman Rajapaksa)
What do you want me to withdraw?

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
Will you withdraw?

ලක්ෂ්මන් රාජපක්ෂ මයා.
(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)
(Mr. Lakshman Rajapaksa)
What is the word you want me to withdraw?

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
You ought to know.

ලක්ෂ්මන් රාජපක්ෂ මයා.
(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)
(Mr. Lakshman Rajapaksa)
I want to know what word you are asking me to withdraw.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
Will you withdraw the word or leave the House?

ලක්ෂ්මන් රාජපක්ෂ මයා.
(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)
(Mr. Lakshman Rajapaksa)
I withdraw the word.

ඇහැලියගොඩ පොහොර ගබඩාවක්

9. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (පී. බී. විජයසුන්දර මයා. වෙනුවට)
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සබරගමු පළාතට මධ්‍යස්ථානය වන ඇහැලියගොඩ නගරයේ මුළු පළාතටම ප්‍රයෝජනවත් වන පරිදි පොහොර ගබඩාවක් පිහිටුවීමට කලින් තීරණය වී තිබුණ බව එතුමා දන්නවාද? (ආ) දැනට එම තීරණය වෙනස්කර රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් ප්‍රයෝජනය සලකා එම දිස්ත්‍රික්කයේ මධ්‍යස්ථානය වන රත්නපුරේ එකී පොහොර ගබඩාව පිහිටුවීමට තීරණය කර ඇති බව එතුමා දන්නවාද? (ඉ) කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ අමාත්‍යාංශයෙන් මෙතෙක් පළාතට කෙරුණ මූලික ප්‍රයෝජනවත් වැඩ සංඛ්‍යාවක් රත්නපුර ඡන්ද කොට්ඨාශයට පමණක් සීමා වූ බව එතුමා දන්නවාද? (ඊ) වහාම මෙම ප්‍රතිපත්තිය වෙනස් කිරීමට එතුමා ක්‍රියා කිරීමට පොරොන්දු වෙනවාද? (උ) මුලින් ගන්නා ලද තීරණය පරිදි පොහොර ගබඩාව පළාතටම මධ්‍යස්ථානය වන ඇහැලියගොඩ පිහිටුවීමට ක්‍රියා කරනවාද?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)
(*a*) No. Eheliyagoda was one of the alternative sites considered but given up as it was not central to the paddy areas of Ratnapura District. Out of the 53,685 acres under paddy cultivation in Ratnapura District Eheliyagoda is central only to approximately 13,872 acres whereas Ratnapura is central to the entire 53,685 acres. (*b*) a fertilizer store will be set up at Ratnapura for the benefit of the entire District. (*c*) No. (*d*) Does not arise. (*e*) Does not arise.

වල්පිට රජයේ ගොවිපලේ ජී. ආර්. ගුණතිලකගේත් ලියන් සිංඤෝගේත් සේවය ස්ථිර කිරීම

11. **එල්. බී. ජයසේන මයා.** (බිංගිරිය) (ලක්ෂ්මන් ජයකොඩි මයා වෙනුවට)
(திரு. எல். பி. ஜயசேன—பிங்கிரிய)
(Mr. L. B. Jayasena—Bingiriya)
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වල්පිට රජයේ ගොවිපලේ අවුරුද්දක් ඇතුළත දවස් 150 ක් වැඩ කළ කම්කරුවන් ස්ථිර සේවකයන් හැටියට සලකා සේවකයින් ගණනාවකගේ සේවය ස්ථිර කළ බවත්, පසුගිය තුන්වස මුළුල්ලේ මෙය ක්‍රියාත්මක කළ බවත් එතුමා දන්නවාද? (ආ) ඉහත කී සුදුසුකම් ඇති ජී. ආර්. ගුණතිලක සහ ලියන් සිංඤෝ යන දෙදෙනාට ස්ථිර තත්ත්වයක් නොදුන්නේ මන්ද? (ඉ) ඉහත කී දෙදෙනාගේ ඉල්ලීම ඉටු කරනවාද? නො එසේ නම් ඇයි?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)
(*a*) Labourers who had put in 150 days work within six months have been placed on monthly pay as temporary labourers. (*b*) Because there are no vacancies in the sanctioned temporary cadre of the Farm to promote them. (*c*) They will be placed on monthly pay when vacancies arise.

ප්‍රාදේශීය රැකී රක්ෂා කාර්යාලවල ලියාපදිංචි වූවන්ට රක්ෂා ලබාගැනීමට ප්‍රමාදවීම

13. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (පී. බී. විජයසුන්දර මයා. වෙනුවට)
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ ප්‍රධාන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

රැකීරක්ෂා කාර්යාලයේත්, පළාත්වල තිබෙන රැකීරක්ෂා කාර්යාලවලත් ප්‍රාදේශිය රැකීරක්ෂා කාර්යාලවලත්, රැකීරක්ෂා සඳහා සම්මුඛ පරීක්ෂණවලට කැඳවීමේ ප්‍රතිපත්තිය ඒ ඒ ස්ථාන අනුව වෙනස් වන්නේද? (ආ) ප්‍රදේශිය රැකීරක්ෂා කාර්යාලයක ලියාපදිංචි වී සිටින රැකීරක්ෂා රහිත අයෙකුට රක්ෂාවක් ලබාගැනීමට අනෙක් ප්‍රධාන ස්ථානයක ලියා පදිංචි වී සිටින අයෙකුට වඩා බොහෝ කලක් ප්‍රමාද වන බව එතුමා දන්නේද? (ඉ) ප්‍රාදේශිය රැකීරක්ෂා කාර්යාලයක් වන අවිස්සාවේල්ල රැකීරක්ෂා කාර්යාලයේ ලියා පදිංචි වූවන්ට රක්ෂාවක් ලබා ගැනීමට අනෙක් නැනෙක ලියා පදිංචි වූවන්ට වඩා බොහෝ කාලයක් බලා සිටීමට සිදු වන බව එතුමා දන්නවාද? (ඊ) එසේ නම්, එම ප්‍රමාදය නැති කිරීමට එතුමා ක්‍රියා කිරීමට බලාපොරොත්තු වෙනවාද?

ගරු ද සොයිසා සිරිවර්ධන
(கௌரவ டி. சொய்ஸா சிரிவர்தன)
(The Hon. de Zoysa Siriwardena)

(*a*) No. (*b*) This is possible because opportunities for employment vary according to each area covered by a particular exchange. (*c*) This is possible for the same reason given at (*b*) above. (*d*) The Government is aware of the necessity for creating more employment and it is hoped that the position will improve when the Government's development projects are implemented.

මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

මතු පළ වන යෝජනාව සභාසම්මත විය:

"1961 සැප්තැම්බර් මස 4 වන සඳුදා ද, 1961 සැප්තැම්බර් මස 5 වන අඟහරුවාදා ද, 1961 සැප්තැම්බර් මස 6 වන බදාදා ද, 1961 සැප්තැම්බර් මස 7 වන බ්‍රහස්පතින්දා ද, 1961 සැප්තැම්බර් මස 8 වන සිකුරාදා ද, 1961-62 විසර්ජන කෙටුම්පත් පණත සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතුය."—[ගරු ඩී. පී. ද සිල්වා]

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகநயக்க)
(Mr. W. Dahanayake)

ගරු සභානායකතුමාගෙන් එක්තරා වැදගත් කාරණයක් ගැන අසන්නට මා කැමතියි. කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමාට (ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.) ලබන සතියේ මෙම ගරු සභාවට පැමිණීම සඳහා සහනයක් දෙන්නය කියා අපි ගරු සභානායකතුමාගෙන් ඉල්ලීමක් කළා. ඒ ගැන ගරු සභානායකතුමා කරුණාපූර්වකව කටයුතු කරනවා ඇතැයි අපි විශ්වාස කරනවා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)

මා ඒ කාරණය ගැන ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාට (ඩබ්ලිව්. දහනායක මයා.) කරුණු කියා ඇති. ඇමති මණ්ඩලයෙන් අහන්නේ නැතිව මා යෝජනාවක් නොගෙනෙන බව මා කීවා. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් හෝ ඇමතිවරුන් හෝ ඒ අනුව යෝජනාවක් ගෙනෙන්න කියා නැහැ.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා. (අවිස්සාවේල්ල)
(திரு. டீ. பீ. ஆர். குணவர்தன—அவிசாவலை)
(Mr. D. P. R. Gunawardena—Avissawella)

කැමැත්ත ගත්තේ නැද්ද?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)

මා ඒ ගැන ඇහුවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

පුද්ගලික අදහසක්ද?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)

පුද්ගලික කැමැත්තක් අනුව නොවෙයි, මා යම්කිසි යෝජනාවක් ගෙනෙන්නේ ඇමති මණ්ඩලයේ තීරණය අනුවයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

APPROPRIATION BILL, 1961-62

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.—[ප්‍රගතිය, අගෝස්තු 31]

[කථානායකතුමා මූලාසනාරූඪ විය.]

Head 53.—Minister of Justice

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 474,724

Sub-head 1.—Cadre and Salaries, Rs. 270,920

ඉදිරිපත් කරන ලද සංශෝධනය [අගෝස්තු 31]—

"That the Vote be reduced by Rs. 10 in respect of sub-head 1, item 'Minister'".—[ලෙස්ලි ගුණවර්ධන මයා.]

ප්‍රශ්නය යළින් සභාභිමුඛ කරන ලදි.

කේ. එච්. ජී. ඇල්බට් මයා. (බෙන්තර-ඇල්පිටිය)

(திரு. கே. எச். ஜீ. அல்பேட்—பெந்தற-எல்பிட்டிய)

(Mr. K. H. G. Albert—Bentara-Elpitiya)

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී අධිකරණ අමාත්‍යාංශය පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීම අවශ්‍ය වී තිබෙන වා. මා මේ අවස්ථාවේදී විශෙෂයෙන් නැඟිට සිටින්නේ මගේ කොට්ඨාශයේ අධිකරණ පහසුකම් පිළිබඳව මෙතෙක් කල් පැවති ආණ්ඩු විසින් අතපසු කර තිබූ සේවයක් මේ ආණ්ඩුවේ අධිකරණ අමාත්‍යාංශයෙන් ඉටු වී තිබීම ගැන විශෙෂයෙන්ම අපේ අධිකරණ ඇමතිතුමාට ප්‍රශංසාවක් කිරීම ටයි. ඇල්පිටියේ ප්‍රදේශවාසීන් තමන්ගේ අධිකරණ අසිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට නොයෙකුත් කරදර ඇති බව ප්‍රකාශ කරමින් නොයෙකුත් අවස්ථාවලදී ඇල්පිටිය ප්‍රදේශයට උසාවියක් ඉල්ලා සිටියා. එහෙත් ඊට කලින් සිටි අධිකරණ ඇමතිවරුන් මහජනයා රැවටීමේ උපායන් වශයෙන් නොයෙක් නොයෙක් බොරු පොරොන්දු දුන්නා මිස උසාවියක් පිහිටුවීමට කටයුතු කළේ නැහැ. අද ඒ කාරණය සම්පූර්ණ වශයෙන් ඉටු කිරීමට කටයුතු සලස්වා තිබීම ගැන අපේ ගරු අධිකරණ ඇමතිතුමාට ප්‍රශංසා කරන අතර ඒ ජනතාවගේ අධිකරණ අසිතිවාසිකම් සම්පූර්ණයෙන්ම ආරක්ෂා වන අන්දමට කටයුතු සලස්වන ලෙස මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මේ රටේ සාමදාන විනිශ්චයකාර තනතුරු දීම පිළිබඳව කඹුරුපිටියේ ගරු මන්ත්‍රී (පර්සි වික්‍රමසිංහ මයා.) ඊයේ අදහස් වගයක් ප්‍රකාශ කළා. මාද ඒ පිළිබඳව වචන කීපයක් කියන්න ඕනෑ. අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ සිට පසුගිය මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව පිහිටුවන තුරු මේ රටේ සාමදාන විනිශ්චයකාර පදවි දෙනු ලැබුවේ එක්තරා බමුණු කුලයක් ඇති කිරීමේ පරමාර්ථය අනුව බව තමුන්නාන්සේ දන්නවා. එහෙත් 1956 දී මේ බමුණු කුලය බිඳ වැටීමෙන් පසු මේ රටේ නම්බු නාම දීම සම්පූර්ණයෙන්ම තහනම් කළ යුතු බව මේ රජය ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගත්තා. නමුත් අදත් සමහරු සිතනවා, මේ සාමදාන විනිශ්චයකාර පදවි දෙන්නේ නම්බු නාම වශයෙන්ය කියා. ඒ නිසයි, ඒ පිළිබඳව සමහර දෙස් නැඟීම් තිබෙන්නේ. අපේ පිටිසරබද පළාත්වල සාමදාන විනිශ්චයකාරයකු ඉදිරිපිට දිවුරුම් දී අත්සනක් ලබා ගැනීමට හැතැප්ම 30ක් 40ක් දුර යෑමට සිදු වී තිබෙන බව ගරු අධිකරණ ඇමතිතුමාට මතක් කර දෙන්න කැමතියි. පසුගිය කාලයේදී එතුමා අපේ ප්‍රදේශයට සාමදාන විනිශ්චයකාරවරුන් දෙදෙනකු පත් කර තිබෙනවා. ඒ තනතුරු දීමේදී එතුමා සොයා තිබෙන්නේ නියම අන්දමට කටයුතු කිරීමට ශක්තියක් ඇති අවංක පුද්ගලයන් පමණයි. පරණ අන්දමට ලොකු පවුල්වල ධනවතුන්ට ඒ තනතුරු දීමට එතුමා කටයුතු කර නැහැ. ගෞරව කිරීම් වශයෙන්, නම්බු නාම දීමක් වශයෙන්, මේ සාමදාන විනිශ්චයකාර පදවි දීම සම්පූර්ණයෙන්ම අත්හිටුවා මහජනයාට පහසුව සැලසෙන අයුරු තවත් පුළුවන් තරම් වැඩි ගණනක්, ගම් තුන හතර කට එක් කෙනකු බැගින්වත්, සාමදාන විනිශ්චයකාරවරුන් පත් කරනවා නම් එයින් මහජනයාට යහපතක් මිස අයහපතක් සිදු වන්නේ නැහැ. ගෞරව කිරීමක් වශයෙන්, නම්බු නාම දීමක් වශයෙන්, සාමදාන විනිශ්චයකාර පදවි නොදෙන බව අද රට පිළිගෙන අවසානයි.

ගරු සභාපතිතුමනි, තවත් වැදගත් කාරණයක් ගැන ඊළඟට මම මතක් කරන්නට කැමතියි. ජාතිවාදී අරගල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් මයා.]

සමයේ ඒ අරගල සම්බන්ධයෙන් තොයෙක් නඩු මේ රටේ ඇති වුණා. එයින් එකක් වූ රාජරත්න සිද්ධියත් අපි හොඳින් දනුවා. එබඳු නඩු සිය දහස් ගණනක් මේ රටේ තිබුණා. මගේ ප්‍රදේශයේත් මේ ජාතිවාදී කෝලාහල කාලයේ ඒ පිළිබඳ නඩුවලට අසු වුණු පුද්ගලයන් සිටියා. ඔවුන්ගෙන් සමහරෙක් වැරදිකරුවන් වුණු අතර සමහරෙක් නිදහස් වුණා. මේ කාලයේදී මට පෙනී ගිය එක්තරා කරුණක් මහජන නියෝජිතයකු වශයෙන් මා ප්‍රකාශ කළ යුතුයි. ඒ ප්‍රකාශ කළ යුතු දෙය නම් ඒ කාලයේදී මුලාදැනීන්ට හෝ පොලීසියට හෝ වුවමනා නම් බොරු සාක්ෂි ගොතා නඩු පවරා ඕනෑම කෙනකු අමාරුවේ දමන්ට සම්පූර්ණයෙන්ම ඉඩ තිබුණු බවයි.

පූ. භා. 10.30

එබඳු සිද්ධීන් බොහොමයක් ඇති වී තිබෙනවා. සෑම නඩුවකම නීතිය පිළිබඳව ඇති සෑම වගන්තියක්ම දැනුත් එතුමා කියවා බලන බව මා පුද්ගලිකව දන්න නිසා එතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, ජාතිවාදී කලකෝලාහල පිළිබඳව ඇති සෑම නඩුවක් ගැනම නැවත වරක් පරීක්ෂා කර බලා වරදකරුවන් වී සිටින අය නිර්දෝෂී අයදැයි සොයා බලන්න කියා.

ඊළඟට නීතිඥයන් ගැනත් වචනයක් දෙකක් කියන්නට ඕනෑ. දේශපාලනඥයින් හැමදාම කළුකඩකාරයන්ට දොස් කියනවා. නමුත් එසේ දොස් කියමින් සාමාන්‍ය මහජනයාගේ ශුභසිද්ධිය සඳහා වැඩ කරනවාය කියන අය අතරත් මහජනතාව සූරා කන අන්දමේ අය සිටිනවා. මහජනයා සූරා කන ප්‍රධාන පන්තිය නම් ඉහළ පෙළේ නීතිඥයන් බව අපේ රටේ මහජනයාගේ සාමාන්‍ය පිළිගැනීමයි. ඒ පිළිගැනීම නැති කර දමන්ට රජය විධිවිධාන සලස්වන්ට ඕනෑ. මේ රජය කට යුතු කරන්නේ මහජන යහපත සඳහා නම් මේ නීතිඥ ගාස්තු පිළිබඳ ප්‍රශ්නය මහජන උපද්‍රවයක් වශයෙන් සලකා ක්‍රියා කරන්ට ඕනෑ. ගරු අධිකරණ ඇමතිතුමා ඒ ගැන ක්‍රියා කරාවියයි මා බලාපොරොත්තු වෙනවා.

මගේ ප්‍රදේශයේ ඇති තවත් දුෂ්කරතාවක් ගැන සඳහන් කරන්ට තිබෙනවා. මගේ ප්‍රදේශය බොහොම ඉස්සර සිටම ජනගහනය ඉතා අධික ප්‍රදේශයක්. මෙම ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් වැඩි දෙනකුට තිබෙන්නේ පරම්පරාවෙන් පරම්පරාවට අයිති වේගත එන ඉඩම්. සමහර ඉඩම්වල අයිතිය සොයා බැලීමේදී කිසිම පුද්ගලයකුට අක්කර දහයෙන් පංගුවක්වත් අයිති නොවන අවස්ථාත් තිබෙනවා. මෙම කරුණ නිසා මගේ ප්‍රදේශයේ ඇති වන ආරාවුල් කලකෝලාහල ආදියෙන් විශාල ගණනක් සිදු වන්නේ මේ ඉඩම් බෙදා ගැනීමේ ප්‍රශ්නය උඩයි. එම නිසා දෙමව්පියන්ට අයත් ඉඩම්වලින් යම්කිසි ප්‍රමාණවත් කොටසක් එක් පුද්ගලයකුට හෝ ලැබෙන අන්දමට යම්කිසි නීතියක් ඇති කරන්ට ඕනෑ. විශාල ප්‍රමාණයක් නොවෙතත් සාමාන්‍ය ප්‍රමාණයක්වත් එක් එක් පුද්ගලයාට අයිති වන හැටියට යම්කිසි ක්‍රමයක් සකස් කරන්ට ඕනෑ. ඉඩම් අක්කරයක් හිමිව තිබෙන ගම්බද කෙනකුට දරු පස් දෙනකු සිටියොත් ඒ ඉඩම පහට බෙදෙනවා. ඒ පස් දෙනාටත් දරුවන් පස් දෙනා ගණනේ සිටියොත් එම ඉඩම් විසිපස් දෙනකුට බෙදෙනවා. අන්තිමේදී ඒ විසිපස් දෙනාගෙන් තුන් සියයකට විතර බෙදෙනවා. මේ තත්ත්වය තිබුණොත් ඒ පවුල් අතර ඇතකොටාගැනීම් ඇති වී අත පය ශක්තිය ඇති බලවතාට ඒ ඉඩම භුක්ති විඳීමේ වර ප්‍රසාදය ලැබෙන අතර, අසරණයාට, බැරිමිනිහාට, කිසිවක් ලැබෙන්නේ නැහැ. මේ ක්‍රමය නැති කර දමන්න යම්කිසි වැඩ පිළිවෙළක් ඇති කරන්ට ඕනෑ. ඒ විධියේ නීතියක් ඇති කළොත් මේ අවුල් වියවුල් බොහෝ දුරට විසඳේයයි මා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, කොතෙක් දෙනා කොයි අන්දමින් රාජරත්න සිද්ධිය සම්බන්ධයෙන් ගරු අධිකරණ ඇමතිතුමාට චෝදනා එල්ල කළත්, ඒ එක්කෙනකුවත් කියා සිටියේ නැහැ, අධිකරණ ඇමතිතුමා නීතියට විරුද්ධව ක්‍රියා කර තිබෙනවාය කියා. නීතිය කඩා තිබෙනවා යයි කවුරුවත් ඔප්පු කළේ නැහැ. මේ රටේ නීතිය ආරක්ෂා කිරීම සඳහා පත් කර සිටින එතුමා නීතිය ආරක්ෂා කර ඇති බව ඒ ප්‍රශ්නයෙන් අපට පෙනී ගියා. එම නිසා මේ අවස්ථාවේදී අධිකරණ අමාත්‍යවරයාට ස්තුතිවන්ත වන අතර, අපේ රටේ අනාගතය දියුණුව කරා ගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යාම සඳහා නීතිගරුක මහජනතාවක් ඇති කිරීමට හැම කෙනකු අතරම සාධාරණත්වය බෙදී යන අයුරු ක්‍රියා කිරීමට එතුමාට ධෛර්ය ලැබෙවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

ජී. ජේ. පාරිස් පෙරේරා මයා. (ජාඇල)
(திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா—ஜா-எல)
(Mr. G. J. Paris Perera—Ja-Ela)

ගරු සභාපතිතුමනි, අධිකරණ ඇමතිතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් වචන කීපයක් කියන්නට බලාපොරොත්තු වෙනවා. දැනට අවුරුදු දෙකකට කලින් මා නියෝජනය කරන ජාඇල කොට්ඨාශයට සංචාරක උසාවියක් ලැබුණා. ඒ මඟින් ඒ පළාතේ නඩු කීපයක්ම විසඳන්නට යෙදුණා. ඒ සංචාරක උසාවිය නිසා ජාඇල ප්‍රදේශයේ ජනතාවට සහනයක් ලැබුණා. නමුත් දැන් එය නවත්වා දමන්නට අදහසක් තිබෙන බවට ආරංචියක් තිබෙනවා. එසේ වුවහොත් ඒ පළාතේ ජනයාට මීගමුවේ උසාවියට යන්නට සිදු වෙනවා. එම නිසා මේ ගැන විශේෂයෙන් සලකා බලා ජාඇල සංචාරක උසාවිය දිගටම පවත්වා ගෙන යෑමට කටයුතු යොදන මෙන් ඉල්ලා සිටිනවා.

ණය සහනදායක මණ්ඩලය ගැනත් මතක් කරන්නට ඕනෑ. මීට කලිනුත් මේ ගැන මතක් කළා. ඉඩපහසු ඇති ස්ථිර ගොඩනැගිල්ලක් ලබා දී එහි සේවය කරන නිලධාරි මහතුන්ට සැනසීමෙන් යුතුව වැඩ කරන්නට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

පී. ආර්. රත්නායක මයා. (මාවනැල්ල)
(திரு. பீ. ஆர். ரத்நாயக்க—மாவனல்லை)
(Mr. P. R. Ratnayake—Mawanella)

ගරු සභාපතිතුමනි, අධිකරණ ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ පළමුවෙන්ම මගේ කොට්ඨාශයේ තිබෙන ප්‍රශ්නයක් ගැන ගරු පාර්ලිමේන්තු ලේකම් තුමාගේ සැලකිල්ල යොමු කරවන්නට කැමතියි. දිවංගත අගමැතිතුමා සිටින කාලයේදී ගල් බඩ කෝරළේ තුම්පළාත් පත්තුවේ සාම මණ්ඩල පිහිටු වීමට කටයුතු සලස්වා තුබුණු නමුත් තවමත් ඒ ප්‍රදේශයේ සාම මණ්ඩල පිහිටු වීම ක්‍රියාත්මක කර නැහැ. එම නිසා ඉතා ඉක්මනින් ඒ කොට්ඨාශයේ සාම මණ්ඩල පිහිටුවීමට ක්‍රියා කරන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම් තුමාගෙන් ඉල්ලා සිටිනවා. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) මෙම සාම මණ්ඩල ගැන දීර්ඝ ලෙස කරුණු ප්‍රකාශ කළා. එතුමා විසින් ඉදිරිපත් කරන ලද කරුණු ගැන මා එකඟ වෙනවා. ගම්බද ජනතාවට සාම මණ්ඩලවලින් බොහෝ ප්‍රයෝජන ලැබෙනවා. එම නිසා මා නියෝජනය කරන කොට්ඨාශයේ පමණක් නොව දැනට සාම මණ්ඩල පිහිටුවා නැති සෑම ප්‍රදේශයකම සාම මණ්ඩල පිහිටු වීමට ඉක්මනින්ම ක්‍රියා කිරීම අවශ්‍යයි.

නොයෙක් නොයෙක් ප්‍රශ්න සම්බන්ධයෙන් නඩු මඟට බැසීමට සිදුවන නිසා අද ගම්බද ජනතාවට ලොකු කරදරයකට මුහුණ පාන්නට සිදු වී ඇති බව තමුන්නාන්සේ දන්නවා. සමහර විට ඉක්මනින් නඩු විසඳීම් කෙරෙන්නේ නැහැ. එම නිසා හැකි තරම් ඉක්මනින් එම නඩු විසඳාලීමට වැඩ පිළිවෙළක් සකස් කිරීම මෙම ආණ්ඩුවේ යුතුකමයි. ඉඩම් අවුල් නිරවුල් කර ගැනීමයි විශාල කරදරයක් වී තිබෙන්නේ. අක්කර භාගයක නැත්නම් කාලක ඉඩමක් බෙදා ගැනීමට, අවුලක් බේරා ගැනීමට නඩුවක් කිරීමේදී සමහර විට එම නඩු කියන්නට අයිති අනෙක් ඉඩම් අක්කරයත් විකිණී යනවා. නිතිඥ ගාස්තු ගෙවීමට සිදු වීම නිසා නිරවුල්ව තිබෙන ඉඩම් කැබෙල්ලත් විකිණී යනවා. මේ අන්දමින් පිරිහීමට පත් වන ගම්බද ජනතාව ගලවා ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම් තුමාගෙන් ඉල්ලා සිටිනවා.

රාජරත්න සිද්ධිය ගැනද මට වචන ස්වල්පයක් සඳහන් කරන්නට තිබෙනවා. රාජරත්න මහතාට දී තිබුණ දඬුවම අඩු කරන්නය කියා අග්‍රාණ්ඩුකාරතුමාට උපදෙස් දීම ගැන අධිකරණ ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. මේ සමඟම තවත් වැදගත් ප්‍රශ්නයක් පැන නඟිනවා. රාජරත්න මහතාගේ දඬුවම ලිහිල් කිරීම ගැන නොයෙක් දෙනා නොයෙක් අදහස් පළ කරනවා. සමහරු කියනවා, මේ රටේ උසස් උදවියට තවමත් යම් යම් වරප්‍රසාද ලැබෙනවාය කියා. මා මේ කාරණා සඳහන් කරන නිසා රාජරත්න මහතාට සහනය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. ආර්. රත්නායක මයා.]

දීම ගැන විරුද්ධ වෙනවාය කියා මොහොතකටවත් කල්පනා කරන්න එපා. 1958දී ඇති වූ ජාතිහේද කෝලාහලයේදී ජාතික හැඟීම් ඇවිස්සී යාම නිසා නොයෙක් විධියේ අරගලවලට සම්බන්ධ වුණ පුද්ගලයින්ව අවුරුදු ගණන්වලට සිර ගෙවලට යැවූ බව අප කවුරුත් දන්නා කාරණයක්. මේ ආදි විශේෂ කාරණා කල්පනා කර බලා වෙන්නට ඇති අධිකරණ ඇමතිතුමා රාජරත්න මහතාගේ දඬුවම ලිහිල් කළ යුතුය කියා අග්‍රාණ්ඩුකාරතුමාට උපදෙස් දී තිබෙන්නේ. ඒ නිසා මෙම අරගලය පැවති කාලයේදී මෙවැනි වරදවලට අසුවී සිර ගෙට නියම වූ දහස් ගණන් මේ රටේ මහජනතාව ගැනද කල්පනා කර බලා ඒ අයට පවරා තිබෙන දඬුවම්ද ලිහිල් කොට සහනයක් දීමේ වැඩ පිළිවෙළක් ගැන ආණ්ඩුව කල්පනා කර බලනවාද යන ප්‍රශ්නයට ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ගෙන් මම පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, ණය සහන මණ්ඩලය ගැන වචනයක් දෙකක් කිය යුතුව තිබෙනවා. ගම්බද පළාත්වල වෙසෙන සියයට 80 දෙනකු පමණ මෙම ආයතනයෙන් යම්කිසි ආධාරයක් ලබා ගන්නේ තමන් සතු ඉඩ කඩම් උගස් තබායි. එම මණ්ඩලයේ එකම කාර්යාලය පිහිටා තිබෙන්නේ කොළඹ පමණක් බැවින් ගම්බද අයට මුහුණපාන්නට සිදු වී තිබෙන්නේ බලවත් කරදරයකටයි. අපේ ගමේ සිටින කොළඹට ඇවිත් පුරුද්දක් නැති කෙනෙක් තමාට එම මණ්ඩලයට එන්නට වුවමනාය කියා මා සමග කීවිට මටද එදා විවේක තිබුණ බැවින් ඒ තැනැත්තා සමග කොළඹ අවුත් එය කර දෙන්නට උදව් වෙන්නට සිදු වුණා. මෙවැනි අමාරුකම්වලට මේ පළාත්වල සිටින අයට මුහුණ පාන්නට සිදු වන්නේ ඒ පළාත්වලට කිට්ටුව මෙම මණ්ඩලයේ ශාඛාවක් නැති නිසායි. ඒ නිසා ණය බරින් මිරිකී සිටින දුප්පත් මහජනතාව එයින් මුදවාලීම පිණිස මෙම ණය සහන මණ්ඩලයේ ශාඛා සෑම දිස්ත්‍රික්කයම පාහේ පිහිටුවන්නට කටයුතු යොදවන්න ය කියා පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. විශාල වියදමක් දරන්න සිදු වෙනවා නම් ඒ ඒ ප්‍රදේශයේ සිටින දිසාපතිවරුන්ට හෝ බල තල පවරා දී ඒ ප්‍රශ්නය විසඳීමට ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

පූ. භා. 10.45

මාවනැල්ලේත් අරණායකත් ගම්සභා උසාවි දෙකක් තිබෙනවා. ඒ දෙකෙන් එකක්වත් සංචාරක උසාවියක තත්ත්වයට පත් කරවන මෙන් ඉල්ලා වරින්වර ලියුම් යවා තිබෙන නමුත් තවම සතුටුදායක පිළිතුරක් ලැබී නැහැ. මා නියෝජනය කරන මාවනැල්ල කොට්ඨාශයේ අයට නඩුහබ සඳහා කෑගල්ලටයි යන්න සිදු වන්නේ. සමහර ගම්වල හොඳ පාරවල් නැති නිසාත් රථවාහන පහසුකම් නැති නිසාත් හැතැප්ම ගණන් පයින්ම ගමන් කරන්න සිදුවෙනවා. සමහර අයට හැතැප්ම පහ හය ආදි වශයෙන් පයින්ම ගමන් කර උසාවියට එන්න සිදු වෙනවා. ගම්සභා උසාවියකින් නොවිසඳිය හැකි නඩු සඳහා කෑගල්ලේ උසාවියට යාමට සිදු වන අවස්ථාවල මගේ ප්‍රදේශයේ අයට තවමත් පරණ කාලේ මිනිසුන් කළා වගේ පාන්දර තුනට හතරට නැගිට පිටත් වී බොහෝ දුරක් පයින්ම ගමන් කරන්න සිදු වෙනවා. සමහර විට නියමිත වේලාවට පැමිණෙන්නත් අමාරු වෙනවා. නිදිමරා ගෙන, පයින් ගමන් කර, ඔය තරම් හිරිහැර කරදරවලට මුහුණපාන්න මේ දියුණු වේගන එන යුගයේ ඉඩ තියන්න හොඳ නැහැ. ඒ නිසා මාවනැල්ලේත් අරණාය කත් තිබෙන ගම්සභා උසාවි දෙකින් එකක් සංචාරක උසාවියක් බවට හරවන්නට ඉතා ඉක්මනින් කටයුතු කරන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා.

නීතිඥයන් ගැන දැනටමත් සෑහෙන තරම් කරුණු කියා තිබෙනවා. ඒ අය ගෙන යන ව්‍යාපාරය මොන විධියේ එකක්ද කියා අප දන්නවා. කෙසේ වෙතත් නීතිඥ වෘත්තියේත් හොඳ අය මෙන්ම හොඳයි කියන්න බැරි විධියේ අයත් ඉන්න බව පිළිගන්න ඕනෑ. ඇතැම් අය තමන් වෙත එන අසරණ, නූගත්, විත්තිකරුවනුත් පැමිණිලිකරුවනුත් ගසාකන ආකාරය ගැන අපට අසන්න ලැබෙනවා. සමහර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒවා අසන්නත් කනගාටුයි. තමන් පෙනී සිටි නඩුවකින් ජය ලැබූ පසු, දිනාගත් අය තමන් වෙත ආවාම ඔවුන්ගේ අත් සන් ලබාගෙන ඒ අයට ලැබිය යුතු මුදලක් වෙයි නම් ඒ මුදලත් තමන්ගේ සාක්කුවටම එන විධියේ වැඩ පිළිවෙළක් ඇතැම් නීතිඥයන් යොදනවා. මොවුන් ගෙන් දුප්පත් ජනයා බේරා ගත යුතුයි. කෑගල්ලේ උසාවියේ මෙවැනි දේ සිදු වන බවට පැමිණිලි රාශියක් ලැබී තිබෙන නමුත් නීතිඥයන්ට විරුද්ධව තවම වැඩ පිළිවෙළක් යොදා නැහැ. මේ ගැනත් සලකා බැලුවොත් හොඳයි. නීතිඥයන් දුප්පත් ජනයාට කථා කරන ආකාරය බොහොම නරකයි. සිංහලේ රජකාලේ ඇතැම් මාන්නක්කාර රදළයන් තම අන්තේවාසිකයන්ට කථා කළ ආකාරය වයි උසාවියේදී පවා මේ අය දුප්පතුන් අමතන්නෙ. මහේශාක්‍ය ලීලාවෙන් අනුන්ට නිගා කිරීම මේ කාලෙට ඔබින්නෙ නැහැ. ශීලාචාර විධියට කථා කරන්න නොදන්නවා නම්, කියා දෙන්නවත් ඕනෑ. "උඹ, තෝ, බොල, මෙහාට වරෙන්, එහාට පලයන්, ඉඳ ගනින්, කියාපන්," ආදි වශයෙන් කථා නොකර ශිෂ්ට සම්පන්න මිනිසුන් පිළිගන්න ආකාරයට උසාවියේදීවත් කථා කරන්න මොවුන්ට නියම කළ යුතු කාලය දැන් පැමිණ තිබෙනවා.

රටට ගැළපෙන ආකාරයට නීතිඥ වෘත්තියේ වැඩ කරගෙන යන්න කැමැත්තක් දක්වන නීතිඥයන් සෑහෙන සංඛ්‍යාවක් දැන් අපේ රටේ ඉන්නවා. දැන් පවත්නා තත්ත්වයේ හැටියට යම් නීතිඥයකුට ජාතික ඇඳුමින් සැරසී උසාවියට යන්න වුවමනා කළොත් ඒ සඳහා කල් තබා අවසරය ලබා ගැනීමට සිදු වෙනවාය කියා දැන ගන්න ලැබුණා. ඒ විධියට අවසර අරන් දැනටමත් කෑගල්ලේ එක් නීතිඥ මහත්මයෙක් ජාතික ඇඳුමින් උසාවියට යනවා. ඒ විධියේ අවසරයක් ගැනීමට අවස්ථාවක් තිබෙන්න ඕනෑ නැහැ. එවැනි නීති තිබෙනවා නම් ඒවා සම්පූර්ණයෙන්ම අයින් කර දමා තමන්ට කැමති විධියට උසාවියට ගොස් වැඩ කිරීමට අවසර දෙන ලෙස මම ඉල්ලනවා. පසු ගිය දිනක ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් මට දකින්නට ලැබුණා, එක්තරා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කෝට් එකක් සහ ටයි එකක් අදින්නේ නැතිව උසාවියට ගිය නිසා, උසාවියෙන් එළියට යන්නය කියා එම නඩුකාර මහතා නියම කර තිබුණ බව. ඒ ගරු මන්ත්‍රීතුමා ඇඳ සිටියේ කලිසමක් සහ කමිසයක් පමණලු.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
ඒක ජාතික ඇඳුම නොවෙයි.

පී. ආර්. රත්නායක මයා.
(திரு. பீ. ஆர். ரத்நாயக்க)
(Mr. P. R. Ratnayake)
ඒක හරි. ජාතික ඇඳුම නොවුණත් තමන්ට තිබෙන විධියට තමන්ට කැමති පරිදි ඇඳගෙන යාමට අවසර තිබෙන්න ඕනෑ. ඒ ගරු මන්ත්‍රීතුමාට ටයි එකක් සහ කෝට් එකක් ඇඳගෙන යන්නට බැරි කමක් නොවෙයි. නමුත් කලිසමක් සහ කමිසයක් ඇඳගෙන යාමෙන් උසාවියට අපහාසයක් වන්නේ නැහැ, අගෞරවයක් වන්නේ නැහැ. ඒ වාගේම එය ඒ මන්ත්‍රීතුමාගේ තත්ත්වයට මදිකමක් වන්නෙත් නැහැ. එම නිසා එවැනි නීති රීති නැති කරන ලෙස මම පාර්ලිමේන්තු ලේකම් තුමාගෙන් ඉල්ලා සිටිනවා.

උසාවිවල සිංහල භාෂාවෙන් වැඩ කට යුතු කිරීම ගැන සන්තෝෂ වන්නට පුළුවන් තත්ත්වයක් ඇති වී නැහැ. දොඩන්ගස්ලන්දේ ගරු මන්ත්‍රීතුමා (ඒ. යූ. රොමානිස් මයා.) මේ සම්බන්ධයෙන් ඊයේ සඳහන් කළා. එතුමා ඉදිරිපත් කළ අදහස් සම්බන්ධයෙන් මම එතුමාට ගරු කරනවා. උසාවිවල සිංහලෙන් නඩු ඇසීම තව දුරටත් ප්‍රමාද කර තිබීම ගැන ඊයේ ඒ මන්ත්‍රීතුමා මේ ආණ්ඩුවට චෝදනා කළා. එතුමා කිව්වා, මේ සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයට දොස් කියන්න ඕනෑ නැත, මේ පිළිබඳ චෝදනාව මේ ආණ්ඩුව විසින් භාර ගත යුතුය කියා. මම ඒ මන්ත්‍රීතුමාට එක් කරුණක් මතක් කරන්න කැමතියි. උසාවිවල වැඩ කටයුතු සිංහලෙන් කිරීම සඳහා දැනට නොයෙකුත් බාධා තිබෙනවා. විශෙෂයෙන්ම නඩුකාර මහත්වරුන් වැඩි දෙනා සිංහල නොදන්නා උදවියයි. ඒ වාගේම නීතිඥ මහත්වරුන් වැඩි දෙනකුත් සිංහල දන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ආර්. රත්නායක මයා.]

නැහැ. එම නිසා අද අපට මෙය එක පාරටම කරන්න පුළුවන්කමක් නැති බව කවුරුත් පිළිගන්න ඕනෑ. නමුත් නිදහස ලබාගත් කාලයේ සිට එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව ජාතික භාෂාවට තැනක් දී උසාවිවල කටයුතු කිරීමටත් පටන් ගත්තා නම්, මේ කාලය වන විට උසාවිවල වැඩ කටයුතු සිංහලෙන් කිරීම මීට වඩා පහසුවෙන් කරන්නට ඉඩ තිබුණ බව මම දොඩන්ගස්ලන්දේ ගරු මන්ත්‍රී තුමාට මතක් කරන්න කැමතියි. කෙසේ වුණත්, මම කාටවත් චෝදනා කරන්නේ නැහැ. දැන් මෙවැනි තත්ත්වයක් තිබෙන නිසා පුළුවන් තරම් ඉක්මනින් ලංකාවේ සියළුම උසාවිවල වැඩ කටයුතු සිංහල භාෂාවෙන් කිරීමට මේ ආණ්ඩුව සම්පූර්ණයෙන් මහන්සි වෙන්න ඕනෑ. දැනට වඩා උනන්දුවෙන් මේ ආණ්ඩුව විසින් ඒ කටයුතු කළ යුතු බව විශෙෂයෙන් පාර්ලිමේන්තු ලේකම්තුමාට මතක් කරන්න කැමතියි.

සමාදාන විනිශ්චයකාර පදවි පිළිබඳ ප්‍රශ්නය පැන නැංගා. දැනට සමාදාන විනිශ්චයකාර පදවි පිරිනමන පිළිවෙළ වැරදිය කියා නොයෙක් ගරු මන්ත්‍රීවරු සඳහන් කළා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත් ඒ බව සඳහන් කළා. එසේ වුණත් දැනට සමාදාන විනිශ්චයකාර පදවි දෙනු ලබන්නේ එක්සත් ජාතික පක්ෂය බලයේ සිටි කාලයේ දුන් පිළිවෙළ අනුව නොවෙයි. මේ ගැන මගේ අදහසුත් ඉදිරිපත් කිරීමට මම කැමතියි. සමාදාන විනිශ්චයකාරවරුන් පත් කිරීම සම්පූර්ණයෙන්ම නවතා දමන්නය කියා මම පළමු කොටම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. අද නම්බුනාම ක්‍රමය සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබුණත් සමාදාන විනිශ්චයකාර පදවි නම්බුනාම හැටියට ලබා ගැනීමට බොහෝ දෙනකු අද උත්සාහ කරන බව රහසක් නොවෙයි. මෙම පත් කිරීම් කරන්ට අපට කිසිම වුවමනාවක් නැහැ. දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ අදහසක් තිබුණා, මෙම සමාදාන විනිශ්චයකාර පදවි නැති කර දැමීමට. එතුමාගේ කාලයේදී එතුමා සමාදාන විනිශ්චයකාරවරුන් පත් කළේ නැහැ. දිවුරුම් කොමසාරිස් පදවි පමණයි, ඇති කළේ. මම අදහස් කරනවා, මෙම සමාදාන විනිශ්චයකාර පදවි සම්පූර්ණයෙන්ම නැති කිරීමට එතුමා තුළ අදහසක් තිබුණ බව. කෙසේ වුණත්, මෙම පදවි සම්පූර්ණයෙන් නැති කර ගම්කාර්ය සභාපතිවරුන්ටත්, ගම් කාර්ය සභා නියෝජිත මහත්වරුන්ටත්, පාඨශාලාවල මුල් ගුරුවරුන්ටත්, තවත් ඒ විධියේ වගකිය යුතු තනතුරු උසුලන අයටත්, ඒ පිළිබඳ බලය දිය යුතුය කියා මම යෝජනා කරනවා. සමාදාන විනිශ්චයකාරවරුන්ගෙන් අත්සන් ගැනීමට තිබෙන ෆෝර්ම් කොළවල යම් යම් පදවි නියම කර, වටිනාකම සඳහන් කර එවැනි වගකිය යුතු නිලධාරීන්ට ඒවා අත්සන් කළ හැකි බව සඳහන් කර තිබෙනවා. එම නිසා මා කලින් සඳහන් කළ විධියේ වගකිය යුතු පුද්ගලයන්ට—සමාදාන විනිශ්චයකාර පදවි වශයෙන් නොව—ඒ ඒ පරිදි අත්සන් සහතික කිරීමට මේ අයට පුළුවන්ය කියා, බලයක් දීම ඉතාම උචිත බව මම සලකනවා. ඒ විධියේ ක්‍රමයක් ඇති කර දැනට තිබෙන සියලුම සමාදාන විනිශ්චයකාර පදවි අවලංගු කරන ලෙස ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මම අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා.

පී. සී. ඉඹුලාන මයා. (රුවන්වැල්ල)
(திரு. பீ. சீ. இம்புலான—ரூவான்வல்ல)
(Mr. P. C. Imbulana—Ruwanwella)

ගරු සභාපතිතුමනි, බොහෝ කාලාවේලා වක් මේ සඳහා මිඩංගු වී තිබෙන නිසා දීර්ඝ ලෙස කථා කරන්න මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. උසාවි සම්බන්ධයෙන් සංක්ෂෙප වශයෙන් අදහස් ටිකක් දක්වීම වසි මා බලාපොරොත්තු වෙන්නේ.

ගිය අවුරුද්දේ අයවැය විවාදයේදී, මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කරන විට, මම ගරු ඇමතිතුමාට මතක් කර සිටියා, නඩු ආදි කටයුතු සඳහා උසාවියට පැමිණෙන මහජනයාට පහසුකම් සලසා දෙන්නය කියා. අඩු වශයෙන් ඒ අයට ඉඳගැනීමටවත් සෑහෙන ආසන සංඛ්‍යාවක් සපයා දී නැහැ. උසාවියට පැමිණෙන දස දහස් ගණනකටම ආසන සැපයිය යුතුයයි මා කියන්නේ නැහැ. නමුත් සෑහෙන ගණනකටවත් ඉඳ ගැනීම සඳහා ආසන පනවා දෙන ලෙස මා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට මතක් කර සිටියා. එතුමා එදා කීවා "කල්පනා කර බලන්නම්" කියා. නමුත් අද උසාවිය දිහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැලුවාම එදා තත්ත්වයට වඩා කිසිම වෙනසක් ඇති වෙලා නැහැ. කොහු ලණුවලින් නැතිනම් තේඩාවලින් එහෙන් මෙහෙන් රැන් ඇද තිබෙනවා. මේ නිසා උසාවියට තමන්ගේ නඩු ආදිය සඳහා පැමිණෙන ජනයාට—ඒ අය කොයි විධියේ තත්ත්වයක සිටියත්—සමහර උදවිය අසනීප ගතියෙන් සිටිනවා, සමහර අය නැගිට සිටීමට අමාරුකමක් දක්වනවා—උදේ සිට හැන්දෑවෙන තුරුම හිටගෙන සිටීමට සිදු වෙනවා. උසාවියට තිබෙන භය නිසා කොතරම් අපහසුකමක්—අමාරුකමක් දැනුනද ඒ සියල්ල විඳගෙන හිටගෙනම සිටිනවා. එම නිසා උසාවියට පැමිණෙන මහජනයාට මෙයට වඩා සැප පහසුකම් සලසන ලෙස නැවත වරක් ගරු පාර්ලිමේන්තු ලේකම් තුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟට සාක්ෂි කූඩුව ගැනද යමක් සඳහන් කරන්න කැමතියි. සමහර විට මේවාට සාක්ෂි කූඩුව කියා කියන්නේ දෙහිවල සත්ව උද්‌යානයේ සතුන් දමන කූඩු වාගේ නිසා වෙන්න පුළුවනි. නමුත් මට කියන්න කනගාටුයි, සාක්ෂි දීම සඳහා පැමිණෙන ජනයාට පැය ගණනක්ම රැඳී සිටින්න පුළුවන් වන තත්ත්වයක මේ කූඩු ඇත්තේ නැහැ. එම නිසා වඩා සැප පහසුකම් ඇති වන පරිදි මේවා සකස් කිරීමට ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා විධිවිධාන සලසන්න ඕනෑ.

තවත් කාරණයක් ගැන තමුන්නාන්සේගේ සැලකිල්ල මේ අවස්ථාවේදී යොමු කරවන්න කැමතියි. ඒ, ඉඩම් නඩු ගැනයි. මා දන්න හැටියට අවුරුදු 18-20 පරණ ඉඩම් නඩු තවමත් උසාවිවල විභාග වෙනවා. මට ආරංචියි, අවුරුදු 24ක කාලයක සිට එක නඩුවක් විභාග වෙමින් පවතින බව. මෙවැනි ඉඩම් සම්බන්ධයෙන් නඩු මගට බහින්නේ වැඩි වශයෙන්ම දුප්පත් උදවියයි; පෝසත් උදවිය නොවෙයි. සමහර අය අක්කර 5ක-6ක ඉඩමටයි නඩු කියන්නේ. තත්ත්වය මෙසේ නම් අපට පෙනී යනවා, කොපමණ මුදලක් වියදම් කරන්න ඒ උදවියට සිදු වෙනවාද කියා. ක්‍රිමිනල් නඩු හැරුණු විට උසාවිවල බහුල වශයෙන් විභාග වෙන්නේ ඉඩම් ආරාවුල් පිළිබඳ නඩුයි. එම නිසා ඉඩම් සම්බන්ධයෙන් නඩු කීම අවශ්‍ය නම්, මහජනයාට හිරිහැර නොවන අන්දමට, විශාල වියදමක් දරන්න සිදු නොවන අන්දමට, ඒ කටයුත්ත කර ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කර දීමට ගරු පාර්ලිමේන්තු ලේකම් තුමා කටයුතු කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, මෙම උසාවිවල විනිශ්චයකාරවරුන් අවංක විධියට වැඩ කටයුතු කරගෙන යාම ගැන අප ඉතාමත් සන්තෝෂ වෙනවා. ඒ වාගේම ඒ ගැන අප ප්‍රශංසා කරනවා. සමහරු කියනවා, මෙය බ්‍රිතාන්‍යයන්ගෙන් අපට ලැබුණු දායාදයක්ය කියා. ඒ කෙසේ වුණත් බොහෝ නඩුකාරවරුන් ඉතාමත් අවංක ලෙස කටයුතු කරගෙන යන බව කියන්න කැමතියි. නමුත්, බංකුවෙන් පල්ලෙහා—බිලෝ ද බෙන්ච්—මොන මොන විධියේ වැඩ කෙරෙනවාද කියන එක ගැන තමුන්නාන්සේගේ සැළකිල්ල යොමු කරවන්න කැමතියි. මම උසාවියට හෝ නඩුකාරයින්ට හෝ දොස් කියනවා නොවෙයි. නමුත් මෙම උසාවිවල පාලන කටයුතු කෙරෙන ආකාරය ගැන නම් අපට කිසිසේත්ම සතුටු වෙන්න බැහැ.

ගරු සභාපතිතුමනි, එක ගම්කාර්ය සභාවක සභාපති කෙනෙකුට විරුද්ධව, රුපියල් දහ දාහක් අය කර ගැනීම සඳහා, නඩුවක් පැවරුවා. එසේ නඩු පවරා තිබෙන්නේ එක්තරා පාලමක් තැනීම සඳහා වැඩිපුර රුපියල් දස දාහක් ගම්කාර්ය සභාවෙන් වැය කරලා තිබෙනවාය කියායි. ඒ නඩුව පැවරූ අවස්ථාවේදී රුපියල් 10,000කට ඇප ඔප්පුවක් ඉදිරිපත් කරන්නය කිව්වා. එවිට ඒ ගම්සභාපතිවරයා ඇපයට තැබිය හැකි අනික් ඉඩමක් ඒ අවස්ථාවේදී නොතුබූ යෙන් රත්නපුර අධිකරණ සීමාවෙන් පිටස්තරව පිහිටි ඉඩමක ඔප්පුවක් ඇපය වශයෙන් එදා එහි සිටි ප්‍රධාන ලිපිකාර මහත්මයාට භාර දුන්නා. එදා එහි සිටියේ කනගාටුසබේ කියන මහත්මයකුයි. මේ කාරණා මා හොඳින් දන්න නිසයි, කියන්නේ. ඔහු කිව්වා, රත්නපුර අධිකරණ සීමාවෙන් පිටස්තර ඇති ඉඩම්වල ඔප්පු ඇප වශයෙන් භාර ගන්න බැරිය කියා. එහි ඇත්තක් තිබේදැයි මම දැන ගන්න සතුටුයි. සමහර විටක ඔහුට සන්තෝෂමක් නොලැබුණු නිසා එසේ කියන්න ඇති. නමුත් අද නීතියේ හැටියට ඇප ඔප්පුව සඳහා ඉදිරිපත් කරන ඉඩම් ලංකාවේ කොතැනකවුවත්, ඩී. ආර්. ඕ. මහත්මයෙක් කිව්වොත් ඒ නියම කරන ලද මුදල් ප්‍රමාණය වටින

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. සී. ඉඹුල්දෙණිය මයා.]

වාය කියා, ප්‍රදේශ සීමාවක් නොමැතිව ඒවා භාර ගන්න ඕනෑ. නමුත් ඒ ලිපිකාර මහත්මයා රත්නපුර ප්‍රදේශයෙන් පිටස්තර ඉඩම් ඇපයට භාර ගන්න බැරිය කියා එම ප්‍රදේශයේම ඇති ඉඩම් ඇපයට තියන්නය කිව්වා. උසාවිවලින් මෙවැනි කරදර රාශියක් ඇති වෙනවා. මේ කරදර ගැන තමුන්නාන්සේ සොයා බලා තිබෙනවාද?

අද උසාවිවල පාලනය ගැන බලන විට යම් කිසි සන්තෝෂ මුදලක් නොදී උසාවියකින් කිසිම වැඩක් කර ගන්න බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. උසාවිවල පාලන කටයුතු කරන සියලුම උදවිය වැරදි කරුවන්යයි මම කියන්නේ නැහැ. නමුත් වැරදි කරන කොටසක් ඉන්නවා. එම නිසා ඒ ගැන පරීක්ෂා කර බලා මහජනයාට මුහුණ පාන්න වන එවැනි කරදරවලින් මහජනයාට සහනයක් ලබාදෙන මෙන් මම ඉල්ලා සිටිනවා.

ඊළඟට සාමදාන විනිශ්චයකාරවරුන් පත් කිරීම ගැනත් වචනයක් කියන්න තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවිය පමණක්ය, අද සාමදාන විනිශ්චයකාරවරුන් හැටියට පත් කරන්නේ කියා රටේ ආරංචියක් තිබෙනවා. එය ඇත්තද නැත්ත දැයි මම දන්නේ නැහැ. මාවනැල්ලේ ගරු මන්ත්‍රීතුමා (පී. ආර්. රත්නායක මයා.) කියා සිටියා, සාමදාන විනිශ්චයකාරවරුන් සියලු දෙනාම අස්කරන්නය, ඔවුන්ගෙන් වැඩි ප්‍රයෝජනයක් නැත කියා. එසේ වුවත් සාමදාන විනිශ්චයකාරවරුන් වැඩි ගණනක් පත් කිරීම ගැන මම සන්තෝෂ වෙනවා. පසුගිය කාලයේදී සමහර උදවියට ඔවුන්ගේ ලියවිල්ලක් සහතික කර ගැනීම සඳහා හැතැප්ම 10ක් 12ක් පමණ යන්න සිද්ධ වුණා. සාමදාන විනිශ්චයකාරවරයකු හමුවන්න නොහැකි හෙයින් සමහර අවස්ථාවලදී ඔවුන්ගේ කටයුතු කරවා ගත්තේ පෙරකදෝරුවන් ළඟට ගිහිනුයි. සාමදාන විනිශ්චයකාරවරුන් අද වැඩි ගණනක් සිටින නිසා ඔවුන්ට විශාල පහසුවක් ඇති වී තිබෙනවා. එම නිසා ඒ පත්වීම් නවත්වන්න යයි මම කියන්නේ නැහැ. නමුත් මම උප ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ සුදුසු පුද්ගලයන්ම තෝරා පත් කරන ලෙසයි.

ඩී. ජී. එච්. සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)

(திரு. டீ. ஜீ. எச். சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)

(Mr. D. G. H. Sirisena—First Akurana)

ගරු සභාපතිතුමනි, අධිකරණ ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ වචන කීපයක් කථාකරන්න කැමතියි. එක අතකින් කල්පනා කර බලන විට, යම් රටක උසාවිය ඒ රටේ ආණ්ඩු ක්‍රමය කෙරෙහි බලපාන කේන්ද්‍රස්ථානයක් හැටියට ගණන් ගන්නට පුළුවනි. එබඳු වැදගත් ස්ථානයකින් නිතරම සාධාරණ ආකාරයට යුක්තිය ඉටු විය යුතුයි. අද අපේ රටේ උසාවිවලින් තවමත් ඉක්මනින් යුක්තිය ඉටු කරවා ගන්නට පුළුවන්කම ලැබී තිබෙන්නේ මිල මුදල් අතේ ඇති බලවත් පුද්ගලයන්ට පමණයි. මේ ක්‍රමය කොයි කාලයේ ඇති කරන ලද ක්‍රමයක්ද කියන්නට මා දන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මේ පරිවර්තන යුගයේදී අපේ උසාවි වැඩ කටයුතුවලත් සංශෝධනයක් ඇති කරන්නට ඕනෑ. ගම්බද ජනතාවට සාධාරණ ලෙස යුක්තිය ඉටුවීමට නම් එවැනි සංශෝධනයක් ඇති කළ යුතුයි. ඒ සඳහා අපේ අධිකරණ ඇමතිතුමා සුදුසු පරිශ්‍රමයක් දරනු ඇත කියා අප විශ්වාස කරනවා. උසාවිවල පවතින යල් පැනපු වැඩ පිළිවෙළවල් ක්‍රමක්‍රමයෙන් නැති කර අළුත් විධියේ ප්‍රතිපත්තියකට අනුව ඒවායේ කටයුතු කරගෙන යාමට උත්සාහ දැරීම ගැන ගරු අධිකරණ ඇමතිතුමාට අප ස්තුතිවන්ත වියයුතුයි. එහෙත් එතුමාගේ දැනගැනීම සඳහා උසාවියේ පවතින වැරදි තත්ත්වය ගැන යමක් කිවයුතුව තිබෙනවා. ගම්බද අසරණ ජනයාට උසාවිය ඉතා භයානක ස්ථානයක් හැටියට සලකන්නට සිදු වී තිබෙන බව ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනාගේ කථාවලින්ද පෙනී ගියා. අද මහජනයාට බිය නැතිව උසාවියකට ඇතුළු වන්නට ඉඩක් නැහැ. බිය නැතිව උසාවියකට ඇතුළු වී තමන්ගේ දුක්ගැනවිල්ල ගැන කියන්න අවස්ථාවක් ඔවුන්ට නැහැ. ඇතැම් නීතිඥ මහත්වරු යුක්තිය අයුක්තිය බවටත් අයුක්තිය යුක්තිය බවටත් පෙරළා පෙන්වන්නට වෑයම් කරන බව පේනවා. එම නිසා කාලානුරූපව මේ නීතිඥ වෘත්තියත් සංශෝධනය කළ යුතුව තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇතැම් නීතිඥයන් අසාධාරණ විධියට ගාස්තු අය කරන බව මා නොකීවාට තමුන්නාන්සේලා බොහෝ දෙනා දන්නවා. නීතිඥයන්ට ගෙවන ගාස්තු සඳහා කුවිතාන්සිවත් ලබාගන්න පුළුවන් කමක් නැහැ. එම නිසා යම් නඩුවක් අවසානයේදී යම් අයෙකුට නීතිඥ ගාස්තු අයකර ගන්නට වුවමනා වූ විට ඒ සඳහා නොයෙකුත් කරදර ඇතිවෙනවා. මේ හේතුව නිසා රුපියල් පන් දහසක් වියදම් කළ කෙනෙකුට රුපියල් පනහකට හැට කට වඩා අයකර ගන්න පුළුවන් කමක් ලැබෙන්නේ නැහැ. මේ ක්‍රමය වෙනස් කළ යුතුව තිබෙනවා. ඒ සඳහා අපේ ගරු අධිකරණ ඇමතිතුමා වහාම පියවරක් ගන්නවා ඇත කියා මා විශ්වාස කරනවා.

මේ අවස්ථාවේදී අනුරාධපුර උසාවියේ අංක 11,721 වැන්න යටතේ අසන ලද නඩුවට සම්බන්ධ වී සිටිය මගේ කොට්ඨාශයේ අසරණ පවුලකට විඳින්නට සිදු වුණු මහත් කරදරයක් ගැන මතක් කරන්න කැමතියි. මේ නඩුව සඳහා එක්තරා නීතිඥ වරයකුට රුපියල් 300ක් ගෙවන්න සිදු වුණා.

සභාපතිතුමා.
(அக்கிராசனர்)
(The Chairman)

ඔය නඩුව තවම තියෙනවද? නැත්නම් අවසානද?

සිරිසේන මයා.
(திரு. சிறிசேன)
(Mr. Sirisena)

අවසානයි. මේ රුපියල් 300 අය කර ගත්තා මිසක් මේ පෙරකදෝරු මහත්මයා උසාවියට ඉදිරිපත් වුණේ නැහැ. මම ඉතා මත් සන්තෝෂයෙන් කියන්න කැමතියි, ඒ නඩුවට ඉදිරිපත් වූ තවත් අධිනීතිඥ මහත්මයකු තමා අය කර ගත් ගාස්තුව ආපසු දුන්න බව. ඒ අධිනීතිඥ මහත්මයා නම් වෙන කිසිවකු නොව, තෙල්දෙනිය ආසනය වෙනුවෙන් මේ ගරු සභාවේ පෙනී සිටින එක්සත් ජාතික පක්ෂයේ තිස්ස කපුකොටුව මහත්මයායි. මට නඩුවට පෙනී සිටීමට පුළුවන්කමක් නැහැ, ඒ දිනයට උසාවියට යන්නටත් මට ලැබෙන්නේ නැහැ, කියා ඒ මහත්මයා නඩුවට කලින්ම තමා ගත් මුදල ආපසු දුන්නා. නමුත් අනික් මහත්මයා ඒ විධියට සල්ලි දුන්නේ නැහැ. ඒ පෙරකදෝරු මහත්මයාගේ නම කීම හොඳද නැද්ද කියා මම දන්නේ නැහැ. නමුත් පෙත්සම් මාර්ගයෙන් මම නම කිව යුතුයි. ඒ අසරණ දුප්පත් කාන්තාව ඉඩමක් උගස් කර රුපියල් 300ක් ලබා ගෙනයි, පෙරකදෝරු මහත්මයාට ගෙව්වේ. එහෙත් ඒ පෙරකදෝරු මහත්මයා උසාවිය පළාතටවත් ගියේ නැහැ. සල්ලි ආපසු ඉල්ලුවාම ඒ සල්ලි දුන්නෙත් නැහැ. නීතිඥ සංගමයටත් මම මේ බව ලිපියකින් දැන්නුවා. නමුත් උත්තරයක් ලැබුණේ නැහැ. ගරු අධිකරණ ඇමතිතුමාටත් මම මේ බව දැන්නුවා. කරුණා කර ඒ අහිංසක කාන්තාවට එම රුපියල් 300 ආපසු ලබා දෙන ලෙස, තමුන්නාන්සේගේ මාර්ගයෙන් මම ගරු අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ නඩුවට රුපියල් 300 ගෙවා තිබෙන්නේ මගේ ඡන්ද කොට්ඨාශයේ පෑලව ගමේ උක්කු අම්මා නමැති අසරණ කාන්තාව බව මා කියන්න ඕනෑ. මේ වගේ කපටි වංචනික නීතිඥවරුන් නිසා වැදගත් නම්බුකාර නීතිඥවරුන්ගේ ගෞරවයට හානියක් නොවේවායි මම ප්‍රාර්ථනා කරනවා. මේ අහිංසක ස්ත්‍රියගෙන් මුදල් අරගෙන උසාවියට නොගොස් ඒ මුදලුත් ආපසු නොදී ඇය රවටා තිබෙන්නේ වල්ගම්පාය නමැති නීතිඥ වරයායි. මේ ගැන මම මීට වඩා යමක් කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, අපේ ගම්බද දුප්පත් අසරණ ජනතාවට පහසුවක් සලසා දීම පිණිස සිංහලයෙන් නඩු විසඳීම සඳහා පනතක් ගරු අධිකරණ ඇමතිතුමා මේ ගරු සභාවෙන් සම්මත කරවා ගත්තා. ඒ ගැන ගරු ඇමතිතුමාට මම ඉතා ප්‍රශංසා කරනවා. එහෙත් තවම ඒ නීතිය ක්‍රියාවට පරිවර්තනය වී නැහැ. නුදුරු අනාගතයේදී අඩු වශයෙන් ගම්බද පිටිසර උසාවිවල වත් සිංහලයෙන් නඩු ඇසීමට කටයුතු සැලසේය කියා අපි බලාපොරොත්තු වෙනවා. එසේ පිළිවෙළ යොදන සැටියට ගරු අධිකරණ ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. එපමණක් නොවෙයි, සෑම උසාවියකම සිංහලයෙන් නඩු විසඳීමට උපකාර කරන ලෙස නීතිඥවරුන්ට උපදෙස් දෙන ලෙසත් මම ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]

පූ. භා. 11.15

ගරු සභාපතිතුමනි, තවත් කරුණක් ගැන සඳහන් කළ යුතුයි. ඊයේ මාවනැල්ලේ ගරු මන්ත්‍රීතුමා (පී. ආර්. රත්නායක මයා.) මතු කළ ප්‍රශ්නයක් ගැනයි, ඒ කියන්නට තිබෙන්නේ. උසාවිවල ඉදිරිපත් වන නීතිඥවරුන්ට ඔවුන්ට කැමති ඇඳුමක් ඇඳගෙන උසාවියේ පෙනී සිටීමට අවසරයක් නැති තත්ත්වයක් තිබෙන බව දැන ගන්න ලැබුණා. යම් යම් ආයතන වලට සුදුසු විධියේ ඇඳුමක් පිළිගත යුතු බව මමත් පිළිගන්නවා. අපේ නොයෙකුත් ස්ථානවල ඒ විධියේ සම්ප්‍රදායක් අනුගමනය කරන නිසා උසාවියටත් යම් කිසි ඇඳුමක් තිබිය යුතු බව මා පිළිගන්නවා. ඊට සෑහෙන ඇඳුමක් ගැන තීරණයක් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. බලපත්‍රයක් ලබා ගැනීමට සිදු වූ සුළු ප්‍රමාද දෝෂයක් නිසා මේ ළඟදී දිනක මට කෑගල්ල උසාවිය ඉදිරියේ පෙනී සිටින්නට සිදු වුණා. ඒ අවස්ථාවේදී මා දුටුවා, ජාතික ඇඳුමෙන් සැරසී උසාවියේ පෙනී සිටි නීතිඥයෙක්. ඒ අන් කිසිවෙක් නොවෙයි, තිස්ස විජේරත්න නීතිඥ මහතායි. ඒ නීතිඥතුමා ජාතික ඇඳුමෙන් සැරසී උසාවියේ පෙනී සිටිනවා දැක්ක මට මහත් සතුටක් ඇති වුණා. එම නිසා ජාතික ඇඳුමෙන් සැරසී උසාවිය ඉදිරියේ නඩුවලට පෙනී සිටින්න කැමති උදවියට ඊට අවස්ථා සලසා දෙනමෙන් මා ගරු අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ-දෙවන මන්ත්‍රී)

(திரு. பெர்னாட் சொய்ஸா—கொழும்புத் தெற்கு இரண்டாம் அங்கத்தவர்)

(Mr. Bernard Soysa—Second Colombo South)

Mr. Chairman, the hon. Member for Mawanella (Mr. P. R. Ratnayake) has raised the question of the appointment of J.Ps. In that connection I would like to bring to the hon. Parliamentary Secretary's notice that the Colombo Municipal Council asked the Hon. Minister of Justice last year to make provision for appointing Members of the Council as Justices of the Peace. The original request was that they be made ex-officio justices of the peace. On that occasion the Hon. Minister, when he was interviewed by a delegation from the Council, told the delegation that he was in favour of the idea, but that the question of ex-officio justices of the peace required an amendment to the Municipal Councils Ordinance and that he would so recommend to the Hon. Minister of Local Government and Housing.

At that stage the idea seemed to have miscarried and no amendment to the Municipal Councils Ordinance has been tabled in this House to that effect. Apparently the idea is not viewed with any favour in that Ministry. Despite that fact, since the Hon. Minister of Justice was in favour of making Municipal Councillors Justices of the Peace I want to appeal to him on this occasion, despite the omission of the Ministry of Local Government and Housing to make Members of the Colombo Municipal Council Justices of the Peace.

I am not complaining that there is any partisanship in the matter of making a person a justice of the peace, but I would like to bring to the notice of the Hon. Minister of Justice that in the City of Colombo we have come across some rather surprising instances of persons who have been made justices of the peace; some of them are not even known to their neighbours, leave alone being known to the public of the area. Persons who have not had any kind of prominence in any worthwhile way in public life have been made justices of the peace.

This is not in any way a serious reflection upon all the Justices of Peace within the City of Colombo but only some recent creations. Not only this year, but last year and during the previous Caretaker Governments also we saw the phenomena of some rather strange instances of persons suddenly being elevated to this office.

Since that is the case, I do not see any reason why a Member of the Municipal Council should not be made a justice of the peace. There are a number of functions that he is called upon to perform which require the assistance of a Justice of the Peace in the City of Colombo.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

For instance, there is the simple business of attesting the signature on an affidavit relating to a rice ration book. I know that there are certain Justices of the Peace—I do not know whether it is on grounds of poverty or some other grounds—levy a charge of Re. 1 for the signature. It may be that in some cases the Justice of the Peace is himself a very poor man—I do not know. But then the person who goes to him with the affidavit is sometimes even poorer. So, it appears to be unfair that these Commissioners of Oath or Justices of the Peace should levy a charge of Re. 1 from persons who come to them for the purpose of attesting their signatures on affidavits relating to the loss of their rice ration books. I would, therefore, ask the Hon. Minister to make Municipal Councillors Justices of the Peace. I am quite sure that none of them will levy a rupee or even 50 cents for attesting a signature on an affidavit. If the Municipal Council's Ordinance cannot be amended just now, let the Hon. Minister at least create the existing Municipal Councillors Justices of the Peace.

There are two other matters. In regard to one of them, I raised the question the other day and asked the Hon. Leader of the House to bring it up before the Cabinet. That is the question of compensatory retirement benefit granted to those who retire on account of their inability to conform to the Government's decision on the language question. Now that this Head has come up, I would appeal to the Hon. Minister of Justice since he is the person who is implementing the Government's language policy, to use his good offices to increase the compensatory addition of five years to an officer's service for the purpose of computing his pension—to increase it in the case of those who retire as a result of the language policy. Let them be given something more generous.

One further matter I have to raise with the Hon. Minister is the question of the recent decisions given by the Privy Council. I do not want to say anything against our Judiciary. I have the greatest admiration for the high standards maintained by the Judicial Service in this country over a very long period. But I must certainly say that a certain disquietude has crept in the minds of people over the number of reversals of judgments given here that have occurred at the Privy Council level. This is not an attack on the Privy Council. But it is in some sense a justifiable disquietude. Because when we achieve the status of a Republic, we may have to sever our connections with the United Kingdom, in which case the Privy Council would cease to have authority over appeals from judgments given here. In that event, when persons who are aggrieved by judgments given here are to be denied the relief of an appeal to a court there—it may be a very justifiable step in the completion of a country's independence and so on—if that justice is denied, it is necessary to see that our judgments here have the highest authority and the highest validity. That is why there is a certain disquietude, because apparently the percentage or the number of reversals of judgments given here in cases that have gone in appeal to the Privy Council has increased over the past few years, and the tendency shows there is an increase rather than a decrease.

As I said before, I do not make any criticism of the Judiciary, but this is a state of affairs that needs to be looked into. It is a state of affairs that can be looked into best from the point of view of the Minister of Justice. I should like the Judicial Service Commission to take note of the remarks I have made in this matter, because it is out of greatest respect we have for our Judiciary and the necessity of maintaining a very high standard that I am making these remarks and not in any way as a reflection upon any judge or judges of our courts.

From that point of view, I would like the Hon. Minister to initiate an inquiry as to how this happened and see that some processes are set in motion in order that the disquietude that is creeping into the minds of the people in regard to judgments given here may be removed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

There are three matters I wish to raise. Firstly, will the hon. Parliamentary Secretary tell us what is the reason for this inordinate delay in introducing legislation to give effect to the promise in the last Throne Speech that the Government would take over the newspapers of the Associated Newspapers of Ceylon Limited, as well as the Times of Ceylon, Limited, and vest them in a public corporation ? You will recall, Mr. Chairman, that this promise was made categorically in the last Throne Speech.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

How does that come under this Minister ?

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

This is a function transferred to the Minister of Justice.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Newspapers ?

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

Yes. He is in charge of the legislation. In fact, I asked a specific question from the hon. Parliamentary Secretary at the end of the last Session and he himself gave the assurance that the Bill would be tabled before the end of the last Session. Then came the Queen's Speech this year with no mention of this matter. There was considerable criticism about it in this House and in the Senate. In the Senate the Hon. Prime Minister gave the assurance that a Bill would be introduced in this House. The Hon. Minister of Finance also gave the assurance that a Bill would be introduced. Indeed the Hon. Minister of Finance made reference precisely to the fact that these newspapers are living on borrowed time. It looks to me as if they have got a very long-term loan !

What is the delay ? Can the hon. Parliamentary Secretary give us the assurance that a Bill to implement that promise will be introduced in this Session of Parliament ? I am asking him that question.—[*Interruption*]—I am asking him now. I know that my hon. Friends are contemplating various Bills for the setting up of a so-called Press Council and things like that. Those are not the things that we want. We are asking you to implement that promise you made. In the first Throne Speech you said nothing about a Press Council. Nor did you say anything about this idea that was recently mentioned by the Hon. Minister of Finance—that of getting journalists to sign their names to every report and also give the names of their sources. I do not see the need for any of those things. There is a simple way of dealing with this question of the Press monopoly. I am against anything which is going to curtail the freedom of the Press. But the monopoly of the Press is one of the biggest obstacles to the freedom of the Press, and what we want is a breaking of the monopoly. Apart from that, the normal laws seem to be more than adequate to deal with that question, and I do not think that there should be this interference with the freedom of the Press, the freedom of comment and the freedom of reporting. I do ask that the promise to end the monopoly of the Press by the Associated Newspapers of Ceylon, Limited, and the Times of Ceylon, Limited, should be implemented.

I now come to my next point. You will be aware, Mr. Chairman, that a so-called Six-man Official Committee was set up some time ago to inquire into the working of the language laws, make recommendations about any hardship that non-Sinhala-speaking people may experience as a

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

result of these laws and also recommend what necessary adjustments may be made to help such persons get over such hardships. I understand that one or two Reports have been already given to the Hon. Minister, and I would like to know what the position is regarding this matter. Are those Reports going to be published, or is legislative action going to be taken on this matter? Will the hon. Parliamentary Secretary kindly give us an indication of what is likely to ensue as a result of the appointment of that Six-man Official Committee?

The last point concerns the Attorney-General's Department. I should like the hon. Parliamentary Secretary and his Minister to look into a rather curious matter. I have refrained all this time from making any comment on this, because the matter was *sub judice* and because the newspaper associated with the Communist Party is also involved. Now that the matter is no longer *sub judice*, I would like to refer to it. Recently the Attorney-General's Department sanctioned a prosecution of four newspapers: the "Tribune"; "මව්බිම," the Sinhala organ of the Communist Party; and two other newspapers. You know that, under the newspaper law, the name of the printer or publisher must be imprinted on the newspaper itself. All these newspapers had done that. But a certain person in the Attorney-General's Department resurrected a law passed in the 19th century which stated the Christian name of the person must be given. Now, in the case of your paper "Mowbima" the printer and publisher is a gentleman called Mr. D. B. Alwis and he had faithfully affixed the imprint that the paper had been printed and published by Mr. D. B. Alwis. He does not happen to be a Christian and does not have a Christian name. I made enquiries and found that the printers and publishers of these four papers do not happen to be Christian and do not have Christian names. According to this ancient colonial law, the printer and publisher must have a Christian name and for failing to have a Christian name these four papers have been charged.

ප. භා. 11.30

I should like, very briefly, to tell the House what happened. Plaints were filed and these people went to court ready to contest. On two occasions hearing was put off. On the last occasion they had engaged counsel, paid money and had come ready to contest when a representative of the Attorney-General's Department came into court and said: "we are withdrawing the action."

I want my hon. Friend to go into the matter and see why such an action was taken. I say this is the work of certain Catholic actionists in the Attorney-General's Department because everyone of these papers were for the schools takeover and protested against the attitude of those who were against it.

පාරිස් පෙරේරා මයා.
(திரு. பாரிஸ் பெரேரா)
(Mr. Paris Perera)

Christian?

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

My good Friend should know better about some of his co-religionists. This is an act of utter frivolity; putting people into endless expense and dragging them into court. Is that the kind of treatment one expects from the Attorney-General's Department? I am not accusing the Attorney-General. I do not think he had anything to do with it. Nor am I saying anything against the Crown Counsel the majority of whom are excellent persons. But I have reason to believe that this is something which has been politically motivated. Why was it necessary that this case should have been brought to court and then withdrawn? None of these four papers asked for a withdrawal of this case. They wanted the matter to be thrashed out in court. At this stage the Department concerned decided to drop the trial.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

It was a ludicrous, frivolous, prosecution on the basis of a 19th century law of the colonial regime. If my hon. Friend the Parliamentary Secretary does not know the position, he can bring this to the notice of the Hon. Minister. It would be interesting to know why this prosecution was launched and why it was withdrawn and also whether frivolous prosecutions should be allowed.

ඒ. රත්නායක මයා. (වත්තේගම)
(திரு. ஏ. ரத்னயக்க—வத்தேகம)
(Mr. A. Ratnayake Wattegama)

Government has failed to implement many of the promises made in the Throne Speeches over the last four or five years. With regard to this one important question, namely, the nationalization of the Press, the Associated Newspapers and the "Times", the moment you nationalize them you will have a government monopoly of the Press. The only other news pamphlets will be the Party papers in which are expressed the Party point of view. They are more in the nature of propaganda news-sheets and not newspapers. So that, I do appeal to the Hon. Minister of Justice to consider this matter if the Government is interested in preserving democracy and the freedom of the Press. Certainly, do everything possible to prevent a Press monopoly but nationalization is something different from that. There are various ways in which this has been tried out in other countries such as India and the U. K.

In Britain, for instance, a Press Commission was appointed and there is a very valuable report on the subject. If you stand for democracy you must not rush into doing this because democracy is dying in Ceylon and when you interfere with the freedom of the Press you will annihilate democracy altogether.

In regard to prosecutions carried out by the Income Tax Department, I want to read out an extract from an article appearing in the "Davasa".

ආදායම් නඩු පැවරීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පුදුම ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන බවත් අයබදු ගෙවන්නෝ කියති. කෙනකු ආදායම් බදු නොගෙවූ කල ඔහුට විරුද්ධව නඩු පවරන්නේ ඔහු පදිංචි ස්ථානයට ඉතාම ආසන්න මහෙස්ත්‍රාත් උසාවියේ යි. ආදායම් බදු විස්තර නොසපයන අයට විරුද්ධව කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් තුමා ඉදිරියේ නඩු පැවරීම දැන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළයි. දුරබැහැර පළාත්වල අයට මේ නිසා කරදරවලට හා නොවුවමනා වියදම්වලට මුහුණපාන්නට සිදු වන බවත් කියති.

Those who do not furnish the information are prosecuted in Colombo whether they be residents of Matara, Gampola or any other place. This should be put right by the Minister. There is one other matter that I want to mention. It is in regard to the appointment of J. P's. I shall be very happy if the Member of the area is also consulted with regard to these appointments. Yesterday, we were told that Members are freely consulted in various matters, even in regard to the appointment of sub-postmasters, although, I am sorry I have not been consulted. But certainly in regard to the appointment of J. P's. if Members are consulted they can be very helpful.

The other matter I want to raise with the hon. Parliamentary Secretary is the question of these Conciliation Boards. I am not aware as to whether they are functioning satisfactorily. I suppose this is due to the fact that the Act itself is faulty. I feel that the cumbersome procedure contemplated in the Act might not only delay but defeat the ends of justice.

In fact, litigation is a serious defect in our people. They are very fond of litigation. For the slightest thing they like to go to court and incur very heavy expenditure in lawyers fees, and so on. I remember even so early as in the 19th century it was Skinner who said that the impoverishment of the villager has been mainly due to litigation.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

Lawyers.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ. රත්නායක මයා.

(திரு. ஏ. ரத்நாயக்க)

(Mr. A. Ratnayake)

Lawyers and litigation. Therefore, I welcome this Conciliation Board Act but if you examine the provisions you will find that they are unsatisfactory. They must be put right.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.

(திரு. டீ. பீ. ஆர். குணவர்தன)

(Mr. D. P. R. Gunawardena)

ගරු සභාපතිතුමනි, අධිකරණ ඇමතිතුමාගේ වැය ශීර්ෂය ගැන වචන සවලප යක් කථා කිරීමට මාත් අදහස් කරනවා. විශේෂයෙන්ම මා කියන්නට බලාපොරොත්තු වන්නේ රාජ්‍යභාෂාව ක්‍රියාවේ නොයෙදවීම ගැනයි. නිසි පරිදි රාජ්‍යභාෂාව ක්‍රියාත්මක කරන බවට මෙම ආණ්ඩුව පසුගිය අවුරුද්දේදීත් මෙම අවුරුද්දේදීත් පොරොන්දු වුණා. මේ අවුරුද්දේ අයවැය ලේඛනය ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී ගරු මුදල් ඇමතිතුමා මිනිත්තු 5 ක් විතර සිංහල භාෂාවෙන් කථා කළ එක ඇත්තයි. එහෙත් එම කථාවේ ප්‍රධාන කොටස ඉංග්‍රීසි භාෂාවෙන් කළ බව කාටත් මතක ඇති. 1961-62 අයවැය කථාව ඉංග්‍රීසියෙන් මුද්‍රණය කොට බෙදා හැර තිබෙනවා. නමුත් සිංහලෙන් මුද්‍රණය කර බෙදා හැරි බවක් පෙනෙන්නට නැහැ. ඊටත් වඩා පුදුමය නම් සිංහලෙන් කථා කළ කොටසවත් බෙදා හරින ලද පිටපත්වලට එකතු වී නොතිබීමයි. නියම පිළිවෙළට සිංහලෙන් කටයුතු කරන්නේ කවදාදැයි මා මෙම ආණ්ඩුවෙන් ප්‍රශ්න කරන්න කැමතියි. හරියාකාර රාජ්‍යභාෂාව ක්‍රියාත්මක කරන්නේ කවදාද? අද වන තුරු නම් බැරි වුණා. මුදල් ඇමතිවරයාගේ කථාව සිංහලෙන් මුද්‍රණය කොට බෙදා හැරීමට ඉඩක් තිබුණේ නැද්ද? එසේ නම් ගරු මන්ත්‍රීවරුන්ට එයින් ප්‍රයෝජනයක් ලැබෙනවා නේද? අයවැය කථාව සිංලෙන් මුද්‍රණය කොට ගරු මන්ත්‍රීවරුන් අතර බෙදාහැර තුබුණා නම් ඉංග්‍රීසි භාෂාව ගැන වැඩි දැනුමක් නැති මන්ත්‍රීවරුන්ට අයවැය කථාවේ අඩංගු කරුණු ගැන අවබෝධයක් ඇති කර ගන්නට අවස්ථාව ලැබෙනවා නේද?

මේ ආණ්ඩුව පසුගිය අවුරුද්දේ ජූලි මාසයේදී මහජනයා රැවටුවා. රජයේ භාෂාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මහජනයා රැවටුවා. එදා පෙන්වූ උනන්දුව අද නැහැ. අයවැය ලේඛනයේ අඩංගු වන කරුණු වලටත් වඩා වැදගත් කරුණු රාශියක් අඩංගු වන, අයවැය ලේඛනය හා ආර්ථික විකාශය ගැන විස්තර දැක්වෙන පොතක් සිය කථාව කරගෙන යද්දී ගරු මුදල් ඇමතිතුමා විසින් මෙම සභාව ඉදිරිපිට තබන්නට යෙදුණා. නමුත් මෙය සිංහලෙන් අච්චු ගසා තිබෙනවා අද වනතුරුම නම් දැක්කේ නැහැ. රජයේ භාෂාවෙන් වැඩ කරන්නේ මෙහෙමද? මෙහි පැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ට මෙම ප්‍රශ්න ගැන අවබෝධයක් ලබා ගෙන නියම තීරණයකට එන්නට ආධාර කරන්නේ මෙහෙමද? ඇයි ඒ උදව්ව දෙන්න බැරි? ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනකුට කරුණු හරිහැටි අවබෝධ වුණොත් මේ විධියට සිග්නල් කණු වගේ නොසිටියයි බියක් තිබෙනවාද? ඇත්ත වශයෙන්ම කරුණු හරිහැටි අවබෝධ වුණොත් ඒ මන්ත්‍රීවරුන් මේ විධියට සිග්නල් කණු වගේ හැම එකකටම අත උස්සන එකක් නැහැ. එහෙත් කරුණු අවබෝධ කර ගැනීමට පහසුකම් සලසා නැති නිසා කරන්නට දෙයක් නැහැ. අගමැතිනිය ඇතුළු ඇමතිවරුන් කීප දෙනකු ගැලරියට පමණක් එන්නට අවසර ලබා ගෙන තිබෙනවා. ඒ අය පත්වී සිටින්නේ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයටයි. සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට පත්ව සිටින අගමැතිනිය අද වනතුරු සිංහලෙන් කථා කර තිබෙන්නේ එක දවසයි. අනෙක් සෑම අවස්ථාවේදීම ඉංග්‍රීසියෙන් කථා කර තිබෙනවා. ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් හා වෙනත් මාර්ගවලින් ප්‍රචාරය පමණක් ගෙන ගියාට මදි. යම් දෙයක් කියනවා නම් ඒ කියන දෙය කරන්නට ලෑස්ති වන ලෙස අගමැතිනියටත් මේ ඇමති මණ්ඩලයටත් මතක් කරන්න කැමතියි. සිංහල භාෂාව රජයේ භාෂාව හැටියට 1956 දී අප පිළිගත්තා. එමෙන්ම මේ අවුරුද්දේ මුල පටන් සිංහල භාෂා පණත නියම අන්දමට ක්‍රියාත්මක කිරීමට මේ ආණ්ඩුව පොරොන්දු වුණා. ද්‍රවිඩ ජනතාව හිරිහැරයක් කරදරයක් කරන්නය කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

මා කියන්නේ නැහැ. ඒ කොටස්වලටත් පහසුකම් සලස්වා රටේ වැඩ නියම ආකාරයෙන් කරගෙන යාමට පුළුවන් වන පිළිවෙළටයි එදා භාෂා පණත පාර්ලිමේන්තුව පිළිගත්තේ. ඒ පිළිගත් පණත අනුව වැඩ කරගෙන යන්නය කියන එකයි අපි කියන්නේ. අපි මේ කාරණා මෙහිදී සඳහන් කරන විට ගැලරියේ වාඩි වී අධිකරණ ඇමතිතුමා ඒවාට ඇහුම්කන් දී ගෙන සිටියාට වරදක් නැහැ. අපි කියන්නාවූ මේ කාරණා හොඳින් අවබෝධ කරගෙන නියම පිළිවෙලට වැඩ කටයුතු කරන්න ලැහැස්ති වුණොත් හොඳයි කියන එකයි අපි කියන්නේ.

අල්ලස් කොමිසම ගැනත් මම වචනයක් දෙකක් කියන්න කැමතියි. තල්ගොඩ පිටිය අල්ලස් කොමිෂන් සභාව මඟින් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදනකු වරදකරුවන්ය කියා නිගමනය කළ අවස්ථාවේදී ඒ අයව බේරා ගන්න නොයෙකුත් නීති ඉදිරිපත් කරමින් ආණ්ඩු පක්ෂයේ උදවිය වෑයම් දැරූ හැටි අපි දන්නවා. නමුත් එවැනි අදහස් අනුමත කරන එකම යෝජනාවක්වත් අපි පිළිගත්තේ නැහැ. මෙවැනි දූෂණ කොටස් බේරීම කෙසේ වෙතත් කවරදුවත් දේශපාලන භූමියට බසින්න බැරි වන පරිදි —හත් අවුරුදු කාල සීමාවකට පමණක් නොවෙයි, ජීවිතාන්තය දක්වා දේශපාලන භූමියට ඉදිරිපත් වන්නට බැරි වන පරිදි —නීති සම්පාදනය කළ යුතුයි. ඒ අයට පැනලා යන්නට පුළුවන් වන පරිදි නීති සම්පාදනය කිරීම නොවෙයි අප විසින් කළ යුතුව තිබෙන්නේ. ඒ නිසා මේ අන්දමට වැඩ කටයුතු කිරීමට මේ ආණ්ඩුව කල්පනා කරාවිය කියා අපි විශ්වාස කරනවා. නමින් පමණක් අල්ලස් කොමිෂන් සභාවක් තිබුණාට මදි. එසේම වෙල් විදානේ කෙනෙක් හෝ ගම්මුලාදනී කෙනෙක් හෝ අල්ලස් ගැනීමේ චෝදනාවට වරදකරුවෙක් කළාය කීමට අල්ලස් කොමිෂන් සභාවක් වුවමනා කරන්නේ නැහැ. ඒ මදි. ඊට වඩා ඉහළින් ඉන්න අයව අල්ලන්න ඕනෑ. ඒ පිළිවෙලට වැඩ කළොත් තමයි අල්ලස් කොමිෂන් සභාවකින් බලාපොරොත්තු වන යුතුකම ඉටු වන්නේ.

පූ. භා. 11.45

නීති කෙටුම්පත් කිරීම පිළිබඳවත් අපි අමුතුවෙන් මුදල් වැය කරන නිසා වචන ස්වල්පයක් දක්වන්නට ඕනෑ. පුස්කාපු පරණ නීති පොත් එකතුකොට සිංහලයට පෙරළුවාට මදි. The mere codification of laws and piecing them together will not do, that is not the kind of work that we want. We want the people to look at the problem as a whole, that is, take one particular subject and then write out the necessary legislation, the Bill or legislative enactment, on that particular subject. රාජ්‍ය භාෂාවෙන් මෙය කරන්න පුළුවන් තරම් දක්ෂ නීතිඥ මහතුන් අද මේ රටේ ඉන්නවාය කියා මා පිළිගන්නවා. එක් කාරණයක් එක් විෂයයක් පිළිබඳව අඩංගු විය යුතු නීති රාජ්‍ය භාෂාවෙන් සකස් කිරීමට වැඩ කටයුතු යොදවන්න ඕනෑ. වුවමනා නම් ඊට අවශ්‍ය යෝජනාවක් වුවත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කරවා ගෙන එය කරන්න පුළුවන්. "කෝඩිෆිකේෂන්" එක නමින් දැනට තිබෙන නීති ටික එකතු කරලා රාජ්‍ය භාෂාවය කියලා කාටවත් නොතේරෙන භාෂාවකින් අච්චු ගහලා තිබ්බට මදි බව මතක් කරන අතර, මේ කටයුතු ටික නියම ආකාරයට කෙරේවිය කියා විශ්වාස කරන බවත් මතක් කරන්න කැමතියි. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීන් මේ ගරු සභාවේදී කීවාවගේ, උසාවිවල වැඩ තවමත් සිංහලෙන් කරන්න පටන් ගත්තේ නෑ. 1937-38 කාලේ පටන්ම අප කියන්නෙ අඩු ගණනෙ පහළ උසාවිවලවත් කටයුතු ස්වභාෂාවෙන් කරන්න පටන් ගත යුතුය කියලයි. තවම පටන් අරන් නැහැ. නමුත් සියලුම උසාවිවල වැඩ රාජ්‍ය භාෂාවෙන් කරන්න නම් භාර අරන් තියෙනවා. ඒක නියම විධියට ක්‍රියාවේ යොදන්න නියම වැඩ පිළිවෙළක් අනුගමනය කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් උනන්දු වන මෙන් ගරු අධිකරණ ඇමතිතුමාටත් එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාටත් මේ ආණ්ඩුවටත් මතක් කරමින්, මීට වඩා සතුටුදායක අන්දමට ඒ වැඩ ටික කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයසූරිය මයා.

(திரு. ஜயசூரிய)

(Mr. Jayasuriya)

ගරු සභාපතිතුමනි, කාල වේලාව ඉක්ම යන නිසාත්, තවත් අමාත්‍යාංශ සම්බන්ධයෙන් මීටත් වඩා වැදගත් කරුණු ස්වල්පයක් සාකච්ඡා කරන්ට තිබෙන නිසාත්, වැඩි වේලාවක් ගත නොකර අධිකරණ අමාත්‍යාංශය යටතේ ඉතාමත් කෙටියෙන් වැඩි විස්තර නැතිව වචන දෙක තුනකින් මගේ අදහස් ටිකක් ප්‍රකාශ කරන්නයි මා බලාපොරොත්තු වන්නේ. ඊට අධිකරණ කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගේ සැලකිල්ල යොමු වෙනවා ඇතැයි මා විශ්වාස කරනවා. හෝමාගම සංචාරක උසාවියක් පිහිටුවන ලෙස මීට මාස තුන හතරකට පෙර මා අධිකරණ ඇමතිතුමාට ලියමනකින් දැනුම් දුන්නා. මා හෝමාගම පාර්ලිමේන්තු මන්ත්‍රී නිසා පමණක් නොව ඒ ස්ථානය සංචාරක උසාවියක් පිහිටුවීම සඳහා ඉතාමත් සුදුසු මධ්‍යස්ථානයක් හැටියට මට පෙනී ගිය නිසාත්, ඒ ඉල්ලීම ඉදිරිපත් කළා. ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ලේකම්තුමා කටයුතු කරනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා. ගොඩනැගිලි පහසුකම් අතිනුත්, ගමනාගමන පහසුකම් අතිනුත්, සංචාරක උසාවියක් ඇති කිරීමට හෝමාගම ඉතාමත් සුදුසු ස්ථානය හැටියට මට අවංක ලෙස කියන්න පුළුවනි.

පොලිසිය සම්බන්ධයෙන් කථා කරද්දී ගිය අවුරුද්දේ මා මේ ගරු සභාවට එක් කරුණක් මතක් කළා. මගේ පළාතේ ගම්බද ජනයාට අද දවසේ නඩුවක් සම්බන්ධයෙන් උසාවියකට යන්න සිදු වුණාම අඩු ගණනේ රුපියල් පහක්වත් වියදම් වෙනවා. දැන් පවතින තත්ත්වයේ හැටියට දුප්පත් මිනිසුන් රුපියල් පහක්වත් සොයා ගන්නෙ අමාරුවෙන්. ඒ තත්ත්වය එන්න එන්නම බැරුරුම් වෙනවා. නඩුවක් සඳහා උසාවිය ඉදිරියේ පෙනී සිටියාම බොහෝ විට පොලීසියෙන් කියනවා, නඩුවට තවම පොලීසිය ලෑස්ති නැත, වෙන දිනයකට කල් දමන්න ඕනෑය කියා. ඔය හේතුවෙන් පළමුවන, දෙවන, තුන්වන, හතරවන, වතාවටත් නඩු කල් යනවා. එයින් දුප්පත් අහිංසක ජනයාට ලොකු අමාරුවකට මුහුණ පාන්ට සිදු වෙනවා. මේ කාරණය පොලීසියටත් දැනුම් දී තිබෙනවා. නමුත් අද වන තුරුත් ඒ ප්‍රශ්නය විසඳීමට පොලීසියෙන් කිසිම දෙයක් කර තිබෙන බවක් නම් පෙනෙන්න නැහැ. ඒ නිසා මේ අවස්ථාවේ හැටියට ඒ කාරණය අධිකරණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාගේ සැලකිල්ලට භාජන කළොත් එතුමා ඇමතිතුමාගේ මාර්ගයෙන් පොලීසියටත් දන්වා යම්කිසි පහසුකමක් ලබා දෙනවා ඇත කියා මා කල්පනා කළා. දුප්පත් ජනයාට එවැනි සහනයක් ලබා දුන්නොත් බොහොම හොඳයි.

රාජ්‍ය භාෂාව ගැන ගරු මන්ත්‍රීන් කිප දෙනෙක් කථා කළා. මේ ආණ්ඩුවත් රජයේ සෑම දෙපාර්තමේන්තුවකම සෑම කටයුත්තක්ම රාජ්‍ය භාෂාවෙන්—සිංහල භාෂාවෙන්—කරන්න යනවාය යනුවෙන් ලොකු පොරොන්දුවක් ජනතාවට දුන්නා. එය විශාල දෙයක් හැටියටත්, වටිනා සේවයක් හැටියටත්, මේ ආණ්ඩුවෙන් කරන්න යන ප්‍රගතිශීලි දෙයක් හැටියටත්, ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් ලොකු අකුරින් ප්‍රකාශ කළා. එහෙත් එසේ කර මාස තුන හතරක් යන්න ඉස්සර සිංහල භාෂාවෙන් රාජ්‍ය කටයුතු කිරීමේදී ඇතිවන අමාරුකම් සම්බන්ධයෙන් සොයා බලන්න තමුන්නාන්සේලා කොමිෂන් සභාවක් නැත්නම් කාරක සභාවක් පත් කර තිබෙනවා. මොකක්ද මේකෙ තේරුම? අමාරුකම් සොයන්න තිබුණේ එවැනි ප්‍රතිපත්තියක් පිළිගන්න කලිනුයි. අමාරුකම් තිබෙනවාය කියා තමුන්නාන්සේලාට පෙනී ගියත් එවැනි නීති ඇති කරන්න වුවමනා නැහැ. ඒ මොකද? මේ රටේ කටයුතු සිංහල භාෂාවෙන් කරන්නයි දැන් තීරණය කරගෙන තිබෙන්නේ එසේ නම් මොකක්ද මේ කරන විහිළුව? මේක වංචාවක්; ජනයා මුළාකිරීමක් එසේ අමාරුකම් ඇති වෙනවා නම්, එවැනි අමාරුකම් ඇති වුණ විට ඒවාට පිළියම් කරන්න ඕනෑ. දැන් කරන්න යෑම ඊට පිළියමක් නොවෙයි. ඒවා කරන්න තිබුණේ රජයේ භාෂාව සිංහල කරන්න කලිනුයි. දැන් ද්‍රවිඩ මහත්වරුන් සමග එකතු වී කොමිෂන් සභා පත් කරන විට, අපට මේ ගැන බියක් ඇති වෙනවා. රාජ්‍ය භාෂාවෙන් නියම අන්දමට කවදාවත් කටයුතු කෙරෙන්නේ නැත කියා බියක් පහළ වෙනවා. දැන් කොමිෂන් සභාවකින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

ඇති වැඩක් නැහැ. සම්පූර්ණයෙන් රජයේ කටයුතු සිංහල භාෂාවෙන් කරනවාය කියා රජය භාරගෙන තිබෙනවා. එම නිසා දැන් ඒ ගැන ස්ථිර අදහසක් ඇති කරගෙන ඒ වැඩ කරගෙන යා යුතුයි.

ප්‍රවෘත්ති පත්‍ර සම්බන්ධව බලමු. තමුන්නාන්සේලා ගිය අවුරුද්දේ රාජාසන කථා වේදී කිව්වා—මේ අවුරුද්දේ රාජාසන කථාවේ නම් තිබුණේ නැහැ—ප්‍රවෘත්ති පත්‍ර සියල්ලක්ම රජය සතු කරනවාය කියා. ඒ ප්‍රකාශය කළ දා සිටම නියම සාධාරණ අන්දමකට ඒ පත්‍රවලින් කටයුතු සිද්ධ වන්නේ නැති බව මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමතියි. රජයට පක්ෂව, රජයේ අදහසක් පමණක් ඇතිව, රජයට බයක් පෙන්වමින්, කටයුතු කරන බවයි දැන් පෙනෙන්නේ. ඒ බව ලංකාවේ සෑම දෙනකුටම පේනවා. තමුන්නාන්සේලා අවංක ලෙස කල්පනා කර බැලුවොත්, තමුන්නාන්සේලාට පෙනී යනවා ඇති, අපේ පත්‍ර එක පැත්තක් අරගෙන, දේශපාලන වශයෙන් එක පැත්තක් අරගෙන, කටයුතු කරන බව. එය සතුටුදායක දෙයක් නොවෙයි: අසතුටුදායක දෙයක්. මේ විධියට මෙම පත්‍ර රජයට ගන්නය කියා සෑම අවස්ථාවකදීම කියන්නේ, අපේ කොමියුනිස්ට් පක්ෂයේ මහත්වරුයි. ඒ ගැන අවංක ලෙස කල්පනා කර බැලුවොත් තමුන්නාන්සේලාට පෙනී යාවි, එවැනි තත්ත්වයක් ඇති වීම හොඳ නැති බව. එපමණක් නොව, දැන් "මොනොපොලි" කියන එකත් නැහැ. දැන් අලුත් පත්‍රයක් ප්‍රසිද්ධ කර තිබෙනවා. අපට ලැබී තිබෙන ආරංචිවල හැටියට, රජයේ ආධාරත් ඒ "දවස" පත්‍රයට ලැබෙන බව දැනගන්න තිබෙනවා. ඒ නිසා මේ පත්‍ර දැන් රජයට ගැනීමට ඇති වුව මනාව මොකක්ද? නැවත වරක් එම නිසා මේ ගැන කල්පනා කර බැලුවොත් හොඳ බව මම ආණ්ඩුවට මතක් කරන්න කැමතියි. මේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක් හැටියට තමුන්නාන්සේලා පිළිගන්නවා නම්, එවැනි ප්‍රජාතන්ත්‍ර ක්‍රමයක්, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක්, මේ රටේ ඇති කිරීම තමුන්නාන්සේලාගේ අදහස නම්, පත්‍ර රජයට ගැනීමේ අදහස අත්හරින්නය කියා මම ඉතාමත් කරුණාවෙන් සහ ගෞරවයෙන් තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

සභාවේ කාලය මිට වඩා ගැනීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ. මා කලින් සඳහන් කළ පරිදි, හෝමාගමට සංචාරක උසාවියක් ඉතාමත් ඉක්මනින් ලබා දෙන හැටියට ඉල්ලා සිටිමින් මගේ කථාව අවසාන කරනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

රැස්වීම අ. භා. 2 වන තුරු තාවකාලිකව අත් සිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, අ. භා. 2 ට නැවත පවත්වන ලදි.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා. (බුලත්සිංහල)
(திரு. எட்மன் சமரக்கொடி—புளத்சிங்ஹள)
(Mr. Edmund Samarakkoddy—Bulathsinhala)

Mr. Chairman, I wish to raise just two matters under the Vote of this Ministry and I promise not to take more than five or seven minutes the most.

The first matter is one that I would just like to bring to the notice of the House, and after apprising the House of the situation I would leave it at that. This matter arises out of the position that the Government took yesterday with regard to the Rajaratna affair about which I do not want to go over the details again. The Government's position was that they were not going to give the House any reasons as to why they tendered certain advice to His Excellency the Governor-General. I do not want to argue that matter because we argued it yesterday. The position of the Government was that they were not going to tell the the House and the country the reasons for that advice. Thereafter the hon. the First Member for Colombo-South (Mr. J. R. Jayewardene) informed us of a speech made by the hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena). I myself looked up the speech. These are the remarks of the hon. Member

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

for Avissawella as found in column 7995 of the 'HANSARD of 22nd June, 1961:

"Did not the Hon. Minister of Justice tell me that he went through the record and found certain alterations in the record and that from his reading of the record he was in a position to recommend a pardon?"

That statement of the hon. Member for Avissawella was not contradicted by any Member of the Government. The Hon. Minister of Finance, who was in the House when he made that statement, was not in a position to contradict it either on that date or thereafter, and the Hon. Minister of Justice who would have been aware of this statement made by the hon. Member for Avissawella had not thought it fit to contradict it if that was wrong.

My point is this: if the Government has taken up the position that they do not think that it is in our interests or the interests of the country to give the reasons why the Hon. Minister has tendered certain advice to His Excellency the Governor-General, then I say he has to explain this position. An hon. Member of this House has made a responsible statement after an interview with the Hon. Minister of Justice. We have no reason to disbelieve the hon. Member and we have to take him at his word. If that is so, this is the position that has arisen: The Hon. Minister of Justice who has taken up the position that he is not going to reveal the reasons for his intervention in the Rajaratna case, has told the hon. Member for Avissawella that he has gone into the record of this case and he has found certain alterations in that record. Surely, this House is entitled to the confidence of the Hon. Minister of Justice? If, apart from the members of his Cabinet, he reveals certain matters to any member of the public or a Member of this House, this House has the right to demand the confidence of the Hon. Minister of Justice. The House has a right to expect that. I say the Hon. Minister of Justice is guilty of a very serious lapse in that he has disregarded the House, and it almost amounts to a contempt of the House. I do not want to say anything more than that on that matter.

The other matter I want to bring to the notice of this House is about the question of bribery. On this matter too I will not take more than a couple of minutes. Last year I brought this matter to the notice of hon. Members when we were discussing the question of the Bribery Report. I brought out the fact that this House and the Government are called upon to take certain steps arising out of the recommendations of the Bribery Commission. We were very happy that as a result of the protests, statements and speeches made by hon. Members of this House the Government was compelled to advise the two hon. Members of their Party concerned to resign their seats. That matter does not end there.

I brought to the notice of the House on an earlier occasion—other Members of the House also did so—that that Bribery Commission, known as the Thalgodapitiya Commission, was set up by the then Hon. Prime Minister under the Commissions of Inquiry Act. Unfortunately, under the provisions of that Act, no immediate penal consequences follow after the Commission issues its findings. The Commission has issued its findings. Now what are we to do?

If this Commission of Inquiry was appointed under Section 13 (3) (*k*) of the Constitution, then we would not have had any difficulty. Section 13 (3) (*k*), to remind hon. Members, reads:

"If during the preceding seven years he has been adjudged by a competent court or by a commission appointed with the approval of the Senate or House of Representatives or by a committee thereof to have accepted a bribe or gratification offered with a view to influencing his judgment as a Senator or as a Member of Parliament;"

Now, if the Commission was appointed in terms of Section 13 (3) (*k*), then automatically the Members

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එඩිමන්ඩ සමරක්කොඩි මයා.]

who were found guilty of bribery would be disqaulified. But in view of the present situation, this House is called upon to take further steps. We have precedents with regard to that matter.

In 1943, I reminded hon. Members of this House, after the L. M. D. de Silva Commission found certain Members of the State Council guilty, the State Council took further steps in introducing a Bill called the Expulsion of Members Bill, during the course of which some hon. Members resigned. As a result, they were thereafter disqualified according to the Constitution. Are we, or are we not, called upon to take the further step that has become necessary now ? If indeed we have decided to recognize the fact that two Members of the House were found guilty of bribery, and if indeed the Government Parliamentary Party in recognition of this fact decided to respect that decision of the tribunal and tendered the advice to those two hon. Members that it was inevitable under those circumstances to resign, then they have a duty cast upon them to take the further step, that is, to bring legislation to disqualify these two from seeking to enter Parliament hereafter.

The question of qualification and disqualification can be reviewed by the Select Committee that has been appointed. We know that hon. Members of this House have expressed their views with regard to the question of removing disqualifications arising out of certain convictions. Those are matters that can be gone into by the Select Committee. There, too, I think—if I may venture to give an opinion—we should draw a distinction between offences that involve moral turpitude and others. That is to say, if a court of law has found a person guilty of bribery or corruption, it is my humble opinion that we should not permit such a person to seek to enter a legislative assembly or a representative assembly. That distinction will have to be made.

My point is this : here are two people who have been found guilty. We have acted on the Report of the Bribery Commission, and these two are no longer here. But they are in a position to come back to this House. They can contest at the polls again and enter this House. We will be stultifying ourselves if we allow such a situation to develop as a result of inaction on the part of this House.

In all seriousness, I say this is not a party matter. At the recent by-elections the Government decided that they will not put forward as candidates the two Members who were found guilty. They did that deliberately. But are we waiting till the people forget those allegations ? Ours is a country where people have short memories, and it is possible that they will forget. There are some people who seem to think that if the electors want somebody, it is of no concern whether that person has been found guilty or not. I beg to differ. I do not think anybody found guilty of corruption should be encouraged to come forward. That will be to encourage corruption. Anybody found guilty of bribery and corruption should be debarred. A situation has arisen where the Government should introduce legislation to prevent these two persons, who have been found guilty of bribery, from entering this House. That is to say, a Bill should be brought to disqualify them. I earnestly ask the Government and the House to persist in this matter and to see that that legislation is passed.

Incidentally, I would like to ask the Government what it has done in regard to the Motion, which was passed, to compel hon. Members of this House, members of local bodies, Government servants, officers in corporations and even trade union officials to declare all their assets and liabilities. That Motion was passed and there was no difference of opinion in regard to it. What has happened to that Motion ? I say that bribery and corruption has not stopped. If at all, they have become worse. Once again we find that allegations are being made and the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

finger is being pointed at people in high places, even—I say it reluctantly —at hon. Members of Parliament. I do not say that those allegations are true, but once again we find a stream of allegations coming in.

Therefore, in order to protect ourselves and in the interests of the purity of public life, I say that this Government is in duty bound to introduce legislation to make it incumbent on people such as Members of Parliament, members of other local bodies, high officials of the corporations and the Government, officials of trade unions and members of their families, to declare their assets. If we do not do that, we will be called upon to explain our silence in the matter. This Government will have to explain why they have so far not implemented that valuable resolution. If we are interested in the purity of public life, let us take these steps. Otherwise, please do not talk about corruption hereafter.

අ. භා. 2.15

ලක්ෂ්මන් රාජපක්ෂ මයා.
(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)
(Mr. Lakshman Rajapaksa)

ගරු සභාපතිතුමනි, අධිකරණ අමාත්‍යාංශය සම්බන්ධයෙන් වචන සවලපයක් කථා කිරීමට මම අදහස් කළේ කරුණු දෙකක් පැහැදිලි කර ගැනීම පිණිසයි. මේ කාරණා ගැන වැඩි වේලා ගත කිරීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ. අධිකරණ අමාත්‍යාංශයේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගේ කථාවෙන් මේ කාරණාවලට පිළිතුරු ලැබේයයි කියා මම විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, නිස්සමහාරාම ඡන්ද කොට්ඨාශය දකුණු පළාතේ තිබෙන විශාල ඡන්ද කොට්ඨාශයක් බව තමුන්නාන්සේ දන්නවා ඇති. නමුත් මෙම පළාතේ අධිකරණ කටයුතු සඳහා ඇත්තේ නිස්ස මහාරාම සහ හම්බන්තොට සංචාරක මහෙස්ත්‍රාත් උසාවි දෙක පමණයි. මේ කාරණය සම්බන්ධයෙන් කාලයක් තිස්සේම මේ ගරු සභාවේදී—කාරකසභා අවස්ථාවලදීත්—මම මතක් කර සිටියා. හම්බන්තොට ස්ථිර වශයෙන් උසාවියක් පිහිටුවන ලෙස මෙයට පෙර සිටි අධිකරණ ඇමතිවරුන්ගෙනුත් මා කරුණු පැහැදිලි කර දෙමින් ඉල්ලා සිටියා. දිවංගත ගරු එම්. ඩබ්ලිව්. එච්. ද සිල්වා මහතා අධිකරණ ඇමතිතුමා වශයෙන් පත්ව සිටියදී, මෙම අදහස පිළිගෙන ඒ සඳහා විධිවිධාන යෙදූ බව මට හොඳින් මතකයි. එම නිසා මෙම ප්‍රමාදය කුමන කාරණයක් නිසාදැයි ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් දැන ගන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, ඊළඟට මම දැන ගන්න කැමතියි, සාමදාන විනිශ්චයකාරවරුන් පත් කරන්නේ මොන අන්දමකටද කියා. එක ඡන්ද කොට්ඨාශයක් වෙනුවෙන් කී දෙනෙකු පත් කරනවාද, ඒ විධියේ පත් කිරීමක් තිබෙනවාද, එසේ නැතිනම් මොන විධියේ ප්‍රතිපත්තියක් උඩ මේ අය පත් කරනවාද, කරුණා කර මේ ගැන කරුණු පැහැදිලි කර දෙනවා ඇතැයි ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මම බලාපොරොත්තු වෙනවා.

අවසාන වශයෙන් මා ඉදිරිපත් කළ මෙම ප්‍රශ්න දෙකට ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගේ කථාවෙන් පිළිතුරු ලබේයයි මම විශ්වාස කරනවා.

අනිල් මුණසිංහ මයා. (අගලවත්ත)
(திரு. அனில் முனசிங்ஹ—அகலவத்த)
(Mr. Anil Moonesinghe—Agalawatta)

ගරු සභාපතිතුමනි, ප්‍රමාද වී නමුත් අධිකරණ අමාත්‍යාංශය සම්බන්ධයෙන්, විශෙෂයෙන් උසාවිවල වැඩ කටයුතු සම්බන්ධයෙන්, වචන ස්වල්පයක් කථා කිරීමට මම අදහස් කරනවා.

සාමාන්‍යයෙන් අපේ උසාවිවල තවමත් පංති භේදය පවතිනවායයි හැඟෙන ආකාරයට කටයුතු කෙරෙන බව, නැතිනම් උසාවි එබඳු ස්වරූපයක් උසුලන බව අපට පෙනෙන්ට තිබෙනවා. උසාවියේ කටයුතු කරන කෙනෙකු හැටියට මට කියන්න පුළුවනි, සමහර විත්තිකරුවන් උසාවියට ගෙනාවාම ඒ විත්තිකරුවන්ට නොයෙක් නොයෙක් අවස්ථාවලදී අසභ්‍ය වචන පවා පාවිච්චි කරමින් බණින බව. අපේ රටේ මහජන ආණ්ඩුවක්, ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක්, පවතින කාලයකදී පවා උසාවියකට විත්තිකරුවකු පැමිණියාම "පලයන්, උඹ" යනාදී වචන පාවිච්චි කරමින් කථා කිරීමේ සිරිතක් පවතිනවා නම් එය ඇත්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනිල් මුණසිංහ මයා]

වශයෙන් කනගාටුවට කාරණයක්. හැබැයි කලිසම් ඇදගත් උසාවිය ආවාම ඒ විධියට කථා කරන්නේ නැහැ. මම හිතනවා, මෙය අපේ රටේ තිබෙන පංති භේදය අනුව භාවිතා වන දෙයක්ය කියා. එම නිසා මින් ඉදිරියටවත් ඒ ආකාරයෙන් කථා කරන්න එපාය කියා අධිකරණ ඇමතිතුමා ඒ අයට අවවාද කරන හැටියට මම ඉතා ආදරයෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට අපේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීන් විසිනුත් කළ ඉල්ලුමක් තමයි, අපේ උසාවිවලට පැමිණෙන නීතිඥ මහතුන්ට ජාතික ඇඳුම ඇඳගෙන එසේ පැමිණෙන්ට අවස්ථාව සලසා දෙන්නටය කියා. ඇත්තෙන්ම තවම ඊට ඉඩක් නැහැ. අපි දන්නවා ඔවුන්ට එසේ පෙනී සිටින්ට පුළුවන් වන්නේ ඒ ඒ උසාවිවල සිටින විනිශ්චයකාරවරුන්ගේ කැමැත්ත අනුව බව. සමහර විට නීතිඥ මහත්මයකු කබාය අඳින්නේ නැතිව කෝට් එක ඇඳන් ගියොත් ඔහු කියන දේ ඇහෙන්නේ නැතැයි නඩුකාරතුමා කියනවා. එතකොට අපට වන්නේ නැවත ගොස් කොහෙන් හෝ කබායක් ඇඳගෙන එන්ටයි. ඒ ගැනත් යම් කිසි තීරණයක් කොට රටේ සාමාන්‍ය ජනතාවගේ ඇඳුම ඇඳගෙන උසාවියේ පෙනී සිටින්ට නීතිඥ මහත්වරුන්ට අවස්ථාවක් දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

මේ රටේ ප්‍රවෘත්ති පත්‍ර පිළිබඳව ඊළඟට වචන ස්වල්පයක් කථා කළ යුතුයි. මේ ප්‍රශ්නය අද උදේ කාලයේදී මතු වුණා. පත්‍ර සමාගම්වලට තිබෙන බලය—ජනසම්මත විරෝධී බලය—කඩනවායයි මේ ආණ්ඩුව පළමුවන රාජාසන කථාවේදී පොරොන්දුවක් දුන්නා. මට මතකයි, ඒ පොරොන්දුව දෙන අවස්ථාවේදී නිදහස් චතුරශ්‍රය අසල රැස් වී සිටි විශාල ජනකායක් ප්‍රීති ඝෝෂා පැවැත්වූ හැටි. නමුත් අද වන තුරුත් ඒ පොරොන්දුව ක්‍රියාත්මක කර නැහැ. ආණ්ඩු පක්ෂයත් කැබිනට් මණ්ඩලයත් වෙනස් අදහස් මේ ගැන ප්‍රකාශ කර තිබෙන බව මම දන්නවා. එම නිසා මේ පත්‍ර සමාගම් ජනසතු කිරීමේ යෝජනාව ගැන අදහස් ටිකක් ප්‍රකාශ කරන්ට ඕනෑ.

මේ පත්‍ර සමාගම් ජනසතු කරනවා නම් බස් ව්‍යාපාරය ජනසතු කළාක් මෙන්, එසේ නැති නම් වරාය ජනසතු කළාක් මෙන්, ඒ ප්‍රතිපත්ති උඩ ජනසතු කරන වාට මාත් අපේ පක්ෂයත් සම්පූර්ණයෙන්ම විරුද්ධ වෙනවා. අපි කැමති නැහැ, ධනපති කබලෙන් ඒකාධිපති ලිපකට වැටෙන්ට. එහෙත් පත්‍ර සමාගම් ජනසතු කරන්ට යයි අප ඉල්ලන්නේ මේ හේතු නිසයි. අද ලංකාවේ ඇත්තේ පත්‍ර සමාගම් දෙකයි. ඊයේ පෙරේදා තවත් අළුත් පත්‍රයක් බිහිවී තිබෙනවා. නමුත් මේ පත්‍ර සමාගම් දෙක ක්‍රියා කරගෙන යන්නේ එක්සත් ජාතික පක්ෂයේ බලය තහවුරු කරන අන්දමටයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
ප්‍රචාරක අංශය.

අනිල් මුණසිංහ මයා.
(திரு. அனில் மூனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

බොහොම හරි; තමුන්නාන්සේලා ඒ ප්‍රචාරක අංශය තවමත් තියාගෙන ඉන්නෙ? [බාධාකිරීමක්] වත්තේගම ගරු මන්ත්‍රීතුමා (ඒ. රත්නායක මයා.) කථාකරමින් ජනසතු කිරීම ගැන එතුමා විරුඬය කියා එසේ නොකිරීම ගැන සතුට පළකළා. ඒ අතර එංගලන්තයේ පත්‍ර සමාගම් පිළිබඳව පත් කරන ලද කොමිෂන් සභාව පිළිබඳව අදහස් ප්‍රකාශ කොට, ඒ අදහස් අනුව අපි හැඩගැසෙන්ට ඕනෑය කිව්වා. ඊට මම සියයට සියයක්ම එකඟයි. මොකක්ද, එංගලන්තයේ පත්‍ර කොමිෂන් සභා වාර්තාවේ කියා තිබෙන්නේ? ප්‍රවෘත්ති පත්‍ර 13 කට අඩු ගණනක් මුද්‍රණය වෙනවා නම් දේශපාලනය අතින් එක අදහසක් පමණක් ඉදිරිපත් වන්ට පුළුවන්යයි ඒ වාර්තාවේ කියා තිබෙනවා. එහෙම නම්—ප්‍රවෘත්ති පත්‍ර 13 ක් තිබියදී තත්ත්වය එසේ වන්නේ නම්—ප්‍රවෘත්ති පත්‍ර දෙකක් ඇති විට කුමන තත්ත්වයක් ඇති වේදැයි කල්පනා කර බලන්න. දැනට මේ රටේ ඇති පත්‍ර සමාගම් දෙකේ පත්‍ර එක ආකාරයටමයි, ගෙන යන්නේ. එක පත්‍රයකට නුවුවමනා දේ අනෙක් පත්‍රය පළ කරන්නේ නැහැ. එලෙසම ඒ පත්‍රයට නුවුවමනා දේ අනෙක් පත්‍රයේ පළ කරන්නේ නැහැ. මම මේ ගැන හොඳින්ම දන්නවා. මේ පත්‍ර සමාගම් දෙකම එක පවුල් බලයකටයි අයත් වන්නේ. එක සමාගමක් එක පවුලකට අයිතියි. අනික ඒ පවුල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලය උඩ රඳා පවතින්නක්. ඒ වාගේම ඒ වායේ ප්‍රවෘත්ති තිබෙන්නේ ද එකම විධියටයි. ප්‍රවෘත්ති ගෙන්වීමේ මාර්ගයද එකමයි. මේ රටට එන ප්‍රවෘත්ති ඒ පත්‍ර දෙකට පමණක් සීමා වී තිබෙනවා. කොටින්ම ඒ පත්‍රවලින් අපට දෙන්නේ ඒ පත්‍රවලට වුව මනා දේ පමණයි. පත්‍ර සමාගම් ජනසතු කරන විට ඒ ජනසතු කිරීම එක් පක්ෂයකට හෝ එක් ආණ්ඩුවකට හෝ බලය පාවිච්චි කිරීමට පුළුවන් වන ආකාරයට සංවිධානය කිරීම නරක දෙයක් බව ප්‍රතිපත්තියක් හැටියට පිළිගන්නා ලෙස මා යෝජනා කරනවා. එසේ නොපිළිගන්නා අදහසක් තිබෙනවා නම් ඒ අදහසට මා සියයට සියයක්ම විරුද්ධයි. එක්සත් ජාතික පක්ෂයට තිබෙන පත්‍ර වෙනත් පක්ෂයකට යනවාට මා කැමති නැහැ. ඒ පත්‍ර එක්සත් ජාතික පක්ෂයට පවා සීමා වී තිබෙනවාට මා කැමති නැහැ. ඊටත් මා විරුද්ධයි. එම නිසා මේ පත්‍ර රාජසන්තක කරන අවස්ථාවේ අප කල්පනා කළ යුත්තේ ජනසම්මතවාදය ආරක්ෂා වන ආකාරයට ප්‍රවෘත්තිපත්‍ර සමාගම් සකස් කරන්නත් සංවිධානය කරන්නත් පුළුවන් කොයි විධියටද යන්න ගැන බව කියන්න කැමතියි.

"ටයිම්ස් ඔප් සිලෝන්" පත්‍ර සමාගම ගැන බලමු. ඒ සමාගම ආණ්ඩුවෙන් පත් කරනු ලබන සංයුක්ත මණ්ඩලයකට භාර දෙනවාය කියා හිතමු. එසේ භාර දී ඒ පත්‍ර සමාගමේ කොටස් ග්‍රාම සංවර්ධන සමිති, විවිධ සේවා සමුපකාර සමිති, වෘත්තීය සමිති සහ සමාගම් පණත යටතේ ලියා පදිංචි කරන ලද වෙනත් සමාගම්වලට ලබා ගැනීමට සීමා සහිත කාලයක් ඉඩ දෙනවා. එසේ කළාම ඒ ඒ සමාගම්වලින් ඒ ඒ ශාඛා සමිතිවලින් මේ පත්‍ර සමාගමේ කොටස් ගන්නවා ඇති. ඉන් පසු ඒ පත්‍රවල පාලක මණ්ඩලය එම කොටස්කරුවන් ගෙන් සමන්විත වෙනවා ඇති. ඒ අන්දමට එක් පත්‍රයක්වත් සංවිධාන කළොත් කවදාවත් එහි බලය එක් පක්ෂයකට යන්නෙ නැහැ. මේ රටේ දහස් ගණන් මහජන සංවිධාන තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. මා සඳහන් කළ ආකාරයට කොටස් බොඳී ගියොත් කවදාවත් එක් පක්ෂයකට මේ පත්‍රය සම්බන්ධ බලය සීමා කරන්න බැරිය කියා මා හිතනවා. ධනපති පංක්තියේ අයට වුවත් ඒ බලය සල්ලිවලට ගන්න බැහැ. මෙහි පරමාර්ථය විය යුත්තේ පුළුවන් තරම් පළල් විධියට මෙහි කොටස් මහජනයා අතරේ බෙදීමයි. කොහොමද ඒක කරන්න පුළුවන් වන්නෙ? පුද්ගලයන්ට දුන්නොත් ඒ පුද්ගලයන්ගෙන් තවත් පුද්ගලයන්ට ඒ අයිතිය යන්න ඉඩ තිබෙනවා. එහෙත් සමාගම්වලට දුන්නාම ඒ සමාගම්වල නියෝජිතයින්ටයි ඉන්දැ බලය ලැබෙන්නෙ. අන්න ඒ ආකාරයටයි පත්‍රවල අයිතිවාසිකම තිබිය යුත්තෙ. ඒ විධියට සංවිධානය කළොත් ජනසම්මතවාදයට ඉඩ ලැබෙන පරිදි පත්‍ර සමාගම පවත්වාගෙන යන්න පුළුවන්වේවි. සමහර විට මේ රටේ ඉන්න ප්‍රසිද්ධ කතීෘවරුන්, ප්‍රසිද්ධ ලේඛකයන් වුවත් ඒ පත්‍ර සමාගම්වල පාලක මණ්ඩලයට ඇතුළු කරන්න පුළුවනි. ඒ පාලක මණ්ඩලය සකස් විය යුත්තේ මොන විධියටද කියා පැහැදිලි ලෙස ප්‍රකාශ කිරීමයි කළ යුතුව තිබෙන්නෙ. ඉන් පසුව පත්‍රයේ වැඩ කරන කතීෘවරුන්ට අනෙකුත් සියලු දෙනාටත් යම්කිසි ඉඩක් දෙන්න පුළුවනි. ඒ විධියට පත්‍රය ගෙන යන්න වුවමනා නම් එහි පාලක මණ්ඩලයට කෙනකු පත් කරන්න පුළුවනි. අන්න ඒ ආකාරයට සංවිධාන කළොත් සාර්ථක ලෙස පත්‍රය පවත්වාගෙන යන්න පුළුවන් වෙනවාට සැකයක් නැහැ.

මෙවැනි වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වුවමනා නම් ඕනෑ තරම් සාධක පෙන්නුම් කරන්න අපට පුළුවනි. ඇමෙරිකාවේ පවා මෙවැනි වැදගත් අදහස් ක්‍රියාත්මක කළ තැන් තිබෙනවා. ඇමෙරිකාව ධනපති රටක්, ලෝකයේ ප්‍රධාන පංක්තියේ අධිරාජ්‍යවාදී රටක්. නමුත් එවැනි රටක පවා මෙවැනි අදහස් ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් අපට පුළුවන් බවට කිසිම සැකයක් නැහැ. බේරේ ගෙදර "ඩේලි නිවුස්" පත්‍රයේ කොටසුත් අපට පුළුවනි මහජනයා අතරේ බෙදා දෙන්න. එක් කෙනකුට ගන්න පුළුවන් ප්‍රමාණය මෙතෙක්ය, ඊට වඩා ගන්නට බැරිය යනාදි වශයෙන් සීමා කරන්න පුළුවනි. එහෙම කළොත් මහජනයාට ප්‍රයෝජනයක් ලැබෙන ආකාරයට වැඩ කරාවි කියා හිතන්න පුළුවනි. ඒ අනුව අධිකරණ ඇමතිතුමා වැඩ පිළිවෙලක් යොදනවා ඇත කියා මා බලාපොරොත්තු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනිල් මුණසිංහ මයා.]

කෙසේ වෙතත් මේ පත්‍ර සමාගම් රාජසන්තක කර එක් පක්ෂයකට හෝ එක් ආණ්ඩුවකට හෝ බලය පාවිච්චි කරන්න පුළුවන් වන ආකාරයට සංවිධානය වෙන වාට මා සම්පූර්ණයෙන්ම විරුද්ධයි. අපට ලැබෙන ආරංචි අනුව මේ පත්‍ර සමාගම් රාජසන්තක කරන්න නොව වෙනත් දෙයක් කරන්න අලුත් පනතක් සකස් කර තිබෙනවාලු. පත්‍ර සමාගම් රජයට අර ගෙන කොටස් බෙදා දීමෙන් පමණක් වෙනසක් වෙන එකක් නැහැ. එසේ කිරීමෙන් පමණක් අප බලාපොරොත්තු වන කර්තව්‍යය ඉටු වන්නේ නැහැ. එම නිසා මේ ප්‍රශ්නය ගැන හොඳින් කල්පනා කර බලා මහජනතාවට ප්‍රයෝජනවත් වන ආකාරයට කටයුතු කරන හැටියට මා ඉල්ලා සිටිනවා. එක්සත් ජාතික පක්ෂයට අවස්ථාව ලබාගන්න ඉඩ නොදී සමාජවාදී ගමන යාමට හැකි වන ආකාරයට පත්‍ර නීතිය සකස් කරන හැටියට අවසාන වශයෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 2.30

ඩී. පී. ආර්. වීරසේකර මයා. (රත්න පුරය)

(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—இரத்தினபுரி)

(Mr. D. P. R. Weerasekera—Ratnapura)

ප්‍රවෘත්ති පත්‍ර පිළිබඳව වචන ස්වල්පයක් කථාකරන්ට මා බලාපොරොත්තු වෙනවා. මා එසේ කථා කරන්න අදහස් කරන්නේ පත්‍ර සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් දරන අදහස් ගැන අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (අනිල් මුණසිංහ මයා.) කරුණු වගයක් ප්‍රකාශ කරන්න යෙදුණු නිසයි. ඊයේ මා පාර්ලිමේන්තුවට මගේම නමින් පුද්ගලික යෝජනාවක් ඉදිරිපත් කළා මේ පත්‍ර සම්බන්ධව. එම යෝජනාවෙන් මා කියා සිටින්නේ රාජාසන කථාවෙන් කරන ලද ප්‍රකාශයට අනුව ප්‍රවෘත්ති පත්‍ර රජයට ගෙන ක්‍රියා කරන්නය කියායි. මහජනයා රවටාගෙන, අධිරාජ්‍යවාදීන්ට කත් අදින පත්‍ර සමාගම් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රචාරක අංශයක් බවට පත් වී තිබෙන බව අප දන්නවා. අප මුලදී මේ පත්‍ර සමාගම් රජයට ගැනීම පිළිබඳව යම්කිසි පොරොන්දුවක් මහජනයාට දුන්නා නම් එම පොරොන්දුව මහජනයා විසින්ද පිළිගත්තා නම්, අප දැන් ඒ අනුව ක්‍රියා කරන්න ඕනෑ. එහෙම නැතිනම් බොරු නොකියා නිකම් ඉන්න ඕනෑ. මුලදී මහජනයාට පොරොන්දු වුණු ආකාරයට පත්‍ර සමාගම් පිළිබඳව ක්‍රියා කළේ නැති නම් ඒ හේතුව නිසා මටද රජයට දොස් කියන්න සිදු වන බව——

අනිල් මුණසිංහ මයා.

(திரு. அனில் முனசிங்ஹ)

(Mr. Anil Moonesinghe)

දොස් කිවාට මදි. ඉල්ලා අස්වන්න ඕනෑ.

ඩී. පී. ආර්. වීරසේකර මයා.

(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)

(Mr. D. P. R. Weerasekera)

ඒ හරිය මම බලාගන්නම්. මා කථා කරන්නේ රජයේ ප්‍රතිපත්තියට විරුද්ධව නොවෙයි. පත්‍ර සම්බන්ධයෙන් ක්‍රියා කරනවාය කී ආකාරයට කටයුතු නොකළොත්—

සභාපතිතුමා

(அக்கிராசனர்)

(The Chairman)

කරුණා කර නිශ්ශබ්ද වන්න. දැන් ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන් නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

ඩී. පී. ආර්. වීරසේකර මයා.

(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)

(Mr. D. P. R. Weerasekera)

ගරු සභාපතිතුමනි, පත්‍ර මාර්ගයෙන් කෙරෙන නොයෙකුත් අපරාධකාරී ක්‍රියා සම්බන්ධයෙන් කරුණු කීපයක් ප්‍රකාශ කරන්න කැමතියි. මගේ කොට්ඨාශයේ ගම්සභා මැතිවරණ දෙකක් තිබුණා. එම මැතිවරණ දෙකෙන් එකකදී මගේ පක්ෂයත් සමසමාජ පක්ෂයත් අතර යම්කිසි හැප්පීමක් ඇති වුණා. එසේ හැප්පුණු නිසා එම ගම්සභා මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආසන 12 කුත්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එක්සත් ජාතික පක්ෂයට ආසන 9 කුත්, සම සමාජ පක්ෂයට ආසන 4 කුත්, කොමියුනිස්ට් පක්ෂයට ආසන 2 කුත් ලැබුණා. නමුත් පත්‍රයේ පළ වුණු ආරංචිය සත්‍ය ආරංචියක් නොවෙයි. පත්‍රයේ තිබුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආසන 7 ක් ලැබුණු බවයි. දිනුම් ලත් අපේ අනිකුත් අපේක්ෂකයන් ස්වාධීන අය හැටියටයි පත්‍රකාරයන් විසින් නම් කර තිබුණේ. එසේම සමසමාජ පක්ෂයට විරුද්ධව මා නොයෙකුත් විධියේ චෝදනා කළ බවත්, පත්‍රවල පළ වී තිබුණා. එසේ සිදු වුණේ කුමන හේතුවක් නිසාද කියා මා කියන්න කැමතියි. එම තරඟය සඳහා එක්සත් ජාතික පක්ෂයෙන් ඉදිරිපත් වී සිටියා අමුපිටිය නමැති මහත්මයෙක්. ඒ මහත්මයාගේ ඇපත් නැති වුණා. කුරුවිට ප්‍රදේශයේ 'දිනමිණ' වාර්තාකරු වශයෙන් සේවය කළේ ද ඒ මහත්මයායි. එම ප්‍රකාශය ගැන මා පත්‍රයෙන් විමසූ විට පත්‍රය කීවේ එම ප්‍රකාශය එවා තිබෙන්නේ කුරුවිට වාර්තාකරු නොවන බවයි. එම බොරු ප්‍රකාශය කරන ලද්දේ රත්නපුර වාර්තාකරුය කියායි පත්‍රකාරයන් කීවේ. මා ලඟ රත්නපුරේ වාර්තාකරුගේ ලිපියක් තිබෙනවා. එහි සඳහන් වෙනවා ඔහු එවැනි දෙයක් කීවේ නැත කියා. අනතුරුව සභාපති තේරීමේදීත් අපට ජයග්‍රහණය අයිති වුණා. සමසමාජ පක්ෂයේ සභික යන් 4 දෙනාත් සමග අපට 18 දෙනෙක්ද එක්සත් ජාතික පක්ෂයට 9 දෙනෙක්ද ඡන්දය දුන්නා. අනික් ගම්සභා ඡන්ද විමසීමේදී අපට ආසන 11 ක්ද එක්සත් ජාතික පක්ෂයට ආසන 2 ක්ද හිමි වුණා. එහිදීද පත්‍රකාරයන් ප්‍රචාරය කළේ එක්සත් ජාතික පක්ෂයට වැඩි බලයක් ලැබුණාය කියයි.

සංචාරක දෙපාර්තමේන්තුව ගැන තමුන්නාන්සේ දන්නවා. ඒ දෙපාර්තමේන්තුවට විරුද්ධව මා නොයෙකුත් විධියේ පැමිණිලි මෙම ගරු සභාවේදී කර තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් මට චෝදනා කළා. මෙවැනි චෝදනා මන්ත්‍රණ සභාව තුළදී කරනවා මිසක් එළියට ඇවිත් කරන්නේ නැත කියා. එහෙත් ගරු සභාපතිතුමනි, මා මේවාට පිළිතුරු පත්‍රවලට යැවීවත් ඒවා කවදාවත් ප්‍රසිද්ධ කරන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ රැස්වීමක් තිබී බොත්, බෙහෙත් තෙල් විකුණන කෙනකු කුලියට ගෙන්වා කථා කෙරෙව්වත්, බොහොම ලොකුවට, පිටු බාගයක් පමණ ලොකුවට, පත්‍රයේ පළ කරනවා. ආණ්ඩුවට පක්ෂව ඇත්තක් කිව්වත්, මොන විධියේ ප්‍රකාශයක් කළත්, එය පත්‍රයේ පළ කරන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට මම කියා සිටිනවා, අප පොරොන්දු වූ අන්දමට පත්‍ර ජනසතු කළ යුතු බව. එක මන්ත්‍රීවරයකු කී පිළිලෙළට අපි ඒකාධිපති බලයක් පාවිච්චි කරන්නේ නැහැ. මහජනයාට ප්‍රයෝජනවත් වන අන්දමට නියම ඇත්ත ප්‍රකාශ වන අන්දමට මේ පත්‍ර පරිවර්තනය කළ යුතු බව තරයේම ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

කේ. අබ්දුල් ජබ්බාර් මයා. (ගලගෙදර)
(ஜனாப் கே. அப்துல் ஜபார்—கலகெதர)
(Mr. K. Abdul Jabbar—Galagedara)

ගරු සභාපතිතුමනි, අධිකරණ අමාත්‍යාංශය ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී මාද, ගලගෙදර ආසනය වෙනුවෙන් වචන සවලපයක් ප්‍රකාශ කරන්න කැමතියි. ගලගෙදර ආසනයේ එක කොනක සිට කෙනකුට මහනුවර උසාවියට යන්නට සිදු වුනොත් හැතැප්ම 25ක් පමණ දුර යන්නට වෙනවා. දුප්පත් කෙනකුට හෙට උදේ නඩුවකට පෙනී සිටින්නට තිබෙනවා නම් ඔහු අද සවස ගමන ආරම්භ කළ යුතු බව මම මේ ගරු සභාවට මතක් කරන්න කැමතියි. ඒ ගලගෙදර ආසනයේ දුප්පත් ජනතාවට අනුකම්පා කර දැනට එහි තිබෙන ගම්සභා උසාවියේ සතියකට දවස් දෙකක් නැත්නම් අඩු ගණනේ දවසක් වත් මහේස්ත්‍රාත් උසාවියක් ඇති කරන ලෙස මම ගරු අධිකරණ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. හැතැප්ම 3, 4ක් පයින් ඇවිත් මහපාරට ළඟා වී නියම වේලාවට බස් රථයක් අල්ලා ගන්නට බැරි වුනොත් ඒ දුප්පත් ජනතාවට රුපියල් 25ක් 30ක් වියදම් කර උසාවියේ පෙනී සිටීම සඳහා මහනුවරට යෑමට සිදු වී තිබෙන බව මම මේ සභාවට මතක් කරන්න කැමතියි. මා මේ ගැන රඹුක්කන සිටින අපේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට අමුතුවෙන් මතක් කරන්න වුවමනාවක් නැහැ. මහනුවර දිස්ත්‍රික්කයේ නඩුවක් ඇති වුනොත් ගලගෙදර ජනතාවට මහනුවරට යන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබ්දුල් ජබාර් මයා.]

සිදු වී තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. එම නිසා සතියකට දවසක් හෝ දෙකක්වත් ඒ ගලගෙදර ආසනයේ මහේස්ත්‍රාත් උසාවියක් පවත්වන ලෙස ඉතා බැගෑපත්ව ඉල්ලමින් මගේ කථාව අවසාන කරනවා.

ටී. විලියම් ප්‍රනාන්දු මයා. (නුවරඑළිය)
(திரு. ரி. வில்லியம் பெர்ணாண்டோ—நுவரெலிய)
(Mr. T. William Fernando—Nuwara Eliya)

ගරු සභාපතිතුමනි, සිංහල භාෂාව පමණක් දන්නා මා මේ අවසථාවේදී රාජ්‍ය භාෂාව ගැන වචන සවලපයක් කථා නොකොලොත් එය මදිකමක් බව මට හැඟෙනවා. මා විටින් විට කථා කරමින් සිංහල භාෂාවෙන් මේ සථානයේ සෑම කටයුත්තක්ම කිරීමට අවසථාව සලසා දෙන ලෙස ඉල්ලා සිටියා. සෑම පණතක්ම මේ වනතුරුත් අපට ඉදිරිපත් කරන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණයි. සිංහල භාෂාව පමණක් දන්නා ගරු මන්ත්‍රීවරු කීප දෙනෙක් මේ ගරු සභාවේ ඉන්නවා. ඒ මන්ත්‍රීවරුන් ඉතා අමාරුවෙන් මේ පණත් පිළිබඳ විවාදවලට සහභාගි වන්නේ, අර පැත්තෙන් මේ පැත්තෙන් කෙරෙන කථා වලින් යම් යම් අදහස් උපුටා ගෙනයි. එසේ නැතිව නියම අන්දමින් පණතක් තේරුම් ගෙන එය විග්‍රහ කර විවාදයකට සහභාගි වන්නට ඔවුන්ට ලැබෙන්නේ නැහැ. එසේ වීම, සිංහල භාෂාව පමණක් දන්නා කෙනකු මහජන නියෝජිතයකු වශයෙන් මේ උත්තරීතර මන්ත්‍රණ සභාවට පත් වී පැමිණි විට තමා දන්නා සිංහල භාෂාවෙන් මහජනතාවගේ අයිතිවාසිකම් සඳහා කථා කිරීමට ඉඩක් නැති වීම, මේ ගරු සභාවට කරන මහත් මදිකමක් හැටියට සලකන්නට පුළුවන්. එම නිසා සිංහල භාෂාවෙන් මේ සථානයේ සියලුම වැඩකර ගෙන යෑමට ඉක්මනින්ම අවකාශ ලබා දෙන ලෙස මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, නීතිඥවරුන්ට ජාතික ඇඳුමින් උසාවිවල පෙනී සිටීමට ඉඩ ලබා දිය යුතු බව මමත් ප්‍රකාශ කරන්න කැමතියි. ඒ සම්බන්ධයෙන් අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාත් (අණිල් මුණසිංහ මයා.) මේ පැත්තේ සහෝදර ගරු මන්ත්‍රීවරයකුත් කී දේ මම අනුමත කරනවා. දැන් කාන්තාවන් බොහෝ දෙනෙක් නීතිඥ වෘත්තියෙහි යෙදෙමින් උසාවිවල පෙනී සිටිනවා. සාරියෙන් සැරසී නීතිඥ මණ්ඩලයේ පෙනී සිටින කාන්තාවක් නුවර එළිය උසාවියෙත් සිටින බව මා ආඩම්බරයෙන් මතක් කරන්න කැමතියි. අපේ රටේ අගමැතිවරිය වශයෙන් කාන්තාවක් සිටින මේ යුගයේදී, මහත් ප්‍රබෝධයකින් යුතුව කාන්තාවන් මහජන කටයුතුවලට ඉදිරියට ඇදී එන මේ අවස්ථාවේදී, තමන්ගේ ජාතික ඇඳුම වූ සාරියෙන් සැරසී සේවයට එන නීතිඥවරියන්ගේ ඇඳුම අශෝභන වන සේ කළු කබායක් දමා ඒ ජාතික ඇඳුම විනාශ කරන්නට ඉඩ නොදී ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම තමන්ගේ ජාතික ඇඳුමෙන් සැරසී නීතිඥ වෘත්තියෙහි යෙදෙන්නට අවකාශ ලබා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

මේ ගරු සභාවේ දෙපැත්තේම ගරු මන්ත්‍රීවරු කීපදෙනෙක්ම ප්‍රවෘත්ති පත්‍ර ගැන කථා කළා. ගොබල්ස්ගේ ප්‍රචාරය මෙන් ලංකාවේ ප්‍රවෘත්ති පත්‍ර රට අවුල් කරනවා. බඩු මිල වැඩි කළාය කියා හෝ වෙනත් විධියේ අසත්‍ය ප්‍රවෘත්ති හෝ පුවත්පත්වල පළ කරනවා. එම නිසා කලින් පොරොන්දු වූ පරිදි මේ වර්ෂයේ වත් ප්‍රවෘත්ති පත්‍ර අත් කර ගෙන පත්‍ර රජයට ගන්නවාය කීමේ සත්‍යය සථිර වශයෙන් පෙන්වා දෙන්නට ඕනෑ. ඒවා රජයට අත් කර ගැනීමට හැකිතාක් ඉක්මනින් කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

තවත් වැදගත් කාරණයක් ගැනත් මතක් කරන්නට තිබෙනවා. පසුගිය කාලයේදී මේ උත්තරීතර සභාවට පත්ව මහජන නියෝජිතයින් වශයෙන් ඉතා ගෞරවයෙන් මේ ගරු සභාවේ කටයුතු කළ මන්ත්‍රීවරුන්ට සමාදන විනිශ්චයකාර පදවි ලැබී තිබුණා. යම්කිසි විධියකින් එවැනි අයට අද ආසන අහිමි වී තිබුණත්, මේ සථානයේ සිට ජාතිය වෙනුවෙන් යම්කිසි සේවයක් කර තිබෙන එවැනි පුද්ගලයින්ට ඒ කලින් තිබුණු තනතුර දිගටම පවත්වා ගෙන යෑමට අවසර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. මන්ත්‍රීවරුන්ට පමණක් නොව, අවංකව රටට සේවයක් කළ ගම්සභාපති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වරුන් ඒ තනතුරින් ඈත් වූවත්—ඔවුන්ගේ දේශපාලන ප්‍රතිපත්ති උඩ මහජනතාව විසින් ඔවුන් ඈත් කර දැමුවත් ඒ අය අතර අවංක දේශප්‍රේමීන් සිටින්නට පුළුවනි—එවැනි අයට කලින් තිබුණු පරිදි සමාදාන විනිශ්චයකාර ධුර හිමි කර දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

අල්ලස්වලින් රට දූෂණය වී තිබෙන බවට රටේ නොයෙක් රාවයන් ඇති වී තිබෙනවා. එම නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේත්, සියළුම සංයුක්ත මණ්ඩල සහ සමුපකාර ආදී සෑම ආයතනයකම සිටින සියළුම සේවකයින්ගේත් වත්කම් හෙළි කිරීමටත් ඒ අනුව ඔවුන්ගේ අඹු දරුවන්ගේ පවා වත්කම් හෙළි කිරීමටත් නිගමනයක් කරන්නට ඕනෑ. එසේ නැත්නම් ඒ සේවා කාලයේදී නොයෙක් දූෂණ සිදු වන්නට පුළුවනි. එවැනි නීතියක් පනවා වත්කම් හෙළි කරවා සමාජයට සේවය කරන අය නියම පිරිසිදු තත්ත්වයක තබා ගන්නට ඕනෑ. ඒ ගැන සැලකිල්ල යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

තවත් වැදගත් කරුණක් ගැන මතක් කරන්නට තිබෙනවා. රටේ විශාල පරිවර්තනයක් ඇතිවී ගෙන යන මේ අවස්ථාවේදී අප විසින් කල්පනා කළ යුතුව තිබෙනවා, දක්ෂතාවයක් ඇති කාර්ය ශූර පැසුණු බුද්ධිමත් පිරිසක් වයස අවුරුදු 55 ඉක්ම වූවන් අතර සිටින බව. සමහර විට ඔවුන්ගේ සේවය අපට අවශ්‍ය වන්නට ඉඩ තිබෙන නිසා වයස 55 පසු කර තිබෙන එවැනි බුද්ධිමතුන් ඈත් වන අන්දමේ යම් තීරණයක් දැනට ගෙන තිබෙනවා නම් ඒ ගැන නැවත වරක් සලකා බලා ඒ අය රාජ්‍ය සේවයෙහි තව දුරටත් රඳවා ගැනීම ගැන සැලකිල්ල යොමු කරන ලෙස ඉල්ලනවා. ඇත්ත වශයෙන්ම ඇතැම් ඖනාන්තරවල ඇති වන පුරප්පාඩු පිරවීමට පුහුණු වූවන් නො සිටින්නටත් පුළුවනි. පුහුණු වීම සඳහා ඒ තැන්වලට ආධුනිකයන් පත් කරගෙන සවභාෂාවෙන් කටයුතු කිරීමට පුළුවන්කමක් ඇති වුණාට පසු මෙම විශ්‍රාම ගැන්වීම කිරීම සුදුසුයයි මා කල්පනා කරනවා. තව කාලයකටවත් මෙම වයස සීමාව වෙනස් කර දමන ලෙස මා ඉල්ලනවා. මා හිතන්නේ විල්මට් ඒ. පෙරේරා මහත්මයාගේ වාර්තාවේ සඳහන් කර තිබෙන වයස අවුරුදු 62 හෝ 72 හෝ කීය හෝ ඒ යෝජනා කර තිබෙන වයස් ප්‍රමාණය අනුව වැඩ කිරීමට කටයුතු සලසන ලෙස ඉල්ලා සිටිනවා.

අ. භා. 2.45

වැඩිදුර කථා කරන්නට මා අදහස් කරන්නේ නැහැ. අවශාන වශයෙන් තවත් එක කාරණයක් කියන්න කැමතියි. හරකුන් සඳහා බක්කිවලට තණකොළ දමන්නාක් මෙන්, එහෙම නැත්නම් පුන්නක්කු දමන්නාක් මෙන්, කිසිම පිළිවෙළකට නැතිව ලිපිලේඛන ටිකක් මේ ආසන ඉදිරිපිට ඇති සාක්කුවලට දමා තිබෙනවා. මේවා ක්‍රමවත්ව අහුරා නැති නිසා හදිසියේ යම් ලිපියක් ලේඛනයක් සොයා ගන්න බැහැ. මේ කවරය සාදා තිබෙන්නේ සුරක්ෂිතව ලිපිලේඛන තබන්නටයි. එහෙත් සුරක්ෂිතව නොව හරකුන්ට තණකොළ දමන ආකාරයට ඒවා මෙම සාක්කුවලට දමා තිබෙනවා. සේවකයන් මදි නම් තවත් සේවකයන් අරගන්න. මෙවැනි ගෞරවනීය ස්ථානයක මේ විධියට කටයුතු සිදු වන්න ඉඩ දීම හරි නැති බව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்சா)
(Mr. Bernard Soysa)

Mr. Chairman, allow me just one minute before the hon. Parliamentary Secretary replies. Since the question of the take over of the Press has been discussed I was a little alarmed by what was said by the hon. Member for Homagama (Mr. Jayasuriya). The hon. Member, said that since a new paper called the "Davasa" has been started the monopoly that existed earlier no longer existed. The implication in the hon. Member's argument is that there was a monopoly earlier. The question then is whether the U. N. P. has changed its position in regard to what it declared last year. On the other hand, the question whether the starting of a new paper has broken that monopoly is answered effectively in the report submitted by the British Press Commission itself.

The question of a monopoly in regard to the Press rests really upon

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

what opportunities exist for a variety of political opinion to find expression in the public Press ; the question of sufficient competitive interests being found as between various newspaper houses or concerns ; what guarantee there is that various minor political opinions would find expression in the public Press in some form. To say that a monopoly does not exist merely because a new paper has been started, because just one paper has been added, is hardly a view that one would have expected at this stage of the discussion on the question.

However that may be, I am even more alarmed by some of the utterances of the Hon. Minister of Finance in the course of the Budget Debate, when he was questioned on this matter. When you regard his remarks with the earlier draft Bill that was circulated in regard to the Press takeover, there is sufficient ground to fear that what is contemplated is not a Press take-over but a control of journalists. That would be a very unfortunate state of affairs. The control of journalists is not a matter for any Government. Journalism is a profession. If you are interested in maintaining high and proper standards in that profession, then encourage the profession to evolve its own code and organization in the enforcement of that code. Let it not be a Government matter. You have the profession of lawyers, it may be that the Bar Council sometimes acts as a trade union of lawyers *vis-a-vis* the rest of the population of the country, but the Bar Council exists primarily for the purpose of seeing that a high standard of professional ethics is maintained by those who practice the legal profession.

Similarly, in regard to medicine. The medical men have their own organization for the purpose of seeing that a proper code of medical ethics is evolved and for seeing that that code is observed.

In regard to journalists, too, that should be the aim rather than set up some licensing authority of the Government, somebody like the competent authority, who might cancel a journalist's licence to prevent him practising his profession just because he did not happen to like a particular article published by his journal. No, Sir. What we demand is the breaking of that monopoly that exists today, not the setting up of some method of controlling journalists by any Government—not this Government, any Government, whatever Governments exists in this country—not a control of journalists by the Government but a breaking of the existing press monopoly which is in the hands of private capitalists who exploit it for certain particular political ends of their own.

Mr. Chairman, since we have heard pronouncements more or less to this effect from the Hon. Minister of Finance, the fears that were generated by the draft Bill that was not presented here but which achieved some circulation, those fears have been further strengthened by what has been said before by spokesmen on the other side. I would, therefore, urge on the Hon. Minister to see to it that you break the existing press monopoly but do not control journalists in that way.

එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා. (අධිකරණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன—நீதி யமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. N. H. A. M. Karunaratne—Parliamentary Secretary to the Minister of Justice)

ගරු සභාපතිතුමනි, පක්ෂ කිපයක ගරු මන්ත්‍රීවරුන් ගණනාවක් විසින් ඉදිරිපත් කරන ලද කරුණු සියල්ලක්ම හිතේ ධාරණ කරගෙන පිළිතුරු දීම අමාරු වැඩක් බව මා නොකීවාට තමුන්නාන්සේ දන්නවා ඇති. එසේ වෙතත් හැකි තරමින් සෑම ප්‍රශ්නයකටම පිළිතුරු දීමටයි, මා හැඟී සිටියේ. පළමුවෙන්ම ඉතාමත් කණගාටුදායක සිද්ධියක් ඔබ තුමා ඉදිරියේ මතක් කරන්න කැමතියි. රාජරත්න මන්ත්‍රීතුමාගේ නඩුව සම්බන්ධයෙන් අධිකරණ ඇමතිතුමා තමන් ඉදිරියේ කී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දෙයක් හැටියට අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) විසින් මෙම ගරු සභාවේදී ප්‍රකාශ කරන ලදුව, **හෑන්සාඩ්** වාර්තාවේ පළවූ ප්‍රකාශයක් ගැන දකුණු කොළඹ පළමුවැනි ගරු මන්ත්‍රීතුමාත් (ජේ. ආර්. ජයවර්ධන මයා.) බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමාත් (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) විසින් සඳහන් කරන්නට යෙදුණා. මේ කාරණය පිළිබඳව ගරු අධිකරණ ඇමතිතුමා ප්‍රකාශ කළේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා කරුණු වැරදි විධියට අවබෝධ කරගෙන ඒ විධියට කියා ඇති බවයි; වැරදි වැටහීමක් අනුව ඒ විධියට කියා ඇති බවයි. රාජරත්න මන්ත්‍රීතුමා උපවාසයේ යෙදුණු හැටියේම වාගේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා ගරු අධිකරණ ඇමතිවරයා හමු වී "යම්කිසි වරදක් කර දඬුවමක් ලැබුවහොත් ඒ දඬුවමින් ගැලවීම සඳහා පෙත්සමක් ඉදිරිපත් කිරීමෙහිදී ඔබ කෙසේ කටයුතු කරන්නෙහිද?" යනුවෙන් අසා තිබෙනවා. ඒ මිස රාජරත්න මහතාගේ නඩුව ගැන ප්‍රශ්න කර නැහැ. රාජරත්න මහතාගේ නඩුව වැනි නඩුවකදී සමාවක් දීම සඳහා අධිකරණ ඇමතිවරයා කටයුතු කරන්නේ කොහොම දැයි අසා තිබෙනවා. එවැනි නඩුවක් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ ගැන ඇසුවා මිස රාජරත්න මහතාගේ නඩුව සම්බන්ධයෙන් අසා නැහැ. ඒ අවස්ථාවේදී අධිකරණ ඇමතිවරයා ප්‍රකාශ කර තිබෙන්නේ උසාවියට ඉදිරිපත් නොකෙරෙන, උසාවියට නොලැබෙන, යම් යම් ලියකියවිලි ආදියක් හෝ පැමිණිලි හෝ තිබෙනවා නම් ඒවා සියල්ලක් ගැනම පරීක්ෂා කර බලා ඊට පසු සුදුසු උපදෙස් දෙන බවයි. ඒ හැර රාජරත්න නඩුව සම්බන්ධයෙන් පොලීසියෙන් කෙරී ඇති වැරදි නිසා මේ මේ විධියට කටයුතු කරන වායයි කියා නැහැ. ඒ අවස්ථාවේදී රාජරත්න මහතා උපවාසයේ යෙදී සිටියා. නමුත් ඔහුට ලැබුණු දඬුවමින් ඔහු නිදහස් කිරීම ගැන කිසිම පියවරක් ගෙන තිබුණේ නැහැ. මේ ගැන සවදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා සාක්ෂි දරනවා ඇති. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා විසින් මේ පිළිබඳව කරන ලද ප්‍රකාශය අසත්‍ය බව මෙම ගරු සභාවේදී වහාම සඳහන් කරන ලෙස ගරු අධිකරණ ඇමතිවරයා විසින් දෙවතාවක්ම ගරු සවදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයාට දන්වන ලද නමුත්, එසේ කිරීමට අමතක වී තිබෙනවා. මේ විධියට අසත්‍ය කරුණක් වාර්තා ගත වීම නිසා චෝදනාවකට මුහුණ පාන්න සිදු වුණා.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
මට වචනයක් කියන්න ඉඩ දෙන්න.

එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.
(திரு. என். எச். ஏ.. எம். கருணாரத்ன)
(Mr. N. H. A. M. Karunaratne)
තව ටිකයි.

අධිකරණ ඇමතිතුමා හමු වීම සඳහා පැමිණි රාජරත්න මන්ත්‍රීතුමාගේ නීතිඥ තැනටවත්, රාජනීතිඥ චිට්ටි මහතාටවත්, එතුමා ඒ විධියේ සමාවක් දීම ගැන කියා නැති කොට මෙය විශ්වාස කළ හැකිද? විශ්වාස කරන්ට පුළුවන්ද ගරු අවිස්සාවේල්ලේ මන්ත්‍රීතුමා කියන දේ? එතුමා අවංක තැනැත්තකු නිසා බොරුවක් කියනවා යයි මා කියන්නේ නැහැ. එතුමාට මේ කාරණය පිළිබඳව වැරදි අවබෝධයක් ඇති වූ බවයි මා හිතන්නේ.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
මේ පිළිබඳව මට වචන තුන හතරක් කථා කරන්ට ඉඩ දෙනවාද? මේ කාරණය ගැන මා මේ ගරු සභාවේදී සඳහන් කළේ ඉතාමත්ම අකමැත්තෙන්. මම ගරු අධිකරණ ඇමතිතුමා හමු වී රාජරත්න නඩුව පිළිබඳ විස්තර—නඩු තීන්දුව, හිරේ යාම, උපවාසය, යනාදි කාරණා පිළිබඳ විස්තර—සියල්ලක්ම සාකච්ඡා කළා. සාමාන්‍ය වශයෙන් නම් මම ඒ පිළිබඳව වචනයක්වත් මේ ගරු සභාවට කියන්නේ නැහැ. නමුත් මෙම කාරණය පිළිබඳව මේ ගරු සභාවේදී සාකච්ඡාවක් පැන නැංග එක් වතාවකදී ගරු මුදල් ඇමතිතුමා යම් යම් දේ කියාපු නිසා, බාගයක් කියා නවත්වන්න එපාය, මේ පිළිබඳ සම්පූර්ණ ඇත්ත මෙහිදී කියන්නය, කියා මම එතුමාට කිව්වා.

මම අධිකරණ ඇමතිතුමා හමු වන්ට ගියේ රාජරත්න සිද්ධිය ගැන සාකච්ඡා කිරීමටයි. එසේ නැතිව නීතිය හදුරණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

ශිෂ්‍යයකු මෙන් යම් යම් දේ දැනගැනීමට එතුමා ළඟට ගියේ නැහැ. රාජරත්න මහතාට හිර දඬුවම් නියම කර තිබෙන්නේ මොන කාරණයක් නිසාද, ඒ පිළිබඳව පෙත්සමක් ඉදිරිපත් කරන්නේ කෙසේද, යනාදි කාරණා පිළිබඳව මා අධිකරණ ඇමතිතුමාත් සමග සාකච්ඡා කළා. ඒ අවස්ථාවේදී මට දැනගන්න පුළුවන් වූ තරම් මට, මට අවබෝධ වූ හැටියට, හොඳින්ම එතුමා කිවා පොලීසියේ එන්ට්‍රි පොත්වල යම් යම් වෙනස්කිරීම් කර තිබෙනවාය කියා. එමෙන්ම උසාවියට ඉදිරිපත් කරන ලද සාක්ෂිවලද පරස්පර විරෝධතා තිබෙන නිසා එම සාක්ෂි එකට එක ගළපන්ට බැරි හෙයින් තීන්දුව වෙනස් කරන්ට පුළුවන් බවත් සමාව දෙන්ට පුළුවන් බවත් එතුමා කිවා. ගරු අධිකරණ ඇමතිතුමා එසේ කිවේ නැතැයි කියා අද කියනවා නම්, එය රට මුළා කිරීමට කරන්නාවූ සම්පූර්ණ අසත්‍ය ප්‍රකාශයක් බව මා කියන්ට ඕනෑ. මේ ඇමතිවරුන්ට ඒ අවස්ථාවේදී වචනයක්වත් මතක නැහැ. සියල්ලම ඉවර වුණායින් පස්සෙයි මතක් වෙන්නේ. සවදේශ කටයුතු භාර ඇමතිතුමාට කිවාලු මේ කාරණය ගැන කියන්නය කියලා. නමුත් මතක නැති වුණාලු. [බාධා කිරීම්]

ගරු මෛත්‍රීපාල සේනානායක (කම්කාරු, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)

(கௌரவ மைத்திரிபால சேனநாயக்க— கைத்தொழில், உள்நாட்டு, கலாச்சார விவகார அமைச்சர்)

(The Hon. Maithripala Senanayeke) Minister of Industries, Home and Cultural Affairs)

ඒ අවස්ථාවේදී ගරු සභාපතිතුමනි, මට ප්‍රකාශයක් කරන්ට——

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.

(திரு. டீ. பீ. ஆர். குணவர்தன)

(Mr. D. P. R. Gunawardena)

ඔව්, දැන් මතක් වෙනවා. තමුන්නාන්සේලාගේ මතක ගෙදර තියල ඇවිත් වැඩක් නැහැ. [බාධා කිරීම්]

ගරු මෛත්‍රීපාල සේනානායක

(கௌரவ மைத்திரிபால சேனநாயக்க)

(The Hon. Maithripala Senanayeke)

මන්ත්‍රීවරයා මෙතන නිකම් කෑ ගැහැව්වාට මදි. [බාධා කිරීම්]

සභාපතිතුමා

(அக்கிராசனர்)

(The Chairman)

කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

ගරු මෛත්‍රීපාල සේනානායක

(கௌரவ மைத்திரிபால சேனநாயக்க)

(The Hon. Maithripala Senanayeke)

ගරු සභාපතිතුමනි, යම්කිසි පැහැදිලි ප්‍රකාශයක් කිරීම දැන් අවශ්‍යව තිබෙනවා. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා එම ප්‍රකාශය එදා කළායින් පසු මෙම සභාවේ ගැලරියේ සිටි ගරු අධිකරණ ඇමතිවරයා මට එන්ටය කියා පණිවිඩයක් එවා එම සාකච්ඡාව අවසානයේදී රජය වෙනුවෙන් මේ පිළිතුර කෙළින්ම ප්‍රකාශ කරන්ටය කිවා. ගරු අධිකරණ ඇමතිතුමා එවැනි ප්‍රකාශයක් කවදාවත් කළේ නැති බවත් අධිකරණ ඇමතිතුමා වශයෙන් තමාට ඇපැලක් ආවායින් පසු යම් යම් කරුණු තිබෙනවා නම් සොයා බලා ඒ අනුව ඉඩක් තිබෙනවා නම් පමණක් යමක් කරනවාය යන ප්‍රකාශය කළ බවත් මට මේ සභාවේදී ප්‍රකාශ කරන්ට කිවා. අපට අමතක කරන්ට වුවමනාවක් නැහැ. හංගන්ට වුවමනාවකුත් නැහැ. ගරු අධිකරණ ඇමතිතුමා එදා කී දේ අප විශ්වාස කරනවා. ඒ නිසා ගරු මන්ත්‍රීවරයා කෑ ගසා මහජනයා මුළා කිරීමට වුවමනා නැහැ. [බාධා කිරීමක්]

සභාපතිතුමා

(அக்கிராசனர்)

(The Chairman)

කරුණා කර නිශ්ශබ්ද වන්න.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.

(திரு. டீ. பீ. ஆர். குணவர்தன)

(Mr. D. P. R. Gunawardena)

ගරු සභාපතිතුමනි, මට එක් කාරණයක් පමණයි කියන්ට තිබෙන්නේ. මා එදා කී දේ වැරදි නම් ඒ අවස්ථාවේදීම හරිගස්සන්ට තිබුණේ මුදල් ඇමති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුමාටයි. මුදල් ඇමතිතුමා ඒ අවස්ථාවේදි කිවා, වෙන්න පුළුවන්, කාරණය අපි පිළි ගන්නවාය කියා. සමාව දෙන්න අමාරු වක් වන්නේ නැතැයි කියා මුදල් ඇමතිතුමා කිවා. මම සාමාන්‍ය වශයෙනුයි කියන්නේ. හරියට වචන ටික **හැන්සාඩ්** එක බැලුවොත් කියන්ට පුළුවන්. ඇයි ඒ වෙලාවේ කිව්වෙ නැත්තෙ? [බාධා කිරීමක්] මැදවච්චියෙ පිළිමවල් මෙහෙ හරි යන්නේ නැහැ. ගිහිල්ලා එහෙ ගහ ගන්න. ඇත්ත ඕකයි. [බාධා කිරීමක්]

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

දැන් මෙතන තිබෙන ප්‍රශ්නය අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා කියන වචනය පිළිගන්නවාද නැත්නම් අධිකරණ ඇමතිතුමාගේ වචනය පිළි ගන්නවාද යන්නයි. ඒ ප්‍රශ්නය බේරුම් කර ගැනීමට මේ අවස්ථාවේදී ඉඩක් නැති නිසා——

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

මුදල් ඇමතිතුමා සිටින වේලාවක මෙය නිරාකරණය කර ගන්නවා විනා මේ අවස්ථාවේදී තීන්දුවක් දෙන්න එපාය කියා මා ඉල්ලා සිටිනවා. මේ පිළිමෙට වඩා කාරණා තේරෙනව මුදල් ඇමතිතුමාට.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

ඔව්, ඒ පිළිබඳව දැන් සාකච්ඡාවක් කරන්ට වුවමනාවක් නැහැ.

එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.
(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)
(Mr. N. H. A. M. Karunaratne)

හැන්සාඩ් වාර්තා පොතේ තවත් එක් කාරණයක් සඳහන් වී තිබෙනවා. එනම් එන්ට්‍රි වාර්තා පොතේ යම් වෙනස්කිරීමක් කර තිබෙනවා යන්නයි. නමුත් එහි අකුරක්වත් වෙනස් කර නැති බව මට මේ සභාවට කියන්ට පුළුවන්.

අ. භා. 3

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

එහෙම නම් එදා අධිකරණ ඇමතිතුමා මට කිව්වේ බොරු.

එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.
(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)
(Mr. N. H. A. M. Karunaratne)

ගරු සභාපතිතුමනි, දැන් ඉතින් ඒ ප්‍රශ්නය ගැන තව දුරටත් කියන්න වුව මනාවක් නැහැ කියා මා හිතනවා. පිළිතුරු දිය යුතු ප්‍රශ්න රාශියක්ම තිබෙන නිසා එකින් එක වෙන් වෙන් වශයෙන් ගෙන ක්‍රමානුකූලව ඒවාට පිළිතුරු දීමට බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීන් තම තමන්ගේ කොට්ඨාශවල තිබෙන අඛලන් වූ ගම්සභා උසාවි ගැනත් පොලීස් උසාවි ගැනත් සඳහන් කළා. එක් එක් මන්ත්‍රීවරයා ඉදිරිපත් කළ අඩුපාඩු වෙන් වෙන් වශයෙන් සඳහන් කරමින් ඒ සෑම එකක්ම සම්බන්ධයෙන් කරන්න යන්නේ මොකක්ද යනාදි වශයෙන් දිර්ඝ විස්තරයක් කරන්න මා දැන් බලාපොරොත්තු වන්නේ නැහැ. ඉදිරිපත් කරන ලද සෑම අදහසක්ම වටිනා අදහසක් හැටියට සලකන අතර, අඛලන් වී තිබෙනවාය කියන ගොඩනැගිලි පරීක්ෂා කර බලා ඒ සම්බන්ධයෙන් කළ යුතු දේ කරන්ටත්, අලුත්වැඩියා කළ යුතු ගොඩ නැගිලි අලුත්වැඩියා කරන්ටත් ඉදි කළ යුතු ගොඩනැගිලි වෙනොත් ඒ සම්බන්ධ යෙන් සුදුසු පරිදි ක්‍රියා කරන්ටත්, පොලිස් උසාවි අවශ්‍ය තැන්වලට ඒවා ලබා දෙන්ටත්, අමාත්‍යාංශය කටයුතු කරනවා ඇති.

සාමදාන විනිශ්චයකාරයන් සහ හදිසි මරණ පරීක්ෂකයන් පත් කිරීම ගැන මට කියන්න තිබෙන්නේ, ඒ ඒ කොට්ඨාශවල අවශ්‍යතාවන් අනුව ඒ පත් කිරීම් සිදු වන බවයි. අවශ්‍යතාවන් ගැන සඳහන් කරමින් පෙත්සම් සහ ඉල්ලීම් ඉදිරිපත් වුණාම ඒවා ඒ ඒ කොට්ඨාශයේ ඒජන්ත උන් නැහේට හෙවත් ආණ්ඩුවේ ඒජන්තතුමාට යවනවා. ඒ සම්බන්ධයෙන් ඔහුගේ අදහස් විමසනවා. මේ පදවිවලට පත් කරනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍ර ලැබුණාම ඒවාත් ඒජන්තතුමාට යවා ඒ ඒ පුද්ගලයාගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.]

චරිතයත් ගතිගුණත් සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගන්නවා. ඉල්ලුම්කරුගේ චරිතාකම ගැනත් රෙකමදාරු ලබා ගන්නවා. ලක්ෂ ගණන් වස්තුව තිබෙන්න වුවමනාවක් ඇත්තේ නැහැ. සාමාන්‍ය යෙන් යමක් කමක් තිබිය යුතු තමයි. ඒ අතරම පළාතේ මන්ත්‍රීවරයාගෙනුත් විමසනවා. කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ලංකා සමසමාජ පක්ෂය, එක්සත් ජාතික පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, යනාදී කවර පක්ෂයකට අයිති කෙනකු වුවත් අපට කමක් නැහැ. පක්ෂය භේදයක් නැතිව පළාත් භාර මන්ත්‍රීවරයාගෙන් විමසීම කරනවා. ප්‍රදේශයේ අවශ්‍යතාවන් අනුව සුදුසු අය තෝරා පත් කරනවා. ඒ විධියටයි සාමදාන විනිශ්චයකාරවරුන් තෝරා පත් කරන්නේ.

කොරනර්වරුන් හුඟක් වයස්ගතව— අවුරුදු අසූව අනූව ආදි වශයෙන්—සිටිනත් තවමත් සේවයේ තබාගෙන ඉන්නෙ මක් නිසාද කියා ප්‍රශ්න කර තිබෙනවා. ඒ වයස පැනපු අය ඉන්නවා නම්, එවැනි දුබල දුර්වල පුද්ගලයන් ඉන්නවා නම්, ඒ අය අයින් කර හොඳට පණ තියෙන වීකක් ගාය ඇති අය පත් කරන්න බලා පොරොතුත්තු වෙනවා.

ඉඹුලාන මයා.
(திரு. இம்புலான)
(Mr. Imbulana)
ගාය කියන්නෙ මොකටද?

විජයබාහු විජයසිංහ මයා. (මීරිගම)
(திரு. விஜயபாஹு விஜயசிங்ஹ—மீரிகம)
(Mr. Wijayabahu Wijayasinha—Mirigama)
ගාය කියන්නෙ පණ තියෙන කියන එකයි.

එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.
(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)
(Mr. N. H. A. M. Karunaratne)

සාම මණ්ඩල ගැන කියන්න යෙදුණා. කලබල ආදිය තිබෙන පළාත්වල දැන් සාම මණ්ඩල ක්‍රියාත්මක වන්නේ නැහැ. සම්හර සාම මණ්ඩලවල නියමිත කාල සීමාව ඉගවී ගොස් තිබෙන නිසා නවත්වන්න සිද්ධ වී තිබෙනවා. සාම මණ්ඩලයක් අවුරුදු දෙකක් බල පවත්වනවා. ඒ කාල සීමාව පැනපුවාම සාම මණ්ඩලය නැති වෙනවා. ඊළඟට නැවත සාම මණ්ඩලයක් පත් කරනවා. එසේ පත් කිරීමට පෙර ග්‍රාම සංවර්ධන ආදී නොයෙක් සමිතිවලින් සාමාජිකයන්ගේ නම් ඉල්ලා යවනවා. ඒ අනුව ළඟදී සාම මණ්ඩල ඇති කරන අතර දැනට තිබෙන අනෙක් සාම මණ්ඩල මීට වඩා හොඳට වැඩ කරන විධියට පිළියෙළ කිරීමට ගරු ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා.

නඩු මගට බහින දුප්පත් අය කෙරෙහි අනුකම්පාවක් දක්වා ඔවුන් වෙනුවෙන් නීතිඥයන් පත් කර දීමෙන් ආධාර කරන ලෙස ඉල්ලා සිටියා. ඒ වෙනුවෙන් රුපියල් 50,000 ක් පමණ වෙන් කර තිබෙන බව කියන්න කැමතියි. නීති මණ්ඩලයට මෙය ඉදිරිපත් කර තිබෙනවා. කොළඹ ඇතුළත නීතිඥ මණ්ඩලයේ අය දැනටමත් පෙනී සිටිනවා. පිට පළාත්වලටත් එවැනි නීතිඥයන් දීමට කටයුතු සලස්වා තිබෙනවා.

දුප්පතාට ආධාර දීමක් වශයෙන්, සම්හර මුද්දර ගාස්තු ගෙවන්න බැරිකමක් තිබෙනවා නම්, ඊටද පහසුකම් සලසා තිබෙන බව මම කියන්න කැමතියි. තවද, බොහෝ උසාවිවල නඩු කල් යන බවත්, නඩු ඇසීම ප්‍රමාද වන බවත් කියන්න යෙදුණා. ඒක ඇත්ත. බොහෝ උසාවිවල ඒ තත්ත්වය තිබෙනවා. ඒ ගැන ඇමතිතුමාට දන්වා, ඉක්මනින් යම් කිසි ක්‍රියා මාර්ගයක් යොදන්න බලාපොරොත්තු වෙනවා.

එක්තරා උසාවියක විනිශ්චයකාරවරයෙක්, බොහෝම අශෝභන විධියට, අයුතු විධියට නඩු සඳහා උසාවියට පැමිණෙන පුද්ගලයන්ට හිරිහැර කරනවාය කියා දකුණු කොළඹ ගරු පළමු වන මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) ප්‍රකාශ කරන්න යෙදුණා. යම් කිසි උසාවියක වැඩ කරන නීතිඥ මණ්ඩලය විසින්, ඒ උසාවියේ විනිශ්චයකාරවරයාට විරුද්ධව චෝදනා ඉදිරිපත් කරනවා නම්, අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් විභාගයක් පවත්වන්න අපි සූදානම්. ඒ වාගේම ගම් බද උසාවිවලත්, ඒ විධියේ දුෂණ තිබෙනවා නම් ඒ කරුණු ඉදිරිපත් කළ විට, එම කොමිෂන් සභාව මගින්ම කටයුතු කිරීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපි බලාපොරොත්තු වෙනවා. එසේ නැතිව ඒ පිළිබඳ තීරණයක් ගැනීම ඇමතිතුමාට අයිති වැඩක් නොවෙයි. එවැනි කරුණු තිබෙනවා නම් ඒවා එම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්නය කියා කියන්න ඇමතිතුමාට පුළුවනි. ඒ මිස ඒ ගැන තීන්දුවක් දීමට ඇමතිතුමාට පුළුවන්කමක් නැහැ.

රාජ්‍ය භාෂාව ක්‍රියාත්මක වන්නේ නැත කියා, බොහෝ දුරට ගරු මන්ත්‍රීන් විසින් කරුණු ඉදිරිපත් කරන්ට යෙදුණා. ලංකාව අවුරුදු ගණනාවක් තිස්සේ අධිරාජ්‍ය වාදීන් යටතේ තිබී නිදහස ලබා ගත්තාට පසුව, සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරන්ට යෙදුණේ ඉතා මෑතදීයි. එම නිසා, හදිසියේම, අපි බලාපොරොත්තු වන ඉක්මනින්ම, සිංහලෙන් කටයුතු කිරීමට ටිකක් අමාරුකම් තිබෙන බව අපි කවුරුත් පිළිගන්න ඕනෑ. ඒ මක්නිසාද? නීති පොත් ආදිය තව බොහෝ දුරට සිංහලට පරිවර්තනය කරන්න තිබෙනවා. ඒ වාගේම දැනට සිටින විනිශ්චයකාරවරුන් අස් කරන්නත් බැහැ, ඒ අයගේ නියම කාල සීමාව පසු වන තුරු. එම නිසා නීතිය සම්බන්ධයෙන් වැඩ කරන අයට ක්‍රමානුකූලව යම්කිසි පුහුණුවක් දීමෙන්, රාජ්‍ය භාෂාව අනුක්‍රමයෙන් ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

උසාවිවල තවමත් සිංහලෙන් නඩු අසන්නේ නැත කියන ප්‍රශ්නය නඟා තිබෙනවා. අපි දැනට 12 දෙනකු පමණ අරගෙන රෙකෝඩ් තැබීම, ටයිප් ගැසීම, ආදිය සිංහලෙන් කරගෙන යනවා. තවත් 25 දෙනකු පමණ පුහුණුව ලැබීම පිණිස නොයෙක් ප්‍රදේශවල දිස්ත්‍රික් උසාවිවල පිටත් කර යවා තිබෙනවා. උසාවිවල කරන වැඩ එක්තරා විනයක් ඔස පුහුණුවක් අනුව, එක්තරා ක්‍රමයකට, කරන්න ඕනෑ බව තමුන්නාන්සේ දන්නවා ඇති. එම නිසා එවැනි පුහුණුවක් ලබා ගැනීමටයි මෙම අමාත්‍යාංශය මගින් 25 දෙනකු ඒ ඒ දිස්ත්‍රික් උසාවිවලට පිටත් කර යවා තිබෙන්නේ. එපමණක් නොවෙයි, රාජ්‍ය භාෂා අංශය මගින්, දැනට උසස් නිලධාරීන් උදෙසා පංක්ති පවත්වාගෙන යනවා. ඒ අතර ඇත ප්‍රාදේශවල සිටින අයට තැපැල් මාර්ගයෙන් සහ ගුවන් විදුලි මාර්ගයෙනුත් උගැන්වීමට කටයුතු පිළියෙළ කර තිබෙනවා. මේ විධියට ක්‍රමානුකූලව ටික ටික ඒ කටයුතු කරගෙන යන විට, සම්පූර්ණයෙන්ම අපි නොදැනුවත්වම මේ රටේ උසාවි වල වැඩ කටයුතු සිංහලෙන් කිරීමට අපට පුළුවන් වනවා ඇති.

සභාපතිතුමනි, ලෙජිස්ලෙටිව් ඉනැක්මන්ට්ස්—Legislative Enactments—නමැති නීති පොත් මුද්‍රණය කර තිබෙනවාද, ඒවායේ තත්ත්වය කෙසේද, කියා ප්‍රශ්නයක් අසන්න යෙදුණා. දැනට කාණ්ඩ 11ක් සම්පූර්ණයෙන්ම අවසාන කර තිබෙන බව මම ගරු සභාවට දන්වන්න කැමතියි. ආණ්ඩුවේ මුද්‍රණාලයේ පාලක නිලධාරියා අපට කියා තිබෙනවා, දැනට දොළොස්වෙනි කාණ්ඩයේද භාගයක් අවසානයි; පළමුවැනිදාට ඉස්සර සම්පූර්ණයෙන්ම අවසන් කරන්නට පුළුවනිය කියා. ඊට අදාළ 'Subsidiary Legislation Supplementary Legislation' අවසන් කළාට පසුව ඒ සියල්ලම මුද්‍රණය කර දීමට එහි ප්‍රධානියා අපට පොරොන්දු වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, උසාවිවල සිංහලෙන් වැඩ කරන්නේ නැහැයි කියන කාරණය සම්බන්ධයෙනුත් වචනයක් කියන්නට කැමතියි. දැනට ගම්බද උසාවි 17 කම සිංහලෙන් වැඩ කළ යුතුය කියා ගරු ඇමතිතුමා ආඥාවක් නිකුත් කර තිබෙනවා. ඒ අතරම සංචාරක උසාවි 91 කම සිංහලෙන් වැඩ කළ යුතුයයි ගරු ඇමතිතුමා විසින් නියෝග කර තිබෙනවා. මගේ කල්පනාවේ හැටියට මෙය ඉතාමත් ලොකු දෙයක්. මන්ද? මෙයට පෙර කිසිම උසාවියක සිංහලෙන් නඩු ඇසුවේ නැහැ. දැනට මෙම උසාවිවලට සිංහලෙන් වැඩ කළ හැකි නිලධාරීන් පත් කර යවනවා. සිංහල ලඝු ලේඛකයන්, සිංහල භාෂාවෙන් කටයුතු කළ හැකි ලිපිකරුවන්, ආදී නිලධාරීන් මේ උසාවිවලට පත් කර යැවීමෙන් පසුව ක්‍රම ක්‍රමයෙන් හැම උසාවියක වාගේම සිංහලෙන් කටයුතු කිරීමට පුළුවන් වෙනවා ඇතැයි මම විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, තවත් කාරණයක් විශෙෂයෙන් මේ ගරු සභාවේ මන්ත්‍රීතුමන්ලාගේ දැන ගැනීම පිණිස කියා සිටින්නට කැමතියි. මේ ගරු සභාවේ බොහෝ මන්ත්‍රීවරුන් ප්‍රශ්න කළා,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.]

"ප්‍රෙස් බිල්" හෙවත් මේ පුවත් පත් පනත කවදා ඉදිරිපත් කරනවාද කියා. ඇත්ත වශයෙන්ම එය ඉදිරිපත් කරන්නේ කවදාදැයි සථිර වශයෙන්ම උත්තරයක් දීමට මට පුළුවන්කම තිබෙනවා. තමුන්නාන්සේට කියන්නට කැමතියි, මේ අවුරුද්ද අවසාන වන්නට පෙර ඒ පනත මේ ගරු සභාවට ඉදිරිපත් කරන බව.

ගරු සභාපතිතුමනි, මේ සභාවේදී ඉදිරිපත් කරන ලද නොයෙක් නොයෙක් කරුණු එකින් එක මා සටහන් කරගෙන තිබුණත් ඒ සියල්ලටම මේ අවස්ථාවේදී පිළිතුරු දෙන්න මම අදහස් කරන්නේ නැහැ. එයින් ඉතාමත් වැදගත්යයි හැඟෙන කරුණුවලට පමණක් පිළිතුරු සැපයීමට මම තෝරා ගත්තා. මේ කාරණා ගැන සාකච්ඡා කර නොපමාව ඒවා ඉෂ්ට කර දෙන්නට අපි උත්සාහ ගන්නා බව කියන්නට කැමතියි. (බාධා කිරීම්) යම් කිසි චෝදනාවක් යම් කෙනෙකුට විරුද්ධව ඉදිරිපත් කර තිබෙනවා නම්, ඒ ගැන විභාග කර බලනවා.

ගරු සභාපතිතුමනි, නැවතත් මම මාතෘකාවට බහින්නම්. තමුන්නාන්සේ දන්නවා රාජරත්න මහතාගේ නඩුවේ සිද්ධීන් සම්බන්ධයෙන් මෙම ගරු සභාවේදී ප්‍රකාශයක් කරන ලෙස මගෙන් ඊයේ ඉල්ලා සිටි බව. ඒ කාරණය ගැන මා ප්‍රකාශයක් කළා. නමුත් ගාල්ලේ ගරු මන්ත්‍රීවරයාට (ඩබ්ලිව්. දහනායක මයා.) එය වැටහී නොතිබුණු නිසා, අවබෝධ වී නැති නිසා, එය නැවත වරක් පැහැදිලි කර දෙන ලෙස මගෙන් ඉල්ලා සිටියා. මා නැවත වරක් දන්නා භාෂාවෙන් එම ප්‍රකාශය පැහැදිලි කර දෙන්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, මේ සේරම අර්බුද ඇති වී තිබෙන්නේ රාජරත්න මහතා මේ ගරු සභාවේ මන්ත්‍රීවරයකුය යන හැඟීම පැත්තකට දමා අපක්ෂපාතව කල්පනා නොකරන නිසයි. එසේ නැතිනම් මගේ ප්‍රකාශයෙන් එයට හේතුව හොඳින්ම පැහැදිලි වෙනවාට කිසිම සැකයක් නැහැ. මා කළ ප්‍රකාශය මෙන්න මේකයි. රාජරත්න මහතා මේ රටේ සාමය කඩ කිරීමට උත්සාහ කළ නිසා, මේ රටේ නීතිය ගරු නොකළ නිසා, මේ රටේ සාමාන්‍ය පුරවැසියකු හැටියට ඔහුට විරුද්ධව චෝදනා ඉදිරිපත් කොට, ඒ චෝදනාවලට ඔහු වැරදිකරුවකු බව ඔප්පු වූ නිසා නීති මාර්ගයෙන් ඔහුට දඬුවම් ලැබුණා. ඊළඟට ඔහුට කරන්නට තිබුණේ කුමක්ද? නීති මාර්ගයෙන් එයින් බේරීමට උත්සාහ කිරීමයි. ගරු සභා පතිතුමනි, ඔහුට පමණක් නොවෙයි, මේ රටේ ඕනෑම පුද්ගලයෙක් රටේ සාමය කඩ කිරීමට උත්සාහ කරනවා නම්, නීතිය කඩ කිරීමට උත්සාහ දරනවා නම්, ඔහුට නීතියෙන් දඬුවම් ලැබෙනවා. එය ඔබතුමාටත්, මටත්, කාටත් සාධාරණයි. එම නිසා ඔහුට මුලින් නියම වුණු අවුරුදු දෙක හමාරක සිර දඬුවමින් බේරීමට නීතියේ පිහිට සෙව්වා. ඔහු ඊළඟට කළේ මොකක්ද? ඉහළ උසාවියෙන් හෝ තම දඬුවමෙන් බේරීමට ඔහු නීති මාර්ගය අනුගමනය කළා.

අ. භා. 3.15

ඒ උගත් විනිශ්චයකාරවරු, ඔහු එතරම් තදබල වරදක් නොකළේය යන හැඟීම නිසා වන්නට ඇති, ඔහුට යම් කිසි සහනයක් දුන්නා. අවුරුදු දෙකහමාරේ හිර දඬුවම අවුරුදු එකහමාරක් කළා. ඊට පසුව ඔහු ජ්‍රිවි කවුන්සලයට ඒ නඩුව ඉදිරිපත් කිරීමට කල්පනා කළ නමුත් කෙසේ හෝ එය සිදු වූයේ නැහැ. ඒ අතරතුර ඒ මහත්මයා උපවාසයක යෙදී එය අත්හැර මේ රටේ ඕනෑම පුරවැසියකුට තිබෙන අයිතිය අනුව—යම්කිසි දඬුවමක් ලැබුණ අවස්ථාවේදී ගතහැකි සෑම උත්සාහයක්ම ගෙන ඉන් පලක් නොවූ විට අවසානයේදී මේ රටේ සිටින ශ්‍රෙෂ්ඨ පුද්ගලයා වන අග්‍රාණ්ඩුකාරතුමා වෙත පෙත්සමක් ඉදිරිපත් කිරීමේ අයිතිය අනුව—එතුමාණන්ට අධිකරණ ඇමතිතුමාගේ මාර්ගයෙන් පෙත්සමක් ඉදිරිපත් කළා. එල්ලුම් ගහට නියම වූ කෙනකුට පවා ඉන් නිදහසක් දෙන්නට යයි, අධිකරණ ඇමතිතුමා මාර්ගයෙන් අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ඉල්ලන්ට පුළුවනි. රාජරත්න මහත්මයා හිරගෙට ගියේ 23 වන දායි. ඊට පසුව එතුමා ඉදිරිපත් කළ පෙත්සම අධිකරණ ඇමතිතුමා හොඳ හැටි කියවා බලා, උසාවිවලට නොලැබුණු ලියුම් පවා ගෙන්වාගෙන පරීක්ෂා කර බලා, එතුමාගෙන් ඉටු විය යුතු කායර්යක් හැටියට ඉතා ඥානාන්විතව ඒ ගැන කල්පනා කර බලා, අග්‍රාණ්ඩුකාරතුමන් වෙත එතුමාගේ උපදෙස් ඉදිරිපත් කළා. මෙය වරදවා තේරුම් ගත් ගාල්ලේ ගරු මන්ත්‍රී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුමා (ඩබ්ලිව්. දහනායක මයා.) ඔහුට මොන බලයක් තිබෙණවාදැයි ඇහුවා. "what right has he?" කියායි ඇසුවේ. එය බලයක් නොවෙයි; අධිකරණ ඇමතිතුමා සතු කාර්යයයි. තමන් සතු කායර්යයෙහිත්, බලයෙහිත් වෙනස මේ රටේ ඉරණම විසඳීමේ වගකීම කලක් දැරූ ගාල්ලේ මන්ත්‍රීතුමා වැනි පුද්ගලයකුට නොතේරීම ගැන මම කනගාටු වෙනවා. ඇත්තෙන්ම අධිකරණ ඇමතිතුමා කළේ වරදක්ද? මේ රටේ පවතින සාමාන්‍ය නීතිය අනුව රාජරත්න මහත්මයා විනිශ්චයට භාජන වුණා. ඒ අනුව ඒ මහත්මයාට දඬුවම් ලැබුණා. ඉන් සහනයක් ලබා ගැනීම සඳහා රාජරත්න මහත්මයා නියම මාගීයෙන් කටයුතු කළා. අධිකරණ ඇමතිතුමා ඒ මාගී අවහිර කළාද?

අධිකරණ ඇමතිතුමාට මේ රටේ පවතින නීතිය අනුව සහනයක් දීම පිළිබඳව අග්‍රාණ්ඩුකාරතුමාට බලයක් දීමට පුළුවන්කම තිබෙනවා. ඉතින් ඒ අනුව අධිකරණ ඇමතිතුමාට එතුමාගේ අදහස් අග්‍රාණ්ඩුකාරතුමන් වෙත ඉදිරිපත් කරන්නට ඉඩ නැද්ද? එසේ නොකිරීමට නම් ඒ නීතිය අවලංගු කරන්නට ඕනෑ. අධිකරණ ඇමතිතුමාගේ උපදෙස් පරිදි අග්‍රාණ්ඩුකාරතුමා විසින් සහනයක් දීමේ ක්‍රියා පිළිවෙළ වෙනස් කරන්නට ඕනෑ. නමුත් ඒ නීති තිබෙන තුරු අධිකරණ ඇමතිතුමා ගත් පියවර වැරදි යයි කාට නම් කියන්න පුළුවන්ද? එය ඉතා සාධාරණ පියවරක් බවයි, මගේ හැඟීම. ඒ ගැන ඇත්ත වශයෙන්ම මම එතුමා පිළිබඳව ආඩම්බර වෙනවා. එතුමාගේ පාර්ලිමේන්තු ලේකම් හැටියට මට වැඩ කිරීමට ලැබීම ගෞරවයක් ලෙස මම සලකනවා.

නමුත් මෙහි ලොකු රහසක් තිබෙනවා. මොකද සමහරුන්ට මේ ගැන හිතේ ලොකු අමාරුවක් තිබෙන්නෙ? මිනිහකුට හිර දඬුවම නියම වූ විට ඔහුගේ ඉල්ලීම පරිදි එය අඩු කිරීම වරදක් හැටියට සමහරු සලකනවා. එල්ලුම් ගහට නියම වූ කෙනකුගේ දඬුවම අඩු කිරීමත් සමහරුන්ට වැරදියි. ලෝකයේ ජනසම්මත නීතියක් තිබෙනවා. මා මීට පෙර කීවාක් මෙන් ම්ලේච්ඡ ජාතීන් අතර පවා, අශිෂ්ටයන් අතර පවා, ඔවුන්ගේ කණ්ඩායමේ ප්‍රධානියාට උත්පත්තියෙන් හෝ පාරම්පරිකව හෝ එසේත් නැති නම් ඔහුගේ තෙදබල අනුව හෝ යම් කිසි විශෙෂ බලයක් තිබුණා. අදත් ප්‍රධාන රාජ්‍ය පාලකයාට සෙවෙනි බලයක් තිබෙනවා. ඒ ගැන තර්ක කරන්න වුවමනාවක් නැහැ. ඒ අනුව, රාජරත්න මහතාට දී තිබුණු දඬුවම අග්‍රාණ්ඩුකාරතුමා ලිහිල් කළා. මේ තීන්දුව වෙනස් කිරීම සිදු වුණේ රාජරත්න මහත්මයා හිරේ වැටුණාට පසුවයි. කරුණු එසේ ව තිබියදී තමුන්නාන්සේලා මගෙන් අහනවා ඇයි මේ ගැන ප්‍රකාශයක් කරන්න බැරි කියා. ඔහුගේ තත්ත්වය මොකක්ද? මේ ගරු සභාවට ආයිත් එන්න ඔහුට පුළුවන්ද? යනාදී ප්‍රශ්න අහනවා. ඒවා අපට අයිති වැඩ නොවෙයි. අග්‍රාණ්ඩුකාරතුමා එතුමාට නිදහසක් දුන්නේ මන්ත්‍රීවරයකු හැටියට සලකා නොවෙයි. සෑම දෙනාම එක හා සමාන පුරවැසියන් හැටියට සැලකීමේ ප්‍රතිපත්තියට අනුව, යම් පෙත්සමක් ඉදිරිපත් කළාට පසුව. කටයුතු කළා. එසේ නැතිව එය කළේ යම් මන්ත්‍රීවරයකුට ආසනයක් හිමි කර දීමටවත් අහිමිකර දැමීමටවත් නොවෙයි. මේ ගැන ප්‍රකාශයක් කරන්න අපට ඇති අයිතිය මොකක්ද? එතුමාගේ ආසනය සම්බන්ධයෙන් කථා කිරීමට අපට අයිතියක් නැහැ. එතුමාගේ ආසනය රැකගැනීම හෝ නැති කරගැනීම එතුමාට අයිති වැඩක්. මාස දෙකකින් පසුව එතුමා මෙම ගරු සභාවට ආවොත් කථා නායකතුමා ඒ ගැන බලාගනීවි.

එමෙන්ම එතුමාට අතුරු මැතිවරණයකට ඉදිරිපත් වන්නට සිදු වුණොත්, ඒ අනුව සුප්‍රිම් උසාවිය මගින් එතුමාට දුන් තීන්දුව සම්බන්ධයෙන් යම් විරුද්ධතාවක් ප්‍රකාශ කරන්න කැමති කෙනෙක් සිටියොත් ඒ අවස්ථාවේදී ඉදිරිපත් වේවි. අපට අයිති වැඩක් නොවෙයි මේ. මේ සම්බන්ධයෙන් අපේ ප්‍රකාශයක් වුවමනා කරන්නේ නැහැ.

මේ සම්බන්ධයෙන් ලොකු හිසේ කැක්කුමක් ඇති වී තිබෙන්නේ කුමක් නිසාද කියන එක මා දන්නවා. කවුරුත් දන්නවා රාජරත්න මහතා ලොකු උපවාසයක් කළ බව. එසේම එතුමා හිරේට නියම වුණු බවත් දන්නවා. ඒ සිද්ධිය මුල් කරගෙන බොහෝ දෙනා කරන්න බලාපොරොත්තු වුණේ වෙනත් දෙයක්. එළුවා යන විට උගේ එල්ලෙන එක වැටෙනකන් ඌ පස්සෙන් නරියා යන්නා වාගේ බොහෝ දෙනා රාජරත්න මහතා අද මැරේවි, හෙට මැරේවි, එම නිසා රටේ ලොකු කලබලයක් ඇති වේවි,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.]

එසේ වූ විට මෙවැනි ශ්‍රේෂ්ඨ වීර පුද්ගලයකු මැරෙන්නට මේ ආණ්ඩුව ඉඩ හැරියාය කියා ප්‍රචාරයක් ගෙන යන්නට පුළුවන් වේවි, කියන හැඟීමෙන් ඒ දෙස බලාගෙන සිටියා. ඔවුන් කී විධියට එතුමාට නිදහස දුන්නා නම්, "මෙන්න මේ ආණ්ඩුව කරපු වැඩේ. මන්ත්‍රීවරයෙක් ඕනෑම දඩබ්බර කමක් කරලා ඒකට දඬුවමක් ලැබුණු විට ඊට විරුද්ධව උපවාසයක් කළොත් එපම ණින්ම ඔහු නිදහස් කර හරින එකයි මේ ආණ්ඩුව කරන වැඩේ; මේ ආණ්ඩුව එතරම්ම දුර්වලයි". යනාදී වශයෙන් **කියමින්** රටේ ප්‍රචාරයක් ගෙන යාමට මේ අය සූදානම් වන බව අප දන්නවා. ඒ මන්ත්‍රීවරයා මිය ගියා නම් වැන් එකක දමාගෙන රට සෑම තැනම ඇවිදීවි, මේ ආණ්ඩුව අපේ ශ්‍රේෂ්ඨ වීරයකු මරා දැමුවාය කියමින්. එසේ ප්‍රචාරය කොට ආණ්ඩුව ගැන මහජනතාව කලකිරවාවි. ඒ අය බලාපොරොත්තුව සිටි එකම දෙයක්වත් හරි ගියේ නැහැ. බලා ගෙන හිටියාට අරක වැටුණේ නැහැ. එම නිසා තව තවත් ගමන් කරන එකයි කරන්නේ. ඒ අය අසාර්ථක ලෙස එම සිද්ධියෙන් පසුබැස්සා. ඒකයි නියම කතන්දරේ. තමුන්නාන්සේ ඒ බව පිළිගන්නවා ඇති.

රාජරත්න මහතා සමග තවත් 8 දෙනෙක් හිරයට නියම වූ බව තමුන්නාන්සේ දන්නවා ඇති. කෝ, ඒ අයගෙන් එක මිනිහෙක් ගැනවත් ඇහුවාද?

ජේ. ආර්. ජයවර්ධන මයා. (දකුණු කොළඹ පළමුවන මන්ත්‍රී)

(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்புத் தெற்கு முதலாம் அங்கத்தவர்)

(Mr. J. R. Jayewardene—First Colombo South)

මා ඇහුවා.

එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.

(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)

(Mr. N. H. A. M. Karunaratne)

තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා, එහෙම ඇහුවා නම්. බොහොම හොඳයි. තමුන්නාන්සේට හොඳ ගති තිබෙන නිසා එහෙම අසන්නට ඇති. නමුත් වැඩි දෙනාට මතක් වුණාද? කවුරුත් මිනිසුන් නොවෙයිද? ඒ අයට පංචස්කන්දයක් නැද්ද? ඔකයි කතන්දරේ. මේ කරුණු අනුව තමුන්නාන්සේට පේනවා ඔවුන්ගේ අදහස කුමක්ද කියා.

ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුව කරන්නේ මොනවාද කියා සමහර ගරු මන්ත්‍රීවරු නොයෙක් විධියට ප්‍රශ්න කළා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් නිතරම කියන්නේ තමුන්නාන්සේලා කරන්නේ මෙහෙමයි, අපි මෙහෙම කළේ නැහැ කියා. එක්සත් ජාතික පක්ෂය මේ මේ දේවල් කළාය කියා සමහර ගරු මන්ත්‍රීවරු ප්‍රකාශ කරනවා. කොයි මන්ත්‍රීවරයා කොහොම කීවත් මම එක්සත් ජාතික පක්ෂය කරපු දේ ගැන කථා කරන්නේ නැහැ. මම අයවැය ලේඛනය දෙවන වර කියවීම පිළිබඳ විවාදයේදී මගේ කථාවේදීත් කීවේ තමුන්නාන්සේලා නොකරපු දේ ගැනයි. මේ කථාවේදී කියන්නේත් තමුන්නාන්සේලා නොකරපු දේ ගැනයි. ගරු සභාපතිතුමනි, බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා. මයා.) ප්‍රකාශ කළා—"මිනිස්ටර් ඔප් අන්ජස්ටිස්"—අනීතිය අනුගමනය කරන ඇමතිතුමාය, කියා. නමුත් අපේ අධිකරණ ඇමතිතුමා මේ රටේ නීතිය වැටෙන්නට නොදී නිසියාකාර ආරක්ෂා කරන, නියම නීති ගරුක ඇමතිවරයකු බව මම සාක්ෂි ඇතිව පෙන්වන්නම්.

ගරු සභාපතිතුමනි, උසාවිවල සිංහලයෙන් නඩු ඇසීමට පණතක් ඉදිරිපත් කිරීම අයුක්තියක්ද කියා මම අහනවා. මේ රටේ සාමාන්‍ය ජනතාවට තේරෙන භාෂාවකින් මේ රටේ නඩු ඇසීමට පණතක් ඉදිරිපත් කළේ කව්ද? ඒ අපේ අධිකරණ ඇමතිතුමා බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. එය අයුක්තියක්ද කියා මම අහනවා. එපමණක්ද? තමුන්නාන්සේ දන්නවා ඇති, නීතිඥවරුන් වශයෙන් කටයුතු කරන ගරු මන්ත්‍රීවරු අපට වඩා හොඳින් දන්නවා ඇති, සාමාන්‍ය පුද්ගලයකුට ඇපල් නඩුවක් ඉදිරිපත් කරන්න ගියාම කොයි තරම් අමාරුකම් ඇති වෙනවාද යන්න. ඇපැල් වාතාවට සත 25ක මුද්දරයක් අඩුවෙලා තිබුණොත් ඇපල් ගන්න බැහැ. යම්කිසි වගන්තියක් හරියට ඇතුළු වෙලා නොතිබුණොත් එයින් ඇපැල නිෂ්ප්‍රභ වෙනවා. කාල සීමාව අඩුවෙලා තිබුණොත් එයින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇපෑල නිෂ්ප්‍රභ වෙනවා. මේ ගැන ඔය අනීති අනුගමනය කරනවාය කියන අපේ ඇමතිතුමා කළේ කුමක්ද? මුද්දර අඩු නම් සම්පූර්ණ ඇපෑල වීසි නොකර ඒ ඇපෑල් වාර්තාව ඉදිරිපත් කරන පුද්ගලයාට නියෝග කර ඒ පුද්ගලයාගෙන් එම මුදල අය කරන්න කටයුතු කළා. ඒවා අනීතිද? අඩු පාඩු තිබෙනවා නම් ඒවා හරි ගැස්වීම සඳහා කාලයක් දෙන්න මාර්ගය සලස්වා තිබෙනවා.

ඊළඟට අපේ ඇමතිතුමා කළේ මොන වාද? පොලීසියේ පොතක ලියාපු දෙයක් මෙපමණ කාලයක් කොයි මිනිහාටද බලා ගන්න පුළුවන්කම තිබුණේ? නමුත් ඒ පැමිණිලි සියල්ලක්ම පිළිබඳ සහතික පිට පත් විත්ති පක්ෂයේ හෝ වේවා, පැමිණිලි පක්ෂයේ හෝ වේවා, ඕනෑම කෙනකුට ලබා ගැනීමට අද පුළුවන්කම තිබෙනවා. මේවා කළේ මගේ අධිකරණ ඇමතිතුමා බව මම තමුන්නාන්සේලාට කියා සිටිනවා. එපමණක්ද? මීට කලින් වෛද්‍ය වරයකු සාක්ෂියකට කැඳෙව්වොත් ඔහුට කී දවසක් උසාවියට එන්නට සිදු වෙනවාද? ඒ නිසා දුප්පත් කෙනකුට නඩුවකට කොපමණ මුදලක් වියදම් කරන්න සිදු වෙනවාද? අද පුළුවන්කම තිබෙනවා, වෛද්‍යවරයකුගෙන් නියම සහතිකයක් ඉදිරිපත් කරන්ට. අවශ්‍ය නම් පමණයි, වෛද්‍යවරයා ගෙන්වන්නට සිදුවන්නේ. විත්ති පැමිණිලි දෙපක්ෂයටම ඒ බලය තිබෙනවා. එවැනි ලිහිල් මාර්ග ඇති කිරීමෙන් කරන්නේ අනීතියක්ද කියා මම තමුන්නාන්සේගෙන් ප්‍රශ්න කරන්නට කැමතියි. ඔය විධියේ වැඩ එක්සත් ජාතික පක්ෂය කළාද කියා මම අහනවා. අපේ ආණ්ඩුව මේ විධියේ සේවයකුයි කරගෙන යන්නේ.

ගරු සභාපතිතුමනි, මම වැඩි දුර කථා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. ගරු මන්ත්‍රීවරු, මේ කරුණුවලින් සෑහීමට පත් වේය කියා මම හිතනවා. රාජරත්න අර්බුදය නැත්නම් වෙනත් නඩු ඇදල ගැනීමෙන් කිසි වැඩක් වන්නේ නැහැ. ඔය කරුණු අනුව අපට මඩ ගැසීමට ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාට (ඩබ්ලිව්. දහනායක මයා.) බැරි බව මම තමුන්නාන්සේට කියන්නට කැමතියි. අපේ ගරු අධිකරණ ඇමතිතුමාගේ ක්‍රියා මාර්ගය ඉතාමත් ශ්‍රේෂ්ඨ ක්‍රියා මාර්ගයක් හැටියට මේ සභාවට දක්වමින්, මෙපමණ වේලාවක් මට සවන් දීම ගැන මගේ ගෞරවය සහ කෘතඥතාව තමුන්නාන්සේලාට පිරි නමමින්, මගේ වචන සවලපය සමාප්ත කරනවා.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

Mr. Chairman, there is one small matter which I would like to raise arising out of a statement made by the hon. Parliamentary Secretary to the Minister of Local Government and Housing (Mr. Pasqual) when he accused the *ex*-Solicitor General, Mr. A. H. M. Ameer, of building some houses on a block of reservation. Mr. Ameer has just written to me saying that this is a total falsehood. He says that he has not put up any building in this place and he has no block of reservation in the electorate of Matugama.

කේ. එච්. ජී. ඇල්බට් මයා.
(திரு. கே. எச். ஜீ. அல்பேட்)
(Mr. K. H. G. Albert)

නාත්තාගේ ඉඩම් එහෙ තිබෙනවා. නාත්තාගේ ඉඩම්වලයි අමීර් ගෙවල් හදන්නෙ.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

The accusation was against Mr. Ameer. I have the letter from Mr. Ameer in my hand and I thought it was my duty to read the letter because a report has appeared in the newspapers about this matter. Mr. Ameer says he has put up no buildings and he has no block of reservation and the statement made is completely untrue.

ආර්. සිංගල්ටන්-සැමන් මයා. (පත් කරන ලද මන්ත්‍රී)
(திரு. ஆர். சிங்கல்டன்-சமன்—நியமன அங்கத்தவர்)
(Mr. R. Singleton-Salmon—Appointed Member)

Mr. Chairman, I would like to raise one matter under this Head. I am sorry I was not here earlier in order

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිංගල්ටන්-සැමන් මයා.]

to do so. I would like to know from the hon. Parliamentary Secretary what the position is with regard to the re-print of the Legislative Enactments of Ceylon. It is a question that I have raised for, I think, seven or eight years with successive Parliamentary Secretaries to Ministers of Justice. We have been told various stories. There was one U. N. P. Parliamentary Secretary who said that they had finished with it and it was handed over to the Minister of Finance to be printed. The next year we were told that it was absolute nonsense and they had not finished yet. Could the hon. Parliamentary Secretary tell us what the position is at the moment about the re-print of the Legislative Enactments of Ceylon which has not been done since 1938 ? That they are in an absolutely chaotic state, I think every lawyer will agree. Twenty three years of amendments to all the Legislative Enactments !

I think it was Act No. 2 of 1956 which authorizd the re-print of these Enactments. The House had voted certain moneys for this purpose for very many years since 1956. After all, I realize it is only five years ago, but surely in five years something can be done. At one time we were told that they were held up because of the rather longer piece of legislation like the Penal Code, the Criminal Procedure Code. I appealed at that time—that must have been about four years ago—that surely that could be re-printed separately and the re-prints of the small Acts could be got on with.

I would appreciate if the hon. Parliamentary Secretary could give us some idea of whether the re-print will come in our lifetime or not.

එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.
(திரு. என். எச். ஏ. எம். கருணாரத்ன)
(Mr. N. H. A. M. Karunaratne)

Mr. Chairman, I made an explanation with regard to the Legislative Enactments. I think the hon. Member could not follow it because it was made in Sinhalese. The position is that all the twelve parts are ready. We have printed them and I think within the course of the next week or so you will have them for your perusal.

සිංගල්ටන්-සැමන් මයා.
(திரு. சிங்கல்டன்-சமன்)
(Mr. Singleton-Salmon)

I look forward to reading it.

"53 වන ශීර්ෂයෙහි "අධිකරණ අමාත්‍ය" විෂය සම්බන්ධයෙන් වැය සම්මතය රුපියල් 10 කින් අඩු කළ යුතුය." යන ප්‍රශ්නය විමසන ලදි.

කටහඬවල් අනුව "විරුද්ධ" මන්ත්‍රීන්ට ජය බව සභාපති විසින් ප්‍රකාශ කරන ලදි.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

Divide by name !

කාරක සභාව මතු පළ වන අන්දමට—පක්ෂව 17 ; විරුද්ධව 32 ; යනුවෙන්—බෙදුනේය :

පක්ෂව

පී. ඩී. ඉඹුලාන මයා.
ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
ලෙස්ලි ගුණවර්ධන මයා.
ජේ. ආර්. ජයවර්ධන මයා.
ගාමනී ජයසූරිය මයා.
ආර්. ඩබ්ලිව්. තෙන්නකෝන් මයා.
ඩබ්ලිව්. දහනායක මයා.
එම්. එච්. එම්. නසීනා මරික්කාර් මයා.
ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්, කේ.බී.ඊ.
ආචාර්ය එන්. එම්. පෙරේරා
එම්. ඩී. බණ්ඩා මයා.
අනිල් මුණසිංහ මයා.
ඒ. රත්නායක මයා.
ලක්ෂ්මන් රාජපක්ෂ මයා.
එම්. සිවසිතම්පරම් මයා.
ඕ. පී. ජේ. සෙනෙවිරත්න මයා.
බර්නාඩ් සොයිසා මයා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විරුඬව

ගරු සී. පී. ද සිල්වා
ගරු මෛත්‍රීපාල සේනානායක
ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන
එන්. එච්. ඒ. එම්. කරුණාරත්න මයා.
ඒ. අදිකාරි මයා.
කේ. එච්. ජී. ඇල්බට් මයා.
පී. ද එස්. කුලරත්න මයා.
ඩී. එම්. ගුණසේකර මයා.
ලක්ෂ්මන් ජයකොඩි මයා.
එස්. ඩී. ආර්. ජයරත්න මයා.
පී. ඩී. ජයසුන්දර මයා.
එල්. බී. ජයසේන මයා.
ඩී. ඊ. තිලකරත්න මයා.
ලක්ෂ්මන් ද සිල්වා මයා.
කේ. බී. ඩී. පෙරේරා මයා.
ආර්. එස්. පෙරේරා මයා.
ආර්. එස්. වී. පෝලියර් මයා., සී.බී.ඊ.
ටී. විලියම් ප්‍රනාන්දු මයා.
එස්. ඩී. බණ්ඩාරනායක මයා.
පී. බී. බාලසූරිය මයා.
චන්ද්‍රසේන මුනවීර මයා.
ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.
පී. ආර්. රත්නායක මයා.
සී. එස්. රත්වත්තෙ මයා.
වෛද්‍යාචාර්ය එස්. ඒ වික්‍රමසිංහ
විජයබාහු විජයසිංහ මයා.
ඊ. වීජේසූරිය මයා.
ලීලානන්ද විරසිංහ මයා.
ඩී. එස්. සමරසිංහ මයා.
ඩී. ජී. එච්. සිරිසේන මයා.
ඩබ්ලිව්. ජී. එම්. ඇල්බට් සිල්වා මයා.
ආර්. සිංගල්ටන්-සැමන් මයා., සී.බී.ඊ.

"53 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය සඳහා රු. 4,74,724 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

53 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Vote No. 2.—Administration Charges —Recurrent Expenditure, Rs. 79,224

"53 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය සඳහා රු. 79,224 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

53 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Vote No. 3.—Administration Charges —Capital Expenditure, Rs. 400,000

"53 වන ශීර්ෂයෙහි 3 වන වැය සම්මතය සඳහා රු. 4,00,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

53 වන ශීර්ෂයෙහි 3 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Vote No. 4.—Services provided by the Department—Recurrent Expenditure, Rs. 50,000.

"53 වන ශීර්ෂයෙහි 4 වන වැය සම්මතය සඳහා රු. 50,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

53 වන ශීර්ෂයෙහි 4 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Head 54.—Revision of the Legislative Enactments and Subsidiary Legislation

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 14,475

"54 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය සඳහා රු. 14,475 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

54 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝ කරන ලදි.

Vote No. 2.—Administration charges —Recurrent Expenditure, Rs. 400

"54 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය සඳහා රු. 400 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

54 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Head 55.—District Courts

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 2,584,290

"55 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය සඳහා රු. 25,84,290 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

55 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Vote No. 2.—Administration Charges —Recurrent Expenditure, Rs. 244,190

"55 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය සඳහා රු. 2,44,190 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

55 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Head 56.—Court of Requests and Magistrate's Courts

Vote No. 1—Personal Emoluments and other allowances of staff, Rs. 2,166, 473

"56 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය සඳහා රු. 21,66,473 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

56 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Vote No. 2.—Administration charges —Recurrent Expenditure, Rs. 282,448

"56 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය සඳහා රු. 2,82,448 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

56 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝ කරන ලදි.

Head 57.—Fiscals

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 1,570,551

"57 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය සඳහා රු. 15,70,551 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

57 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Vote No. 2.—Administration charges —Recurrent Expenditure, Rs. 1,164,389

"57 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය සඳහා රු. 11,64,389 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

57 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Head 58.—Conciliation Boards

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 66,500

"58 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය සඳහා රු. 66,500 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

58 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝ කරන ලදි.

Vote No. 2.—Administration charges —Recurrent Expenditure, Rs. 7,750

"58 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය සඳහා රු. 7,750 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

58 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝ කරන ලදි.

Head 59.—Attorney-General

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 958,165.

"59 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය සඳහා රු. 9,58,165 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

59 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Vote No. 2.—Administration charges —Recurrent Expenditure, Rs. 330,620

"59 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය සඳහා රු. 3,30,620 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

59 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Head 60.—Legal Draftsman

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 366,115

"60 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය සඳහා රු. 3,66,115 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

60 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Vote No. 2.—Administration charges —Recurrent Expenditure, Rs. 8,223

"60 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය සඳහා රු. 8,223 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

60 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Head 61.—Rural Courts

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 1,261,000

"61 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය සඳහා රු. 12,61,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

61 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Vote No. 2.—Administration charges —Recurrent Expenditure, Rs. 183,437

"61 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය සඳහා රු. 1,83,437 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

61 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Head 62.—Debt Conciliation Board

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 67,648

Sub-head 1.—Cadre and Salaries, Rs. 21, 387

ජයසූරිය මයා.
(திரு. காமினி ஜயசூரிய)
(Mr. Jayasuriya)

I move, "That the Vote be reduced by Rs. 10 in respect of sub-head 1, item 'Secretary (Temporary)'".

As far as I know, the Debt Conciliation Board has been in existence for over 10 to 15 years. But I find under this Head that the Secretary of the Board holds a temporary appointment. The 3 clerks, 2 stenographers, 1 binder, 1 karyala karya sahayaka and 1 labourer are all temporary. Nine out of the thirteen employees in this office are all temporary.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

The Board is temporary.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

Well, if the Board is temporary, how long are you going to have it temporary? The Board has been in existence for close on 15 years. I would like to have an explanation on this. People have been working there for over 10 years and are still under this temporary category. This is a most peculiar state of affairs. I wish to have some explanation in regard to this matter.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I wish to raise the same matter with regard to the temporary nature of the service of a number of these employees. The stenographers, clerks, labourer and others have had to spend a good portion of their lives on a temporary basis. Are they at least assured of permanent employment elsewhere? That is what is worrying us. We have no objection to the Debt Conciliation Board being temporary on the basis that some day it will be wound up and there will be no debts to be settled in the future. But I

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

notice that you have increased the general estimate. The amount of money to be spent on this Head has gone up under Votes 1 and 2, but you continue to have these persons, from the Secretary down to the labourer, on a temporary basis. If you are going to wind-up this board and, therefore, you are not going to make permanent appointments. is it not possible at least to give these people a guarantee that their services under this Board will be recognized and that they will be absorbed later in some permanent posts elsewhere ? If you do that they will be satisfied.

"62 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය සඳහා රු. 67,648ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

62 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Vote No. 2.—Administration charges —Recurrent Expenditure, Rs. 5,775

"62 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය සඳහා රු. 5,775 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

62 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Head 63.—Department of the Bribery Commissioner

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 360,973

"63 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය සඳහා රු. 3,60,973 ක මුදල උප ලේඛනයට ඇතුළත් විය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

63 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Vote No. 2.—Administration charges —Recurrent Expenditure, Rs. 77,800

"63 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය සඳහා රු. 77,800 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

63 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය, උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Head 64.—Official Language Department

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 1,402,585

Sub-head 1.—Cadre and salaries, Rs. 857,608

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I move, "That the Vote be reduced by Rs. 10 in respect of sub-head 1, item 'Commissioner for Official Language Affairs' (Apportionment No. 1)".

There was a post of temporary translator advertised recently. I believe it is for your Temporary Central Translation Bureau. An examination was held and 50 applicants sat for this examination. Thereafter a certain number were chosen for an interview at which the formality of going through the certificates was required. I understand that, for no discoverable reason, it is not the person who came first in the test who is to be appointed but somebody else. The appointment was to be made on the applicant's merits, qualifications, character and everything else. If there is nothing that can be said against the person who came first in the examination, he should have priority in the matter of appointment. But, apparently, he is to be set aside and somedoby else is to be appointed. I do not wish to mention names. This is a matter that the Hon. Minister should look into with a view to preventing any injustice being done to any person.

"64 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය සඳහා රු. 14,02,585 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

64 වන ශීර්ෂයෙහි 1 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Vote No. 2.—Administration charges —Recurrent expenditure, Rs. 161,370.

"64 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය සඳහා රු. 1,61,370 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

64 වන ශීර්ෂයෙහි 2 වන වැය සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

Head 70.—Minister of Industries, Home and Cultural Affairs

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 522,367.

Sub-head 1.—Cadre and salaries, Rs. 319,003

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

I move, "That the Vote be reduced by Rs. 10 in respect of sub-head 1, item 'Minister'."

ගරු සභාපතිතුමනි, කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ගැන කථා කරන විට මුලින්ම කියන්නට තිබෙන්නේ මෙම ඇමති අංශයේ වැඩ ඉතාමත්ම අමාරු පිළිවෙළකට සකස්කර තිබෙන බවයි. මේ අමාත්‍යාංශය යටතේ තිබෙන දෙපාර්තමේන්තුවල ගණන 20 ක් පමණ වෙනවා. මෙම දෙපාර්තමේන්තු 20 ඇමතිවරුන් තිදෙනකුට භාර දෙන ලෙස පසු ගිය අවුරුද්දේදී විරුද්ධ පක්ෂය විසින් කියන ලද බව තමුන්නාන්සේට මතක ඇති. දැනට නම් ඇමතිවරුන් තිදෙනකුගේ වැඩ එක ඇමතිවරයකුට පැවරී තිබෙනවා. කර්මාන්තත්, ස්වදේශ කටයුතුත්, සංස්කෘතික කටයුතුත් යන මේ සියල්ලේම බර එක ඇමතිවරයකුට දරන්නට බැරි බවයි, අප කල්පනා කරන්නේ. කොයි තරම් දක්ෂ කෙනකු වුණත් එක් ඇමතිවරයකුට ඔය තරම් වැඩ ප්‍රමාණයක් කරන්න බැහැ. ඇමතිවරුන් ගණන වැඩි කිරීම ප්‍රතිපත්තියක් හැටියට සුදුසු දෙයක්යයි අප කියන්නේ නැහැ. නමුත් වුවමනා තරමට වඩා අඩු පිරිසක් සිටීම වැඩට බාධාවක් නම් අමාත්‍යාංශ ගණන වැඩි කළ යුතුමයි. ඒ නිසයි, ඇමතිවරුන්ගේ සංඛ්‍යාව වැඩි කරන ලෙස අප ඉල්ලන්නේ. ගිය අවුරුද්දේත් විරුද්ධ පාර්ශ්වයෙන් මේ ඉල්ලීම කර තිබෙනවා. මේ අවුරුද්දේත් අප කියන්නේ දෙපාර්තමේන්තු 20 ක වගකීම එක් ඇමතිවරයකුට පවරා තිබීම අයුක්තියක් බවයි. එය ඒ ඇමතිවරයාට කරන අයුක්තියක්ය කියන්න පුළුවනි. පසුගිය දොළොස් මාසය තුළ මේ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු විස්සේ වැඩ හරියාකාර කරන්ට යම්කිසි විධියකින් ඒ ගරු ඇමතිතුමාට බැරි වුණා නම් ඊට වැරදිකාරයා ඒ ඇමතිවරයා නොව එතුමාට දෙපාර්තමේන්තු 20 ක් භාර දුන් ආණ්ඩුවය කියන්න පුළුවනි. මේ ආකාරයට කථා කිරීම ගැන තමුන්නාන්සේ මට සමාව දෙන්න ඕනෑ. මේ 20ම වැදගත් දෙපාර්තමේන්තු. ඒ නිසා අනෙක් අමාත්‍යාංශ සම්බන්ධයෙන් ගන්නවාට වඩා ටිකක් වැඩි වේලාවක් මේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් ගත කරනවාට තමුන්නාන්සේ මට සමා වෙන්න ඕනෑ.

ග්‍රාම සේවකයන් පත් කිරීම සම්බන්ධව මුලින්ම මතක් කරන්න කැමතියි. තව මාස ස්වල්පයකින් ග්‍රාම සේවකයන් පත් කිරීමට සියලුම විධිවිධාන සලසා තිබෙනවා. නොබෝදා විභාග දෙපාර්තමේන්තුව මගින් ඒ සඳහා විභාගයකුත් පවත්වා තිබෙනවා. ඒක බොහෝම හොඳ දෙයක්. ග්‍රාම සේවකයන් තෝරා ගැනීම සඳහා පැවැත්වෙන විභාගය, විභාග දෙපාර්තමේන්තුවට භාර දීම ගැන අපි සන්තෝෂ වෙනවා. ඒ විභාගයේ ප්‍රතිඵල අනුව ග්‍රාම සේවකයන් තෝරා ගන්නවා නම් අපට සන්තෝෂ වෙන්න පුළුවනි. එහෙත් ග්‍රාම සේවකයන් තෝරා පත් කරන්නේ විභාගයේ ප්‍රතිඵල අනුව නොව, වෙනත් ගුප්ත ක්‍රමයකටය කියා අපට නොයෙක් පළාත්වලින් ආරංචි ලැබී තියෙනවා.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ඒ බොරු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகநாயக்க)
(Mr. W. Dahanayake)

ගුප්ත ක්‍රමයක් නැතෙයි කියනවා නම් අපි සන්තෝෂ වෙනවා. අගෝස්තු 14 වෙනි සඳුදා ජනතා පත්‍රයේ පළමුවන පිටුවේ තිබෙන ආරංචියක් ගරු ඇමතිතුමාගේ දැනගැනීම පිණිස කියවන්න කැමතියි. එහි තිබෙන්නේ මගේ අදහසක් නොවෙයි. වැදගත් ප්‍රවෘත්ති පත්‍රයක පළමුවන පිටුවේ තිබෙන ආරංචියක් නිසයි, මා එය කියවන්ට බලාපොරොත්තු වන්නේ :

ග්‍රාම සේවක සුදුස්සන් සොයයි. ගම්පහ ජනතා වාර්තාකරු විසිනි. ගම්පහ ආසනය තුළ තිබෙන ගම්වලට ග්‍රාම සේවක නිලධාරීන් තෝරා ගැනීම සම්බන්ධයෙන් ඒ ඒ ගම්මුලාදැනි කොට්ඨාශ තුළ ඇති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලුම කොමිටිවලට සාකච්ඡා කර සුදුස්සන් කවුරුද යනු වහා දන්වන ලෙස ගම්පහ පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. ඩී. බණ්ඩාරනායක මහතා පක්ෂ ශාඛාවන්ට දන්වා තිබේ.

එසේ ඒකමතිකව ඒ ඒ ගම්වලට ග්‍රාම සේවකයින් වශයෙන් පත් කිරීමට සුදුසු අය තීරණය කිරීම අපහසු නම් නුසුදුස්සන් කවුරුන් දැයි නම් කර සතියක් ඇතුළත තමාට දන්වන ලෙස වැඩි දුරටත් දන්වා ඇත.

ඊළඟට ගරු සභාපතිතුමනි, ඊයේ පළ වූ ජනතා පත්‍රයේ 6 වැනි පිටුවේ "ජනහඬ" නමැති තීරයේ කොළඹ 12 පදිංචි පියදාස ගමගේ නමැති මහතකු පළ කර තිබෙන ලිපියෙන් කොටසක් මා දැන් කියවනවා. එය මෙසේයි :

රජය කෙතරම් අපක්ෂපාතව ග්‍රාම සේවකයන් තෝරා ගන්නා බව පළ කළත් 1961 අගෝස්තු 14 දා "ජනතා" පත්‍රයේ මුල් පිටුවේ පළ වූ වාර්තාව කියවීමෙන් හැම විභාගාපේක්ෂකයෙක්ම කනස්සල්ලට පත් වී ඇති බව පැහැදිලිය. ග්‍රාම සේවකයින් තෝරා ගැනීම සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ට බලතල පවරා ඇති බවට හොඳ නිදසුනකි මේ.

ගරු සභාපතිතුමනි, මේ කාරණය පිළිබඳව රටේ එක්තරා මහජන මතයක් පැන නැඟ තිබෙන බව ජනතා පත්‍රයේ පළ වූ මේ ලිපි දෙකෙන්ම පෙනී යනවා ඇති. ඒ නිසා ග්‍රාම සේවකයන් පත් කරන විට දේශපාලන බලපෑම්වලින් තොරව සුදුස්සන් පමණක් ගරු ඇමතිතුමා තෝරා ගන්නවා ඇතැයි මම හිතනවා. ඇමතිතුමාගේ අදහස පිරිසිදු නිසා, මෙම ගරු සභාවට ප්‍රකාශයක් කොට රටේ පැතිරී තිබෙන දූසමාන ආරංචි නැති කර දමන්ටය කියා මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ අය පත් කරන විට දේශපාලන බලපෑම් වලින් තොරව සුදුස්සන් පත් කරාවිය කියාත් විශ්වාස කරනවා.

මීළඟට ගරු සභාපතිතුමනි, සුරා සම්බන්ධයෙන් මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ගැන මා වචන ස්වල්පයක් කියන්න කැමතියි. සුරා සම්බන්ධයෙන් දැනට තිබෙන ප්‍රතිපත්තිය සංශෝධනය කර දැනට රටේ තදින් පවත්නා කසිප්පු උවදුර නැති කිරීමට විධිවිධාන සලස්සන වාය කියා දැනට අවුරුද්දකට පමණ උඩදී ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා රටට පොරොන්දුවක් දුන්නා. දැන් නම් අවුරුද්දක් පසු වී තිබෙන නමුත් අනු ගමනය කරන්නේ මොන විධියේ ක්‍රියා මාර්ගයක්ද කියා තවම පෙනෙන්ට නැහැ. ගරු ඇමතිතුමාගේ නියෝගයක් අනුව ඒ ඒ පළාතේ තිබෙන්නාවූ ප්‍රාදේශීය කාරක සභාවලද ඒ පිළිබඳව සාකච්ඡා කොට යම් යම් තීරණ ඇමතිතුමාට යවා තිබෙන බව මතක් කරන්න කැමතියි.

කිතුල් ගස් සම්බන්ධයෙන් පණවා තිබෙන රෙගුලාසිය ගැන මම විශේෂයෙන් සඳහන් කරන්න කැමතියි. තල්පේ පත්තුවේ සහ හිනිදුම් පත්තුවේ කිතුල් ගස් මැදීමට විශේෂ බලපත්‍රයක් සකස් කර දීම ගැන කල්පනා කරන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)
රැස්වීම විනාඩි 30කට අත් සිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகநாயக்க)
(Mr. W. Dahanayake)

සභාපතිතුමනි, කිතුල් ගස් මැදීම සම්බන්ධයෙන් 1959 ජූලි මාසයේ 1 වන දා සිට අළුත් නීතියක් පනවන්නට යෙදුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එනම්, කිතුල් ගස් මැදීමට බලපත්‍රයක් ලබා ගැනීමට වුවමනාය කියායි. මෙම කාරණාව සුරාබදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයාගේ වාර්තාවේ 38 වන පිටුවේ සඳහන් වී තිබෙනවා.

"The licensing of kitul trees for tapping of sweet toddy was re-introduced with effect from July 1, 1959."

1959 ජූලි මාසයේදී කැබිනට් මණ්ඩලයේ සිටි කෙනෙක් හැටියට මට නම් මතක නැහැ, මෙම ප්‍රශ්නය ගැන එවැනි තීන්දුවක් කැබිනට් මණ්ඩලයෙන් ගත්තාද නැද්ද කියා. කැබිනට් තීන්දුවක් නොගෙනම දෙපාර්තමේන්තුව මගින්ම මෙම තීන්දුව ගෙන ඇති බවයි මම කල්පනා කරන්නේ. කොහොම වුණත්, මෙම තීන්දුව අනුව හුඟක් දෙනකුට තමන්ට තිබුණ එකම රක්ෂාව නැති වී ගොස් තිබෙනවා. එය වැඩි වශයෙන්ම ගාලු දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවටත්, හිනිදුම පත්තුවටත් බල පාන ප්‍රශ්නයක් බව මම කියන්න කැමතියි. මෙම තීන්දුව නිසා කිතුල් ගස් මදිමින් සිටි අයට පමණක් නොව, කිතුල් පැණි සහ හකුරු කර්මාන්තයේ යෙදී සිටි අයටත් රක්ෂාව නැති වී ගොස් තිබෙනවා. ඒ හේතුකොටගෙන දැන් කිතුල් පැණි සහ කිතුල් හකුරු කියන දෙය සොයා ගන්නම බැහැ, ඇත්තෙම නැහැ. අපි දන්නවා කිතුල් හකුරු සහ කිතුල් පැණි ඉතාමත් පෝෂ්‍යදායක ආහාරයක් බව. දියවැඩියාවෙන් පෙළෙන ලෙඩුන්ට කිතුල් පැණි කන්නය කියා වෛද්‍යවරුන් පවා උපදෙස් දෙනවා. එම නිසා බොහොම රසවත්, ඒ වාගේම ලෙඩට ගුණ කෑමක් එක අතකින් මහජනයාට නැතිව තිබෙන අතර, අනික් අතින් හුඟක් දෙනකුට රක්ෂාව නැති වී තිබෙනවා. මම කල්පනා කරනවා 1959 දී මෙම රෙගුලාසිය ඇති කෙළේ වැඩි දුර කල්පනා කරන්නේ නැතිවය කියා. ඒ දවස්වල කිතුල් ගස් මැදීමට අවසර දීමට විරුද්ධව මොන මොන විධියේ උද්ඝෝෂණ තිබුණාදැයි කියන්න ඕනෑ නැහැ. පිටිසර බද ජනතාවට 1959 ට පෙර මෙන් කිතුල් ගස් මැදීමට අවසර දෙන්නය කියා, ඒ සඳහා නීතියෙන් ඉඩකඩ සලසන්නය කියා, මා ඉතා කරුණාවෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගාලු දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන්ගේ ඒකාබද්ධ කොමිටිය විසින්ද ඒ සියළු දෙනාගේම එකඟත්වය ඇතිව මේ අවසරය ඉල්ලා තිබෙනවා. ගාලු දිස්ත්‍රික්කයෙන් පමණක් නොවෙයි, වෙනත් පළාත්වලින්ද මේ ආකාරයෙන් අවසර ඉල්ලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, 1959 වර්ෂය තුළ "ට්‍රී ටැක්ස්" වශයෙන් හෙවත් ගස් මැදීමට අවසර දීමෙන් යාපනය දිස්ත්‍රික්කයෙන් ලැබී ඇති ආදායම රුපියල් 7,14,510 ක් වෙනවා. මේ බව සුරාබදු කොමසාරිස්වරයාගේ වාර්තාවෙන් පැහැදිලි වෙනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

The revenue derived from tree tax in the area in the Jaffna District for 1958/59 was Rs. 714,510.

ගරු සභාපතිතුමනි, ගාලු දිස්ත්‍රික්කය තුළ ගස් මැදීමේ අවසරය දෙනවාද නැද්ද කියා ගරු ඇමතිතුමාගෙන් මම ප්‍රශ්න කරනවා. දැන් මේ සභාවේදී එයට පිළිතුරු දෙන්න බැරි නම් ළඟදීම එයට උත්තරයක් දෙන්නය කියා අප ඉල්ලා සිටිනවා. මේ ආකාරයෙන් අවසර ඉල්ලා සිටින්නේ කාරණා තුනක් මුල් කොට ගෙනයි. එක කාරණයක් තමයි, කසිප්පු වසංගතය නැති කිරීම. දෙවැන්න, රැකී රක්ෂා ප්‍රශ්නය තරමක් දුරටවත් විසඳීම. විශේෂයෙන්ම ගාලු දිස්ත්‍රික්කය තුළ රැකී රක්ෂා හිඟකමේ ප්‍රශ්නය බෙහෙවින් බලපවතිනවා. එම නිසා සැළකිය යුතු සංඛ්‍යාවකටවත් රක්ෂා ලබාදීමට මේ නිසා පහසු වෙනවාට කිසිම සැකයක් නැහැ. තුන්වැනි කාරණය නම් ගස් බදු දීම නිසා ලැබෙන ආදායම පළාත් ආණ්ඩු සභාවලට ලබාගැනීමට නීතියෙන් ඉඩකඩ සලසා ගැනීමයි. මේ නිසා පළාත් ආණ්ඩු සභාවකට වේවා ගම්සභාවකට වේවා ලොකු ආදායමක් ලබාගන්නට පුළුවන් වෙනවා. ගරු සභාපතිතුමනි මේවා ගැන වාද විවාද කරන්න, රන්ඩු වෙන්න අපට වුවමනා කමක් නැහැ. අප අවංක ඉල්ලීමක් කර තිබෙනවා. අපගේ වැටහීමේ හැටියට මෙය ඉතාමත් වැදගත් යෝජනාවක්. එම නිසා මේ කාරණය ගැන ඉක්මනින් තීරණයක් දෙන්නය කියා මා තමුන්නාන්සේගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමාට මේ ගරු සභාවේදී කියන්නට බැරිද, මේ සම්බන්ධයෙන් ළඟදීම තීන්දුවක් දෙනවාය කියා.

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමාට මතක් කරන්නට කැමැතියි, මේ නොබෝදා නීති ගණනාවක්ම ඇතිකිරීමෙන් ලංකාවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

සියළු දෙනාගේම ප්‍රශංසාව ලබාගත් බව. එයින් එක් වැදගත් නීතියක් තමයි හොර ඔට්ටු පොළවල් පැවැත්වීම අවහිර වන පරිදි නීතියක් ඇති කිරීම. නමුත් මේ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගෙන් උපදෙස් ලබා ගන්නේ නැතුව, මේ ගැන සාකච්ඡා කරන්නේ නැතුව, නීතිය හරිහැටි ක්‍රියාවේ යොදවන්නේ නැතුව, හිතුමතේ කටයුතු කර ගෙන යාමේ ප්‍රතිඵලයෙක් වශයෙන් දැන් පසුගිය කාලයේදී තිබුණාටත් වඩා හොර ඔට්ටුපොළවල් වැඩි දියුණු වී තිබෙනවා. එම නිසා මේ ගැන සොයා බලා, විශේෂයෙන් මේ නීති හරිහැටි ක්‍රියාවේ යෙදවීමට පොලීසියට බලකර සිටින ලෙස මා ඉල්ලා සිටිනවා.

හොර ඔට්ටු පොළවල් වාගේම කැසිනෝවල් වල පැවැත්වෙන සූදු නැවැත්වීමට තමුන්නාන්සේ කටයුතු යොදනවා ඇතැයි මම කල්පනා කරනවා. තවමත් කැසිනෝවල් වල පෙර මෙන්ම සූදු පවත්වා ගෙන යනවා. තවත් කිව යුතු වැදගත් කාරණයක් තිබෙනවා. ජැක්පොට් නමින් හඳුන්වන අයුතු අන්දමේ මුදල් ගසා කෑමේ ව්‍යාපාරය නවත්වන්නට නීති ඉදිරිපත් කළත් ඒ නීති හරිහැටි ක්‍රියාවේ යෙදී නැති බව අපට බොහෝ අවස්ථාවලදී පෙනී ගොස් තිබෙනවා. එම නිසා නොයෙක් ආකාරයෙන් මහ ජනයාගේ මුදල් ගසාකන මේ ව්‍යාපාර, මේ සූදු නවත්වා දැමීමට දැනට පණවා ඇති නීති ඊති ප්‍රමාණවත් නැත්නම්, ඒවා ක්‍රියාවේ යෙදවීමට යම්කිසි බාධාවක් ඇත්නම්, ඒවා නැතිකර දැමීම සඳහා සංශෝධන ගෙනාවොත් සෑම මන්ත්‍රීවරයකුගේම සහයෝගය සම්පූර්ණයෙන්ම ලැබෙනවාට කිසිම සැකයක් නැහැ. බොහෝ වේලා කථා පවත්වන්නේ නැතුව ඒ සියලුම සංශෝධන නීති ඉක්මනින්ම සම්මත කර දෙනවා. තමුන්නාන්සේට මතක ඇති මේ නීති 3 ම කිසිත් කථාවක් නැතුව මේ සභාව සම්මත කළ බව. ඒ විධියටම මේ සංශෝධන නීති හෙට ගෙනාවොත් හෙටම අපි සම්මත කර දෙනවා. එම නිසා කරුණා කර තමුන්නාන්සේ පටන් ගත් මේ ව්‍යාපාරය සාර්ථක වන තුරු නියම පිළිවෙළට කරගෙන යන මෙන් අපි ඉල්ලා සිටිනවා.

මීළඟට, සංස්කෘතික දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු සම්බන්ධව යමක් කිය යුතුව තිබෙනවා. සංස්කෘතික දෙපාර්තමේන්තුව පිළිබඳ නොයෙක් කරුණු ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් මේ නොබෝදා අපට දැන ගන්නට ලැබුණා. කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමා, (සෝමවීර චන්ද්‍රසිරි මයා.) සංස්කෘතික දෙපාර්තමේන්තුව අසභ්‍ය පොත් ප්‍රසිද්ධ කිරීමට ධෛර්ය දෙනවා යයි චෝදනාවක් ඉදිරිපත් කර තිබුණා. ඒ පිළිබඳව ගරු ඇමතිතුමා ඉතා පරීක්ෂාකාරීව කටයුතු කරන්න ඕනෑ. ඒ කාරණය පිළිබඳව මම ඇමතිතුමාට අවවාදයක් නොදෙන්නේ, විශේෂඥ පිරිසක් විසින් සාහිත්‍ය පොත් සම්බන්ධයෙන් එතුමාට උපදෙස් දෙන නිසයි. ඒ කරන ලද සියලුම චෝදනාවලින් එක කරුණක් අපට පැහැදිලිව පෙනෙනවා. අසභ්‍ය පොත් වන්නට පුළුවනි, නැති නම් නුසුදුසු ඉහළ පන්තියේ සාහිත්‍ය පොත් වන්නට පුළුවනි, ඒ කුමක් වුවත් දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු සතුටුදායක නැති තත්ත්වයක ඇති බව නම් පෙනෙනවා. සමහර අවස්ථාවලදී වැඩි උසස් තත්ත්වයක් නැති පොත්වලට පවා සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් ආධාර මුදල් දී තිබෙනවා. දෙපාර්තමේන්තුවෙන් නිකුත් කොට ඇති වාර්තාව කියවන විට කිසිත් ප්‍රසිද්ධයක් නැති පොත්වලට පවා ආධාර දී තිබෙන බව පෙනෙනවා. ඊට පසුවත් ඒවාට ප්‍රසිද්ධියක් ලබා ගැනීමට බැරි වී තිබෙනවා. එම නිසා සංස්කෘතික දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු පරීක්ෂාකර බැලිය යුතු යයි මම කියනවා.

සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ රජෝර්තුවේ සඳහන් වී තිබෙනවා, රුසියාවෙන් ගෙන්වන ලද නැටුම් කණ්ඩායමකට රුපියල් 26,000ක් වියදම් කළාය කියා. මා මේ ගැන සඳහන් කරන විට සමහරු හිතාවි, මම රුසියන් නැටුම්වලට විරුද්ධය කියා. මා එවැනි විරුද්ධත්වයක් ප්‍රකාශ කරනවා නොවෙයි. මේ මුදල් වියදම් වූයේ කෙසේද කියායි මම අහන්නේ. සංස්කෘතික දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂතුමාගේ වාර්තාවේ පෘ. 12 පිටේ රුසියන් නැටුම් කණ්ඩායම සඳහා වූ වියදම රුපියල් 26,092.52 යයි සඳහන් කර තිබෙනවා. එතරම් මුදලක් වියදම් කොට ඒ රුසියන් නැටුම් කණ්ඩායම ගෙනාවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මොකටද? එතරම් මුදලක් වියදම් කොට පිටරටකින් නැටුම් කණ්ඩායමක් ගෙන් වීම අවශ්‍යද? මම ඇමතිතුමාගෙන් කරුණාවෙන් ඉල්ලනවා, ඒ වෙනුවට එම මුදල රුහුණු නැටුම් කණ්ඩායම වෙනු වෙන් වියදම් කරන්න කියා. රුහුණු නැටුම් කලාවට උදව් දෙනවා මදි. උඩරට නැටුම් කලාවට විශෙෂ උදව් තිබෙන එක ඇත්තයි.

1959දී, ඒ කියන්නේ මා අධ්‍යාපන ඇමති වරයා වශයෙන් කටයුතු කළ කාලයේදී, රුහුණු නැටුම් කණ්ඩායම් මා කරා ඇවිත් පෙන්වා දුන් කරුණු අනුව මා එම නැටුම් අංශයට තැන ලබා දුන් හැටි මේ අවස්ථා වේදී මතක් කරන්න කැමතියි. රුහුණු නැටුම් ගාන්ධර්ව විභාගයේ එක විෂය යක් හැටියට පිළිගන්න ලෙස මා නියෝග කළා. නමුත් අද එය නැති කරලයි තියෙන්නෙ. මා යට කී විධියට රුහුණු නැටුම් කලාවට දුන් ආධාරය අද නැති කර දමලයි තියෙන්නෙ. රුහුණු නැටුම් කලාව වෙනුවෙන් සංස්කෘතික දෙපාර්ත මේන්තුව මගින් වැඩි වියදමක් කරන්නේ නැති බවයි කියන්න තිබෙන්නෙ. පිටරටින් එන ඒවාට රුපියල් විසිඅය දහසක් වියදම් කරනවා වෙනුවට එම මුදල අපේ රටේ දේ සඳහා වියදම් කරනවා නම් කවුරුත් සතුටු වෙනවා ඇති. මේ වාර්තාවේ අඩංගු කරුණු අනුව අපට ඒ බව පේනවා. එතරම් උසස් ලෙස පිළි ගන්න බැරි ඇතැම් දේ සඳහා විශාල වශ යෙන් මුදල් වියදම් කර තිබෙන බව පෙනී යනවා. එම නිසා සංස්කෘතික ඇමති අංශ යේ වැඩ කටයුතු ගැන තමුන්නාන්සේ වැඩි සැලකිල්ලක් දක්වා ක්‍රියා කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, දිවංගත එස්. ඩබ් ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා සංස්කෘතික දෙපාර්තමේන්තුවක් පිහි ටෙව්වේ මේ රටේ සංස්කෘතියට ධෛර්‍ය දීම පිණිසයි. හොඳ දේට ධෛර්‍ය දීමයි මේ අංශය මගින් සිදු විය යුත්තේ. කරුණු එසේ වුවත් වැදගැම්මක් නැති දේ සඳහා මුදල් වියදම් වෙන බවයි පෙනෙන්නෙ. එම ක්‍රියාව මේ දෙපාර්තමේන්තුව පිහිටු වීමේ මූලික පරමාර්ථයට විරුද්ධයි. එම නිසා මේ කරන වියදම් ගැන පරීක්ෂාකර බලන්නය කියා ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ප්‍රවේශමෙන් මේ මුදල් වියදම් කරන්න කල්පනා කරන්න ඕනෑ. කවුරු හරි පොතක් ලිව්ව පලියට, කවුරු හරි නාට්‍යයක් රඟදැක්වුව පලියට, කවුරු හරි චිත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වූ පලියට, ඒ සියල්ලටම ධෛර්‍ය දිය යුතුය කියා අප කියන්නේ නැහැ.

මා බොහොම සන්තෝෂ වෙනවා ගරු ඇමතිතුමාගේ එක්තරා තීන්දුවක් ගැන. අපේ රටේ නිපදවනු ලබන චිත්‍රපට සම් බන්ධයෙන් ගරු ඇමතිතුමා දක්වා ඇති සැලකිල්ල ගැන මා බොහොම සන්තෝෂ වෙනවා. මේ චිත්‍රපට අංශයෙහි සියලුම වැඩ කටයුතු සම්බන්ධයෙන් හොඳට පරීක්ෂා කර බලා සන්දේශයක් සකස් කිරීම සඳහා තමුන්නාන්සේ කොමිටියක් පත් කළාය කියා අප ප්‍රවෘත්ති පත්‍ර මාර්ග යෙන් දුටුවා. ඒ ගැන ප්‍රශංසා කරන්න ඕනෑ. අවුරුදු ගණනාවක පටන් ම සිංහල චිත්‍රපට නිපදවන බව අප දන්නවා. නමුත් සිංහල චිත්‍රපට කලාවට නියම විධියේ ධෛර්‍යයක් රජයෙන් ලැබී නැති බව මේ අවස්ථාවේදී මතක් කළ යුතුයි. චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලංකාවේ චිත්‍රාගාර ඇත්තේ නැහැ. එවැනි සුළු සුළු තැන් තිබෙන්න පුළුවනි. නමුත් ඉතා උසස් තත්ත්වයේ ඒවා නොවෙයි. එම නිසා නියම විධියට ශබ්ද ලබාගෙන, නියම විධි යට රඟපා, චිත්‍රපට නිෂ්පාදනය කරන්න කැමති අය ඉන්දියාව බලා යන්න ඕනෑ. ඒ අය ඉන්දියාවේ ස්ටුඩියෝවලට ගිහින් තමන්ගේ වැඩ කටයුතු කරගන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ඉන්දියාවට චිත්‍රපට නිපදවන්න යාම නිසා ඉබේම වැරදි කිප යක් සිදු වෙනවා. අපේ සිංහල සංස්කෘති යට දකුණු ඉන්දියානු සංස්කෘතිය මිශ්‍රවීම ඉන් සිදුවන එක් වරදක් හැටියට සල කන්න පුළුවනි. දකුණු ඉන්දියාවේ සරුව පින්තල සංස්කෘතිය අපේ සංස්කෘතිය සමග මිශ්‍ර වෙනවාට අප කැමති නැහැ. මා සිංහල චිත්‍රපට බොහොමයක් දැක තිබෙනවා. සෑම සිංහල චිත්‍රපටියක්ම වාගේ බොහොම ආසාවෙන් බලන්න යන කෙනෙක් මා.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

"සිම්බෝ" චිත්‍රපටිය කී සැරයක් බැලුවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩබ්ලිව්. දහනායක මයා
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

මා "සිම්බෝ" චිත්‍රපටිය බැලුවා. එක සැරයයි බැලුවේ.

ගරු සභාපතිතුමනි, ඒ විධියට අපේ සංස්කෘතියට ඔවුන්ගේ සංස්කෘතිය මිශ්‍ර වන්න ඉඩ දුන්නොත් මොකද වන්නේ? සිංහල චිත්‍රපටිවල සම්පූර්ණයෙන්ම වාගේ දකුණු ඉන්දියානු සංස්කෘතිය මැවී පෙනෙනවා ඇති. එම නිසා කොළඹ ක්‍රමය යටතේ ආඩාර ලබා ගෙන හෝ වෙන පිට රටකින් ආඩාර ලබා ගෙන හෝ ඉතාමත් උසස් විධියේ අංග සම්පූර්ණ, හොලිවුඩ් එකේ නිපදවන තරමටම ලස්සන චිත්‍ර පට නිපදවන්නට පුළුවන්, චිත්‍රාගාරයක් ආණ්ඩුව විසින් පිහිටුවන ලෙස මම තමුන්නාන්සේගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. උසස් චිත්‍රාගාරයක් පිහිටු වීම පෞද්ගලික ව්‍යාපාරිකයන්ට කරන්න බැරි දෙයක්. දැනට තමුන්නාන්සේ ගෙන යන ක්‍රියා මාර්ගය හරි. චිත්‍ර පට නිපදවන්න ඉන්දියාවට යන්න දෙන්න එපා. "ඩබ් කිරීමෙන්" පසු හෙවත් ඉන්දියාවේ චිත්‍රපටියක් අරගෙන මෙහෙ කට හඬ පමණක් කවා ඒ චිත්‍රපටිය සකස් කිරීමෙන් පසු ඒ චිත්‍රපටිය මෙහි පෙන්වීම තහනම් කිරීම හොඳ බවයි, මගේ අදහස. ඒ මන්ද? "ඩබ් කිරීමට" ඉඩ දුන්නොත් සිංහල චිත්‍රපටියට කවදාවත් ඉඩ ලැබෙන්නේ නැහැ. දකුණු ඉන්දියාවේ චිත්‍රපට කර්මාන්තය විසින් හැදීගෙන එන ලියලා ගෙන එන අපේ චිත්‍රපට කර්මාන්තය නැති කරනවාට කිසි අනුමානයක් නැහැ. එම නිසා තමුන්නාන්සේ මේ ගැන නිශ්ශබ්දව නොසිට සිංහල චිත්‍රපටිය හොඳ පිළිවෙළට දියුණු කිරීමට විධි විධාන යෙදීම ගැන මම සන්තෝෂ වෙනවා. ඉදිරියට මේ සම්බන්ධයෙන් තමුන්නාන්සේ අනුගමනය කරන්නේ මොන විධියේ ක්‍රියා පිළිවෙළක්ද යන්න අප දැන ගන්න කැමතියි.

තමුන්නාන්සේ යටතේ කලායතනය තිබෙනවා. ඒ කලායතනය ගැන මම වැඩි දුර කථා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. කුලරත්න වාර්තාව නමැති වාර්තාවක් තිබෙනවා. කුලරත්න මහත්මයාගේ ප්‍රධානත්වයෙන් කලායතනයේ වැඩ කට යුතු ගැන පරීක්ෂා කර බැලූ කොමිසන් සභාව කලායතනය දියුණු කිරීමේ වැඩ පිළිවෙළක් මේ වාර්තාවෙන් පෙන්වා දුන්නා. ඒ එකම රෙකමදාරුවක්වත් තවම ක්‍රියාවේ යෙදී නැහැ. විශෙෂයෙන්ම, කලායතනයේ ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ට රක්ෂා සපයාදීම ආණ්ඩුවේ යුතුකමක්. කලායතනයට ලොකු වියදමක් කෙරෙනවා. එම වියදමින් ප්‍රයෝජනයක් ගන්නට වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. කලායතනයේ අවුරුදු 5ක් පුහුණු වන අයගෙන් සමහරෙක් ගිහින් අද ගම්මුලා දැනින් වෙනවා, ග්‍රාම සේවා විභාගයට පෙනී සිටිනවා. තමන් ඉගෙන ගත් ශිල්පයෙන්, තමන් ලබා ගත් දක්ෂකමින්, ඒ අයට ප්‍රයෝජනයක් නැහැ. එම නිසා කලායතනයේ පුහුණු වන සියලුම ශිෂ්‍යයන්ට ප්‍රයෝජනවත් රක්ෂා සපයාදීම සඳහා වැඩ කටයුතු යෙදීම තමුන්නාන්සේ භාර ගන්න ඕනෑ.

හිර ගෙදර දෙපාර්තමේන්තුව තිබෙන්නේත් තමුන්නාන්සේ යටතේයි. ඒ ගැන මම කියන්නේ එක කරුණක් පමණයි. හිර ගෙදරින් පිටවන හිරකරුවන්ට ආඩාර දෙන ක්‍රමයක් තිබෙනවා. ඒ විධියට ආඩාර දෙන්න ඕනෑ. නමුත් අද ආඩාර දීම කෙරෙන්නේ අඩුවෙනුයි. හිර ගෙදර සිට පිටවන අයට ආඩාරයක් දීමට ඇප මුදලක් ඉල්ලනවා. හිර ගෙදරින් පිට වූ එක පුද්ගලයකුට බර කරත්තයක් සහ ගොනකු ගැනීම සඳහා රුපියල් 600ක් දීමට ඇපකරුවකු ඉල්ලූ බව මම දන්නවා. ඇපකරුවකු ලබා ගන්නට බැරි වුණාම ඒ මනුෂ්‍යයාට උදව් කරන්නේ නැහැ. අපේ රටේ දුප්පත් මනුෂ්‍යයකුට ඇපකරුවකු සොයා ගැනීම අමාරුයි. රුපියල් 600ක 700ක ණයක් දෙන විට ඇපකරුවකු සොයා ගන්නය කියා කියනවා නම් ඒක කෙරෙන්නේ නැති වැඩක්. ඒ නිසා ඇපයක් ඕනෑය කියන රෙගුලාසිය ඉවත් කර නියම විධියේ පාලන ක්‍රමයක් ඇති කර, පරීක්ෂණ ක්‍රමයක් ඇති කර, ඒ අයට ඇපකරුවන් නැතිව ණය දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. සිර ගෙවලින් පිට වන අය රක්ෂා නැති නිසා නැවතත් සිර ගෙවලට යනවා. එය වළක්වන්ට තිබෙන එකම මාර්ගය එවැනි අයට උදව් දීමයි. සිරකරුවන් පිට වුණාට පසු ඔවුන්ට උදව් දෙන ක්‍රමය ගැනත් පිකක් දුරට සෝදිසි කර නියම උදව් දීමේ පිළිවෙළක් ඇති කරන ලෙස මා ඉල්ලා සිටින්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ වගේම රෙජිස්ට්ර්-ජනරාල් දෙපාර්ත මේන්තුව තිබෙන්නේත් තමුන්නාන්සේ ගේ ඇමති අංශය යටතේයි. උප්පැන්න සහතික ලබා ගැනීමට ඇති අමාරුකම ගැන මා හිතන්නේ නොයෙක් අවස්ථාවලදී මන්ත්‍රීවරුන් බොහෝ දෙනකු පැමිණිලි කර තිබෙනවා. දැනට එම දෙපාර්තමේන්තු වේ සිටින සේවක සංඛ්‍යාව ඒ වැඩ කටයුතු සඳහා ප්‍රමාණවත් නැත්නම් සේවකයන් ගණන වැඩි කර හෝ උප්පැන්න සහතික පිටපත් ලබාගැනීමට පහසුකම් සලස්වන්ට ඕනෑ. රක්ෂාවක් ලබා ගැනීම සඳහා ඉදිරි පත් කරන්ට උප්පැන්න සහතිකය ඉල්ලා සිටි විට උප්පැන්න සහතිකය නිසි වෙලා වට නොලැබීම නිසා ඇතැම් අයට රක්ෂා නැතිව යනවා. සියලුම විභාග සඳහාත් උප් පැන්න සහතික වුවමනා කරනවා. කලට වේලාවට උප්පැන්න සහතිකය ලබා ගැනී මට නොහැකි වීම නිසා සමහරෙකුට විභාග වලට පෙනී සිටින්ට බැරිව ගොස් තිබෙනවා.

ප්‍රමාද නොකර උප්පැන්න දීම වගේම කළ යුතු තවත් වැදගත් කටයුත්තක් තිබෙනවා. සභාපතිතුමනි, කලින් ලියා පදිංචි කරන්ට නොහැකි වූ නම් අළුතෙන් ලියාපදිංචි කිරීම ඉතා පරෙස්සමින් කළ යුතු කාරියක් බව මා දන්නවා. මන්ද? දකුණු ඉන්දියාවේ සිට කල්ලතෝනින් වශ යෙන් මෙරටට එන අයත් මේ අනුව ලියා පදිංචි වන්ට පුළුවන් නිසයි. ඉන්දියන් කල්ලතෝනි කාරයින්ට පුළුවනි, යාපන යේ නම් දී ලියාපදිංචි වන්ට. එහෙත් සිංහල ප්‍රදේශවල එවැනි ප්‍රශ්නයක් නැති බව මා තමුන්නාන්සේට කියන්ට කැමතියි. සමහර පිටිසර පළාත්වල ළමයින්ට උප්පැන්න නැහැ. එවැනි ළම යකු සඳහා උප්පැන්නයක් ලබා ගන්ට දෙමව්පියන් විසින් රුපියල් 5 ක් මුද්දර සඳහා වියදම් කර ඉල්ලුම් පත්‍රයක් ඉදිරි පත් කළාම ඒ ගැන අවුරුද්දක් පමණ විභාග කර ඒ උප්පැන්නය ලියාපදිංචි කිරීමට බැරිය කියා ලියුමක් එවනවා. හැම සිංහල ප්‍රදේශයකම වගේ මෙය සිදු වෙන වා. සිංහල ප්‍රදේශවල මේ විධියේ හොරකම් කිරීමක් ඇති වන්නේ නැහැ. සිංහල ප්‍රදෙශ වල දෙමව්පියන් ළමයකුගේ නම හොරට ලියාපදිංචි කරන්ට ඉල්ලා සිටින්නේ නැහැ. ගාල්ලේ ආරෝග්‍යශාලාවේ උපන් ළමයින්ගේත් උප්පැන්න අද නැති වෙලා. එහෙම අවස්ථාවලදීත් අවුරුද්දක් විතර විභාගයක් පවත්වා අන්තිමේදී උප්පැන්න දෙන්න බැහැ කියන්නේ ඇයි? මේ සඳහා පවත්වන විභාගවලදී තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින ප්‍රධාන සාක්කියක් තමයි, ඒ ළමයා උපදින අවස්ථාවේ කටයුතු කළ වින්නඹු මාතාව ගේ සාක්කිය. ළමයගේ දැන් වයස අවුරුදු 12 ක් වන්ට පුළුවනි. රුපියල් පහක මුද්දරයක් ගසා ඉල්ලුම් පත්‍රයක් දැම්මාට පසු පවත්වන විභාගයට ගියාම ඒ ළමයා උපදින අවස්ථාවේදී ළඟ සිටි වින්නඹු මාතාවගේ සාක්කියක් ඉල්ලනවා. ඒ වගේම ඒ කාලයේ හිටපු ගම්මුලාදැනියා ගේ සාක්කියක් ඉල්ලනවා. මැරුණු මිනි සුන් සාක්කිවලට කොහොම ගෙන යන්නද? එක සාක්කියක් පමණක් මදි. සාක්කි දෙක තුනක් ඉල්ලනවා. නොයෙක් විධියේ නඩු කියනවාටත් වඩා උප්පැන්න යක් අළුතෙන් ලියාපදිංචි කරවා ගැනීමට සිංහල දෙමවුපියන්ට අද අමාරු තත්ත්ව යක් ඇති වී තිබෙනවා. අනුරාධපුර පළාතේ උදවිය මේ කාරණයේ අමාරුකම ගැන නොයෙකුත් අවස්ථාවල ගරු ඇමතිතුමාට මතක් කර ඇතිවාට සැකයක් නැහැ. එම නිසා මේ ගැන සැලකිල්ල යොමු කොට මේ කටයුත්ත සඳහා පහසුවක් ඇති කරන ලෙස ඉල්ලා සිටිනවා.

තමුන්නාන්සේගේ කර්මාන්ත දෙපාර්ත මේන්තුව ගැන්ත් වචන ස්වල්පයක් කියන්න කැමතියි. මෙම අයවැය ලේඛන යෙන් රෙදි විවීමේ කර්මාන්තය සඳහා මුදල් වෙන් කර නැහැ. රෙදි වියන කර්මාන්ත ශාලා 1000 ක් පිහිටුවිය යුතුයයි 1957 දී පමණ බණ්ඩාරනායක මහතාගේ කැබිනට් මණ්ඩලය තීරණය කළා. ඒ අනුව 1957, 1958 සහ 1959 යන වර්ෂවල මෙම කර්මාන්ත ශාලා පිහිටුවා ගෙන ආ නමුත් තවත් බෙහොම ටිකක් ඉතුරු වී තිබෙනවා. එවකට මෙම අංශය භාරව සිටියේ ඒ. පී. ජයසූරිය මහතායි. මේ මඟින් 20,000 ටත් වඩා ගම්බද ගැහැණු ළමයින්ට රක්ෂා දෙන්නට පුළුවන් වුණා. එහෙත් දැන් මේ පිළිබඳ වැඩ කටයුතු සියල්ලම අතහැර දමා තිබෙන්නේ ඇයි? අවුරුදු පතා මෙම ක්‍රමය දියුණු කළ යුතුව තිබියදී, අතහැර දමා තිබෙන්නේ ඇයි? 1957 දී කරන ලද ආකාරයටම කරන්නැයි මා කියන්නේ නැහැ. වුවමනා නම් විදුලි බලයද යොදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

ගෙන මෙම කර්මාන්තය කරගෙන යන්න පුළුවනි. එසේ කළ යුතුයි. ඒ මිස, අර 20,000 ට ලැබුණු රක්ෂාව නැති වන පරිදි කිසියම් පියවරක් ගැනීම නුසුදුසුයි. ඒ ක්‍රම යේ වරදක් තිබෙනවා නම් එම වරද නිවරද කොට සංශෝධනයක් ඇතිව අළුත් ක්‍රමය කට එය සකස් කළාට කමක් නැහැ. ගම් බද පළාත්වලින් පැමිණි ගරු මන්ත්‍රී වරුන්ට තම පළාතට පහසුවෙන් කළ හැකි සේවය රෙදි වියන කර්මාන්ත ශාලාවක් පිහිටුවා දීමයි. නමුත් ඒ සඳහා මෙම අය වැය ලේඛනයෙන් මුදල් ඉල්ලා නැහැ. ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව මඟින් එළු සැදීම සඳහා පට්ටල් කීපයක් ඇති කිරීමට අදහස් කරන බව මුදල් ඇමති වරයා විසින් සිය අයවැය කථාවේදී පෙන්වා දෙන්නට යෙදුණා. මේ කරුණු ඇතුළත් කොට පොතක් ප්‍රසිද්ධ කර තිබෙනවා. එහි සියළුම විස්තර අඩංගු වෙනවා. නමුත් පොතේ විස්තර තුබුණාට ගමේ කර්මාන්ත නැත්නම් වැඩක් නැහැ. කර්මාන්ත තිබෙන්නට ඕනෑ පොතේ නොව, ගමේයි. එම නිසා කර්මාන්ත දෙපාර්තමේන්තුවත්, ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවත් එකතු වී ගම්බද ජනයාගේ ප්‍රයෝජනය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් යටතේ කර්මාන්ත ඇති කිරීමට විධිවිධාන යොදන මෙන් තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටින වා.

තීරු බදු වැඩි කර පිටරටින් ගෙන්වන බඩු සීමා කළ බව අප දන්නවා. සමහර බඩු ගෙන්වීම සම්පූර්ණයෙන්ම නවත්වා තිබෙනවා. එවැනි ක්‍රියා මාර්ගයක් අනු ගමනය කරන විට, පිටරටින් මෙරටට ගෙන්වීමට තහනම් කර ඇති බඩු මෙහිම නිපද වීමට කටයුතු යෙදීම කර්මාන්ත දෙපාර්තමේන්තුවේ යුතුකමක්. ගමක් ගමක් පාසා අළුත් කර්මාන්ත ඇති කිරීමට කර්මාන්ත දෙපාර්තමේන්තුවට යුතුකමක් තුබුණා. පිටරටින් ගෙන්වීමට තහනම් කර ඇති බඩු වෙනුවට මේ රටේම එවැනි බඩු නිපදවීමේ පිළිවෙළක් තවත් අරඹා නැහැ. තවම එවැනි ව්‍යාපාරයක් ගෙන නැහැ. තව මත් මෙරටට පිටරටින් උළු ගෙන්වනවා. මේ රටට වුවමනා තරම් උළු නිපද වීමට තවමත් ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් යොදා නැහැ. මේ සඳහා වැඩ පිළිවෙළක් පටන් ගන්නට බැරි ඇයි? ඇයි ඒ ගැන සෝදිසි කරන්න බැරි වුණේ? කොච්චර උළු පිට රටින් මේ රටට ගෙන්වනවාද, කොච්චර උළු මේ රටට වුවමනා කරනවාද, ඒ ඒ පළාත්වල කොච්චර උළු හදන්න පුළුවන්ද, යනාදි කරුණු සොයා දැනගන්න ඕනෑ. මේ රටේ උළු සෑදීම මේ විධියට ආරම්භ කළ යුතුය කියා නියම වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න ඕනෑ. ඒ සඳහා ඒ තරම් විශාල වියදමක් යන්නෙ නැහැ.

තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවකින් කරන්න පුළුවන් තවත් වැදගත් වැඩක් ගැන කියන්න ඕනෑ. අයි. එක්ස්. එල්. කියන ජෑම් වර්ගය දැන් ඉස්සර වගේ ලාබෙට ගන්න බෑ. ටින් එකක් රුපියල් හතරක් පහක් වෙනවා. තීරු බද්ද වැඩි කිරීම නිසා දැන් ඒවා ඒ තරම් ගෙන්වන්නෙත් නැහැ. ඒ නිසා මිල වැඩියි. අපේ රටේ ජෑම් හදන්න පුළුවනි. නමුත් කෝ හදනවා? අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව පැපොල්වලිනුත්, අන්නාසිවලිනුත් ජෑම් හදනවා. අන්නාසි දෝසි, පැපොල් ජෑම්, ආදි වශයෙන් නොයෙක් දේ හදනවා. පිටරටින් ගෙන් වන ද්‍රව්‍ය නතර කිරීම නිසා අපේ රටට වුවමනා කරන ප්‍රමාණය දැන් ඉතින් අපේ රටේම නිපදවන්ට වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. නමුත් ඒ තරම් දුරට කර්මාන්ත දියුණු කර නැහැ. එහෙත් අසුවල් තැන්වල අසුවල් කර්මාන්ත ඇති කරන්න වැඩ ආරඹා තිබෙනවාය කියා පෙන්වන්න පුළුවන්ද? කර්මාන්ත දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. නමුත් එවැනි දෙයක් නැහැ. උගුරැස්ස වැනි පළතුරුවලින් ජෑම් හදන්න වැඩ පිළිවෙළක් තිබෙන්නේ කොහෙද? ජෑම් සෑදීමට වුවමනා කරන පලතුරු වර්ග මොනවාද, ඒවා ලබාගැනීමට කළ යුත්තේ කුමක්ද, යනාදී වශයෙන් යෝජනා ඉදිරිපත් කර ඒ අනුව ආණ්ඩුවේ ඉඩම්වල හෝ පලතුරු වවා ඒ වැවිලි මාර්ගයෙන් පලතුරු සපයාගන්න ඕනෑ. අද ලංකාවේ ගැමියන් මේවා වගා කළොත් කොහෙද ඒවා ගෙන යන්නෙ? යම් මනුෂ්‍යයෙක් පොඩි යන්ත්‍රයක් අරන් ජෑම් හැදීමට ලෑස්ති වුණොත් ඊට වුවමනා පලතුරු හොයා ගන්නෙ කොහෙන්ද? ඒ නිසා දෙපාර්තමේන්තුව ඊට ක්‍රමයක් සකස් කරන්න ඕනෑ. තීරු බද්ද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නංවනවාත් සමගම තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවෙන් ඒ මොහොතේදීම වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න ඕනෑ, ඒ බඩු මේ රටේ සෑදීමට. නමුත් එවැනි ක්‍රම යක් ඉදිරිපත් කර නැහැ. එවැන්නක් ඉදිරිපත් කළොත් ගම්බද ජනයාට රක්ෂා වල් ලැබෙනවා පමණක් නොව, රටට වුව මනා කරන බඩුත් නිෂ්පාදනය වෙනවා.

උඩරට ගැමි කොමිෂන් සභා වාර්තාව ක්‍රියාවේ යෙදීමේ දෙපාර්තමේන්තුවක් තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ තිබෙනවා. යූ. එන්. පී. කාලයේදී නම් උඩ රට ගැමි කොමිෂන් සභාවේ නිර්දේශ මධ්‍යම පළාතටත් ඌව පළාතටත් පමණක් බල පාන ඒවා හැටියට සලකා ක්‍රියා කළා. එහෙත් ඊට පසු ගරු බණ්ඩාර නායක අගමැතිතුමාගේ කැබිනට් මණ්ඩ ලය ඒ සීමාව වෙනස් කර තවත් ප්‍රදේශ වෙනුවෙන් ඒ නිර්දේශ බල පාන හැටියට පිළිගත්තා. ඒ 'සම්බන්ධයෙන් කැබිනට් තීරණයක් තිබෙනවා. ඒ අනුව වෙනත් පළාත්වලටත් ඒ යෝජනා බල පාන බව සලකන්න ඕනෑ. උඩරට කියන වචනය අපට වුවමනා නැහැ. කොතනින් ඉරක් ඇඳලාද උඩරට කියන කොටස සීමා කරන්න යන්නෙ? එහෙම කරන්න වුව මනාවක් නැහැ. සබරගමුවත්, ගාලු දිස්ත්‍රික් කයේ හිනිදුම් කෝරලයත්, මාතර දිස්ත්‍රික් කයේ මොරවක් කෝරලයත්, හම්බන් තොට දිස්ත්‍රික්කයේ ප්‍රදේශත්, අනුරාධ පුරයේ ගැමි කොට්ඨාශත්, වැනි කොටස් මීට අහු වෙන්න ඕනෑ. ගැමි ජනතාවය කීවාම ලංකාවේ එක් පළාතක් නොවෙයි ගණන් ගන්නෙ. බොහෝ කාලයක සිට සෑහෙන තරම් වැඩක් කෙරී නැති ගැමි ප්‍රදේශ සියල්ලක්ම සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් ගැමි ජනතාව වෙනුවෙන් ඇති කරනවා නම් අපි බොහොම සන්තෝෂ වෙනවා.

ගරු සභාපතිතුමනි, මා අධ්‍යාපන ඇමති වරයාව සිටි කාලයේදී කළ එක්තරා වැඩ කට මේ අයයි ප්‍රශංසා ලබාගෙන තිබෙන්නේ. එය දැකලා මම පුදුම වුණා. මධ්‍යම, ඌව යනාදි පළාත්වලින් ගුරුවරුන් වශයෙන් පුහුණු වීමට ඉදිරිපත් වන ජ්‍යෙෂ්ඨ සමතුන්ට වැඩි සැලකිල්ලක් දැක් වෙන ක්‍රමයක් මා ඇමතිවරයාව සිටි කාල යේදී ආරම්භ කළා. එය උඩරට ගැමි කොම් සමේ අනුග්‍රහයෙන් කළ වැඩක් නොවෙයි. මමයි ඒක කළේ.

ගරු සභාපතිතුමනි, ගම්බද පාරවල් සම්බන්ධයෙන්ද මා දැන් වචන ස්වල්ප යක් කියන්න ඕනෑ. විශේෂයෙන් උඩරට පළාත්වල තිබෙන පාරවල් ගැමි කොමිසම යටතේ පවත්වාගෙන යනු ලබන දෙපාර්ත මේන්තුව මගින් සාදා දෙනවා නම් මා සන්තෝෂ වෙනවා. තමුන්නාන්සේගේ භාරයේ පවත්නා ග්‍රාම සංවර්ධන සමිතින් පාරවල් හදනවා. නමුත් අද පවතින ක්‍රමයේ හැටියට ඊට පසුව ඒවා බලාගන්න වත් දියුණු කරන්නටවත් කවුරුවත් නැහැ. මෙම ආයතන මගින් පාරවල් සාදා දුන්නාම අවුරුද්දක් දෙකක් හොඳින් තිබෙනවා; ඊට පසුව කාර් එකක්වත් ගෙන යන්න බැරි අබලන් තත්ත්වයකට වැටෙනවා. මෙම සමිති මගින් සාදන පාරවල් පළමුකොටම එම පළාත්වල තිබෙන පළාත් පාලන ආයතන වලට භාර දෙන්න ඕනෑ. ඊට පසුව ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට භාර දීලා "A ක්ලාස් රෝඩස්" වශයෙන් දියුණු කර ගන්න.

අවසාන වශයෙන් මා තමුන්නාන්සේට මේ කාරණය කියන්න කැමතියි. මේ ආණ්ඩුව තමුන්නාන්සේට දෙපාර්තමේන්තු විස්සක් භාර දීමෙන් කර තිබෙන්නේ විශාල වරදක්. ඒ නිසා ලබන අවුරුද්දේ අයවැය සාකච්ඡාව පවත්වන විට මෙම දෙපාර්තමේන්තු 20 අඩු ගණනේ තුන් දෙනකු අතරවත් බෙදා තිබෙනවා දකින්නට ලැබේයයි බලාපොරොත්තු වෙමින්ද, ඒ සමගම දෙපාර්තමේන්තු 20 ක් භාර අරගෙන උසුලන්නාවූ බැරුරුම් වගකීම ගැන මගේ සන්තෝෂය ප්‍රකාශ කරමින්ද, මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

ජයසූරිය මයා.

(திரு. காமனி ஜயசூரிய)

(Mr. Gamani Jayasuriya)

ගරු සභාපතිතුමනි, දැන් මාස දෙකකට පමණ කලින් චීන රටින් මේ රටට දන්ත ධාතූන්වහන්සේ නමක් වැඩමවා, මේ රටේ සෑම පළාතකම පාහේ ප්‍රදර්ශනය කොට, ඒ මගින් මේ රටේ බෞද්ධ ජනතාවට එම දන්ත ධාතූන් වහන්සේ වැඳ පුදා ගැනීමට ඉඩ සලසා දීමෙන් අපේ ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා විශාල පිංකමක් කර ගත් බව තමුන්නාන්සේලා සියලු දෙනාම මතක ඇතැයි මා කල්පනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

අ. භා. 5.15

මෙම දන්තධාතූන් වහන්සේ ගැන සම්භර දෙනකුගේ අදහස් වෙනස් වන්න පුළුවනි. ඒ කෙසේ වුණත් අපේ රටේ බෞද්ධ ජනතාවට වඳින්න, පුදන්න, පිංකමක් කර ගන්න, අවසථාවක් . එසේ ලබා දීම ගැන කවුරුත් සන්තෝෂ වෙනවා. එම නිසා මම තවත් ඉල්ලීමක් ගරු ඇමතිතුමා වෙත ඉදිරිපත් කරන්න කැමතියි. ටිබෙට් රටේ සිටින සෑම බෞද්ධයකු විසින්ම ගෞරව කරන, ඒ රටේ බෞද්ධ ජනතාවගේ නායකයා හැටියට පිළිගෙන සිටි දලයිලාමා තමන්ගේ රටෙන් එළවා දමා අද ඉන්දියාවේ බොහෝ දුකෙන් කනගාටුවෙන් කාලය ගත කරනවා.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

කනගාටුවෙන්ද සිටින්නේ? එයා හොඳ සල්ලිකාරයෙක්. පැක්ටේරි අයිති කාරයෙක්.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

ඒ එක අදහසක්. කොමියුනිස්ට් මන්ත්‍රීවරුන්ගෙන්—කොමියුනිස්ට් වාදීන්ගෙන්—ඊට වඩා වෙනස් අදහසක් ලබා ගන්න බැහැ. නමුත් දලයිලාමාට ගෞරව කරන බෞද්ධ ජනයා අද මේ රටේ සිටිනවා. නියම බෞද්ධ ජනයා දලයිලාමාට ගෞරව කරනවා. නමුත් කොමියුනිස්ට් වාදීන් ආගමක් ගැන විශ්වාසයක් නැති උදවියයි. එම නිසා ඒ විධියට නින්දිත ලෙස කථා කිරීම ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ.

වෛද්‍යාචාර්ය ඇස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

එහෙම නින්දිත කථාවක් කළේ නැහැ.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

ඒ කියන විධිය නිකම් විහිළු කිරීමක් වගෙයි. චෝදනා එල්ල කිරීමක් වගෙයි. තමුන්නාන්සේට නම් මෙය හිනහවට කාරණයක් වෙන්න පුළුවන්. නමුත් අපි ගෞරව කරන පූජකවරුන්ට ඒ අන්දමට කථා කරන විට අපේ හිතට ටිකක් රිදෙනවා. එම නිසා මම ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ ඒ දලයිලාමා——

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

බුද්ධරක්ඛිතටත් සල්ලි තිබෙනවා.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

අන්න බලන්න, දැන් මම කී දේ ඔප්පු වුණා නේද? බුද්ධරක්ඛිතගේ නම දලයිලාමාගේ නමත් සමග සසඳනවා. එවැනි වචනයක් අහන්න ලැබෙන්නේ හරි පුද්ගලයකුගෙන් නොවෙයි; කොමියුනිස්ට් වාදීන්ගෙන් පමණයි.

නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමතිතුමා චීන ධාතූන් වහන්සේ මේ රටට වැඩමවා කළ පිංකම තවත් සම්පූර්ණ කර ගන්න නම් දුකෙන් කාලය ගත කරන ඒ ටිබෙට් බෞද්ධ නායකයාට අපේ සිඛසථානත් අපේ දන්ත ධාතූන් වහන්සේත් වැඳ පුදා ගැනීමට අවසථාවක්——

ගරු මෛත්‍රිපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனஞயக்க)
(The Hon. Maithripala Senanayake)

එසේ පැමිණීමට බාධා කර නැහැ.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

මම කියන්නේ දලයිලාමාටත් මේ රටට ආරාධනා කර තමුන්නාන්සේ අර කළ පිංකම තවත් සම්පූර්ණ කරගෙන තමුන්නාන්සේට නිවන් සැපත් ලබා ගන්න වැඩ පිළිවෙළකුයි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(Hon. C. P. de Silva)

සාදු, සාදු.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) කථා කරන අවසථාවේදී උන්නැහේ ග්‍රාම සේවක නිලධාරීන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තෝරා පත් කිරීම ගැන ඉතාම භයානක අදහසක් ප්‍රකාශ කළා. ග්‍රාම සේවක නිලධාරීන් ගැන මේ සභාවේ සාකච්ඡා කරන අවස්ථාවේදී අපට දැනගන්න ලැබුණේ මෙම ග්‍රාම සේවක නිලධාරී මහතුන් තෝරන්නේ විභාගයක් පවත්වා බවයි. මේ සම්බන්ධයෙන් මොන විධියේ වරප්‍රසාද අපේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට ලබා දී තිබෙන වාද කියා අපි දන්නේ නැහැ. මෙම ග්‍රාම සේවක නිලධාරීන් තෝරා ගන්න අවස්ථාවේදී——

ඩබ්ලිව්. ජී. එම්. ඇල්බට් සිල්වා මයා. (මොනරාගල)

(திரு. டப்ளியு. ஜீ. எம். அல்பேட் சில்வா—மொனராகல)

(Mr. W. G. M. Albert Silva—Monragala)

එවැනි වරප්‍රසාද දී නැහැ.

ජයසූරිය මයා.

(திரு. ஜயசூரிய)

(Mr. Jayasuriya)

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට එවැනි වරප්‍රසාද දී නැහැ කියා දැනගන්න ලැබීම සන්තෝෂයට කාරණයක්. එහෙම නම් මම එක් කරුණක් දැන් සභාවට ඉදිරිපත් කරන්න කැමතියි. අපට කිප දෙනකුගෙන් ලියුම් මාර්ගයෙන් දැනගන්න ලැබී තිබෙනවා, එක්තරා කාරණාවක් ගැන. මැණික් දිවෙල පළාතෙනුත් අපට ලිපියක් ලැබී තිබෙනවා. ගම්පහ මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මයා.) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ අන්දමට ලිපියක් යවා තිබෙන බව අපට දැනගන්ට ලැබී තිබෙනවා. ගිය මාසේ දහවෙනි දින ලිපියක් එවා තිබෙනවා. ඒ ලිපිය මෙසේයි:

මහත්මයාණනි, ඔබගේ ගම් කොට්ඨාශයට ග්‍රාම සේවක නිලධාරියකු තෝරා ගැනීමේ ප්‍රශ්නය ගැන ඔබගේ ගම්මුලාදෑනි කොට්ඨාශය තුළ ඇති අප පක්ෂයේ සියළුම කොමිටි සමග සාකච්ඡා කර සුදුසු කවිද යන්න තීරණය කර අප්‍රමාදව දන්වා එවනු මැනවි. එසේ ඒ කමතිකව සුදුස්සකු තීරණය කර ගත නොහැකි නම්, ගමේ ඉල්ලුම්කරුවන් අතුරින් නුසුදුස්සන් කවුරුදැයි නම්කර සතියක් ඇතුළතදී දන්වා එවනු මැනවි. මෙයට ගම්පහ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ අණපරිදි පෞද්ගලික ලේකම්.

මේ අන්දමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ගම්පහ මන්ත්‍රීවරයා විසින් ලියුම් යවා තිබෙනවාය කියා ආරංචියක් තියෙනවා. ආරංචිය කොයි තරම් දුර ගියාද කියතොත් එය පත්‍රයකද පළ වී තිබුණා. ගිය මාසේ 15 වැනිදා දිනමිණ පත්‍රයේ "ගම්පහ මන්ත්‍රී සුදුස්සන් සොයයි" යන හිසින් ප්‍රවෘත්තියක් පළ වී තිබුණා. මෙම ප්‍රවෘත්තිය එවා තිබෙන්නේ යක්කල ප්‍රදේශයෙනුයි.

ගරු සභාපතිතුමනි, ඇමතිතුමා මෙවැනි දෙයක් කිරීමට නම් කවදාවත් එකඟ වේයයි මම කල්පනා කරන්නේ නැහැ. නමුත් මේවා නිකම් ඉබේට සිදුවූ දේවල් නොවෙයි. එහෙම අදහසක් නැත කියා පිළිතුරු දීමෙන් පමණක් සෑහීමට පත්වන්න එපා. තමුන්නාන්සේ මේ ගැන සොයා බලන්න ඕනෑ. යම් විධියකින් මෙහි අඩංගු කරුණුවල යම්කිසි සත්‍යයක් තිබේ නම් ඒ ගැන සීරිය වැඩ පිළිවෙළක් අනුගමනය කරන්න ඕනෑ. එසේ නැතිනම් එම විභාගයට පෙනී සිටි සෑම අපේක්ෂකයකුගේම සිතේ බියක්-සැකක් ඇති වෙන්න පුළුවනි. එම නිසා ඒ සැකය නැති කර දමන්න තමුන්නාන්සේ නියම අන්දමින් වැඩ කරාවියයි මම කල්පනා කරනවා.

ගරු මන්ත්‍රීවරයෙක්

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

යූ. එන්. පී. කාලේ කළේ කොහොමද?

ජයසූරිය මයා.

(திரு. ஜயசூரிய)

(Mr. Jayasuriya)

සමහර උදවිය කියන්නේ හරි පුදුම කථාවක් නේ. යූ. ඇන්. පී. කාරයෙක් ලිදට පැන්නාය කියා තමුන්නාන්සේලාත් ලිදට පනිනවාද? මොකක්ද මේකේ තේරුම?

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේත් මේ ගරු සභාවේ මන්ත්‍රීවරුනුත් පිළිගන්නවා ඇති, මේ රටේ ආර්ථික තත්ත්වයෙන් නගා ලීමට නම්, රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා ගැනීමට නම්, ඉතාම අවශ්‍ය දේ අළුතින් කර්මාන්තයන් ඇති කිරීම බව. නමුත් යම් කිසි කර්මාන්තයක් යම් ලෙසකින් අසාර්ථක වුණොත්, අද බොහෝම ලේසියෙන් සෑම දෙනාටම ගරු මන්ත්‍රීතුමාට චෝදනා කරන්න පුළුවනි. නමුත් කර්මාන්තයක් නියම අන්දමින්, ප්‍රයෝජනවත් වන අන්දමින්, සාර්ථක වන අන්දමින්, කරගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

යාම එතරම් ලේසි පහසු කටයුත්තක් නොවෙයි. යම් කර්මාන්තයක් සාර්ථක කර ගැනීමට නම්, තමන්ගේ සම්පූර්ණ කාලයත්, සම්පූර්ණ ශක්තියත්, ඒ සඳහා යොදවන්න ඕනෑ. මේ කර්මාන්ත, ගොවි කර්මාන්තය වාගේ නොවෙයි. අපේ රටේ ඉඩම් හිමි මහතුන්ට ගොවි කර්මාන්තය ගැන නම් එක්තරා ප්‍රමාණයක පළපුරුද්දක් තිබෙනවා. සාමාන්‍යයෙන් මේ රටේ බොහෝ දෙනකුට පළපුරුදු කර්මාන්තයක් තමයි, ගොවි කර්මාන්තය. එම නිසා ඒ රක්ෂාවේ යෙදී සිටින අයට ඒ පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙන බව අපි පිළිගන්නවා. නමුත් අළුතින් යන්ත්‍ර සූත්‍ර සපයා ගෙන අළුතින් කර්මාන්තයක් ආරම්භ කිරීම ගොවි කර්මාන්තය මෙන් පහසු කාර්‍යයක් නොවෙයි. මේ විධියේ කර්මාන්තයක් අපට අළුත් දෙයක්. අසුවල් තැන ෆැක්ටරියක් හදන්නය, අසුවල් යන්ත්‍රෝපකරණ ගෙනෙන්නය කියා කීම නම් බොහොම ලෙහෙසියි. කියන හැටියටත් පොතේ හැටියටත් ඒවා කරන්න අමාරුයි. පොත පතත් තිබෙන්න ඕනෑ. ඒවාගේම සැලැස්මකුත් තිබෙන්න ඕනෑ.

මේ රටේ කර්මාන්ත පිහිටුවන්නට යාමේදී ඉතාමත් කල්පනාකාරී ලෙස වැඩ කළ යුතුයි. කලක් ගියාට පසු, කර්මාන්ත නියම තත්ත්වයට පත් වුණාට පසු, ඒ තරම් අමාරු වන්නේ නැහැ. නමුත් පටන් ගන්මේදී, කිසිත් පළ පුරුද්දක් නැති අවස්ථාවේදී, ඒ කටයුතු බොහොම මහන්සියෙන් කරන්නට ඕනෑ. අපට කර්මාන්ත ඉතා අවශ්‍ය නම්, අපේ තිබෙන අඩුපාඩුකම් සම්පූර්ණ කර ගැනීම අවශ්‍ය නම්, ඉතා කල්පනාකාරී ලෙස වැඩ කටයුතු කළ යුතු නම්, මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා, එතුමා හෝ වෙන කෙනකු හෝ මේ කර්මාන්ත අංශය පමණක් භාර ගන්නය කියා. එසේ නැතිව කවදාවත් මේ වැඩය කරන්න ලැබෙන්නේ නැහැ. වෙනත් කටයුතු අතර මෙය කරන්න ගියොත් කොයි තරම් සමර්ථ කෙනකුට වුවත් නියම අන්දමට ඒ කාර්යය ඉටු කරන්න බැරි වෙනවා. ඒ අංශය භාර ඇමතිට දිනපතාම, දවල් රෑ දෙක්හිම, කළ යුතු වැඩ තිබෙනවා. මේ කටයුතු තමන්ගේ නිලධාරීන්ට භාර දී ප්‍රතිපත්ති මේවාය. කියා ඒ වැඩ කටයුතු කරන්න සැලැස්වීමෙන් කවදාවත් බලා පොරොත්තු වන ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් වන්නේ නැහැ. කර්මාන්ත පිළිබඳ ඇමතිතුමා මේ ගැන ලොකු සැලකිල්ලක් දක්වන බව මම දන්නවා. ඒවා සාර්ථක කර ගැනීමට එතුමා මහන්සි වන බවත් මම දන්නවා. නමුත් ඒවායේ නියම ප්‍රතිඵල ලබා ගැනීමට නම් ඊටත් වඩා තවත් මහන්සි විය යුතුයි, ඊටත් වඩා තවත් කල්පනා කළ යුතුයි.

මේ රජයේ දස අවුරුදු සැලැස්මෙන් කියා සිටිනවා, අසවල් කර්මාන්තය අපේ රජය විසින් කරනවාය කියා; අසවල් කර්මාන්ත අපි පෞද්ගලික අංශයට භාර දෙන වාය කියා. පෞද්ගලික අංශයත් අපට වුව මනා යයි ප්‍රකාශ කර තිබෙනවා. පෞද්ගලික අංශයත් තමුන්නාන්සේලාට වුව මනා යයි පිළිගන්නවා නම්, ඒ අංශයෙන් යම්කිසි සේවයක් බලාපොරොත්තු වෙනවා නම්, අද—විශේෂයෙන් මේ අයවැය ලේඛනයෙන් පසු—ඒ බලාපොරොත්තු ඉටු නොවන බව මට කියන්න පුළුවනි. මේ අයවැය ලේඛනයෙන් පසු කවදාවත් ඒ ආධාර නම් ලැබෙන්නේ නැහැ. පෞද්ගලික අංශයෙන් කරවා ගැනීමට තමුන්නාන්සේලා කර්මාන්ත සිය ගණනක් නම් කර තිබෙනවා. මේ අයවැය ලේඛනය ඉදිරිපත් කරන්නට පෙර ගරු මුදල් ඇමතිතුමා නොයෙක් ද්‍රව්‍යවල තීරු බදු වැඩි කළා, නොයෙක් දේ පිටරටින් ගෙන්වීම තහනම් කළා. ඒ අවස්ථාවේදී පෞද්ගලික අංශය කල්පනා කළා, තත්ත්වය මෙසේ නම් අපටත් යමක් කරන්නට පුළුවන්ය කියා. ඊට පෙර ඔවුන් සිත් තුළ කෙතරම් බියක් තිබුණත් ඒ අවස්ථාවේදී යමක් කිරීම සඳහා ඔවුන් නම් ලියාපදිංචි කරවා ගත්තා. නමුත් මේ අයවැය ලේඛනයෙන් පසු නම් ඔවුන් ඒ කාර්යයන් ඉටු කිරීමට ඉදිරිපත් වේ යයි මම නම් හිතන්නේ නැහැ.

තමුන්නාන්සේට කාල වේලා තිබේ නම් මේ ගැන හොඳින් කල්පනා කර බලන්න, දැනට පනවා ඇති අය බදු තිබියදී රජය බලාපොරොත්තු වන ආධාර පෞද්ගලික අංශයෙන් ලබා ගන්නට පුළුවන්ද කියා. මේ මේ ආධාර මේ මේ අන්දමට ලැබෙන වාය කියා කියන්නට බොහොම ලෙහෙසියි. නමුත් මේ බදුවලින් පෞද්ගලික අංශයට වන කරදර මොනවාද කියා හොඳින් කල්පනා කර බැලුවොත් ඒ හිතන අන්දමට කවදාවත් ඒ ආධාර ලබා ගන්නට බැරි බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේට වැටහෙනවා ඇති. තමුන්නාන්සේලාගේ එවැනි බලාපොරොත්තුවක් නැති නම් ඒක වෙනම දෙයක්. ප්‍රථමයෙන් සිතාගන්න ඕනෑ දෙයක් තමා, අපට පෞද්ගලික අංශය වුවමනාද නැද්ද කියන එක. පෞද්ගලික අංශය වුවමනා නැත කියනවා නම්, මීටත් වඩා අයබදු අය කරලා වුවත් කමක් නැහැ වැඩ කරගෙන ගියාට. එහෙත් පෞද්ගලික අංශය වුවමනාය කියා සිතනවා නම්, මීට වඩා කල්පනාවෙන් කටයුතු කිරීම වැදගත් බව මතක් කළ යුතුව තිබෙනවා. තමුන්නාන්සේ සාධාරණ පුද්ගලයෙක් නිසා මේ ගැන සොයා බැලුවොත් තමුන්නාන්සේට පෙනී යාවි, පෞද්ගලික වශයෙන් කර්මාන්ත ආරම්භ කිරීම සඳහා වැඩි ආධාරයක් නොලැබෙන බව.

අ. භා. 5.30

ගරු සභාපතිතුමනි, පිටරටවලින් මේ රටට ගෙන්වමින් තිබුණු නොයෙකුත් දේවල් ගෙන්වීම දැන් තහනම් කර තිබෙනවා. රෙදි ඒ ගණයට වැටෙන දෙයක්. මා මේ අංශය ගැන කථා කරන විට ඇතැම් අය සිතාවි මගේ කර්මාන්තයක් බේරා ගැනීම සඳහා කථා කරනවාය කියා. එවැනි අදහසකින් නොවෙයි මා කථා කරන්නේ. පුටු කුෂන් කරන්න යොදන රෙදි ආදිය ගෙන්වීම තහනම් කර තිබෙනවා. රුපියල් 2.50 කින් ද කොහේ ද වැඩිය අය කරන කුෂන් රෙදි පිටරටවලින් මෙරටට ගෙන්වීම තහනම් කර තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා ඇති වඩු කර්මාන්තයේ යෙදී සිටින අය ගැන. සුළු සුළු වශයෙන් වඩු කර්මාන්තය කරගෙන යන අය මොරටුව වැනි පළාත්වල සිටිනවා. ඒ අයට මේ නිසා සිදු වන්නේ ලොකු කරදරයක්. මේ විධියට තව පස් මාසයක් හය මාසයක් පමණ යන විට පුටු ආදිය කුෂන් කරන්න පාවිච්චි කරන රෙදි වර්ග මේ රටේ නැතිව යාවි. වැල්ලවත්ත මෝලේ එවැනි රෙදි හරිගස්සන්නෙත් නැහැ. "කර්වින්" රෙදි හරිගස්සනවා ඇති. නමුත් පුටු ආදිය කුෂන් කිරීමේදී පාවිච්චි කරන රෙදි වර්ග හරිගස්සන්නේ නැහැ. එවැනි රෙදි වර්ග මේ රටේ සදන්න වුවමනා නැත කියා ප්‍රකාශ කරනවා නොවෙයි. හෙමින් සැරේ තත්ත්වානුකූලව එවැනි දේ නිපදවන තුරු එම කටයුත්ත සැහෙන අන්දමකට කර ගෙන යනවා නම් හොඳයි. තව පැත්තකින් බලන විට මේ විධියට කටයුතු කෙරුණොත් රටේ රැකිරක්ෂා ප්‍රශ්නයද උග්‍ර වෙනවා. පුටු කුෂන් කරන අයට රක්ෂා නැති වෙනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)
කරුණා කර නිශ්ශබ්ද වන්න. දැන් කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
මා ප්‍රකාශ කළ අන්දමේ සුළු සුළු බාධා වත් නැති කරගන්න පුළුවනි, තමුන්නාන්සේ නියම අන්දමට කල්පනා කර බලා කටයුතු කරනවා නම්. මා කාටවත් දෙස් පවරනවා නොවෙයි. තමුන්නාන්සේ කෙරෙහි ඇති ආදරය නිසයි මෙසේ කියන්නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
කුඩම්මගෙ ආදරය.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීළඟට තවත් කාරණයක් කියන්න කැමතියි. සපත්තු සදන අය ගැනයි මීළඟට මා කථා කරන්ට බලාපොරොත්තු වන්නේ. සපත්තු සෑදීම සඳහා පාවිච්චි කරන හම්වල බද්ද සියයට විසි එකේ සිට සියයට හැත්තෑ අට දක්වා වැඩි කර තිබෙනවා. මා මේ කියන්ට යන්නේ ඒ හේතුවෙන් ලොකු කොම්පැනි කාරයන්ට සිදු වන්නාවූ පාඩු ගැන නොවෙයි. පොඩි පොඩි කඩ දමාගෙන සපත්තු සදන අය සිටිනවා. සමහර රටවල මැෂින් නැතිව අතින් සදන සපත්තු වර්ගවල මිල වැඩියි. ඒ කෙසේ වෙතත්, මේ රටේද නෝනාවරුන්ගේ සෙරෙප්පු, මහත්වරුන්ගේ සපත්තු, යනාදිය සදන පොඩි පොඩි නිෂ්පාදකයන් සිටිනවා. මේ සම්වල මිල වැඩි වුණාම එවැන්නන්ට දවසේ වියදමවත් සොයාගන්න අමාරු වෙනවා. තමන්ගේ භාර්යාව සහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

දරුවන් පෝෂ්‍ය කරගැනීම සඳහා වත් ඔවුන්ට මුදල් සොයා ගන්න බැරි වෙනවා. ගිය අවුරුද්දේ නෝනාවරුන් සඳහා සදනු ලබන සපත්තු සෙරෙප්පු ආදිය විකුණන ලද්දේ රුපියල් 10 ටත් 30 ටත් අතර ගණන්වලටයි. නමුත් මේ තීරු බද්ද වැඩි වුණාට පස්සේ රුපියල් 18ත් 45ත් අතරේ ගණන්වලට ඒ සපත්තු විකුණනවා. ඒ උදවිය හඳන මහත්වරුන්ගේ සපත්තු ගිය අවුරුද්දේ විකුණුවේ රුපියල් 22 ටයි. අද විකුණන්නේ රුපියල් 40 ටයි. මේ රටෙත් ලෙදර් හදන පැක්ටරියක් තියෙනවා. නමුත් එතන හැදෙන ලෙදර් ප්‍රමාණය බොහොම මදියි. මේ සපත්තු සෙරෙප්පු හදන උදවිය ලංකාවේ සෑම නගරයකම පාහේ ඉන්නවා. ඒ අයට වුවමනා ලෙදර් සොයා ගැනීම බොහොම අමාරුයි. එපමණක් නොවෙයි. glazed kid, white kid, white buck ආදි උසස් තත්ත්වයේ සමහර ලෙදර් වගී ඉන්දියාවෙන් සහ යුරෝපයෙන් ගෙන්වනවා. සියයට 20 ක්ව තිබුණු ඒ වාගේ තීරු බද්දත් සියයට 110 දක්වා අද වැඩි කර තිබෙනවා. මෙවැනි දෙයක් සිද්ධ වන්නේ නැහැ, අපේ ඇමතිතුමාට මේ ප්‍රශ්නය ගැන කල්පනා කරන්න වෙලා තිබුණා නම්. තමුන්නාන්සේට මේ සියල්ලම කරන්න බැහැ, ඇමතිතුමනි, කර්මාන්ත ගැන බලන්නයි, කසිප්පු ගැන බලන්නයි, නාට්‍ය ගැන බලන්නයි ගියාම කවදාවත් ඒ එකක්වත් හරියට කර ගන්න බැරී වෙනවා. විශේෂයෙන්ම කර්මාන්ත ඉතාමත්ම වැදගත් දෙයක්. අපේ රටට හොඳ කර්මාන්ත ඉතාමත් අවශ්‍යයි. ඒ කර්මාන්ත නියම විධියට දියුණු කරන්න බැරි වුණොත් අපේ දියුණුවත් පහළ බසිනවා.

සරොම්, තුවා ආදිය හැදීමට සම්බන්ධව තිබෙන කුඩා කර්මාන්තශාලා ගැන ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) සඳහන් කළා. ඒවා දියුණු කිරීමට මේ වෑය ශීර්ෂයේ කිසිම මුදලක් වෙන් කර නැති බව ඒ මන්ත්‍රීතුමා කීවා. එසේ වෙන් කර නැත්තේ තමුන්නාන්සේ ඒ කර්මාන්ත සියල්ලම නවත්වන්න අදහස් කරගෙනද කියා මම දන්නෙ නැහැ. මගේ කොට්ඨාශයේ පොඩි ගෙවල් මේ සරොම්, තුවා ආදිය හැදීම කෙරෙනවා. ඒ රක්ෂාව කිරීමෙන් ජීවත් වන උදවිය තිබෙනවා. 500 ක් 600 ක් පමණ ඉන්නවා. ඒ පොඩි කර්මාන්තශාලා පවත්වාගෙන යන උදවියට අද ජීවිතය ගෙන යාමට බැරි තත්ත්වයක් ඇති වෙලා තියෙනවා. ඊට හේතුව ලියාපදිංචි කිරීමේ බද්දක් ගෙවන්න සිදු වීමයි. අවාසනාවකට වගේ ඒ ගණන් ටික අද මට ගෙනෙන්න අමතක වී තිබෙනවා. ඒ බද්ද නිසාත්, අර්ථ සාධක අරමුදලක් ගෙවන්න සිදු වී තිබෙන නිසාත්, යම්කිසි ගොඩනැගිල්ලක් කුලියට අරගෙන කර්මාන්තය ගෙන යනවා නම් ඒ ගොඩනැගිල්ලට කුලී ගෙවන්න සිදු වන නිසාත් තමන්ගේම ගොඩනැගිල්ලක් නම් ඉදහිට වත් එය අළුත්වැඩියා කිරීමට සිදු වන නිසාත්, පොඩිවුණත් මැෂින්වලටත් මුදල් වියදම් කරන්න සිදු වන නිසාත්, තමුන්නාන්සේගෙන් උදව් නොලැබුණොත් අද එවැනි කර්මාන්තයක් කරන්න බැරි බව තමුන්නාන්සේටම පෙනෙනවා ඇති. මේක බොහොම කනගාටුදායක සිද්ධියක්. ඒ මන්ද? එවැනි සුළු කර්මාන්ත ගම්බද පළාත්වලින් නැතිව ගියොත් රැකීරක්ෂා ප්‍රශ්නය තවත් උග්‍ර වෙනවා. ඔය අන්දමේ කර්මාන්තවල යෙදී යම් කිසි සුළු මුදලක් උපයා ගන්න 600 ක පමණ පිරිසක් මගේ කොට්ඨාශයේ සිටිනවා. මේ ගැන සොයා බලා වහාම තමුන්නාන්සේ විසින් කටයුතු නොකළොත් ඒ 600 ක පමණ පිරිසට රක්ෂාව නැතිව යනවා.

තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ලොකු කර්මාන්ත කීපයක් ගැනත් ඊළඟට වචනයක් දෙකක් කියන්න කැමතියි. ඒ කර්මාන්තවල ඇති අඩුපාඩු සහ වැරදි ගැන තමුන්නාන්සේට වගකියන්ට බැරි බව මා දන්නවා. ඒ මන්ද? ඒ වැරදි සහ අඩුපාඩු ඇති වුණේ තමුන්නාන්සේ ඒ අංශය භාර ගන්න පෙරයි. එහෙත් ඒවාට වගකිය යුත්තේ මේ ආණ්ඩු පක්ෂයමයි. ඒ වැරදිවලින් වැඩි හරියක් සිදු වී තිබෙන්නේ මීට පෙර තිබුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු කාලයේදීමයි. ඒ අඩුපාඩු තිබෙන කර්මාන්ත ශාලාවලින් වැඩි හරියක් ඇති කළේ මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩු කාලය තුළදීයි. ඒ පාඩුවලින් වැඩි හරියක් සිදු වුණේ දුර්වල පාලනය නිසයි. සිමෙන්ති fපැක්ටරියේ පාලනය ඉතා දුර්වල තත්ත්වයක තිබෙන බව මට දැනගන්න ලැබී තිබෙනවා. එහි පාලනයේ ඇති දුර්වලකම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසයි, එහි හොරකම් සිදු වන්නේ. කන්කසන්තුරේ සිමෙන්ති කම්හල වේ සිදු වන හොරකමක් ගැන යම් කිසි සේවකයකු එහි මැනේජර්ට දැනුම් දුන් නොත් ඒ හොරකම දැනුම් දුන් පුද්ගල යායි, අමාරුවේ වැටෙන්නේ. එවැනි තත් වයකට අද ඒ කර්මාන්ත ශාලාව වැටී තිබෙනවා. උසාවියකදී මෙම කර්මාන්ත ශාලාව සම්බන්ධව කරන්න යෙදුණු විස් තරයකින් කොටසක් දැන් මා කියවන්න අදහස් කරනවා. එතැන සිදු වන සිඹින් වල බැරෑරුම්කම එයින් තමුන්නාන්සේට පෙනී යනවා ඇති.

"The accused has no doubt taken full advantage of the inefficiency and incompetence of his superior officers directing affairs in the office of the Ceylon Cement Corporation," observed Mr. A. E. Buultjens, Additional District Judge of Colombo, in the course of his order imposing a sentence of 2 years' hard labour on . . . . . "It is difficult to understand how these frauds, in some instances clumsily executed, have so easily escaped the notice of superior officers. It is clear that there has been a complete lack of supervision and vigilance on the part of the superior officers of the Ceylon Cement Corporation. Over one year has elapsed since the discovery of the first fraud," Mr. Buultjens proceeded to say.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අන්න ඒ තත්ත්වය තමයි, අද නොයෙකුත් සංයුක්ත මණ්ඩලවල පවතින්නේ. තමුන්නාන්සේ විසින් ලුණු සංයුක්ත මණ්ඩලය ගැන විභාගයක් ඇති කරන්න යනවායයි පත්‍රය මාගීයෙන් දැක මා ඉතා සන්තෝෂ වුණා. එතැනත් සිදු වන පුදුම දේවල් ගැන අපට දැනගන්න ලැබී තිබෙනවා. එහි සම්පූර්ණ පාලනය පැවරී තිබෙන්නේ ලේකම් මහතාටයි. ඒ ලේකම් මහතා තමා කැමති පරිදි සියලුම පත්වීම් තමාගේ නෑදෑ පිරිසට, මිත්‍ර පිරි සට, දෙනවා මිස වෙන දෙයක් ගැන කල්පනා කරන්නේ නැහැ. මේ පුද්ගලයා නුසුදුසුය, මේ පුද්ගලයා සුදුසුය, ආදී වශයෙන් කල්පනා නොකර පත්වීම් දෙනවා. මේවා ගැන සොයා බැලීමට කොමිෂන් සභාවක් පත් කිරීම ගැන සතුටු වෙනවා. සිමෙන්ති කර්මාන්ත ශාලාව සඳහාත් කන්තලේ සීනි කර්මාන්ත ශාලාව සඳහාත් මේ විධියේ කොමිෂන් සභා පත් කළොත් බොහෝ ප්‍රයෝජන ලැබෙනවා ඇතැයි මා සලකනවා.

අ. භා. 5.45

කන්තලේ සීනි කර්මාන්ත ශාලාව ගැන ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙක් කථා කළා. මාත් ඒ ගැන කරුණක් දෙකක් කියන්නට සතුටුයි. මගේ කල්ප නාවේ හැටියට අද දින අනෙක් රටවල සීනි මිළ බැසගෙන යනවා. අද පමණක් නොව දැන් අවුරුදු ගණනාවක සිටම සීනි මිළ අඩුයි. ගල්ඔය එක සීනි කර්මාන්ත ශාලා වක් තිබියදී කන්තලේ තවත් සීනි කර් මාන්ත ශාලාවක් සාදන්න ගොස් විශාල මුදලක් වියදම් කර තිබෙනවා. එක සීනි කර්මාන්ත ශාලාවක් තිබියදී තවත් එකක් සදන එක නුවණට හුරුදායි මට නම් සථිර වශයෙන්ම කියන්න අමාරුයි. ඒ සඳහා තීරණයක් ගැනීම ආණ්ඩුවේ යුතුකමයි. නමුත් මගේ අදහස ගැන කල්පනා කර බලනවා ඇතැයි සලකනවා. කන්තලේ සීනි කර්මාන්ත ශාලාව සඳහා අද වන විට රුපියල් කෝටි 20 ක් 25 ක් මේ රටේ මුද ලින් වියදම් කර තිබෙනවා. ඒ තරම් විශාල මුදලක් වියදම් කිරීමෙන් නියම ප්‍රයෝජන යක් ලැබේද නැද්දැයි අවබෝධ කර ගැනීම තමුන්නාන්සේලාගේ යුතුකමයි. කන්තලේ සීනි කර්මාන්ත ශාලාව සඳහා උක් වැවීමට අක්කර 4,000ක් එළි කර ඇතැයි දැන ගන්න තිබෙනවා. නමුත් මගේ කල්පනාව අද වන තුරු අක්කර 2,000කට වඩා උක් වගා කර නැති බවයි. අක්කර 3,000කට වඩා වඩා තිබේයයි සමහර උදවිය කියනවා. පොත්පත්වල අක්කර 3,000ක් යයි සඳහන් වුණත්, එක වරම එය පිළිගන්නේ නැතිව ඒ පිළිබඳව පරීක්ෂා කර බැලීම සුදුසුයි. අද දින කන්තලේ fපැක්ටරියේත් වගා කරන කොටසේත් සිටින නිලධාරි මණ්ඩලය කම්කරුවන්ට සමාන බවයි, මට නම් දැනගන්ට ලැබී තිබෙන්නේ. නිලධාරි මණ්ඩලයත් කම්කරුවනුත් එක වාගේම පිරිසක් බව දැන ගන්ට තිබෙනවා. fපැක් ටරියේ වැඩ කරන කම්කරුවන් ඒ නිල ධාරීන්ගේ ගෙවල මෙහෙකරුවන් වශ යෙන් යොදා ගන්න බවත් දැනගන්ට තිබෙනවා. මේ ගැන මා පෞද්ගලිකව සොයා බැලුවේ නැහැ. නමුත් ඒ විධියට ආරංචියි. ගරු ඇමතිතුමා මේ ගැන සොයා බලන එක හොඳයි.

නොයෙක් වර්ගවල මැෂින් ගෙන්වා තිබෙනවාලු. රුපියල් හතළිස් දාහක් පමණ වියදම් කර චේන් කටර් ගෙන්වා තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

නමුත් එයින් අද වනතුරු ප්‍රයෝජන ගෙන නැතිලු. අව්වට වේලෙමින්, වැස්සට තෙමෙමින් තිබෙනවාලු. එසේ නම් මේ නිලධාරීන් මොනවද කරන්නෙ? මේ යන්ත්‍රය ගරාජය කවත් නබා ප්‍රවේසම් කරන්න බැරි තරම් දුර්වල පාලනයක්ද අද කන්තලේ තියෙන්නෙ?

අහස් යානාවෙන් පැමිණ බෙහෙත් විදින යන්ත්‍රයක් රුපියල් 90,000ක් වියදම් කරලා ගෙන්වා ගත්තාලු. එය කී වාරයක් පාවිච්චි කළාද? ඉන්දියාවෙත් මෙවැනි උක් වගාවන් ඇති. ඒවාටත් අහස්යානා වෙන් පැමිණ බෙහෙත් විදිනවාද? මේවා සොයා බලන්න ඕනෑ.

එතන වැඩ කරන නිලධාරීන්ට බංගලා හදා දී තිබෙනවාලු. බී-3 වර්ගයේ බංගලා 10කුත්, බී-5 නිවාස 5කුත් හදා තිබෙන වාලු. ඒ වෙනුවෙන් රුපියල් හත් ලක්ෂ යක් වියදම් කර තිබෙනවාලු. මේ ගෙවල් 15 වෙනුවෙන් ඔය තරම් වියදම් කළා නම් එක් ගෙයකට රුපියල් 40,000ක් වියදම් කර තිබෙනවා. තමුන්නාන්සේගෙ ගෙටත් වියදම් වුණේ රුපියල් 45,000 යි. මේ තරම් මුදල් වියදම් කර මේ අයට ගෙවල් සෑදීම අවශ්‍යද? එසේ කිරීම සුදුසුද කියා සොයා බලන්න. මේ ගොඩනැගිලි හදා තිබෙන්නෙත් ඉතාමත් නරක අන්දමටලු. දොර ජනෙල් හදා තිබෙන්නෙ වැනිස්ට්‍රා ලෑලි වලින්ලු. පඤ්චිකාවත්තෙ පරණ යකඩලු අරන් තියෙන්නෙ. යතුරු ආදියත් පඤ්චිකාවත්තෙන්ම ගත් පරණ ඒවාලු. මෙවැනි දේ සිදු වී තිබෙනවාද නැද්ද කියා සෝදිසි කර බලන්න.

උක් වවන මණ්ඩියේ ගෙවල් 200 ක් පමණ තිබෙනවාලු. ඒවා ගොවි ජනපදවා සින් වෙනුවෙන් හැදූ ඒවාලු. ඒවා දැන් සම්පූර්ණයෙන් කඩා බිඳ දමා තිබෙන වාලු. එසේ කිරීමට කිසිම වුවමනාවක් නැහැ. ඒවාසිනුත් ප්‍රයෝජනය ගන්න පුළුවනි. උක් වවන මණ්ඩියට කිට්ටුව වෙල් යායක් තිබෙනවා. ළඟම තිබෙන පැක්ටරි යෙන් ලෙහෙසියෙනුත් පහසුවෙනුත් පඩි යක් ලබා ගැනීමේ මාර්ගය පෑදී තිබෙන නිසා දැන් ඒ කුඹුරුවල වැඩ කිරීම නවත් වලාලු. එයින් ලොකු පාඩුවක් සිද්ධ වෙන්න පුළුවනි. ඒ ගැනත් තමුන්නාන් සේ සොයා බලන්න උත්සාහ කරන මෙන් කරුණාවෙන් ඉල්ලනවා.

තවත් ගරු මන්ත්‍රීන් මේ අමාත්‍යාංශය යටතේ නොයෙක් කරුණු සම්බන්ධයෙන් කථා කරන්න බලාපොරොත්තුවෙන් සිටින නිසා මීට වඩා කාලයක් ගත කරන්න මා අදහස් කරන්නෙ නැහැ. තමුන්නාන්සේ භාර අරන් තියෙන්නෙ බොහොම භාර දූර වැඩක්. කර්මාන්ත දියුණු කිරීම, කර්මාන්ත ඇති කිරීම බොහොම වැදගත් වැඩක්. එය තමන්ගේ සම්පූර්ණ කාලය මිඩංගු කර කළයුතු වැඩක් හැටියට සල කන්න ඕනෑ. ඒ නිසා කැබිනට් මණ්ඩල යේ අනෙක් ගරු ඇමතිවරුන්ටත් ගරු අගමැතිනියටත් කියා කර්මාන්ත අංශය පම ණක් භාර ගන්නා මෙන් එතුමාගෙන් මා කරුණාවෙන් ඉල්ලනවා. එසේ කළොත් මම හිතනවා අද තිබෙන දුර්වලතාවයන් සම්පූර්ණයෙන් නැති කර දමන්නට පුළු වන් වේවිය කියා. ඒ හෙයින් එසේ කරන්නට පුළුවන් වේවායයි ප්‍රාර්ථනය කරමින් මගේ කථාව අවසන් කරනවා.

සේනපාල සමරසේකර මයා. (අක්මීමන)

(திரு. சேனபால சமரசேக்கர—அக்மீமன)

(Mr. Senapala Samarasekera—Akmeemana)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සවදේශ කටයුතු සහ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ මට වචන සවලාපයක් ප්‍රකාශ කරන්නට තිබෙනවා. ගඩොල් සහ උළු කර්මාන්තය මගේ ප්‍රදේශයේ විශාල වශයෙන් කෙරෙන නිසා කර්මාන්ත ශාලාවක් ඇරඹීමට රජ යෙන් ආධාර ලබා ගැනීමේ බලාපොරොත් තුවෙන් ඒ පිළිබඳව මූලික පරීක්ෂණයක් කිරීමට නිලධාරියෙකු එවන්න කියා මාස කීපයකට කලින් ගරු ඇමතිතුමා හමු වී මා ඉල්ලීමක් කළා. මේ සම්බන්ධයෙන් මා හමු වී කරුණු සොයා බලන්නය කියා එවෙලේම ගරු ඇමතිතුමා නියම කළා. දැන් මාස හත අටක් පමණ ගත වී තිබෙන නමුත් අදවන තුරු මා හමුවන්නට කිසිවකු ආවේ නැති බව සඳහන් කරන්නේ කනගාටුවෙනුයි.

මෙම කර්මාන්තයේ යෙදෙමින් ජීවිකාව කර ගන්නා වූ දහස් ගණනක් මගේ ප්‍රදේශයේ සිටිනවා. අද දින පිට රටින් උළු ගෙන්වීම සඳහා විශාල මුදලක් මේ රටින් ඇදී යනවා. ඒ නිසා මෙම කර්මාන්තය දියුණු අන්දමින් පවත්වාගෙන යාමට කර්මාන්ත ශාලාවක් සාදා දුන්නොත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රටෙන් ඇදී යන විශාල මුදල් ප්‍රමාණය මේ රටේම නවත්වා ගන්නට පුළුවන්වනවා පමණක් නොව රැකී රක්ෂා ප්‍රශ්නයද තරමක් දුරටවත් විසඳන්නට පුළුවන් වෙනවා. මෙම කර්මාන්තයට ආධාර දීමට රජයෙන් කම්හලක් සාදා දුන්නොත් රජයේ වෙන අනෙක් කම්හල් මෙන් මෙය නම් සුදු අලියෙක් නොවන බව මට ඉදුරාම කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගිංතොට තුනී ලෑලි කම්හල සම්බන්ධයෙන් ද වචන සවලපයක් කියන්න තිබෙනවා. රජය මගින් පවත්වාගෙන යන කම්හල අතුරෙන් ලාභ ගෙන දෙන කර්මාන්ත ශාලා දෙක තුනක් හෝ තිබෙනවා නම් ගිංතොට තුනී ලෑලි කර්මාන්ත ශාලාව ඉන් එකක් බව කියන්න පුළුවන්. නමුත් මෙහි වැඩ කරන්නා වූ කම්කරුවන්ට නොයෙක් හිරිහැර විඳින්නට සිදු වී තිබෙනවා. මෙම කර්මාන්ත ශාලාවේ පාලක මණ්ඩලය මෙහි වැඩ කරන කම්කරුවන්ගේ දුක්ගැනවිලි ගැන සැහෙන ප්‍රමාණයකට සොයා බලනවායයි කියන්නට බැහැ. එමෙන්ම දැනට වඩා වැඩ දන්නා වූ කම්කරුවන් මෙම ආයතනයට බඳවා ගත යුතු බවත් මා කියන්න කැමතියි. එසේ කළොත් කම්කරුවන් අතර සමගියක් ඇති වී, මෙහි තිබෙන්නා වූ යම් යම් වැරදි ආදිය පෙන්වා දෙමින් එය දියුණු කර ගැනීමේ මාර්ග පෙන්වා දෙන්නට පුළුවන්. එපමණක් නොව එවැනි වැඩපිළිවෙළක් ඇති කළහොත් කම්කරුවන් අතර දැනට වඩා සමගියක් ඇති වෙනවා පමණක් නොව තව තවත් හොඳින් වැඩ කිරීමටද ආසාවක් ඔවුන් තුළ ඇති වෙනවා නොඅනුමානයි. මෙම කර්මාන්ත ශාලාවට අවශ්‍ය පමණ ලී සපයා දෙන්නට ක්‍රම වත් වැඩ පිළිවෙළක් යොදවන්න ඕනෑ. අද දින ලෑලි ගෙන්වීම සඳහා පිට රටට විශාල මුදලක් ඇදී යනවා. එසේ නැතිව මීට වඩා ලාභ පිළිවෙළකට මෙම කම්හලට වුවමනා තරම් ලෑලි සපයා දෙන්නට පුළුවන් නම් මෙහි නිෂ්පාදනය දෙතුන් ගුණයකින් වැඩි කරගන්න පුළුවන් වේවි. එවිට තවත් දහස් ගණනකට රක්ෂාවල් දෙන්නට පුළුවන් වෙනවා පමණක් නොව ලාභ වශයෙන් විශාල මුදලක් ඉතිරිකර ගන්නද පුළුවන් වෙනවා.

මෙම කම්හල ගැන මේ ප්‍රදේශවාසීන් තුළ තිබෙන්නා වූ එක්තරා කලකිරීමක් ගැනද මා මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මතක් කර දෙන්න ඕනෑ. ඒ කාරණය පිළිබඳව ගරු ඇමතිතුමාට මා කරුණු ඉදිරිපත් කළ අවස්ථාවේදී මෙම කම්හල පිහිටා තිබෙන ප්‍රදේශයට සැතැප්ම 5 ක් 10 ක් ඇතුළත සිටින්නා වූ අය කම්කරුවන් වශයෙන් බඳවා ගත යුතුය කියා ඇමතිතුමා නියම කළා. ඒ කොයි හැටි වුණත්, දැන් බොහෝම පුදුම විධියට අළුත් ක්‍රියා මාර්ගයක් ගෙන යනවා. ස්ථිර කම්කරුවන් පත් කරන්නේ නැතිව, කම්කරුවන් තිහක් හතළිහක් අරගෙන මාසයක් වැඩ දී, නවත්වා, ඊට පසු නැවතත් අළුත් පිරිසක් බඳවා ගන්නවා. මම හිතනවා කම්හල විශාල කර කම්කරුවන්ට වැඩ දීමට අවසථාවක් ඇති කළොත්, අපට සෑම දෙයක්ම හරියාකාර සාධාරණ ලෙස විසඳා ගන්න පුළුවන් වේවිය කියා.

අ. භා. 6

ඒ වාගේම තවත් වැදගත් කාරණාවක් ගැන ගරු ඇමතිතුමාගේ සිත යොමු වී තිබෙනවා. එනම් Oil refinery නොහොත් තෙල් පෙරීමේ මධ්‍යස්ථානයක් ඇති කිරීමයි. දැන් රටේ තිබෙන කථාව අනුව, මෙම මධ්‍යස්ථානයත් වෙනත් ප්‍රදේශයකට ඇදෙන්නට සූදානම් වන බව දැන ගන්නට තිබෙනවා. මේ සම්බන්ධයෙන් මම නිලධාරීන්ට දොස් කියනවා නොවෙයි. නමුත්, අපේ සෑම කර්මාන්තයක්ම උතුරු නැගෙනහිර පළාත් වලට ඇදෙන ගතියකුයි තිබෙන්නේ. එය මේ ආණ්ඩු කාලයේදී නොව අධිරාජ්‍යවාදී යූ. එන්. පී. කාලයේදී සිටම සිදු වේගෙන එන එකක්. අපේ සෑම කර්මාන්තයක්ම උතුරට හා නැගෙනහිරට ඇදෙන ගතියක් තිබෙනවා. ඒවා දකුණට ඇදෙනවා බොහෝම අඩුයි. දකුණට ලැබී තිබෙන්නේ තුනී ලෑලි කම්හල පමණයි. දැනට ගාලු වරාය සංවර්ධනය කරගෙන යනවා. ගාලු වරායට නුදුරිනුයි මගේ ඡන්ද කොට්ඨාශයත්, හබරාදුව ඡන්ද කොට්ඨාශයත් පිහිටා තිබෙන්නේ. එම නිසා ඒ ඡන්ද කොට්ඨාශවලින් අක්කර දෙතුන් සියයක පමණ තැනි තලා භූමියක් තෝරාගෙන තෙල් පෙරීමේ කම්හලාව පිහිටුවීමට පුළුවන් වනවාට කිසිම සැකයක් නැහැ. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සේනපාල සමරසේකර මයා.]

ආකාරයෙන් කටයුතු කර, සෑම දෙයක්ම උතුරටත් නැගෙනහිරටත් දෙන්නේ නැතිව, දකුණටත් දෙන හැටියට මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) රෙදි වියන මධ්‍යස්ථාන ගැන කිව්වා. එම නිසා මමත් ඒ ගැන වැඩි යමක් කියන්නට යන්නේ නැහැ. රෙදි වියන මධ්‍යස්ථාන ගැන ඇමතිතුමාත් සමග සාකච්ඡා කළ අවස්ථාවේදී එතුමා කිව්වා, රෙදි වියන මධ්‍යස්ථානවල වියන රෙදි විකිණීමට අමාරුකම් තිබෙනවාය එම නිසා "පවර් ලූම්ස්" ගෙන්වන්න අදහස් කරනවාය කියා. මම නම් කැමතියි, ප්‍රතිපත්තියක් වශයෙන් අතින් රෙදි වියන මධ්‍යස්ථාන දෙනවා නම්. එසේ කළ විට, අපේ ඡන්ද කොට්ඨාශවලට ටිකක් වැඩ කර පෙන්වන්නත් පුළුවනි, ඒ වාගේම සුළු වශයෙන් වුවත් රැකී රක්ෂා ප්‍රශ්නයත් තරමක් දුරට විසඳෙනවා ඇති. කොයි හැටි වුණත්, මගේ කොට්ඨාශයට ලොකු අසාධාරණයක් සිදු වී තිබෙනවා. ඒ ප්‍රදේශයේ South Ceylon Youth Council නමැති ආයතනයේ සිය ගණනක් ළමයින් රෙදි වියන වැඩ ඉගෙන ගත්තා. ඒ අයට දැන් අවුරුදු කීපයක සිට නූල් දුන්නා, ඒවා ගෙදර ගෙන ගොස් යන්ත්‍රවලින් රෙදි වියා ආපසු ගෙනත් දෙන්නය කියා. අවුරුදු ගණනක සිට ඒ ක්‍රමය කර ගෙන ආවා. සැතපුම් 5-6 දුර ප්‍රදේශවල ළමයින් මෙම මධ්‍යස්ථානයෙන් වැඩ ඉගෙන ගෙන තමන්ගේ යන්ත්‍රවලින් ගෙදර ගොස් රෙදි වියා ගෙනත් දී මුදල් ලබා ගැනීමට පුරුදුව සිටියා. ඒ අයට එතැනින්ම නූලක් ලැබෙනවා. ඒ ක්‍රමය නිසා රැකී රක්ෂා ප්‍රශ්නය සාමාන්‍ය වශයෙන් විසඳෙනවා. නමුත් පුදුමයකට මෙන් මේ අළුත සිට—කොයි දෙපාර්තමේන්තුවක නිලධාරීන්ද කියා මම දන්නේ නැහැ, යල් පැනපු පරණ නීතියක් මතුකර දැන් කියනවාලු—ඒ "යූත් කවුන්සිල්" එක තිබෙන්නේ හිරිඹුර කියන ප්‍රදේශයේයි—ඒ ගමේ සිටින උදවියට පමණයි, එතැන වැඩ කරන ළමයින්ට පමණයි, නූල් දෙන්නට පුළුවන් කියා. එහෙම නම් අවුරුදු ගණනක් තිස්සේ මේ නිලධාරීන් බුදියගෙන සිටියාද කියා මා අහන්න කැමතියි. මේ යල් පැනපු නීතිය මතුකර තිබෙන නිසා දැන් කලින් එයින් ප්‍රයෝජනය ලබමින් සිටි අය මහත් කරදරයකට—ලොකු අමාරුවකට—පත් වී සිටිනවා. දැන් නූල් ලැබෙන්නේත් නැහැ. නූල් ලැබෙන්නේ නැති නිසා රෙදි වියන්නත් බැහැ. එම නිසා රෙදි විකුණන්නත් බැහැ. සිය ගණනක් දැන් අමාරුවේ වැටී සිටිනවා. මේ සම්බන්ධයෙන් ඒ අය විසින් සකස් කරගත් ලද පෙත්සමක් දැන් සුමානයකට දෙකකට උඩදී මම ඇමතිතුමාට ඉදිරිපත් කළා. දැන් අළුතෙන් මධ්‍යස්ථාන ඇති කරන්නෙත් නැති නිසා මෙපමණ කාලයක් ඒ කට යුත්ත බොහෝම අමාරුවෙන් කරගෙන ආ උදවිය ගැන විශේෂ අනුකම්පාවක් දක්වා කලින් කරගෙන ආ විධියටවත් ඒ අයට කටයුතු කරන්නට ඉඩ ලබා දෙන හැටියට ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මිළඟට මම කථා කරන්නට බලාපොරොත්තු වන්නේ සුරා ප්‍රශ්නය ගැනයි. සභාපතිතුමනි, සුරා ප්‍රශ්නය ගැන ගාල්ලේ ඒ කාබද්ධ කොමිටියේ කථා කරන්න ගිහින් ගාල්ලේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබූ යෝජනාවක් ගැන අන්තිමේදී කථා කරන්නට සිදු වූයේ දොරවල් වසා ගෙනයි. රා ප්‍රශ්නය ගැන කථා කරන්න ගිහින් එවැනි තත්ත්වය කුයි ඇති වුණේ. හැබැයි එක්කෙනකුවත් රා බී සිටියේ නැහැ. ලොකු කෝලාහලයක් වෙන්නත් ගියා.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
රා නොබී වෙරි වුණා.

සමරසේකර මයා.
(திரு. சமரசேக்கர)
(Mr. Samarasekera)
කවුරුවත් රා බී සිටියේ නැහැ. රා ගැන කථා කර ගන්න ගිහින් ගහ ගන්නත් ගියා. හැබැයි මම නම් නොවෙයි. කොයි හැටි වුණත් දැන් සෑම ගමකම අස්සක් මුල්ලක් නැර හොර සුරා බෝ වී තිබෙනවා. ඒවා නොයෙක් නොයෙක් නම්වලින් හඳුන්වනවා. අපේ විරුද්ධ පක්ෂයේ නායකතුමාගේ නම යොදා තිබෙනවාලු. අගමැතිණියගේ නමත් යොදා තිබෙනවාලු. අපේ පළාත්වල නම් ඒවාට කියන්නේ "කරිඤ්ඤං" කියලයි. මේක අළුත් නමක් වෙන්න පුළුවනි. නමුත් සෑම ගෙදරකම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දැන් කරිසිඳුං හදනවා. මේක නැති කරන්න තිබෙන එකම ක්‍රමය නම්, යාපනයේ වාගේ සෑම ප්‍රදේශයකම රා මදින්න අවසර දීමයි. ගාල්ලේ පැවති දිස්ත්‍රික් සම්බන්ධකරන කාරකසභා රැස් වීමේදී ගාල්ලේ දිසාපතිතුමා පරණ පුස් කාපු වාර්තාවක් ඉදිරිපත් කරල කියනවා, යාපනයේ රා මැදීමට අවසර දීම නිසා කාන්තාවන් හා ළමයින් රා බොන්න පුරුදු වී සිටිනවාය කියා. මෙයට පිළිතුරු දුන් එම කොමිටියේ උප සභාපතිතුමා කීවා, යාපනයේ ජනතාව රා බීමට පුරුදු වුණත් ඒ අයට ඒ කෙන් කිසි පාඩුවක් සිදු වෙලා නැත කියා. අද ආණ්ඩුවේ රැකීරක්ෂා වල යෙදී සිටින්නන්ගෙන් වැඩි දෙනා යාපනයේ වැසියනුයි. එපමණක් නොව බොහෝ උගත් අය යාපනයේ ප්‍රදේශ යෙන් එනවා. නමුත් අපේ පළාත්වල වැසියන් හොර සුරාවට ඇබ්බැහි වෙලා සිටීම නිසා සියලු දෙනාටම යන්න සිදු වෙන්නේ ඉස්පිරිතාලවලටයි. මම මේ කාරණය ගැන ගරු ඇමතිතුමාගේ විශෙෂ සැළකිල්ල යොමු කරවන්න කැමතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බෞද්ධ කොමිෂන් සභා වාර්තාවෙන් කොයි අන්ද මේ යෝජනා ඉදිරිපත් කළත්, කොමිෂන් සභා වාර්තාවල තිබුණු පලියටම යම් යම් දේවල් කරන්න ආණ්ඩුවට බැහැ. ආණ්ඩුව නිතරම කටයුතු කළ යුත්තේ මහජන මතය අනුවයි, මහජන යහපත සඳහායි. අර කොමිෂන් සභාවේ මේ විධියට යෝජනා කරල තිබෙනවාය; මේ කොමිෂන් සභාවේ මේ විධියට අනුමත කර තිබෙනවාය, කියා වැඩ කරන්න පුළුවන් කමක් නැහැ. ඒ නිසා බෞද්ධ කොමිෂන් සභා වාර්තාවෙන් කොයි විධියේ කාරණා අනුමත කර තිබුණත් මේ රටේ පැතිරී තිබෙන හොර සුරා ව්‍යාපාරය නැවැත්වීමට තිබෙන වැදගත්ම පිළියමක් තමයි, ගස් මැදීමට අවසර ලබා දීම. එපමණක් නොවෙයි, මේ නිසා විශාල සංඛ්‍යාවකට රැකීරක්ෂා ලබා දීමටත් පුළුවන් වෙනවා. එක ගසකට රුපියල් 10 ගණනේ නොවෙයි, රුපියල ගණනේ ලැබුණත් විශාල ආදායමක් රජයට ලබා ගන්න පුළුවන් වෙනවා. විශෙෂයෙන්ම ආර්ථික දුෂ්කරතාවයකට මුහුණ පාන්න වී තිබෙන මේ අවධියේදී රජයට මෙය විශාල ආදායම් මාර්ගයක් සේ අපට සලකන්න පුළුවනි.

ඒ වාගේම කිතුල් රා මැදීමට අවසර දීම සම්බන්ධයෙන් ගලගෙදර ගරු මන්ත්‍රීවරයාට (අබ්දුල් ජබාර් මයා.) ලොකු කරදරයක් තිබෙනවා. මම ඒ ගැනත් එක්තරා කාරණයක් කියන්නම්. අපේ ගමට අල්ලපු ගමේ එක්තරා වයස්ගත කාන්තාවක් කිතුල් ගසක් මැද ගැනීම සඳහා දිසාපතිතුමාගෙන් අවසර පත්‍රයක ඉල්ලා යැවුවා. ගම්මුලාදැනියාගේ වරදින් හෝ නැතිනම් කාගේ වරදකින් හෝ මෙය දිසාපතිතුමාට ප්‍රමාද වෙලයි ලැබී තියෙන්නෙ. නමුත් මේ අතරතුර — බලපත්‍රය ලබා ගන්න පෙර—සුරාබදු දෙපාර්තමේන්තුවෙන් මේ අය බලපත්‍ර නැතුව කිතුල් ගසක් මැදීමේ වරදට අල්ලා ගෙන තිබෙනවා. මේ නිසා ඒ අහිංසක උදවියට අපමණ හිරිහැරවලට භාජන වන්න සිදු වෙලා තියෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී ගාල්ලේ සුරාබදු කාර්යාලය ගැනත් වචනයක් නොකියාම බැහැ. ගරු ඇමතිතුමා මේ අවස්ථාවේදී මේ ස්ථානයේ නොසිටීම ගැන මම කනගාටු වෙනවා. සමහරවිට එතුමාට හදිසි කටයුත්තක් තිබෙනවා වෙන්න ඇති. එතුමාට මගේ ලොකු ගෞරවයක් තිබෙනවා. එතුමා බොහෝම හොඳ ගුණ යහපත් කෙනකු හැටියට රටේ කවුරුත් පිළි අරගෙන තිබෙනවා. එපමණක් නොවෙයි. එතුමා දෙපාර්තමේන්තුවල වැඩ කටයුතු ගැන වුවමනාවට වඩා ඇඟිලි ගසන්නේ නැති ඇමතිවරයකු හැටියට ඒ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පවා පිළිගෙන තිබෙනවා. නුමුත් කොයි තරම් හොඳ කෙනකු වුණත් එතුමා යටතේ තමයි, ලංකාවේ තිබෙන දෙපාර්තමේන්තුවලින් ඉතාම නරක දෙපාර්තමේන්තුව තිබෙන්නේ. ඒ එක් සයිස් නැතිනම් සුරාබදු දෙපාර්තමේන්තුවයි. නමුත් කියන්න කනගාටුයි, මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන සෑම නිලධාරියකුගෙන්ම වාගේ මෙම හොර සුරා ජාවාරම් කාරයින්ට අනුබල ලැබෙනවා. මා කියන්නේ නැහැ මේ දෙපාර්තමේන්තුවේ සේවය කරන සියයට සියයයක්ම නිලධාරීන් නරකයි කියා. අවංකව තම සේවය කරන නිලධාරීන් සිටියත් ඒ නිලධාරීන්ට හොඳින්, අවංකව තම වැඩ කටයුතු කරගෙන යන්න ඉඩ ලැබෙන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සමරසේකර මයා.]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීට මාස කීපයකට උඩදී මම අපේ පළාතේ සුරාබදු සුපිරින්ටෙන්ඩන්ට් වරයාට විදුලි පණිවුඩ යක් යැව්වා, මගේ ගෙට නුදුරින් හොර සුරා පළවල් දෙකක් පවත්වාගෙන යන බාය කියා. මම ලිපියක් යැව්වේ නැත්තේ ලිපි ගැන ඒ අය කොහෙත්ම සැලකිල්ලක් දක්වන්නේ නැති නිසයි. නමුත් මම යැවූ විදුලි පණිවුඩයටද සිදු වූයේ ඒ දෙයමයි. මාස ගණනක් ගත වී ගියත් මගේ විදුලි පණිවුඩයට කිසිම පිළිතුරක් ලැබුණේ නැති නිසත්, ඒ ගැන කිසියම් ක්‍රියා මාර්ගයක් අනුගමනය කර නැති නිසත්, මම කොළඹට පැමිණි දිනක සුරාබදු කොමසාරිස් වරයා හමුවෙන්ට ගියා. මම එතුමාට මේ කාරණය පැහැදිලි කර දුන්නා. මම විදුලි පණිවුඩයක් එවූ බවත් ඒ ගැන සැලකිල්ලක් දක්වනවා නබා එයට පිළිතුරක්වත් එවීමට තරම් සුරාබදු දෙපාර්තමේන්තුව උනන්දුවක් නොදැක්වූ බවත් මම පැහැදිලි කර දුන්නා. ඇත්ත වශයෙන් එතුමා මේ කාරණය ගැන බොහෝම කනගාටු වුණා. මේ සම්බන්ධයෙන් ලොකු උනන්දුවකින් එතුමා කටයුතු කළ බවට පසුව පෙනී ගියා. එතුමාගේ උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් එතෙක් පවත්වාගෙන ආ ඒ හොර සුරා පළවල් වලින් එකක් සම්පූර්ණයෙන්ම වසා දමන්න සිදු වුණා. අනිත් හොර සුරාපළ දැන් දුව දුව තම වෙළඳාම කරගෙන යන බව දැනගන්න ලැබී තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සුරාබදු දෙපාර්තමේන්තුවේ අනිකුත් නිලධාරීන් කෙසේ වෙතත් සුරාබදු කොමසාරිස්වරයා නම් අවංකව, උනන්දුවෙන් කටයුතු කර ගෙන යන බව අපට පෙනී යනවා. එහෙත් එම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන අනිකුත් නිලධාරීන්ගේ සහයෝගයක් නැතිකම නිසා එතුමාට තම වැඩ කටයුතු නිසියාකාර කරගෙන යන්න පුළුවන් කමක් නැහැ. එහෙත් එතුමාගේ උත්සාහය, මහන්සිය, ගැන ස්තුතිවන්ත වන්න ඕනෑ.

අද සුරාබදු දෙපාර්තමේන්තු යටතේ සේවය කරන සුරාබදු නිලධාරීන් පරීක්ෂකවරුන්, ආදීන් පමණක් නොවෙයි, එම කාර්යාලවල සේවය කරන පියන්වරුන් පවා හොර සුරා ජාවාරම් කාරයින්ගෙන් අල්ලස් ලබාගැනීමට පුරුදු වී සිටිනවා. මේ නිසා බොහෝමයක් නිලධාරීන් ධනපති යන් වෙලා සිටිනවා.

ඒ ඒ ප්‍රමාණයේ හැටියට රුපියල් 50, රුපියල් 100, 150, 200, 300 සෑම සොර සුරා පළකින්ම ලබා ගන්නවා. ඒ මුදල් මාසේ අන්තිමේදී එකතු කොට තම තමන්ගේ නිලතලවල හැටියට බෙදා ගන්නවා. පියුන්කරුවෙත් කොටසක් යනවා. සුරාබදු පරීක්ෂකවරුන්ට කොමසාරිස්තුමාටත් වඩා වැඩි ආදායමක් මේ අල්ලස් ගැනීම නිසා ලැබෙනවා. එවැනි දේ නොකරන නිලධාරියකු සිටියත් කොයි අන්දකින් හෝ යටිකුවිටු වැඩ කොට ඒ නිලධාරියා මාරු කර හැරීමට කටයුතු සලස්වනවා. දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් සමහර විට මේවා දන්නේ නැතිව ඇති. කෙසේ වුවත් සමහර නිලධාරීන් අපට කියනවා, තත්ත්වය මෙසේ වුවත් මේවා ගැන කියා අපට බේරුමක් නැති නිසා, කියනවා නම් නම් නොකියා කරුණු ඉදිරිපත් කරන්නය කියා.

මේ රටේ හොර සුරාව නැති කිරීමට නම් රා මැදීමට බලපත්‍ර දිය යුතුයි. සුරා බදු දෙපාර්තමේන්තුව රටේ හොර සුරා ඇති කරන දෙපාර්තමේන්තුවක්, නැති කරන දෙපාර්තමේන්තුවක් නොවෙයි. හොඳ නිලධාරීන් කීප දෙනෙක් හදිසියේ සිටියත් ඉන් වැඩක් නැහැ, සියයට අනූවකටත් වඩා අල්ලස්කාරයින් සිටින නිසා. මෙසේ කීමට සිදු වීම ගැන මම බොහෝම කනගාටු වෙනවා. දුප්පත් මිනිහෙක් ගහක් මැද ගෙන බිව්වොත් ඔහු ඇල්ලීමට නම් යනවා. නමුත් ඒ යන්නේ විශාල හොර සුරා පොළවල් පසු කර ගෙනයි. එසේ වුවත් ඒ දෙස නම් ඔවුන් බලන්නේ නැහැ. මගේ පළාතේ විශාල හොර රා පොළක් පැමිණිලි ගණනාවක් ගියාට පසු වැටලුවා. වටලා එහි තිබුණු සියලුම රා හැලි අරගෙන ගියාලු. නමුත් එදා රාත්‍රියේදීම එක රා හැලියක් හැර අනික් සියල්ලම ආපසු දී තිබෙනවා. ඉතින් මේවා කාටද කියන්නේ? දෙපාර්තමේන්තුවට කිව්වත් වැඩක් නැහැ. ඇමතිතුමාට කිව්වත් වැඩක් නැහැ. ඇමතිතුමා දෙපාර්තමේන්තුවෙන් රිපෝර්තුවක් ඉල්ලනවා. දෙපාර්තමේන්තුව ඒ හොරාටම පිටත් කරනවා, පිළිතුරු එවන්නය කියා. පාර්ලිමේන්තුවේ ඒ පිළිබඳව ප්‍රශ්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යක් ඇසුවත් අපට ලැබෙන්නේ අර හොරා දෙන උත්තරයමයි. ඒ නිසයි, මේ දුෂ්ණ දිගින් දිගටම සිදු වන්නේ.

මම හොර සුරාවට විරුද්ධව බොහෝ කට යුතු කර තිබෙනවා. පොලීසිය ලවා සොර සුරා පොළවල් කීපයක්ම වටලවා තිබෙනවා. සුරා බදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කොමසාරිස්වරයාට එතුමාගේ නිලධාරීන් ගෙන් අහන්න පුළුවනි, ඔවුන්ට වටලන්නට බැරි හොර සුරා පොළවල් පොලීසිය වටලන්නේ කෙසේද කියා. ඇත්තෙන්ම ඒ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට දඬුවම් කිරීමෙන් නම් වැඩක් නැහැ. ඔවුන් සම්පූර්ණයෙන්ම අස් කරන්නට ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් නිසා මෙය කරන්න අමාරු වුවත් කළ යුත්ත නම් ඔවුන්ට පයින් ගසා එළවීමයි. එවැනි නරක නිලධාරීන් සිටීම දෙපාර්තමේන්තුවට නරකයි; දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නරකයි; ඇමතිතුමාට නරකයි; මුළු ආණ්ඩුවටම නරකයි.

මගේ කථාව අවසන් කිරීමට පෙර තවත් එක කාරණයක් කිය යුතුව තිබෙනවා. ඒ උප්පැන්න, විවාහ, මරණ ලියා පදිංචි කරන්නන් පිළිබඳවයි. යම්කිසි නිලයක් දරන කොටසක් මේ රටේ බොහෝම අමාරුවෙන් ජීවත් වෙනවා නම් ඒ මේ රෙජිස්ට්‍රාර්වරුනුයි. ඔවුන්ට උප්පැන්න මරණ ආදිය සම්බන්ධයෙන් ලැබෙන කොමිස් මුදල ඉතාමත් සුළුයි. නගරබදව නම් ජීවත් වන්නට සෑහෙන තරම් මුදලක් ලැබෙනවා ඇති.

අ. භා. 6.15

පිටිසර පළාත්වල සිටින රෙජිස්ට්‍රාර්වරුන් නිකම් වේලෙනවා. ඒ අයට ලැබෙන ආදායම මදි. එම නිසා ජීවත් වන්න පුළුවන් තත්ත්වයේ ආදායමක් උපදින ආකාරයට ඔවුන්ට ලැබෙන කොමිස් මුදල වැඩි කරන්න ඕනෑ; එහෙම නැතිනම් මාසික වේතනයක් දෙන්න ඕනෑ. මේ රෙජිස්ට්‍රාර්වරුන් වැදගත් නිලයක් දරන කොටසක් හැටියට අප සලකනවා. එම නිසා ඒ අයට එම නිලය දරන තුරු සාමදාන විනිශ්චයකාරවරුන් හැටියට කටයුතු කිරීමේ වරප්‍රසාද සලසා දෙන්න ඕනෑ. ලංකාවේ සිටින එවැනි සෑම කෙනෙකු වෙනුවෙන්ම එසේ ක්‍රියා කරන්න ඕනෑ. මේ කාරණය ගැන මීට වඩා යමක් කියන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ.

මීට සවලප වේලාවකට ප්‍රථම මට එක් වචනයක් ඉල්ලා අස් කර ගන්න ලෙස ගරු සභාපතිතුමා නියෝග කළා. සමහර නිලධාරීන් කරන වැරදි ගැන මතක් වන විට ඉඛේම ඒ අන්දමට කිය වෙනවා. ඒ වරද වෙනුවෙන් මා නැවතත් වරක් සමාව ඉල්ලනවා. එක්සයිස් දෙපාර්තමේන්තුව එක්කෝ නැති කර දමන්න ඕනෑ; එසේ නැතිනම් එම දෙපාර්තමේන්තුවේ සේවය කරන නරක නිලධාරීන් අස් කර හොඳ නිලධාරීන් පත් කරන්න ඕනෑ. රටේ මහ ජනතාවට හිරිහැර නොකරන නිලධාරීන් පත් කරන්න ඕනෑ. ගිය සතියේ ද කෙනෙක් ඇවිත් මට එක්තරා පැමිණිල්ලක් කළා. "මන්ත්‍රීතුමනි, අපේ ගෙවල් අසල "කරිංඤ්ඤං" කියන හොර සුරා වගීය විකුණනවා. ඒ ගැන කියා මා පෙත්සම් කීපයක් යැව්වා. ඒ පෙත්සම් යැව්වාට "කරිංඤ්ඤං" විකුණන තැන වැටලුවේ නැහැ. අන්තිමේදී මගේ ගෙදර 'කරිංඤ්ඤං' කළයක් තිබුණාය කියා බොරු චෝදනාවක් කොට මට නඩුවක් දමා තිබෙනවා," යනුවෙන් ඒ තැනැත්තා මා ඉදිරියේ එම පැමිණිල්ල කළා. ඒ තැනැත්තාගේ නම ගම වුණත් කියන්න පුළුවනි. ඒ විධියේ සිද්ධීන් ගැන ලියා එවූ විට කොමසාරිස්තුමා කියනවා මේ සම්බන්ධව නඩුවක් උසාවියේ තිබෙන නිසා තමාට මැදිහත් වන්න බැරිය කියා. හොර සුරාපොළක් ගැන ඔත්තුව දීපු පුද්ගලයා අන්තිමේ විත්තිකාරයා බවට පත් වුණ හැටි මා කී කථාවෙන් පෙනී යනවා ඇති. මේ අන්දමේ අසාධාරණ ක්‍රියා අද රටේ බොහෝ සෙයින් සිදු වෙනවා. දුප්පත් කෙනෙකුට හොර සුරාපොළක් කිට්ටුව වාසය කරන්න බැරි තරමයි.

ගාල්ල පැත්තේ තත්ත්වය ගැන කියන්න කැමතියි. මා දන්නේ නැහැ අනිකුත් පළාත්වල කොහොමද කියා. ගිය සතියේ, සඳුදා, මට පෙත්සමක් ලැබුණා අක්මීමන පොලීසියට යාබදව පිහිටි ඉහළ ගොඩ කියන හරියේ "කරිංඤ්ඤං" රා පොලක් තිබෙනවාය කියා. ගාල්ලේ එක්සයිස් දෙපාර්තමේන්තුව ගැන මගේ කිසිම විශ්වාසයක් නැහැ. හොර සුරාපොළවල් ගැන ලියුම්වලින් දැනුම් දුන්නාට දෙපාර්තී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සමරසේකර මයා.]

මේන්තුවට ඒ ලියුම් ලැබෙන්නේ නැතිලු. එම නිසා මා පොලිස් ඉන්ස්පෙක්ටර් මහතාටත් ඒ.එස්.පී. මහතාටත් ටෙලිග්‍රෑම් මගින් දන්වා——

ගරු මන්ත්‍රීවරයෙක්

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

රෙජිස්ටර් ලියුම්වලට උත්තර ලැබෙනවාද?

සමරසේකර මයා.

(திரு. சமரசேக்கர)

(Mr. Samarasekera)

ටෙලිග්‍රෑම්වලටත් උත්තර නොලැබෙන තත්ත්වයක් තිබෙනවා නම් රෙජිස්ටර් ලියුම්වලට උත්තර ලැබේවිද කියන එක ගරු මන්ත්‍රීතුමා තේරුම් කර ගන්න ඕනෑ.

අක්මීමන පොලීසිය පිටුපස තිබෙන අසුවලාට අයිති අසුවල් සොර සුරා පොළ සතියක් ඇතුළතදී නැති නොකළොත් ඒ ගැන පාර්ලිමේන්තුවේදී කරුණු කියා සිටිනවාය යනුවෙන් මා දන්වා හැරියා. මේ වතාවේ මා ගෙදර යන විට ඒ විධියට කටයුතු කර තිබෙනවාද කියා බලන්න ඕනෑ. හොර සුරා සදන අය විශාල ගෙවල් පවා සදාගෙන තිබෙනවා, ඒවායින් ලබන ආදායම්වලින්. හොර සුරා බීමෙන් මහජන තාව ලෙඩුන් බවට පත් වන්ට ඉඩ නොතබා හොර සුරා මැඩ පැවැත්වීම සඳහා වැඩ පිළිවෙළක් යොදන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. හොර සුරා මැඩලීමේ මාගීයක් වශයෙන් කාටත් පොල් ගසක් මැද ගැනීම සඳහා අවසර පත්‍ර නිකුත් කරන හැටියට මා ඉල්ලා සිටිනවා. එසේ අවසර පත්‍ර නිකුත් කිරීමේදී රජයට යම්කිසි මුදලක් අය කර ගන්නත් පුළුවනි. යාපනයේ අයට තල් රා මැද ගැනීමට අවසර දී තිබෙන්නා වාගේ මේ පළාත්වල අයටත් ඒ අන්දමේ සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ඇල්බට් සිල්වා මයා.

(திரு. அல்பேட் சில்வா)

(Mr. Albert Silva)

ගරු උප සභාපතිතුමනි, සුරා බදු ප්‍රතිපත්තිය ගැන සහ සුරා බදු දෙපාර්තමේන්තුව ගැන අක්මීමන ගරු මන්ත්‍රීතුමා (සේනපාල සමරසේකර මයා.) කී කරුණු ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු විය යුතු බව මමත් ප්‍රකාශ කරන්න කැමතියි. තල් ගස් මැදීමට අද උතුරු පළාතේ සෑම කෙනකුටම අවසර දී තිබෙනවා. උතුරු පළාතේ තල් රා මැදීම කෙරෙන නිසා අද ඒ පළාතේ කිසිම කෙනෙක් කසිප්පුවලටවත්, කරිසිඳුවලටවත් ඇබ්බැහි වෙලා නැහැ. හොඳ පුරවැසි පිරිසක්, හොඳ උගත් ජනාතවක්, උතුරු පළාතෙන් බිහි වෙලා තියෙනවා. උතුරු පළාතේ ජනයාට කොයි තරම් මොළේ තිබෙනවාද යන්න තමුන්නාන්සේ දන්නවා ඇති. අද ඔඩිට් දෙපාර්තමේන්තුව දෙස බැලුවොත් ඒ දෙපාර්තමේන්තුවේ ඉන්න අය ගෙන් සියයට සියයක්ම උතුරු පළාතේ ද්‍රවිඩජනයා බව තමුන්නාන්සේට පෙනෙනවා ඇති. ඔවුන්ගේ මොළය ඒ තරම් දියුණු වෙලා තියෙන්නේ තල් රා නිසා වන්නට පුළුවන්. එම නිසා මේ කසිප්පු කරිසිඳුං ආදි විෂ මත්පැන් නැති කිරීමටත්, ආණ්ඩුවට ආදායමක් ලබා ගැනීමටත්, උතුරු පළාතට දී තිබෙන වරප්‍රසාදය දකුණු පළාතට පමණක් නොව ලංකාවේ අනිකුත් සෑම පළාතකටමත් දෙන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අක්මීමන ගරු මන්ත්‍රීතුමා කීවා වගේ ගසකට රුපියල් 10 බැගින් නොව රුපියල බැගින් අය කළත් ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයට විශාල මුදලක් ලබා ගන්නට පුළුවන්. එසේ විශාල මුදලක් ලැබෙන අතර කසිප්පු වසංගතයත් සම්පූර්ණයෙන්ම නැති වෙනවා. එම නිසා මේ සම්බන්ධව අවධානය යොමු කර කටයුතු කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මේ ගැන තවත් ප්‍රතිකර්මයක් කළ යුතුයි. අපේ ආහාර කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා නම් ඕවාට විරුද්ධ වෙයි. සමහර විට උන්නැහේ උපාසකයෙක් වෙන්නට පුළුවන්. උපාසක කම් කරලා මේ ආණ්ඩු කරන්න බැහැ. මේ සම්බන්ධයෙන් කළ යුතු අනික් ප්‍රතිකර්මය නම් අරක්කු මිළ අඩු කිරීමයි. දැනට රුපියල් 8 දක්වා අරක්කු මිළ අඩු කර තිබෙනවා. ඒ මදි. ඒ අරක්කු බෝතලය රුපියල් 5 කරන්න ඕනෑ. අරක්කු මිල රුපියල් 5ට බැස්සුවොත් අද තිබෙන කසිප්පු, කරිසිඳුං ආදියත් සම්පූර්ණයෙන්ම අතුරුදහන් වෙලා යනවා ඇති. එසේම ලංකාවේ නිපදවන අරක්කු,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලංකාවේ සෑම තානායමකම විකුණන්නට අවසරය දෙන්න ඕනෑ. විදේශිකයන් අපේ තානායමකට පැමුණුනාම ඔවුන්ට ලංකාවේ බීමක් ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. එම නිසා ඒ ගැනත් ඇමතිතුමාගේ අවධානය යොමු විය යුතුයි.

සුරා බදු දෙපාර්තමේන්තුව ගැන කිව යුතු කරුණක් තිබෙනවා. මගේ කොට්ඨාශයේ තැබෑරුමක් 1961 වර්ෂයේදී ටෙන්ඩර් කළා. ඒ තැබෑරුම 1960 වර්ෂයේදී ටෙන්ඩර් කළේ බොහොම සුළු මුදලකටයි ; රුපියල් 12,000කටයි. නමුත් වරාගල තැබෑරුම ටෙන්ඩර් කළාට පසු ඊට අල්ලපු ගමේත් තැබෑරුමක් පිහිටුවීමට අවසර දුන්නා. මේ ගැන මම ඇමතිතුමාට මතක් කළා. ඇමතිතුමා මොන ක්‍රියා මාර්ගයක් ගත්තාද මම දන්නෙ නැහැ. මහ පාරේ සිට හැතැප්ම 6 ක් දුර ස්ථානයක මේ වරාගල තැබෑරුම පිහිටුවීමට ටෙන්ඩර් ලබා ගත් නමුත් ඊට පසු මහපාර අයිනේ ගමකට මේ තැබෑරුම ගෙනත් තිබෙනවා. මේ ගැන මා එවකට හිටපු දිසාපතිතුමා සමග සාකච්ඡා කළාම, එසේ වෙනස් කරන්නට එතුමාට බල යක් තිබෙනවාය කියා මට කීවා. ටෙන්ඩර් කාල සීමාව පසු වුණත් මේ ගැන පරීක්ෂණයක් පවත්වන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1960 ජනවාරි 1 වැනිදා මොනරාගල කච්චේරිය විවෘත කළ බව ගරු ඇමතිතුමා දන්නවා ඇති. ඒ කච්චේරියෙන් ඡන්ද කොට්ඨාශ 4 ක මහජනයා අද වැඩ ගන්නවා. මොනරාගල ඡන්ද කොට්ඨාශයේත්, බිබිලේ ඡන්ද කොට්ඨාශයේත්, අම්පාරේ ඡන්ද කොට්ඨාශයෙන් කොටසකත්, අලුත්නුවර ඡන්ද කොට්ඨාශයෙන් කොටසකත්, වැඩ කෙරෙන්නේ මේ මොනරාගල කච්චේරියෙනුයි. ඒ තරම් විශාල ප්‍රදේශයක වැඩ කටයුතු කරන ඒ කච්චේරිය ඇමතිතුමා දැක තිබෙනවාදැයි මා දන්නේ නැහැ. සමහරවිට මැතිවරණ කාලයේදී එතුමා දකින්න ඇති. ඒ කච්චේරිය ඉතා කුඩායි. එහි සේවක පිරිසත් මදි. එම නිසා මෙම කච්චේරිය ගැන ඇමතිතුමාගේ අවධානය යොමු විය යුතුයි. අංග සම්පූර්ණ කච්චේරියක් හැටියට එය දියුණු කර අවශ්‍ය නිලධාරීන් හා උපකරණ ආදිය සලසා දී එහි සෑම පහසුකමක්ම සලසන ලෙස මා ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට මොන රාගල තානායම ගැනත් වචන දෙක තුනක් කියන්ට ඕනෑ. එහි දැනට තිබෙන්නේ කාමර හතරයි. එයිනුත් දෙකක කච්චේරියේ සේවය කරන නිලධාරීන් දෙදෙනකු පදිංචිව සිටින නිසා හදිසියේ පැමිණෙන සංචාරකයින් සඳහා ඉතිරිව තිබෙන්නේ කාමර දෙකක් පමණයි. තමුන්නාන්සේ දන්නවා ඇති, අද මොන රාගල නගරය කොතරම් දියුණු වී තිබෙන වාද කියා. ඒ වගේ ඉහිනියාගල, ගල්ඔය, වැනි ප්‍රදේශ බලා ගමන් කරන සංචාරකයින් හා රාජකාරිය සඳහා යන උදවියටත් එය විශාල කරදරයක්ව තිබෙනවා. මා හිතන්නේ කාමර 15 ක් 20 ක් ඇති විශාල ගොඩනැගිල්ලක් සෑදුවත් ඊට අවශ්‍ය තරම් සංචාරකයින් එහි පැමිණෙනවා ඇති. ඒ ගැනත් ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කර ඉතා ඉක්මනින් එය සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඊළඟට මා කථා කරන්නේ ගරු ඇමතිතුමා යටතේ තිබෙන මහා භාරකාර දෙපාර්තමේන්තුව ගැනයි. තමුන්නාන්සේ දන්නවා ඇති, කතරගම දේවාලය සහ ඒ දේවාලයට අයත් ඉඩකඩම් රැක බලා ගැනීමට බස්නායක නිලමේ කෙනෙකු පත් කළ බව. ඒ බස්නායක නිලමේ විශාල අක්‍රමිකතා කරන්ට පටන් ගෙන තිබෙනවා. ඒ දේවාලයට අයත් කැලෑ ඉඩම් අක්කර දොළොස් දාහක් විතර තිබෙනවා. පසුගිය දවස්වල ඒ ඉඩම්වලින් රුපියල් 20,000ක් පමණ වටින ලී තොගයක් කපා තිබෙනවා. දේවාලයට අයත් ඉඩම්වලින් කැපූ ලී බව නොදැන රජය විසින් ඒ ලී තහනම් කළා. පසුව සොයා බැලුවාම ඒවා දේවාලයට අයත් ඉඩම්වල ලීයි. ඒවා කප්පවා තිබෙන්නේ කවුද කියා සොයා බැලුවාම පෙනී ගියේ බස්නායක නිලමේ විසින් කප්පවා තිබෙන බවයි. මහා භාරකාර දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායමින් විශාල මුදල් ප්‍රමාණයක් ඒ බස්නායක නිලමේ විසින් වංචාවෙන් ප්‍රයෝජන ගෙන තිබෙනවා. මේ ගැන මහා භාරකාර දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂණයක් පවත්වන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබෙන පිංපඩි ගැනත් යමක් කියන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් සිල්වා මයා.]

රක්ෂාවක් කර කියා ගන්න බැරි දුප්පත් මහලු අයටත් ඒ වගේම ක්ෂය රෝගය වැළඳුනු අයටත් එම දෙපාර්තමේන්තුවෙන් ආධාර මුදල් ලැබෙනවා. මොනරාගල නගරය තුළ හැතැප්ම දෙක තුනක පමණ ප්‍රදේශය තරමක දියුණු තත්ත්වයක තිබුණත්, අවට ප්‍රදේශ ඉතා නොදියුණු තත්ත්වයක තිබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ ප්‍රදේශවල රැකීරක්ෂා ඉතා අඩුයි. හේන් ගොවිතැන් කිරීමෙන් ජීවත් වන පිරිසකුයි, ඒ ප්‍රදේශවල සිටින්නේ. කෑත් කවුරුත් නැති, රක්ෂාවක් කර ගන්න බැරි, අවශ්‍යයෙන්ම පිංපඩියක් ලැබිය යුතු පුද්ගලයකු අපට ලියුමක් එවූ විට "ගරු මන්ත්‍රීතුමනි, මට පිංපඩියක් ලබා දෙන්න" කියා, අප එය දිසාපති වෙත ඉදිරිපත් කරනවා. රැස්වීම කට ගියත්, පිළිගැනීමේ උත්සවයකට ගියත්, විවෘත කිරීමකට ගියත්, ඒ ප්‍රදේශවල ජනතාව ඒ ඒ ප්‍රදේශයේ ඇති අඩුපාඩුකම් අපට ඉදිරිපත් කරනවා. ඒ අතර පිංපඩි ඉල්ලා ඉදිරිපත් කරන ලියුම් විශාල මිටියක් තිබෙනවා.

අ. භා. 6.30

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පිං පඩි ඉල්ලන විශාල පිරිසක් සිටිනවා. මේ පිළිබඳව දිසාපතිතුමාට ලියා යැවූ විට සමහර විට පිළිතුරු ලැබෙන්නේ හය මාසයකට, අවුරුද්දකට, පසුයි. එසේ වීම ගැන මා දිසාපතිවරුන්ට දෙස් කියන්නේ නැහැ. කෙසේ වුවත්, පිං පඩි ඉල්ලන්නාට පිළිතුරු ලැබෙන්නේ බොහොම ප්‍රමාද වෙලයි. පිළිතුරු ලැබෙන විට බාගදා, ඒ පිං පඩි ඉල්ලූ තැනැත්තා මිය ගොසින් වන්නටත් පුළුවනි. කච්චේරියේ උසස් නිලධාරීන් අතින් මෙවැනි ප්‍රමාද සිදු වෙනවායයි මා කියන්නේ නැහැ. සමහර විට සාමාන්‍ය නිලධාරීන් අතින් එසේ වෙනවා විය හැකියි; එසේ නැත්නම් ආදායම් නිලධාරී තැනගේ කාර්යාලයෙන් විය හැකියි, එසේත් නැත්නම් ගම්මුලාදැනි තුමාගෙන් විය හැකියි. කෙසේ වෙතත් මේ පිළිබඳව සුදුසු වැඩ පිළිවෙළක් යොදන ලෙස ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා. ඉතා ඉක්මනින්ම වැඩ පිළිවෙලක් සකස් කරන්න.

මා නියෝජනය කරන මොනරාගල කොට්ඨාශයේ විශාල වශයෙන් දැව දඬු තිබෙනවා. ඒ වගේම ඉලුක් තිබෙනවා. සාමාන්‍යයෙන් අක්කර හැට, හැත්තෑ දහසක පමණ ඉලුක් මොනරාගල කොට්ඨාශයෙහි තිබෙනවා. මේ තරම් දැව දඬු හා ඉලුක් තිබෙන නිසා මේ දෙවර්ගයෙන් ප්‍රයෝජන ගත හැකි කර්මාන්ත ශාලා ඇති කිරීමට පුළුවන්කම ඇතත් මෙතෙක් එවැනි පියවරක් ගෙන නැහැ. වාලවිච්චියෙහි කඩදාසි කර්මාන්ත ශාලාවක් තිබෙන බව අප දන්නවා. ඒ සඳහා ඉලුක් ගෙනෙන්ට සිදු වී තිබෙන්නේ පිට පළාත්වලින්. නමුත් මොනරාගල නම් කඩදාසි කර්මාන්ත ශාලාවක් සඳහා වුවමනා කරන අමු ද්‍රව්‍ය සෑහෙන තරම් තිබෙන නිසා ඒ ගැන සැලකිල්ල යොමු කරන ලෙස ඉල්ලා සිටින අතර, එහි ඕනෑ තරම් දැව දඬුත් තිබෙන නිසා වඩු කර්මාන්ත ශාලා කීපයක් පිහිටුවීම අවශ්‍ය බවත් මතක් කරන්න කැමතියි. වැඩි වශයෙන් හේන් ගොවිතැනින් ජීවත් වන ජනතාවක් සිටින මොනරාගල ප්‍රදේශයේ ජනතාව දුගී බවෙන් පීඩිතයි. හේන් ගොවිතැන් කළ විට නියම විධියට වර්ෂාව නොලැබුණහොත් ඒ වර්ෂයේදී එහි ජනතාවට කන්න දෙයක් නැහැ. එම නිසා අනෙකුත් ප්‍රදේශවල කර්මාන්ත ශාලා පිහිටුවනවා වගේම මොනරාගල කොට්ඨාශයේත් කර්මාන්ත ශාලා පිහිටුවා එහි ජනතාවට රැකී රක්ෂා අතින් සහනයක් සලසා දෙන ලෙස ඉල්ලන්ට කැමතියි. ඕනෑ තරම් අමු ද්‍රව්‍ය තිබෙන විට, ඒ වගේම රැකීරක්ෂා නැති අය දහස් ගණනක් සිටින විට, කර්මාන්ත ශාලා ඇති කිරීමේ පහසුව හා අවශ්‍යතාව ගැන පෙනී යන්ට ඕනෑ. එහෙයින් මොනරාගල කොට්ඨාශයට වඩු කර්මාන්ත ශාලා කීපයක් හා කඩදාසි කර්මාන්ත ශාලාවක් ලබා දෙන්න.

තව මන්ත්‍රීවරුන් කීප දෙනකු කථා කිරීමට සිටින නිසා මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අවසාන වශයෙන් තව එක කාරණයක් කියන්න සතුටුයි. මගේ ප්‍රදේශයේ පමණක් නොව සෑම ප්‍රදේශයකම මහලු නිවාස ඇති කළ යුතුයි. රැකීරක්ෂාවක් කර ගන්න බැරි අසරණ මහලු උදවිය සෑම ප්‍රදේශයකම ඉන්නවා. ඔවුන්ට සහනයක් සැලසීමක් වශයෙන් ඡන්ද කොට්ඨාශ අනුව බැරි නම් දිස්ත්‍රික්ක වශයෙන් හෝ, එසේත් බැරි නම් පළාත් වශයෙන් හෝ, මහලු නිවාස පිහිටුවන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පී. බී. බාලසූරිය මයා. (ගලිගමුව)
(திரு. பீ. பி. பாலசூரிய—கலிகொமுவ)
(Mr. P. B. Balasuriya—Galigamuwa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාත් වචන හත අටක් කථා කිරීමේ බලා පොරොත්තුවෙනුයි නැගී සිටියේ. මගේ කථාව කරන්න පෙර හෝමාගම ගරු මන්ත්‍රීතුමාගේ (ගාමනී ජයසූරිය මයා.) කථාව පිළිබඳව යමක් කීමට මා අදහස් කරනවා.

දළදාව චීනයෙන් මේ රටට වැඩම කරවීම පිළිබඳව එතුමාගේ කථාවෙන් කියවුණු කොටස උපහාසාත්මක ප්‍රකාශයක් බව එයට සවන් දුන් ගරු මන්ත්‍රීන්ට වැටහී යනවා ඇති. එතුමා සමහරවිට එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරයකු වශයෙන් ඒ ප්‍රකාශයෙන් අදහස් කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව අමුතුවෙන් දන්ත ධාතුවක්, එහෙම නැත්නම් දංෂ්ට්‍රා ධාතුවක්, මෙහාට වැඩම කළාය කියා වෙන්න ඇති. "ඔහෙන් වරෝ" කියන කියමන ඒ විධියට කෙලින් නොකියා "වහෙන් ඔරෝ" යනුවෙන් වෙනත් විධියකට කියන්න එතුමා උත්සාහ කළා වෙන්න ඇත කියා මා හිතනවා. ඒ වගෙයි මට නම් තේරුම් ගියේ.

ජයසූරිය මයා.
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

එහෙම වැටහුණත් එවැනි අදහසක් තිබුණෙ නැහැ මගෙ හිතේ නම්.

බාලසූරිය මයා.
(திரு. பாலசூரிய)
(Mr. Balasuriya)

එහෙම කියනවා නම් මාත් බොහොම සන්තෝෂයි. එක්සත් ජාතික පක්ෂයේ මහත්වරු මේ දවස්වල ලංකාව වටේ ධාතු වැඩමවනවා. කෑගල්ලටත් ධාතු වැඩමෙව්වා. මා සමග ගලිගොමුව පාර්ලිමේන්තු ආසනය සඳහා තරඟ කර පැරදුණු අපේක්ෂිකාවගේ ගුණමයි ඒ කාලය තුළ වර්ණනා කළේ. ඔන්න ධාතු වැඩමවීම සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දංෂ්ට්‍රා ධාතූන් වහන්සේ වැඩම කළ නමුත් ඒ කිසිම තැනක, කිසිම දිනක, ආණ්ඩු පක්ෂයේ ගුණ වර්ණනා කළාය කියා කාටවත් පෙන්වන්න පුළුවන් වේයයි මා හිතන්නෙ නැහැ. එවැනි දෙයක් කොහෙදිවත් කළේ නැහැ.

ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මයා.) ග්‍රාම සේවකයන් පත් කිරීම සම්බන්ධයෙන් කළාය කියන දෙයක් සම්බන්ධයෙන් සඳහන් කර තිබෙනවා. ගම්පහ ගරු මන්ත්‍රීතුමා පමණක් නොවෙයි, ලංකාවේ කවර ප්‍රදේශයක් නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වුවත් ග්‍රාම සේවකයන් පත් කිරීම සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වීම වරදක්ය කියා මා හිතන්නෙ නැහැ. සෑම මන්ත්‍රීවරයෙක්ම ඒ පිළිබඳව තමාගේ අවධානය යොමු කරනවා නම් ඉතාමත් හොඳය කියන එකයි මගේ පිළිගැනීම. මා එසේ කියන්නේ මේ ප්‍රශ්නය යුක්තිසහගත අන්දමට විසඳීම අත්‍යවශ්‍ය දෙයක් හැටියට මා සලකන නිසයි. සමහර විට නිලධාරීන් අතින් යුක්තිය ඉෂ්ට වෙනවා වෙනුවට අයුක්තියක් සිදු වන්නත් ඉඩ තිබෙනවා. එබඳු අයුක්තියක් සිදු වූ අවස්ථාවකදී ප්‍රයෝජන ගැනීම පිණිස එම විභාගයෙන් සමත් වූ අයදුම්කරුවන් ගැන සොයා බලා කරුණු පරීක්ෂා කර තොරතුරු රැස් කර තබා ගැනීම ගම්පහ ගරු මන්ත්‍රීතුමාට පමණක් නොව මේ ගරු සභාවේ යම්තාක් මන්ත්‍රීවරුන් සිටිනවාද ඒ හැම දෙනාටම ප්‍රයෝජනවත් විය හැකි බව ප්‍රකාශ කරන්න කැමතියි.

1956 වර්ෂයේ මේ රටේ අතින් වියන රෙදි කර්මාන්ත ශාලා දාහක් ඇති කිරීම පිණිස වැඩ පිළිවෙළක් ඇති කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් රෙදි වියන පාඨශාලා නවසිය ගණනක් දැනටමත් මේ රටේ ඇති කර තිබෙනවාය කියා මා හිතනවා. මේ රටට වුවමනා කරන රෙදිවලින් සියේට 45 ක් පමණ මේ රටේම නිපදවන්න ඒ මගින් අපට පුළුවන්කම ලැබුණා. ස්වදේශ කට යුතු භාර ගරු ඇමතිතුමා තව දුරටත් උත්සාහ කළොත් තවත් පේශ කර්මාන්ත ආයතන ඇති කරන්න පුළුවන් වේවි. ඒ මගින් ඉතිරි සියේට 55 ත් මේ රටේම නිෂ්පාදනය කර රෙදි සම්බන්ධයෙන් අපට ස්වයංපෝෂිත තත්ත්වයක් ලබාගන්න පුළුවන් වෙනවා ඇති. ඒ ගැන කිසිම සැකයක් නැහැ. ඒ ගැන සලකා බලා කටයුතු කරන මෙන් නැවතත් එතුමාගෙන් ගෞරවයෙන් මා ඉල්ලා සිටිනවා.

උඩරට ගැමි කර්මාන්ත සමහරක් නැති වන තැනට කරුණු දැනටමත් යෙදී තිබෙනවා. හන කර්මාන්තය, ලාකඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බාලසූරිය මයා.]

කර්මාන්තය, කැටයම් කර්මාන්තය, ආදිය සම්බන්ධයෙන් උඩරට විශාල ප්‍රසිද්ධියක් ලබා තිබෙනවා. හන කර්මාන්තය එක්තරා කුලයකට අයත් වූවක් සේ සලකන පිරිසකගේ කර්මාන්තයක් හැටියටයි තවමත් උඩරට පළාත්වල කෙරෙන්නෙ. ලාකඩ කර්මාන්තය ගැන කියන්න තිබෙන්නෙත් එයමයි. කැටයම් කර්මාන්තය ගැන වුවත් ඊට වැඩි වෙනසක් කියන්න බැරි තරමයි. මේ කර්මාන්ත තුන මේ රටින් නැති වී නැසී යන්න ඉඩ නොදී පවත්වාගෙන යාම සංස්කෘතික වටිනාකමක් ඇති දෙයක් රැක ගැනීමක් හැටියට වුවත් වැදගත්කමක් තිබෙන්නක් බව කියන්න පුළුවනි. ඒ නිසා එක් කුලයකට පමණක් මෙය සීමා නොකර සෑම කෙනකුටම ප්‍රයෝජන වන පරිදි මෙම කර්මාන්තය දියුණු කරන ලෙස ස්වදේශ කට යුතු භාර ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

නාට්‍ය කලාව ගැනද යමක් කිවයුතුව තිබෙනවා. සාමාන්‍ය වශයෙන් උඩරට නාට්‍ය කලාවය, රුහුණු නාට්‍ය කලාව හෙවත් පහත රට නාට්‍ය කලාවය යනුවෙන් නාට්‍ය කලාව කොටස් දෙකකට බෙදා දක්වන්න පුළුවනි. ඒ දෙකෙන් විශෙෂයෙන්ම උඩරට නාට්‍ය කලාව ලෝකයේ අනෙක් නාට්‍ය කලාවන්ට නොදෙවැනි වූ චමත්කාර ජනක කලාවක් බව ලෝකයා පිළිගෙන ඉවරයි. නාට්‍ය කලාව ගැන කල්පනා කර බලන විට සාමාන්‍යයෙන් එක් එක් ප්‍රදේශය අනුව වෙනස් වෙනස් අංගයන්ගෙන් සහ සම්ප්‍රදායයන්ගෙන් යුක්තව එය පවත්නා බව අපි දන්නවා. සාමාන්‍යයෙන් කන්ද උඩරට පවා, කඩුගන්නාවෙන් එහා ප්‍රදේශවල, එක් විධියක සම්ප්‍රදායයක් අනුගමනය කරන අතර හතර කෝරළයේ අනුගමනය කරන්නේ වෙනත් සම්ප්‍රදායයක් බව අප දන්නවා. එමෙන්ම හත් කෝරළයේ සම්ප්‍රදාය එක් විධියකට හැඩ ගැසී තිබෙන අතර සබරගමුව තවත් ක්‍රමයක් සකස් කර ගෙන තිබෙනවා. සබරගමු නාට්‍ය කලාව රුහුණු නාට්‍ය කලාවත් සමග එක්තරා ක්‍රමයක සම්මිශ්‍රණයක් ඇති කරගෙන තිබෙන බවත් ඒ නිසා මේ එක් එක් ප්‍රදේශයකට ප්‍රවේණි වූ නාට්‍ය සම්ප්‍රදායන් තව තවත් දියුණු කරලීම පිණිස එක් එක් ප්‍රදේශයේ වෙන වෙනම ලලිත කලායතනය බැගින් පිහිටුවිය යුතුය කියා මා කල්පනා කරනවා. කොටින්ම කුරුණෑගල, මහනුවර, කෑගල්ල, රත්නපුරය, මාතර නැත්නම් ගාල්ල යන ප්‍රදේශවල වෙන් වෙන් වශයෙන් ලලිත කලායතනය බැගින් ඇති කළොත් ඒ ඒ ප්‍රදේශවලටම ප්‍රවේණි වූ නාට්‍ය සම්ප්‍රදායන් ආරක්ෂා කර ගන්න පුළුවන් වනවාට කිසිම සැකයක් නැහැ.

පොත්පත් සම්බන්ධයෙනුත් වචන කීපයක් කිවයුතුව තිබෙනවා. පිට රටින් මේ රටට ගලා එන අසභ්‍ය පොත්පත් පමණක් නොව මේ රටේ පළ කෙරෙන අසභ්‍ය පොත්පත් තහනම් කිරීමටද නීති මාලාවක් සකස් කිරීම ඉතාමත් අවශ්‍ය වී තිබෙනවා. මේ රටේ පළ වන අසභ්‍ය පොත්පත් තහනම් කිරීමට නීතියක් තිබෙනවා ද කියා මා දන්නෙ නැහැ. අසභ්‍ය පොත්පත් රාශියක් මේ රටේ පළ වී තිබෙනවා. ඒවායේ තිබෙන යම් යම් දේ මෙම ගරු සභාවේ සඳහන් කර මේ ස්ථානය කෙලෙසන්න මම කැමති නැහැ. මේ පොත්වල තිබෙන සමහර කොටස් අපේ කුඩා දරුවන්ට හෝ මහල්ලන්ට හෝ පමණක් නොව සභ්‍යත්වයේ සේයාවක් ඇති කවරෙකුට හෝ කියවා සිටින්නට පුළුවන්කමක් නැති බව මා කියන්නට ඕනෑ. ඒවා ඒ තරම්ම නින්දනීයයි ඒ තරම්ම ගර්හනීයයි. ඒ පොත් නම් කියවන්නට පුළුවන්කමක් නැහැ. ඒවායින් සමහර කොටස් උපුටා මෙහිදී කියවන ලෙස යමෙකු කියනවා නම් එය මට කියවා පැහැදිලි කර දෙන්න පුළුවනි. නමුත් ඒවා මෙහිදී කියවීම මෙම ගරු සභාව කෙලෙසීමක් සේ මා සලකනවා.

සුරා සූදු ප්‍රශ්නය ගැන මම වචන ස්වල්පයක් කියන්න කැමතියි. අපේ පළාත්වල නම් කසිප්පු ජාවාරම තදින්ම කෙරෙනවා. කසිප්පු බහුලව පෙරණ ප්‍රසිද්ධ ස්ථාන තිබියදී ඉතාමත් සුළු ස්ථාන පමණක් පොලීසිය අල්ලන බව කියන්න ඕනෑ. අලින්ට රිංගන්න පුළුවන් කඩුලු තිබියදී කුඹින් රිංගන කඩුලු මකනවා. අපට වුවමනා කරන්නේ අලින් රිංගන කඩුලු වැසීමයි. කුඹින් රිංගන කඩුලු තිබුණත් කමක් නැහැ. අපේ අක්මීමන ගරු මන්ත්‍රීතුමා (සේනපාල සමරසේකර මයා.) කිව්වා වාගේ, එක්සැසිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පගාකාරයාට යටත් වී සිටින නිසා මේ කටයුත්ත හරියාකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ක්‍රියාත්මක කරගෙන යාමට පුළුවන්කමක් නැහැ. මට පෙනෙන හැටියට නම් මෙම දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන්ම නැති කර දැමිය යුතුයි. පොලීසියට සහ ගම්පති වත් සී. අයි. ඩී. දෙපාර්තමේන්තුවටත් මේ කටයුත්ත භාර දුන්නොත්, මීට වඩා හොඳින් එය කරගෙන යන්න පුළුවන් වෙනවා ඇති. මෙම දෙපාර්තමේන්තුවට කරන වියදම නිකම් අපතේ යන මුදලක් බව මම කියන්න කැමතියි.

අ. භා. 6.45

චිත්‍රපටි කර්මාන්තය ගැන මට කලින් කථා කළ ගරු මන්ත්‍රීන් සඳහන් කරන්ට යෙදුණා. මේ රටේ චිත්‍ර පටි කර්මාන්තය සාමාන්‍ය වශයෙන් උසස් තත්ත්වයක නැති බව අපි දන්නවා. ඊට හේතුව චිත්‍ර පටි කලාව මේ රටේ ඇති වුණේ ඉතා මෑතදී නිසයි. ඒ නිසා අංග සම්පූර්ණ ලෙස චිත්‍ර පටි සකස් කරන්න පුළුවන්කමක් නැහැ. ඊටත් වැඩි හේතුවක් වී ඇත්තේ කාලාත්මක ලෙස යම්කිසි චිත්‍රපටියක් සකස් කළොත්, ඒ සඳහා ලොකු ආදායමක් ලබාගන්ට පුළුවන්කමක් නැති වීමයි. එංගලන්තයේ යම්කිසි කලාත්මක චිත්‍රපටියක් සකස් කළොත්, එය ලෝකයේ සෑම තැනකම පෙන්වා ලොකු ආදායමක් ලබා ගන්න පුළුවනි. ඉන්දියාවේ හින්දි චිත්‍රපටියක් සකස් කළොත්, ලෝකයේ අර්ධයක පමණ එය පෙන්වා ලොකු ආදායමක් ලබාගන්න පුළුවනි. නමුත් මේ රටේ සිංහලෙන් චිත්‍රපටියක් සකස් කළොත්, 65 ලක්ෂයක් 75 ලක්ෂයක් පමණ සිටින සිංහල ජනතාවට පමණයි එය පෙන්වන්න පුළුවන් වන්නේ. එතකොට ඒ ලැබෙන ආදායම පමණයි එවැනි නිර්මාණයකට ලැබෙන්නේ. එම නිසා මේ රටේ සිංහලෙන් සකස් කරන කලාත්මක චිත්‍රපටියකට ලොකු මුදලක් හම්බ කර ගන්න බැරි බව තමුන්නාන්සේලාට වැට හෙනවා ඇති. කරුණු මෙසේ නිසා, මේ රටේ චිත්‍රපටි පාලකයින් කරන්නේ, මුදල් උපයන ආශාවෙන් චිත්‍රපටි කලාව සම්පූර්ණයෙන්ම පහත් තත්ත්වයකට හෙළා ගැලරිය සතුටු කිරීම පිණිස චිත්‍රපටි නිපදවීමයි.

අද එංගලන්තය, ඇමෙරිකාව, වැනි රටවල පාසැල් ශිෂ්‍යයන්ට ඉතාමත් ප්‍රයෝජනවත් වන පරිදි පාසැල් ළමයින් උදෙසා නොයෙක් චිත්‍රපටි නිෂ්පාදනය කරනවා. පාසැල් ශිෂ්‍යයන් සඳහා වෙනමම ඒ රටවල චිත්‍රපටි සකස් කරනවා. ඇත්ත වශයෙන්ම අද චිත්‍ර පටි කර්මාන්තය අධ්‍යාපන විෂයෙහි ඉතා උසස් ලෙස බල පාන්නක් වී තිබෙන බව වෙනත් රටවලින් ඔප්පු වී තිබෙන නිසා, මේ රටේද රජය මගින් හෝ පාසැල් ශිෂ්‍යයන් සඳහා චිත්‍රපටි සකස් කිරීම ඉතාමත් සුදුසු බව මම තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි.

තවද ඒ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, රෙජිස්ට්‍රාර්වරුන්ට සෑහෙන පඩියක් ගෙවිය යුතුය කියා. මම නම් හිතන්නෙ නැහැ, එවැනි පඩි ගෙවීමක් කළ යුතුය කියා. මගේ අදහස නම්, ඒ අයට ලැබෙන ගාස්තුව වැඩි කළ යුතුය යන්නයි. රෙජිස්ට්‍රාර්වරුන්ට පඩි ගෙවීමට ගියොත්, ඔවුනුත් රජයේ සේවක තත්ත්වයට වැටෙනවා. එසේ රජයේ සේවකයන් බවට පත් කළොත්, ඔවුන්ට ඇති ස්වාධීනත්වය නැතිව යනවා. රෙජිස්ට්‍රාර්වරුන් සාවාධිනත්වයෙන් කටයුතු කරන පිරිසක් විය යුතුයි. ඒ නිසා ඔවුන්ට පඩි දෙනවා වෙනුවට කළ යුත්තේ, වැඩි ආදායමක් ලැබෙන පරිදි ඔවුන්ට වැඩි මුදලක් අය කර ගැනීමට බලය දීමයි. පඩි දීමට ගියොත් සිදු වන්නේ, ඒ අයත් රජයේ සේවක තත්ත්වයට වැටී රජයේ සේවකයන් තවත් කොටසක් ඇති වීමයි.

සමහර පාසැල් ළමයින්ගේ උප්පැන්න සහතික සොයාගන්න බැරි වෙනවා. පාසැල් ගුරුවරයකු වශයෙන් ඒ ගැනත් වවන දෙක තුනක් කියන්න කැමතියි. දරුවකු උපන් විට දෙමව්පියන් ගොස් උප්පැන්නය ගැන දැන්නුවාම සමහර විට, අර රෙජිස්ට්‍රාර්වරයා ඒක ලියන්නත් පුළුවනි, නොලියන්නත් පුළුවනි. නමුත් එයින් සිදු වී ඇති ප්‍රමාදය වැටහෙන්නේ ඒ ළමයාගේ උප්පැන්න සහතිකය ගන්න ගිය අවස්ථාවේදීයි. ඉතින් ඒ උප්පැන්නය හරිගස්සා ගැනීමට බොහෝම මහන්සි වී නඩුවක්ද දැමීමට දෙමව්පියන්ට සිද්ධ වෙනවා. ඒ නඩුව විසඳන්නෙත් බොහොම උග්‍ර විධියටයි. ඒ සඳහා පාසැලේ ප්‍රධානාචාර්‍යවරයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බාලසූරිය මයා.]

කැඳවනවා, ආරච්චි රාළ ගෙන්වනවා; හාල් පොත ගෙන්වනවා. එපමණක් නොවෙයි, බැංකුවේ මුදලක් දමා තිබෙනවා නම්, ඒ බැංකු පොතත් ගෙන්වනවා එවැනි උග්‍ර විධියට මේ සියල්ලම කළාට පසුවත්, අර ළමයාගේ උප්පැන්නය ගන්න බැරි වන අවස්ථා තිබෙනවා. මේ නිසා සමහර විට බොහෝ දෙමව්පියන්ට පසුතැවිලි වන්ට සිද්ධ වෙනවා. අපි මේ උප්පැන්නයක් ඉල්ලන්නේ මේ රටේ සිංහලයකුට දුව ඉපදී සිටින සිංහල කොල්ලෙකුට බව අපි හිතන්න ඕනෑ. මේ රටට ඇවිත් සිටින ඉන්දියාවේ කොල්ලන් අපේ ගෙදරවල හදාගෙන අපි ඔවුන්ට උප්පැන්න දෙන්න ලැහැස්ති වෙනවා නොවෙයි. මේ රටේ සිංහලයින්ට දාව, එසේ නැතිනම් උතුරේ දෙමළ උදවියට දාව, මේ රටේම උපන් දරුවන්ට, ඒ දෙමව්පියන්ගේ පරම්පරාව ඔප්පු වුණාසින් පසුවත් උප්පැන්න සහතිකය ලබාගැනීමට අපහසු වී තිබෙනවා. එම නිසා පාසැල් ගුරුවරයාගේ සාක්ෂි, පාසැල් සහතිකය, ඒ වාගේම ආරච්චිරාළගේ සාක්ෂි, මේ ආදිය විභාග කර බලා සාධාරණ විධියට, යුක්තිය ඉෂ්ට වන ආකාරයට කටයුතු කළොත් උප්පැන්න සහතිකය මෙයට වඩා ලෙහෙසියෙන් ලබා දිය හැකිය කියා මා කල්පනා කරනවා. නඩු විභාග කරනවාට වඩා උසස් විධියටයි ඒ විභාගය කරන්නේ. මෙසේ කිරීමෙන් ගම්බද අපේ අසරණ දෙමව්පියන් අද මුහුණ පා ඇති කරදරය මගහරවාගන්ට පුළුවන් වෙනවා ඇති. එම නිසා ඉදිරියට වත් එබඳු කරදරයකට මුහුණ පාන්ට ඉඩ නොලැබෙන අන්දමට කටයුතු යොදන ලෙස ගරු ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගෙන් මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Mr. Deputy-Chairman, the Hon. Minister has such a wide variety of functions entrusted to his Ministry that any criticism that is made under his Vote would have to cover a very wide range. If we could have organized this Debate in a better way, perhaps we may have contributed whatever we had to say under the various subjects according to the sub-heads given in the Estimates. But since it has now become the practice to raise most matters under the Minister's Vote itself, despite the cumbersome nature of the procedure, it becomes necessary to state all that we have to state on the various subjects under this Vote itself.

The first point I wish to make is that concerning the long debated proposal and the long conceded position in regard to the abolition of the kachcheri system. We have discussed this item sectionally in regard to the headmen system, the appointment of headmen or *grama sevakayas* and so on in lieu of headmen. I am taking the much wider question for discussion, and that is the question of the abolition of the kachcheri system as a whole.

If you go back in history you will find that among the various relics of the imperialist days in our land, one that still survives in a most obnoxious way is this kachcheri system. Far from abolishing the kachcheri system, we are enlarging its functions; for instance, with every new piece of legislation we pass here, we find that when you set up a Controller or a Commissioner here at the centre, since he cannot operate on an Island-wide scale and it is not possible to decentralize his department in any possible way, you add his functions to those of the Government Agent and the kachcheri.

Now, the Licensing of Traders Act was passed here. The licensing is taking place through the kachcheries. When the Minister of Finance talked about decentralizing the collection of inland revenue, he suggested the appointment of Assessors to each kachcheri. Now, the last one perhaps may on historical grounds be excused because these kachcheries were really institutions for the purpose of collecting revenue. But that is only by the way.

We have a large number of functions that we have added to the kachcheri such as social services, licensing of traders and so on. All these functions have been handed over to the kachcheri. Now that is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Now three corporations have been put into one—plywood, hard-board and leather. The Chairman of the Plywood Factory is responsible for the Leather Factory and also the Tanning Factory. Mr. Robin Rutnam is an efficient man. But then you have the offices of the corporations in Colombo. There are three factories with three different sets of boards and managing directors. Unless the Hon. Minister is able to directly use his influence and see that these three boards, including the administrative heads in the various sectors of the industry, co-ordinate their work and co-operate, the work of these corporations will suffer heavily. There will not be that direct contact which a chairman should have in an industry. You have several corporations put together and you leave it to one man to tackle them all together. The responsibility for selecting the men who would co-ordinate or have the aptitude to co-operate is not left to the individual to whom you have given the responsibility. You appoint people.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

In the same way, in the Cement Factory there was a hard-worked expert who has shown his loyalty to the Government and to the country and who has successfully developed the Cement Factory, and you have removed his Board, a Board with which he has been able to work. You have given no explanation why they were removed, whether it is for inefficiency, for resisting the Americans or whether it is to get a more efficient Board. In its place you have thrust a Civil Servant, a most reactionary person, whose loyalty is more to Queen's House and to New York than to this industry. You have crippled the enthusiasm of those who have been devotedly working for you. If Dr. Ponnamperuma—

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

He is still where he was. I have not removed him.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

He is still where he was, but you have put the biggest obstacle in his way. He has to carry a big millstone on his neck—the new Chairman—and he has now to tackle the problem of the workers below and the powers above. He has not got a Board that is giving him co-operation, a Board who have the deep sympathy which they should have for the policies which he has carried out so far. He has saved this country several million rupees by resisting the Americans from forcing their contract on us for the second kiln.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

There is no difference of opinion on that matter. In fact I have backed him on that.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

I do not challenge the sincerity or the motives of the Hon. Minister.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

Why I removed the Chairman was because Mr. Coomaraswamy was a little too old and feeble. He could hardly walk round the factory with me when I visited the place. He said he would faint, at the circuit bungalow. Now we are going to expand the K. K. S. Factory, have a clinker grinder in Galle and a second cement factory. So I decided I should have a full-time Chairman, as the new Board was going to have so much of work to do.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

Is it also the fact that pressure has been brought to bear to give the second cement factory project to the German contractors without calling for world tenders, or even before the site in Puttalam is selected and the railway line completed ?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

There is a proposal that the present contractors who have the contract for the extension of the K. K. S. Cement Factory should also be given the construction of the Second Cement Factory in Puttalam on negotiated rates. That proposal has been made because we could save one year on that scheme. The present railway line is almost reaching Puttalam, the factory is to be sited at Puttalam and then if we can start work at Puttalam immediately, by the time the railway goes to the deposits, that is 18 miles north of Puttalam, we can have the factory finished and we can save one whole year if we avoid calling for tenders. That is the proposal that has been made.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

Now the facts are coming out. At first, there was a policy of the Department under the previous Government. After considerable struggle the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

offer of the Soviet Government was put through to complete the first project under the Malwatu Oya Scheme—that is, to get their designs and get on to the second stage. Then it was pointed out to them: "Ceylon is having an unchanging policy. We want to call for world tenders for designs, then we will settle the people who designed and thereafter call for world tenders for the project. That is the inalienable efficiency with which we are running the Government." And the Soviet Government had to clearly tell the Ceylon Government: "You can give the contract to any foreign private body. That is your business. But our machinery will be available only to your Government, your officials and your experts. If foreign countries come in, they must bring in their machinery." What I mean is that if we want to develop our industries, we can do so not by giving contracts to foreign Governments. It is for our own Government and our own technical staff to be closely incorporated and to develop the industries themselves with the help of foreign experts. That is the way socialist countries carry out these projects.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

The hon. Member might be interested to know that the Cabinet has sanctioned the setting up of a National Construction Corporation. In fact, first they will be doing the iron and steel project, and they will be working in close collaboration with the Russian team. Both the tyre and tube and iron and steel projects have been negotiated with the leading contractors.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

I am glad that this statement comes from the Hon. Minister. I thank him. That is first time the Soviet Government has been able to penetrate the resistance of this Government to start a National Construction Corporation. Finally, it is not the Communist Party which has succeeded. Faced with the problems created by your officials, heads of departments and various vested interests that have their tentacles into the departments and services, you have been prevented up to date from having a national development corporation. That is evidence of the problems we have had to face and the way it was posed to us by the Soviet experts who came here to build our industries and our river basin projects. They said, "The main thing you should have is your construction corporation, so that you can draw from the knowledge and experience of our experts who will teach your people how to operate the machines."

It is true that up to now this idea did not come to the Government. How is it that from 1948 up to 1960 such an idea did not come to this country which had close relations with the German, U. S. and U. K. concerns, with whom we had dealings since we became a free country? Even before that, some of our leaders had direct contracts with constructional firms and approached their Governments regarding our various projects. But it was left to a socialist Government to bring this idea to us. The socialist Governments can stand on their own without my testimonial. But what I want to impress on this Government and the House is the fact that there is a definite organized attempt to prevent the real economic independence of the country, to prevent the independent development of our economy so that it may stand on its own feet.

අ. භා. 2.45

Here is that concerted organized campaign—what is called neo-colonialism. When colonialism cannot be imposed directly with political power and military occupation, it comes in indirectly in the form of vested interests. Companies in capitalist countries, like showing a carrot before the animal, show how very conveniently you can develop or, for instance how convenient it is to develop your textile mill at Veyangoda. But when you have to foot the bill for maintenance and repairs and when our

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

people are unable to operate the mill, the difficulties will arise. It was the same in the case of the Paranthan Chemical Corporation and the Oils and Fats Corporation. They were over-capitalized and are now running at a loss. The Paranthan Chemical Corporation, as I mentioned earlier, has installed an electric plant which we find had never been installed anywhere else in the world before and will, I expect, never be installed any where else hereafter. These are the consulting engineers ! These are the big capitalist firms which do not take any responsibility. They do their job, take their profits and go away.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

The Paranthan Chemical Corporation was established during the time of the U. N. P.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

That is what I am telling you. Even in the time of the U. N. P. they were dealing with the same species. That policy has not changed. So, it is not entirely the fault of the U. N. P. Government. It was the policy of the Imperialists to undermine the industrial development of countries which were not under colonial rule. It was their policy to see that those countries which wanted to free themselves from the tentacles of vested imperialist interests and get assistance from socialist countries were never allowed to develop. What is the fundemental difference in what is now taking place in Cuba and the rest of the Latin American countries ? These are glaring examples staring us in the face. Tomorrow I am flying to North Korea which is the most industrially developed country in Asia, and which produces nitrogenous fertilizers, the best in the world. They have after a struggle, fighting the Americans, separated themselves from the clutches of the imperialists. But if you go to South Korea, you will find that all industries there have closed down because of P. L. 480. No industrialization is going on in this region save in countries over which the imperialists have no hold.

I am not going into details with regard to the other Ministries, because I do not have the opportunity now. They will no doubt be dealt with in due course. I want to tell the Hon. Minister that we are not singling out his Ministry for criticism. The same problems come up in much sharper form in regard to other Ministries, particularly the Ministry of Agriculture, Land, Irrigation and Power. The irrigation, water development and other schemes that are being "sold" to this country by the Americans and the danger of accepting them with blind faith will no doubt be discussed by the hon. Members when that Ministry's land development, irrigation, diversion of the Mahaveli Ganga and various other projects come up.

It is not that we are isolating the Ministry of Industries for criticism. This is a general disease that we have to fight against. If you want to take the antidote from socialist countries, you must be prepared to take their medicine also. If you go to take the medicine from capitalist countries, you will get back the disease, however much you may take the antidote from socialist countries.

ගරු මෛත්‍රිපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

Western medicine against Ayurveda !

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

Whether it is one system or the other, the imperialists' poison attacks all without any racial differentiation. Now even the white races are being victimized. In European countries you find smaller nations being trampled by the bigger, more powerful capitalist countries.

Therefore, I would earnestly point out to the Hon. Minister that he need not merely appoint a commission to enquire into these various

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

matters. The outrages that have been committed in the Salt Department have now been exposed. Various other departments of the Ministry are guilty of similar corruption, inefficiency, bungling and irresponsiblity. I think that a commission is the least efficient in the matter, because of its delay and impersonal approach. I hope that a Committeee of the Ministers or of this House will go into the whole question with a view to finding out why there has been such inordinate delay, such lack of co-ordination between genuine foreign experts who come here and the local counterparts, why we have not been able to develop a corporation for construction so far, why there is a dearth of experts and why even the existing available talent in the field of technology is attempting to run away from this country. These are serious matters. Even though the question of the training of technicians and experts belongs to the Ministry of Education, it is vitally the concern of this Ministry, to be interested in these matters and to give proper directions because their training is going to benefit your industries. Therefore, you should be the person who is directly involved in having sufficient efficient and trained technicians who can deliver the goods to this country.

It is not just a question of sending officers to the Soviet Union to be trained for your steel industry, but a question of getting technicians and experts for every type of industry. They could be trained here and after being trained up to a certain level they can be sent abroad for further training. These problems are very grave problems because for the last 4 or 5 years the training of engineers had been severely restricted. You are being adversely affected because of the policy adopted by the University authorities, a policy which has no relation whatsoever to your problems of industrial development and your need for efficiency in technology.

Therefore this Ministry has to consider not only what it has undertaken to do. It must also consider seriously matters not within its field. It has to contact the Ministry of Education and see that engineers and technicians are trained to man your industries.

Your Ministry must also concern itself seriously with the Departments dealing with the supply of power. What is the fun of your trying to put up a big steel factory without any coal or oil in this country being discovered so far in this country? Even if these sources of power are discovered, it will take many years before they can be exploited. If you do not have cheap electricity what is the fun of your putting up a big steel factory? If you have hydro-electric power you can reduce the amount of carbon from wood by 50 per cent. That would mean an enormous reduction in costs because wood though available cheaply from rubber plantations has this drawback—its transport costs are prohibitive. Without ensuring that you will have all the hydro-electric power made available to you, what is the fun of planning all these big factories? What is the fun of doing all this if with the diversion of the Mahaveli Ganga you are going to reduce the hydro-electric potential of this country by 25 per cent?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

Reduce? You mean increase.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

Diversion of the Mahaveli Ganga means that you will not have the Ridiagama reservoir scheme and the Victoria Falls reservoir scheme. Work on these schemes will have to be abandoned when you proceed with the diversion scheme. For the diversion scheme you have to spend another Rs. 2,000 million. At this rate the country will go bankrupt. One or the other of these schemes

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

will not go through. I am not discussing the virtues of these schemes. They will be discussed when the Votes dealing with power supplies are taken up.

I am drawing your attention to the fact that you have to study these problems. You are the Minister who will be affected if you do not take steps to see that you will get cheap power very soon. Look at the thermal plant at Grandpass. If you were alive to your responsibilities in 1957 and started, under the multi-purpose programme, a hydro-electric project in one of these rivers, one unit of such a project would have provided you with 50,000 k.w. more. Instead, fuel oil is being imported from abroad to run the thermal plant at Grandpass. This is bad planning. This reflects the imperialist outlook on these matters, namely, that you must have a large percentage of thermal power along with hydro-electric power. Former experts have said that Ceylon has not enough hydro-electric potential and have taken up the position that thermal power is essential as a reserve. But recent investigations have shown that our hydro-electric potential is so enormous that we can completely give up thermal power altogether.

If that is the position, if you have hydro-electric power available, as indeed you have, then you can run your industrial ventures here as cheaply as they are run in other countries. Even if you contemplate that today the cost of a unit of power in this country is three or four times that in European countries—[*Interruption*]—if you take steps to tackle this problem of cheap power and there is close co-ordination between this Ministry and other Ministries concerned with the production of power you can obtain all the power you need and as cheaply as possibly for the development of your industries. But if you take up the attitude: "I have to deal with industries. The development of power is the concern of another Ministry," you will have all these problems on your hands and you will not have discharged your responsibilities by the Government, by the country, by your Ministry.

I would earnestly request the Minister to go into this whole question. Consider the question of reorganization of your Ministry of Industries. Also see that you do not take the advice of your departmental experts, your civil service staff—[*Interruption*]—I am, of course, not trying to use the tar brush against all officials. There are some who are very honest, very efficient and very hard working in the civil service, but that does not mean that these exceptions——

ගරු මෛත්‍රිපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)
That is a matter of opinion.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
It is a matter of judging by the results up to date. The state of affairs prevailing, so far as industries are concerned, is the main ground on which we can go.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)
I understand that the Votes to be taken up next, the Votes of the Ministry of Agriculture, Land, Irrigation and Power, will have to stand down. Will the Hon. Minister explain what the problem is?

ගරු මෛත්‍රිපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)
The Hon. Minister of Agriculture and Leader of the House is not quite well. He has been advised to rest. Shall we take up, after my Votes are over, the Votes of the Ministry of Labour and Nationalised Services?

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා. (අවිස්සාවේල්ල)
(திரு. டீ. பீ. ஆர். குணவர்தன—அவிஸ்ஸாவெல)
(Mr. D. P. R. Gunawardena—Avissawella)
Might I suggest that we discuss the Votes of the Ministry of Commerce, Trade, Food and Shipping next?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

The Votes of the Minister of Labour and Nationalised Services can be taken up later.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனஞயக்க)
(The Hon. Maithripala Senanayeke)

I will discuss this with the Minister and let you know after the tea interval.

ලක්ෂ්මන් ද සිල්වා මයා. *(බලපිටිය)*
(திரு. லக்ஷ்மன் டி. சில்வா—பலப்பிட்டிய)
(Mr. Lakshman de Silva—Balapitiya)

ගරු සභාපතිතුමනි, කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කර්මාන්ත ගැන වචන ස්වල්පයක් කථා කිරීමට අදහස් කරනවා. මොරටුවේ සිට තංගල්ල දක්වා අමු පොල් ලෙලි පල් කිරීමේ ව්‍යාපාරයේ යෙදී සිටින ගෘහණීන්ගේ ගණන ඉතා විශාලයි. එහෙත් ඒ ගෘහණීන් සඳහා අපේ මේ රජයෙන් තවම වැඩි ආධාරයක් නොලැබීම ගැන කනගාටුයි. මීට පෙරත් මේ ගැන කියා ඇති. ඒ කර්මාන්තය කර ගෙන යන සමුපකාර සමිතිවලට සුළු වශයෙන් ණය දෙන බව නම් ඇත්තයි. පොල් ලෙලි පල් කර කොහු කිරීම පිණිස එවැනි සුළු ආධාරයක් ලැබෙනවා. නමුත් ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් පොල් ලෙලි පල් කිරීම සඳහා පහසු ක්‍රමයක් සලසා දුන්නොත්, යන්ත්‍ර මාර්ගයෙන් ඒ කාර්යය කිරීමේ ක්‍රමයක් සලසා දුන්නොත් කොහු කර්මාන්තයේ යෙදී සිටින දුප්පත් ගෘහණීන්ට ලොකු ප්‍රයෝජනයක් ලැබෙනවා ඇති.

පොල් ලෙලි පල් වන්නට මාස හයක් ගත වෙනවා. මාස හයක් ගත වන්නට පෙර පොල් ලෙලි පල් කර ගෙන යන්ත්‍ර මාර්ගයෙන් කොහු පිළියෙළ කර ගැනීමට හැකි වන සේ කිසියම් වැඩ පිළිවෙළක් සකස් කිරීම අවශ්‍යව තිබෙනවා. එහෙයින් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහතුන් ලවා හෝ එසේ නැත්නම් ඉංජිනේරු සංගමයට දන්වා යවා ඒ සංගමය ලවා හෝ මේ පිළිබඳව අවවාද ලබා ගෙන ගම්බද කොහු කර්මාන්තය සඳහා යන්ත්‍රයක් සකස් කරනවා නම් ඉතාමත් හොඳයි. සමුපකාර ක්‍රමයට ණය මුදල් දී, යන්ත්‍ර ක්‍රමයකුත් සකස් කොට කොහු කර්මාන්තයට උදව් කළහොත් මොරටුවේ සිට තංගල්ල දක්වා පොල් ලෙලි පල් කිරීමේ කර්මාන්තයේ යෙදී සිටින දුප්පත් ගෘහණීන්ට යහපතක් සැලසෙන බව ප්‍රකාශ කිරීමට කැමතියි. මේ රජයෙන් නොයෙකුත් කර්මාන්තශාලා පිහිටුවා තිබීම ගැන අපි සන්තෝෂ වෙනවා. නමුත් ඒ එකක් එකක් ගැන කල්පනා කරන විට අපට එපමණ සන්තෝෂ වන්නට බැහැ. මේ රටේ නොයෙකුත් සංයුක්ත මණ්ඩල තිබුණත් ඒවායින් පාලනය කරන කර්මාන්ත ශාලා එකකින් දෙකකින් පමණයි, අපට ලාභයක් ලැබෙන්නේ. අනිකුත් කර්මාන්ත ශාලාවලින් අපට නොයෙකුත් අලාභ හානි සිදු වී තිබෙනවා. සිමෙන්ති කර්මාන්ත ශාලාවෙනුත්, දකුණු පළාතේ පිහිට වූ තුනී ලෑලි කර්මාන්ත ශාලාවෙනුත් පමණයි, අපට ලාභයක් ලබා ගන්නට පුළුවන් වී තිබෙන්නේ. ඒ කර්මාන්තවලට අවශ්‍ය අමු ද්‍රව්‍ය තිබෙන පළාත්වල, කම්කරුවන් ලාභයට සහ පහසුවට ලබා ගන්නට පුළුවන් පළාත්වල, ඒ කර්මාන්ත ශාලා පිහිටුවන්නට කටයුතු කරනවා නම් ඒවායින් ලාභ ගන්නට පුළුවන් වෙයි. ගින්තොට තුනී ලෑලි කර්මාන්ත ශාලාව ගැන කල්පනා කර බැලුවොත් ඒ කර්මාන්තයට අවශ්‍ය අමු ද්‍රව්‍ය එම කර්මාන්තශාලාව ඇති ප්‍රදේශයෙන් පහසුවෙන් ලබා ගන්නට පුළුවන් බවත්, එම ප්‍රදේශය විශාල ජනගහනයක් සිටින ප්‍රදේශයක් නිසා ලෙහෙසියෙන් කම්කරුවන් ලබා ගන්නට පුළුවන් බවත් අපට පෙනෙනවා. එම නිසයි, තුනී ලෑලි කර්මාන්ත ශාලාවෙන් ලාභ ගන්නට පුළුවන් වී තිබෙන්නේ. අනික් කර්මාන්ත ශාලාවලින් හරියාකාර ලාභ ගන්නට බැරි වී ඇත්තේ එම කර්මාන්තවලට අවශ්‍ය අමු ද්‍රව්‍ය තිබෙන පළාත්වලට ඇතින් එම කර්මාන්ත ශාලා පිහිටුවීම නිසයි.

අ. භා. 3

පුත්තලමේ පිහිටුවන්නට යන දෙවැනි සිමෙන්ති කර්මාන්ත ශාලාව ගැන කල්පනා කර බලමු. මීට කලින් කර්මාන්ත ඇමති කෙනකුව සිටි විලියම් සිල්වා මහත්මයා ඒ කාලයේදී කීවා මට මතකයි, සිමෙන්ති කර්මාන්ත ශාලාව දකුණු පළාතේ පිහිටුවන්නට යන බව. ඒ කාලයේදී මිණිත්දෝරු මහත්වරුන් ගොස් දකුණු පළාතේ හික්කඩුව ආදී ප්‍රදේශවල නොයෙකුත් තැන් මැන, නොයෙක් කටයුතු කළ බව මට මතකයි. පසුව, නොයෙකුත් බලපෑම් උඩද මා දන්නේ නැහැ, බලපෑම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උඩය කියා මා කල්පනා කරනවා, අලුතෙන් රේල් පාරකුත් කපා ගෙන නොයෙකුත් කරදර මධ්‍යයේ විශාල වියදමක් දරා ඒ දෙවෙනි සිමෙන්ති කර්මාන්ත ශාලාව පුත්තලමේ පිහිටු වීමට වැඩ කර ගෙන යනවා. හරියාකාර කල්පනා කර බලනවා නම් සිමෙන්තිවලට අවශ්‍ය අමු ද්‍රව්‍ය දකුණු පළාතේ හික්කඩුව, අකුරල ආදී ගම්වල තිබෙන බවත්, රේල්පාර සහ මහපාර පහසුවෙන් ප්‍රයෝජන ගත හැකි බවත්, එසේම ගාලු වරාය ප්‍රයෝජනයට ගත හැකි බවත් අපට පෙනෙනවා. එසේ තිබියදීත් පෞද්ගලික බලපෑම් අනුව බන්ගදෙණියට අලුතෙන් රේල්පාරකුත් කපමින් සිමෙන්ති කර්මාන්ත ශාලාව ඒ ප්‍රදේශයේ පිහිටු වීමට කටයුතු කර ගෙන යනවා. නියම විධියට කල්පනා කරනවා නම් මේ සිමෙන්ති කර්මාන්ත ශාලාව පිහිටු විය යුත්තේ මා කලින් සඳහන් කළ පහසුකම් සියල්ලක්ම තිබෙන දකුණු පළාතේ යි. මේ සිමෙන්ති කර්මාන්ත ශාලාව පුත්තලමේ පිහිටු වනවා වෙනුවට දකුණු පළාතේ පිහිටු වනවා නම් මහජනයාගේ මුදල් විශාල ප්‍රමාණයක් මේ රජයට ඉතිරි කර ගැනීමට පුළුවන් වෙනවා. හිටපු ධීවර හා කර්මාන්ත ඇමති විලියම් සිල්වා මහතා අපට කී කරුණු නිසයි, විශේෂයෙන්ම මේ අදහස මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට මා කල්පනා කළේ.

ගරු සභාපතිතුමනි, ලුණු කර්මාන්තය ගැන කල්පනා කර බලමු. මේ රටේ තිබුණු ලුණු කර්මාන්තය එම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහතුන්ගේ දූෂණ නිසා අද නැත්තටම නැති වී තිබෙනවා. අද අපට පිටරටින් ලුණු ගෙන්වීමට පවා සිදු වී තිබෙනවා. ඒ හිටපු කර්මාන්ත ඇමතිතුමා ජපන් රටට ගොස් මෙහි ආපසු පැමිණි අවස්ථාවක මා සමග ඇති වූ පෞද්ගලික සාකච්ඡාවකදී ප්‍රකාශ කළා, ජපන් රටට ලුණු යැවීමට අදහස් කර තිබෙන බව. එහෙත් දැන් අපට සිදු වී තිබෙන්නේ කුමක්ද? අපේ රටට අවශ්‍ය ලුණු පිටරටින් ගෙන්වා ගැනීමටයි. මෙවැනි දූෂිත වැඩ කරන නිලධාරීන් ගැන පරීක්ෂා කිරීමට කොමිසන් සභා පත් කිරීමෙන් ඇති වැඩක් නැහැ. එවැනි කඩාකප්පල්කාරී නිලධාරීන් මේ රටින්ම නෙරපා දැමීමට ඇමතිවරුන්ට හෝ අගමැතිනියට හෝ බලයක් තිබෙන්නට ඕනෑ. කොමිසන් පත් කිරීමෙන් සිදු වන්නේ මහජන මුදල් නිකරුණේ වියදම් වීමයි. ඊට වඩා වැඩි ප්‍රයෝජනයක් එයින් සිදු වෙනවා යයි මා හිතන්නේ නැහැ. එවැනි දූෂණ ක්‍රියාවල යෙදෙන නිලධාරීන්ට නියම විධියට අච්චු කරන්න ඕනෑ. අපේ රටේ මුල් ආරම්භයේ පටන්ම වගේ තිබුණු ලුණු කර්මාන්තය අද නැත්තටම නැති වී ගොස් තිබෙනවා. අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්‍ය එස්. ඒ. වික්‍රමසිංහ), කොම්යුනිස්ට් පක්ෂයේ නායකතුමා, විසින් මෙම කර්මාන්තය ගැන දීර්ඝ විස්තරයක් කරන්න යෙදුණා. ඒ ගැන එතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ඒ පැරණී කර්මාන්ත නැති වී යනවා නම් අපේ රටට සිදු වන්න යන්නේ කුමක්ද කියා අප කල්පනා කර බලන්න ඕනෑ. රජයේ ලුණු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දූෂණ නිසාවෙන් අද අපට පිටරටවලින් ලුණු ගෙන්වන්න සිදු වී තිබෙනවා. මා කලින් කීවාක් මෙන් මේවාට කොමිසන් වුවමනා කරන්නේ නැහැ. එවැනි නිලධාරීන් පිටමං කර දැමීමට ඒ අංශය භාර ඇමතිතුමාට හෝ ගරු අගමැතිට හෝ බලය තිබිය යුතුයි. එවැනි කඩාකප්පල්කාරී නිලධාරීන් සිටින්නේ ඔය දෙපාර්තමේන්තුවේ පමණක් නොවෙයි. කොයි දෙපාර්තමේන්තුවේ හෝ එවැනි කඩාකප්පල්කාරී කටයුතුවල යෙදෙන නිලධාරීන් සිටිනවා නම් වහාම ඔවුන් එම තනතුරුවලින් පිටුවහල් කළ යුතුයි. එවැනි දූෂිත නිලධාරීන් සිටින තෙක් අපේ රට සංවර්ධනය කළ නොහැකි බව මා ප්‍රකාශ කරන්න කැමතියි. අපි සංවර්ධන ක්‍රම ගැන කථා කරනවා, මුදල් වෙන් කරනවා, ඒ වගේම මුදල් වියදම් කරනවා. එහෙත් අන්තිමේදී සිදු වන්නේ කුමක්ද? සංවර්ධන ක්‍රම, කර්මාන්ත ව්‍යාපාර, ආදිය කඩාකප්පල් කර දමා නිලධාරීන් ඔවුන්ගේ සාක්කු තර කර ගැනීමයි. අද ප්‍රතිපත්තිය වී තිබෙන්නේ ඒ කයි. මෙවැනි ක්‍රියා අපට ඉවසා සිටින්න පුළුවන් ඒවා නොවෙයි. මෙම කරුණු ගැන සොයා බලා කෙළින් වැඩ නොකොළොත් අපේ රට තවත් ප්‍රපාතයට වැටෙන බව මා මතක් කරන්න කැමතියි. ලුණු කර්මාන්තය ගැන මා ඊට වඩා යමක් කියන්න යන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ද සිල්වා මයා.]

ඊළඟට අපේ රටේ පොල් කර්මාන්තය ගැන කල්පනා කර බලමු. අපේ රටේ පොල්වල මිළ ඉතා පහළ බැස තිබෙනවා.

සභාපතිතුමා

(அக்கிராசனர்)

(The Chairman)

පොල් ගැන කථා කළ යුත්තේ මේ වැය ශීර්ෂය යටතේ නොවෙයි.

ලක්ෂ්මන් ද සිල්වා මයා.

(திரு. லக்ஷ்மன் டி. சில்வா)

(Mr. Lakshman de Silva)

පොල් වැවිල්ල ගැන කථා කිරීමට නොවෙයි සභාපති තුමනි, මා අදහස් කළේ. සවදේශ කටයුතු භාර ඇමතිතුමා යටතේ "ඇක්සයිස් ඩිපාට්මන්ට්" එක තිබෙන නිසා ඒ අනුව වචන සවලාපයක් ප්‍රකාශ කිරීමටයි මා අදහස් කළේ. එසේ නැතිව ඇමතිතුමාගේ අංශයට අයත් නැති කරුණු කීමට මා අදහස් කළේ නැහැ. පොල් නොයෙක් කර්මාන්තවලට යොදා ගන්න පුළුවන්කම තිබෙනවා. මා කලින් සඳහන් කළ කොහු කර්මාන්තය පළල් ලෙස දියුණු කිරීමේදීත් පොල් ගස බොහෝ දුරට යොදා ගන්න සිදු වෙනවා.

ඒ වගේම සීනි කර්මාන්තය දෙස බලමු. විශාල සීනි තොගයක් පිටරටින් මෙරටට ගෙන්වන නිසා ඒ ගැන කල්පනා කර සීනි කර්මාන්ත ශාලා දෙකක් දැනට රටේ පිහිටුවා තිබෙනවා. සීනි ගැන කල්පනා නොකර පොල් ගස ගැන කල්පනා කළා නම් විශෙෂඥයන්ගේ උපදෙස් ඇතිව හකුරු නිශ්පාදනය දියුණු කරන්න ඉඩ තිබුණා. එසේ කළා නම් සීනි කර්මාන්තශාලා පිහිටුවීමෙන් ලබා ගන්න ප්‍රයෝජනයට වඩා වැඩි ප්‍රයෝජනයක් ලබා ගැනීමට ඉඩ තිබුණා. අපේ පැරණි මුතුන් මිත්තන් තේවලට සීනි දැම්මේ නැහැ. ඔවුන් තේ බීවේ හකුරුත් සමගයි. ඔවුන් බොහෝ කාලයක් ජීවත් වූයේත් එනිසාම බව මා ප්‍රකාශ කරන්න කැමතියි. හකුරු මනුෂ්‍ය ශරීරයට ඉතා හොඳ පෝෂ්‍ය ආහාරයක්. "ග්ලූකෝස්" නොතිබුණු යුද්ධ කාලයේදී, ඒ වෙනුවට හකුරු පාවිච්චි කරන්නයයි දොස්තරවරුන් විසින් ළමයින් හම්බ වුණු මව්වරුන්ට නියම කළා. හකුරු කන අයට දියවැඩියා රෝගය හැදෙන්නේ නැහැ. එම නිසා පොල් ගසින් නියම විධියට ප්‍රයෝජන නොගෙන, ඒ වගේම දේශීය නිෂ්පාදන දියුණු නොකර, ආවාට ගියාට වැඩ කර අපේ රට නියම විධියට සංවර්ධනය කිරීමට නොහැකි බව මා මතක් කරනවා. පොල් ගස් වවා තිබෙනවා. එනිසා අමුතුවෙන් වවන්ට වුවමනා කරන්නේ නැහැ. නුමුත් වියළි කලාපයේ උක් ගස් වවන්ට යාම මුදල් වැය වන හිරිහැරදායක වැඩක්. මා එසේ කියන්නේ පසුගිය දවස්වල උක් ගස් කැපීම සඳහා මිනිසුන් සොයා ගැනීමට පවා අපහසු වුණු නිසයි. විශෙෂයෙන්ම වියළි දේශගුණය ඒ උදවියට උසුලන්න බැහැ. එම නිසා ඒ උදවිය ඒවායේ වැඩ කිරීමට මැළිකමක් දක්වනවා.

ගරු සභාපතිතුමනි, අපේ රටේ පිහිටීම අනුව ජනගහනය වැඩියෙන් සිටින ප්‍රදේශවල දැනට සරු ලෙස පොල් වගා කර තිබෙනවා. එම නිසා තවත් පොල්ගසින් ප්‍රයෝජන ලබාගැනීමට පුළුවන් වන ආකාරයට කර්මාන්ත දියුණු කිරීමට රජය උනන්දු වෙන්න ඕනෑ. මේ නිසා මෙරටින් පිටරට ඇදී යන විශාල මුදලක් මේ රටේම නවත්වාගන්න පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. අද අවුරුදුපතා මෙරටට සීනි ගෙන්වීම සඳහා විශාල මුදලක් වැය වන බව අප හොඳින්ම දන්නවා. නුමුත් පොල්ගසින් ලබාගන්න සාරයෙන් හකුරු නිෂ්පාදනය කරන්න තවත් ධෛර්ය දුන්නොත් මේ මුදල ඉතුරු කරගන්න පුළුවන් වෙනවා. ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ දන්නවා, පිටිසරබද පළාත්වල ජනයා සීනිවලට වඩා ප්‍රයෝජනයට ගන්නේ පොල්ගසින් නැත්නම් කිතුල් ගසින් ලබාගන්න මීරාවලින් හදා ගන්න හකුරු බව. විශෙෂයෙන්ම සිංහල අළුත් අවුරුදු උත්සව කාලයට නොයෙකුත් රස කැවිලි පෙවිලි හදන්න ගන්නේ හකුරු මිස සීනි නොවෙයි. මෙයින් පෙනී යන්නේ අපේ රටේ ජනතාව හකුරුවලට වැඩි කැමැත්තක් දක්වන බවයි.

ඒ වාගේම අපේ රටේ, පැතිරී ඇති කසිප්පු උවදුර නැති කර දැමීමට පොල් ගස ඉතාමත්ම ප්‍රයෝජනවත් වෙනවා. පොල්ගසින් ලබාගන්න සාරය ශරීර සෞඛ්‍යයට කොහෙත්ම අහිතකර නැහැ. එම නිසා පොල්ගස සෑම දෙනාගේම සහෝදරයෙක්, මවෙක් හෝ පියෙක් හැටියට සැලකීමෙහි වරදක් නැහැ. මා කලින් සඳහන් කළ ආකාරයට අපේ රටේ කසිප්පු උවදුර නැති කිරීමට කිසිම හිරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හැරයක් කරදරයක් නැතිව පොල්ගස යොදා ගන්න පුළුවනි. එම නිසා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ අපේ රටේ පැතිරී තිබෙන මෙම කසිප්පු වසංගතය නැති කර දැමීම සඳහා රා මැදීමට අවසර දෙන ලෙසයි.

මට කලින් කථා කළ ඔය පැත්තේ මෙන්ම මේ පැත්තේ සිටින මගේ සහෝදර ගරු මන්ත්‍රීවරුන් රා මැදීමට අවසර දීම සම්බන්ධයෙන් නොයෙකුත් අදහස් ප්‍රකාශ කළා. රා මැදීමටත් ඒවා විකිණීමටත් යාපනය ප්‍රදේශයේ ජනයාට රජයෙන් අවසර දී තිබෙනවා. විශෙෂයෙන් මේ කාරණය සම්බන්ධයෙන් මගේ අදහස් ගිය අවුරුද්දේ රාජාසන කථාවේදීද හෙළිදරව් කළා. නුමුත් ඒ සම්බන්ධයෙන් කිසිම පියවරක් මේ රජය නොගැනීම ගැන මම කනගාටු වෙනවා. විශෙෂයෙන් දකුණු පළාත් වැසියන්ට රා බොන්ට ඕනෑකමක් තිබුණත් ඒ සඳහා ඒ අයට සැතපුම් තිහ හතළිහක දුර යන්න සිදු වෙනවා. අපේ ප්‍රදේශයේ තිබෙන්නේ එකම තැබෑරුමයි. අළුත්ගම පාරේ බෙන්තර ගඟට මෙහායින් ඒ එකම තැබෑරුම පිහිටා තිබෙන නිසා ඒ පළාත් වල වැසියන්ට රා බීමෙහි අවශ්‍යතාවක් තිබුණොත් මේ ස්ථානයට පමණයි, එන්ට පුළුවන්කම තිබෙන්නේ. එම නිසා යාපනය ප්‍රදේශයට රා මැදීමට සහ විකිණීමට අවසර දී තිබෙන ආකාරයට මේ පළාත් වලටද ඒ අවසරය දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. ගස් මැදීමට මෙතෙක් අපේ පළාත්වල වැසියන්ට අවසර නොදුන්නේ, නොදෙන්නේ, මොන කාරණයක් නිසා දැයි මට තේරෙන්නේ නැහැ. මට පෙනෙන හැටියට අපේ පළාත්වල වැසියන්ට දක්වන්නේ කුඩම්මාගේ සැලකිල්ලයි. ඒ ආකාරයෙන් අපේ පළාත්වල වැසියන්ට සලකනවා නම්, එය කිසිසේත් සාධාරණ නැහැ. එම නිසා මම ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරනවා, අපේ පළාත් වල වැසියන්ට යාපනයේ වැසියන්ට මෙන් ගස් මැදීමේ අවසරය නොදෙන්නේ කුමන කාරණයක් නිසාද කියා.

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී එක්තරා කාරණයක් මට මතක් වුණා. මම හිතනවා, ඒ කාරණය මේ සභාවේදී තමුන්නාන්සේට මතක් කර දීමට ඉඩ දෙනවා ඇතැයි කියා. සමහරවිට මේ අවස්ථාවට එය නොගැළපුනත්, මතක් කර දීම අපේ පළාත්වාසීන්ට කරන ගෞරවයක්යයි මම කල්පනා කරනවා. අපේ දිවංගත ගරු බණ්ඩාරනායකතුමා ජීවත්ව සිටි කාලයේදී එංගලන්තයට ගිය විටකදී, ආරක්ෂක නිලධාරියකුගේ ආරක්ෂාව නොමැතිව පැමිණියේ මන්දැයි එතුමාගෙන් එහිදී ප්‍රශ්න කළාම එතුමා කීවේ, මගේ අතේ බලපිටියේ බස්තමක් තිබෙනවා, එනිසා ආරක්ෂක නිලධාරියකුගේ සහාය මට ඕනෑ කරන්නේ නැහැයි කියායි. මේ කාරණය ඒ දිනවල පත්‍රවලත් පළ වී තිබුණා තමුන්නාන්සේ දකින්න ඇති. මෙයින් ගරු සභාවට පැහැදිලි වෙනවා, එතුමා අපේ ප්‍රදේශය ගැන කොතරම් සැලකිල්ලක් දක්වා තිබුණාද, ප්‍රදේශය ගැන කොතරම් අවබෝධයකින් යුක්තව සිටියාද කියා. එමෙන්ම බලපිටියේ ජනතාව එතුමාට කොපමණ ආදරයක් කරුණාවක් දක්වූවාද යන්න, පසුගිය මාර්තු මැතිවරණයේදී දකුණු පළාතෙන්, බලපිටිය හා රත්ගම යන ආසන දෙක සඳහා පමණක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් තෝරා එවීමෙන් පැහැදිලි වෙනවා. මේ විවාදයට මේ කාරණය අදාළ නොවුණත් දිවංගත ගරු බණ්ඩාරනායකතුමා අප පළාත් ගැන දක්වූ සැලකිල්ල මේ අවස්ථාවේදී සිහිපත් කර දීමටයි මා සඳහන් කළේ.

ගරු සභාපතිතුමනි, මේ හැරෙන්න මගේ පළාත සම්බන්ධයෙන් තවත් කාරණා කීපයක් ගැන සඳහන් කරන්න කැමැතියි.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

ගරු මන්ත්‍රීවරයා කරුණා කර මෙයට අදාළ දේ ගැන පමණක් කථා කරනවා නම් හොඳයි. මෙම වැය ශීර්ෂය පිළිබඳ විවාදය අද අවසන් කිරීමට ඕනෑ හෙයින් කථාව පුළුවන් තරම් කෙටි කරන ලෙස ඉල්ලා සිටිනවා.

ලක්ෂ්මන් ද සිල්වා මයා.
(திரு. லக்ஷ்மன் டி. சில்வா)
(Mr. Lakshman de Silva)

ගරු සභාපතිතුමනි, මේ සභාවේදී මම කථා කරන්නේ බොහොම කලාතුරකින්. මේ සභාවේ වැඩි වේලාවක් කථා කිරීමට මම අදහස් නොකළත් සමහර මන්ත්‍රීවරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ද සිල්වා මයා.]

නොයෙක් අවස්ථාවලදී පැය දෙක තුන කථා කළා. නමුත් තමුන්නාන්සේ ඒ අයට අණ කළේ නැහැ කථාව කෙටි කරන්ට. එම නිසා මට ඒ අන්දමින් අණ කිරීම ගැන කනගාටු වෙනවා.

සභාපතිතුමා
(அக்ஷிராசனர்)
(The Chairman)

ගරු මන්ත්‍රීවරයාට මම අණ කළා නොවෙයි. මා කීවේ මෙම වැය ශීර්ෂය පිළිබඳ විවාදය අද කෙළවර කළ යුතු නිසා කථාව ට වැඩි කාලයක් ගත නොකරන ලෙසයි.

අ. භා. 3.15

ලක්ෂ්මන් ද සිල්වා මයා.
(திரு. லக்ஷ்மன் டி. சில்வா)
(Mr. Lakshman de Silva)

අපටත් මෙවැනි අවස්ථාවලදීයි, අපේ අදහස් ප්‍රකාශ කරන්න ලැබෙන්නේ. ඉතින් මෙවැනි අවස්ථාවලදීත් අපේ අදහස් ප්‍රකාශ කිරීමට බැරි නම් කොයි වෙලාවේදීද එසේ කළ හැක්කේ කියා මම දන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ කණ්ඩායමේ රැස්වීම්වලදීත් අපට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු වුවත් ඇත්ත ප්‍රකාශ කරන්න පුරුදු මට එය නොකියා බැහැ. කුඩා කාලයේ සිටම ඇත්ත ප්‍රකාශ කිරීමට පුරුදු වූ කෙනකු වශයෙන් කොයි පැත්තේ සිටියත් බොරුවෙන් වැඩක් නැති නිසා අවංකව කථා කිරීමට සිදු වෙනවා. නීති රීති අනුව ඒවා හරිද වැරදිද කියා මා දන්නේ නැහැ. මම නවක මන්ත්‍රීවරයෙක්. අවුරුද්දයි තවම මේ ගරු සභාවට ඇවිත්. අපි තවම මේ නීති හරි හැටි පාඩම් කර ඇත්තේ නැහැ. ඒ නිසා අපට කියන්න තිබෙන දේ මෙහිදී ප්‍රකාශ කළ යුතුයි.

උළු ගඩොල් කර්මාන්තය අපේ පළාතේ ඉතා බහුලව පවතිනවා. එම නිසා ඒ පළාතේ උළු ගඩොල් කර්මාන්තය දියුණු කිරීම පිණිස ගරු ඇමතිතුමා ආධාරයක් කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා. අපේ පළාතේ උළු ගඩොල් කර්මාන්තශාලාවක් ඇති කොට එහි සිටින දුප්පත් ජනතාව දුකින් මුදවාලීමට යම් කිසි වැඩ පිළිවෙලක් ඇති කරන මෙන් මම ඉල්ලා සිටිනවා. අම්බලන්ගොඩ මීටියා ගොඩ කියන ගමෙහි පිහන් කර්මාන්තය සඳහා ඉතා හොඳ මැටි තිබෙනවා. එම නිසා ඒ පළාතෙහි පොඩි පිහන් කර්මාන්තශාලාවක් පිහිටුවා දෙන මෙන් මම ඇමතිතුමාගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ග්‍රාම සේවක නිලධාරීන් පිළිබඳව හැම පැත්තෙන්ම කරුණු ප්‍රකාශ වී තිබෙනවා. ඒ ගැන මටත් වචනයක් දෙකක් කථා කිරීමට තිබෙනවා. ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා ප්‍රසිද්ධියේම ප්‍රකාශ කර තිබෙනවා, ග්‍රාම සේවක නිලධාරීන් පත් කිරීම ඉතාමත් සාධාරණ ලෙස, කිසිම දේශපාලන බලපෑමක් නැතිව, ඇමතිතුමාගේ ඇඟිලි ගැසීමක් නැතිව සුදුස්සන්ම පත් වන ආකාරයෙන් කරනවාය කියා. අවංක ලෙස සෘජුව වැඩ කිරීම ගැන මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

මගේ කොට්ඨාශයේ බෙන්තර තිබෙන ආදායම් පාලක නිලධාරි කාර්යාලය ගැනත් වචනයක් කිය යුතුව තිබෙනවා. ඒ පත්තුවේ උතුරු කොණෙහිය, ඒ කාර්යාලය පිහිටා තිබෙන්නේ. ඒ නිසා බලපිටියේ ජනතාවට ආදායම් පාලක නිලධාරිතුමා හමුවීමට ඒ කාර්යාලයට පැමිණීම ඉතා මත් කරදරයක් වී තිබෙනවා. එම නිසා එම කාර්යාලය බෙන්තර වලල්ලාවිට කෝරළයේ බස්නාහිර මධ්‍යස්ථානයක පිහිටුවා ඒ ප්‍රදේශවාසීන්ට පහසුවක් සලසා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

රුහුණු නැටුම් සම්බන්ධවද වචනයක් කිය යුතුයි. පළාත් පාලන කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා ඊයේ ගාල්ලේ නගර සභා ශාලාවේදී රුහුණු නැටුම් සංදර්ශනයක නැගී බෙදා දීමේ උත්සවයකට සහභාගි වී තිබෙනවා. රුහුණු නැටුම් පිළිබඳව රජය වැඩි සැලකිල්ලක් දක්වන්නේ නැහැ. උඩරට නැටුම් ගැන ලොකු සැලකිල්ලක් දක්වා වැඩ කරන අතර රුහුණු නැටුම් පිළිබඳව එතරම් සැලකිල්ලක් නොදක්වීම ගැන මම කනගාටු වෙනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් උඩරට නැටුම් පිළිගෙන උඩරට නැටුම් පුහුණු වූ අය පාසැල්වල ගුරුවරුන් හැටියට පත් කොට ඔවුන්ට වේතනයක් ද දීමට කටයුතු සලසා තිබෙනවා. උඩරට නැටුම් ගුරුවරුන්ට පුහුණු ගුරුවරුන්ටත් වැඩිය වේතනය ලැබෙනවා. නමුත් රුහුණු නැටුම් ගුරුවරුන්ට එම සහනය ලැබෙන්නේ නැහැ. රුහුණු නැටුම් ඉගැන්වීම සඳහා නොයෙකුත් කලායතන තිබෙන නමුත් ඒවායින් ඉගෙනීම ලැබීමට ශිෂ්‍යයන් පැමිණෙන්නේ නැහැ. රුහුණු නැටුම් කලාව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මගින් පිළිගෙන නැති නිසා රුහුණු නැටුම් ගුරුවරුන්ට අනාගතයක් නැහැ. එම නිසා උඩරට නැටුම් කලාවට දී ඇති සෑම වරප්‍රසාදයක්ම රුහුණු නැටුම් කලාවටද ලබාදෙන මෙන් සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. රජය විසින් පිළිගන්නා ලද පළමුවන ශ්‍රේණියේ නැටුම් කලායතනයකට රුපියල් තුන් දහසක පමණ ආධාරයක් ලැබෙනවා. දෙවන ශ්‍රේණිය, තුන්වන ශ්‍රේණිය, ආදී වශයෙන් පවත්නා ඉන් පහළ කලායතනවලට ඊට අඩුවෙන් ගෙවනවා. උඩරට නැටුම් පුහුණු කරවන කලායතනවලට එම සහනය ලැබී ඇති නමුත් පහතරට නැටුම් කලායතනවලට එම සහනය ලැබී නැහැ. එම නිසා එවැනි කලායතනවලට ඉගෙනීම සඳහා දරුවන් එවන්ට දෙමව්පියන් කැමති වන්නේ නැහැ. එම සහනය රුහුණු නැටුම්වලටත් ලැබෙනවා නම් රුහුණු නැටුම් කලාව දියුණුවට පත් වේවී. ළමුන් පනහකට වැඩි ගණනක් සිටියොත් තමයි රුහුණු නැටුම් කලායතනයකට ආධාරයක් ලැබෙන්නෙ. රුහුණු නැටුම් කලාවට අනාගතයක් නැති නිසා ළමුන් පනහක්වත් එක ආයතනයකට එන්නෙ නැහැ. එම නිසා උඩරට නැටුම් කලාවට දී ඇති සෑම වරප්‍රසාදයක්ම රුහුණු නැටුම් කලාවටත් ලබා දෙන මෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

මෙරිල් ප්‍රනාන්දු මයා. (මොරටුව)
(திரு. மெரில் பெர்ணாண்டோ—மொறட்டுவை)
(Mr. Meryl Fernando—Moratuwa)

ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ කරුණු ස්වල්පයක් ඉදිරිපත් කරන්න අදහස් කරනවා. මුලින්ම කථා කරන්න අදහස් කරන්නේ ගිනිපෙට්ටි කර්මාන්තය ගැනයි. ඒ පිළිබඳව ප්‍රශ්න දෙක තුනක් මතු කරන්න කැමතියි. මේ වර්ෂයේ ගිනිපෙට්ටි බෑන්ඩරෝල් බද්ද වැඩි කිරීම නිසා ගිනිපෙට්ටි මිල නැග තිබෙනවා. ඒ හේතුවෙන් මෙම ගරු සභාව තුළ ගිනිපෙට්ටි මිල සම්බන්ධව සහ ගිනිපෙට්ටි කර්මාන්තය සම්බන්ධව නොයෙකුත් සාකච්ඡා ඇති වී තිබෙනවා. මා ගිනිපෙට්ටි මිල ගැන නැවතත් සාකච්ඡා කරන්න අදහස් කරන්නේ නැහැ. නමුත් ගිනිපෙට්ටි කර්මාන්තය ගැන කථා කළ යුතුයි.

මේ රටේ ගිනිපෙට්ටි කර්මාන්තය අවුරුදු විසි පහක පමණ කාලයක සිට රජයෙන් ආරක්ෂා කරගෙන ඇවිත් තිබෙනවා. එම ආරක්ෂාව ලබා දීම සඳහා සකස් කළ "Manufacture of Matches Ordinance" යනුවෙන් නීති මාලාවක් තිබෙනවා. එහි පාලනය ගෙන යන්නේ කර්මාන්ත ඇමතිතුමායි. ගිනිපෙට්ටි නිෂ්පාදනය කළ යුතු ක්‍රම අනුව කර්මාන්ත ශාලා කීපයකට එම කර්මාන්තය බෙදා දී තිබෙනවා. සමහර මුල් කොටස්කාරයන් තමතමන්ට අයිති කොටස් විකුණා දමන නිසා අද මුල් කොටස්කාරයන් අතින් ගිනිපෙට්ටි කර්මාන්තය ගිලිහිලයි තියෙන්නෙ. අද රටේ ගිනිපෙට්ටි කර්මාන්ත ශාලා කීපයක් තිබෙන එක ඇත්ත. නමුත් ඒවායින් නිපදවන ගිනිපෙට්ටිවල තත්ත්වය මොකක්ද? "අලියා" ගිනිපෙට්ටි සහ "ලංකා ලයිට්" ගිනිපෙට්ටි හැරුණු විට අනිකුත් ගිනිපෙට්ටි වර්ගවල තත්ත්වය අසතුටුදායකයි. බොහෝ විට ඇතැම් ගිනිපෙට්ටි වර්ග අතේ පත්තු වෙනවා. ඒවායේ නියම විධියට ගිනිකුරු ඇත්තෙත් නැහැ. රෙගුලාසියට අනුව ගිනිකුරු යම් සංඛ්‍යාවක් ගිනිපෙට්ටියක තියෙන්න ඕනෑ. නමුත් එය සිදු වන්නේ නැහැ. ගිනිපෙට්ටි නියම මිලට හම්බවන්නෙත් නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

කම්කරුවන්ට පඩි ගෙවන්නෙත් නැහැ.

මෙරිල් ප්‍රනාන්දු මයා.
(திரு. மெரில் பெர்ணாண்டோ)
(Mr. Meryl Fernando)

මේ කර්මාන්තය පාලනය නොකරන්නේ ඇයි?

හුඟක් ගිනිපෙට්ටි කර්මාන්ත ශාලාවල වැඩ කරන කම්කරුවන්ගේ තත්ත්වයද ඉතාම අසතුටුදායකයි. මා මුලින් සඳහන් කළ නීති මාලාවේ එක්තරා වගන්තියක් තිබෙනවා. ඒ නීතිය අනුව කම්කරු ඇමතිතුමාටත් සංස්කෘතික ඇමතිතුමාටත් කම්කරුවන්ගේ තත්ත්වය පිළිබඳව යම් කිසි පාලනයක් ඇති කරන්න පුළුවන්යයි මා විශ්වාස කරනවා. මෙන්න එම නීතිය සඳහන්ව ඇති වගන්තිය:

The control of manufacture of matches, flints, veneers of boxes and the safety and health of persons employed in the manufacture of such article.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෙරිල් ප්‍රනාන්දු මයා.]

අලියා ගිනි පෙට්ටි කම්හාන්ත ශාලාවේ, ප්‍රබල කම්කරු සමිතියක් තිබෙනවා. එතැන පමණයි, සාමූහික බලය යොදා කම්කරුවන්ට යම් යම් අයිතිවාසිකම් දිනා ගැනීමට පුළුවන් තත්ත්වයක් තිබෙන්නේ. අනෙක් තැන්වල සමිති තබා ගැනීමට ස්වාමි පක්ෂය ඉඩ දෙන්නේ නැහැ. මොරටුවේ ලංකා ලයිට් ගිනිපෙට්ටි කම්හාන්තශාලාවෙත්, කැළණියේ නැෂනල් මැච් වර්ක්ස් කියන ස්ථානයේත් ඉඩ දෙන්නේ නැහැ. සමිතියක් තැබුවොත්, සමිතියේ නායකයන්ට පහර ගසා කම්කරුවන් දොට්ට දමා ඒ අයට නොයෙකුත් කරදර හිරිහැරවලට මුහුණ පෑමට ඉඩ සලස්වනවා. පඬි පාලක සභාවේ රෙගුලාසිවත් ඒ තැන්වල ක්‍රියාවේ යෙදෙන්නෙ නැහැ. සියලුම රෙගුලාසි වාගේ උල්ලංඝණය කර තිබෙනවා. කම්කරුවන්ට නිති පතා වැඩ දෙන්නෙ නැහැ. ආණ්ඩුවේ ආරක්ෂාව ඇති අවුරුදු 25ක පමණ කාලයක් තිස්සේ පවත්වාගෙන යන කම්හාන්ත ශාලාවක නිති පතා වැඩ ලැබෙන තත්ත්වයක් කම්කරුවන්ට නැත් නම් එයින් ප්‍රයෝජනයක් තිබෙනවාද? බොහෝ විට සෙනසුරාදා දිනවල වැඩ දෙන්නේ නැහැ. සෙනසුරාදා කෙටි දවසක් නිසා අර පැය දෙක-තුනේ ප්‍රයෝජනය ගැනීමට කම්කරුවන්ට ඉඩ දෙන්නේ නැහැ. ගිනි පෙට්ටි කම්හාන්ත ශාලාවල තිබෙන්නේ ඔවැනි තත්ත්වයක් නම් මන්ද තමුන්නාන්සේ මේ නීතිවලින් ඒවා පාලනය කරන්නෙ නැත්තෙ.

දැනට ක්‍රියාත්මක කර තිබෙන කොටස් ක්‍රමය අනුව යම් යම් කම්හාන්ත ශාලාවලට දී තිබෙන ආරක්ෂාව ඉවත් කළ යුතු බව අපේ හැඟීමයි. තමුන්නාන්සේ පිටරටින් ගිනි පෙට්ටි ගෙන්වීම තහනම් කර තිබෙනවා. එහෙම නම් මේ රටේ ගිනි පෙට්ටි නිෂ්පාදනයට තරඟ කිරීමට ඉඩ දෙන්න. එතකොට අලියා ගිනි පෙට්ටි කම්හාන්ත ශාලාවටත් ලංකා ලයිට් ගිනි පෙට්ටි කම්හාන්ත ශාලාවටත් මේ කම්හාන්තය ගෙන යන්න පුළුවන් වේවි. අනෙක් කම්හාන්ත ශාලාවලට එය කරගෙන යන්න බැරි වේවි. ඒ අයගෙන් නියම විධියේ සේවයක් සිදු වන්නෙ නැති නිසාත්, අපට ඒ අයගෙන් ගිනි පෙට්ටි නියම විධියට ලැබෙන්නෙ නැති නිසාත්, නියම පඬි නඩි ගෙවීමක් සහ සැහෙන තත්ත්වයක් කම්කරුවන්ට නැති නිසාත්, ඒ අයගෙන් රටට ප්‍රයෝජනයක් නැහැ. එම නිසා ඒවා නැවතුණාට කමක් නැහැ. ගිනි පෙට්ටි සම්බන්ධයෙන් දැන් තිබෙන තත්ත්වය වෙනස් කර එම කම්හාන්තයට තරඟ කිරීමට ඉඩ දුන්නොත්, ඒ මඟින් රටට යම් කිසි සේවයක් ලබා දීමට තමුන්නාන්සේලාට හැකි වේවිය කියා අපි කල්පනා කරනවා. එය කරන්න තමුන්නාන්සේලා සූදානම්ද කියා මම ප්‍රශ්න කරනවා.

ඊළඟ කාරණාව ගිනි පෙට්ටි බෙදා හැරීමේ ප්‍රශ්නයයි. ගිනි පෙට්ටි බෙදාහැරීමේදීත් බෙදා හරින්නන් අයුතු ලාභ ගන්නවාය කියා නොයෙකුත් අවස්ථාවලදී චෝදනා පැන නැඟී තිබෙනවා. ශත තුනහමාර බැගින් ගිනි පෙට්ටියක් වෙළෙන්දාට ලැබිය යුතුය කියා මිල නියම කර තිබුණත් ඒ මිළට වෙළෙන්දාට ගිනි පෙට්ටි ලැබෙන්නේ නැහැ. ගිනි පෙට්ටි බෙදාහරින අය විසින්ම ශත තුනහමාරට වැඩියෙන් අය කරනවාය, ඒ මඟින් අයුතු ලාභ ගන්නවාය කියා බොහෝ විට චෝදනා මතු වී තිබෙනවා. කරුණු එසේ නම් ගිනි පෙට්ටි බෙදා හැරීම සමුපකාර තොග වෙළඳ ආයතනය මඟින් නොකරන්නේ මන්ද කියා මම ප්‍රශ්න කරන්න කැමතියි. අප පක්ෂයේ මන්ත්‍රීවරයකු වන ඩොරික් ද සූසා සෙනෙවි මන්ත්‍රීතුමා සෙනෙවි මන්ත්‍රී මණ්ඩලයේදී අවුරුදු දෙකකට පෙර එවැනි යෝජනාවක් ඉදිරිපත් කළා. මෑතදී ප්‍රවෘත්ති පත්‍රවලින් නම් එය කරන්න යන වාය කියා අපට දකින්න ලැබුණා. නමුත් තවමත් ඒ ගැන තීරණයක් ගෙන තිබෙන වාද කියා මම දන්නේ නැහැ. තොග වෙළෙඳ ආයතනය මඟින් ගිනි පෙට්ටි බෙදා හැරීමෙන් ලැබෙන ආදායම ඉතා සුළු එකක් වෙන්න පුළුවන්. ගිනි පෙට්ටි දුසිම් 120ක් විකුණූ විට සමුපකාර තොග වෙළෙඳ ආයතනයට ලැබෙන්නේ ශත 75 ක ලාභයක් පමණයි. නමුත් කෙසේ හෝ ගිනි පෙට්ටි නියම මිළට ලබා ගැනීමේ ක්‍රමයක් එයින් ඇති වෙනවා. සමුපකාර තොග වෙළෙඳ ආයතනය මඟින් ගිනි පෙට්ටි බෙදා හරිනවා නම්, ඒ මාර්ගයෙන් සමුපකාර සමිතිවලටත් බලයලත් වෙළෙන්දන්ටත් ගිනි පෙට්ටි ලබා ගැනීමට ඉඩ සලසා දෙනවා නම්, නියම මිලට මහජනයාට ගිනිපෙට්ටි ගැනීමට ඉඩ ලැබෙනවා. එම නිසා එවැනි ක්‍රියා මාර්ගයක් ඇති කිරීමට වෙළෙඳ කටයුතු පිළිබඳ ඇමතිතුමා සතුටුද කියා මම ප්‍රශ්න කරන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට සභාපතිතුමනි, ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය පිළිබඳව කථා කරන්න සතුටුයි. මෙම කර්මාන්තවලින් මෑත කාලයේදී විශාල පාඩු වී තිබෙනවා. වඩු කර්මාන්තය කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ පවතින කාලයේදී නම්—1945, 46, 47 යන වර්ෂවල—ලාභ තිබුණා. නමුත් මෑත කාලයේදී පාඩු ඇති වී තිබෙනවා. ඒ පාඩු ඇති වීමට හෙතු කීපයක් තිබෙනවා. තමුන්නාන්සේලාට මතක ඇති, පසු ගිය දවස්වල එම සංයුක්ත මණ්ඩලයේ කම්කරුවන්ගේ සම්මේලනයේදී එම නියෝජිතයන් තමුන්නාන්සේලා සමඟ සාකච්ඡාවක් පැවැත්වූ බව. එම සාකච්ඡාවට මන්ත්‍රීවරුන් කීපදෙනෙක් පැමිණ සිටියා. කලට වේලාවට ලී නොලැබෙන බවට එදා කළ පැමිණිල්ල ගැන යමක් නොකර තිබීම නිසා තවමත් ඒ චෝදනාව ඒ විධියටම කරන්න සිදු වී තිබෙනවා. වැඩපොළවලට වුවමනා ලී කැලෑ දෙපාර්තමේන්තුවෙන් නියම වෙලාවට ලැබෙන්නෙ නැහැ. මේ මාසේ පළමුවන දා සිට කොටස් ක්‍රමයක් අනුව වැඩ කරන්න පටන් ගත්තත් එයින් මොකක්ද සිද්ධ වුණේ? තවමත් නියම වෙලාවට ලී ලැබෙන්නෙ නැහැ. ඒ නිසා වැඩි කාලය කුත් ගත වෙනවා; කම්කරුවන්ට පාඩුත් වෙනවා. මේ තත්ත්වය හරිගස්සන තුරු වැඩ පොළවල තත්ත්වය හොඳ අතට හරවන්න බැහැ. පාඨශාලා, කන්තෝරු, අරෝග්‍යශාලා ආදි ආණ්ඩුවේ ආයතනවලට වුවමනා බඩු මේ වැඩපොළවලින් සපයනවා. එය ක්‍රමවත්ව කෙරෙන්නට නම් කැලෑ දෙපාර්තමේන්තුව ක්‍රමවත් පිළිවෙළකට ලී සපයන්න ඕනෑ.

අ. භා. 3.30

මොරටුවේ වැඩපොළවල් 4 ක් තිබෙනවා. ඒ හතර පාලනය කරන්න 4 දෙනෙක් ඉන්නවා. කර්මාන්තශාලා එකසි කලින් තිබුණේ. කම්කරුවන් පන්සිය ගණනක් සිටි නමුත් හිටියේ පාලකයන් එක්කෙනයි. අද කම්කරුවන් හත් සියයක් වෙනුවෙන් පාලකයන් 4 දෙනෙක් ඉන්නවා. ඒ නිසා මේ කර්මාන්ත ශාලා ඒකාබද්ධ කර නිල ධාරීන් වෙනුවෙන් යන වියදම අඩු කරන ලෙස කම්කරුවන් ඉල්ලා සිටිනවා. ඒ විධියේ වැඩ පිළිවෙළක් නොගන්නේ මන්දැයි ගරු ඇමතිතුමාගෙන් මා ප්‍රශ්න කරනවා.

බඩු සාදා අවසන් වූ පසු ඒවා ඒ ඒ දෙපාර්තමේන්තුවලින් භාර ගැනීම ප්‍රමාද කරනවා. ඉස්කෝල බඩු සාදා අවසන් කර ගොඩ ගසා කලක් ගත වන තුරුත් ඒවා ගෙන යන්නෙ නැහැ. සමහර විට මාස ගණන් ගත වන තුරුත් වැඩපළවල බඩු ගොඩ ගසා තබන්නට සිදු වෙනවා. ලක්ෂ ගණන් වටිනා බඩු ඒ විධියට වැඩපොළවල ගොඩ ගසා තබන්නට සිදු වීම අපරාධයක් බව කියන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් හොඳ වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. සමුපකාර වඩු සමිතිවලින් සෑදූ බඩු එසේ ගොඩ ගසා තබන්නට සිදු වන බවට පැමිණිලි ලැබෙනවා.

මණ්ඩලයට සභාපති මහත්මයෙක් පත් කර සිටිනවා. කරුණා කර ඒ මහත්මයාට එක් වැඩක් හැටියට එය භාර දෙන්න. කලින් හිටපු මහත්මයා ඒ වැඩ කොටස හරියාකාර කරන්න උත්සාහ කළ නමුත් ඒ මහත්මයාට අමාත්‍යාංශයේත්, දෙපාර්තමේන්තුවේත්, සංයුක්ත මණ්ඩලයේත් වැඩ කරන්නට සිදු වූ නිසා සම්පූර්ණ කාලය යොදා එම වැඩ කොටස කරන්නට බැරි වුණා. ඒ නිසා දැන් පත් කර සිටින මහත්මයාට භාර එකම කාර්යය හැටියට එය කර ගෙන යාමට ඉඩ දෙනවා නම් හොඳයි.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)
He is on a full time basis.

මෙරිල් ප්‍රනාන්දු මයා.
(திரு. மெரில் பெர்ணாண்டோ)
(Mr. Meryl Fernando)
කර්මාන්ත සංවර්ධන අංශය සම්බන්ධයෙන් දකුණු කොළඹ දෙවන ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොසිසා මයා.) සඳහන් කළා. මේ අංශයෙන් කාර්මික යන්ත්‍ර සාදන්නන්ට නියම ධෛර්‍යයක් ලැබෙන්නෙ නැහැ.

මොරටුවේ එවැනි කෙනෙකු ගැන මම දන්නවා. ඒ තැනැත්තා වඩු කාර්මිකයන්ට අවශ්‍ය යන්ත්‍රයක් නිපදෙව්වා. එම යන්ත්‍රය නිපදවා වඩු කාර්මිකයන්ට සැපයීමේ අදහසින් දෙපාර්තමේන්තුවෙන් ආධාරයක් ලබා ගන්නට උත්සාහ කළ නමුත් එය ලැබුණේ නැහැ. ඒ නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෙරිල් ප්‍රනාන්දු මයා.]

තමුන්නාන්සේ මේ ගැන උනන්දුවක් දක්වනවා නම් මෙම යන්ත්‍රය දියුණු කිරීමට උපකාර කිරීමෙන් මේ කාර්මාන්තයේ යෙදී සිටින්නවුන්ට උපකාරයක් සලස්වන්නට පුළුවන්වනවා නොඅනුමානයි.

සුළු කාර්මිකයන්ට ආධාරයක් දීමක් වශයෙන් ණය පහසුකම් දීම පිළිබඳව මා මේ ගරු සභාව වෙත ඉදිරිපත් කළ යෝජනාවක් තමුන්නාන්සේලා පිළිගත්තා. ඒ පිළිබඳව වරින් වර නොයෙක් විධියේ වාර්තා පුවත්පත්වල පළ වූ නමුත් අදවන තුරු එවැනි ක්‍රමයක් නම් ක්‍රියාවේ යොදවා නැහැ. එහි ප්‍රතිඵලයක් නිසා දෝ රුපියල් හාර පන්දාහ, හත් අටදාහ ආදී වශයෙන් ණය ලබා ගැනීමට ඉල්ලුම් පත් දෙදහක් පමණ සුළු කාර්මිකයන්ගෙන් මෙම දෙපාර්තමේන්තුවට ලැබී තිබෙන නමුත්, ණය දීමේ ක්‍රමයක් නම් මේ වනතුරුත් දෙපාර්තමේන්තුව මගින් සකස් කරලා නැහැ. එවැනි ණය දීමේ ක්‍රමයක් ඉක්මනින් සකස් කළහොත් වඩු කාර්මිකයන්ට මෙන්ම වෙනත් අයටද-යන්ත්‍ර ආදිය නිපදවන්නන්ට—එමගින් ආධාර දීමේ ප්‍රතිඵලයක් වශයෙන් මුළු කර්මාන්තයටම විශාල ප්‍රයෝජනයක් අත්වෙනවා. එහෙයින් ණය දීමේ ක්‍රමයක් පුළුවන් තරම් ඉක්මනින් සකස් කරන්න කියා මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

මීළඟට ගරු සභාපතිතුමනි, වඩු-කර්මාන්තයේ යෙදී සිටින්නවුන්ට අද දින මුහුණ පාන්නට සිදු වී තිබෙන ප්‍රශ්න කීපයක් පිළිබඳව වචන සවලපයක් කියන්නට තිබෙනවා. වඩු කර්මාන්තයේ යෙදී සිටින කාර්මිකයන් වැඩ කරන්නේ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් ඕඩර් ලබා ගෙනයි. මේ අය සාදන බඩුවලට ගෙවන මිල පිළිබඳ කිසිම වෙනසක් පසුගිය අවුරුදු කීපය තුළදී ඇති වී නැහැ. 1953-54 කාලයේ පටන් අද දක්වාත් එකම මිලයි ගෙවන්නේ. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවත්වා ගෙන යනු ලබන කැලෑ දෙපාර්මේන්තුව මගින් විකුණන ලබන ලී වල මිල, හල්මිල්ල, බුරුත ආදි ලීවල මිල, වැඩි කළා. එමෙන්ම මෙරටට ගෙන්වනු ලබන නොයෙක් බඩු සීමා කිරීමේ අදහසින්, ඒවායේ තීරු බදු ගරු මුදල් ඇමතිතුමා විසින් වරින් වර වැඩි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, වඩු කාර්මිකයන්ට අවශ්‍ය වූ සරන්දරු, ඇණ ආදි ද්‍රව්‍යවල මිල කීප ගුණයකින් වැඩි වී තිබෙනවා. නමුත් මෙම වඩු කාර්මිකයන් සාදන බඩුවලට අනෙක් දෙපාර්තමේන්තුවලින් ගෙවනු ලබන්නාවූ මුදල් ප්‍රමාණය පසුගිය හත් අට අවුරුද්ද තුළදී කොහෙත්ම වැඩි වෙලා නැහැ. මේ හේතුකොට ගෙන මේ අයට විශාල අමාරු තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වී තිබෙන නිසා මේ ප්‍රශ්නය කෙරෙහි තමුන්නාන්සේගේ සැලකිල්ල යොමු වනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

පේස කර්මය පිළිබඳවද වචන සවලපයක් කිව යුතුව තිබෙනවා. පේස කර්මාන්ත මධ්‍යස්ථාන මගින් නිපදවනු ලබන සරොම් තවමත් විශාල ගබඩාවල රැස් කර තිබෙනවා. පේස කර්මාන්තය පිළිබඳ අනුගමනය කරන්නා වූ ප්‍රතිපත්තිය කෙරෙහි ඇමතිතුමා ඉතාමත්ම සැලකිලිමත් වෙනවා ඇතැයි මා කල්පනා කරනවා. මේ අන්දමට මෙම මධ්‍යස්ථාන තව දුරටත් පවත්වා ගෙන යනවාද එසේ නැත්නම් මේවා ප්‍රතිසංවිධානය කිරීමට පිළිවෙළක් යොදනවාද යනාදි ප්‍රශ්න පිළිබඳව ඉතා උනන්දුවෙන් කල්පනා කර බැලිය යුතු කාලය දැන් පැමිණ තිබෙනවා. එසේ නොකළහොත් අවුරුදු පතා විශාල මුදල් ප්‍රමාණයක් එක් අතකින් වැය කරන අතර අනික් අතින් ලක්ෂ ගණන් සරොම් ගබඩාවල රැස් කරන්නට සිදුවේවි. මේ පිළිබඳව මා පසුගිය දවස්වලදී ද ප්‍රශ්න කීපයක් මෙම ගරු සභාවේදී ඇසුවා. ඒ නිසා මේ ප්‍රශ්නය කෙරෙහි උනන්දුවක් දක්වන මෙන් මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

සරොම් සුදු කරන්නාවූ මධ්‍යස්ථානයක් මොරටුවේ තිබෙනවා. මෙම යන්ත්‍රය ක්‍රියා කරන්නේ නැතැයි කියා ගිය වර්ෂයේ අයවැය ලේඛනය පිළිබඳව කාරක සභා අවස්ථාවේදී තමුන්නාන්සේට පෙන්නුම් කර දුන්නා. 1959 දී පමණ එම යන්ත්‍රය පිහිටෙවූ නමුත් එදා එය ක්‍රියා කරන තත්ත්වයක් තුබුණෙත් නැහැ; අද ක්‍රියා කරන තත්ත්වයක් ඇත්තෙත් නැහැ. දෙපාර්තමේන්තුවේ මධ්‍යස්ථානයේ සරොම් සුදු කරගන්න බැරි වෙන කොට පෞද්ගලික ධනපති කර්මාන්තකාරයන්ට සරොම් දී සුදු කරවාගන්න සිදු වෙනවා. සුදු කිරීම වෙනුවෙන් එක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සරොමකට ශත 30 ක් ගෙවන්න සිදු වී තිබෙනවා. දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර වැඩ නොකර තිබෙන විට වෙනත් අයට වාසියි. පෞද්ගලික ධනවතුන් ඒ සරොම් සුදු කිරීමේ කාර්‍යය භාරගන්නේ ආශාව ට නොව ලාභ ලබාගැනීම සඳහායි. සෑම සරොමකින්ම වාගේ ශත 10 ක ශුද්ධ ලාභයක් ඇති බව දැනගන්න තිබෙනවා. මේ විධියට පසුගිය අවුරුදු එකහමාර ඇතුළතදී වැල්ලවත්තේ රෙදි මෝලට රුපියල් පන්ලක්ෂයක් ගෙවා තිබෙන වා. මොරටුවේ "ලංකා වීවිං මිල්ස්" එකට රුපියල් එක්ලක්ෂ විසිපන් දහසක් ගෙවා තිබෙනවා.

තත්ත්වය මෙසේ නම්, අර කී යන්ත්‍ර ය ක්‍රියාත්මක කරවන්න තමුන්නාන්සේ කටයුතු නොකරන්නේ මන්දැයි මා අහනවා. 1963 වන තුරු එය ක්‍රියාත්මක කරවන්න බලාපොරොත්තුවක් නැති බවත්, පසුව වේයන්ගොඩ මෝලේ ඒ වැඩ කරන්න බලාපොරොත්තු වන බවත්, එතෙක් මොරටුවේ මෝලේ ඒ වැඩ කරන බවත්, තමුන්නාන්සේ විසින් දෙන ලද පිළිතුර අනුව පෙනී යනවා. නමුත් මොරටුවේ මෝල ක්‍රියාත්මක කර වන්නේ නැහැ. එය වැඩ කරන්නේ නැහැ. ඒ උත්තරය දෙන කාලයේ සරොම් තිස් ලක්ෂයක් ගබඩාවේ තුබුණා. ඒවායේ වටිනාකම රුපියල් කෝටි දෙකයි. ඒ උත්තරය අනුව එසින් සරොම් පණස් දහසක් වේයන් කා දිරාපත් වී ගොස් තිබෙනවා. ඒවායේ වටිනාකම ලක්ෂ හතරයි. මෙවැනි තත්ත්වයක් පවතින නිසා මේ ගැන සම්පූර්ණ පරීක්ෂ ණයක් කර බැලීම අවශ්‍යයි. සරොම් සුදු කිරීම සඳහා රජය විශාල මුදලක් වියදම් කරන නිසාත්, ඒ වගේම මොරටුවේ පේස කර්ම මධ්‍යස්ථානය සඳහා විශාල මුදලක් වියදම් කරන නිසාත්, ඒ මධ්‍යස්ථානය ගැන විශේෂ පරීක්ෂණයක් පවත්වා එය හොඳ තත්ත්වයකට ගෙන එන්ට කටයුතු කළ යුතුයි.

පෞද්ගලික කම්කරුන්ත ශාලාවල මේ වැඩේ කරන්න පුළුවන් නම් දෙපාර්ත මේන්තුවේ කම්කරුන්ත ශාලාවේ මේ වැඩේ කරන්න බැරි ඇයි? මෙහි ලොකු රහසක් තිබෙනවා. සමහර නිලධාරීන් ධනපතියන් සමඟ එකතු වී මේ යන්ත්‍රය ක්‍රියාත්මක නො කරවීමට වැඩ කටයුතු කරනවාද කියා සැකයි. එසේ හිතන්ට ඉඩ තිබෙනවා. සුදු කිරීම සඳහා සමහර ස්ථානවලට සරොම් දුන්නාම, ආපසු ලැබෙන්නේ පළුදු වෙලයි. තුවාල කර ගේන සරොම් නැවත ඩයි කරන්ට දීමෙන් එකකට ශත 40 ක් ගෙවන්ට ඕනෑ. තුවාල වුණු සරොම්වලට ඒ අයගෙන් අලාභය අය කරනවාද? සරොම් දහස් ගණනකට ඒ විධියේ තුවාල සිදු වී තිබෙනවා.

අ. භා. 3.45

සේවකයන්ගේ තත්ත්වය ගැනත් වච නයක් කියන්ට කැමතියි. සමහර සේවක යන් අවුරුදු පහළොවක් පමණ වැඩ කර ඇතත්, ඔවුන්ට පෙන්ෂන් ගැනීමට හැකි වන තත්ත්වයක් තවම සකස් කර නැහැ. පුහුණු කම්කරුවන් සිටිනවා; අර්ධ පුහුණු කම්කරුවන් සිටිනවා. ඔවුන් සියලු දෙනා ටම සලකන්නේ දවස් පඩි ලබන අස්ථිර කම්කරුවන් හැටියටයි. එම නිසා ඒ අයට ලැබිය යුතු අසිතිවාසිකම් ලබා දීමට ක්‍රියා කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. දකුණු කොළඹ දෙවැනි ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) කලා යතනයේ චිත්‍රකර්මය ඉගෙන ගන්න ගුරු වරුන් ගැන කථා කරමින්, ඒ අයට රක්ෂා ලබා දීමට වැඩ පිළිවෙළක් සලස්වන ලෙස තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටියා. මමත් ඒ කාරණය ගැන මතක් කරන්න කැම තියි. ඒ අය අවුරුදු 3 ක් හෝ ඊට වැඩි කාලයක් තමන්ගේ වියදමෙන් එම කලා යතනයේ ඉගෙන ගත් පසු අධ්‍යාපන දෙපාර්තමේන්තුව කියනවා නම්, චිත්‍ර කර්මය ඉගැන්වීම සඳහා ගුරු විද්‍යාලවලින් පිට වන අය පමණක් බඳවා ගන්නවාය කියා, මා හිතන පිළිවෙළට ඒ කීම අසාධාර ණයි. ගුරු විද්‍යාලවල චිත්‍ර කර්මය පිළිබඳව විශේෂ අංශයක් නැහැ. ගුරු විද්‍යාලවල ඉගෙන ගන්න අය තමන් තෝරා ගන්න විෂයයන් අනුව කොයි දේත් ඉගෙන ගත යුතුයි. නමුත් ගුරු විද්‍යාලවලින් පිට වන අයව පමණක් චිත්‍ර කර්ම ගුරුවරුන් හැටි යට බඳවා ගන්නවා නම් එසින් සිදු වන්නේ කලාතනයෙන් පිට වන අයට අවස්ථා වක් නොලැබීමයි. ගුරුවරුන් තුන් දෙන කුට පමණ රක්ෂා දීල තියෙනවා. ඒ මොන හේතුවක් නිසාද දන්නෙ නැහැ. නමුත් අනික් අයට රක්ෂා දෙන්නෙ නැහැ. එම නිසා මේ කරුණ ගැන ගරු අධ්‍යාපන ඇමතිතුමා සමඟ සාකච්ඡා කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෙරිල් ප්‍රනාන්දු මයා]

තීරණයක් ගෙන, ඒ අයට රක්ෂා ලබා දීමට වැඩ කටයුතු සලස්වන ලෙස මම ඉල්ලා සිටිනවා.

සමහරුන්ට සහතික ලැබී තිබෙනවා. නමුත් රක්ෂාවක් ලැබෙන්නෙ නැහැ. චිත්‍ර කර්ම ගුරුවරුන් හැටියට ඒ අයට පත්වීම් දෙන්නෙ නැහැ. එහෙම නම් කලායතනය තිබීමේ තේරුම කුමක්ද?

තවත් එක කාරණාවක් කියන්න තිබෙනවා. සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් අවුරුද්දක් අවුරුද්දක් පාසා නොයෙකුත් සමිති සමාගම්වලට විශාල මුදලක් බෙදා දෙනවා. මේ මුදල් බෙදා දීමේදී යම් කිසි ක්‍රමයකට වාර්තා ලබා ගන්න බව මම දන්නවා. නමුත් මුදල් ලැබිය යුතු සියළුම සමිතිවලට මුදල් ලැබෙනවාද යන්නත්, මුදල් ලබා ගන්න අය ඒ මුදල් නියම පිළිවෙළට පාවිච්චි කරනවාද යන්නත්, සෝදිසි කිරීමට පරීක්ෂණයක් පවත්වන වාද යන්න මම දැන ගැනීමට කැමතියි. සමහර සමිති සමාගම්වල කටයුතු නියම විධියට කෙරෙන්නෙ නැති බවට ආරංචි තිබෙනවා. "සිංහලීස් කල්චරල් ඉන්ස්ටිටියුට්" හෙවත් සිංහල සංස්කෘතික ආයතනය පටන් ගත්තේ බොහොම හොඳ බලා පොරොත්තු ඇතිවයි. පොලිස්පතිතුමාත් ඒ ආයතනයේ ආරම්භකයෙක්. නමුත් එහි කටයුතු ගැන දැන් දැන් අසතුටුදායක ආරංචි තිබෙනවා. ඔවුන්ගේ මුදල්වල අඩුවක් තිබෙනවා. කලාකාරයන්ට එතන තැනක් ලැබී නැහැ. නාට්‍ය ලියන එක ලේඛකයකු හැරුනාම අනික් කිසිම කලාකාරයකුට එහි කිසිම තැනක් ලැබී නැහැ. එසේ නම් "සිංහලීස් කල්චරල් ඉන්ස්ටිටියුට්" කියා ගම්භීර නමක් තිබුණත් ඒ ස්ථානයේ වැඩ කටයුතු කෙරෙන්නේ කෙසේද යන්න සොයා බැලිය යුතුයි. සමහර අවස්ථාවල සංස්කෘතියට ඇල්මක් තිබෙන අය මහන්සියෙන්, උනන්දුවෙන්, පරිත්‍යාගයෙන් වැඩ කළත් ඒ අයට මුදලක් ලැබෙන්නෙ නැහැ. ලැබෙනවා නම් ලැබෙන්නෙ ඉතාම සුළු මුදලක්.

රුහුණු නැටුම් ගැන බලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ද සිල්වා මයා.) කීවා. ඔය විධියට නොයෙකුත් පැමිණිලි තිබෙනවා. ඒ නිසා දෙන මුදල් නියම විධියට පාවිච්චි කරනවාද, සුදුසු අයට ඒවා දෙනවාද යන්න ගැන පරීක්ෂණයක් පවත්වන ලෙස මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, තව එක කාරණයක් පමණක් කියන්න තිබෙනවා. කසිප්පු ගැන මම කථා කරන්නෙ නැහැ. එක ප්‍රශ්නයක් පමණක් අහන්න සතුටුයි. ගරු ඇමතිතුමාගේ සුරා බදු ප්‍රතිපත්තිය කුමක්ද කියා ප්‍රකාශ කරන ලෙස මේ ගරු සභාවේ මන්ත්‍රීවරු කීප දෙනෙක්ම ඉල්ලා සිටියා. වරින් වර මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් සම්බන්ධ කරන කාරක සභා සාකච්ඡාවලදී රා තැබෑරුම් විවෘත කළ යුතු බවට යෝජනා සම්මත කර තමුන්නාන්සේට එවා තිබෙනවා. රා තැබෑරුම් විවෘත කළොත් කසිප්පු ව්‍යාපාරයට පහර දෙන්න පුළුවන්. නමුත් තමුන්නාන්සේ ඒකට කැමැත්ත දීලා නැහැ. කැමැත්ත නොදෙනවා නම් එසේ කැමත්ත නොදෙන්නේ කුමන හේතුවක් නිසාද කියා ප්‍රකාශ කරන ලෙස මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, මම මීට වඩා කථා කිරීමට අදහස් කරන්නෙ නැහැ. තමුන්නාන්සේට ස්තුති කරමින් මගේ කථාව අවසාන කරනවා.

ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස් (නාත්තන්ඩිය)

(சேர் அல்பேட் எப். பீரிஸ்—நாத்தாண்டிய)

(Sir Albert F. Peries—Nattandiya)

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් මාත් වචනයක් දෙකක් කථා කිරීමට අදහස් කරනවා. මේ ඇමති ශීර්ෂය ගැන කල්පනා කර බැලුවාම දෙපාර්තමේන්තු 21 ක් මෙය යටතේ තිබෙන බව පෙනී යනවා. මුළු ආණ්ඩුවෙන්ම විශාල බරක් උසුලන ඇමතිවරයා හැටියට සිටින්නේ මේ ඇමතිතුමායි. ඒ මන්ද? දෙපාර්තමේන්තු 21 ක වැඩ කටයුතු කිරීම ලෙහෙසි පහසු කාර්යයක් නොවෙයි. දෙපාර්තමේන්තු වලත් නොයෙක් අංශ තිබෙනවා. මා හිතන්නේ මේ ඇමති අංශය යටතේ දැනටමත් සංයුක්ත මණ්ඩල 12 ක් විතර තිබෙනවා. මේ අන්දමින් කල්පනා කර බලන විට මනුෂ්‍යයකුට කරන්ට නුපුළුවන් තරම් වැඩ කොටසක් මේ ඇමතිවරයා කර ගෙන යන බව පෙනෙනවා. අගමැතිවරිය ලංකාවට ආ හැටියේ මේ ඇමතිවරයාගේ බර සැහැල්ලු කරයි කියා මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලාපොරොත්තු වෙනවා. ඒ මන්ද? මේ ඇමති අංශයෙන් ඉතා වැදගත් වැඩ කටයුතු රාශියක් කෙරෙන්ට තිබෙන නිසයි. ඉතා කල්පනාකාරීව යම්කිසි සැලැස්මක් අනුව මෙම කටයුතු කළ යුතුව තිබෙනවා. මේ ඇමතිවරයාට හරියාකාර ඒ වැඩ කටයුතු කරන්ට බැරිව තිබෙන්නේ දෙපාර්තමේන්තු රාශියක් එතුමා යටතේ තිබෙන නිසයි. ඒ ගැන මා ඇමතිවරයාට අනුකම්පා කරනවා. පසුගිය කාලයේ මේ ඇමතිතුමා මා ඉතා කිට්ටුව ආශ්‍රය කළ කෙනෙක්. එම නිසා මා දන්නවා, එතුමාට ඉතා කල්පනාකාරීව කටයුතු කරන්ට ශක්තියක් තිබෙන බව. එතුමාට කාල වේලා මදිකම නිසා වන්නට ඇති, ඒ ඇමති අංශයේ කටයුතු දවසින් දවස පමා වන්නේ.

කර්මාන්ත ගැන කල්පනා කර බැලුවත්, ඒ සෑම දෙයක්ම අද කරගෙන යන්නේ පාඩු ලබමින් බව පෙනී යනවා. ඒ නිසා මෙම ඇමති අංශයට අයත්ව තිබෙන දෙපාර්තමේන්තු කිපයක් වෙනත් ඇමති අංශයකට භාර දී හෝ, එසේ නැත්නම් වෙනත් ඇමතිවරයකු පත් කර, මෙයින් සමහරක් ඒ ඇමතිවරයාට භාර දී හෝ කටයුතු කරනවා නම් හොඳයයි මා කල්පනා කරනවා. ඇමතිවරුන් වැඩි කිරීම ගැන බොහෝ දෙනෙක් විරුද්ධයි. අනෙක් ඒවා ගැන කල්පනා කරන්ට වුවමනා නැහැ, කර්මාන්ත සඳහාම ඇමතිවරයකු පත් කළොත් ඒ ඇමති අංශය සඳහා විය දම් වන මුදල හැර තවත් විශාල මුදලක් ඉතිරි කරගැනීමට පුළුවනි. ඒ වගේම එසේ කිරීමෙන් මේ රටේ දුප්පත් ජනයාට විශාල සේවයක් කරන්ටත් පුළුවන් බව මට පෙනී යනවා. ඒ මන්ද? අපේ රටේ වැසියන්ට රක්ෂා දෙන්ට පුළුවන් වන්නේ කර්මාන්තශාලා මගිනුයි. ගම්බද පළාත් දියුණු කරන්නට පුළුවන් වන්නේත් එයිනුයි. හොඳ කල්පනාවෙන් කර්මාන්ත ශාලා ඇති කරනවා නම් විශාල ප්‍රයෝජනයක් ලබාගන්න පුළුවනි.

කලින් පාඩු වෙමින් තිබුණු එක් කර්මාන්තශාලාවක් ගැන පමණක් පෙන්වා දෙන්ට කැමතියි. නාත්තන්ඩියේ විදුරු කර්මාන්තශාලාව රජය මගින් කරගෙන ගොස් පාඩු සිදු වීම නිසා කලක් වසා දමා තිබී පසුව එය කෑලිවලට කඩා විකුණන්ට ගැසට් කළා. ඒ අවස්ථාවේදී මා ඉදිරිපත් වී බොහොම අමාරුවෙන් එය ඉල්ලාගෙන නියම අන්දමින් කටයුතු කරන්ට දන්න කීප දෙනකුත් රැස් කරගෙන ජපන් රටින් විශේෂඥයින් ගෙන්වා වාර්තාවක් පිළියෙළ කර ඒ අනුව කටයුතු කරගෙන ගිය නිසාත්, ඒ වගේම එහි අධ්‍යක්ෂ වශයෙන් පත් කළ මහත්මයාගේ විශ්වාසවත් භාවය නිසාත්, දැන් එයින් සෑහෙන ලාභයක් ලබාගන්ට පුළුවන් වී තිබෙනවා. මාස්පතා ගණන් බලමින් ඒ පොත අතේ තබාගෙන සිටින්ටය කියා අප ඒ අධ්‍යක්ෂතුමාට කියා සිටියා. ඒ විධියට කටයුතු කිරීමෙන් මේ අවුරුද්ද ඇතුළත සියයට 25 ක පමණ ලාභයක් අප ගෙවා තිබෙනවා. මාස්පතා මෙවැනි ව්‍යාපාරවල ගණන් බලන්ට ඕනෑ. "ඉන්ටර්නල් ඔඩිට්" එකක් තබාගෙන ඇතුළේම ගණන් බලන්ට ඕනෑ. මා හිතන්නේ ඇමතිතුමාට ඊට කාලය ඕනෑ. මා කියන අන්දමේ ක්‍රමයක් ඇති කළොත් ඒ ව්‍යාපාරය කරගෙන යන්නේ ලාභයට ද, පාඩුවටද, යන්න විනාඩි 10 ක් තුළ බලාගන්න පුළුවනි. පාඩුවක් සිදු වෙනවා නම් ඒ පාඩුව සිදු වන්නේ කුමක් නිසාද කියාත් විනාඩි 5 කින් නිගමනය කරගන්නට පුළුවනි. ඒ හැටියට ගණන් තබන්නේ නැතුව කවදාවත් මේ කර්මාන්තශාලා දියුණු කරන්ට, ඒවායේ වැඩකටයුතු නියම අන්දමට ගෙන යන්ට, බැහැ. ඇතැම් කර්මාන්තශාලාවල අවුරුද්දකින්වත් ගණන් බලා නැහැ. නමුත් අවුරුද්දකට දෙකකට පස්සේ ගණන් බැලුවාම සොයා ගන්ට ලැබෙන්නේ නැහැ, කලින් මාස කිපය තුළ පාඩු හෝ ලාබ ඇති වුණේ මොන කාරණයක් නිසාද, කටයුතු ගෙන යා යුත්තේ මොන ආකාරයටද, ලාබ ලැබිය හැක්කේ කොයි අන්දමටද, කියා. එපමණක් නොවෙයි, හොරකම් කෙරෙන්නේ කොයි අංශයෙන්ද, පාඩු ඇති වෙන්නේ කොයි අංශයෙන්ද, කියා දැනගැනීමට අවසථාවක් සැලසෙන්නේ නැහැ. එම නිසා ඔය ආකාරයට නම් මේ කර්මාන්ත ශාලාවල වැඩ කටයුතු ගෙන යන්ට ලැබෙන්නේ නැතැයි කියන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, ඊළඟට පේස කර්මාන්තය සම්බන්ධයෙන් වචනයක් කථා කරන්ට මම අදහස් කරනවා. අපේ රටේ පේස කර්මාන්තය දියුණු කළොත් විශාල දෙනකුට රැකීරක්ෂා ලබා දෙන්න පුළුවනි. තමුන්නාන්සේ සමහර විට අසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්]

ඇති, නාත්තන්ඩියේ පේස කර්මාන්ත සංගමයෙන් දැන් ගෑණු ළමයින් 2,500 කට පමණ රක්ෂා ලබා දී තිබෙනවා. මේ අය ගෙන් බොහෝ දෙනකු පේස කර්මාන්ත යේ යෙදෙන්නේ තමන්ගේ නිවෙස්වල මයි. කලින් මේ අයට පුහුණුවක් ලබා දී මෙන් පසුව තමන්ගේ ගෙවලම යන්ත්‍ර තබාගෙන වැඩ කටයුතු කරගෙන යනවා. එපමණක් නොවෙයි, මාස්පතා මෙම සංග මයෙන් ගණන් බලනවා. ඒ සඳහා "ඉන්ටර්නල් ඔඩිට්" කියා අංශයක් තිබෙනවා. මෙසේ මාස්පතා ගණන් බැලීම නිසා යම් ලෙසකින් පාඩුවක් සිදු වෙනවා නම්, එය කොයි ආකාරයෙන්ද සිදු වන්නේ කියා පහසුවෙන්ම සොයා ගන්න පුළුවනි. සමුපකාර දෙපාර්තමේන්තුවෙන් පාලනය වන කර්මාන්තශාලාවල අවුරුද්දකටවත් ගණන් බැලීමක් කරන්නේ නැති වුණත් මෙම වැඩ පිළිවෙළ යටතේ අවුරුද්දකට වරක් පෞද්ගලික ගණන් බලන සමාගම කට භාර දී ගණන් බලනවා. මේ ක්‍රමවත් වැඩ පිළිවෙළ අනුගමනය කිරීම නිසා, දැනට ලක්ෂ 7ක් පමණ ලාභ ලැබී තිබෙනවා. ඒ ලැබෙන මුදල ඒ කර්මාන්තය තවත් දියුණු කිරීමට යොදාගෙන යනවා. රජයෙන් ආධාර වශයෙන් අප ඉල්ලාගෙන තිබෙන්නේ ඉතාම සුළු ප්‍රමාණයක්. නුමුත් නියම ආකාරයට තව දුරටත් මේ කර්මාන්තය ගෙන යන්ට පුළුවන් වුණොත් ඉතා සාර්ථක ප්‍රතිඵල ලබාගැනීමට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ.

ගරු සභාපතිතුමනි, ඊළඟට මෙම සංගමය මුහුණ පා තිබෙන කරදර ස්වල්පයක් ගැන තමුන්නාන්සේට දන්වන්නට කැමතියි. දැනට සරොම් නිපදවීම බොහෝ දුරට අඩු වී තිබෙන නිසා බොහෝ දෙනකුට අමාරු තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ක්‍රමවත් වැඩ පිළිවෙළක් අනුගමනය කිරීමට සංගමය අදහස් කරගෙන තිබෙනවා. විශෙෂයෙන් මේ ළඟදී සිට නූල් ලබාගැනීම නොයෙක් අවස්ථාවලදී ප්‍රමාද වී තිබෙනවා. එහෙත් මේ කර්මාන්තය දියුණු කිරීමට නම්, ඒ සඳහා අවශ්‍ය නූල් ලබාගැනීමට පහසුකම් සලසන්ට ඕනෑ. මෙයට කලින් මෙම සංගමයට පිටරටින් නූල් ගෙන්වා ගැනීමේ පහසුකම් තිබුණා. ඒ කාලයේ නිත රම ලක්ෂ දෙකක පමණ නූල් කලින් තත්

පත් කරගෙන තිබුණා. නුමුත් අද ඒ තරම් පහසුකම් නැහැ. ඉදිරියට වේයන්ගොඩින් නූල් ලබා දෙන්ට යනවාය කියා අපට ආරංචියි. එසේ ලබා ගත හැකි වුවොත් මේ කටයුතු හොඳින් ගෙන යන්ට පුළුවන් කියා මම කල්පනා කරනවා. එපමණක් නොවෙයි, අණ්ඩුවේ ආධාර අරගෙන නිති පතාම කටයුතු කිරීම හරි නැතැයි අප සංගමයට පෙනී ගොස් තිබෙනවා.

මම මේ ළඟදී එක්තරා පේස කර්මාන්ත ශාලාවකට ගියා. ඒ ස්ථානයේ පාලනය ගෙන යන්නේ භාර්යාව හා ස්වාමිපුරුෂයා පමණයි. ඒ හැර ඒ ස්ථානයේ ළමයින් 125 දෙනකු පමණ කර්මාන්තයේ යෙදී සිටිනවා. යන්ත්‍ර 80ක් පමණ තිබෙනවා. නුමුත් ආණ්ඩුවෙන් මෙම කර්මාන්ත ආයතනයට කිසිම ආධාරයක් ලැබෙන්නේ නැහැ. එසේ නමුත් වැඩ කටයුතු ඉතා හොඳින් කර ගෙන යන බව මට පෙනී ගියා. මෙම ස්ථානයේ නිපදවන රෙදි මිල දී ගැනීමට වෙළෙන්දන් සිටිනවා. ඒ අය නිපදවනු ලබන රෙදි ලබාගෙන විකුණනවා. මේ ආකාරයෙන් ඉතාමත් හොඳින් කටයුතු කරගෙන යන ස්ථාන අපේ පළාතේ තිබෙනවා. මේ ආකාරයෙන් ආණ්ඩුවේ කිසිම ආධාරයක් නැතිව ගෘහ කර්මාන්තයක් වශයෙන් පේස කර්මාන්තය ඉතාමත් ජනප්‍රිය තත්ත්වයකට පත් වී තිබෙනවා. රජයෙන් මේ ස්ථානවලට ආධාර දුන්නොත් ඉතාමත් දියුණු තත්ත්වයකට පේස කර්මාන්තය නගා සිටුවන්න පුළුවනි.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

With regard to the question about the Debate, I have discussed this with the Hon. Minister of Commerce, Trade, Food and Shipping. He has fixed up a conference tomorrow morning. He says that, in case I finish early today, the Minister of Labour and Nationalised Services will follow ; and then, if he happens to be let off lightly, the Minister of Commerce will come as early as possible tomorrow.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

We do not propose to let off anybody lightly.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

රැස්වීම අ. භා. 4.30 වන තුරු තාව කාලිකව අත්හිටවනවා. නැවත පටන් ගන්න විට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 4.30ට නියෝජ්‍ය කථානායක නැන්දත් හිඟු ප්‍රනාන්දු මහතාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදි.

ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්
(சேர் அல்பேட் எப். பீரிஸ்)
(Sir Albert F. Peries)

ගරු සභාපතිතුමනි, තේ පානයට පෙර මා කථා කරමින් සිටියේ පේස කම්කාරයන්ගේ සම්බන්ධවයි. අපේ පේෂ කාර්මික ද්‍රව්‍ය ආණ්ඩුවට දීමට පමණක් නොව, පිටට විකිණීමටත් දැන් කාලය පැමිණ තිබෙනවා. ආණ්ඩුව ගැන අපි මෙපමණ කල් බලාගෙන සිටියා. අපි තව දුරටත් ආණ්ඩුව ගැන බලා පොරොත්තු වන අතර සෑමදාම ආණ්ඩුව ගැනම බලාපොරොත්තු වීම සුදුසු නැති නිසා අපේ රෙදිපිළි භාණ්ඩ පිටට විකිණීමටත් අපි සැරසිය යුතුයි. ඒ සම්බන්ධයෙන් සමුපකාර සංගම්වලට සැහෙන තරම් අමාරුකම් තිබෙනවා, විශේෂයෙන්ම ආණ්ඩුවේ තිබෙන 'රතු පටි ක්‍රමය' නිසා. ඒවායින් අපේ සංගම්—විශේෂයෙන්ම ලාභ තිබෙන සංගම්—සැහෙන තරම් දුර නිදහස් කළොත්, ඒ සංගම්වලට වුවමනා අයුරු කට යුතු කරන්නට ඉඩ දුන්නොත්, පේෂ කර්මාන්තය කවදාවත් මේ රටින් ඉවත් නොවන බව මට ගරු ඇමතිතුමාට කියන්න පුළුවනි. පේෂ කර්මාන්තය දවසින් දවසම දියුණු වී දැන් බොහෝ දෙනෙක් ඉන් බොහෝ ප්‍රයෝජන ගන්නවා. ඒ නිසාම ගම්බද ආර්ථික තත්ත්වයද තරමක් දුරට දියුණු වන බව මට කියන්න පුළුවනි. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමා අපේ සංගමය පිළිබඳව නම් දැන් මේ රතු පටි හුඟක් ගළවා දමා තිබෙනවා. ඒ නිසා දැන් ඊළඟ පියවරයි, අපට ගැනීමට තිබෙන්නේ. ඒ රතු පටි තව ටිකක් බුරුල් කරගෙන යනවා නම් තමයි, අපට නියම අන්දමට මේ කටයුතු කරගෙන යන්නට පුළුවන් වන්නේ. ඇමතිතුමා අපට කියා තිබෙනවා වේයන්ගොඩ නූල් කටින මෝලෙන් වුවමනා තරම් නූල් අපට දෙන වාය කියා. එසේ කළොත් අපට ඇති ප්‍රශ්න රාශියක්ම විසඳා ගන්නට පුළුවන් වෙනවා. ඒ නිසා ඒ ගැන මම මීට වැඩි යමක් කියන්නේ නැහැ.

සමාජ සේවා දෙපාර්තමේන්තුව ගැනත් වචනයක් දෙකක් කිය යුතුව තිබෙනවා. මගේ කොට්ඨාශයේ බොහොම දෙනෙක් ඉන්නවා ඒ දෙපාර්තමේන්තුවෙන් මාස් පතා සහනාධාරයක පඩි ලබන උදවිය. සමහරුන්ගේ නම් අද ලැයිස්තුවලට ඇතුළත් වී ඇතත් පඩි ලැබෙන්නේ නැහැ. සමහර විට ඒ සම්බන්ධයෙන් වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණයත් මදි ඇති. එම නිසා, කෙසේ හෝ ඒ සඳහා තවත් මුදල් වෙන් කොට ඒ උදවියටත් මුදල් ලබා දෙන මෙන් මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම අනාථ දරුවන් නඩත්තු කරන අනාථ නිවාස තිබෙනවා. මෙතෙක් කාලයක් ඒවා බොහොම හොඳට පවත්වාගෙන ආවා. සමාජ සේවා වැඩවලට කැමති අය ඒවාට ආධාර දීගෙන ආවා. නමුත් අද දවසේ නොයෙකුත් අන්දමේ බදු බර ඔවුන්ගේ කර පිට වැටී තිබෙන නිසා, ඒවායේ නඩත්තුවට ඔවුන්ගෙන් ලැබුණු ආධාර අඩුවෙලා තියෙනවා. මුලදී බොහොම ආශාවෙන් දුන්නු ආධාර පවා ලබා ගැනීම දැන් ඉතා අමාරු වී තිබෙනවා. එවැන්නන් ළඟට ආධාර ඉල්ලන්නට ගිය විට කියන්නේ බදු බර පැට වී තිබෙන නිසා ඉස්සරවාගේ ආධාර කරන්න බැරි බවයි. එම නිසා එවැනි අනාථ නිවාසවලට ලැබෙන ග්‍රාන්ට් මුදල් වැඩි කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. දැනට එක ළමයකු සඳහා රුපියල් 25ක මුදලක් ගෙවන බව පෙනෙනවා. නමුත් ඒ මුදල ප්‍රමාණවත් නොවන බවයි, කියන්න තිබෙන්නෙ.

ගරු සභාපතිතුමනි, සුරා බදු දෙපාර්තමේන්තුව ගැන බොහෝ දෙනා කථා කරනවා. අරක්කු බෝතලයක මිල රුපියල් දෙකකින් අඩු කිරීම උඩ අද කසිප්පු ව්‍යාපාරය තරමක් දුරට අඩුවී තිබෙන බවයි පෙනෙන්නෙ. තවත් සැහෙන ප්‍රමාණයකින් අරක්කු මිල අඩු කළොත් එය කසිප්පු ව්‍යාපාරය නැති කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවෙන් එක්තරා විධියක සේවයක් කළා වෙනවා. එසේ කිරීම නිසා ආණ්ඩුවට ආදායම අඩු වෙනවාය කියා සිතන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස්]

බැහැ. අරක්කු මිල අඩු වන විට වැඩි වැඩියෙන් අරක්කු විකිණෙනවා. එම නිසා විශාල ප්‍රමාණයක් මුදල් උපදිනවා.

මගේ ආසනයේ ඩී.ආර්.ඕ. කන්තෝරුව ගැන වචනයක් කියන්න ඕනෑ. එම කන්තෝරුව බොහොම අබලන් තත්ත්වයකයි තිබෙන්නෙ. මේ මෑතදී මා එහි ගිය අවස්ථාවක එම ගොඩනැගිල්ල මගේ ඔළුවට කඩා වැටේද කියා මට භය හිතුණා. එම නිසා මගේ ආසනයේ ඩී.ආර්.ඕ. කන්තෝරුව සඳහා අලුත් ගොඩනැගිල්ලක් සෑදීම ගැන කල්පනාව යොමු කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලමින් මගේ වචන සවලපය අවසාන කරනවා.

ටී. විලියම් ප්‍රනාන්දු මයා. (නුවරඑළිය)
(திரு. ரீ. வில்லியம் பெர்ணாண்டோ—நுவரெலிய)
(Mr. T. William Fernando—Nuwara Eliya)

ගරු සභාපතිතුමනි, මේ ඉදිරිපත් කර තිබෙන වැය ශීර්ෂය උඩ වචන සවලපයක් කථා කරන්ට මාද අදහස් කරනවා. මේ සාකච්ඡා කරගෙන යන්නේ අප විසින් ඉතා දුකසේ උපයා ගන්න මුදලින් රුපියල් 15,54,93,867 ක මුදලක් වෙන් කර ගැනීමටයි. එම නිසා මේ ඉතා දුකසේ උපයා ගන්න මුදල නිසියාකාරයෙන් ප්‍රයෝජනයට ගෙන සංවර්ධනය කරා ගමන් කරන්න කල්පනා කළොත් ඒ මගින් රටේ ජනතාවට විශාල සැනසීමක් ලැබෙනවා ඇති. විශෙෂයෙන් මේ අමාත්‍යාංශය මගින් කරගෙන යන වැඩ කටයුතු සාර්ථක ලෙස කරගෙන ගියොත් ඒ මගින් රටේ අනාගතය සෞභාග්‍ය සම්පන්න වෙනවා ඇති. කෘෂිකර්ම අමාත්‍යාංශයත් මේ වාගේම සැලකිය යුතු තැනක් ගන්න අමාත්‍යාංශයක්. එහි කටයුතුද නිසියාකාරයෙන් කරගෙන යනවා නම් ගොවි තැන දියුණු වී, අස්වැන්න වැඩි වී, රට ස්වයංපෝෂිත වෙනවා ඇති. වෙනත් අමාත්‍යාංශ නොයෙකුත් අන්දමින් සේවය කළත් රටේ ප්‍රගතිය ඇති කිරීම සඳහා විශාල මෙහෙයක් සිදු කරන්නේ මා නම් කරන ලද අමාත්‍යාංශ දෙකයි. එම නිසා මේ වැඩ කටයුතු කෙරෙහි නිලධාරීන්ගේ සානුකම්පාව යොමු විය යුතුව තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ වර්ෂයේ අප මුදල් උපයා ගත්තේ කුමන ආකාරයටද යන්න මහජන ආන්දෝලනය අනුව අපට පේනවා. නිලධාරීන්ටද ඒ බව වැටහෙනවා ඇති. ධනවතාගෙන් පටන් ගෙන අසරණ ගොවි කම්කරුවා දක්වාම සිටින සෑම කෙනකුත් විසින්ම රජයට උපකාර කරන බව පේනවා. අවසාන වශයෙන් කියනවා නම් හිඟන්නා හිඟමනේ ගොස් ලබා ගන්න මුදලෙන් රටේ සංවර්ධනය සඳහා කොටසක් වැය වෙනවා. පාන් පෙත්තක් කෑ තේ කෝප්පයක් බී ජීවත් වන හිඟන්නා ගෙනුත් යම් මුදල් කොටසක් රජයට ලැබෙනවා. ඒ තරම් මහන්සියෙන් උපයා ගත්, ඉතාමත් දුෂ්කර මධ්‍යයේ ලබාගත්, මෙම මුදල නියම විධියට, අලුක්කාලක්වත් අපතේ නොයන විධියට, රටේ ඉදිරි ගමනේත් ජාතික සංවර්ධනයේත් අවශ්‍යතාවන් සඳහාම උපයෝගී කරගෙන සුරක්ෂිතව වැඩ කරන්නේ නම්, මහජන අනුකම්පාව අප කෙරෙහි ඇති වේවි; නැතහොත් මහජනයාට අප පිළිකුල් වේවි. එම නිසා දෙපාර්තමේන්තුවල සිටින නිලධාරීන්, අපි වැටුප් ලබන්නේ මේ අන්දමින් ලබාගත් මුදලින්ය, අපි යැපෙන්නේ ඒ මුදල් නිසාය කියා සිතාගෙන, තමන් කරන සේවය අවංකව, රටේත් ජාතියේත් පොදු යහපත තකාම ඉටු කළ යුතුයි. එසේ නැතිව තමන්ගේ රක්ෂාව වැටුපට පමණක් සීමා කරගෙන වැඩ කරන්නේ නම්, මහජන මුදලින් යැපෙන ඒ නිලධාරීන් තම රාජකාරි කාලය අපතේ හරිනවා නම්, ඔවුන්ට පමණක් නොව තම දරුවන්ටත් පවා අනාගතයේදී ඒ පව් විඳීමට සිදු වේවි. ඒ විධියෙන් අය කර ගන්න අයබදු මුදල්වලින් තමයි, අද මේ සංවර්ධන වැඩ කටයුතු කරන්නේ. එම නිසා අප සියලුදෙනාම උත්සාහවන්තව කටයුතු කළොත් තමයි, මහජනයා ඉදිරියේ අප බලාපොරොත්තු වන සැනසීම අපට ලබා ගන්න පුළුවන් වන්නේ.

දැන් පැමිණ තිබෙන්නේ කර්මාන්ත අතින් රට ඉදිරියට ගමන් කරවිය යුතු කාලයක්. රැකීරක්ෂා ප්‍රශ්නය ගැන බලන විට, අඩු ගණනේ පාන් පෙත්තවත් බනිස් ගෙඩියවත් කෑමට මුදලක් සොයා ගන්න බැරි රැකීරක්ෂා නැති දහස් ගණනක් අද සිටින බව පෙනෙනවා. රැකීරක්ෂා සුලභ කිරීම එක එල්ලේ කළ හැක්කේ මෙම කර්මාන්ත අමාත්‍යාංශය මගිනුයි. නියම විධියට මෙම අමාත්‍යාංශය මගින් වැඩ කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙන ගියොත් රැකීරක්ෂා නැති බොහෝ දෙනකුට රැකියාවල් දෙන්න පුළුවන්කම ලැබෙනවා.

ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළ යුතු දෙපාර්තමේන්තු 21ක් තිබෙනවා. එතුරු මෑද පළාතේ විසි මහා යෝධයන් පිරිවරාගෙන සිටින තමුන්නාන්සේ නියම අන්දමින් මේ කටයුත්ත කළොත් තමුන්නාන්සේට එදා සිටි ඒ විරෝදාර නරවරයකු මෙන් වැජඹෙන්න පුළුවනි. එම නිසා තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවල සිටින නිලධාරීන්ගෙනුත් සියලුම සේවකයන්ගෙනුත් ඉල්ලා සිටිය යුතු කරුණක් ගැන තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න කැමතියි. එනම් අනන්ත ලෙස අතිකාල වැටුප් ලබා නොගත යුතු බවයි. එවැනි වැඩ පිළිවෙළක් කොයිම අමාත්‍යාංශයක හෝ තිබේ නම් වහාම එය නැවැත්විය යුතුයි. අතිකාල වැටුප් දීමට වුවමනාවක් නැහැ. අද රැකීරක්ෂා නැති ලක්ෂ සංඛ්‍යාත ජනකායක් රටේ සිටින නිසා අතිකාල වැටුප්, සේවයෙහි සිටින නිලධාරීන්ට සහ සේවකයන්ට නොගෙවා තාවකාලිකව හෝ රැකීරක්ෂා නොමැතියන්ට ඒ වැඩ පවරන්න පුළුවනි. එම නිසා කම්කරුවාගේ සිට ලිපිකරුවා දක්වාද, ලිපිකරුවාගේ සිට ඊටත් වඩා උසස් නිලධාරියා දක්වාද, යම් කිසි කෙනෙකු අතිකාල වැටුප් ලබන්නේ නම්, අතිකාල වැටුප් සඳහා මේ දෙපාර්තමේන්තු 20 තුළ වැඩ තිබේ නම්, වහාම ඒ අතිකාල වැඩ නවත්වා රැකීරක්ෂා නැති අර අසරණයන්ට තාවකාලිකව හෝ එම වැඩ ලබාදෙන්නය කියා මම ඉල්ලා සිටිනවා. මෙම අමාත්‍යාංශය පමණක් නොව, එසේ වැඩ කරන සෑම අමාත්‍යාංශයකම මේ ක්‍රමය ක්‍රියාත්මක කරන ලෙස මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

අපේ ගරු ඇමතිතුමා කර්මාන්ත සම්බන්ධව විශාල උනන්දුවක් දක්වනවා. එතුමා ඒ වෙනුවෙන් එදත් උනන්දුවෙන් කටයුතු කළා. අදත් එලෙසම කටයුතු කරගෙන යනවා. නමුත් මේ තරම් විශාල දෙපාර්තමේන්තු රාශියක් සම්බන්ධ කරගෙන වැඩ කටයුතු කිරීමේදී එය කරන්න පුළුවන් වූයේ සමහර විට එතුමා අවිවාහක යකු නිසා වෙන්න පුළුවන්. එතුමා විවාහක යකු වූවා නම්, තමන්ගේ භාර්‍යාවගෙන් සහ දරුවන්ගෙන් නොයෙකුත් කරදර ඇති වන නිසා, ඒ විධියට වැඩ කරන්න බැහැ. එතුමාට ලැබී තිබෙන වරප්‍රසාදය නම් එතුමා අවිවාහකයකු වීමයි. එම නිසා විසි මහා යෝධයින්ගෙන් කෙනකු වාගේ නියම විධියට රට සංවර්ධනය කිරීමට ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

කර්මාන්ත සම්බන්ධයෙන් කල්පනා කර බලන විට, අද උක් දඬු කපා ඉවත් කරනවා. ඒ උක් දඬු පමණක් නොව උක් දඬුවල කොළ පවා අපතේ හරිනවා. කපා ඉවත දමන උක් කොළ නාස්ති වන්නට ඉඩ නොදී හාඩ්බෝඩ් වැනි දේ සෑදීමට පාවිච්චි කරන්න පුළුවනි.

අ. භා. 4.45

මගේ ප්‍රදේශයේ වර්ණවත් පස් තිබෙනවා. බණිජ වස්තු පරීක්ෂණයේ යෙදෙන නිලධාරීන් ඉන්නවා නම් ඒ අය ලවා මේ පස් පරීක්ෂා කරවන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් මාත් නොයෙක් තොරතුරු එකතු කරගෙන තිබෙනවා. නුවරඑළියේ අලංකාර මැටි වර්ග තිබෙන බව තමුන්නාන්සේ නොයෙක් විට අසා ඇති. කළු, සුදු, කහ ආදී වර්ණයන්ගෙන් යුත් මැටි වර්ග එහි තිබෙනවා. ඒ කිරිමැටි දෙස නෙත් යොමු කර මැටි කර්මාන්තය අතින් උසස් දියුණුවක් ලබා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් හොඳයි. කතර ගම එක්තරා කන්දක හොඳ පස් වර්ග යක් තිබෙනවා. ඒ පස්වලින් "චෝක් පවුඩර්" හදන්න පුළුවන්ය කියනවා. ලෝකයේ වෙනත් බොහෝ රටවලට ලැබී නැති වටිනා වස්තු අපට අපේ පොළොවෙන් ලබා ගතහැකි බව කල්පනා කර එයින් ප්‍රයෝජන ගන්න ඒත්සාහ කළ යුතු බව මතක් කරන්න කැමතියි. අපේ සමුද්‍රය වටා ස්වර්ණ වර්ණයද ඇතුළු පංච වර්ණයෙන් යුත් වැලි තිබෙනවා. විද්‍යාඥයින් ලවා ඒවා පරීක්ෂා කරවා අපට ප්‍රයෝජන ගන්න පුළුවන් ආකාරයට යොදාගන්නවා නම් හොඳයි. වැසි තිබෙන බණිජ වස්තු එසේම තිබෙන්නට නෑර සොයාගෙන අපේ දියුණුවට උපයෝගි කර ගන්නා ලෙස ගෞරවයෙන් ඉල්ලන්න කැමතියි. අධිරාජ්‍යවාදීන් අප පාලනය කළ කාලයේ මේවා ගැන නොසලකා සිටියේ, ඇලිමැලි ගතියක් දැක්වූයේ, ඔවුන්ගේ රටවලින් අමුද්‍රව්‍ය ගෙන සාදන දේ අපට විකිණීමේ අදහසිනුයි. ලංකාවේ තිබෙන බණිජ වස්තු සොයාගෙන දැන්වත් අපේ ප්‍රයෝජනයට යොදන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

ශිෂ්‍යත්ව දී අපි අපේ දරුවන් පිටරට වලට යවනවා. නමුත් ඒ අය මේතාක් කල් අපේ රටේ තිබී සොයා ගෙන තිබෙන්නෙ මිනිරන් පමණයි. පස් පරීක්ෂා කර බිලා වෙනත් දේ සොයා ගැනීමට අපේ ඛණිජ වස්තු පර්යේෂණ අංශයේ නිලධාරීන් උනන්දු කරවන්න ඕනෑ.

බන්ධනාගාරවල සිර මැදිරිවල නතර කර ඉන්න සිරකරුවන්ගෙන් රටේ සංවර්ධනය සඳහා යම් සේවයක් ලබා ගන්නවා නම් කොයි තරම් හොඳද? ඒ සඳහා තාවකාලික වශයෙන් හෝ යම් වැඩ පිළිවෙලක් සකස් කරන්න ඕනෑ. ජාතිය වෙනුවෙන් ඒ අයගෙන් ගතහැකි යමක් වෙතොත් එය ලබා ගන්නා මෙන් ඉල්ලා සිටිනවා. එසේ නැත්නම් සිරමැදිරි තුළ හෝ යම් වැඩ පිළිවෙලක් ඇති කළොත් මේ රටේ ධනසම්භාරය වැඩි කර ගන්න පුළුවනි.

පුවක් ලෙල්ල අහක දමන නමුත් එයිනුත් යම්කිසි ප්‍රයෝජනයක් ගන්න පුළුවන්ය කියා මා කල්පනා කරනවා. පොල් ලෙල්ලෙන් කොයි තරම් ප්‍රයෝජන ගන්නවාද? එසේම පුවක් ලෙල්ලෙනුත් යම් කිසි ප්‍රයෝජනවත් වැඩක් ගන්නට බැරිද කියා සොයා බැලිය යුතුයි. පුවක් ලෙල්ලේ යම්කිසි සිල්ක් වර්ගයක් තිබෙනවාලු. ඒ ගැන සිත් යොමු කරන්න කැමතියි.

රාජ්‍ය ලේඛනාගාරය තිබෙන්නේ මා නියෝජනය කරන නුවර එළිය කොට්ඨාශයේ නිසා දැන් ඒ ගැනත් යමක් නොකිව්වොත් එය ලොකු අඩුපාඩුවක් හැටියට මා කල්පනා කරන නිසා ඒ ගැනත් යමක් කියන්න කැමතියි. අපේ ජාතියේ ඉතිහාසය ගැන අපට කියා දෙන කෙන්ද්‍රයක් වැනි රාජ්‍ය ලේඛනාගාරයේ තිබෙන්නේ ජාතික වස්තු හැටියට ගතහැකි වටිනා දේවල් බව කියන්න ඕනෑ. ඒවා අන්ධකාරයෙන් වැසී සැලකිල්ලක් නැතිව තිබුණත් පසු කාලයකදී අපේ අතීතය කියා පාන වැදගත් වස්තුවක් හැටියට අපි සලකන්න ඕනෑ. එහි තැන්පත් කර තිබෙන වටිනා ලිපි ලේඛනාදිය ක්‍රමවත් ලෙස සකස් නොකර තිබීමෙන් විනාශ වී යන්නට ඉඩ තිබෙන බව කියන්නේ බලවත් සංවේගයකිනුයි. ලංකාවද යුද බියෙන් මිරිකී සිටි කාලයේදීයි එහි තිබෙන්නාවූ වටිනා ලිපි ලේඛනාදිය ආරක්ෂා කර ගැනීමට රාජ්‍ය ලේඛනාගාරය නුවරඑළියට ගෙන ගියේ. තාවකාලික වශයෙන් මෙම ස්ථානයට මෙම ආයතනය ගෙන ගොසින් වායු සමනය කොට එම ලිපි ලේඛන ආරක්ෂා වන විධියට වැඩ කටයුතු සලස්වා තිබෙන නමුත්, එහි ඉඩ කඩ මදි කමේ ප්‍රශ්නය තදින් බලපාන නිසා පොත් පත් නියම පිළිවෙලට ආරක්ෂා වන්නේ නැහැ. ඉඩකඩ මදිකමේ ප්‍රශ්නය කෙතරම්ද කිවහොත් පොලිසිය අසළ කාමරයක තැන් පත් කර තිබෙන සමහර ලේඛන පෝරවලට විනා වෙන කිසිවකට ප්‍රයෝජන නැති තත්ත්වයකට පරිවර්තනය වී තිබෙන බව මට කියන්න සිදු වී තිබෙනවා.

අවුරුදු හත් අට සියක් පැරණි ලිපි ලේඛනාදිය සොයා ගැනීම පිණිස, සමහර අතීත තොරතුරු සොයා බැලීම පිණිස, රාජ්‍ය ලේඛනාගාරයට යා යුතුව තිබෙනවා. තම තමන්ගේ වත් පොහොසත්කම් පිළිබඳව ඕලන්ද යුගයේදී මෙන්ම පෘතුගිසි යුගයේදීද පිළියෙල කරනු ලැබූ තෝම්බු පවා සොයා ගෙන නඩුහබවලට මැදිහත් වී සිටින අය යන්නේ මෙම ස්ථානයටයි. ඒ නිසා මෙම ජාතික වස්තුව විනාශ වී යන්ට ඉඩ නොදී රැක ගැනීමට ආධාර ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් මෙහි අද පවත්නා තත්ත්වය පෙන්වා දීමට ගරු අගමැතිනිය මෙන්ම ගරු මුදල් ඇමතිතුමාද මෙම ස්ථානයට කැඳවාගෙන ගිය නමුත්, මෙහි තිබෙන්නාවූ අඩු පාඩුකම් පිරිමසා ගැනීමට මේ වර්ෂයේදීවත් සැහෙන මුදලක් වෙන් කර තිබෙනවාද කියා මම දන්නේ නැහැ. පසුගිය අවුරුදු හත් අට සීය තුළදී අප රටේ ඉතිහාසය ආදිය ලියැවුණු පොත් පත් අනාගත පරම්පරාවට ආරක්ෂා කර දීම පිණිස මෙම දෙපාර්තමේන්තුවට අවශ්‍යයෙන්ම වුව මනා කරන ගොඩනැගිලි ආදිය පුළුවන් තරම් ඉක්මනින් දිය යුතුයි.

මෙතන තැන්පත් කර තිබෙන්නා වූ ශාස්ත්‍රීය පොත් පත් ආදිය රෙපරේරු කිරීමට, ආරක්ෂා කිරීමට, සිටින අයට අද දින වැඩ කරන්න සිදු වී තිබෙන්නේ නොයෙක් දුෂ්කරතාවන් මධ්‍යයේයි. අවුරුදු හයසීය හත්සීය පැරණි පොත්වල පිටු දිරා ගිය විට අකුරක් හෝ විනාශ වන්න ඉඩ නොදී සිල්ක් වැනි ඉතාමත් සියුම් කඩදාසි වගයක් පාවිච්චි කොට ඒවා ආරක්ෂා කරන රාජ්‍ය ලේඛනාගාරයේ පාලකතුමාටත් අනෙක් නිලධාරී මහතුන්ටත් මගේ අවංක ස්තුතිය මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවස්ථාවේදී පුද කරනවා. මෙම සේවයේ යෙදී සිටින අය ඉතාමත්ම උද්‌යෝගිමත්ව ක්‍රියා කරමින් ජාතික වස්තුවක් රකින ජාති ප්‍රේමීන් බව මට නොපැකිලව කියන්න පුළුවන්. නමුත් ඉඩකඩ මදි කමිනුත් උපකරණ මදි කමිනුත් මේ අයට නොයෙක් දුෂ්කරතාවන්ට මුහුණ පාන්න සිදු වී තිබෙනවා. දිරා ගිය පොත්වල සමහර පිටු ආරක්ෂා කර ගැනීම පිණිස එම කඩදාසිය ඉතාමත්ම සියුම් අන්දමකින් පලා එහි මැදට සිල්ක් කඩදාසියක් ඉතාමත්ම සූක්ෂම අන්දමින් යොදා මේවා ආරක්ෂා කිරීමට වැඩ කරන සේවකයන්ට දෙනු ලබන්නේ ඉතාමත්ම අල්ප වූ වැටුපකි. කාර්යාල කාර්ය සහායකයන්ට නැත්නම් පණිවුඩ ගෙන යනු ලබන්නන්ට ගෙවන්නාවූ වැටුපට සමාන වූ වැටුපකුයි මේ අයට ගෙවන්නේ. දැන් පළ කර තිබෙන වැටුප් වාර්තාවේද රුපියල් 180 කින් පටන්ගෙන රුපියල් 270 දක්වා වැඩි වන පඩි ක්‍රමයකුයි, මේ අයට යෝජනා කර තිබෙන්නේ. මේ තරම් දක්ෂ රාජකාරියක යෙදී සිටින නිලධාරීන් පිරිසකට මෙවැනි පඩි ක්‍රමයක් යෝජනා කිරීමෙන් කර තිබෙන්නේ බලවත් අපරාධයක් බව මා කියන්න ඕනෑ.

දිනපතාම මේ රටේ පළවන්නා වූ පුවත් පත්වල ඉතාමත්ම කුඩාවූ සටහන් මෙක්‍රෝ fපිල්මිං යනුවෙන් හඳුන්වන ඉතාමත්ම සූක්ෂම ක්‍රමය අනුව මුද්‍රණය කොට සුරක්ෂිතව තැන්පත් කිරීමට වැඩ කරන දක්ෂ කැමරා ශිල්පියෙකුත් මෙහි වැඩ කරනවා. ප්‍රවෘත්ති පත්‍ර පිට පත්වල ඉතා කුඩා ඡායාරූප ගෙන ඒවා තැන්පත් කර තිබෙනවා. දියුණු රටවල නම් මෙවැනි ඡායාරූප ආරක්ෂා කර තබන්නේ පොළොව යටයි. නමුත් අපේ රටේ සුරක්ෂිත භාවය ගැන ඒ තරම් සැලකිල්ලක් දක්වන්නේ නැති ව වාතාවරණයට අසුවන සේ තැන්පත් කර තිබෙනවා. ඒ දක්ෂ ශිල්පීන්ගේ තත්ත්වය උසස් කළ යුතු බව බණ්ඩාරනායක ශ්‍රීමතා පවා පිළිගත්තේ වී නමුත් අද දක්වාම කනගාටුදායක තත්ත්වයක ජීවත් වන්ට ඔවුන්ට සිදු වී තිබෙනවා. ඒ ගැන අවධානය යොමු කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, පොත් බැඳීම පිළිබඳව පුහුණු වීම සඳහා වෙනත් දෙපාර්තමේන්තුවලින් මේ ස්ථානයට සේවකයන් යවනවා. වෙනත් දෙපාර්තමේන්තුවලින් යන සේවකයන් පුහුණුව ලබා ආපසු පැමිණි විට ඔවුන්ගේ වැටුප් වැඩි වෙනවා. ශෝලයන්ගේ වැටුප් වැඩි වෙතත් ගුරුවරුන් ඊට අඩු වැටුපක් ලබන බව කන ගාටුවෙන් මතක් කිරීමට සිදු වී තිබෙනවා. එහෙයින් යුක්තිය විසඳන්නැයි මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

කිවයුතු තවත් කාරණයක් තිබෙනවා. මේ කාර්යාලය තිබෙන්නේ කුලී ගොඩනැඟිල්ලකයි. මාසයකට රුපියල් 600 ගණනේ අවුරුද්දකට රුපියල් 7,200 ක කුලියක් වැටෙන ගොඩනැඟිල්ලක් මේ සඳහා ලබාගෙන ඇති අතර, දැනට අවුරුදු 18 ක් එම ගොඩනැඟිල්ලට කුලී ගෙවූ බව පේනවා. 1960 සැප්තැම්බර් මාසයේ නිකුත් වූ 1959 පරිපාලන වාර්තාව අනුව මේ ආයතනය පවත්වාගෙන යෑම පිළිබඳ ප්‍රශ්නය එදා සිටම ආණ්ඩුවේ උද්‌යෝගිමත් සැලකිල්ලට භාජන වෙමින් පවත්නා බවත්, මෙය නුවරඑළියේ පවත්වාගෙන යාම සඳහා අවුරුද්දකට රුපියල් 18,000ක පමණ අතිරේක වැයක් සිදු වන බවත්, පෙනී යනවා. අමතර දීමනා සඳහා රුපියල් 18,000ක් වැය වෙනවාලු. 1943 සිට ගණන් බැලූ විට මේ අතිරේක මුදල රුපියල් 3,24,000 ක් වෙලා තිබෙනවා. නියම සැලැස්මක් අනුව කටයුතු කරගෙන ආවා නම්, වෙනත් රටවල රාජ්‍ය ලේඛනාගාර පවත්වාගෙන යන ආකාරයට ගින්නෙන් ආරක්ෂා වීම, කෘමීන්ගෙන් ආරක්ෂා වීම, ශීත වායුවෙන් ආරක්ෂා වීම, ආදී වශයෙන් නොයෙකුත් විනාශයන්ගෙන් ආරක්ෂා වීම සඳහා නියම විධියේ සැලැස්මක් ඇතිව නියම විධියේ ගොඩනැඟිල්ලක් ඇතිව මෙම ලේඛනාගාරය පවත්වාගෙන ආවා නම්, මේ රුපියල් 3,24,000 මුදල නිස්කාරණයේ අපතේ යන්නේ නැහැ. එහෙයින් ජාතික වස්තුවක් වූ මෙය විනාශ වීමට ඉඩ නොදී ආරක්ෂා කරුගනීම සඳහා සුදුසු විධිවිධාන යෙදේවායි ප්‍රාර්ථනය කරනවා.

ගරු සභාපතිතුමනි, සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා රුපියල් 33,87,335 ක් වැය වූ බව කියා තිබෙනවා. මගේ කල්පනාවේ හැටියට නම් මේ මුදල වියදම් කිරීමෙන් සිදු වූයේ සුරා මර්දනයක් නොව වර්ධනයකුයි. මේසා විශාල මුදලක් සුරා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

බදු දෙපාර්තමේන්තුව වෙනුවෙන් වියදම් කර ඇති නමුත් දැන් රටපුරා කසිප්පුව වර්ධනය වී තිබෙනවා. සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කසිප්පු, රා, ආදිය වර්ධනය කිරීම සඳහා ආධාර වී තිබෙන නිසයි, මේ විධියේ ප්‍රතිඵල ලැබී ඇත්තේ. කසිප්පු පෙරන්නන් සොයා මේ විශාල මුදල බෙදා දුන්නා නම් ඔවුන් කසිප්පු ජාවාරම අතහැර වෙනත් මොකක් හෝ කර්මාන්තයක් කොට දිවි රැකගන්නවා නොඅනුමානයි. ඔවුන් කසිප්පු පෙරන්නේ ජීවිකාව සඳහායි. සුරාබදු දෙපාර්තමේන්තුවට මේ තරම් මුදලක් වියදම් කිරීම අපරාධයක්. රැකීරක්ෂාවක් නැතිව කසිප්පු ආදිය පෙරණ උදවිය සොයා ඒ අයට එම මුදල බෙදා දුන්නා නම් ඔවුන් එම මුදල යොදා මොකක් හෝ කර්මාන්තයක් කොට තම අඹුදරුවන් පෝෂණය කරනවා ඇති. ඒ වගේම කසිප්පු පෙරීම අතහැර දමනවා ඇති.

අ. භා. 5

කසිප්පු ගැන මේ විධියට කථා කරන කොට මගේ පපුව කිටි කිටි ගානවා, අර පැත්තටත්—එක්සත් ජාතික පක්ෂයේ පැත්තටත්— වචනයක් නොකියා අත් හැරියොත් හොඳ නැහැ කියා. මාර්තු මැතිවරණ කාලයේදී මේ කසිපප්පු ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම ගෙනිච්චේ එක්සත් ජාතික පක්ෂයයි. බත්ගොට්ටයි, කසිප්පු බෝතලයි දීලයි, මැතිවරණ සටන ගෙනිච්චේ. ජූලි මැතිවරණයේදී ඒක තව දියුණු තියුණු කර රට සෑම තැනම ව්‍යාප්ත කළා කසිප්පු බෝතලය, බෝතලය දීපන්, බත් ගොට්ට ගොට්ට දීපන්, කසිප්පු එක ගහලා බත් ගොට්ට කලා අලියට කෙළින් කතිර ගහන්න කියාපන්, යන සැලැස්මක් උඩ එක්සත් ජාතික පක්ෂයේ අය කසිප්පු ව්‍යාපාරය ලංකාවේ සෑම තැනම ව්‍යාප්ත කළ බව මේ අවස්ථාවේදී මා කියන්න ඕනෑ. කසිප්පු ගැන කථා කරන විට ඊට වගකිව යුත්තේ එක්සත් ජාතික පක්ෂය බව අපි මතක් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, උඩරට ගැමි පුණරුත්ථාපන ක්‍රමය සඳහා රුපියල් 30 ලක්ෂයක මුදලක් මෙහි වෙන් කර තිබෙනවා. උඩරට ගම් අද සහමුලින්ම විනාශ මුඛයට පත් වී තිබෙනවා. උඩරට දුප්පත් ගැමි ජනතාවට විඳින්න සිදු වී තිබෙන දුක් හිරිහැර ගැන මේ අවස්ථාවේදී වචනයක් කියන්ටම ඕනෑ. ඒ අයට ඉන්න නිවාසයක් නැහැ; බොන්න වතුර ටිකක් නැහැ. ඒ උඩරට ප්‍රදේශයෙන් විශාල කොටසක් අදත් අසිතිව තිබෙන්නේ යුරෝපීය වතු සමාගම්වලටයි. ඒවා එක වරම උදුරා ගන්න යයි මම කියන්නේ නැහැ. කෙසේ හෝ ඒ උඩරට දුප්පත් ගැමි ජනතාවගේ නිවාස ප්‍රශ්නයත් ඉඩම් ප්‍රශ්නයත් අධ්‍යාපන ප්‍රශ්නයත් මාර්ග පහසුකම් පිළිබඳ ප්‍රශ්නයත් හරියාකාර විසඳීම සඳහා මේ මුදල් සතයක්වත් අපතේ නැර හරියාකාර වියදම් කරනවා නම් එයින් ඔවුන්ට විශාල සහනයක් බලාපොරොත්තු වන්න පුළුවන්. උඩරට ගැමි කොමිෂන් සභා වාර්තාවේ සඳහන් යෝජනා ඉතා උනන්දුවෙන් ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කරන ගරු උදලාගම මහත්මයාට මගේ අවංක ස්තුතිය පුද කරනවා. අද එතුමා තනිවම වලපනේ ආදි ප්‍රදේශවල නොයෙකුත් වැඩ කටයුතු කර ගෙන යනවා. එතුමාට සහාය වීමට අවශ්‍ය නිලධාරීන් දීමෙන් ඒ ගැමි කොමිෂන් සභා වාර්තාවේ සඳහන් යෝජනා ක්‍රියාත්මක කර පරිහානියට පත් වී සිටින උඩරට දුප්පත් ගැමි ජනතාව ආරක්ෂා කරගන්න ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, නුවරඑළිය ප්‍රදේශයේ තිබෙන එකම කර්මාන්ත ශාලාව බීර පෙරන කර්මාන්ත ශාලාවයි. ලංකාවේ පමණක් නොව, ලෝකයේ වෙනත් තැන්වලත් ලංකාවේ උස් ප්‍රදේශයක නිෂ්පාදනය කරන මේ බීර ගැන පැහැදීමක් තිබෙනවා. එම නිසා නුවරඑළියේ බීර ලෝකයේ වෙනත් රටවලටත් යවා මුදල් උපයා ගන්න පුළුවන්. නමුත් අද ඒ බීර කර්මාන්ත ශාලාව තිබෙන්නේ කනගාටුදායක තත්ත්වයකයි. ඒ කාරණය මෙතැන කීම වැරැද්දක්ද මම දන්නේ නැහැ. නමුත් කියන්න ඕනෑ. නුවරඑළියේ බීර නිෂ්පාදනය කරන විට අරක්කු මිල අඩු කළා. අරක්කු මිල අඩු කළ විට බීර වීදුරුවක් ගහන මනුෂ්‍යයා ඒ බීර බීම සම්පූර්ණයෙන්ම නවත්වා අරක්කු බොන්න පුරුදු වුණා. ඒ නිසා බීර පෙරීම බොහෝ දුරට අඩු වී තිබෙනවා. මේ බීර නිෂ්පාදනය කරන සමාගම නගර සභාවට අවුරුද්දකට රුපියල් 41,000 ටත් 45,000 ටත් අතර ගණනක් ජල බද්ද වශයෙන් පමණක් ගෙවනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ස්ටැන්ලි තිලකරත්න මයා. (කෝට්ටේ)
(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)
(Mr. Stanley Tillekeratne—Kotte)
ඒ බීරවල වැඩිපුර තිබෙන්නෙ වතුරයි.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

නගර සභාවට එයින් විශාල ආදායමක් ලැබෙනවා. බීරවලින් බද්දක් ගැනීමත් අරක්කු මිල අඩු කිරීමත් නිසා අද බීර නිෂ්පාදනය බොහෝ දුරට අඩු වී තිබෙනවා. එම නිසා එතැනින් කම්කරුවන් විශාල ගණනක් අස් කිරීමට වැඩ පිළිවෙළ යොදා ගෙන යනවා. දරුවන් සිටින අසරණ දෙමාපියන්ට රක්ෂා නැති වුණොත් එය තවත් භයානක ප්‍රශ්නයක්. එක් අතකින් මෙය දියුණු කිරීමෙන් විශාල ආදායමක් ලබා ගත හැකි අතර අනික් අතින් කසිප්පු උවදුර නැති කර දැමීමට බීර සුලභ කිරීම හොඳයයි සමහරු කියනවා. බීර බීම හොඳ යයි මා කියන්නෙ නැහැ. මම නම් බීර බොන්නෙ නැහැ. මේ රටේ කෙසේ වෙතත් පිටරට යවා හෝ ඒවා විකුණා ගන්නට පුළුවන්කමක් තිබෙනවා. ලංකාවේ දේ අගේ කොට වැඩි දෙනකු ගන්නවා. ඇති. අප පදිංචිව සිටින ස්ථානයේ සිට හැපැප්ම 1 1/4 ක් පමණ ඇතින් ඇති උල්පතක ජලය රැගෙන පෙරා ගන්න බීර තමයි, මේ තරම් රසවත්ය කියන්නේ. මෙම කර්මාන්තය දියුණු කරන්නටය කියා මා මීට පෙරත් මේ ගරු සභාවේදී ඉල්ලා සිටියා. පළමුවෙන් ලාංකිකයන් කීප දෙනකු විසින් මෙම කර්මාන්තය ආරම්භ කරන ලද්දේ ඉතා සුළුවෙනුයි. අද එය විශාල දියුණුවකට පත්ව තිබෙනවා. එහෙත් දැන් එය මේ අන්දමින් විනාශ මුඛයට පත් වන්නට යනවා. මීට වඩා විශාල බීර කර්මාන්ත ශාලාවක් ඇති කර බීර පිටරට යැවීමට කට යුතු සලස්වන මෙන් මා මීට කලිනුත් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටියා. රජය මගින් හෝ මේ රටේ සිටින විශාල ධනේශ්වරයින් කීප දෙනකු විසින් හෝ මෙවැනි කර්මාන්ත ශාලාවක් ඇති කරනවා නම් ඒ ජලයෙන් විශාල ප්‍රයෝජනයක් ලබා ගන්නට පුළුවන්කම තිබෙනවා. බංකොලොත් වෙන්නෙ නැහැ. ලුණු කර්මාන්ත සංයුක්ත මණ්ඩලයෙන් සිදු වන පාඩු ගැන දැන් කිය වුණා. ඒ විධියේ අසාධාරණයක් මෙයින් සිදු වන්නේ නැහැ. කෙලින්ම විශාල ධනයක් මෙරටට අද්දවා ගන්නට පුළුවනි. මේ විධියට බීර කර්මාන්තයෙන් පාඩු සිදු වන්නට ගියොත්, මොන ක්‍රමයකින් හෝ ඔවුන් බලාපොරොත්තු වන්නේ ලාභයක් නිසා, දැනට ඒවා ප්‍රණීත විධියට සකස් කරන්නට ගන්න සංයෝග ද්‍රව්‍ය අඩු කර සාදන්න පුළුවනි. ඒ ද්‍රව්‍ය අඩු වන විට ඒවායේ රසයත් අඩු වන්නට පුළුවනි.

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)
නැහැ, නැහැ. සූර් එකත් අඩු වෙනවා.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

ඒ මෝල පිහිටුවා දැන් පණස් අවුරුද්දක් සම්පූර්ණ වීගෙන එනවා. ඒ පණස් අවුරුදු සංවත්සරය නිමිත්තෙන් ජුබිලි වේල් එකක් සාදන්නට අදහස් කර තිබෙනවා. ඒ ජුබිලි වේල් එකෙන් ගරු මන්ත්‍රීතුමාගේ ඔළුවත් කැරකෙන්නට ඉඩ තිබෙනවා. මා හිතන්නේ ඒවායේ හොඳ සූර් එකක් ඇති වෙයි.

සභාපතිතුමනි, පසුගිය දවස්වල ලංකාවේ පැමිණි ටැස්මේනියා පාර්ලිමේන්තුවේ සභානායකතුමාව මා ඒ ස්ථානයට එක් කර ගෙන ගියා. ජාඇළ ගරු මන්ත්‍රීතුමාත් (ජේ. ජී. පාරිස් පෙරේරා මයා.) අප කැටුව ගියා. එතුමා මේ සථානයේ දැන් නොසිටීම ගැන මා කනගාටු වෙනවා. ඇපල් සහ බීර ටැස්මේනියාවේ ජාතික නිෂ්පාදන භැටියට සලකන්නට පුළුවනි. මසුත් එසේ වන්නට පුළුවනි. මා කලින් කී ටැස්මේනියා පාර්ලිමේන්තුවේ සභානායකතුමා ලංකාවේ බීර ගැන එතුමාගේ සතුට ප්‍රකාශ කරමින් කියා සිටියා "අපේ රටෙන් ඇපල් ගෙන්වීමට තිබුණු ඉඩකඩත් නැතිව ගියා. අනික් ප්‍රධාන ජාතික වෙළඳාම වශයෙන් කරන බීරත් මෙහාට එවන්න විධියක් නැහැ. එම නිසා ලංකාව සමග තිබුණු වෙළඳ සම්බන්ධකම් හුගක් දුරට අඩු වුණා" කියා. ඇපල් වැවීමට තරම් සරු සාර බිම් නුවර එළියේ තිබෙනවා. මා හිතන්නේ එය කෘෂිකර්ම අංශයේ අවධානය යොමු විය යුතු කරුණක්. එම නිසා ජාත්‍යන්තර කුසලාන කීපයක් අත් කර ගෙන ජාත්‍යන්තර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

ගෞරවයක් ලැබූ බීර කර්මාන්තය ගැන කල්පනා කර බලා බීර වැඩි වශයෙන් නිපද වීමට සහයෝගය දක්වන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

ඇයි වැල වරකාවලිනුත් බීම පෙරන්න ඕනෑ.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

ඔව්. පළතුරුවලින් යම්කිසි යුෂ වර්ගයක් සකස් කර ගත්තාට වරදක් නැහැ. කපුටන් කොටා බීම ඇද හැලෙන වැල වරකා ආදියෙන් බීමට සුදුසු ප්‍රණීත පානයක් සකස් කර ගන්නවා නම් එය පුෂ්ටිමත් ආහාරයක් වන්නට පුළුවනි. වරකා පානය පමණක් නොවෙයි, අඹ දොඩම් වැනි පළතුරුවලින් යුෂ සකස් කර, මෙන්න සුමිහිරි පානේ කියා දෙන්න පුළුවනි. ඒ ගැනත් කල්පනාව යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. කෝට්ටේ අන්නාසි වගේම මගේ ප්‍රදේශයෙත් පෙයාර්ස් තිබෙනවා. ඉතාමත් සරු අන්දමින් නුවරඑළිය ප්‍රදේශයේ වැවෙන පෙයාර්ස් ටින්වල අසුරා, පලතුරු දුබල කාලයේදී ප්‍රයෝජනයට ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කරනවා නම්, කර්මාන්තයක් වශයෙන් ආරම්භ කිරීමට කල්පනා කරනවා නම්, ඇත්ත වශයෙන්ම එය ඉතාමත් ප්‍රයෝජනවත් පියවරක්යයි තමුන්නාන්සේට මතක් කර දෙන්න කැමතියි. එම නිසා පලතුරු සුලබව තිබෙන කාලයට ඒවා නාස්ති නොකර ටින්වල අසුරා ඒවාට නියමිත මිළක් ලබා දීමට කටයුතු සකස් කළොත් එයින් මෙම වගාවට විශාල රුකුලක් ලැබෙනවාට කිසිම අනුමානයක් නැති බව තමුන්නාන්සේට මතක් කර දෙන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, "කෝසස්" ක්‍රමයේ ආහාර සඳහා ප්‍රයෝජනයට ගන්න ග්‍රීන් පීස් මෙම පළාතේ ඉතාමත් සුලබ ලෙස වගා කරන්න පුළුවනි. ඒවා නියම අන්දමට වගා කර ටින්වල අසුරා ආරක්ෂා කර ආහාරය පිණිස ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් මේ සඳහා පිටරට ඇදී යන මුදල් මෙහිම රඳවාගන්න පුළුවනි. එම නිසා මේවා ගැන ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරනවා නම් හොඳයයි කියන්න පුළුවනි. මා කලින් බියර් සෑදීම ගැනත් කීවා. මේ හැම මාර්ගයකින්ම අපේ රටෙන් ඇදී යන විශාල මුදලක් මේ රටේ නතර කරගන්න පුළුවන් වෙනවා.

ගරු සභාපතිතුමනි, මෙතරම් විශාල මුදලක් අප මේ වර්ෂය සඳහා උපයෝගි කර ගත්තේ ඉතාමත් අමාරුවෙන් බව අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ලංකා ඉතිහාසයේ පළමුවන වරට උස් පහත් භේදයක් නැතිව සෑම තරාතිරමේ කෙනෙකුගේම සහයෝගය ඇතිව මේ වර අයවැය සකස් කර ගැනීමට අප ලැහැස්ති වී තිබෙනවා. අප රට වැසි සියලු දෙනාගේම අවසාන උත්සාහය මේ රටේ ජාතික සංවර්ධනය සඳහා යොමු කළ අවස්ථාවක් ලෙස මෙය හඳුන්වා දෙන්න පුළුවනි. ජාතික පරිහාණියක් ගැන නොයෙක් පැතිවලින් කීවත්, ඒ පරිහාණියට හේතුව ගැන කථා කිරීමට මේ අවස්ථාව නොවෙයි. මේ රටේ තිබුණු නොයෙක් විධියේ විපර්යාස නිසා ඇති වුණු ආර්ථික පරිහාණිය මේ අවස්ථාවේදී මකා දමා රටේ ජාතියේ ඉදිරිගමන සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් ගෙන යාම පරමාර්ථ කොටගෙන පොහොසතාගෙන් පමණක් නොව දුප්පතාගෙන්ද යම් යම් අපහසුකම් මධ්‍යයේ සහයෝගය බලා පොරොත්තු වී තිබෙනවා. එහෙත් මේ අන්දමින් ලබා ගන්න එක සත අළුත් කාලක්වත් ජාතියේ යහපත සඳහා වැය නොකොට අපතේ යැව්වොත් කවදාවත් මේ ජනතාවගෙන් කිසිම සමාවක් ලැබෙන්නේ නැහැ. කොටින්ම දෙවියන්ගෙන් පවා ඉඩක් ලැබෙන්නේ නැහැ. එම නිසා මේ සෑම වැඩ පිළිවෙළක්ම යථා පරිදි ක්‍රියාත්මක කිරීමට නම්, ලැබෙන මුදල් නිසි පරිදි වියදම් කිරීමට නම්, ඒ කටයුතුවල නිරතව සිටින නිලධාරීන් නියම විධියේ ජාතික අභිමානයෙන් යුතුව, දේශප්‍රේමී හැඟීමකින් යුතුව, මේ රට ස්වයංපෝෂිත කිරීමේ අධිෂ්ඨානයකින් යුතුව, තම යුතුකම් නොපිරිහෙළා ඉටු කරන්ට ඕනෑ. ඒ වාගේම මේ රටේ කම්කරු ජනතාවගේ සම්පූර්ණ සහයෝගය ලැබෙන අන්දමින් වැඩ කටයුතු කරන්න ඕනෑ. පංති භේදවලින් තොරව එකම ජාතියක් වශයෙන්, එකම ජනතාවක් වශයෙන්, අප නැඟී සිටින්ට ඕනෑ. ඒ වාගේම මේ රටේ ස්ත්‍රී පුරුෂ හැම දෙනාම මේ රට දියුණු කිරීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහා පෙරමුණ ගෙන කටයුතු කරන්ට ඕනෑ. බාල මහලු ආදි වෙනස්කම් නොතකා හැම කෙනෙක්ම එක වාගේම ජාතියේ ඉදිරි ගමන සඳහා පෙරමුණ ගන්ට ඕනෑ. එමෙන්ම අනාගතයේදී දියුණු ජාතීන් සමග අත්වැල් බැඳගන්න ඕනෑය කියන හැඟීමෙන් යුක්තව මේ අවස්ථාවේදී බල ලෝභයෙන් තොරව, පංති භේදයක් නැතිව, සියලු දෙනාම එකාකාරයෙන් නැඟී සිටීමට උත්සාහ ගන්න මෙන් ඉල්ලමින්, අතිකාල වැටුප් මීට පසුව කිසි කෙනකුට නොදී ඒ වෙනුවට රැකීරක්ෂා නැති අසරණ ජනතාවට රැකීරක්ෂා ලබා දෙන ලෙස ඉල්ලමින්, කිසිදු භේදයකින් තොරව මේ රටේ ඉදිරි ගමනට සෑම දෙනාගේම සහ යෝගය අවංකවම දෙන ලෙස ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය මෙයින් සමාප්ත කරනවා.

ඒ. යූ. රොමානිස් මයා. (දොඩන්ගස්ලන්ද)

(திரு. ஏ. யூ. ரொமானிஸ்—தொடங்கஸ்லந்தை)

(Mr. A. U. Romanis—Dodangaslanda)

ගරු සභාපතිතුමනි, නුවරඑළියේ ගරු මන්ත්‍රීවරයාගෙන් (ටී. විලියම් ප්‍රනාන්දු මයා.) ඉතාමත් රසවත් කථාවක් අපට අසන්ට ලැබුණා. එතුමාගේ කථාවට පසුව මට කථා කරන්න අවස්ථාවක් ලැබීම ගැන මම ඉතා සන්තෝෂ වෙනවා.

මෙම අමාත්‍යාංශය ගැන කල්පනා කරන විට, එය මහ පුදුම අමාත්‍යාංශයක්යයි මට හැඟී යනවා. ඒ මන්ද, එක් අතකින් සුරා වඩිනය කිරීම මෙන්ම අනික් අතින් සුරාව මර්දනය කිරීමද මේ අමාත්‍යාංශයට අයත්ව තිබෙන කටයුතු බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. මේ අමාත්‍යාංශය සම්බන්ධව කථාවට බැසීමට පෙර අපේ ඡන්ද කොට්ඨාශයේ කෙරීගෙන යන එක්තරා දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට පැමිණිල්ලක් කිරීමට තිබෙනවා. දැන් බොහෝ ගරු මන්ත්‍රීන් දූෂණය තුරන් කිරීම සම්බන්ධවයි කථා කළේ.

අ. භා. 5.15

ග්‍රාම සේවක නිලධාරීන් තෝරා ගැනීමේ වැඩ පිළිවෙලක් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ වැඩ පිළිවෙල අනුව දැනට සිටින ගම්මුලාදැනීන් ද ඔවුන්ගේ සුදුසුකම් අනුව මේ තනතුරුවලට පත් කිරීමට බලාපොරොත්තුවක් තිබෙනවා. [බාධා කිරීමක්.] නුසුදුසුකම් අනුව අයින් කරනවා නම් මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ. එකම මුලාදැනියකුවත් තබා ගන්න නොවෙයි, මා කියන්නේ. මේ පසු ගිය 29 වන දා අපේ ආදායම් පාලක නිලධාරී කාර්යාලයේ මුලාදැනීන් සම්බන්ධව තොරතුරු විමසීමේ විභාගයක් පැවැත්තුවා. ඒ අවස්ථාවේදී දියතිඩයංගම කියන ගමේ මුලාදැනියා අනික් මුලාදැනීන් සමග පැමිණ සිටියා. ඒ මුලාදැනියාගේ නම හමිඩ්. ඒ මහත්මයා දැන් පක්ෂයේ සාමාජිකයෙක් හැටියට ඉතා ලැදිකමකින් ඒ ප්‍රදේශයේ කටයුතු කරනවා.

ගරු මන්ත්‍රීවරයෙක්

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

මොන පක්ෂයේද?

රොමානිස් මයා.

(திரு. ரொமானிஸ்)

(Mr. Romanis)

ඒ මහත්මයා ගැන මම වුවමනා නම් සුළු විස්තරයක් කරන්නම්. ඔහු 1955 කාලයේදී එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල යෝධයකු වශයෙන් කටයුතු කළා. ඒ කාලයේදී ඔහු සමුපකාර සමිතියක් පිහිටුවා ගෙන දවස් 20 ක් ඇතුළත වී බුසල් 17,000 ක් රජයට විකිණුවා. මේ සම්බන්ධයෙන් පෙන්සමක් ගිය විට එකල දෙවන ඒජන්ත තුමා වශයෙන් සිටි සෑම් සිල්වා මහත්මයා ඒ ගැන පරීක්ෂණයක් කරන්න සූදානම් වුණා. පරීක්ෂණය පවත්වා ගෙන යන විට මොහු එකල සිටි අගමැතිතුමා වෙත ගොස් කිව්වා, ඒ දිසාපතිතුමා කොමියුනිස්ට් කාරයෙක්ය, කුරුණෑගල කච්චේරිය කනවාය, කොහොම හරි මාරු කරන්නය කියා. එතුමා කරුණු හරියාකාර දැන සිටියේ නැහැ. එතුමා අවංක නිසා මේ කියන්නේ ඇත්තක් යයි පිළිගෙන ටෙලිග්‍රෑම් එකකින් ඔහු මාරු කළා. විභාගයත් එතැනින් නැවතුනා. ගිය වතාවේදී ඒ පුද්ගලයා එක්සත් ජාතික පක්ෂයෙන් නොමිනේෂන් ලබා ගන්න උත්සාහ කළා. නමුත් බැරි වුණා. ඊට පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අල්ලා ගෙන රට ගසා කෑමේ ක්‍රමයක් දැන් යොදාගෙන යනවා. එසේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රොමානිස් මයා.]

කිරීමට යයි ඇමතිතුමා නියෝගයක් කළා දැයි මම දන්නේ නැහැ. එදා කියා තිබෙන්නේ මෙහෙමයි: ලැයිස්තුවක් සකස් කරන්න හමීඩ් මහත්මයාගේ අයියා, මුස්තාපා මහත්මයා., දොඩන්ගස්ලන්දට රජයෙන් පත්කර තිබෙනවා; හිරියාලට මෝහන්ලාල් ගුණතිලක මහත්මයා පත් කර තිබෙනවා; ගම්මුලාදෑනින් සියලුදෙනාටම තුන්වෙනිදා හමීඩ් මහත්මයාගේ ගෙදරදී මේ දෙදෙනා හමුවන්න පුළුවනි. මේ අනුව මුලාදෑනීන් වැඩි ගණනක් ඊයේ ආවා. අදත් එන්න බැරි වුණු මුලාදෑනියෙක්, අඹන්කොල මුලාදෑනියා, ඇවිත් සිටියා. මේ බොරුවක් නොවෙයි. මම මේ රජය මෙතෙක් විවේචනය කළේ නැහැ; කරන්න බලාපොරොත්තු වූයේත් නැහැ. නමුත් මේ වාගේ දූෂණ වැඩ කෙරෙන විට විවේචනය කරන්න සිද්ධ වෙනවා. මේ කරුණු ගැන ප්‍රවෘත්ති පත්‍රවලත් පළවුණා. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුන් සිටින කොට්ඨාශවල ග්‍රාම සේවක නිලධාරීන් පත් කිරීම සම්බන්ධයෙන් ලැයිස්තු පිළියෙළ කරන බව පේනවා. ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මයා.) තමාගේ පෞද්ගලික ලේකම්ගේ මාර්ගයෙන් ලියුම්වලින් දන්වා තිබෙනවා. මේක රහසක් නොවෙයි. මේ විධියේ වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවානම් ඒක අපරාධයක්. ඒක දූෂණ ක්‍රියාවක්. ඒක අන්ත දූෂණ ක්‍රියාවක්. මේ විධියට නම් ආදායම් පාලක නිලධාරීන්, දිසාපතිවරුන් සහ රජයේ වෙනත් නිලධාරීන් යන කොටස්වලින් වැඩක් නැහැ. ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන්ම මේක කරන්න සූදානම් වෙනවා නම් තව දුරටත් මහජන මුදල් විනාශ කර නිලධාරීන් පත්කිරීමේ තේරුමක් නැහැ.

ඩී. ජී. එච්. සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)

(திரு. டீ. ஜீ. எச். சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)

(Mr. D. G. H. Sirisena—First Akurana)

ගම්මුලාදෑනීන් පත් කරන්නේ දේශපාලන පක්ෂවලට ලැදි අයගෙන් නොවෙයි.

ගරු මන්ත්‍රීවරයෙක්

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

යූ. එන්. පී. කාලෙ ඒක කළා.

රොමානිස් මයා.

(திரு. ரொமானிஸ்)

(Mr. Romanis)

යූ. එන්. පී. කාලෙ කළ එක නරක නිසා තමයි, තමුන්නාන්සේලාට රට භාර දුන්නෙ. තමුන්නාන්සේලත් ඒකම කරන්නද අදහස් කරන්නෙ? ඒ විධියටම තමුන්නාන්සේලාත් කරන්න ගියොත් අනික් මැතිවරණයේදී——

කේ. එච්. ජී. ඇල්බට් මයා. (බෙන්තර-ඇල්පිටිය)

(திரு. கே. எச். ஜீ. அல்பேட்—பெந்தற-எல்பிட்டிய)

(Mr. K. H. G. Albert—Bentara-Elpitiya)

මහජනයා නැවත වරක් නිසි විධියට පිළිතුරු දෙනවා ඇති.

රොමානිස් මයා.

(திரு. ரொமானிஸ்)

(Mr. Romanis)

මෙවැනි ක්‍රියා කරන්න එපා.

ගරු මන්ත්‍රීවරයෙක්

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

ඕවා පත්‍රවල පළවන ආරංචි.

රොමානිස් මයා.

(திரு. ரொமானிஸ்)

(Mr. Romanis)

පත්‍රවල නොවෙයි. මා කියන්නේ ඇහින් දුටු, කණින් ඇසූ දේවල්. මගේ ඡන්දදායක කොට්ඨාශයේ කෙරීගෙන යන වැඩයි මා කියන්නේ. මේවා ඔප්පු කරන්න සාක්ෂි ඕනෑ තරම් තිබෙනවා. මේවා බොරු නොවෙයි. මේවා රජය අප්‍රසාදයට ලක් කිරීම සඳහා සාදන ලද බොරු නොවෙයි. මෙවැනි දූෂණ ක්‍රියා නතර කරන හැටියට මා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

සේනපාල සමරසේකර මයා. (අක්මීමන)

(திரு. சேனபால சமரசேக்கர—அக்மீமன)

(Mr. Senapala Samarasekara—Akmeemana)

දැන් සිටින ගම්මුලාදෑනියා යනවාට තමුන්නාන්සේට හරි දුකයි.

රොමානිස් මයා.

(திரு. ரொமானிஸ்)

(Mr. Romanis)

මුලාදෑනියා මගේ පක්ෂිකාරයෙක් නොවෙයි. තමුන්නාන්සේලට පක්ෂම් අල්ලන මිනිසුන් හොඳ වෙන්නත් අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පන්දම් අල්ලන මිනිසුන් නරක් වෙන්නත් හේතුවක් නැහැ. කාටත් එක සමාන අයිතිවාසිකම් තියෙන්න ඕනෑ, ඒ විධියට කථා කරනවා නම්. එක් කොටසකට පන්දම් අල්ලන උදවිය හොඳ වෙන්නත්, තවත් කොටසකට පන්දම් අල්ලන උදවිය නරක් වෙන්නත් හේතුවක් නැහැ. මේක නොවෙයි ප්‍රජාතන්ත්‍රවාදය. අප පන්දම් අල්ලවාගන්න ලෑස්ති නැහැ. තමුන්නාන්සේලයි පන්දම් අල්ලවා ගන්න ලෑස්ති වෙන්නෙ. [බාධා කිරීමක්] වචනවලට ප්‍රතිවචන දීමටම කල්පනා කිරීමෙන් මේ ප්‍රශ්න නිරාකරණය වන්නේ නැහැ. ඇතැම් විට ගරු ඇමතිතුමා මේ කරුණු ගැන දන්නෙ නැතුවා වෙන්න පුළුවනි. අප මේ ගරු සභාවට පැමිණ සිටින්නේ මේ කරුණු ගැන ප්‍රකාශ කිරීමටයි. මේ දූෂණ ක්‍රියා නවත්වන්න ඕනෑ. දූෂණ ක්‍රියා වැඩි කර ගන්න අපට වුවමනාවක් නැහැ. මන්ත්‍රීකම රක්ෂාවක් කර ගන්න මගේ බලාපොරොත්තුවක් ඇත්තේ නැහැ. කාටවත් මා පන්දම් අල්ලන්නෙත් නැහැ. ඒ බව තමුන්නාන්සේලා හිතාගන්න ඕනෑ. මේවා සත්‍ය කරුණු. මේවායින් අඛමල් රේණුවක්වත් බොරු වන්නේ නැහැ. මා පන්දම් විරෝධියෙක්. බලයට පත් වන කොයි පක්ෂයකට හරි—[බාධා කිරීම්] හමීඩ් මහත්මයාට විරුද්ධව වැඩ කළත් මා දිනුවා, මන්ත්‍රීවරුනි. ඒ බව තමුන්නාන්සේලා සිතාගන්න. මා හමීඩ් මහතාට බිය නැහැ. [බාධා කිරීම්] තමුන්නාන්සේලාට උත්තර දෙන්න ගියොත් මගේ කථාව හුගක් දික් වෙන්න පුළුවනි. ඔය ප්‍රශ්නවලට උත්තර දෙන්න ගියොත් මගේ කථාවට තවත් වැඩි කාලයක් තමුන්නාන්සේගෙන් ඉල්ලා ගැනීමට මට සිද්ධ වෙනවා. මගේ කථාවට පිළිතුරු දීම පිණිස ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට අවස්ථාව පැමිණි විට ඊට පිළිතුරු දෙන්නය කියාත් මගේ කථාවට බාධා නොකර කථාව කරගෙන යාමට ඉඩ දෙන්නය කියාත් මම ඉල්ලනවා.

මෙම අමාත්‍යාංශය ගැන කල්පනා කරන විට දෙපාර්තමේන්තු 21ක් මේ අමාත්‍යාංශය යටතේ පාලනය වෙනවා. ඒ වාගේම එහි පාලනය පිණිස සිටින අපේ ඇමතිතුමාගේ දක්ෂතාව නිසාම මේ තරම් විශාල දෙපාර්තමේන්තු ගණනක් මෙම අමාත්‍යාංශයට භාර දී තිබෙනවාය කියා මම විශ්වාස කරනවා. නමුත් මා කලින් මතක් කළා වාගේ එකිනෙකට ප්‍රතිවිරුද්ධ පාලනයක් මෙම අමාත්‍යාංශයේ තිබෙනවා. ඒ මොකක්ද? එක අතකින් සුරාව වර්ධනය කිරීමයි, අනික් අතින් සුරාව මර්දනය කිරීමයි. ඒ වාගේම සංස්කෘතිය වර්ධනය කිරීමත් තමුන්නාන්සේටම පැවරී තිබෙනවා. අපේ සංස්කෘතියට එක්තරා විධියකින් කර්මාන්ත සම්බන්ධ කර ගන්න පුළුවන්ය කියා අපට හිතන්න පුළුවන්. නමුත් මොන විධියකින්වත් සුරාව අපේ සංස්කෘතියට සම්බන්ධ කර ගන්න පුළුවන් කමක් නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
ඇයි සිංහල රජ කාලයේදී සුරාව සම්බන්ධ වී තිබුණෙ නැද්ද?

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)
කරුණා කර බාධා කරන්න එපා.

රොමානිස් මයා.
(திரு. ரொமானிஸ்)
(Mr. Romanis)
"සිංහල" රජ කාලයේදී තිබුණේ නැහැ. "හිංගල" රජ කාලයෙදීයි තිබුණෙ. මන්ත්‍රීතුමා ඒ බව තේරුම්ගන්න ඕනෑ. "සිංහලය", "හිංගලය" කියා දෙකක් තිබෙනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)
බාධා කිරීම්වලට ඇහුම්කන් නොදී කරුණා කර මන්ත්‍රීවරයාගේ කථාව කර ගෙන යන්න.

රොමානිස් මයා.
(திரு. ரொமானிஸ்)
(Mr. Romanis)
සභාපතිතුමනි, මෙය අපේ සංස්කෘතියට අයිති දෙයක් නොවෙයි. සුරාව වර්ධනය කිරීමත්, සංස්කෘතිය වර්ධනය කිරීමත් යන දෙකම කරන්නට ගියොත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රොමානිස් මයා.]

එය බෞද්ධ සංස්කෘතියටත් ජාතියටත් සිදු වන ලොකුම වරදක් [බාධා කිරීමක්.]

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

කරුණා කර බාධා කිරීමෙන් වළකින්න.

රොමානිස් මයා.
(திரு. ரொமானிஸ்)
(Mr. Romanis)

සුරාව ගැන මීට පෙර කථා කළ අපේ ගරු නුවරඑළියේ මන්ත්‍රීතුමා (ටී. විලියම් ප්‍රනාන්දු මයා.) පසුගිය මැතිවරණයේදී විශාල වශයෙන් මහජනයාට කසිප්පු දුන්නේ එක්සත් ජාතික පක්ෂයෙන් පමණක්ය කියා එක්සත් ජාතික පක්ෂය ට පහරක් ගැසුවා. ඒක සම්පූර්ණ බොරු වක්. හිතට විරුද්ධ නැතිව ඒ මන්ත්‍රීතුමා කථා කළා නම් දෙපක්ෂයෙන්ම එය කෙරුණු බව පැහැදිලි වෙන්න තිබුණා.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

අපි දුන්නේ නැහැ.

අ. භා. 5.30

රොමානිස් මයා.
(திரு. ரொமானிஸ்)
(Mr. Romanis)

තමුන්නාන්සේලා එසේ කීම ගැන මම කනගාටු වෙනවා. මම නිදර්ශණයක් වශ යෙන් සත්‍ය සිද්ධියක් විස්තර කරන්නම්. අපේ පළාත් පාලන ආයතනයේ නොහොත් ගම්කාර්ය සභාවේ මැතිවරණ යක් මේ ළඟදී පැවැත්වුණා. ශ්‍රී ලංකා නිද හස් පක්ෂයෙන් ඉදිරිපත් වුණු හිතවතුන් ඒ අපෙක්ෂකයා වෙනුවෙන් කසිප්පු බෝතල 100 ක් පෙරුවාලු. යූ. එන්. පී. එක වෙනුවෙන් වැඩ කළ අයට ඒ බව ආරංචි වී ඔවුන් බෝතල 150 ක් පෙරු වාලු. ඔන්න අපේ ගම්වල තිබෙන තත්ත්වය. මෙය සිනහ විය යුතු කාරණයක් නොවෙයි. අපේ මැතිවරණ පවත්වන්නේ කොහොමද කියා තමුන්නාන්සේලා ටිකක් කල්පනා කර බලන්න ඕනෑ. මම කථා කරන්නෙ අවංකවයි. තමුන්නාන්සේලා වාගේ බොරුවට එක පැත්තක් අරගෙන මම කථා කරන්නෙ නැහැ. මම පෙන්වා දෙන්නෙ අද රටේ තිබෙන නියම තත්ත්ව යයි. එවැනි තත්ත්වයක අපේ රට අද පවතින බව තමුන්නාන්සේලා පිළිගන්න ඕනෑ. නාම යෝජනා පත්‍ර භාර දීමෙන් පසුව කරන පළමුවන වැඩේ නම් කසිප්පුවලට වුවමනා අඩුවැඩිය හොයා ගැනීමයි. එවැනි තත්ත්වයකයි අද අපේ රට පවතින්නෙ. අපේ රටේ එක තැනක පමණක් නොවෙයි එවැනි තත්ත්වයක් තියෙන්නෙ. මා කීවේ අපේ රටේ හැම තැනකම වාගේ තිබෙන දෙයක් ගැනයි. හිතට විරුද්ධව කථා කරන කෙනකු මිස හෘදය සාක්ෂියට එක ඟව කථා කරන කාටවත් මා කී දේ එසේ නොවේය කියන්න බැහැ. සමහර හොඳ අයත් නැතුවාම නොවෙයි. සියේට 90 ක් වත් එහෙම කරන බව නම් නිර්භයවම කියන්න පුළුවනි. ඒක පිළිගන්න ඕනෑ. ඒ නිසා මේ උවදුර නැති කිරීමට සටන් කිරීම පළමුකොටම ආරම්භ කළ යුතුව තිබෙනවා. ඒ සඳහා පැහැදිලි යෝජනා ඉදිරිපත් කරන්න මේ අවස්ථාවේ මට පුළුවන්කමක් නැහැ. නමුත් එක් උවදු රක් නැති කිරීමට තවත් උවදුරක් ඇති කිරීමයි දැන් කෙරෙන්නෙ. කසිප්පු උවදුර නැති කරන්න රා බහුලව සපයන්න ඕනෑය අරක්කු බහුලව සපයන්න ඕනෑය කිය නවා. නමුත් රාවලින් වෙරි වුවත්, අරක්කුවලින් වෙරි වුවත්, කසිප්පුවලින් වෙරි වුවත් එහි වෙනසක් නැහැ. ඒකේ බොරුවක් නෑ. කෝටාල්වලින් වෙරි වුණත් එච්චරම තමයි. ඒකේ කිසිම වෙනසක් නැහැ. මේවාට දැනටමත් පුරුදු වී සිටින අය ගැන කොහොම වෙතත් අපේ අනාගත පරම්පරාවවත් ගළවා ගන්න ඕනෑ නම් සුරාව මේ රටින් සම්පූර්ණයෙන් තුරන් කරන්න ඕනෑ. ඒ සඳහා පක්ෂ භේදයක් නැතිව සාකච්ඡා කර සූදානම් වෙන්න ඕනෑ. මොනම සුරාවක්වත් වර්ධ නය කළ යුතුය කියා බෞද්ධයකු වශයෙන් මම නම් කියන්නෙ නෑ. මම බිව්වෙත් නෑ, බොන්නෙත් නැහැ. මැතිවරණය වෙනුවෙන් මා අරක්කු බින්දුවක්වත් දුන්නෙත් නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

කසිප්පු දුන්නෙත් නැද්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රොමානිස් මයා.
(திரு. ரொமானிஸ்)
(Mr. Romanis)

කසිප්පු දුන්නෙත් නෑ. හැබැයි, මාර්තු මැතිවරණයේදී නම් අරක්කු ටිකක් දුන්නා තමයි. නොදන්නාකමටයි මාර්තු මැතිවරණයේදී වුණත් එහෙම කළේ. හැබැයි, ජූලි මැතිවරණයේදී නම් එක කඳු ලක්වත් දුන්නෙ නැහැ. ඒ නිසා වෙන්න ඇති මට පක්ෂ වූ ඡන්දදායකයින්ගෙ ගණන ටිකක් අඩු වුණෙ. [බාධාකිරීමක්.] ඇත්ත කථා කරන්නත් බිම ඉද ගන්නත් බය වෙන්න එපා කියලා ගැමි කථාවක් තියෙනවා. මාත් ඒ දෙකෙන් එකක්වත් කරන්න බය නෑ. මේක රක්ෂාවක් කර ගන්න මම ලෑස්ති නැහැ. මට ඕනෑ ඇත්ත කථා කරන්නයි. ඒ නිසා මට බය වෙන්න වුවමනාවකුත් නැහැ. ගරු ඇමතිතුමා තරුණයෙක් නිසා මේකෙ බරපතළකම දන්නෙ නැතුවා වෙන්න ඇති. මට වගේ දරු පිරිසක් ඇති වුණුදාට නම් තමන්ගෙ දරුවන් නොමඟ යනවා දකින්න භය නිසා මේක නම් මොන විධියකින්වත් මේ රටෙන් තුරන් කළ යුතු උවදුරක්ම තමයි කියා හිතෙනවාමයි. ඒක මට කියන්න පුළුවනි. මා යෝජනා කරන්නේ ආණ්ඩු පක්ෂය, විරුද්ධ පාර්ශ්වයය කියා වෙන සක් නොසලකා කවුරුත් එකතු වී සාකච්ඡා කර මේ රටින් සුරාව තුරන් කරන්න වැඩ පිළිවෙළක් යොදන හැටියටයි. එසේ කළොත් අරක්කු පාවිච්චිය අඩු කිරීමට බීරවල මිල අඩු කළ යුතුය කියාවත්, කෝටාල්වල, කසිප්පුවල පාවිච්චිය අඩු කිරීමට නම් අරක්කු මිල අඩු කළ යුතුය කියාවත්, කල්පනා නොකරනවා ඇති. සුරාව නරකමයි. මොන සුරාවෙන් මත් වුණත් ප්‍රතිඵලය එකමයි. සුරාව සෞඛ්‍යයට වුවමනා දෙයක් නොවෙයි. සුරාව ශරීරයට එතරම්ම අහිතකර දෙයක්. එය ශරීරයට හිතකරය කියා වෛද්‍ය ශාස්ත්‍රය අනුව කාටවත් ඔප්පු කරන්න බැහැ. මත් ද්‍රව්‍ය බහුල වශයෙන් පාවිච්චි කිරීමට ඉඩ හැරියොත් සිදු වන්නේ ජාතියක් වශයෙන් අපි ආපසු යාමයි.

එක් කාරණයක් පිළිබඳව මට විශෙෂ ඉල්ලීමක් ගරු ඇමතිතුමාගෙන් කරන්න තිබෙනවා. මා පෙනී සිටින්නා වූ ඡන්ද කොට්ඨාශය තිබෙන්නේ වයඹ පළාතේයි. මගේ ප්‍රදේශයද කඳුකර ප්‍රදේශයක් බැවින් ගමනාගමන පහසුකම් ඉතාමත්ම දුලභයි. ඒ නිසා දොඩම්ගස්ලන්ද කොට්ඨාශයට උඩරට ගැමි කොමිෂන් සභාවේ යෝජනා ක්‍රියාත්මක කරන මෙන් මා ඉතා ඕනෑ කමින් ඉල්ලා සිටිනවා—[බාධාකිරීමක්] වාසනාවකට මෙන් හිරියාල ආසනයට නම් අඩුපාඩුකම් ඇත්තේ නැහැ. නුමුත් මා පෙනී සිටින්නා වූ දොඩම්ගස්ලන්ද ප්‍රදේශයට නම් සපයා දී තිබෙන ගමනාගමන පහසුකම් සහ අනෙක් පහසුකම්ද ඉතාමත්ම මදි. මෙම අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු ලේකම්තුමා අප පළාතට පැමිණි අවස්ථාවේදී එහි තිබෙන්නා වූ අඩුපාඩුකම් සියල්ලම පාහේ සියැසින් බලා ගැනීමේ අවස්ථාව මා ලබා දුන්නා. ඒ නිසා දොඩම්ගස්ලන්දද උඩරට ගැමි කොමිෂන් සභාවයටතට ගෙන එය දියුණු කරන මෙන් ඉතාමත්ම බැගෑපත්ව මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගෘහ කර්මාන්ත අංශය යටතේද මට වචන තුන හතරක් කියන්න තිබෙනවා. සුළු කර්මාන්ත අතින් පවා මගේ ඡන්ද කොට්ඨාශයේ පවතින තත්ත්වය ඉතාමත් පහත් බව මා අමුතුවෙන් කිවයුතු නැහැ. රෙදි විවීමේ මධ්‍යස්ථාන පිහිටුවීමද නවතා දමා තිබෙන බව මට දැනගන්නට ලැබී තිබෙනවා. මේ ඇත්තද නැත්තද කියා හරියාකාර මා දන්නේ නැහැ. නමුත් රෙදි විවීමේ කර්මාන්තය ගම්බද පළාත්වල තරමක් දියුණුව පැවති කර්මාන්තයක්. ඒ නිසා රෙදි විවීමේ මධ්‍යස්ථාන පිහිටුවීම නවත්වා දැමීමෙන් නොදියුණු පළාත්වලට වන්නේ විශාල හානියක්. මෙම මධ්‍යස්ථාන පිහිටුවිය යුතු ස්ථාන කිපයක් මගේ පළාතේ තිබෙනවා. ඒ නිසා විශෙෂයෙන් නොදියුණු පළාත්වල රෙදි විවීමේ මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩ පිළිවෙළක් අරඹන මෙන් මම ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑ කමින් ඉල්ලා සිටිනවා. අපේ රටේ ස්වාභාවික ධන නිධාන එමට තිබෙන බවත් ඒවායින් ප්‍රයෝජන ගත යුතු බවත් නුවර එළියේ ගරු මන්ත්‍රීතුමා විසින් කියන්ට යෙදුණා. එතුමාගේ ඒ ප්‍රකාශය ගැන මා ඉතාමත්ම සන්තෝෂයි. මා එය අනුමත කරනවා. කර්මාන්තවලින් දියුණු වීමට නම්, අපේ රටේ තිබෙන ඒ ස්වාභාවික ධන නිධානයන්ගෙන් ප්‍රයෝජන ගත යුතුයි. නොඑසේ නම් නියම කර්මාන්ත දියුණුවක් සලසා ගත නොහැකියි. මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රොමානිස් මයා.]

ලක්දිවේ නොයෙකුත් පළාත්වල ඉතාමත් වටිනා ඛණිජ පස් වර්ග තිබෙනවා. මේ පොළොවේ නොයෙක් තැන්වල ඉතා වටිනා ඛණිජ වර්ග තැන්පත් වී තිබෙනවා. අප ඒවායින් ප්‍රයෝජන ගත යුතුයි. කර්මාන්ත සඳහා වෙනම අමාත්‍යාංශයක් ඇති කර මේ රටේ කර්මාන්ත සංවර්ධනයට බැස්සොත් සාර්ථක ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් වෙනවා ඇති. රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්න තිබෙන එකම මාර්ගය කර්මාන්ත දියුණු කිරීමයි. එසේ නම් ඒ වෙනුවෙන් වෙනම අමාත්‍යාංශයක් ඇති කළාම මොකද? මහජනයා ඒ ගැන විරුද්ධ වන එකක් නැහැ; සතුටු වේවි. ඇමතිවරයාට තරුණභාවය තිබෙන එක නම් ඇත්තයි. නමුත් ඔය වගේ තරුණ කාලයට වැඩිපුර මහන්සි වන්න හොඳ නැහැ නොවැ. මගේ කථාව දීර්ඝ කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. කර්මාන්ත අතින් මේ රට සංවර්ධනය කිරීම සඳහා නියම විධියේ වැඩ පිළිවෙළක් යොදනවා ඇතැයි විශ්වාස කරමින් මගේ කථාව මෙයින් සමාප්ත කරනවා.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

Mr. Chairman, I rise to make a few comments on the Estimates of the Ministry of Industries, Home and Cultural Affairs. I agree with the criticism indulged in by a very large number of hon. Members that this Ministry has too many departments in it. Twenty one departments certainly are too many for even the ablest and most energetic Minister. But I find it extremely difficult to understand who advised Senator Sirimavo Ratwatte Bandaranaike to bring in twenty one departments under this Ministry—[*Interruption*] —Kandyan Peasantry Rehabilitation Scheme, Salt Department, Excise Department, Public Trustees Department, the Department of National Museums, the Department of Prisons. I think the Government has failed to realise the importance of industrial development, because if it had realised the need for proper and rapid industrial development it would not have brought in such a large number of departments into the Ministry of Industries, Home and Cultural Affairs.

This Government has failed to realize that there are three Ministries—Development Ministries — I might say four, if the departments are properly brought under those Ministries. The Department of Industries should be a Ministry by itself; the Government Mineralogist could certainly come in it, also the Salt Department, and the Excise Department so far as it is engaged in the production of alcohol, whether potable alcohol or alcohol for industrial purposes. But all other departments serve as an encumbrance to prevent the general industrial development of this country, because the Hon. Minister is prevented from paying proper attention to the needs of industrial development in this country.

අ. භා. 5.45

I agree with the criticism that has already been levelled by the hon. Member for Akuressa (Dr. S. A. Wickremasinghe) and other hon. Members, that this Government should take early steps to set up a proper Ministry of Industries with a capable—I am not saying that this Minister is not capable—a capable Minister in charge of industrial development. That is my first criticism. This Government would not have failed to realise the importance of this problem if it only had read the recommendations of the Planning Council. I would like to point out certain recommendations of the Planning Council in the Ten Year Plan. This is what it says on industrial development. I hope you will excuse me if I read a few passages from this valuable document, the only document we have up to date on comprehensive planning embracing all departments. On page 345 this is what it says:

"The reasons why it is necessary to take immediate steps towards establishing a rapid rate or industrialisation in Ceylon have been advanced in an earlier part of this Report".——

This report refers to the earlier part. I am not going to read from that.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"The need for industrialisation stems from two basic conditions of the economy of Ceylon. The first is that the current rate of population growth and with it, of the work force, is very high by world standards. The rate of growth of the latter is indeed expected to become even higher after 1963. The Second is that opportunity for absorbing this population growth within the traditional central industries of Ceylon—peasant agriculture and plantation crops—are strictly limited even when extensive irrigation work and land settlement are taken into account".

Then on page 347 it makes this general observation. First they indicate the calculations of requirements of industrial projects which are summarised in Table 1, which serves two purposes. Table 1 is on page 347. Then they state :

"First they indicate the magnitude of the needs which are likely to arise over the next decade. These needs will have to be met either by an expansion of exports or by a programme of import replacement. Failing a sufficient expansion of export and/or an adequate programme of import replacement the economy will be faced initially by balance of payments problems on a major scale and subsequently by a decline in real income as it will become increasingly difficult to import the volume of goods needed to maintain, let alone expand, levels of real income".

We are already meeting with that balance of payments problem.

Then, on page 348, this is what the Plan says :

"Clearly the scope for industrialisation via import replacement is large ....."

Then lower down :

"Given that this is the case and that rapid industrialisation is needed to provide employment directly and to provide the basis for a general expansion of the economy, then the question arises what are the fields in which industrialisation should take place. Before considering this question further, however, it is advisable first to consider a few general issues which are basic to the successful implementation of the investment programme.

First the planning authorities must be concerned about the provision of an adequate power supply...."—

That is why I mentioned earlier that there are important things like industries, power, transport, and lands. These are important development Ministries and should be in charge of Ministers who devote their sole time and entire energy to these Ministries and should not be encumbered with these unnecessary cultural affairs and various other things.——

"This question which is of major importance is taken up separately in another chapter. Secondly they should be directly concerned, not as has been the tendency in the past with a relatively large number of relatively minor projects but, initially at least, in meeting market requirements, present and expected in a limited range of products, the investment needs for which and the expected output from which are large enough to have a significant effect on the level of investment activity and on the subsequent course of economic development. Investment along these lines simultaneously contributes to the solution of a number of problems which a country such as Ceylon faces when it steps up its rates of industrialisation."

Then again—I do not want to read long quotations but just a few lines—on page 355 the National Planning Council says :

"Any country which is dependent on foreign sources for the greater part of its plant and machinery requirements must be prepared to meet short term strains on the balance of payments when it increases its rate of industrialisation. The foreign exchange requirements for capital expenditure on industry become evident at an early stage while the fruits of that expenditure in terms of imports savings develop relatively slowly and with a time lag which is dependent on the period of time required to bring factories into production".

These are problems that must be faced. It is no use talking about making profits as soon as you open a factory. Then there is the other problem of foreign exchange payment.

On page 359, the planning Council says :

"There are some other aspects of the process of reinvestment that need discussion. First there is the question of pricing policy. Broadly speaking there are two alternatives available for Government controlled projects. The expected surpluses from a process of industrialisation can either be passed on to the consumers in the form of lower prices or prices can be maintained and the surpluses used to finance the expansion programme. Given that the investment programme must continue and is of highest priority then the former alternative is less desirable than the latter."——

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

That is, high prices for the industrial products that we produce in the earlier stages of our planned projects ——

"If consumers benefit by lower prices then the finance for subsequent investment has to be raised from them either by loans or by taxation....."

That is what we are trying to do now.

"If the surplus is retained its availability will be a direct incentive to the maintenance of a sustained programme of investment while at the same time it will minimise the strains on the Budget which will necessarily arise while the investment programme is being pursued."

Then, again, on page 360 it says:

"Finally it must be emphasised that the appearance and scale of financial surplus is dependent upon the success of the actual physical processes of investment and factory operation. If there is faulty planning of projects, if management is not efficient and if the labour force does not become sufficiently skilled and disciplined to factory conditions the financial surplus will be slow to appear and when they do will be on an inadequate scale".

These are problems that practically everyone of our present industries is faced with, whether it is the Oils and Fats Factory or the Sugar Factory. The Cement Factory has got over these initial difficulties, and we can say it is on its feet substantially earning profits and is in a position to help other industries.

Then, I would like to read this passage of the Plan:

"The importance of most of the questions of this type is considered in more detail in another section of this chapter. It is at this point, however, that the importance of the efficiency of the initial stages of planning should be emphasised. There are two general points which need special consideration. First there is the complexity of technical relationship within the industrial sector itself ....."——

That is not a matter which affects us so much as a country like India ——

"....i.e., it is increasingly the case as industry develops that the final products of one branch of industry form the raw materials of another one. Failure to make adequate allowance for this interrelationship can only result in the appearance of bottlenecks which not only delay the whole process but which may also add considerably to the final cost of industrial products. Secondly industry is intimately connected with other sectors of the economy especially, in some cases, with agriculture for the supply of raw materials and with the transport industry for the supply of raw materials and the distribution of the finished products. Inadequate recognition of this at the planning level can be even more costly both in terms of time and final cost than inadequate intra-industry planning. Finally, the question of project formulation and preparation must be considered."

Now these are problems that the present industries are faced with. I will come more specifically to some of these problems when I make a detailed criticism of the Textile Factory and the Sugar Factory.

Here is what the National Planning Council has recommended on page 366 after surveying the field and discussing the various problems. This is the conclusion that it has come to:

"In the light of the previous discussion the National Planning Council recommends:

1. That the Government should inform the Ceylon Cement Corporation that the output of the cement industry should be increased over the next decade along the lines indicated in this report.

2. That the Cement Corporation's immediate target at Kankesanturai...."

——

I do not want to go over it because it has been repeated so many times, but I want to say this much about the Cement Corporation. You see, the idea was to have not only a second kiln at Kankesanturai but to have a third kiln or a third factory somewhere else in addition to the Puttalam Factory. This is discussed on page 367 of the Report of the National Planning Council. The hon. Member for Balapitiya (Mr. Lakshman de Silva), I believe, wanted to know why they could not set up a factory in the Ambalangoda area. That is answered in this Report.

අ. භා. 6

Here it is on page 363.

The long term aim of the plan is to achieve an output of 1,000,000 tons of cement by about 1968. This is a really substantial increase on the present output of the industry of 75,000 tons....

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I believe the factory now is producing about 80,000 tons.

....but it should not be beyond the capacity of the economy either to achieve this rate of production or to absorb it in consumption. The existing plans which are currently being put into practice, are to raise the present output at Kankesanturai by putting in a second kiln which will raise output from 75,000 tons per annum to 200,000 per annum by 1962....

You have not started the work on this. I believe you have just got a loan and hope the work will be started soon.

As soon as this is completed it is proposed to begin installations of a third kiln which would increase output to 300,000 tons. In the meanwhile construction would have been commenced on a second set of kilns based on limestone deposits at Puttalam.

You do not know where this is going to be located. There are other problems to be decided. It is not purely a question of limestone. The railway extension is important. Matters like centres of consumption have to be considered. How far is the Kankesanturai plant from the points of consumption which are chiefly in the southern areas which are the most thickly populated areas ? The transport costs between point of manufacture and points of consumption are very heavy. All these matters have to be gone into carefully by the Minister so far as state industrial projects are concerned. All this has a bearing on the ultimate cost of your products to the consumer. It goes on :

In the meanwhile construction would have been commenced on a second set of kilns based on the limestone deposits at Puttalam.

As a matter of fact, some years ago a Czech team inquired into this project but I must say they were not supplied with all the information, with the result that their report was faulty to some extent. It was faulty because they were not given all the information which was available with the Minister of Industries and in his departments—the Department of Mineralogy and various other departments had all the information but they did not furnish them to the scientists, with the result that their report, as I said, was to some extent faulty.

The exact site of this plant has yet to be determined but will lie somewhere between Colombo and Puttalam.

I do not know whether it is going to be sited between Colombo and Puttalam but it will have to be at some point where the limestone deposits really are—20 miles north of Puttalam, but we have to consider other questions also. Of course, if the plant is located between Colombo and Puttalam there are advantages, for instance, water. I do not know where the water supply for a plant sited north of Puttalam is going to be. It is going to be a very difficult matter. But if you site that plant somewhere between Colombo and Puttalam, say north of the Kochchikade area, then there would be the Deduru-oya, a perennial stream, which would assure ample supplies of water. If the plant is sited at such a point, it will not be far from Deduru-oya, no, I am sorry Maha-oya. The plant can get all the water supplies from Maha-oya and it will be nearer the centres of consumption, the thickly populated areas around Colombo and Colombo District. This will reduce costs because by reducing transport costs you will reduce the cost to the consumer. It would not be a difficult problem to bring down limestone from 20 miles north of the Puttalam area. You can build the railway from Bangadeniya and once it is constructed, well, all the limestone you require can be brought down. As I said, it is not only a question of limestone. There are other requirements necessary such as fuel and so on, particularly water supplies—unless you have a process which will economize water. This has to be looked into very carefully. The report goes on to say :

In determining the best (i.e. the cheapest) location for this plant fairly complex calculations have to be made which have to take into account the availability of supplies of water, clay and power and the balancing out of the relative costs of bringing the different types of raw materials to the plant from Puttalam and from Colombo. For cheap

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

operation this second factory also implies the extension of the railway line some twenty miles north of Puttalam.

That is to bring down the limestone. I am told that the limestone deposits north of Puttalam are very rich, probably the richest in the Island.

The Puttalam Factory is to produce 450,000 tons, whether this takes the form of three kilns of 150,000 tons capacity or two of 225,000 tons will be decided at a later stage.

A third factory is scheduled to begin production in 1968. The location of this factory is not yet decided.

This is the factory which the hon. Member for Balapitiya (Mr. Lakshman de Silva) has in mind. I am afraid, besides other considerations, there is this danger. If the limestone deposits are removed from that area, if you gradually break up the entire reef, the sea will just wash twenty miles in.

There are at least three potential sites, i.e. at Kankesanturai, at Puttalam or based on the calcareous muds in the vicinity of Galle.

The Ambalangoda area.

Further drilling and research is required at each of these sites to determine the availability of quantity and quality of raw material supplies at each of these sites before a decision on the location of the third plant can be reached.

Of course, you have now decided to have a clinker grinding plant at Galle. Therefore you will be importing clinkers either from abroad or getting it from the surplus at Kankesanturai factory. But that is not a full-fledged cement factory in that sense.

Of course availability of raw materials is only one of the factors affecting this decision. The final decision will rest at least as much on the relative transport costs to and from these possible sites.

Now I want to say a word or two with regard to their recommendations. I will read them now :

1. That the Government should inform the Ceylon Cement Corporation that the output of the cement industry should be increased over the next decade along the lines indicated in this report.

Our need for cement is expanding daily.

That the Cement Corporation's immediate target at Kankesanturai should be stepped upto 300,000 tons if it can be shown that it is technically possible to provide the required port facilities at Kankesanturai and at Galle at the right time.

There is provision made now for improving the port at Kankesanturai and so this problem does not arise. Then at Galle there is provision this year for developing Galle Harbour.

If it is possible, the port authorities should be informed of the urgency of these needs and should be granted the funds that will be required. The Department of Government Electrical Undertakings should also be informed of this decision and be required to meet the electricity demands which are implicit in this programme.

The Minister in charge of power is not here.

The Railway Department should be advised that steps should be taken immediately to ensure that the railway is extended to the limestone deposits north of Puttalam by 1962.

I now wish to say a word regarding cement manufacture. I must say that the Manager of the Cement Factory, Dr. Ponnaperuma, is a distinguished scientist, able to take charge and, as manager of the Cement Corporation, he has proved that he has managerial ability. I cannot understand—I agree with the hon. Member for Akuressa (Dr. S. A. Wickremasinghe)—why a civil servant who was driven from pillar to post has been made Chairman of this Corporation. I do not know whether it is to help the Manager and the Board of Directors of the Corporation or only to obstruct the work, the efficient work of the Manager. Very few of our scientists have proved that they have managerial ability. Dr. Ponnaperuma is undoubtedly one who has. I do not know. The Minister will have to watch very carefully this Civil Servant who does not want to stay in one post but wants to go everywhere. I do not know why he

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

was made the Chairman of this corporation and what special contribution he can make. He would have done much better as a Government Agent somewhere attending to routine work. But for development work—from my experience of the man, from what I know of him—the man is absolutely unsuited and he will not, in any way, be able to help this important corporation which has been managed well, which has shown profits and which is helping to run the other industries in the country. I do not want to say more than that. I do not want to give the costs, the transport costs and the fuel costs, which really make the Kankesanturai cement expensive. If you can bring down the transport and fuel costs then the Kankesanturai cement can be sold at a very much lower price than it is fetching today.

I want to say a word about the textile mill. I agree with the hon. Member for Akuressa (Dr. S. A. Wickremasinghe) that we have bought very expensive ultra-modern equipment for the Veyangoda mill. I do not know whether the workers and technologists who are there will be able to utilize that machinery with the care they deserve ; if they cannot, then it will be another white elephant.

As the Director of Industries in this country we had a person who was brought up, trained and proved efficient as the Registrar of Companies. He knows company law fairly well but in the industrial field I do not know whether he knows anything. In the last few years I do not think he has learnt very much and under his direction the Department of Industries has suffered. Mismanagement, bad siting, defects, all that sort of thing in the industries are so largely due to his inability to understand industrial problems.

With regard to the textile factory I want to say another word. I cannot understand why the factory is sited at Dompe. Is it purely to satisfy the Minister of Finance ? I want to know why, because important problems have to be tackled, such as the problem of transport. Are you going to build a rail road from Veyangoda to Dompe ? There is no railway to go over there ! At page 169 of " State Industrial Projects " this is what the Hon. Minister says:

> The Corporation's future plans are to set up a second mill for spinning, weaving and finishing at Dompe on a site approximately 63 acres in extent which has already been selected for the purpose. This is situated about ½ mile from the Pugoda junction, about ¾ mile from the Kelani river.

That whole area gets flooded. I do not know whether this particular site is above flood level. If it is not so you have to raise all the roads which approach this site.

අ. භා. 6.15

Then the other problem is transport. I do not know whether you are going to make use of the Kelani river for purposes of transport. If it is developed it should be more economical and less costly than rail transport. I do not know whether you have such a plan. How are you going to bring the raw material and various other things and take out the finished product ? Is it by lorry transport ? Would it not have been better, wiser and more economical to have sited this factory near Veyangoda not far from the present factory, where you have the benefit of the advice of those who have a certain amount of experience in running the factory ? I know that the Plant is a gift from China, though perhaps not so up-to-date as the Swiss machinery, but with the production of yarn and cloth it might be all right in another ten or twelve years.

These are problems that should have been looked into, and looked into very carefully, before siting another factory at Dompe. Personally I think it would have been better and wiser to have sited it not far from the present Veyangoda Plant. The Veyangoda Plant is on the main line. There you have not only the transport facilities but all

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

the other facilities too; the experience of people who are running the other factory will be readily available to you. Technical experience is very expensive to obtain and when you have obtained that experience there is no point in duplicating it somewhere else merely because there is a river somewhere.

I wish the Hon. Minister will look into these problems. Simply because the Finance Minister says, "I too want a textile mill", like a school boy who wants a toy you cannot afford to waste money like this. It is very expensive in the long run and the people of this country have to foot the bill.

Personally I have nothing against it. I too would welcome it because it is not too far from my constituency. That is purely looking at it from that point of view. I might be able to get a few people to cross over there and work at the textile factory. But that is not the problem. These things must be examined very closely and we must see that every rupee spent is well spent and that we get a return on our investment.

Even from the point of view of raw material there are no special advantages. Veyangoda does not grow any cotton. You must have sources of raw material. I do not know whether the Hon. Minister of Agriculture, Land, Irrigation and Power is pursuing his cotton project. Kirindi-oya basin is where cotton is to be grown. If he is pursuing that project then we should have cotton in about three or four years.

Before siting your factory the question of power, fuel, transport (rail or water) must be looked into very carefully and also the sources of raw material. The Hon. Minister must look into these problems if he wants to make this venture a success. As a matter of fact, we are told that at least the spinning section of the Veyangoda factory has started working. The other sections have not yet been completed I am told.

Now I want to say a word about the Sugar Factory. That is in a mess. Has the Hon. Minister come to some definite decision with regard to the taking over of the plantation too? Has the Hon. Minister of Agriculture handed over to him the plantation?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனஞயக்க)
(The Hon. Maithripala Senanayeke)

Yes, from 1st October.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

I am very glad that that has been done, and I hope that the Hon. Minister will see to it that the planting of the sugar cane is done properly, because sugar cane does not just grow of itself; you have to remove the weeds, apply fertilizer and see that the water is available.

They always speak of this question of water. When we wanted to start this factory and the plantation at Kantalai, the opposition came from the Minister of Lands and Land Development then. He says there is not enough water. I say there is enough water in the augmented Kantalai Scheme. If you do not have enough water for all, then it is necessary to see that the rice-growers are denied water in order that the sugar cane plantation may have sufficient water, because this sugar cane factory is more important for the country economically than a few acres of paddy, which you can have somewhere else.

Hon. Ministers must have a sense of proportion and know what projects should have priority over other projects, instead of coming here and saying, "For the *purana* fields we are legally bound to provide water". That type of answer is not good enough in the context of today's needs; maybe in the old days it was good enough, but when we want to be self-sufficient in our primary national needs it sometimes becomes necessary to alter old laws. If *purana* fields cannot be provided

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

with water while meeting the demands of the sugar-cane growers, then the former must give place to the latter. So valuable an asset as the Kantalai Sugar Factory cannot be allowed to deteriorate for want of cane for crushing. Laws can be amended or altered; our laws are not like the laws of the Medes and the Persians. Industrial needs must have precedence over other needs.

I do not want to say anything more. I hope the Hon. Minister will consider these matters and that Hon. Senator Sirimavo Bandaranaike will consider the question of setting up a Ministry of Industries for the Department of Industries, the Government Mineralogist's Department, the Salt Department and the Excise Department, handing over the other departments to the Minister of Home Affairs who has too much work, appointing *gramasevakas*, D. R. Os, A. G. As, Government Agents and what not.

ඇල්බට් මයා.
(திரு. அல்பேட்)
(Mr. Albert)

ගරු සභාපතිතුමනි, ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයෙන් මගේ ප්‍රදේශයට සිදු විය යුතු කටයුතු කීපයක් පිළිබඳව වචන දෙක තුනක් ප්‍රකාශ කිරීමට මා අදහස් කරනවා. ඊට වාරයක් පැමිණෙන තුරු අද පාර්ලිමේන්තුවට පැමිණි වේලේ සිට මෙතෙක් නොඉවසිල්ලෙන් බලා සිටියා. දැන් ඊට ඉඩ දීම ගැන තමුන්නාන්සේට මා ස්තුති කරනවා. මා කරුණු කීපයක් ගැනම හිත යොමු කර තිබෙනවා. මගේ ප්‍රදේශය ජනගහනය ඉතා අධික, දිළිඳු ජනකායක් ඇති, ඒ වගේම අමු ද්‍රව්‍යවලින් ගහන ප්‍රදේශයක් බව මා මීට ප්‍රථමයෙනුත් පෙන්වා දී තිබෙනවා. ගිය වාරයේ මෙම ඇස්තමේන්තුව ගැන කථා කරද්දීත් මගේ ප්‍රදේශයේ නොයෙක් තැන්වල තිබෙන අමු ද්‍රව්‍ය පිළිබඳව මා සඳහන් කළා. කර්මාන්ත ශාලාවක් පටන් ගෙන ඒ පළාතේ ගම්වැසියන්ට සුළුවෙන් ආධාර කරන ලෙස මා ගිය වරත් ඉල්ලා සිටියා. පසුගිය අවුරුද්දේ කොතෙක් කියා සිටියත් මෙතෙක් සිදු වී තිබෙන්නේ ඒ පිළිබඳව ලියුම් කියුම් හුවමාරුවක් පමණයි. ඒ ලිපිවලිනුත් අපට දැන ගන්නට ලැබී තිබෙන්නේ අප ඉල්ලා සිටි කාරණා ගැන ක්‍රියා කරගෙන යන වාය, ලිපිය ලැබුණාය යන්න පමණයි. අපේ ඇමතිතුමා කර්මාන්ත ගැන උනන්දුවක් දක්වන නමුත් එතුමාට දක්ෂ නිලධාරී පිරිසක් නැති බව කනගාටුවෙන් කියන්නට ඕනෑ. මේ රටේ ජාතික සංවර්ධනය සඳහා කර්මාන්ත දියුණු කිරීමට නම් එවැනි නිලධාරී පිරිසක් අවශ්‍යයි. මා එසේ කියන්නේ අනෙක් කරුණක් නිසා නොවෙයි. මගේ ප්‍රදේශයේ, එතුමාගේ භාරයේ තිබෙන කච්චේරිවල, ආදායම් පාලක නිලධාරීන්ගේ කාර්යාලවල, පමාව නිසා ඒ පළාත්වල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම ඇනහිටි තත්ත්වයක පවතිනවා. ඇත්ත වශයෙන්ම ඉඩම් පිළිබඳව පමණක් නොවෙයි, අනිකුත් හැම වැඩක්ම වාගේ පමා වීමට හේතුව වී තිබෙන්නේ මෙම කාර්යාලවල වැඩ කටයුතුවල ඇති ප්‍රමාදය බව ඒ නිලධාරීන් පවා පිළිගන්නවා. මේවා ගැන ගරු ඇමතිතුමාට කලින්ම මම දන්වා සිටියත් තවමත් එයට ප්‍රතිකර්මයක් යෙදී නැහැ. මා විශේෂයෙන්ම මගේ ප්‍රදේශයේ වැඩ කටයුතු ගැන කනගාටුවට පත් වෙනවා. ඒ ප්‍රදේශයේ වාසය කරන මහ ජනතාවගේ ප්‍රශ්න විසඳීම ඇනහිට තිබෙන හෙයින් ඒ ප්‍රදේශය සම්පූර්ණයෙන් අත්හැර දමා ඇති ප්‍රදේශයක් සේ හැඟී යනවා.

ගරු සභාපතිතුමනි, මා කියන්න කැමතියි, ඒ පළාත්වල ග්‍රාම සංවර්ධන සමිතිවල වැඩ කටයුතු පවා හරිහැටි කෙරෙන්නේ නැති බව. දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ ග්‍රාම සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන ලද මුදල්වලින් විශාල කොටසක් ආපසු රජයට එවීමට කටයුතු යෙදී තිබෙන බව මට ආරංචියි. නමුත් අපේ ගම්වල උදවියගේ කටයුතු සඳහා මුදල් ඉල්ලූ අවස්ථාවේදී මුදල් නැතැයි කීවා. එපමණක් නොවෙයි. මේ කටයුතු සඳහා රජයෙන් මුදල් වෙන් කරලා නැතැයි කී නමුත්, අවසාන මොහොතේදී, මුදල් ඉතුරු වී තිබෙනවාය, නමුත් මාස දෙකක් ඇතුළත දී ඒ මුදල් වියදම් කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර ගත නොහැකිය, කියා ඒ මුදල් ආපසු යැවීමට වැඩ කටයුතු සකස් කිරීම කනගාටුවට කරුණක් බව මේ අවස්ථාවේදී මතක් කළ යුතුව තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් මයා.]

එම නිසා මා විසින් සඳහන් කරන ලද මේ කාරණා ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන කරන මෙන් ඉල්ලනවා.

මගේ ප්‍රදේශයේ කම්කන්තශාලා පිහිටුවනවා නම්, ඕනෑ තරම් අමුද්‍රව්‍ය සොයා ගන්න පුළුවනි—සපයන්නට පුළුවනි. අපේ ප්‍රදේශයේ මැටි කම්කන්තශාලා සහ උළු කම්කන්තශාලා පිහිටුවනවා නම් ඒ කර්මාන්ත සඳහා හුරු පුරුදු කම්කරුවන් මගේ ප්‍රදේශයෙන් ඕනෑ තරම් සොයා ගන්න පුළුවනි. ඒ අයගේ සහයෝගය ඇතිව ඉතා දියුණු තත්ත්වයකට ඒ කර්මාන්ත පවත්වා ගෙන යන්න හැකි වෙනවා ඇති. ඒවාගේම මා කියන්න කැමතියි, බෙන්තර ප්‍රදේශයට කාඩ්බෝඩ් කර්මාන්ත ශාලාවක් පිහිටුවන ලෙස මා කලින් ඉල්ලීමක් කළා, නමුත් ඒ ඉල්ලීම මේ වනතුරුවත් ඉටු වුණේ නැහැ. ඒ කර්මාන්තය සඳහා වුවමනා කරන අමු ද්‍රව්‍ය ඉතා පහසුවෙන් අපේ ප්‍රදේශයෙන් ලබා ගන්න පුළුවනි.

ගරු සභාපතිතුමනි, මේ අවුරුද්දේ මුල් මාස කීපයේදී අපේ පළාතට මොන මොන අන්දමේ කර්මාන්ත ශාලා වුවමනාද කියා අපෙන් ප්‍රශ්න කර එව්වා. ඒ අනුව අවශ්‍ය කර්මාන්ත ශාලා පිළිබඳව පැහැදිලි විස්තරයක් යැවූ නමුත් අද වනතුරුවත් ඒ පිළිබඳව කිසිම දැන්වීමක් කර නැහැ. එම නිසා, යම් යම් අංශවල වැඩ කටයුතු කිරීමේදී යම් යම් ප්‍රමාදයන් තිබෙනවා නම් ඒවා පිළිබඳව නියම පරීක්ෂණයක් කර නිසි පරිදි ක්‍රියා කිරීමට උනන්දුවක් දක්වන ලෙස ඒ නිලධාරීන්ට අණ කරන ලෙස තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මම කියන්න කැමතියි, අපේ රටේ තේ සහ රබර්වල මිල ඉහළ නැඟ තිබුණු කාලයේ, අපේ රටට විශාල ධනයක් ගලා ආ කාලයේ, මේ රටේ සංවර්ධන කටයුතු සඳහා මුදල් වෙන් නොකිරීම නිසාත්, අපට මුදල් ඕනෑ තරම් තිබෙනවාය කියා උදන් අණමින් රටේ සංවර්ධනය සඳහා කිසිම මුදලක් වැය නොකිරීම නිසාත්, එක්සත් ජාතික පක්ෂය කළේ ජාතික අපරාධයක් යයි අපි කියනවා නම් එතරම්ම, නැති නම් එයට මදක් අඩු අපරාධයක් අප අතින් සිදු වී තිබෙන බව. ඒ මන්ද? 1956 අවුරුද්දේදී මේ රටේ මහ ජනතාව මේ රටේ ජාතික දියුණුව සඳහා ඉදිරි ගමනට පියවර තැබිය යුතු යයි විශාල උද්ඝෝෂණයක් කළා. නමුත් ඒ නැඟී සිටි ජනතාවගේ ශ්‍රමය අප අපතේ හැර තිබෙනවා. එය නොසලකා හැරීම නිසා ක්‍රම ක්‍රමයෙන් මහජන උද්ඝෝෂණය මහජන උනන්දුව නැතිවී ගියා. එහෙත් එබඳු තත්ත්වයකට පත්ව තිබියදී නැවතත් ජනතාව නඟා සිටුවීම සඳහා, නැතිනම් ජනතාවගේ ඉදිරි ගමන සඳහා, තමුන්නාන්සේ ගෙන තිබෙන පියවර ගැන, අරඹා ඇති වැඩ පිළිවෙල ගැන, සෑම දෙනාගේම සහයෝගය මෙන්ම තමුන්නාන්සේට ඒ වැඩ කටයුතු කර ගෙන යෑම සඳහා සම්පූර්ණ ධෛර්‍ය්‍ය ලැබේවා යි මා ප්‍රාර්ථනය කරනවා.

අ. භා. 6.30

ගරු සභාපතිතුමනි, රා මැදීම පිළිබඳව මන්ත්‍රීවරු කීපදෙනෙක්ම කථා කළා. එසේ නොයෙක් නොයෙක් විධියට කථා කරන්න හේතුව ගරු ඇමතිතුමාගේ සුරා ප්‍රතිපත්තිය පැහැදිලි නොකිරීමයි. අපේ ප්‍රදේශයේ විශාල ගොවි ජනතාවක් වාසය කරනවා. ඒ ගොවීන් බොහෝ දෙනකු මා කුඩා කාලයේ උදේ සිට සවස් වනතුරුම වෙල්වල වැඩ කොට ඇවිත් සවසට රා කෝප්පයක් බී ඔවුන්ගේ වෙහෙස සම්පූර්ණයෙන්ම නිවා ගත් බව මට මතකයි. නමුත් අද ඒ කාලයේ මෙන් දක්ෂ ගොවීන් නැහැ. ආහාර හිඟ වීමත්, කිතුල් ගස් මැදීමට අවසර නොදීම නිසා ගම්බද තිබූ කිතුල් රා නැති වීමත්, එවැනි දක්ෂ ගොවීන් නැති වීමට හේතු වේය කියා මම කල්පනා කරනවා. මීට කලින් බෙන්තර ඇල්පිටිය ප්‍රදේශයේ රා මැදීම කළා. එහෙත් පසුගිය අවුරුදු කීපය තුළ එය නවත්වා තිබෙනවා. ඒ ගැන ගරු ඇමතිතුමාට පැමිණිලි කරන ලෙස ඒ ප්‍රදේශයේ ජනතාව මගෙන් ඉල්ලා සිටිනවා. එම නිසා ඒ ගැන අවධානය යොමු කරන ලෙස තමුන්නාන්සේගෙන් මම ඉල්ලා සිටිනවා.

මේ රටේ සමහර නායකයන් අමද්‍යප ව්‍යාපාරය ගැන රට පුරා බෙරිහන් දෙනත් ඔවුන් මෙරට මත්පැන්වලින් නොව පිට රට මත්පැන්වලින් සංතර්පණය වන බව අප අසා තිබෙනවා. ආණ්ඩු කිරීමත් සිල් රැකීමත් වැඩ දෙකක් ලෙස සලකා මේ රටේ අවශ්‍යතාවන් අනුව කටයුතු යෙදීමට ගරු ඇමතිතුමාගේ ප්‍රතිපත්තිය සකස් කර ගන්නවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රදේශයේ යකඩ වැඩට ඉතාමත්ම දක්ෂ කම්කරු පිරිසක් සමිතියක් වශයෙන් සංවිධාන වී සිටිනවා. ඒ කම්කරුවන්ගේ සමිතියට අපි රජයේ ආධාර ඉල්ලුවා. දැන් ඒ සමිතියට සුළු සුළු ආධාර ලැබෙන්නට රජය මාර්ග සලස්වා තිබෙනවා. ඒ කම්කරුවන් ඕනෑම විදේශීය භාණ්ඩයක් සමග තරඟ කරන්නට පුළුවන් යකඩ භාණ්ඩ සෑදිය හැකි ඉතාමත් දක්ෂ කම්කරුවන් බව ප්‍රකාශ කරන්න කැමතියි. විශෙෂයෙන් ඔවුන්ට සාමාන්‍ය ගෘහොපකරණ සෑදීමට පුළුවන්කම තිබෙනවා.

මේ රටේ සංස්කෘතිය ගැනත් වචනයක් නොකියා බැහැ. සංස්කෘතික දෙපාර්ත මේන්තුව කොපමණ වැඩ කරනවාය කීවත් ජාතියේ සංස්කෘතිය පිරිහීමේ ප්‍රපාතය කරා යන බව කිය යුතුයි. අපේ චිත්‍ර සහ කලා ශිල්ප පමණක් නොව, අපේ නාට්‍ය පමණක් නොව, අපේ බාල පරම්පරාවගේ හැසිරීමත් එන්ට එන්ටම පිරිහීමට පත් වන නිසා අපේ ජාතික සංස්කෘතිය දිනෙන් දිනම පරිහාණියට යන බව ප්‍රකාශ කරන්න ඕනෑ. රටේ සංස්කෘතිය පිරිහෙන අතරම අපේ ශිෂ්ටත්වයත් පිරිහීමට පටන් ගෙන තිබෙනවා. පිට කොටුවේ නොරිස් වීදියේ පදික වේදිකාවේ තිබෙන පොත් තමුන්නාන්සේ දැක්කොත් ඒ මුළු ප්‍රදේශයම ගිනි ලෑමට තරම් ජාතික හිත් වේදනාවක් තමුන්නාන්සේට ඇති විය හැකි බව මා කියන්න සතුටුයි. සංස්කෘතික දෙපාර්තමේන්තුව මේ පිළිබඳව මේ වන තෙක් ඇස් පියා ගෙන සිටීම ලජ්ජාවට කරුණක්.

ගරු සභාපතිතුමනි, මේ රටේ කලායතන වලට ආධාර දෙන ක්‍රමය පිළිබඳවත් වචනයක් කිය යුතුයි. මගේ ප්‍රදේශයේ නමින් පමණක් කලායතන තිබෙනවා. ඒවා ආණ්ඩුවේ ආධාර මුදලත් ලබා ගන්නවා. ඒ මුදල් පාවිච්චිය පිළිබඳව කිසිම සෙවීමක් බැලීමක් කරන්නේ නැත්නම් මහජන මුදල් කාබාසිනියා නොකර ඒ පිළිවෙළට ආධාර දීම නවත්වා දැමීම වඩා හොඳ බව මම ප්‍රකාශ කරන්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, අපට ඉදිරි කාලයේදී ලක්ෂපානින් විදුලි එළිය ලබා ගන්න පුළුවන්. දැනටත් ගාලු දිස්ත්‍රික්කයට ලක්ෂපානින් විදුලි එළිය ලැබී තිබෙනවා. එම නිසා තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුව මගින් විදුලි කාර්මිකයන් පුහුණු කිරීමට යම්කිසි වැඩ පිළිවෙළක් ඇති කිරීම සුදුසු බව ප්‍රකාශ කරන්නට කැමතියි.

මගේ ප්‍රදේශයට අයිති විශාල සපත්තු කර්මාන්ත ශාලාවක් තිබෙනවා. මේ සපත්තු කර්මාන්ත ශාලාව පාලනය කරන්නේ අත්තනොමතික අන්දමටයි. මේ කර්මාන්ත ශාලාව පවත්වාගෙන යන අය හිතු හිතු ආකාරයට සේවකයන්ට පඩි ගෙවමින් කටයුතු කරන බව පේනවා. මෙහි කම්කරුවන්ට සහනයක් ලබා දෙන්නට කම්කරු ඇමතිතුමා කල්පනා කළ යුතුයි. මේ කර්මාන්තයේ දියුණුවක් බලා පොරොත්තු වෙනවා නම් මේ කර්මාන්ත ශාලාව ගරු ඇමතිතුමා අතට ගෙන ක්‍රියා කරන්න ඕනෑ. පඩි පාලක සභා ආඥා පණතට යටත් කොට හෝ මේ කම්කරුවන්ට සහනයක් ලබා දෙන්න කල්පනා කළ යුතුව තිබෙනවා.

පේස කර්මාන්තය ගැන යමක් කියන්න ඊළඟට මා කල්පනා කරනවා. දෙපාර්තමේන්තුව ගෙන යන ප්‍රතිපත්තියේ වරද නිසා අද පේස කර්මාන්තයේ දියුණුව සම්පූර්ණයෙන්ම ඇන හිටලා. 1925 සිට මේ රටේ පේස කර්මාන්තය ඉතා සීඝ්‍රයෙන් දියුණු වේගෙන ආ බව අප දන්නවා. ගාලු දිස්ත්‍රික්කයේ පවා පේස කර්මාන්තය පැතිර ගියා. නමුත් අළුතින් ඇති කරන ලද ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ඇතැම් ප්‍රතිපත්ති නිසා අද පේස කර්මාන්තයේ දියුණුව ඇන හිට ලයි තියෙන්නෙ. පෞද්ගලිකව රෙදි වියන අයට සම්පූර්ණයෙන්ම පහර වැදිලයි තියෙන්නෙ. සමුපකාර සමිති වැනි සමිති වලට ලාබ වන ආකාරයට කටයුතු කරන්ට යාමෙන් මේ තත්ත්වය ඇති වී තිබෙනවා යයි කියන්නට පුළුවනි. එවැනි සමිතිවලට සහාය දක්වනවාට මා විරුද්ධ නැහැ. නමුත් මේ ගෙනයන ප්‍රතිපත්තියේ දුර්වලකම නිසා ගෘහ කර්මාන්තයක් වශයෙන් නැගිගෙන ආ පේස කර්මාන්තයේ දියුණුව නැතිවන තැනටයි කරුණු යෙදී තිබෙන්නෙ.

ගරු සභාපතිතුමනි, පිටරට රෙදි යාර හතරකට මෙරට රෙදි යාරයක් බැගින් ගන්න ඕනෑය කියන නීතියක් මීට අවුරුදු කිපයකට උඩදී පනවන ලද බව අප දන්නවා. මේ නීතිය, "පිටරට රෙදි යාර දෙකක් ගන්නා විට මෙරට රෙදි යාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් මයා.]

තුනක් ගන්න ඕනෑය" කියා වෙනස් කරන්න ඕනෑ තරම් කල් තිබුණා. එවැනි නීතියක් සකස් නොකිරීම නිසා මෙරට රෙදි ගොඩ ගැසෙන්න පටන් ගත්තා. ගොඩගැසී දිරා ගියා. මේ රටේ රෙදි වියන්නන්ට ධෛර්‍යයක් සැලසෙන ආකාරයට කටයුතු සැලසුණේ නැහැ. දිරා යන රෙදි ඔහේ දිරා ගියා. විදෙශ රටවලින් ගෙන්වන රෙදි යම් ප්‍රමාණයක් අනුව මෙරට රෙදි ප්‍රමාණයක්ද ගැනීමට නීති පැනෙව්වාට පසුව —ඒ කියන්නේ සරොම් ආදිය හතරට එක බැගින් ගැනීමට නීති පැනවූවාට පසුව—වෙළෙන්දන් අතර එක්තරා ව්‍යාපාරයක් ආරම්භ වුණා. මෙරට රෙදි බාල බව පෙන්වීම සඳහා රුපියල් හතට ගන්නා එක රුපියල් දෙකට, දෙකයි විසිපහට ආදී වශයෙන් විකුණා දමන්නට ඔවුන් වැයම් කළා. එසේ කොට වෙනත් අයට මෙරට රෙදි මහජනයා අතරෙ විකුණන්නට බැරිවන ආකාරයට කටයුතු සැලැස්සුවා. ඒ අන්දමට මෙරට රෙදිවල තත්ත්වය පහත දැම්මා. එම වැඩ පිළිවෙළ නිසා විකුණා ගන්න බැරි වූ ලංකා සරොම් තිස් පන් ලක්ෂයක් පමණ ගොඩගැසී තිබුණු බව පසුගිය දවස්වල අපට අසන්න ලැබුණා. මෙසේ ගොඩ ගැසුණු රෙදි නියම මිලට විකුණා දීම සඳහා මගේ කොට්ඨාශයේ පිටිගල කියන හරියේ තරුණයන් කොටසක් සූදානම් වුණු බව මට මතකයි. එසේ සූදානම් වී දෙපාර්තමේන්තුවට දන්වා එවූ බවද මතකයි. නමුත් දෙපාර්තමේන්තුවෙන් පිළිතුරක්වත් ලැබුණේ නැහැ. ජාත්‍යානුරාගයෙන් යුක්තව එවැනි රෙදි තොග නියම මිලට විකුණා දෙන්නට ඔවුන් ඉදිරිපත් වුණු නමුත් දෙපාර්තමේන්තුවෙන් ඔවුන්ගේ ලිපිවලට පිළිතුරුවත් එව්වේ නැහැ. ජාතික කර්මාන්ත දියුණු කළ යුත්තේ මේ අන්දමටද? නිලධාරි මහතුන්ට වුවමනා වුවමනා විධියට කටයුතු කරන්න ඉඩ දුන්නොත් මේ තියෙන ජාතික කර්මාන්ත ටිකත් නැති වී යනවා ඇති.

ගරු සභාපතිතුමනි, මීට අවුරුදු කීපය කට පෙර මගේ කොට්ඨාශයේ මහලු නිවාසයක් ආරම්භ කරන්නය කියා එක්තරා පුද්ගලයකුට රජය මගින් රුපියල් දහ පහළොස් දහසක් වෙන්කර දී තිබෙනවා. ඒ පුද්ගලයා මැරුණා. අද මහලු නිවාසයත් නැහැ; ඒ සඳහා දුන් රුපියල් 15,000ත් නැහැ. මේ පිළිබඳව වගකිය යුත්තේ කවුරුන්ද, ඒ මුදල් අය කරගත යුත්තේ කාගෙන්ද, යන මේ කරුණු පිළිබඳව ඉතා ඉක්මනින් පරීක්ෂණයක් කරන ලෙස මම ඉල්ලා සිටි මුත්, තවමත් මට එහි ප්‍රතිඵලයක් නම් දන්වා නැහැ.

අවසාන වශයෙන් මතක් කළ යුතුව තිබෙන්නේ ග්‍රාම සේවකයින් පිළිබඳවයි. තමුන්නාන්සේලා අපි කවුරුත් පිළිගෙන තිබෙනවා, මේ රටේ ගම්මුලාදෑනි ක්‍රමය ඉතාම නරක එකක් බව. අප පමණක් නොවෙයි, මහජනයාගෙන් සියයට අනූවකටත් වඩා ගම්මුලාදෑනීන් නරක බව පිළිගෙන තිබෙනවා. කවුරුත් ඔවුන්ට දොස් කියනවා, බණිනවා. ඒ වාගේම ගම්මුලාදෑනීන් ප්‍රතිගාමී පිරිසක්ය, ඔවුන් මේ රජයේ වැඩ කඩාකප්පල් කර දමනවාය, කියන පිළිගැනීමක් රටේ තිබෙනවා. ඒ නිසා ඇති වූ මහජන විරෝධය නිසයි, ගම්මුලාදෑනීන් අස් කොට, ඒ වෙනුවට උද්‍යෝගීමත් තරුණ පිරිසක් යොදවන්ටයයි රටේ උද්ඝොෂණයක් ඇති වූයේ. යම් කිසි අන්දමකින් නැවතත් වරක් ප්‍රතිගාමී පිරිසක්ම—ගම්මුලාදෑනීන්ටත් වඩා නරක ප්‍රතිගාමී පිරිසක්—මේ අළුත් තනතුරු ලබා ගත්තොත්, දැනටත් වඩා බරපතළ තත්ත්වය කටයි ආණ්ඩුවට මුහුණ දෙන්ට වන්නේ.

එක්තරා ප්‍රදේශයක යම් කිසි පුද්ගලයෙක් ග්‍රාම සේවකයින් තෝරාගැනීම සඳහා නාම ලේඛනයක් සකස් කරගෙන යනවායයි මෙහිදී කියවුනා. අපට ලැබී තිබෙන ආරංචි අනුව, එක්සත් ජාතික පක්ෂයේ නායකයෙක් එක්සත් ජාතික පක්ෂයට හිතවත් තරුණයින්ගේ ලැයිස්තුවක් සකස් කරගෙන යනවා, එක්සත් ජාතික පක්ෂයේ ලේකම්වරයකුගේ බෑනා කෙනෙක් අධ්‍යක්ෂවරයා වශයෙන් ඉන්නවාය, ඔහු ලවා මෙය කරවාගන්න පුළුවන්ය කියා. ඔහුට මේ රටේ ඇමතිවරයාටත් වඩා බලය තිබෙනවායයි හැම තැනම ප්‍රචාරයක් ගිහින් තිබෙනවා. කටයුතු එසේ වෙද්දී හොරාට ඉස්සෙල්ලා කෙසෙල් කෑන වැට පනින්නාක් මෙන්, මේ ආණ්ඩුව දුෂණ වැඩ කරන්නේයයි ආණ්ඩුවට චෝදනා එල්ල කරනවා. දුෂණ ක්‍රියා කිරීමට අර අදින මිනිසුන්මයි, අනික් මිනිසුන්ට එම චෝදනා එල්ල කරන්නේ. එම නිසා මම ඇමතිතුමාට කියා සිටින්නේ, මේ රටේ ජන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තාව නැවතත් වරක් ගම්වල බලය ප්‍රතිගාමීන්ට දීමට කැමති නොවන බවයි. එනිසා ප්‍රගතිශීලී තරුණයන්ට ඒ බලය පැවරීමට ඇමතිතුමා උද්‍යොගිමත් වේයයි මම විශ්වාස කරනවා. ඒ තනතුරු සඳහා දේශපාලන පක්ෂවලට සම්බන්ධ පුද්ගලයින් පත් කරන්න කියා නොවෙයි, මා කියන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ වේවා, එක්සත් ජාතික පක්ෂයේ හෝ වේවා, ලංකා සමසමාජ පක්ෂයේ හෝ වේවා, කොමියුනිස්ට් පක්ෂයේ හෝ වේවා, අය පත් කරන්නය කියා මම කියන්නේ නැහැ. මේ රටේ ජනතාවගේ සිත් මෙතෙක් කල් රිදවූ ගම්මුලාදැනීන් ඉවත් කොට, ජනතාවගේ යහපත සඳහා, මේ රටේ ශුභ සිද්ධිය සඳහා, කටයුතු කරන ප්‍රගතිශීලී තරුණයින්ම ඒ තනතුරුවලට පත් කරන මෙන් මම ඉල්ලා සිටිනවා. එසේ නැතුව කලින් සිටි ප්‍රතිගාමීන්ම මේ තනතුරුවලට නැවතත් පත් වුවහොත්, මේ රටේ අනාගතය අන්ධකාර වෙනවා; මේ රජයේ අනාගතයත් අන්ධකාර වෙනවා; එමෙන්ම මේ රටේ ප්‍රගතිශීලීන්ගේ අනාගතයත් අන්ධකාර වෙනවා.

මගේ ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරී කායාලයෙන් මෙන්ම ගෘහකර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් පත් කර සිටින නිලධාරීන්ගේ කටයුතු පිළිබඳව මම ලියුම් කීපයක්ම යවා තිබෙන නමුත්, ඒ පිළිබඳව මට කිසිම උත්තරයක් ලැබී නැහැ. උත්තරයක් ලැබුණත් කියන්නේ ඒ පිළිබඳව කටයුතු කිරීම සඳහා දිසාපතිතුමාට නැති නම් අධ්‍යක්ෂවරයාට එය යැවීමය කියායි. ඉන් එහාට කිසිම පිළිතුරක් නැහැ. පසු ගිය ජනවාරි මාසයේ සිට පසු ගිය මාසය දක්වා යැවූ ලිපිවලට මේ වන තුරු පිළිතුරු ලැබුණෙ නැහැ. මීට වඩා යමක් කීමට මා බලාපොරොත්තු වන්නෙ නැහැ. මේ කරුණු තමුන්නාන්සේගේ සැලකිල්ලට භාජන කරනවා ඇත කියා බලාපොරොත්තු වෙමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 6.45

ආර්. ජී. සේනානායක මයා. (දඹදෙණිය)
(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)
(Mr. R. G. Senanayake—Dambadeniya)

ගරු සභාපතිතුමනි, අපේ කර්මාන්ත ඇමතිතුමාගේ වැය ශීර්ෂය දෙස බලන විට එතුමාට වැඩ රාශියක් භාර දී තිබෙන බව අපට පෙනී යනවා. මා පමණක් නොව, මට පෙර කථා කළ සෑම ගරු මන්ත්‍රීවරයකුගෙන්ම වාගේ ඒ බව කියවුණා. වැඩ කටයුතුවල සම්බන්ධතාවක් නැති, එකක් අනෙකට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ වැඩ තිබෙන එම අමාත්‍යාංශය හරියටම පිස්සිගේ පළා මල්ල වාගේ බව අපි කවුරුත් පිළිගන්න ඕනෑ. ඒ මල්ලෙ අහසේ තරුත් තිබෙනවා; මුහුදෙ මඩත් තිබෙනවා. එතුමාට සංස්කෘතික වැඩත් තිබෙනවා, කර්මාන්තත් තිබෙනවා, මූලාදැනීන් පිළිබඳ කටයුතුත් තිබෙනවා, ඒ වාගේම අමද්‍යප වැඩත් තිබෙනවා, අධ්‍යාත්මික වැඩත් තිබෙනවා. නැති දෙයක් නැහැ. එකිනෙකට ප්‍රතිවිරුද්ධ කටයුතු රාශියක් තිබෙනවා.

අද කසිප්පු ව්‍යාපාරය ගැන මෙම ගරු සභාවේදී සෑම මන්ත්‍රීවරයකුගෙන්ම වාගේ ප්‍රකාශ වුණා. කසිප්පු කාරයන්ට දිවා සැප ලැබෙනවා. නමුත් නිවන් පතාගෙන සිටින භික්ෂූන් වහන්සේලා මර්දනය කරනවා. ඔය විධියට බලන විට, කසිප්පු වර්ධනයයි, භික්ෂු මර්දනයයි එකාකාරව එතුමාට කරන්න සිද්ධ වී තිබෙනවා. කර්මාන්තත් තිබෙනවා; ඉන්ද වැඩත් තිබෙනවා. මේ විධියට මේ සියලුම වැඩ කරගෙන යාමේදී එතුමාට අමාරුකම් ඇති වන බව අප පිළිගන්න ඕනෑ.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

කරුණා කර නිශ්ශබ්ද වන්න. කථානායකතුමා දැන් මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසන යෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා මූලාසනා රූඪ විය.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

කෙසේ වුණත්, ඉතාමත්ම වැදගත් අංශයක් එතුමාට භාර වී තිබෙනවා. එනම් මේ රටේ කාර්මික යුගයක් පාලනය කිරීමයි. මෙපමණ කාලයක් තිස්සේ මේ රටේ යම් කිසි ජීවන තත්ත්වයක් පැවතුණා නම් ඒ, සම්පූර්ණයෙන්ම ගොවිතැන්වලින් ලැබුණ ආදායම අනුව පමණක්ම බව අපි කවුරුත් දන්නවා. තේ රබර් සහ පොල්වලින් මේ රටේ සම්පූර්ණ පාලන වියදම දැරුණු බව අපි කවුරුනුත් අවිවාදයෙන් පිළිගත යුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

දෙයක්. ඒ වාගේම අපි ඊට වැඩි පියවරක් ගෙන දුප්පත් මහජනයාගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට නම් මේ රටේ කාර්මික යුගයක් ඇතු කළ යුතු බව නැවත ප්‍රශ්නයක් නැතිව කවුරුත් පිළිගන්න කරුණක්. ඒ තමයි ඉතාමත් වැදගත් අංශය. ඔය විධියට එතුමාට තවත් වැඩ රාශියක්ම පැවරී තිබුණත්, මේ කාරණාව ගැනම එතුමාගේ මුළු කාලය යොදා කට යුතු කිරීමෙන් ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් වැඩි කල් යන්න මත්තෙන් රටට සහනයක් ලබා දෙන ලෙස එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

කාර්මික වැඩ පිළිවෙළක් යෙදීමට නම් මූලික පරමාර්ථයක් අනුව වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. කම්කාරී යුගයක් ඇති කිරීමේදී පරමාර්ථ දෙකකින් ඒ වැඩ පිළිවෙළ සකස් විය යුතුයි. ඇතැම් රටවල කම්කාරී යුගයක් ආරම්භ කිරීමේදී මූලික වශයෙන් කරන්නේ, විදේශික රටවලින් ඒ රටවලට ගෙන්වන බඩු සහ ද්‍රව්‍ය නවත්වා ඒවා ඒ රටවල නිෂ්පාදනය කරන්න සැලැස්වීමයි. ඒ රටවල රැකීරක්ෂා නැති ප්‍රශ්නයත් තද බදයක්ත් නොතිබේ නම් අර ප්‍රශ්නය පමණක් ගැන ක්‍රියා කළාට කමක් නැහැ. නමුත් මේ රටේ තවත් ප්‍රශ්නයක් තිබෙනවා. රැකීරක්ෂා නැති අයගේ ප්‍රශ්නයයි ඒ. ඒ නිසා නිෂ්පාදනය වැඩි කිරීම සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් සකස් කරන විට පුළුවන් තරම් පිරිසකට රැකීරක්ෂා ලැබෙන විධියට ඒ වැඩ පිළිවෙළ සකස් කිරීම ගැන සැලකිල්ලක් දක්වන මෙන් තමුන්නාන්සේට උපදෙසක් දෙන්න කැමතියි. විශාල මෝලක් ඇති කළ තරමින් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්න බැරි බව තමුන්නාන්සේ දන්නවා. ඒ ප්‍රශ්නයට නියම පිළිතුරක් එයින් ලැබේය කියන්න බැහැ. පිටරටින් එන බඩු නම් නවත්වන්න පුළුවන් වේවි. නමුත් එයින් රැකීරක්ෂා නැතිකම පිළිබඳ ප්‍රශ්නය තවත් උග්‍ර වෙන්න පිළිවන් බව කල්පනාවට ගත යුතුයි. මගේ මේ තර්කය උදාහරණයකින් පැහැදිලි කරන්න පුළුවනි. දැන් යන්ත්‍ර 30,000 කින් පමණ රෙදි වියන බව කවුරුත් දන්නවා. එසේ වෙතත් ඒ මගින් කෙරෙන නිෂ්පාදන ඒ තරම් දියුණු නැති බවත් පිළිගන්නට ඕනෑ. ඒ නිසා නිෂ්පාදනය වැඩි කරන අදහසින් ලොකු මෝලක් ඇති කළොත් සමහර විට කුඩා යන්ත්‍ර 30,000 කින් සුමාන තුන හතරකින් නිෂ්පාදනය කරන ප්‍රමාණය ඒ ලොකු මෝලෙන් එක් දිනකදී නිපදවන්න පුළුවන් වෙන්ට ඉඩ තියෙනවා. එසේ කරන්ට කලින් මෝලෙන් කීදෙනෙකුට වැඩ දිය හැකිද කියා කල්පනා කරන්ට ඕනෑ. කුඩා රෙදි මෝලක වැඩ කිරීමෙන් කොයි තරම් පිරිසක් යැපෙනවාද කියාත් කල්පනා කර බලන්ට ඕනෑ. එසේ කර, කර්මාන්තයක් අලුතින් ඇති කරන්ට කලින් සොයා බැලිය යුතු වැදගත් කරුණු ගැන සොයා බලන ලෙසත්, දැනටමත් රක්ෂාවල් ඇතිව සිටින අයගේ රක්ෂාවල් නැති වී යන වැඩ පිළිවෙළක් ඇති කිරීම නිසා සිදු වියහැකි හානිය ගැන කල්පනා කරන ලෙසත්, රක්ෂාවල් තිබෙන උදවියගේ රක්ෂා නැති කර නිෂ්පාදනය පමණක් වැඩි කිරීම ගැන ක්‍රියා නොකරන ලෙසත් බැගෑපත් ලෙස මතක් කරන්ට කැමතියි.

මුලින්ම තිබෙන්නේ පුළුවන් තරම් වැඩි සංඛ්‍යාවකට රක්ෂාවල් දෙන ක්‍රමයක් ඇති කිරීමයි. ඒකත් උදාහරණයකින් පැහැදිලි කරන්නම්. රුපියල් දෙතුන්දහක වියදමින් පිහිටුවා ගත් වී මෝල්වලින් විශාල පිරිසක් ජීවිකාව කරගෙන යන බව තමුන්නාන්සේ දන්නවා. ඒ අයට යම් මුදලක් හම්බකර ගන්ට ඒ මෝල් උපකාර වෙනවා. විශාල මෝලක් ඇති කළොත් අවට තිබෙන මෝල් සියල්ලම වැසී යන්ට පුළුවනි. ඒ විශාල මෝලෙන් විශාල වැඩ කොටසක් කරන්ට පුළුවන් බව අපි දන්නවා. කුඩා මෝල් දාහකින් කෙරෙන වැඩ එක් මෝලකින් කෙරෙන තරම් විශාල මෝලක් ඇති කරන්ට බැරි නැහැ. නමුත් එයින් කී දාහකට රක්ෂාව නැති වෙයිද? ඒ නිසා නිෂ්පාදනය වැඩි කිරීම ගැන පමණක් සලකා කර්මාන්ත යුගය ආරම්භ කරන්ට එපා යයි අවවාද කරන්ට ඕනෑ. මේ කාරණය ජපන් රටට ගිය අවස්ථාවේ මට හොඳාකාර අවබෝධ වුණා. බටහිර රටවල ප්‍රතිපත්තිය වී තිබෙන්නේ පුළුවන් තරම් ලොකු මෝල් ඇති කිරීමයි. ආසියාවේ ක්‍රමය නොවෙයි ඒ අය අනුගමනය කරන්නෙ. කුඩා මෝල් සියල්ල ඒකාබද්ධ කර ඒ වෙනුවට විශාල මෝලක් ඇති කිරීම බටහිර ජනාකීර්ණ රටවල ප්‍රතිපත්තියක් හැටියට තිබේතත් ජපන් රට අනුගමනය කරන්නේ ඊට සම්පූර්ණ ප්‍රතිවිරුද්ධ මාර්ගයක් බව මට පෙනී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගියා. එහි විශාල මෝලක් තිබෙනවා නම් එය කඩා ඒ වෙනුවට එහි වැඩ රට පුරාම විහිදී යන ආකාරයට කුඩා කර්මාන්තශාලා ඇති කිරීමයි කෙරෙන්නෙ. එසේ කිරීමෙන් විශාල පිරිසකට රක්ෂාවල් ලබා ගන්ට පුළුවන් වෙනවා. යකඩ, වානේ ආදි දේවල් සාදන විශාල කර්මාන්තශාලා කුඩා කොටස් වලට හරවා ටොන් දහය පහළොව, විස්ස, තිහ ආදි වශයෙන් කුඩා ප්‍රමාණයන් නිපදවන කුඩා ආයතන හැදීමයි ඒ අය කරන්නෙ. ඒ ගැන ඒ අයගෙන් ප්‍රශ්න කරන විට ඊට පිළිතුරු වශයෙන් ඒ අය මා සමග කීවෙ, "අපි මේ ප්‍රතිපත්තිය පිළිගත්තෙ යුද්ධ කාලෙ අපේ කර්මාන්ත මධ්‍යස්ථාන සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීමේ උපායක් හැටියටයි" කියලයි. යකඩ හෝ වානේ නිපදවන විශාල කර්මාන්ත ශාලාවක් එක තැනක පමණක් තිබුණා නම් සතුරන් විසින් හෙළනු ලබන බෝම්බයකින් එය විනාශ වුණොත් එයින් මුළු රටටම විශාල පාඩුවක් දැනෙනවා පමණක් නොව සමහරවිට මුළු රටටම ඒ කර්මාන්තය නැති වී යන්ටත් පුළුවන්. රට පුරාම කුඩා කර්මාන්තශාලා තිබෙන විට ඒ හැම එකක්ම එක් වරම විනාශ වන්නෙ නැහැ. යුද්ධ කාලේ ආරක්ෂාව සඳහා ඇති කළ වැඩ පිළිවෙළ ඒ අය දැන් දිගටම ක්‍රියාවේ යොදනවා.

සෑම ව්‍යාපාරයක්ම මේ ආකාරයටයි මේ උදව්ය බෙදාගෙන යන්නේ. ජපන් රටේ රෙදි නිපදවන කම්හලක් බැලීමට මම එක දවසක් ගියා. විශාල කම්කරු පිරිසක් වැඩ කරන ගොඩනැඟිලිවල විශාල යන්ත්‍ර මාර්ග යෙන් රෙදි වියනවා බලන්ටයි, මා බලා පොරොත්තු වූයේ. නමුත් මෙම ස්ථානය පෙන්වීමට මා සමග ගිය තැනැත්තා මා ගෙන ගොසින් බැස්සුවේ එක ගම්මානයක ටයි. රෙදි නිපදවීම පිණිස ඒ ගමේ තිබුණ සෑම ගෙදරකම පාහේ ඉලෙක්ට්‍රික් යන්ත්‍ර තිබුණා විනා විශාල කම්හල් දකින්ට තිබුණේ නැහැ. ඒ නිසා මෙවැනි විශාල කර්මාන්තයක් වුවද ක්‍රමවත් අන්දමකට බෙදා, පතුරුවා හැර, නවීන යුගයේදී ක්‍රියාවේ යොදවන්නට පුළුවන් බව මෙයින් පැහැදිලිව පේනවා ඇති.

මෙය මේ අන්දමට කරන්න පුළුවන් වන්නේ විදුලි පහසුකම් සෑම ගෙදරකටම පාහේ පහසු මිලකට ලබා දුන්නොත් පමණයි. එවැනි වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යෙදෙව්වොත්, සෑම ගෙදරක්ම කුඩා කම්හලක තත්ත්වයට පරිවර්තනය කරන්න පුළුවන්. ඒවාට යෝග්‍ය සුළු යන්ත්‍ර ආදිය බහුල වශයෙන් පතුරුවා හැරීමට විධිවිධාන සලස්වන්න ඕනෑ. ඒ නිසා විශාල කර්මාන්තයක් වුවද මේ විධියට පතුරුවා හැර සාර්ථක අන්දමට කර දෙන්ට පුළුවන් වන පරිදි අළුත් උපකරණ ආදිය සැපයීම ගැනත් තමුන්නාන්සේ ටිකක් කල්පනා කර බලන්න ඕනෑ.

මෙපමණ කල් කම්හල් තිබුණාවක් යන වචනය පාවිච්චි කළාම අපි කල්පනා කළේ කම්කරුවන් රාශියක් එකතු වී විශාල ගොඩනැඟිලිවල විශාල යන්ත්‍ර මගින් කරනු ලබන්නාවූ ව්‍යාපාරයක් ගැනයි. නමුත් ජපානය වැනි දියුණු රටක රෙදි කර්මාන්තය වැනි දියුණු කර්මාන්තයක් මේ අන්දමට ගෙයක් පාසා පවුලේ සිටින අඹු දරුවන්ද එකතු වී වැඩ කටයුතු කරන කුඩා කම්හල් ඇති කිරීමෙන් පෙනී යන්නේ, කේතරම් සාර්ථක අන්දමට ජල විදුලි පහසුකම් සපයා දීමෙන් මෙය කළ හැකිද කියායි. ජල විදුලි පහසුකම් සපයා දීම සම්බන්ධයෙන් අප රටේ අද පවතින තත්ත්වය කුමක්ද? අපේ රටේ ජනතාවට ජල විදුලි පහසුකම් සපයා දී තිබෙනවාද? එසේ නැත්නම් මේවා පාවිච්චි කිරීමේ ක්‍රම පිළිබඳව හෝ මේ රටේ ශිෂ්‍යයින්ට ඉගැන්වීමේ පහසුකම් යොදා තිබෙනවාද? අප අපේ රටේ බොහෝ කලක සිටන් සෑම තැනකම වාගේ විදුලි කම්බි අදිනවා. නමුත් මෙතරම් විශාල වූත් වැදගත් වූත් මෙම බලවේගය පාවිච්චි කරන්නේ කුමන දේවලටද කියා අපි කල්පනා කර බලන්න ඕනෑ. කඩ මණ්ඩිවලට එළිය සැපයීමට පමණක්ද අපි විදුලි බලය යොදවන්නේ? ඒ නිසා විදුලි උපකරණ පාවිච්චි කිරීම පිළිබඳව පුළුවන් සෑම ධෛර්යයක්ම අපේ රටවැසියන්ට ලබා දෙන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ අන්දමට රට පුරාම විදුලි පහසුකම් ඇති කොට ඒ මගින් මෙම ප්‍රශ්න විසඳීමට උත්සාහ කරනවා විනා විශාල මෝල් පිහිටුවා රට සවංර්ධනය කිරීමට සිතුවොත් තමුන්නාන්සේලාගේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳේවිය කියා හිතන්න එපා.

ලොකු මෝල් පිහිටෙව්වාම බාග වෙලාවට මේ රටේ රක්ෂා නැති අයගේ ගණන දැනට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

වඩා වැඩි වන්ට පුළුවනි. ලොකු රෙදි මෝලක් පිහිටෙවූ විට ගම්බදව පේශ කම්කරුවන් දිවි රැක ගන්න 30,000 කට සිදු වන්නේ මොකක්ද? ගම්බද ගෘහ කර්මාන්තයක් වූ රෙදි විවීමේ ව්‍යාපාරයට පහර වැදුණොත් සිදු වන්නේ මොකක්ද? කම්කරුවන් 200කට, 300කට මහ මෝලේ රක්ෂාව ලැබෙනවා ඇති. ඒ අතර 30,000 කට රක්ෂා නැතිව යනවා ඇති. එම නිසා මේ මහ මෝල්වලින් මහ fපැක්ටරිවලින් සිදුවන විපාක ගැනත් කල්පනා කර බැලිය යුතුයි.

ජපන් රටේ මෙන් ගම්බදවත් නිෂ්පාදනය දියුණු කළ යුතුයි. නගරවලට පමණක් නිෂ්පාදනය සීමා කිරීම වැරදියි. දැනට නගරවල විශාල මෝල් ඇති කොට තිබෙනවා. කර්මාන්තශාලා පිහිටුවා තිබෙනවා. නමුත් ගම්බදව සිටින්නාට ජීවිකා වෘත්තිය සඳහා තිබෙන්නේ කුඹුරු ගොවිතැන පමණයි. ඒ ගොවි ජනතාවත් මෙම කර්මාන්තවලට හවුල් කර ගැනීමේ මාර්ගයක් තවම තිබෙනවාද? ගම්බද ජනතාවගෙනුත් කර්මාන්ත නිෂ්පාදනයක් ඇති කරවීමට වැඩ පිළිවෙළක් යෙදීම ඉතාමත්ම අවශ්‍යයි. දැන් විදුලි බලය ලැබෙනවා. එම නිසා කාර්මික යුගයේ කොටස්කරුවන් වීමට ගම්බද ජනතාවටත් අවස්ථාව සලසා දිය යුතුයි. දැන් සිටම විදුලි බලය ලබා දී උපකරණ ලබා දී විශේෂ දැනුමක් ලබා දී ඒ අයත් කාර්මික යුගයේ කොටස්කරුවන් කරගත යුතුයි. සෑම කර්මාන්තයක්ම නගරවලට උදුරාගෙන එන්නේ නැතිව ගම්බද ජනතාව ලවාත් කාර්මික නිෂ්පාදනය ඇති කරවීමට වැඩ පිළිවෙළක් යෙදිය යුතුයි. ඒ සඳහා විශාල අරමුදල් වුවමනා නැහැ. විදුලි බලය ලබා දී ආධාර මුදල් දී මාර්ගය පෙන්වුවහොත්, උපකරණ පාවිච්චිය පුහුණු කරවුවහොත්, ගම්බද ජනතාව කාර්මික නිෂ්පාදනයෙහි යෙදෙනවා ඇති. සුළු ආධාරයක් දෙන කොට හැම දෙනාම ඒ සඳහා ඉදිරිපත් වී කාර්මික භාණ්ඩ නිෂ්පාදනයෙහි යෙදෙනවා ඇති.

රටක නිෂ්පාදනය ඇති වන්නේ මහ මෝල්වලින් පමණක් නොවෙයි. ගංගා පිරෙන්නේ උල්පතින් එන වතුරෙන් පමණක් නොවෙයි. උල්පතින් එන ජලයට අහසින් වැටෙන වැහි බිංදුත් එකතු වෙලයි, ගංගා පිරෙන්නේ. වැහි බිංදු එකතු වීමෙන් ගංගා පිරෙන්නාක් මෙන් කුඩා කර්මාන්ත එකතු වීමෙන් කාර්මික නිෂ්පාදනයෙන් රට පොහොසත් වෙනවා ඇති. එංගලන්තය ඇමෙරිකාව වැනි රටවල් දෙස බලා මෙහි මහ fපැක්ටරි පිහිටුවා අපේ තත්ත්වය දැනටත් වඩා හීන කරවන්න එපා. එය යුක්තියට වඩා අයුක්තියක් වෙනවා. ඒ රටවල තිබෙන්නේ මේ රටට වඩා වෙනස් තත්ත්වයක්. ඒ රටවල මේ රටේ මෙන් ජනගහනය අතින් තදබදයක් නැහැ. මේ රටේ ජනතාව දුප්පත් වන්නා වාගේම ජනගහනය අතින් තදබදය වැඩියි. එම නිසා අතින් කරන වැඩ ටික යන්ත්‍රවලට භාර දුනහොත් ඒ දුප්පත් ජනතාවගේ බඩට ගැසීමක් වෙනවා නේද? ජපන් රටේ ජනගහනය අතින් තදබදයක් පවත්නා සේම මේ රටේත් ජනගහනය අතින් තදබදයක් පවතිනවා. ඇත්ත වශයෙන්ම ජපන් රටේ මේ රටටත් වඩා ජනගහනය පිළිබඳ තදබදයක් තිබෙනවා. ඒ ගැන සලකා තමන්ගේ රටට ඔබින අයුරු ඒ රට කාර්මික නිෂ්පාදනයට බැස තිබෙනවා නේද? අපට එයින් ආදර්ශයක් ගන්ට පුළුවන් නේද? ඇමෙරිකාවේ තිබෙන මහ මෝල් බලා ඒ අනුව හෝ ස්විට්සර්ලන්තයේ තිබෙන මහ මෝල් බලා ඒ අනුව හෝ ජර්මනියේ තිබෙන මහ මෝල් බලා ඒ අනුව හෝ මෙහිත් මහ මෝල් පිහිටුවා කර්මාන්ත සංවර්ධනය කරන්ට යෑමේ විපාක අධිකයි. එයින් නිෂ්පාදනය වැඩි වන බව ඇත්තයි. එහෙත් ඒ ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් විශාල පිරිසකට රක්ෂා නැතිව යනවා; විශාල පිරිසක් දුකට පත් වෙනවා. එම නිසා කර්මාන්ත යුගයක් බිහි කරන්ට ගරු ඇමතිවරයාට වුවමනාවක් තිබෙනවා නම් ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රමය ගැන බුද්ධිමත් තීරණයකට එළඹිය යුතුයි. අනික් රටවල් කෙරූ පලියට, වෙනත් රටවල තිබුණු පලියට, එහෙදි දැක්ක පලියට පිටරටවලින් දෙන පලියට ඒවා මෙරට පිහිටුවන්නේ නැතිව අපේ ප්‍රශ්නයත් ඒ රටේ ප්‍රශ්නයත් එක වගේද නැත්නම් විශෙෂයක් තිබෙනවාදැයි කල්පනා කර බලා අපේ රටේ කම්කරු යුගයක් ඇති කරන්ට තමුන්නාන්සේ මහන්සි ගත යුතු බවත් මතක් කරන්න ඕනෑ. ඒ වගේම තවත් කාරණයක් කිවයුතුව තිබෙනවා. කම්කරු දියුණු කිරීමට ඇති අමාරුවක් වශයෙන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෙන්වා දෙන්නේ මුදල් හිඟකමයි. ආණ්ඩුවෙන් හැම කර්මාන්තයක්ම පටන් ගන්න අදහස් කරනවා. නමුත් කරන්න පුළුවන්ද? බැහැ. තමුන්නාන්සේලා පෞද්ගලික ව්‍යාපාරවලට ආධාර උපකාර දෙනවා නම් ඒ තරම් මුදලක් නැතත් කර්මාන්ත දියුණු කරන්න පුළුවනි. සුළු ධනපතියන් එකතු කරගෙන ඒ අයගේ ධනය ප්‍රයෝජනවත් වන ආකාරයට යොදවන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන් බව මතක් කරන්නට කැමතියි.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)
ඒක තමයි, අපේ ප්‍රතිපත්තිය.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
අසුවල් කර්මාන්තයට බලපත්‍ර දෙන්නේ මෙපමණයි, යන විධියේ සීමාවක් කර තිබෙනවා. යම් කෙනකුට පැන්සල් කර්මාන්තයකට බලපත්‍රයක් දුන්නා නම්, තවත් කෙනකුට අවුරුදු 5ක් 6ක් යනතුරු එවැනි කර්මාන්තයකට බලපත්‍රයක් දෙන්නේ නැතිව ඔහුට තනි බලය පාවිච්චි කරන්න ඉඩ දෙනවා.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)
එහෙම එකක් නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
නමුත් පැක්ටරි ඇති කිරීම සීමා කර තිබෙනවා. පැන්සල් සාදන පැක්ටරි තිබෙන්නට ඕනෑ දෙක තුනක් පමණයි, ඊට වඩා ඇති කරන්නට ඉඩ දෙන්න බැහැ, යන විධියේ සීමා කිරීමක් ඇති කර තිබෙනවා. ඔය ආකාරයට නොයෙක් අංශ සඳහා බලපත්‍ර දීම සීමා කර තිබෙනවා. බලපත්‍ර ඉල්ලා ලබා ගන්නට බැරි වූ බොහෝ දෙනෙක් ඉන්නවා. ඊට හේතුව කුමක්ද? මේ කර්මාන්තය අසුවල් අසුවල් පුද්ගලයන් පටන් ගෙන තිබෙනවා, අසුවල් කොම්පැනිය පටන් ගෙන තිබෙනවා, එම නිසා තවත් කෙනෙකුට එය පටන් ගැනීමට බලපත්‍ර දීම තව අවුරුදු 10ක් යනතුරු සුදුසු නැත, යන විධියේ අදහසක් අනුව වැඩ පිළිවෙළක් දැනට ගෙන යනවා. එය ඇමතිවරයාගේ ක්‍රමය නොවන්නට පුළුවනි. එහෙත් තමුන්නාන්සේගේ නිලධාරීන් ගෙනයන වැඩ පිළිවෙළ ඒකයි. මේ බලපත්‍ර ලබාගත් අය කවුද කියා සොයා බැලුවොත් තමුන්නාන්සේ පුදුම වේවි. නොයෙක් නොයෙක් කර්මාන්ත සඳහා බලපත්‍ර විශාල තොගයක් ලාංකිකයන්ගේ නම් ඉදිරිපත් කර ලබාගත් විශාල ඉන්දියානු ධනපතියන් දෙතුන් දෙනෙක් සිටිනවා. එක් අයෙක් පැන්සල් සාදන්නටත්, තව කෙනෙක් පැන්තල සාදන්නටත්, තවත් කෙනෙක් රෙදි සාදන්නටත් බලපත්‍ර ලබාගෙන තිබෙනවා. මේ විධියේ ඉන්දියානු කාරයින් තුන් දෙනකු සිටිනවා. මේ ගැන හාරා අවුස්සා බලන්න. පෙනෙන්නට තිබෙන්නේ ලාංකික නම් වුවත් මුදල් ඉන්දියන් කාරයින්ගේ. ඒ උදවිය මේ රටේ කාර්මික අනාගතය උගසට ගෙන අනික් අයට එය සීමා කර තිබෙනවා. ඒ අයට මෙය වෙන් කර තිබෙන නිසා තවත් පළල් කරන්නට පුළුවන්කමක් නැහැ. අවුරුදු 5ක් යනතුරු අළුත් බලපත්‍ර වෙන අයට දෙන්නේ නැහැ. නම නම් සිංහල, නමුත් යටින් තිබෙන්නෙ ඉන්දියන් කාරයින්ගෙ අයිතිවාසිකම්.

ගරු ද සොයිසා සිරිවර්ධන
(கௌரவ டி சொய்ஸா சிரிவர்தன)
(The Hon. de Zoysa Siriwardena)
ඒත් ලංකාවෙන් මුදල් පිටරට ගෙන යන්ට ඉඩ දෙන්නේ නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
මුදල් පිටරට ගෙන යාම ලොකු අමාරු කාරියක්ද? ඉන්දියාවට මුදල් යැවීම මහා අමාරු කාරියක්ද? ඉන්දියාවට මුදල් යැවීම ලෙහෙසි කාරියක් බව තමුන්නාන්සේලා කවුරුත් දන්නවා. එතැන නොවෙයි ප්‍රශ්නය. අපි ආරම්භ කරන කර්මාන්තවල ඇත්ත වශයෙන්ම කොපමණ ලාංකිකයන් යෙදී සිටිනවාදැයි මදක් හිතා බලන්න. කනගාටුයි කියන්න, මේ රටේ කර්මාන්ත ආයතනවල වැඩි වශයෙන් සිටින්නේ විදේශිකයනුයි. අන්න ඒ කාරණය ගැන තමුන්නාන්සේට තර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

යේම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම දැනට දී තිබෙන පර්මිට් ක්‍රමය ගැන ඉතා පරීක්ෂාවෙන් සලකා බලනවා නම් හොඳය කියා පෙන්වා දීමට පුළුවනි.

ගරු සභාපතිතුමනි, එක්තරා කාලයකදී ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා කෙරෙහි මගේ තද විශ්වාසයක් තිබුණා. මේ ව්‍යාපාරය ඉතාමත්ම වටිනා ව්‍යාපාරයක් බව මතක් කළ යුතුව තිබෙනවා. තමුන්නාන්සේ දන්නවා ඇති නිදහස ලබා ගැනීම සඳහා මේ රටේ ජනතාව එක්තරා සටනක් ගෙන ගිය බව. නුමුත් ලබා ගත් නිදහස කුමක්ද? විදේශීය තනි පාලනයක් ගෙන ගිය ආණ්ඩු කාරයකුගෙන් මේ රට නිදහස් කර ගත්තා පමණයි. එසේ නිදහස් කරගෙන භාර දුන්නේ කාටද? මහජනයාගෙන් පත්වන මහජන මන්ත්‍රී මණ්ඩලයකට මේ රටේ පාලන බලය භාර දුන්නත් නියම වශයෙන්ම මේ රට විශේෂයෙන් අපේ ගම්බද ජනතාව නිදහස් වුණාදැයි කල්පනා කර බලන්න. සුදු අධිරාජ්‍යවාදීන්ගේ පාලන සමයේදී මේ රට පාලනය වූයේ පෞද්ගලික නිලධාරීන්ගේ මාර්ගයෙනුයි. නුමුත් එදා මෙන්ම අදත් පාලනය ගෙන යන්නේ ඒ ආකාරයටයි. මහජන මතය විමසන්නට අද මාර්ගයක් තිබෙනවාද?

ගම්බද මහජනතාව වෙනුවෙන් අපි නොයෙකුත් විධියේ පණත් ඉදිරිපත් කරමින්, මුදල් වෙන්කරමින්, නිලධාරීන් පත් කරමින් කරන්නට අදහස් කරන්නේ ගම්බද ජනතාවට සේවයක්. නුමුත් මේවායින් ගම්බද ජනතාවට සේවයක් වනවාද කියා සොයා බැලීමට තිබෙන්නේ කුමන මාර්ගයක්ද? ගමේ ඕනෑ එපාකම් ගැන, ගමට සිදු වී ඇති සේවය ගැන කථා කරන්න කාටද පුළුවන්? ගමේ මුදලාලිට පුළුවන්ද? ගමේ මුලාදැනියාට පුළුවන්ද? එහෙම නැත්නම් ගමේ ඉඩම් හිමියාට පුළුවන්ද? එසේත් නැත්නම් ගමේ ස්වාමින්වහන්සේට පුළුවන්ද? ඇත්ත වශයෙන්ම තම අදහස් උදහස් දැක්වීමට ගමට සමිතියක් තිබිය යුතුමයි. අප මේ ගරු සභාවේ යෝජනා කරන යම් යම් වැඩ පිළිවෙලවල් නියම අන්දමින් ක්‍රියාත්මක වෙනවාද කියා බලනන්ට එක්තරා සභාවක් තිබිය යුතුයි. ගමින් නැගෙන හඬ මේයයි කියා, ගමේ ඇතිවන වාද විවාද මේවාය, කියා අවබෝධ කරගෙන වැඩ කටයුතු කරන්නට ඕනෑ. එතකොට තමයි, අපට ලැබුණ නිදහස, හෙවත් මහා ආණ්ඩුවට ලැබුණ නිදහස ගමටද අයිති වෙන්නේ එදා ගම්වල තනි හිතුවක්කාර නිලධාරී පාලන ක්‍රමයක් ගෙන ගියා නම් අදද ගම්වල පවතින්නේ එබඳුම පාලන ක්‍රමයක්. මේ ක්‍රමය කෙළවර කිරීමට මේවා විවේචනය කිරීමට ගමේ සභාවක් ඇති කරන්නට ඕනෑ බව තමුන්නාන්සේ පිළිගන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය මේ රට පුරා පැතිරී ගියේ යුක්ති සහගත අන්දමට ගම්වල කටයුතු කෙරෙනවාද, මේ පණත් නියම අන්දමින් ක්‍රියාවේ යෙදෙනවාද, මේ සම්බන්ධයෙන් මහජනයාගේ අදහස් උදහස් මොනවාද, කියා දැන ගැනීමේ අවස්ථාවක් එම සමිති මගින් සැලසෙන නිසයි. මේ සමිති කෙරෙහි මහජනතාව කොතරම් උනන්දුවක් දක්වූවාද යන්න අපට රහසක් නොවෙයි. තමුන්නාන්සේ දන්නවා අපේ ගම්බද ප්‍රදේශවල මේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර නොයෙකුත් අන්දමේ සමිති තිබුණ බව. මේ නිසා ගම්බද ජනතාවට සමිති සමාගම් තිත්ත වන තත්ත්වයක් ඇති වී තිබුණා. හැම කටයුත්තකටම සමිති පිහිටුවීමට ඒ අය පුරුදු වී සිටියා. සමූපකාර සමිති තිබුණා, ගොවි ජන සමිති තිබුණා, සෞඛ්‍ය සමිති තිබුණා, ප්‍රජා මණ්ඩල සමිති තිබුණා. මේ ආදී අනන්ත අප්‍රමාණ සමිති තිබුණා. එහෙත් ග්‍රාම සංවර්ධන සමිති පටන් ගැනීමත් සමගම එමගින් මේ රටේ ගම්බද ජනතාවට කෙලින්ම රට පාලන කටයුතුවලට සහභාගි වන්නට, පාලන ක්‍රමය විවේචනය කරන්නට, ලැබිය යුතු දේ මොනවාද කියා තෝරා බේරා දැන ගන්නට ඉඩකඩ සැලසෙන නිසා මහජනයා ඒ සමිති ඉතා සන්තෝෂයෙන් පිළිගත්තා. එනිසා ඒ සමිතිවලින් ගම්බද ජනතාවට විශාල සෙතක් සැලසුණා. මේ සමිති මගින් ගමේ වැඩ කටයුතු ගැන විවේචනය කළා පමණක් නොවෙයි. ඇතැම් අවස්ථාවලදී ගම්බද වැඩ කටයුතු ගැන උනන්දුවක් නොදැක්වූ අවස්ථාවලදී රජයට පවා දෙස් නැගුවා. එපමණක් නොවෙයි. මෙම සමිතිවල සාමාජිකයන් රජයේ ආධාරයක් නොලබාම, ඇතැම් අවස්ථාවලදී ස්වශක්තියෙන් කටයුතු කර තිබෙනවා. රජයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සුළු ආධාරයක් පමණක් ලබාගෙන තමන්ගේ දහඩිය මහන්සියෙන් ගම්බද පාරවල් කැපීම ආදී අනන්ත වැඩ කටයුතු මේ සමිති මගින් කළ අවස්ථාවල් තිබෙනවා.

අ. භා. 7.15

ආණ්ඩුව පාසැල් ගොඩනැගිලිවලට විශාල මුදල් ප්‍රමාණයක් අපතේ වියදම් කළා. එවිට ග්‍රාම සංවර්ධන සමිති ඉදිරිපත් වෙලා කිව්වා, සියයට පනහක් අපට දෙන්න, ඉතිරි හරිය අප කරන්නම්, කියා. මේ පිළිවෙළට ග්‍රාම සංවර්ධන සමිති ආණ්ඩුවට කොයි තරම් ආධාර උපකාර කළාද? ඔය ග්‍රාම සංවර්ධන සමිති පමණ ආණ්ඩුවට අලාභයක් නොකර, උපකාර වන පිළිවෙළට අතින් සල්ලි දමා සේවය කළ වෙන කිසිම සමිති ක්‍රමයක් නැහැ. අනික් සියලු සමිතිම ආණ්ඩුවෙන් සල්ලි ගත්තා මිසක් අතින් සල්ලි දමා මහජන සේවයක් කළේ නැහැ. ආණ්ඩුවෙන් මුදලක් ලබාගෙන, එසේම මහජනයාගෙනුත් මුදල් එකතු කර ගෙන, මහජන සේවයක් කළ එවැනි සමිති දියුණු කළ යුතු නොවේද? ආණ්ඩුවෙන් දමන කොටස වෙනුවට ගම්මුන් ගෙනුත් කොටසක් ඊට එකතු වෙනවා නම් එයින් ආණ්ඩුවට විශාල පහසුවක් ලැබෙනවා නොවේද? අද පාසැල් ගොඩනැගීමට එක ඡන්ද කොට්ඨාශයකට දෙන්නේ රුපියල් 37,000 යි. පාරවලට සල්ලි නැහැ, පිං පඩි දෙන්න සල්ලි නැහැ, ගුරුවරු වැඩ කරන්න බැහැ, ආදී වශයෙන් නිතරම හඬ නගනවා නේද? එවැනි කට යුතු සඳහා ආණ්ඩුවට මුදල් හිඟ නම්, තමුන්නාන්සේලා කළ යුත්තේ ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරයට පණ පොවා ඒ වැඩවලට අවශ්‍ය වියදමින් කොටසක් ඒ ඵදවියට දරාගෙන රටට සේවයක් කරන්න අවස්ථාව දීම නොවේද? වැඩ කරන්න පුළුවන් මුදල්වලින් පමණක් නොවෙයි, මහන්සියෙනුත් වැඩ කරන්න පුළුවන්. ඒ කොටස ඒ ඵදවිය කළා නේද? එවැනි ප්‍රයෝජනවත් ව්‍යාපාරයකට අද කුමක්ද වෙලා තියෙන්නේ? ඒවාට නිලධාරීන් පත් කරලා නැහැ. ඒ සමිති තියෙනවාද නැද්ද දන්නෙත් නැහැ. සමහර සමිති සම්පූර්ණයෙන්ම දිය වෙලා ගිහින්. ග්‍රාම සංවර්ධන සමිති දියුණු කරනවාය, සියයට පනහක් සියයට හැත්තෑ පහක් සියයට සියයක් ආධාර දෙනවාය, කියා පොරොන්දු වී දැන් තුට්ටුවක්වත් දෙන්නේ නැහැ.

ගරු මෛත්‍රිපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)
No no. There is Rs. 1,750,000.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
එතකොට එක කොට්ඨාශයකට කොච්චර ලැබෙනවාද කියා බලන්න. රුපියල් 1,500යි ලැබෙන්නෙ. පාරවල් කැපීමටත්, ස්කෝල ගොඩනැගිලි හැදීමටත්, කර්මාන්ත මධ්‍යස්ථාන ඇති කිරීමටත්, මේ මුදල සෑහෙනවාද? ඊට කලින් එක කොට්ඨාශයකට රුපියල් 10,000ක් ලැබුණා නේද? රුපියල් 1,500 මොනවා කරන්ටද? ඒ නිසා මේ ගැන විශෙෂයෙන් සලකන්ට ඕනෑ. ආණ්ඩුවේ සල්ලි කාගෙන යැපෙන අනික් සමිති රාශියක් තිබියදී මේ සමිති පමණයි, අතින් මුදල් යොදා සමාජ සේවයක් කරන්නේ.

ගරු සභාපතිතුමනි, තවත් විශෙෂ ප්‍රශ්නයක් තියෙනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පමණක් නොව විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් වන අපිත් ඕනෑම වැරැද්දක් දුටු විට නිලධාරීන්ට බණිනවා; නමුත් මහජනයාගේ අදහස් මොනවාද යන්න ඒ නිලධාරීන්ට දැනගැනීමට මාගී යක් සූදානම් කර තිබෙනවාද? අතන මේ විධියේ අමාරුවක් තියෙනවාය, මෙතැන මේ විධියේ කරදරයක් තිබෙනවාය, අහවල් තැන මේ විධියේ අවහිරයක් තිබෙනවාය, කියා ඒ නිලධාරීන් දැනගන්නේ කොහොමද? මන්ත්‍රීවරුන්ට නම් මේ ගරු සභාවේ නැගිට තම තමන්ගේ කොට්ඨාශවල තිබෙන දුර්වලකම් අමාරුකම් කියන්ට පුළුවනි. නමුත් ඒ නිලධාරීන්ට ජනතාවගේ අමාරුකම් දැනගැනීමට මාර්ගයක් තිබෙනවාද? ඒ ඵදවියටත් රට දියුණු කිරීමට අපට වගේම කැක්කුමක් තිබෙනවා. අපේ නහරවල මෙන්ම ඒ අයගේ නහරවලත් සිංහල ලේ ගමන් කරනවා. නමුත් අද ඒ අයට ගම්බද ප්‍රදේශ දියුණු කිරීමට අවස්ථාව නැති නිසා ඒ අය මහජනයා ගෙන් ඈත් වී සිටිනවා. ග්‍රාම සංවර්ධන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

සමිති පිහිටුවන මුල් අවස්ථාවේදී ඒ නිලධාරීන් ඉතා ආසාවෙන් ඉදිරිපත් වී මහජනයාට සේවයක් කරන්න පටන් ගත්තා. ආණ්ඩුවටත් ගමටත් එකතු වන්ට තිබුණු හොඳම ක්‍රමය මේ ග්‍රාම සංවර්ධන සමිති ක්‍රමයයි. අද කෝ ඒ ග්‍රාම සංවර්ධන සමිති? අද ඒවා නැත්තටම නැති වෙලා තිබෙනවා. ඒ ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරයේ වටිනාකම ලංකාවේ සිටින අපේ ඇමතිවරුන්ට නොපෙනුනත් සැතපුම් 20,000 ක් දුර සිටින කැනඩාවට පෙනුනා. ග්‍රාම සංවර්ධන සමිති මගින් කරන පාරවලට ආධාර මුදල් දෙන්න කැනඩාව ඉදිරිපත් වුණා. ගම්බද මහජනයා උනන්දුවෙන් කරන සෑම දේකටම උපකාර කරන්න සතුටු අය ඉන්නවා. ඉන්දියාව අවුරුදු පහෙන් පහට සකස් කරන සැලැස්ම අනුව අපට පේනවා ඒ රටේ සංවර්ධනය ඇති වී තිබෙන්නේ කුමන වැඩ පිළිවෙළක් උඩද කියා. ඒ රටේ සංවර්ධනය වැඩි වශයෙන් ඇති වී තිබෙන්නේ මේ විධියේ ගම්බද කුඩා ව්‍යාපාර මගිනුයි. ඔවුන් විසින් වරින්වර සකස් කරනු ලබන සැලැස්ම අනුව අපට ඒ බව පෙනී යනවා. ගම්බද සංවර්ධන ක්‍රමවලින් තමයි අනිකුත් ක්‍රමවලට වඩා ඔවුන්ට ප්‍රයෝජන ලැබී තිබෙන්නේ. නමුත් තමුන්නාන්සේලා සකස් කරන සංවර්ධන වැඩ පිළිවෙළ මොකක්ද? ඇයි තමුන්නාන්සේලා ග්‍රාම සංවර්ධන අංශය පාවිච්චියට නොගන්නෙ? සෞඛ්‍ය අංශයෙන් වේවා සදාචාර අංශයෙන් වේවා, ගොවිකම් අංශයෙන් වේවා කරනු ලබන සංවර්ධන කටයුතුවලදී ඒවායේ මුල් තැන ග්‍රාම සංවර්ධන සමිතිවලට පවරා නොදෙන්නේ ඇයි? ග්‍රාම සංවර්ධන සමිතිය ගමේ මූලික සභාවක් බවට පත් කර ඉන්දියාවේ මෙන් හොඳ සැලැස්මක් අනුව කටයුතු කර රටේ ජනතාව අතර නියම සංවර්ධනයක් ඇතිවන ආකාරයට කටයුතු නොකරන්නේ ඇයි?

ගරු සභාපතිතුමනි, එක එක අංශවල නිලධාරීන් ගැන මා දන්නවා. ග්‍රාම සංවර්ධන නිලධාරීන්ට විශෙෂ ගෞරවයක් මා විසින් දියයුතුව තිබෙනවා. ඒ අය සේවය කරන්නේ නීති රීතිවල බලය අනුව නොවෙයි. මහජනයාට දඬුවම් කරන්න ඒ අයට බලයක් නැහැ. මහජනයාගේ සිත් දිනාගෙන ඔවුන්ගේ උදව් උපකාර ලබාගෙන සේවය කරන්න ඕනෑ. තමුන්නාන්සේ ඒ අයවලුන් කැඳවා විශෙෂ පුහුණුවක් ලබා දෙන්න ඕනෑ. ඒ ඒ කර්මාන්ත දියුණු කරන්නේ කුමන කුමන ආකාරයටද කියා ඔවුන්ට කියා දෙන්න ඕනෑ. ශිෂ්‍යත්ව දී ජපන් රට වැනි රටවලට ඔවුන් පිටත් කර හරින්න ඕනෑ. එසේ කොට පුහුණුවක් ලබා දෙන්න ඕනෑ, ග්‍රාම සංවර්ධන කටයුතු ගැන. එවැනි පුහුණුවක් නොමැතිව ගම් පාලනය කරන්නවත් ගම් සංවර්ධනය කරන්නවත් බැහැ. ඒ අයට කර්මාන්ත ආදිය ගැන හොඳ පුහුණුවක් දෙනවා නම් කොතරම් සහනයක්ද?

ගම්මුලාදැනීන්ගේ වැරදි ගැන කියන වාර අනන්තයි. වැරදි කරන ගම්මුලාදැනීන් ඉන්නවා. එය අප පිළිගන්න ඕනෑ. නමුත් තමුන්නාන්සේලා සොයා බලන්න ඕනෑ ගම්මුලාදැනීන් ඒ විධියට වැරදි කරන්නේ කුමන කාරණයක් නිසාද කියා. අද රට පාලනය කරන නිලධාරීන් අතුරෙන් ඉතා කුඩාම නිලධාරියා තමා ගම්මුලාදැනියා. මේ මන්ත්‍රණ සභාවේ සම්මත කරන පණත් අනුව ගම්වල වැඩ කටයුතු කරන්නේ ගම්මුලාදැනියායි. උසස් පෙළේ නිලධාරීන්ට රුපියල් දාහ, දෙදාහ, තුන්දාහ ආදී වශයෙන් වේතනය ලැබෙනවා. නමුත් වැඩ කරන ගම්මුලාදැනියාට රුපියල් හැටයි. රුපියල් හැටකින් මේ යුගයේ ජීවත් විය හැකිද? මුලාදැනීන්ට නියම විධියේ පඩියක් දෙනවා නම් ඔය කියන විධියේ අයුතු වැඩ සඳහා ඔවුන් තම බලය පාවිච්චි කරන්නේ නැහැ. ඔවුන් ජනතාව මිරිකා ලේ උරා බොන්නේ අන්න ඒ අඩු පාඩුව නිසයි. දැන් ඇතැම් ගම්මුලාදැනීන් බලය පාවිච්චි කරන්නේ හම්බ කරන්නයි. ඒ බව අප දන්නවා. නමුත් ලේ උරා බොන්නන් වශයෙන් ඔවුන්ට දොස් කියන එක වැරදියි. නියම වේතනයක් ඔවුන්ට දෙන්න. එසේ කළ විට වැරදි ක්‍රියාවලින් වළකිවි. එසේ කළ විට ඔවුන්ගෙන් නියම සේවයක් සැලසෙන බව පෙනී යාවි.

අළුතින් පත් කරන්න යන ග්‍රාම සේවක නිලධාරීන් ගැන වචනයක් කියන්න කැමතියි. මේ අළුත් නිලධාරීන් කොටස තම තමන්ගේ ගම්වලටම පත් කරනවාද, ඔවුන් වැරදි කලොත් ප්‍රදෙශයෙන් ප්‍රදෙශයට මාරු කරනවාද කියන එක කවුරුවත් දන්නෙ නැහැ. මාරු කරන්න අදහස් කරනවා නම් ඒ අනුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේලාට ප්‍රශ්න කීපයකට මුහුණ පාන්න සිදුවීමෙන් අමාරුවට වැට නෙවා ඇති. හාල් පොතක් දෙන්නේ ඇදිනීම අනුව නොවේද? ඡන්දදායක ලැයිස්තු සකස් කරන්නේ හැදිනීම අනුව නොවෙයිද? මුලාදැනීන් විසින් කරනු ලබන අනෙකුත් හැම දෙයක්ම වාගේ කරන්නේ ගම්වැසියන් කවුරුන්දැයි හඳුනාගෙන නොවේද? ඔවුන්ගේ ඇදිනීම වුවමනා කරන්නේ නැති නම් මුලාදැනීන් අවශ්‍ය වන්නෙත් නැහැ. ඉතින් පළාත්වාසීන් හරියට අඳුනන්නේ නැති නම් එවැනි මුලාදැනියකු ගෙන් මොන සේවයක් බලාපොරොත්තු වන්නට පුළුවන්ද? හොර ඡන්දයක් දැම්මොත් ඔහු කවුදැයි හඳුනාගන්නට බැරි නම්, හාල් පොතක් නිකුත් කරන විට ඒ දෙන්නේ නියම තැනැත්තාටයයි හඳුනාගන්නට බැරි නම්, එවැනි මුලාදැනියකුගෙන් කුමන සේවයක් බලාපොරොත්තු වන්නට පුළුවන්ද?

පසුගිය කාලයේ කල්ලතෝනීන් අල්ලා ගැනීමට මහක් තිබේ දැයි පරීක්ෂා කිරීමට මම මන්නාරමට ගිය අවස්ථාවේදී නිලධාරීන් අපට කිව්වේ ඔවුන් හරියට තෝරා ගන්නට බැරිය කියායි; කෙනකුගේ මුහුණ බලා ඔහු මෙහි පුරවැසියෙක්ද පිටින් පැමිණි කෙනෙක්දැයි තෝරා ගන්නට බැරිය කියායි. ඒ අවස්ථාවේදී අපි අදහසක් ඉදිරිපත් කළා, තම කොට්ඨාශයේ සිටින පිටින් පැමිණ ඇති පුද්ගලයින්ගේ නම් ලැයිස්තුවක් සකස් කර දෙන්න යයි ගම්මුලාදැනීන්ගෙන් ඉල්ලීමට. ඒ අනුව අපි මන්නාරම් ප්‍රදේශයේ සිටින සෑම ගම් මුලාදැනියකුගෙන්ම ඉල්ලා සිටියා තම කොට්ඨාශවල පිටතින් පැමිණ සිටින අයගේ නම් ලැයිස්තුවක් සකස් කර දෙන්නය කියා. ඒ ලැයිස්තු අනුව අපට පෙනී ගියා 5000 ක් පමණ කල්ලතෝනීන් එහි සිටි බව. එසේ සොයා ගන්නට පුළුවන් වූයේ ඒ මුලාදැනීන් තම ප්‍රදේශවාසීන් හඳුනා ගෙන සිටි නිසයි. ප්‍රදේශයේ වැසියන් හඳුනන්නේ නැති නම් එවැනි කටයුත්තක් කරන්නේ කොහොමද? මෙයින් හොඳටම ඔප්පු වෙනවා ගම ගැන දැනුමක් ඇති, ගමේ සිටින්නන් හඳුනා ගැනීමට පුළුවන් කෙනකු සිටිය යුතු බව. එම නිසා ඒ කාරණාව ගැන ඇමතිතුමාගේ අවධානය යොමු වෙනවා ඇතැයි මම විශ්වාස කරනවා.

තවත් කාරණයක් කියන්න තිබෙනවා. බදුල්ලේ මන්ත්‍රීතුමා (බී. එච්. බණ්ඩාර මයා.) කිව්වා විදේශිකයනුත් ඡන්ද ලැයිස්තුවලට ඇතුළත් කෙරෙනවාය කියා. විදේශිකයින්ට පුරවැසිකම් ලැබෙන්නේ ඉතා සියුම් පරීක්ෂාවකින් පසුව බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ සඳහා ඉතා තද නීති පනවා තිබෙනවා. ඉන්දියානු පුරවැසියන් පිළිබඳව ආණ්ඩු දෙකක් ඉතා තදින් සාකච්ඡා කර තිබෙනවා. ඉන්දියානු පකිස්තානු පුරවැසියන් පිළිබඳ නීති අනුව ඉතාමත් පරිස්සමෙන්, ඉතාමත් හෙමින් සිරුවේ, ඉතා සියුම් පරීක්ෂණ පවත්වා, මූලදී අපි එක්තරා පිරිසක් පුරවැසියන් හැටියට භාර ගත්තා. ඊට පසුව කල්ලතෝනීන්ගේ පැමිණීම වැළැක්වීම සඳහා රට වටේ මුර දමද්දී, තවත් ආණ්ඩුවක් සමග ඒ පිළිබඳව හැප්පීම් ඇතිවෙද්දී, ඔවුන්ගේ පැමිණීම හා ඔවුන් පුරවැසියන් වීම සඳහා ඇති සියලුම කපොලු වැසීමට උත්සාහ කරද්දී, මේ අමාත්‍යාංශය කිසිම වග විභාගයක් නැතිව විදේශිකයන් ඡන්දදායක නාම ලැයිස්තුවලට ඇතුළත් කරනවා.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனஞயக்க)
(The Hon. Maithripala Senanayeke)

එක සම්පූර්ණ අසත්‍යයක් [බාධා කිරීමක්]

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனஞயக்க)
(Mr. R. G. Senanayake)

යම් කෙනකු ඡන්දදායකයකු නොවේ යයි ඔප්පු කිරීම සඳහා රුපියලක මුද්දරයක් ගැසූ ලියවිල්ලක් ඒ ඡන්දතුමාට ඉදිරිපත් කරන්නට ඕනෑ.

මෙරිල් ප්‍රනාන්දු මයා.
(திரு. மெரில் பெர்ணாண்டோ)
(Mr. Meryl Fernando)

කෙනකුට උප්පැන්න සහතිකයක් ඉදිරිපත් කරන්නට බැරි වුණොත් ඔහු ලාංකීයයෙක් හැටියටවත් පිළිගන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ලාංකිකයකුද නැද්ද කියන එක නොවෙයි, මම කියන්නේ. මෙහි පුදුමයක් වී තිබෙන්නේ එක කොටසක් ප්‍රතික්ෂෙප කරන තැනැත්තා අනික් කොටස භාර ගැනීමයි. පුරවැසියන් නොවූ අය දහස් ගණනින් ඡන්දදායක ලැයිස්තුවලට ඇතුළත් වෙනවා යයි කියන්නේ මා නොවෙයි බදුල්ලේ මන්ත්‍රීතුමායි. උඩරට ඡන්දදායක ලැයිස්තුවලට ඔවුන්ගේ නම් ඒ විධියට ඇතුළු වුවහොත් අනික් වාරයේ උඩරට මන්ත්‍රීවරුන් වශයෙන් එන වැඩි දෙනෙක් නල්ලයිලත් සුප්පයියලත් වේවි. එම නිසා එහෙම වෙන්නේ නැතැයි නොකියා, ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රීවරයෙක් එසේ කියන නිසා, ඒ ගැන ටිකක් සොයා බලන මෙන් මම ඉල්ලා සිටිනවා. මට ඇමතිතුමාගෙන් තවත් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. කැලණි විහාරය බලා ගන්නය කියා මහ භාරකාරතුමා යම් කෙනෙක් පත් කර තිබෙනවා. මේ සම්බන්ධ නඩුව තිබෙන කාලයේදී ඒ නඩුවෙන් තීන්දුවක් දෙන්ට පෙර යම් කිසි කෙනකු කැලණි විහරයේ පාලනය භාර ගත යුතු බව මහා භාරකාරතුමාට කියන්නය කියා මම යෝජනා කළා.

අ. භා. 7.30

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

විශේෂ නීති පනවලයි එය කෙළේ. [බාධා කිරීම්.]

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

කවුද මේ සෝමරත්න කියන්නේ? කැලණි විහාරයේ දායක සභාවක් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

දායක සභාවට භාර දෙන්න කියලද කියන්නේ? ඒක හරියට හොරාගෙ අම්මගෙන් පේන අහන්නා වාගෙයි.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

එහෙනම් තමුන්නාන්සේ සෝමරත්න උන්නැහේට දුන් එක හොඳයි! සෝමරත්න උන්නැහේ ගිහින් අම්බලන් ගොඩින් මුරකාරයන් තුන් දෙනකු කැඳවා ගෙන ඇවිත් පත් කර තිබෙනවා. ඇයි කැලණියේ මිනිසුන් නැද්ද ඒ සඳහා පත් කරන්න? සෝමරත්නට—බයස්කෝප් කාරයකුට—කැලණි විහාරය භාර දෙන්නේ තමුන්නාන්සේ වාගේ කෙනෙක් පමණයි.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

එයා පත් කරන්න ඇත්තේ එයාට විශ්වාස අයයි.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මොන යුතුකමක් පිටද උන්නැහේව පත් කර තිබෙන්නේ? විශේෂයෙන් බෞද්ධ කටයුතු ගැන ප්‍රධානත්වය දිය යුත්තේ ඒ අයටද? බයස්කෝප් හැදු පළියට කැලණි විහාරය හිමි වෙන්නේ කොහොමද? දායක සභාවක් තිබෙනවා නම්, ඒ දායක සභාවෙන් මෙපමණ කලක් කටයුතු කරගෙන ආවා නම්, පෙරහැර ආදී සෑම දෙයක්ම මෙපමණ කලක් කළා නම්, ඇයි ඒ දායක සභාවෙන් ඒ ගැන ඇසුවෙ නැත්තේ? හොඳයි, එහෙමත් නැත්නම් මහබෝධි සමාගමට භාර දෙන්න බැරිද? නැහැ. මේ පටන් ගෙන තිබෙන්නේ පන්සල් මංකොල්ලයයි. ඔපමණක් නොවෙයි, දැන් පන්සල් 5 ක් අල්ල ගත්තා [බාධා කිරීම්.] තමුන්නාන්සේගේ වැඩ අංශය ගැන බලන්න. තමුන්නාන්සේගේ අර්ථසාධක මුදල් අංශයට සිදු වී තිබෙන දේ දන්නවා නොවේද? අත්සන් නොකර ගත් සල්ලි වියදම් නොකර දැන් ඒ සල්ලි අහෝසි වී තිබෙනවා. හැම තැනම මංකොල්ලේ. එක පැත්තකින් සමුපකාර මංකොල්ලේ. අනික් පැත්තෙන් කරවල මංකොල්ලේ. දැන් පන්සල් මංකොල්ලෙන් පටන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙන. යම් තැනක සල්ලි ටිකක් තිබෙන වා නම් එතැනට පැන මංකොල්ල කෑමටයි නිතරම සූදානම් වන්නේ. ඒ නිසා තමුන්නාන්සේගෙන් සාධාරණ ලෙසයි මම මේ ගැන ප්‍රශ්න කරන්නේ. අර දායක සභාව මෙපමණ කලක් පන්සලේ නඩත්තුව ගෙන ගියා නම් ඇයි පිට කෙනෙක්—මේ ගැන දන්නේ නැති කෙනෙක්—ඒ සඳහා පත්කර ගත්තේ ?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

එපමණ කලක් නඩත්තු කර ඉතුරු වී තිබුණේ රුපියල් 20යි.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

තිබුණේ රුපියල් 20 නම් මොනවාටද මුරකාරයන් පස් දෙනෙක්. මුරකාරයෙකුට රුපියල් 150 ක් ගෙවනවා.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

දැන් මාසයකට ආදායම රුපියල් 3000ක් තිබෙනවා.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මුරකාරයා ඇදේ බුදිය ගන්නවා; ස්වාමීන් වහන්සේ බිම බුදිය ගන්නවා. ඔන්න භාරකාරයාගේ පාලනය.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ඔය ප්‍රචාර හරි යන්නේ නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

බලමු ප්‍රචාර හරි යන්නේ නැද්ද කියා? මීළඟට බුද්ධ ශාසන කොමිෂන් සභා වාර්තාව ගැන බලමු. තමුන්නාන්සේලා කිව්වා මෙය ක්‍රියාවේ යොදවනවාය කියා. ඒ කියමන පරිදි එය ක්‍රියාවේ යොදවනවාද නැද්ද කියා මම දැන ගන්න කැමතියි. ඒ වාර්තාව, නිකාය තුනෙන්ම ප්‍රතික්ෂේප කර තිබෙන බව තමුන්නාන්සේලාට පේන වා ඇති. "අපට තමුන්නාන්සේලාගේ නීති රීති වුවමනා නැත, ඔය නීති රීති වැරදි ය, මීට කලින් ඔය විධියේ නීති තිබුණේ නැත, අපේ ශාසනය අපි අවුරුදු දහස් ගණනක් තිස්සේ රැක ගත්තා" ය කියා ඒ අය මේ වාර්තාව ප්‍රතික්ෂේප කර තිබෙනවා. ඔය විධියේ නීති රීති හදන්න ය කියා බෞද්ධ තොරතුරු පරීක්ෂක සභා වෙන් ඉල්ලා තිබුණේ නැහැ. ශාසනය හැදීම පැත්තක තබා තමුන්නාන්සේලා සූදානම් වන්නේ භික්ෂූන් වහන්සේලා හැදීමට පමණයි. ශාසනයේ අඩු පාඩු අනන්ත හදන්න තිබෙනවා. නමුත් තමුන්නාන්සේලා අරගෙන තිබෙන්නේ භික්ෂූන් වහන්සේලාගේ අංශය පමණයි. භික්ෂු භික්ෂුනී උපාසක උපාසිකා කියා ශාසනයේ අංශ 4 ක් තිබෙනවා. ඇදගෙන තිබෙන්නේ භික්ෂු සංවිධානය පමණයි. ඇයි අනෙක් අංශ ගැන කල්පනා කරන්නෙ නැත්තේ ? අනන්ත අප්‍රමාණ අඩු පාඩු තිබියදී ඒවා සම්පූර්ණ කරන්න වීර්ය කරන්නේ නැහැ. තිබෙන එකත් නැති කරන්නයි උත්සාහ කරන්නේ. දැන් උත්තර සංඝ සභාවක් කියා සභාවක් තමුන්නාන්සේලාගේ ඒ වාර්තාවෙන් යෝජනා කර තිබෙනවා. උත්තර සංඝ සභාවේ පමණයි ස්වාමීන් වහන්සේලාට බලය තිබෙන්නේ. ඊළඟට තිබෙන සංඝ සභා සියල්ලකම, නොහොත් ප්‍රථම කොට තිබෙන ශාසන සංගමයේ වැඩි ගණනක් සිටින්නේ ගිහි උදවියයි. ඒක තමයි, මහ සභාව. සාමාජිකයන් 101 දෙනකු ඒ සභාවේ සිටිනවා. නමුත් ස්වාමීන් වහන්සේලා සිටින්නේ 19 දෙනයි. අනෙක් අය, එසේ නැත්නම් අසූ දෙදෙනෙක් ගිහි උදවියයි. විභාර පාලක සභා ඇති කර තිබෙනවා. අවුරුදු 21 පැන් නාම සෑම දෙනකුම එහි සාමාජිකයෝ. හැලි අරක්කු කාරයා, ගරක් හොරා, රට පාලුවා, සමූපකාර පාලුවා, ඒ කවුරු වුනත් කමක් නැහැ, ඒ සභාවට පත් වෙනවා, ස්වාමීන් වහන්සේලාව පාලනය කරන්න. නමුත් භික්ෂූන් වහන්සේලා බඳවා ගන්නේ උප සම්පදා වුණ අය පමණයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

ස්වාමීන් වහන්සේලාගෙන් පමණයි ශීලය බලාපොරොත්තු වන්නේ. ගිහි උදවිය සිල්වත් වෙන්න ඕනෑ නැහැ. ඒ උදවියටයි පන්සල භාර දෙන්නේ. කාපන් කියලා, සමුපකාර සමිති කන ආකාරයට. ඔන්න ඔය විධියට පන්සල් මංකොල්ලයයි දැන් මේ කරන්න වියයුතු කරන්නේ. සමුපකාර සමිති කන්නෝ තමයි අද රට හැම තැනම වාගේ ඉන්නෙ. අපේ පන්සලුත් ඒ අයට බාර දෙන්න හදන්නෙ ඒ විධියට කරන්වද?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ඔය කතාව මේ පැත්තෙ ඉන්නකොට නොකිව්වෙ ඇයි?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

පන්සල් දේපොළ ශාසනයට බාර දීලා තියෙන්නෙ රජකාලයේ සිට බව අපේ ඉතිහාසයෙන් පෙනෙනවා ඇති. ඒවා රජකාලේ සාංගික කරලයි දුන්නෙ. දැන් තමුන්නාන්සේ වගේ කුඩා ඇමතිවර යෙකුට උදුරා ගන්න නොවෙයි එදා දුන්නෙ. ඒ නිසා මේ අවවාදය හිතට ගන්න. ලංකාවේ අවුරුදු දෙදාස් පන්සිය යක ඉතිහාසය ගැන කල්පනා කර බලන විට තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලය ඉතා කුඩා දෙයක් බව කල්පනාවට ගන්ට. කොයි විධියට දැන් හිතාගෙන හිටියත්, ඔය පනත නම් ක්‍රියාවේ යොදවන්ට බැරි වෙනවාමයි. ඒක ක්‍රියාවේ යොදන්ට පටන් ගත්තොත් ශාසනය සුද්ධ කරන්ට ඔය විධියට නම් පුළුවන් වෙන්නෙ නෑ. නමුත් ගරු ඇමතිතුමා නම් සුද්ධ වෙයි. ඒ ගැන මම තමුන්නාන්සේට අභියෝග කරනවා.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ඔය අදහස මේ පැත්තෙ ඉන්නකොට කිව්වෙ නැත්තෙ ඇයි? එතකොට පිළිගත්තා මහ ලොකුවට, බොහොම හොඳයි කියලා.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

කවුද පිළිගත්තෙ?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ඇයි, එදා 1956 දී පිළිගත්තෙ නැද්ද? ඔව්, එතකොට හිටියෙ මේ පැත්තෙ නොවැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

කොහොමද එහෙම කියන්නෙ? තමුන්නාන්සේලා එතකොට ඒක අච්චු ගහලවත් තිබුණෙ නැහැ. මේ ළඟදී තමයි එහෙම කළේ. ඉතින් කොහොමද එදා පිළිගත්තාය කියන්නෙ?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

දැන් ඉතින් අත්තක් නැති නිසා ඒකෙ එල්ලෙන්න හදනවා.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

දැන් තමුන්නාන්සේට මේ කාරණය මතක් කරන්න ඕනෑ. මොන පිළිවෙළටද තමුන්නාන්සේ විහාර සමිති සම්බන්ධයෙන් වාර්තා කරන්න ස්වාමීන් වහන්සේලා කීපනමක් පත් කිරීමට තෝරා ගත්තෙ? අත්සන් කර තිබෙනවා නේද?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ඉතින් මේ පැත්තෙ ඉන්නකොට ඒ ගැන ප්‍රශ්න කළේ නැත්තෙ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

හොඳයි, ඒකට කමක් නෑ. මම දැන් ප්‍රශ්න කරනවා. උත්තර දෙන්න.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ඔව්, දැන් ඉතින් ප්‍රශ්න කරනවා තමයි, අත්තක් නැති හින්දා.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

හොඳයි, බලමුකෝ අත්තක් නැද්ද කියලා.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ගරු බණ්ඩාරනායක අගමැතිතුමා කොමිෂන් සභාවක් පත් කරන අවස්ථාවේ ඔය ගැන හොඳ නරක නොකිව්වෙ?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ඒකෙ වගක් ඕනෑයැ දැන්? මම අහපු ප්‍රශ්නයට දැන් උත්තර දෙන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

ඒ ප්‍රශ්නෙට උත්තර දෙන්න.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ඒ කාලෙ ඔය ප්‍රශ්න ඇහුවෙ නෑ. දැන් අහනවා, අත්තක් නැති හින්දා.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ඒකෙන් කමක් නෑ. ප්‍රශ්නෙට උත්තර දෙන්න.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

මේ පැත්තෙ ඉඳගෙන ඇමතිකම් කරන කොට ඒ ගැන ප්‍රශ්න කළේ නෑ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

හොඳයි, දැන් දෙන්න උත්තර.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

මම නියම වේලාවට උත්තර දෙන්නම්.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ඔව්, නියම වෙලාවට උත්තර ලැබෙනවා ඇති. ඒක අපි දන්නවා. මහජනයා නියම වෙලාවට උත්තර දෙනවා ඇති. මේ කොමිෂන් සභාවේ වාර්තාව තමුන්නාන්සෙ කියෙව්වද? "ඔබ්සර්වර්" පත්‍රය විතරක් කියෙව්වට මදි.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

තමුන්නාන්සේ වුණත් ඒ වාර්තාව කියවලා තියෙනවද? කියෙව්වා නම් ඔය විධියට කථා කරන්නෙ නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

නිකම් බලයට තෝරා ගත් යම් පිරිසක්—

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

කවුද තේරුවෙ?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

කවුරු තේරුවත් කමක් නෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ඒ දවස්වල කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයෙක් හැටියට හිටපු තමුන්නාන්සෙට ඒ සම්බන්ධයෙන් වගකීමක් නැද්ද?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

දැන් කරන්ට එපා කියන්නෙ වගකීමක් ඇතිව තමයි.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

බොහොම ලක්ෂණයි ඒ කතාව. මේ පැත්තෙ ඉන්න කාලෙ ඔය කතා ඔය විධියට නොකළෙ ඇයි? ඒ කාලෙ මේවා පිළිගත්තේ නැද්ද? බණ්ඩාරනායක——

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

එදා අල්ලස් කොමිෂන් සභාව පත් කළ අවස්ථාවේ බණ්ඩාරනායක උන්නැහේ කිව්වෙ නැද්ද, අල්ලස් අරන් අහු වුණු කෙනෙකුට බේරිල යන්ට දෙන්නෙ නෑ කියලා? දැන් ඒ ගැන මොකද කරන්නෙ?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

අල්ලස් කතාව ගැනද මේ කතා කරන්නෙ? ඒක වෙනම කතාවක්. ඒක වෙනම වැඩක්.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

අල්ලස්කාරයන් සම්බන්ධයෙන් බණ්ඩාරනායක ප්‍රතිපත්තිය නෑ. නමුත් සභාමීන්වහන්සේලා සම්බන්ධයෙන් පමණක් එහෙම ප්‍රතිපත්තියක් ඕන කියනවා.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

එදා ඒ ඔක්කොම අනුමත කළා. අද ඇවිල්ලා අනික් පැත්තට කතා කරනවා.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මම අහන්න කැමතියි මෙන්න මේ කාරණය. එදා බණ්ඩාරනායක මහත්මයා කිව්වද අල්ලස් දූෂණවලට අහු වුණු අයට ඔය විධියේ සහනයක් දෙනවාය කියා?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයෙක් වශයෙන් තමුන්නාන්සේ එදා හිටියා නේ? කොමිෂන් සභාව පත් කරනකොට එදා තමුන්නාන්සේ කැබිනට් මණ්ඩලයේ හිටියා. ඒක එදා අනුමත කළා. අද මොකක්ද මේ කියන්නෙ?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

අල්ලස් කොමිෂන් සභාව ගැනයි මම කියන්නෙ.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

අල්ලස් කොමිෂන් සභාව ගැන නොවෙයි මේ කථා කරන්නෙ. ශාසන කොමිෂන් සභාව ගැන නේද කියාගෙන ආවෙ?

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

දැන් ඒවා ගැන කතා කිරීමෙන් වැඩක් නෑ. කාරණයට අදාළව කතා කරන්න.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ගරු මන්ත්‍රීතුමා දැන් ප්‍රශ්න කළේ මේ ආණ්ඩුවට සභාමීන් වහන්සේලා ගැන කථා කරන්න කිසිම අයිතිවාසිකමක් තියෙනවද කියලයි. එදා ඒ ගැන කතා කරන අවස්ථාවේ ඇමතිවරයෙක් හැටියට හිටියා. එදා ඔක්කොම පිළිඅරන් දැන් තමාට තැනක් නැති නිසා මෙයින්වත් වාසියක් ලැබෙයි කියල හිතාගෙන ඔය විධියට ප්‍රශ්න කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මෛත්‍රීපාල බුදුන්ගෙන් මම අහන්නේ කොහොමද තමුන්නාන්සේගේ මේ අළුත් විනය ප්‍රතිපත්ති ක්‍රියාවේ යොදවන්නේ කියායි.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

අද නම් කැළණියේ පන්සල ගැන තමුන්නාන්සේට ලොකු කැක්කුමක් තිබෙනවා.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

සෑම කොමිෂන් සභාවකම වැඩ කටයුතු තමන්ගේ වාර්තාව අග්‍රාණ්ඩුකාරතුමාට භාර දීමෙන් පසුව අවසන් වන නමුත් මෙම කොමිෂන් සභාවේ සාමාජිකයන් නම් වාර්තාව අග්‍රාණ්ඩුකාරතුමාට ඉදිරිපත් කිරීමෙන් පසුවත් වරින්වර රැස්වෙනවා. මොකද මේ අය නැවත නැවතත් රැස් වන්නේ ? ඒ අයට පඩියකුත් ගෙවනවාද ?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

නැහැ, නැහැ. පඩි ගෙවන්නේ නැහැ. විශේෂයෙන් කොමිෂන් සභාවේ අදහස් උදහස් පිළිබඳව අවවාද අනුශාසනා ලබා ගැනීමටයි, මේ මහතුන්ගෙන් යුත් කාරක සභාවක් පත් කර තිබෙන්නේ. මගේ කැමැත්ත අනුවයි, පත් කර ගත්තේ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මගේ ප්‍රශ්නයට ඒ විධියේ පිළිතුරක් ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මටත් වුවමනා කර තිබුණේ මෙම කොමිටිය පත් කර තිබෙන්නේ කොයි ආකාරයටද, කවුරුන් විසින්ද, යනාදි විස්තර දැන ගන්ටයි. තමුන්නාන්සේගේ කොමිෂන් සභාව යෝජනා කළ ප්‍රතිපත්තින්ට විරුද්ධව——

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

නැහැ. කොමිෂන් සභා වාර්තාව ක්‍රියාවේ යෙදවීමේදී ඉදිරිපත් වන යම් යම් ප්‍රශ්න පැහැදිලි කර ගැනීමේ අදහසිනුයි, මට අවවාද අනුශාසනා ලබා ගැනීමටයි, මෙම කොමිෂන් සභාවේ සිටි සාමාජිකයන්ගෙන් සමහර දෙනෙක් පත් කර ගත්තේ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විශෙෂයෙන් ගුරු තනතුරු සඳහා වන අන්දමට තමුන්නාන්සේලා අළුත් නියෝගයක් දමා තිබෙනවා. පත්‍රවල නම් තිබුණා, එය ඉවත් කර තිබුණාය කියා. දෙපාර්තමේන්තුවෙන් තවමත් එය පැහැදිලි කර දීලා නැහැ. ඒ කාරණය ගැන කොමිෂන් සභා වාර්තාවේ සඳහන් කර තිබෙනවා නොවේද ? තමුන්නාන්සේවත් ඔය වාර්තාවේ තිබෙන යෝජනාවල් කියෙව්වාද ?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

දඹදෙණියේ ගරු මන්ත්‍රීවරයා එම වාර්තාවේ කොපියක් දෙපාර්තමේන්තුවෙන් ලබා ගත්තේ ගිය සුමානෙයි. [බාධා කිරීම්]

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මෙවැනි දේවලට අත ගසන්න ගොසින් තමුන්නාන්සේගේ දේශපාලන ජීවිතයට හානියක් කර ගන්න එපාය කියා මා කියනවා. තමුන්නාන්සේ මෛත්‍රීපාල බුදුන් වෙන්න ගියොත් කපෝති වන බව මතක් කරමින් මගේ වචන සවලප්පය අවසාන කරනවා.

අ. භා. 7.45

කේ. ඩී. ඩී. පෙරේරා මයා. (බණ්ඩාරගම)
(திரு. கே. டீ. டீ. பெரேரா—பண்டாரகம)
(Mr. K. D. D. Perera—Bandaragama)

ගරු සභාපතිතුමනි, දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමාගේ වේගවත් කථාවෙන් පසු මට කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. ඩී. ඩී. පෙරේරා මයා.]

ඉතාමත්ම සතුටුයි. බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ කොමිෂන් සභා වාර්තාව ගැන විස්තරයක් කොට අපේ ගරු ඇමතිතුමාට ලොකු අවවාදයක් කළ එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජිතයකු වශයෙන් සිටි කාලයේදී ඇඳ සිටියේ මේ දැන් අප අදින්නා වාගේ ජාතිකඇඳුමයි. නමුත් අළුත් පක්ෂයේ නායකයා වශයෙන් අද දින බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ සභ්‍යත්වය ගැන කථා කළේ යුරෝපීය ඇඳුමකින් සැරසීගෙනයි. එයින් පෙනී යන්නේ උන් නැහේ එකක් හිතාගෙන එකක් කථා කරන බවයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
අලුත් පක්ෂයේ ඇඳුම.

කේ. ඩී. ඩී. පෙරේරා මයා.
(திரு. கே. டீ. டீ. பெரேரா)
(Mr. K. D. D. Perera)

සමහර විට ඒ ගරු මන්ත්‍රීවරයා කීවාක් මෙන්, එය අලුත් පක්ෂයේ ඇඳුම වෙන්ට බැරි නැහැ. ඇඳුම අනුව කල්පනා කරතොත් එතුමා අත්වැල් බැඳ ගන්නේ කුමන පක්ෂයක් සමඟද කියන එක පැහැදිලිව පෙනී යනවා.

ඊළඟට අපේ ප්‍රදේශයේ පවතින බලවත් කරදරයක් සම්බන්ධයෙන් වචන සවලපයක් ප්‍රකාශ කරන්න කැමතියි. කළුතර දිස්ත්‍රික්කයේ බට කර්මාන්තයේ යෙදී සිටින්නන් අද දින විශාල කරදරයකට මුහුණ පා සිටිනවා. ඒ ප්‍රදේශයේ මහජනයා බට කූඩා විවීම රැකියාවක් වශයෙන් කරගෙන එනවා. තේ පැළවල ආරක්ෂාවටත් රබර් පැළවල ආරක්ෂාවටත් යොදන එම බට කූඩා වියන්නන්ගේ සංඛ්‍යාව 12,000 ක් පමණයි. නමුත් දැන් අවුරුද්දක පමණ සිට වතු අයිතිකාරයන්ගේ තේ පැළ හා රබර් පැළ ආරක්ෂා කිරීම සඳහා බට කූඩා යොදනවා වෙනුවට පොලිතීන් නමැති කඩදාසියෙන් පිළියෙල කරගන්නා ලද කූඩා විශේෂයක් යොදනවා. මෙයින් බට කර්මාන්තයට විභාල පහරක් වැදී තිබෙනවා. කිසියම් කුඩු වර්ගයක් ලංකාවට ගෙන්වා ලංකාවේ පිහිටි කඩදාසි කර්මාන්ත ශාලාවෙහි මේ කඩදාසි වර්ගය පිළියෙළ කරන බව කර්මාන්ත අධ්‍යක්ෂ තුමාගෙන් මට දැනගන්ට ලැබුණා. ඒ අනුව කඩදාසි කර්මාන්ත ශාලාවෙන් විමසූ විට එම කර්මාන්ත ශාලාවෙහි එවැනි කඩදාසි වර්ගයක් නිෂ්පාදනය නොකරන බවත්, ඒවා පිටින් ගෙන්වන ලද කඩදාසි වර්ගයක් බවත් දන්වා එවා තිබුණා. බට කූඩා වෙනුවට පොලිතීන් කඩදාසියෙන් සදාගන්න ගොටු පාවිච්චි කිරීම නිසා විශාල සංඛ්‍යාවකට රක්ෂාව නැති වී ගොස් තිබෙන බව මුලින් සඳහන් කළා. මේ පිළිබඳව තව දුරටත් සෝදිසි කර බැලීමෙන් පසුව අපට දැනගන්ට ලැබුණේ, බට කූඩා පාවිච්චි කිරීමට වඩා පොලිතීන් කඩදාසි කූඩා පාවිච්චි කිරීම නිසා ලොරිවලින් බට කූඩා ගෙනයෑමට යන වියදම ඉතුරු වෙනවාත් හැර ඒවා තැන්පත් කිරීම සඳහා ස්ටෝරු ගාස්තු වශයෙන් යන මුදල්ද අඩු වන බවයි. ඒ පහසුව නිසා, ඒ ලාභය නිසා, බට කූඩා වෙනුවට පොලිතීන් කඩදාසි කූඩා පාවිච්චි කරනවාලු. මේ අලුත් වැඩ පිළිවෙළ නිසා බට කූඩා විවීමේ කර්මාන්තයේ යෙදී සිටින දහස් ගණනකට රක්ෂා නැති වීමේ ප්‍රශ්නයකට මුහුණ පාන්ට සිදු වී තිබෙනවා. මුසාජී කොම්පැණිය වැනි කොම්පැණිවලින් මේ අලුත් කඩදාසි කූඩා වතුවලට සපයන බවට ආරංචියක් තිබෙනවා. කර්මාන්ත අමාත්‍යාංශයටත් දෙපාර්තමේන්තුවටත් මා මේ පිළිබඳව කීප විටක්ම දැනුම් දුන්නා. එහෙත් සෑහෙන වැඩ පිළිවෙළක් තවම ඇති වුණේ නැහැ. එහෙයින් ඉතාමත්ම ඉක්මණින් මේ ගැන වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනවා.

බට පැලලි විවීමත් අපේ ප්‍රදේශයේ තිබෙන තවත් කර්මාන්තයක්. පාඨශාලා ආදියට බට පැලලි ආදිය සැපයීමට ඒ ප්‍රදේශයේ සමිති සමාගම්වලට නියමව තිබුණා. එහෙත් දෙපාර්තමේන්තුවේ වරදක් නිසා හෝ එසේ නැත්නම් යම්කිසි කෙනකුගේ අක්‍රමිකතාවක් නිසා හෝ තවමත් පෞද්ගලික කොන්ත්‍රාත්කාරයන්ගෙන්ම එම බට පැලලි ලබාගන්න බව දැනගන්ට තිබෙනවා. මේ ළඟදී මේ පිළිබඳව ඒ දෙපාර්තමේන්තුවට දැනුම් දීමේ ප්‍රතිඵලයක් වශයෙන් මාස දෙකක් ඇතුළත පාඨශාලා 84 ක් සඳහා බට පැලලි සපයන ලෙස එක් සමිතියකට කියා එවා තිබුණා. මාස දෙකක් ඇතුළත පාඨශාලා 84 කට බට පැලලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සපයන්නට එම සමිතියට කිසිසේත් පුළුවන්කමක් නැහැ. සමහර විට මෙසේ කියා යවන ලද්දේ එම ඉල්ලීම ඉටු නොකළ හැකි බවට සමිතියෙන් ප්‍රකාශයක් ලබා ගැනීම පිණිස වන්ට පුළුවනි. දෙමාසයක් තුළදී පාඨශාලා 84 ක් සඳහා බට පැලලි සැපයිය නොහැකි බව ඒ සමිතිය මගින් දෙපාර්තමේන්තුවට ලියා යවනු ලැබීමෙන් පසු කරදරයක් නැතිව ඒ කටයුත්ත කොන්ත්‍රාත්කාරයන්ටම භාර දීමට පුළුවන් වෙනවා. මේ විධියේ තත්ත්වයක් පවතින නිසා බට පැලලි සැපයීමේ කොන්ත්‍රාත් ගෙන යෑමට සමිති සමාගම්වලට අපහසු වී තිබෙනවා. දැන් ටික දවසකට පෙර දෙපාර්තමේන්තුවත් සමඟ මේ ගැන සාකච්ඡා කළ අවස්ථාවේදී බට පැලලි සැපයීම සඳහා කල් දෙන බවට පොරොන්දු වුණා. මේ අවුරුද්දේ කොටසක් සපයා ඉතිරි කොටස ලබන අවුරුද්දේ සැපයීමට කටයුතු සලස්වන බවට පොරොන්දු වුණා. නමුත් අද වනතුරු ඒ පිළිබඳව කිසිම හැලහොල්මනක් නැහැ. සමහර විට පෞද්ගලික කොන්ත්‍රාත්කාරයින්ගෙන් බට පැලලි ලබා ගන්නවා වෙන්ට පුළුවනි. මේ සමඟම මතක් කළ යුතු කාරණයක් නම්, බට කර්මාන්තයේ නොයෙදෙන, බට පැලලි ගැන කිසිම දැනීමක් නැති, සමහර සමිතිවලින් මේ දෙපාර්තමේන්තුවට බට පැලලි සපයා තිබෙන බවයි. පෞද්ගලික කොන්ත්‍රාත්කාරයන් විසින් මේ විධියේ වැඩ කරවනු ලබන බව දැන ගන්ට තිබෙනවා. බට පැලලි සම්බන්ධව කිසියම් අක්‍රමික වැඩ පිළිවෙළක් ඇති බව මේ කාරණාවලින් හරි හැටි ඔප්පු වෙනවා.

දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) කී පරිදි ග්‍රාම සංවර්ධන සමිතිවලින් විශාල සේවයක් සිදු වන බව මා පිළිගන්නවා, නමුත් ග්‍රාම සංවර්ධන සමිති සම්බන්ධයෙන් තිබෙන එක්තරා අඩුපාඩුවක් මතක් කරන්න සතුටුයි. විවිධ සේවා සමුපකාර සමිතිවලට ව්‍යවස්ථා මාලාවක් තිබෙනවා. එහෙත් සාමාජිකයන් පත් කරන්නේ මෙහෙමයි, අස් කරන්නේ මෙහෙමයි, කටයුතු කළ යුත්තේ මෙහෙමයි, ආදි වශයෙන් සඳහන් වන ව්‍යවස්ථා මාලාවක් ග්‍රාම සංවර්ධන සමිතිවලට නැහැ. එම නිසා සමහර ග්‍රාම සංවර්ධන සමිති අවුරුදු ගණන් රැස්වීම් පවත් වන්නේ නැතිව තිබෙනවා. සමහර සමිති පවත් වාගෙන යන්නේ නිලධාරීන් දෙතුන් දෙනා කුගේ වුවමනාවටයි. සමහර ඒවාට ලැබෙන ආධාර මුදල්වලට සිදු වන්නේ කුමක්ද කියා සාමාජිකයන් දන්නේ නැහැ. එම නිසා ග්‍රාම සංවර්ධන සමිති සඳහා ව්‍යවස්ථා මාලාවක් සකස් කරන්නට දෙපාර්තමේන්තුව විසින් වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. සමහරවිට ග්‍රාම සංවර්ධන සමිතිවලටම ඒ ව්‍යවස්ථා සම්පාදනය කරන්නට අවවාද කළත් සමිතිවලින් සම්පාදනය කරන ව්‍යවස්ථා එතරම් ප්‍රමාණවත් වන එකක් නැහැ. මන්ද? ආණ්ඩුවත් සමඟ සම්බන්ධකම් තිබෙන නිසා විවිධ සේවා සමුපකාර සමිති ව්‍යවස්ථා මෙන් ව්‍යවස්ථා මාලාවක් ග්‍රාම සංවර්ධන සමිති සඳහාත් ආණ්ඩුවේ අනුදැනීම ඇතිව සකස් කරන්නට ඕනෑ. එසේ සෑදුවොත් විශාල මෙහෙයක් එයින් සිදු කරන්නට පුළුවන් වෙනවා ඇති. ඒ වගේම තවත් වැදගත් කාරණයක් තිබෙනවා. මීට පෙර කථා කළ මන්ත්‍රීවරුන් කීප දෙනකු පෙන්නුම් කළ ආකාරයට බොහෝ ග්‍රාම සංවර්ධන සමිතිවලින් පාරවල්, ලිං, වැසිකිළි ආදිය ආණ්ඩුවේ ආධාර මුදල්වලින් තනනවා. එසේ තැනුවත් ඒවාට ආධාර මුදල් දෙන්නේ ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයේ සභාපතිතුමා ඒවා භාර ගන්න බවට ලිපියක් දුන්නොත් පමණයි. ග්‍රාම සංවර්ධන සමිතියකින් පාරක් සදනවා නම් ඒ පාර පළාත් පාලන ආයතනය භාර ගන්නවායයි කිව්වොත් පමණයි, දෙපාර්තමේන්තුව ඊට ආධාර දෙන්නේ. එහෙත් පළාත් පාලන ආයතන ඉතා දුර්වල තත්ත්වයක තිබෙන නිසා ඒවාට පුළුවන්කමක් නැහැ, ග්‍රාම සංවර්ධන සමිති මගින් සදන සෑම පාරක්ම භාරගෙන නඩත්තු කිරීමට. සමහරවිට ග්‍රාම සංවර්ධන සමිති මගින් පිළියෙළ කරන පාරවල් පළාත් පාලන ආයතනවල ව්‍යවස්ථාවලට එකඟ නොවන ආකාරයට පිළියෙළ කරන පාරවල් නිසාත්, එවා භාර ගැනීමේදී පළාත් පාලන ආයතනවලට නොයෙක් කරදර ඇති වෙනවා. ආණ්ඩුවෙන් ආධාර දී යම්කිසි වැඩක් කළාට පසු එය නඩත්තු කරන්නට තවත් දෙපාර්තමේන්තුවකට භාර දීම මහා විහිලුවක්. එම නිසා ග්‍රාම සංවර්ධන සමිති පළාත් පලාන ආයතන මගින් පාලනය වෙනවා නම් අපට පුළුවන් වෙනවා, යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න. එවිට පළාත් පාලන ආය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. ඩී. ඩී. පෙරේරා මයා.]

තන මගිනුත් පාරවල් සෑදීම සඳහා මුදල් වියදම් කරන අතර ප්‍රදේශයට අවශ්‍ය වන අන්දමින් ග්‍රාම සංවර්ධන සමිති මාර්ගයෙනුත් පාරවල් සෑදීම සඳහා මුදල් වියදම් කරන්නට පළාත් පාලන ආයතනවලට පුළුවන්කම ලැබෙනවා.

තවත් ඉතා වැදගත් කරුණක් ගැන කියන්නට තිබෙනවා. මොරටුවේ ගරු මන්ත්‍රීතුමා (මෙරිල් ප්‍රනාන්දු මයා.) කථා කරමින් ගිනි පෙට්ටි කර්මාන්තය ගැන හොඳ විස්තරයක් කළා. එතුමා විසින් කියන ලද සෑම කාරණයකට ම මා එකඟ වෙනවා. මෙවැනි සුළු කර්මාන්ත ඇති කර මෙරට ඒ කර්මාන්ත අතින් ස්වයංපෝෂිත කරන්නට ඉදිරිපත් වන නොයෙක් සමිති සමාගම් නැත්නම් පුද්ගලයින් සිටින නමුත් දෙපාර්තමේන්තුවෙන් ආධාර නොකරන නිසා ඔවුන්ට කිසිවක් කරන්නට නොහැකිව තිබෙනවා. විස්තර විමසූ අවස්ථාවකදී මට දැන ගන්නට ලැබුණා, ගිනි පෙට්ටි සෑදීම එක්තරා සමිති සමාගම් කීපයකට පමණක් සීමා කර තිබෙන නිසා වෙන අයට ඒවා නිපදවන්නට ඉඩ දෙන්නට බැරි බව. හොඳයි ඒක අපි පිළිගන්නවා. නමුත් මෙරටට අවශ්‍ය සත 5 හේ ගිනි පෙට්ටිය පිටරටින් ගෙන්වීමට සිදු වීම ආණ්ඩුවේ ලජ්ජාවට කරුණක්. එම නිසා අපට යුතුකමක් තිබෙනවා ආණ්ඩුව මගින් මෙවැනි දේවල් නිපදවන්න යම් යම් ව්‍යාපාර ඇති කරන්නට. දැනට දින කීපයකට කලින් හඳුන් කුරු කර්මාන්තය දියුණු කිරීම සඳහා සමිතියක් පිහිටුවා ආණ්ඩුවේ ආධාර ඇතිව එය කරගෙන යන්නට අප අදහස් කළා. ඒ සෑම වැඩ පිළිවෙලක්ම සකස් කිරීමේදී දෙපාර්තමේන්තුව ළඟට එන තුරු කටයුතු කරන්නට පුළුවනි. එතැනට ආවාට පසු සම්පූර්ණයෙන්ම ඒවා කඩාකප්පල් වෙනවා. ඒ මන්ද? ආධාර දෙන බව කිව්වත් නියම විධියේ ආධාර ක්‍රමයක් නැති නිසයි. මේ නිසා සමිති සමාගම් ඉතා අධෛර්යයට පත් වී සිටිනවා. එපමණක් නොවෙයි, මගේ අත්දැකීම් අනුව මට කියන්නට පුළුවනි නිලධාරීන් හතර දෙනකු සමග කථා කළොත් ඒ අය හතර දෙනා කරුණු විස්තර කර දෙන්නේ හතර ආකාරයකටයි. සමහර සමිති විශාල මහන්සියක් ගන්නවා. ඒ වගේම ඇතැම් සමිතිවල ලොකු අරමුදලක් තිබෙනවා. එහේත් වැඩ කිරීමට දෙපාර්තමේන්තුව ආධාර නොකරන නිසා ඒ වැඩ කටයුතු ගෙන යන්න පුළුවන්කමක් නැහැ. විශාල කර්මාන්ත ඇති කිරීම සඳහා කල්පනා කරන අතරම ගිනිපෙට්ටි, හඳුන් කුරු, එහෙම නැත්නම් මැටි කර්මාන්තය ආදී කර්මාන්ත ගම්බද පළාත්වල ඇති කිරීමෙන් විශාල ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවන් බවත් කල්පනා කරන්නට ඕනෑ.

අසභ්‍ය පොත් පත් හා චිත්‍රපටි සම්බන්ධයෙනුත් වචනයක් දෙකක් කිය යුතුව තිබෙනවා. එක් දිනක් නුවර එළියේ මන්ත්‍රීතුමා (ටී. විලියම් ප්‍රනාන්දු මයා.) කථා කරන අවස්ථාවකදී ඒ පිළිබඳව හොඳ විස්තරයක් කර දෙන්නට යෙදුණා. මට ලැබී තිබෙන ආරංචියේ හැටියට සභ්‍ය අසභ්‍ය යන වචන දෙකේ තේරුම සොයා ගැනීම දෙපාර්තමේන්තුවට ලොකු හිස රදයක්ව තිබෙනවා.

මේ අසභ්‍ය කියන වචනය ඉංග්‍රීසි සංස්කෘතිය අනුව කල්පනා කළාම පළල් තේරුමක් තිබෙනවා, නමුත් සිංහල සභ්‍යත්වය, සංස්කෘතිය අනුව නම් කෙටි තේරුමක් තිබෙනවාය කියනවලු. ඒ නිසා මේ අසභ්‍ය කියන වචනයේ තේරුම සොයා ගන්න බැරුව දෙපාර්තමේන්තු දඟලනවාය කියා ආරංචියි. ඇත්ත වශයෙන් කියතොත් අසභ්‍ය චිත්‍රපටියක් බලන විට, එසේ නැත්නම් අසභ්‍ය පොතක් බලන විට, අසභ්‍ය කියන්නේ කුමක්ද, සභ්‍ය කියන්නේ කුමක්ද කියා කුඩා දරුවකුට වුණත් තේරුම් ගන්න පුළුවනි. සමහරවිට බාල නැටුමක් නටනවා නම්, එසේ නැත්නම් ඉංග්‍රීසි චිත්‍රපටයක කාන්තාවක් නිරුවතින් රඟ දක්වනවා නම් ඉංග්‍රීසි ක්‍රමය අනුව එය අසභ්‍ය නොවුවත් සිංහල ක්‍රමය අනුව, නැත්නම් සිංහල සභ්‍යත්වය සංස්කෘතිය අනුව, එය ශීලාචාරයයි, හොඳ යයි කිසිවකු කල්පනා කරන්නේ නැහැ. ඒ අනුව කල්පනා කර බලන විට මේ අසභ්‍ය කියන වචනයේ තේරුම සොයා සොයා අවුරුදු ගණනාවක් කාලය ගත කරන්න කල්පනා කළොත් අසභ්‍ය පොත් පත් චිත්‍රපටි ආදිය නිසා මේ රට විනාශ වෙන්න පුළුවනි. එම නිසා වචනයේ අර්ථය පැහැදිලි කිරීමට වටහාගැනීමට යනවාට වඩා අසභ්‍ය කියන වචනයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සාමාන්‍ය අදහසක් තේරුම් ගෙන සිංහල සංස්කෘතියට සභ්‍යත්වයට ගැළපෙන ආකාරයෙන් කල්පනා කොට සඟරා, පොත් පත්, චිත්‍රපට ආදියෙහි යම්කිසි තහනමක් ඇති කිරීමට මහන්සි ගන්නවා නම්, එය ඉතාමත් හොඳයයි කියන්න පුළුවනි.

ගරු සභාපතිතුමනි, රා මැදීම සම්බන්ධයෙන් වචන දෙක තුනක් ඊළඟට කථා කිරීමට මා අදහස් කරනවා. ඇත්ත වශයෙන්ම මගේ ප්‍රදේශයේ ඇති බලවත් කරදරයක් තමයි, මේ හොර සුරා ව්‍යාපාරය. මෙයට දින කීපයකට පෙර හොර මත් පැන් පානය කිරීම නිසා ඒ ස්ථානයේදීම මත්පැන් විෂ වී දෙදෙනකු ජීවිතක්ෂයට පත් වුණු බව අපට පුවත්පත්වලින් දැක ගන්න ලැබුණා. මේ අන්දමින් මරණ විශාල සංඛ්‍යාවක් අප රටේ දිනපතා ඇති වෙනවා. අද හිරගෙවල සංඛ්‍යාව වැඩිවන්නේද, අපරාධ සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යන්නේද, උසාවිවල නඩු වැඩි වන්නේද, මේ හොර සුරා නිසා බව රහසක් නොවෙයි. එම නිසා මෙයට නියම ප්‍රතිකර්මයක් යෙදිය යුතු කාලය දැන් එළඹී තිබෙනවා. මේ කාරණය සම්බන්ධයෙන් නොයෙක් විධියේ අදහස් නොයෙකුත් ගරු මන්ත්‍රීවරුන් විසින් මේ ගරු සභාවේදී ප්‍රකාශ කළා. අරක්කු මිල අඩු කිරීමෙන්, රා තැබෑරුම් හැම තැනම විවෘත කිරීමෙන්, මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්වේය කියා කීවා. නමුත් අරක්කු මිල අඩු කිරීමෙන් වත්, සෑම තැනකම තැබෑරුම් විවෘත කිරීමෙන්වත්, මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳන්න ලැබෙන්නේ නැහැ. සමහර විට රා තැබෑරුමක් හැතැප්ම 10ක් 12ක් 15ක් 20ක් දුරින් පිහිටෙව්වත් ගම්බද ජනතාවට තමන්ට අවශ්‍ය වේලාවට මත්පැන් ලබා ගැනීමට පහසු වෙන්නේ නැහැ. එම නිසා මෙයින් බලාපොරොත්තු වන නියම ප්‍රයෝජනය ලබා ගැනීමට පුළුවන් වෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මා යෝජනාවක් වශයෙන් මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන කාරණයක් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ සැලකිල්ල නැවත වරක් යොමු කරවන්නට කැමතියි. මන්ද? එක් අයකුට එක පොල්ගසක් මැද ගැනීමට අවසර දෙනවා නම් මේ හොර සුරා අලෙවිය සම්පූර්ණයෙන්ම නවත්වා දමන්ට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. සමහරුන් කල්පනා කරන්න පුළුවන්, ගසක් මැදීමට අවසර දීමෙන් මේ රටේ සෑම දෙනාම වාගේ සුරාවට ඇබ්බැහි වෙනවාය කියා. නමුත් මේ රටේ ශීඝ්‍රයෙන් වැඩි වෙන අපරාධ සංඛ්‍යාව අතින් සලකා බලන විට, ඒවා අඩු කිරීමට ඇති වැදගත්ම ප්‍රතිකර්මයක් වශයෙන් මෙසේ රා මැදීමට අවසර දීම වඩාත් නුවණට හුරු යයි මම කල්පනා කරනවා. මා එසේ කියන්නේ මේ හේතුව නිසයි. සාමාන්‍යයෙන් මහජනයා නීති විරෝධී මත්පැන් පාවිච්චි කරන්නේ ප්‍රසිද්ධියේ නොවෙයි. කෑලයකට ගිහිල්ලා යන්න බැරි තරම් තත්ත්වයකට තමා පත් වන තෙක් බොනවා. මේ නිසා ඉබේම කලකෝලාහල වලට මිනිසුන් පෙළඹෙනවා. නමුත් තමන්ට වුවමනා කරන පිළිවෙළට ගසක් මැද ගැනීමට අවසර දෙනවා නම්, මේ අන්දමට මත්පැන් බී කලකෝලාහල කර ගන්න මිනිසුන් පෙළඹෙන්නේ නැතැයි මා කල්පනා කරනවා.

ඒවාගේම තවත් එක් කාරණයක් ගැන මතක් කර දෙන්න ඕනෑ. යාපනයේ ප්‍රදේශයේ වැසියන්ට තල්ගස් මැද ගැනීමට රජයෙන් අවසර දී තිබෙනවා නම් ඇයි අපේ ප්‍රදේශවල වැසියන්ට ගස් මැද ගැනීමට අවසර නොදෙන්නේ කියා ප්‍රශ්න කරන්න පුළුවනි. මේ සමහම තවත් කොටසක් කියා සිටින්න පුළුවනි, මෙසේ ඉඩ දීමෙන් අපේ ළමයින් සහ කාන්තාවන් මත්පැන් බීමට පෙළඹෙනවාය කියා. නමුත් මම මේ අදහසට එකඟ වන්නේ නැහැ. මන්ද? දැනටමත් හොර සුරාවට අපේ රටේ ළමයින් බොහෝ දුරට ඇබ්බැහි වී සිටිනවා. එසේ නම් අප නිගමනය කර ගන්න ඕනෑ, මේ හොර සුරා බීමෙන්—විෂ ද්‍රව්‍ය බීමෙන්—අපේ බාල පරම්පරාව නිදහස් කර ගන්නවාද, එසේ නැත්නම් ඔවුන් රා බීමට පුරුදු වනවාය කියා නිගඩව සිටිනවාද යන කාරණයයි.

ගරු සභාපතිතුමනි, මෙසේ ඉඩ දීමෙන් සැලසෙන ප්‍රයෝජන රාශියක් තිබෙනවා. එසේ අවසර දීමෙන් රජයට විශාල ආදායමක් ලැබෙනවා. ජනතාව හොර සුරාවෙන් මුදා ගන්න ලැබෙනවා. ගස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. ඩී. ඩී. පෙරේරා මයා.]

මැදීමට අවසර දීමෙන් ලැබෙන ආදායමෙන් පළාත් ආණ්ඩු සභාවලට, ගම්කාර්ය සභා වලට ඒ ඒ පළාත්වල වැඩ කටයුතු කිරීමට අවකාශ ලැබෙනවා ඇති.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන් ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපති මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 1961 සැප්තැම්බර් 5වන අඟහරුවාදා.

කල් තැබීම

යෝජනාව ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. "මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය"—[ගරු මෛත්‍රීපාල සේනානායක]

ඩබ්ලිව්. දහනායක මයා. (ගාල්ල)
(திரு. டப்ளியு. தகனாயக்க—காலி)
(Mr. W. Dahanayake—Galle)

I wish to bring to the notice of the Hon. Acting Minister of Health and the Hon. Minister of Education jointly, a certain subject which concerns them both. Eighty-nine students qualified for direct admission to the Faculty of Medicine of the University of Ceylon, Peradeniya, at a combined Preliminary and 1st M.B. examination held in December, 1960. These 89 students have not yet been admitted to the University. They have not been informed when they may hope for admission. They seem to have been completely ignored.

It is admitted by one and all that there is a very serious shortage of qualified medical men. It is not an easy task for a student to qualify for direct admission to the Faculty of Medicine. It is only the very cleverest who can so qualify. It would be a pity if 89 of our very best students are thus thrown into the streets.

I would request the two Hon. Ministers to hold joint consultations with a view to taking these students into the Peradeniya University at once.

පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)
(திரு. பேர்சி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

How much of personal attention has the Hon. Minister given to these departments ? How many of these corporations has he visited personally during the course of last year ? Has he made any personal reports on the working of these important corporations ? Is he aware of the shortcomings of these corporations ? The answer is, "No". Neither the Hon. Minister nor his Permanent Secretary can give us in detail any explanation as to, say, the recurring losses in these corporations. In the course of my remarks, I shall make a few observations in regard to these corporations.

I will now proceed to itemize these industries under the various Votes. In regard to the appointments under the new village headmen scheme it has been remoured time and again that certain Members of Parliament and others who are aligned with various political parties have been drawing up lists of proposal headmen—*grama sevakas*. We do not know whether this is true. We can only come to conclusions in this matter by judging the Government from past evidence. Take, for instance, the applications to schools where teachers were concerned. We have found that there was political influence——

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
Where ? There was nothing.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

When the Education Minister's Vote is taken up, I shall depend on no less a person than the Director of Education to substantiate the allegations I make. I have challenged the Hon. Minister of Education in the presence of Dr. Ananda Guruge on this matter.

Further, both in regard to the C. W. E. and your corporations, we find that certain unsatisfactory appointments have been made. Are we not, therefore, justified in thinking that there may be some truth in these rumours ? I have of course not seen these lists. If I had seen them, I would have said so. But these rumours are afloat. So, I would ask the Hon. Minister to ensure to the best of his ability that only those who are deserving and have a meritorious record will secure these appointments.

From that point I will pass on to the activities of the present Divisional Revenue Officers. I have found that their activities are duplicated in the kachcheris. For instance, when you want assistance for flood relief, you find that by the time the assistance comes more damage has occurred. Apparently, the Government Agent does not send a separate officer for inquiry. He depends on the inquiry and report of the D. R. O. Then why can you not delegate that power to the D. R. O. to deal immediately with the situation ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසිංහ මයා.]

The activities of the Divisional Revenue Officers and the rural development societies are closely connected. What is the position of these societies? Yesterday, the hon. Member for Dambadeniya (Mr. R. G. Senanayake) said that Rs. 1,750,000 was allocated as grants to these societies. He said that there was only Rs. 1,000 to each society. That is incorrect. It is Rs. 11,000. But what is Rs. 11,000?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

No, that is not correct. It is something more. That is only under one Vote. If you look at the other Votes, you will see that there is much more.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

How much? I ask the Hon. Minister to tell us fairly and squarely.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

I cannot be interjecting my answers at every point.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

If the Hon. Minister chooses to intervene, he must answer the point fully. Or let him give us a chance of replying after he makes his speech.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

If the hon. Member will read the Estimates correctly, he will find that there is much more under the other Votes.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

I have read the Estimates correctly. Nowhere in the Estimates is it stated that the rural development societies can draw more than Rs. 1,750,000. If they want to do so, they will have to come again and appeal to the Hon. Minister. We know what reply has been given to them. I will give a particular instance where I myself appealed to the Hon. Minister. More than a month has passed, but still I have not had the courtesy of a reply from him.

That is the position. In our rural areas the people are prepared to contribute voluntarily. They want only some minute assistance from the Government—in most cases a couple of thousand rupees—[*Interruption*]. The villagers and the rural population are prepared to contribute the food needed for the people who work. But even that minute assistance we cannot get from this Government.

Time and again we have gone to them. It has always been a matter of putting us off on one excuse or another. The favourite device is to pass us from one Ministry to another Ministry. When we go to the Ministry of Industries we are told: "This comes under the Ministry of Local Government." When we go to the Ministry of Local Government we are told: "No, this comes under the Ministry of Transport". From there we are very often referred to the Ministry of Agriculture. Then again they send us back to the Ministry of Industries! So it goes on. We are shuttled from one Ministry to another Ministry. I think people have got thoroughly dissatisfied and frustrated. They are giving up their attempts to obtain assistance from the Government even in a small way. The spirit of rural development is being given up by them. I appeal to the back benchers of the Government, because they know what the position is, to tell the Hon. Minister what is happening to all our rural development undertakings. Many of these back benchers have told us that their position is just the same when they try to get some assistance from the Government. They must tell the Hon. Minister that when we apply for rural development assistance this assistance must be forthcoming and forthcoming immediately.

Mr. Chairman, the time at our disposal is limited. We can speak on

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

one Department for an hour—the drawbacks are so many—but time does not permit us to do so.

I want to speak a few words about the Excise Department. The hon. Member for Yatiyantota (Dr. N. M. Perera) spoke very disparagingly of this Department. It may be that there are certain faults in this Department—I do not say no—[*Interruption*] but we must find out where the fault lies. During the last Budget Debate I asked the Hon. Minister what the set-up of this Department is. I pointed out to him that he was assigning excise inspectors to bring cases up in court and was pitting them against first-rate lawyers and advocates. These excise inspectors have no knowledge of the law themselves and naturally these cases fail. How can you blame them? You have not given them a training. You have not given them elementary knowledge of how to conduct court cases. How can you expect them to make this Department a success?

Let the Hon. Minister deny this if he can. The entire Excise Department has not got more than a dozen and a half vehicles for the purpose of patrolling the length and breadth of this island. How can you expect them to fight the *kassippu* menace with such meagre equipment? How many vehicles do you think the Excise Department has? What is the strength of the Excise Department? Look at the situation, Mr. Chairman. For one whole district, only one inspector and three or four guards are provided to tackle all the work. Is that not true? Why is the Hon. Minister joining hands with the hon. Member for Yatiyantota in slinging mud at his own Department when the fault lies with him, the Minister? —[*Interruption*].

අ. භා. 2.15

Yes, the Hon. Minister must either scrap the entire Department or amalgamate it with the Police Department. Or the Hon. Minister must give this Department all the assistance he can. You have no business to condemn Government servants in this vulgar fashion when they have no chance of replying. It is most unfair. I for one do not wish to associate myself with this type of unfair criticism. I have said that the Excise Department is not above blame. In many instances people have complained to me that excise officers have taken bribes. It may be so. It may not be so. I am not holding a brief for them. I am only telling you that you must judge a case on its merits. If you refer to the provision made for this year what do you find? You say that *kassippu* is becoming an ever increasing menace. Look at your Estimates. Are you increasing the strength of your striking force? Are you increasing the strength of your Excise Department? Are you providing for more vehicles for this Department. What are you doing? Do you hope to come in here next year and again save your face by making scapegoats of your own officers?

ස්ටැන්ලි තිලකරත්න මයා. (කෝට්ටේ)
(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)
(Mr. Stanley Tillekeratne—Kotte)

Scrap the Department or reorganize it.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

Yes, the Hon. Minister should either scrap the Department or reorganize it. If he does that I would be the first to applaud him. But I will certainly not be a party to this mud-slinging on people who cannot reply.

Then I come to the actual Department of Industries. I want to ask the Hon. Minister about the working of the Kantalai sugar factory. I have been there on two occasions during the last six months. The Hon. Minister in reply to a question asked by the hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena) said that from the 1st October the entire Corporation would come under the Ministry of Industries. I want to ask the Hon. Minister whether the Pioneer Corps, too, would come under his Ministry—[*Interruption.*] No,—he says "no". What do you mean? You say that you are taking over the entire Corporation but at the same time you say that all these people who are working in the field will not come under you——

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

It is organised under the Ministry of Defence and External Affairs.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

That is the point. The Hon. Minister says that it comes under the Ministry of Defence and External Affairs, this Pioneer Corps. You do not know the workings of your own Corporations. You told us that you are taking over this Sugar Corporation entirely, but every single workman is going to be under the directions of the Ministry of Defence and External Affairs. What is the meaning of this explanation ?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

The question was posed by the hon. Member as to whether the Pioneer Corps would come under my Ministry. The pioneer corps is an organization under the Ministry of Defence and External Affairs. I am using them for harvesting. That does not mean that I am taking them over.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

May I put it this way ? Will the Hon. Minister accept that all the sugar cane harvested, all the sugar cane planted, all the transport of this cane, is the work of the Pioneer Corps ? In other words 90 per cent of the wokers in the sugar plantation are men belonging to the Pioneer Corps. If you are taking over this Corporation entirely and want to run it efficiently, these men must be under your direct control. You cannot be going from Ministry to Ministry for your labour. We found that as a result of pulling in different ways by you and the Hon. Minister of Agriculture, Land, Irrigation and Power the Corporation has not been successful. You are again leaving room for the same set-up. Last year what was the estimated acreage to be cultivated and what was actually cultivated ? A Russian team cleared a jungle of 400 acres last year whereas 1,000 acres should have been cleared. Will the Hon. Minister admit that not one acre of the plantation was manured last year ? And what is the result ? The sugar cane has not reached maturity for harvesting and crushing into sugar. Therefore, the Corporation is running at a loss. These are stark, naked, facts.

When the Corporation calls for funds, the Industries Department says they have no funds and directs it to the Department of Agriculture. Then the Department of Agriculture says that they have no funds and directs it to the Industries Department. So they play ball between the two of them and at the end of the year the balance sheet shows a loss. Therefore, I ask the Hon. Minister to consider very seriously the question of decentralizing the work so that he could pay more attention to this important Corporation.

Next, I wish to refer to the Leather Factory. It is doing very well. It is one of the few Corporations that are doing well—thanks, I may say, to Mr. Robin Rutnam.

නීල් ද අල්විස් මයා. (බද්දේගම)
(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)
(Mr. Neal de Alwis—Baddegama)

What about the U. N. P. days ?

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

It was doing very much better !

The Hon. Minister wants to protect the Leather Factory. He has imposed a duty of 115 per cent on imported leather. What was the leather he was trying to protect ?

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

I do not know !

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

I know that the Hon. Minister has much uses for leather !

ගරු මෛත්‍රිපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

Do not judge me by your standards !

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

The leather that he was intending to protect was the cow hide. He has banned the import of cow hide. Cow hide is used for the manufacture of little children's and ladies' shoes. You impose a duty of 115 per cent and what is the result ? A poor family is unable to buy a pair of shoes for the children and the women. It has become impossible for them to pay that high price. A little child's pair of shoes costs as much as Rs. 20 owing to the inordinately high duty that has been imposed. I ask the Hon. Minister not to blindly sign an order raising the duty from 5 or 15 per cent to 115 per cent but to consider the matter very carefully. He should find out for what purposes these articles are used. I want to know from the Hon. Minister whether he will consider the question of giving some relief if he finds that the statements I have made now are true.

I shall now refer to the Oils and Fats Corporation. Here is a first-class over-capitalised Corporation. The Hon. Minister will say that he was not the Minister in charge then, but he is a member of the Cabinet. Have you attempted to rectify the situation ? You are visiting your sins on other departments. The Department of Agriculture is forced to buy the products of the Oils and Fats Corporation at almost double the price of similar products in the market. Representations had been made to the Hon. Minister of Agriculture, Land, Irrigation and Power about that. The Director of Agriculture has recommended that the Department of Agriculture farms should purchase their requirements outside the Oils and Fats Corporation because their products are far too expensive.

Poultry breeding and animal husbandry was recommended as a small scale industry in this country. The Corporation's poultry food is very expensive. I made a written request to the Hon. Minister on behalf of my electorate to sell poultry food at a cheaper price, because in my electorate there are stretches of land available for poultry breeding and animal husbandry. The Hon. Minister told me that the Oils and Fats Corporation requires all the stale flour. I then checked up the facts and found that there were 85,000 bags of stale flour available at that time and the Oils and Fats Corporation required only 2,000 bags. The Hon. Minister had not bothered to verify his facts. " Saddled with an enormous amount of work " is no excuse. As far as we are concerned, we want a job of work done, we do not care who does it. I cannot go back to my electorate and say that the Hon. Minister could not find his facts and figures. I might rather say that he is incapable of verifying his facts and figures.

I shall now come to the pet subject of the Hon. Minister, the Industrial Protection Act. What is this Industrial Protection Act that you have foisted on the people ? Have you gone into the working of the Industrial Protection Act ? You are blindly giving a blank cheque to various people to run monopolies. Have you seen the profits these people are making ?

ගරු මෛත්‍රිපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

We have just promulgated the Act !

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

The Hon. Minister has not checked up the margin of profit. The locally produced article is selling at only 10 per cent below the imported article. That is after you have imposed a duty of about 100 per cent on the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසිංහ මයා.]

imported article. The companies under the Industrial Protection Act are making colossal profits. The consumer still has to pay a higher price. Not only that, you are forcing the consumer to buy shoddy material under the Industrial Protection Act. You do not insist on a standard of production, you do not insist on a quality standard. That is either because you do not have the necessary machinery or you are not interested in it.

I say that the consumer also must be protected. He must not be fleeced. It is the duty of the Hon. Minister to see that the consumer gets his article at a fair price and he must also see that the consumer gets a genuine article. I sincerely hope that the Hon. Miinster will pay much attention to this matter at least in the coming year. The Industrial Protection Act should not be taken as a licence for selling inferior products. There is not a word mentioned about the quality of products in the little booklet issued by the Hon. Minister called the Investor's Guide. There is a beautiful picture of the Hon. Minister there. Quality is a pre-requisite.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

Other bulletins are coming.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

You should lay it down here. When you give protection to investors you should also see that they render service to the people. It is no use saying that you are going to start—

අ. භා. 2.30

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

In that booklet I am stating the position generally. You will have to wait for the law implementing it.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

Two years have gone and the law is still not with us.

A word about excise policy. The Hon. Miinster has reduced the price of arrack and I sincerely hope it will help fight the *kasippu* menace to some extent. But why have you prohibited the transport of locally-produced liquor while allowing foreign liquor to be transported in any quantity throughout the land? The poor man who wants to take a couple of bottles of toddy home is caught and prosecuted, but you let alone those who carry any number of bottles of foreign liquor. I cannot understand the sense of this.

නීල් ද අල්විස් මයා.
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

These are your old U. N. P. laws.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

I do not care whose laws they are, but once it is realized that the laws are senseless and iniquitous it is the duty of the Government to remove them. I ask the Hon. Minister whether he will permit the free transport of locally-produced liquor in the same way as foreign liquor. That is all I have to say.

අ. භා. 2.30

පී. ආර්. රත්නායක මයා. (මාවනැල්ල)
(திரு. பீ. ஆர். ரத்நாயக்க—மாவனல்லை)
(Mr. P. R. Ratnayake—Mawanella)

ගරු සභාපතිතුමනි, මම දීර්ඝ වශයෙන් කථා කිරීමට මේ අවස්ථාවේදී අදහස් කරන්නේ නැහැ. අපේ ගම්බද පළාත් සම්බන්ධයෙන් කරුණු සවලපයක් කථා කිරීම වැදගත් යයි මම කල්පනා කරනවා. මෙම වැය ශීර්ෂය පිළිබඳව කරුණු දැක් වීමට පෙර ගරු දොඩම්ගස්ලන්දේ ගරු මන්ත්‍රීවරයා (ඒ. යූ. රොමානිස් මයා.) විසින් ඊයේ මෙම ගරු සභාවේ දී කරන ලද ප්‍රකාශයක් සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර දීම අවශ්‍ය යයි මම කල්පනා කරනවා. එතුමාගේ කථාවේදී සඳහන් කළා, ග්‍රාම සේවක තනතුරුවලට පත් කිරීම සඳහා දැනටමත් යම් යම් උදවිය තෝරා එවා තිබෙනවාය කියා. එතුමාට පිළිතුරු වශයෙන් මට කියන්නට පුළුවනි, ඔවැනි ප්‍රකාශ නොයෙක් නොයෙක් උදවිය නොයෙක් නොයෙක් අවස්ථාවලදී කරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නට පුළුවන් බව. රජයේ ජ්‍යෙෂ්ඨ පත්වීම් දෙන අවස්ථාවේදී මේ වාගේම ප්‍රශ්නයක් මතු වුණු බව මේ අවස්ථාවේදී මතක් කර දෙන්නට පුළුවනි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හිතවත්කම් දක්වන උදවියට මෙම ජ්‍යෙෂ්ඨ පත්වීම් දෙන්නට යනවායයි ප්‍රචාරයක් තිබුණත්, ඒ අවස්ථාවේදී ආණ්ඩුව සාධාරණ පිළිවෙළට, නියම ප්‍රතිපත්තියක් අනුව කටයුතු කළ බව තමුන්නාන්සේ දන්නවා ඇති. එම නිසා දොඩම්ගස්ලන්දේ ගරු මන්ත්‍රීවරයා කොයි ආකාරයේ අදහසක් මේ සභාව ඉදිරියේ තැබුවත්, නොයෙක් විධියේ ප්‍රචාරයන් ගෙන යාමට උත්සාහ දරුවත්—සමහර පුද්ගලයන් අතින් සිදුවන වැරදිවලට ආණ්ඩුවවත් ඇමතිතුමාවත් වගකීමට බැඳී නැහැ—ඒ වායේ කිසිම සත්‍යයක් නැති බවත්, මේ පත්වීම් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා විසින් ප්‍රතිපත්ති විස්තර කර තිබෙන ආකාරයට අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පැවැත්වෙන විභාගයෙන් සමත්ව ඉන් පසුව සම්මුඛ පරීක්ෂණයෙන් ද සමත්වුණායින් පසුව මෙම තනතුරුවලට පත්වීම් දෙන බවත් මට කිසිම සැකයක් නැතුව මේ අවස්ථාවේදී කියන්න පුළුවනි.

ගරු සභාපතිතුමනි, දොඩම්ගස්ලන්දේ ගරු මන්ත්‍රීවරයා ඒ සමගම සඳහන් කළා, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව තිබුණු කාලයේදී ඒ ආණ්ඩුව සමග එකට වැඩ කළ උදවිය දැන් පුද්ගලික ප්‍රයෝජන ලබා ගැනීම සඳහා මේ ආණ්ඩුවේ ගරු ඇමතිවරුන් පස්සේ යනවාය කියා. ඇත්ත වශයෙන් ඒ **කරුණු හෙළිකරවා දීම ගැන** එතුමාට අපේ ස්තුතිය හිමිවෙන්නට ඕනෑ. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු තිබුණු කාලයේදී මැති ඇමතිවරුන් පස්සේ ගිහින් ඒ අය නොයෙකුත් අල්ලස් දූෂණ ආදී කටයුතු සඳහා පොළඹවා ගත් උදවිය මේ ආණ්ඩුවේ ගරු ඇමතිවරුන් පස්සෙත් යනවා නම් ඒ අයගෙන් ප්‍රවේශම් වෙන ලෙස මම ගරු ඇමතිතුමන්ලාට විශේෂයෙන් මතක් කර සිටිනවා.

එක්සත් ජාතික පක්ෂයේ අය මෙන් මම ගරු ඇමතිතුමාට දොස් කියන්න අදහස් කරන්නේ නැහැ. එතුමා විශාල මහන්සියක් ගෙන කර්මාන්ත දියුණු කිරීම සඳහා වැඩ කරනවා. එසේම එතුමා පෞද්ගලික සුළු කර්මාන්තවලට ණය දීමේ ප්‍රමාණය වැඩි කර තියෙනවා. සමාගම් මඟින් කරන කර්මාන්තවලටත් දෙන ණය සීමාව රුපියල් 50,000 දක්වා වැඩි කර තිබෙනවා. එතුමා පිරිසිදු අදහසකින් සුළු කර්මාන්ත දියුණු කිරීම සඳහා වැඩ පිළිවෙළක් යෙදුවත් එයින් නියම ප්‍රයෝජන ලබා ගැනීමට ඇති වී තිබෙන අවහිරකම් කිපයක් ගැන ගරු ඇමතිතුමාගේ කල්පනාව යොමු කිරීමට මම කැමතියි. සුළු කර්මාන්තවලට ණය දීම සම්බන්ධයෙන් දැනට දෙපාර්තමේන්තුවේ තිබෙන ප්‍රතිපත්ති අනුව නියම වෙලාවට ණය ලබා ගැනීමට ලොකු අපහසුවක් තිබෙනවා.

ඒ ඒ දිස්ත්‍රික්කවල තිබෙන ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවල අනුමැතිය ඇතිවයි, සුළු කර්මාන්තවලට ණයක් දෙන්නේ. 1960 අවුරුද්දේදී අපේ පළාතේ සුළු කර්මාන්තවලට ණය ඉල්ලූ කීප දෙනකුටම තවම ණය ලබා ගන්නට බැරි වී තිබෙන බව මම දන්නවා. කෑගල්ලේ ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත නිලධාරිතුමාට කෙළින්ම මේ අයට මුදල් ගෙවීමට අවස්ථාවක් ලබා දී නැහැ. එතුමා පළාතේ ඉල්ලුම් පත්‍ර පරීක්ෂා කර රෙකමදාරු කර ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවට එවන්නට ඕනෑ. ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව ණය මුදල් ගෙවන්නේ දිස්ත්‍රික්කයේ නිලධාරි තැනගේ රෙකමදාරුව උඩ නම් මේ ණය දීමට ඒ දිස්ත්‍රික්කයේ සිටින නිලධාරිතුමාටම බලය දී ඒ ඒ දිස්ත්‍රික්කවලට මුදල් බෙදා වෙන් නොකරන්නේ කුමක් නිසාද කියා මම ගරු ඇමතිතුමාගෙන් අහන්නට කැමතියි. සුළු කර්මාන්ත නියම විධියට දියුණු කිරීමේ අදහසක් ගරු ඇමතිතුමාට තිබෙනවා නම් ඒ ඒ දිස්ත්‍රික්කවල සිටින නිලධාරීන්ට ඉල්ලුම් පත්‍ර රෙකමදාරු කිරීමේ බලය පමණක් නොව මුදල් බෙදා දීමේ බලයත් පවරා ඒ ඒ දිස්ත්‍රික්කවලට මුදල් වෙන් කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය කොයි තරම් හොඳ ව්‍යාපාරයක් වුණත් නියම විධියට කටයුතු කරන ග්‍රාම සංවර්ධන සමිති සියයට 5 ක් වත් නැති බව කියන්න ඕනෑ. සමහර ග්‍රාම සංවර්ධන සමිති දේශපාලන පක්ෂවල අතකොළු වෙලා තියෙනවා. අවුරුදු තුන හතරකට සමහර ග්‍රාම සංවර්ධන සමිතිවල රැස්වීම් පවත්වන්නෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. ආර්. රත්නායක මයා.]

නැහැ, සමිතිවලට කොන්ත්‍රාත් දීම පටන් ගත් පසු සමහර ග්‍රාම සංවර්ධන සමිති කල බල වෙලා තියෙනවා. කොන්ත්‍රාත් ලබා ගැනීමට ඒ අය උනන්දු වෙලා තියෙනවා. නියම විධියට රැස්වීම් පවත්වන්නෙ නැති, වාර්තා අනුව වැඩ කරන්නෙ නැති ග්‍රාම සංවර්ධන සමිතිවල සිටින නිලධාරීන් ඉවත් කර ඒ ග්‍රාම සංවර්ධන සමිතිවලට අළුතෙන් නිලධාරීන් පත් කිරීමට දෙපාර්තමේන්තුවට නියම කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, සමාජ සේවා දෙපාර්තමේන්තුවට වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණවත්ය කියන්න බැහැ. අපේ පළාත්වල සහනාධාර ලැබීමට සුදුසු අයගේ නාම ලැයිස්තු කෑගල්ල කච්චේරියේ පිළියෙළ කර තිබෙනවා. නමුත් තවම ඒ අයට ආධාර මුදල් ලබා ගන්නට බැරි වෙලා තියෙනවා. මුදල් ලැබිය යුතු සුදුස්සන් හැටියට තෝරා ගත් අයගේ නම් අවුරුදු ගණනක් කච්චේරියේ ලැයිස්තුවල තිබෙනවා. කෑගල්ලේ කච්චේරියේ පමණක් නොව අනෙක් කච්චේරිවලත් එලෙස ඇතැයි මම හිතනවා. සමහර දෙනකුට සහනාධාර දීම අනුමත වී එන විට ඔවුන් මිය ගොස්. ඔවුන්ට සහනාධාර නොලැබෙන්නේ මුදල් නැතිකම නිසාලු. නියම විධියට සහනාධාර ලැබිය යුත්තන්ට මුදල් නැතිකම නිසා ඒ ආධාර නොලැබෙතත්, සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් සමහර නුසුදුස්සන්ගට සහනාධාර ලැබෙනවා. එම නිසා ඒ මුදල් ලැබිය යුතු අයට ඒවා දීම සඳහා මීට වඩා ක්‍රමවත් වැඩ පිළිවෙළක් යොදවන අතර සහනාධාර නොදිය යුත්තන්ට ඒ මුදල් නොලැබෙන ලෙස වග බලා ගන්න මෙන් මම ඉල්ලනවා.

සුරාබදු දෙපාර්තමේන්තුව පිළිබඳව නොයෙක් විධියේ විවේචන ඇති වී තිබෙනවා. ඒ පිළිබඳව සෑහෙන පමණ කරුණු සාකච්ඡා වූ නිසා ඒ ගැන වැඩි දුර කථා කිරීමට මම කල්පනා කරන්නේ නැහැ. එහෙත් ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කිරීම සඳහා කාරණයක් දෙකක් කියන්ට අදහස් කරනවා. යටියන්නොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්‍ය එන්. එම්. පෙරේරා) කීවාක් මෙන්, ඒ දෙපාර්තමේන්තුව විසුරුවා හැරීමටයි තිබෙන්නේ. ඒ දෙපාර්තමේන්තුවෙන් අපේ රටට කිසිත් සේවයක් සිදු වන්නේ නැහැ.

අද සුරා සූදු විරෝධීන් එක් අදහසක් ඉදිරිපත් කරන අතර, ඊට විරුද්ධ අය තවත් අදහසක් ඉදිරිපත් කරනවා. මේ සුරා සූදු විරෝධී ව්‍යාපාරය පටන් ගත් උදවිය, විශේෂයෙන්ම එහි නායකත්වය දරූ උදවිය, මේ ගරු සභාවේ ඉන්නවා. සමහරුන් තමන්ට නැති වූ බලය මෙවැනි ව්‍යාපාරයක් මගින් වත් ලබාගන්න අදහසින්, දේශපාලන වාසියක් ලබාගන්නා අදහසින්, සමහර අවස්ථාවලදී ඉදිරිපත් වෙනවා. නමුත් තමන්ට බලය ලැබී තිබුණු අවස්ථාවේදී ජාතියටවත් ආගමටවත් නැති විධියේ ප්‍රතිපත්තියක් අනුවයි කටයුතු කළේ. ඒ නිසයි, සුරා සූදු පිළිබඳ ප්‍රශ්න පැන නැඟ තිබෙන්නේ. නියම අවංක චේතනාවෙන් වැඩ නොකරන නිසයි, කසිප්පු උවදුර වැඩි වශයෙන්ම ඇති වී තිබෙන්නේ; මහජන සෞඛ්‍යයට හානිකර නොයෙකුත් බීම ඇති වී තිබෙන්නේ. ඒ නිසා මේ ප්‍රශ්නය පිළිබඳව යම්කිසි පැහැදිලි ප්‍රතිපත්තියක් ප්‍රකාශ කරන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මේ රටේ උසස් උදවියට, යමක් කමක් කර කියා ගන්න පුළුවන් උදවියට, ඕනෑ විධියට බීම පාවිච්චි කිරීමට ඉඩ ලැබී තිබෙනවා. මාවනැල්ල ආසනය තුළම නොයෙක් විධියේ බීම විකුණන සමාජශාලා දෙකක් තිබෙනවා. ඒවා කරගෙන යන්නේ බලපත්‍ර ඇතිවයි. එකක් අරනායකයි; අනික මාවනැල්ලේයි. සමාජශාලා වශයෙන් පවත්නා ඒ දෙපොළින්ම කෙරෙන්නේ සම්පූර්ණයෙන්ම බීම වෙළඳාමයි. මම ගරු ඇමතිතුමාට පළාතේ මහජනයා විසින් දී තිබෙන පෙත්සමක් ඉදිරිපත් කළා, දැනට මාස දෙකකට පෙර එයින් අපි ඉල්ලා සිටියා, ඒ පිළිබඳව විභාග කොට ඒ සමාජශාලා දෙකට දී තිබෙන බලපත්‍ර එක්කෝ අවලංගු කරන්නය, එසේ නැති නම් ඒ පළාතේ සිටින සාමාන්‍ය උදවියටත් තමන්ට වුවමනා බීම වර්ග පාවිච්චි කිරීමට හා වෙළඳාම් කිරීමට නිදහස දෙන්නය කියා. සුරාබදු දෙපාර්තමේන්තුව ගෙන යන ප්‍රතිපත්තිය වෙනස් කිරීමට දැන් කාලය පැමිණ තිබෙනවා. ඒ දෙපාර්තමේන්තුව කොයි විධියේ සීමාවක් ඇති කළත් ඉන් පහර වදින්නේ සාමාන්‍ය ගම්බද ජනතාවටයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපේ ගම්බද ජනතාව කිතුල් ගස් මදිනවා. ඒවාගේම පොල් ගස් මදිනවා. යාපනේ තල් ගස් මදින්ට අවසර දෙනවා නම් අපේ පළාත්වල කිතුල් ගස් මදින්ට අවසරපත්‍ර නිකුත් නොකරන්නෙ ඇයි? සුරාව සම්බන්ධයෙන් නොයෙක් උදවිය නොයෙක් මත දරනවා. ඒ ඒ පුද්ගලයන් දරන අදහස් මොනවා වෙතත්, රජය මගින් අනුගමනය කරන ප්‍රතිපත්තියක් වෙතොත් ඒ ප්‍රතිපත්තිය කාටත් එක හා සමානව බල පාන්ට ඕනෑ. සුරාව මේ රටින් තුරන් කරනවා නම් හොඳය කියා ප්‍රතිපත්තියක් පිළිගනිතොත් මා ඒ ප්‍රතිපත්තිය අනුමත කරන්ට ලෑස්තියි. එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය නොකරනවා නම්, එක්තරා බලපුළුවන්කාර පිරිසකට පමණක් පහසුකම් ලැබෙන ආකාරයට වැඩ පිළිවෙළ සලසා තිබෙන්නෙ ඇයි? එක්තරා පිරිසකට පමණක් පහසුකම් ලබා ගැනීමට ඉඩ දෙන අතර සාමාන්‍ය මහජනයාටත් ඒ පහසුවම නොදෙන්නේ ඇයි කියන එකයි මා ඉදිරිපත් කරන ප්‍රශ්නය. ඒ නිසා කිතුල් ගස් මැදීමට අපේ පළාත්වල ජනයාට ඉඩ දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. එයින් කිසිම හානියක් සිදු වන්නේ නැහැ. ආර්ථික තත්ත්වය අතින් අපටත් වඩා තරමක් දියුණු යාපනයට තල් ගස් මැදීමට ඉඩ දෙනවා නම් අපේ පළාත්වල අයට කිතුල් ගස් මැදීමට අවසර දුන්නාට හානියක් වේයයි මා නම් කල්පනා කරන්නේ නැහැ. නීතියෙන් ඉඩ නොලැබුණත් තමන්ගේ වුවමනාව බල පාන නිසා කොහොම හරි කිතුල් ගස් මැද, තමන්ගේ පාවිච්චියට ගන්න අය ඕනෑ තරම් ඉන්නවා. ඒ නිසා වුවමනා කරන කාටත් කිතුල් මැදීමට බලපත්‍ර දෙන එක හොඳයි. හැබැයි, එසේ බලපත්‍ර දෙන අතරම තවත් වැදගත් දෙයක් කරන්ට පුළුවනි. මත් පැන් පාවිච්චි කර මහජනයාට අවහිර වන විධියට හැසිරෙන අය ගැන පොලීස් නිලධාරීන්ට මීට වඩා දැඩි ලෙස නීති ප්‍රකාර ක්‍රියා කළ හැකියි. එය යුක්තිසහගත ක්‍රියා මාර්ගයක් බවයි, මගේ පිළිගැනීම.

අ. භා. 2.45

සංස්කෘතික දෙපාර්තමේන්තුව දැඩි විවේචනයට භාජන කරන්ට මා අදහස් කරන්නෙ නැහැ. මගේ කොට්ඨාශයේ කලායතන ගණනාවක් තිබෙනවා. සමහර ඒවාට උඩරට නැටුම් ආදි කලාවන් ඉගෙනීම සඳහා සියයක් දෙසියයක් පමණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් එනවා. ඒ වගේම සමහර ආයතනවල කලා ගුරුවරුනුත් කීප දෙනෙක් ඉන්නවා. මාවනැල්ල කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් මා පත් වී මාස ගණනක් ඇතුළත මේ කලායතන ගැන සඳහන් කර සංස්කෘතික දෙපාර්තමේන්තුවට ලියුම් යවා ආධාර කරන මෙන් ඉල්ලා සිටියා. එක් කලායතනයකට පමණක් රු. 1,500 ක් ලැබුනා. නමුත් අනෙක් එකකටවත් ශත පහකින් හෝ ආධාරයක් මේ වන තුරු ලැබී නැහැ. ගුරුවරුන් දෙතුන් දෙනකු සිටින කලායතනයකට රුපියල් 1,500 ක් ලැබුණත් ඒ මුදල ගුරුවරුන්ගේ අවුරුද්දක ගමන් ගාස්තුව සඳහා වත් සෑහෙන ගණනක් නොවෙයි. මාවනැල්ල කොට්ඨාශයේ කලායතන දහයක් තිබෙන නමුත් ආධාරයක් ලැබී තිබෙන්නේ එයින් එකකට පමණයි. ඒ නිසා ඒ ගැන සුදුස්සක් කරන මෙන් ඉල්ලනවා.

ගල්බඩ සහ කිනිගොඩ කෝරලය මාවනැල්ල කොට්ඨාශයේ ආදායම් පාලක කොට්ඨාශයක් බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ වගේම පරණකුරු කෝරළේ නමිනුත් ආදායම් පාලක කොට්ඨාශයක් තිබෙනවා. පරණකුරු කෝරළේ ආදායම් පාලක නිලධාරි කාර්යාලය තිබෙන්නේ කෑගල්ලේයි. මේ ගැන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කොමිටියේදීත් කරුණු සාකච්ඡාවට භාජන කර තිබෙනවා. තුන්පළාත් පත්තු ගල්බඩ කෝරළේ ගම්කාර්ය සභාව තිබෙන්නෙ මාවනැල්ල ළඟම බව තමුන්නාන්සේ දන්නවා ඇති. තුන් පළාත් පත්තු කොට්ඨාශයේ සමහර ජනයාට තමන්ගේ වුවමනාවක් ඉටු කර ගැනීම සඳහා ආදායම් පාලක නිලධාරි මහත්මයා හම්බ වෙන්ට වුවමනා වුණොත් සමහර විට හැතැප්ම විස්සක් විසිපහක් පමණ දුර ගෙවා යන්ට සිදු වෙනවා. ඒ අපහසුව නැති කර දැමීම සඳහා මේ ආදායම් පාලක කොට්ඨාශ දෙකින් කොටස් වෙන් කර යා කිරීමෙන් අලුත් ආදායම් පාලක කොට්ඨාශයක් ඇති කළ යුතුය කියා මා කල්පනා කරනවා. මෙවැනි වැඩ පිළිවෙළක් අනුගමනය කිරීමෙන් එම පළාතේ මහජනතාවට විශාල සේවයක් සිදු වන බව එම පළාතේ ආදායම් පාලකතුමාද ප්‍රකාශ කර තිබෙන බව මා සතුටින් සඳහන් කරන්න කැමතියි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ආර්. රත්නායක මයා.]

එම නිසා මෙම යෝජනා ගැන ගරු ඇමතිතුමා කල්පනා කර බලනවා ඇතැයි මා හිතනවා.

බුලත්සිංහල ගරු මන්ත්‍රීවරයා (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) සඳහන් කළ කාරණයක් ගැන මටද වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න තිබෙනවා. අද දින රටේ පවතින කච්චේරි ක්‍රමය අයින් කොට ඒ වෙනුවට රට සභා ක්‍රමයක් ඇති කිරීම පිළිබඳව එතුමා කරුණු සඳහන් කළා. මෙය අද ඊයේ පැන නැංග ප්‍රශ්නයක් නොව දිවංගත ගරු බණ්ඩාරනායක අග මැතිතුමාගේ කාලයේදීම හටගත් ප්‍රශ්නයක් බව මා කියන්නට කැමතියි. මෙම යෝජනාව ඉදිරිපත් වූ කාලයේදී නොයෙක් විධියේ ජාතිභෙදවාදී ප්‍රශ්න පැන නැංග නිසා මෙය තරමක් දුරට අමතක වී ගොසින් තිබෙනවා. කෙසේ හෝ වේවා මෙම ක්‍රියා මාර්ගය සාර්ථක කර ගැනීමට නම් මෙම දෙපාර්තමේන්තු ප්‍රතිසංවිධානය කළ යුතු බව මා පළමුකොටම කියන්නට කැමතියි. කච්චේරි ක්‍රමය නියම විධියට නැති කර දමන්න සුදුසු වැඩ පිළිවෙළක් යොදනවා නම් මීට වඩා ලෙහෙසියෙන් මෙම ප්‍රශ්නය විසඳන්න පුළුවන් බව මා කියන්න ඕනෑ.

කච්චේරි ක්‍රමය අධිරාජ්‍යවාදී කාලයේ පටන් පැවත ආ ක්‍රමයක්. නිලධාරීන්ගේ අතේ සම්පූර්ණයෙන්ම බලය තබාගෙන පාලනය ගෙන යන ක්‍රමයකුයි කච්චේරි ක්‍රමය. ගම්මුලාදැනීන්ගේ මාර්ගයෙන් ගෙන යන්නාවූ මෙම පාලන ක්‍රමය පවත්වාගෙන යන්නේ එම පලාත්වල දිසාපතිතුමන්ලාට වුවමනා අන්දමට විනා මහජනයාගේ වුවමනා එපාකම් අනුව නොවෙයි. ඒ නිසා මෙසේ නිලධාරීන්ට පමණක් වග කිව යුතුව තිබෙන ක්‍රමය වෙනුවට කෙලින්ම මහජනයාට වගකිව යුතු ක්‍රමයක් සකස් කළ හැකි නම් එය ඉතාමත්ම යෝග්‍ය බව මා කියන්නට කැමතියි. මහජන නියෝජිතයින්ට මෙවැනි බලයක් දෙනවා නම් ඇත්ත වශයෙන්ම මේ පළාතේ මහජනතාවට මුහුණ පාන්නට සිදු වී තිබෙන ප්‍රශ්න දැනට වඩා සතුටුදායක අන්දමකට විසඳා ගන්නට පුළුවන් වෙනවා නිසැකයි. ඒ නිසා පුළුවන් තරම් ඉක්මනින් මෙම කච්චේරි ක්‍රමය සම්පූර්ණයෙන්ම ඉවත් කොට මා සඳහන් කළ පරිදි වැඩ පිළිවෙළක් යොදන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඡන්දදායකයින් ලියාපදිංචි කිරීමේ කාර්යය භාර දෙපාර්තමේන්තුවේ වැඩ කරන්නාවූ නිලධාරීන් මෙන්ම සමහර ගම්මුලාදැනීන්ද සමහර ඡන්දදායකයින්ගේ නම් ඡන්ද ලැයිස්තුවල ඇතුළත් නොකිරීමේ වැඩ පිළිවෙළක් ගෙන යන බව මට දැන ගන්න ලැබී තිබෙනවා. ඒ නිසා මෙම ඡන්ද ලැයිස්තු නිවැරදිව සකස් කර ගන්නට නම්, ඒ අන්දමට තමන්ගේ නම ලැයිස්තුවෙන් ඕනෑ කමින්ම අත් හැර දමා තිබෙන තැනැත්තකු පැමිණිල්ලක් කර ඒ ඔප්පු කළ විට ගම්මුලාදැනියාට හෝ නිලධාරියාට හෝ විරුද්ධව රජයෙන් දඩුවම් කරන්න ඕනෑ. එසේ නැතිව කිසි දවසක නියම විධියට කරන්නට පුළුවන් වන්නේ නැහැ. අද දින මා නියෝජනය කරන කොට්ඨාශයෙහි ඡන්දදායකයන් වීමට සුදුසුකම් ලැබූ අය 5,000 ක් පමණ සිටිතත් නිලධාරීන් ඒ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා නොකර, ඔවුන් ලියාපදිංචි කිරීම අතහැර දමා තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව මැතිවරණ නීතිවල ලොකු වෙනසක් ඇති කළා. එයින් විශාල සේවයක් සිදු වුණා. මහජනයාට පහසුවක් ඇති වුණා. එහෙත් ඡන්ද කාර්යාල පිහිටුවීමත්, "බැලට් පේපර්" නැත්නම් ඡන්ද පත්‍රිකා බෙදීමත් තවමත් කරන්නට පුළුවනි. ඒවාත් තහනම් කළහොත් විශාල සේවයක් සිදු වන බව කියන්න පුළුවනි. එසේ වුවහොත් කිසිම බලපෑමක් ඇති නොවී මහජන කැමැත්ත ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබෙනවා. එම නිසා ඒ ගැනත් ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු වෙනවා ඇතැයි කල්පනා කරනවා.

උඩරට ගැම් කොමිෂන් සභාව යටතේ කෙරී ගෙන යන වැඩ පිළිවෙළ ගැන අප ඉතාමත් සන්තෝෂයි. කෑගල්ල දිස්ත්‍රික්කයත් මේ ගැම් කොමිෂන් සභාව යටතට ගත යුතු බව මතක් කරන්න ඕනෑ. දියුණු පළාත්වලට නොයෙකුත් ව්‍යාපාරවලින් සේවයක් සිදු වෙනවා. එහෙත් කෑගල්ල දිස්ත්‍රික්කය ඒ තරම් දියුණු පළාතක් නොවෙයි. නොදියුණුම තත්ත්වයක නැතත් සාමාන්‍යයෙන් කෑගල්ල දිස්ත්‍රික්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කය පවතින්නේ අඳුරු තත්ත්වයකයි. එම නිසා මෙම වර්ෂයේදී කෑගලු දිස්ත්‍රික් කය උඩරට ගැමි කොමිෂන් සභාව යට තට පත් කොට ඒ පළාතේ තිබෙන ප්‍රශ්න සෑහෙන පමණකින් විසඳන්න ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

සෝමා වික්‍රමනායක මිය. (දෙහිඕවිට)
(திருமதி சோமா விக்ரமநாயக்க—தெஹிஓவிட்ட)
(Mrs. Soma Wickramanayake—Dehiowita)

ගරු සභාපතිතුමනි, මෙම ඇමති අංශය පිළිබඳ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන පළමුවෙන්ම මගේ ස්තුතිය පළ කරන්න කැමතියි. විශේෂයෙන්ම මා කියන්න අදහස් කරන්නේ කර්මාන්ත ගැනයි. මා නියෝජනය කරන කොට්ඨාශය පිහිටි සබරගමුව වැනි ප්‍රදේශවල කිසිම කර්මාන්තයක් ඇත්තේ නැහැ. රබර් වතුවල ඉඳ හිට ලැබෙන වැඩ හැර ඒ ප්‍රදේශයේ ජනයාට කරන්න වෙන වැඩක් නැහැ. එම නිසා රබර් ප්‍රයෝජනයට ගෙන කිසියම් කර්මාන්තයක් ඒ ප්‍රදේශයේ ඇති කරන්නේ නම් එය මහජනතාවට පමණක් නොව මුළු රටටමත් ප්‍රයෝජනයක් වෙනවා. අපේ ගම්බද මිනිසුන් රබර් වතුවල වැඩ කර එකතු කර දෙන රබර් කිරි ටික එංගලන්තයට යවනවා. ඉරේෂර් කෑල්ල පවා සාදන්නේ එහියි. ඒ ඉරේෂර් කෑලි නැවත මේ රටට ගෙන්වීමෙන් පසුව එක කෑල්ලක් ශත පහ ගණනේ මිළයට ගෙන අපේ දරුවන්ට දෙන්න සිදුවෙනවා. ඉරේෂර් වැනි දේ සෑදීම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන්න වුවමනා වෙන්නේ නැහැ. සුළු මුදලක් වියදම් යන එවැනි කර්මාන්තයක්වත් ඒ පළාතේ පටන් ගන්නවා නම් සෑහෙන පිරිසකට රක්ෂා ලබා ගන්න පුළුවන් වෙනවා ඇති. සෑහෙන පිරිසකට ජීවන මාර්ගය සලසා ගන්න හැකි වෙනවා ඇති. කර්මාන්ත දියුණු කිරීම, රටක් දියුණු කිරීම සඳහා වුවමනා කරන කාරණයක් හැටියට අප කවුරුත් පිළිගන්නවා. අපේ රට නිදහස ලබා දැනට 14 අවුරුද්දක් ඉක්ම ගොස් ඇතත්, අපට පසුව නිදහස ලත් රටවල් දැන් අපේ රටට වඩා දියුණුවක් ලබා ගෙන තිබෙනවා. අද ලෝකයේ තිබෙන වෙනත් රටවල් මිනිසුන් පවා අජටාකාශයට යවනවා. නමුත් 14 අවුරුද්දක් තිස්සේ මේ රටේ කෙරී තිබෙන්නේ මොනවාද කියා බැලුවොත් අපේ දෑසින් කඳුළු වැගිරෙනවා. අවුරුදු 14 කට කලින් අපේ ගම්බද ප්‍රදේශයම් උත්සවශ්‍රීයක් ඉසුළුවාද, නිදහස ලබා ගත් දිනයට වඩා අද භයානක ලෙස ඒ තත්ත්වය පිරිහී තිබෙනවා. රට විශාල අමාරු තත්ත්වයකට වැටී තිබෙනවා. එදා නිදහස ලබාගන්නා අවධියේදි සමහර විට හත—අට සමත් කළ අයට රැකියාවක් ලබා ගැනීමට පුළුවන්කම තිබුණා. නමුත් අද ජ්‍යෙෂ්ඨය සමර්ථ කරලත් රක්ෂාවක් ලබා ගන්න බැරුව දසදහස් ගණනක් දුක් විඳිනවා. එදා රුපියලකින් වේලක් පිරිමසා ගන්නට පුළුවන්කම තිබුණත් අද රුපියල් දෙකකින්වත් වේලක් පිරිමසා ගැනීමට බැරි තත්ත්වයකුයි තිබෙන්නෙ. ඔය විධියට පසුගිය අවුරුදු 14 තිස්සේ රටේ තත්ත්වය බරපතළ ලෙස පිරිහී තිබෙනවා.

අපේ රටේ අමු ද්‍රව්‍ය තිබෙනවා. ඛනිජ ද්‍රව්‍ය තිබෙනවා. රටේ දියුණුවට වුවමනා කරන නොයෙකුත් ද්‍රව්‍ය තිබෙනවා. ඒ සියල්ලටම වැඩියෙන් මේ රටේ මිනිස් බලය තිබෙනවා. ශ්‍රම ශක්තිය තිබෙනවා. නමුත් අද එය අපතේ යනවා. රැකියාවක් කරන්න පුළුවන් ශක්තියක් ඇති මිනිහාට අද කරන්න රැකියාවක් නැහැ. කර්මාන්ත සම්බන්ධයෙන් බලන විට කර්මාන්තශාලා, යන්ත්‍ර සූත්‍ර ආදිය අපි උපයෝගී කරගත යුතු බව ඇත්තයි. ඒ අනුව මනුෂ්‍යයාගේ ජීවිත සැපවත් කළ යුතු බව ඇත්තයි. නමුත් මේ සියල්ලටම වඩා මිනිසාගේ ප්‍රශ්නය ඉස්මතු වෙන්න ඕනෑ. කර්මාන්තශාලා, යන්ත්‍ර සූත්‍ර ආදී සෑම දෙයක්ම තිබෙන්නේ මනුෂ්‍යයාගේ ප්‍රයෝජනයටයි. එසේ මනුෂ්‍යයාගේ ප්‍රයෝජනයට තිබෙන යන්ත්‍ර සූත්‍ර උපයෝගි කර ගන්නවා වාගේම මනුෂ්‍යයා පිළිබඳ ප්‍රශ්නයත් ප්‍රධාන එකක් බව අපි අමතක කළ යුතු නැහැ.

විශාල ලෙස කර්මාන්ත කරන්න යාම ගැන වචන ස්වල්පයක් කියන්න කැමතියි. අපේ පියා ඉස්සර කී වචනයක් මට මතකයි, "තරහ කාරයෙක් සිටිනවා නම්, කබල් කාරයක් ගෙන |තැගි දෙන්න"

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෝමා වික්‍රමනායක මිය.]

කියා. ඒ වාගේම කොහෙන් හෝ රටකින් අපේ රටට උසුලා ගන්න බැරි තරම් සුදු ඇතෙක් ලැබුණ විට අවුරුදු ගණනක් නිස්සේ විශාල දුක් කරදර වලට අපට මුහුණ පාන්න සිදු වෙනවා. එම නිසා විශාල කර්මාන්ත පටන් ගැනීමට කලින් සුළු කර්මාන්ත පටන් ගැනීමෙන් නොයෙක් නොයෙක් අත්හදා බැලීම් කර ඒ අනුව ඉගෙන ගෙන යම්කිසි අභ්‍යාසයක් ලබා ලොකු කර්මාන්ත පටන් ගන්නවා නම් එය නුවණට හුරුද නැද්ද කියා කල්පනා කිරීමට දැන් කාලය එළඹ තිබෙනවා.

කිතුල් ගස් සම්බන්ධයෙන් කරුණු දෙක තුනක් ප්‍රකාශ කරන්න කැමතියි. මගේ ප්‍රදේශයේ බොහෝ කිතුල් ගස් තිබෙනවා.. පසුගිය කාලයෙදී කිතුල් ගස් මැදීමෙන් බොහෝ කලක පටන්ම මගේ ප්‍රදේශයේ විශාල පවුල් සංඛ්‍යාවක් ජීවත් වුණා. කිතුල්, මහා රා වලටත්, මීරා වලටත්, මැදීමෙනුයි ඔවුන් ජීවත් වුණේ. රබර් වතු පටන් ගන්නත් කලින් සිටයි, ඔවුන් මෙය කරගෙන ආවේ. ඉතින් කිතුල් ගස් මහා රා වලට හෝ මීරා වලට හෝ මදින්නේ නැත්නම් අලියාට කන්න දෙනවා මිස වෙන ප්‍රයෝජනයක් එයින් ගන්න බැහැ. එම නිසා ඒ ජාතික වස්තුවෙන් ලැබෙන ප්‍රයෝජනය අපේ රටට අහිමි කර තැබීමෙන් අපේ ගම්බද ජනතාව විශාල කරදරයකට වැටී තිබෙනවා. එම නිසා කිතුල් මහා රා වලටත්, මීරා වලටත් මැදීමට අවසර දෙනවා නම් එයින් විශාල ප්‍රයෝජනයක් අත්වන බව මම තමුන්නාන්සේට මතක් කරන්නට කැමතියි.

අ. භා. 3

මේ අවස්ථාවේදී කසිප්පු ගැනත් වචනයක් නොකියා බැහැ. මේ කසිප්පු කරදරය නිසා බොහෝ කරදර හිරිහැර විඳින්නට සිදු වී තිබෙන්නේ කාන්තා පක්ෂයට හා දූ දරුවන්ටයි. කොයි වේලේ පොලිසියට ඇද ගෙන යාවිද කියන භයෙනුයි, ගෙදර සිටින ගැනුන්ට නිතරම ජීවත් වෙන්න සිදු වී තිබෙන්නේ. කෙසේ වුණත් කසිප්පු ව්‍යාපාරය නීතියෙන් විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් දෝ කියන සැකයක් මා තුළ තිබෙනවා. අද ඊයේ සිට නොව මහා සම්මත රජ්ජුරුවන්ගේ කාලයේ සිට මිනිසුන් සුරා පානය කර තිබෙන බව අපට පැහැදිලි ව පෙනෙනවා. එම නිසා මෙය නීතියෙන් පාලනය කරන්න පුළුවන් ප්‍රශ්නයක්ය කියා මම විශ්වාස කරන්නේ නැහැ. සියල්ලටම වඩා මනුෂ්‍යයාට ප්‍රධාන වන්නේ මනුෂ්‍ය ජීවිතයයි. ජීවිතයට සෑම මනුෂ්‍යයකු තුළම ආශාවක් තිබෙනවා. ජීවිතයට තිබෙන ඒ ආශාව නිසා තමයි, හම්බ කරන්නේ; දාඩිය වගුරුවන්නේ; දිවා රෑ වෙහෙසෙන්නේ. ඔය විධියට තමන්ගේ ජීවිතය සියල්ලටම වඩා ප්‍රධාන බව අපි කල්පනා කරන්න ඕනෑ. ජීවිතය පිළිබඳව එවැනි ආශාවක් මිනිසා තුළ තිබෙනවා නම්, යම් කිසි දෙපාර්තමේන්තුවකින් හෝ වේවා, වෙනත් යම් ක්‍රමයකින් හෝ වේවා, චිත්‍රපටි මගින් හෝ වේවා, කසිප්පු බීමෙන් සිදු වන අනතුර ඒ කසිප්පු පාවිච්චි කරන උදවියට පෙන්වන්න ඕනෑ. සෑම තැනකම එය ප්‍රදර්ශනය කර මිනිසුන්ට දැකීමට අවස්ථාව සලසන්න ඕනෑ. එක්තරා දොස්තර මහත්මයෙක් මා සමග කීවා, කසිප්පු පාවිච්චි කිරීමෙන් ශරීරය තුළ තිබෙන ඉතාමත් අවශ්‍ය අවයව දිය වී යනවාය ඒ හේතුකොටගෙන මිනිසාට ආහාර ගන්න බැරිව යනවාය කියා. ඒ මිනිහාගේ වැදගත් ශරීර කොටස් ක්‍රියාත්මක නොවී යනවලු. එවෙලාවෙමත් මැරී වැටෙන තරම් විෂ සහිත කසිප්පු වගී තිබෙනවා. ඒ බව මහජනයාට ඔප්පු කරනවා නම්, ඒ වාට මහජනයාට කන් දෙන්ට සලස්වනවා නම්, ඒ වායේ ආදීනව තිබෙන බව ඇත්තටම ඔප්පු කර දෙනවා නම්, මෙහි ඇති භයානකකම පෙන්වා දෙනවා නම්, විෂ මත් පැන් වර්ග පානය කිරීම හුඟක් දුරට අඩු වෙනවාය කියන එක මගේ විශ්වාසයයි. ප්‍රචාරයෙන් මිස නීතියෙන් නම් මේක කර ගැනීමට පුළුවන්ද කියන එක සැක සහිතයි.

අපේ රටේ නළු නිළියන් ගැන ඊළඟට මා වචනයක් දෙකක් කියන්නට කැමතියි. සංස්කෘතික දෙපාර්තමේන්තුව සිනමා කර්මාන්තය ගැන විශේෂ සැලකිල්ලක් දක්වන මේ අවස්ථාවේදී ඒ කර්මාන්තයේ යෙදී සිටින නළු නිළියන් ගැන මා වචනයක් කියන්ට ඕනෑ. ඇතැම් නළු නිළියන්ගේ පිංතූර බිත්තිවල ගහගෙන පොල් තෙල් පහන් පත්තු කරන අය පවා මේ රටේ සිටිනවා. ඒ වාගේම නළුවෙක් හෝ නිළියක් බලා ගැනීමට දවසක් තිස්සේ අච්චට වෙලීගෙන වැස්සට තෙමීගෙන බොහෝ මහන්සියෙන් කාලය ගත කරමින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලොකු භක්තියකින් බලා සිටින අයත් ඉන්නවා. ඒ අය බලන්ට ඇති ආශාව නිසාම අතේ තිබෙන සතය වියදම් කර චිත්‍රපටි නරඹන අයත් සිටිනවා. ඔය විධියෙන් එකතු වන මුදල් ලැබෙන්නේ අර නළු නිළියන්ට නොවෙයි. එය කනගාටුදායක කරුණක්. සිනමා අයිතිකාරයාට මුදල් එකතු කර දෙන්ට මහජනයා එතැනට යන්නේ නැහැ. මහජනයා යන්නේ නළු නිළියන් බලන ආශාවෙනුයි. එහෙම නම් ඒ අයට එහි ප්‍රයෝජනය ලැබෙන්ට ඕනෑ. බොහෝ විට චිත්‍රපටි සඳන උදවියගෙන් නළු නිළියන්ට හරි හැටි පඩියවත් ලැබෙන්නේ නැහැ. සමහර විට චිත්‍රපටියේ වැඩ අවසාන වූවාට පසු ඔවුන් රවටනවා. නියමිත පොරොන්දු පඩියවත් දෙන්නෙ නැහැ. එම නිසා ඒ අයට අනික් අවස්ථාවේදී ජීවත් වන්න හැටියක් නැහැ. බොහෝ විට නළු නිළියන්ට අවුරුද්දකට එක චිත්‍රපටියක පමණක් රඟ පා ජීවත් වන්ට පුළුවන්කමක් නැහැ. සමහර විට සුර කුමාරයන් වගේ දිව්‍යාංගනාවන් වගේ චිත්‍රපටිවල අප දකින නළු නිළියන් ඉන්න තැන්වලට ගිහින් බැලුවොත් හදවත කකියන්ට පටන් ගන්නවා. හරි හැටි ජීවත් වන්ට තත්ත්වයක් නැතිකම නිසා ඔවුන් වාසය කරන්නේ ලැයින් කාමර වැනි කුඩා කාමර වලයි. ඇත්තටම මේක සමාජවාදී රජයක් නම්, සමාජයට මෙතරම් සේවයක් කරන, මෙතරම් ආස්වාදයක් ලබා දෙන, උදවියට ඒකෙන් යම් ප්‍රයෝජනයක් ලැබෙන තැනට මේ කර්මාන්තය සකස් කරන්ට යම් කිසි වැයමක් කළ යුතුයි. මේ නළු නිළියන්ට හරියාකාර පඩි නඩි ගෙවන්නේ නැති නම්, ඒ අයට හරියාකාර ගෙවිය යුතු මුදල් ගෙවන්නේ නැත්නම්, ඒ චෝදනා ඔප්පු වුණොත් චිත්‍රපටි නිෂ්පාදකයන්ට යම්කිසි දඬුවමක් තිබිය යුතු බව මා මතක් කරන්න කැමතියි.

ලංකාවට සිනමා කලාව එන්ට පෙර තිබුණු නාට්‍ය කලාව ඉතිරි වී තිබුණේ පැරණි නාට්‍ය කලාකරුවන් කීප දෙනකු නිසා බව මතක් කරන්න ඕනෑ. ශකුන්තලා, අරක මේක, කියා ටවර් හෝල් එකේ එහෙම නාට්‍ය පෙන්වූ බව තමුන්නාන්සේලාට මතක ඇති. ඒවා නිසා තමයි, මේ නාට්‍ය කලාව ලංකාවේ අල්ලා සිටියේ. නීතිඥ ජෝන් ද සිල්වා මහතාගෙන් නාට්‍ය සභාවක් තිබුණා. ඒ නාට්‍යවලට සහභාගි වුණු නළු නිළියන්ගෙන් බොහෝ දෙනකු අද අන්ත දුක්ඛිත භාවයකිනුයි ජීවත් වන්නේ. ඒ අයගෙන් සමහරු එක් වී පොඩි පොඩි නාට්‍ය රඟ දක්වන්ට මහා බැරෑරුම් වැයමක් කරනවා. නමුත් මේ නාට්‍ය ප්‍රදර්ශනය කරන්ට හරියාකාර ශාලාවක්වත් ලබා ගැනීමට ඒ අයට පුළුවන්කමක් නැහැ. ටවර් හෝල් නෘත්‍ය ශාලාව වැනි එකක් අරගෙන ආණ්ඩුව මගින් පාලනය කරමින් ඒ අයගේ නාට්‍ය එහි ප්‍රදර්ශනය කරන්ට පහසුවෙන් ලබා ගැනීමට හැකි වන අන්දමට යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරනවා නම්, එය ඒ අංශයට කරන ලොකු සේවයක්යයි මා කල්පනා කරනවා. එය සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් ඒ කලා ශිල්පීන්ට කරන මහඟු සේවයක් මෙන්ම රටට කරන මහඟු සේවයක්ද වන බව මා ප්‍රකාශ කරන්න කැමතියි.

ඊළඟට ගම්මුලාදෑනි ප්‍රශ්නය ගැනත් වචනයක් කියන්නට ඕනෑ. මට හිතෙන හැටියට ගම්මුලාදෑනියා හරියට ගමරාළගේ වංගෙඩිය වගෙයි. කොටාගෙන කන්නත්, අටුවට යන්නත්, පුටුවට ගන්නත්, දොර අටවන්නත්, ඔය ඔක්කෝටම ගමරාළට තිබුණේ වංගෙඩියයි. ඒ වගේ ගම්මුලාදෑනියා තමයි, හැම දෙපාර්තමේන්තුවකම ගමක් එක්ක තිබෙන සම්බන්ධය. ඕනෑම දෙපාර්තමේන්තුවකට ගමක යම්කිසි වැඩක් කරගන්න ඕනෑ වුනොත් අන්තිමට එය ගම්මුලාදෑනියා පිට පටවනවා. මාත් ගම්මුලාදෑනීන් භයානක පිරිසක් වශයෙන් සලකන කෙනෙක්. ඒ හැමෝම භයානක අය වුණේ ඇයි? එක් කෙනකු දෙන්නකු හෝ ස්වල්ප දෙනකු භයානක මිනිසුන් වුණා නම් අපට හිතන්න පුළුවනි, එය පුද්ගලයින්ගේ වරදය කියා. නමුත් සිරිතක් වශයෙන් හැමෝම භයානකයි. ගමක සිටින හොඳ සුවව කීකරු තරුණයකු හෝ සොයා ගෙන ගම්මුලාදෑනි තනතුරක් දී අවුරුදු දෙකක් විතර ගියාම ඔහු ගමේම සිටින ජනප්‍රිය නැති මිනිහා වෙනවා නම්, ගමේම සිටින නරක මිනිහා වෙනවා නම්, මහජනයාට පෙනෙන්ට බැරි නොම්මර එකේ ද්‍රෝහියා වෙනවා නම්, එහෙම නම් එය මේ ක්‍රමයේ තිබෙන බරපතළ වරදක්. පුද්ගලයාගේ වරදක්ය කියන්ට බැහැ. මේවා සිදු වන්නේ පුද්ගලයන්ගේ වැරදි නිසා පමණක්ය කියා අපට කියන්න බැහැ. සුළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෝමා වික්‍රමනායක මිය.]

චේතනයක් ලබන ගම්මුලාදැනියාගෙන් බලාපොරොත්තු වන්නේ කුමන අන්දමේ සේවයක්ද? ගමේ කලකෝලාහලයක් සිදු වුණු විට ඒ ගැන විභාග කිරීම සඳහා එතැනට ගම්මුලාදැනියා දුව යන්න ඕනෑ. පොලිසිය කොතරම් සැතපුම් ගණනක් දුරින් පිහිටියත්, අවි ආයුධ රැගෙන කොතරම් මිනී මරුවන් සංඛ්‍යාවක් මග රැක සිටියත්, ගම්මුලාදැනියා එතැනට යන්න ඕනෑ. මිනී මැරුමක් සිදු වුණු විට ගම්මුලාදැනියා ඒ මිනිය රකින්නත් යන්න ඕනෑ. ඒ වා ගේම දාමරිකයන් අල්ලන්නත් ඕනෑ. අවි ආයුධ සොයන්නත් ඕනෑ. පොලීසියේ මහත්වරු හීල් හෙවනේ ඉඳලා හීන් සැරේ කාලා බීලා දින දෙක තුනකට පසුව එවැනි තැනකට එනතුරු ගම්මුලාදැනියා එතන වැඩ කටයුතු ඔක්කෝම තම වියදමෙන් කරගෙන බලාගන්න ඕනෑ. අන්තිමේ දී පොලීසියෙන් ලොකු, පුංචි මහත්වරු ආවා ම ඔවුන්ට කුකුල් මස් ඇතුව සංග්‍රහ කරන්නත් ඕනෑ. එවැනි වියදම්වලට ආණ්ඩුවෙන් ගෙවන්නේ නැහැ. ඒවා ත්‍යාග වශයෙනුයි සලකන්නෙ. ඔවැනි දුර්වල තැන් දහසකුත් එකක් තිබෙනවා. කෑලය කින් ගහක් කැපුවොත් ඒකටත් ගම් මුලාදැනියා වග කියන්න ඕනෑ. සමහර විට එක ගම්මුලාදැනියාට ආණ්ඩුවේ ඉඩම් අක්කර දහස් ගණනින් භාර වී තිබෙනවා. යම් විධියකින් එවැනි ඉඩමකින් යමෙක් හේනක් කාරිය කෙටුවොත් ඒකටත් වග කියන්න ඕනෑ ගම්මුලාදැනියායි. ගහක් කපා ගහක් දිගේ ඇදගෙන ගියොත් ඒක ටත් ඔහු වග කියන්න ඕනෑ. මේ අන්දම ට ගමේ කෙරෙන ඉමහත් සිදුවීම් රාශිය කට ඔහු වග කියන්න ඕනෑ. යම් යම් කට යුතු සඳහා ගමට එන සෑම නිලධාරියකුටම ඔහු සාත්තු සප්පායම් කරන්න ඕනෑ, ඉඳුම් හිටුම් දෙන්න ඕනෑ, කාර් සපයන්න ඕනෑ, බොරු සාක්කි සොයා දෙන්න ඕනෑ. ඔය විධියට සේවය කරන්න ඕනෑ. දහස කුත් එකක් මේ අන්දමේ වැඩ කරන මිනිහා මෙහෙම යනකොට යම් විධියකින් නරක් නූනොත්, දෙවියනේ, ඒක මහ පුදුමයක්! ඔහුට සුළු පඩියයි ලැබෙන්නෙ. මෙවැනි වැරදි සිදුවන්නේ රජය ක්‍රියාවේ යොදවන ක්‍රමයේ වරදිනුයි. නිලධාරීන්ට පමණක් දොස් පැවරීමෙන් වැදගැම්මක් ඇත්තේ නැහැ.

ගම්මුලාදැනීන් අතර පමණක් නොවෙයි, දෙපාර්තමේන්තුවල වෙන වෙනත් නිලධා රීන් අතරත් වැරදි කෙරෙනවා. දුෂණ කෙරෙනවාය, පගා ගහනවාය, අරක කරනවාය, මේක කරනවාය, ලියුම් හංගනවාය කිය කියා එවැන්නන්ට දොස් කියනවා. ඇයි මෙවැනි තත්ත්වයක් පැන නැඟී තිබෙන්නෙ? මේ තරම් ප්‍රබල අන්දමට වැරදි කෙරෙන්නේ ක්‍රියාවේ යොදවන ක්‍රමයේ වරද නිසයි. නිලධාරීන්ට පමණක් බැනලා වැඩක් නැහැ. බොහොම උද්‍යොගිමත්ව බොහොම අවංකව, බොහොම කරුණාවන් තව මුලදී සේවයට බැඳී, අප හොඳ සේව යක් කරනවාය කියන හැඟීමෙන් කටයුතු කරගෙන යන අය දෙපාර්තමේන්තුවල සිටිනවා. එවැනි අය මුලදී එසේ කටයුතු කළාට අවුරුද්දෙන් දෙකෙන් කලකිරීමට පත් වෙනවා. ඔවුනුත් අර වැරදි ආකාරය ටම කටයුතු කළේ නැතිනම් අතනින් මෙ තෙන්ට, මෙතනින් අතෙන්ට, එතනින් බින්තැන්නට යනාදී වශයෙන් මාරු කර නවා. එසේ කිරීමෙන් ඔවුන් හිංසාවට පත් වෙනවා. දෙපාර්තමේන්තු පවත්වා ගෙන යන ක්‍රමයේ තිබෙන වරද නිසයි මෙසේ සිදුවන්නෙ. මෙවැනි වැරදි නැන් සුද්ධ නොකර, මෙවැනි දුෂණ ක්‍රියා නැති නොකර සමාජවාදය ඔස්සේ ගමන් කරන්න බැහැ. ඒ සඳහා කොතරම් වීර්ය කළත් හරි යන්නේ නැහැ. නිලධාරීන්ගේ අවංක භාවයෙන් හෝ සහජ දක්ෂතාවන්ගෙන් ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. රටේ තත්ත්වය හොඳ අතට හැරෙන්නේ නැහැ. මේවා බැරුරුම් ප්‍රශ්න වශයෙන් ගරු ඇම තිතුමා සලකන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන සමිති ගැන කරුණක් මතක් කරන්න කැමතියි. ග්‍රාම සංවර්ධන සමිති මගින් ගම් වලට විශාල සේවයක් කෙරෙනවා. මිනිසුන් බොහෝ මුදල් වියදම් කොට නොයෙකුත් වැඩ කටයුතු කරනවා. ඔවුන් පාරවල් පවා කපනවා. තුන් හාරසිය ගණන් වියදම් කොට තමන්ගේ ශ්‍රම ශක්තිය සහමුලින් කැප කොට ආණ්ඩුවෙන් බෝක්කුවක දෙකක පමණ ආධාරයක් පමණක් ලබා ගෙන ඔවුන් පාරවල් කපනවා. එසේ කපන පාරවල් ආණ්ඩුවට නැතිනම් ගම්සභාවට පවරා දුන්නාම මොකද වන්නේ? ඒවා නිසියාකාර නඩත්තු කරන්න කෙනෙක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැති වෙනවා. ඔය විධියට අවුරුදු දෙක තුනක් යන විට අර පාරේ වාහනයකට තබා මිනිහෙකුටවත් යන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා. මගේ කොට්ඨාශයේ ග්‍රාම සංවර්ධන සමිති මගින් කපන ලද එක්තරා පාරක් තිබෙනවා. ඒ පාරේ ඇතැම් වළවල්වලට මා බැස්සහම මාත් නොපෙනෙන තරමයි. බල්ලහැල ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිති මගින් තනා තිබෙන පාරේ වළවල්වලට බැස්සාම මාත් පෙනෙන්නෙ නැති තරමයි. ඒ පාර කවදාවත් තිබුණු තැනම හැදීමෙන් ලාබයක් ඇතිවන්නෙ නැහැ. වෙන තැනකින් වෙන ම පාරක් හදන එක මීට වැඩිය ලාබයි. මේ වැනි පාරවල් ආරක්ෂා කිරීම සඳහා නියම වැඩ පිළිවෙළක් අනුගමනය නොකළොත් මිනිසුන්ගේ ශ්‍රම ශක්තිය නිරපරාදේ අපතේ යනවා, රජයෙන් දෙන ආධාරත් අපතේ යනවා.

ග්‍රාම සංවර්ධන සමිති ගැන තවත් වචනයක් කියන්න කැමතියි. ගමේත් නගරයේත් තිබෙන මෙවැනි සමිති අතර විශාල පරතරයක් තිබෙනවා. නගරබදව පවුල් බලය තදින් බලපාන්නේ නැහැ. නගරබද අයට කොවැනි අවස්ථාවකදී වුවත් පවුල් වලට යටත් වන්න වුවමනාවක් නැහැ. නමුත් ගම්බදව පවුල් බලය බොහොම තියෙනවා. ලොකු ලොකු අය ඉදිරිපත් වෙලා ග්‍රාම සංවර්ධන සමිති අල්ලා ගත්තාට පස්සේ ඒවාට විරුද්ධව වෙනත් අය නැගී එන්නේ නැහැ. මහජනයාගේ කටහඬ එවාසින් ඇහෙන්නේ නැහැ. මහජනයාගේ ඕනෑ එපාකම් එවැනි ග්‍රාම සංවර්ධන සමිති මගින් ඉටු කෙරෙන්නේ නැහැ. එවැනි ග්‍රාම සංවර්ධන සමිති පාවිච්චි වන්නේ පවුලකට දෙකකට පමණක් සීමා වූ ආයුධයක් හැටියටයි. අවසාන වශයෙන්, තමුන්නාන්සේලා ආරම්භ කරන්ට යන කර්මාන්ත වලින් එසේ නැත්නම් අනුගමනය කරන්ට යන අළුත් වැඩ පිළිවෙලවල්වලින්, නියම ප්‍රයෝජන ලබා ගැනීමට නම් මහජනතාවගේ සහයෝගය ඒ සඳහා ලබාගන්න ඕනෑ. එසේ ලබා ගැනීමට නම් මේවා කරන්නේ තමුන්නාන්සේලාගේ යහපත සඳහාය, එම නිසා මේවා දියුණු කරගැනීමට තමුන්නාන්සේලාගේ සහාය ඕනෑය, කියා මහජනතාවට තේරුම් කර දෙන්න ඕනෑ, ඔප්පු කර පෙන්වන්න ඕනෑ. එසේ නැතුව ප්‍රජාතන්ත්‍රවාදී රජයක් ඇති කරන්න කිසිසේත් පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

අ. භා. 3.15

ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුව බලයට පත් කළේ මහජනතාවයි. නොයෙකුත් අවහිර බාධා මධ්‍යයේ මේ රටේ ජනතාව සටන් කරලා තමයි, මේ ආණ්ඩුව පිහිටුවා ගත්තේ. එම නිසා මහජනතාව කෙරෙහි විශ්වාසය තබා ඒ අයගේ සහාය ලබාගත් තරමටයි, ඒ අයගේ විශ්වාසය දිනාගත් තරමටයි, මේ වැඩ කටයුතු සාර්ථක අන්දමින් කරගෙන යන්ට පුළුවන්කම ලැබෙන්නේ. මේ මහජන මුදල් රැස්කලේ, දෙයියනේ ආප්ප උයන අම්මගේ ලිප්ගල යට හංගලා තිබෙන තුට්ටු දෙක අතගාල, එසේ නැත්නම් තවත් දුප්පතකුගේ පාන් ගෙඩියෙන් බදු අරගෙන තමයි. එම නිසා මේ මුදල් අනිවාර්තයේ නාස්තිවන තැනට ඉඩ තැබුවොත් මහජනයාගෙන් කිසිම සමාවක් ලැබේය කියා සිතන්න බැහැ. එම නිසා මහජනතාව කෙරෙහි විශ්වාසය තබා, මේ ආණ්ඩුව මේ රටේ ජනතාවගේ සුභසිද්ධිය සඳහා කුමන වැඩ පිළිවෙළක් ගෙන යනවාද කියා ඒ අයට තේරුම් කර දී, ඒ අයගේ සහාය ලබාගෙන, විශ්වාසය දිනාගෙන, ඒ ජනතාවගේ ශක්තිය කෙරෙහි විශ්වාසය තබා, තමුන්නාන්සේලා වැඩ කටයුතු ඉදිරියටත් කරන්න බලාපොරොත්තු වෙනවා නම්, මා හිතනවා යම්කිසි යහපතක් මහජනතාවට කරන්න පුළුවන් වේය කියා. එසේ නැත්නම් යම්කිසි යහපතක් සිද්ධවේය කියන එක ගැන මට නම් අඩමානය කියන එක ප්‍රකාශ කරමින් මගේ වචන සඵලපය මෙයින් අවසන් කරනවා.

එස්. ඩී. ආර්. ජයරත්න මයා. (හලාවත)
(திரு. எஸ். டீ. ஆர். ஜயரத்ன—சிலாபம்)
(Mr. S. D. R. Jayaratne—Chilaw)

ගරු සභාපතිතුමනි, ඊයේ සවස අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) මේ ගරු සභාවේදී සඳහන් කළ කාරණය සම්බන්ධයෙන් මගේ ද අදහස් ස්වල්පයක් දක්වන්න මම කැමතියි. එතුමා සඳහන් කළේ කර්මාන්ත ශාලා පිහිටුවීම සඳහා ස්ථාන සොයා ගැනීම පිළිබඳවයි.

ගරු සභාපතිතුමනි, මම මුලින්ම සඳහන් කරන්ට යන්නේ පුත්තලමේ පිහිටුවන්ට යන දෙවැනි සිමෙන්ති කම්හල ගැනයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයරත්න මයා.]

පුත්තලමට එහායින් පරණ මන්නාරම් පාරේ සැතපුම් විස්සක් පමණ ගියායින් පසුව තමයි සිමෙන්ති සෑදීම සඳහා අවශ්‍ය වන හුණුගල් ආදී අමු ද්‍රව්‍ය සොයා ගැනීමට පුළුවන් වෙන්නේ. ඒ ස්ථානයේම, මගේ කල්පනාවේ හැටියට, කර්මාන්ත ශාලාව පිහිටුවීමට අපහසුවක් නැහැ. ඒ යාබ දවම ජලය ලබාගැනීමට වැවක් තිබෙනවා. එම නිසා අමු ද්‍රව්‍ය ලබාගන්න ස්ථානයට සැතපුම් 25 ක් 30 ක් මෙහායින් සිමෙන්ති කර්මාන්තශාලාව ඉදි කිරීමට අදහස් කර තිබෙන්නේ කුමන කාරණයක් නිසාදැයි මට නම් වැටහෙන්නේ නැහැ. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා කී පරිදි අවශ්‍ය අමු ද්‍රව්‍යත් ජලයත් සොයා ගන්න පුළුවන් නම්, එම ස්ථානයේම කර්මාන්තශාලාව පිහිටුවීමට කල්පනා කළොත් එයින් සාර්ථක ප්‍රතිඵල ලබාගන්න පුළුවන් වෙනවා. එම නිසා මේ ආකාරයෙන් අමු ද්‍රව්‍ය සොයා ගැනීමට පුළුවන් වෙනත් ස්ථානවලත් සිමෙන්ති කර්මාන්තශාලා ඉදි කිරීමට රජය කල්පනා කළොත් එය ඉතාමත්ම නුවණට හුරු කරුණක්ය කියා මේ අවස්ථාවේදී පෙන්වා දෙන්න පුළුවනි.

ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාශයේ හාඩ් බෝඩ් කර්මාන්තශාලාවක් පිහිටුවීමට, පසුගිය රජයේ කර්මාන්ත ඇමතිතුමා අදහස් කර තිබුණා. මේ කාරණය සම්බන්ධයෙන් ඒ අවධියේදී විශාල ආන්දෝලනයක් තිබුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් මණ්ඩලය පිහිටුවා මාස දෙක තුනක් ගත වෙනවාත් සමගම ඒ වැඩ කටයුතු එතැනින් කෙළවර කර දැම්මා. ඒ මණ්ඩලයට පඩි නඩි පවා ගෙවූ බව මට දැන ගන්න ලැබුණා. නමුත් ඇත්ත වශයෙන්ම හාඩ් බෝඩ් නිෂ්පාදනයට අවශ්‍ය සෑම අමු ද්‍රව්‍යයක්ම අපේ පළාතෙන් ඉතාමත්ම පහසුවෙන් ලබාගන්න පුළුවනි. ඉතා හොඳ ජලය තිබෙනවා, අමු ද්‍රව්‍ය තිබෙනවා, ඒ වාගේම පළපුරුදු කම්කරුවන් සිටිනවා. එම නිසා හාඩ් බෝඩ් කර්මාන්ත ශාලාවක් පිහිටුවනු ලැබුවොත් එය ඉතාමත්ම ලාභ ලැබිය හැකි කර්මාන්තයක් වෙනවාට කිසිම සැකයක් නැහැ. එම නිසා මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා, මේ කාරණය ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන කරන්නය කියා. එසේ සැලකිල්ලට භාජන කර ඉතා ඉක්මනින් මෙම කර්මාන්තශාලාව පිහිටුවීමට වැඩ කටයුතු යොදනවා ඇතැයි මම විශ්වාස කරනවා.

ඒ වාගේම බංගදෙනියේ උළු කර්මාන්ත ශාලාවක් පිහිටුවන්න දැන් කටයුතු යොදා ගෙන යනවා. එහි ගඩොල් නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, වෙනත් උපකරණ පවා සූදානම් කර තිබුණු නමුත් පසුව ඒ අදහස අත්හැර දමා තිබෙනවා. ගඩොල් කර්මාන්තයට අවශ්‍ය ඉතා හොඳ මැටි එහි සොයා ගැනීමට පුළුවන් නිසා, ඒ ගඩොල් නිෂ්පාදනය සඳහා ගෙන ආ යන්ත්‍ර උපකරණ නැවත ලබා දී ඒ කර්මාන්තය දියුණු කරන්න කටයුතු සලස්වන ලෙස ගරු ඇමතිතුමාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. කර්මාන්ත ශාලා ගැන මා කථා කරන්ට අදහස් කරන්නේ එපමණයි.

ඊ ළඟට මා කැමතියි, ඊයේ දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) ප්‍රකාශ කළ අදහස් ගැන කථා කරන්ට. එතුමා බෞද්ධ කොමිෂන් සභා වාර්තාවට විරුද්ධව කථා කළා; ගරු ඇමතිතුමාට දොස් කිවා. නමුත් ඒ බෞද්ධ කොමිෂන් සභාව පටන් ගන්න කාලයේ එතුමාත් ඇමති කෙනකු හැටියට සිටි බව කව්රුත් දන්නවා. දැන් අදහස් වෙනස් වී තිබෙන්නේ කුමක් නිසාද යනු මා ප්‍රශ්න කරන්න කැමතියි. අළුත් පක්ෂයක් පිහිටුවා ගෙන අගමැති කෙනකු වීමට බලාපොරොත්තුවෙන් සිටින නිසා අදහස් වෙනස් වී තිබෙනවාදෝ යන සැකයක් අපට ඇති වෙනවා. මම බෞද්ධාගමට ආදරය ඇති බෞද්ධයෙකු වශයෙන් ඉල්ලා සිටිනවා, ශාසන කොමිෂන් සභා වාර්තාව ක්‍රියාත්මක කරන ලෙස.

ගරු සභාපතිතුමනි, බොහෝ කාලයකට පෙර බෞද්ධ භික්ෂූන් වහන්සේ නමකට පාරේ බැහැලා යන්න පුළුවන්කමක් නොතිබුණු බව තමුන්නාන්සේ දන්නවා ඇති. නොයෙක් විධියේ ආගම් භේද තිබුණු ඒ අවස්ථාවේදී මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, බත්තරමුල්ලේ ශ්‍රී විභූති හිමි, ආදීන් ඉදිරිපත් වී නොයෙක් වාද විවාද කර බෞද්ධ භික්ෂූන් වහන්සේලාට නැවතත් පාරේ බැහැලා යන්න අවස්ථාවක් ලබා දුන්නා. නමුත් අද බෞද්ධයන් නිසාම බෞද්ධ භික්ෂූන් වහන්සේලාට පාරේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැහැලා යන්න බැරි වී තිබෙනවා. දුශ්ශීල භික්ෂූන් වහන්සේලා ගැන නොවෙයි මා කථා කරන්නේ, සිල්වත් භික්ෂූන් වහන්සේලා ගැනයි. අද උන්වහන්සේලාටත් පාරේ බැහැලා යන්න බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා.

මගේ පළාතේ එක්තරා පන්සලක් තිබෙනවා. එතන ලොකු හාමුදුරුවන්ට කැලෑ අක්කර දහස් ගණනක් තියෙනවා. ඔය හාමුදුරුවෝ රෑට ලාම්පු බැඳගෙන දඩයමේ යනවා. හොර තුවක්කුවක් අරගෙන කාර් එකකින් දඩයමේ යන හාමුදුරුකෙනකු ළඟදී කුරුණෑගල පැත්තේදී අසු වී තිබෙන බව තමුන්නාන්සේ පත්‍රයෙන් දකින්නට ඇති. හාමුදුරුවන්ගෙන් ඇහුවම, දඩයමේ යනවාය කීවලු. එසේම ළඟදී හාමුදුරු නමක් ගෑණු ළමයකුට අත් බෝම්බයක් පාර්සල් කර යවා කෝච්චියේදී ඒ බෝම්බය පුපුරා ගාඩ් කෙනකුට තුවාල වුණාය කියා නඩුවක් තිබුණා. ළඟදී හාමුදුරු කෙනකු හොර සල්ලි අච්චු ගැසුවාය කියා හිරේට යවා තිබුණු බවත් තමුන්නාන්සේ දන්නවා ඇති. එසේම අපේ ජාතියේ නායකයකු වූ—මහජන නායකයකු වූ—දිවංගත ගරු බණ්ඩාර නායක අගමැතිතුමාට වෙඩි තැබුවාය කියා නඩුවක් තිබුනෙත් හාමුදුරුවරුන්ට විරුද්ධවයි. ඔවැනි තත්ත්වයක් තිබෙන විට, අපේ සිල්වත් භික්ෂූන් වහන්සේලා පාරේ බැහැලා යන්නෙ කොහොමද? සමහර අය භික්ෂූන් වහන්සේලා ළඟින් යන විට පිස්තෝල නැද්ද කියා අහන බව මම දන්නවා. ඒ නිසා අද සිල්වත් භික්ෂූන් වහන්සේලා බොහොම ලජ්ජාවෙන් පන්සල් ඇතුළටම වෙලසි ජීවත් වන්නෙ. උන්වහන්සේලාට දානයකට වඩින්න බැහැ; පිරිතකට වඩින්න බැහැ. එවැනි තත්ත්වයක් තිබෙද්දී අපි කොහොමද තව දුරටත් බලාගෙන ඉන්නෙ? අප බුද්ධාගම බේරා ගන්නට ඕනෑ. ඒ නිසා ශාසන ශෝධනයක් නොකර බැහැ.

හැබැයි, පොට්ටනිකාරයන් නම් ඊට විරුද්ධව කෑගහන බව අපි පිළිගන්නවා. පොට්ටනිකාරයන්, මුදලාලිලා, වෙදකම් කරන හාමුදුරුවරුන්, කට්ටඩින්, ශාස්ත්‍රකාරයන්, මීට විරුද්ධව කෑගහනවා, ඒ අයගේ ජාවාරම් කරගැනීමට බැරි වන නිසා. අපි බලාගෙන ඉන්ට හොඳ නැහැ. අපේ නිර්මල බෞද්ධාගම අප ආරක්ෂා කර ගන්න ඕනෑ නම්, එදා සිල්වත් භික්ෂූන් වහන්සේලා කෑගසා ඉල්ලා ගත් කොමිෂන් සභාව ඉදිරිපත් කළ වාර්තාව ක්‍රියාත්මක කරන්ට ඕනෑ. එසේ කළොත් අපේ සිල්වත් භික්ෂූන් වහන්සේලාට නැවතත් පාරේ බැහැලා යන්ට පුළුවන් වෙනවා. ඒ පිළිවෙළට සිල්වත් භික්ෂූන් වහන්සේලාට මහජනයාට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීමට අවස්ථාවක් ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. අවස්ථාවාදීන් තමන්ගේ වාසිය තකා කියන දේ අප අහන්න වුවමනා නැහැ. එහාට මෙහාට පනින—ලිස්සන ගහේ බඩගාන—අය කියන දේ අප අහන්න වුවමනා නැහැ. මහජනතාව ඉල්ලූ විධියට ශාසන කොමිෂන් සභා වාර්තාව ක්‍රියාවේ යොදන ලෙස ගරු ඇමති තුමාගෙන් මම නැවතත් ඉල්ලා සිටිනවා.

ඊයේ දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා කථා කරන අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මෛත්‍රී බුදුන්ය කීවා. බෞද්ධාගම ගැන කථා කළත්, සාමාන්‍ය මනුෂ්‍යයකු බුදුන් වහන්සේට සමාන කරන්ට හොඳද කියන එක උන්නැහේ දන්නෙ නැහැ. උන්නැහේ ප්‍රසිද්ධ දත් දොස්තර කෙනකු බව අපි දන්නවා. නරක දතක් ගළවන්න ගිහින් ලෙඩා මළාය කියා එක අවස්ථාවක දී උන්නැහේ කීවා. එසේම චීනයෙන් වැඩමවූ දන්ත ධාතූන් වහන්සේත් මොකක්ද දතක්ය කියා පත්‍ර මාර්ගයෙන් කියා තිබෙන බව අපි දැක්කා. අපට එයින් වැඩක් නැහැ. නමුත් කිසි දවසක දේව දත්තයෙක් වන්ට එපාය කියා මම එතුමාට කියනවා.

සුරාව පිළිබඳවත් ගරු ඇමතිතුමාගේ මනස යොමු කළ යුතුව තිබෙනවා. මෙහි කථා කළ මන්ත්‍රීවරු ඒ පිළිබඳව නොයෙක් විධියේ අදහස් ප්‍රකාශ කළා. මගේ කොට්ඨාශයේ රජයෙන් අවසර නොලබා සුරා පෙරන හොර ස්කාගාරයක් තිබෙනවා. එහි දවසකට සුරා බෝතල දහස් ගණනක් හදනවා. නමුත් ඒ හදන්නේ නියම මද්‍යසාරයෙන් නොවෙයි. නියම මීරාවලින් නොවෙයි; නොයෙක් විධියේ වෙනත් දේ වලිනුයි. සීනි, රට ඉදි, සක්කරා වැනි දේ වලින් පෙරා එහි සැර ඇති වීම සඳහා ගෙම්බන්, සිකනලුන්, කැරපොත්තන්, ගෝනුස්සන් ආදී සතුන් දමනවා. එවිට එයින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයරත්න මයා.]

වෙරි මතයක් ඇති වෙනවා. මහජන සෞඛ්‍යයට අහිතකර එවැනි දේ සෑදීම නතර කිරීමට වැඩ පිළිවෙළක් යොදන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අද තැබෑරුම්වල තිබෙන රාත් නියම පොල් රා නොවෙයි; කොළඹ තැබෑරුම්වලත් ඇත්තේ පොල් රා නොවෙයි. තැබෑරුම්වල ඒවා හදනවා. ඒ සඳහා පඩි දී තබා ගන්න දක්ෂ උදවිය හරක් ඇට, අර්තාපල්, ආදිය දමා එරඬු පොල්ලෙන් ගැසීමෙනුයි ඒවා හදන්නෙ. ලැබෙන හොඳ රා සක්කරා සෑදීමට විකුණනවා. ඒ අයථා ක්‍රම නැති කළ යුතුයි. මම යෝජනා කරනවා මිනිසුන්ට ගස් මදින්ටත් ඒ ගස් යටම තබාගෙන රා විකුණන්ටත් බලය දෙන්ටය කියා. ගහකට රුපියල් 10 බැගින් අය කළත් කමක් නැහැ. එවිට මිනිසුන්ට හොඳ රා ටිකක් ලබාගන්න පුළුවනි. විෂ රහිත පෝෂ්‍යදායක දෙයක් ලබාගන්න පුළුවනි.

දැනට නිෂ්පාදනය කරන අරක්කු මදියකියනවා. අපිට සිල් අරක්කුවල මිල අඩු කරන්න පුළුවනි. සිදුවේ රජයේ ස්කාගාරයක් තිබෙනවා. ඒ ස්කාගාරයට මේ වෂියේ සිට රා සපයන්නේ සමුපකාර සමිතියක් මගිනුයි. ඒ සම්බන්ධයෙන් මම සුරාබදු දෙපාර්තමේන්තුවට ස්තුතිවන්ත වෙනවා, මුලින් තිබුණු පොඩි පොඩි බාධා ඉවත් කොට සමිතිය මගින් රා සැපයීමට කටයුතු සැලසීම ගැන. රජයේ ස්කාගාරයේ අරක්කු පෙරීම සඳහා රා එන්නේ වැඩි වශයෙන්ම මගේ කොට්ඨාශයෙනුත් නාත්තන්ඩියේ ගරු මන්ත්‍රීවරයාගේ කොට්ඨාශයෙනුත් බව පේනවා. මේ නිසා කම්කරුවන් බොහෝ ගණනකට රක්ෂාව ලැබෙනවා. ඒ ප්‍රදේශ වලින් වුවමනා පමණ රා සැපයීමට පුළුවන් තත්ත්වයක් තිබෙනවා. එම නිසා ඒ පළාතෙහි සමුපකාර ස්කාගාරයක් පිහිටුවා දෙන මෙන් මා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ කළොත් රා බීමෙන් සෑහීමකට පත් නොවන අයට හොඳ අරක්කු බීමට කටයුතු සලස්වන්න පුළුවනි. රා සැපයීමේදී සමුපකාර සමිතියට සමහර විට ලොරි හිඟකම නිසා පාඩු සිදු වෙනවා. ඒ ගැනත් කල්පනා කර බලන ලෙස මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. රෙ. 12න් පසු රාවල තියෙන නියම බලය අඩු වෙන නිසා ඊට පසු ඒවා ස්කාගාරයට ගෙනාවාම පැත්තකට දමනවා.

බලයෙන් සුරාව නැති කිරීමට කටයුතු කිරීම හොඳ නැහැ. බලයෙන් නැති කිරීමට උත්සාහ කරන්න කරන්න හොර සුරා වැඩි වෙනවා. එම නිසා සුරා බීමට බලාපොරොත්තු වන මහජනයාට ඒ සුමිහිරි පානය දෙන්න ඕනෑ. ඔවුන්ගේ බීමට සුදුසු පානයක් ලබා දුන්නොත් හොර සුරාව නැති කරන්න පුළුවන් වේවි. එම නිසා මා මුලින් කී විධියට අපේ පළාතටත් ස්කාගාරයක් ලබා දී දැන් තිබෙන ස්කාගාරයට සෑම පහසුකමක්ම ලබා දෙන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සමහර අවස්ථාවලදී යම්කිසි කාරණයක් ගැන අපට කථා කරන්ට වුවමනා වූ විට ඒ සඳහා සමහර නිලධාරි මහත්වරුන්ගෙන් අපට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. එසේ වන්නේ දෙපාර්තමේන්තුවල සමහර නරක නිලධාරීන් සිටින නිසයි. ඔවුන්ගෙන් ටිකක් පරිස්සම් වන ලෙස මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 3.30

යූ. බී. වන්නිනායක මයා. (යාපහුව)
(திரு. யூ. பி. வன்னிநாயக்க—யாப்பஹுவ)
(Mr. U. B. Wanninayake—Yapahuwa)

ගරු සභාපතිතුමනි, කාර්මික සංවර්ධනයට පමණක් සීමා වූ අමාත්‍යාංශයක් වෙනම අමාත්‍යවරයකු යටතේ ඇති කරනවා නම් මීට වඩා ශීඝ්‍ර ලෙසත් සාර්ථක අන්දමිනුත් වැඩ කරගෙන යාමට පුළුවන් වේය යනුවෙන් මට පෙර කථා කළ ආණ්ඩු පක්ෂයේත්, විරුද්ධ පාර්ශ්වයේත් ගරු මන්ත්‍රීවරුන් කියා සිටියා. එහි යම්කිසි සත්‍යයක් මෙන්ම හරයකුත් තිබෙන බව මාත් පිළිගන්නවා. වර්තමාන ලංකාව මුහුණ පා සිටින ආර්ථික තත්ත්වය අනුව මේ ආණ්ඩුවෙන් හෝ වේවා, වෙන ආණ්ඩුවකින් හෝ වේවා, ඉක්මනින් විසඳිය යුතුව තිබෙන නොයෙක් ප්‍රශ්න අතර කාර්මික සංවර්ධනය පිළිබඳ ප්‍රශ්නය ඉතා වැදගත් තැනක් ගන්නා බව කවුරුත් පිළිගන්නවා ඇති. ඉතා සියුම් අන්දමට කල්පනා කර, නොයෙක් විධියේ පර්යේෂණ පවත්වා, නා නා අංශවල විශේෂඥයන්ගේ අදහස් උදහස් විමසා ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් සකස් නොකොට කාර්මික දියුණුවක් ඇති කිරීමට උත්සාහ කළොත් එයින් අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලැබෙන්නේ ප්‍රයෝජනයට වඩා අප්‍රයෝජනයක් බව කල්පනා කරන විට, ඒ මන්ත්‍රීන් කළ විවේචනවල යම්කිසි හරයක් තිබෙන බව අපි කවුරුත් පිළිගන්ට ඕනෑ.

ලංකාවේ කර්මාන්ත දියුණු කිරීම පිළිබඳව, එසේ නැත්නම් ලංකාව කාර්මික රටක් කිරීම පිළිබඳව දරන ප්‍රයත්නයේදී බාධාවන් රාශියකට මුහුණ පාන්ට සිදු වෙනවා. ඒ මොනවාද යන්න දීර්ඝ විස්තරයකින් පැහැදිලි කරන්ට මා මේ අවස්ථාවේ අදහස් කරන්නේ නැහැ. කෙසේ වෙතත්, කරුණක් දෙකක් ගැන පමණක් ලුහුඬින් සඳහන් කරන්ට කැමතියි.

දුප්පත් රටක් හැටියට, ජාතික ආදායම අතින් දුර්වල රටක් හැටියට, කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සෑහෙන ප්‍රමාණයක අරමුදලක් ඇති කර ගැනීම අපට පහසු කාර්යයක් නොවෙයි. ඒ වගේම අප ආරම්භ කරන කර්මාන්තවල නියුක්තව සේවය කරන්ට තරම් දක්ෂපක්ෂකමක් ඇති, නිපුණත්වයක් ඇති, දැන උගත්කමක් ඇති, පළපුරුද්දක් ඇති, පුරුදු පුහුණුවක් ඇති දක්ෂ සේවකයින් සෑහෙන සංඛ්‍යාවක් අපට නැති බවත් තමුන්නාන්සේ දන්නවා. කර්මාන්ත ආයතන පාලනය කිරීම සඳහා වුවමනා කරන දැනුම හා නිපුණත්වය ලැබූ කළමනාකාරයන් පවා අපට ඇත්තේ නැහැ. ඒ අතර රටේ නිෂ්පාදනය කරනු ලබන දේවලින් සෑහෙන ප්‍රමාණයක් ලෝක වෙළෙඳ පොළේ අලෙවි කිරීම සම්බන්ධයෙනුත් අමාරුකම් තිබෙන බව අපි දන්නවා. ඒ අනුව සලකා බලන විට, ලංකාවේ කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් යම් වැදගත් පියවරක් ගත යුතුව තිබෙන්නේ එවැනි බාධාවන් රාශියක් මධ්‍යයේ නිසා, එය ඉතා මත් අමාරු කාර්යයක් වී තිබෙනවා. ලංකාව දැන් මුහුණ පා සිටින ආර්ථික තත්ත්වය මග හරවා අපේ වත්කම වැඩි දියුණු කර ගැනීම සඳහා කළ යුතු එකම පිළියම නම් කාර්මික සංවර්ධනය කෙරෙහි දැඩි උනන්දුවක් දැක්වීමය යනුවෙන් අප කියතත්, ඒ අදහස ක්‍රියාවේ යෙදීම නම් කියන තරම් ලෙහෙසි දෙයක් නොවෙයි. යන්ත්‍ර සූත්‍රවලින් සඳන බඩු සඳහා අවුරුද්දක් පාසා අපේ රටෙන් විශාල ධනස්කන්ධයක් පිට රටවලට ඇදී යනවා. 1957 දී අප ප්‍රයෝජනයට ගත් බඩුවල මුලු මුදල කෝටි 154.3ක් බව පෙනෙනවා. යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය වෙනුවෙන් ඒ තරම් මුදලක් වැය කර තිබෙන නමුත්, මේ රටේම නිපදවන්ට අපට පුළුවන් වී තිබෙන්නේ අපට වුවමනා ප්‍රමාණයෙන් සියේට 15 ක් පමණයි. කෝටි 116ක් පමණ වටිනා ද්‍රව්‍ය මේ රටට පිටරටවලින් ගෙන්වා ගත්තා. අපට අවශ්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් පිටරටවලට ඇදී යන ඒ විශාල ධනස්කන්ධය සම්පූර්ණයෙන්ම කෙසේ වෙතත් සෑහෙන ප්‍රමාණයක්වත් මේ රටේ ඉතිරි කර ගැනීම අවශ්‍යයි. ඒ සඳහා මොන මොන කර්මාන්ත පටන් ගත යුතුද යන්න ගැන පරීක්ෂා කළ යුතුයි. ඇමති මණ්ඩලය අද ආරම්භ කර තිබෙන කර්මාන්ත හුඟ හරියක්ම එවැනි සෝදිසියකින් පසුවයි ආරම්භ කර තිබෙන්නෙ.

මෙම කරුණු දෙක නිසා අප රටේ කාර්මික දියුණුවක් අවශ්‍ය බව අප කවුරුත් පිළිගන්නවා. මේ රටේ පවතින රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම පිණිස එවැනි වැඩ පිළිවෙළක් අවශ්‍ය බව පළමු වන කාරණය වශයෙන් මට පෙන්වන්න පුළුවන්. මේ රටේ වැඩ කරන ජනතාව අවුරුද්දෙන් අවුරුද්ද වැඩි වේගෙන යන බව කවුරුත් දන්නවා. කෘෂිකර්මය ප්‍රධානම ව්‍යාපාරය වශයෙන් පවත්වා ගෙන යන මේ රටේ එයම තව කෙතරම් දුරට දියුණු කළත්—අලුත් ඉඩම් වගා කිරීමෙන් හා තිබෙන ඉඩම්වලින් ලැබෙන අස්වනු ප්‍රමාණය වැඩි කිරීමට වැඩ පිළිවෙළ යෙදීමෙන් කෘෂි කර්මාන්තය අතින් පමණක් කෙතරම් දියුණු කළත්—අවුරුද්දක් පාසා වැඩි වන්නාවූ ජනගහනයට රැකීරක්ෂා සැපයීමට පුළුවන්කමක් නැති බව විශේෂඥයන්ගේ අදහසයි. ලංකාවේ පවතින ආර්ථික තත්ත්වය ගැන පරීක්ෂා කළහොත් මම හිතනවා, එම අදහස පිළිගත යුතුය කියා. ඒ නිසා කර්මාන්ත පටන් ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ හෙයින් අපේ රටේ ජාතික ධනය, ජාතික ආදායම, දියුණු කිරීමේ, වර්ධනය කිරීමේ, වැදගත් මාර්ගයක් හැටියට සැලකිය හැක්කේ කාර්මික දියුණුවයි. ඒ මගින් මේ රටින් පිට රටට ඇදී යන විශාල මුදල් ප්‍රමාණයෙන් කොටසක්වත් මේ රටේම නතර කර ගන්න පුළුවන් වේවි.

මේ රටේ කාර්මික සංවර්ධනය මෙම ඇමති අංශය මගින් ආරම්භ කර තිබෙන්නේ මේ රජය විසින්ම ඉදිරිපත් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වත්තිනායක මයා.]

තිබෙන දස අවුරුදු සැලැස්ම අනුවය කියා මම කල්පනා කරනවා. නමුත් ආණ්ඩුවේ මෙම සැලැස්ම අනුවම කාර්මික සංවර්ධනයට වැය කළ යුතු මුදලත් රජය මගින් 1959, 1960, 1961, 1962 යන හතර අවුරුද්ද තුළදී වියදම් කරන්න බලාපොරොත්තු වූ මුදලත් අතර විශාල පරතරයක් තිබෙන බව සංඛ්‍යා ලේඛන පරීක්ෂා කළහොත් තමුන්නාන්සේලාට පෙනී යනවා ඇති. මෙම දස අවුරුදු සැලැස්ම බිහි වීමට කලින්, සියලුම අංශ ඒකාබද්ධ කොට දස අවුරුදු සැලැස්මක්—මේ රටේ මීට කලින් කවරදාවත් ඇති නොවූ අන්දමේ සැලැස්මක්—සකස් කර නවාය කියා මේ පිළිබඳව විශාල වර්ණනා වක් කළ බව තමුන්නාන්සේලා කාහටත් මතක ඇතැයි මා විශ්වාස කරනවා.

එක් එක් අංශයක් වෙනුවෙන් වර්ෂයක් පාසා වියදම් කළ යුතු මුදල් ප්‍රමාණය මෙම සැලැස්මේ සඳහන් කර තිබෙනවා. ඒ නිසා එහි පෙන්වා තිබෙන පරිදි එම මුදල් ප්‍රමාණ යන් මෙම අංශයන් සම්බන්ධයෙන් වැය නොකොළොත් තමන් බලාපොරොත්තු වන්නාවූ වැඩ පිළිවෙළ ක්‍රියාවේ යොදවන්න පුළුවන්කමක් ඇති වන්නේ නැහැ. මේ සෑම අංශයක් වෙනුවෙන්ම වියදම් කර තිබෙන මුදල් ප්‍රමාණය ගැන විස්තර දක් වමින් මෙම ගරු සභාවේ කාලය මිඩංගු කිරී මට මම අදහස් කරන්නේ නැහැ. නමුත් වියදම් කරන්න බලාපොරොත්තු වන මුදලත් සැලැස්ම අනුව පෙන්වා තිබෙන මුදලත් අතර කෙතරම් පරතරයක් තිබෙන වාද යන්න මා පෙන්වන්න වැයම් කරනවා.

මෙම විස්තර ගරු මුදල් ඇමතිතුමා අය වැය ලේඛනය ඉදිරිපත් කළ අවස්ථාවේදී අපට දුන් ධවල පත්‍රිකාවේ 37 වැනි පිටුවේ දක්වා තිබෙන සංඛ්‍යා ලේඛනවලින් හොඳා කාර පෙනෙනවා. ඒ අනුව 1959 අවුරුද්ද වෙනුවෙන් දස අවුරුදු සැලැස්ම අනුව රුපි යල් ලක්ෂ 519ක් වියදම් කරන්න බලා පොරොත්තු වූ නමුත් වියදම් කර තිබෙන්නේ රුපියල් ලක්ෂ 182ක් පමණයි. මෙතැන විශාල පරතරයක් තිබෙනවා. 1960 වෙනුවෙන් සැලැස්ම අනුව රුපියල් ලක්ෂ 908ක් වියදම් කරන්න බලා පොරොත්තු වූ නමුත්, වියදම් කර තිබෙන්නේ රුපියල් ලක්ෂ 289ක් පමණයි. මෙම ගණන එම අවුරුද්ද තුළදී ඇත්ත වශයෙන්ම වියදම් කළ මුදල් ප්‍රමා ණය නොව, වියදම් කිරීමට ඇස්තමේන්තු කර තිබූ මුදල් ප්‍රමාණයයි. මෙහිද විශාල පරතරයක් තිබෙනවා. සැලැස්ම අනුව 1961 දී රුපියල් ලක්ෂ 1,033 ක් වියදම් කළ යුතුව තුබුණා. එහෙත් වියදම් කිරීම පිණිස වෙන් කරන ලද්දේ ලක්ෂ 443 යි. සැලැස්ම අනුව නම් ලබන අවුරුද්දේදී රුපියල් ලක්ෂ 1,010ක් වියදම් කළ යුතුයි. නමුත් වියදම් කිරීමට බලාපොරොත්තු වන්නේ ලක්ෂ 506යි. මේ ඉලක්කම් එකතු කළ විට, 1959-62 දක්වා රජය මගින් රුපියල් ලක්ෂ 3,470 ක් වියදම් කළ යුතුයි. එහෙත් වියදම් කිරීම සඳහා වෙන් කර ඇති මුදල රුපියල් ලක්ෂ 1,420 යි. වියදම් කළ යුතු මුදලත් වියදම් කිරීම සඳහා වෙන් කර ඇති මුදලත් අතර පරතරය ලක්ෂ 2,050 යි. මේ සැලැස්මේ සඳහන් කර ඇති අන්දමට සෑම අංශයක්ම එකකට එකක් සම්බන්ධයි. එම නිසා එක අංශයක් දුර්වල වුණොත් මුළු සැලැස්මම දුර්වල වෙනවා. කෘෂිකර්මය වේවා, කර්මාන්ත වේවා, රැකීරක්ෂා සැපසීම වේවා එකකට එකක් සම්බන්ධ වන සේ සකස් කර තිබෙනවා. එම නිසා එක අංශයක් දුර් වල වුණොත් මුළු සැලැස්මම කඩා වැටෙ නවා. මුළු ගොඩනැගිල්ලම කඩා වැටෙනවා. කර්මාන්ත සඳහා වියදම් කළ යුතු මුදලට රුපියල් ලක්ෂ 2,050ක් අඩුවෙනුයි, මෙම හතර අවුරුද්ද තුළ වියදම් කිරීම සඳහා වෙන් කරන ලද්දේ. එසේ නම් මේ සැලැස්ම පිළිබඳව අපට කිසියම් විශ්වාස යක් ඇති කර ගත හැකිද? මේ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන ලද්දේ ඒ බව පෙන්වීමටයි. මේ සැලැස්ම ගැන අපට විශ් වාසයක් තබන්නට පුළුවන්කමක් නැහැ.

ඒ වගේම මේ කර්මාන්ත පිළිබඳව අපට නොයෙකුත් ආරංචි අසන්න ලැබෙනවා. කර්මාන්ත පාලනයේ තිබෙන නොයෙකුත් දුර්වලකම් පිළිබඳව මෙම විවාදයේදීත් අපට අසන්න ලැබුණා. සමහර කර්මාන්ත පාලනය පිළිබඳව නොයෙකුත් දේශපාලන බලපෑම් තිබෙන බව එළිදරව් වුණා. දෙපාර්ශ්වයේම සිටින ගරු මන්ත්‍රීවරු ඒ බව ප්‍රකාශ කළා. එවැනි දේශපාලන බල පෑම් අනුව මෙම කර්මාන්ත පාලනය කිරීමට ගියහොත් ලොකු විනාශයක් සිදු වෙනවා ඇති. කර්මාන්ත ශාලා ආරම්භ කරන ස්ථාන පවා තෝරා ගනු ලබන්නේ දේශපාලන අදහස් අනුව බව දෙපැත්තේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ම ගරු මන්ත්‍රීවරුන් විසින් ප්‍රකාශ කරන්නට යෙදුණා. මේ විධියට ක්‍රියා නොකර නියම සංවර්ධනයක් ඇති කිරීමේ පරමාර්ථයෙන් මින් ඉදිරියට කටයුතු කරගෙන යනවා ඇතැයි කල්පනා කරනවා. බොහෝ කර්මාන්ත නියම විධියට සංවිධානය කර නැහැ. පරීක්ෂා කළ යුතු කරුණු පිළිබඳව නියම ආකාරයට පරීක්ෂා නොකර ක්‍රියා කරන බව, නියම පියවරවල් අනුව කටයුතු නොකරන බව පෙනෙන්ට තිබෙනවා. නිදර්ශනයක් වශයෙන් කන්තලේ සීනි කර්මාන්තය ගැන සඳහන් කරන්න පුළුවනි. බලාපොරොත්තු වුණු අන්දමට කන්තලේ සීනි කර්මාන්තය දියුණු නොවුයේ සෑහෙන පමණ කම්කරුවන් ලබා ගත නොහැකි වූ නිසායයි කර්මාන්ත දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද පොතක 115 වැනි පිටුවේ සඳහන් වී තිබෙනවා. සෑහෙන පමණ කම්කරුවන් ලබා ගත නොහැකි වූ නිසා, බලාපොරොත්තු වුණු අන්දමට කන්තලේ සීනි කම්හාන්තය දියුණු කරන්නට බැරි වුණාලු. ඒ සඳහා විශෙෂ පුහුණුවක් ලැබූ විශෙෂ දැනීමක් ඇති කම්කරුවන් නොවෙයි, වුවමනා කරන්නේ. සාමාන්‍යයෙන් වැඩ කරන්න පුළුවන්, ඒ තරම් පුහුණුවක් අවශ්‍ය නැති, කම්කරුවනුයි වුවමනා කරන්නේ. අපි එක පැත්තකින් කෑ ගසනවා, අපේ රටේ රැකීරක්ෂා හිඟකම දිනෙන් දින උග්‍රවීගෙන යනවාය කියා. දහස් ගණන් ජනයා රැකීරක්ෂා ඉල්ලා රැකීරක්ෂා කායාලවලට පැමිණ උද්ඝොෂණය කරනවා. ගම්බද ජනතාව රක්ෂා නැතිකමින් නොයෙක් විධියේ දුක් විඳිමින් කාලය ගත කරන බවත් අපි දන්නවා. එවැනි රටක ඇමති මණ්ඩලයක් මඟින් ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවේ සඳහන් වී තිබෙන්නේ යම්කිසි කම්හාන්තයක් ඒ සැලැස්මට අනුව ක්‍රියාවේ යෙදීමට අමාරු වුණේ කම්කරුවන් හිඟකම නිසාය කියායි. එසේ කීම මම හිතනවා, ඒ කම්හාන්තය සකස් කිරීම පිළිබඳව ලොකු දුර්වලකමක්ය කියා. මෙන්න මේ විධියට මේ වාර්තාවේ සඳහන් කර තිබෙනවා. මම සියල්ලම කියවන්නේ නැහැ. සුළු කොටසක් පමණයි කියවන්නේ. එහි 115 වන පිටුවේ මෙසේ සඳහන් වී තිබෙනවා:

The plan for cultivation was to provide in 1958 for a cultivated area of 1,600 acres.

1958 දී අක්කර 1,600 ක උක් වගා කිරීමට බලාපොරොත්තු වුනා ලු. නමුත් බලාපොරොත්තු වුණ අන්දමට ඒ අවුරුද්දේ උක් වගාව කෙරී නැහැ. 1959 අවුරුද්දේ නැවතත් අක්කර 1,600 ක උක් වගා කිරීමට බලාපොරොත්තු වුණා ලු. නමුත් වගා කර තිබෙන්නේ අක්කර 660 යි. 1960 අවුරුද්දේ නැවතත් අක්කර 1,600 ක් වගා කිරීමට බලාපොරොත්තු වුණා ලු. නමුත් වගා කරන්න පුළුවන්කම ඇති වුණේ අක්කර 1,175 යි. 1961 අවුරුද්ද නොහොත් මේ අවුරුද්දේත් අක්කර 1,600 ක් වගා කිරීමට බලාපොරොත්තු වෙනවා. නමුත් මෙතෙක් කොපමණ අක්කර ගණනක් වගා කරන්න පුළුවන් වුවාද කියා අපට තවම හරියාකාර දැන ගන්න ලැබී නැහැ. ඒ වාගේම මෙහි තව දුරටත් මෙසේ සඳහන් කර තිබෙනවා:—

However, due chiefly to the shortage of labour in the Kantalai area both programmes of land development and planting of sugar cane have fallen short of targets.

මෙය එක් අතකින් බලන විට ක්‍රිමිනල් අපරාධයක්. මේ රටේ කම්හාන්තයක් සැලැස්මට අනුව නියම කාලයේදී ක්‍රියාවේ යොදවන්ට බැරි වුණේ සෑහෙන පමණ මිනිසුන් ඒ වැඩ සඳහා සොයා ගන්න බැරි වුණ නිසා ලු. සමහර විට වෙනත් කරුණු මීට හේතු වෙන්න ඇති. නමුත් වැඩට සෑහෙන පමණ මිනිසුන් සොයා ගන්න බැරි වුණාය කියන එක අපට විශ්වාස කරන්න පුළුවන්ද?

ලුණු කම්හාන්තය ගැන මම වැඩි යමක් කියන්න අදහස් කරන්නේ නැහැ. ඒ පිළිබඳව සෑහෙන පමණ කරුණු මෙම ගරු සභාවේදී ප්‍රකාශ වුණා. ලබන අවුරුද්දේ ජපානයට ලුණු දෙන්ට යම්කිසි ගිවිසුමකට බැඳී සිටින රටකට 1961 අවුරුද්ද අවසානයේදී ලුණු පිටරටවලින් ගෙන්වීමටත් සිදු වුණ බව මේ අවස්ථාවේදී නොකියාම බැහැ. මා හිතනවා, අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්‍යවරයා එස්. ඒ. වික්‍රමසිංහ මයා.) සැලකිය යුතු දීර්ඝ විස්තරයක් කරන්ට යෙදුණා. ඊට වඩා යමක් මම කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් එක කාරණයක් පමණක් සඳහන් කරන්න ඕනෑ. කම්හාන්ත ගැන සාකච්ඡා කරන විට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් මේ වාගේම විවේචනාත්මකව කථා කළ බව අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වන්නිනායක මයා.]

මතකයි. නොයෙකුත් දුර්වලකම් ඒ කමිටුව සම්බන්ධයෙන් තිබෙනවාය කියා ප්‍රකාශ කරන්න යෙදුණා. ඇත්තෙන්ම පක්ෂය ගැන පවා නොසලකා, සත්‍යය ප්‍රකාශ කරමින් නොයෙකුත් දුර්වලකම් මේ ගරු සභාව ඉදිරියේ තැබුවා. නමුත් ඒ මන්ත්‍රීවරු එක කරුණක් එළිදරව් වන අන්දමට කථා කළේ නැහැ. සමහර මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා, මෙවැනි කමිටුවයක් දුර්වල තත්ත්වයකට පත්කළ නිලධාරීන්ට නොයෙකුත් දඬුවම් පමුණුවන්න ඕනෑය කියා. නොයෙකුත් තර්ජන හා චෝදනා, නැත්නම් දෝෂාරෝපණ ඒ නිලධාරීන් වෙත එල්ල කරන්න යෙදුණා. මම හිතනවා, එය වැරදි ප්‍රතිපත්තියක් කියා. එය ඒ හැටි හොඳ දෙයක් නොවේයි. සමහර කමිටුව සථලදායක ලෙස ක්‍රියාවේ යෙදෙන විට ඒ ප්‍රශංසාව සහ ගෞරවය ඇමති මණ්ඩලය විසින් ගන්නවා. නමුත් ඒ තරම් සථලදායී නොවන විධියට නැත්නම් ඒවා වැරදි විධියට ක්‍රියාවේ යෙදෙන අවස්ථාවේදී එහි අගෞරවය හා චෝදනාව නිලධාරීන් මත පැටවීමට ඉදිරිපත් වීම ඒ නිලධාරීන්ගේ කටයුතුවලට ධෛර්‍යය දීමක්ය කියා මම හිතන්නේ නැහැ. අපි දන්නෙ නැහැ, සමහරවිට නිලධාරීන් විසින් දෙන ලද උපදෙස් ඇමතිතුමා නොපිළිගත් නිසා එවැනි දුර්වල තත්ත්වයක් ඒ කමිටුවල ඇති වුණාද කියා. අපි කොහොමද දන්නේ? එම නිසා කමිටුව පිළිබඳව යම්කිසි අගෞරවයක් හෝ ගෞරවයක් තිබෙනවා නම් ඒ දෙකම ඇමතිතුමාට පිරිනමන්නට අප ලැහැස්ති වන්න ඕනෑ. ගෞරව ලැබිය යුතු තැනදී ඒ ගෞරවය ඇමතිතුමාට දීමටත්, වැඩ වැරදුණු අවස්ථාවලදී නිලධාරීන් පිට ඒ වරද පවරන්නත් අප ඉදිරිපත් වුනොත් නිලධාරීන්ගෙන් අප බලාපොරොත්තු වන සේවය හරියාකාර ලබා ගැනීමට පුළුවන්කමක් ලැබෙන්නේ නැත කියා මා විශ්වාස කරනවා. ගම්බද කියමනක් තියෙනවා, "ගැහුම් බැණුම් කපුරාළට බත් ටික බන්ඩිරාළට" කියා. ඒ ප්‍රතිපත්තිය එතරම් හොඳ එකක්ය කියා මා හිතන්නේ නැහැ.

ඊළඟට ප්‍රාදේශීය පාලනය පිළිබඳවත් චෝදනාවක් දෙකක් මා කියන්න අදහස් කරනවා. කච්චේරි ක්‍රමය අහෝසි කරන්න ඕනෑය, ඒ වෙනුවෙන් වෙනත් ක්‍රමයක් යොදන්න ඕනෑය, යන විධියේ කියමන් රාශියක් මේ සථානයේදී ප්‍රකාශ වුණා. ඒ කෙසේ වෙතත් සමහර කච්චේරිවල කටයුතු ගෙන යෑමට තරම් සුදුසු අන්දමක ගොඩනැගිලි පවා නොමැති බව මතක් කරන්න ඕනෑ. ඊට නිදසුනක් වශයෙන් කුරුණෑගල ලේකම් කාර්යාලය පෙන්වා දෙන්න පුළුවනි. එය ඉතා පැරණි පෘතුගීසින්ගේ හෝ ඕලන්දක්කාරයින්ගේ කාලයේදී හැදූ ගොඩනැගිල්ලක්. ඒක එහාට මෙහාට දික්කර නොයෙකුත් කම්කටොලු මධ්‍යයේයි, එහි නිලධාරීන් කටයුතු කර ගෙන යන්නේ. පළාත් පාලන කටයුතු කොයි අන්දමින් කෙරුණත් කටයුතු කරගෙන යෑමට සුදුසු අන්දමේ කාර්යාල වුවමනා කරනවා. එම නිසා ඒ කටයුතු සම්පූර්ණ කර දීමට ඇමතිතුමාගේ අවධානය යොමු වෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

ඒ එක්කම ආදායම් පාලක කොට්ඨාශ සම්බන්ධයෙනුත් වචනයක් කියන්න ඕනෑ. දැනට තිබෙන ආදායම් පාලක නිලධාරී කොට්ඨාශ දෙකට තුනට කඩා, කුඩා කිරීමට යම්කිසි වැඩ පිළිවෙළක් ගැන සම්බන්ධීකරණ කාරක සභාවලදී අප සාකච්ඡා කළා. මා හිතන්නේ ඒ යෝජනා දැන් ඇමතිවරයාට ඉදිරිපත් කර තිබෙනවාය කියායි. ඒ කැඩීම්වලට—කොට්ඨාශ කුඩා කිරීම ගැන—ඇමති අංශයේ එකඟත්වයක් තිබෙන නිසා එම කටයුත්ත ඉතා ඉක්මනින් කළ යුතු බව මා මතක් කරනවා.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனஞயக்க)
(The Hon. Maithripala Senanayeke)

නිලධාරීන් පුහුණු කරන්න පමණක් අවුරුදු දෙකක් යනවා.

වන්නිනායක මයා.
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

මට මතක හැටියට වන්නි හත්පත්තුව වර්ග හැතැප්ම 640 ක් පමණ විශාලයි. එක ආදායම් පාලක නිලධාරියකුට කොහෙත්ම එම ප්‍රදේශයේ වැඩ කටයුතු කරන්න අමාරුයි. එම නිසා නොයෙකුත් අංශවලින් ලැබෙන ලිපි රාශියක් දැනට කාර්යාලයේ ගොඩ ගැසී තිබෙනවා. කච්චේරියේත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙමයි. කච්චේරියේ සමහර දෙපාර්ත මේන්තුවලට ගියාම අපට කියනවා, සෑහෙන පමණ නිලධාරීන් නැහැ, යතුරු ලියන ආදි උපකරණ නැහැ කියා. සිංහලෙන් කටයුතු කරන්න පටන් ගත්තාට පසුව සිංහලෙන් කටයුතු කිරීමට දැනීම ඇති නිලධාරීන් සමහර දෙපාර්තමේන්තුවලට පත් කර නැහැ. වන්නි හත්පත්තු ආදායම් පාලක කොට්ඨාශය දෙකකට හෝ තුනකට බෙදා ආදායම් පාලක කොට්ඨාශ දෙකක් හෝ තුනක් ඒ පළාතේ ඇති කළ හොත් එය ඒ ප්‍රදේශයේ පාලනය දියුණු කිරීමට තිබෙන හොඳම මාර්ගය බව මා කල්පනා කරනවා.

ඒ එක්කම ග්‍රාම සේවකයන් තේරීම පිළිබඳවත් වචනයක් කියන්න කැමතියි. ග්‍රාම සේවකයන් තේරීමත් ආදායම් පාලක කොට්ඨාශ කැඩීමත් අතරේ අන්‍යොන්‍ය සම්බන්ධයක් තිබෙනවා. මා දන්න හැටියට, මට ආරංචි වී තිබෙන අන්දමට මේ සේවකයන් තෝරන්න යන්නේ එක් එක් ආදායම් පාලක කොට්ඨාශ වෙනුවෙනුයි. පළාත් පළාත් වශයෙන් නොවෙයි.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

තෝරන්නේ ආදායම් පාලක කොට්ඨාශයෙන් වුණත්, මාරු කිරීම් මුළු දිස්ත්‍රික්කයේම කරනවා.

වන්නිනායක මයා.
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

තේරීමේදී වුණත් සෑහෙන බලපෑමක් දිස්ත්‍රික්කය තුළ දී සිදු වෙනවා. මේ බෙදා වෙන් කිරීමේදී වන්නි හත්පත්තුව වැනි විශාල කොට්ඨාශයක් අඩු ගණනේ දෙක කටවත් කැඩෙනවාමයි. එක කොට්ඨාශයක් වශයෙන් තියෙන විට [බාධාකිරීම්.]

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

කල් දමන්න බැහැ.

වන්නිනායක මයා.
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

කල් දමන්නය කියා මා කියන්නෙ නැහැ. මා ඊට විරුද්ධයි. ආදායම් පාලක කොට්ඨාශ කඩා ඒ අනුව ග්‍රාම සේවකයන් තෝරනවා නම් හොඳයි.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

වසම් ගණනේ වෙනසක් වන්නේ නැහැ.

වන්නිනායක මයා.
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

වසම් ගැන නොවෙයි මා කියන්නෙ. දිස්ත්‍රික්කය අතර ග්‍රාම සේවකයන් මාරු කරන්න කල්පනා කරනවා නම් දැන් සිටම ඔවුන්ගේ වැඩ කටයුතුවලට වුවමනා කරන කාර්යාල පහසුව සලසන්න කල්පනා කරන්න ඕනෑ. ඒ වාගේම ඔවුන්ගේ නිවාස පහසුව ගැනත් කල්පනා කරන්න ඕනෑ. යම් ග්‍රාම සේවකයෙකු සැතපුම් පනහක් හැටක් දුර මාරු කළාම ඔහුට ඉමහත් කරදරවලට මුහුණ පාන්න සිදු වෙනවා. කාර්යාල පහසුව හා නිවාස පහසුව නිසි යාකාර නොමැති වූ විටයි එවැනි කරදරවලට මුහුණ පාන්නට සිදු වන්නේ.

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

දැන් ආණ්ඩුවේ අනිකුත් සේවකයන්ට කොහොමද? ස්කෝල මහත්වරුන්ට එහෙම?

වන්නිනායක මයා.
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

සේරම ස්කෝල මහත්වරුන්ට නිවාස ලබාදීමේ ප්‍රතිපත්තිය රජය පිළිගෙන තිබෙනවා. තමුන්නාන්සේට ඒක මතක නැති වෙලා.

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்னயக்க)
(Mr. A. Ratnayake)

ඒ මහත්මයාට පිස්සු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්නිනායක මයා.
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

මා මේ කියන්නේ ඉතා අවශ්‍ය දෙයක්. මේ විධියට මාරු වී යන ග්‍රාම සේවකයන්ගෙන් සමහර අයට ඉන්ට ලැබෙන ස්ථානය එම පළාතේ මධ්‍යස්ථානයක්ද නොවන්නට පුළුවනි. එසේම සාමාන්‍ය ගෙදරක වාසය කරන්න සිදුවන්නත් පුළුවනි. ඒ අනුව එවැන්නන්ගේ රාජකාරියට බාධා පැමිණෙන්නට පුළුවනි. මේ සියලු දෙනාටම එක වර කාර්යාල සහ නිවාස පහසුව සල සන්න පුළුවන්කමක් නැති එක ඇත්තයි. රජයේ ගුරුවරුන් සියලු දෙනාටම නිවාස පහසුව සලසා දිය යුතුය කියන ප්‍රතිපත්තිය රජය පිළිගෙන තිබෙනවා. සියලුම ගුරුවරුන්ට එම පහසුව ලැබී නැතත් ප්‍රතිපත්තියක් වශයෙන් එය පිළිගෙන තිබෙනවා. එම නිසා මූලාරම්භයේදීම මේ අන්දමට වැඩ කරගෙන ගියොත් අවුරුදු කීපයක් යන විට ග්‍රාම සේවකයන්ට වුවමනා කරන කාර්යාල සහ නිවාස පහසුව ක්‍රමක්‍රමයෙන් ලැබෙන්නට පුළුවනි.

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்னயக்க)
(Mr. A. Ratnayake)

පරණ අරංචි මහත්මයාගේම ගෙදර නවතීවි.

වන්නිනායක මයා.
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

තුවක්කු බලපත්‍ර දීම සම්බන්ධයෙන් වචනයක් කියන්න කැමතියි. යම් යම් කරුණු උඩ තුවක්කු බලපත්‍ර දීම නතර කරලයි තියෙන්නෙ.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

තාවකාලිකව.

වන්නිනායක මයා.
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

මා කියන කරුණු යම් යම් පළාත්වල සේවය කරන ලොකු නිලධාරීන් පවා පිළිගන්නවා. අපේ පළාත වැනි පළාත්වල ගොවීන්ට තුවක්කු පාවිච්චි නොකර තමන්ගේ ගොවිතැන් අලින්, ඌරන් වැනි සතුන්ගෙන් බේරාගැනීම අමාරුයි. තුවක්කු දීමෙන්—

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்காத்ன)
(Mr. Stanley Tillekeratne)

අලින්ගෙන් නම් බේරගන්න බැහැ. ඒක නිසා වෙඩි තියන්නම ඕනෑ.

වන්නිනායක මයා.
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

මා කියන්නේ වල් අලින් ගැනයි. අද කච්චේරිවල තුවක්කු ලයිසන් ඉල්ලුම් පත්‍ර දහස් ගණන් ගොඩගැසී තිබෙනවා. තාවකාලිකව තුවක්කු බලපත්‍ර දීම නවතා දමා තිබෙන නිසා ඒවා ගැන වැඩ කෙරෙන්නෙ නැහැ. එම නිසා ගම්බද ජනයාට අමාරුකම් රාශියකට මුහුණ පාන්න සිදු වී තිබෙනවා.

සුරා බදු දෙපාර්තමේන්තුව ගැන වචන කීපයක් කථා කරන්න කැමතියි. මා ඒ ගැන වැඩි දුරට කථා කරන්න බලා පොරොත්තුවන්නේ නැහැ. රජයේ සුරා බදු ප්‍රතිපත්තිය කුමක්ද කියා විස්තර කළ යුතුයි. සුරා බදු දෙපාර්තමේන්තුව වසා දමන්න පවා ඔය පැත්තේ ගරු මන්ත්‍රීවරු යෝජනා කළා. සුරා බදු දෙපාර්තමේන්තුව වසා දමා ඊට වියදම් කරන මුදල් කසිප්පු කාරයන් අතර බෙදා දුන්නොත් ඔවුන් කසිප්පු ව්‍යාපාරය අතහැර දමා හොඳ ජීවිත ගත කරනවා ඇත කියා ගරු මන්ත්‍රීවරුන් කියන්නට යෙදුනා. මා සිතන්නේ නැහැ ඔය එකක්වත් කරන්න පුළුවන්ය කියා. රජයේ සුරා බදු ප්‍රතිපත්තිය කුමක්ද කියා පැහැදිලි වශයෙන් ප්‍රකාශ කරන තුරු අපට මේ ගැන බේරුමක් කරගන්න බැහැ. මා දීර්ඝ වශයෙන් කථා කරන්නට බලා පොරොත්තු වන්නේ නැහැ. ගරු සභාපති තුමනි,——

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

රැස්වීම විනාඩි 30 කට තාවකාලිකව අත්සිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්නිනායක මයා.
(திரு. வன்னிநாயக்க)
(Mr. Wanninayake)

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් එක කාරණයක් ගැන පමණක් සඳහන් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. ඒ උඩරට ගැමි කොමිෂන් සභාව පිළිබඳවයි. මට මතක හැටියට රාජ්‍ය මන්ත්‍රණ සභා කාලයේ දී ඒ ගැමි කොමිෂන් සභාව පත් කළ විට, ඒ කොමිෂන් සභාවේ පරීක්ෂණය සඳහා සීමා කළේ පළාත් දෙකක් පමණයි. එනම් මධ්‍යම පළාත සහ ඌව පළාත යන පළාත් දෙකයි. ඒ අවස්ථාවේදී අනිකුත් උඩරට පළාත්වාසීන් වෙනුවෙන් අප ඉදිරිපත් වී කියා සිටියා, අනිකුත් උඩරට පළාත් වෙනුවෙන්ද පරීක්ෂණයක් පවත්වනවා නම්, ඉතාමත් හොඳය කියා. ඒ අවස්ථාවේදී එවකට තිබුණු රජයෙන් අපට දැන ගන්නට ලැබුණේ, පරීක්ෂණය ඒ පළාත් දෙකට පමණක් සීමා වුවත් එයින් ලැබෙන ප්‍රතිඵල අනුව, එයින් දැන ගන්නට ලැබෙන කාරණා අනුව, අනිකුත් පළාත් සම්බන්ධයෙන්ද ඒ ආකාරයෙන් ක්‍රියා කරනවාය කියායි. එම නිසා මා කියා සිටින්න කැමතියි, උඩරට ගැමි කොමිෂන් සභා වාර්තාව අනුව යම් වැඩ පිළිවෙළක් අනුගමනය කරනවා නම්, කුරුණෑගල දිස්ත්‍රික්කයද එයට එකතු කිරීමට කටයුතු කිරීම ඉතා හොඳය කියා. එම නිසා උඩරට සංවර්ධනය කිරීම සඳහා මුදල් වෙන් කිරීමේදී කුරුණෑගල පළාතත් එයට ඇතුළත් කොට ඒ මුදල්වලින් ඒ පළාත්ද දියුණු කරන්නට කල්පනා කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.
(කලවාන)
(திரு. எல். டீ எஸ். ஏ. குணசேக்கர—களவான)
(Mr. L. de S. A. Gunasekera—Kalawana)

ගරු සභාපතිතුමනි, මා පළමුවෙන්ම කථා කිරීමට බලාපොරොත්තු වන්නේ සුරාබදු දෙපාර්තමේන්තුව ගැනයි. [බාධා කිරීම්] රාළහාමිලා ගැනත් පසුව කථා කරනවා. නුමුත් පළමුවෙන්ම මේ කාරණය ගැනත් වචන ස්වල්පයක් කථා කරන්න ඕනෑ. මේ ගරු සභාවේ බොහෝ මන්ත්‍රීවරුන් කියා සිටියා, අරක්කු මිල බැස්සීමෙන් කසිප්පු වෙළඳාම අඩු කරන්නට පුළුවන්ය කියා. නුමුත් අරක්කු මිල අඩු කිරීමෙන් පමණක් අද කසිප්පු ජාවාරමේ යෙදී සිටින අය ඒ ජාවාරම අත්හරිය කියා අපට සිතන්න බැහැ. ඒ නිසා මේ කසිප්පු ව්‍යාපාරය නවත්වා දැමීමට නම් පළමුවෙන්ම කළ යුතු වන්නේ අරක්කු මිල අඩු කිරීම නොවෙයි. මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ දැනට කසිප්පු ව්‍යාපාරය ගෙන යන අයට දෙන දඩුවම් ලිහිල් නිසා මෙයට වඩා බර පතල දඩුවම් පමුණුවන ලෙසයි. මා ගරු ඇමතිතුමාට යෝජනාවක් වශයෙන් කියා සිටින්නේ, දැනට කසිප්පු ව්‍යාපාරයේ යෙදී සිට අසුවන අයට සිර දඩුවමත් සමගම රුපියල් දහසකට ඉහළ දඩයක්ද ගසන්නට ඕනෑ බවයි. ඒ වාගේම බරපතළ වැඩ ඇතිව අවුරුදු 3 ක පමණ කාලයක් සිරගෙට යවන්න ඕනෑ. එසේ නැතුව නම් කවදාවත් මේ ව්‍යාපාරය අපේ රටින් තුරන් කරන්න පුළුවන් වේයයි මම කල්පනා කරන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම කසිප්පු ව්‍යාපාරය නැති කරන්න බැරි සුරා බදු දෙපාර්තමේන්තුවේ දුෂණ ක්‍රියා නිසා යයි බොහෝ දෙනෙක් දොස් නගුවා. නුමුත් මෙම දෙපාර්තමේන්තුව ගැන යම් කිසි හැඟීමක් ඇති කර ගතහොත් ඒ ආකාරයෙන් දොස් පවරාවියයි මා කල්පනා කරන්නේ නැහැ. ඒ මන්ද? එක ප්‍රදේශයක එක සුරාබදු කාර්යාලයක සේවයේ යෙදී සිටින්නේ නිලධාරීන් හය-හත් දෙනකු පමණයි. එම නිසා මුළු පළාතක පැතිරී තිබෙන හොර සුරා වෙළඳාම නැවැත්වීමට මේ නිලධාරීන් සංඛ්‍යාවට පුළුවන් කමක් නැහැ. විශෙෂයෙන් කියනවා නම් සබරගමු දිස්ත්‍රික්කයේ ඇති සුරාබදු දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන ඒ නිලධාරීන් හත් දෙනාට ඒ වැඩ කටයුතු නියම අන්දමින් කරගෙන යන්න පුළුවන් කමක් නැහැ. කෙසේ නුමුත් ඒ නිලධාරීන් හත් දෙනාටයි ඒ කටයුතු සියල්ලක්ම කිරීමට පැවරී තිබෙන්නෙ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
පගා දීලා ඕවා කරන්න බැහැ.

එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.
(திரு. எல். டீ எஸ். ஏ. குணசேக்கர)
(Mr. L. de S. A. Gunasekera)

මෙයින් පෙනී යන එක් කාරණයක් තමයි, එක ගමක එක ස්ථානයකට දවසක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]

ගියොත් මේ නිලධාරීන් හත් දෙනා ට මුළු පළාතටම යන්න හය මාසයක් පමණ ගත වෙනවා. ඒ මන්ද? නිලධාරි සංඛ්‍යාව අඩු නිසයි.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම තවත් එක් කාරණයක් ගැන විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. දැනට මේ සුරා බදු නිලධාරීන්ට ගෙවන පඩිය මෙයට වඩා වැඩි කරන්න ඕනෑ. තමුන්නාන්සේලා ඒ නිලධාරීන්ට ඇති කරදර ගැන නො දන්නවා විය හැකියි. ඒ නිලධාරීන්ට දව සක බටා වශයෙන් ලැබෙන්නේ රුපියල් 3 සි. අතිරේක දීමනා වශයෙන් මාසයකට ලැබෙන්නේ රුපියල් 7 සි. ඒ මුදලෙන් ඒ නිලධාරීන්ට ඔවුන්ගේ තත්ත්වය ආරක්ෂා කර ගන්න පුළුවන්ද? සුළු වේතනයක් ලබන මේ නිලධාරියකු යම් ප්‍රදේශයකට ගොස් රාත්‍රියක් ගත කළොත් ඔහුට ලැබෙන රුපියල් 3 බටා මුදල ප්‍රමාණවත් වෙනවාද? නැහැ. එම නිසා මේ නිලධාරීන්ගේ පඩි වැඩි කළ යුතුයි. එමෙන්ම ඔවුන්ට ලැබෙන අතිරේක දීමනාවන්ද වැඩි කළ යුතුයි. එසේ නැති නම් මේ නිලධාරීන් විසින් අල්ලනු ලබන අයට දඩුවම් කළ විට දඩ ගසන මුදලෙන් භාගයක් ඊට සහභාගී වූ නිලධාරීන්ට ලබා දීමට කටයුතු සලස්වන්න ඕනෑ. එවිට ඒ නිලධාරීන් අවංකව ක්‍රියා කරනවා ඇති. සමහර විට මේ නිලධාරීන් හොර සුරා පොළවල් වැටලුවත් ඒවා ඔප්පු කිරීමට ඔවුන්ට බොහෝ කරදර සිද්ධ වෙනවා. එම නිසා ඒ කරදරවලට සරිලන මුදලක් ඔවුන්ට ලැබීමට සැලැස්වීම වරදක් නොවේ. ඔවුන්ට දැනට තෑගි වශයෙන් ලැබෙන්නේ සත 50ක් රුපියලක්, දෙකක් පමණයි. මේ නිසයි හොර සුරාකරුවන්ට විරුද්ධව නඩු නොපවරා ඔවුන්ගෙන් රුපියල් 25,30 ලබා ගැනීමට සමහරුන් කල්පනා කරනවා ඇත්තේ. කරුණු මෙසේ හෙයින් වැරදිකරුවන් වූවන්ට දඩ ගසන මුදලෙන් භාගයක් නිලධාරීන්ට ලබා දීමට බැරි නම් සුරාබදු දෙපාර්තමේන්තුව වසා දමා එහි සිටින නිලධාරීන් පොලිස් දෙපාර්තමේන්තුවට භාර දී පොලිසිය මාර්ගයෙන් ඒ කටයුතු කරන්න සලස්වන මෙන් මම ඉල්ලා සිටිනවා. මේ අතර කසිප්පු හා හොර සුරා පෙරන තැන් ඇල්ලීම සඳහා අර "fප්ලයිං ස්කොඩ්" කියන නිලධාරි කණ්ඩායම හිටි හැටියේ යවා සෝදිසි කර බලා යම් ලෙසකින් ඔවුන් ඒවා අල්ලා ගත්තොත් ඒ ප්‍රදේශය භාර ව සිටින නිලධාරීන්ට දඩුවම් දීමට මාර්ගයක් යෙදෙවිවොත් එයද හොර සුරාව නැති කිරීමට පහසුවක් වෙනවා.

තව කරුණක් කියන්න තිබෙනවා. ඒ කිතුල් ගස්වලින් ගන්න බද්ද ගැනයි. කලවාන කොට්ඨාශයේ සියයට 60ක් පමණ ජනතාව ජීවත් වන්නේ කිතුල් මැදීමෙනුයි. ඔවුන්ට කිතුල් මැදීම සඳහා දැන් අවසර ගන්න සිදුවී තිබෙනවා. මේ අවසරය ගැනීමට, යම් ඉඩමක හවුල්කාරයන් සිටිනවා නම් ඒ හැම හවුල්කාරයකුගේම කැමැත්ත ගන්න ඕනෑ. ඉඩමකින් 144න් පංගුව අයිති සමහර අය මගේ කොට්ඨාශයේ සිටින බව මම දන්නවා. මේ ඉඩමෙන් 144න් එක කොටසක් අයිතිකාරයෙක් තමාගේ කිතුල් මැද ගැනීමට අනිත් හවුල්කාරයින් 143 දෙනාගේම කැමැත්ත ගන්න ගියොත් කොපමණ කාලයක් ගත වෙයිද? මෝරන්නට පෙර කිතුල් මල මැදිය යුතු නිසා මේ විධියට අවසර දීමේ ක්‍රමය නැති කර මීට අවුරුදු දෙකකට කලින් තිබුණු ක්‍රමයම ක්‍රියාත්මක කිරීම සුදුසු බව මම ප්‍රකාශ කරන්න කැමතියි. මේ කිතුල් මදින්න අවසර දෙන්නේ නොමිළයේයි. රජය මේ සඳහා කරදර වන නමුත් කිසිම මුදලක් අය කරන්නේ නැහැ. එම නිසා මේ අවසර දීමේ ක්‍රමය ඉක්මනින්ම ඉවත් කරන ලෙස මම ඉල්ලා සිටිනවා. මේ කිතුල් බද්ද සම්බන්ධව තවත් දෙයක් කියා තිබෙනවා. දඩ ගැහුම් කා තිබෙන කෙනකුට අද කිතුල් මැදීමට අවසර ලබා ගැනීමට පුළුවන්කමක් නැහැ. තමන්ගේම වත්තේ කිතුල් ගහක් තිබුණත් තමා දඩුවමක් ලබා තිබෙන කෙනකු නම් ඒ කිතුල් ගහ මැද ගන්නට අවසරයක් ලැබෙන්නේ නැහැ. මේ ක්‍රමය අනුව යම්කිසි කෙනෙක් දඩුවම් ලබා තිබෙනවා නම් ඔහුගේ පොල් ගහෙනුත්, රබර් ගහෙනුත්, කොස් ගහෙනුත් ඔහුට ආදායම ලබා ගන්නට බැරි වන්නට ඕනෑ. එම නිසා මේ නීතියත් ඉවත් කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

අ. භා. 4.45

අද රජයේ ලලිත කලායතනය යනුවෙන් ආයතනයක් තිබෙනවා. එහි සංගීත අංශය,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැටුම් අංශය සහ චිත්‍ර කර්ම අංශය යනුවෙන් අංශ තුනක් තිබෙනවා. මේ කලාය තනයෙන් සංගීතයෙනුත්, නැටුම්වලිනුත් සමත් වන අයට යම්කිසි තැනක් ලැබෙනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ඒ අය ගුරුවරුන් වශයෙන් පත් කර ගන්නවා. නමුත් චිත්‍ර කර්මය ඉගෙන ගන්න අයට කිසිම තැනක් ලැබෙන්නේ නැහැ. අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඒ අයව පිළි ගන්නේ නැහැ. සංගීත ගුරුවරුනුත්, චිත්‍ර කර්ම ගුරුවරුනුත් පුහුණු කරන්නේ සංස්කෘතික දෙපාර්තමේන්තුවෙනුයි. නමුත් ඔවුන්ට රක්ෂා ලැබෙන්නේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙනුයි. මේ එකම කලායතනයෙන් පිටවන සංගීතය උගත් අයටත්, නැටුම් උගත් අයටත් ලැබෙන වර ප්‍රසාදය චිත්‍රකර්මය උගත් අයටත් දිය යුතු බව මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරන්න කැමතියි. එම කලායතනයේ චිත්‍ර කර්මය උගන්වන ගුරුවරුන්ට මාස් පතා රජයෙන් දහස් ගණනක් වියදම් කරනවා. එසේ වියදම් කර අවුරුද්දකට 300 ට අධික ගණනකට චිත්‍ර කර්මය උගන්වනවා. එසේ චිත්‍ර කර්මය ඉගෙන ගන්නා ළමයින්ට යම්කිසි අනාගතයක් නැත්නම් ඒ ඉගැන් වීමෙන් කිසිම පලක් නැහැ.

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ චිත්‍ර කර්මය පිළිබඳව බිලින් නමැති විශෙෂ නිලධාරි මහත්මයෙක් ඉන්නවා. ඒ බිලින් මහත්මයා පුහුණුවක් ලබා තිබෙන්නේ ළමා චිත්‍ර සම්බන්ධව පමණයි. ඒ මහත්මයා රෙකමදාරු කරන්නේත් "චයිල්ඩ් ආර්ට්" හෙවත් ළමා චිත්‍ර කරන ගුරුවරුන් පමණයි. අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළිගෙන තිබෙන්නේ පාසැල්වල උගන්වන සාමාන්‍ය ගුරුවරුන්ටත් චිත්‍ර කර්මය උගන්වන්නට පුළුවන් බවයි. එහෙත් කලායතනයේ ඉගෙන ගන්නා ගුරුවරුන් තුළ ඇති චිත්‍ර කර්ම දැනීමේත් අභ්‍යාස විද්‍යාලයෙන් පිට වන ගුරුවරුන් තුළ ඇති චිත්‍රකර්ම දැනීමේත් ලොකු වෙනසක් තිබෙනවා. එම නිසා චිත්‍ර කර්මය ඉගෙන ගෙන ලලිත කලායතනයෙන් පිට වන අයට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ගුරුවරුන් හැටියට පත්වීම් ලබා දිය යුතු බව මා මතක් කරන්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, විශෙෂයෙන් රත්නපුරය, බදුල්ල, පැල්මඩුල්ල, අවිස්සාවේල්ල ආදි ගම්බද පළාත්වල කච්චේරිවල සිටින නිලධාරීන් උන් හිටි හැටියේම මාරු කරනවා. දිසාපතිවරුන්ගේ ඉල්ලීම් ගැන පවා නොසලකා ගම්බද පළාත්වල සිටින නිලධාරීන් යාපනය, වවුනියා, ත්‍රිකුණාමලය වැනි ඈත පළාත්වලට මාරු කර යවන්නේ මොන හේතුවක් නිසාදැයි මා දන්නේ නැහැ. එහෙත් කොළඹ සිටින අයගෙන් සියේට 95ක් පමණ රජ සම්පත් විදිමින් කිසිම පළාතකට මාරු කරනු නොලැබ කොළඹම සේවය කරන බව පෙනෙනවා. සමහර නිලධාරීන් ලිපිකරුවන් වශයෙන් කොළඹ පිහිටි කාර්යාලයකට පත් වී එදා සිට විශ්‍රාම ලබන තෙක් කොළඹම සේවය කරන බව නොයෙක් විට පෙනෙනවා. රත්නපුරය වැනි ප්‍රදේශයක කච්චේරියක හෝ එවැනි කාර්යාලයක හෝ සේවය කරන නිලධාරීන් වරින්වර නොයෙක් පළාත්වලට මාරු කර යවනවා නම් පෞද්ගලික වෙළහෙළඳාම්වල යෙදෙමින්, ටැක්සි ආදිය තබාගෙන ඒ මගිනුත් මුදල් උපයන, නැව් සමාගම්වල කොටස් කරුවන් වශයෙන් සිටිමින් එයිනුත් මුදල් උපයන නිලධාරීන් හැමදාම කොළඹම තබා නොගෙන අනෙකුත් පළාත්වලටත් මාරු කර යැවීම සුදුසුය කියා මා කල්පනා කරනවා. පළාත්බද කච්චේරි වැනි තැන්වලට අවශ්‍යය කියා ප්‍රධානයන් විසින් සහ පළාතේ මන්ත්‍රීන් විසිනුත් ඉල්ලා සිටින නිලධාරීන් ඒ කාර්යාලවල නතර කිරීම ගැනත් කල්පනා කරන මෙන් ඉල්ලා සිටිනවා.

බන්ධනාගාරවල නිලධාරීන් දෙදාහකට වඩා නැහැ. පොලීස් නිලධාරීන්ටත්, බන්ධනාගාර නිලධාරීන්ටත් ඉස්සර එක හා සමාන පඩි ලැබුණු නමුත් මීට පෙර ඇති වූ පඩි කොමිෂන් සභාවෙන් පසු පොලීසියට පඩි වැඩි වූ අතර බන්ධනාගාර නිලධාරීන්ට එසේ එක හා සමාන සැලකිල්ලක් දක්වා නැහැ. මේ දෙපක්ෂයටම සමාන වරප්‍රසාද දීම සුදුසුය කියා මා කල්පනා කරනවා. කැලේ ඉන්න කොටි අල්ලන්නාවගේ පොලීසිය රටේ ඉන්න අපරාධකාරයන් අල්ලා නීතිය ඉදිරියට ගෙන එන අතර, ඒ කොටියන් බලාගන්නේ බන්ධනාගාර නිලධාරීන් බව අපි දන්නවා. මේ අය හොඳ මිනිසුන් බවට හරවා නියමිත කාලයෙන් පසු ආපසු යැවීමත් බන්ධනාගාර නිලධාරීන් භාරයේ තිබෙන වැදගත් කායීයක් නිසා මේ දෙවගීයේ නිලධාරීන්ට එක හා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ද එස්. ඒ. ගුණසේකර මයා.]

සමාන පඩිනඩි හා වරප්‍රසාද ලැබිය යුතුයි. පොලීසියේ නිලධාරීන්ට පිටින්වත් යමක් හොයා ගන්ට පුළුවන්කම තිබෙන නමුත් බන්ධනාගාර නිලධාරීන්ට එහෙම එකක් වත් ලැබෙන්නෙ නැති බව තමුන්නාන්සේ දන්නවා ඇති.

කර්මාන්ත සම්බන්ධයෙනුත් යමක් කියන්ට ඕනෑ. දෙහිඕවිට ගරු මන්ත්‍රීතුමිය (සෝමා වික්‍රමනායක මිය.) ප්‍රකාශ කළාක් මෙන් ලංකාවේ නිෂ්පාදනය කරන රබර් අමු ද්‍රව්‍යයක් වශයෙන් මිලට ගන්නා එංගලන්තය, ජර්මනිය වැනි රටවල් ඒවා ටයර් පියුඩ්, ඉරේසර් ආදිය බවට හරවා අපටම ආපසු විකුණනවා. අපේ රබර්වලින් මේ දේවල් අපටම හදා ගන්ට පුළුවන් විය යුතුයි. කලවාන කොට්ඨාශයට ඒ නම පාවිච්චි කරනු ලබන නමුත් එහි නියම නම කුකුළු කෝරළයයි. එහි තමයි, කුකුළු වැල් වේවැල්, බට ආදිය බහුල වශයෙන් තිබෙන්නෙ. නමුත් ඒ කොට්ඨාශයේ කිසිම කර්මාන්ත ශාලාවක් ඇති කර නැහැ. ලංකාවේ වේවැල් කර්මාන්තයට වුවමනා කරන වේවැල් ප්‍රමාණයෙන් සියයට හැටක පමණ ප්‍රමාණයක් ලබා ගන්නේ මගේ කොට්ඨාශයෙනුයි. බට, වේවැල්, ලී යන තුන් වර්ගයම මගේ පළාතේ, කලවානේ, බහුල වශයෙන් තිබෙන නිසා මෙම පළාතේ‍ද රජය මගින් කර්මාන්ත ශාලාවක් අරඹන්නය කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නට කැමතියි.

අප රටේ තිබෙන ග්‍රාම සංවර්ධන සමිති දෙශපාලන පැති අරගෙන ක්‍රියා කරන නිසා අද දින බොහෝ සෙයින් පිරිහී ගොස් තිබෙන බව මාවනැල්ලේ ගරු මන්ත්‍රීවරයා (පී. ආර්. රත්නායක මයා.) කී පරිදි අප පිළිගන්නට ඕනෑ. කලකට උඩදී නම් මෙම සමිති රටේ දියුණුවට විශාල සේවයක් කළ නමුත් දැන් අවුරුදු දෙක තුනක පටන් ඒවා පිරිහී ගොස් තිබෙනවා. මෙම සමිති රටට විශාල සේවයක් ලබා දෙන්නට පුළුවන් නමුත් එසේ කර ගන්න බැරිව තිබෙන්නේ උසස් නිලධාරීන් ගෙනයන වැඩ පිළිවෙළ නිසායයි සිතන්න පුළුවන්. කෙසේ හෝ වේවා කලින් දුන්නාක් මෙන් මෙම සමිතිවලට ආධාරදීමට වැඩ පිළිවෙළක් රජය විසින් යෙදිය යුතුය කියා මා කල්පනා කරනවා.

ග්‍රාම සේවා ක්‍රමය සම්බන්ධයෙන්ද වචන ස්වල්පයක් කිව යුතුව තිබෙනවා. යාපහුවේ ගරු මන්ත්‍රීවරයා (ශ්‍රී. බී. වන්නිනායක මයා.) මේ අයගේ නිවාස සම්බන්ධයෙන් කළ ප්‍රකාශ මා සම්පූර්ණයෙන් අනුමත කරනවා. නොයෙක් පළාත්වලට පත් කර යවනු ලබන ග්‍රාම සේවකයන් ඒ ඒ පළාත්වල සිටින ගෙවල් හිමියන්ගෙන් ගෙවල් කුලියට රැගෙන තම රාජකාරී කරන්නට ගියහොත් එය කවරදාවත් හරියාකාර කරන්න බැරි බව මට ඉදුරාම කියන්න පුළුවන්. බැරි වේලාවත් ගෙහිමියාට හෝ ඔහුගේ අනුගාමිකයකුට හෝ විරුද්ධව ග්‍රාම සේවකයාට කටයුතු කරන්නට සිදු වූවොත් ගෙවල් අයිතිකාරයා කියාවි ගෙයින් අස්වී යන්නය කියා. මෙවැනි අවස්ථාවක් පැන නැංගොත් තමන්ගේ නෑදෑ හිතවතුන් කිසිවකු හෝ නැති පළාතක ජීවත්වී වැඩ කරන්නට සිදු වන තැනැත්තකු කොහේ යන්නද? ඒ නිසා මේ අයට නිවාස සපයා දීම අවශ්‍ය යෙන්ම කළ යුතු දෙයක් හැටියට මම පිළිගන්නවා. ගම්මුලාදෑනි ක්‍රමය වෙනස් කිරීම ගැන ඇත්ත වශයෙන්ම මා කැමතියි. එමෙන්ම අළුතෙන් ආරම්භ කරන්න යන මෙම ග්‍රාම සේවා ක්‍රමයද දවසින් දවස දියුණුවෙන් දියුණුවට පත් වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 5

පී. ජී. බී. කෙනමන් මයා. (මැද කොළඹ දෙවන මන්ත්‍රී)

(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி இரண்டாம் அங்கத்தவர்)

(Mr. P. G. B. Keuneman—Second Colombo Central)

Mr. Chairman, I would like to make just a few points as I do not wish to delay this House. I want to ask the Hon. Minister to exercise special care in the matter of granting permits for industries which are started here on a basis of Ceylonese and private capital participation. I wish particularly to draw his attention to one fact. Does the Hon. Minister satisfy himself, before he gives permission for such ventures to start, that all the conditions that are agreed to between the parties are in the interests of this country? Is he aware that many industries

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

here are really an attempt to get round import duties by manufacturing or assembling in Ceylon certain articles which, if sent in another form, would have to pay a higher import duty ; that for this privilege royalties and patent right payments have to be made to the foreign companies merely for the use of their trade names ; and that these sums are also being remitted out of the country ?

We have Manhattan shirts being made here ; we have Gillette razor blades going to be made here ; Coca-Cola—incidentally I want to ask the Hon. Minister why he gave permission—

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

I did not give permission. Something very funny had happened during the period of the interim Government.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

Something stinkingly funny has happened in that period. Anyway I do not want to ask the Hon. Minister to answer for the sins of his predecessors.

In all these cases large sums of money, sometimes amounting to half a lakh or a lakh of rupees are just being paid for the right to use a name. Surely, if you are going to make things here it does not matter whether a shirt is named Manhattan, or whether a drink is sold in some other name, or whether a razor blade is a Gillette blade or a Lanka blade. If they want to use a trade name, why should the party here pay for that right ? I would ask the Hon. Minister to keep his eye on this aspect of the matter and stop this sort of thing, and, if necessary, make a condition that this type of agreement should not be entered into.

I have one other matter to raise with regard to industries which are started privately. Recently—actually last Friday—a *Gazette Extraordinary* was published setting out the new rates of duty payable on machinery certified by the Department of Industries as essential for the industrial development of this country. The rates of duty are 7½ per cent preferential and 17½ per cent. general. If, Mr. Minister, you say that you are going to leave certain industries for private persons, surely you must give them some type of encouragement and assistance in getting down the necessary machinery for starting work.

I have a number of concrete cases. But may I make a suggestion ? The Ministry should go into these applications, and if it is convinced that the importation of a certain type of machinery is essential or valuable for industrial development in this country, it should issue a certificate to that effect, and on that basis these duties should be either waived or lowered as the case may be.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Order, please ! The Deputy-Speaker will now take the Chair.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන් නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I have certain special cases in mind where persons have been wanting to import machines for assisting the building industry in this country, particularly a case of certain persons who wanted to import machinery for the manufacture of 'agglomocrete', that is cement-sand blocks hollow and solid, which will be 40 per cent cheaper than bricks and are less breakable than bricks and which may be able to cheapen the process of building. Some of these things cannot be

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

imported from the Commonwealth countries, and if you suddenly ask a small man to pay 17½ per cent duty on machinery which may cost him about a lakh, what you are really telling him is: "Don't start your industry." If you are prepared to undertake all that work in the public sector, well and good, I am with you, but otherwise, I would request the Hon. Minister to kindly examine the effect of these duties on small people who are trying to start industrial projects.

May I urge on the Hon. Minister the need to set up a national sports council on the lines of the Arts Council? I am not suggesting that it should be as much of a mess as the Arts Council is today, but for some reason sports have never been regarded as part of culture, and not even as part of education. But we have a great deal of athletic talent in this country, and it has been left to the tender mercies of private clubs many of whom are financially broke, or to the patronage of rich persons. I think it is necessary for our country to realise that there is a State duty to assist sport and athletics.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

I am already doing that.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I am very glad. One of the main jobs is to set up a national sports council to start with, so that various sports associations can get together and on funds voted by this House be able to do something not only to help deserving cases of outstanding athletes but also raise the general level of athletic prowess in our country. We have some excellent persons but we do not have sufficient official sponsorship, and they also do not get enough backing to be able to go to international competitions and sports festivals and compete on international standards. I am sure that if this national sports council is set up it will do ten times more valuable work than what is being done by the Arts Council. I am not saying that every section of the Arts Council is working badly, there are one or two sections that are working, but the other places are just a series of intrigues and some rather questionable rackets. I think the Hon. Minister knows about these things and I hope he will investigate them.

I would like to say a word about elections. May I urge on the Hon. Minister the need without delay to introduce legislation making certain changes that were introduced into the Parliamentary Elections Order in Council applicable to the elections law governing local bodies? You see, for instance the prohibition of transport and various other changes that were brought in in Parliamentary elections do not exist as far as local government elections are concerned, and all the worst type of corruption and semi-corruption still goes on in the matter of local government elections. I hope that the step I have urged would be taken. At the same time I wish to stress that the Government should review, in the light of the experiences of the two general elections in 1960, the amendments which we made in the Parliamentary Elections Order-in-Council.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

The normal practice is for the House to appoint a committee. Immediately the report of the Commissioner is out we will do that.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

As you know, this House and the law intended that transport should be prohibited, but in practice this was openly flouted, particularly by the U. N. P., in the last General Election. And it was later found that what they did was quite legal. All these laws

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

relating to the use of taxis and the hiring of cars were openly flouted. It was obvious that the very intentions of the House were brought to nought. I hope that the necessary measures will be taken by the Hon. Minister in order to deal with these matters.

May I congratulate the Hon. Minister on his decision to appoint a Commission to inquire into the state of the Sinhalese films in this country ? It was long needed. I myself have spoken about it. In fact I was giving up hope that anything would be done and was thinking myself of introducing a Motion. I am very glad, and I again congratulate the Hon. Minister on that decision. I hope that this Commission will not deal purely with moral and aesthetic matters. I hope that it will also examine the economics and structure of our indigenous film industry, because the reason for the stultification of this industry, in my opinion, lies particularly in the role played by the monopoly of distribution, and the distributors again becoming producers. Unless that is broken, you are not going to have a development of the Sinhalese film. It will just go on standing where it is except for an occasional film which shows a certain amount of taste and excellence. I hope that this will be done quickly and that, following that, the Hon. Minister will take action. In fact, I find no reason why the Hon. Minister should await a report of the Commission before he deals with some of these problems of the monopoly of import, distribution and production sides of the films. I hope that he will go into the question whether he can act simultaneously while this Commission is examining the other questions which are concerned with this, namely studio space, payment of actors, development of acting talent and so on.

I have one other question. I understand that a number of firms, since the ban on imports, have made application for permission to assemble in Ceylon certain articles. Some of them have asked for permission to assemble cars, others radios, and so on. Has the Hon. Minister come to any decision on this matter ? I know that assembly does not solve the problem of foreign exchange ; it means that you are only saving labour cost. Therefore, as far as the general problem of conserving foreign exchange is concerned, assembly alone does not deal with it. The importance of assembly is that it does help the development of certain skills among our own workers, and in the process of assembly year by year the Hon. Minister can insist that a certain proportion of the assembled article should be fabricated or manufactured in this country. May I first know whether he has reached a decision and, if not, when he will reach a decision ?

පී. එම්. කේ. තෙන්නකෝන් මයා. (මිහින්තලේ)

(திரு. பீ. எம். கே. தென்னகூன்—மிஹிந்தலே)

(Mr. P. M. K. Tennekoon—Mihintale)

ගරු සභාපතිතුමනි, මේ රට වෙළාගෙන සිටින හලාහල විෂ රකුසාගෙන් මේ රට බේරා ගැනීම පිළිබඳව මෙම විවාදයේදී සාකච්ඡා වුණු බව තමුන්නාන්සේ හොඳින් ම දන්නවා. මේ රටේ ජනතාව කාලාන්තරයක් තිස්සේම හලාහල විෂවර්ග පාවිච්චි කරන්න පුරුදු වී විනාශය කරා ගමන් කරන අවස්ථාවේදී මේ රටේ ප්‍රධාන සංස්ථාව වන මේ ගරු සභාවේ කටයුතු කරන අපේ ප්‍රධාන යුතුකම වන්නේ ඒ ජනතාව බේරා ගැනීම සඳහා මාර්ගයක් පාදා ගැනීමයි.

අ. භා. 5.15

ලංකාවේ උතුරේ සිටින ජනතාවට තල් ගස් මැදගෙන හොඳම පානයක් පිළියෙල කර ගැනීමට වරප්‍රසාදයක් ලැබී තිබේ නම්, ඉඩකඩ සලසා දී තිබේ නම්, දකුණේ ජීවත් වන ජනතාවටත් ඒ විධියේ වරප්‍රසාදයක් සලසාලීමේ සාධාරණය පිළිබඳව, ඒ විධියේ වැදගත් වටිනා පානයක් සකස් කර ගැනීමට අවස්ථාව සලසා දීමේ සාධාරණය පිළිබඳව, පසුගිය වර්ෂයේ මේ ගරු සභාවේදී පවත්වන ලද අයවැය කෙටුම්පත් සාකච්ඡාවේදී මා විසින් පැහැදිලි කරන්ට යෙදුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

එසේ කළහොත් උතුරේ ජනතාවට මෙන්ම දකුණේ ජනතාවටත් නියම සෘජු දායක පානයක් ලබා ගැනීමට මාර්ගය සැලසෙන්නා වාගේම එමගින් ආණ්ඩුවට විශාල ආදායමක්ද ලැබිය හැකි බව මා මතක් කළා. නමුත් අවාසනාවකට වගේ මගේ ඉල්ලීම ඉෂ්ට වුණේ නැහැ. ජනතාව ගමන් කරන්නේ කුමන පැත්තටදැයි අපට පෙනී යන්ට ඕනෑ.

අරක්කු මිල රුපියල් දෙකකින් අඩු කිරීම නිසා මේ ප්‍රශ්නය විසඳුණාදැයි අපහිතා බලන්ට ඕනෑ. සැර පානයක් ගත් තැනැත්තකුට මේ වගේ අරක්කු අර පරණ තත්ත්වයෙන් දුන්නාට ඔහු කැමති වන්නේ නැහැ. අරක්කු මිල රුපියල් දෙකකින් අඩුකර තිබියදී එය පාවිච්චි නොකරන්නේ මන්දැයි හැළි අරක්කු බොන මිනිසකුගෙන් මා ඇසූ විට ඔහු කීවේ, "අනේ මහත්මයෝ, ඒක ගැසුවාට වදින්නේ නැත" කියායි. එසින් පෙනී යන්නේ අරක්කු මිල අඩු කළත්, සැර පානයකට පුරුදු වූ අයෙකුට සැර ගතියකින් යුත් පානයක්ම වුවමනා කරන බවයි. මෙහි තිබෙන තත්ත්වය ඒකයි. අරක්කුවල මිල මොන විධියෙන් අඩු කළත් තත්ත්වය ඒකයි. හැළි අරක්කු බෝතලයක් බොන මිනිසකුට අනෙක් අරක්කු බෝතල දෙකක් බිව්වත් මදි. ඒ නිසා මීට පිළියමක් යොදන්ට වුවමනායි. එක් පැත්තකින් කල්පනා කරන විට සුරාව මේ රටින් තුරන් කළ යුතු බව ඇත්තයි. බෞද්ධයකු වශයෙන් මා එය පිළිගන්නවා. නමුත් ජනතාව වැටී සිටින තත්ත්වය දෙස බලන විට බණ කිය කිය ජනතාව සමාපත්තියට සමවැද්දවීමට වඩා ඒ මිනිසුන්ට හොඳ පානයක් දී විෂ පාන වර්ග පාවිච්චියෙන් ඔවුන් බේරා ගැනීම අවශ්‍ය බව පෙනී යනවා. ඒ බව මා මෙන්ම මේ ගරු සභාවේ සිටින අනෙකුත් මන්ත්‍රීවරුන්ද පිළිගන්නවා ඇති.

ගල්ඔය රම් හදන්ට යන බවත්, ලබන දෙසැම්බර් මාසයේ සිට ඒවා ලබා ගැනීමට හැකි බවත්, ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් දැනගන්ට ලැබුණා. ඒ ආරංචිය ගැන නම් ඉතා සන්තෝෂයි. එය විස්කි වගේ සැර ගතිය තිබෙනවාය කියාත් ආරංචියි. එය අඩු මුදලට මිනිසුන්ට ලබා දෙනවා නම්, එය සෑම කෙනකුටම ලබා ගන්න පහසු කම් සලස්වා තිබෙනවා නම්, ඔය හැළි අරක්කු ආදී හලාහල විෂ පානයන් තරමක් දුරට මේ රටෙන් ඉවත් කර ගන්න පුළුවන් වේවිය කියා අපි විශ්වාස කරනවා. ඒ වාගේම තමුන්නාන්සේ දන්නවා අද රජයේ සේවකයන් කීප දෙනකුට එකතුවී ක්ලබ් එකක් පවත්වාගෙන, තමන්ට කැමති විධියට අඬිය ගහගෙන, හැන්දෑවට විනෝද වන්න පුළුවන් බව. නමුත්, අවාසනාවකට මෙන් සුරාවට ඇබ්බැහි වුණ ගම්බද ජනතාවට එවැනි අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. සාමාන්‍ය මිනිසාට අරක්කු ටිකක් බීමට අවස්ථාවක් නැහැ. තැබෑරුම් අළුතෙන් විවෘත කිරීම පවා තමුන්නාන්සේලා තහනම් කර තිබෙනවා. ඒ නිසා ඔවුන්ට අරක්කු ටිකක් ගැනීමට පිළිවෙළක් නැහැ. නමුත්, රජයේ සේවකයන්ට—මම ඔවුන් ගැන ඊර්ෂ්‍යාවෙන් මෙය කියනවා නොවෙයි—ක්ලබ් හා සමාජ ශාලා ඕනෑ විධියට තබාගෙන හැන්දෑවට විනෝද වන්න පුළුවන්කම තිබෙනවා. එතකොට සභාපතිතුමනි, සමාජයේ මිනිස් කොටස් දෙකකට දෙවිධියකට සැලකීම සාධාරණ නොවන බව තමුන්නාන්සේට පෙනී යනවා ඇති. ආණ්ඩුවේ සේවකයන්ට ලැබෙන ඒ වරප්‍රසාදය, නොයෙකුත් දුෂ්කරතාවලට භාජන වෙමින්, දස දුක් විඳිමින්, තමන්ගේ ශරීර ශක්තිය යොදා මහන්සි වන දුප්පත් ගොවියාටත් කම්කරුවාටත් ලබා දීමට වැඩ පිළිවෙළක් යොදනවා නම්, එය ඒ ජනතාව කෙරෙහි මේ ආණ්ඩුව කරන විශාල යුක්තියක්ය, සාධාරණයක්ය, කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අප කවුරුත් පිළිගන්න ඕනෑ. එසේ නැති ව, මේක විෂය, බොන්න එපාය, කියා කොතෙක් බණ කිව්වත්, ජීවිත ආශාව පවා අත් හැර ඒ හලාහල විෂ බීම පාවිච්චිය සඳහා තැබූ පියවර ඔවුන් නවත්වන්නේ නැතිව මරණය දක්වා වුවත් ගෙන යන බව මතක් කරන්න කැමතියි. ඒ කරුණ ගැන මම එපමණයි කියන්නේ.

සභාපතිතුමනි, උතුරු මැද පළාත වැනි ප්‍රදේශවල එක් ආදායම් පාලන නිලධාරියකුට විශාල කොටස් භාර දී තිබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති. ගරු ඇමතිතුමාත් ඒ කරුණ ගැන මා සමග එකඟ වෙනවා. දැන් ටික කලකට උඩදී ගරු ඇමතිතුමාගේ තීරණයක් උඩ හුරුළු පළාත—ඒ කියන්නේ යාපනය දිස්ත්‍රික්කයටත් වඩා විශාල ප්‍රදේශයක්—දෙකට බෙදූ නමුත්, ඒ ප්‍රදේශයේ විශාලකම නිසා දෙදෙනකුටවත් ඒ ප්‍රදේශය පාලනය කරන්න බැරි තත්ත්වයක් තිබෙන බව තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි. ඒ නිසා මා ඉතා ඕනෑකමින් හා දයාබරව ඉල්ලා සිටිනවා, ගමන් පහසුකම් නැතිකමින් පීඩා විඳින ඒ ගම්බද ජනතාවගේ පහසුව පිණිස හුරුළු පළාත මධ්‍යම කොට්ඨාශය කියා තවත් කොට්ඨාශයක් ඇති කරන්නය කියා. ඒ වාගේම කලාගම් පළාත ගම්මුලාදෑනි කොට්ඨාශ 30කින් පමණ සමන්විත වන කොට්ඨාශයක්. ඒ ප්‍රදේශයත් ආදායම් පාලන නිලධාරි මහත්මයකුට පාලනය කරන්න බැරි තරම් විශාල ප්‍රදේශයක්. ඒ නිසා එයද කලාගම් ප්‍රදේශය උතුර, කලාගම් ප්‍රදේශය දකුණ, කියා කොටස් දෙකකට වෙන් කර දෙන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ කළොත් එහි පාලන කටයුතු ඉතාම ලෙහෙසියෙන් කරගෙන යන්න පුළුවන් වෙනවා ඇති.

ඒ වාගේම සභාපතිතුමනි, ඉතාමත් කනගාටුවෙන් ප්‍රකාශ කළ යුතු තවත් වැදගත් කරුණක් තිබෙනවා. තරුණ වියේදී හොඳහැටි වැඩ කර රටට ප්‍රයෝජනවත් ලෙස ගොවිතැන් ආදිය කර වයෝවෘද්ධ අවස්ථාවට පත් වන අපේ අම්මලා තාත්තලා ඒ අවසාන කාලයේ ජීවිතය ගෙන යාම සඳහා යම් කිසි සහනාධාර මුදලක් නොහොත් පිංපඩියක් ඉල්ලනවා. අවාසනාවකට මෙන් ඒ ඉල්ලුම් පත්‍රය ගැන පරීක්ෂා කළාට පසු කෙනකුට බත් කා ජීවත් වීමට ලැබෙන්නේ මාසයකට රුපියල් 5ක හෝ 7.50ක මුදලක් පමණක් බව ඉතා කනගාටුවෙන් සඳහන් කරන්න සිදු වී තිබෙනවා. තමුන්නාන්සේ දන්නවා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් "ස්ටඩ් බුල්ස්" කියා ගවයන් වර්ගයක් පට්ටි ගැස්වීම සඳහා අපේ ගම්බද ගව පට්ටිවලට යවන බව. ඔය ගොනකුට පිදුරු කැවීම පිණිස මසකට රුපියල් 15ක් පමණ ගෙවනවා. ඒ ගොනාගේ නඩත්තුව සඳහා රුපියල් 15ක් ගෙවන නමුත්, තම ජීවිත පරිත්‍යාගයෙන් මේ රට සංවර්ධනය කිරීම සඳහා ඉහදිය මහන්සියෙන් වැඩ කළ අපේ ගොවි අම්මලාට ගොවි තාත්තලාට සලකන්නේ ඊටත් වඩා දින පිළිවෙළටයි. තමන්ගේ අවසාන ජීවිත කාලය ගත කිරීම සඳහා ජීවන වියදම වශයෙන් මසකට ගෙවන්නේ රුපියල් 5ක් හෝ 7.50ක් වැනි සුළු මුදලකුයි. ජීවිත පරිත්‍යාගයෙන් වැඩ කළ ගම්බද ගොවි අම්මලාට ගොවි තාත්තලාට නහින දෙහින කාලයේදී හොඳ මිනිසුන් වශයෙන් ජීවත්වීමට තරම් ප්‍රමාණවත් මුදලක් දීම සඳහා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

අද ගම්බද රැකීරක්ෂා ප්‍රශ්නය ඉතාමත්ම උග්‍ර වේගන එන අවස්ථාවකුයි තිබෙන්නේ. උතුරු මැද පළාතට යම් කිසි විධියකින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

වර්ෂාව නොලැබුණොත්, ජලය නැති නිසා කන්නයක් දෙකක් ගොවි තැන් කිරීමට බැරිවෙනවා. ඒ නිසා ඒ දුප්පත් ගොවි පවුල්වල රැකීරක්ෂා ප්‍රශ්නය ඉතාමත් උග්‍ර වෙනවා. ඒ තත්ත්වය මග හරවා ඔවුන්ගේ පවුල් නඩත්තු කර ගැනීමට අවසථාව සලසා තිබෙන්නේ රජය මගින් සහනාධාර වැඩ දීමෙනුයි. ඒ සඳහා අවුරුදු පතා රුපියල් කෝටි ගණනක මුදලක් වියදම් වන බව තමුන්නාන්සේ දන්නවා ඇති. රජ රට ජනතාවට එවැනි අවසථාවකට මුහුණ දෙන්න සිදු වන නිසා ඒ ජනතාව එයින් මුදවා ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කිරීමට අප කල්පනා කරන්න ඕනෑ. ඒ වගේම උතුරු මැද පළාතේ හැම ගමක්ම පාසාම වගේ අතරින් පතර පේෂ කර්මාන්ත මධ්‍යසථාන ඇති කර තිබුණු බවත් තමුන්නාන්සේ දන්නවා ඇති. අද ඒවා ඉතා ජනප්‍රිය වී තිබෙන බව පෙනී යනවා. දේශීය ජාතික නිෂ්පාදනයන්ට තැනක් දී රටේ ජනතාව දේශීය ඇඳුම් පැළඳුම් පාවිච්චි කරන්න යන මේ අවසථාවේදී එවැනි මධ්‍යසථාන ගමක් පාසා ඇති කර තමන්ගේ ඇඳුම් පැළඳුම් තමන්ට සකස් කර ගැනීමට අවසථාව සලසා දෙනවා නම් එයින් එක් අතකින් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳෙන අතර අනික් අතින් ජාතික හැඟීමකින් යුතුව රටේ ජනතාවට ඉදිරියට යාමටත් අවස්ථාව සැලසෙන බව ප්‍රකාශ කරන්න කැමතියි.

ඒ එක්කම ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳවත් වචනයක් දෙකක් කියන්න ඕනෑ. ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳව නොයෙක් මත ප්‍රකාශ වුණා. මිහින්තල කොට්ඨාශයේ සංවර්ධන සමිති පිළිබඳව ඇත්ත වශයෙන්ම මා ඉතා සන්තෝෂ වෙනවා. මා හිතන්නේ ගරු ඇමතිතුමාත් මා සමග එකඟ වෙනවා ඇත කියායි. ඒ කොට්ඨාශයේ ග්‍රාම සංවර්ධන සමිතිවලින් මේ නොබෝදා යෝජිත පාඨශාලා 15ක් හදා ආණ්ඩුවට භාර දුන්නා. මා හිතන්නේ ඒ එක් ගොඩනැගිල්ලක් රුපියල් හත් අට දාහක් පමණ වටිනවා. එවැනි උනන්දුවකින් මගේ ප්‍රදේශයේ ඇති ග්‍රාම සංවර්ධන සමිති අධ්‍යාපනික දියුණුවට කටයුතු කිරීම අපේ සන්තෝෂයට කාරණයක්. ඒ වගේම මෙවැනි ව්‍යාපාරවල යෙදෙන ග්‍රාම සංවර්ධන සමිතිවලට රජයෙන් ලැබිය යුතු ආධාර මුදල් දෙනවා නම් ඉදිරියේදී ඔවුන් ස්වෝත්සාහයෙන් අවශ්‍ය කටයුතු කිරීමට නොබා ඉදිරිපත් වන බව මතක් කරන්නට කැමතියි.

අවසාන වශයෙන් තවත් එක් කාරණයක් ගැන කියන්න ඕනෑ. දැනට පවතින හදිසි නීති නිසා තුවක්කු බලපත්‍ර දීම නවත්වා දමා තිබෙනවා. හදිසි නීතිය එසේම තිබෙද්දී මෙම ක්‍රමයේ වෙනසක් කරන්නය කියා මා බල කරන්නේ නැහැ. මේ හේතුවෙන් උතුරු මැද පළාතේ ගොවි ජනතාව තම ගොවිතැන් ආරක්ෂා කර ගැනීමට බැරිව ඉතා අමාරු තත්ත්වයක ජීවත් වන බව මා මතක් කරන්න ඕනෑ. ඒ මන්ද මේ වියලි කාලයේදී ඔවුන්ගේ ගොවිතැන් වල් අලින්ගෙන් විනාශ වී යනවා. අලින් ඒවා විනාශ කර දමනවා. නමුත් තමා ළඟ තිබෙන තුවක්කුවට පතරොමක් ලබා ගැනීම ලෙහෙසි පහසු කාර්යයක් නොවෙයි. ඉල්ලුම් පත්‍ර කීපයක් යවා රුපියලක මුදලක් කච්චේරියේ තැන්පත් කර බලපත්‍රයක් කච්චේරියෙන් ලබා ගෙන ඒ බලපත්‍රය කොළඹට නැත්නම් කුරුණෑගලට ගෙන ගොස් පතොරොම් 25ක් ලබා ගැනීමට අද ඒ ගොවිරාළට සිදු වී තිබෙනවා. අන් හැම කටයුත්තක්ම කර ගෙන පතරොම් ටිකත් ගෙන ගෙදර යන විට ඇත්ත වශයෙන්ම ගොවියාට දකින්නට ලැබෙන්නේ විනාශ වී ගිය ඔහුගේ ගොවිපොළයි. එම නිසා නීතිය කොහොම වුණත් සාමාන්‍ය ගොවියාට තමාගේ ගොවිතැන ආරක්ෂා කර ගැනීම සඳහා පතරොම් ලබාගැනීමට පහසු ක්‍රමයක් ඇති කර දෙනවා නම් ඔවුන්ට එය මහත් සැනසීමක් වනවාට කිසිම සැකයක් නැහැ. මේ හැම කාරණයක් පිළිබඳවම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවමින් මගේ කථාව නිමා කරනවා. ස්තුතියි.

යූ. පී. වයි. ජිනදාස මයා. (කුණ්ඩසාලෙ)
(திரு. யூ. பீ. வை. ஜினதாஸ—குண்டசாலே)
(Mr. U. P. Y. Jinadasa—Kundasale)

ගරු සභාපතිතුමනි, කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරන මේ අවස්ථාවේදී මා මතක් කරන්න කැමතියි, මගේ කොට්ඨාශයේ කර්මාන්ත මධ්‍යසථානයක් ආරම්භ කර ඒ කටයුතු කිරීම සඳහා මේ අයවැය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලේඛනයෙන් විශාල මුදලක් වෙන් කර තිබෙන බව. ඒ ගැන ගරු ඇමතිතුමාට මා ප්‍රශංසා කරනවා. අපේ ප්‍රදේශවල ගම් බද ප්‍රදේශවල—කර්මාන්ත මධ්‍යස්ථාන තව තවත් ආරම්භ කිරීමටත් ඒ පළාත්වල තිබෙන අමු ද්‍රව්‍ය ගැන පරීක්ෂණයක් පැවැත්වීමටත් කටයුතු කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. "ඩොලොමයිට්" කියන හිරි ගල් රාශියක් ඒ ප්‍රදේශයේ තිබෙනවා. පොහොර සඳහා ඒවා පාවිච්චි කරනවා. පොහොර සකස් කිරීම පිණිස ඒ ගල් කොළඹට පවා ගෙන එනවා. මාතලේ ප්‍රදේශයේ සිමෙන්ති කර්මාන්තය සඳහා ප්‍රයෝජන ගත හැකි ගල් වර්ග තිබෙනවා. මේ කර්මාන්තය දියුණු කිරීමෙන් රටේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට පුළුවන් වෙනවා. ඒ මගින් අපේ ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නත් හැකි වෙනවා. අපේ පළාත්වල රැකීරක්ෂා ප්‍රශ්නය ඉතාම උග්‍රයි. අපේ පළාතේ ගොවීන්ට අවුරුද්දකට මාස හත අටකට වැඩිය රක්ෂාව නැහැ. එම නිසා එවැනි පළාත්වල කර්මාන්ත සුලබ කරන්න ඕනෑ. ගම්බද ප්‍රදේශවල වඩු කර්මාන්ත මධ්‍යස්ථාන තිබෙන නමුත් ඒවාට ලී නැහැ. ඒ වාගේම ඒවායේ වැඩ කරගෙන යාමට සැලකිය යුතු ඕඩර් ඒවාට ලැබෙන්නේ නැහැ. පාඨශාලාවලට අවශ්‍ය උපකරණ ආදිය සෑදීම ඒවාට බාර දෙන්න පුළුවනි. ඒ ගැන තමුන්නාන්සේගේ කල්පනාව යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ කළ විට ගම්බද ජනතාවගේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳෙනවා ඇති.

ගරු සභාපතිතුමනි, සමාජ සේවා දෙපාර්තමේන්තුව ගැන වචනයක් කියන්න ඕනෑ. මේ රටේ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දක්ෂ අධ්‍යක්ෂවරයෙක් ද සිටින බව අපි දන්නවා. නමුත් දුප්පත් අයට මහජන ආධාර කාරිය ලැබීම බොහොම ප්‍රමාදයි. ඇතැම් අයට දිය යුතු ආධාර ඔවුන් මැරෙනතුරුත් ලැබී නැති බව පේනවා. ගම්වල වැඩි බලයක් තිබෙන්නේ ගම්මුලාදැනීන්ටයි. එම නිසා ඔවුන් නොයෙකුත් අන්දමේ දූෂණ ක්‍රියා කරන බව පේනවා. අහළ පහළ ජීවත් වන අයට, එසේ නැතිනම් තමන්ට සුළු සුළු බැල මෙහෙවර කරන අයට පමණයි, ඔවුන් මහජන ආධාර ඉක්මනින් ලබාදීම සඳහා ක්‍රියා කරන්නේ. එම නිසා මහජන ආධාර අංශය වෙනුවෙන් මීට වඩා යෝග්‍ය වැඩ පිළිවෙළක් යොදන හැටියට මා ඉල්ලා සිටිනවා. ළඟදී එක්තරා පුද්ගලයෙක් හිරේට ගියා. ඔහුගේ පවුලේ දරුවන් 6 දෙනෙක් ඉන්නවා. සිරගෙට නියම වී දැනට මාස 3ක් පමණ වෙනවා. නමුත් ඒ පවුලට සුළු ආධාරයක්වත් දීම සඳහා ක්‍රියා කර නැහැ. හදිසියේ ගෙවල් ආදිය ගිණිබත් වීම නිසා බොහෝ දුප්පත් අය අමාරුවේ වැටෙන බව පේනවා. එවැන්නන්ට ආධාර දීම ගැන කථා කරන විට මහනුවර කච්චේරියේ නිලධාරීන් කියන්නේ මුදල් නැති බවයි. එවැනි ආධාර දීම ඉතා ප්‍රමාදයි. එම නිසා ඒ ගැනද කල්පනාව යොමු කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

මගේ කොට්ඨාශයේ මහලු නිවාසයක් තිබෙනවා. ප්‍රථමයෙන් එය යම් කෙනකුගේ පදිංචිය සඳහා පාවිච්චි කළ එකක්. නිකකැටිය කියන හරියේ පිහිටි එම ස්ථානය අළුත්වැඩියා කොට එම ස්ථානය දියුණු කිරීමට කල්පනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා. මීට වඩා මුදල් වෙන් කොට මහලු අයගේ සැප පහසුව සලසා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම අන්ධයන්ට කර්මාන්ත පුහුණු කිරීම සඳහා වෙරායවත්තේ සාදන ලද ගොඩනැගිල්ලේ වැඩ කිරීම තාම ආරම්භ කර නැහැ. මන්දපෝෂණය හේතුවෙන් අන්ධ බවට පත් අය විශාල සංඛ්‍යාවක් අප පළාත්වල සිටිනවා. යථෝක්ත ස්ථානයේ වැඩ පටන්ගෙන ඔවුනට සහනයක් ලබා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා.

සෑම පක්ෂයකින්ම වාගේ ග්‍රාම සංවර්ධන සමිති ගැන කියන්න යෙදුණා. අපේ ප්‍රදේශවල ග්‍රාම සංවර්ධන සමිති තිබෙනවාද නැද්ද කියාවත් දැනගන්න නැහැ. මගේ කොට්ඨාශයේ සිටින ග්‍රාම සංවර්ධන නිලධාරීන් තමන්ගේ සේවය හරියාකාර ඉෂ්ට කරන්නේත් නැහැ. ගමන් වියදම් නොදෙන නිසා ග්‍රාම සංවර්ධන නිලධාරීන් ගම්වලට යන්න මැලිකමක් දක්වන බව එක්තරා රැස්වීම කදී ප්‍රකාශ කර තිබෙනවා. එවැනි දුර්වල නිලධාරීන් ගැන කල්පනා කර බලන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජිනදාස මයා.]

ඕනෑ. ග්‍රාම සංවර්ධන සමිතිවලට ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ උපකාරය විශේෂයෙන් ලබා දෙන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මත්පැන් ප්‍රශ්නය ගැන යමක් කියන්න කැමතියි. මත්පැන් සම්බන්ධයෙන් කථා කළ බොහෝ ගරු මන්ත්‍රීවරුන් විසින් කියන්න යෙදුණා මහජනයාගේ සෞඛ්‍යයට හානිකර නොවන අන්දමේ සුරා පෙරන්ට අවස්ථාව සලසා දෙන්නය කියා. මා කියන්නේ ඒක නොවෙයි. සුරා සුදු කොමිෂන් සභාවේ වාර්තාව ක්‍රියාත්මක කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

අ. භා. 5.30

කසිප්පු සුරා ආදිය ගැන කථා කරමින් මන්ත්‍රීවරුන් බොහොම දෙනෙක් කිව්වා, ලංකාවේ පොල් ගස්, කිතුල් ගස් තිබියදී කවදාවත් ලංකාවෙන් සුරාව තුරන් කරන්න බැරිය කියා. ඒ අදහස් ගැන මම එකඟ වන්නේ නැහැ. පොල් ගස්වලිනුත් කිතුල් ගස්වලිනුත් ගන්න මී රා වලින් සීනි, හකුරු, පැණි ආදිය හදන්න පුළුවනි. එම නිසා ඒවා සෑදීමට ගස් මැදීම සඳහා අවසර පත්‍ර දීමේ ක්‍රමයක් ඇති කළොත්, වැඩි කලක් ගත වන්ට පෙර ලංකාවේ සුරාව බොහෝ දුරට අඩු කරන්න පුළුවන් වේ යයි මම කල්පනා කරනවා. සුරා සුදු කොමිෂන් සභාව තම වාර්තාවෙහි බැස තිබෙන නිගමනයට එන්න ඇත්තේ මේ අදහස් අනුව වෙන්න ඇති. එසේ කොට හොරෙන් මත්පැන් පෙරන අයට තද බල දඬුවම් දීමට කටයුතු සලස්වන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම හිතන්නේ නැහැ, හොර මත්පැන් කසිප්පු ආදිය පාවිච්චි කිරීමේ ප්‍රශ්නය අරක්කු මිල අඩු කිරීමෙනුත්, ගස් මැද ගස් යට ඉදගෙන රා විකිණීමට ඉඩ දීමෙනුත්, විසඳන්න පුළුවන් වේය කියා. ඒක හරියට කැහි ගැනි දීලා හොටු ගැනි ගත්තා වගෙයි. එම නිසා ඒ ගැන සම්පූර්ණයෙන්ම මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ඒ අතර කොයි ලෙසකින් හෝ හොර මත්පැන් තහනම් කිරීමට මූලික වැඩ පිළිවෙළක් ඇති කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

ශාසන කොමිෂන් සභාවේ වාර්තාව ක්‍රියාත්මක කිරීමට යාම ගැන මම ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. අද රටේ බුද්ධ ශාසන කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳව නොයෙක් විධියේ වැරදි අදහස් ප්‍රචාරය වී තිබෙනවා. ඒවා නැති කිරීම සඳහා ඒ වාර්තාවේ පිටපත් බෙදා හරින ලෙස මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා. එම වාර්තාවෙහි අඩංගු මොනවාදැයි මහජනයා නොදන්න නිසාය. විශේෂයෙන්ම සංඝයා වහන්සේලා ඒවා හරියාකාර නොදන්න නිසයි, ඊට විරුද්ධ වන්නේ. මෙතෙක් උන් වහන්සේලාට තිබුණු ශාසනික නිදහස නැති වන ලෙස විනයානුකූල නොවන නීති පනවා බුද්ධාගම ආණ්ඩුව යටතෙහි තබා ගෙන නොයෙක් විධියේ පාලන නීති ඇති කරාවියයි උන්වහන්සේලා තුළ සැකයක් හා භයක් ඇති වී තිබෙනවා. ඒ නිසා ඒ සැක බිය දුරු කිරීම සඳහා එම වාර්තාවේ පිටපත් බෙදා හැර එය ක්‍රියාත්මක කරන ලෙස මම ඇමතිතුමාගෙන් නැවතත් ඉල්ලා සිටිනවා.

සංස්කෘතික දෙපාර්තමේන්තුව ගැනද වචනයක් කිය යුතුව තිබෙනවා. උඩරට නැටුම් බොහෝ දුරට දැන් දියුණු වී තිබෙනවා. එහෙත් ඒ නාට්‍ය කලාව දියුණු කිරීම සඳහා අපේ රටේ තවම නාට්‍ය කලා යතනයක් නොමැති හෙයින් මහනුවර ප්‍රදේශයේ එවැනි කලායතනයක් පිහිටුවන මෙන් මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ කළොත් දැනට ලෝක කීර්තියට පත් වී තිබෙන උඩරට නාට්‍ය කලාව තවත් දියුණු කොට රැකගැනීමට අවස්ථාවක් ලැබෙනවා. දැන් හැම පාසැලකටම වාගේ නාට්‍ය කලාව ඉගැන්වීමට පුහුණු ගුරුවරුන් පත් කොට ඔවුන්ට වැටුප් දීමටත් කටයුතු සලස්වා දී තිබෙනවා. ඒ ගැන අපේ සන්තෝෂය පළ කරන අතර, ඒ කටයුතු තවත් දියුණු කරන මෙන් අපි ඉල්ලා සිටිනවා.

මේ අතර ඊයේ පෙරේදා වූ සිද්ධියක් පිළිබඳවත් වචනයක් කීමට මා අදහස් කරනවා. විහාර දේවාලගම් පණත යටතේ මහියංගන චෛත්‍යය එක්සත් ජාතික පක්ෂයට පවරා තිබෙනවාදැයි මම දන්නේ නැහැ. මේ මාසේ පළමුවැනිදා ලංකාව පුරා ප්‍රදර්ශනය කිරීම සඳහා චෛත්‍යවර්ධන සමිතිය මගින් ගෙන යනු ලබන චෛත්‍ය රාජයාගේ ධාතු කරඬුව මගේ කොට්ඨාශයේදී—මැණික් හින්නේදී—පිළිගෙන ප්‍රදර්ශනය කරවීම සඳහා අපේ ප්‍රදේශයේ කාරක සභාව තීරණය කර ගත්තා. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනුව මහත් හරසරයකින් යුතුව ධාතු කරඬුව පිළිගැනීම සඳහා දහස් ගණන් ජන කාය එකතු වී කටයුතු කළා. කාරක සභාවේ සභාපති හැටියට එම ධාතු කරඬුව මෝටර් රථයෙන් සභා ශාලාවට වැඩම කරවීම මට භාර දී තිබුණා. ඒ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයට ගැතිකම් කරන ස්වාමීන් වහන්සේ නමකුත් එක්සත් ජාතික පක්ෂයේ මුහන්දිරම් කෙනකු වන වත්තේගම පළාතේ කෙනකුත් එය වළක්වා වෙන කෙනකුට ඒ කටයුත්ත භාර කළා. මේ අන්දමට කටයුතු කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රචාරක වැඩ කිරීම සඳහා මහියංගන චෛත්‍යරාජයාණන් එක්සත් ජාතික පක්ෂයට ලියා දී තිබෙන නිසාදැයි මම දැනගන්න සතුටුයි. විහාර දේවාලගම් පණත යටතේ උන්නැහේලාට ඒ විධියේ බලයක් පවරා තිබෙනවාද? බෞද්ධ සිද්ධ ස්ථාන පිළිබඳ කටයුතු ඒ විධියට එක පක්ෂයකට භාර දිය නොහැකි බව සැදැහැවත් බෞද්ධයකු ලෙස මම ප්‍රකාශ කරනවා. විශේෂයෙන් අප වාගේ බෞද්ධයන්ට මේ විධියේ නින්දිත වැඩ කිරීම ගැන මම කණගාටු වෙනවා. මේ විධියේ වැඩ කර ඔවුන් ආගම දියුණු කරන්න යනවාද, ඔවුන්ගේ පක්ෂය දියුණු කරන්න යනවාද කියා මා අහන්න කැමතියි. එක්සත් ජාතික පක්ෂයේ අයට හැර වෙන අයට ඊට සහභාගි වන්න ඉඩ නොදී වැඩි කළ බවයි, අපට දැන ගන්න ලැබුනේ. මීට පසු බෞද්ධ වේවා, ක්‍රිස්තියානි වේවා, මුස්ලිම් වේවා මෙවැනි ආගමික වැඩ කරන අවස්ථාවලදී, දේශපාලන පක්ෂ ගැන නොසලකා ක්‍රියා කිරීමට සලස්වන ලෙස මම ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, ඒ චෛත්‍යයේ කොත් වහන්සේ හරි ගස්වා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ ලාඡනය වූ අලියාගේ ලාඡනය යොදා බව මට කියන්න අමතක වුණා. ඒ කොත් වහන්සේ එක්සත් ජාතික පක්ෂයට භාර දීලාද එසේ නැත්නම් බෞද්ධයන්ට භාර දීලාද කියා මා දන්නෙ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
ඒක කොළ පාටද?

යූ. පී. වයි. ජිනදාස මයා.
(திரு. யூ. பீ. வை. ஜினதாஸ)
(Mr. U. P. Y. Jinadasa)

කොළ පාට නම් නැහැ. ආගම් දියුණුවට පරිත්‍යාග කරන අවස්ථාවේදී, බෞද්ධයන්ට හෝ වේවා, වෙනත් ආගමිකයන්ට හෝ වේවා සාධාරණ විධියට ප්‍රයෝජනවත් වන අන්දමින් ඒ පරිත්‍යාග කිරීමට කල්පනාවෙන් ක්‍රියා කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී උඩරට ගැම් කොමිෂන් සභාව ගැනත් වචන යක් දෙකක් කියන්න ඕනෑ. මේ වාර්තාව අනුව මගේ ඡන්ද කොට්ඨාශයේ නම් කිසිම වැඩක් කෙරිලත් නැහැ, කරන්නට අනුමත කරලත් නැහැ. මේ ගැම් කොමිෂන් සභා වාර්තාව යටතේ අපේ ඡන්ද කොට්ඨාශවලට පාරවල් සහ පාසල් සපයා දී ඉතා නොදියුණු තත්ත්වයක සිටින ඒ උඩරට ජනතාවට සහනයක් සලසා දීමට කටයුතු කරන ලෙස මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

පී. සී. ඉඹුලාන මයා. *(රුවන්වැල්ල)*
(திரு. பீ. சீ. இம்புலான—ரூவான்வல்ல)
(Mr. P. C. Imbulana—Ruwanwella)

ගරු සභාපතිතුමනි, කාරක සභා අවස්ථාව නිසා මේ වැය ශීඝ්‍රීය යටතේ දීර්ඝ ලෙස කථා කරන්න මම අදහස් කරන්නෙ නැහැ. පළමුවෙන්ම මෙම රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ගැන වචන යක් දෙකක් කියන්න බලාපොරොත්තු වෙනවා. නීතියේ අඩුපාඩුවක් නිසාද දන්නෙ නැහැ, උප්පැන්න ලියා පදිංචි කිරීම සම්බන්ධව, විශේෂයෙන්ම ප්‍රමාද වූ උප්පැන්න ලියා පදිංචි කිරීම සම්බන්ධව, ඒ දෙපාර්තමේන්තුවට විරුද්ධව ගැම් ජනතා වගෙන් නොයෙක් පැමිණිලි අහන්නට ලැබෙනවා. ගැමියන් කීප දෙනකුම තමන්ගේ දරුවන්ගේ උප්පැන්න ලියා පදිංචි කිරීමට කෑගල්ලේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට ගොස් ඒ වැඩය කර ගන්න බැරිව ආපසු හැරී ඇවිත් තිබෙනවා. සමහර අවස්ථාවලදී ගම්මුලාදැනියාත්, අනිකුත් නිලධාරිනුත් සාක්ෂි දුන් විටත්, දෙමාපියන් දෙදෙනාම "මේ මගේ පුතාය, මේ මගේ දුවය" කියා සාක්ෂි දුන් විටත්, උප්පැන්නය රෙජිස්ටර් කරන්න සාක්ෂි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉඹුලාන මයා.]

මදිය කියා ආපසු එවා තිබෙනවා. නීතියේ ප්‍රමාද දෝෂයන් නිසා මෙය සිදු වී තිබෙන වාද දන්නෙ නැහැ. ඒ නිසා මේ කාරණාව හිතේ තියාගෙන නීතියේ ප්‍රමාද දෝෂයක් තිබෙනවා නම් එය හරිගස්වා මේ උප්පැන්න ඉක්මනින් ලියා පදිංචි කිරීමට පහසුකම් සලස්වන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සුරාබදු දෙපාර්තමේන්තුව ගැන කථා කළ හැම මන්ත්‍රීවරයෙක්ම පාහේ ඊට විරුද්ධව ඉදිරිපත් කළ චෝදනාවලට මා විසිනුත් එකතු කළ යුතු චෝදනා තිබෙනවා. සුරාබදු දෙපාර්තමේන්තුව දූෂිත පාලනයක් උඩ ක්‍රියා කරන බව රහසක් නොවෙයි. සෑම පළාතකම සුරාබදු ප්‍රහාරක හමුදාවක් තිබෙනවා. ඒ අය පහර ගහන්නෙ කාගෙවත් සාක්කුවලට පමණයි.

ඇත්ත වශයෙන්ම මේ අංශයෙන් කෙරෙන සේවය මොන විධියේ එකක්ද යන්න ගැන සුළු විස්තරයක් දිය යුතුය කියා මා කල්පනා කරනවා. විශෙෂ වගකීමේ හැඟීමකින් යුක්තවයි මා මේ කියන්නෙ. මා කියන දේ ඇත්ත හැටියට මට ඒත්තු ගොස් තිබෙන නිසයි මා මේ කාරණය සඳහන් කරන්නෙ. මේ ප්‍රහාරක හමුදාවේ නිලධාරීන් හැම මාසයකම එක් තරා දිනයක කලින් නියම කරගනු ලබන ස්ථානයකට එනවා. ඒ එන්නෙ අල්ලස් එකතු කර ගැනීමටයි. මේක රහසක් නොවෙයි. ඒ නිසා ගරු ඇමතිතුමා මේ සුරාබදු ප්‍රහාරක හමුදාව නැති කරනවාද නැද්ද කියන එක අපට දැනගන්න ඕනෑ. එහෙම නැත්නම් අමුතු සංවිධානයක් ඇති කරනවාද නැද්ද යන්න ගැන කල්පනා කරනවා ඇතැයි මා විශ්වාස කරනවා.

අල්ලස් ගැනීම සම්බන්ධයෙන් නඩු දෙකක්ම මේ ළඟදී ඇති වුණා. අල්ලස් ගැනීමක් සම්බන්ධයෙන් අල්ලස් කොමසාරිස් දෙපාර්තමේන්තුවට දැනුම් දුන්නා. ඒ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ අංශයෙන් නිලධාරීන් කීප දෙනෙක් අවිස්සාවේල්ලේ උසාවිය ළඟට ආවා. අල්ලස් ගැනීම සම්බන්ධයෙන් පැමිණිල්ල ඉදිරිපත් කළ අයත් අල්ලස් දෙපාර්තමේන්තුවේ නිලධාරීනුත් එකතු වී සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අනුදැනුමක් නැතිව කොළඹ සිට පැමිණි රහස් පොලීසියේ නිලධාරිනුත් සමග එක් නැනක හිටියා. එහිදී ඒ අය කථා කර ගත්තා අසුවල් දිනයේදී අසවල් ස්ථානයේදී කල් තබා ලකුණු කරගන්නා ලද රුපියල් 250ක් වෙනදා පුරුදු විධියට සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට දිය යුතුය කියා. නමුත් මේ නිලධාරීන් ඒ නියම කර ගත් දවසේ එහාට ගියේ නැහැ. මෙහි ලොකු රහසක් තිබෙනවාය කියා මා හිතනවා. නිලධාරීන් අල්ලා ගැනීමෙන් තමන් කරදරයට වැටෙන්ට ඉඩ තිබෙනවාය කියා කල්පනා කළ නිසා ඔවුන් දෙවන දවසේ නියම කර ගත් ස්ථානයට යන්නෙ නැතිව හිටියා වෙන්ට ඇත කියා හිතෙනවා. ඔන්න ඔය විධියේ වැරදි වැඩ කෙරෙන බව පෙනෙනවා.

එක් තැනක කසිප්පු ජාර් 4ක් ඇල්ලුවා. නමුත් පැමිණිල්ල ඉදිරිපත් කළේ කසිප්පු තිබුණාය කියා නොවෙයි; රා බෝතල් දෙකක් පමණක් තිබුණාය කියා නඩුව ඉදිරිපත් කළා. සුරාබදු ප්‍රහාරක හමුදාව රුපියල් 250ක් අරන් රා බෝතල් දෙකක් පමණයි තිබුණෙ කිව්වා. රා බෝතල් දෙකක් තිබුණාය කියා නඩුවක් ඉදිරිපත් වුණාම විත්තිකාරයාට උසාවිය අනුකම්පාවක් දක්වන නිසා, නඩුකාරතුමන්ලා ඒ අයට සුළු දඩයක් පමණක් නියම කරන නිසා, ඒ විධියට අල්ලස් ගෙන බරපතළ නොවන ආකාරයට නඩුවකුත් දමන සිරිතක් තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවේ සුරා ප්‍රතිපත්තිය කුමක්දැයි අපට පැහැදිලිව දැනගන්ට ඕනෑ.

ගම්බද ජනතාවට රා ගස් හෙවත් කිතුල් ගස් මදින්ට අවසර පත්‍ර දෙනවාද යන්නත් අපට දැනගන්ට ඕනෑ. යාපනේ කෙරෙන ආකාරයට අනෙක් පළාත්වලටත් කිතුල් ගස් මැදීමට ඉඩ දෙනවාද? යාපනේ අයත් තමන්ගේ දරුවන් මත්පැන් බීමට පුරුදු වීමෙන් වළක්වන්නට උත්සාහයක් ගන්න බවත්, මේ විධියට තල් ගස් මදින්ට අවසර දීම ගැන ලොකු චෝදනාවක් ඉදිරිපත් කරන බවත්, දැනගන්නට ලැබී තිබෙනවා. කසිප්පු උවදුර නැති කිරීම සඳහා දුප්පත් ගැමි ජනයාට රා මැදීමට ඉඩ දෙනවාද?

උඩරට ගැමි පුනරුත්ථාන ක්‍රමය ගැන කථා කරන්ට කලින් අධිරාජ්‍ය මත්පැන් ප්‍රතිපත්තිය ගැනත් වචනයක් කථා කරන්ට බලාපොරොත්තු වෙනවා. මේ ගැන ගරු මන්ත්‍රීන් කීපපොළක්ම කථා කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තානායම්වලත් අරක්කු විකුණන්ට ඉඩ දෙන ලෙස බොහෝ දෙනෙක් ඉල්ලා සිටියා. විස්කි, බීර, වැනි දේ වැන්වල නිදහසේ ගෙන යන්නාක් මෙන් අරක්කුත් වැන්වල ගෙන යන්ට ඉඩ තිබිය යුතුය කීවා.

අ. භා. 5.45

පිට රටවලින් ගෙන් වනු ලබන බීම ජාති විකිණීමට ෙපාරින් ලිකර් ෂොප්ස් වශයෙන් හැදින්වෙන සාප්පුවලට ලයිසන්ස් දී තිබෙනවා. තැබෑරුම් විවෘත කිරීමට ලොකු කරදරයක් තියෙනවාය කියනවා නම් මෙම සාප්පුවල අරක්කු විකිණීමට බලපත්‍ර දෙන්න බැරි ඇයි කියා මම ප්‍රශ්න කරනවා. එවැනි වැඩ පිළිවෙළක් ඇරඹුවොත් දැනට මේ රටේ තදින්ම බල පවත්වන්නාවූ කසිප්පු උවදුර මැඩලීමට පුළුවන් වේයයි මම කල්පනා කරනවා.

උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව යටතේ පළාත් දෙකක් සම්බන්ධයෙන් වැඩ පිළිවෙළවල් ගෙන යනවාය කීවත් ඇත්ත වශයෙන්ම මෙය සීමා වී තිබෙන්නේ මධ්‍යම පළාතට පමණයි. මෙම ක්‍රමයට සබරගමු පළාතද ඇතුළත් කරන්න යනවා. මෙම ක්‍රමය යටතේ ඌව පළාතටත් මධ්‍යම පළාතටත් මුදල් රාශියක් වියදම් කර විශාල සේවයක් කර තිබෙනවා. සබරගමුව මෙම ක්‍රමය යටතට ගනු ලැබුවේ ප්‍රමාද වී නිසා මෙම පළාතට මේ අවුරුද්ද වෙනුවෙන් වෙන් කර තිබෙන මුදල දෙගුණ කරන්නය කියා මා ඉතා ඕනෑකමින් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

යම් යම් පළාත්වල පිහිටුවා තිබෙන ශාසන ආරක්ෂක සමිති ගැන වචන තුන හතරක් කියන්න ඕනෑ. මගේ පළාතේ ආරම්භ කළ මෙවැනි සමිතියකට සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් සෑහෙන ප්‍රචාරයක් කිරීමෙන් පසුවත් පැමිණ සිටියේ දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන් ඇතුළු ගිහියන් 15 දෙනකුත් භික්ෂූන් වහන්සේලා 3 නමකුත් පමණයි. ශාසන ආරක්ෂක සමිතිවල රැස්වීම්වලට භික්ෂූන් වහන්සේලා නොපැමිණෙන්නේ කුමන හේතුවක් නිසාද කියා පරීක්ෂා කර බලන මෙන් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. සෘජුව වැඩ කරන්නාවූ භික්ෂූන් වහන්සේලාගේ සහයෝගය මෙම වැඩවලට ලබාගන්න බැරිව තිබෙනවා; ඒ ස්වාමීන් වහන්සේලා මේවාට සහභාගි වීමට මැලිකමක් දක්වනවා.

ග්‍රාම සංවර්ධන සමිති නියම අන්දමට ක්‍රියාත්මක කිරීමේ බලය පැවරෙන්නේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ටයි. කිසියම් සමිතියක් නිසි අන්දමට කටයුතු නොකරනවා නම් ඊට හේතු පරීක්ෂා කර බලා ප්‍රතිකර්ම යෙදීමේ වගකීම රඳා තිබෙන්නේ මේ නිලධාරීන්ගේ අතේයි. දැන් නම් මෙම සමිතිවල දූෂණ කටයුතු ඉතා බහුල වශයෙන් කෙරෙන බව පිළිගන්න ඕනෑ. මෑත හුගයේදී ලංකාවේ ආර්ථික දියුණුව සහ මහජන යහපත සඳහා ග්‍රාම සංවර්ධන සමිති මඟින් විශාල වැඩ කොටසක් සිදු වුණා. ඒ පිළිබඳව එක් නිදර්ශනයක් දෙන්ට කැමතියි, ග්‍රාම සංවර්ධන සමිති මාර්ගයෙන් එක් ප්‍රාදේශක පාරවල රුපියල් 60,000 ක් වටිනා පස් වැඩ ප්‍රමාණයක් කරන ලද නමුත් වර්ෂාව නිසා අවුරුදු දෙකකදී ඒ සියල්ලම විනාශ වී ගියා. රුපියල් 60,000 ක් වටිනා පස් වැඩ කර ඇතැයි නිගමනය කෙළේ ඒ ප්‍රාදේශයේ ඉංජිනේරුතුමායි. ඒ පස් වැඩ රාශියම ගංගාවලට සේදී ගියා. එම නිසා මේ සඳහා ඉතාමත් යෝග්‍ය සුදුසු පිළියමක් යෝජනා කරන්ට මා බලාපොරොත්තු වෙනවා. කඳු හෙල් වංගු සහිත පාරවල මෙවැනි වැඩ කරන අවස්ථාවේදී ඒ කඳුවලට හෙල්වලට සහ වංගුවලට තාර දැමීම පිණිස ඒ ග්‍රාම සංවර්ධන සමිතිවලට සෑහෙන ආධාර මුදලක් දිය යුතුයි. ඒ පාරවල් නිත්‍ය වශයෙන් සකස් කිරීම සඳහා ඒ ග්‍රාම සංවර්ධන සමිතිවලට ආධාර මුදලක් දිය යුතුයි.

මීළඟට ඛනිජ දෙපාර්තමේන්තුව ගැන මතක් කළ යුතුව තිබෙනවා. මෙම දෙපාර්තමේන්තුව මඟින් මේ රටේ තිබෙන ඛනිජ ද්‍රව්‍ය සම්බන්ධව නියම පරීක්ෂණයක් කරන ලද බව අපට කියන්ට බැහැ. නියම පරීක්ෂණයක් කරන ලද්දේ නම් සබරගමු පළාතේ නොයෙකුත් ප්‍රදේශ ඒ පරීක්ෂණයට අසු විය යුතුයි. එහෙත් පරීක්ෂණයක් තබා අඩු වශයෙන් ඒ ප්‍රදේශයේ "සර්වේ" එකක්වත් නැහැ. මොන මොන ඛනිජ වගී මේ රටේ තිබෙනවාද, මොන මොන විධියට ඒවා ප්‍රයෝජනයට ගත හැකිද, කියා තවමත් තීරණයක් කර නැහැ. එම නිසා සබරගමුව ප්‍රදේශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉඹුලාන මයා.]

යේ ඒ පිළිබඳ පරීක්ෂණ පවත්වන්ට වුවමනා බව ඉතා ඕනෑකමින් මතක් කරනවා. මේ කරුණු ගැන සලකා බලන ලෙස ඉල්ලමින් මගේ කථාව සමාප්ත කරනවා.

එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා. (පොතුවිල්)
(ஜனாப் எம். ஏ. அப்துல் மஜீது—பொத்துவில்)
(Mr. M. A. Abdul Majeed—Pottuvil)

Mr. Chairman, I take this opportunity to speak a few words and I will not take much time. I am sorry to find that the Hon. Minister is not in his seat. I appeal to the Hon. Acting Minister of Labour and Nationalised Services to bring these matters to his notice.

The first matter is regarding the acute problems we are facing as a result of the new kachcheri that was opened at Amparai a few months back in, I should say, undue haste. Merely lighting some brass lamp in some building, calling it the establishment of a kachcheri, and leaving matters at that will not make the kachcheri function.

The area that has now been put under the Amparai kachcheri is very much more in extent and the population is also very much more, than the area and and population under the present Batticaloa Kachcheri. I am sorry to say that this kachcheri has been given stepmotherly treatment by the Government. What is more, no Government Agent has been posted to it. No money provision has been made for it. There is only a potty little safe which can be easily lifted by a few people. That is all that they have for a strong room in that kachcheri.

Confusion has been made worse confounded by the Gal Oya Board rushing in and divesting itself of its powers in relation to the Left Bank Channel. There is a power vacuum there. Formerly, the conservancy and scavenging work on the Left Bank was done by the Board. I met the Resident Manager of the Board recently and he told me that he was pulling out all his officers by October 1st. Who is thereafter going to undertake the scavenging and conservancy work? Local bodies have not yet been formed in the Valley. I would request the Government to appoint a Special Commissioner at least to look after the aspects of the local government work or to see that the Gal Oya Board continues to carry out the functions it is now performing or did perform on the Left Bank.

Another matter is the place where the kachcheri is sited. The only reason given for opening the kachcheri in that place was that they had enough buildings. For God's sake, if you do not believe what we say, get reports from your officers. There is a potty little building. You have sent clerks to work there. They are finding it awfully difficult to function. About 10 or 12 of them are cramped in a small place. It is no place for a kachcheri. I would appeal to the Minister—if he has no time for it—to send some of his officials to inspect it. I am not here canvassing for some particular place. But I am sure you would agree that when you site a kachcheri for a district you must go about it in such a way that you select the best place. So far as the people of my electorate, Pottuvil, are concerned, they could at least go to Batticaloa. People outside Pottuvil would have to come 46 miles to Karativu, 16 miles from there to Amparai, and another 7 miles from there in three different buses. I would therefore appeal to the Hon. Minister to kindly see to it that the kachcheri is sited in a central spot.

There is one more matter. From newspaper reports I understand that amendments to the Wakfs Ordinance have been approved by the Cabinet. I appeal to the Minister to give top priority to this matter and see that the legislation is brought before us very early.

In conclusion I would like to refer to the question of destitute persons. There are hundreds of people in the Amparai district who had been placed in the "very urgent" waiting list for assistance by the Government Agent as far back as two years

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ago. They are still in that "very urgent" waiting list. They are a category of persons who have been classified as destitute. If no assistance is given to them by Government, they would have to starve. I do not think it would cost the Government very much to make payment at least to these urgent cases. I appeal that this be done early.

ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)
(திரு. ரி. பி. எம். ஹெரத்—வளப்பனே)
(Mr. T. B. M. Herath—Walapane)

ගරු සභාපතිතුමනි, සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මමද වචන කීපයක් කථා කිරීමට බලා පොරොත්තු වෙනවා. පළමු කොට මම ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මෙම ගරු සභාවේදීත්, පිටතේදීත්, විශාල උද්ඝෝෂණයක් වශයෙන් පැවතුණ ගම් මුලාදැනි ක්‍රමයට විරුද්ධව, ගම්මුලාදැනීන් විසින් මේ රටේ මහජනතාව සූරා කෑමේ ප්‍රතිපත්තියට විරුද්ධව පසු ගිය අවුරුද්ද තුළ ගත් පියවර ගැන. විශේෂයෙන්ම ගම් මුලාදැනීන් ගෙන් අධික ලෙස හිරිහැර විඳින ජනතාවගේ නියෝජිතයකු වශයෙන් ඒ පියවර ගැන මම ගරු ඇමතිතුමාට ස්තුති වන්ත වෙනවා.

අ. භා. 6

මී ළඟට සංස්කෘතික කටයුතු ගැන වචන කීපයක් සඳහන් කරන්න ඕනෑ. අපේ සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් මේ රටේ ජාතික නැටුම් දියුණුවට ගෙන යන වැඩ පිළිවෙළ ප්‍රසංශනීයයි. අපේ රටේ ඕනෑ තරම් භේද තිබෙනවා. සමාජයේ සෑම තැනම නොයෙකුත් දේ භේද භින්න වී තිබෙනවා. එසේ භේද භින්න වී තිබෙන තාක් අපට මිනිස් සංහතියක් වශයෙන් මනුෂ්‍ය සමාජයක් වශයෙන් දියුණු වන්නට පුළුවන් කමක් තිබේය කියා මම විශ්වාස කරන්නේ නැහැ. එම නිසා උඩ රට නැටුම් හෝ වේවා, සබරගමු නැටුම් හෝ වේවා, පහතරට නැටුම් හෝ වේවා, ඒ නැටුම් කලාවන් සඳහා වෙන වෙනම සංවිධාන පිහිටුවා ගෙන කටයුතු කිරීම ගැන මගේ විරුද්ධත්වය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න සිදු වී තිබෙනවා. එම නිසා මේ ලංකාවේ මොන මුල්ලක තිබුණත්, මොන ස්ථානයක තිබුණත්, ඒ සියල්ලම ජාතික නැටුම් හැටියට ගෙන ඒ නැටුම් සියල්ලටම සමාන අවස්ථාවක් ලබා දෙන්නය කියා මම ඉල්ලා සිටිනවා. සමහර විට උඩ රට මන්ත්‍රීවරයකු හැටියට මා මෙසේ ප්‍රකාශ කිරීම ගැන සමහර ගරු මන්ත්‍රීවරුන් මා සමග අමනාප වෙන්න පුළුවනි. නමුත්, මා කියන්නේ අපේ නැටුම් කලාව විශෙෂ ප්‍රදේශවලට සීමා කර තැබීමෙන් අපේ ජාතික සංස්කෘතියට එයින් පහරක් වැදෙන බවයි. එම නිසා ඒ සියලුම නැටුම් ඒකාබද්ධ කොට ජාතික නැටුම් සම්ප්‍රදායක් ඇති කර ගෙන අපේ පැරණි සංස්කෘතිය ලෝකයේ අනෙක් රටවලට බෙදා හරින ලෙසයි, මා ඉල්ලන්නෙ.

තවත් කරුණක් නම්, අපි බොහෝ විට අපේ පැරණි සංස්කෘතිය ගැනම පමණක් කථා කරනවා විනා, අපේ වර්තමාන සංස්කෘතිය ගැන කල්පනා කරන්නේ නැහැ. අපේ පැරැන්නන් මේ විධියට ජීවත් වුණාය මේ විධියට කෙළි සෙල්ලම්වලින් ජීවත් වුණාය කියා පැරණි අය කළ කී දේ ගැන උදම් ඇනුවාට මදි. අද ජීවත්වන අපි අනාගතයේ ඇති වන උදවියට අගය කළ හැකි අන්දමේ යම් සංස්කෘතියක් ඇති කර තබා මිය යා යුතු බව අමතක කළ යුතු නැහැ. ඒ නිසා පැරණි සංස්කෘතික දේවල් ආරක්ෂා කරන අතර, අපේ රටට, අපේ සමාජයට ගැලපෙන සංස්කෘතික නිපදවීම් ආදී සංස්කෘතික කටයුතු ගෙන යාම ඉතාම වැදගත් බව මම මතක් කරන්න කැමතියි.

සංස්කෘතික අංශයෙන් අද යම් යම් පොත් තහනම් කරන්න සිද්ධ වී තිබෙන බව අපට පෙනී යනවා. යම් යම් කෘතීන් සහ චිත්‍රපටි ආදිය තහනම් කරන්න සිද්ධ වුණා. ඒ මොකද? එවැනි දේවල් අනාගතයේදී බිහි වන පරම්පරාව අගය කරාවිය කියා අපට හිතන්න බැහැ. අගය කළ නොහැකි දේවල් ඇතිවන විට සංස්කෘතියක් ඇති පිරිසක් මේ විදියට ජීවත් වුණාය කියා අනාගතයේදී කල්පනා කරන්න ඉඩක් නැහැ.

විශෙෂයෙන් චිත්‍රපටි ගැන වචනයක් කියන්න ඕනෑ. මා කරන්නට යන ප්‍රකාශය සම්පූර්ණයෙන් සත්‍යයක්ද නැද්ද කියා මා දන්නේ නැහැ. නමුත් මේ ගැන සොයා බලන විට, චිත්‍රපටි නිපදවීම සඳහා විශාල මුදල් සම්භාරයක් පිටරට ඇදී යන බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. බී. එම්. හේරත් මයා.]

අපට පෙනෙන්න තිබෙනවා. චිත්‍රපටි නිපද වීම සඳහා මේ රටෙන් පිටරට ඇදී යන මුදල් ඒ චිත්‍රපටි නිෂ්පාදනය සඳහාම හරියාකාර යොදවන්නේ නැත කියා චෝදනාවක් තියෙනවා. එම නිසා ඒ මුදල් නියම පරිදි ඒ සඳහාම යොදවනවාද නැද්ද කියා සොයා බැලීමට ඉක්මනින් පියවරක් ගන්නා ලෙස මම ඇමතිතුමාගෙන් ඉල්ලනවා.

ඊළඟට උඩරට ගැම් කොමිෂන් සභාව ගැන වචනයක් කියන්න ඕනෑ. සභාපතිතුමනි, අපට අද ජීවත් වන්නට සිද්ධ වී තිබෙන්නේ "උඩරට ගැම් කොමිෂන් සභාව" කියන වචනයට පමණක් සීමා වී ඒ වචනය යටතේ සි. සමහර විට නොයෙක් අංශවලින් අප නොයෙක් උදව් ඉල්ලා සිටි විට අපට අසන්න ලැබෙන්නේ කුමක්ද? "මධ්‍යම පළාත උඩරට ගැම් පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවට අයත් කොට්ඨාශයක්. ඒ නිසා වෙනත් අංශවලින් ඒ ප්‍රදේශයට වැඩි මුදලක් වුවමනා නැත" කියන එකයි. ග්‍රාම සංවර්ධන අංශයෙන් ඉල්ලා සිටියත්, කර්මාන්ත අංශයෙන් ඉල්ලා සිටියත්, පාරවල් සාදන අංශයෙන් ඉල්ලා සිටියත් කියන්නේ උඩරට ගැම් පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවෙන් උඩරට ප්‍රදේශවලට විශේෂ සැලකිලි ලැබෙනවා, එම නිසා මේවාසින් ආධාර මුදල් වුවමනා නැත කියායි. දැන් අපට සිදු වී තිබෙන්නේ කුමක්ද? අපට කොයි පැත්තකින්වත් ආධාර ලැබෙන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම උඩ රට ගැම් සංවර්ධන සැලැස්ම අඳුව මගේ කොට්ඨාශය සම්බන්ධයෙන් පිළියෙල කරන ලද සැලැස්මවල් රාශියක් තිබෙනවා. නමුත් සැලැස්මවල් තිබෙනවා විතරයි, වැඩ කෙරෙන්නේ නැහැ. අවුරුදු පතා මුදල් වෙන් කරනත් ඒ මුදල්වලට සිදු වන්නේ කුමක්ද කියාවත් දන්නේ නැහැ; භාණ්ඩාගාරයට ආපසු එනවාද කියා සොයා බලන්න ඕනෑ. උඩරට ගැම් පුනරුත්ථාපන නිලධාරියකු නිකම් පුටුවක් රත් කළාට මේ කටයුත්ත සිදු වන්නේ නැහැ. කරනවා නම් හරියට කරන්න. උඩරට සංවර්ධන ව්‍යාපාර යටතේ ලැබෙන මුදල්වලින් අපේ ප්‍රදේශවල තිබෙන අඩු පාඩුකම් නැති කර ඒ ප්‍රදේශ දියුණු කරන්න ඕනෑ. එසේ නැතිව එක එක කියා මහජනයා රැවටීමෙන් ප්‍රයෝජනයක් නැහැ. ඒ පරණ පුස්කාපු සැලැස්ම වීසිකර දමා උඩරට ප්‍රදේශවල හෝ අනෙක් ප්‍රදේශවල හෝ සංවර්ධනය කළ හැකි සංවර්ධනය කළ යුතු ප්‍රදේශ තිබෙනවා නම්—උඩරට ප්‍රදේශ විතරක්ය කියා මා කියන්නේ නැහැ—ඒවා දියුණු කරන්න අප මහන්සි ගන්න ඕනෑ. කොළඹ නැත්නම් බස්නාහිර පළාත පමණක් දියුණු කර මෙරට සංවර්ධනය කරන්න පුළුවන් කමක් නැහැ. ලක්ෂ සංඛ්‍යාත ජනකායක් සිටින රටක 10,000 ක් දියුණු කර මුළු රටම දියුණු කළාය කියා කියන්න බැහැ. සෑම දෙනාම එක්තරා ප්‍රමාණයකින් දියුණු වන්න ඕනෑ. වලපනේ වැනි ඇතැම් කොට්ඨාශවල මිනිසුන් ලොව ඇති වුණු ද, සිටම පයින් ඇවිදිමින් දුක් විඳිද්දී කොළඹ වැනි ප්‍රදේශවල උදවිය පමණක් සැප පහසුකම් විඳීම මොන ප්‍රජාතන්ත්‍රවාදයක්ද, මොන සමාජවාදයක්ද කියා අපට ප්‍රශ්න කරන්න සිදු වී තිබෙනවා. මේ රටේ දියුණු යයි කියන උදවිය විශාල පාරවල් දියුණු කරගෙන දැන් අහස් යාත්‍රාවලින් යන්න කථා කරනවා. එහෙත් අපට තවමත් පරණ විධියට හණ මිටිය කරේ තියා ගෙන කඳු උඩ යන්න සිදු වී තිබෙනවා. මේ තත්ත්වයෙන් මිදෙන්නට බැරි නම් උඩරට ගැම් පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවක් වුවමනා නැති බව කනගාටුවෙන් ප්‍රකාශ කරනවා. සංවර්ධන කියන නම පමණක් තිබීමෙන් ප්‍රයෝජනයක් නැහැ. ඒ නිසා ගරු ඇමතිතුමනි, පසුගිය දවස්වල ඔබ අදහස් කළාක් මෙන් යම්කිසි කාරක සභාවක් ඇති කර එය වැඩක් කරන ආයතනයක් බවට පත් කරන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ නැතිව පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවලින් වැඩක් නැහැ. එම නිසා ක්‍රියා කාරක උඩරට ගැම් සංවිධානයක් ඇති කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, රජයේ සුරා ප්‍රතිපත්තිය පිළිබඳවත් හුඟක් දේවල් කියැවුණා. මටත් ඒ ගැන වචනයක් කියන්න ඕනෑ. ඒ මන්ත්‍රීවරුන් මොන විධියට මේ ප්‍රකාශ කරනවාදැයි මා දන්නේ නැහැ. මා සුරා පානය නොකරන නිසා සුරාවලට විරුද්ධව කථා කරනවා යයි සමහරුන් හිතන්න පුළුවනි. තවත් කෙනකු සුරා දියුණු කරන්න යයි කිව්වාම ඔහු සුරා පානය කරන නිසා එහෙම කියනවා යයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

චෝදනා කරන්න පුළුවනි. මා අහන්නේ සුරා පිළිබඳව යම්කිසි ප්‍රතිපත්තියක් තිබෙනවාද කියන එක පමණකි.

සමාජ ශාලාවක් සඳහා අවසර පත්‍රයක් ගෙන ඕනෑ තරම් සුරා තබා ගැනීමට පුළුවනි. ඒ වගේම, නීති විරෝධී බූරු ගැසීම් වැනි සූදු ආදි ඕනෑ එකක් කරගෙන යන්න පුළුවනි. දුප්පත් මිනිහාට ලයිසන්ස් දෙන්නේ නැහැ. ඔහු රා බෝතලයක් හැදූ හැටියේ අල්ල ගන්නවා. උසස්ය කියන මිනිසුන්ට සමාජ ශාලා අවසර පත්‍රයක් ලබා ගෙන ඕනෑ තරම් වැරදි කරන්න ඉඩ හැර තිබෙනවා. අහිංසක මිනිසකු රා බෝතල යක් පෙරුවාම "fප්ලයින් ස්කොඩ්" හෙවත් කඩා ගෙන පනින කණ්ඩායම ගිහින් ඒ මිනිසාව අල්ල ගන්නවා. සමහර විට ඔහු ළඟ රා නොතිබෙන්නත් පුළුවනි. ගම්මුලාදැනියා තරහ වුණොත් රා නැති තැනත් රා මුට්ටි තබා අල්ලාගෙන යනවා. ගරු සභාපතිතුමනි, මේ වැඩ පැරණි හණ මිටි කාලයේ තිබුණු වැඩ බව පෙනෙනවා. අධිරාජ්‍යවාදී ප්‍රතිපත්ති අනුව කටයුතු කළ සුදු මහත්වරුන්ට අවශ්‍ය කරන මත්පැන් සහ සමාජශාලා ආරක්ෂා කරගැනීම සඳහා කරන ලද වැඩයි මේ. අපේ මිනිසුන්ව යට පත් කොට තබාගෙන කරගෙන ගිය වැඩයි මේ. හැමෝටම එකම විධියේ ප්‍රතිපත්ති යක් ක්‍රියාවේ යොදවන්න ඕනෑ. ඒ අනුව එක්කෝ එවැනි වැඩවලට ඉඩ දෙමු; එසේ නැති නම් ඉඩ නොදෙමු. මොකක් හරි එක ප්‍රතිපත්තියක් තියෙන්න ඕනෑ. මේ විධියට සක්ක ගහලා, අණ්ඩ දමලා, පැලැස්තර දමලා වැඩ කරන්න ලැබෙන්නෙ නැහැ. එක්කෝ සුරා ඇති කරමු. එසේ නැති නම් සුරා නැති කරමු. දෙකෙන් එකක් කරන්න ඕනෑ.

කර්මාන්ත අංශය ගැන කථා කරන්න තියෙනවා. මේ ඇමතිතුමාගේ අංශයට වැඩ කටයුතු හත අටක් භාර වී තිබීම ගැන කල්පනා කර බලන විට ඒ සියල්ලකම වැඩ කටයුතු මෙසේ කරගෙන යාම ගැන ගරු ඇමතිතුමාට අප ස්තුති කරන්න ඕනෑ. නමුත් කර්මාන්ත අංශය ගැන කියන්න තියෙන්නෙ එම අංශයේ තත්ත්වය බොහොම කනගාටුදායක බවයි. අපේ ප්‍රදේශවලට ලුණු නැහැ. වටේටම මුහුදක් ඇති රටක වැසියන් හැටියට අපට ලුණු නැතෙයි කියන්ට සිදු වීම ගැන මට ලජ්ජා හිතෙනවා. කර්මාන්ත අංශයේ තිබෙන දක්ෂතාව ඒ අනුව පෙනී යනවා. ගරු සභාපතිතුමනි, මා ගරු ඇමතිතුමාට පෙන්වා තිබෙනවා මගේ කොට්ඨාශයේ ඇති ඉතා වටිනා පුදුමාකාර ගරුඬ ගලක්. එම ගරුඬ ගලින් හොඳ කම්මන්ත කරන්න පුළුවනි. ඒ ගල වැඩෙන ස්වභාවයක් පෙන්වන ගලක්. එක් අවුරුද්දක එම ගලින් යම් ප්‍රමාණයක් කඩා දැමුවොත් අනික් අවුරුද්ද වන විට ඒ කඩා දැමූ ප්‍රමාණය සම්පූර්ණයෙන්ම වාගේ වැඩිලා. ඒ ගල ගැන පරීක්ෂා කරන්නය කියා ගරු ඇමතිතුමා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට නියෝග කර දැනට මාස 6 ක් පමණ වන නමුත් තවම ඒ සම්බන්ධයෙන් මට ලියුම් කැල්ලක්වත් ලබාගන්න බැරි වුණා. මේ විධියට කර්මාන්ත දියුණු කරන්න පුළුවන්ද? මේ නිලධාරීන් අතර අපේ රටට ආදරය දක්වන අය ඉන්න ඕනෑ. මේ ගලින් අපේ රටට කර්මාන්තයක් බිහි කර දීම ලොකු යුතුකමක් හැටියට මා සලකනවා. අවංක හැඟීමකින් වැඩ කරන අය සිටිනවා නම් උපාධිධාරීන් නැති වුණාට කමක් නැහැ. එවැනි අයයි මේ විධියේ තැන්වල සිටිය යුත්තේ.

රෙදි වියන මධ්‍යස්ථාන ගැන කියන්න ඕනෑ. ටික වේලාවක් ගත වුණත් ඒ ගැන කියන්න ඕනෑ. අපේ රෙදි වියන මධ්‍යස්ථාන එන්න එන්නම නැති වේගනයි යන්නෙ. කොළඹට එම රෙදි තොග ගණනින් එවනවා, නමුත් මුදල් හම්බ වන්නේ නැහැ. රෙදි වියන ළමයින්ට මුහුණ පාන්න සිදු වී ඇති තත්ත්වය ගැන කියන්න කැමතියි. ඒ අය සරොම් සියයක් නිෂ්පාදනය කළොත් ඒවායින් සරොම් හතරයි හොඳ සරොම් හැටියට සලකන්නෙ. අනූ හයක්ම හොඳ නැහැ. ඒ අනූ හයට සල්ලි නැහැ. මසකට රුපියල් දෙකක් විතර හම්බ කරගෙන කොහොමද ඔවුන් ජීවත් වන්නෙ? එම කර්මාන්තය කරන අයට ඒ මගින් ආදායමක් ලබාගන්න පුළුවන්කමක් නැති නම් මොකද වෙන්නෙ? මේ හේතුව නිසා අද දවසේ රෙදි වියන මධ්‍යස්ථාන වහන්නයි සිදු වී තිබෙන්නෙ. සරොම් හතරයි හොඳ බවට තෝරන්නෙ. ඉතිරි අනූ හයම අයින් කරනවා. මා අහන්නෙ ඒ සරොම් අනූ හයට සිදු වන්නේ කුමක්ද කියායි. ඒවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. බී. එම් හේරත් මයා.]

ගන්නේ කවුද? යවන්නේ කොහාටද? හොර කඩයට යවනවාද? ඒ සරොම් යම් යම් අය අතට යන බවයි රටේ රාවය අනුව මට නම් කියන්න තියෙන්නෙ. එම නිසා ඒ ගැන විශෙෂයෙන් සොයා බලන ලෙස මා ඉල්ලා සිටිනවා.

උගත්කමක් තිබෙන යම් ළමයෙක් රෙදි කර්මාන්තයේ යෙදෙනවාය කියා සිතමු. අවුරුදු හතරක් පහක් රෙදි කර්මාන්තය ඉගෙනගෙන අවසාන වුණාට පසු ඒ ළමයාට එම දැනුම උඩ ගුරු වෘත්තියක් ලබා ගන්ට අවස්ථාව සලසන්න ඕනෑ. නමුත් අද එසේ කර නැහැ. ඒ විධියට එක පැත්තකින් දියුණුවට යන්න හැටියකුත් නැහැ. අනික් පැත්තෙන් වෙහෙසට සරිලන ආදායමක් ලබාගන්න මාර්ගයකුත් නැහැ. තත්ත්වය එසේ නම්, කිසිවෙක් මේ කර්මාන්තයෙහි රැඳී සිටියිද? කවුරුත් මේ කර්මාන්තයේ යෙදෙන්නෙ නැහැ. එම නිසා මෙම රෙදි විවීමේ මධ්‍යස්ථානවල දැනට කෙරෙන කටයුතු ගැන විධිමත් පරීක්ෂණයක් කිරීමට අවධානය යොමු කරන ලෙස මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් විශෙෂයෙන් ඉල්ලා සිටිනවා. හොරාගේ අම්මාගෙන් පේන අහනවා වාගේ මේ පරීක්ෂණය කිරීමට ඒ අයටම භාර කිරීමේ තේරුමක් නැහැ. මා කලින් කීවා වාගේ මේ රටට ආදරයක් ඇතිව, තමන්ගේ හිතට එකඟව කටයුතු කරන පුද්ගලයන් යොදා ගත්තොත් පමණයි, මේ කටයුත්ත සාර්ථක අන්දමින් කර ගත හැකි වන්නෙ.

ගරු සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන සමිතිවලින් විශාල සේවයක් ගමට සිදු වුණු බව මේ අවස්ථාවේදී මතක් කරන්න සතුටුයි. නමුත් ඒ සමිතිවලින් කෙරෙන වැඩ කටයුතු සඳහා ප්‍රමාණවත් මුදලක් රජයෙන් නොලැබීම කනගාටුවට කාරණයක්. එපමණක් නොවෙයි, තවත් පුදුම නීති වගයක් පනවා තිබෙනවා. ගම්සභා කොමිටිවලට අයිති පාරක් හදන්න නීතියෙන් ඉඩක් නැතිලු ග්‍රාම සංවර්ධන සමිතිවලට. ගම්සභා කොමිටිවලට අයිති වුණත් වෙන කාට අයිති වුණත් මහජනයා ගමන් කිරීම පිණිස මේවා ප්‍රයෝජනයට ගන්නවා නම්, ආණ්ඩුවෙනුත් ආධාර මුදලක් ලැබෙනවා නම්, මේ අන්දමේ නීති පැනවීම කිසිසේත් සාධාරණ නැහැ. ගම්සභා කොමිටියට අයිති වුණත් එවා හැදීමට ඉඩ දෙන්න ඕනෑ. අද අපේ ගම්බද පළාත්වල, විශෙෂයෙන් අපේ කොට්ඨාශවල පවතින තත්ත්වය ගැනයි, මා මෙතෙක් කරුණු පැහැදිලි කළේ. කැනේඩියන් ආධාර මුදලෙන් හෝ වේවා, ග්‍රාම සංවර්ධන අරමුදලින් හෝ වේවා, මේ පළාත්වල ගම්සභා කොමිටියට අයත් පාරක් තැනීමට අවසරයක් නැහැ. මේවා මොන විධියෙන් හදා ගත් නීතිද කියා මට නම් තේරෙන්නෙ නැහැ. මගේ කල්පනාවේ හැටියට මේවා ගම්බද පළාත්වල දියුණුවට බාධා ඇතිවන විධියට හදා ගත් නීතිය කියන්නට පුළුවනි. නමුත් ගම්බද ජනතාව අද වැටී සිටින දුගී තත්ත්වයෙන් නගා සිටුවීමට රජය මෙන්ම සෑම ආයතනයක්ම මහන්සි ගන්න ඕනෑ; සහාය දෙන්නට ඕනෑ. මෙන්න මේ කාරණා ගැන ඇමතිතුමාගේ විශෙෂ සැලකිල්ල යොමු කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

අ. භා. 6.15

ග්‍රාම සංවර්ධනය සඳහා වැඩි පුර මුදලක් වැය කළ යුත්තේ අපේ පළාත් වැනි නොදියුණු පළාත්වලට බව මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. මේ කාරණය ගැන විශෙෂයෙන් ඔබතුමාගේ සැලකිල්ල යොමු වෙන්න ඕනෑ. මෙයට වඩා දීර්ඝ ලෙස කථා කිරීමට මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. තවත් එක් කාරණයක් ගැන තමුන්නාන්සේගේ සැලකිල්ල යොමු කරන්න කැමතියි. අපේ ප්‍රදේශවල දියුණු කළ හැකි කර්මාන්ත ඕනෑ තරම් තිබෙනවා. අපේ ගරු ඇමතිතුමා කීවා වාගේ හුණු ගල්, නොයෙක් වටිනා පස් වර්ග, වටිනා ගල් වර්ග ඕනෑ තරම් තිබෙනවා. එයින් මහජනතාවට ප්‍රයෝජනවත් විය හැකි කර්මාන්ත ගම්බද ප්‍රදේශවල දියුණු කරන්න පුළුවනි. පන් වර්ගවලින් පැදුරු විවීම ආදි නොයෙකුත් කර්මාන්ත ඇති කරන්න පුළුවනි. මේ සමගම කියන්නට කැමතියි, අපේ පළාත්වල ඉන්නා විශාල වශයෙන් වැවෙන එඬරු ගස්වලින් තෙල් නිපදවීමට වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් විශාල මුදලක් මේ රටේ ඉතිරි කර ගන්න පුළුවනි. අද එඬරු තෙල් සඳහා විශාල මුදලක් පිට රට ඇදී යන බව අප දන්නවා. එහෙත් යන්ත්‍ර සූත්‍ර සපයා දෙන්න පුළුවන් නම් මෙරටට වුවමනා කර එඬරු තෙල් ප්‍රමාණය මේ රටේම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිපදවා ගැනීමට ශක්තියක් තිබෙනවා. මේ වාගේ සුළු කර්මාන්ත ගම්බද ඕනෑ තරම් ඇති කරන්නට පුළුවන්.

ගරු සභාපතිතුමනි, සමහර උදවිය අහන්න පුළුවන්, රුපියල් තුන් හාර සිය යක්, එසේ නැත්නම් හාර පන් දහසක් මෙරටේ නතර කර ගැනීමෙන් මේ රට සංවර්ධනය කරන්න පුළුවන්ද කියා. නමුත් අපි උත්සාහ කළ යුත්තේ මෙරටින් ඇදී යන සෑම සතයක්ම මේ රටේ නතර කර ගැනීමටයි. එසේ කිරීමට නම් ගම්බද කර්මාන්තවලට සම්පූර්ණ ආධාර, අනුබල දෙන්න ඕනෑ. ඒ වාගේම මේ මාර්ගයෙන් ගම්බද ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට පුළුවන් වෙනවා. එම නිසා මා සඳහන් කළ කාරණා සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ සැලකිල්ල මේ අවස්ථාවේදී යොමු කරනවා. අවසාන වශයෙන් මා නැවත වරක් මේ රටේ චිත්‍රපටි නිපදවීමට පුළුවන් නම් චිත්‍රපටි නිපදවීමට පිට රට වලට යන්නේ මොන කාරණයක් නිසාදැයි සොයා බලා එයට නිසි ප්‍රතිකර්මයක් නොපමාව යොදන ලෙස ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

ගරු සභාපතිතුමනි, මගේ කථාවට වැඩි වේලාවක් ගත කිරීමට මම අදහස් කරන්නෙ නැහැ.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Order, please! At this stage may I remind hon. Members that there are six more Ministries to go through and only two days more? The Hon. Minister hopes to reply by 7.15 P.M. today. Unless hon. Members curtail their speeches I do not think we can finish by that time.

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

If hon. Members desist from making election speeches we can finish early.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

There are about 15 hon. Members who wish to speak.

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

Those who have missed the bus during the Budget Debate are trying to make election speeches now.

ගරු සභාපතිතුමනි, විශෙෂයෙන්ම අපේ ගරු ඇමතිතුමාගේ භාරකාරත්වය යටතේ තිබෙන සංස්කෘතික දෙපාර්තමේන්තුව පසු ගිය කාල සීමාව තුලදී ඉතා වටිනා සංස්කෘතික සම්බන්ධකම් ඇති කර ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කර තිබුණා. එපමණක් නොවෙයි, කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීවරයා (යූ. පී. වයි. ජීනදාස මයා.) කිවා වාගේ, මහියංගනයේ කොත් වහන්සේ භාර දී තිබෙන්නේ යූ. එන්. පී. පක්ෂයට පමණක් බව පෙනී යනවා. මෙවර යූ. එන්. පී. තරුණ සමිතිය මැයි දින රැළිය පැවැත්වූයේ මහියංගනයේදීයි. මහියංගන කොත්වහන්සේ අලුත් නගර සභා ශාලාවේ ප්‍රදර්ශනය කරන දවසේ එතැන කොත් වහන්සේ බලා වැද පුදා ගෙන ඉන් පසුව දැදිගම මහා නායක සවාමීන් වහන්සේ බැහැ දැකීමට වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. කෙසේ හෝ වේවා, තමුන්නාන්සේගේ සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් නව චීනය සමග සවලප තරමින්වත් සංස්කෘතික සම්බන්ධකමක් ඇතිකර ගන්නට ගිය අවස්ථාවේදී එයට විරුද්ධව "සියරට" පත්‍රය මගින් විශාල උද්ඝෝෂණයක් ගෙන ගියා. ආගම එක්සත් ජාතික පක්ෂයට පමණක් පොදු වස්තුවක් කරගෙන සිටි නිසා ඒ අය ඒ අවස්ථාවේ දී භය වුණා. නමුත් ආගම ඒ අයට පමණක් නොවෙයි භාර වී තිබෙන්නේ. කෙසේ හෝ වේවා, නව චීනයත් අපත් අතර තිබෙන සංස්කෘතික හා ආගමික සම්බන්ධකම් වැඩි කර ගනිමින් නව චීනයේ ආධාර ඇතිව ඒ සර්වඥ ධාතූන් වහන්සේ ලංකාවේ සැදැහැවත් බෞද්ධ ජනතාවට පෙන්වීම ගැන මම අපේ අවංක ස්තුතියත්, කෘතඥතාවයත් තමුන්නාන්සේ වෙත පුදා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්වැන්ලි තිලකරත්න මයා.]

නමුත් මෙහි පොඩි ඇබැද්දියක් සිදු වී තිබෙනවා. සර්වඥ ධාතූන්වහන්සේ ලංකාවට වැඩමවා ගෙන ඒම සඳහා චීනය බලාගිය අපේ කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් හපුතලේ මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා.) පිකිං නගරයට ගියේ මඟදී බාගවෙලාවට නිප්පොළවල් දෙකක් තුනක් සොයා ගෙන වෙන්නට ඇති. ඒ මහත්මයා බලාපොරොත්තු වෙන්න ඇති නව චීනයේ හොංකොං, සිංගප්පූරු නයිට් ක්ලබ් වැනි නොයෙක් විනෝද විදිය හැකි සථාන තිබේය කියා. ඒ නිසා තමයි, ලංකාවට ඇවිත් වගකීම් රහිතව ඒ පාර්ලිමේන්තු ලේකම්තුමා හපුතලේදී පැවැත් වූ රැස්වීම කදී අසත්‍ය ප්‍රචාරයක් කර තිබෙන්නේ. ඒ ගරු මන්ත්‍රීතුමා සංස්කෘතික කටයුතු පිළිබඳවත් පාර්ලිමේන්තු ලේකම් ධුරය උසුලනවා. එතුමා නව චීනයට ගොස් නව චීන ආණ්ඩුවේ ආගන්තුක සත්කාර සියල්ලක්ම විඳ ලංකාවට අවුත් ඇමරිකන් ගමනක් බලාපොරොත්තු වෙන් හපුතලේදී කළ ඒ කථාව ගැන මම මගේ සම්පූර්ණ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. නව චීනයට පළමුවෙන් ගියා, දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා. (ආර්. ජී. සේනානායක මයා.). ඊට පසුව, මේ ළඟදී සෞඛ්‍ය ඇමතිතුමා ගියා. යූ. එන්. පී. එකේ අයත් ගිහින් තිබෙනවා. එපමණක් නොවෙයි, අද උදේ දෙස්තර මැඩොන්සාත් ප්‍රකාශයක් කර තිබෙනවා. මේ පාර්ලිමේන්තු ලේකම්තුමාගේ කථාව වැනි කැත ප්‍රකාශයන් කිරීම ගැන අපි අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරන අතර, ඒ පාර්ලිමේන්තු ලේකම්තුමා හොංකොං, හවායි, හොනලුලු ආදී රටවල ඇති හොල්මන් නව චීනයේ නොතිබීමෙන් ටිකක් අමනාප වීම ගැන අපි පුදුම වන්නේ නැහැ.

අපේ මේ කර්මාන්ත ඇමතිතුමාට සිද්ධ වී තිබෙනවා, ගම්බද පේෂකම් මධ්‍යසථාන ආරක්ෂා කිරීමට. ඒ පිළිබඳව—ලංකාවේ පේෂ කර්මාන්තය යාන්ත්‍රික වශයෙන් හෝ වේවා දියුණු කිරීමට—අවශ්‍ය පියවර කීපයක් ගෙන තිබෙනවා. ගිය වර්ෂයේ අය වැය ලේඛන විවාදයේදී මම පැහැදිලි කළා, අපේ බවලත් උදවිය අදින ඇඳුම් පිළිබඳව පරීක්ෂණයක් කරන්න යයි කියා. දීර්ඝ පරීක්ෂණයක් නොවෙයි. මන්ද? අද ලංකාවට ගෙන්වනවා, කැෂ්මියර් සාරි, මනිපුරි සාරි ආදිය. ඒවා ගෙන්වීම නැවැත්වීමට ඇමතිතුමා වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. ඒ වාගේම කොටින් සාරිත් ගෙන්වනවා. කොටින් සාරි තව ටික කලක්, ලංකාවේ යාන්ත්‍රික පේෂකර්මය දියුණු කරන තෙක්, අනික් ප්‍රදේශවලත් ඇති කරන්න යන පේෂ කාර්මික කර්මාන්ත ශාලා විවෘත කරන තෙක්, ගෙන්වීමට ඉඩ දිය යුතුයි. ගත වූ කාල සීමාව තුළ දී මොරටුව ආදී ප්‍රදේශවල—බාගවෙලාවට යූ. එන්. පී. එකෙන් වෙන්න පුළුවනි, එය අපේ ප්‍රශ්නයක් නොවෙයි—ලංකාවේ මිනිසුන්ට අවශ්‍ය විධියේ ෂර්ට් නිෂ්පාදනය කිරීමට කර්මාන්තශාලාවක් පටන් ගෙන තිබෙනවා. සමහර විට මැතිවරණ කාලයේ දී ඒවායේ නිෂ්පාදනය කරන්නේ කොළ පාට බුෂ් කෝට් වෙන්න පුළුවනි. රස්කින් ප්‍රනාන්දු මහත්මයාගේ වේලෝනා ආදි තැන් තිබෙනවා. කාගේ හෝ වේවා කමක් නැහැ. තමුන්නාන්සේට යුතු කමක් තියෙනවා මේ කර්මාන්ත ශාලා ආරක්ෂා කර ලංකාවේ තවත් මෙවැනි කර්මාන්ත ශාලා ඇති කිරීමට. අද පිට රටින් ලංකාවට එනවා මැන් හැටන්, වැන් හුසේන්, ඇරෝ ආදි ෂර්ට්ස් ගෙන්වීම සම්පූර්ණයෙන්ම නැවැත්වීම අවශ්‍යයි. අපේ ලංකාවේ ඩිප්ලෝමැට්, ඩයා ආදි ෂර්ට්ස් හදනවා. ඒවා ඉතා හොඳයි, අපට අඳින්න පුළුවන්. එම නිසා පිට රටින් ෂර්ට්ස් ගෙන්වීම නැවැත්වීම ඉතා අවශ්‍ය දෙයක්.

සභාපතිතුමනි, ලංකාවේ සපත්තු කර්මාන්තයත් කෙරෙනවා. ලංකාවේ බාටා තිබෙනවා, සින්වා තියෙනවා, තවත් සපත්තු කර්මාන්ත ශාලා තියෙනවා. ඒ සපත්තු කර්මාන්ත ශාලා ආරක්ෂා කිරීමට පිට රටින් අපේ රටට සපත්තු ගෙන්වීම සම්පූර්ණයෙන් තහනම් කරන්න ඕනෑ. විශෙෂයෙන් රත්මලාන, මොරටුව ආදි ප්‍රදේශවල මෙවැනි කර්මාන්ත ශාලා කීපයක් තියෙනවා. අපේ ප්‍රදේශවල කම්කරු තරුණ තරුණියෝ මේ සථාන වලට රක්ෂාවට යනවා. එම නිසා මේ කර්මාන්ත ආරක්ෂා කිරීම ඉතා මත් අවශ්‍ය දෙයක්. ලඟදී සින්වා ආදී සපත්තුවල සැම්පල් අපට එවා තිබුණා. හැබැයි, දෙකක් එව්වොත් වෙන කෙනකුට එකක් දේය කියා එකයි එවා තිබුණේ. මේ කර්මාන්ත පිළිබඳව නියම පරීක්ෂණයක් ඇති කර ඒ සඳහා තවත් අමාත්‍යාංශයකින් ආධාර අවශ්‍ය නම් ඒ ආධාරත් ලබාගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම කර්මාන්ත දියුණුවට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා. මේ කර්මාන්ත ශාලා කවුරු පටන් ගත්තත් අපට කමක් නැහැ. ලංකාවේ බ්‍රෙසියර්ස් හැදීම ගැන වැලිගම ගරු මන්ත්‍රීතුමා (මොන්වේගු ජයවික්‍රම මයා.) විරුද්ධ වුණා අපට මතකයි. ලංකාවේ කොපුවෙ දැම්මත් එකයි, පිට රට කොපුවෙ දැම්මත් එකයි. එහි වරදක් නැහැ. ලංකාවේ කොපුවෙ දැම්මාම ඇත්ත වශයෙන්ම ලාංකික ස්වරූපයක් ඇති වෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ සහෝදරයෙක් ඒ බ්‍රෙසියර්ස් නිෂ්පාදනය කරනවාය කියා වැලිගම ගරු මන්ත්‍රීතුමා චෝදනා කළා. ඒ වේලාවේ අප කීවා, කවුරු කළත් කමක් නැහැ, ලංකාවේ හදන්න පුළුවන් නම් ඊට සම්පූර්ණයෙන්ම ආධාර දිය යුතුයි කියා. මෙවැනි කර්මාන්තවලට තමුන්නාන්සේගේ අංශයෙන් සම්පූර්ණයෙන්ම ආධාර දිය යුතුයි.

ගරු සභාපතිතුමනි, චිත්‍ර කලා ගුරුවරුන් පිළිබඳව ගරු මන්ත්‍රීවරු කීප දෙනෙක්ම කථා කළා. තමුන්නාන්සේගේ කලායතනයෙන් යම්කිසි කලා පුහුණුවක් ලබා ගුරුවරුන් රාශියක් සමර්ථ වී ඉන්නවා නම් ඔවුන්ට පාඨශාලාවල කලා ගුරුවරුන් වශයෙන් පත්වීම් දීමට වැඩ කටයුතු සලස්වන්න ඕනෑ. අද කලා ගුරුවරුන්ට ලැබෙන පඩිය සාමාන්‍ය ජ්‍යෙෂ්ඨ විභාගයෙන් පමණක් සමත් වී සිටින ගුරුවරුන්ට ලැබෙන පඩියට වඩා වැඩියි. නමුත් තමුන්නාන්සේගේ අමාත්‍යාංශයත් අධ්‍යාපන අමාත්‍යාංශයත් අතර ඇති සම්බන්ධත්වයේ අඩුකම නිසා කලා ගුරුවරුන්ට අද ස්ථානයක් නැහැ. ස්කූල් ඔෆ් fපයින් ආට්ස් හෙවත් සියුම් කලා පිළිබඳ ආයතනය ගැන කල්පනා කර බලමු. ගම්බද දුප්පත් තරුණ තරුණියන් බොහොම අමාරුවෙන් දුර පළාත්වල සිට ඇවිත් එතැනින් පුහුණුවක් ලබා ගන්නවා. නමුත් නැටුම් ගුරුවරුන් වශයෙන් හෝ සංගීත ගුරුවරුන් වශයෙන් හෝ චිත්‍ර කර්ම ගුරුවරුන් වශයෙන් හෝ පුහුණුව ලබා ගත් පසු ඔවුන්ට පාඨශාලාවල පත්වීම් ලබා ගන්න පුළුවන්කමක් නැහැ. ඔවුන්ට කුමක්ද සිදු වන්නේ? මේ වර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සමිතුන් ලියා පදිංචි කිරීමේ ක්‍රමය උඩ තමයි, ඔවුන්ටත් පාඨශාලාවල ගුරු පත්වීම් ලැබී තිබෙන්නේ. එම නිසා මේ පිළිබඳව ගරු ඇමතිතුමා වහාම ක්‍රියා කරන්න ඕනෑ. යම් කිසි බලාපොරොත්තුවක් ඇතිව ඉගෙන ගන්න මේ අය තුළ උද්‍යෝගයක් ඇති කිරීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර වැඩ පිළිවෙළක් යෙදීම ඉතාම අවශ්‍යයි.

ගරු සභාපතිතුමනි, චීනයෙන් ලැබෙන ආධාර පිළිබඳවත් වචනයක් කියන්න ඕනෑ. චීන ආණ්ඩුවෙන් අවුරුදු පතා දෙන රුපියල් ලක්ෂ 150ක ආධාර මුදල හරියා කාර යොදවා නැතැයි ළඟදී පත්‍රවල වාර්තා වී තිබුණා. තමුන්නාන්සේ මීට අවුරුදු 1 1/2කට පෙර චීනයේ සිටියා. තමුන්නාන්සේ වෙන අමාත්‍යාංශයක් භාරව සිටින විට කර්මාන්ත අමාත්‍යාංශය භාරව සිටි විලියම් සිල්වා මහතා ඒ කාලයේ නව චීනයත් සමග සම්මුතියක් ඇති කර ගත්තා, පේෂ කර්මාන්ත ශාලා තුනක් ලංකාවේ හරිගැස්වීමට. නමුත් නව චීනයෙන් ලැබෙන මේ ආධාර අපි හරි හැටි ප්‍රයෝජනයට යොදා නැහැ. චීනයේ ආධාර ඇතිව එක කර්මාන්ත ශාලාවක් පටන් ගන්න යනවාය කියා අපට ආරංචියි. නමුත් ඒ චීනයෙන් අපට ලැබෙන ආධාර නිසියාකාර ලබාගෙන කර්මාන්ත ශාලා කීපයක් පිහිටුවන්න පුළුවන්. විශෙෂයෙන්ම කර්මාන්ත සඳහා පිට රටින් ලැබෙන ආධාර නිසි පිළිවෙළට පාවිච්චි කර නැහැ. එපමණක් නොවෙයි, අද තමුන්නාන්සේ ඉදිරියේ ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තියෙනවා.

අ. භා. 6.30

සුරාව පිළිබඳව වැරදි පරිශුද්ධ භාවයක් ඇති කරන්ට බැහැ. You cannot develop false standards of value in these matters—and false laws. වැරදි පරිශුද්ධ භාවයක් ඇති කළොත් ඒ මගින් මුළු ලංකාවම ඉතා අඳුරු යුගයකට පා තබනවා ඇති. මා නියෝජනය කරන කෝට්ටේ ප්‍රදේශය කසිප්පු වලට බොහොම ප්‍රසිද්ධයි. එහෙත් ගරු මන්ත්‍රීන් පරිශුද්ධ භාවය ගැන කථා කරන විට එසේ කරන්නේ දිව එක් පැත්තකට හරවාගෙන බව කියන්ට ඕනෑ.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි තිලකරත්න මයා.]

කොළඹ තැබෑරුම් වසා දමන විට දවසේ වැඩ අවසන් කර ගෙවල් බලා යන අය හයි ලෙවල් පාරේ තිබෙන කසිප්පු තිප් පොළට ගිහිල්ලා කසිප්පු බී ගෙදර යන්න පුරුදු වෙනවා. කොළඹ තැබෑරුම් වහන්න වහන්න වැලිකඩ, රාජගිරිය, බත්තලමුල්ල, ජාඇළ, කඳාන ආදි තැන්වල කසිප්පු පෙරන තැන් සහ විකුණන තැන් වැඩි වැඩියෙන් විවෘත වෙන්ට පටන් ගන්නවා. ඒ අය වැඩ නවත්වන්නෙ නැහැ. හැම තැනම කසිප්පු ව්‍යාපාරය තදින් බෝ වෙනවා. ලංකාවේ සුරාසැල් වසා දමා ඒ මගින් මේ රටේ මිනිසුන් මත්පැන් බොන ස්ථාන අඩු කිරීමෙන් ඔවුන් බොන ප්‍රමාණය අඩු වේය කියා සමහර අය හිතනවා. එවැනි මෝඩ අදහස්වලට මා නම් කොහෙත්ම එකඟ වන්නේ නැහැ. ගැහැණුත් දැන් කොකාකෝලා බොනවාලු. බොන්න කියනවා නම් ඩිස්ප්‍රින් දලා බොන්න දෙන වාලු. එතකොට ඕනෑ තරම් වැනෙන්ට පුළුවන්ලු. ඒ නිසා මත්පැන් සම්බන්ධයෙන් වැරදි ප්‍රතිපත්ති අනුගමනය කළොත් මොකද වෙන්නෙ?

සමහර ගරු මන්ත්‍රීන් කීවා, මේ රටේ මත්පැන් බොන්න ඕනෑ අයට ඕනෑ තරම් බොන්න ඉඩ දෙන්න කියා. අද රටේ කසිප්පු හැර වෙන මොනම බීම වර්ගයක්වත් බොන්න කැමැත්තක් නැති මනුෂ්‍ය පිරිසක් ඇති වී තිබෙනවා. එක් දේශපාලන පක්ෂයකට පමණක් බාර වී තිබෙන දෙයක් නොවෙයි, බීම. හැම පක්ෂයේම අය බොනවා. එක්සත් ජාතික පක්ෂය නම් මැතිවරණ කාලයේදී කසිප්පු බෙදා හරින වාය කියනවා. යු. එන්. පී. අපේක්ෂකයින් වෙනුවෙන් වැඩ කරන අය පමණක් නොව අපට වැඩ කරන අයත් කසිප්පු බොනවා. සමහර උදවිය වේදිකාවට නැඟලා ඉන්න කොට ගද ගහනවා. බැලුවාම කසිප්පු ගහලා ඉන්න බව දැනගන්න ලැබෙනවා. ඒක ඔය තරම් ලේසියෙන් වෙනස් කරන්න පුළුවන් දෙයක් නොවෙයි.

ළඟදී බෞද්ධ සම්මේලනය ඉදිරියට කසිප්පු රජ කෙනෙක් ගිහිල්ල කිව්වලු ලංකාවේ කසිප්පු මුල් බැස ගන්නවා ඇත කියා. ස්ථිරවම ලංකාවේ කසිප්පු පවතිනවා ඇති කිව්වලු. "It will come to stay" කිව්වලු. බෞද්ධ සම්මේලනයට එවැනි තර්ජන තිබෙනවා නම්, කළු යුත්තේ කුමක්ද? වැරදි ප්‍රතිපත්ති උඩ මෙය සාර්ථක කරගන්න බැහැ. සුරා ප්‍රතිපත්තිය අමුතු ආකාරයකට ගරු ඇමතිතුමා සකස් නොකරනවා නම්, එතුමාගේ එම ක්‍රියාව හේතුකොටගෙන ලංකාවේ ජනගහනයෙන් වැදගත් කොටසක් කසිප්පු රකුසාට බිලි වීමේ අවස්ථාවක් ඇති වෙන්ට ඉඩ තිබෙනවා. බොන අයට බොන්න අවස්ථාව දෙන්න ඕනෑ. නමුත් බීම සම්බන්ධයෙන් යම්කිසි ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ.

සෝවියට් දේශයෙත් බීම තිබෙනවා. උඩුනුවර ගරු මන්ත්‍රීතුමා (ටී. බී. ජයසුන්දර මයා.) ළඟදී සෝවියට් දේශයට ගිහිල්ලා ආවා. එහි ඕනෑ තරම් බීම වර්ග තිබෙන බව එතුමා දකින්නත් ඇති. නමුත් ඒ සම්බන්ධයෙන් එහි ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් ගෙන යනවා. බීම සීමා කිරීමේ වැඩ පිළිවෙළක් එහි තිබෙනවා. ඕනෑම තැනකින් බීම ලබා ගන්න බැහැ. එහෙත් බීම ඕනෑ තරම් තියෙනවා. ඒ එක්කම චිත්‍රවලින්, නාට්‍යවලින්, බයිස්කෝප්වලින්, ප්‍රසිද්ධ රැස්වීම් මාර්ගයෙන්, ප්‍රසිද්ධියේම පරිශුද්ධ කිරීමේ ව්‍යාපාර ඇති කර බීම ක්‍රමානුකූලව අඩු කරන්න වැඩ කරගෙන යනවා. එහෙත් 1959 අවුරුද්දේදී පමණක් සෝවියට් රුසියාවේ ජනයා මත්පැන් ලීටර් ලක්ෂ 1,300 ක් පානය කරලා තිබෙනවා. රටේ මිනිසුන් බීමට බලවත් ගිජුකමක් දක්වනවා නම් ඒ අයට බොන්න ඉඩ දෙන්න ඕනෑ. බෞද්ධ සම්මේලනයද මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් වැරදි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් බෞද්ධ මහජනතාවට කරන්නේ විශාල වරදක් බව මා ප්‍රසිද්ධියේම කියන්න කැමතියි. බීම ලබා ගැනීමට නොයෙක් අපහසුකම් තිබීමේ ප්‍රතිඵලයක් වශයෙන් කසිප්පුවලට කෙතරම් දුරට මේ රටේ ජනයා ඇබ්බැහි වී තිබෙනවාද කිවහොත් රම්, විස්කි, බ්‍රැන්ඩි, ජින් ආදී කිසිම බීමක් ගැනීමෙන් ඒ අයට සූර් වෙන්නේ නැහැ. කසිප්පු ගැසුවොත් තමයි, හරියටම ජොහෝර් එක ලැබෙන්නෙ. ඒ නිසා තමුන්නාන්සේගේ වැදගත් කාර්ය භාරය වී තිබෙන්නේ දැනට ජීවත් වන තරුණයන් මෙන්ම නැගීගෙන එන් නාවූ බාල පරපුර ආරක්ෂා කිරීම නොවේද කියා මම අහනවා. I do not accept this false sense of morals. You must be honest in these matters. බොන්ට වුවමනා කරන මිනිසුන්ට බොන්ට ඉඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තබන්න. නුමුත් එය ක්‍රමක්‍රමයෙන් සීමා කරන්න. වැඩි වැඩියෙන් බිව්වොත් ශරීරයට වන හානි නොයෙක් ප්‍රචාර මඟින් රට පුරා පතුරුවා හරින්න.

විරුද්ධ පාර්ශ්වයේ ගරු නායකතුමා නම් සුරාව ළඟටවත් ගන්නේ නැහැ. නමුත් යූ. එන්. පිය 'රට ජාතිය බේරගන්න ඩඩ්ලිට රට භාර දෙන්න' කියා ප්‍රචාරයන් ගෙන ගියේ කසිප්පු උඩයි. එවැනි ප්‍රතිපත්ති අනුව වැඩ කරන්න බැහැ, ගරු සභාපතිතුමනි. පරිශුද්ධ භාවය පිළිබඳව අපි අනුගමනය කරන ප්‍රතිපත්තියේ යම්කිසි වැදගත් පදනමක් තියෙන්න ඕනෑ. එසේ නැතුව නොයෙක් විධියේ වර්ජන ව්‍යාපාර ඇරඹීම සම්පූර්ණයෙන්ම වැරදි බව මා කියන්ට ඕනෑ.

මේ රටේ බීර නිෂ්පාදනය කරන මධ්‍යස්ථානයක් නුවරඑළියේ තිබෙනවා. එය ආණ්ඩුවේ පාලනය යටතට ගන්ට ඕනෑ. ආණ්ඩුව යටතට ගෙන එහි තත්ත්වය උසස් කොට, අපේ කඩවල තිබෙන්නා වූ සිසිල් බීම වගී මෙන් වැඩි අමාරුවක් නැතුව මහජනයාට ලබාගන්න පුළුවන් වන පිළිවෙළට ඒවා විකුණන්ට ඕනෑ. අද දින නුවරඑළියේ පෙරන බීරවල තත්ත්වය කෙතරම් අසතුටුදායකද කිවහොත්, සමහර බීර බෝතලවල භූමිතෙල් රහද තිබෙන බව බීර බොන අය කියනවා මා අසා තියෙනවා. නුවරඑළියේ ගරු මන්ත්‍රීවරයා (විලියම් ප්‍රනාන්දු මයා.) කීවා, ලංකාවේ බීරවල තත්ත්වය දියුණු කර පිටරට යැවීමටත් වැඩ පිළිවෙළක් ඇති කරන්ටය කියා. කෙසේ හෝ වේවා ගරු ඇමතිතුමා අනුගමනය කරන ප්‍රතිපත්තිය අනාගතයේදී සාර්ථක වේය කියා මා හිතනවා. තමුන්නාන්සේ කියන්න සම්පූර්ණයෙන්ම අමද්‍යප ව්‍යාපාරය පිළිගන්නවා කියා. නුමුත් මෙය සම්පූර්ණයෙන් ක්‍රියාවේ යොදවන්න පුළුවන් වන්නේ පළමුවෙන් කසිප්පු ව්‍යාපාරය මැඩලීමට ශක්තිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාවේ යෙදුවහොත් පමණක් බව කියන්න. එසේ ප්‍රකාශ කොට මෙම ව්‍යාපාරයේ තිබෙන්නා වූ අඩුපාඩු පිරිමසා මෙය ශුද්ධ කිරීමට තමුන්නාන්සේ දැඩි වීර්යයකින් කටයුතු කරනවා නම් තමුන්නාන්සේට මහජනයාගේ සහයෝගය ලබාගන්ට පුළුවන් බව මා විශ්වාස කරනවා. මෙය අවුරුද්දක් දෙකක් ඇතුළතදී සාර්ථක කර ගන්ට පුළුවන් වැඩ පිළිවෙළක්, ක්‍රියා මාර්ගයක් නොවෙයි. සමහර විට අවුරුදු කීපයක් ගත වන්ට පුළුවන්. ඉතාම දියුණු සමාජ ක්‍රමයක් පවතින්නාවූ සෝවියට් දේශයේ පවා මෙවැනි වැඩ පිළිවෙළක් පටන් අරගෙන එක්තරා කාල සීමාවක් පසු වී ගියායින් පසුවයි, මහජනයා ඇබ්බැහි වී සිටි මෙම පුරුද්ද ක්‍රමක්‍රමයෙන් අඩු වී ගියේ. කසිප්පු බොන අයට රා බීමේ පහසුකම් රටපුරාම ඇති කරන්න. එත කොට කසිප්පු බීමට ඇබ්බැහි වී සිටින අය එයින් ගළවා ගන්න පුළුවන් වේවි.

ආණ්ඩුව සිටින්නාවූ තත්ත්වය දෙස බැලු විට පරිශුද්ධ භාවය මේ ආණ්ඩුවට රකින්න පුළුවන්ය කියා මා කල්පනා කරන්නේ නැහැ. ආණ්ඩුව අරක්කු ඉස්කාගාර අයිතිකාරයෙක්. එසේ නම් යම් යම් පුද්ගලයින් විසින් පවත්වාගෙන යනු ලබන ඉස්කාගාරද රජයට ගැනීම රජයේ බලවත් යුතුකමක්ව තිබෙනවා. මීගමුව, නාත්තන්ඩිය, හලාවත යනාදී පළාත්වල තිබෙන්නාවූ ඉස්කාගාර මඟින් වස විෂ මහජනයාට සැපයීම නතර කිරීමට කළ යුතුව තිබෙන එකම දෙය තමයි, මේවා සියල්ලම ආණ්ඩුවේ පාලනය යටතට ගැනීම. එසේ කරාවිය කියා මා අවංකවම බලාපොරොත්තු වෙනවා. මේ ප්‍රතිපත්ති ඇතිව හැංගි හොරා සෙල්ලම් කරන්න බැහැ. ප්‍රසිද්ධියේ සෙල්ලම් කරන්න ඕනෑ. දඹදෙණියේ ගරු මන්ත්‍රීවරයා (ආර්. ජී. සේනානායක මයා.) ගැන ගරු ඇමතිතුමා භය වන්න ඕනෑ නැහැ. එයා මොන ව්‍යාපාරය පටන් ගත්තත් ඒවා ඔක්කොම බංකොලොත් ව්‍යාපාරයි. ශාසන කොමිෂන් සභාවේ වාර්තාව ගැන තමුන්නාන්සේ ටිකක් පරිස්සමින් ක්‍රියා කරන්න ඕනෑ. යූ. එන්. පී. එකේ සිටින සංඝ නායක වන මාලේවන ඤාණීස්සර වැනි දලයිලාමාවරුන්ට මේකෙන් පහර ගසන්න ඕනෑ. නමුත් අධ්‍යාපනයක් ලබාගෙන පාඨශාලාවක උගන්වන භික්ෂූන් වහන්සේලා ඉවත් කිරීමෙන් තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය ආරක්ෂා වන්නෙත් නැහැ, මේ රටේ භික්ෂූන් වහන්සේලාට ආධාරයක් ලැබෙන්නේත් නැහැ. මේ ප්‍රතිපත්තිය වෙනස් කරන්න ඕනෑ. විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයකු වශයෙන් මට ඇති අත්දැකීම අනුව මේ බව කියන්න පුළුවනි. තව මාස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි තිලකරත්න මයා.]

ගණනක් යන්න පෙර බෞද්ධ ශාසනයටත් බෞද්ධ ජනතාවටත්, බෞද්ධ අධ්‍යාපනයටත් උත්කෘෂ්ඨ සේවයක් සලසාලිය හැකිව විශ්ව විද්‍යාලවලින් පිටවන භික්ෂූන් වහන්සේලා දොට්ට දැමීමයි, තමුන්නාන්සේලාගේ මෙම ප්‍රතිපත්තියෙන් සිදු වන්නේ. ඊට වඩා දෙයක් නැහැ. එහෙම නැත්නම්, "තමුන්නාන්සේලා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවයට ගන්නවා; ආණ්ඩුවේ සේවයට ගන්නවා; නමුත් තමුන්නාන්සේලාට අවශ්‍ය තරම් පඩි දී ඉතුරු හරිය බෞද්ධාගමේ වැඩ කටයුතු සඳහා තැන්පත් කරන්න ඕනෑ" කියා කියන්න.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

මේ කාරණය පැහැදිලි කරන්න සතුටුයි. ඒ තීරණය ගත්තේ එක එක ඡන්ද කොට්ඨාශයෙන් ජ්‍යෙෂ්ඨ සමතුන් 25 දෙනා බැගින් තෝරා පත් වීම් දෙන අවස්ථාවේදීයි. ශාසන කොමිෂන් සභාවේ නිර්දේශයක් අනුව ඒ අවස්ථාවේදී ඒ විධියේ තීරණයක් ගත්තා. පඩිනඩි නොදිය යුතුය යන නිර්දේශය අනුව ඒ විධියේ තීරණයක් ගත්තා. මහජනයාගෙන් කෙනකු පත් කළ හැකි නම් භික්ෂූන් වහන්සේ නමක් පත් නොකළ යුතුය යන අදහස ඇතිව ඒ අවස්ථාවේදී ඒ විධියේ තීරණයක් ගත්තා. ජ්‍යෙෂ්ඨ සමතුන් 25 දෙනා බැගින් තෝරා පත් වීම් දෙන්ට යන විට භික්ෂූන්ද ඉදිරිපත් වීමට ඉඩ තුබුණු නිසා ඒ විධියේ තීරණයක් ගත්තා මිස උපාධිධාරීන් ගැන ඒ විධියේ තීරණයක් ගත්තේ නැහැ.

ස්ටැන්ලි තිලකරත්න මයා.
(திரு. ஸ்டான்லி திலக்கரத்ன)
(Mr. Stanley Tillekeratne)

මා කීවේ උපාධිධාරීන් ගැනයි. වැරදි පිළිවෙළට සල්ලි හම්බ කරන පොට්ඨනිකාර යන් සඳහා නම් අර විධියට කටයුතු කළාට කමක් නැහැ. මිනිපේ ස්කීම් එකේ කොටසක් අයිති මහියංගනයේ විහාරය ආරක්ෂා කරන යූ. එන්. පී. එකේ මුදලාලි හාමුදුරුවරුන් සඳහා නම් ඒ විධියට කළාට කමක් නැහැ. සැදැහැවත් බෞද්ධයන් ඒ ගැන විරුද්ධ වන එකක් නැහැ. එහෙත් මේ ශාසන කොමිෂන් සභාවේ වාර්තාව ගැන පරිස්සමින් ක්‍රියා කරන්න ඕනෑ. උසස් අධ්‍යාපනයක් ලබා තමන්ගේ දුප්පත් නෑදෑයින්ට දෙමව්පියන්ට ආධාර කරන කිසියම් භික්ෂුවක් සිටිනවා නම්, පිරිවෙණේ ඉගෙන විශ්ව විද්‍යාලයට බැඳී උපාධියක් ලබා ගෙන පොඩි පහේ පඩියක් ලබමින් අම්මට තාත්තට සල්ලි යවා ඉතුරු හරිය තමන්ගේ උසස් අධ්‍යාපනයට යොදන භික්ෂුවක් සිටිනවා නම් ඒ භික්ෂුව සඳහාත් ඒ විධියේ ක්‍රියා මාර්ගයක් අනුගමනය කළොත් හොඳ නැහැ. ශාසන කොමිෂන් සභා වාර්තාව ටිකක් පිරිසිදු කර ප්‍රගතිශීලි අදහස් ඇති භික්ෂූන්ට පහර නොවදින සේ එය ක්‍රියාවේ යෙදවුවහොත් සමහරුන් කියන්නා සේ බාගදා ඔබ මෛත්‍රී බුදුන් වන්නත් පුළුවනි. කෙසේ හෝ වේවා, මේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඔබ ගත් සෘජු පියවර ගැන සන්තෝෂ වෙනවා. මේ වාර්තාව ටිකක් දුර ශුද්ධ නොකර ක්‍රියාවේ යෙදවුවහොත් ඔබටත් මේ ආණ්ඩුවටත් අපටත් ටිකක් අමාරු වෙනවා ඇති. ඇයි? අපත් ඔබේ සහයෝගකාරයින් නොවැ. එම නිසා අපටත් අමාරුකම්වලට මුහුණ පාන්න සිදු වෙනවා ඇති. "මොකද මහත්මයෝ ඇමතිතුමා මේ කරන්න යන්නේ?" කියා සමහර හාමුදුරුවරුන් අපෙන් ඇහුවා. එවිට මා කීවේ කෙසේ හෝ මේ තත්ත්වය වෙනස් කර දෙන්න උත්සාහ කරන බවයි. භික්ෂූන් වහන්සේලා මේ රටේ ප්‍රගතිශීලි ව්‍යාපාරයෙහි නියුක්ත වුණා. ඒ අන්දමට ප්‍රගතිශීලි ව්‍යාපාරයේ වැඩ කළ අයට පහර ගැසීම හොඳ නැහැ. සී.ටී.බී. කම්කරුවන්ගේ දේශපාලන අයිතිවාසිකම් නැති වුණා. ජාතික පාඨශාලා ක්‍රමය යටතේ රජයට ගන්නා ලද පාඨශාලාවල සේවය කරන ගුරුවරුන්ගේ දේශපාලන අයිතිවාසිකම් නැති කරන්න යනවා. ඒ අතර ප්‍රගතිශීලි භික්ෂූන් වහන්සේට පහර වදිනවා. මේ අන්දමට කටයුතු කරගෙන යෑම හරිද? බෞද්ධ ශාසනය පිරිසිදු කිරීම සඳහා භික්ෂූන් වහන්සේ විනයක් අනුව හැඩ ගැස්වීම සඳහා වැඩ කරනවා නම් අප විරුද්ධ වන්නේ නැහැ. නමුත් ඒවා ඉතා ප්‍රවේශමෙන් කළයුතු දේවල් හැටියට මම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මතක් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇක්සයිස් දෙපාර්තමේන්තුවේ නම් නොයෙකුත් අඩුපාඩුකම් තිබෙනවා. එහි ඇති ප්‍රතිපත්තිය ගැන කල්පනා කර බලන්න ඕනෑ. එම දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන් ප්‍රතිසංවිධානය කරන්න ඕනෑ. එසේ ප්‍රතිසංවිධානය කර මෙම දෙපාර්තමේන්තුව පොලීසියත් සමග සම්බන්ධ කර වැඩ කිරීමට සලස්වා ඇක්සයිස් දෙපාර්තමේන්තුව කියන එක සම්පූර්ණයෙන්ම ඉවත් කර දැමීමට වැඩ පිළිවෙළක් සකස් කිරීම ඉතාමත්ම වැදගත් බව සඳහන් කරන්න කැමතියි.

ග්‍රාම සේවක නිලධාරි ක්‍රමය ඇති කිරීම, අර මුල් බැසගෙන බින්න බැසගෙන තිබුණ ගම්මුලාදෑනි ක්‍රමයට වඩා හොඳ වුණත් එයින්ම ප්‍රශ්නය නිරාකරණය වුණා වන්නේ නැහැ. මෙයින් සම්පූර්ණ ප්‍රශ්නය විසඳුනේ නැහැ. මෙතෙක් කල් අපි කිව්වා, ලංකාවේ මධ්‍යම ආණ්ඩුව ජන සම්මත වුණාට ප්‍රාදේශීය පාලනය ජන සම්මත වී නැත කියා. එම නිසා ප්‍රාදේශීය පාලනය කෙරෙහි බලපාන කච්චේරි ක්‍රමය ඉවත් කරන්නේ නැතිව, අර පරණ කොලෝනියල් ආණ්ඩු ක්‍රම යටතේ තිබුණ ඩී.ආර්.ඕ. ක්‍රමය ඉවත් කරන්නේ නැතිව, ප්‍රාදේශීය පාලන ක්‍රමය ජන සම්මත ආණ්ඩුවක ප්‍රතිපත්ති පරිදි ක්‍රියාවේ යොදවන්න බැරි බව තමුන්නාන්සේලා පිළිගන්න ඕනෑ. මේ ප්‍රශ්නය විසඳීම පිණිස යම්කිසි පියවරක් ගන්න සූදානම් වූ අවස්ථාවේදී මෙය භාෂා ප්‍රශ්නයක්ය කියා බොහෝම ලොකු කාලගෝට්ටියක් කර ෆෙඩරල් කාරයින්ට අවස්ථාවක් දෙන්න යනවාය කියා, ලොකු උද්ඝෝෂණයක් පැන නැංගා. දිවංගත අගමැතිතුමා ඒ Regional Council ක්‍රමය ක්‍රියාවේ යොදන්නට ලැහැස්ති වන විට නොයෙක් නොයෙක් ජාති භේද වාදී කොටස් ඒ අවස්ථාවේදී නැගිට මෙය ලංකාවේ ෆෙඩරල් කාරයාට තැනක් දෙන්න යනවාය කියා ලංකාවට ඉතාමත්ම අවශ්‍යව තිබූ ඒ ජනසම්මත ප්‍රතිසංස්කරණය කරන්න ඉඩ දුන්නේ නැහැ. මෙය ඇති කිරීමෙන් ෆෙඩරල් කාරයින්ට ඉඩක් ලැබෙන්නේ නැති බව මම තමුන්නාන්සේලාට මතක් කරන්න කැමතියි. එම නිසා ප්‍රාදේශීය පාලනය පිළිබඳ ඉටුවිය යුතු ඒ යුතුකම ඉදිරි කාලයේදී මේ ආණ්ඩුව මඟින් ඉටුවිය යුතු බව මම මතක් කරනවා. ග්‍රාම සේවකයන් පමණක් පත් කිරීමෙන් නොහොත් ඩී.ආර්.ඕ. කාර්යාලයක් නැති මේ ප්‍රශ්නය විසඳුණාය කියා සිතන්න එපා. නමුත් එම ජන සම්මත පාලනය වෙත වැටී ඇති පාරේ ඉදිරි පියවරක් මෙම ග්‍රාම සේවකයන් පත් කිරීමෙන් ඉදිරියට තැබීම ගැන අපේ අවංක ස්තුතිය ඔබතුමාට පිරිනමන්න කැමතියි.

තවත් එක කරුණක් ගරු ඇමතිතුමාට මතක් කරන්න තිබෙනවා. මින් මත්තට සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් එක එක්කෙනාව පාර්සල් කර යවන විට ඊට සුදුසු අය බලා පාර්සල් කර යවන්න ඕනෑ. ආරියදාස මහතා—සංස්කෘතික උපඇමතිතුමා—යවන විට එතුමාව යවන්න තිබුණේ එතුමාට වුවමනා කරන රටවලටයි. ඇත්ත වශයෙන්ම මේ කරුණ ගැන සංස්කෘතික ඇමතිතුමාගේ යුතුකමක් තිබෙනවා, නව චීන තානාපති කාර්යාලයට කනගාටුව ප්‍රකාශ කර යැවීමට. එයා කියනවාලු, "මේ රටේ හරකියක් වුණ එක හොඳයි, ඒ රටේ මිනිහෙක් වුණ එකට වඩා" කියා. ඔව් මේ රටේ හරකියක් වුණ එක හොඳයි, ඒ වර්ගයේ පව්ටි හරක් ඉවතවා නම් කියා මම එතුමාට කියන්න කැමතියි. මීට වඩා දුරට මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු සියල්ලම සාර්ථක වේයයි කියා මම අවසාන වශයෙන් ප්‍රාර්ථනා කරනවා.

ඊ. විජේසූරිය මයා. (මස්කෙළිය)
(திரு. ஈ. விஜேசூரிய—மஸ்கெலிய)
(Mr. E. Wijesuriya—Maskeliya)

ගරු සභාපතිතුමනි, කාලවේලා බොහෝ ඉක්ම ගොස් තිබෙනවාය කියා තමුන්නාන්සේ දැන් ටිකකට කලින් මතක් කරන්න යෙදුණා. ඒ නිසා මගේ කොට්ඨාශයට අවශ්‍ය කරුණු දෙකක් ගැන පමණක් කියා මගේ කථාව සමාප්ත කරන්නයි මම අදහස් කරන්නේ. මස්කෙළිය කොට්ඨාශය ප්‍රමාණයෙන් ඉතාම විශාල ඡන්ද කොට්ඨාශයක් බව මම පළමුවෙන්ම තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ. ප්‍රමාණයෙන් විශාලවා පමණක් නොව උස් කඳුවලින් සහ හෙල්වලින් ගහණව පවතින කොට්ඨාශයක් බව තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ. ඒ විධියේ නොයෙක් දුෂ්කරතාවලින් පිරුණාවූ ඒ ප්‍රදේශයට අද වන තුරුත් ඩී.ආර්.ඕ. තුමෙක් හෝ ඩී.ආර්.ඕ. කාර්යාලයක් නැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. විජේසූරිය මයා.]

වීම ඉතාමත් කනගාටුවට කාරණයක්. ඒ ප්‍රදේශයේ ජීවත්වන දුප්පත් ජනයාට හාල් පොතක් මාරු කර ගැනීමට වුවමනා වූ අවස්ථාවකදී හෝ වේවා, අනාථ මුදලක් ලබා ගැනීමට වුවමනා වූ අවස්ථාවකදී හෝ වේවා, ඒ විධියේ තවත් නොයෙකුත් වෙනත් ඕනෑ එපාකම් ඇතිවුණ අවස්ථාවකදී හෝ වේවා ඒ කොට්ඨාශයේ සිටින අසරණ දුප්පත් උදවියට සිදුවන්නේ අරනාවලපිටියේ තිබෙන ඩී.ආර්.ඕ. කාර්යාලයට යෑමටයි. ඒක ඉතා අසාධාරණ දෙයක්. මා පළමුවෙන් කියා සිටියා වගේ, මගේ ඡන්ද කොට්ඨාශය ප්‍රමාණයෙන් කියන්නට බැරි තරම් විශාලයි. එම නිසා මෙම කරුණ ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කර හැකිනාක් ඉක්මනින් මස්කෙළි ප්‍රදේශයට, ගිණිගත්හේනේ හෝ ඊට නුදුරු ස්ථානයක හෝ ආදායම් පාලක නිලධාරි කාර්යාලයක් ඇති කර දෙන ලෙස ඒ ප්‍රදේශයේ දුප්පත් ජනතාව වෙනුවෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, බට කර්මාන්තය ඒ ප්‍රදේශයේ හොඳ හැටි දියුණු කරන්න පුළුවන් කර්මාන්තයක්. ඒ ගැන විශේෂ ඕනෑකමක් දක්වා ඊට අවශ්‍ය ආධාර ප්‍රදේශවාසීන්ට ගරු ඇමතිතුමා ලබා දෙනවා නම්, එයින් ඒ උදවියට විශාල සහනයක් ලැබෙන බව මා කියන්ට කැමතියි. පසුගිය කාල සීමාවේදී පේෂකර්ම මධ්‍යස්ථාන අළුතින් පිහිටුවීම නවත්වා දමා තිබුණු බවක් මට දැන ගන්න ලැබුණා. මගේ කොට්ඨාශය වැනි දියුණුවෙන් හුගක් අඩු ප්‍රදේශවල, විශේෂයෙන් ගම්බද ප්‍රදේශවල, අළුතින් පේෂකර්ම මධ්‍යස්ථාන ඇති කර ඒ ප්‍රදේශවල ජීවත්වන තරුණියන්ට රෙදි විවීමේ කර්මාන්තය ඉගෙන ගැනීමට අවස්ථාවක් ලබා දෙන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

පසුගිය මහා මැතිවරණයට පසුව උඩරට ඡන්ද කොට්ඨාශවල ඡන්ද ලැයිස්තුවලට ඡන්දදායකයින් විශාල ගණනක් ඇතුළු වී තිබෙනවා. ඒ අළුතින් ඇතුළු වී තිබෙන නම් දෙස බැලුවාම පෙනී යන්නේ ඉන්දියානුකාරයන්ගේ නම් වැඩි වශයෙන් ඒවාට ඇතුළත් වී තිබෙන බවයි. මේ ඡන්ද බලය ලැබී තිබෙන්නේ පුරවැසි භාවය ලබා ඇති අයටද? එසේ නැත්නම් පුරවැසි භාවය නොලැබුණු අයටත් ඡන්ද බලය ලැබී තිබෙනවාද යන කරුණ ගැන සොයා බැලීමට ගරු ඇමතිතුමා විසින් විශේෂ පරීක්ෂණයක් ඇති කරන්න ඕනෑ.

තවත් එක කරුණක් පමණක් ගරු ඇමතිතුමාට මතක් කර දෙන්න මා අදහස් කරනවා. ඒ කාරණය නම් හිංතොට තිබෙන "ප්ලයි වුඩ්" කර්මාන්තයයි. එය හොඳ හැටි දියුණු කරන්න පුළුවන් කර්මාන්තයක්. තේ පෙට්ටි සෑදීමට ගන්න මේ "ප්ලයි වුඩ්" ලෑලි පිටරටින් ගෙන්වීම නිසා මේ රටින් විශාල මුදලක් පිටරට ඇදී යන බව තමුන්නාන්සේට මතක් කර දෙන්න ඕනෑ. මේ විධියේ කර්මාන්ත අපේ රටේ දියුණු කරන්න ඕනෑ. එසේ කළ විට මෙරට තේ පෙට්ටි සෑදීම සඳහා පාවිච්චි කරන වැනිස්ට්‍රා ලෑලි වුවමනා තරම් සපයා ගන්න පුළුවන් වෙනවා ඇති. පිට රටින් ගෙන්වන වැනිස්ට්‍රා ලෑලි තරම් මෙරට නිපදවන වැනිස්ට්‍රා ලෑලි හොඳ නැතෙයි කියා කියනවා. එම නිසා තමුන්නාන්සේ ඒ ගැන කල්පනාව යොමු කර සුදුසු පරිදි ක්‍රියා කරන්න ඕනෑ.

ශ්‍රීමත් රසික් fපරීඩ් (මැද කොළඹ පළමු වන මන්ත්‍රී)

(சேர் ராஸிக் பரீத்—கொழும்பு மத்தி முதலாம் அங்கத்தவர்)

(Sir Razik Fareed—First Colombo Central)

I shall be very brief. I only want to make a few comments and I do hope the Hon. Minister will give effect, or at least give his greatest attention to what I say.

The Hon. Minister is anxious to start new industries. But I would ask him to give help to those who have already started certain industries but are unable to carry on for want of further help. I have forwarded no less than five cases but none of those have been attended to so far.

The Hon. Minister has banned the importation of jaggery from India and Pakistan. Jaggery is used for many purposes other than *kasippu*. I would earnestly ask him to ban the importation of yeast which is one of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the main ingredients in the preparation of *kasippu* rather than jaggery. Jaggery is used to make *dodol* in Colombo Central.

Unemployment is rampant in Colombo Central. There is unemployment not only in Colombo Central but in the whole of Ceylon. I know that the Hon. Minister is doing his very best; he has very good intentions. But unfortunately you cannot stop a man from gambling. The Ceylonese instinct is such that you cannot stop a man from gambling. The Hon. Minister in his own way is endeavouring to stop racing. He has already brought a Bill to that effect. But what is the outcome? Those little boys who used to sell tickets and make a few rupees are now unable to earn that money and maintain their families. So I do hope that the Hon. Minister will contribute his share to solve the unemployment problem.

Next I want to refer to the Ceylonese film industry. I earnestly ask the Hon. Minister to give his best attention to this industry. I know of a certain film company in Colombo Central which is mainly composed of Ceylonese actors. They want some sort of help. I hope the Minister will give his best attention to this matter.

In regard to appointment of Quazis, we are in a most embarrassing position. I would ask the Hon. Minister to think seriously of scrapping the whole system of appointment of Quazis. The present system is very unsatisfactory.

As the Hon. Minister is anxious to reply I shall conclude with the plea that he give his best attention to the few matters that I have raised.

අ. භා. 7

එල්. බී. ජයසේන මයා. (බිංගිරිය)

(திரு. எல். பி. ஜயசேன—பிங்கிரிய)

(Mr. L. B. Jayasena—Bingiriya)

අපේ ප්‍රදේශයේ ඇති ආදායම් පාලක කාර්යාලයට කටුගම්පොල හත්පත්තුවේ ජන්ද කොට්ඨාශ තුනක් අයිතියි. එම ප්‍රදේශය විශාල ජනගහනයක් ඇති ප්‍රදේශයක්. ප්‍රාදේශීය පාලන ක්‍රමය යටතේ කච්චේරියේ කාරක සභාවක් මගින් එම ආදායම් පාලක කොට්ඨාශය කොටස් දෙකක් හැටියට වෙන් කරන්න කටයුතු සකස් කර තිබෙනවා. එම වෙන් කිරීම ක්‍රියාවේ යෙදවීම සඳහා තව තිබෙන්නේ ගරු ඇමතිතුමාගේ අනුමතිය ලබාගන්න එක පමණයි. හදිසියේම ඒ විධියට කොටස් කිරීම කරන්න අමාරු නම් සහකාර ආදායම් පාලක නිලධාරියෙක් හෝ යොදනවා එහි වැඩ ඉක්මන් කරනවා නම් ලොකු පහසුවක් වෙනවා ඇති.

අපේ ප්‍රදේශයේ මහලු නිවාසයක් තැනීම සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කර අවුරුද්දක් පමණ වෙනවා. නමුත් තවම ඒ කටයුතු ආරම්භ කර නැහැ. ඒ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. කටුගම්පොල හත්පත්තුවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අනාථ නිවාසයක් කොයිම තැනකවත් නැහැ. එම නිසා ඒ පළාත්වල සිටින අනාථයන්ට දුර බැහැර යන්න සිදු වී තිබෙනවා. මේ වර්ෂයේදීවත් එම කටයුත්ත ආරම්භ වේය කියා අප විශ්වාස කරනවා.

ඛණිජ විද්‍යා පර්යේෂණ මගින් පෙනී ගොස් තිබෙනවා අපේ කොට්ඨාශයේ යකඩ බහුල වශයෙන් තිබෙන බව. මෑ ඒ බවට සාක්ෂි කීප වාරයකදීම ඉදිරිපත් කර තිබෙනවා. මීට ශත වර්ෂ කීපයකට පෙර යකඩ ගෑරූ සථාන සහ මෙවලම් ආදිය මගේ කොට්ඨාශයේ තිබී සොයාගෙන තිබෙනවා. යගම් වෙල, යගම් තුලාන, යගම් පත්තුව, යහලාරාව යනාදී නම්වලින් හඳුන්වන ගම් ගැන කල්පනා කර බලන විට පෙනී යන්නේත් අපේ කොට්ඨාශයේ යකඩ බහුලව තිබුණු බවයි. මේ වර්ෂයේදී යකඩ කර්මාන්තය ගැන මූලික පර්යේෂණ කටයුතුවත් ආරම්භ කෙරෙනවා නම් කිසිම කර්මාන්ත දියුණුවක් නැති අපේ ප්‍රදේශයට එය ලොකු සැනසීමක් වෙනවා ඇති.

ඊළඟට ගස් මැදීම ගැන කියන්න කැමතියි. උතුරු ප්‍රදෙශවලට තල්ගස් මැදීම සඳහා අවසර දී තිබෙනවාක් මෙන් වියලි ප්‍රදේශයක් හැටියට සලකා මගේ ප්‍රදේශයටද පොල් ගස් මැදීම සඳහා අවසර දෙන්න ඕනෑ. අපේ දිස්ත්‍රික් සම්බන්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. බී. ජයසේන මයා.]

කරන කාරක සභාව එකච්ඡන්දයෙන් තීරණය කරගත් පරිදි එවැනි ඉල්ලීමක් කර දැන් හුඟ කාලයක් ගත වී තිබෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කය වියලි ප්‍රදේශයක් හැටියට සලකා මිනිසකුට ගස් විස්සක් නිදහස්ව මැදගන්න අවසර දීම පිළිබඳව ගරු ඇමතිතුමා ඉක්මනින් තීරණයක් ගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා.

පසුගිය කාලය තුළ කිසිම කර්මාන්ත ශාලාවක් අප ප්‍රදේශයේ පටන්ගෙන නැහැ. මගේ කොට්ඨාශයේ පමණක් නොවෙයි, කුරුණෑගල දිස්ත්‍රික්කයේම නැහැ. කර්මාන්ත සම්බන්ධව පත් කර ඇති කුරුණෑගල කච්චේරියේ නිලධාරීන් ඒ ගැන කිසි තැකීමක් කරන්නේ නැති නිසා සමහර ගම්බද ප්‍රදේශවල තිබෙන මැටි කර්මාන්තය, කොහු කර්මාන්තය වැනි කර්මාන්තත් අභාවයට යමින් පවතිනවා. එවැනි කර්මාන්ත උගන්වන තැන්වල ඉන්නේ ගුරුවරුන් පමණයි. වැඩ කෙරෙන්නේ නැහැ. ඔවුන් කර්මාන්ත විනාශ කරන්න පත් කළ අයය කියා මා හිතනවා. කාවේනිගම පළාත්වල ඇති වලං, කොහු ආදි කර්මාන්ත පුහුණු කිරීම සඳහා පත්කර එවා ඇති ගුරුවරුන් සම්බන්ධයෙන් සම්පූර්ණ පරීක්ෂණයක් කරන්නට ඕනෑ. මේ ගුරුවරුන් කිසිම වැඩක් නොකර තිබියදී පඩි ගෙවන්නේ මොන හේතුවක් නිසාද කියා. එම නිසා මේ ආකාරයෙන් කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැති ගුරුවරුන් පිළිබඳව පරීක්ෂණයක් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ ගුරුවරුන් කර්මාන්ත පිළිබඳව සැලකිල්ලක් දක්වන්නේ නැත් නම් එම අංශයෙන් ඉවත් කර, ඔවුන් සැලකිල්ලක් දක්වන කටයුතුවලට පිටත්කර යවන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ නැතිව කිසි වැඩක් නොකර මේ සථානවල සිටීමෙන් පලක් නැහැ. විශෙෂයෙන්ම නම් වශයෙන් හඳුන්වා දෙනවා නම් ප්‍රාදේශිය කර්මාන්ත පුහුණු කිරීම සඳහා පත් කර තිබෙන සුගතදාස ජයවික්‍රම කියන නිලධාරියා ගැන සඳහන් කරන්න පුළුවනි. මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස කථා කිරීමට කාලය නොමැති වීම ගැන මම කනගාටුවෙනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය වර්ෂ කීපය තුළදී අපේ සංස්කෘතික දෙපාර්තමේන්තුව මගිනුත්, ප්‍රදේශයේ තිබෙන සාහිත්‍ය සංගම් මගිනුත් සාහිත්‍යය සම්බන්ධයෙන් ඉතාම උසස් වැඩ පිළිවෙළක් කරගෙන ගියා. නමුත් දඹදෙණියේ සාහිත්‍ය උළෙල පැවැත්වීමෙන් පසු, ඒ වර්ෂයෙන් පසු සාහිත්‍ය සංදර්ශන පැවැත්වීම අත්හැර දමා තිබෙනවා. සාහිත්‍යය කියන එක ගොඩ නැගිල්ලක් කණුවක් වාගේ පෙන්වන්නට පුළුවන් දෙයක් නොවෙයි. සාහිත්‍යයෙන් බලාපොරොත්තු වෙන්නේ චෙතසික නිහතමානී භාවයයි.

එසේ වුණත් මෙතක් ගෙන ගිය වැඩ පිළිවෙළවල් දිහා බැලුවාම තම හිතවතුන්ට නොයෙක් විධියෙන් ආධාර කිරීමේ, තෑගි බෝග ආදිය පිරිනැමීමේ ක්‍රමයක් සංස්කෘතික දෙපාර්තමේන්තුව ඇතුලේ සිදු වී තිබෙනවා. එම නිසා මේ අංශවල සේවයේ යෙදී සිටින නිලධාරීන් කවුදැයි සොයා බලා ඒ දෙපාර්තමේන්තුවල යම් යම් දුෂණ කට යුතු සිදු වී තිබෙනවා නම්, සිදු වෙනවා නම්, ඒ දෙපාර්තමේන්තු සුද්ධ පවිත්‍ර කර දමා, ඒ උදවිය එම සථානවලින් ඉවත් කර දමා, ක්‍රමවත් වැඩ පිළිවෙළක් ආරම්භ කිරීමට ඇමතිතුමා උත්සාහ ගනීවි යයි මම බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, දැන් සාහිත්‍ය උත්සව අවුරුදු පතා පැවැත්වීම නතර කර දමා තිබෙනවා. සාහිත්‍යය උත්සව සඳහා අදමෙන් පේරාදෙනිය වැනි සථාන කලින් තෝරා ගත්තේ නැහැ. චෛතිහාසික වැදගත්කමක් උසුලන, සාහිත්‍ය කටයුතු ගැන ප්‍රසිද්ධියක් උසුලන නගරවලයි, මෙයට පෙර සංස්කෘතික දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව සාහිත්‍ය උත්සව පැවැත්වූයේ. එම නිසා මින් ඉදිරියට සාහිත්‍ය උළෙල පවත්වනවා නම් එබඳු නගර තෝරා ගන්නා ලෙස මතක් කර සිටිනවා. එවැනි සථාන තෝරා ගෙන ඉදිරියටත් සාහිත්‍ය වැඩ කටයුතු ගෙන යනවා ඇතැයි මම විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ පළාත්වල බොහෝ සංඛ්‍යාවක් යෙදී සිටින පේෂ කර්මාන්තය ගැනද වචනයක් සඳහන් කරන්නට ඕනෑ. අද ගම්බද කර්මාන්ත අතින් විශේෂ තැනක් ගන්නා රෙදි විවීමේ කර්මාන්තය ගැන මෙයට වඩා උනන්දුවක් ගරු ඇමතිතුමා දක්වන්න ඕනෑ යයි කියන්න සිදු වී තිබෙනවා. අද අපේ ප්‍රදේශවල රෙදි විවීම බොහෝ දුරට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇණ හිටි තත්ත්වයකයි පවතින්නේ. මන්ද? අද ඒ රක්ෂාවේ යෙදී සිටින තරුණියන්ට, ඒ තමන් සේවයේ යෙදී සිටින ආයතනය රජයේ ලියා පදිංචි කරන්න බැහැ. ඒ වාගේම ඒ කම්කරු යට අවශ්‍ය නූල් ලබා ගන්න බැහැ. ඒ වාගේම නිපදවන රෙදි අලෙවි කර ගැනීමට මාර්ගයක් නැහැ. තමන්ට යන්ත්‍ර තිබුණත් ඒ සඳහා අවශ්‍ය නූල් නැති නම් ඒ කම්කරු ආයතනය කොහෙත්ම ගෙන යන්න බැහැ. එම නිසා අද අනාථ භාවයට පත්ව ඇති මෙම කම්කරු ආයතනයේ යෙදී සිටින දහස් සංඛ්‍යාත තරුණියන්ගේ යහපත සඳහා, පොදුවේ ගම්බද ජනතාවගේ සුභ සිද්ධිය සඳහා, ඒ අයට නූල් සපයා දීමට සහ නිපදවන රෙදි අලෙවි කර ගැනීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර දෙන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම අද පේෂකම්කරු සමුපකාර සමිති ලියා පදිංචි නොකිරීම යුක්ති සහගත නැහැ. ඒවා ලියා පදිංචි කිරීමට අවසර දීමෙන් සහ ඒවාට හැකි හැම අංශයෙන්ම අනුබල දීමෙන් අපේ ගම්බද කම්කරු ආයතනයක් නඟා සිටුවීමට උත්සාහ දරන්නට ඕනෑ. දැන් කරගෙන යන අන්දමට නම් මේ රටේ මේ විධියේ ප්‍රශ්න විසඳන්න ලැබෙන්නේ නැහැ. මෙයට වඩා පුළුල්, එමෙන්ම ක්‍රමවත් වැඩ පිළිවෙළක් අනුගමනය කිරීමෙන් ගම්බද කර්මාන්ත දියුණු කරන්න ගරු ඇමතිතුමා උත්සාහ ගන්නවා ඇතැයි බලාපොරොත්තුවෙමින් මගේ වචන සඵලය අවසන් කරනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

කරුණාකර නිශ්ශබ්ද වන්න. කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා දැන් මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූ අතර, කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.

ජී. ඩබ්ලිව්. සමරසිංහ මයා. (කුලියාපිටිය)
(திரு. ஜீ. டப்ளியு. சமரசிங்ஹ—குளியாப்பிட்டிய)
(Mr. G. W. Samarasinghe—Kuliyapitiya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී දීර්ඝ ලෙස කථා කිරීමට මා අදහස් නොකරතත් කාරණා දෙකක් ගැන පමණක් කථා කිරීමට මම බලාපොරොත්තු වෙනවා. පළමුවෙනි කාරණය වශයෙන් සඳහන් කරන්නේ, රජයේ නොයෙකුත් අංශවලට නිලධාරීන් තෝරන අවස්ථාවේදී ඒ අයගේ පරම්පරා ගණනාවක තොරතුරු ප්‍රශ්න කරනවා. රාජකාරී කටයුතු සම්බන්ධයෙන් මෙතෙක් කල් පදවි ලබා ගැනීමට පුළුවන්කම තිබුණේ ඉංග්‍රීසියට ඇලුම් දක්වන උදවියට පමණයි. ඒ වාගේම එදා සිංහල රජවරුන් රාජ්‍ය කරන සමයේදී, විශේෂයෙන් යුද්ධ හමුදාවල රාජකාරී කටයුතුවල යෙදුණු සිංහල පුරවැසියන්ට එදා ඉංග්‍රීසින් මේ රට අල්ලා ගැනීමෙන් පසුව ඔවුන් සතු බලතල සම්පූර්ණයෙන්ම නැතිකර දමා, ඔවුන්ගේ ඉඩ කඩම් පවා කොල්ලකාගෙන, ඔවුන්ගේ පාරම්පරික පදිංචිය පවා වෙනස් කර දමා තිබුණු බවට අපට රහසක් නොවෙයි; මේ නිසා නැතිවී ගිය පාරම්පරික උරුමයන් ගැන ප්‍රශ්න කිරීම කිසිසේත් සුදුසු වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එම නිසා යම් යම් පදවිවලට පුද්ගලයන් තෝරා ගන්නා විට ඒ අයගේ පාරම්පරික විස්තර ගැන විමසන්නේ නැතුව අධ්‍යාපන සුදුසුකම ගැන පමණක් සළකා පත්වීම් දෙන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ඒ පත්වීම්වලට නිලධාරීන් පත් කරන අවස්ථාවේදී අධ්‍යාපන සුදුසුකම් අනුව, තෝරා පත් කරන හැටියට මම ඉල්ලා සිටිනවා.

ඒ සමගම කිය යුතු කාරණයක් තිබෙනවා. එනම් උඩරට ගැමි කොමිෂන් සභාව පිළිබඳවයි. දැනට සතියකට පෙර කුරුණෑගල දිස්ත්‍රික් කොමිටියේ සාකච්ඡාවක් ඇති වුණා. ඒ අවස්ථාවේදී වයඹ පළාතට කොපමණ මුදලක් වෙන් කර තිබෙනවාදැයි දිසාපතිතුමාගෙන් ඇසූ මුත්, එතුමා එය දැන සිටියේ නැහැ. වයඹ පළාතේ මේ දක්වාම කිසිම කම්කරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සමරසිංහ මයා.]

ශාලාවක් පිහිටුවා නැහැ. කුලියාපිටිය, බිංගිරිය, කටුගම්පොළ, වාරියපොළ යන මේ කිසිම ප්‍රදේශයක කම්කාන්තශාලාවක් පිහිටුවා නැති බව ප්‍රකාශ කරන්නේ ඉතා කනගාටුවෙනුයි. වයඹ පළාත් පොල් කම්කාන්තය කෙරෙන ප්‍රදේශයක්. එහි කොහු කම්කාන්ත මධ්‍යස්ථානයක් ඇති කළොත් ඒ සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය පහසුවෙන් ලබා ගැනීමට පුළුවන් නිසා එය දියුණු කරගන්ට පුළුවනි. ඒ සඳහා විශාල මුදලක්ද වැය වන්නේ නැහැ. එය කුලියාපිටියේ පිහිටුවන්නටයයි මම කියන්නේ නැහැ. වයඹ පළාතේ කුමන ආසනයක හෝ කොහු කර්මාන්තශාලාවක් පිහිටුවන ලෙස මම ඉල්ලා සිටිනවා.

පින් පඬි දීම සම්බන්ධයෙන්ද වචනයක් කිය යුතුයි. අද ගම්බද දුප්පත් කෙනකුට ලබාගත හැකි එකම වරප්‍රසාදය පින් පඬියක් ලබාගැනීමයි. නමුත් දුප්පත් කෙනකු පින් පඬියක් ඉල්ලුවත් මාස හත අටකින් වත්, සමහරවිට අවුරුද්දකින්වත්, ඒ පිළිබඳව දෙපාර්තමේන්තුවෙන් උත්තරයක් ලබාගන්න බැහැ. එම නිසා ඊට ඇමතිතුමාගේ අවධානය යොමු කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

කුලියාපිටිය ප්‍රදේශයෙහි බීඩි කර්මාන්තයෙහි යෙදී සිටින බොහෝ දෙනෙක් සිටිනවා. සිගරට් මිල වැඩි වීම නිසා එම කර්මාන්තය දැන් දියුණු වෙමින් පවතිනවා. දැනට එම කර්මාන්තයෙහි 50,000 කට වැඩි දෙනෙක් රක්ෂාවේ යෙදී සිටිනවා. එම නිසා පිටරටින් ගෙන්වන බීඩි සංඛ්‍යාව සියයට 40 දක්වා සීමා කළොත් තවත් 50,000 කට පමණ මේ රටේ රක්ෂාව ලබාගන්න පුළුවන් වේවි. කාල වේලා නොමැති නිසා මීට වඩා යමක් කීමට මම බලාපොරොත්තුවන්නේ නැහැ. තමුන්නාන්සේට ස්තුතියි.

ටී. බී. ජයසුන්දර මයා. (උඩුනුවර)
(திரு. ரி. பி. ஜயசுந்தர—உடுநுவர)
(Mr. T. B. Jayasundera—Udunuwara)

නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීන ගැන මම සන්තෝෂ වෙනවා. වැදගත් ප්‍රශ්න රාශියක් තිබෙත්, කාල වේලා නොමැතියෙන් එතරම් වෙලා ගැනීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ.

උඩරට ගැමි කොමිෂන් සභාවේ වාර්තාව ක්‍රියාවේ යෙදවීමට මේවර නිස් ලක්ෂයක් වෙන් කර තිබීම ගැන මම පළමුවෙන්ම සන්තෝෂ වෙනවා. ගිය වර්ෂයේත් මේ වාගේ සල්ලි වෙන් කර තිබුණා; නමුත් අපේ පළාත්වලට ඒ තරම් වැඩක් සිද්ධ වුණේ නැහැ. මගේ කොට්ඨාශයේ පාරක් වත් පාසැල් ආදි අනෙක් දෙයක්වත් සඳහා මුදල් වෙන් වී තිබුණේ නැහැ. එම නිසා කරුණා කර මේ වර්ෂයේ උඩරට ගැමි කොමිෂන් සභා වාර්තාව ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර ඇති මුදල්වලින් මගේ කොට්ඨාශයේ පාරවලුත් සෑදීම සඳහා සුළු කොටසක්වත් යොදවන මෙන් මම ඉල්ලා සිටිනවා.

අපේ ගම්බද පළාත්වල ඇති සුළු කර්මාන්ත සඳහා රජයේ කිසිත් ආධාරයක් නොලැබෙන නිසා ඒවා කරගෙන යාමට අපහසු තත්ත්වයක් තිබෙනවා. මගේ කොට්ඨාශයේ සුළු කර්මාන්ත රාශියක් තිබෙනවා. පිත්තල බඩු සෑදීම, පිහියා සෑදීම ඉන් දෙකක් පමණයි. ඒ කර්මාන්තයන්හි යෙදී සිටින මහත් වරුන් මගේ අනුමැතියද ඇතිව ඔවුන්ගේ ඒ සුළු කර්මාන්ත කරගැනීම සඳහා ආණ්ඩුවට නොයෙක් විට ලියුම් ලියා ඇතැම් අවස්ථාවලදී පෝර්ම කොළත් පුරවා යවා තිබෙනවා. නමුත් අවුරුද්දක් පමණ ගත වූවාට පසු පිහියා සෑදීමේ යෙදී සිටින ඩිංගිරි අප්පු මහත්මයාටත් පිත්තල කර්මාන්තයෙහි යෙදී සිටින මහත්වරුන්ටත් ආධාර දෙන්න බැරියයි ලියා යවා තිබෙනවා. මම ඒ ගැන කනගාටු වෙනවා. ඒ අය ඒ කර්මාන්ත පරම්පරාවෙන් පරම්පරාවට පවත්වා ගෙන එන්නේ ඉතාමත් අමාරුවෙනුයි. දුනු පිහියාවලට පමණක් කොයි තරම් විශාල මුදලක් පිටරටට ඇදී යනවාද යන්න තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ වාගේ කර්මාන්ත දියුණු කිරීමට තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුවෙන් හැකි තරම් ආධාර දිය යුතු බව මම ප්‍රකාශ කරන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන සමිති ගැනත්, ග්‍රාමසංවර්ධන නිලධාරි මහත්වරුන් ගැනත් වචන ස්වල්පයක් කථා කරන්න ඕනෑ. ග්‍රාම සංවර්ධන සමිති රාශියක් අපේ පළාත්වල තිබෙන නමුත් ග්‍රාම සංවර්ධන නිලධාරීන් ශූර කමක් ඇතිව හරියාකාර වැඩ නොකරන නිසා එම සමිති අභාවයට ගොස් තිබෙනවා. අවුරුදු ගණනකින් ඒ නිලධාරීන් ඇවිත් නැහැ. ඒ නිලධාරීන් වැඩ කරන්නේ ඩී. ආර්. ඕ. කන්තෝරුවලයි. එම ග්‍රාම සංවර්ධන සමිතිවලට නව පණක් දීමට වැඩ කටයුතු නොකිරීම ගැන මම කනගාටු වෙනවා. එම ග්‍රාම සංවර්ධන සමිතිවලින් මීට වඩා සේවයක් ලබා ගැනීමට ඒ නිලධාරීන් උනන්දු කරවන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන්, දේවාල විහාර ගම් ආඥු පණත ගැන වචන ස්වල්පයක් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. දැනට ඒ පණත යටතේ මැල්සිරිපුර වැනි ප්‍රදේශවල අක්කර 400 ක, 500 ක පමණ විශාල ප්‍රදේශවලින් දෙන්නේ තෙල් නැලියක් දෙකක් පමණයි. එම නිසා ඒවා නැවත තක්සේරු කර ඒවායින් නියම ආදායම් බද්දක් ලබාගෙන විහාර දේවාල ගම් දියුණු කිරීමට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නායක නිලමේවරුන් තේරීමේදී කෝරාළ මහත්වරුන්ටත් ඡන්දය දීමට පුළුවන්කම තිබෙන නිසා, නොයෙකුත් දූෂණ ඇතිවන බවත්, නියම විධියට ඉදිරිපත් වන මහත්මයකුට ජයග්‍රහණය කරන්න බැරි බවත්, තමුන්නාන්සේ දන්නවා ඇති. මේ කාලයේ ලංකාවට වුවමනා නැති සේවයක් අදත් තිබීම ගැන මම කනගාටු වෙනවා. අදත් කෝරාළ මහත්වරු නිස් ගණනක් ලංකාවේ සිටිනවා. මින් පසුවත්, බස්නායක නිලමේවරුන් තේරීමේදී කෝරාළ මහත්වරුන්ට ඇති ඡන්දය දීමේ බලය නැති කළ යුතුයි. ග්‍රාම සේවා ක්‍රමය ඇති කරන විට ආරච්චි මහත්වරුන් අස් කරන්නාක් මෙන් මේ කෝරාළ මහත්වරුනුත් අස් කරන ලෙස මම ඉල්ලා සිටිනවා. අවසාන වශයෙන් බෞද්ධ කොමිෂන් සභා වාර්තාව ක්‍රියාත්මක කරන ලෙසත්, දේවාලවල බස්නායක නිලමේවරුන් කරන දූෂණ ක්‍රියා ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර වැඩ කරන ලෙසත් මම ඉල්ලා සිටිනවා.

ගරු මෛත්‍රිපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දවස් 3ක පමණ කාලයක් නිස්සේ මගේ අමාත්‍යාංශය පිළිබඳව නොයෙකුත් කරුණු ප්‍රකාශ කෙරුණා.

ඒ. යූ. රොමානිස් මයා. (දොඩන්ගස්ලන්ද)
(திரு. ஏ. யூ. ரொமானிஸ்—தொடங்கஸ்லந்தை)
(Mr. A. U. Romanis—Dodangaslanda)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ඇමතිතුමාට පොතක් පිළිගන්වන්නට තිබෙනවා.

ගරු මෛත්‍රිපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ගරු මන්ත්‍රීතුමා ඊයේත් කථා කළා. ඉවර වුණාම පස්සෙ දෙන්න. දවස් 3ක් නිස්සේ කී කරුණුවලට මිනිත්තු 45ක් ඇතුළතදී පිළිතුරු දීම අමාරු බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. ඒ කෙසේ වෙතත්, මගේ අමාත්‍යාංශය පිළිබඳව ඉදිරිපත් වූ කරුණුවලට හැකි තරම් පිළිතුරු දීමට මම මහන්සි ගන්නවා. ගරු මන්ත්‍රීවරුන් තම තමන්ගේ ඡන්ද කොට්ඨාශවල කටයුතු සම්බන්ධව ඉදිරිපත් කර තිබෙන පෞද්ගලික කරුණු ගැන මේ අවස්ථාවේදී පිළිතුරු නොදී **හැන්සාඩ්** වාර්තාව මගේ අමාත්‍යාංශයට ලැබුණු වහාම ඒ ඒ මන්ත්‍රීවරුන්ට ඒ ඒ කාරණා පිළිබඳව පෞද්ගලිකවම පිළිතුරු යැවීමට කටයුතු සලස්වන බව මම ප්‍රථමයෙන්ම කියන්න කැමතියි. එසේ කිරීමට මා අදහස් කළේ දවස් 3ක් නිස්සේ ඉදිරිපත් කළ කරුණු එකක් එකක් ගැන පිළිතුරු දීමට සූදානම් වුණොත් ඒ සඳහා වැඩිපුර කාලයක් ගත වන නිසයි.

මාද පිළිගන්නවා, අමාත්‍යාංශය විශාල නිසා අමාත්‍යාංශයේ සෑම දෙපාර්තමේන්තුවකම කටයුතු හරියාකාර කරන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මෛත්‍රීපාල සේනානායක]

සැහෙන තරම් කාලයක් මට නොලැබෙන බව. ඒ නිසා ඒ සම්බන්ධව යම් කිසි වැඩ පිළිවෙළක් ඇති වෙනවා නම් මමත් ඒ ගැන සතුටු වෙනවා. මේ අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන් විශේෂයෙන්ම ග්‍රාම සේවා ක්‍රමය ගැනත්, ඊට අදාළ කච්චේරි ක්‍රමය ගැනත් අදහස් ප්‍රකාශ කර තිබෙනවා. ග්‍රාම සේවා ක්‍රමය පිළිබඳව යෝජනාව ඉදිරිපත් කළ දවසේදීම මා ප්‍රකාශ කළා, මේ වෙනස් වීම ඇති වීමෙන්ම කච්චේරි ක්‍රමයේ වෙනස් වීමක් සිදු නොවන බව. කච්චේරි ක්‍රමය වෙනුවට වෙනත් වැඩ පිළිවෙළක් යොදන්න අදහස් කරනවාය යනුවෙන් එදා මා කීවා. දැන් ඒ සම්බන්ධව වැඩ කටයුතු කරගෙන යනවා. දැන් පවතින කච්චේරි ක්‍රමය වෙනස් කරන විට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය අනුව මහජනයා විසින් තෝරා පත් කරනු ලබන ක්‍රමයක් ඒ වෙනුවට ඇති කළ යුතුය යන්න අප පිළිගත යුතුයි. පළාතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනුත් පළාත් පාලන ආයතන වැනි වෙනත් ආයතනත් සම්බන්ධ කරගෙන කච්චේරි ක්‍රමය වෙනුවට සුදුසු වෙනත් පාලන ක්‍රමයක් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය අනුව සකස් කළ යුතුය යන්න කවුරුත් පිළිගන්නවා ඇත කියා මා හිතනවා. රජයත් එය පිළිගෙන තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ප්‍රතිපත්තියක් වශයෙන් එය පිළිඅරන් තිබෙනවා. ඊජනල් කවුන්සිල් කියා හෝ ප්‍රාදේශීය මණ්ඩලය කියා හෝ අන් කවර උචිත නමක් හෝ යොදා ඒ සම්බන්ධ ආයතනය සකස් කර ගත යුතුයි. එවැනි වැඩ පිළිවෙළක් සකස් කර වැඩි කල් යන්ට පෙර ඒ පිළිබඳ විස්තර ගරු මන්ත්‍රීන්ට දැනගන්ට ඉඩ හැරීමට පමණක් නොව මේ ගරු සභාවේ සාකච්ඡා කිරීමටත් අවස්ථාවක් දීමට මා බලාපොරොත්තු වෙනවා. ඒ බව මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්ට සතුටුයි.

ග්‍රාම සේවක නිලධාරීන් තෝරා පත් කිරීම සම්බන්ධව අදහස් ඉදිරිපත් කළ අතර ඇතැම් ගරු මන්ත්‍රීවරුන් විසින් යම් යම් චෝදනාත් ඉදිරිපත් කර තිබෙනවා. ඒ කටයුත්ත භාරව සිටින ඇමතිතුමා වශයෙන් මේ සම්බන්ධයෙන් යම්කිසි ප්‍රකාශයක් මේ ගරු සභාවට කළ යුතුය කියා මා කල්පනා කරනවා. යම්කිසි පාලන ක්‍රමයක් වෙනස් කර ඒ වෙනුවට වෙනත් ක්‍රමයක් ඇති කිරීමේදී දේශපාලන බලපෑම්වලට ඉඩ දීම කොහෙත්ම නුසුදුසු බව මා පිළිගෙන තිබෙනවා. අපේ ආණ්ඩුවත් එය ඒ විධියටම පිළිගෙන තිබෙනවා. ගම්මුලාදැනීන් පත් කිරීම නතර කර, ඒ ක්‍රමයත් වෙනස් කර, ඒ වෙනුවට ග්‍රාම සේවය සඳහා නිලධාරීන් පත් කර ගැනීමට තීරණය කළේ ඒ අනුවයි. ඒ සඳහා නොබෝදා රජයේ විභාග දෙපාර්තමේන්තුව මගින් විභාගයකුත් පවත්වා තිබෙනවා. ඒ විභාගයෙන් සමර්ථ වූ අයදුම්කරුවන් පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට නැවත කැඳවීමට කටයුතු සලසා තිබෙන බව ආණ්ඩුව වෙනුවෙනුත්, මගේ අමාත්‍යාංශය වෙනුවෙනුත්, මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්ට කැමතියි. ඉන් පසු ග්‍රාම සේවය සඳහා නිලධාරීන් තෝරා ගැනීම පී. එස්. සී. හෙවත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පිළිවෙළක් අනුව කිරීමට රජය බලාපොරොත්තු වන බව පමණක් මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා. ඒ හැර වෙන ක්‍රමයකින් ඒ නිලධාරීන් පත් කරන්ට රජය අදහස් නොකරන බව මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

ඒ සමගම අප ගත් තවත් තීරණයක් ගැන කියන්ට සතුටුයි. යෝජිත ග්‍රාම සේවයේ එක් වැදගත් අංගයක් සම්බන්ධවයි ඒ තීරණය ගත්තෙ. ඒ තීරණය අනුව අභිනවයෙන් තෝරා ගනු ලබන ග්‍රාම සේවක නිලධාරීන් තමන් පත් කරනු ලබන දිස්ත්‍රික්කය ඇතුළතම මාරු කරනු ලැබිය හැකි පිරිසක් වෙනවා. ඒ අනුව පළමුවන පත්වීමේදී තමන් උපන් කොට්ඨාශයේ නොව වෙනත් කොට්ඨාශයක සේවය සඳහා ඒ අයට යන්ට සිදු වන බව ප්‍රකාශ කරන්ට සතුටුයි. ඒ මක්නිසාද කිවොත්, නව ක්‍රමය අනුව පත්වීම් ලබන අයදුම්කරුවන් තමන් උපන් කොට්ඨාශයකුත් තුළ පත්වීම් ලැබීමට සුදුස්සන් වෙතත්, උපන් වසමේම, මුලාදැනි කොට්ඨාශයේම, තුලානයේම, සේවය සඳහා පත්වීම් ලබා ගන්ට මහන්සි ගන්ට ඉඩ තිබෙන නිසා තමන් උපන් ප්‍රදේශයෙන් පිටස්තරව ඇති කොට්ඨාශයක සේවය කිරීමට වැඩ පිළිවෙළක් ඇති කරනවායයි කළ ප්‍රකාශය අනුව ක්‍රියා කිරීමක් බව කියන්ට සතුටුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රජයේ සුරා ප්‍රතිපත්තිය කුමක්ද යන්න දීර්ඝ විවේචනයට ලක් වුණා. පසුගිය අය වැය විවාදයේදීත් මේ සම්බන්ධයෙන් කෙලින්ම මා ප්‍රකාශ කළා. හොර සුරා මැඩලීමට යම් වැඩ පිළිවෙළක් ඇති කරනවා නම්, තත්ත්වය අවබෝධ කරගෙන ඒ අනුව ප්‍රශ්නය විසඳීමට ඉදිරිපත් වෙනවා නම්, පමණක්, එම කටයුත්ත කළ හැකිය යන්න අප පිළිගන්න බව කියා තිබෙනවා. ඒ නිසා ක්‍රියා මාර්ග දෙකක් අනුගමනය කරන්නට බලාපොරොත්තු වෙනවා. පළමු වැන්න වශයෙන් කළ යුත්තේ හොර සුරාව නැති කිරීමයි. හොර සුරාව මැඩලීමට නම් සුරාව පාවිච්චි කරන මහජනයාට අස නීපයකට භාජන නොවී පාවිච්චි කළ හැකි දේ වශයෙන් සහතික කරන්න පුළුවන් පානයක් දීමට සූදානම් විය යුතුයි. ඒ සඳහා මගේ හැඟීම අනුව කැබිනට් මණ්ඩලයෙන් අනුදැනුම ලබා ගැනීමට යම් යම් යෝජනා ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්ට කැමතියි. අද අප ගෙන යන ප්‍රතිපත්තිය ඉතා මත්ම දුර්වලයි. පිටරටින් ගෙන්වනු ලබන බීමවලට ලැබෙන වර ප්‍රසාදයවත් මේ රටේ බීමවලට ලැබෙන්නේ නැතැයි කියා බොහෝ ගරු මන්ත්‍රීවරු කීවා. ඒ නිසා මේ සම්බන්ධයෙන්ද රටේ සුභ සිද්ධියට අදාළවන ක්‍රියා මාර්ගයක් පිළි ගෙන ක්‍රියාකිරීම අවශ්‍ය බව මා පිළිගෙන තිබෙනවා. එම ප්‍රතිපත්තිය අනුව ක්‍රියා කිරීමටද මා බලාපොරොත්තු වනවා.

තානායම් පොළවල අපේ රටේ නිපදවන අරක්කු ගන්නට නැතැයි කියා බොහෝ ගරු මන්ත්‍රීවරු කීවා. ඒ නිසා මෙම ආයතන භාරව වැඩ කරන නිලධාරීන්ට, ඒ ඒ තැන්වල අවශ්‍යතාවන් අනුව, වුවමනා කම් අනුව, විකිණීමට ඉඩ දීමට අප තීරණය කර තිබෙනවා.

උතුරු පළාතේ නිදහසේ තල්ගස් මැදීමට ඉඩ දී තිබෙනවාක් මෙන් Tree Tax System දකුණේද ඉඩ නොදෙන්නේ මන්ද යන කාරණය ඉදිරිපත් කළා. මෙම කාරණය පිළිබඳව පරීක්ෂා කර බැලූ කොමිෂන් සභාව උතුරේ අද පවතින තත්ත්වය සතුටුදායක නැතැයි කියා ප්‍රකාශ කර තිබෙනවා. එපමණක් නොව, මා යාපනයට ගිය අවස්ථාවේදීත්, සෑම ගහක් යටම වාගේ තැබෑරුමක් පටන්ගෙන තිබෙන බැවින් ළාබාල දරුවන්ද සුරාවට ඇබ්බැහිවීමෙන් බාල පරම්පරාවට විශාල අපරාධයක් වන නිසා මෙම ක්‍රමය වෙනස් කරන්නටය කියා මා හමු වූ නියෝජිත පිරිස් දෙකක්ම ඉල්ලා සිටියා. ඒ නිසා රජයේ සුරාබදු ප්‍රතිපත්තිය පොදු වශයෙන් ගෙන විසඳන අවස්ථාවේදී මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට අපි බලාපොරොත්තු වන බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

කාලවේලා මදි නිසා මීට වඩා වැඩි විස්තරයක් මේ අවස්ථාවේදී කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. උඩරට ගැමි කොමිෂන් සභාව සම්බන්ධයෙන්ද මන්ත්‍රීවරු කීප දෙනෙක් තමන්ගේ අදහස් පළ කළා. මෙහි වැඩ කටයුතු සම්බන්ධයෙන්—පාරවල් කැපීම්, දිස්පැන්සරි සෑදීම්, පාඨශාලාවල් ඉදි කිරීම් සම්බන්ධයෙන්—රුපියල් ලක්ෂ 43 කට ටිකක් වැඩි මුදලක් වෙන් කර තිබෙන බව තමුන්නාන්සේලාට පෙනෙනවා ඇති. මෙම ක්‍රමය යටතේ කෙරෙන වැඩ දැනට වඩා පුළුල් නොකරන්නේ, වෙන අනෙක් ප්‍රදේශද මීට ඇතුළත් නොකරන්නේ, කුමන හේතුවක් නිසාද කියා සමහර ගරු මන්ත්‍රීවරු ප්‍රශ්න කළා. දැනටමත් මේ සම්බන්ධයෙන් එක්තරා පියවරක් අර ගෙන තිබෙනවා. උතුරු මැද පළාතද මෙම වැඩ පිළිවෙළ යටතට ගැනීම සම්බන්ධයෙන් මා හිතනවා ප්‍රාදේශීය කාරක සභා සාකච්ඡා කරගෙන යනවාය කියා. මේ සම්බන්ධයෙන් ගෙන යා යුතු වැඩ පිළිවෙළ ගැන උපදෙස් දීමට මණ්ඩලයක් පත් කරන්න යනවා. සංයුක්ත මණ්ඩලය වැනි මණ්ඩලයක් පත් කරන්න යැයි සමහර ගරු මන්ත්‍රීවරු කීවත්, එවැන්නක් කරන්න බැහැ. එවැන්නක් කළොත් ආණ්ඩුවක් තුළ තවත් ආණ්ඩුවක් පිහිටෙව්වා වැනි තත්ත්වයකට වැටේවි. ඒ නිසා උපදෙස් දීමට පමණක් ඇඩ්වයිසර් කොමිටියක් වශයෙන් කාරක සභාවක් පත් කරන්න බලාපොරොත්තු වෙනවා.

කර්මාන්ත සම්බන්ධයෙන්ද කාරණා කීපයක් මතක් කරන්න තිබෙනවා. වැඩියෙන් විස්තර සඳහන් නොකර, කර්මාන්ත සම්බන්ධයෙන් කාරණා කීපයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මෛත්‍රිපාල සේනානායක]

පමණක් මතක් කරන්න අදහස් කරනවා. මගේ අමාත්‍යාංශය යටතේ සංවර්ධන අංශ යක් ඇති කර තිබෙන නිසා, කර්මාන්ත දෙපාර්තමේන්තුව තුළ තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් එක්තරා ප්‍රතිසංවිධානයක් කර තිබීම ගැන මෙම ගරු සභාව සන්තෝෂ වේවිය කියා මා හිතනවා. එම සංවර්ධන අංශය ඇති කර දැනට මාස හතරක් පමණයි. කර්මාන්ත දියුණු කිරීම සඳහා දැනට වැඩ කටයුතු කරනු ලබන්නේ ඒ අංශය මගිනුයි. මා ඒ සංවර්ධන අංශය ඇති කිරීමට අදහස් කෙළේ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ කටයුතු කර ගෙන යනවාට වඩා, සෑම අවස්ථාවේදීම මට හමු වී සාකච්ඡා කළ හැකි වන පරිදි එය මගේ අමාත්‍යාංශයේ කොටසක් වශයෙන් තබා ගැනීම සුදුසු නිසයි. එසේ කිරීමෙන් වෙනත් කටයුතු අතර කර්මාන්තවලට ලබා දිය යුතු සථානය ලබා දිය හැකි වෙතැයි මා කල්පනා කළා. ඒ වැඩ පිළිවෙළ යොදා දැනට මාස හතරක් පමණයි. ඒ කාලය තුළදී අප බලාපොරොත්තු වූ කටයුතු සියල්ලම ඉෂ්ට වුණායයි මා කියන්නේ නැහැ. නමුත් මෙසේ කටයුතු කරගෙන යෑමේදී දිනෙන් දිනම කර්මාන්ත දියුණුවට වුවමනා කරන වැඩ පිළිවෙළ ඇති කරන්ට පුළුවන් වන නිසා මා සන්තෝෂ වෙනවා.

අ. භා. 7.30

දැනට රජයේ කර්මාන්ත වශයෙන් යම් යම් සංයුක්ත මණ්ඩලවල කර්මාන්ත කර ගෙන යනවා. ඒවා සම්බන්ධ විස්තර ලැයිස්තුවක් ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවේදී ඉදිරිපත් කරන්ට යෙදුණා. පෞද්ගලික අංශයේත් උපකාරය ඇතිව පිටරටින් ගෙන්වනු ලබන ද්‍රව්‍ය මේ රටේම නිෂ්පාදනය කිරීමට වැඩ පිළිවෙලක් යොදා තිබෙනවා.

මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන සංයුක්ත මණ්ඩල කිපයක වැඩ සතුටු දායක නොවන බව මා පිළිගන්නවා. විශෙෂයෙන්ම ලුණු කර්මාන්තය පිළිබඳව අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍ය ආචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) කී කාරණා අනුව නැවතත් ඒ ගැන සොයා බැලීමට කොමිෂන් සභාවක් පත් කිරීමට වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා. පසුගිය කාල සීමාව තුළදී අක්‍රමිකතා සිදු වී තිබෙනවාද, එසේ නම් ඒවා මොනවාද, ඒ අක්‍රමිකතා සිදු වීමට මොන කාරණා හේතු වුණාද, ඒ නිසා රජයේ මුදල් අපතේ ගියාද, යන මේ කරුණු සොයා බැලීමට වැඩ පිළිවෙළක් යෙදීමට බලාපොරොත්තු වෙනවා.

පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)
(திரு. பேர்சி விக்ரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

වංචාකාරයන් හිරේ යවන්ට ඕනෑ.

ගරු මෛත්‍රිපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனஞயக்க)
(The Hon. Maithripala Senanayeke)

ඒ සම්බන්ධයෙන් ඊට වඩා විස්තරයක් කරන්ට බලාපොරොත්තු වන්නේ නැහැ. කන්තලේ සීනි කර්මාන්තය ගැනත් වචනයක් දෙකක් කිය යුතුයි. කන්තලේ වැවේ වතුර ප්‍රමාණය සීමා සහිතයි. කන්තලේ අළුතින් දියුණු කළ ඉඩම් සියල්ලම උක් වැවීම සඳහා යොදා ගත හැකි නම් ඒ කර්මාන්තශාලාව දියුණු කිරීමට කිසිම අපහසුවක් නැහැ. සීනි කර්මාන්තය සඳහා උක් වැවීමට දැනට අක්කර 8,000 ක් වෙන් කර තිබෙනවා. සෑම විටම එයින් අක්කර 6,000 ක් වගා කිරීමට කටයුතු යොදා තිබෙනවා. පුරාණ කුඹුරු හැර කොලනි ක්‍රමයට වී වගා කිරීම සඳහා ගම්මුන්ට දී තිබෙන තවත් අක්කර 6,000 ක් තිබෙනවා. ඒ ඉඩම් ප්‍රමාණයත් උක් වගාව සඳහා යොදා ගත හැකි නම් ලොකු ප්‍රයෝජනයක් ලැබෙනවා. කෘෂිකර්මී ඇමතිතුමාත් සමග මේ ගැන සාකච්ඡා කරන්ට මා බලාපොරොත්තු වෙනවා. ඒ ගොවියන් උක් වැවීමට අකමැති නම්, කුඹුරු ගොවිතැනම කරගෙන යන්ට ඔවුන්ට වුවමනා කරනවා නම්, කුඹුරු ගොවිතැනට ඉඩ ලැබෙන වෙනත් ව්‍යාපාරවලට ඔවුන් යොදවා හෝ මේ ඉඩම් ප්‍රමාණය උක් වැවීමට යෙදුවහොත් හුඟක් හොඳයි. ඒ ගොවියන් උක් වැවීමට කැමති වෙතොත් වැඩි ආදායමක්ද ලබන්නට පුළුවන් වෙනවා ඇති. මෙසේ කර ගතහොත් දැනට තිබෙන වතුර ප්‍රමාණයෙන්ම ඒ අක්කර 12,000 ම, 14,000 ම වගා කරන්ට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එහෙම නම් වැඩ කල් යන්ට පෙර මේ කර්මාන්තශාලාව දියුණු කරගන්න පුළුවනි. මෙම සංයුක්ත මණ්ඩලයට පත් කොට සිටින නව සභාපතිතුමා සමග මා මේ සම්බන්ධව සාකච්ඡා කොට අදහස් ප්‍රකාශ කර තිබෙනවා. ඒ අක්කර 12,000 ම 14,000 ම එක් වැවීම සඳහා යොදවා ගත හැකි නම් වැඩ කරදරයක් නැතිව ඒ කර්මාන්ත ශාලාව දියුණු කර ගැනීමට හැකි වෙනවා පමණක් නොව දැනට ඒ ප්‍රදේශයේ වී ගොවිතැනෙහි යෙදී සිටින ගොවි මහතුන්ට එක් වැවීම නිසා වැඩි ආදායමක් ලබා ගන්ටත් හැකි වෙනවා ඇති.

මෙම සංයුක්ත මණ්ඩලවලට පත් කර සිටින නිලධාරීන් ගැන අකුරටස්සේ ගරු මන්ත්‍රීතුමා යම් යම් අදහස් ප්‍රකාශ කළා. සම්පූර්ණ කාලය යෙදවිය හැකි සභාපති කෙනකු සිමෙන්ති සංයුක්ත මණ්ඩලයට පත් කෙළේ කිසියම් හේතුවක් ඇතිවයි. මා ඊයේ ප්‍රකාශ කළ පරිදි එතෙක් කල් වැඩ කරගෙන ගිය කුමාරසවාමි මහතා වයෝවෘද්ධයි. මම පසුගිය දවසක ඒ කර්මාන්තශාලාව බැලීමට ගිය අවස්ථාවේදී එතුමා කිව්වා, අනේ මට අමාරුයි, ඔබතුමාත් සමග කර්මාන්තශාලාවේ ඇවිදින්න යෑමට අපහසුයි, ඒ නිසා මට ටිකක් විවේක ගන්න ඕනෑයි කියා. ඒ නිසා මම කල්පනා කළා, කන්කසන්තුරේ සිමෙන්ති කම්හල එතැනම විශාල කරන ගමන්ම, ගාල්ලේ තවත් කර්මාන්තශාලාවක් ඇති කිරීමට යන ගමන්ම, පුත්තලමේ තවත් කර්මාන්තශාලාවක් ඇති කිරීමට යන ගමන්ම, සම්පූර්ණ කාලය යොදා වැඩකිරීමට පුළුවන් නිලධාරියකු පත් කළ යුතුය කියා. එම අදහස අනුවයි, ඒ වැඩ පිළිවෙළ යොදා තිබෙන්නේ.

පුත්තලමේ කර්මාන්තශාලාව පිහිටුවන ස්ථානය ගැනත් යම් විධියක තීරණයක් කර තිබෙනවා. පුත්තලමේ පිහිටුවන්ට යන කර්මාන්තශාලාවට වුවමනා කරන අමු ද්‍රව්‍ය තිබෙන්නේ පුත්තලමට හැතැප්ම 18 ක් 20 ක් පමණ උතුරෙනුයි. එම ස්ථානය දක්වාම දුම්රිය මාර්ගයක් දැමීමට දැන් කටයුතු කරගෙන යනවා. දැනටමත් ඒ මාර්ගයේ හැතැප්ම 15 ක් පමණ දුරට කටයුතු කෙරී තිබෙනවා. අපි කර්මාන්තශාලාව ඉදි කරන්න බලා පොරොත්තු වන්නේ පුත්තලම් නගරයට දකුණෙනුයි. ඒ කියන්නේ පාලාවි කියන අහස්යාත්‍රා තොටුපොළට කිට්ටුවයි. පුත්තලමට හැතැප්ම 20 ක් පමණ උතුරෙන් පිහිටි ඒ අමු ද්‍රව්‍ය ඇති ස්ථානයට දුම්රිය පාර දමා අමු ද්‍රව්‍ය ගෙන්වා ගෙන ඒ කර්මාන්තශාලාවේ කටයුතු කිරීමටයි, අපි බලාපොරොත්තු වන්නේ. කර්මාන්තශාලාව ඉදි කිරීමට යන කාලයත්, අමු ද්‍රව්‍ය ගෙන්වීමට වුවමනා කරන දුම්රිය පාර දැමීමට යන කාලයත්, යන දෙකම සලකා බලලයි, ඒ කම්හල සම්බන්ධව ගෙන යන වැඩ පිළිවෙළ සකස් කර තිබෙන්නේ. මෙතැන කර්මාන්තශාලාවේ වැඩ කටයුතු අවසාන වන විට අර සැතපුම් විස්සේ දුම්රිය මාර්ගයත් අවසාන වෙනවා. එතකොට එක පාරටම වැඩ පිළිවෙළ ක්‍රියාවේ යොදවන්න පුළුවන් වෙනවා.

සිමෙන්ති සම්බන්ධයෙන් තවත් වැඩ පිළිවෙළක් අනුගමනය කිරීමට අපි අදහස් කරනවා. ඒ වැඩ පිළිවෙළ මෙතෙක් කල් එළිදරව් නොකළත් මේ අවස්ථාවේදී මේ ගරු සභාවට එය ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා. මේ රටේ සංවර්ධන වැඩ කටයුතු සඳහා සිමෙන්ති ඉතාමත්ම අවශ්‍යයි. එම නිසා මම තීරණය කර තිබෙනවා—තව ටික දවසකින් ඒ සඳහා කැබිනට් අනුමතියත් ලැබේවිය කියා මම බලාපොරොත්තු වෙනවා—ලංකාවට වුවමනා කරන සිමෙන්ති සියල්ලම ඔය සංයුක්ත මණ්ඩලය මගින්ම ලංකාවට ගෙන්වීමට, නොහොත් සිමෙන්ති ගෙන්වීම රජය සතු කිරීමට වැඩ පිළිවෙළක් යෙදිය යුතුය කියා. එසේ කිරීමට අදහස් කිරීමට හේතු වන කරුණු කීපයක් තිබෙනවා. අද යාපනේ කර්මාන්තශාලාවෙන් රුපියල් 7.50 ට පිට වන සිමෙන්ති බෑග් එක අනුරාධපුරයේදී ගන්ට සිදු වන්නේ රුපියල් 11.50 ක් ගෙවීමෙනුයි. මට වුවමනා කරන්නේ ලංකාවට අවශ්‍ය සිමෙන්ති මෙම කර්මාන්තශාලාවල නිපදවන ගමන්ම, අපට වැඩිපුර වුවමනා කරන ප්‍රමාණය අපේ වෙළඳ ඇමතිතුමා ගිවිසුම් ඇති කරගෙන තිබෙන සෑම රටකින්ම ගෙන්වා අඩු මිලකට ඒ සිමෙන්ති ලබා ගැනීමටයි. සිමෙන්ති සාධාරණ මිලකට විකුණන්න පුළුවන් වුවහොත් විශේෂයෙන්ම කර්මාන්ත දියුණුවටත්, සංවර්ධන වැඩටත්, ඒ වාගේම නිවාස ප්‍රශ්නය විසඳීමටත්, එය මූලික වශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මෛත්‍රීපාල සේනානායක]

අදාළ වනු ඇත කියා මම බලාපොරොත්තු වෙනවා. ඒ නිසා වැඩි කල් යන්ට මත් තෙන් එවැනි වැඩ පිළිවෙළක් ඇති කිරීමට අදහස් කරනවා. මේ විධියට ක්‍රම ක්‍රමයෙන් කටයුතු කර අපට වුවමනා කරන සිමෙන්ති මේ රටේම නිපදවමින් පිටරටින් ගෙන්වීම සීමා කිරීමට අපට පුළුවන්කම ලැබෙනවා. ඒ නිසාමයි, මේ විධියේ වැඩ පිළිවෙළක් ඇති කිරීමට අදහස් කළේ.

ඊළඟට මට පෙනී ගිය තවත් වැදගත් කරුණක් ගැන වචනයක් කියන්න ඕනෑ. මගේ අමාත්‍යාංශයට අයිති කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ තිබෙන සංයුක්ත මණ්ඩලවලම ගොඩනැගිලි සම්බන්ධව ඒ ඒ කර්මාන්තශාලා ඉදි කිරීම වම යම්කිසි ආයතනයක් අවශ්‍ය වී තිබුණා. ඒ සඳහා කැබිනට් අනුමතිය ලැබී තිබෙනවා. Designs and Construction Corporation නමැති, අපේ ගොඩනැගිලි සැලැස්මවල් අපම ඇඳ ගැනීමෙන් සහ ඒවා සෑදීමේදී අපට ආධාර ගැනීම පිණිස අපේ ඉංජිනේරුවන්ටත් අපේ කාර්මිකයන්ටත් වැඩ ඉගෙන ගත හැකි ආයතනයක් පටන් ගැනීමට අපි අදහස් කර තිබෙනවා. අපේ යකඩ හා වානේ කම්හල සම්බන්ධව වුවමනා කරන ගොඩනැගිලි කීපයක් ගැන දැන්මම මෙම ආයතනය මගින් සැලැස්මවල් පිළියෙළ කරගෙන යනවා. ඒ වාගේම චීන රටෙන් ලැබෙන රෙදි වියන කර්මාන්තශාලාවට වුවමනා කරන ගොඩනැගිල්ලද සඳහා මේ ආයතනය මගින් දැන්මම සැලැස්මක් සූදානම් කරගෙන යනවා. ටයර් සහ ටියුබ් කම්හලට වුවමනා කරන ගොඩනැගිලි සම්බන්ධයෙනුත් සැලැස්මවල් සූදානම් කරගෙන යනවා. මේ අවස්ථාවේදී මම ඉතාමත් සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්නට කැමතියි, අපේ ලාංකිකයෙක් වන දක්ෂ ඉංජිනේරු මහත්මයකු වූ වරුයේ උප ඉංජිනේරු තැන්පත් කුලසිංහ මහතා මෙම ආයතනය භාරව කටයුතු කිරීම පිණිස යෙදීමට ගරු කම්කරු ඇමතිතුමාගේ අවසරය ලබාගෙන තිබෙන බව. මෙවැනි දේවලට ඒ මහත්මයා විශේෂඥයෙක්. ඒ මහතාගේ සහාය ඇතිව මේ වැඩ කටයුතු ඉදිරියට කරගෙන යාමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන්න කැමතියි. ඊළඟට අප ආරම්භ කරන්න බලාපොරොත්තු වන කර්මාන්ත කීපයක් ගැනත් වචනයක් දෙකක් කියන්න අදහස් කරනවා. යකඩ සහ වානේ කර්මාන්තය සම්බන්ධව විස්තරයක් කිරීමට වුවමනා නැතැයි මා හිතනවා මන්ද? ඒ පිළිබඳ "ඇග්‍රිමන්ට්" එක අත්සන් කර අවසාන නිසා. ඒ වගේම ටයර් සහ ටියුබ් කර්මාන්තය පිළිබඳව වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවා. පෝර කර්මාන්ත ශාලාවක් සම්බන්ධව දැන් සාකච්ඡා කරගෙන යනවා. පෝර මෝලක් ඇති කිරීමට ප්‍රථමයෙන් පෝර මිශ්‍ර කර බෙදා හැරීමට වැඩ පිළිවෙළක් සකස් කිරීම අපේ අදහසයි.

නීල් ද අල්විස් මයා. (බද්දේගම)
(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)
(Mr. Neal de Alwis—Baddegama)

කවදද ඒක කරන්නේ?

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

ඒ ගැන මේ අවස්ථාවේදී විස්තරයක් කරන්න පුළුවන්කමක් නැහැ. "සිලිකේට් බ්‍රික්ස්" කියන කාර්මික ගඩොල් වගීයක් ඇති කිරීම සඳහාත් දැනට කටයුතු කරගෙන යනවා. ඒ ගඩොල් යොදා ගොඩනැගිල්ලක් සෑදුවාසින් පසු එහි බිත්තිවලට පිටින් "ප්ලාස්ටර්" එකක් වුවමනා කරන්නෙ නැහැ. ඒ "සිලිකේට් බ්‍රික්ස්" කියන ගඩොල් වගීය ලංකාවේ සෑදීමට පෝලන්තයත් සමග දැනට කටයුතු කරගෙන යනවා. "පෙට්‍රෝලියම් රිපයිනරි" හෙවත් අමු තෙල් මෙරටට ගෙන්වා එය පිරිසිදු කිරීමේ කර්මාන්ත ශාලාවක් මෙහි ඇති කිරීමටත් දැනට කටයුතු කරගෙන යනවා. තව ටික දිනකින් ඒ වැඩ පිළිවෙළ සම්බන්ධ අදහස් ගරු සභාවට ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වන නිසා දැන්මම ඒ ගැන ප්‍රකාශයක් කරන්න මා අදහස් කරන්නේ නැහැ. ඒ වගේම මෙතෙක් කල් වෙළඳ ඇමතිවරයා භාරයේ තිබුණු තිරිඟු පිටි සෑදීමේ මෝලත් මගේ අමාත්‍යාංශයට දැන් භාරවී තිබෙන බව දන්වන්න කැමතියි. එය තවත් දියුණු කිරීමට අදහස් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කරද්දී එක් මන්ත්‍රීවරයෙක් ප්‍රශ්න කළා, කාර් සම්බන්ධව යම් තීරණයක් ගෙන තිබෙනවාද කියා. කාර්, රේඩියෝ යන්ත්‍ර, වැනි දේවල කොටස් මෙහි ගෙන්වා සම්බන්ධ කිරීමේ වැඩ පිළිවෙල—ඇසැම්බ්ලින්—සම්බන්ධව මේ විධියේ ප්‍රතිපත්තියක් ගෙන යන්නයි, මා අදහස් කරන්නේ. ක්‍රම ක්‍රමයෙන් අවුරුදු පතා ඒ සඳහා අවශ්‍ය කොටස් යම් ප්‍රමාණයක්වත් ලංකාවේ සෑදිය යුතුය යන ප්‍රතිපත්තිය අනුව එවැනි වැඩ පිළිවෙළකට අපේන් බාධාවක් නැහැ. කාර් කොටස් වශයෙන් මෙරටට ගෙනැවිත් සවි කිරීම සඳහා කලින් අවසර ඉල්ලා තිබුණේ 13 දෙනකු පමණක් වුවත් දැන් විශාල කොම්පැණි හතරක් පහකුත් ඒ ගැන උනන්දුවක් දක්වනවා. එක් කොම්පැණියකට පමණක් ඒ පිළිබඳ තනි අයිතිය දෙන්න බලාපොරොත්තුවක් නැහැ. ක්‍රම ක්‍රමයෙන් ඒ කාර් සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය අවුරුදුපතා වැඩි වැඩියෙන් මෙරට නිපද වන්න සූදානම් වන අයට පමණක් බල පත්‍ර දීමටයි, මා අදහස් කරන්නේ. [බාධාකිරීමක්.] No. That is the sort of policy—progressive manufacture of certain parts. That is more or less decided. ඒ ක්‍රමය නිසා කාර්වල එතරම් මිළ අඩු වීමක් ඇති වේයයි මට කියන්න බැහැ. සමහරවිට ලංකාවට අවශ්‍ය කාර් සියල්ලම සෑදීම එක කොම්පැණියකට භාර දුන්නොත් නම් කාර්වල මිළ අඩු වන්න ඉඩ තිබෙනවා. කොම්පැණි කීපයකට භාර දුන්නොත්, වැඩිම වුණොත් එක කාර් එකක මිළ රුපියල් 500 කට 600 කට වඩා අඩු කරන්න පුළුවන්වේය කියා මම හිතන්නෙ නැහැ. එහෙත් මේ ක්‍රමය නිසා මේ රටේ විශාල කම්කරු පිරිසකට රක්ෂා ලැබෙනවාට නම් අනුමානයක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විස්තර වශයෙන් කියනවා නම් තවත් කර්මාන්ත රාශියක් ගැන සඳහන් කරන්න පුළුවනි. ඒවා එකක් එකක් ගැන විස්තරයක් කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් විශේෂයෙන් පේශ කර්මාන්තය ගැන මතක් කළ යුතුව තිබෙනවා. පේස කර්මාන්තය සම්බන්ධයෙන් ගෙන යන ප්‍රතිපත්තිය මොකක්ද? ගෘහ කර්මාන්තයක් වශයෙන් ඊට අනාගතයක් තිබෙනවාද? යන ප්‍රශ්න බොහෝ දෙනතු විසින් අසන්න යෙදුණා. අද ලංකාවේ ජනගහනය අනුව සලකන විට අපට වර්ගයකට රෙදි යාර කෝටි $14\frac{1}{2}$ ක් පමණ අවශ්‍යයි. සියක් ලක්ෂයක ජනගහනයක් ඇති අපේ රටට රෙදි යාර කෝටි $14\frac{1}{2}$ ක් පමණ වුවමනා කරනවා. ඒ සම්පූර්ණ රෙදි පිළි ප්‍රමාණය ගෘහ කර්මාන්තයක් වශයෙන් හෝ මැෂින් මාර්ගයෙන් හෝ විදුලි බල යෙන් හෝ සකස් කරන්න පුළුවන්කමක් නැහැ.

අ. භා. 7.45

පේෂ කර්මාන්තය ගෘහ කර්මාන්තයක් හැටියට කරගෙන යන තැන් තිබෙනවා. ඒවායේ රෙදි පිළි අපට සීමා කරන්න වෙනවා. අද පේස කර්මාන්තය දියුණු වී තිබෙනවාය කියන්නේ, තවත් විධියකින් කියනවා නම් යම් යම් අය නිපදවන රෙදි පිළි අද දවසේ විකුණන්නට පුළුවන්කම ලැබී තිබෙනවාය කියන්නේ, "Industrial Products Act" නමැති ආඥා පණත යටතේ ඒවාට යම්කිසි ආරක්ෂාවක් සැලසී තිබෙන නිසයි. පාරිභෝගිකයන්ට වුවමනා කරන අන්දමේ හොඳ ලස්සන රෙදි පිළි නිපදවන්න අද අපේ ගෘහ කාර්මිකයන් උත්සාහ නොගන්නා බව කනගාටුවෙන් නමුත් කියන්ට සිදු වී තිබෙනවා. කොයි විධියට සාරි, සරොම් ආදිය සෑදුවත් ඒවා රජයට ගන්නවා. එසේ කරන්නේ රජයේ ප්‍රතිපත්තිය අනුවයි. පිටරටවලින් රෙදි ගෙන්වන අය අපේ රෙදිවලිනුත් එක්තරා කොටසක් ගත යුතු නිසා එසේ කරනවා. ඒවායේ අලෙවි වීමක්ද තිබෙනවා. අද තත්ත්වය එසේ වුණාට අනාගතයේදී අපට වුවමනා කරන රෙදි අපේ රටේම නිපදවා ගන්න පුළුවන්කම ඇති වුණොත් ඔවැනි ආඥා පණත් යටතේ ගෘහ කාර්මිකයන්ට ආරක්ෂාවල් සැලසෙන්නෙ නැහැ. ගෘහ කාර්මිකයන් හැටියට බොහෝ දෙනා නිපදවන රෙදි යාර ගණන් සීමා කරන්න එදාට අපට සිදු වෙනවා. එසේ නොකළොත් ඒවායේ ලාබය දරන්න සිදු වන්නේ පාරිභෝගිකයන්ටයි. දැන් අපි සරොමක් රුපියල් නවයටද කොහේද නිපදවන්නන් ගෙන් ගන්නවා. එය වෙළෙන්දාට විකුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මෛත්‍රිපාල සේනානායක]

I believe that in the course of this Debate much will be said again about the dry fish scandal. Personally, I was the first to raise this question in a somewhat detailed form on the Floor of this House. I do not want to speak anything further on the subject except to point out that the Hon. Minister is misinformed of the set-up. He told me in conversation that the C. W. E. is now set to take on the dry fish trade and that it will become the sole importer of dry fish. But this much I must tell the Hon. Minister. You have up to date no direct exporter from the Middle East ; and I do not think that you will be able to get one. You have got exporters from Pakistan and India shipping direct to your C. W. E. Have you found out whether these were the original exporters before you got into the trade ? What has happened is that the original exporters from India and Pakistan now sell their supplies to you through a buying house and still keep a margin of profit through the Indian and Pakistani wholesalers who function in Ceylon. The set-up is the same. Formerly they sold and got a profit ; today without selling they get a profit. Those are the facts of the case. You have not been able to establish direct contact with an export house ; you go through a buying house, through an agent.

This is a very disreputable state of affairs which can lead to much abuse. I believe that the Hon. Minister is misinformed on these matters. The personnel he has secured to assist him in these matters cannot be commended in any way. I am sorry to say this. I do not think that people like Messrs. Navaratna and Raja paksa are in any way suitable to carry out these functions. May I ask whether Mr. Rajapaksa had any previous knowledge of dry fish ; whether he had any pervious experience in the business ; I know how long he has been in business ; I know what business he has done. I am not casting any aspersions. I am only saying that he is not the suitable man to deliver the goods. And if he fails in these functions, it is the Hon. Minister who will have to take the blame.

May I make a suggestion regarding this dry fish trade ? When you go abroad to meet these people direct—as I believe you intend to do quite soon—would it not be possible for you to take some knowledgeable

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසිංහ මයා.]

people along with you, people who will be able to tell you the exact *modus operandi* of this trade? I need not mention to you that an international organisation like Interpol has stated that Ceylon is the distribution centre for narcotics—which is closely allied with the dry fish trade. These dry fish traders are not paragons of virtue and you must, therefore, be armed before you face them.

As I said, Sir, the Hon. Minister has sometimes been misinformed. Now take the question of the sugar that came on the "Moravia" which was sold. The Principal Collector of Customs refused to issue a release order but certain instructions were issued overnight and the sugar was issued. Later on, the matter was handed over to the C. I. D. to recover the sugar. You attempted to trace the people who bought this sugar but you failed. Do you know that one of those people often meets you although your officials have not told you? Is there not one Somaratne, among those people, who bought this sugar syrup? And still you say that the C. I. D. is unable to trace these people, that they cannot be found.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)

Somaratne of Kelaniya?

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

A very close relation, closely connected to him.

ගරු ටී. බී. ඉලංගරත්න (වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති)
(கௌரவ ரீ. பி. இலங்கரத்ன—வர்த்தக, வியாபார, கப்பற்றுறை அமைச்சர்)
(The Hon. T. B. Ilangaratne—Minister of Commerce, Trade, Food and Shipping)

To whom?

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

His brother.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා. (අවිස්සාවේල්ල)
(திரு. டீ. பீ. ஆர். குணவர்தன—அவிசாவலை)
(Mr. D. P. R. Gunawardena—Avissawella)

Trustee of the Raja Maha Vihare, Kelaniya.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

He has bought this sugar syrup.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

And?

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

And you are trying to recover it. Do you not know the people to whom you sold it? Cannot these people be traced? However, Sir, I do not want to contradict the Hon. Minister but if that is the information he has, let it rest at that. If you wish me to place certain facts before you I am prepared to do so.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I will be very happy.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

Now I want to mention a few words about the Food Department. We find that you seem to be lacking storage space and that has been a major excuse when in points of fact the people have to live a hand to mouth or ship to mouth existence. This is a very unsatisfactory state of affairs. You have put yourself in the position of a business man, in that when you handle food for this country, when you buy food, you are a business man first and as such you should buy when the market price is low. But to make an excuse that you do not have godowns and that, therefore, you cannot buy even when the market is low or that you cannot

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

enter into a contract in those circumstances because you have no godowns is a very lame excuse. This should have been foreseen four or five years ago and the necessary godowns should have been built. Now I know when the hon. Member for Avissawella was a Minister certain arrangements were made to see that godowns were built. What has happened to those? I earnestly hope that the Hon. Minister who seems to be burdened with a number of duties will be relieved of some of them because I know he will be able to make good if he is given a chance.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

All that is being done, the stores are being built.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

I am making particular reference to the Ministry of Commerce and Trade because this Ministry is not merely a supplier of food to this country or one that merely channels trade. No, Sir. It is very much more. In the present financial crisis that the Government finds itself, this Ministry has got to play a major part.

So far, this Government has found only two alternatives to get over the financial crisis, that is, they are hoping for financial aid or foreign aid in large doses and in frequent doses from abroad. That is one. The other is the adverse trade balance. There is, of course, a third alternative which would require a very bold Government to take that step; I believe,, the third alternative would be the best but that is not to be spoken of at this moment.

ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන (කම් කරු හා ජනසතු සේවා පිළිබඳ වැඩ බලන ඇමති)
(கௌரவ எம். பீ. டி சொய்ஸா சிரிவர்தன —தொழில், தேசியமய சேவைகள் பதில் அமைச்சர்)
(The Hon. M. P. de Zoysa Siriwardena—Acting Minister of Labour and Nationalized Services)

What is it?

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

The Hon. Minister knows, do not worry. Now speaking of these trade balances, if you look at the Report of the Principal Collector of Customs for 1959—the 1960 Report is not yet available—you will find certain statistics given there. Last year I brought to your notice that you had a trade deficit of Rs. 54,998,023 with Brazil, to which country you exported only Rs. 5 worth of goods! Has that situation improved? Have you sent out somebody from your Department to look into this? Have you investigated the possibilities of bi-lateral trade with this country? You are exporting only Rs. 5 worth of goods to Brazil—[*Interruption*]. Mr. Chairman, the Hon. Minister says that there are to be trade dealings, that it that is coming soon. But one year has passed and nothing has been done so far. I know all these facts are not palatable when they are brought to the notice of the Hon. Minister. He should get his officials to find out whether these statements we make are correct. His officials can verify the facts and tell him whether we are making rash statements or whether we are making correct statements on which action should be taken. His officials come here and listen to all we have to say. I do not think the Hon. Minister is getting the co-operation he deserves from his officials. I do not make these statements very lightly. I will prove them to you. This is one set

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසිංහ මයා.]

of officials I am not satisfied with. Indeed, this is the first set of officials I have spoken against——

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

The hon. Member should not drag in these officials into the Debate. He can speak about the Hon. Minister.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

I am speaking about the Minister ——

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்காரத்ன)
(The Hon. Ilangaratne)

He is anticipating. I am taking notes and I will reply.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

Then look at our trade position with India. What is our trade position with India? We had an adverse balance of trade in 1959 of Rs. 193 million! What is our trade deficit with Burma? It was Rs. 130 million in 1959. What is our trade deficit with Japan? It was Rs. 105 million. What is our trade deficit with Brazil? It was Rs. 54 million. What is the sum total of our trade deficits with only these four countries. It comes to Rs. 484,560,028—almost Rs. 500 million with four countries! That is the magnitude of our trade deficit with only four countries. If you had been able, even to some extent, to reduce this trade deficit you would have found money for the running of your Government. Just imagine, Mr. Chairman, a trade deficit of Rs. 500 million with only four countries!

We have done nothing about this. We have embassies in so many countries. The men who grace these embassies are floating about in the gay centres of Paris, London and New York. They are skiing in Switzerland and in Norway. They are singing love songs in Cuba! What is the meaning of all this? When there is a job of work to be done why is it not being attended to? Why cannot the Hon. Minister take direct action? Why cannot he get at the true position by asking his officials to bring these matters directly to his notice? You are expecting a trade mission from Brazil somewhere this year or very soon. I sincerely hope you will be able to come to some bi-lateral agreement whereby you can give them some tea. Probably that would be the only alternative. I do not know about oil, because they have their own oil processing materials or natural products. So, the only alternative may be tea. They also use spices to some degree. You may be able to explore that avenue also.

Then take a country like Burma, which is a very close neighbour of ours. We have a trade deficit of Rs. 130 million with Burma. We export, I believe, goods worth Rs. 23 million. We export to Burma Rs. 1,375,643 worth of goods. Burma is a country that uses oils and fats in about ninety per cent of their diet. Of course, they use different types of oil. But have you explored the possibility of exporting coconut oil to them?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்காரத்ன)
(The Hon. Ilangaratne)

They are buying coconut oil. We are in close contact with all countries.

පූ. භා. 10.30

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

I hope the Hon. Minister will be able to have the same satisfaction when he is called upon to answer at the next Budget, if he happens to be

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

here! He says he is having close contact with all countries. I wish him success.

I want to ask the Hon. Minister about our local trade. What have you done with our local trade? It is needless to say that you have eliminated the Ceylonese small trader. If that is your policy then let that be; I will not argue about that.

I want to say a few words about our tea trade. We find an ambiguous position regarding our tea trade. A packet of ordinary tea costs about Rs. 2.50 a pound while a pound of good quality tea costs about Rs. 4. That is the price charged by big European companies when they sell tea direct to the ordinary consumer. But if you go to the tea auctions to buy tea to be shipped to London mid-country tea averages 90 cents per pound. What is the C.I.F. price in London? It is 48 cents to 52 cents. Now why should we pay six or seven times more for tea in our own country? That is the position. When these companies sell direct to the consumer here in Ceylon they try to get the best price, that is, from Rs. 2.50 to Rs. 4 per pound. What we get here is B.O.P. or mixed B.O.P. or B.O.P. and dust. When these companies ship tea to their allied companies in London they send them the best tea at the lowest possible rates, thus denying this country of millions of rupees. The identical tea finds its market in London between 4 shillings and 7 shillings per pound. The Government must investigate this matter because it needs a thorough investigation.

We were hoping that you would establish tea auctions on the continent. From the London auctions tea comes to Holland, Hamburg and all the way to the Middle East—and to meet out deficit. We go bowl in hand begging for the money that has been fleeced from us. I implore the Hon. Minister to appoint a Commission to go into this matter immediately.

I want to stress another matter. The reason why I found fault with the officials of this Department is because I believe, from the news items conveyed to us, that the Hon. Minister is misinformed. I will give an example. Recently I found a statement in the newspapers that the commercial banks get a commission on trade done by business houses. Where in the world have you heard of such nonsense, unless they hypothecate this so-called commission and get an overdraft? There is a Sinhalese saying: හොරාගෙ අම්මගෙන් පේන අහනවා වගෙයි. It is like that. That is why I say the officials have misinformed the Hon. Minister. I have proved my case and it is up to you to act. I have been critical of your Ministry whenever it was necessary and I have also given you bouquets when necessary. I sincerely trust you will investigate these few matters I have brought to your notice.

පී. ආර්. රත්නායක මයා. (මාවනැල්ල)
(திரு. பீ. ஆர். ரத்நாயக்க—மாவனல்லை)
(Mr. P. R. Ratnayake—Mawanella)

ගරු සභාපතිතුමනි, ගරු ආහාර හා වෙළඳ කටයුතු පිළිබඳ ඇමතිතුමාගේ වැය ශීර්ෂයේදී විශේෂයෙන්ම ගම්බද පළාත් වලට බල පා තිබෙන අවහිරකම් ගැන වචන කීපයක් කියන්න බලාපොරොත්තු වෙනවා. ගම්බද පළාත්වලට විශාල වශයෙන්ම බල පාන අමාත්‍යාංශයක් තමයි, මේ ආහාර අමාත්‍යාංශය. වත්තල ගරු මන්ත්‍රීතුමා (ජයසිංහ මයා.) ගරු ඇමතිතුමා ගැන තරමක ප්‍රශංසාවකින් යුක්තව කථා කරන වා අසන්න ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. අපේ ආණ්ඩුවේ සිටින ගරු ඇමතිවරුන්ගෙන් ආහාර ඇමතිතුමා තරම් විවේචනයට භාජන වන ඇමතිවරයකු මේ මුළු කාලය තුළම අපට දකින්න ලැබුණේ නැහැ. කොතෙක් විවේචනවලට භාජන වුවත් අධෛර්යයට පත් නොවී තමන්ගේ කල්පනාව හරියාකාර මෙහෙයවා ඉතා මත් දක්ෂ අන්දමින් කටයුතු කරන නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ආර්. රත්නායක මයා.]

ඉතාම වැදගත් ප්‍රශ්නවලදී, විශේෂයෙන්ම බඩු මිල පිළිබඳ ප්‍රශ්නවලදී, සෑහෙන තරමක ටවත් සතුටුදායක ලෙස කටයුතු කළාය කියා අපට සන්තෝෂ වෙන්න පුළුවන්. බඩු මිල පිළිබඳ ප්‍රශ්නය ගම්බද ජනතාවට බොහෝ තදින් බලපාන ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමාගේ දක්ෂතාව නිසා ඒ පළාත්වල ජනතාවට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය නියම මිළකට ලබා ගැනීමට අද අවස්ථාව සැලසී තිබෙනවා. එම නිසා එතුමාට මගේ ගෞරවය මේ අවස්ථාවේදී පුද කරනවා.

එතුමා පමණක් නොව, මහජන පෙරමුණු ආණ්ඩු කාලයේදී ආහාර කටයුතු භාරව සිටි අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) විරුද්ධ පක්ෂවල විවේචනවලට බොහෝ තදින් ලක් වුණා. නමුත් අද අපේ වෙළඳ ඇමතිතුමා කරන්නා වාගේම, ඒ විවේචන ගැන සැලකිල්ලක් දක්වන්නේ නැතිව මේ රටේ සාමාන්‍ය මහජනයාගේ ජීවන වියදම් ප්‍රශ්නය අඩු කිරීමට එතුමා ලොකු උත්සාහයක් දැරුවා. මෙම දුෂ්කර කටයුත්ත කිරීමේදී අපේ රටේ සිටින ගසා කන වෙළෙන්දන් සමග ලොකු සටනක් කරන්න සිදු වී තිබෙනවා. අපේ ඇමතිතුමාට මෙම සටනින් අද සෑහෙන ජයග්‍රහණයක් ලැබී තිබෙනවා. කොයි විධියේ විවේචන කළත් ඒ විවේචන කළ උදවිය එතුමා ගැන ප්‍රශංසා කිරීමෙන් අපට පෙනී යන්නේ එතුමා අතින් සෑහෙන වැඩ කොටසක් සිදු වී තිබෙන බවයි. පොදු වශයෙන් විවේචනය කළා පමණක් නොව පෞද්ගලික වශයෙනුත් ඇමතිතුමාට අපහාස කළ අය සිටිනවා. ගරු ඇමතිතුමා වෙළෙන්දන් සියල්ලම නැති කරන්න යනවාය කියා රැස්වීම්වලදී නොයෙකුත් චෝදනා කර තිබෙනවා. අපේ ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාද (ඩබ්ලිව්. දහනායක මයා.) වෙළඳ ඇමතිතුමාව එසේ විවේචනය කර තිබුණා. නමුත් අද එතුමාත් පිළිගන්නවා ඇති අපේ වෙළඳ ඇමතිතුමාට භාර වී තිබෙන වැඩ කොටස සෑහෙන තරමකට කෙරී තිබෙන බව.

ගරු සභාපතිතුමනි, තවත් එක් ප්‍රශ්නයක් ගැන කථා කරන්න කැමතියි. අපේ ගරු ඇමතිතුමාට පමණක් නොවෙයි, මේ ආණ්ඩුවට විරුද්ධව විශාල චෝදනාවක් නගා තිබෙනවා, මේ රටේ සුළු වෙළෙන්දන් නැති කරන්ට යනවාය කියා. මෙරටට පිට රටින් ගෙන්වන සෑම බඩුවක්ම සමුපකාර තොග වෙළඳ ආයතනය මාර්ගයෙන් ගෙන්වා මේ රටේ වෙළඳුන්ට පහර ගසන්ට යනවාය කියා එක්සත් ජාතික පක්ෂය රට පුරා ලොකු ප්‍රචාරයක් ගෙන යනවා. නුමුත් ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ දන්නවා ඇති, මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති අනුව, මෙ රටට ගෙන්වන මූලික ද්‍රව්‍ය පමණක් සමුපකාර තොග වෙළඳ ආයතනය මාර්ගයෙන් බෙදා හැරීම සඳහා වැඩ කටයුතු සකස් කර තිබෙන බව. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු කාලයේදී හාල්, සීනි, පිටි, ආදී මහ ජනතාවගේ මූලික පාරිභෝගික ද්‍රව්‍යයන් ගෙන්වීම වෙළඳුන්ට භාර කර තිබුණා. එක්සත් ජාතික පක්ෂය වැනි ධනපතියන් හා සම්බන්ධකම් පවත්වන ආණ්ඩුවක් ඒ ආකාරයෙන් කටයුතු කළායැයි කීම ගැන පුදුම වන්ට දෙයක් නැහැ. මේ ආකාරයෙන් හාල් සීනි පිටි ආදී ද්‍රව්‍යයන් කෙළින්ම රජය මගින් ලබාගෙන මහජනතාවට බෙදා හැරීමේ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙන්නේ එමගින් ජනතාවට විශාල සේවයක් කරන්න පුළුවන් නිසයි.

ගරු සභාපතිතුමනි, මෙරටට කරවල ගෙන්වීමත් සමුපකාර තොග වෙළඳ ආයතනය මාර්ගයෙන් කිරීමට රජය අදහස් කර ගෙන තිබෙනවා. එසේ කර තිබෙන්නේ වෙළඳුන්ට පහර ගැසීමේ අදහසින් නොවෙයි. මේ රටේ වැසියාට අවශ්‍ය ආහාර ද්‍රව්‍යයක් වන කරවල අඩු මිලකට ලබා දීම සඳහායි. එම නිසා මේ චෝදනා කිසිම සාධාරණයක් නැති ඒවා හැටියට තමුන්නාන්සේට පෙන්වා දෙන්න පුළුවන්. සුළු සුළු අඩුපාඩුකම් තිබුණත් අළුතින් පටන් ගත් මෙම ව්‍යාපාරයෙන් මහජනතාවට විශාල සේවයක් සැලසෙන බව කියන්න පුළුවනි. කරවල ගෙන්වීම කෙළින්ම රජය මගින් කළේ නැත්තේ මොකදැයි වත්තල ගරු මන්ත්‍රීවරයා (ජයසිංහ මයා.) ප්‍රශ්න කළා. ආරම්භයේදී එක වරටම එවැනි වැඩ පිළිවෙළක් අනුගමනය කරන්ට බැරි වුණත්, ඉදිරියට එසේ ගෙන්වීමට රජය මගින් වැඩ පිළිවෙළවල් යොදාගෙන තිබෙනවා. ඒ ගැන අපේ ගරු ඇමතිතුමාට ස්තුති කරන්න ඕනෑ. මේ නිසා කරවල ගෙන්වීමේ මුවාවෙන් පිටරටට ඇදී යන කෝටි ගණනක මුදලක් නතර කරගන්න පුළුවන් වනවාට කිසිම සැකයක් නැහැ. එසේ කරන ගමන්ම දැනට කරවල සඳහා ඇදී යන මුදලත් මේ රටේ සම්පූර්ණයෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නතර කර ගනු සඳහා මේ රටේම කරවල නිෂ්පාදනය කිරීමට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. එසේ කළෝතින් පමණයි, මේ වැඩ පිළිවෙළින් නියම ප්‍රයෝජනයක් අපට ලබා ගත හැකි වන්නේ. ගරු සභාපති තුමනි, අපේ ගරු ඇමතිතුමාට කොයි ආකාරයෙන් දොස් නැගුවත්, මෙයට පෙර රු. 1.80 ට විකුණූ කරවල රාත්තල දැන් ශත 70 ට 74 ට ලබාගන්න පුළුවන්කම තිබෙනවා. මෙයින් ගම්බද ජනයාට විශාල සේවයක් සැලසෙනවාට අනුමානයක් නැහැ. එම නිසා මේ විධියේ බොරු ප්‍රචාර ගෙන යාම ගැන ඇත්ත වශයෙන්ම මම කනගාටු වෙනවා.

ගරු සභාපතිතුමනි, තවත් කාරණයක් ගැන තමුන්නාන්සේගේ සැලකිල්ල යොමු කිරීමට මේ අවස්ථාවේදී මම කල්පනා කරනවා. කරවල පමණක් නොවෙයි, මහ ජනතාවට අවශ්‍ය වන වෙනත් ද්‍රව්‍ය සමුපකාර තොග වෙළඳ ආයතනය මාගී යෙන් ලබා දීමට කටයුතු සලසන්ට ඕනෑ. විශේෂයෙන්ම මේ ආයතනය මගින් බෙදා හරින ද්‍රව්‍යයන් ඈත පිටිසර පළාත්වල වැසියන්ට ලබා ගැනීමට පහසුකම් නැහැ. මේ පළාත්වලට ගෙනෙන බඩු අතරමගදීම විකිණී යනවා. එම නිසා මේ පළාත්වල වැසියන්ට කෙළින්ම තොග වෙළඳ ආයතනයෙන් ද්‍රව්‍ය ලබා ගැනීමට පහසුකම් සලසන්ට ඕනෑ. සමුපකාර තොග වෙළඳ ආයතනයට අයත් ලොරිවලින්ම ගම්බද පෙදෙස්වලටත් ඒ ද්‍රව්‍ය ලබා ගැනීමට ඉඩ සැලැස්වුවහොත් එයින් විශාල සේවයක් ඉටු වන බව කියන්න කැමතියි. එසේ වුවොත් දැනට බඩු ගැනීම සඳහා කොළඹට පැමිණීමට ඒ පළාත්වල වැසියන්ට වුවමනා වන්නේ නැහැ. එසේ කළොත් ඒ අයට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ, සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් ලබා ගන්න බඩු කොළඹදී විකුණා මුදලක් ගැනීමට. එම නිසා මේ ගැන කල්පනා කර බලන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපේ පළාත්වල විවිධ සේවා සමුපකාර සමිති තිබෙනවා. ඒ විවිධ සේවා සමුපකාර සමිති නියම විධියට කටයුතු කරනවා නම් අපේ ගම්වල සාමාන්‍ය දුප්පත් මහජනතාවට ඇති ප්‍රශ්න රාශියක්ම විසඳා ගන්න පුළුවන් වෙනවා. විවිධ සේවා සමුපකාර සමිති හරියාකාර ක්‍රියා කරනවා නම් ඒ දුප්පත් ජනතාවට ඔවුන්ගේ බඩු ඒ සමිතිවලට විකුණා සෑහෙන මිලක් ලබා ගන්න අතර තමන්ට අවශ්‍ය බඩුද අඩු මිලකට ලබා ගන්න පුළුවන් වෙනවා. නමුත් අවාසනාවකට මෙන් කොයි තරම් හොඳ පරමාර්ථයක් ඇතිව පටන් ගත් ව්‍යාපාරයක් වුවත් එයින් අපේ ගම්බද ජනතාවට නියම ප්‍රයෝජනය ලැබෙන්නේ නැහැ. ඊට හේතුව ඒ සමිති තුළට නොයෙකුත් විධියේ ප්‍රතිගාමී කොටස් ඇතුළත් වීමයි. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) ඇමති ධුරය දැරූ කාලයේදී යම් යම් පුද්ගලයින් මේවායින් පැත්තකට කිරීමට විශාල උත්සාහයක් ගත්තා. ඒ විධියට නීති ඇති කොට මේ සමිතිවල බලය අල්ලා ගෙන සිටින ප්‍රතිගාමී පිරිස්, ඒ වාගේම ඒවාට රිංගා ගෙන සිටින කළු කඩකාරයින්, ඒවායින් ඉවත් නොකළොත් පොදු මහජනතාවට ලැබිය යුතු ප්‍රයෝජන ලැබෙන්නේ නැහැ. ඒවා ලබන්නේ එක්කෙනෙක් දෙන්නෙක් නැතිනම් අතලොස්සක් පමණක් වන්නට පුළුවනි. අද සමහර සමිති තිබෙනවා නමින් පමණක් සමිති වශයෙන්, මුදල් අතින් බංකොලොත්. කළමනාකරුගේ සල්ලිවලින් පමණක් ගෙන යන සමිති තිබෙනවා. ඒ සමිති සම්පූර්ණයෙන්ම පාලනය කරන්නේ කළමනාකාරයායි. සමිතියේ සභාපති ලේකම් භාණ්ඩාගාරික යන සියලුම නිලධාරීන් ඔහු යටතේ සිටින්නේ. සමහර විට ඒ සමිතිවල රැස්වීම් අවුරුදු දෙක තුනකින්වත් පවත්වන්නේ නැහැ. ඒ නිසා එවැනි සමිති සම්පූර්ණයෙන්ම අවලංගු කරන ලෙස මම ඉල්ලා සිටිනවා. එසේ නොකොට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් උඩ තම නිලධාරීන් තෝරා ගැනීමේ අයිතිය සාමාජිකයන්ට තිබිය යුතු යයි කීමෙන් පමණක් නම් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. මන්ද? අද ගම්වල සිටින සාමාන්‍ය මහජනයාට වුවමනාව තිබුණත් මෙවැනි සමිතිවල බලය අල්ලා ගෙන සිටින නිලධාරීන් අයින් කිරීමට පුළුවන්කමක් නැහැ. ගමේ සිටින බලපුළුවන්කාරයිනුයි, ඒ සමිතිවල නිලතල අල්ලාගෙන සිටින්නේ. සාමාන්‍ය දුප්පත් අය නොවෙයි. එම නිසා සාමාන්‍ය අයට ඔවුන්ට විරුද්ධව ඉදිරියට ගොස් කටයුතු කිරීමට පුළුවන්කමක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. ආර්. රත්නායක මයා.]

එවැනි සමිතිවල රැස්වීම් තිබුණත් සාමාන්‍ය අය ඒ රැස්වීම් ඉදිරියට ගොස් අර ප්‍රබල පිරිසට විරුද්ධව යමක් කීමට ඉදිරිපත් වන්නේ නැහැ. එසේ නොකරන්නේ, කළොත් ඒ ගමේ ජීවත් වන්නට නුපුළුවන් නිසයි. එවැනි තත්ත්වයකයි අද සමහර විවිධ සේවා සමුපකාර සමිතිවල සාමාජිකයින් සිටින්නේ. එම නිසා නියම විධියට වැඩ නොකරන සමිති පිළිබඳව පරීක්ෂා කොට බලා හරියාකාර රැස්වීම් නොපවත්වන, හරියාකාර කටයුතු නොකරන, සමිති අවලංගු කොට ඒවා සමුපකාර සංගමයට භාර දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. සමහර විට එසේ කිරීම නුසුදුසු යයි සමහර මන්ත්‍රීවරුන් කියන්න පුළුවනි. එසේ නම් සිදු වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අනුව ඒ අයථා වැඩ ගෙන යන පිරිසට රට ගසා කෑමට ඉඩ දීමටයි. මගේ කොට්ඨාශයේ—මාවනැල්ල ප්‍රදේශයේ—තිබෙන එවැනි විවිධ සේවා සමුපකාර සමිති ඒ ලෙස භාර දුනහොත් ඉන් මහජනයාට යම්කිසි සේවයක් ලබා ගන්න පුළුවන් වෙනවා. මේ කාරණා ගැන ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

පූ. භා. 10.45

සමුපකාර පරීක්ෂකවරුන් ඔවුන්ගේ වැඩ හරියාකාර නොකරන නිසයි බොහෝ තැන්වල මෙවැනි ප්‍රශ්න මතු වන්නේ. හරියාකාර වැඩ කරන උදවියත් සිටිනවා. නමුත් එසේ නොකරන උදවිය නිසයි බොහෝ තැන්වල කරදර ඇති වන්නේ. සමුපකාර කඩේ පරීක්ෂා කිරීමට යන සමහර පරීක්ෂකවරුන් මැනේජර් සමග මිත්‍ර වී ඔහුගෙන් අරක්කුත් බී වෙනත් සංග්‍රහයනුත් විඳ සමහර විට මැනේජර්ගේ ගෙදරින් දවල් කෑමත් කාලා යනවා මිස ඒ කඩවල කෙරෙන වැඩ කටයුතු සම්බන්ධයෙන් නියම විධියේ සෝදිසියක් කරන්නේ නැහැ. සමහර අය වංක නිසා ඔය විධියේ දේ සිදු වෙනවා. මැනේජර්ගෙන් ප්‍රයෝජන ගන්ට බලා පොරොත්තු වන මේ සමුපකාර පරීක්ෂකවරුන්ට තමන්ගේ රාජකාරිය හරියාකාර කරන්ටත් බැහැ. ඒ නිසා තමයි සමුපකාර විවිධ සේවා සමිති මාර්ගයෙන් නියම සේවයක් ලබා දෙන්ට බැරි වී තිබෙන්නේ. මිල පාලක පරීක්ෂකවරුන් පත් කර ඉන්නවා. මේ අය සෑම ප්‍රදේශයකම වාගේ දකින්ට ලැබෙනවා. වරින්වර මේ පරීක්ෂකවරුන් කඩවලට ගිහිල්ලා බඩු අල්ලනවා. නමුත් ඒ අය ඉන්පසු නඩු පවරන බවක් නම් අපට පෙනෙන්නෙ නැහැ. දුප්පත් වෙළෙන්දෙකුගේ කඩයකට ගිහිල්ලා බඩු ඇල්ලුවොත් නම් නොවරදවාම නඩු දමනවා ඇති. මේ මිල පාලක පරීක්ෂකවරුන්ට තොග වෙළෙන්දන් අහු වෙන්නෙ නැහැ. හාල් මැස්සන් කාලක් විකුණපු දුප්පත් මනුෂ්‍යයෙක් අල්ලා ගත්තොත් නම් නඩු දමනවාමයි. ලොකු වෙළෙන්දන්ගෙන් තමන්ට වාසියක් ලැබෙන නිසා එවැන්නක් නොදෙන දුප්පත් වෙළෙන්දන් පමණක් අල්ලා නඩු දමනවා. ඒ නිසා මිල පරීක්ෂකවරුන් ගැනත් ගරු ඇමතිතුමා ටිකක් කල්පනාවෙන් සිටීම සුදුසුයය කියා මා කල්පනා කරනවා.

මිලයට ගන්න බඩු නැතෙයි කියා ගරු ආහාර ඇමතිතුමාට බොරුවට බණිනවා. ඔනෑ කෙනෙකුට ඒ විධියට බණින්න පුළුවනි. නමුත් ගරු ඇමතිතුමා ගත් පියවරවල් නිසා එතුමාට වෙළෙන්දන්ගෙන් නොයෙක් ඇනුම් බැනුම් අහන්න වෙතත් එයින් මහජනයාට නම් ලොකු සෙතක් වුණා. පාලන මිල කුමක්දැයි මහජනයාට හොඳාකාර දැන ගන්ට පුළුවන් විධියට බඩු මිල ප්‍රදර්ශනය කරන ලෙස කළ නියෝගය නිසා මා නියෝජනය කරන මාවනැල්ල කොට්ඨාශයේ බඩු විකුණන සෑම කඩයකින්ම දැන් නියම මිලට බඩු ලබා ගන්ට පුළුවන් වී තිබෙනවා. අල, රතු ලූනු, බොම්බයි ලූනු වැනි දේ සමහර විට පාලන මිලටත් අඩුවෙන් ලබා ගන්ට පුළුවන් වී තිබෙනවා. මෙවැනි දේ කිරීමේදී ගරු ඇමතිතුමාට වෙළඳ මහත්වරුන්ගෙන් අපවාද අහන්න සිදු වෙනවා තමයි. නමුත් මහජනයාට සේවය කිරීමේදී සුළු පිරිසකගෙන් ලැබෙන ඔවැනි අපවාදවලින් අධෛර්ය නොවන මෙන් මා ඉල්ලා සිටිනවා.

සුළු වෙළෙන්දන් විනාශ කරන්ට ගරු ඇමතිතුමා උත්සාහ කරනවාය කියා චෝදනාවක් තිබෙනවා. ඒ නිසා සුළු වෙළෙන්දන් තුළ ඇති වී තිබෙන බිය දුරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරමින් සමුපකාර සංගම්වලින් ඒ සුළු වෙළෙන්දන්ටත් නියමිත මිලට බඩු ලබා දීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මාවනැල්ලේ සමුපකාර සමිති සංගමයට ලැබුණු කරවල තොගය සමුපකාර කඩ සමිතිවලටත්, පොත්වලට හාල් බෙදා දෙන පෞද්ගලික වෙළෙන්දන්ටත් ලැබෙන විධියට බෙදා දුන් බව ප්‍රකාශ කරන්ට පුළුවන්වීම ගැන මා සන්තෝෂ වෙනවා. එසේ කරන්ට පුළුවන් වූයේ ඒ කටයුත්ත හා සම්බන්ධ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසුවයි. ඒ අනුව සුළු වෙළෙන්දන්ටත් සෑහෙන ප්‍රමාණයක් කරවල බෙදා හරින්ට අපට පුළුවන් වුණා. එවැනි වැඩ පිළිවෙළක් හැම තැනකම ඇති කරන මෙන් ඉල්ලා සිටිනවා.

තේ පිළිබඳවත් ගරු මන්ත්‍රීවරුන් සඳහන් කර තිබෙනවා. වත්තල ගරු මන්ත්‍රී තුමා (ජයසිංහ මයා.) වැදගත් දෙයක් කීවා. තේ නිපදවන ප්‍රදේශයක් හැටියට සලකනු ලැබුවත් අපේ පළාත්වල පවා හොඳ වර්ගයේ තේ ලබා ගැනීමේ අමාරුවක් තිබෙන බව ගරු ඇමතිතුමාට මතක් කරන්ට ඕනෑ. බොහෝ විට අහක දමන තේ කොළ තමයි අපට ලබා ගැනීමට සිදු වන්නේ. ඒ නිසා තේ නිපදවන පළාත්වලට පමණක් නොව ලංකාවේ හැම ප්‍රදේශයකටම ඉතා හොඳ තේ ලබා ගැනීමට පුළුවන් වැඩ පිළිවෙළක් සමුපකාර සමිති මාර්ගයෙන් හෝ ඇති කර දෙනවා නම් හොඳයි. පිටරටවලට ටිකක් අඩුවෙන් වික්කත් අපේ රටේ ඉන්න අයටත් අපේ රටේ නිපදවන හොඳම හොඳ තේ ලබා ගැනීමට අවස්ථාවක් තිබෙන්ට ඕනෑ. තේ නිපදවන රටක ඉන්න අයටත් හොඳ තේ නොලැබෙනවා නම් ඒක ලොකු අපරාධයක්. ඒ නිසා ඒ ගැන සලකා බලන මෙන් ඉල්ලා සිටිනවා.

පෙට්‍රල් සංයුක්ත මණ්ඩලය, රක්ෂණ සංයුක්ත මණ්ඩලය, වැනි ආයතන ගැන මගේ දැනුම අඩුයි. ඒ නිසා ඒ ගැන වැඩි යමක් කියන්න අදහස් කරන්නේ නැහැ. එහෙත් වෙනත් සංයුක්ත මණ්ඩලවල වැඩ කෙරෙන ආකාරය ගැන අපට දැන් සෑහෙන අවබෝධයක් ලැබී තිබෙනවා. ඒවායේ වැඩ සාර්ථක නොවීමට එක් ප්‍රධාන හේතුවක් වී තිබෙන්නේ ඒවායේ යම් ස්ථානාන්තරයක ඇබෑර්තුවක් හෙවත් පුරප්පාඩුවක් ඇති වුණාම ඒ සඳහා ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් හෝ විශ්ව විද්‍යාලයකින් හෝ ලබා ගත් උසස් අධ්‍යාපන සුදුසුකම් ගැන විශෙෂ සැලකිල්ලක් දක්වීමය කියන්ට පුළුවනි. බී. ඒ. උපාධිය ලබා තිබෙනවාද, එහෙම නැත්නම් එම්. ඒ. පාස් කරලා තියෙනවාද, යනාදි වශයෙන් සොයා බලා පත්වීම් දෙනවා මිස ඒ ඒ පදවිය සඳහා නැතුවම බැරි විශෙෂ සුදුසුකම් ගැන බැලීම අඩුයි. එයින් සංයුක්ත මණ්ඩලවල වැඩ කඩාකප්පල් වෙනවා. විභාග පාස් කළ අය තුළ සාමාන්‍ය ජනතාව කෙරෙහි කැක්කුමක් නැහැ, ජාතියට ආදරයක් නැහැ. ඒ අයට වුවමනා කරන්නේ තමන්ගේ තනතුර තබා ගැනීමට මිස, එසේ තබා ගනිමින් උසස් තත්ත්වයක වැජඹෙන්නට මිස, සාමාන්‍ය ජනතාවගේ ප්‍රශ්න විසඳීමට නොවෙයි. එම නිසා ඒවාට නිලධාරීන් පත් කිරීමේදී ඒ ව්‍යාපාරය ගැන දැනීමක් තිබෙන අය මෙන්ම මේ රටේ මහජනතාව ගැන අවංක කැක්කුමක් තිබෙන අය තෝරා ගන්න ඕනෑ. එසේ නැතිව උසස්වීම සඳහා මේවාට රිංගා ගැනීමට උත්සාහ කරන අයට ඉඩ දුන්නොත් ඒ ව්‍යාපාර සාර්ථක කර ගැනීමට ලැබෙන්නේ නැහැ. නොයෙකුත් චෝදනා ඉදිරිපත් වුණත්, අවංක නිලධාරීන්, දක්ෂ නිලධාරීන්, පත් කිරීම ගැන මම ගරු ආහාර ඇමතිතුමාට ස්තුති කරනවා. කෙතරම් දුරට චෝදනා ආවත්, ඒවාට භය වන්නේ නැතිව නියම විධියට වැඩ කටයුතු කරගෙන ඉදිරියට යන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලනවා.

ගරු සභාපතිතුමනි, සහතික මිළට වඩා වැඩි මිළට බඩු විකුණන වෙළෙන්දන්ට මීට වඩා තද දඬුවම් දෙන ලෙසත් මම ඉල්ලා සිටිනවා. ලක්ෂයක් දෙකක් තියෙන මනුෂ්‍යයෙකුට රුපියල් දාහක් දෙදාහක් දඩ ගැහුවාට ඒ මනුෂ්‍යයාට දැනෙන්නේ නැහැ; රිදෙන්නේ නැහැ. එම නිසා වැඩි මිළට බඩු විකිණීම ගැන දඩ ගහන්නේ නැතුව හිරේ යැවීමටම නීති සකස් කරන ලෙස මම ඉල්ලා සිටිනවා. එසේ නොකළොත් සාමාන්‍ය ජනතාව ගසා කන කළු කඩ කාරයන්ගෙන් ඒ සාමාන්‍ය ජනතාව බේරා ගන්නට පුළුවන් කමක් නැහැ. එසේම අපේ රටෙන් පිටරට යවන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. ආර්. රත්නායක මයා.]

නොයෙකුත් දේවලට පුළුවන් තරම් වැඩි මිළක් ලබාගන්නට අප උත්සාහ කරන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, අපේ පළාත්වල ජනතාව පුවක් කරුංකා කර විකිණීමෙන් විශාල ආදායමක් ලබා ගන්නා බව ඔබතුමා දන්නවා. එසේම පෙති පුවක් විකිණීමෙනුත් අපේ ගම්බද ජනතාවට විශාල ප්‍රයෝජනයක් ලැබුණා. නමුත් අද මේ පෙති පුවක් සහ කරුංකා පුවක් කිසිම මුදලකට විකුණා ගැනීමට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. අපට ආරංචි පිළිවෙළට ඊට හේතුව ඉන්දියාවේ වෙළඳපොළේ මේ පුවක් ආදිය විකිණීමට අවසර නොදීමයි. ඒවා විකිණීම නවත්වා තිබෙන බවයි, අපට දැන ගන්නට ලැබී තිබෙන්නේ. එම නිසා ඉන්දියානු ආණ්ඩුව සමඟ සාකච්ඡා කර මේ ද්‍රව්‍ය අලෙවි කර ගැනීමට අපේ ගම්බද ජනතාවට අවසථාව ලබා දෙන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ ද්‍රව්‍ය විකිණීමෙන් ඒ දුප්පත් ජනතාවට ලොකු ආදායමක් ලැබුණ නිසා, මේවා විකුණා ගන්නට බැරිවීම අද ලොකු ප්‍රශ්නයක් වී තිබෙනවා.

මෙතෙක් කල් පෞද්ගලික වෙළෙන්දන් අතේ තිබූ හාල් ආදිය ඇදීමේ කොන්ත්‍රාත් සමුපකාර සංගම්වලට පැවරීම ඉතා හොඳ වැඩ පිළිවෙළක් බව මම මේ අවසථාවේදී කියන්න කැමතියි. ඒ කොන්ත්‍රාත් කාරයන් අතේ තිබූ බඩු ඇදීමේ වැඩ පිළිවෙළ සමුපකාර සංගම්වලට පවරන විට ඒ පෞද්ගලික ලොරි හිමියන් ළඟ වැඩ කළ කම්කරුවන් සමුපකාර සංගම්වල වැඩ කිරීමට ගැනීමට සලස්වන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. සමහර ලොරි හිමියන් ළඟ මේ කම්කරුවන් විස්සතිහ වැඩ කරනවා.

ගරු සභාපතිතුමනි, මීට වඩා වැඩි යමක් කියන්නට මම අදහස් කරන්නේ නැහැ. විවිධ සේවා සමුපකාර සමිතිවල වැඩ හරියාකාර කිරීමට සලස්වන ලෙස මම නැවතත් ඉල්ලා සිටිනවා. ඒ කඩ සමිති මේ විධියට තියෙන්නට ඉඩ දුන්නොත් අප අදහස් කරන විධියේ නියම ප්‍රයෝජනයක් ඒ සමිතිවලින් ලබා ගැනීමට බැහැ. ලංකාවේ නීති කෙසේ වුණත්, හරියාකාර වැඩ කෙරෙන්නේ නැති සමිති, මාවනැල්ල ආදී ප්‍රදේශවල තිබෙන සමිති, සම්පූර්ණයෙන් අවලංගු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. சில்வா)
(Dr. W. D. de Silva)

ගරු සභාපතිතුමනි, මේ ඇමති අංශයේ වැඩ පිළිවෙළ ගැන වචන සවලපයක් කියන්නට ඕනෑ. අයවැය සම්බන්ධවත් මේ රටේ අයබදු ගැනීම සම්බන්ධවත්, වෙළඳාම් සම්බන්ධවත්, කොළඹ නගර සභාවේදී එක්සත් ජාතික පක්ෂය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවලට මා අතුරු යෝජනාවක් ගෙනාවා. එක්සත් ජාතික පක්ෂයේ යෝජනාව වූයේ මේ අයවැය ලේඛනය පිළිගන්න බැරි බවයි. අයවැය ලේඛනය නොපිළිගන්නා අතර, දුප්පත් මහජනතාව මත පටවා තිබෙන අයබදු මේ රටේ සිටින විදේශික වෙළෙන්දන් පිට පැටවිය යුතු යයි මම අතුරු යෝජනාවක් ඉදිරිපත් කළා. එම අවසථාවේදී කොළඹ නගර සභාවේ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම මගේ අතුරු යෝජනාවට විරුද්ධ වුණා.

පූ. භා. 11

ගරු සභාපතිතුමනි, අපේ රටේ වෙළඳාම —මා මෙහිදී විශෙෂයෙන් සඳහන් කරන්නේ උසස් පන්තියේ වැදගත් වෙළඳාමයි —රැඳී තිබෙන්නේ ලාංකිකයන් අතේ නොවෙයි, විදේශිකයන් අතේයි. වත්තල ගරු මන්ත්‍රීතුමා (ජයසිංහ මයා.) තේ වෙළඳාම ගැන කීවා. තේ නිපදවීමත්, තේ අලෙවි කිරීමත්, තේ බෙදා හැරීමත් කියන සියලු දේම රැඳී තිබෙන්නේ විදේශිකයන් අතේයි. ඒ බව සමහරුන්ට අමතක වී තිබෙනවා. සමහරුන් වෙළඳාම ගැන කියන විට කල්පනා කරන්නේ සුළු වෙළෙන්දන් කරන වෙළඳාම ගැන පමණයි. සුද්දන්ගේ කාලයේ වාගේම, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ වාගේම, අදත් වැදගත් වෙළඳාම පවතින්නේ සුද්දන්ගෙ අතේයි. දුප්පත් මහජනතාව මත පැටවී තිබෙන බදු බර සැහැල්ලු කරගැනීමේ චේතනාවෙන් කොළඹ නගර සභාව ඉදිරියට ගෙන ආ අතුරු යෝජනාවට විරුද්ධව එක්සත් ජාතික පක්ෂය ඡන්දය පාවිච්චි කළා. වැඩ කරන සාමාන්‍ය ජනතාවගේ කර පිට පටවා ඇති බදු බර ඔවුන් වෙතින් ඉවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර ඒ බදු බර සියල්ලක්ම විදේශීය වෙළෙන්දන්ගේ කර පිට පැටවීම සඳහා ගෙන ආ අතුරු යෝජනාවට විරුද්ධව ඒ අය ඡන්දය දුන්නා. එය පිළිගත්තේ නැහැ.

අයවැය ලෙඛනය විවේචනය කළාට පමණක් මදි. එය විවේචනය කරන අතර අළුත් යෝජනාද ඉදිරිපත් කරන්න ඕනෑ. සමහර අය විවේචනයට බසින්නේ වෙන වෙනත් නොයෙකුත් අදහස් උඩයි. නමුත් වගකීමක් ඇති මන්ත්‍රීවරුන් වශයෙන් මේවා විවේචනය කරන අය එසේ විවේචනය කරන අතරම මේවාට සුදුසු අළුත් වැඩ පිළිවෙළවල්ද දැනගැනීම සඳහා ඉදිරිපත් කරන්න ඕනෑ. වැදගත් අදහස් ඇති, උනන්දුවක් ඇති මන්ත්‍රීවරුන් සහ දෙශපාලන පක්ෂ මේ බව සිය යුතුකමක් හැටියට සලකන්න ඕනෑ. මෙම අයවැය ලෙඛනයේ විවේචනය කළ යුතු නොයෙකුත් අංශ තිබෙනවා. මේ පැමිණ තිබෙන්නේ වෙළඳාම පිළිබඳ අංශයයි. මෙය විවේචනය කරන අතරම මීට සුදුසු අළුත් වැඩ පිළිවෙළවල්ද යෝජනා කළ යුතුයි. අපේ වැඩ පිළිවෙළවල් මොනවාද කියා මහජනයා දැන ගත යුතුයි. දෙශපාලන පක්ෂවලට අතීතයක් තිබෙනවා. ඒවායේ අනාගතය ගැන හිතාගන්න පුළුවන් වන්නේ ඒවායේ අතීතය ගැන බැලීමෙන් පසුවයි. මා තව වරක් කනගාටු වෙනවා එක්සත් ජාතික පක්ෂය යට කියන ලද අතුරු යෝජනාවට විරුද්ධ වීම ගැන.

ගරු සභාපතිතුමනි, සංයුක්ත මණ්ඩල කීපයක් මේ අමාත්‍යාංශය යටතේ තිබෙනවා. සංයුක්ත මණ්ඩල ආරම්භ කරන විට ඒ ගැන අප සතුටු වුණා. තෙල් සංයුක්ත මණ්ඩලය, ඉන්ෂුවරන්ස් සංයුක්ත මණ්ඩලය, ආදිය සකස් වීම ගැන අප සතුටු වුණා. විදේශිකයන් සතු වෙළඳාම් සියල්ලක්ම ජාතික සන්තක කරන වැඩ පිළිවෙළවලට අප සියලු දෙනාම සතුටුවෙන්න ඕනෑ. කෙසේ වෙතත් මා එක්තරා වැඩකට නම් අසතුටු වුණු බව මතක් කරන්න ඕනෑ. තෙල් සංයුක්ත මණ්ඩලය පිළිබඳ කායර්යේදියි මා අසතුටු වුණේ. බාගෙටයි එය ගත්තේ. බාගෙට ගැනීමේ වැඩ පිළිවෙළට මා නම් කවදාවත් සතුටු වන්නේ නැහැ. එම නිසයි මා අසතුටු වුණේ. ගන්නවා නම් සම්පූර්ණයෙන්ම ගන්න ඕනෑ. බාගෙට කරන වැඩ අඩ පණ වෙනවා. ඒවා කඩා කප්පල් කිරීම සඳහා කුමන්ත්‍රණ ඇති වෙනවා. කොහොම කිව්වත් අපි තවම ඉන්නේ සුද්දන්ගෙ යටතේයි. රටේ ආර්ථික තත්ත්වය අනුවයි දෙශපාලන දියුණුව ඇති වන්නේ. අදත් වැඩි සම්බන්ධකම් තියෙන්නෙ අධිරාජ්‍යවාදීන් සමගයි. එම නිසා බාගෙට ගැනීම උඩ මේවා කඩාකප්පල් වෙනවා. බාගෙට ගැනීම, බාගෙට හිටීම, බාගෙට වාඩිවීම, ඔය ආදී වශයෙන් නම් කළ හැකි බාගෙට කරන කොයි වැඩ කටයුතුත් සාර්ථක වන්නේ නැහැ. තෙල් ගෙන්වීම, බෙදා හැරීම, වැනි සියල්ලක්ම ජාතිය සන්තක කරන්ට ඕනෑ. බාගෙට කළොත් අඩපණ වෙනවා. බාගෙට කළොත් කිසිවක් සාර්ථක වන්නේ නැහැ. ගරු ඇමතිවරයාගේ යෝජනාවට මා පක්ෂ වුණු බව ඇත්තයි, නමුත් මා කියන්නේ ඛනිජ තෙල් සම්බන්ධ සියලුම කටයුතු එක පාරටම රජයට ගන්න ලෙසයි. බාගෙට කරන්න එපා. බාගෙට කළොත් සුද්දන් ඉන්නේ ඒවා කඩාකප්පල් කිරීමටයි. යටත් විජිත රටවල වැඩ පිළිවෙළ ඒකයි. සුද්දන්ගේ වැඩ පිළිවළ ඒකයි.

ඉන්ෂුවරන්ස් ව්‍යාපාරය අරගෙන තිබෙන්නෙත් බාගෙටයි; කාලටයි. බැංකු පිළිබඳවත් ඒ විධියමයි. අරගෙන තිබෙන්නේ ලංකා බැංකුව පමණයි. මේ බැංකු පිළිබඳ අංශය ගරු ආහාර ඇමතිවරයාට අයිති නැති වුණත් ඔහු ඒ ගැන ගරු මුදල් ඇමතිවරයාට බල කරන්න ඕනෑ. බැංකු ජනසතු කිරීම හරියට කරන ලෙස ගරු මුදල් ඇමතිවරයාට බල කරන්න ඕනෑ. ලංකා බැංකුව ලාංකිකයන් ගෙයි. අනෙක් බැංකු සුද්දන්ගෙයි. ලාංකිකයන්ගේ බැංකුව විතරක් ගත්තේ ඇයි? බැංකු බිස්නස් සියල්ලම ජාතිය සන්තක කරන්න ඕනෑ. බාගෙට කරලා නම් කවදාවත් මේ වැඩේ සාර්ථක වන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ සිටින මගේ මිත්‍ර ගරු මන්ත්‍රීන් මේ කරුණු ගැන කල්පනා කර බලන්ට ඕනෑ. සමහර විට බාගෙට කිරීම මුලදී හොඳ දෙයක් වගේ පෙනෙන්ට පුළුවනි; නමුත් අන්තිම වශයෙන් වැඩ පිළිවෙළ යෙදෙන කොට බාගෙට ගත්ත දේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා]

නිසා පිටුපස්සට ගියා වගේ වෙනවා. බැංකු ජනසතු කිරීමේ ස්වරූපය පෙනෙන වා නේද? අරගෙන තිබෙන්නේ ලංකා බැංකුව පමණයි. විදේශිකයන්ගේ බැංකු වලට අත ගසන්න බයයි. එහෙම කරල බෑ. සමාජවාදය ගෙන යන්ට නම් එහෙම කරල බෑ. සමාජවාදය කරා ගිය රටවල් මුලින්ම ජනසතු කෙළේ විදේශික දේපළයි. සවදේශිකයන්ගේ දේපළ ගත්තේ පස්සෙයි. සමහර විට බිස්නස් කරන සවදේශිකයන්ගේ ආධාරය ලබා ගෙනයි, විදේශික බිස්නස් ගත්තේ. තෙල් සංයුක්ත මණ්ඩලයත්, ඉන් ෂුවරන්ස් සංයුක්ත මණ්ඩලයත්, බැංකුත් එකකට එකක් සම්බන්ධයි. ඒ නිසා මේවා බාගෙට ගෙන නියම සමාජවාදයක් ඇති කරන්න බැහැ. ඒ බව හොඳින් ඔළුවේ අච්චු ගසාගන්ට ඕනෑ. විදේශීය වතු යායවල්, විදේශීය බැංකු, කොට්ටම් විදේශීය දේපළ සම්පූර්ණයෙන්ම, ජාතිය සන්තක කරන්ටම ඕනෑ. එසේ නැතිව සවදේශිකයන්ගේ දේපළ පමණක් ජන සතු කළොත් විදේශිකයන් කුමන්ත්‍රණ යොදනවා ඇති. විදේශීය වැඩ පිළිවෙළේ ඉතිහාසය ඒකයි. එම නිසා මෙම කාරණා ගැන වැදගත් ලෙස කල්පනා කරනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

මෙම සංයුක්ත මණ්ඩල ගැන මාව නැල්ලේ ගරු මන්ත්‍රීවරයා (පී. ආර්. රත්නායක මයා.) හොඳ කථාවක් කළා. ඒවා කරන්නේ කොහොමද, කළ යුත්තේ කොහොමද, ඒවායේ පාලනය භාර දිය යුත්තේ කාටද, යනාදිය පිළිබඳව ඒ මන්ත්‍රීවරයා පැහැදිලිව කරුණු ප්‍රකාශ කළා. සමහර ජනසතු ව්‍යාපාරවල උසස් තැන්වලට පත් කර සිටින්නේ ජනසතු ව්‍යාපාරවලට විරුද්ධ අයයි. මේ අමාත්‍යාංශය යටතේ ඇති සංයුක්ත මණ්ඩලවලට පමණක් නොව වෙනත් අමාත්‍යාංශ යටතේ ඇති සංයුක්ත මණ්ඩලවලටත් ඒ විධියේ අය පත් කර සිටිනවා. ගමනාගමන සේවයේත් ඒ විධියේ අය සිටිනවා. මාවනැල්ලේ ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් ඒ විධියේ අය පත් කර සිටිනවා නම් මේ ව්‍යාපාර සාර්ථක වන්නේ කොහොමද? පාඩු වන ආකාරයට මේවා පවත්වාගෙන යන්නේ "මේ රටේ ජනසතු ව්‍යාපාර කරන්න බැහැ; පාඩු වෙනවා" යි බියක් මහජනයා තුළ ඇති කරවීමටයි. පෞද්ගලික බිස්නස්කාරයන්ට මෙම ව්‍යාපාර කරගෙන යෑමට ඉඩ දිය යුතු බවට හැඟීමක් ඇති කරවීමටයි. ජනසතු කළොත් පාඩු වන බවත්, පෞද්ගලික ව්‍යාපාරිකයන්ට දුන්නොත් පාඩු නොසිදු වන බවත්, මහජනයා අතර ප්‍රචාරය කරන්ට, මහජනයා තුළ ඒ අදහස ස්ථිර කරවන්ට, සමහරුන් ක්‍රියා කරනවා. කොට්ටම් ජනසතු ව්‍යාපාරවල මූලික තැන් වලට පත් කරනු ලබා සිටින්නේ ජනසතු වට විරුද්ධ උදවියයි.

එවැනි උදවිය පත් කළාම සිදු වන්නේ ඒ අයත් බිස්නස් කරන්න පටන් ගෙන ජනසතු ව්‍යාපාරය කඩාකප්පල් කර දැමීමයි. එහෙයින් මෙම ව්‍යාපාර මහජනයාටද එපා වී යනවා. ඒ නිසා ජනසතු ව්‍යාපාරයක් සාර්ථක අන්දමට පවත්වා ගෙන යන්ට තමුන්නාන්සේ අදහස් කරනවා නම් ප්‍රධාන වශයෙන් වැදගත් කාරණා තුනක් පිළි අරගෙන ඒ අනුව ක්‍රියා කරන්න ඕනෑ. මෙම ජනසතු ව්‍යාපාරවල දියුණුවට, එම ව්‍යාපාර සාර්ථක කර ගැනීමට, බලවත් පරිශ්‍රමයක් දරණ උදවිය එවැනි ව්‍යාපාරවලට පත් කිරීම පළමුවන කරුණ වශයෙන් සැලකිය හැකියි. එමෙන්ම මෙම ව්‍යාපාරවල වැඩ කරන්නාවූ කම්කරුවන්ගේ සහායද, කම්කරු සංවිධානවල සහායද, ලබා ගන්න පාලක මණ්ඩලය සෑම අවස්ථාවකදීම කටයුතු කළ යුතුයි. එපමණක් නොව, මෙම මණ්ඩලවල පාලන කටයුතු සම්බන්ධයෙන් එක්තරා ප්‍රමාණයක වගකීම් භාරය කම්කරුවන්ට දීමද වැදගත් කරුණක් හැටියට සැලකිය යුතුයි.

මෙවැනි වැඩ පිළිවෙළක් අද වනතෙක් ආණ්ඩුව පිළියෙළ කර නැතුවා පමණක් නොව සමහර සංයුක්ත මණ්ඩලවල සිටින පාලකයින් කම්කරු සංවිධානවලට භය බවද කියන්න සිදු වී තිබෙනවා. මේ බිය නිසාම කම්කරු සංවිධාන කඩාකප්පල් වෙන්න වැඩ පිළිවෙළවල් යොදන සමහර මණ්ඩල තිබෙන බවද මා දන්නවා. ඒ නිසා එවැනි ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන්න එපායයි මා ආණ්ඩුවට කියා සිටිනවා.

තෙල් සංයුක්ත මණ්ඩලය ගැනද මට කරුණු කීපයක් සඳහන් කරන්න වී තිබෙනවා. මෙම මණ්ඩලයට පත් කර සිටින එන්. ඊ. වීරසූරිය මහතා එතැනින් අස් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දැමිය යුතු බව මම කෙළින්ම කියා සිටින්න ඕනෑ. මේ රටේ තිබෙන ලොකු බිස්නස්වල විශාල ධනස්කන්ධයක් යොදා වැඩ කරන මෙවැනි උදවිය සංයුක්ත මණ්ඩලවලට පත් කළාම ඒවා සාර්ථක කිරීම වෙනුවට ඔවුන් කරන්නේ එම ආයතන කඩාකප්පල් කර දැමීමට නොයෙක් විධියේ වැඩ පිළිවෙළවල් යෙදීම බව මා මේ ගරු සභාවේදී කියා සිටින්න ඕනෑ. තමුන්නාන්සේ තෙල් සංයුක්ත මණ්ඩලයේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට බලාපොරොත්තු වෙනවා නම් එම ආයතනයේ සේවයේ යෙදී සිටින කම්කරුවන්ගේ සංවිධානවල සහායද ලබා ගෙන දැනට මේවා අල්ලා ගෙන සිටින සුදු අධිරාජ්‍යවාදීන්ට විරුඬව වැඩ පිළිවෙළක් ගෙන යා යුතු බව මා කියන්න ඕනෑ. දැනට මෙම ආයතනයේ සේවය කරන පළපුරුදු සේවකයන්ගේ සහ සංවිධානවල සහය ලබා ගන්න කටයුතු නොකිරීම නිසා ඔවුන් අතර විශාල නොසන්සුන් භාවයක් හටගෙන තිබෙන බව මා කියන්න ඕනෑ. කලක් තිස්සේ මෙම ව්‍යාපාරයේ වැඩ කළ උදවිය එයින් අස් කර දමන්න වැඩ පිළිවෙළවල් යොදා ගෙන යන බවද මට ආරංචියි.

ඉන්ෂුවරන්ස් බිස්නස් එක ජනසතු කළායින් පසු එහි කලක් තිස්සේ වැඩ කළ උදවිය අස් කර දමන්ට යම් යම් වැඩ පිළිවෙළවල් යෙදූ බව තමුන්නාන්සේම දන්නවා ඇති. ජනසතු කිරීමේ එක් ප්‍රතිඵලයක් විය යුත්තේ සේවයේ යෙදී සිටින්න වුන්ට රක්ෂාවල් නැති වී යෑම නොව තව තවත් රක්ෂාවල් වැඩි වීමයි. ඒ නිසා එවැනි වැඩ පිළිවෙළක් යොදන මෙන් තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. අද දින මේ උදවිය සිටින්නේ තද බියකිනුයි. ඒ නිසා මේ අයගේ සංවිධාන සමග සාකච්ඡා පවත්වා මේ අයට නිසි තැන් ලබා දීම සමාජවාදී ආණ්ඩුවක යුතුකමක් බව අපි පිළිගන්න ඕනෑ.

නැව් සංයුක්ත මණ්ඩලයක් පිහිටුවීම පිණිස ගරු ඇමතිතුමා පණතක් ඉදිරිපත් කිරීම ගැන අප සතුටු වන්න ඕනෑ. ඒ නිසා දැනට මෙම ව්‍යාපාරයේ යෙදී සිටින්නාවූ අයගේ සංවිධාන සමග සාකච්ඡා පවත්වා මෙය සාර්ථක කර ගැනීමට ඔවුන්ගේ සහාය ලබා ගැනීමටද වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. එසේ නැතිව සුද්දන් සමග අත්වැල් බැඳ ගෙන ලොකු තැන්වල හිටපු, විශාල කොම්පැනිවල වැඩ කරපු, උදවියම මේ තැන්වලට පත් කළහොත් සමාජවාදී ගමන නැති කර දමන්න, කඩාකප්පල් කර දමන්න, ඒ උදවිය ක්‍රියා කරනවා ඇති.

පූ. භා. 11.15

රක්ෂා නැති නැව් කම්කරුවන් දෙතුන් සියයක් ඉන්නවා. පිටරටවලින් නැව් ආවාම ඒ උදවිය සේවයට ගන්නේ නැතිව ලංකාවේ සිට ඉන්දියාවට ටෙලිග්‍රෑම් යවනවා, නැව්වල වැඩ කිරීමට කම්කරුවන් ගෙන්වාගන්න. අවුරුදු දෙක තුනක් තිස්සේ රක්ෂා නැති, ඉන්ට තැනක් නැති, කන්ට දෙයක් නැති, ඒ පිරිස නිකම් සිටිනවා. ඒ විධියේ වැඩ පිළිවෙළක් අද වරායේ සිදු වෙනවා. මෙම කරුණු ගැන කරුණාවෙන් තමුන්නාන්සේගේ සිත යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ වගේම වෙළෙන්දන් ගැන මත භේද හා තර්ක රාශියක් අද සමාජයේ ඇති වී තිබෙනවා. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ (ඩබ්ලිව්. දහනායක මයා.) අදහස්වලට විරුද්ධව මාවනැල්ලේ ගරු මන්ත්‍රීතුමා (පී. ආර්. රත්නායක මයා.) එක්තරා අදහසක් ප්‍රකාශ කළා. ඇත්ත වශයෙන්ම ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ සමහර අදහස් අපට පිළිගන්න බැහැ. විශේෂයෙන් ඒ මහතා ස්කෝල ප්‍රශ්නය පිළිබඳව ගෙන ගිය ව්‍යාපාරය ගැන නම් කවදාවත් අපට එකඟ වන්ට බැහැ. එහෙත් මේ වෙළෙන්දන් පිළිබඳ ප්‍රශ්නය පැහැදිලිව තෝරා බේරා ගන්න ඕනෑ.

මූලික වශයෙන් මේ රටේ වැදගත් වෙළඳාම් වැඩි වශයෙන් තිබෙන්නේ සවදේශික යන් අතේ නොව සුද්දන් අතේයි. තේ නිපදවීමේ අයිතියෙන් සියයට අනූවක් පමණ තිබෙන්නේ සුද්දන් අතේයි. ලංකාවේ උදවියට අයිතිව තිබෙන්නේ ඉතා සුළු ප්‍රමාණයයි. ඒ වගේම රබර් ව්‍යාපාරය, බැංකු බිස්නස් ආදිය, තවමත් තිබෙන්නේ සුද්දන් අතේයි. මේවායේ මූලික අයිතිවාසිකම් තවමත් තිබෙන්නේ සුද්දන්ට බව තමුන්නාන්සේට මතක් කරන්න ඕනෑ. එම නිසා පහර ගහනවා නම් ඉස්සරවෙලා පහර ගහන්න ඕනෑ කාටද? රටේ ජාතිකයන්ට නොව විදේශිකයන්ට බව සමාජවාදය කරා යන ආණ්ඩුවක් පිළිගන්න ඕනෑ. මේ රටේ වෙළඳාමෙන් සියයට 60කට පමණ අයිතිවාසිකම් කියන්ට පුළුවන් ඒ සුද්දන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා]

ආරක්ෂා සහිතව, හිරිහැරයක් නැතිව, අපට හිනා වෙවී සිටිනවා. සමහර අවස්ථාවලදී අපත් සමග වැඩ කර ආණ්ඩුව පිහිටුවන්ට ආධාර දුන් ඇතැම් සුළු වෙළඳුන්ටයි, අප පහර ගහන්න ලැහැස්ති වී සිටින්නේ. ජන සතු කිරීම් කරනවා නම්, වෙළෙන්දන්ට යම්කිසි පහරක් ගහනවා නම්, පළමුව ඒ පහර විදේශිකයන්ට ගැසීමට යුතුකමක් තිබෙනවා. මේ රටේ වෙළඳාම, බෙදා හැරීම, විදේශිකයන් මිරිකාගෙන සිටිනවා. ඒ උදවිය පැත්තකට කර දේශීය කොටස්වලට පමණක් පහර ගැහීම යුතුකමක් නොවෙයි.

මේ සමාජයේ මිනිසකුට රක්ෂාවක් නැත්නම් ඒ මිනිහා කරන්නේ මොකක්ද? වෙළඳාමක්. ඇත්ත වශයෙන්ම සම හර බිලැක්මාර්කට් කාරයින් සිටිනවා, නමුත් සියලුම වෙළෙන්දන් බිලැක්මාකට් කාරයන් හැටියටයි හංවඩු ගැසී තිබෙන්නේ. දේශීය කොටස ඒ විධියට හංවඩු ගැසීම යුතුකමක් නොවෙයි. මේ රටේ බිලැක්මාකට් කරන්නේ, මේ රටේ වැරදි කුමන්ත්‍රණ වැඩ පිළිවෙළවල් යොදන්නේ, විදේශිකයන් බව පිළිගන්ට ඕනෑ. අධිරාජ්‍යවාදයට විරුද්ධව සටනක් කිරීමට නම්, මේ රටේ ජාතික ව්‍යාපාර නගා ලීමට නම්, විදේශිකයන් අත තිබෙන ඒ අයිති වාසිකම් මේ රටේ ජාතිකයන් සතු කළ යුතු බව අප සියලු දෙනාම පිළිගන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, එම නිසා විදේශික ද්‍රව්‍ය බෙදා හැරීමේ ව්‍යාපාර ජනසතු කරන්න ඕනෑ. තවම එය තිබෙන්නේ සුද්දන් අතේයි. කොළඹ නගරයේ තිබෙන විශාල වෙළඳ කොම්පැනි කාගේද? ඒවා විදේශික සුද්දන්ගේයි. "සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස්" හෙවත් අයිස් කොම්පැනියේ සුද්දා මහත් වෙවී සිටිනවා. එහි බේකරි අංශයේ සේවය කළ සිය ගණනක් පසුගිය දා එළියට දැම්මා. ඒ සේවකයින් අද බඩගින්නේ සිටින අතර සුද්දා තවත් තර වෙනවා. තවම සුද්දා මහත් වෙලා. ඒවයි ජනසතු කරන්න ඕනෑ. ලක්ෂ කෝටි ගණන් මුදල් හම්බ කරන ඒ කොම්පැනි කෙළින්ම ජනසතු කරනවා නම් මේ රටේ වැඩ කරන සාමාන්‍ය ජනතාව, කම්කරු ජනතාව ඒ වැඩ පිළිවෙලට සෑම වේලාවේම සහාය දීමට ඉදිරිපත් වන බවට මට නම් කිසිම සැකයක් නැහැ. වැඩි වශයෙන් වෙළඳාම කරන්නේ සාමාන්‍ය පවුල්වලින් එන උදවියයි. විශේෂයෙන්ම පහත රට දුප්පත් පවුල්වලින් පැමිණි උදවියයි අද සුළු වෙළෙන්දන් වශයෙන් වෙළඳාමෙහි යෙදී සිටින්නේ. කිසිම රක්ෂාවක් නැතිව ජීවත් වන ඒ උදවිය නොයෙක් කරදර හිරිහැර මැද සුළු වෙළඳාමක් පටන් ගෙන වෙළඳාම් කරගෙන යනවා. ඉතින් ඒ උදවිය නොවෙයි. බිලැක්මාකට් කාරයෝ. බිලැක්මාකට් කාරයන් වෙන කවුරුවත් නොවෙයි, මේ රටේ සිටින සුද්දන් බව මම කියන්න කැමතියි. අවුරුදු 450ක් තිස්සේ ඔය වැඩේ කරගෙන ආවා. තවමත් ඒ විධියටම කර ගෙන යනවා. ඒ සුද්දෙ තමයි, බිලැක්මාකට් කාරයෝ. මේ රටේ පමණක් නොව මුළු ආසියාවේම සිටින බිලැක්මාකට් කාරයෝ සුද්දන් බව තමුන්නාන්සේ පිළි ගන්න ඕනෑ. මේ සුදු විදේශිකයන් බිලැක්මාකට් කාරයන් හැටියට අපි කෙලින්ම හංවඩු ගහනවා. එම නිසා මේ සුද්දන්ගේ වෙළඳාම ජනසතු කළ යුතුයි. එසේ නොකර මේ රටේ ජනයාට පමණක් පහර වදින පිළිවෙළට කට යුතු කළොත් එහි වාසිය ලැබෙන්නේ අර සුදු විදේශික අධිරාජ්‍යවාදීන්ට බව තමුන්නාන්සේ පිළිගන්න ඕනෑ.

මන්ත්‍රීවරුන්ගෙන් මම ඉතා ආදරයෙන් ඉල්ලා සිටිනවා මේ කරවල බෙදීමේ ජාවාරම අත්හැර දමන්නය කියා.. කරවල බෙදීමේ වැඩ පිළිවෙළට මන්ත්‍රීවරු සහභාගි වෙන්න එපා. ඒ සඳහා උපදෙස් දීම වෙනම දෙයක්. මහජනතාව මන්ත්‍රීවරුන් පත් කර එවා තිබෙන්නේ මන්ත්‍රීවරුන්ගේ ඥාන ශක්තිය යොදවා මේ රටේ මහජනතාවට දේශපාලන වැඩ පිළිවෙළක් සකස් කර දීමටයි. නමුත් වෙළඳාමට සම්බන්ධවී ඒ කටයුතු කරගෙන ගියොත් හරිහෝ වේවා වැරදි හෝ වේවා පස්සේ නරක චෝදනා මන්ත්‍රීවරුන්ට ඇසීමට සිද්ධ වේවි. එම නිසා වෙළඳාමට කෙලින්ම සම්බන්ධ වෙන්න එපාය කියා මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් කරුණාවෙන් සහ බැගෑපත්ව ඉල්ලනවා. ඒ මොකද, අනාගතයේදී ඒ පිළිබඳ නොයෙකුත් චෝදනා ඇති වෙන්න පුළුවන් නිසයි. එය සමහර විට මන්ත්‍රීවරුන්ගේ දේශපාලන අනාගතයට ඇතිවන කැළලක් වෙන්න පුළුවන්.

ඒ වාගේම සුද්දන් ගැන තවත් වචනයක් කියන්න ඕනෑ. අද සුද්දන් වෙළඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොම්පැනි පිහිටුවා ගෙන තිබෙනවා. ඒවා අයිතිකාර සුද්දෝ එම කොම්පැනිවල වැඩ කරන උදවියට හිරිහැර කරනවා. ගරු ඇමතිතුමා කම්කරු පන්තියෙන් ආ කෙනකු නිසා, මේ රටේ ලිපිකාර පංතියේ සිට පැමිණි කෙනකු නිසා, එතුමා දන්න වා ඇති සේවකයින්ට තිබෙන කරදර මොනවාද කියා. ඒ කොම්පැනි අයිතිකාර යන් එම කොම්පැනිවල වැඩ කරන ලිපි කාර මහත්වරුන්ටත් කම්කරු මහත් වරුන්ටත් නොයෙක් විධියේ හිරිහැර කරනවා. ආණ්ඩුවේ සේවයේ සාමාන්‍ය පංතියේ සිටි තැනැත්තෙක් අපේ ගරු ඇමතිවරයකු වශයෙන් පත්වීම ගැන අපි ආඩම්බර වෙන්න ඕනෑ.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

ඔය කරුණු මේ ශීර්ෂය යටතේ කියන්න ඕනෑ නැහැ. ඒවා කම්කරු අංශ යේදී ගන්න පුළුවනි.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)

මම කියන්නේ සභාපතිතුමනි, කරවල වෙළඳාම ගැනයි. මේ ගරු ඇමතිතුමා ගැන අපි ආඩම්බර වෙන්න ඕනෑ. මේ ඇමති තුමාට ඒක අයිතියි. මේ රටේ ලිපිකාර සේවයේ සිටි ලිපිකාර මහත්මයෙක් මේ තරම් වැදගත් තනතුරකට උසස් වී තිබීම ගැන අපි සියළු දෙනාම සතුටුවෙන්න ඕනෑ. එම නිසා ලිපිකාර මහත්වරුන්ටත් කම්කරු මහත්වරුන්ටත් තිබෙන අමාරු කම් ගැන එතුමා හොඳාකාර දන්නවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

ඔය කරුණු සියල්ලම මීට අදාළ නැහැ. ඒවා කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පැමිණි විට කියන්න පුළුවනි.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)

මෙම ඇමතිතුමා ගැනයි මම කියන්නේ. ලිපිකාර මහත්වරුන් සහ කම්කරු මහත් වරුන් විශාල ධෛර්යයක් ගැනීමෙනුයි මෙම මහතාව අපේ ගරු ඇමති මණ්ඩල යට ඒ දවස්වල පත් කළේ. එම නිසා ඒ උදවියට ඇති අමාරුකම් ගැන අද ක්‍රියා කරන්න ඕනෑ. මම මේ කරුණු කියන්නේ අද ලිපිකාර මහත්වරුත් කම්කරු මහත් වරුත් කනගාටුවෙන් සිටින බැවිනුයි. සමහර අය මට කීවා, දැන් අපේ ඉලංගරත්න ඇමතිතුමාට අපව මතක නැති වෙලා, අප ගැන වචනයක්වත් කථා කරන්නෙ නැහැ, අප ගැන සටන් කරන්නෙ නැහැ, කියා. ඒ අය මේ කාරණය ගැන බොහොම කනගාටුවෙන් ඉන්නවා. මම කීවා, ඇමතිතුමාව තමුන් නාන්සේලා තවම හඳුනාගෙන නැහැ; එතුමා ලොකු මොලයක් තියෙන කෙනෙක්; හරි වෙලාවට පහර දෙන්ට පුළුවන්ය කියා. ගරු සභාපතිතුමනි, ඒ ගොල්ලන්ගේම පැලැන්තියේ, ඒ ගොල් ලන්ගේම ධෛර්‍යයෙන් මේ මන්ත්‍රී මණ්ඩලයට පැමිණි කෙනෙක් මේ වාගේ වැදගත් අවස්ථාවකදී, ඒ කම්කරු ලිපිකරු මහතුන්ට කෙළින්ම පහර වැදී තිබෙන අවස්ථාවකදී, නිශ්ශබ්දව සිටීම ගැන ඒ ලිපිකරු-කම්කරු මහතුන් කනගාටු වී සිටින බව ගරු ඇමතිතුමාට මතක් කර සිටින්ට ඕනෑ. ගරු වෙළඳ ඇමතිතුමා කම්කරු-ලිපිකරු මහතුන්ගේ බල වේගයෙන් මේ සභාවට ඇවිත් ඒ අය වෙනුවෙන් පෙනී සිටින අවස්ථාවේදී ඉතා අමාරු තත්ත්වයේ වැටී සිටින ලිපිකරු වන්-කම්කරුවන්—[බාධාකිරීම්]

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

දැන් ඔය ප්‍රශ්නය ගැන කථා කිරීම අත් හැර දමා වෙනත් එකකට බසිනවා නම් වඩා හොඳයි.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. டி சில்வா)
(Dr. W. D. de Silva)

ගරු සභාපතිතුමනි, මම ගරු ඇමති තුමාට මතක් කිරීමක් වශයෙන් පමණයි කියන්නේ.

මාවනැල්ලේ ගරු මන්ත්‍රීවරයා (පී. ආර්. රත්නායක මයා.) අපේ ඇමතිතුමාට කීවා, භය නැතුව එඩිතරව වැඩ කරන්ට ඕනෑය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා]

කියා. ඇත්ත වශයෙන්ම ගරු ඇමතිතුමා ඒ ආකාරයෙන් වැඩ කරන්ට ඕනෑ. එසේ කළ යුතු බව අපි පිළිගන්න ඕනෑ. සමහර අවස්ථාවලදී ගරු මුදල් ඇමතිතුමාගේ අදහස් අපි පිළිනොගත්තත්, විශෙෂයෙන්ම මේ අයවැය ලේඛනය ගැනත් අප තරයේම විරුද්ධ වුණත්, එතුමා කෙළින් කටයුතු කරනවා. මේ රටේ සුදු අධිරාජ්‍යවාදීන්ට හා ධනපතියන්ට කෙළින්ම වාසි වන අන්දමට, එහෙත් මේ රටේ සාමාන්‍ය වැඩ කරන ජනතාවට සම්පූර්ණයෙන්ම අවාසි වන අන්දමට, සකස් කර ඇති මේ අයවැය ලේඛනයේ ස්වරූපයට මම තරයේම විරුද්ධ වෙනවා. නුමුත් ගරු මුදල් ඇමතිතුමා ගැන එක් කාරණයක් කියන්ට පුළුවනි. එතුමා කීවා, තමුන්නාන්සේලා මොකක් කීවත් මම ඉදිරිපත් කළ දේ කෙළින්ම ඉදිරිපත් කරනවාය කියා. ඇත්ත වශයෙන් ඒ අගය කළ යුතු දෙයක්—හොඳ ගතියක්. සමහර විට මේ පැත්තේ උදවිය කියනවා, කොල්ලෙක්ය කියා. කොල්ලෙක් හෝ වේවා, වෙන කෙබදු අයෙක් හෝ වේවා, කාට පහර වැදුණත් එතුමා කෙළින් කටයුතු කළා. [බාධාකිරීම්]

ගරු සභාපතිතුමනි, ඊළඟට වෙළඳාම ගැනත් වචනයක් කියන්න ඕනෑ. මම නොයෙක් රටවල ඇවිදලා තිබෙනවා. රත්නපුරයේ ගරු මන්ත්‍රීවරයාත් (ඩී. පී. ආර්. වීරසේකර මයා.) පිටරට ඇවිද නොයෙක් කාරණා ඉගෙන ගෙන තිබෙනවා. මමත් ඊයේ පෙරේදා චීනයට ගියා. එහි වෙළඳාම ගැනත් වචනයක් මතක් කරන්ට ඕනෑ. එහි එකම සුද්දෙකුටවත් වෙළඳාම් කරන්ට ඉඩ දෙන්නේ නැහැ. සමාජවාදය කරා යන රටක් වුණත් තව මත් ජාතික වෙළඳුන් එහි ඉන්නවා. විදේශීය වෙළඳුන්ගේ ව්‍යාපාර සියල්ලක්ම වාගේ ජාතිය සතු කර තිබෙනවා. සවදේශ කටයුතු පිළිබඳ අපේ පාර්ලිමේන්තු ලේකම්තුමා (ආරියදාස මහතා) ඊයේ පෙරේදා චීනයට ගිය වේලාවේදී දැක්ක දෙයක් ගැන කී කථාවකින් අපේ කෝවිටේ ගරු මන්ත්‍රීවරයාට (ස්ටැන්ලි තිලකරත්න මයා.) හොඳටම තරහ ගොස් තිබෙන බව පෙනී ගියා. ඒ කථාව—එක පැත්තක ගොනෙක් බැඳලා අනික් පැත්තේ—[බාධාකිරීම්]

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

ඒ කාරණය ගැන කථා කිරීම අත්හැරලා වෙන එකක් ගැන කථා කරන්න.

වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා
(டொக்டர் டப்ளியு. டீ. சில்வா)
(Dr. W. D. de Silva)

මම කියා සිටින්නේ චීනයේ වෙළඳාම ගැනයි. ආරියදාස මහතා [බාධාකිරීම්] චීනයේ මිනිසුන් වැඩ කරන ආකාරය ගැන හොඳට දැක තිබෙනවා. ඒ වාගේම චීනයේ වෙළඳාම ගැනත් දකින්ට ඇතැයි මම කල්පනා කරනවා. නුමුත් කෝවිටේ මන්ත්‍රීවරයා කිපී තිබෙන්නේ එක්තරා වචනයක් ගැනයි.

ගරු සභාපතිතුමනි, ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා පිළිගන්නවා ඇති, චීනයේ ජනතාව වැඩ කිරීමට දක්ෂ, බොහෝම වෙහෙස මහන්සි වී වැඩ කරන ජනතාවක් බව. අපි ඒ ජනතාව පිළිගන්න ධර්මය නොපිළිගත්තත්, ඒ වැඩ පිළිවෙළෙහි එක්තරා ස්වරූපයක් තිබෙන බව පිළිගන්ට ඕනෑ. චීන ජනතාවගේ ආශාව විදේශීය යන්ගේ පාලනය යටතේ තිබෙන වෙළඳ ව්‍යාපාර තම ජනතාවට අයිති කර දීමටයි. අපේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා හොඳ ඥාන ශක්තියක් ඇති වැදගත් මහත්මයෙක්. එම නිසා මා කියන කාරණා එතුමාද පිළිගන්නවා ඇතැයි මම කල්පනා කරනවා. සෑම දාම මහජනයා අතර වැඩ කරන ඒ මහතා මේ වැඩ පිළිවෙළත් මහජනයා අතර ප්‍රචාරය කරාවියයි මම බලා පොරොත්තු වෙනවා. එපමණයි මා මේ ගැන කියන්නේ.

ප. භා. 11.30

මේ අමාත්‍යාංශය ගැන මම විශාල වර්ණනාවක් කිරීමට යන්නේ නැහැ. නමුත් ඇමතිවරයා නම්, අර වත්තල මන්ත්‍රීතුමා (ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා.) කීවාක් මෙන්, වැඩ කරනවා. අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ ගැන නම් අපට එතරම් සතුටු වන්ට බැහැ. විශේෂයෙන්ම තෙල් සංයුක්ත මණ්ඩලයේ පත්වීම් ගැන, ඉන්ෂුවරන්ස් සමාගම්වලින් අස් කළ අය පිළිබඳව කිසිත් නොකිරීම ගැන, විදේශීය ව්‍යාපාරය ආරක්ෂා කිරීම ගැන, ඒ අතර සවදේශිකයන්ට පහර ගැසීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැන, අපට කිසිසේත්ම සතුටු වන්නට බැහැ. අද අපේ දේශීය සුළු වෙළෙන්දන් ඉතා බයකිනුයි සිටින්නේ. විශේෂයෙන්ම රුහුණේ සිටින දුප්පත් වෙළෙන්දන් බයෙනුයි සිටින්නේ. වෙළඳාම නැති වී යන වාටත් වඩා ඔවුන් බය වී තිබෙන්නේ වෙළඳාමක් පටන් ගන්නා විට ඔවුන් "බිලැක් මාකට්කාරයන්" යයි මහජනයා කියන්න පටන් ගන්නා නිසයි. මෙයින් මහත් භේද ඇති වී තිබෙනවා. එවැනි භේද මේ රටට වුවමනා නැහැ. මේ රටේ වෙළඳාම ජාතිය සතු කරන තුරු මූලික වශයෙන් පහර ගැසිය යුත්තේ උඩ රට විදේශීය වතු යායවල් අයත්කර ගෙන සිටින සුද්දන්ටයි. ඒවා ජනසතු කරන්නට බැරි නම් අඩු ගණනේ ජාතිකයන් සන්තක කොට විදේශිකයින් තල්ලු කර දැමිය යුතුයි. එසේ කිරීමෙන් පමණයි, සමාජ වාදය කරා යන්නට පුළුවන් වන්නේ. එසේ නැතිව අධිරාජ්‍යවාදීන්ගේ බලය තිබෙන රටවල විදේශික කොටස් ආරක්ෂා කරමින් දේශිකයන්ට පහර වදින අන්දමින්, වැඩ කරන ජනතාවට පහර වදින අන්දමින්, කටයුතු කළොත් කවදාවත් සමාජවාදය කරා නම් යන්නට පුළුවන් වන්නේ නැහැ. එසේ කිරීමෙන් දිගින් දිගටම අධිරාජ්‍යවාදය කරා යන බවට මට නම් සැකයක් නැහැ.

ගරු ආහාර ඇමතිතුමා සමාජ වාදය ගැන දන්නා කෙනෙක්. එම නිසා ඒ වැඩ පිළිවෙළ මාරු කර කෙලින්ම විදේශීන්ගේ කර උඩ බර පටවන මෙන් මම එතුමාගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. දේශික යන් බය කරන්නේ නැතිව, දේශිකයින්ට ඒ කටයුතු කිරීම සඳහා පහසුකම් සලසා දෙන්නට ඕනෑ. ඔවුන්ගේ බය ඉවත් කරන්නට ඕනෑ. එසේ කළොත් තමයි, සමාජ වාදය කරා යන්නට පුළුවන් වන්නේ. කවදාවත් අපට නිකම්ම සමාජවාදය ලැබෙන්නේ නැහැ. කොයි රටකවත් නිකම්ම සමාජවාදය ඇති වුණේ නැහැ. සමාජවාදය ලබාගත හැක්කේ සටනක් කිරීමෙන් පමණක් බව අපි පිළිගන්න ඕනෑ. ඒ සටන කරන්නට පුළුවන් වන්නේ මේ රටේ දේශිකයිනුත් මේ රටේ වැඩ කරන ජනතාවත් සංවිධානය කර ඒ සංවිධානවල ශක්තිය මුවහත් කර, තවත් ප්‍රබල කර, විදේශීය බලපෑම්වලට විරුද්ධව වැඩ කළොත් පමණයි. මේ රටේ සමාජවාදයක් බිහි කරන්නට වුවමනා නම් එසේ කරන ලෙස ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

ඩබ්ලිව්. දහනායක මයා. (ගාල්ල)
(திரு. டப்ளியு. தகனாயக்க—காலி)
(Mr. W. Dahanayake—Galle)

ගරු සභාපතිතුමනි, වෙළඳ ඇමතිතුමාගේ වැඩ කටයුතු පිළිබඳව ප්‍රශංසා කිරීමට හෝ දොස් පැවරීමට හෝ අපට වඩා පුළුවන් වන්නේ මේ රටේ සිටින පාරිභෝගිකයන්ටයි. අද තිබෙන තත්ත්වය අනුව සාමාන්‍ය මහජනයාට අවශ්‍ය බඩු බොහෝ දුරට හිඟ වී තිබෙනවා. ඒ අතර බොහෝ අවශ්‍ය බඩුවල මිල නැග තිබෙනවා; පාලන මිලට වඩා බොහෝ ඉහළ නැග තිබෙනවා. තමුන්නාන්සේ පරීක්ෂණයක් කර බැලුවොත් පෙනේවි සෑම ගමකම වාගේ අවශ්‍ය ද්‍රව්‍ය ඉතාමත් හිඟ බව. සුදු ලූනු, සියඹලා, රතුලූනු, මසූර් පරිප්පු, කොත්තමල්ලි, කරවල, උම්බලකඩ යන මේ ද්‍රව්‍ය 7 අද හුඟක් හිඟ වී තිබෙනවා. ඒ අතර මේ අවශ්‍ය බඩු නියම මිලට ලැබෙන්නෙත් නැහැ.

ගරු වෙළඳ ඇමතිතුමාගේ වැඩ කටයුතු සම්බන්ධව විනිශ්චය කරන විට ඒ විනිශ්චය දෙන මහජනයාට වුවමනා කරන බඩු ලාබෙටත් පාලන මිලටත් වුවමනා තරම් ලබා ගත හැකි නම් පමණයි එතුමාගේ වැඩ හොඳින් කෙරෙනවාය යනුවෙන් විනිශ්චය කළ හැකි වන්නේ. පසුගිය දා ඒ සම්බන්ධයෙන් මා කරුණක් ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේ ගරු ඇමතිතුමා මෙහි සිටියේ නැහැ. ගම්පහ සමුපකාර තොග වෙළඳ ආයතනයේ රිසිටි පත්‍රයක් එදා මා ඉදිරිපත් කළා. රු. 1.35කට සුදු ලූනු රාත්තලක් ගම්පහ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් විකුණූ බව එයින් ඔප්පු වෙනවා. වෙන වෙළෙන්දෙක් ඔය ගණනට වික්කා නම් ඔහුට විරුද්ධව නඩු පවරන්ට පුළුවනි. සුදු ලූනු වර්ග කීපයක් තිබෙන බව අපි දන්නවා. නමුත් පාලන දැන්වීම්වල තිබෙන්නෙ එක් වර්ගයයි. සත 35 කට හෝ 40 කට විකිණිය හැකි සුදු ලූනු තමන් ළඟ නැති නිසා 1.35 ට විකුණන වෙළෙන්දා අහු වෙනවා. ඒ නිසා පෞද්ගලික වෙළෙන්දා සුදු ලූනු ගෙන්වීම හා වෙළඳාම දැන් නතර කර තිබෙනවා. ඊටත් වඩා අපූරු නිදර්ශනයක් ගරු ඇමතිතුමාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

ලියා එවා ඇති. අගෝස්තු 3 වනදා ගාල්ලේ අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව සුදුදුරු රාත්තල් බාගයක් සත 47ට වික්කා. එහි සිට යාර 100 ක් ඇතින් පෞද්ගලික වෙළෙන්දෙක් සුදු දුරු රාත්තල් බාගයක් සත 45 ට වික්කා. පෞද්ගලික වෙළෙන්දට විරුද්ධව ඒ ගැන දැන් නඩු පවරා තිබෙන නමුත් අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවට කෝ නඩු? නඩු දමන්න කියනවා නොවෙයි. මේ ගැන සෝදිසි කරන ලෙසයි මා කියන්නෙ.

තමුන්නාන්සේ විටින්විට පාලන මිල ගණන් නිකුත් කරන නමුත් ඒවා වලංගු වන කාලය සති දෙකක්ය, සතියක්ය, දින දහයක්ය, දින පහක්ය කියා නියමයක් නැහැ. ගැසට් නිවේදනය නිකුත් වූ වහාම අරන් බැලුවොත් අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන්වත් ඒ මිලට බඩු ගන්න බැරි නම් පෞද්ගලික වෙළෙන්දා කොහොමද ඒ මිලට බඩු විකුණන්නෙ? ඒ ගැනත් තමුන්නාන්සේ කල්පනා කර බලන්න. මා කල්පනා කරන හැටියට නම් වෙළඳ මිල නිකුත් කළ යුත්තේ නියම කාල වේලාවක් අනුවයි. ඒ කාල සීමාව සති දෙකකට වරක් හෝ සතියකට වරක් හෝ වෙන්න පුළුවනි. මිල ගණන් නිකුත් කරන විට එය ගැසට් නිවේදනයක් හැටියට පමණක් නොව කච්චේරිවලින් නිකුත් කරන දැන්වීම් මාර්ගයෙනුත්, ගුවන් විදුලි සේවයෙන් කෙරෙන ප්‍රචාරයන් මාර්ගයෙනුත්, පත්‍රවල පල කරන නිවේදන මාර්ගයෙනුත් මහජනයාට දැන ගන්න සලසනවා නම් ක්වදාවත් ඔය සිදු වුණු දේ—අලෙවි සංවර්ධනය භාර දෙපාර්තමේන්තුවේ ගබඩාව සත 47 කට විකුණු දේ පෞද්ගලික වෙළෙන්දකු සත 45 කට වික්කාම පෞද්ගලික වෙළෙන්දාට විරුද්ධව පමණක් උසාවියේ නඩු පැවරීම වැනි දේ—සිදු වන්නේ නැහැ. අද බඩු හිඟයි. එසේම නියම මිලට බඩු ගන්න නැහැ. හැබැයි, හිඟ නැති සමහර බඩු තිබෙනවා. අර්තාපල්, බොම්බයි ලූනු, මිරිස්, මුං ඇට හිඟ නැහැ. පසුගිය 30 වැනි බදාදා ගාල්ලෙන් ආහාර පාලක නිලධාරිතුමා හමු වීමට ගිය වෙළඳ සේවක සංගමයේ මහත්වරු මේ හිඟ නැති ද්‍රව්‍ය 3 ක් ගැන ඉතා වැදගත් කරුණක් ආහාර පාලකතුමාට පෙන්වා දී තිබෙනවා. ගිය සතියේ අර්තාපල් රාත්තල සමුපකාර සමිතිවල විකුණු පාලන මිල ශත 27 යි, නමුත් පෞද්ගලික වෙළෙන්දා ගිය සතියේ අර්තාපල් රාත්තල ශත 22 ට වික්කා. ගිය සතියේ බොම්බයි ලූනු රාත්තල සමුපකාර සමිතිවල විකුණු පාලන මිල ශත 28යි. පෞද්ගලික වෙළෙන්දා ගිය සතියේ බොම්බයි ලූනු රාත්තල වික්කා ශත 20 ට. එසේම මුං ඇට රාත්තල පසුගිය සතියේ සමුපකාර සමිතිවල විකුණු පාලන මිල ශත 37 යි. පෞද්ගලික වෙළෙන්දා පසුගිය සතියේ මුං ඇට රාත්තල වික්කා ශත 25 ට. සමුපකාරයේ ශත 27 බඩුව ශත 22 ට, ශත 28 බඩුව ශත 20 ට, ශත 37 බඩුව ශත 25 ට, පෞද්ගලික වෙළෙන්දා වික්කා. හිඟයක් නැති ද්‍රව්‍ය තුනක් සමුපකාර කඩේ විකුණන මිලට වඩා අඩු මිලකට පෞද්ගලික වෙළෙන්දා වික්කා. මේ කාරණාව ගරු ඇමතිතුමා ඉතාමත් උනන්දුවෙන් හිතට ගන්න ඕනෑ.

බොම්බයි ලූනු, අර්තාපල් සහ මුං ඇට ඉතාමත් අවශ්‍ය ද්‍රව්‍ය 3 ක්. පෞද්ගලික වෙළෙන්දාට සමුපකාරයේ විකුණනවාට වඩා ශත 5ක් අඩුවෙන් බඩුවක් විකුණන්ට පුළුවන් නම් මේ කාරණා ගැන තව දුරට කල්පනා කරන්ට ඕනෑ නේද කියා මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි. කොහොමද පෞද්ගලික වෙළෙන්දාට ඒ විධියට අඩු මිලට බඩු විකුණන්ට පුළුවන් පිළිවෙළක් ඇති වුණේ? මුං ඇට ගැන ඒ විධියේ වැඩ පිළිවෙළක් කරන්න පුළුවන් නම්, තවත් ද්‍රව්‍ය ගැන ඒ විධියේ වැඩ පිළිවෙළක් ඇති කරන්න බැරිද කියා අපි තව දුරට කල්පනා කර බලන්න ඕනෑ.

අද ගරු ඇමතිතුමාගේ ආහාර බෙදා හැරීමේ ක්‍රමයේ ඇති දුර්වලකම ගැන මම ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. මේ රටේ සාමාන්‍ය ජනයාට බඩු විකුණන්නේ සිල්ලර වෙළෙන්දායි. ඒ ඇත්ත ඇමතිතුමා පිළිගන්න ඕනෑ. මේ රටේ සමුපකාර සමිති තුන් හාරදාහක් තිබෙනවා. නමුත් සිල්ලර කඩ ලක්ෂ දෙකක් තුනක් තිබෙනවා. සිල්ලර වෙළෙන්දා බඩු බෙදා හැරීමේ ක්‍රමයේ ඉතාමත් වැදගත් ශ්‍රේෂ්ඨ ස්ථානයක් දරනවා. නමුත් අද සිදු වී තිබෙන්නේ බෙදා හැරීමේ ක්‍රමයේ ශ්‍රේෂ්ඨ ස්ථානයක් දරන ඒ සිල්ලර වෙළෙන්දාට බඩු ගන්න තැනක් නැති වීමයි. ගරු ඇමතිතුමාගේ නොයෙකුත් රෙගුලාසි තිබෙනවා; පණත් තිබෙනවා. සිල්ලර වෙළෙන්දා දෙගොල්ලකු අතරට අහු වෙලා සිටිනවා. එක පැත්තකින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිල්ලර වෙළෙන්දට විරුද්ධව ආණ්ඩුවේ නීති රීති තිබෙනවා. අනික් පැත්තෙන් දැන් තිබෙන ක්‍රමය සිල්ලර වෙළෙන්දාට අවහිර යක් වී තිබෙනවා. ඒ ක්‍රමය අනුව සිල්ලර වෙළෙන්දාට බඩු ගන්න තැනක් නැහැ. සිල්ලර වෙළෙන්දා තොග වෙළෙන්දා ගෙන් බඩු ගන්න ගියොත් තොග වෙළෙන්දා කියන්නේ කුමක්ද? අපට ඔය මිලට බඩු දෙන්න බැහැ. තමුසෙට ඕනෑ නම් වැඩි මිලට ගන්න, නැත්නම් යන්න, කියනවා. එම නිසා බඩු බෙදා හැරීමේ ක්‍රමයේ ඉතාමත් වැදගත් තැනක් ගන්න සිල්ලර වෙළෙන්දාට අද තිබෙන ක්‍රමය අනුව බඩු ගන්න තැනක් නැති වී තිබෙනවා. මේකයි අද ඇති වී තිබෙන පටලැවිල්ලට මූලික හේතුව. නියම මිලට ප්‍රමාණවත් අන්දමට සිල්ලර වෙළෙන්දාට බඩු ලබාගැනීමට මාර්ගයක් සැලසී නැති නිසයි එසේ සිදු වී තිබෙන්නේ.

පූ. භා. 11.45

සී. ඩබ්ලිව්. ඊ. එක මගින් සිල්ලර කඩ විවෘත කර තිබෙනවා. වෙන්නප්පුව, තලාතුඔය, බම්බලපිටිය සහ බලල්ල වැනි පළාත්වල විවෘත කර තිබෙන බව මා දන්නවා. හෙට අනිද්දාට රත්ගමත් එකක් විවෘත කරන්න යනවා. මේවායින් ඇති ප්‍රයෝජනය මොකක්ද? මේ සිල්ලර වෙළඳ ආයතනවල නියම විධියේ ගණන් තැබීමේ ක්‍රමයක් තිබෙනවාද? ඒ බිල්පෝවල පොත්පත් හරියාකාර තබනවාද? නැහැ. ඒවායේ පාලන කටයුතු නිසි විධියට කෙරෙන්නේ නැහැ. නියම විධියට එකවුන්ට් තබන්නෙත් නැහැ. නියම විධියට "සුපවයිස්" කෙරෙන්නෙත් නැහැ. තමුන්නාන්සේට කියන්න පුළුවන්ද, මේ සිල්ලර වෙළඳ සැල් කොහේ කොහේ විවෘත කර තිබෙනවාද කියා? ඒවායින් කොපමණ ආදායමක් ලැබෙනවාද කියා තමුන්නාන්සේට කියන්න පුළුවන්ද? දිනපතා සතිපතා සහ මාස්පතා ඒවායේ කෙරෙන වෙළඳාම් ගැන නියම විස්තරයක් දෙන්න පුළුවන්ද? ඒවායේ ලාභය කොපමණද, ඒවායේ සේවය කරන්නන්ට ගෙවනු ලබන පඩි නඩි කොපමණද, එම ආයතන පවත්වන තැන්වලට ගෙවන ගෙවල් කුලී කොපමණද, යන ප්‍රශ්නවලට සෑහෙන පිළිතුරු සපයන්න තමුන්නාන්සේට පුළුවන්ද? මේ විධියට විවෘත කර ගෙන යන සිල්ලර වෙළඳ සැල් සමහර විට තව අවුරුද්දක් දෙකක් මේ ආකාරයටම පවත්වාගෙන ගියොත්, ඒවා නඩත්තු කරන්න ලංකාණ්ඩුවේ තිබෙන සල්ලි මදි වේවි. අලාබ පියවන්ටම මදි වේවි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
එහෙම වෙන්නෙ නැහැ. මා ඒ ගැන බලා තිබෙනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)
තලාතුඔයේ වෙළඳ සැලෙන් මසකට කොපමණ ආදායමක් ලැබෙනවාද? එහි සේවකයන්ට කොච්චර පඩි ගෙවනවාද, කියා තමුන්නාන්සේට කියන්න පුළුවන්ද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
පෙන්වන්න පුළුවනි.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)
ඒ ගැන අපි තමුන්නාන්සේට බොහොම ස්තුතිවන්ත වෙනවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
ඒවායින් කෙරෙන්නේ සිල්ලර වෙළඳාම පමණක් නොවෙයි, තොග වෙළඳාමත් කෙරෙනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)
තමුන්නාන්සේ තවම ඒ ඒ පළාත්වලට තොග වෙළඳ ආයතන පිහිටුවීම වැඩි කළේ නැහැ. ගාලු දිස්ත්‍රික්කයට තියෙන්නෙ එක තොග වෙළඳ සැලයි. සෑම පත්තුවකටම, සෑම ඩී. ආර්. ඕ. ප්‍රදේශයකටම, තොග වෙළඳ ආයතනය බැගින් තියෙන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

සී. ඩබ්ලිව්. ඊ. එකේ වැඩ පිළිවෙළ නියම විධියට ක්‍රියාවේ යොදවනවා නම් කළ යුත්තේ එයයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒ සම්බන්ධ සැලැස්මක් තිබෙනවා. ඒ අනුව ක්‍රියා කරනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

ලංකාවේ සෑම කෙරවලකටම සී. ඩබ්ලිව්. ඊ. තොග වෙළඳ ආයතනයක් තියෙන්න ඕනෑ. එසේ කොට සිල්ලර වෙළෙන්දාට ඒවාසින් බඩු ගැනීම සඳහා අවස්ථාව සලසා දෙන්න ඕනෑ. එසේ කළොත් සිල්ලර වෙළෙන්දාට අද දවසේ මුහුණ පාන්ට සිදු වී තිබෙන කරදරවලින් ඔහුට මිදෙන්න පුළුවන්කම ලැබෙනවා ඇති. තවම නම් ඒ විධියට ක්‍රියා කර නැහැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒ ගැන කටයුතු කරන්ට සැලැස්මක් තිබෙනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

සැලැස්මක් තිබෙන බව ඇසීම සතුටට කරුණක්. එය ඉක්මනින්ම ක්‍රියාවට යොදවා අද දවසේ මුහුණ පාන්ට සිදු වී තිබෙන දුෂ්කරතාවන්ගෙන් මහජනයා මුදවාගන්න ලෙස මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. සිල්ලර වෙළඳාමට පෙර තොග වෙළෙඳාම පටන් ගත්තා නම් වඩා හොඳයි. තමුන්නාන්සේ මේ තොග වෙළඳාම කර ගෙන යන්නේ මොන විධියටද කියා කල්පනා කර බලමු. මම වටිනා රෙගුලාසි තුනක්, "ගෝල්ඩන් රූල්ස්" තුනක් කියන්නම්. ඇමතිතුමාගේ තොග වෙළඳාම ගැන මා දෙස් කියන්නේ නැහැ. සමහර විට දෙපාර්තමේන්තුවෙන් අප කරුණු අසනවා. නමුත් කිසි කරුණක් ගැන කියන්න දෙපාර්තමේන්තුව අසතුටුයි. එම නිසා සම හර විට අත්සන් නැති ලියවිලිවලින් කරුණු සොයා ගන්න අපට සිදු වෙනවා. ඒ ලියුම්වලින් එකතු කර ගත් කරුණු අනුව "ගෝල්ඩන් රූල්ස්" තුනක් පෙන්නුම් කර දෙන්නට මා කැමතියි. පළමුවැනි එක, පෞද්ගලික වෙළෙන්දාගෙන් තොග වෙළඳ ආයතනයට බඩු ගැනීම තහනම් කිරීමයි. දැනට තොග වෙළඳ ආයතනය බඩු ගන්නේ කොහෙන්ද? බොහෝ බඩු ගන්නේ පෞද්ගලික වෙළඳුන්ගෙනුයි. මේ ක්‍රමය අතහැර ආණ්ඩුවෙන් ආණ්ඩුවට බඩු ගැනීමේ ක්‍රමයක් සකස් කර ගන්නට ඕනෑ. Government to Government purchase ක්‍රමයක් වුවමනායි. යම්කිසි රටකින් කරවල ගෙන්වනවා නම් ඒ රටේ ආණ්ඩුවෙන්ම ඒවා ලබා ගන්නට ඕනෑ. පෞද්ගලික වෙළෙන්දාගෙන් ලබා ගන්න එපා. අර්තාපලුත් ඒ විධියයි. අනෙක් බඩු මුට්ටුත් ඒ විධියයි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

හැම රටක්ම ඒ විධියට සංවිධානය වෙලා නැහැ.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

බොහෝ රටවල අපේ නියෝජිතයන් සිටිනවා. එම නිසා ඒ ඒ ආණ්ඩු සමඟ සාකච්ඡා කර වැඩ පිළිවෙළක් සකස් කරන්න ඒ අයට බැරිද? ඒ අය මොකද කරන්නෙ?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

හැම රටවල්ම එවැනි ක්‍රමයක් අනුගමනය කරන්නෙ නැහැ. එවැනි ක්‍රමයකට සංවිධානය වෙලා නැහැ. ඒ නිසා පෞද්ගලික ව්‍යාපාරිකයන්ගෙන් බඩු ගන්න සිදු වී තිබෙනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

ඒ කීම මා පිළිගන්නේ නැහැ. ජපන් රටින් යම් ද්‍රව්‍යයක් ගන්න වුවමනා නම් ඇමතිවරයාගේ නියෝජිතයන් මිට්සුබිෂි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොම්පැනිය සමග සාකච්ඡා කරන්න වුව මනා නැහැ. අපේ නියෝජිතයෙක් ජපන් රටේ ඉන්නවා. ජපන් රටේ ආණ්ඩුව සමග ඒ පිළිබඳව සාකච්ඡා කර වැඩ පිළිවෙළක් යොදා ගන්න ඔහුට පුළුවනි. ඒ විධියට කථා ආරම්භ කරනවා නම් කිසිම ආණ්ඩුවක් ඊට විරුද්ධ වේයයි මා සිතන්නේ නැහැ. මා මේවා කියන්නේ කරුණු ඇතිවයි. අද දවසේ සිදු වන්නේ මොන විධියේ දෙයක් ද? පෞද්ගලික වෙළෙන්දා විකුණන ජපන් රටින් එන මැකරල් ටින් එකක් මා මේ ගරු සභාවට ගෙනැත් පෙන්නුවා. එහි මිල ශත 90යි. නමුත් තොග වෙළඳ ආයතන යෙන් විකුණන මැකරල් ටින් එකක වට්නා කම රු. 1.05යි. මේ ටින් දෙකම ආවේ ජපන් රටින් නේද? මිට්සුබිෂි කොම්පැනිය එක ලේබලයක් අලවා පෞද්ගලික වෙළෙන්දාට දුන්නා. තවත් ලේබලයක් අලවා තොග වෙළඳ ආයතනයටත් දුන්නා. නමුත් දෙකම එකයි. ඒ වුණාට මිල වෙනස්. මේ අතරතුර කුමක් සිදු වුණාදැයි ඇමතිතුමා දන්නේ නැහැ. එම නිසා Government to Government purchase transaction ක්‍රමයක් ඇති කරන්න. අනෙක් ඒවාට ඉඩ දෙන්න එපා. ලංකාවේ නිපදවන සබන් හැර අනෙක් සියළුම සබන් තොග වෙළඳ ආයතනය ලබා ගන්නේ පෞද්ගලික කොම්පැනිකාරයන්ගෙන් බව ගරු ඇමතිතුමා දන්නවා.

කරවල ගැන පමණක් නොවෙයි, අපට කථා කරන්ට තිබෙන්නේ. බේබි සෝප්, කියුටිකියුරා, ඕඩිකොලෝන්, ෆේස් ක්‍රීම්, හෙයාර් ක්‍රීම් යනාදී සෑම ද්‍රව්‍යයක්ම තමුන්නාන්සේගේ තොග වෙළඳ ආයතනය ගන්නේ පිටකොටුවේ තිබෙන "ලල්වානි" නමැති තොග වෙළෙන්දාගෙන් නොවේ ද? ඇයි තමුන්නාන්සේ මහදේවන් නමැති පිටකොටුවේ සිටින බඩු ගෙන්වන තැනැත්තාගෙන් කොමිස් දීලා මේවා ගන්නේ? ආණ්ඩුව මගින් කෙළින්ම ඒ රටේ ආණ්ඩුවට ලියා යවා, ලල්වානිලාට කොමිස් නොදී, මෙම බඩු ගෙන්වන්න බැරි ඇයි කියා මම තමුන්නාන්සේගෙන් අහනවා.

1960 අගෝස්තු මාසයේ සිට 1961 ජනවාරි මාසය දක්වා කාලය තුළදී සී. ඩබ්ලිව්. ඊ. ආයතනය පුද්ගලික වෙළෙන්දන්ගෙන් ලබා ගෙන තිබෙන ද්‍රව්‍ය පිළිබඳ විස්තරයක් මට ඇමතිතුමාම දී තිබෙනවා. එම ලේඛනය අනුව උම්බලකඩ වෙතුවට පාවිච්චි කරන ජපන් රටින් ගෙන්වන බොනිටො fපිෂ් හොණ්ඩර 3,600ක් පිට කොටුවේ වෙළෙන්දකුගෙන් අරගෙන තිබෙනවා. මට නම් මේක තේරෙන්නේ නැහැ ගරු සභාපතිතුමනි. අපේ ආණ්ඩුවට කෙළින්ම ජපන් රටට ලියා යවා මීට වඩා ලාභයට මේ ද්‍රව්‍ය ගෙනවුත් පාරිභෝගිකයන්ට බෙදා දෙන්න බැරි ඇයි? මේ රටේ සිටින වෙළෙන්දන්ගෙන් මේවා ගන්න ගියාම ඒ අයටත් කොමිස් මුදලක් ගෙවන්න සිදු වෙනවා නේද? එපමණක් නොවෙයි, රතුලූනු, බොම්බයි ලූනු, ආදි ද්‍රව්‍යයන් මේ පිළිවෙළටම පෞද්ගලික වෙළඳුන්ගෙන් ලබා ගෙන තිබෙනවා.

1960 නොවැම්බර් මාසයේ සිට 1961 ජනවාරි මාසය දක්වා පෞද්ගලික වෙළඳුන් ගෙන්වූ ඉන්දියානු ලූනු හොණ්ඩර 5,600ක් අරගෙන තිබෙනවා නේද? ඇයි මේවා පෞද්ගලික වෙළඳුන් ගෙන් ගත්තේ? ආණ්ඩුවේ නියෝජිතයකු ඉන්දියාවට යවා හෝ ඉන්දියාවේ සිටින අප ආණ්ඩුවේ නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ ඉන්දියාවෙන්, මේ පෞද්ගලික වෙළඳුන්ට කොමිස් මුදල් නොදී, ගෙන්වා ගන්න බැරි වුණාද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
කොයි කාලය තුළදීද ඔය කියන්නේ?

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகநாயக்க)
(Mr. W. Dahanayake)
1960 අගෝස්තු මාසයේ සිට 1961 ජනවාරි දක්වා කාලය තුළදී.

Imported foodstuffs requisitioned during the period :

Bonito fish 3,600 cwt. Indian Onions 5,600 cwt. Coriander 1,300 cwt.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
Requisitioned not purchased.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

හොඳයි, "පර්චස්" යන වචනයට "රෙක්විසිෂන්" යන වචනය පාවිච්චි කරන්න කියනවා නම් මම එහෙම කරන්නම්. මේ බලන්න, තමුන්නාන්සේගේ යටතේ පවත්වා ගෙන යන දෙපාර්තමේන්තුවක නිලධාරීන් දෙදෙනකුගෙන් යුත් කොමිටියක් කියා තිබෙන්නේ කුමක්ද කියා:

A team consisting of two officials from the Marketing Department and the Co-operative Department who visited India in 1959 to study the dry fish trade estimated that the margin between the Indian wholesale price and the Colombo wholesale price would be as high as 40 per cent.

ඉන්දියාවේදී ගෙවන මිලට වඩා සියයට 40කින් පමණ වැඩි මිලක් කොළඹදී ගෙවන්න සිදු වන බව මේ නිලධාරීන් කියා තිබෙනවා. එපමණක් නොවෙයි, පිට රටින් බඩු ගෙන්වන තොග වෙළඳුන් ඉන්වොයිසස් "ලෝඩ්" කරන බව තමුන්නාන්සේම කියා තිබෙනවා නේද? කරවල වෙළඳාමේ යෙදී සිටි තොග වෙළඳුන් ඉන්වොයිසස් ලෝඩ් කළ බව තමුන්නාන්සේම දන්නවා නේද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
ඒක ඇත්තයි.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

එසේ නම් මේ ඉන්වොයිසස් ලෝඩ් කරන කුට ස්මග්ලර්ලා ළඟට තමුන්නාන්සේලා බඩු ගන්න යන්නේ ඇයි?

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

රැස්වීම අ. භා. 2 වන තුරු තාවකාලිකව නවත්වනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් ඔවුවන ලදින්, අ. භා. 2ට නැවත පවත්වන ලදී.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

සභාපතිතුමනි, මා කලින් විස්තර කරමින් සිටියේ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් බඩු බෙදා හැරීමේදී අනුගමනය කළ යුතු ගෝල්ඩන් රූල් කියන ඉතා හොඳ රෙගුලාසි වගයක් ගැනයි. එයින් පළමුවැනි ගෝල්ඩන් රූල් එක—ගවර්න්මන්ට් ටු ගවර්න්මන්ට් පර්චේස්—ආණ්ඩුවෙන් ආණ්ඩුවට බඩු ගැනීමයි. ඒක ඉතා හොඳ රෙගුලාසියක්. දෙවෙනි ගෝල්ඩන් රූල් එක නැත්නම් අවශ්‍ය රෙගුලාසිය ලංකාවේ ජාවාරම් කරගෙන යන "ඉම්පෝටර්" හෙවත් බඩු පිටරටින් ගෙන්වන අයගෙන් නම් බඩු ගන්න එපා කියන එකයි. ඒ අය බඩු ගෙන්වන්නේ "ලෝඩඩ් ඉන්වොයිසස්" ක්‍රමයටයි. ඒ කියන්නේ බඩුවල මිළ හුගක් වැඩි කර කඩදාසිවල පෙන්වනවා. ඒ බව තමුන්නාන්සේගේ කොමිටියත් පිළිගෙන තිබෙනවා. මේ දෙවෙනි ගෝල්ඩන් රූල් එක තමුන්නාන්සේ පිළිපදින්නේ නැති නිසා—මා තමුන්නාන්සේය කියා කීවාට එය වරදවා තේරුම් ගන්න එපා; සමහර විට මේ හුගක් දේවල් ගැන ඇමතිතුමා දන්නේ නැතුව ඇති; සමහර විට එතුමා මේවා ගැන දැන ගන්නෙ අප කිව්වාට පසුව වන්න ඇති—නොයෙක් අන්දමේ චෝදනා අහන්නට සිදු වෙනවා. දෙවෙනි ගෝල්ඩන් රූල් එක පිටකොටුවේ වෙළඳුන් ළඟට යන්න එපාය කියන එකයි. තමුන්නාන්සේගේ දෙපාර්තමේන්තුව ඒ වෙළඳුන් ළඟට ගිය නිසා එන චෝදනා බලන්න. අපට මේ කාරණා ගැන දෙපාර්තමේන්තුවෙන් අසා දැන ගන්න බැහැ. පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළත් දැන ගන්න බැහැ. එහෙත් මේ කාරණා ගැන, නම් නැති ලියුම් ඕනෑ තරම් එනවා. මේ මා අතේ තිබෙන ලිපියේ "නැපෝලියන්ස් ඩිරයි fපිෂ් රැකට්" එකක් ගැන ලියා තිබෙනවා. මෙහි කොටස් තුනක් තිබෙනවා. මුල්ම රැකට් එක හැටියට මෙහි පෙන්වා දී තිබෙන්නේ සමුපකාර තොග වෙළඳ ආයතනය වේලිච්ච හාල් මැස්සන්ය කියා පෝර ගෝනි 2,000ක් නැපෝලියන් සමාගමෙන් ගත් බවයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

කාගෙද අත් අකුරු? ගාල්ලෙ කෙනෙකු ගේද?

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

නැහැ, නැපෝලියන් සහ සමාගම, පිට කොටුව, කොළඹ. මේවා අරගෙන තිබෙන්නේ ඒ පුද්ගලයාගෙන් නොවෙයි, කොමිෂන් ඒජන්ට් කෙනකුගෙනුයි. මෙම ලියුම මට එවා තිබෙන තැනැත්තා මේ විධියේ දෙයක් මට කියා තිබෙනවා:

I suggest that you find out what prices Mr. Napoleon realized from the C. W. E. and how he settled with the shipper for this transaction so as to find out the profit made by Mr. Napoleon.

දෙවෙනි රැකට් එක හැටියට මේකෙ පෙන්වා දී තිබෙන්නේ නැපෝලියන් සහ සමාගම ඒඩන් රටේ තොග වෙළඳුන්ට දන්වා යවා වේලිච්ච හාල් මැස්සන් අඩු මිළකට ගෙන්වා වැඩි මිළකට දී තිබෙන බවයි. ඒ ගැන මේ විධියට මෙම ලිපියේ සඳහන් කර තිබෙනවා:

"....arranged with the officials of the C. W. E. to purchase this full shipment of 2,200 bags received per SS Macloris although the price of dried sprats at that time was Rs. 50. He again played out the C. W. E. for Rs. 67 and gained Rs. 37 in the second transaction."

ඊළඟට තුන්වෙනි රැකට් එකය කියා මේ ලියමනෙන් කියන්නේ ජේ. එන්. පී. නැපෝලියන් ප්‍රනාන්දු සමාගම පිටරටින් ආ කරවල—නොයෙකුත් වෙළෙන්දන්ගේ නම් මෙහි විස්තර කර තිබෙනවා—සියල්ලම පරාක්‍රම ස්ටෝරුවට අරගෙන සී. ඩබ්ලිව්. ඊ. එකට විකුණූ බවයි. මෙන්න මෙහෙමයි එහි විස්තර කර තිබෙන්නේ.

"On the 19th instant Mr. Napoleon and his follower Mr. Madona cleared 75 per cent of their goods from the Parakrama Store and disposed of same at the open blackmarket rate to Bankshall Street. But on the 23rd of this month Mr. Rajapakse, Director of the C. W. E., gave a wrong statement in the Daily News on page 1, sixth column, as appeared in that paper that he took delivery of 25 per cent. . . . There were no stocks of dried fish to obtain 25 per cent from the store. You will see how the small importers were deceived by Mr. Napoleon, and the Director of the C. W. E. It was due to Mr. Napoleon's hat-trick in the trade that officers in the C. W. E., those in favour of Mr. Napoleon, assist him in all his misdeeds. Hence Mr. Napoleon always came out with flying colours in all his tricks with the C. W. E. These inferior goods are requisitioned by the C. W. E."

This is how he beats Truman and Bedser—

"I therefore request your goodself to investigate Napoleon's racket with the C. W. E. and see that justice prevails in our motherland."

මේ නැපෝලියන් ප්‍රනාන්දු සමාගම තුන් සැරයක් තමුන්නාන්සේලාගේ සමුපකාර වෙළඳ ආයතනයට කරවල දී තිබෙනවා. මම අර දෙවෙනි රෙගුලාසිය වශයෙන් කිව්වා, ඒ ගොල්ලන්ගෙන් කරවල ගන්න එපාය කියා. ඒ කරවල ඒ අය දෙන්නේ මොන මිලකටද, මොන විධියකින්ද කියා බලමු. කරවල වෙළඳාම ගැන තමුන්නාන්සේලා පත් කළ කොමිටිය මෙන්න මේ විධියට කියා තිබෙනවා.

"Apart from the large number of middlemen through whom the dried fish pass before it finally reaches the consumer, there are numerous malpractices in the dried fish trade which makes it perhaps the most corrupt of all import trades in Ceylon. Importers in Ceylon are as a rule branches or close associates of forwarding agents in India, with the result that prices declared by the local importers are often fictitious, and considerable amounts of foreign exchange are fraudulently remitted to India by these importers."

ඒ වැරදි කරන ඉම්පෝටර්ස්ලාගෙන්ම, ඒ වැරදි මිලටම බොරුවට නියම කරන මිලටම, කරවල ගෙන්වන මුදලාලිගෙන්ම හොරට මුදල් ලංකාවෙන් පිට කරන අය ගෙන්ම තමුන්නාන්සේලාගේ තොග වෙළඳ ආයතනය මහජනයාට බෙදා හැරීම පිණිස තුන් සැරයක් කරවල අරගෙන තිබෙනවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මට වචනයක් කියන්න ඉඩ දෙනවාද? සභාපතිතුමනි, මේ ප්‍රශ්නය ගැන ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඉලංගරත්න]

හුඟක් දුරට ගිය නිසා මම කෙලින්ම කියන්න කැමතියි, තොග වෙළඳ ආයතනය කිසිම කෙනකු ළඟට ගොස් බඩු මිලට ගත්තේ නැත කියා. විශේෂයෙන් කරවල ගත්තේ නැහැ. ගත්තේ බලයෙනුයි. ඒ කාලවලදී කරවල මෙරටට ගෙන්වන වෙළෙන්දන් නොයෙක් අකටයුතුකම් කළ නිසාත්, පාරිභෝගිකයාට නියම මිලකට ඒවා නොයන නිසාත්, ඒවා වසන්කර ගෙන සිටින නිසාත් අපි ගිහින් ඒවා බලෙන් අරගෙන පසුව ගණන් හිලව් බලා සාධාරණ මිලක් නියම කර ගෙවන්න යෙදුණා. සමහර ඒවාට තවමත් ගෙවා නැහැ. එසේ ගෙවා නැත්තේ වැදගත් කරුණක් නිසයි. නැපෝලියන් ප්‍රනාන්දු හෝ වේවා, වෙන කවුරු හෝ වේවා, ඒ බඩු ගෙන්වන තැනැත්තා කියන මිළ ගැන අපේ විශ්වාසයක් නැති නිසා ඒ බඩුවල වටිනාකම කොපමණද යන්න ඒ රටවලින් සොයා බලා ඒ අනුව මුදල් ගෙවීමටයි, අපි ඒ ගෙවීම් ප්‍රමාද කර තිබෙන්නේ. එම නිසා මේ කමිටුවේ වාර්තාව අපි සම්පූර්ණයෙන්ම පිළිගන්නවා. පිටකොටුවේ වෙළෙන්දන්ගෙන් අපි ගන්න යන්නේ නැහැ. අපි මීට කලිනුත් ඒ විධියට කර තිබෙනවා. මා ඇමති ධුරයට පත් වන්න කලිනුත් කරවල පමණක් නොව අපට වුව මනා කරන අල ලුණු, ආදි අනෙක් අවශ්‍ය ආහාර ද්‍රව්‍ය පවා එවැනි අවස්ථාවලදී බලෙන් ගෙන තිබෙනවා. සී. ඩබ්ලිව්. ඊ. එකේ නිලධාරීනුත් ආහාර කොමසාරිස් වරයාත් ගොස් බලෙන් ඒ බඩු අරගෙන අවස්ථාවට සැහෙන විධියට කටයුතු කර තිබෙනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகநாயக்க)
(Mr. W. Dahanayake)

ගරු ඇමතිතුමා දුන් විස්තරය ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. නුමුත් මගේ කල්පනාවේ හැටියට එතුමා දුන් විස්තරයෙන් මා කී දෙයෙහි වෙනසක් වෙනවාය කියා මට වැටහෙන්නෙ නැහැ. සමහරවිට එය මගේ කල්පනාවේ ඇති දුර්වලකමක් නිසා වෙන්ට පුළුවනි. ගරු ඇමතිතුමා කියනවා බලෙන් ගත්තාය කියා. එතුමා මිළට නම් අරගෙන නැහැ. "Did not purchase, but requisitioned" මේකේ තේරුම මොකක්ද? මේකත් එක විධියක ගැනීමක්. It is another form of purchase, it is purchase by force" "අපි මිළදී ගත්තේ නැහැ. නමුත් බලයෙන් ගත්තා"ය කියන්නේ කොහොමද? එකවරක් නොවෙයි, තුන් සැරයක්ම ඒ අයගෙන් කරවල මිළදී අරගෙන තිබෙනවා. මම තමුන්නාන්සේගෙන් ප්‍රශ්න කරන්නේ තමුන්නාන්සේලා දුන් මුදල ගත්ත මිළට වඩා කොපමණ වෙලා තිබෙනවාද?

අ. භා. 2.15

දෙවැනි 'ගෝල්ඩන් රූල්' එක වශයෙන් මා කියා සිටින්නේ කරවල මිළදී ගැනීම සඳහා ඔය උදවිය ළඟට නොයන ලෙසයි. කරවල මෙරටට ගෙන්වන නැපෝලියන් ප්‍රනාන්දු සහ තොග වෙළඳ ආයතනයේ නිලධාරීන් අතරේ ලොකු ජාවාරමක් නැතිනම් ලොකු 'රැකට්' එකක් තිබෙන වාය කියා චෝදනාවක් නැඟී තිබෙනවා. එසේ චෝදනා කරන්නේ මේ පෞද්ගලික වෙළඳ ව්‍යාපාරිකයන් ළඟට තමුන්නාන්සේලා යන නිසයි. මහජනයාට කරවල තොග වෙළඳ ආයතනයේ මාර්ගයෙන් බෙදා දීමට පෙර කෙලින්ම පිටරටින් ගෙන්වීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුව තිබෙනවා. නුමුත් එසේ කිරීම වෙනුවට නැවත නැවතත් කරවල මෙරටට ගෙන්වන ව්‍යාපාරිකයන්ගෙන් කරවල බලහත්කාරයෙන් ලබා ගැනීමට කල්පනා කර සිටිනවා. මේ බලහත්කාරයෙන් ලබා ගත්තාය කියන කරවලවල තත්ත්වය කොයි ආකාරද? මේ කරවල ඉතාමත් නරක ඒවායයි අපට නොයෙක් පළාත්වලින් පැමිණිලි ලැබී තිබෙනවා. නුමුත් නැපෝලියන් ප්‍රනාන්දු නමැති අයගේ මාර්ගයෙන් මෙරටට ගෙන්වන කරවල තොග වශයෙන්ම රජය ලබා ගන්නවා. දැන් ඒ වෙළඳ ව්‍යාපාරිකයාට කිසිම කරදරයක් නැතිව තොග වශයෙන්ම කරවල රජයට විකුණන්න පුළුවනි. ගරු සභාපතිතුමනි, මෙයට සති දෙකකට පමණ පෙර නැපෝලියන් ප්‍රනාන්දුට පුළුවන් වුණා, ඒ ඩින් නගරයට විදුලි පණිවුඩයක් යවා මෙරටට කරවල ගෙන්වා ගැනීමට. නුමුත් ඒ අවස්ථාවේදී තමුන්නාන්සේට ඒ ආකාරයෙන්ම කටයුතු කරන්නට බැරි වුණේ මන්දැයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මම ප්‍රශ්න කරන්නට කැමතියි. පළමුවෙනි වරට කරවල ජාවාරම හෙවත් රැකවි එක අවසාන වුණාට පසුව, නැපෝලියන් ප්‍රනාන්දු සමග දෙවැනි සහ තුන්වැනි ජාවාරම්වලට ලෑස්ති වුණා. පළමුවැනි තොගය නැපෝලියන් ප්‍රනාන්දුගෙන් රජය බලහත්කාරයෙන් අයිති කරගත්තා නම්, දෙවැනි තුන්වැනි වරටත් ඔහු ගෙන්වන කරවල ගැනීමේ තේරුම කුමක්දැයි මම ප්‍රශ්න කරන්න කැමතියි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

තවත් ගෙන්නෙවිලොත් ඒවත් අරගන්නවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

තමුන්නාන්සේලා කවදාද ඒ අයගෙන් ලබා ගන්නෙ නැතුව කෙලින්ම සමුපකාර තොග වෙළඳ ආයතනය මාර්ගයෙන් මෙරටට ගෙන්වන්නෙ කියා අහන්නට කැමතියි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

දැනට කෙලින්ම පිටරටින් ලබා ගැනීමට වැඩ කටයුතු සකස් කරගෙන යනවා. ඒ අතරතුර මෙරටට ගෙන්වන කරවල සියල්ලක්ම ලබා ගන්නවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

තවමත් අපේ ගරු ඇමතිතුමා වැඩ පිළිවෙළක් සකස් කර නැති බව පෙනී යනවා. නුමුත් මේ වනතුරු පෞද්ගලික වෙළඳුන්ගේ මාර්ගයෙන් මේ රටට කරවල ගෙන්වීම නවත්වන්න රජයට පුළුවන් වෙලා නැහැ.

අනික් කරුණ, තමුන්නාන්සේ කීවේ, නැපෝලියන් ප්‍රනාන්දු සමාගමෙන් එසේ ලබාගත්තාය කීවත්, තමුන්නාන්සේගේ රාජපක්ෂ කියන නිලධාරී තැන කරවල මිළදී ගැනීම සඳහා සොයා ගෙන ගොස් තිබෙන්නේ නූර් බායි කියන කොමිෂන් ඒජන්ට් කෙනෙකුවයි. කොමිෂන් සඳහා සියයට කීයක් ඒ මහතා ලබා ගත්තාද කියා මම කියන්ට දන්නෙ නැහැ. නුමුත් ඒ නූර්බායි කියන මහතා කරවල විකුණන කෙනෙක් නම් නොවෙයි. නිකම්ම කොමිස් එකටයි, වැඩ කරන්නේ. සමුපකාර තොග වෙළඳ ආයතනයට ගිහින් බලන්න රීසිවි එක කාගේ නමටද කියා. නූර් බෝයි කරවල ගෙන්වන කෙනෙක් නොවෙයි. නූර් බෝයි ගත්තේ නැපෝලියන් ප්‍රනාන්දුගෙන්. නමුත් මුළු රටම විශ්වාස කරනවා, මේ කරවල වෙළඳාම සම්පූර්ණයෙන්ම සමුපකාර තොග වෙළඳ ආයතනය අතට ගෙනය කියා. මේ කරවල වෙළඳාම සමුපකාර තොග වෙළඳ ආයතනයට ගන්න එපා යයි කවුරුවත් කිව්වද? නැහැ. අපි සියලු දෙනාම කිව්වා, කරවල වෙළඳාම සම්පූර්ණයෙන්ම ගන්නය කියා. කිසිම වෙළෙන්දෙක් සමග ඒ ආයතනයට සම්බන්ධකමක් තබා ගන්න වුවමනාවක් නැහැ. කෙළින්ම පිට රටින් කරවල ගෙන්වන්න පුළුවනි.

කරවල ජාවාරම තුළ විශාල හොරකම් තිබුණු බව සත්‍යයක්. ඒ බව මුළු රටම පිළිගෙන තිබෙනවා. කරවල සඳහා අවුරුද්දකට රුපියල් ලක්ෂ 800 ක් පමණ ලංකාවෙන් පිට රට ගියා. මේ ලක්ෂ 800 න් කොපමණ අපතේ යන්න ඇද්ද? අඩු ගණනේ ඒ මුදලෙන් තුනෙන් එකක් පමණවත් හොර ජාවාරම්කාරයින් තරවීමට ගියා. එම නිසා කරවල ජාවාරම සමුපකාර තොග වෙළඳ අයතනයට ගැනීම හොඳ බව අපි සියලු දෙනාම පිළිගත්තා. නමුත් දැන් අපි චෝදනා කරන්නේ තමුන්නාන්සේ එය අරගෙන නැති නිසයි. දැන් ඇමතිතුමා කිව්වා, අපිත් ගෙන්වනවා, ඒ ගොල්ලනුත් ගෙන්වනවාය කියා. ඇයි පිට අය ගෙන්වන්නේ? ඒ අය ගෙන්වූ විට ඇයි තමුන්නාන්සේලා ඔවුන්ගෙන් ගන්නේ? ඒ අය ලාභයක් නොගෙන නිකම්ම දෙනවාද? ලාභයක් ඇතිවයි, දෙන්නේ. ඔවුන් ගන්න ඒ ලාභය ගෙවන්නේ කවුද? පාරිභෝගිකයින් නොවේද? මේ නිසා "සෙකන්ඩ් ගෝල්ඩන් රූල්" එක මෙයයි. පිට අයගෙන් ගන්න එපා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒ රූල් එක අපි දැන් භාරගන්නේ නැහැ. වෙළෙන්දන්ගෙන් අපි බලයෙන් ගන්නවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

ඒ අය කරවල ගෙන්වීම තහනම් කරන වාද, නැද්ද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒක වෙනම ප්‍රශ්නයක්.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

මම අහනවා ප්‍රශ්නයක්: පෞද්ගලික වෙළෙන්දන් පිට රටින් කරවල ගෙන්වීම තමුන්නාන්සේ තහනම් කරනවාද නැද්ද? මීට උත්තරයක් වුවමනායි. ඊට උත්තරයක් නොමැතිව තමුන්නාන්සේලා ගෙන යන ක්‍රමය කුමක්දැයි තේරුම් ගන්න අමාරුයි. අපේ පරමාර්ථය මෙයයි: පාරිභෝගිකයාට ලාභයට බඩු දීමයි. ඒ වැද ගත් පරමාර්ථය අනුව—

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

කරවල පිළිබඳව දැන් එය ඉෂ්ට වෙනවා. කරවල දැන් ලාභයට දෙනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

සියයට 40ක් මිල වැඩි කර ගෙන්වන පෞද්ගලික වෙළෙන්දාගෙන් ගත්තාම කොහොමද ලාභයට දෙන්නේ? එම නිසා මගේ තර්කයට කරුණා කර තමුන්නාන්සේ මොකක් හරි උත්තරයක් දෙන්න. පෞද්ගලික වෙළෙන්දන් පිට රටින් කරවල ගෙන්වීම තහනම් කරනවාද, නැද්ද?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

සභාපතිතුමනි, අපි දැන් කරවල කෙලින්ම ගෙන්වනවා. ඒවාගේම පෞද්ගලික ව්‍යාපාරිකයනුත් ගෙන්වනවා. පෞද්ගලික ව්‍යාපාරිකයින් ගෙන්වන ඒවා අපි බලයෙන් අත්පත් කර ගන්නවා. එසේ ගෙනදැනට පවත්නා වැඩ පිළිවෙළ අනුව බෙදා දෙනවා. අපට වුවමනා කරවල සම්පූර්ණයෙන්ම ගෙන්වීමට අවශ්‍ය සංවිධාන සර්ව සම්පූර්ණ කරන තුරු පෞද්ගලික ව්‍යාපාරිකයින් ගෙන්වන දේ අපි බලයෙන් ගෙන බෙදා හරිනවා. මුළු ලංකාවටම වුවමනා කරන සම්පූර්ණ කරවල ප්‍රමාණය තනිකර සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් පමණක් ගෙන්වන්ට පුළුවන් සංවිධානයක් ඇති කර ගත් වහාම එම කාර්යය පෞද්ගලික ව්‍යාපාරිකයන්ට කරගෙන යන්ට තවත් ඉඩක් නොදී වැඩ කරන්ට බලාපොරොත්තු වෙනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

ගරු ඇමතිතුමා කළ ඒ ප්‍රකාශය, ඒ සම්බන්ධයෙන් අපට දුන් සවිර පිළිතුරක් හැටියට අපි පිළිගන්නවා. ඒ විධියට උත්තර දීම ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔය කියන විධියට දැන් පෞද්ගලික ව්‍යාපාරිකයාත් කරවල ගෙන්වනවා; ආණ්ඩුවත් ගෙන්වනවා. ආණ්ඩුව පෞද්ගලික ව්‍යාපාරිකයාගෙනුත් කරවල මිල දී ගන්නවා. ඒ උත්තරය සතුටුදායකය කියා මම කියන්නේ නැහැ. මන්ද? තමුන්නාන්සේගේ කොමිටිවලිනුත් ඔප්පු වී තිබෙනවා, පෞද්ගලික ව්‍යාපාරිකයා සියේට 40ක් වැඩි කරන ලද බිල් පෙන්වා මූදල් ගන්නා බව.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ඒ ගණනට අපි ඒ අයගෙන් ගන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

තමුන්නාන්සේ කියනවා, ඒ ගණනට ගන්නෙ නැහැ කියා. ඒ උත්තරය දීම ගැනත් තමුන්නාන්සේට මම ස්තුති වන්ත වෙනවා. නැපෝලියන් ප්‍රනාන්දු කොම්පැනියේ ඉන්වොයිස්වල සඳහන් කර තිබෙන මිලත්, තමුන්නාන්සේ කර වල වෙනුවෙන් ගෙවා තිබෙන මිලත් ඉදිරි පත් කරනවා නම් ඒ කියමන මම පිළි ගන්නවා. එසේ කළොත් ඉන්වොයිස්වල සඳහන් කර තිබෙන්නෙ කීයද, සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් ගෙව්වෙ කීයද කියා අපට පෙනී යනවා ඇති. ඉන්වොයිස් වල තිබෙන ගණන සියේට 40 කින් අඩු කර තිබෙනවා නම් මම තමුන්නාන්සේට අනේක වාරයක් ස්තුති කරන්න කැමතියි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

නැපෝලියන් ප්‍රනාන්දු හෝ වෙන කවු රුන් හෝ ඉදිරිපත් කරන ගණන් හිලව් අනුව නොවෙයි අපි බඩු ගන්නෙ. පිටරට වලින් මේ රටට බඩු ගෙන්වන අයගේ ගණන් හිලව් පරීක්ෂා කර බලා, ඒවායේ හරි වැරදි සොයා බලා ඉන්පසු ඒවා ගන්නවා මිස, මෙහාට ඒවා ගෙන්වන අය කියන ගණන්වලට ගන්නෙ නැහැ. ඒ නිසා ඒ කියන විස්තර ඉදිරිපත් කළ යුතුය කියා මා හිතන්නෙ නැහැ.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

මෙන්න මේ කාරණය පමණයි මට දැන ගන්න ඕනෑ කරන්නෙ. අසුවල් දවසේ අසුවල් අයගෙන් මෙන්න මේ ඉන්වොයිස් එකෙන් මේ තරම් මිලක් ගෙවා මෙන්න මේ තරම් ප්‍රමාණයක් ගත්තාය කියනවා නම් ඒ ඇති. එතකොට තර්කය ඉවරයි. කාටවත් චෝදනා කරන්න නොවෙයි මා සූදානම් වෙන්නෙ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මමත් මේ කථාව වුවමනාවක් නැතුව දීර්ඝ වන නිසයි කෙටි කරන්ට හිතාගෙන කල් තියාම විස්තරය දෙන්ට කල්පනා කළේ.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

මම කියන විධියට ගන්න ගණන් දෙනවා නම් මාත් බොහොම සන්තෝෂ වෙනවා. කෙසේ වෙතත් අපට දැන ගන්න ලැබී තිබෙන්නෙ පිටරටින් ගෙන්වන අය තමන්ගේ බිල් සියේට 40 කින් වැඩි කරනවාය කියන එකයි. එපමණක් නොවෙයි, ඒ අය ගෙන්වන කරවලවල කොච්චර කුණු, රොඩු ආදිය තිබෙනවාද කියා සොයා ගන්නත් අමාරුයි. මෙන්න මෙහෙමයි කොමිටියෙන් කියා තිබෙන්නෙ:

"The prices declared by the local importers are also fictitious and considerable amounts of foreign exchange are fraudulently remitted to India by these importers. The detection of any such frauds is made extremely difficult by the bewildering variety of grades and qualities of dry fish which are imported and also by the large amount of sand and other extraneous matter which are sent in the packages of dry fish in order to make the checking of loaded invoices more difficult."

ඩී. පී. ආර්. වීරසේකර මයා. (රත්නපුර)
(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—இரத்தினபுரி)
(Mr. D. P. R. Weerasekera—Ratnapura)

Who has signed that letter?

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

This is the Report of the Departmental Committee. I am reading from the Report of the Departmental Committee.

පී. බී. ජී. කෙනමන් මයා. (මැද කොළඹ දෙවන මන්ත්‍රී)
(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி இரண்டாம் அங்கத்தவர்)
(Mr. P. G. B. Keuneman—Second Colombo Central)

The Cost-of-Living Committee Report.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

එතන එහෙමයි තියෙන්නෙ. පෞද්ගලික ව්‍යාපාරිකයා ගෙන්වන ඒවායේ කොපමණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

කුණු රොඩු වැලි ආදිය තිබෙනවාද? සියේට විස්සක් පමණ කුණු, රොඩු, වැලි ආදිය තිබෙනවා. ඔවුන් ඕනෑකමින්ම ඒවාට එකතු කරන්නෙ ඒ සියල්ලම තමුන්නාන්සේ ඒ අයගෙන් ගන්න නිසයි. ඒ විධියට ගැනීම වැරදියි කියා අපි කියනවා. ඒ නිසා සමුපකාර තොග වෙළඳ ආයතනය මගින් කෙලින්ම පිටරටින් මේ ද්‍රව්‍ය ගෙන්වීම තමුන්නාන්සේගේ යුතුකමක්ය කියා අපි කියනවා. එසේ කළ යුතු බව මා සථිර වශයෙන් කියන්න කැමතියි.

තුන් වන ගෝල්ඩන් රූල් එක හැටියට මා තමුන්නාන්සේට කියන්න කැමතියි, ප්ලෑන් එකක් අනුව, නියමිත වැඩ පිළිවෙලක් අනුව බඩු මිට්ටු ගෙන්විය යුතු බව. සමුපකාර තොග වෙළඳ ආයතනයේ මොන බඩුවක් හෝ නැති බව පෙනී ගියාම කරන්නෙ දුවලා ගිහිල්ලා පිට. කොටුවේ ඉන්න මිනිසුන්ගෙන් ඒ බඩුව ගෙන්වා ගැනීමයි. එහෙම නැත්නම්, මෙතැන තමුන්නාන්සේගේ ඉස්ටෝරුව හිස් වුණාම ටෙලිග්‍රෑම් ගහන්න පටන් ගන්නවා. සැලැස්මක් ඇතිව නොවෙයි, ඒවා කරන්නේ. මසුර් ඩාල් ගෙන්වන්නේ තමුන්නාන්සේගේ තොග වෙළඳ ආයතනය මාර්ගයෙනුයි. නමුත් සැලැස්මක් නැතිව වැඩ කරන නිසා මෙන්න බලන්න, සිදු වී තිබෙන දේ. 1960 සැප්තැම්බර් මස 9 වැනිදා සිට 1960 ඔක්තෝබර් 27 වැනිදා දක්වා තමුන්නාන්සේගේ සමුපකාර තොග වෙළඳ ආයතනයට මසුර් ඩාල් හොඟ්ඩර 3,400 ක් පෞද්ගලික වෙළෙන්දන්ගෙන් ගන්න සිදු වුණා. නමුත් ඒ මසුර් ඩාල් ගෙන්වන්නේ සමුපකාර තොග වෙළඳ ආයතනයි. ඒ ගෙන්වන පිළිවෙළ හරි නැහැ. ඒ බඩු කොපමණ වුවමනාද, කොයි කාලයකට වුවමනාද යන්න ගැන කිසිම සැලැස්මක් නැහැ.

අ. භා. 2.30

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)

(டொக்டர் என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)

(Dr. N. M. Perera—Yatiyantota)

There is a different racket there. I have explained it to the Hon. Minister before.

ඩබ්ලිව්. දහනායක මයා.

(திரு. டப்ளியு. தகனயக்க)

(Mr. W. Dahanayake)

My good Friend says that there is another racket there. That may be so. That is a racket within a racket.

පෞද්ගලික වෙළෙන්දාගෙන් හොන්ඩර 3,400ක් ගන්න සමුපකාර තොග වෙළඳ ආයතනයට සිදු වුණේ කොහොමද? කොයි කාලයට ගෙන්වන්න ඕනෑද, කොයි තරම් ප්‍රමාණයක් ගෙන්වන්න ඕනෑද යන්න සමුපකාර තොග වෙළඳ ආයතනය දන්නේ නැහැ. එසේ දන්නවා නම් තමන් ගෙන්වන බඩුවම පෞද්ගලික වෙළෙන්දාගෙන් ගන්න සමුපකාර තොග වෙළඳ ආයතනය ඒ පෞද්ගලික වෙළෙන්දා ළඟට දුවන්නේ ඇයි? මෙපමණ කාලයක් වැඩ කටයුතු කළාට පසු අසුවල් දේ මේ කාලයට මෙපමණ වුවමනාය කියන්න සමුපකාර තොග වෙළඳ ආයතනයට බැරිද? එම නිසා තුන්වැනි ගෝල්ඩන් රූල් එක හැටියට මම දෙන්නේ සමුපකාර තොග වෙළඳ ආයතනය අනුන්ගේ පස්සෙ දුවන්නෙ නැති වන පිළිවෙළට සැලැස්මක් ඇතිව බඩු ගෙන්විය යුතු බවයි.

ගරු ඉලංගරත්න

(கௌரவ இலங்கரத்ன)

(The Hon. Ilangaratne)

ඔය හොන්ඩර 3,400 ගත්තේ කොයි කාලයේදීද?

ඩබ්ලිව්. දහනායක මයා.

(திரு. டப்ளியு. தகனயக்க)

(Mr. W. Dahanayake)

Between 9.9.60 and 27.10.60 you purchased 3,435 cwt. of Masoor dhal at a cost of Rs. 226,000, which amount you paid to the private trade through this process of requisition.

ආචාර්ය එන්. එම්. පෙරේරා

(டொக்டர் என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

You are making a mistake. ඔවා ගෙන්වන්නේ සමුපකාර තොග වෙළඳ ආයතනය නොවෙයි, ආහාර දෙපාර්තමේන්තුවයි. දෙපාර්තමේන්තුව පෞද්ගලික වෙළඳුන්ට විකුණනවා. ඒ නිසයි, මා විරුද්ධ වුණේ. මීට කලින් මා ගරු ඇමතිතුමාට තේරුම් කරදී ඔප්පු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

කළා, විශාල ජාවාරමක් කරන බව. එය හරි ගස්සන්නටය කියා මම ඇමතිතුමාගෙන් ඉල්ලුවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
Lentils.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
Whole lentils.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

ගරු සභාපතිතුමනි, මේ තොග වෙළඳ ආයතනයේ තිබෙන තවත් වැරැද්දක් මම පෙන්වා දෙන්න කැමතියි. දෙපාර්තමේන්තුවෙන් මේ ගැන කරුණු සවලස්සයක් දැන ගන්න මම බොහොම මහන්සි ගත්තා. නමුත් දැන ගන්න බැරි වුණා. දෙපාර්තමේන්තුවේ පත්වීම් ගැන වත්තල ගරු මන්ත්‍රීතුමා (මෙල්ටන් ජයසිංහ මයා.) කථා කළා. යම්කිසි පත්වීමක් සම්බන්ධව තමුන්නාන්සේගෙන් ප්‍රශ්නයක් ඇසුවාම අපට ලියුම් එවනවා, පත්වීම් ගැන —no Ministerial responsibility— ඇමතිතුමා වග කියන්නේ නැත කියා. පත්වීමක් සම්බන්ධ ප්‍රශ්නයක් ඇතිවූ විට ගරු ඇමතිතුමා ඊට වග කියන්නේ නැතෙයි කියනවා. අසුවල් අසුවල් අන්දමට වැරදි සිදු වෙනවාය කියා මහ ජනයා ලියුම් මගින් කියා සිටිනවා. මා බොහොම අකමැතියි මෙවැනි කරුණු ඉදිරි පත් කරන්න. නමුත් අපට ලැබෙන කරුණු දෙස බලන විට ඒවා ඉදිරිපත් නොකර බැහැ. මා නම් සඳහන් නොකරයි මේවා ඉදිරිපත් කරන්නෙ. මේවායේ නම් සඳහන් වන පුද්ගලයන්ට යම් අයුත්තක් කෙරුණොත් ඒක වැරදි නිසයි එසේ කරන්නෙ. තමුන්නාන්සේගේ තොග වෙළඳ ආයතනය දැන්වීමක් ප්‍රසිද්ධ කළා යකඩ බඩු දෙපාර්තමේන්තුවේ මැනේජර්කම සඳහා සුදුසු අයකු තෝරා ගැනීමට. එය නොවැම්බර් මස 8 වන දා "ඩේලි නිවිස්" පත්‍රයේයි පළ වුණේ. මෙන්න ඒ දැන්වීම:

Qualifications : At least five years' experience in a senior executive position in a large mercantile establishment together with experience in the import and sale of hardware lines. A general standard of education will be required, preference being given to graduates.

මේ තනතුර සඳහා එක්තරා පුද්ගලයෙක් තෝරා ගත්තා. මා නම කියන්න කැමති නැහැ. ඔහුට තිබුණු සුදුසුකම් මොනවාද මේ තනතුර සඳහා තෝරාගන්න? Five years' experience in a senior executive position in a large mercantile establishment : nil. අඩු වශයෙන් අවුරුදු පහකවත් පළපුරුද්දක් තිබෙන්න ඕනෑ, විශාල වෙළඳ ආයතනයක පාලන කටයුතු සම්බන්ධව. ඒ සුදුසුකම එයාට නැහැ. Experience in the import and sale of hardware lines : nil. යකඩ බඩු වෙළඳාම පිළිබඳවත් පළපුරුද්දක් තියෙන්න ඕනෑ. ඒ සුදුසුකමවත් එයාට නැහැ. A general standard of education will be required, preference being given to graduates : nil. ඒ සුදුසුකමත් ඔහුට නැහැ. ඔහු උපාධිධරයෙකුත් නොවෙයි. ඔහු උපාධිධරයකුට කිව්වු කරන්නවත් බැරි පුද්ගලයෙක්. එස්. එස්. සී. විභාගයවත් සමත් කර තිබෙනවාද යන්න සැක සහිතයි. මේ පත් කර සිටින පුද්ගලයාගේ සුදුසුකම් මොනවාද කියන එකයි මා අහන්නෙ. මේ සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවූ අවස්ථාවේදී පළපුරුද්දක් තිබෙන උපාධිධාරීන් ඉල්ලුම් කර තිබුණාද නැද්ද කියන ප්‍රශ්නයට ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්න ඕනෑ. මේ තෝරාගත් පුද්ගලයාට සම්බන්ධකමක් ඇති කෙනෙක් මෙහි සිටින බවත් පේනවා. මා එම චෝදනා ගෙනෙන්න කැමති නැහැ. කාගේ හරි නෑ කෙනෙක් වීම යම් දෙයකට ඇති සුදුසුකමක් නොවෙයි. ඒක නුසුදුසුකමක්ද නොවෙයි.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
Is he a relative of a Minister ?

ඩබ්ලිව් දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

මට වුවමනා නැහැ කාගෙවත් ඇඟට මඩ පහරක් ගසන්න. තමුන්නාන්සේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

"preference being given to graduates" යනුවෙන් ප්‍රසිද්ධ කළා නම් මා දැනගන්න කැමතියි එයාට කොයිතරම් සුදුසුකම් තිබුණාද කියා. අවුරුදු පහක පමණ පළපුරුද්දක් තිබෙන්න ඕනෑය කියා තමුන්නාන්සේ කීවා නම් එයාට කොපමණ කාලයක පළපුරුද්දක් තිබුණාද කියා දැනගන්න කැමතියි. ඊළඟට—

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නයට පිළිතුරු දුන්නොත්—

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)

ඇමතිවරයකුගේ නෑයෙක්.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

මගේ නෑයෙක් නොවෙයි.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

ඇතින් නෑයෙක් වෙනවාද කියන්න දන්නෙ නැහැ.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)

වෙළඳ ඇමතිතුමාගේ නෑයෙක් නොවෙයි.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

වෙනත් අවස්ථාවන්හිදී ඔතන ඉන්න ඇමතිවරයකුගේ නෑයෙක්.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)

මා නොවෙයි ඒ කීවේ. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමයි (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) කීවේ.

විජයබාහු විජයසිංහ මයා.
(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)
(Mr. Wijayabahu Wijayasinha)

කාගෙද කිව්වොත්, දැනගන්න.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

කළුගල්ල ඇමතිතුමාගේ මස්සිනා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)

ගරු සභාපතිතුමනි, මට වුවමනා කරන්නේ සුදුසුකම් ගැන කියන්න පමණයි. ඔක්තෝබර් 10 වනදා "ඩේලි නිවුස්" පත්‍රයේ දැන්වීමක් පළ කළා.

බඩු පිටරට යැවීම පිළිබඳව මැනේජර් කෙනකු වුවමනාය කියා දැන්වීම් පිට කර තුබුණා. මෙන්න:

MANAGER, EXPORT DEPARTMENT, C. W. E.

At least 5 years experience in a senior executive position in a recognized firm. A general standard of education will be required but preference will be given to graduates.

Five years experience in a senior executive position—nil. General standard of education preference being given to graduates—nil.

නමුත් පත් කරගනු ලැබූ තැනැත්තාට පළපුරුද්දක් නැහැ. ඔහු උපාධිධාරියකු හෝ උපාධියකට කිට්ටු සුදුසුකමක් තිබෙන කෙනෙකුත් නොවෙයි. තවත් මේ විධියට එවා තිබෙන ලියුම් කියවන්නට මට පුළුවනි. නමුත් ඒවා කියවන්ට මා කැමති නැහැ. මේකයි, මා ඉදිරිපත් කරන තර්කය. මා මේවා ඉදිරිපත් කරන්නේ, කියවන්නේ අකැමැත්තෙනුයි. සමහර විට හොඳටම ඇත්තයයි විශ්වාස කොට කියෙව්වත් එයින් අයුක්තියක් වුණොත් හොඳ නැහැ. එම නිසා දැන්වීම් ප්‍රසිද්ධ කර, ඉල්ලුම් පත්‍ර කැඳවා, ඒ ඉල්ලුම් පත්‍ර පිළිබඳ ලැයිස්තුවක් සාදා, මණ්ඩලයක් පත් කොට සුදුසුකම් සොයා නියම විධියට සමුපකාර තොග වෙළෙඳ ආයතනයේ පත්වීම් දෙනවාදැයි මා ගරු ඇමතිතුමා ගෙන් අසනවා. මා ළඟ ලියුම් රාශියක් තිබෙන නමුත් ඒවා කියවන්ට මා කැමති නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Appropriation Bill, 1961-62 —*Committee*

ගරු ඉලංගරත්න

(கௌரவ இலங்கரத்ன)

(The Hon. Ilangaratne)

කරුණාකර ඒ ලියුම් දුන්නොත් හොඳයි. ඒ ලියුම් දුන්නොත් ස්තුතිවන්ත වෙනවා.

ඩබ්ලිව්. දහනායක මයා.

(திரு. டப்ளியு. தகனுயக்க)

(Mr. W. Dahanayake)

ඉදිරිපත් කරන්නෙ නැතැයි මා කීවා. එහෙත් තමුන්නාන්සේ බලකරනවා නම්, ඒවා ඉදිරිපත් කරන්නම්. මීට පෙර කරන ලද පත්වීම් ගැන ඇති වූ සාකච්ඡාවට මා සහභාගිවුණේ නැහැ. සාකච්ඡා සීමා කිරීමට මා කැමතියි. රටෙන් අපට ලැබෙන ලියකියවිලි අනුව සමුපකාර තොග වෙළඳ ආයතනයේ පත්වීම් සම්බන්ධයෙන් අයුතු වැඩ කෙරෙන බව පෙනෙනවා. ඒ ගැන රටේ ලොකු රාවයක් පවතිනවා. ඒත්තල ගරු මන්ත්‍රීතුමා (ෂෙල්ටන් ජයසිංහ මයා.) තවත් නම් දෙක තුනක් එකතු කළා. එම නිසා මා තමුන්නාන්සේට කියන්නේ සමුපකාර තොග වෙළඳ ආයතනයේ දියුණුව ඇති කිරීම පිණිස නියම විධියට ක්‍රියා කරන ලෙසයි.

ගරු ඉලංගරත්න

(கௌரவ இலங்கரத்ன)

(The Hon. Ilangaratne)

මට ඒ ලියුම් පිටපත් දුන්නොත් ස්තුතිවන්ත වෙනවා.

ඩබ්ලිව්. දහනායක මයා.

(திரு. டப்ளியு. தகனுயக்க)

(Mr. W. Dahanayake)

සමුපකාර තොග වෙළඳ ආයතනය දියුණු වෙනවා නම් අපි සියළු දෙනාම කැමතියි. එහෙයින් ගරු ඇමතිතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටින්නේ සෑම කෝරළයකටම එක එක තොග වෙළඳ ආයතනය බැගින් පිහිටුවා දූෂණවලින් තොරව ඒවායේ වැඩ කරවීමට කටයුතු සකස් කරන ලෙසයි. සෑම කෝරළයකම තොග වෙළඳ ආයතනය බැගින් පිහිටුවන්න.

තවත් සුළු කරුණක් දෙකක් මතක් කර මගේ කථාව අවසන් කරන්නට බලා පොරොත්තු වෙනවා. බඩු මිල අඩු කිරීමේ පරමාර්ථය ඇතිව ක්‍රියා කරගෙන යනවා නම්, පිටි සහ සීනි "යුනියන්" වලින්ම ගන්නටයයි සිල්ලර වෙළඳුන්ට කියන්නේ ඇයි? මැනිං මාර්කට් එකෙන් ගත්තොත් "යුනියන්" වලින් ගන්නවාට වඩා ශතයක් දෙකක් අඩු වෙනවා. එසේ තිබියදී "යුනියන්" වලින්ම ගන්නටයයි බල කරන්නේ මන්ද? මෙම ආණ්ඩුව පිටි සහ සීනි මිල ශත 5 කින් ඉස්සුවා. මේ ගැන අද දින රටේ ලොකු උද්ඝොෂණයක් තිබෙනවා. මැනිං මාර්කට් එකෙන් හැර වෙළෙඳ පොළේ අනෙක් තැන්වලින් පිටි සහ සීනි මිළට ගන්නට අවසර දෙනවා නම් අනෙක් තැන්වල විකුණන ගණන් වලට වඩා සතයක් හෝ දෙකක් අඩුවෙන් පාරිභෝගිකයාට දෙන්නට අපට පුළුවන්ය කියා සිල්ලර වෙළෙන්දෝ කියනවා. ඇයි තමුන්නාන්සේ ඒ අවසරය නොදෙන්නේ?

අ. භා. 2.45

තමුන්නාන්සේ කියනවා බඩු මිල අඩු කරන්නය කියා. අපි සියළු දෙනාම සතුටු වෙනවා පමණක් නොව බලකර කියා සිටින්නේත් බඩුවල මිල අඩුකරන්න කියා තමයි. තමුන්නාන්සේ මේවායේ මිල අඩු කර තිබෙන්නේ කොහොමද? ගාල්ලේ වරායක් තිබෙන නමුත් දකුණු පළාතට පිටි එවන්නේ ත්‍රිකුණාමලයේ සිට දුම්රියෙනුයි. අවුරුදු ගණනාවක් තිස්සේ ගාලු වරායෙන් එම ද්‍රව්‍ය ගෙන්වන්නටය කියා ආණ්ඩුවේ දෙපාර්ත මේන්තු සමග ලියුම් ගනුදෙනු කළ නමුත් එහි ප්‍රතිඵලය වී තිබෙන්නේ ලියුම් ගොමුව තර වීම පමණයි. අවුරුදු 10කට පමණ උඩදී නම් ගාලු වරායට මෙවැනි ද්‍රව්‍ය ගෙනාවා. නමුත් දැන් නැව් නවත්වන බර්ත්ස් නැතැයි කියා අළුතෙන් තර්කයක් ඉදිරිපත් කරනවා. දකුණු පළාතේ උදවිය පිටි වැඩිය පාවිච්චි කරන්නේ නැතැයි කියා තවත් තර්කය කුත් ඉදිරිපත් කරනවා. පාවිච්චි කරන්නේ සුළු ප්‍රමාණයක් වුවත් ත්‍රිකුණාමලයේ සිට දුම්රියෙන් ගෙනෙනවාට වඩා ගාලු වරායට නැවෙන් පිටි ගෙන ඒම ලාභ නොවේද කියා මා තමුන්නාන්සේගෙන් අහනවා. අවුරුදු දහයකට උඩදී නම් ගාලු වරායේ ඕනෑ තරම් බඩු බෑවා. මොකක්ද මේකේ තේරුම? සමහර විට අපි මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

කියන දේ ගැන තමුන්නාන්සේ හරියට දන්නෙත් නැහැ. මේ ප්‍රශ්න පිළිබඳව නොයෙක් දෙපාර්තමේන්තු සමග කාල යක් තිස්සේ ලියුම් ලියා ප්‍රතිඵලයක් නොලැබුණ නිසයි මේ දේ තමුන්නාන්සේට කියන්නේ.

මේ රටේ බඩු මිල පහත දමන තෙක් අපිත් ඉතා ඕනෑකමින් බලා සිටිනවා. වැද ගත් පරමාර්ථ දෙකක් අමතක කර දම මින් තමුන්නාන්සේගේ දෙපාර්ත මේන්තුව එක්තරා ව්‍යාපාරයක් ගෙන යන බවයි මට පෙනී යන්නේ. මේ විධියට තව දුරටත් ක්‍රියා කරගෙන ගියොත් පාරි භෝගිකයාට විශාල හානියක් සිදු වේවි. තමුන්නාන්සේ සිල්ලර වෙළෙන්දාට ගහන පහර වදින්නේ ගම්බද දුප්පත් ජනයාට බව බොරුල්ලේ ගරු මන්ත්‍රීවරයා (වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා) පැහැදිලි වශයෙන් විස්තර කර දුන්නා.

ආණ්ඩුව යටතේ රෙජිස්ට්ර් වෙන්න කියා තමුන්නාන්සේ සිල්ලර වෙළඳුන්ට කියනවා. සමහර වෙළඳුන් රෙජිස්ට්ර් වී තිබෙන අතර අනෙක් අය රෙජිස්ට්ර් වෙලා නැහැ. රෙජිස්ට්ර් වුණේ නැත්නම් තමුන් නාන්සේ බඩු දෙන්නේ නැද්ද ඒ අයට? රෙජිස්ට්ර් විය යුතු දිනයත් සැප්තැම්බර් මස 15 වනදා තෙක් දික්කර තිබෙනවා. මේ රටේ සිල්ලර වෙළඳුන් ලක්ෂ දෙකක් තුනක් පමණ සිටිනවා. මේ සෑම දෙනාම තමුන්නාන්සේගේ නීතිය අනුව රෙජිස්ට්ර් වුණොත් කොළඹ තිබෙන තොග වෙළඳ ආයතනයට අවුත් බඩු ගන්නද කියන්නේ? මේකත් කරන්නට පුළුවන් දෙයක්ද? සිල්ලර වෙළෙන්දාට දොස් කියන්නට කලින් තමුන්නාන්සේ විසින් කළ යුතුව තිබෙන එක යුතුකමක් තිබෙනවා. ඔහුගේ වෙළඳාම ගෙන යාම පිණිස කොන්ට්‍රෝල්ඩ් මිලට සිල්ලර වෙළෙන්දාට බඩු සපයන්න.

අපේ පාර්ලිමේන්තුවේ කැන්ටිමට සැපයූ එක්තරා ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් පාලන මිලට වඩා වැඩිය අය කළාය කියා එම ද්‍රව්‍ය සැපයූ තැනැත්තාට විරුද්ධව තමුන් නාන්සේ නඩුවක් දමා තිබෙනවා. මා මේ අවස්ථාවේදී ඒ පිළිබඳව විස්තරයක් කරන්නේ නැහැ. කාරණය පමණයි, සඳ හන් කරන්නේ. කොළඹ මෙවැනි ස්ථාන යක මේ විධියේ වැඩක් වන්නට ඉඩ තිබේ නවා නම් ගම්බද පළාත්වල පවතින්නේ මොන විධියේ තත්ත්වයක්ද කියා තමුන් නාන්සේටම සිතා ගන්නට පුළුවන්. සම හර පළාත්වල කඩවල් වසා දමනවාය කියා පුවත්පත්වල පළ වන ආරංචි බොරු නොවෙයි. අපේ පළාතේ තිබෙන සමහර කඩ වල් වසනවා මගේ ඇස් දෙකෙන්ම දැක තිබෙනවා. එක කරුණක් බඩු ගන්න තැනක් නැහැ. අනික් කාරණය බඩු ගෙනත් විකුණන්න බයයි. කොන්ට්‍රෝල් මිළ කීයදැයි දන්නෙ නැති නිසා බඩු ගෙනැ විත් විකිණීමට ලොකු බයක් තිබෙනවා. පත්‍රයකින් කොන්ට්‍රෝල් මිළ බලා ගන්න පුළුවන් වුණත් ඒ මිළට බඩු ගන්න තැනක් නැහැ. එම නිසා මේ කඩ වැසී යාම නවත්වන්න තමුන්නාන්සේට යුතුකමක් තිබෙනවා. හෙට අනිද්දා කියා හැමදාම කල් නොදමා තොග වෙළඳායතනයේ ශාඛා හැම ප්‍රදේශයකම වගේ පිහිටුවා ඒවා මගින් බඩු බෙදා හරින්න. මගේ කථාවේ අවසාන ඉල් ලීම නම් අසුවල් දවසේ ඒ විධියේ බෙදා හැරීමේ ස්ථාන හැම කෝරළයකම හැම පත්තුවකම හැම ප්‍රදේශයකම ඇති කරන බවට පොරොන්දුවක් දෙන්න කියන එකයි. නියම විධියේ බඩු බෙදා හැරීමේ ක්‍රමයක් ඇති කළාය කියා එදාට මා තමුන්නාන්සේට ප්‍රසංශා කරනවා.

මා අවසාන වශයෙන් ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි, බඩු මිළ ගැනත් ඒ වගේම බඩු බෙදා හැරීම ගැනත් කථා කරමින් මා එතුමාට පුද්ගලික චෝදනාවක් නොකළ බව. ඒ ඇමතිතුමා හුඟක් වැඩ කටයුතු භාරගෙන ඉතා බැරුරුම් ප්‍රශ්න විසඳීමට ක්‍රියා කරන ඇමතිවරයකු බව අපි දන්නවා. ඇමතිවරයාගේ ලොකු උත්සාහ යක් තිබුණත් ඒ උත්සාහය සම්පූර්ණ යෙන් සඵල වී නැති බවයි, අප අදහස් කරන්නේ. බඩු මිළ බස්සවන්න බඩු නියම විධියට බෙදා හැරීමට ඉදිරියේදී එතුමාගේ වැඩ කටයුතු සඵල වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව නවත් වනවා.

ඩී. පී. ආර්. වීරසේකර මයා.
(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)
(Mr. D. P. R. Weerasekera)

ගරු සභාපතිතුමනි, ගාල්ලේ ගරු මන්ත්‍රී තුමා (ඩබ්ලිව්. දහනායක මයා.) ප්‍රකාශ කළ දේවල් ගැන ප්‍රථමයෙන් සුළු විවේචනයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොකර මගේ කථාව කරන්න පුළුවන් කමක් නැහැ. දැනට මේ ගරු සභාවේ විරුඬ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් 18 දෙනකු විතර සිටින බව පෙනී යනවා. ඒ කවුරු හෝ මෙම කරුණු ඉදිරිපත් කළා නම් මා දොසක් කියන්නේ නැහැ. එදා අගමැති ධුරය දරා ගෙන වෙළෙඳ අංශය සම්පූර්ණයෙන් ජාවාරමක් කරගෙන විදේශික වෙළෙඳුන්ට නොයෙක් අන්දමේ බලතල දී මේ අද තිබෙන ප්‍රශ්නය උග්‍ර කළ මන්ත්‍රීවරයාම මේ චෝදනා ඉදිරිපත් කිරීම ගැනයි මා කනගාටු වන්නේ. නැපෝලියන් ප්‍රනාන්දු කියන මහත්මයකු ගැන උන්නැහේ සඳහන් කළා. ඒ මහත්මයා ගැන විස්තර මාත් දන්නවා. උන්නැහේට විශාල බල තල දී මේ රටේ මුදල් පිටරට යවා බඩු ගෙන්වා විශාල ජාවාරම් කරන්න ඉඩ දුන් ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාම උන්නැහේ ගැන සඳහන් කිරීම ගැන මා පුදුම වෙනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)
කරුණා කර ඔප්පු කරන්න.

ඩී. පී. ආර්. වීරසේකර මයා.
(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)
(Mr. D. P. R. Weerasekera)
එපමණක් නොවෙයි, ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා ටෙලිෆෝන් කර කියනවලු ඒ මහත්මයාට, "තමුන්නාන්සේට මම මෙච්චර උදව් කළා. ඇයි ඒවායින් ප්‍රයෝජන නොගන්නේ" කියා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)
ඒක බොරුවක්. ඔය ගැමි කතා වෙන තැනක ගිහින් කියන්න.

ඩී. පී. ආර්. වීරසේකර මයා.
(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)
(Mr. D. P. R. Weerasekera)
මේ විධියේ විහිළුවක් තිබෙනවා. එය ඇසුවොත් තමුන්නාන්සේ වරුවක් සිනාසෙයි. නැපෝලියන් ප්‍රනාන්දු මහත්මයා කියනවා, "තමුන්නාන්සේට මොකක්ද මගෙන් වුවමනා කරන්නෙ" කියා ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා එතුමාගෙන් ඇසුවාම ඔහු කිව්වලු "මට මොකවත් ඕන නැහැ, තමුන්නාන්සේ හමුවෙන්න ඉන්ටර්විපියරන්ස් එකක් විතරක් දුන්නොත් ඇති" කියා. ඉන්ටර්විව් කියන එකට ඔහු කිව්වේ එහෙ මලු. ඒක පිටකොටුවේ කඩමණ්ඩියේ තියෙන විහිළුවක්. මේ ජාවාරම් ගැන කථා කරන අතර පුරවැසි ජාවාරම කරපු ඒ තාවකාලික ආණ්ඩුවේ නායකයා හැටියට සිටි තමුන්නාන්සේ අපේ ඇමතිතුමාව විවේචනය කිරීම ගැන මා කනගාටු වෙනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)
ඒක බොරුවක්.

ඩී. පී. ආර්. වීරසේකර මයා.
(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)
(Mr. D. P. R. Weerasekera)
නුවරඑළියේ බුචර් මහත්මයාට ඒ කාලයේ පුරවැසිකම ලැබී තිබෙනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)
තමුන්නාන්සේලා බුචර්ලට පුරවැසිකම් දෙනවා ඇති.

ඩී. පී. ආර්. වීරසේකර මයා.
(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)
(Mr. D. P. R. Weerasekera)
එහෙමණක් නොවෙයි. තාවකාලික ආණ්ඩු කාලයේදී රත්නපුර ප්‍රදේශයේ විශාල වෙළඳුන් තුන් දෙනකුට උම්බලකඩ හොණ්ඩර 25 ගණනේ ලැබී තිබෙන බව මා ඔප්පු කරන්න ලැහැස්තියි. ඒවා රත්නපුරයට ආවේ නැහැ. එක වෙළෙන්දෙක් කපුර් මුදලාලි. අනික් දෙන්නගෙ නම් මම ලියාගෙන තිබුණා, දැන් මතක නැහැ. ඕනෑ නම් පසුව කියන්නම්. උන්නැහෙලා මේවා පිටකොටුවෙදීම විකුණල රුපියල් 3,000 ක මුදලක් ලබාගත් බව මට ඒ එක වෙළෙන්දෙක් කිව්වා. උන්නැහේ සාක්කි දෙන්න වුණත් ලැහැස්තියි.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)
ඒ සාක්කි ගේන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. පී. ආර්. වීරසේකර මයා.
(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)
(Mr. D. P. R. Weerasekera)

අපිත් ඔය විධියේ කොමිෂන් සභාවක්, විභාගයක්, ඉල්ලා සිටිනවා. ගරු සභාපති තුමනි, විවේචනය කිරීම බොහොම පහසු වෙන් කරන්න පුළුවන්. නමුත් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම අමාරු දෙයක්. එවැනි අවස්ථාවක් ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාට තිබුණු කාලයේදී ඒ මන්ත්‍රීතුමා කට යුතු කළ හැටි අපි කවුරුත් දන්නවා. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා මාස 4ක් 5ක් ඇතුළතදී අපේ වස්තුව, අපේ ධනය, විදේශික නාඩාර්වරුන්ට සූරා ගන්න ඉඩ සලස්වා දුන් බව හැම ගරු මන්ත්‍රීවරයෙක්ම දන්නවා. ඔර්ලෝසු ජාවාරම ගැන බලන්න.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

තමුන්නාන්සේ අහන්න තමුන්නාන්සේලාගේ මැද කොළඹ පළමුවන මන්ත්‍රීතුමාගෙන්; සර් රසික් fපරීඩ්ගෙන්.

ඩී. පී. ආර්. වීරසේකර මයා.
(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)
(Mr. D. P. R. Weerasekera)

හරි, මම සියයට සියයක්ම පිළිගන්නවා. නමුත් තමුන්නාන්සේගේ ඇමතිවරයකු හැටියට එදා එතුමාට ඉඩ දුන්නේ තමුන්නාන්සේ නොවේද? එසේ නම් තමුන්නාන්සේ නොවේද මහජනයාට වග කිය යුත්තේ? අනෙක් කුණු ගොඩවල් අවුස්සා මේ ගරු සභාවේ කාලය ගත කිරීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් යම් යම් දේ ගැන විවේචනය කරන විට ඒවා ආපසු තමන්ට වදිය කියන කරුණ ගැන ටිකක් කල්පනා කළා නම් හොඳ බව එතුමාට මතක් කරන්න කැමතියි. තමුන්නාන්සේගේ මඩිස්සලයේත් හුනු පොඩි තිබෙන බව සොයා බලා කථා කළා නම් මේක සිද්ධ වන්නේ නැහැ.

සභාපතිතුමනි, සමුපකාර තොග වෙළඳ ආයතනය කරවල ජාවාරමට බසින්න පෙර ප්‍රශ්න දෙකක් තිබුණා. එකක් ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා විස්තර කළා වාගේම අපේ රටේ මුදල් ලෝඩඩ් ඉන්වොයිසස් ආදි නොයෙකුත් මාර්ගවලින් පිටරට යැවීමයි. අනෙක දුප්පත් ජනතාවට සෑහෙන මිළකට කරවල නොලැබීමයි. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු කිහිප දෙනකු ගෙන් සඳහන් වුණ අන්දමට, කරවල ජාවාරම කෙළින්ම සමුපකාර තොග වෙළඳ ආයතනයට අරගෙන පෞද්ගලික වෙළඳුන්ට කොහෙත්ම කරවල ගෙන්වීමට බැරි වන අන්දමට නීති පැනෙව්වා නම් හොඳය කියා මමත් පිළිගන්නවා. නමුත් එය එක වර කිරීමට අපහසු තවත් කරුණක් තිබෙනවා. සමුපකාර තොග වෙළඳ ආයතනය කෙළින්ම කරවල මෙරටට ගෙන්වීම අයිති කර ගත් විට මෙරටට වුව මනා කරන සම්පූර්ණ කරවල ප්‍රමාණය ගෙන්වා ගැනීමේ ශක්තියක් එම ආයතනයට නොලැබුණොත් එයින් මහජනයාට ලොකු පහරක් වදින බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. හොණ්ඩර 200ක් අපට වුවමනා කරනවා නම්, සමුපකාරයට ශක්තිය තිබෙන්නේ හොණ්ඩර 100ක් පමණක් ගෙන්වීමට නම්, රටට අවශ්‍ය කරවල ප්‍රමාණය නැති කමින් විශාල බිලැක් මාර්කට් ව්‍යාපාරයක් ඇති වන බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. එම නිසා අපට අවශ්‍ය කරවල ප්‍රමාණය සියයට සියයක්ම සමුපකාරය මගින් ගෙන්වන්න ශක්තියක් ලැබෙන තුරු ඒ අඩුපාඩු පිරිමසා ගැනීම පිණිස අනෙක් වෙළඳ මහත්වරුන්ටත් බඩු ගෙන්වන්න ඉඩ දී, ඒ අයත් සමග සම්බන්ධකම් ඇති කරගෙන, නියම මිලට ඒවා මහජනයාට ලැබෙන පරිදි පරීක්ෂාකාරීව කටයුතු කරගෙන යන ව්‍යාපාරයකුයි දැන් අපි ගෙන යන්නේ.

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) කිව්වා චෝදනා සහිත ලියුම් තිබෙනවාය කියා. මම අභියෝග කරනවා එසේ තිබෙනවාය කී ලියුම් කරුණා කර සභාවට ඉදිරිපත් කරන්නය කියා. මම නම් පිළිගන්නේ නැහැ එවැනි ලියුම් තිබෙනවාය කියා. ඇමතිතුමාත් ඒ ලියුම් ඉල්ලූ නමුත් දුන්නේ නැහැ. දැනුත් තවම නිශ්ශබ්දව සිටිනවා.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனாயக்க)
(Mr. W. Dahanayake)

ඔහේගේ තත්ත්වයෙන් අනික් අය මනින්න ඕනෑ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. පී. ආර්. වීරසේකර මයා.
(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)
(Mr. D. P. R. Weerasekera)

අපි බලා සිටිනවා එතුමා ලියුම් ඉදිරිපත් කරනතුරු. කෝ? ඉදිරිපත් කරන්නේ නැහැ. සභාපතිතුමනි, අමූලික බොරුවකුයි එතුමා ගෙන ගියේ.

සභාපතිතුමනි, මේ කර තිබෙන වැඩ කටයුතු ගැන ඇමතිතුමාට මම ප්‍රශංසා කරනවා. එතුමා කර තිබෙන සෑම දේම හරිය කියා මම කියන්නේ නැහැ. සියයට සියයක්ම හරිය කියා කවුරුවත් කියන්නේ නැහැ. අඩුපාඩු තිබෙනවා. අවුරුදු 10ක් 15ක් තිස්සේ කරගෙන ගිය වැඩක් වෙනස් කළ හැටියේ මාස ගණනකදී අඩු පාඩු සියල්ලම හරිගස්සන්න බැහැ. ඒ ඒ අවස්ථාවලදී ඒ අඩුපාඩුකම් අසුවල් අසුවල් දේ යයි ඉදිරිපත් කර ඒවා සංශෝධනය කිරීමට උන්නැහේට ආධාර කිරීමයි අපේ යුතුකම. කරන දේ බාගෙට කිරීම ලොකු අඩුපාඩුව බව මම කල්පනා කරනවා. නුමුත් ඒකට ඇමතිතුමාට දොස් කියා වැඩක් නැහැ. සියල්ලටම පළමු රජයේ වෙළඳ ප්‍රතිපත්තිය කුමක්ද කියා පැහැදිලි කර ගන්නට ඕනෑ. මෙරටට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගෙන්වීම සමුපකාර තොග වෙළඳ ආයතනය මාර්ගයෙන් කරනවාද, එසේ නැත්නම් පෞද්ගලික අංශවලටත් ඊට ඉඩ දෙනවාද, එසේත් නැත්නම් එක්තරා කොටසක් පමණක් ගෙන්වීමට පෞද්ගලික අංශවලට ඉඩ දෙනවාද කියා අප නිරවුල් කර ගන්නට ඕනෑ. මෙවැනි සුළු ප්‍රශ්න පවා අද පැන නැඟී තිබෙන්නේ පෞද්ගලික අංශවලට එසේ ඉඩ දී තිබෙන නිසයි. එම නිසා මෙරටට කරවල ගෙන්වීම පමණක් නොවෙයි, අනිකුත් සියලුම ආහාර ද්‍රව්‍ය සමුපකාර තොග වෙළඳ ආයතනයේ මාර්ගයෙන් ගෙන්වා බෙදා හැරීමට විධි විධාන සලසන ලෙස ගරු ඇමතිතුමා ගෙන් මා ඉල්ලා සිටිනවා. එසේ කළොත් පමණයි, මේ ප්‍රශ්න නියම අන්දමින් විසඳන්නට පුළුවන් වෙන්නේ. මේ කාරණය ගැන ගරු ඇමතිතුමා විශෙෂයෙන් කල්පනා කර බලනවා ඇතැයි මම විශ්වාස කරනවා.

අ. භා. 3

ගරු සභාපතිතුමනි, ජාවාරම් ගැන කථා කරන විට, පසුගිය තාවකාලික ආණ්ඩුව තිබුණු කාලයේ, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව තිබුණු කාලයේ, ඇති වුණ සිද්ධීන් ගැන කියා ඒ පක්ෂවලට පහර ගැසීමට මම අදහස් කරන්නේ නැහැ. නුමුත් යම්කිසි තර්කයක් ඉදිරිපත් කර ඒ ගැන විවේචනය කරන විට ඒ හැම ආණ්ඩු කාලයක් තුළදීම සේවය කළ නිලධාරීන්ගේ දුර්වලකම් ගැන ද සලකා බලන්නට ඕනෑ. ඒ කාලයේදී ලොකු පිටි ජාවාරමක් තිබුණා. මේ නිසා ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්නට යයි ලොකු උද්ඝෝෂණයක් ඇති වුණා; එ පමණක් නොවෙයි, මෙයට සම්බන්ධ වෙළඳුන් පස් දෙනකුගේ බලපත්‍ර අවලංගු කර දමන තැනට වැඩ කටයුතු යෙදුණා. නුමුත් අද ඒ 'පසිල්' හොයා ගන්නට නැහැ. මට දැන ගන්නට ලැබුණු ආරංචිවල හැටියට එක්තරා උසස් තත්ත්වයක් දරණ පුද්ගලයකුට රුපියල් දහසක මුදලක් දී තිබෙනවා.

පත්වීම් දීම් සම්බන්ධයෙනුත් වචනයක් කියන්නට කැමතියි. එක්සත් ජාතික පක්ෂය එක් එක් පුද්ගලයාට පත්වීම් දුන් ආකාරය ගැන අප හොඳ හැටි දන්නවා. සමුපකාර දෙපාර්තමේන්තුවට නිලධාරීන් පත් කරන අවස්ථාවේදී කිසිම පරීක්ෂණයක් නැතිව පත්වීම් ලබා දුන් බව මා දන්නවා. අවශ්‍ය නම් මට ඒ අයගේ නම් ගම් පවා කියන්නට පුළුවනි. ගරු සභාපතිතුමනි, ඔවැනි වැරදි කවදත් සිදු වෙනවා. වෙළඳ අමාත්‍යාංශය යටතේ තිබෙන යම් යම් ආයතනවල යම් යම් අඩුපාඩුකම් තිබෙනවා නම්, ඒවා මගහරවා රටට, ජාතියට මේ අමාත්‍යාංශයෙන් සෙතක් වන අන්දමින් වැඩ කටයුතු සකස් කිරීමට ගරු ඇමතිතුමා උත්සාහ ගන්නවා ඇතැයි මම විශ්වාස කරනවා. කරවල ජාවාරම විදේශික යන්ගේ අතින් තොග වෙළඳ ආයතනයට ගැනීමෙන් රටට වැදගත් සේවයක් කරන්නට පුළුවන් වේයයි මම කල්පනා කරනවා. යම් යම් කාරණා ගැන විවේචනය කරන විට තමන් කියන දේ සම්පූර්ණයෙන්ම නිවැරදි යයි කල්පනා කිරීම සාධාරණ නැහැ. නොයෙක් නොයෙක් අඩුපාඩුකම් ඇති වෙන්නට පුළුවනි. ඒවා නැති කර දැමීමට සෑම පුද්ගලයෙකුගේම සහයෝගය දෙන ලෙස මතක් කරන්නට කැමතියි.

තවත් වැදගත් කාරණයක් ගැන මේ අවස්ථාවේදී තමුන්නාන්සේගේ සැලකිල්ල යොමු කරන්නට කැමතියි. මම පසුගියදා විලි ප්‍රදේශයේ තේ වෙළඳ මධ්‍යස්ථානය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. වීරසේකර මයා.]

කට ගිය අවස්ථාවේදී 'Pure Celan Tea' නමින් හැඳින්වෙන රාත්තලේ තේ පැකැට් ටුවක් රුපියල් 8 කට විකුණන බව මට පෙනී ගියා. මම එයින් තේ කෝප්පයක් බීලා බැලුවාම මට හැඟිගියා, සියයට පහක් වත් ඒ තේ පැකට්ටුවල ලංකාවේ උසස් වර්ගයේ තේ නැතැයි කියා. නොයෙකුත් බාල තේ වගී කලවම් කොට පැකට් කර, ලංකාවේ තේ වශයෙන් රාත්තල රුපියල් 8 කට දකුණු අමෙරිකාවේ විකුණනවා. ඇත්ත වශයෙන්ම දැනට පවතින තේ වෙන්දේසි කිරීමේ ක්‍රමය සම්පූර්ණයෙන්ම නවතා දමා කෙළින්ම ඒ ඒ රාජ්‍යයන් සමග වෙළඳ හුවමාරුකම් ඇති කර ගැනීමට මේ රජය කල්පනා කරනවා නම්, තේ වලින් මෙයට වඩා විශාල ලාභයක් ලබා ගන්නට පුළුවන්වෙනවාට කිසිම සැකයක් නැහැ. විදේශීය වතු ජනසතු කිරීම පිළිබඳ ප්‍රශ්නය පැන නැඟි අවස්ථාවලදී කියා සිටියේ යම් ලෙසකින් මේ වතු ජනසතු කරනු ලැබුවොත් එංගලන්තය ලංකාවේ තේ මිළදී ගැනීම නවත්වන්නට පුළුවනිය කියායි. ගරු සභාපතිතුමනි, දකුණු අමෙරිකාවේ අලෙවි වන්නේත් ලංකාවෙන් එංගලන්තයට යවන තේ බව මතක් කරන්නට පුළුවනි. දකුණු අමෙරිකාවේ ජනතාව කෝපි බොන උදවිය නොවෙයි. සෑම නිවසකම සෑම හෝටලයකම, තේ පාවිච්චි කරනවා. නුමුත් මෙරටින් රුපියල් දෙක තුනකට ලබා ගන්නා තේ රාත්තල රුපියල් 8 ගණනේ විකුණනවා. දකුණු අමෙරිකාවට යවන මේ තේවලින් එංගලන්තය විශාල ලාභයක් ලබා ගන්නවා.

ඒ වාගේම ඉතාලියේත් මේ ජාවාරම ගෙන යනවා. අපේ තේවලට ලැබෙන්නේ සුළු මුදලක්. ඔවුන් ඉන්දියාවෙනුත් චීනයෙනුත් ලාභ තේ ගෙන්වා කවලම් කොට පැකට්වල අසුරා ලංකා තේ යයි ලොකු මුදලකට විකුණනවා. එම නිසා මම ඉල්ලා සිටිනවා, මේ වෙන්දේසි ක්‍රමය නැති කොට අපේ තේ අනෙක් රටවල පාරිභෝගිකයින්ට කෙළින්ම ලැබෙන ලෙස ඒ රටවල් සමග යම්කිසි වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස.

අලෙවි කිරීමෙහි ලොකු අඩුපාඩු තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති ලොකුම අඩුපාඩුවක් නම් එහි සමුපකාර තොග වෙළඳ ආයතනයක් නොමැති වීමයි. ඒ පිළිබඳව ඇමතිතුමා ක්‍රියා මාර්ගයක් යොදවා ඒ පළාතට තොග වෙළඳ ආයතනයක් ලබා දීමට කටයුතු යෙදීම ගැන මම එතුමාට ප්‍රශංසා කරනවා. රජයට පහර ගසන වෙළෙන්දන් සිටින බව රහසක් නොවෙයි. බොරැල්ලේ මන්ත්‍රීතුමා (වෛද්‍ය චාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා) දොස් කීවත්, මම රත්නපුරයට ගොස් කරවල බෙදීම කරන බව ඇත්තයි. එසේ කරන්නේ ජාවාරමක් හැටියට නොවෙයි. එහි සමුපකාර තොග වෙළඳ ආයතනයක් නොමැති නිසා කොළඹ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් කරවල ගෙන ගොස් එහි බෙදා දීමේ කටයුතුවලට මම සහභාගි වෙනවා. එසේ කරවල ගෙන ගොස් සමුපකාර තොග වෙළඳ ආයතනයේ නිලධාරීන් විසින් ජාවාරම් නොකරන ඇත ගම්වල සිටින වෙළෙන්දන්ටද විකුණනවා. එහි කිසිම වැරැද්දක් ඇතැයි මා නම් හිතන්නේ නැහැ. එසේ විකුණා ලබාගන්න මුදල් ගෙනවුත් කොළඹට භාර දෙනවා. අපි මේ වැඩට සහභාගි වූවාට මුදල් අතපත ගාන්නේ නැහැ. බිල් ලියන්නෙත් නැහැ. අපේ පරමාර්ථය වෙළෙන්දන්ට ලාභ ගැනීමට කටයුතු කිරීම නොවෙයි; දුප්පත් ජනතාවට වැඩි මිලක් නොගෙවා කරවල ලබා දීමයි. ඊට වැරදි කියන්නේ මන්දැයි මට නම් තේරෙන්නේ නැහැ. රත්නපුරයේ තොග වෙළඳ ආයතනයක් විවෘත කොට කරවල බෙදා දෙන තුරු මට කොපමණ බැන්නත්, දොස් කීවත්, මම ඒ කටයුත්ත කරගෙන යනවා.

සමුපකාර සමිති ගැනත් වචන ස්වල්පයක් කිය යුතුව තිබෙනවා. ඇතැම් සමුපකාර සමිති ඇතැම් දේශපාලන පක්ෂවල අතකොලු හැටියට පාවිච්චි කරනවා. රත්නපුර කොට්ඨාශයේ තිබෙන සමුපකාර සමිතිවලට මම ලියා යැව්වා, අසවල් දවසේ අසවල් තැනට අවුත් කරවල ගෙන යන්ටය කියා. අපි සමුපකාර සමිතිවලට හොන්ඩර 5 බැගින් බෙදා දීමට අපේ කාරකසභා රැස්වීමේදී තීරණය කර ගත්තා; නමුත් ඇතැම් සමුපකාර සමිති එය ගැනීමට නොපැමිණ ගමේ රැස්වීම් පවත්වා ගමේ සමුපකාරයට කරවල දෙන්නේ නැතැයි ප්‍රචාරයක් ගෙන යනවා. මම එක් සමුපකාරයකට ගොස් එහි කාරකසභාවට මේ පිළිබඳව කරුණු පැහැදිලි කර දුන්නා. ඒ නිසා ඒ කාරකසභාව දෙකට කැඩී ගියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එක්සත් ජාතික පක්ෂයේ අය සමුපකාර සමිති පක්ෂයේ කටයුතු කරවා ගැනීමට පාවිච්චි කරන නිසා දෙන කරවල ගන්නේ නැතිව කරවල ලැබෙන්නේ නැතැයි රජයට විරුද්ධව ව්‍යාපාරයක් ගෙන යෑමෙන්—කරදරයට පත් වන්නේ දුප්පත් ජනතාවයි. මෙවැනි ප්‍රචාර පවතිනත් කරවල ප්‍රශ්නය නම් ඒ කියන තරමටම උග්‍ර නැහැ. ඒ ප්‍රශ්නය තවත් දුරට විසඳීම සඳහා අපට ලොකු සේවයක් කරන්ට පුළුවනි. පඩි ලබන නිලධාරීන් වශයෙන් නොව, ජනතාවට ඇති කරදරවලින් ඔවුන් මුදවා ලීම සඳහා සේවය කිරීමේ බලාපොරොත්තුවෙන්, අපට ඒ කටයුතුවලට උදව් දිය හැකියි.

සමුපකාර සංගම් ගැනත් ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කළ යුතුව තිබෙනවා. ඇමතිතුමාගේ නියෝගය අනුව සමුපකාර සංගම් තොග ආයතනයෙන් අවශ්‍ය බඩු ගන්නවා. එහෙත් ඔවුන් එහි සිදුරක් සොයාගෙන ඒ ගන්න බඩු පිටකොටුවේ කළු කඩකාරයාට විකුණා ඒ වෙනුවට වෙනත් බාල බඩු ගෙන යනවා. අල හොන්ඩර 10 ක් තොග ආයතනයෙන් ගත්තොත් එය පිටකොටුවේ කළු කඩකාරයන්ට විකුණා කුණු අල ටිකක් ඒ වෙනුවට අරගෙන ගොස් මහජනයාට විකුණනවා. සමුපකාර ආයතනයෙන් ගත් අලය කියා එයින් මහජනයාට එක් අතකින් පහර වදින අතර සමුපකාර තොග වෙළඳ ආයතනයේ නමටත් කැලලක් සිදු වෙනවා. එම නිසා ඒ පිළිබඳවත් ඇමතිතුමා කල්පනා කර බැලිය යුතුයි. ඒ අතර මා යළිත් වරක් වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාට ප්‍රශංසා කරන්නේ එතුමාගේ අමාත්‍යාංශයේ කොයි තරම් අඩුපාඩුකම් තිබුණත් ඉතා උනන්දුවෙන් කටයුතු කරන එතුමා ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ අනුවම මේ රජයට සමාජවාදී මුහුණුවරක් ලැබී තිබෙන බවය යන්න පැහැදිලිවම පෙනෙන නිසා බව කෙලින්ම ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

කෙනමන් මයා.

(திரு. கெனமன்)

(Mr. Keuneman)

Mr. Chairman, the Hon. Minister of Commerce, Trade, Food and Shipping has been engaged in a struggle against various trading monopolies and it is, therefore, natural that these monopolies and their friends inside and outside this House should be critical of the Hon. Minister and his deeds. I am not saying that there is nothing to criticise about the Hon. Minister. In my opinion, the Hon. Minister is not pursuing the fight hard enough, fast enough, and he is not getting the support that he should be getting from other Members of the Government. But the fact is we should all realise it is precisely because for the first time a number of the entrenched positions in the import trade have been touched that there is so much squealing going on.

You will recall, Mr. Chairman, that the dry fish problem became a very big problem a short while ago. At that time I made a speech in this House pointing out that the dry fish problem was a real problem to the consumers in the sense that a great deal of dry fish was being hoarded and was not available to consumers. I also pointed out that this was part of a deliberate political campaign that was being waged for the purpose of preventing the Government or the C. W. E. putting its fingers into the dry fish trade. At that time, specimens of dry fish were produced here and elsewhere—people shouted about the matter—and now we do not hear so much on that question. That is also another striking back and I must say though there are weaknesses in this fight on the dry fish front, weaknesses to which I will allude in a moment, still there are certain positive achievements too which this House and the country should give its mind to.

I do not think the Hon. Minister or his officials had any experience in this dry fish trade before they touched it and many people wondered whether they would make any impression on it, because it was not only a highly monopolised trade but a highly skilful trade with big ramifications, with a lot of experience in business crookery of all types, with far more experience than either the Hon. Minister or his officials have. And,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

there are certain indications now that to some extent the position is beginning to improve.

The monoply, I think, is in the process of being licked. It is fighting a rearguard action, and a pretty powerful rearguard action, supported by some people opposite too. But, I think, it is in the process of being defeated provided the Government is prepared to be resolute and to fight this matter out to the end.

Secondly, the supply position is also beginning to improve. This is one of the slackest, adverse, months for dry fish—people seem to forget these things sometimes—but in spite of that, the supply position is improving. Still in many rural areas dry fish is not available adequately while in some places it is not available at all, but particularly in the towns and other areas dry fish which was not available earlier is really becoming available now.

අ. භා 3.15

Thirdly, the price has come down. I think that is a factor people should remember, and provided the Government does not give in at this crucial stage of the fight, I think, within the next three or four months the position should improve to a very great extent. As a matter of fact, the whole purpose or a great deal of the agitation that was carried on on the dry fish question was mainly due to the Government and the C. W. E. putting its fingers into this trade. But it is precisely because of this decision that was taken to put its fingers into the trade and to take over at least a part of the trade that the position has to some extent improved.

The real point about the dry fish question is this : You cannot improve any further unless you end this nonsensical 75-25 per cent share out between the C. W. E. and the private trade, and unless the import of dry fish is made a Government monopoly. And this is precisely the point to which hon. Members of the Government must now address their minds.

Recently this Napoleon of the dry fish trade, to whom everybody is referring, a gentleman who is a member of my constituency—at least he operates in my constituency in Bankshall Street ; the headquarters of this dry fish trade is in the middle of my constituency—was given a quota of dry fish under this 25-75 per cent agreement. The Hon. Minister knows and everybody knows that that was sold to wholesalers at the controlled rate plus Rs. 50 per cwt. package *santhosum* on the side. The people in the trade themselves told me this and that is precisely what is happening. What is happening today is that 25 per cent of the dry fish is being blackmarketed in the sense that a receipt is issued by the wholesaler to this importer at the controlled price but, in addition to that, Rs. 50 per cwt. package is being paid on the side for which no accounts are being kept. Is the Hon. Minister aware of this ? I am sure he does not know this. Are the Government officials unaware of this ?

As long as you allow this 25 per cent to continue in the hands of importers you are going to have this racket. Do you think the wholesalers are going to be without paying this Rs. 50 ? And, are these people going to keep quiet ? They will pass this on through the retailer to the consumer, and that is one of the reasons why this 75-25 per cent share must be ended and a complete monopoly established over the import or dry fish and that monopoly given either to the C. W. E. or some other State trading agency.

There is another reason. As I pointed out earlier, the dry fish trade is really a cover for a much more lucrative trade, the trade in smuggling of exchange out of this country and the smuggling of gold and dope into this country. Is the Hon. Minister aware of the new proposals that have come from the dry fish trade ? Up to now one of the reasons why they were frightened of the Government or the C. W. E. putting its fingers into this trade or

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the Government establishing a lien on food cargoes that come into Colombo harbour was this : that they would not only lose a trade worth Rs. 80 million a year but that when the Government got hold of those cargoes and opened them up they would find things other than dry fish inside the packages.

In fact, everybody knows the famous story of a certain ship owned by a dry fish company here which came into the harbour. I think it was called the "Mahaluxmi". What happened ? It rushed out again. There was a whole string of lorries waiting for the cargo to be unloaded. But this ship got off the quay before the C. W. E. were able to place a lien on it. Eventually, it went off, left the suspected cargo in India and came back with cargo which contained only dry fish !

What are these very people now doing ? They are proposing that this 75-25 arrangsment should not apply to each individual shipload, but that the Government should take the first three ships and that they should be given the fourth ship ! In other words the Government should take three ships containing dry fish only and they should get one ship of dry fish plus dope and gold. These are the type of proposals that are being put forward. I would ask my hon. Friend and the Government as a whole to stop this nonsense and to establish as early as they can a complete State monopoly over the import of dry fish into this country.

We know that various proposals are being put up to the Department. All this time the dry fish importers have been selling to wholesalers and retailers on credit—credit for as long as six months. So much so, that they claim that they have something like Rs. 12 million owing. But now they are coming forward and saying that they will import and hand it over to the C. W. E.—after extracting the non-dry fish articles in the packages—but that the C. W. E. must immediately pay cash for them. In other words a series of proposals are coming up one after another which are merely designed to perpetuate the old racket in a new form.

This is happening because of this 75-25 arrangement. Some time ago it was 50-50, but now apparently the position has slightly improved and it is 75-25, but still I tell the Hon. Minister and the Government that you are liable to fail in this venture as long as you continue this practice.

My hon. Friend, the Member for Galle (Mr. W. Dahanayake) gave the Hon. Minister several "golden" rules to try. I am sure the hon. Member for Galle speaks with some authority when he speaks about trade. After all he has been the champion of the private trader, the larger sections of the private trade. When he became Prime Minister and formed the L. P. P. he issued a manifesto of the L. P. P. which, apart from being against strikes, socialism and so on, was positive only in regard to one question and that is unrestricted rights for the private trade.

What do his "golden" rules amount to ? His golden rules amount to telling the Government and this country not to stick their fingers into the private trade. I was very pleased to hear the hon. Member for Galle talking about state-to-state trade. He said : "Let there be state-to-state trading." What does that mean ? It means that the Government and the C.W.E. should not stick their fingers into things like dry fish, onions, potatoes chillies and so on. My hon. Friend knows that in the case of commonly consumed foodstuffs here there is no question of state-to-state trade. He even mentioned, I think, eau de cologne and asked the Hon. Minister to sign a trade agreement with another country to import this eau de cologne. He also mentioned baby powder and other articles. But the fact is this. In most capitalist countries it is only in the case of major articles that the state comes in. In the case of other articles they usually refer buyers to reputable businessmen in their country. The most that the Government would do is to recommend that such and such

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

firms are reputable business houses for such articles. So, what the hon. Member for Galle was really saying was: Do not stick your fingers into the private trade. Allow them to continue to monopolise the situation.

All these tactics I believe will have to be fought. They must be fought resolutely. I am asking the Government to fight all these rearguard actions resolutely and not to spend much time on the "golden" rules of the hon. Member for Galle.

The next point I want to raise concerns sugar. I touched on this matter in the course of the Second Reading Debate on the Budget and I return to it again. I think the Government can easily reduce the price of white sugar. I am not talking now of reducing the price from 67 cents back to 62 cents. What I am saying is that it can easily be sold much cheaper—at 62 cents or even 60 cents—and still the Government can make the same profit it was hoping to make.

After the Budget was introduced the Government has contracted with various socialist countries for the supply of white sugar at phenomenally low prices. In fact it is cheaper today. The Government today is buying white sugar at prices which are very much cheaper than what they paid for raw sugar in the past. I think the cheapest price that they ever paid for raw sugar in the course of last year was 24 cents a pound—and quite often it was over that. But Government is now going to get white sugar at slightly under 15 cents a pound and they have already indented for a considerable supply for next year, that is, to buy 120,000 tons which is a supply equal to the total of both white and raw sugar which was sold in the previous year.

With that phenomenal drop in prices and in view of the cheap rates at which you have been able to negotiate another sugar supply for next year from socialist countries like the Soviet Union, Poland, Czechoslovakia and so on, why are you not thinking—instead of increasing the price of sugar from 62 cents to 67 cents—of bringing down the price of sugar? You can easily afford to do that. I know that it may not be possible to do that until the new stocks arrive, because you are selling at the moment stocks bought earlier. But as soon as the stocks arrive, I do ask the Government to make the necessary adjustments in the matter of the price of sugar. It is possible to do that and I hope it will be given the most serious consideration.

There is one point about matches. During the time we debated the tax on matches, a number of hon. Members pointed out the unsatisfactory production position in regard to matches. It is a nonsensical quota system that has been adopted. I am not going into it now because this concerns the Ministry of Industries and not the Ministry of Trade. Even today though the official price has been increased from 3½ cents to 5 cents it is almost impossible to buy a box of matches for 5 cents, particularly from very small retailers. Part of the reason is that there is 25 per cent under-production of matches. Only 75 per cent of the quota is being produced, even though these people have been given a monopoly.

The other point is that the whole question of pricing must be considered more carefully. Owing to inefficiency in production, costing and so on matches are today given even to the wholesalers at 4-79th cents. The wholesaler gives it to the retailer at a little more, so that both the wholesaler and the retailer are expected to get 2/9th of a cent on a box of matches. In the case of big firms which do not sell boxes individually, it is possible for them at least to cover up with a few cents profit. But in the case of the individual retailer this entire pricing system becomes nonsensical. What happens is that the retailer actually has to sell a box for 6 cents. He tells himself: "I must sell it at 6 cents to make a living or else close my shop or else suffer arrest by the price control inspector." So this matter has to be gone into again, particularly from the point of view of pricing.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.30

On the general question of price control I would like to say a few words. I think that an entire review must be made of the price control policy followed by the Government. The Government, in my opinion, is barking up the wrong tree. They have formed the opinion that it is the retailer who is the main blackmarketeer and all their price control efforts—ineffective though they are—are actully directed at this retailer. I am not saying that retailers do not blackmarket; many of them do but some of them do not. If you want to exercise a proper control of prices make it more effective at the point of wholesale. In this country there are about 2,500 wholesalers and about 45,000 retailers. These 2,500 wholesalers are dealing in all sorts of articles some are articles about which we need not worry very much. Out of the 2,500 wholesalers about 500 are dealing in articles which are mainly consumed by the people, other than the articles which are the monopoly of the C.W.E.

You have price control inspectors and you are recruiting some new price control inspectors. They are running all over the place catching hold of a retailer here and another there. They are charging retailers and the magistrates are fining Rs. 50 and so on. How many of your price control inspectors are in the Pettah where most of the wholesale transactions take place ? How many of your price control inspectors are watching the wholesale transactions in the big towns of the outstations ? Those are the places where they should be. I do not see why they should be spending so much time on the retailer. By all means have some flying check on the retailer but watch carefully, supervise carefully, those wholesale transactions.

I think it is absolutely essential for the Government to introduce a system of stock control to find out the stock position of the wholesaler. Find out from the wholesaler his stock position and then follow every wholesale transaction and see that the stocks are delivered to the retailer at the correct time, and also that they are sold at the correct rates. In that way you can also enlist some of the retailers into the struggle against the wholesaler, because these retailers are very often at the mercy of the wholesaler.

My friend the Hon. Minister of Finance says that every man is his own price control inspector. I do not know from where he gets some of his ideas ! If he is dreaming them then he is having really very bad dreams ! It is very nice to say that every man is his own price control inspector, but could you expect a person who lives on credit, who has to depend on the credit given by the retailer, to go round being a price control inspector ? It is all right for my hon. Friend, he does not have to depend on the credit of retailers. But the ordinary person depends on the retailer for credit and as long as he depends on credit he puts up with him.

I am for controlling the retailer too but please go into it at the point of wholesale. You can enlist some of the retailers themselves to complain against these wholesalers if they feel they are strongly backed in this matter.

Once again may I say this ? The C. W. E. is becoming a competitor to the retailer. As far as possible try and enlist the retailer by making the retailer a sub-agent. Of course, if the retailers are bad or inefficient then do their work.

One of these days you have got to educate the petty traders, break them out of the petty trade mentality. But that can only be done by associating them in the first instance with certain activities of the petty trade. I hope that aspect of price control will receive the attention of the Hon. Minister and the Government.

May I also draw the attention of the Hon. Minister to the need for improving not only the state of honesty and efficiency in the co-operatives but also the standard of service to the consumer. I feel this is a matter

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

to which some attention must be paid, because your co-operatives will never be able to compete with the private trade unless they are as civil to the consumer and as helpful to the consumer as the best of the private trader. There is no doubt that the best of the private trader goes on the basis that the customer is always right. You must try to please the customer. If you do not have some article you must try and pursuade him to buy another article which you do have. Salesmanship and civility are sometimes very important in these transactions.

What happens in a number of co-operatives? Some of the co-operative officials are becoming a bureaucracy themselves. All they are saying to the customer sometimes is that an article cannot be had or out of stock; no alternative is suggested; no way of treating the people properly is attempted. And I do not blame them because in the co-operatives the entire emphasis has been on keeping accounts, on rendering accounts, on keeping stocks and so on, but elementary public relations have not been stressed.

The co-operative movement has gone through a couple of stages. In the early days it was just an attempt to knock out the Indian trader and help the Ceylonese to enter the trade and they really got a fillip, if I may say so, under the hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena). He helped them to stand on their feet. But the point is, you must make the co-operatives a proper trading organization, make it possible for them to be able to compete with the private trader and to give the customer and consumer a standard of service, which will be at least on a par with what the best of the private trader is doing. That can only be done if you undertake to train the personnel, the managers and salesmen.

ඒ. රත්නායක මයා. (වත්තේගම)
(திரு. ஏ. ரத்னயக்க—வத்தேகம)
(Mr. A. Ratnayake—Wattegama)

Managers are trained at Polgolla!

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

Yes, managers are trained at Polgolla in accounts, book-keeping, in stocks and so on. It is high time that kind of training is changed.

Look at the matter of displaying your articles. Let us not go into the question of the small co-operatives but into the C. W. E. itself at Whiteaways. The C. W. E. there is now coming down to the level of a *kade* —things are in a jumble, there is no proper display of articles which you would see in other big shops. That question is not being properly tackled. In a small co-operative this cannot be done but in the C. W. E. there you have a large and wide range of articles. You can help the people to see what you have by a proper display of your articles. And the people who come there are not getting the necessary attention. I hope this matter will be looked into.

One point about the Marketing Department. How can the Marketing Department be supposed to be competing with the private mudalali in purchasing the produce of cultivators if it is not allowed to give advances? One of the ways by which the mudalalis always score is that long before the produce, fruit or vegetables, is grown, advances are given, and part of the produce is already mortgaged to the mudalali. Secondly, the mudalalis purchase on the spot. As long as the Marketing Department is not prepared to do that, they can never compete with the mudalalis. The Marketing Department expects the producer first of all to bring the stuff to the department, and only at that point it is prepared to take action; and sometimes even then the stuff is not taken. Cannot a scheme be worked out with the People's Bank or one of the credit institutions to assist the work of the Marketing Department from the point of view of providing credit to the producer? The real reason why Government can never control the price of fish, vegetables and so on is that most of it never passes through the hands of any of these agencies but passes

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

through private hands, and unless you are able to compete at the point of purchase you will not be able to get it. I hope this will also receive attention.

A word about corporations. I think it is high time that some effort was made to standardize salaries in corporations. Every corporation is becoming more or less a law unto itself. I see that one or two of the directors of some of the corporations whom the Hon. Minister has appointed have returned their salaries. It is a very nice gesture. It shows two things, that they are very honourable men, and also that they are men of private means. But I do not believe that directors and others should work for nothing ; otherwise it means that only rich people can work as directors in these corporations. But there must be some type of uniformity at least in the salaries paid by corporations.

We had a very bad experience with the C. T. B., and I am frightened that it might be introduced in some of the other corporations, particularly the Petroleum Corporation, because some of the salaries fixed there seem to be quite excessive.

The Petroleum Corporation is going to be one of our most important corporations and it is also one which is going to face the biggest opposition from private oil monopolists who have great influence with the press and organs of propaganda, and who are themselves able to carry on vast-scale propaganda and influence important people. So unless we watch that situation properly we would be creating ammunition which the petrol monoplists could use to knock down the corporation.

අ. භා. 3.45

When the Hon. Minister opened the corporation what did he say in his first speech to the board of directors ? He asked them, quite correctly, to be vigilant in making appointments. I think that is very necessary. But is that being carried out ? A number of persons who had been executives in American oil firms have been taken into the corporation. The hon. Member for Borella (Dr. W. D. de Silva) referred to the case of Mr. N. E. Weerasooriya. I have already spoken on that matter and I do not want to repeat it again ; it is a bad choice for this corporation. But even at the other levels—the executive levels—what is happening today ? There is a gentleman by the name of U. T. B. Vitachchi, a brother of the famous Tarzie Vitachchi—Members of the Government know how much Mr. Tarzie Vitachchi loved them—who was operational Assistant at Caltex and later promoted Assistant Terminal Superintendent, who has now been appointed Terminal Superintendent of the Petroleum Corporation on a salary of Rs. 2,000 a month. I think this is an unwise choice. There are other cases also.

I raise this question : it is necessary to get good men, reliable men, but are you satisfied about the reliability of some of the men you have appointed ? Are you satisfied that these people are worth the salaries ? Sometimes it is argued that if you do not pay these salaries you cannot attract good men. But is it necessary for there to be such a discrepancy between their former salaries and present salaries ?

ගරු ඉලංගරත්න

(கௌரவ இலங்கரத்ன)

(The Hon. Ilangaratne)

May I interrupt the hon. Member to give the facts ? I have here a list of appointments with all the particulars. Mr. U. T. B. Vitachchi was Technical Assistant, Irrigation Department, then Operations Assistant, Caltex, and Assistant Terminal Superintendent, Caltex. He was appointed Terminal Superintendent of the new corporation. In his last job he is supposed to have drawn Rs. 1,287.50 a month. As Terminal Superintendent of the Petroleum Corporation he is to be paid Rs. 2,025 a month.

කෙනමන් මයා.

(திரு. கெனமன்)

(Mr. Keuneman)

It is a very big step from his previous salary to the present salary. It is also one of the main points made

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

about C. T. B. salaries that persons who were getting, say, Rs. 1,000 a month are placed on Rs. 1,500 a month. I can understand your increasing the maximum of the salary scale, taking them on salaries more or less equivalent to what they received elsewhere and telling them that if their work is good, judged by results, they will be allowed to go on to higher salaries, but you are straightway giving people big steps. I have got a list here, and if you look at it you will find that it is not just some favour done to an individual like Mr. Vitachchi but a general question that should receive attention. I ask the Minister to see that his instructions regarding vigilance are being actually carried out.

During the Second Reading Debate I drew attention to the alarming adverse balance of trade this country has with Japan, India and Burma. Does the Minister propose to do anything about it? You cannot afford this situation to continue without approaching these countries and making some attempt to adjust the position. We are buying large quantities of goods from them; they are buying practically nothing from us. This is also one of the reasons why our external assets are falling. Therefore I hope that some action will be taken. This is not a situation peculiar to 1961; it has happened in 1957, 1958, 1959, and 1960, and I think there must be some attempt made to overcome it, either by working out a system of triangular trade with a third country or in some other way. It is not for me to dictate how it should be done.

Take the question of Japan. Japan buys practically nothing from us, but she buys rubber from Singapore. Why cannot you ask her to buy some rubber from us? We are buying all sorts of things from Japan. It is the same with India. Quite frankly, with all due respect to India, I must say that she is knocking us out of some of our markets. She is knocking us out of some of our tea markets in the Middle East. Then she sells a volume of goods to us and buys practically nothing from us. So I think that these matters should be discussed. I think if they are discussed at a sufficiently high level, sufficiently reasonably, some type of adjustment can be made.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

A trade delegation is going to Delhi in the middle of October.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I am very glad to hear that; I hope it will go to Rangoon and even to Tokyo to discuss this matter, because the cost of a trip is nothing compared to the progress that we will make on this problem. I hope it will be a high level delegation, with good trading men on it, with men who will take some realistic stand in defence of the trade position of our country.

There is one small matter about the labour co-operative in the Trincomalee Harbour. The Government has encouraged the setting up of a labour co-operative in the Harbour of Trincomalee. It was formed out of a number of harbour workers and it was asked to undertake the work of unloading. But neither the Food Department nor the other departments seem to be giving this co-operative any real support.

First of all, they have applied for some type of loan to help them to purchase some equipment, but that matter has been left in abeyance. The result is that they have to spend about Rs. 40,000 in hiring lighters from private establishments and private individuals in order to unload a ship.

Then the Food Department, the Government itself, has reduced the payments to these persons for the work that they do. When this work was handled by private firms they were paying, I think, at the rate of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Rs. 14 per ton ; now that the labour co-operative is functioning, they are paid at the rate of Rs. 8.50 a ton. It means so much less on an average cargo. I hope my hon. Friend will go into this matter. If you set up these labour co-operatives and ask them to undertake work against the private persons engaged in the trade then at least your departments must also help them in that work.

There are two more small points on the question of control of prices. A great deal of attention is paid on the external purchase prices of our goods, tea, rubber and coconut, but we do not get anything like the same attention paid on the internal prices, particularly of tea and coconut. Everybody makes speeches and says that coconut prices are going down. That is true externally, but not internally. We have enormous fluctuations in the prices of coconut as far as the external market is concerned, but even in the worst periods of the external market, the local price does not fall so much.

The same thing happens in the matter of tea. Hon. Members were referring to the fall in the prices of tea, but the man who goes and buys tea locally, where it is produced, never finds the price of tea going down. I think that aspect of the matter must also be examined. We cannot lose both on the swings and on the roundabouts. If certain prices go down, at least the domestic consumer must get some benefit.

Secondly, I ask my hon. Friend, the Minister, to introduce an investigation into the profiteering that is going on on certain articles of local consumption and which are produced in Ceylon. The Cost-of-Living Committee that the Minister appointed only went into certain matters regarding foodstuffs which are imported into this country. But I think it is necessary to follow that up with a proper investigation of the cost of articles produced in this country which effect the cost of living.

I gave many examples in the course of my speech on the Budget. I do not want to repeat them. There is profiteering going on on articles like soap, tooth paste, tooth brushes, analgesics, various medical drugs and so on. That is all a part of a person's cost of living, particularly of the urban people. But why is this not being examined ? May I ask the Hon. Minister to see that the same Committee or another Committee is appointed to examine this question also and to see what relief can be given to the consumer by curbing some of the exorbitant profiteering that is going on in this field as a whole.

I hope my hon. Friend will give attention to some of these points which I have mentioned.

එල්. බී. ජයසේන මයා. (බිංගිරිය)
(திரு. எல். பி. ஜயசேன—பிங்கிரிய)
(Mr. L. B. Jayasena—Bingiriya)

ගරු සභාපතිතුමනි, වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ මාත් වචන කිහිපයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. තමන්ගේ භාරයේ තිබෙන වැඩ කටයුතු සාර්ථක ලෙස කරගෙන යාමට දැඩි උත්සාහයක් ගන්න ගරු ඇමතිතුමාට ප්‍රථම කොටම ස්තුති කරන්ට කැමතියි. එතුමා ඉදිරියේ තිබෙන වැදගත් ප්‍රශ්න සෑහෙන තරමකින්වත් විසඳීම සඳහා උත්සාහ කරන් එතුමාට අපේ ස්තුතිය හිමි විය යුතුයි.

අපේ රටේ බහුතර ජනතාවට වුවමනා කරන අත්‍යවශ්‍ය ද්‍රව්‍යවලින් කිහිපයක් කලක සිටම සීමිත මිලකට සලාක ක්‍රමයට හෙවත් කූපන් ක්‍රමයට බෙදා හැරීම කර ගෙන එන බව අපි දන්නවා. ඒ ද්‍රව්‍ය ලබා ගැනීමට තිබුණ කරදර තවමත් සම්පූර්ණයෙන් නැති වී තිබෙනවාය කියන්ට බැහැ. ඒ නිසා මා නගන ප්‍රශ්නය නම් හාල් වැනි ඇතැම් අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් සීමිත ප්‍රමාණයක්, සීමිත මිලකට කූපන් ක්‍රමයට මහජනයා අතරේ බෙදා දීම අවුරුදු ගණනක් තිස්සේ කරගෙන යනවා නම් ඒ ක්‍රමය අනුව වෙන්ත් අත්‍යවශ්‍ය දේවලුත් බෙදා දීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් ඇති කරන්ට බැරිද යන්නයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසේන මයා.]

එවැනි ක්‍රමයක් අනුව අත්‍යවශ්‍ය බඩු බෙදා හරින්ට පුළුවන්කමක් තිබෙනවා නම් ඒ සඳහා යෙදිය යුතු පහසුකම් මොන වාද, එසේ කරන්න බැරි නම් මඟ හරවා ගත යුතුව තිබෙන අවහිරකම් මොනවාද යනාදී කරුණු ගැන කල්පනා කළ යුතුයි. ඒ නිසා ගරු ඇමතිතුමා ඒ ගැන කල්පනා කර බලා සුදුසු වැඩ පිළිවෙලක් ඉතා ඉක්මනින් යොදුවි කියා මා කල්පනා කරනවා. එසේ නොකළොත් කොයි තරම් උත්සාහ කළත්, කොයි තරම් දැඩි නීතිරීති ඇති කළත්, මේ ප්‍රශ්නය ස්ථිර වශයෙන් විසඳන්න පුළුවන් වේය කියා මා නම් හිතන්නේ නැහැ. හාල්, උම්බලකඩ වැනි අත්‍යවශ්‍ය දේවල් සීමිත ප්‍රමාණයක් සීමිත මිලකට සලාක ක්‍රමයට බෙදා දෙන්නාක් මෙන් ජීවිතයේ එදිනෙදා පාවිච්චියට වුව මනා කරන අත්‍යවශ්‍ය දේවල් පොදු ජනතාවට ලබා ගතහැකි වැඩ පිළිවෙලක් ඇති කිරීම ගැනයි මා සඳහන් කළේ. ඒ සම්බන්ධයෙන් තිබෙන ගැටළුව මොකක්ද යන්නයි මා අහන්නෙ.

සමුපකාර සමිති සම්බන්ධයෙන් ඊළඟට වචන ස්වල්පයක් කථා කරන්නට බලා පොරොත්තු වෙනවා. සමුපකාර ව්‍යාපාරය යටතේ මේ රටට විශාල සේවයක් සිදුවී තිබෙන බව කවුරුත් පිළිගන්නවා. සමහර ස්ථානවල වරින්වර යම් යම් දූෂණ සිදු වන බවට වාර්තා ලැබෙන නමුත් වැඩි වශයෙන්ම බහුතර ජනතාවට සමුපකාර ව්‍යාපාරය නිසා විශාල සෙතක් වන බව කවුරුත් අවිවාදයෙන් පිළිගන්නවා. මේ රටේ සමාජ ජීවිතයක් බිහිකිරීමෙහිලා සමුපකාර ව්‍යාපාරය හැමවිටම ඉවහල් වී තිබෙන බව කියන්න පුළුවනි. විවිධ සේවා සමුපකාර සමිති ක්‍රමය යටතේ පසුගිය කාලයේ ඉතා උසස් වැඩ පිළිවෙළක් ආරම්භ වුණා. නමුත් විවිධ සේවා සමුපකාර සමිති ආරම්භ කළ මුල් කාලයේ තිබුණු උද්යෝගය දැන් දකින්ට ලැබෙන්නේ ඉතම කලාතුරකින් බව කනගාටුවෙන් කියන්න ඕනෑ. සමුපකාර විවිධ සේවා සමිතිවලින් කරන්ට අදහස් කරන ලද්දේ ඉතා වැදගත් කාර්යයක් බව කල්පනා කරන මෙන් ඉල්ලා සිටිනවා. එයින් සාමාන්‍ය ජනයාට සැහෙන ප්‍රයෝජනයක් ලැබීගෙන ආ බව මතක් කළ යුතුයි. එම නිසා රටට අත්‍යවශ්‍ය දේවල් ලබා ගැනීම සඳහා නොයෙක් අඩුපාඩුකම් මඟ හරවා ගැනීම කළ යුතුම දෙයක් බව කල්පනා කළ යුතුයි. තව තවත් ධෛර්‍ය දී ලබන අවුරුද්ද තුළදී එහෙම නැත්නම් ළඟ ළඟම මේ ක්‍රමයෙන් නියම ප්‍රයෝජනයක් ලැබෙන ආකාරයට එය ප්‍රතිසංවිධාන ය කරන මෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 4

සභාපතිතුමා

(அக்கிராசனர்)

(The Chairman)

රැස්වීම විනාඩි 30 කට තාවකාලිකව අත් සිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදි.

ජයසේන මයා.

(திரு. ஜயசேன)

(Mr. Jayasena)

ගරු සභාපතිතුමනි, සමුපකාර සමිති සංගම් නමින් හැඳින්වෙන යුනියන්වලට බඩු ලබා ගැනීමට අපහසුකම් තිබෙන බව ඇමතිතුමාට කියන්න කැමතියි. සමිති සංගම්වලින් සී. ඩබ්ලිව්. ඊ. එකට බඩු ලබා ගන්න පැමිණි විට වුවමනා බඩු තොගය නියම විධියට ලැබෙන්නේ නැහැ. සමහර බඩු ලබා දෙන බවට පොරොන්දු වෙලා බිල ලිව්වට පස්සේ ඒ බඩු සපයන්න බැරිය කියා ආපසු දන්වනවා. සමිති සමාගම්වලට බැඳී සිටින සාමාජිකයන්ට ප්‍රමාණවත් ලෙස බඩු ලබා ගැනීමට තිබෙන අපහසුකම නිසා සමහර විට ඒ සමිති සමාගම්වලට බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ පාන්ට සිදු වෙනවා. එම නිසා සමුපකාරය අද ගෙන යන තත්ත්වය බිඳ වැටෙන්න ඉඩ තිබෙන අතර සමුපකාර ව්‍යාපාරයට ආපදා ගැන අසන්නත් සිදු වෙනවා. අද සමුපකාර සමිති වැඩි සංඛ්‍යාවක් ඉතාමත්ම අවංකව සේවය කරන බව කියන්න පුළුවනි. ඒ නිසා හැම සමුපකාර සමිති සංගමයකටම බඩු සැපයීමට මීට වඩා විධිමත් පිළිවෙළක් සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් යොදනවා නම් ඒ සමිතිවල සේවය නිසියාකාර ලබා ගන්න පුළුවන් වෙනවා ඇති.

සමිති සංගම්වලට බැඳී සිටින සාමාජික සමිතිවලට නිසි පමණ බඩු සපයන්න නොලැබීමෙන් ඒ ශාඛා සමිතිවල සාමාජිකත්වය ලබා ගෙන සිටින සාමාන්‍ය මහජනතාවට බඩු නොලැබී යන අවස්ථා රාශියක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවා. එම නිසාම සමුපකාර ව්‍යාපාරය ගැන මහජනයා තුළ තිබෙන විශ්වාසය නැති වී යන අවස්ථා තිබෙනවා. එම නිසා සමුපකාර සමිති සංගම්වලට සහ සමුපකාර සමිතිවලට අවශ්‍ය ප්‍රමාණ බඩු ලබා දීමට විධිමත් ක්‍රමයක් ඉක්මනින්ම සකස් කර දෙන්න ඕනෑ. අවශ්‍ය බඩු ප්‍රමාණය සපයා දී ඒවා නිසියාකාර නොබෙදන සමුපකාර ආයතන ඇත්නම් ඒවා විසුරුවා හැර ඒ සඳහා අන්‍ය පාලන ක්‍රමයක් සකස් කළාට වරදක් නැහැ. සමුපකාර තොග වෙළඳ ආයතනය ගැන මම දීර්ඝ ලෙස කථා කරන්නේ නැහැ. සමුපකාර තොග වෙළඳ ආයතනය කරදර මධ්‍යයේ වුනත් සෑහෙන සේවයක් කරනවා. නමුත් එහි කටයුතු සියයට සියයක්ම දූෂණ ක්‍රියාවලින්, අයථා ක්‍රමවලින් තොරව කෙරෙනවා යයි කියන්න බැහැ. සමුපකාර තොග වෙළඳ ආයතනයේ බඩු නොයෙක් විට නිශ්කාරණයේ විනාශ වී යන අවස්ථා අපට දකින්ට ලැබෙනවා. ඒවා අපතේ ගිය බඩු හැටියට කපා දැමීමට පුළුවන් බලයක් නීතියෙන් ලැබී තිබෙනවා. සමුපකාර සමිතියක නම් එසේ නිරර්ථක අන්දමින් විනාශයක් කර තිබෙනවා නම් කළමනාකරුගෙන් හෝ වඩාත් දරුණු ලෙස එය සිදු වී තිබෙනවා නම් කාරක සභාවෙන් හෝ අලාභය අය කර ගැනීමට නීති රීති සකස් වී තිබෙනවා. එසේ තිබියදී විශාල බඩු තොගයක් නාස්ති කර තිබුණත් අපතේ යාමක් හැටියට එය කපා දැමීමට සමුපකාර තොග වෙළඳ ආයතනයට හා එහි ශාඛාවලට පමණක් ඉඩක් ලැබෙන සේ නීතිය සකස් කර තිබීම සාධාරණ යයි මම සිතන්නේ නැහැ. සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ඒ මගින් පාලනය වන ශාඛාවලින් හෝ බලාපොරොත්තු විය නොහැකි අන්දමේ අපතේ යාම් සිදු වූ විට එම අපතේ යාම් ඒවා පාලනය කරන කළමනාකරුවන්ගෙන් අය කර ගැනීම සඳහා නීතිරීති සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. සමුපකාර තොග වෙළඳ ආයතනයේ පඩි නඩි සකස් කර ඇති පිළිවෙළ ගැන මැද කොළඹ පළමුවන ගරු මන්ත්‍රීතුමා (ශ්‍රීමත් රසීක් පරීඩ්) කී දේමයි අපටත් කියන්න තියෙන්නෙ.

The great difficulty is that this Government does not have or has not laid down any definite policy. We find on the one hand one Minister going towards the left lured by various attractive proposals but forward by our communist friends. On the other hand we find another Minister taking up the attitude that this country can become prosperous by Government and private enterprise contributing their share towards the industrial development and prosperity of this country. I see that in their Ten-year Plan they want private enterprise to contribute as much as 50 per cent or more towards the development of the country—industrial and commercial development. But the Hon. Minister of Commerce and Trade appears to be taking a line of action which will entirely kill this section of private enterprise. This Ten-year Plan, although it is a good plan, can never be implemented by this Government because of these divergent views of various Ministries.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I want to know whether they have abandoned this Ten-year Plan. It has been framed very carefully and if the policies in it are adhered to there is no doubt that a great deal could be done to improve standards in this country. But owing to differences of views, differences of policies, and as a result of Ministers not arriving at a common understanding in regard to future policy, it looks as if this Plan will never be implemented. It is only a Plan in the air, so to speak. It is only a sort of eye-wash.

I must congratulate the Hon. Minister on one or two things he is doing. He is working hard but I must say he is working hard in the wrong direction. That is the whole trouble. His intention seems to be good. He wants to serve this country. He wants to improve the living conditions of the poor masses of this country. But he is getting about it in the wrong way. Probably this is because he has always been working inside an office and does not know anything about trade and commerce in this country and, as a result, his actions might have disastrous results. I do not in any way condemn the Minister's intentions. I am only saying that he is setting about matters in the wrong way. His intentions are very good indeed. But I have to condemn him because he is doing things in the wrong way. There are no proper people who can advise him. Or it may be that he has good advisers but he is not susceptible to their advise and he is going on in his own way led by certain groups in this country who flatter him by saying that he is doing everything possible, that he is creating state monopolies and so on. But the Minister is forgetting that the creation of state monopolies means that individual freedom is going to be completely lost in this country. Private enterprise is going to be wiped out. When the history of this period comes to be written the Hon. Minister will probably be known as the person who really massacred private enterprise in the country.

I am saying this because, as I understood it, the policy of this Government is to encourage private enterprise side by side with state activities. But how is the Minister setting about this? He does not seem to realise the sufferings of the people. Unemployment is becoming more acute. The figures for unemplayment are now the highest on record in this country. The Minister does not seem to realise that by trying to reduce the price of a commodity by a few cents, which even the poorest people can somehow afford, he is depriving a large number of people of their businesses and trades, of their living. He does not seem to realise that as a result people are being thrown out of employment. This means greater suffering in this country. I would like to ask the Hon. Minister: Is it his policy or is it not his policy to encourage private enterprise and help the trade? By all means do so without destroying the trades and industries that have been built up over the last so many years or perhaps over a whole century in this country.

If by his activities he is improving the conditions of the people, if he is supplying the people with cheaper consumer goods, if he is raising the standard of living of the people, then by all means we can say that he is doing the right thing. But we see that things are getting worse everyday. The Government itself is getting more and more into debt by these activities in the wrong direction and that is why I say that the Government must follow some set plan. They lay down a plan and say this is how they are going to work but each Minister carries on his work in his own way. That is the grave danger in this country.

The Hon. Minister also seems to think that by taking over these trades into the hands of the Government he is helping to form a socialist government. As I said before, we can see an example of real socialism in the Paddy Lands Act that this Government introduced. Help is given to the farmer to improve his conditions. That is more like real socialism. But if the Government takes into its hands all the farms and runs them as

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය කලීල්]

a monopoly and makes the farmer a paid servant, we oppose it. That is the kind of socialism our leftist friends would like this Government to follow.

Let us have the kind of socialism where the people are free and the conditions of the people are improved. That is the kind of socialism I would like this Government to foster and not walk into the trap of our Communist friends.

අ. භා. 7

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்சி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

You want the capitalist system in this country !

වෛද්‍යාචාර්ය කලීල්
(டொக்டர் கலீல்)
(Dr. Kaleel)

Of course !

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்சி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

You want the private trader to prosper.

වෛද්‍යාචාර්ය කලීල්
(டொக்டர் கலீல்)
(Dr. Kaleel)

Yes, we want them to prosper. It is the prosperity of the private trader that makes the country prosper, whereas your communist system will make this country a land of beggars or slaves. Under your monolithic system——

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்சி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

The people want that system.

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)
(டொக்டர் என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)
(Dr. N. M. Perera—Yatiyantota)

What about Nasser ?

වෛද්‍යාචාර්ය කලීල්
(டொக்டர் கலீல்)
(Dr. Kaleel)

We are a country of people who are religious-minded. Whether it is Nasser or Khrushchev it does not make much of a difference to me. The hon. Member for Yatiyantota (Dr. N. M. Perera) seems to think that because a man happens to belong to a particular religion we agree with all his nonsense.

This is a country where the people are religious-minded and the people love freedom. I do not think our leftist friends will ever win the confidence of the people of this country. I do not think they will ever be returned in sufficient numbers to form a Government. The present Government was able to win so many seats and form a Government because they promised the people that they would carry out certain policies which will encourage private enterprise and which will guarantee the freedom of the individual in this country. Now let not the people turn round and say that the S. L. F. P. Government has deceived them by allowing itself to be led by the nose by our leftist friends on that side.

If the Government follows a policy which is in keeping with the promises they made to the people of this country, and not be led in this manner to destroy the freedom of the people and free enterprise that exists in this country, the Government will do well and we can very soon look forward to a very prosperous country, and other countries will look to Ceylon for its products like tea and rubber. See what is happening to our coconut industry. When the people outside realize that our country is free and that we are not being led into some sort of ideology which they do not like, then naturally our prices will not come down.

It is the western countries, particular Britain that buy the largest proportion of our produce. They buy about 600 million rupees worth of our produce. But how much is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Russia buying? Only a very small proportion, perhaps about 10 million rupees worth of our produce. But what are our leftist friends doing? The whole time they are attacking the Western countries, labelling them as Anglo-American imperialists and that kind of thing. We heard a very interesting attack by the hon. Member for Borella (Dr. W. D. de Silva). He made some absolutely unfounded statements.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

You should have been born in the last century!

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

Seventeenth century would have been better!

වෛද්‍යාචාර්ය කලීල්
(டொக்டர் கலீல்)
(Dr. Kaleel)

The last century was much more prosperous and the people were happier and freer than today. Today we are living in terror. The whole world is living in fear. Naturally I regard with greater happiness the good days of the last century than the present conditions under which everyone is living in terror. Not only small countries but bigger and powerful countries, in spite of their wealth, in spite of their power, are living in terror. Perhaps our hon. Friends do not realise it.

I do not object to socialism as such but what I do object to is this kind of fraud that is being perpetrated on the people as socialism. Socialism is a good thing. Even we of the U. N. P. had a social welfare state in view. But it should not be a kind of socialism that is a deception on the people of this country.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

You nationalized the railway.

වෛද්‍යාචාර්ය කලීල්
(டொக்டர் கலீல்)
(Dr. Kaleel)

There is nothing wrong about it. Let us have socialism under which the people are helped to do good work, and the country is helped by private enterprise, instead of destroying that private enterprise that is there to help you and give you every possible service, to improve the conditions of the people of this country.

බී. එච්. බණ්ඩාර මයා. (බදුල්ල)
(திரு. பி. எச். பண்டார—பதுளை)
(Mr. B. H. Bandara—Badulla)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ප්‍රථම යෙන් කථා කළ මැද කොළඹ තුන්වෙනි ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය කලීල්) බොහොම අමාරුවකින් කථා කළා, ඇමෙරිකාවට බණින්නවාය, අධිරාජ්‍යවාදයට බණින වාය, කියා. අපි දන්නවා, ඇමෙරිකාවට බණින කොට, අධිරාජ්‍යවාදයට බණින කොට, මැද කොළඹ තුන්වෙනි ගරු මන්ත්‍රීතුමා වැනි අයට ටිකක් අමාරු ඔව. අප ඇමතිතුමා මහන්සියෙන් වැඩ කරනවාය, ඕනෑකමකින් වැඩ කරනවාය, කියා එතුමාට ප්‍රශංසා කළ අතර එතුමා යන පාර හරි නැත, කියාත් ඒ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. අපි යන්නේ එක්සත් ජාතික පක්ෂය ගිය වැරදි පාරේ නොවන බව මා එතුමාට මතක් කරන්න කැමතියි. හරි පාරේ යන්ට මේ රටේ ජනතාව අපට බලය දී තිබෙනවා.

වෛද්‍යාචාර්ය කලීල්
(டொக்டர் கலீல்)
Dr. Kaleel)

පාර වැරදිලා.

බණ්ඩාර මයා.
(திரு. பண்டார)
(Mr. Bandara)

පාර වැරදුනේ කාටද කියා මැද කොළඹ තුන්වෙනි ගරු මන්ත්‍රීතුමා හොඳ හැටි දන්නවා ඇති. තව ඉදිරියටත් වරදින්න ඉඩ තිබෙනවා. එතුමාගේ කොට්ඨාශයේ කර වල වෙළඳාම කළ වෙළඳුන්ට ලොකු පහරක් වැදුනු නිසා ඒ ගැනත් එතුමාට ලොකු වේදනාවක් තිබෙනවා. මේ රට ගසා කෑ මේ රටේ ජාතික ධනය නොයෙක් අයුතු ක්‍රමවලින් වෙනත් රටවලට ඇදගෙන ගිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

ඒ කූට වෙළඳුන් කීප දෙනකුට පහරක් වැදුනත්, මේ රටේ විශාල ජනකායකට එයින් ලොකු සේවයක් සිදු වුණු බව ඒ මන්ත්‍රීතුමා අමතක කරන්ට හොඳ නැහැ. මෑත ඉතිහාසයේ කිසිදාක මේ රටේ ජනතාවට සත 70කට 80කට 90කට කරවල රාත්තලක් ගන්න පුළුවන්කමක් තිබුණේ නැහැ, ආහාර ඇමතිතුමාගේ මේ ව්‍යාපාරය ඇති නොවුණානම්. ඇමතිතුමාටත් ආණ්ඩුවටත් මෙම ව්‍යාපාරය පටන් ගත් මුල් කාලයේ කරවල සම්බන්ධයෙන් විශාල චෝදනා තිබුණත්, එදා ඇමතිතුමාට චෝදනා කළ අය අද ස්තුති කරන බව අපට පෙනී යනවා. මා හිතනවා, ඒ මන්ත්‍රීතුමාටත් තව ටික කලකින් එය අවබෝධ වේය කියා.

අනික් කාරණය, මට ස්වල්ප වේලාවකට කලින් කථා කළ බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) මෙම කරවල අංශය භාර රාජපක්ෂ මහත්මයාට චෝදනාවක් නැඟුවා, එතුමාගේ වැඩ පිළිවෙළ හොඳ නැත, එහි දූෂණ සිදු වෙනවාය කියා. ඒ වේලාවේ ගරු ඇමතිතුමා ඇසුවා, එවැනි චෝදනාවක් හේතු සහිතව ඉදිරිපත් කරන්න පුළුවන්ද, කියා. එසේ කරන්න බැරි බව බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ඒ විධියේ කට කථා අනුව අවංක නිලධාරීන්ට චෝදනා නොකරන ලෙස මා ගරු මන්ත්‍රීන්ගෙන් ඉල්ලා සිටිනවා. මේ රටේ ලොකු ප්‍රශ්නයක්ව තිබුණු කරවල ප්‍රශ්නය ඉතා ඉක්මනින් විසඳීමට රාජපක්ෂ මහත්මයා මහත් උනන්දුවකින් හා ඕනෑකමකින් කටයුතු කළා. මේ රටේ සෑම ප්‍රදේශයකින්ම ඉතා අඩු මිලකට කරවල ලබාගැනීමට පුළුවන් වන අන්දමේ ක්‍රමයක් එතුමා විසින් සකස් කරන්ට යෙදුනා. ඉතා උද්‌යෝගිමත්ව ඒ කටයුත්ත කිරීම ගැන එතුමාට අපි ස්තුති කරනවා.

මෙහි නොයෙක් අඩුපාඩුකම් තිබෙන බව අප පිළිගන්නවා. කරවල බෙදා හැරීමේ අඩුපාඩුකම් තිබෙනවා. බොහෝ කාලයක් කූට වෙළඳුන් අතේ තිබුණු කරවල ව්‍යාපාරයට මෑතකදී අතට ගත් සමුපකාර තොග වෙළඳ ආයතනයට එතරම් ඉක්මනින් සර්ව සම්පූර්ණව මේ කටයුත්ත කරන්න පුළුවන්කමක් නැහැ. අප බලාපොරොත්තු වෙනවා, ඉතා ඉක්මනින් අපේ ඒ අඩුපාඩුකම් සකස් කරගෙන කරවල ප්‍රශ්නය කියා එකක් මේ රටේ නොතිබෙන්ට කටයුතු කරන්න.

ඒ වාගේම කරවල සඳහා මෙරටින් පිට රට ඇදී යන කෝටි ගණනක් වූ විශාල මුදල මේ රටේ නවත්වාගැනීම සඳහා කරවල මෙහිම නිෂ්පාදනය කිරීමටත්, ඒ අනුව රැකීරක්ෂා නැතිව සිටින මහජනයාට ශාන්තියක් ලැබෙන අන්දමේ වැඩ පිළිවෙළක් සකස් කිරීමටත්, අප අදහස් කරනවා. මේ රට හතර වටේම තිබෙන්නේ මහ මුහුදයි. රට වටේ තිබෙන ඒ වස්තුව උපයෝගි කරගෙන කරවල නිෂ්පාදනය කිරීමෙන් මේ රටේ මහ ජනතාවගේ රැකී රක්ෂා ප්‍රශ්නයත් විසඳා මේ රටේ ජාතික ධනය මේ රටේම රඳවා ගැනීමට කටයුතු කිරීමට අපි අදහස් කරනවා. ගරු ඇමතිතුමා ඉතාම ඉක්මනින් ඒ පිළිබඳව වැඩ පිළිවෙළක් ගන්නවා ඇත කියා අපි බලාපොරොත්තු වෙනවා.

අ. භා. 7.15

කරවල පිළිබඳ ප්‍රශ්නය මතු වී තිබෙන මෙම අවස්ථාවේදී මතක් කළ යුතු තවත් විශේෂ කරුණක් තිබෙනවා. අපේ ප්‍රදේශය වන උඟව ප්‍රදේශයේ සමුපකාර තොග වෙළඳ ආයතනයක් නැති වීම ගැන මම කනගාටු වෙනවා. උඟව ප්‍රදේශයේ අගනුවර වන බදුල්ලේ නොහොත් මා නියෝජනය කර සිටින කොට්ඨාශයේ සමුපකාර තොග වෙළඳ ආයතනයේ ශාඛාවක් පිහිටුවා කරවල පමණක් නොව අනෙක් සියලුම ආහාර ද්‍රව්‍ය වගීත් පාලන මිලට ඒ ශාඛාව මගින් බෙදා හැරීමට ඉතා ඉක්මනින් කටයුතු කිරීම ඉතාම වැදගත් බව මම ගරු ඇමතිතුමාට මතක් කරනවා.

නියෝජ්‍ය සභාපතිතුමනි, අල රාත්තල් තුනහමාරක්, සීනි රාත්තල් 7ක්, ආදි වශයෙන් බඩු ගෙන ගොස් වෙළඳාම් කරන අපේ ගමේ ගොඩේ සිටින සුළු වෙළෙන්දන්ට කරවල ආදිය ලබාගැනීමට අපහසු වීමෙන් තරමක ප්‍රශ්නයකට මුහුණ පාන්න සිද්ධ වුණ බව අපි දන්නවා. ඒ නිසා සමුපකාර කඩ සමිතිවලට පමණක් නොව පෞද්ගලික වෙළෙන්දන්ටත් හැකි තරම් කරවල සපයා මේ රටේ තිබෙන කරවල හිඟය මග හැරීමට අපි කටයුතු කරන්න ඕනෑ. ඒ වගේම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරවල ලොරි දෙක තුනක් ගෙන ගොස් තමන්ගේ ඡන්ද කොට්ඨාශවල පාරිභෝගිකයින්ට බෙදා දීම ගරු මන්ත්‍රීන්ට හැම දාම කරන්න පුළුවන් වැඩක්ය කියා මම පිළිගන්නේ නැහැ. කරවල බෙදා හැරීම මන්ත්‍රීවරයකු විසින් කළ යුතුයයි මා පිළිගන්නේ නැහැ. ඊට වඩා වැදගත් කට යුතු ඕනෑ තරම් අපට කරන්න තිබෙනවා. ඒ නිසා මන්ත්‍රීවරුන්ගේ මාර්ගයෙන් නොව මුළු රටටම කරවල බෙදී යන අන්දමේ වෙනත් වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. කරවල විකිණීම මන්ත්‍රීවරුන්ට කළ හැකි දෙයක් නොවෙයි. ඒ නිසා තාවකාලික බෙදීමේ ක්‍රම සූදානම් කර ගන්නේ නැතිව පොදුවේ රටේ සෑම තැනටම කරවල බෙදී යන අන්දමේ වැඩ පිළිවෙළක් සකස් විය යුතු බව මම මතක් කරන්න කැමතියි.

එක්සත් ජාතික පක්ෂය මෙම කරවල ප්‍රශ්නයෙන් දේශපාලන වාසියක් ලබා ගැනීමට තැත් කළා. බදුල්ලේ සිටින එක්සත් ජාතික පක්ෂයේ නියෝජිතයන් හන්දිවලට වී ගම්බද ප්‍රදේශවල සිට පැමිණෙන මහජනතාව මුළා කරමින් "ඔන්න උඹලා ඡන්දය දුන්නා, දැන් උඹලට කරවල කෑල්ලක් ගන්නත් නැහැ, ගිනිපෙට්ටියක් ගන්නත් නැහැ" ආදී වශයෙන් යම් යම් ප්‍රචාර කළ බව මම හොඳින්ම දන්නවා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයට පන්දම් අල්ලන බදුල්ලේ කඩකාරයින් ඔවුන් සතු කඩ සතියක් වසා මහජනතාව හාමතේ තැබී මේ ව්‍යාපාරයක්ද ගෙන ගියා. නමුත් එය හරි ගියේ නැහැ. ඔන්න ඔය විධියට රට මකබෑ වුණත්, මහජනයා විනාශ වුණත්, ඔවුන්ට වුවමනා කළේ මේ රටේ මහජනතාව කලකිරවා කරවල ප්‍රශ්නය තමන්ගේ වාසියට හරවාගෙන දේශපාලන ප්‍රචාරක කටයුතු කිරීමටයි.

අද විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා කථා කරමින් කිව්වා, පසු ගිය මැතිවරණයේදී තරඟ කළ අපේක්ෂකයන් තුන් දෙනකු අධ්‍යක්ෂවරුන් වශයෙන් පත් කිරීමෙන් ඇමතිතුමා ලොකු වරදක් කර තිබෙනවා කියා. මම අහන්න කැමතියි. එක්සත් ජාතික පක්ෂයේ නායකයින් ඔවුන්ගේ පරාජිත අපේක්ෂකයන් පිටරටවල තානාපතිවරුන් වශයෙනුත්, ඒ වගේම සෙනෙට් මන්ත්‍රණ සභාවේ සාමාජිකයන් වශයෙනුත්, පත් කළ බව ඔවුන්ට මතක නැද්ද කියා. එපමණක් නොව, එක්සත් ජාතික පක්ෂයට ආධාර කළ, මුදල් පරිත්‍යාග කළ, අයට පුරවැසි කම් දුන්නේ නැද්ද කියා මම අහන්න කැමතියි. එපමණක් නොව, එවැන්නන්ට නම්බු නාම පවා දුන්නේ නැද්ද කියා මම අහන්න කැමතියි. එක්සත් ජාතික පක්ෂයේ අරමුදලට රුපියල් 5,000 ක පරිත්‍යාගයක් කළ බදුල්ලේ ඉන්දියානු මුදලාලි කෙනකුට පුරවැසිකම දුන් බව මම හොඳින්ම දන්නවා. ඒවා ගැන කථා කරන්නේ නැහැ. තමුන්නාන්සේලා ඇමතිතුමාට කියන්නේ, මේ රජය කෙරෙහි කිසි විශ්වාසයක් නැති, මේ රජය මක බෑ කරන්න දඟලන, එක්සත් ජාතික පක්ෂයේ අය මේ තනතුරුවලට පත් කරන්න කියලද? ඒ වාගේම කළුගල්ල ඇමතිතුමාගේ නෑදෑයකු පත් කළාය කියා චෝදනා කළා. ගරු ඇමතිවරයකුගේ නෑදෑයකු වූ පලියට, එසේ නැත්නම් මන්ත්‍රීවරයකුගේ නෑදෑයකු වූ පලියට, රජයේ තනතුරක් ඉසිලීමට අයිතිවාසිකමක් නැද්දැයි මම ප්‍රශ්න කරන්න කැමතියි. ඇත්ත වශයෙන්ම මේවා විහිළු කථා හැටියට සලකන්න පුළුවනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමුපකාර ව්‍යාපාරය ගැන ඊළඟට වචන ස්වල්පයක් කථා කරන්න මම අදහස් කරනවා. ඇත්ත වශයෙන්ම මේ සමුපකාර ව්‍යාපාරය මෙයට අවුරුදු කිපයකට උඩදී ආරම්භ කළේ සමුපකාර ණය දෙන සමිති වලිනුයි. නමුත් අද ඒ සමුපකාර සමිති ව්‍යාපාරය පළල් වී ඇති බව පෙනී යනවා. මුලින්ම ගම්බද සමුපකාර ණය දෙන සමිති පිහිටුවා ගත්තේ ගම්බද දුප්පත් ජනතාව ගිනි පොලී කාරයින්ගෙන් බේරා ගැනීම පිණිසයි. ඒ අයට සුළු පොළියක් ගෙවා, මෙම සමිතිවලින් ණය ලබා ගැනීමට අවස්ථාව සැලසුණා. අද මෙය ඉතා පුළුල් ආකාරයෙන් ගෙන යනවා දකින්න ලැබීම ඇත්ත වශයෙන්ම සතුටට කාරණයක්.

ඊළඟට විශේෂයෙන් එක්තරා කාරණයක් ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන කරන්න කැමතියි. අපේ පළාත් වල වැසියන්ට පහසුවෙන් ද්‍රව්‍ය මිලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

ගැනීම සඳහා සමුපකාර තොග වෙළඳ ආයතනයේ ශාඛාවක් උඟව ප්‍රදේශයේ පිහිටුවන්න කටයුතු සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ලංකාවේ බොහෝ පළාත්වල වැඩි දෙනෙක් ආහාරය සඳහා ගන්නේ උඟව ප්‍රදේශයේ වැවෙන එලවළුයි. නුමුත් බොහෝ අවස්ථාවලදී මේ ප්‍රදේශයේ එලවළු රාත්තලක මිළ කොළඹ නගරයේ මිළට වඩා වැඩියි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

බදුල්ලේ ගරු මන්ත්‍රීවරයාට මතක් කරන්න කැමතියි, ලබන මාර්තු 1 වැනිදාට පෙර හතරැස් අඩි 14,000ක් ප්‍රමාණය ඇති විශාල වෙළඳ ගබඩාවක් තැනීමට අප බලාපොරොත්තු වන බව. ඒ වගේම බදුල්ල දිස්ත්‍රික්කයේ වැල්ලවාය, බිබිලේ, සහ බණ්ඩාරවෙල යන ප්‍රදේශවල තවත් ශාඛා 3ක් පිහිටුවන්න බලාපොරොත්තු වෙනවා.

බණ්ඩාර මයා.
(திரு. பண்டார)
(Mr. Bandara)

මේ කාරණය ගැන මතක් කරන විටම ගරු ඇමතිතුමා ඒ අවශ්‍යතාව සම්පූර්ණ කර දීමට වැඩ පිළිවෙලක් සකස් කර තිබෙන බව ප්‍රකාශ කිරීම ගැන මා විශෙෂයෙන් එතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශෙෂයෙන් මේ අවස්ථාවේදී මතක් කළ යුතු තවත් කරුණක් තිබෙනවා. අපේ ප්‍රදේශයේ සහල් විශාල ප්‍රමාණයක් නිපදවන නමුත් ප්‍රදේශයේ වැසියන්ට ඒ සිංහල හාල් ලබා ගන්න අවස්ථාව සැලසී නැහැ. ඒ සහල් පිටපළාත්වල බෙදා හැරීමට කටයුතු යොදා තිබෙනවා. එපමණක් නොවෙයි, මෙම ප්‍රදේශයේ නිපදවන වී පිරිසිදු කිරීම සඳහා මාතර තිබෙන වී මෝලට එවන්න සිදු වෙනවා. මේ නිසා විශාල මුදලක් රජයට වැය වෙනවා. යම් විධියකින් මේ ප්‍රදේශයේම වී මෝලක් පිහිටුවන්න කල්පනා කරනවා නම්, ඒ වැය වන මුදල ඉතිරි කර ගන්න පුළුවන් වෙනවා. මේ ප්‍රදේශයේ නිපදවන සහල් වෙනත් වෙනත් පළාත්වල මහජනයාගේ ප්‍රයෝජනය සඳහා යවන්නේ නැතුව ඒ සහල් සමුපකාර කඩ සමිති මාගීයෙන් පළාතේම වැසියන්ට බෙදා හැරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළයුතු බව ගරු ඇමතිතුමාට මතක් කර සිටිනවා.

මේ අවස්ථාවේදී සමුපකාර කඩ සමිති ගැනද වචනයක් සඳහන් කරන්න ඕනෑ. ඇතැම් පළාත්වල එක්සත් ජාතික පක්ෂයේ බලකොටු හැටියට කටයුතු කරන සමුපකාර කඩ සමිති තිබෙනවා. මේ සමිතිවල දූෂිත ක්‍රියා කලාපයේ ප්‍රතිඵලයක් වශයෙන් බොහෝවිට මහජනයා රජය කෙරෙහි කලකිරීමට පත් වෙනවා. ඇතැම් කඩ සමිතිවලට කරවල වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් ගෙන්වන්නේ නැහැ. එසේ නොගෙන්වා මහජනයාට කියනවා, අපට ඒ ද්‍රව්‍ය ලැබෙන්නේ නැත කියා. මේ නිසා මහජනයා ආණ්ඩුව කෙරෙහි කලකිරෙනවා. එම නිසා යූ. එන්. පී. බලකොටු බවට පත්වී තිබෙන මෙම සමුපකාර කඩ සමිතිවල වගකිව යුත්තන්ට දඬුවම් පමුණුවා සෑම දෙනාටම අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඉතා පහසුවෙන් ලබාගැනීමට වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ගරු ඇමතිතුමාට මතක් කර සිටිනවා.

ඊළඟට මිළ පාලක නිලධාරීන් සම්බන්ධයෙන්ද වචනයක් කථා කිරීමට අදහස් කරනවා. මෙම නිලධාරීන්ගෙන් වැඩි දෙනෙක් අල්ලස් ලබාගන්න බව නම් ඉරහඳ මෙන් ප්‍රත්‍යක්ෂ කරුණක්. මෙයට කළ හැකි එක ප්‍රතිකර්මයක් නම් එම නිලධාරීන්ට එක පළාතක වැඩි කලක් ඉන්න ඉඩ නොදීමයි. එක පළාතක වැඩි කලක් රැඳී සිටින විට ඒ පළාතේ ලොකු වෙළඳුන් සමග නොයෙක් විධියේ සම්බන්ධකම් ඇති කරගෙන, ඒ අයගෙන් අල්ලස් වශයෙන් මාස්පතා යම් යම් දේ ලබාගෙන, තම රාජකාරී කටයුතු හරිහැටි ඉෂ්ට නොකරන්න පුළුවනි. ඔවුන් තොග වෙළෙන්දන් අල්ලන්නේ නැහැ, ඔවුන්ගෙන් ගතමනාව ලැබෙන නිසා. එසේ ගතමනාව නොලැබෙන නිසා සුළු වෙළෙන්දන් ඔවුන් අමාරුවේ දමනවා. එම නිසා මේ නිලධාරීන් ලංකාවේ හැම තැනම මාරු කර හැරීමේ වැඩ පිළිවෙලක් සකස් කරන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අද වෙළඳ සමාගම් හිටි හැටියේම තම සේවකයින් අස් කිරීමේ වැඩ පිළිවෙලක් ගෙන යනවා. ඒ සේවකයින් ආරක්ෂා කිරීම රජයේ යුතුකමක්. එම නිසා අණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පනත් පනවා හෝ ඔවුන්ගේ තත්ත්වය ආරක්ෂා කිරීමට විධිවිධාන සලසන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපේ ආහාර ඇමතිතුමා තරම් මේ කාල සීමාව තුළ වැඩ කළ වෙන ඇමති කෙනෙක් නැහැ. ඒ වාගේම ඒ තරම් විශාල බැණුම් ඇසූ ඇමතිවරයෙකුත් ඇත්තේ නැහැ. එසින්ම හිතාගන්න පුළුවනි, එතුමා කළ වැඩ ප්‍රමාණය ගැන. වැඩිය බැණුම් අහන්නේ වැඩිය වැඩ කරන අයයි. වැඩ නොකරනවා නම් බැණුම් අහන්නෙත් නැහැ. ඒ බැණුම්වලින් අධෛර්‍යවීමත් නොවී තවත් ධෛර්‍යවීමත් වී, මේ රජය බලයට පත් කළ දුප්පත් මහජනතාවට ලාභයට යමක් කන්න බොන්න ලබා දී ඔවුන් සුඛිත මුදිත කිරීම සඳහා තවත් ඉදිරියට යන ලෙස ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

සිරිසේන මයා.
(திரு. சிறிசேன)
(Mr. Sirisena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විදේශීය ධනකුවේරයන් ස්වල්ප දෙනකු සතුව තුබුණු ඒකාධිකාරී වෙළඳ ව්‍යාපාර කිහිප යක් ජාතිය සන්තක කිරීමෙන් ඉතාමත් වීර ක්‍රියාවක් කළ අපේ ගරු වෙළඳ, ආහාර හා නාවුක කටයුතු පිළිබඳ ඇමතිතුමාට පළමුවෙන්ම මම මගේ ස්තුතිය පිරිනමනවා. එතුමා පසුගිය ස්වල්ප කාලය තුලදී ඉතා වැදගත් වෙළඳ ව්‍යාපාර කීපයක් සංයුක්ත මණ්ඩල මාර්ගයෙන් ජාතිය සන්තක කර තිබෙනවා. සමුපකාර වෙළඳ ව්‍යාපාරය දැනට වර්ෂ කිහිපයක කාලයේ සිට මේ රටේ ඉතා ශීඝ්‍ර ලෙස දියුණු වීගෙන එන්නක්. මේ ව්‍යාපාරය මීට වඩා පළල් ලෙස මහජනයාට ප්‍රයෝජන ලැබෙන අයුරු පසුගිය මහජන එක්සත් පෙරමුණේ රජය විවිධ සේවා සමුපකාර සමිතිවලට පරිවර්තනය කිරීම නිසා දැනටමත් ඉන් ඉමහත් ප්‍රයෝජන ලැබී තිබෙනවා.

ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමේදී තරමක ප්‍රමාද දෝෂ තිබෙන බව අපට පිළිගැනීමට සිදු වී තිබෙනවා. එම නිසා මම ගරු ඇමතිතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, ඒ ඒ ප්‍රදේශවල බඩු ගබඩා කිරීමට ස්ථාන කිහිපයක් ඉතා ඉක්මනින් පිළියෙල කොට ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමේ මධ්‍යස්ථාන පිහිටුවන ලෙස.

සමහර පෞද්ගලික වෙළඳ ව්‍යාපාරික යන් අලුත් ක්‍රමයේ බෙදා හැරීමක් පටන් ගෙන තිබෙන බව ගරු ඇමතිතුමා දන්නවා ඇති. ඔවුන් කොළඹ සිට ලොරිවල බඩු පටවාගෙන හිඟුරක්ගොඩ, පොළොන්නරුව, ගල්ඔය, මින්නේරිය සහ මිනිපේ වැනි ස්ථානවලට ගෙන ගොස් විකුණනවා. එවැනි පිළිවෙළක් අනුගමනය කරමින් සමුපකාර තොග වෙළඳ ආයතනයේ ලොරිවලින් හෝ බඩු ගෙන ගොස් දුෂ්කර ප්‍රදේශවල සිටින සිල්ලර වෙළෙන්දන්ට පාලන මිලට තොග වශයෙන් විකිණීම සඳහා උචිත වැඩ පිළිවෙළක් ඉතා ඉක්මනින් ඇති කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 7.30

ගරු මන්ත්‍රීන් කීපදෙනෙක්ම කරවල ප්‍රශ්නය මතු කළා. දැන් ඒ ප්‍රශ්නය සෑහෙන ප්‍රමාණයකින්වත් විසඳී තිබෙන බව අපි පිළිගන්න ඕනෑ. නුදුරු අනාගතයේදී ඒ ප්‍රශ්නය සර්වප්‍රකාරයෙන්ම විසඳීමට වුවමනා ශක්තිය ගරු ඇමතිතුමාට ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා. කරවල ආයතනයට පත් කරන ලද නිලධාරියා ගැන ගරු මන්ත්‍රීන් කීපදෙනෙක්ම සඳහන් කළා. කරවල ආයතනයට පමණක් නොව කවර ආයතනයකට වුවත් පත් කරනු ලබන නිලධාරීන් තමන් වෙත පැවරෙන වැඩ සම්බන්ධයෙන් සෑහෙන දැනුමක්, පළපුරුද්දක්, දක්ෂකමක් ඇති අවංක පුද්ගලයන් විය යුතුය යන්න මා පිළිගන්නවා. ඒ අනුව ගරු ඇමතිතුමා අවංක පුද්ගලයන් පත් කර තිබෙන බව පිළිගන්න ඕනෑ. යම් කිසි ආයතනයක් භාරව කටයුතු කිරීම සඳහා නිලධාරීන් තෝරන විට දේශපාලන පක්ෂ ගැන සලකා හෝ යම් යම් මැති වරුන් සමග ඇති ඥාති සම්බන්ධය ගැන හෝ සලකා, ඒ කරුණු උඩම, වෙනත් සුදුසු කම් ඇති අය නුසුදුස්සන් හැටියට ඉවත් කරන්න පුළුවන්කමක් නැහැ. වුවමනා සුදුසුකම් තිබෙන තැනැත්තාම තෝරා ගැනීම යුක්තිසහගත බව පිළිගන්න ඕනෑ. රාජපක්ෂ මහත්මයා මේ ආයතනයට පත් කිරීම ගැන ඇතැම් මන්ත්‍රීවරු ප්‍රශ්න කළා. ඒ මහත්මයා එක්සත් ජාතික පක්ෂයේ අනුගාමිකයකු නොවන බව මේ ගරු සභාවේදී ප්‍රකාශ කරන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]

කැමතියි. ඒ මහත්මයා පත් කිරීම ගැන ඔය තරම් විවේචනය කළේත් ඒ නිසාම දැයි මා දන්නෙ නැහැ. රජයේ වගකිවයුතු ආයතනයකට පාලකයකු පත් කිරීමේදී සුදුසුකම් අනුව පත් කිරීම ඉතාම වැදගත් බව මොනම දේශපාලන පක්ෂයක් වුවත් පිළිගන්නවා ඇති. රාජපක්ෂ මහත්මයා මේ පදවියට ඉතාමත් සුදුසුයි. ඒ මහත්මයාගේ සුදුසුකම් ඔහුගේ නමින්ම පෙනී යනවා ඇති. රජයට පක්ෂපාතකම දක්වන තැනැත්තා යන්නයි ඒ මහත්මයාගේ නමේ තේරුම. එයිනුත් කැපී පෙනෙන්නේ ඒ මහත්මයා ඉතාමත් සුදුස්සා හැටියට පිළිගෙන අවසාන බවයි.

කරවල ව්‍යාපාරය ගැන ඇතැම් ගරු මන්ත්‍රීවරු කනගාටුව පළ කළා. එක්සත් ජාතික පක්ෂයේ ඇතැම් මන්ත්‍රීන් මෙන්ම හිටපු අග්‍රාමාත්‍යවරයකු වන ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) ඇතුළු මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම කරවල ව්‍යාපාරය විවේචනය කළා. මා දන්න හැටියට නම්, පුරවැසිකම් ලබා ගත් කරවල ජාවාරම්කාර වෙළඳ සමාගම් 13කින් පමණ පසුගිය මැතිවරණ දෙකේදීම විශාල මුදලක් වියදම් කර තිබෙන බව මෙහිදී මතක් කරන්න හොඳ නැහැ වෙන්න ඇති. නැවතත් ඒ විධියේ ආධාර ලබා ගැනීමට බැරි වේය යන හැඟීමක් නිසා පහළ වන බිය නිසා කරවල ජාවාරම ජනසතු කිරීම ගැන වැඩිදෙනෙක් කනගාටු වන බවයි මට පෙනී යන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කරවල ජාවාරම ගැන පමණක් සැලකීම මදි. අපේ රටේ නිපදවන ආහාර ද්‍රව්‍යවලටත්, එසේම වෙනත් ද්‍රව්‍යවලටත්, විශේෂ සැලකිල්ලක් දක්වා මෙරට ජනතාවට ඒවා අලෙවි කර ගැනීමට ගරු ඇමතිතුමා එතුමාගේ සම්පූර්ණ සහයෝගය දෙනවා ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. අපේ රටේ සමහර ආහාර ද්‍රව්‍ය වගා කරනවා. එසේම සමහර ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කරනවා. පිටරටින් ගෙන්වනු ලබන චොකලට්, ටෝෆී ආදී රස කැවිලි වෙනුවට මේ රටේම දැන් රස කැවිලි වර්ග නිපදවනවා. ඒවා නිපදවන සුළු කර්මාන්ත හිමියන්ට ඒවා පහසුවෙන් අලෙවි කර ගැනීමට පුළුවන් වන පිළිවෙළටත්, ඒ නයින් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා ගත හැකි වනු පිණිසත්, ටෝෆී, චොකලට් ආදී සුළු ආහාර ද්‍රව්‍ය පිටරටින් ගෙන්වීම නතර කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

තවත් වෙළඳ ව්‍යාපාර රාශියක් මේ රටේ තිබෙනවා. ඒ සෑම එකක් ගැනම කරුණු ඉදිරිපත් කරන්ට මම අදහස් කරන්නෙ නැහැ. විශේෂයෙන් මතක් කළ යුතු කරුණක් තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාශ කීපයකම කෙරෙන වැදගත් වෙළඳ ව්‍යාපාරයක් තිබෙනවා. කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යට තේ ත් මම මේ ගැන කථා කළා. මේ කාරණය විශේෂයෙන් සටහන් කරගෙන, ප්‍රතිඵල ලැබෙන තෙක්ම මේ සම්බන්ධයෙන් සහයෝගය දී කටයුතු කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. ඡන්ද කොට්ඨාශ වශයෙන් කියනවා නම් අකුරණ, ගලගෙදර, යටිනුවර, උඩුනුවර, ආදී උඩරට ඡන්ද කොට්ඨාශ කීපයකම විශෙෂ වෙළඳ ව්‍යාපාරයක් වශයෙන් පවත්වාගෙන ආ පොල් පෙට්ටි කර්මාන්තය සහ තේ පෙට්ටි කර්මාන්තය ක්‍රමක්‍රමයෙන් අභාවයට පත් වේගෙන යනවා. තමුන්නාන්සේගේ මේ වැය ශීර්ෂය යටතේ පමණක් නොව, ජනසතු සේවා හා කම්කරු ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේත් මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ ඡන්දදායක කොට්ඨාශවල දුප්පත් ජනතාව වෙනුවෙන්, මේ ව්‍යාපාරය සම්බන්ධයෙන් කරන සටන ප්‍රතිඵල ලැබෙන තෙක් දිගටම මෙහයවනවා. දැනටමත් තමුන්නාන්සේ මේ පොල් පෙට්ටි කර්මාන්තය සම්බන්ධයෙන් කාරක සභාවක් පත් කර තිබෙන බව අපට දැනගන්ට ලැබී තිබෙනවා. ඒ ගැන තමුන්නාන්සේට මගේ අවංක ස්තුතිය පිරි නමනවා. පොල් පෙට්ටි කර්මාන්තයේ යෙදී සිටි 15,000 ක පමණ ජනතාවක් දැන් අමාරුවේ වැටිගෙන එන බව තමුන්නාන්සේ දන්නවා ඇති. කලින් දිනකට රුපියල් හත අටක ආදායමක් ලැබූ ඔවුන්ට දැන් ඔවුන්ගේ පෙට්ටි අලෙවි කර ගන්ට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඒ පෙට්ටි දිරා යනවා. දැන් පාවිච්චි කරන්නේ පිටරටින් ගෙන්වන බෑග් වර්ගයි. මේ බෑග් වර්ග හැකි තරම් සීමා කර මෙම පෙට්ටි වෙළඳාමට සම්පූර්ණ සහයෝගය දක්වන්නය කියා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංයුක්ත මණ්ඩලවලට සහ වෙනත් දෙපාර්තමේන්තුවලට නිලධාරීන් පත් කිරීමේදී අපේ දෙශපාලන පක්ෂයට අයිති අය පත් කරනවාය කිය චෝදනා කළා. ඊට පිළිතුරු වශයෙන් මා එක කරුණක් සඳහන් කරන්න කැමතියි. කන්තලේ සීනි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සභාපති වශයෙන් කලක් සේවය කළ එන්. එස්. පෙරේරා මහතා කාගේ කවුද? මට හරියට කියන්න බැහැ. නමුත් දැනගන්න ලැබී තිබෙන ආරංචිය අනුව මට කියන්න තියෙන්නේ ඔහු ලංකා සමසමාජ පක්ෂයේ නායක යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගේ (ආචාර්‍ය්‍ය එන්. එම්. පෙරේරාගේ) සහෝදරයෙක් බවයි. ඇත්තද නැත්තද කියන්න මා හරියට දන්නෙ නැහැ. එය ඇත්ත නම්, ඒ සම්බන්ධව කිසි විවේචනයක් මෙහි නොකෙරුණේ මන්ද කියා මා ප්‍රශ්න කරනවා. ඇතැම් අය දෙශපාලන නායකයන්ගේ ඥාතිවරුන් වන පළියට ඔවුන්ට රජයේ ආයතනවල පත්වීම් නොදීමේ වැඩ පිළිවෙළක් අපේ නැහැ. සුදුසුකම් තිබෙනවා නම් කුමන පක්ෂයක කෙනෙක් වුවත් අප පත් කර ගන්නවා. ඒ අන්දමට සුදුසු තැන්වලට සුදුස්සන් පත් කරගැනීමෙන් එම ආයතන දියුණු කරගන්න පුළුවන් වන බව අප විශ්වාස කරනවා.

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) කථා කරද්දී ඇතැම් කරුණු බොහොම පැහැදිලි ආකාරයට විස්තර වශයෙන් ඉදිරිපත් කළා. වෙළඳ අංශය පවත්වාගෙන යාම ඒ තරම් ලෙහෙසි පහසු වැඩක් නොවෙයි. ආහාර ද්‍රව්‍ය සැපයීම, සමුපකාර ව්‍යාපාරය පවත්වාගෙන යාම, වැනි වැඩ කටයුතු එම අංශයට අයිතියි. ඒ වැඩ බාරදූර වැඩ බව කියන්න ඕනෑ. එදිනෙදා මහජනයා ප්‍රයෝජනයට ගන්න ද්‍රව්‍ය සම්බන්ධව පරිපාලනයක් කිරීම මේ අංශයෙන් කෙරෙන වැදගත් වැඩක්. මෙහි වැඩ කටයුතු සියල්ල දවසින්, සතියෙන්, මාසයෙන්, කරන්න බැහැ. අප යන ගමන ක්‍රමක්‍රමයෙන් යන්න ඕනෑ. ඒ ගමන ක්‍රම ක්‍රමයෙන් වේගවත්ව යන්න උත්සාහ කරන්න ඕනෑ. එම නිසා ඒ සඳහා සෑහෙන කාලයක් ගත වෙනවා ඇති. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා සිතන හැටියට නම් මෙවැනි වැඩක් කරන්න ඒ තරම් කාල සීමාවක් අවශ්‍ය නැහැ. එතුමාට එක් අවස්ථාවක පුළුවන්කම තිබුණා එළි වන්ට මත්තෙන් කැබිනට් ඇමතිවරුන් පවා සංශොධනය කරන්න. නින්දෙන් නැගිටින විට ඇමති කම නැති වූ අය එතුමාගෙ කාලයේ සිටියා. තවත් මාස කීපයකට පසු එළි වන විට තමාගේ මන්ත්‍රීකමත් නැති කර ගන්ට තරම් වැඩ කටයුතු කරන්න එතුමාට දක්ෂතාව තිබුණා. එතුමාට අවස්ථාව පැමිණ තිබුණු වේලේ කරපු වැඩ මහජනයා දන්නවා. එතුමා පක්ෂයකුත් හදා ගත්තා. එම පක්ෂයෙන් කිසිම ප්‍රතිපත්තියක් පැහැදිලි කර තිබුණේ නැහැ. කිසිවක් කරන්නේ නැත කියන එකයි එම පක්ෂයේ ප්‍රතිපත්තිය.

අ. භා. 7.45

සිංහලය රජයේ භාෂාව නොකිරීම, විදේශ ප්‍රතිපත්තිය වෙනස් නොකිරීම, ශාසන කොමිෂන් වාර්තාව ක්‍රියාත්මක නොකිරීම, සමුපකාර බැංකුව නැත්නම් මහජන බැංකුව ක්‍රියාත්මක නොකිරීම, කුඹුරු පණත ක්‍රියාත්මක නොකිරීම, ආදී වශයෙන් ක්‍රියාවේ නොයොදන ප්‍රතිපත්ති ඇතුළත් දස පණතක් එතුමාට තිබුණා. කිසිවක් නොකරන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනවා නම් එය ඉතාමත්ම ලේසියි. අන්තිමේදී මහජනයාත් ඒ පක්ෂයට කිසිම සේවයක් කෙළේ නැහැ. දැන් නම් ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා නොයෙකුත් කරුණු ඉදිරිපත් කරනවා. එහෙත් ඒවා අතර ඔප්පු කළ හැකි කරුණු අඩුයි.

එසේ වුවත් එතුමාගේ කථාවේදී එක වැදගත් කාරණාවක් ගැන සඳහන් වුණු බව මතක් කරන්න කැමතියි. පිළිගත යුතු දෙයක් තිබෙනවා නම් කවුරුන් කීවත් එය පිළිගත යුතුයි. එතුමා සිල්ලර වෙළඳුන් ගැන සෑහෙන විස්තරයක් කළා. සිල්ලර වෙළෙන්දා කියන්නේ දුප්පත් ගම්වැසියන්ගේ ආධාරකාරයකුටයි. හැතැප්ම ගණනක් බඩු මල්ල හිස පිට තබාගෙන ගමට අවුත් ගමේ ජනතාවට ඒ බඩු බෙදා දෙන ඔහුගෙන් ලොකු සේවයක් සිදු වෙනවා. ඔහු ඉතා වේගයෙන් ධනපතියකු වන ලකුණු පෙනෙන්නෙත් නැහැ. එහෙයින් දුෂ්කර ප්‍රදේශවලට සේවයක් කරන දුප්පත් සිල්ලර වෙළෙන්දා ආරක්ෂා කරන්න ඕනෑ. ඔහුට බඩු ලබා ගැනීමට පහසුකම් සලසා දෙන්ට ඕනෑ. මිළ පාලක නිලධාරියා යන්නේ ඔහු ළඟට පමණයි. ඔහු තොග වෙළඳුන් ගැන සොයා බලනවා අඩුයි. එහෙයින් සිල්ලර වෙළඳුන් ගැන සොයා බලන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]

පෙර තොග වෙළඳුන් ගැන සොයා බලන සේ මිළ පාලක නිලධාරීන්ට අණ කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එසේ කරන ගමන්, බඩු බෙදා හැරීමේ මධ්‍යස්ථාන ඇති කරන තෙක් ආහාර දෙපාර්තමේන්තුවේ ලොරිවලින් හෝ පොළොන්නරුව, හිඟුරක්ගොඩ, මිහින්තලේ, මිනිපේ, කන්තලේ, අනුරාධපුරය, වැනි දුෂ්කර ප්‍රදේශවලට බඩු ගෙන ගොස් ගමන් ගාස්තු පමණක් වැඩිපුර අය කොට එම බඩු සිල්ලර වෙළඳුන්ට බෙදා දෙන ලෙස සමුපකාර තොග වෙළඳ ආයතනයට නියෝග කරන්ටත් ඕනෑ. මේ අන්දමට වැඩ කොට සිල්ලර වෙළෙන්දා ආරක්ෂා කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

සතියකට වරක් බැගින් ඒ දුෂ්කර ප්‍රදේශවල ආරංචි අපට ලැබෙනවා. දැන් සියයට 75 ක් පමණ සිල්ලර වෙළඳුන් තම කඩ වසා දමා තිබෙන බව ඒ ආරංචි අනුව අපට පෙනී යනවා. බඩු ලබා ගැනීම සඳහා ඒ කිට්ටුව කිසිම තොග වෙළඳ ආයතනයක් නැහැ. ගරු ඇමතිතුමා ඒ බව දන්නවා ඇති. කරුණා කර තොග වෙළඳාම සම්පූර්ණයෙන් රාජසන්තක කර හෝ සිල්ලර වෙළඳුන්ගේ මාර්ගයෙන් දුප්පත් මහජනතාවට බඩු ලබා ගැනීමට පහසුකම් සලස්වන්න. මෙය එක පාරටම සමුපකාරය මගින් හෝ තොග වෙළඳ ආයතන මගින් හෝ කළ නොහැකි නිසා සිල්ලර වෙළඳුනුත් සහභාගි කොට බඩු බෙදා හැරීමේ ව්‍යාපාරය සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

ඩබ්ලිව්. ඒ. කරුණාසේන මයා. (පැල්මඩුල්ල)

(திரு. டப்ளியு. ஏ. கருணாசேன—பெல்மதுல்ல)

(Mr. W. A. Karunasena—Pelmadulla)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමුපකාරය ගැන වචන සවලාපයක් ප්‍රකාශ කිරීමට සතුටුයි. සමුපකාර ව්‍යාපාරය ශීඝ්‍ර යෙන් දියුණු වීගෙන ආවා. එහෙත් යළිත් එහි එක්තරා පිරිහීමක් ඇති වී තිබෙන බව කනගාටුවෙන් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. මේ පිළිබඳව ගරු ඇමතිතුමා වහාම වැඩ පිළිවෙළක් සකස් කරනවා ඇතැයි මා විශ්වාස කරනවා. සමුපකාර සංගම්වල තිබෙන දූෂණ කටයුතු නැති කර දමා ඒවායේ ක්‍රමානුකූල දියුණුවක් ඇති කිරීමට කටයුතු සලස්වනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා. මගේ පළාතේ තිබෙන සමුපකාර සමිතිවලට යමක් කමක් කර කියාගන්න පුළුවන් නිලධාරි පිරිස් දැන් බලය අල්ලාගෙන තිබෙන බැවින් ඒ පළාතේ සිටින දුප්පත් ජනයාට සමුපකාර ක්‍රමයෙන් නියම ප්‍රයෝජන නොලැබෙන බව සඳහන් කරන්නේ බලවත් කනගාටුවෙන්.

තොග වෙළඳ ආයතනය මගින් සමහර සමුපකාර සමිතිවලට නියම විධියට බඩු සැපයෙන්නේ නැති බව ප්‍රකාශ කරන්ට ඕනෑ. සෑම කොට්ඨාශයකම තොග වෙළඳ ආයතනය බැගින් පිහිටුවීමට අදහස් කර තිබෙනවාය කියා මට දැනගන්ට ලැබී තිබෙනවා. මගේ කොට්ඨාශය තරමක් විශාල බැවින්, අඩු ගණනේ ස්ථාන තුනකවත් තොග වෙළඳ ආයතන ශාඛා පිහිටුවන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ ඒ පළාත්වලට පත් කර සිටින මිල පාලක පරීක්ෂකයන් තමන්ගේ රාජකාරී හරියාකාර නොකරන බවට අපට පැමිණිලි ලැබී තිබෙනවා. ඒ නිසා මෙම ධුරවලට අවංක උදවිය පත් කොට දුක් විඳින මහජනතාවට සේවයක් කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ලංකාවේ සෑම තැනකම පාහේ එක්තරා ප්‍රමාණයක බඩු හිඟයක් ඇති වී තිබෙන බව පත්‍ර මාර්ගයෙන් අපට දැනගන්ට ලැබෙනවා. මොනම ව්‍යාපාරයක් හෝ අළුතින් පටන් ගත් විට යම් යම් දුෂ්කරතාවන්ට මුහුණ පාන්ට සිදු වීම සාමාන්‍ය සිරිතක්. කෙසේ හෝ වේවා, නුදුරු අනාගතයේදී මේවා සියල්ලම විසඳී යනවාට කිසිම සැකයක් නැහැ. ඊට වුවමනා කරන සහයෝගයද ගරු ඇමතිතුමාට සෑම වේලේම දෙන්ට අප ලැහැස්ති වී සිටින බවද මේ අවස්ථාවේදී කියන්න කැමතියි.

අපේ පළාත්වලින් රජය මිල දී ගන්න වී ශුද්ධ කිරීමට යවනු ලබන්නේ හම්බන්තොට තිබෙන වී මෝලටයි. මේ සම්බන්ධයෙන් විශාල මුදලක් රජයට වියදම් කරන්ට සිදු වෙනවා. ඒ නිසා රත්නපුර දිස්ත්‍රික්කයේම වී මෝලක් පිහිටුවා විවිධ සේවා සමුපකාර සමිතිවලටත් හාල් බෙදා හරින පුද්ගලික වෙළඳුන්ටත් එම මෝලේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොටන හාල් බෙදා දීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කළහොත්, සමුපකාර සංගම්වලට විශාල මුදලක් ඉතිරි කර ගන්ට පුළුවන් වේවි. විවිධ සේවා සමුපකාර සමිතිවල අද පවතින ණය පහසුකම් දීමේ ක්‍රමය අනුව නොයෙක් දුෂ්කරතාවන්ට සාමාජිකයන්ට මුහුණ පාන්ට වී තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන්ද නව වැඩ පිළිවෙලක් අනුගමනය කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

තොග වෙළඳ ආයතනයේ නගරවල පිහිටා තිබෙන ශාඛා මගින් බඩු බෙදා දීම සීමා වී තිබෙන්නේ ලොකු නගරවලට පමණයි. ගම්බද ප්‍රදේශවල නියම අන්දමේ බඩු බෙදා දීමේ වැඩ පිළිවෙලක් නැති කමින් ඒ පළාත්වල උදවියට නොයෙකුත් හිරිහැර විඳින්ට සිදු වී තිබෙන නිසා ඒ පිළිබඳවද යෝග්‍ය වැඩ පිළිවෙලක් යොදන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගම්බද පළාත්වල සිටින කුඩා කඩ හිමියන්ගෙන් අපට පැමිණිලි රාශියක් ලැබෙනවා බඩු මිල පාලක මහත්වරුන් ගෙන් නොයෙක් විධියේ හිරිහැර කරදර පැමිණෙනවාය කියා. තමුන්නාන්සේලා මේ අයට දඩුවම් කරන්න කලින් නියම මිලට බඩු සපයා දීමට වැඩ පිළිවෙලක් යොදන මෙන් මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මේ කාරණා සියල්ලම සර්ව සම්පූර්ණ කරගැනීමට අපේ සම්පූර්ණ සහයෝගය ඇමතිතුමාට දෙනවායයි ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ඩබ්ලිව්. ජී. එම්. ඇල්බට් සිල්වා මයා. (මොනරාගල)

(திரு. டப்ளியு. ஜீ. எம். அல்பேட் சில்வா—மொனராகலை)

(Mr. W. G. M. Albert Silva—Monaragala)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාල වේලා බොහොම අඩු නිසා මා ඉතා කෙටියෙන් අදහස් ස්වල්පයක් ප්‍රකාශ කරන්නයි, බලාපොරොත්තු වන්නේ. විදේශික යන් අතේ තිබුණු කරවල වෙළඳාම සමුපකාර තොග ආයතනයට භාර ගෙන කර ගෙන යෑම ගැන අප ඉතා සන්තෝෂ වෙනවා. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙක් කියා සිටියා, ඒ මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශවලට සතිපතා කරවල **හොන්ඩර 200ක් පමණ** ගෙන යන වාය කියා. එහෙත් මගේ කොට්ඨාශයේ පහළ උඟව වෙළඳ සැල් සංගමයට ලැබී තිබුණේ කරවල හොන්ඩර 21ක් පමණයි. සමහර විට ඒ සංගමයේ සභාපතිතුමා පසුගිය මහා මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයකු වශයෙන් තරඟ කළ නිසා එතුමා කරවල නොගෙනියනවා දැයි මා දන්නේ නැහැ. මා එතුමාගෙන් ප්‍රශ්න කළාම එතුමා කියා සිටියේ දවස් දෙකක් කොළඹ ඇවිදිනුත් ලබා ගන්න පුළුවන් වුණේ කරවල හොන්ඩර 21ක් පමණක් බවයි. ඒ සංගමයට සමුපකාර සංගම් 28ක් පමණ අයිතියි. ඒ අනුව ඒ එක සමුපකාර සමිතියකට ලැබෙන්නේ කරවල හොන්ඩර $\frac{3}{4}$ක පමණ ප්‍රමාණයකුයි. එක ගෙදරකට ලැබෙන්නේ කරවල රාත්තල් $\frac{1}{4}$ යි. ඒ කරවල $\frac{1}{4}$ ලබා ගත් අය අපට මේ සුමානේ ලැබුණේ කරවල $\frac{1}{4}$ ය කියා හැම තැනම කියමින් යනවා. දූෂණ ක්‍රියාවල යෙදෙන සමුපකාර සභාපතිවරුන් ගැන විශෙෂ පරීක්ෂණයක් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. තොග වෙළඳායතනයෙන් අවශ්‍ය කරවල ප්‍රමාණය නොදෙනවාද? එසේ නැත්නම් සභාපති කරවල ගෙන යන්නේ නැද්ද කියා මා හරිහැටි දන්නේ නැහැ. සභාපති කියන්නේ දවස් දෙකක් කොළඹ රස්තියාදු වෙලත් ලබා ගන්ට පුළුවන් වුණේ කරවල හොණ්ඩර 21ක් බවයි. සභාපති කියන අන්දමට නම් ඔහුගේ වරදක් පෙනෙන්ට නැහැ. එහෙත් අනික් මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශවලට සතිපතා කරවල හොණ්ඩර 200 ගණනේ ගෙන යනවාය් කියන නිසා සභාපතිගේ කීම විශ්වාස කරන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහළ උඟවේ වෙළඳ සැල් සංගමයේ සභාපතිගේ පසුගිය කාලයේ ක්‍රියා කලාපය ගැන ගරු ඇමතිතුමා දන්නවා ඇති. ඒ සභාපතිට විරුද්ධව චෝදනා රාශියක් ඔප්පු වී තිබෙනවා. සමිතියට අයත් රුපියල් 6,000ක මුදලක් ඒ සභාපති විසින් වංචා කර තිබෙන බව පසුගිය දා පැවැත්වූ පරීක්ෂණයකදී හෙළි වුණා ඒ චෝදනාව ඔප්පු වී තිබෙනවා. මෙම කරුණු සම්බන්ධයෙන් බිබිලේ සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමා සමඟ මා සාකච්ඡා කළා. ඒ ගැන ඉහළ තැන්වලට දන්වා තිබෙන බවත්, ඒ තැන්වල ඒවා ප්‍රමාද වන බවත්, එතුමාට මේ සම්බන්ධයෙන් කරන්න පුළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. ජී. එම්. ඇල්බට් සිල්වා මයා.]

වන් දෙයක් නැති බවත්, කියනවා. දැනට ඔප්පු වී තිබෙන චෝදනා අනුව අද වුණත් ඒ සභාපති සංගමයෙන් අස් කර දමන්න පුළුවනි. එසේ අස් කර දමා, විභාගයක් පැවැත්විය යුත්තේ පසුවයි. සංගමයේ සභාපතිට විරුද්ධව ඇති චෝදනා ගැන පරීක්ෂා කර බලන්න දැනට සී. ඩබ්ලිව්. ඊ. එකට භාර දී තිබෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ මේ බිබිලේ පහළ ඌවේ වෙළඳ සැල් සංගමයේ සභාපති ගෙන ගිය අත්තනෝමතික ක්‍රියා කලාපය ගැන කලක් ආහාර ඇමතිවරයා වශයෙන් සිටි අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ඩී. ජී. ආර්. ගුණවර්ධන මයා.) දැනට සිටින ඇමතිතුමාත් හොඳ හැටි දන්නවා. මා ඉල්ලා සිටින්නේ පළමුවෙන්ම එම සභාපතිගේ වැඩ තහනම් කර ඊට පසුව පරීක්ෂණයක් පවත්වන ලෙසයි.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන් ප්‍රගතිය වාර්තා කරනු පිණිස කාරකසභා නියෝජ්‍ය සභාපති මූලාසන යෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි. නැවත රැස් වීම 1961 සැප්තැම්බර් 7 වන බෘහස්පතින්දා.

කල්තැබීම

යෝජනාව ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභි මුඛ කරන ලදී. "මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය"—[ගරු ඉලංගරත්න].

අ. භා. 8

ඩබ්ලිව්. දහනායක මයා.

(திரு. டப்ளியு. தகனுயக்க)

(Mr. W. Dahanayake)

I wish to bring a very urgent matter to the notice of the Hon. Minister of Education. On 3rd May, a Question was asked in the House about teachers who are undergoing a course of studies in the Universities. These teachers get full-pay leave for two years, but their course of studies is of three years' duration. Thus these teachers get full-pay leave for two years and no-pay leave for one year. This matter was pointed out to the Hon. Minister of Education. A question was raised in this House and answered on 3rd May. The Hon. Minister said on 3rd May that he was considering the matter. Since then the teachers concerned have sent 14 letters to the Hon. Minister and the Director of Education. There has been no reply. These teachers have to undergo a great deal of suffering and hardship as a result of the indecision of the Hon. Minister. I hope that the Hon. Minister will make up his mind soon and grant these teacher-students the privilege of having full-pay leave during the three years.

I wish to point out to the Hon. Leader of the House, who is not here, that among many other things the cost of firewood has gone up in Galle. The reason for it is that up to a few months ago firewood dealers were allowed to purchase any quantity of firewood from the Kottewa firewood depot belonging to the Forest Department. But recently the Forest Department has refused to issue at a time anything more than three yards of firewood or firewood worth more than Rs. 15.

Firewood dealers who go to Kottewa have to spend for transporting in a lorry about Rs. 25 per trip. Whether the quantity of firewood purchased is three yards or twelve yards, the cost of transport is Rs. 25. If the Forest Department sells a dealer only Rs. 15 worth of firewood, he has to spend Rs. 15 on firewood and Rs. 25 on transport. The result of this order of the Forest Department is that there is a shortage of firewood in and around Galle. I would appeal to the Hon. Leader of the House to look into this question very carefully.

My third question is addressed to the Hon. Acting Minister of Health. He is also not here.

Here is the text of a circular letter that has been sent by the Superintendent of Health Services, Galle, to the Galle Hospital. I suppose this circular has been sent to all hospitals throughout the island ; it deals with casual labourers and reads as follows :

"The D. H. S. has informed me that the casual ordinary and conservancy labourers should not be given more than 13 days work a month. You are, therefore, requested to comply with these instructions to the very letter with effect from September, 1961. Please note that you will be personally held responsible for any violation of these instructions."

There are in the Galle Hospital as well as in other hospitals casual labourers who have worked for over

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

6 years. They receive about 20 days of work per month but, according to this circular, such casual labourers will not receive more than 13 days of work a month. Why 13 no one knows! That incidentally is an unlucky number, 13 days of work.

Now if a casual labourer works for 13 days he will get Rs. 30.50. If a casual labourer comes from Hikkaduwa to Galle he will spend Rs. 14 on his season ticket. So, how do you expect such a labourer, his wife and children to live on 13 days work? I think, the Hon. Acting Minister of Health should look into this matter very carefully.

This is a circular that brings shame on the Government. Therefore, I hope that he will take immediate steps to withdraw this circular and to give these unfortunate workers, the casual conservancy labourers, at least 20 days of work each month.

අ. භා. 8.5

පර්සි වික්‍රමසිංහ මයා.

(திரு. பேர்சி விக்ரமசிங்ஹ)

(Mr. Percy Wickremasinghe)

සභාපතිතුමනි, දැන් අධ්‍යාපන දෙපාර්තමේන්තුව කර තිබෙන තීරණයක් ගැන ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට කැමතියි. ලබන ඔක්තෝබර් මස 1 වන දින සිට සෑම දිස්ත්‍රික්කයකම ප්‍රාදේශීය අධ්‍යාපන කාර්‍යාල පිහිටුවීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුව තීරණය කර ඒ සම්බන්ධ වැඩ පිළිවෙලක් සකස් කර තිබෙනවාලු. ඒ අනුව මාතර දිස්ත්‍රික්කය වෙනුවෙන් අධ්‍යාපන කාර්‍යාලයක් මාතර පිහිටුවීමට කටයුතු කර තිබෙනවාලු. අලුතෙන් පිහිටුවන්නට යන මෙම ප්‍රාදේශීය අධ්‍යාපන කාර්‍යාලවල අධ්‍යාපන නිලධාරීන් වශයෙන් නොහොත් ඒ කාර්‍යාල භාර ප්‍රධානීන් වශයෙන් පත් කිරීමට යන්නේ දැනට දිස්ත්‍රික්ක පරීක්ෂක ධුර දරණ උදවියලු. ඒ විධියටයි, අපට දැන ගන්න ලැබී තිබෙන්නෙ. එසේ නම් අධ්‍යාපන නිලධාරීන් හැටියට ඒ කාර්‍යාලවල් කටයුතු කිරීමට තෝරා ගනු ලබන දිස්ත්‍රික්ක පරීක්ෂකවරුන් තෝරා ගන්නේ ජ්‍යෙෂ්ඨතාව අනුවද කියා මම ප්‍රශ්න කරන්න කැමතියි. මාතර කාර්‍යාලයට දැනටම දිස්ත්‍රික්ක පරීක්ෂක වරයකු නම් කර තිබෙනවාලු. අධ්‍යාපන නිලධාරීන් පත් කරන විට ජ්‍යෙෂ්ඨතාව අනුවම සලකා පත් කිරීම සුදුසු බවත්, එසේ ජ්‍යෙෂ්ඨතාව අනුවම තෝරා ගන්න හැටියට වග බලා ගන්නවා නම් ඉතාම හොඳ බවත්, මම ඇමතිතුමාට මතක් කරන්න කැමතියි.

මා එසේ කියන්නේ මක්නිසාද? අපට දැන ගන්න තිබෙන විධියට මාතර අධ්‍යාපන කාර්‍යාලයට තෝරා ගෙන තිබෙන මහත්මයාගේ වයස අවුරුදු 55ක් පමණ වෙනවාලු. මාතර දිස්ත්‍රික්කය වැනි දිස්ත්‍රික්කයක වැඩ කටයුතු කර ගැනීමටත් එතුමාට පුළුවන් වේවිද කියා මම දන්නේ නැහැ. ඒ එක්කම නොයෙකුත් බලපෑම් නිසා ඒ නිලධාරියාම මාතරට තෝරා ගෙන තිබෙනවාය කියන එනයි, අපට දැන ගන්න තිබෙන්නේ. එසේ නම් එය ඉතාම වැරදි ප්‍රතිපත්තියක් බව මම ප්‍රකාශ කරනවා. අධ්‍යාපන ඇමතිතුමා දැනට මෙහි නැහැ. එම නිසා වෙළඳ ඇමතිතුමා ගෙන් වත් මම ඉල්ලා සිටිනවා, මේ කාරණාව අධ්‍යාපන ඇමතිතුමාට ඉදිරිපත් කර අලුත් කාර්‍යාල විවෘත කරන අවස්ථාවේදී ඒ කාර්‍යාලවලට පත් කළ යුතු නිලධාරීන් තෝරා ගන්න විට පළාතේ මන්ත්‍රීවරුන්ගේ අදහසුත් විමසා යවා එවැනි පත් කිරීම් කරන්නය කියා. එක එක පුද්ගලයන්ගේ බලපෑම් උඩ නිලධාරීන් පත් කරනවා නම් එය සම්පූර්ණයෙන්ම බරපතල වැරදි ප්‍රතිපත්තියක් බව මම මතක් කරනවා. විශෙෂයෙන්ම අධ්‍යාපන කටයුතු සම්බන්ධ නිලධාරීන් පත් කරන විට මුළු මහත් දිස්ත්‍රික්කයේම අධ්‍යාපන ප්‍රශ්නයට ඔවුන් බලපාන නිසා එතුමාගේ විශෙෂ සැලකිල්ල මේ කරුණ කෙරෙහි යොමු කර කටයුතු කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

අ. භා. 8.8

වෛද්‍යාචාර්ය එම්. පී. ඩ්‍රහමන් (පත් කරන ලද මන්ත්‍රී)

(டொக்டர் எம். பீ. டிரஹ்மன்—நியமன அங்கத்தவர்)

(Dr. M. P. Drahaman—Appointed Member)

Mr. Deputy-Charman, I wish to ask the hon. Parliamentary Secretary to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එම්. පී. ඩුහමන්]

the Minister of Education—I am sorry he is not here, but I am sure this will be conveyed to him—why 89 students who qualified for direct admission to the Faculty of Medicine on the results of the combined preliminary and First M. B. examination held in December 1960 have no hopes of admission up to this day. Even if it is true that the Faculty block in the second Medical College at Peradeniya will be ready towards the end of the year, is there any reason why the date cannot be ascertained from the P. W. D. and the students officially informed as to when they will be admitted? Each and everyone of these students has been medically examined and they are straining at the leash to start their studies. The country needs every doctor it can get for the nex few decades. Someone has blundered, but certainly not the students. The hon. Parliamentary Secretary replying to the hon. Member for Galle (Mr. W. Dahanayake) on the same subject said that there was not sufficient accommodation in Peradeniya, that there was no medical college to accommodate them. May I point out to the hon. Parliamentary Secretary to the Minister of Education that there would be as many as 100 or more vacancies in the medical block in Colombo in December? A whole batch will be passing out and there will be many vacancies there. I would therefore ask him seriously to consider filling up those vacancies with the 89 direct entrant students. They are all brilliant young men who did very well in the examination in 1960. Instead of asking them to wait till the new medical college is ready in June 1962, they could fill the vacancies in the medical block in Colombo. They have waited already for six months and it will be a grave miscarriage of justice if they are asked to wait another six months—till June 1962—when the academic year starts. I state these facts with full knowledge and advisedly because there is a sinister move afoot to penalize these brilliant students further by delaying their admission till June, 1962, and filling up the vacancies that will occur in December 1961 or January 1962 with mediocrities. What is proposed is to fill up these vacancies with mediocrities and not with these brilliant students who have passed out and are waiting all this time. I hope the hon. Parliamentary Secretary will convey this to the Hon. Minister of Education and urge that serious consideration be given to the issues that I have raised.

අ. භා. 8.12

ට. විලියම් ප්‍රනාන්දු මයා. (නුවරඑළිය)

(திரு. T. வில்லியம் பெர்ணாண்டோ—நுவரெலிய)

(Mr. T. William Fernando—Nuwara Eliya)

ගරු සභාපතිතුමනි, මා නැගී සිටියේ සිංහල භාෂා ප්‍රතිපත්තියට එකඟව වැඩ කිරීමේ විපාකයක් වශයෙන් ඉතාම කණගාටුදායක තත්ත්වයකට මුහුණ පා ඇති ලිපිකරු මහතකු ගැන කථා කිරීමටයි. එදා මේ රටේ රාජ්‍ය භාෂාව සිංහල භාෂාව කිරීම සඳහා විශාල උද්‍යොගයකින් කටයුතු කළ, විශෙෂයෙන්ම කොළඹ නගර සභාවේ වැඩ කටයුතු සිංහල භාෂාවෙන් කිරීමට ඉතා උනන්දුවකින් කටයුතු කළ, ඒ ලිපිකරු මහතාගේ එම ක්‍රියා කලාපයට විරුඬ වූ යම් ප්‍රතිගාමීන් පිරිසක් විසින් අවසානයේදී ඒ දේශප්‍රේමී භාෂා ප්‍රේමී ලිපිකරු මහතාගේ වැඩ කටයුතු වලට අවහිර වන පරිද්දෙන් මෙම පළාතෙන් ඉතා දුර බැහැර පළාතකට මාරු කර තිබෙනවා. ඒ මහතාට දැන් කරන්නට තිබෙන එකම දෙය රක්ෂාවෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි භාර දීමයි. ඒ අනුව පිළියෙළ කරන ලද ලිපියක් තමුන්නාන්සේගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන්න කැමතියි. එයට තමුන්නාන්සේ සවන් දෙන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා:

පළාත් පාලන සේවයේ ලිපිකරුවකු වශයෙන් කොළඹ නගර සභා කාර්යාලයයේ සේවය කරන මම රාජකාරි කටයුතු සිංහලෙන් කිරීම නිසා හිංසාවක් ලෙස ඇත පළාතකට මාරු කිරීම ගැන විරෝධය දැක්වීම වස් එම සේවයෙන් ඉල්ලා අස්වන බව මෙයින් දැනුම් දෙමි.

1961 ජනවාරි මස 1 වැනිදා සිට මේ රටේ පාලන කටයුතු සිංහලෙන් කෙරෙන බව 1956 වර්ෂයේදී ප්‍රකාශයට පත් වූ අවස්ථාවේ සිට නගර සභා සේවකයනට සිංහල භාෂාව පිළිබඳ දැනීමක් ලබා දීමට කටයුතු කළ මම, එවක් පටන් එහි සාහිත්‍ය සංගමයේ ලේකම් වශයෙන්ද කටයුතු කළෙමි.

1961 ජනවාරි මස 1 වැනිදා සිංහලය රජ්වීම අරභයා නගර සභාවේ උත්සවයක්ද සංවිධානය කොට රජයේ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදීමට නො

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දැරූ තැතක් නැත. සිංහල විරෝධී නිලධාරීන්ගේ තර්ජන මධ්‍යයේ කාර්යාලයේ වැඩපල සිංහලෙන් කරමින්ද ඒ සඳහා සෙසු නිලධාරීන්ට සහාය වෙමින් ද කටයුතු කරගෙන යන අවස්ථාවේ ඇත පළාතක් වන වලස්මුල්ලට මා මාරු කරන ලද බවට අණක් ලැබුණි. පළාත් පාලන සේවකයකු වශයෙන් ඒ අණ පිළිපැදීමට මම සූදානම් වූයෙමි.

එහෙත් මෙය සිංහල විරෝධීන්ගේ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් බව පෙනී ගිය හෙයින්ද, මාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වන තක්සේරුකාරතුමාගේ ඉල්ලීම නිසාද, මේ තීරණය වෙනස් කරන ලෙස ඔබ වෙත ආයාචනයක් ඉදිරිපත් කළෙමි.

සාහිත්‍ය සංගමයත්. සෙසු දේශමාමක සංවිධානත් මෙය සිංහල විරෝධීන්ගේ කපටි උපක්‍රමයක් බව රජයටත්, ඔබ කොමිෂන් සභාවටත්, පෙන්නා දෙන ලදි. පළාත් පාලන ඇමති, රජයේ නිලධාරීන් බොහෝ දෙනකු, එම මතය පිළිගත් මුත් ඔබ කොමිෂන් සභාවේ තීරණය වෙනස් නොවූයේ සිංහල විරෝධීන්ගෙන් එයටද බලපෑම් ඇති වූ නිසාදැයි සැකයෙකි.

එය එසේ නම් ඔවැනි සභාවක් මගින් පාලනය වන සේවයක තව දුරටත් රැඳී සිටීම ආත්ම ගෞරවයක් ඇති නියම සිංහලයකු වශයෙන් කොහොමවත් කළ නොහැකිය. මාගේ මේ ඉල්ලා අස්වීමෙන් ඔය සභාවට යම් කිසි ජයක් අත් වූයේ යයි සිතන්නෙහි නම් එය තාවකාලික ජයක් පමණක් බව මතක් කිරීමට කැමැත්තෙමි.

සෙබළකු මැරී වැටුනාට සටනක් නවතින්නේ නැත. එසින් තව තවත් දිරි ගැන්වී පණ ගැන්වී, ජය ගන්නා තෙක් ඉදිරියටම ගමන් කිරීම වීර සිංහලයන්ගේ සිරිතය. එසේම සිංහලය රජකිරීම සඳහා කරන සටන මගේ මෙම පසු බැසීමෙන් නතර නොවනවා ඇත. දැනට ඊට හරස්ව සිටින සිංහල විරෝධීන් නසා අවසාන ජයග්‍රහණය කරා එය ගෙන යනු නියතයි. ඒ සඳහා කරන මාගේ මේ සුළු පරිත්‍යාගය සිංහල සටනට පූජෝපහාරයක් වේවායි ද පතමි.

මෙය ඉදිරිපත් කර තිබෙන්නේ 1961 මැයි 1 වන දින කොළඹ, වැල්ලවත්තේ හයිස්ට්‍රීට්හි අංක 60 දරණ නිවසෙහි පාලිත විදානගමාච්චි මහත්මයා විසිනි. මෙවැනි දේ බොහෝ සිදු වෙනවා. මේ උත්තරීතර උභය මන්ත්‍රී මණ්ඩලයෙන් සිංහලය එකම රාජ්‍ය භාෂාව යයි කියන පනත සම්මත කර ගෙන තිබෙනවා. ඒ අනුව මෙවැනි දේශප්‍රේමීන් ජාති මාමකත්වයෙන් යුතුව කටයුතු කරන විට ඊට බාධා පමුණුවන මෙවැනි නිලධාරීන්ගේ අකටයුතු තවත් ඉවසා ගන්නට බැරිව මෙසේ කිරීමට ඉදිරිපත් වෙනවා. බහුජන මතය අනුව සම්මත කර ගත් නීති ක්‍රියාත්මක කිරීමේදී ඊට විරුද්ධකම් කරන යම් කොටසක් සිටී නම් ඔවුන්ට නිසි දඬුවම් දිය යුතුයි.

මේ අවස්ථාවේදී මේ කටයුතු භාර ඇමතිතුමා මෙහි නොසිටියත් මේ වාර්තාව කියවා බලා මේ ගැන සුදුසු පිළියමක් කොට ජාතිමාමකත්වයෙන් යුතුව වැදගත් සේවයක් ඉටු කිරීමට ඉදිරිපත් වන මෙවැනි දේශප්‍රේමීන්ගේ උද්‍යෝගය අඩ පණ කොට ඔවුන්ට විරුද්ධව කුමන්ත්‍රණකාරී ලෙසට කටයුතු කරන යම් කොටසක් ඒ පළාත් පාලන ආයතනවල සිටි නම් ඔවුන්ට දඬුවම් පමුණුවා අපේ ජාතික භාෂාව ආරක්ෂා කර ගැනීම සඳහා වහාම පරීක්ෂණයක් පවත්වා ඒ අනුව සුදුසු කටයුතු කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

අ. භා. 8.20

සිරිසේන මයා.

(திரு. சிறிசேன)

(Mr. Sirisena)

ගරු උප සභාපතිතුමනි, කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ ඉතා හදිසි වැදගත් කාරණයක් ඉදිරිපත් කරන්ට මා බලාපොරොත්තු වෙනවා. පේරාදෙනියේ විශ්ව විද්‍යාලයීය නේවාසිකාගාරයේ සේවක සංගමය මා වෙත ලියමනක් එවා තිබෙනවා. කාල වේලාව මදි නිසා මා ඒ ලියමන කියවා සම්පූර්ණ විස්තරයක් කරන්ට බලාපොරොත්තු වන්නේ නෑ. එවැනි උත්සාහයක් නොකරතත් මට ලැබී තිබෙන කඩදාසි තමුන්නාන්සේගේ මාර්ගයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමාට ඉදිරිපත් කරන්ටයි මා අදහස් කර ගෙන සිටින්නෙ. මේ කාරණය සම්බන්ධයෙන් සතුටුදායක ප්‍රතිඵල ලැබෙන හැටියට කටයුතු සලස්සනවා ඇතැයි විශ්වාස කරනවා.

පේරාදෙනියේ විශ්ව විද්‍යාලයීය නේවාසිකාගාර සේවක සංගමය වෘත්තීය සමිතියක් වශයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කර තිබෙනවා. අංක 1240 යටතේ මීට අවුරුදු 4 කට පමණ ඉහතදී ලියා පදිංචි කරන ලද මේ සංගමය විස්තර කරන කාරණය සංක්ෂේපයෙන් ඉදිරිපත් කරන්ට කැමතියි. විශ්ව විද්‍යාලයීය නේවාසිකාගාරයේ අරක්කැමියන් වශයෙන් සේවය කරන අයගේ දුක් ගැනවිලි මා වෙත ඉදිරිපත් කර තිබෙනවා. ඒ සමගම එහි වේටර් නමින් හඳුන්වන කෑම සපයන්නාවූ කම්කරුවන්ගේත් කසල ශෝධකයන්ගේත් දුක්ගැනවිලි ඇතුළත් කර තිබෙනවා. අරක්කැමියන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]

ගෙවනු ලබන මාසික වේතනය රුපියල් 87.50 ක් වෙතත් එයින් කෑම සහ නිවාස ගාස්තු වශයෙන් රුපියල් 30 ක් කපා ගනු ලබන නිසා මාසය අවසානයේ ලැබෙන්නේ ඇත්ත වශයෙන්ම රු. 57.50 ක් බව සඳහන් කර තිබෙනවා. ඒ මුදල තමන්ගේ අඹුදරුවන් පෝෂණය කරන්ට මදි බව මා අමුතුවෙන් කියන්ට වුවමනා කරන්නේ නැහැ. එපමණක් නොව, මේ අයට දවස කට පැය 12½ක් වැඩ කරන්නට සිදු වී තිබෙනවා. උදේ කෑම පිළියෙළ කිරීම සඳහා පාන්දර 4 සිට 7 දක්වා දළ වශයෙන් පැය 3කුත්, දවල් කෑම පිළියෙළ කිරීම සඳහා උදේ 7 සිට දවල් 11.30 දක්වා දළ වශයෙන් පැය 4½කුත්, සවස තේ පිළියෙළ කිරීම සඳහා දවල් 2 සිට 3.30 දක්වා දළ වශයෙන් පැය 1½කුත්, රාත්‍රී කෑම පිළියෙළ කිරීම ආදිය වෙනුවෙන් සවස 4 සිට රෑ 7.30 දක්වා පැය 3½කුත් වැඩ කරන්ට සිදු වී තිබෙන බව කියනවා. කෑම කා අවසාන වූ පසු ඒවා අස්පස් කර තැබීමටත් වැඩිපුර පැය 1½ක් තරම් ගත කරන්ට සිදු වී තිබෙනවා. මේ අනුව බලන විට දවසකට මේ කම්කරුවන් විසින් වැඩ කළ යුතු කාලය පැය 12½ක් බව පෙනෙනවා. මේක ඉතාමත් අසාධාරණ වැඩක්. විශ්ව විද්‍යාලය වැනි උසස් ආයතනයක මේ විධියේ අසාධාරණකම් තිබෙනවා නම්, අඩු වේතනයක් ගෙවන අතර වැඩි පැය ගණනක් වැඩත් ගන්නවා නම්, එය ඉතාමත් කනගාටු දායක තත්ත්වයක් බව කියන්ට ඕනෑ. සමාජවාදී ප්‍රතිපත්ති අනුගමනය කරන රජයකට මෙවැනි දේ සම්බන්ධයෙන් චෝදනා එල්ලවීම මදිකමක් බව පිළිගත යුතුයි. මම මේ කඩදාසි තමුන්නාන්සේට ඉදිරිපත් කරනවා. තමුන්නාන්සේගේ මාර්ගයෙන් එය ගරු අධ්‍යාපන ඇමතිතුමා වෙත ලැබීමෙන් පසු මේ පීඩිත කම්කරු පිරිසට යුක්තිය ඉෂ්ට වෙනවා ඇතැයි යන විශ්වාසයෙන් මම මේ කඩදාසි තමුන්නාන්සේට භාර දෙනවා.

අ. භා. 8.23

ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.

(திரு. ஸ்டான்லி மொல்லிகொட)

(Mr. Stanley Molligoda)

ගරු උප සභාපතිතුමනි, අධ්‍යාපන දෙපාර්තමේන්තුව නැටුම් ගුරුවරුන් පත් කරන ආකාරය ගැන වචනයක් කියන්න තිබෙනවා. සබරගමු නැටුම් කලාව උගත් අයට ගුරුවරුන් වශයෙන් පත්වීම් දෙන බව ගැසට් නිවේදන මගින් ප්‍රචාරය කර පරීක්ෂණවලටත් කැඳවන නමුත් අවසානයේ ඒ කිසිවකුට රක්ෂා ලැබෙන්නේ නැහැ; පත්වීම් ලැබෙන්නේ ගාන්ධර්ව විභාගයෙන් සමර්ථ වූ, උඩරට නැටුම් උගත් අයට පමණයි.

සිරිසේන මයා.

(திரு. சிரிசேன)

(Mr. Sirisena)

ඒ කතාවේ කිසිම සත්‍යයක් නැහැ.

ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.

(திரு. ஸ்டான்லி மொல்லிகொட)

(Mr. Stanley Molligoda)

ඒ නිසා කරුණා කර මේ ගැන සලකා බලන මෙන් මා ඉල්ලා සිටිනවා. මා කියන්නෙ මගේ ආරංචියේ හැටියටයි. මා නියෝජනය කරන කොට්ඨාශයේ සපරගමු නැටුම් කලාව ඉගෙන ගත් එක් කෙනකුට වත් ගුරු පත්වීම් ලැබී නැහැ. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නැටුම් ගුරුවරුන් පත් කිරීම දැන් ජාවාරමක් හැටියට කෙරීගෙන යනවාය යන සැකයක් මිනිසුන් තුළ ඇති වේගන යනවා. හැව්ලොක් ටවුමේ මකුලොලුව මහත්මයාගේ පංක්තියට යන අයට පමණයිලු රක්ෂාවල් ලැබෙන්නෙ.

සිරිසේන මයා.

(திரு. சிரிசேன)

(Mr. Sirisena)

ගරු උප සභාපතිතුමනි, ඒ කියමනේ කිසිම සත්‍යයක් නැහැ. ඒවා අසත්‍ය චෝදනා. කිසිම සත්‍යතාවක් නැති බව කියන්න ඕනෑ. මකුලොලුව මහත්මයා කිසිම අසාධාරණයක් කරන්නෙ නැති බව මම දන්නවා.

ගරු ඉලංගරත්න

(கௌரவ இலங்கரத்ன)

(The Hon. Ilangaratne)

ගරු උප සභාපතිතුමනි, ඒ කරුණු සියල්ලක්ම ගරු ඇමතිතුමන් වෙත ඉදිරිපත් කරන බව දැනුම් දෙන්ට කැමතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.25ට, 1961 සැප්තැම්බර් 1 වන දින සභාසම්මතිය අනුව, 1961 සැප්තැම්බර් 7 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

1961 සැප්තැම්බර් 7 වන බ්‍රහස්පතින්දා

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු ආර්. එස්. පැල්පොල] මූලාසනාරූඪ විය.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

1960-61 අංක 73 දරන පරිපූරක ඇස්තමේන්තුව. —[ගරු. ටී. බී. ඉලංගරත්න.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

1960-61 අංක 70, 72, 75 සහ 79 දරන පරිපූරක ඇස්තමේන්තුව.—[අධ්‍යාපන හා ගුවන් විදුලි කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු ඉලංගරත්න.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

1960-61 අංක 74 දරන පරිපූරක ඇස්තමේන්තුව. —[පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමති වෙනුවට ගරු ඉලංගරත්න.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

1960-61 අංක 77 සහ 78 දරණ පරිපූරක ඇස්තමේන්තු.—[ගරු ජෝර්ජ් රාජපක්ෂ.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

1960-61 අංක 71 සහ 76 දරන පරිපූරක ඇස්තමේන්තු.—[ප්‍රවාහණ හා රජයේ වැඩ පිළිබඳ ඇමති වෙනුවට ගරු ඉලංගරත්න.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

1950 අංක 34 දරන නාවික හමුදා පණතේ 161 වන වගන්තිය යටතේ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති විසින් සම්පාදනය කරන ලද රෙගුලාසි මාලාවක්.—[රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට ගරු ඉලංගරත්න.]

සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදි.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

5. ජී. ජේ. පාරිස් පෙරේරා මයා. (ජාඇළ)

(திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா—ஜா-எல)

(Mr. G. J. Paris Perera—Ja-Ela)

කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වේයන්ගොඩ පේස කර්මාන්ත මධ්‍යස්ථානයට කම්කරුවන් බඳවා ගන්නේ කෙසේද? (ආ) කම්කරුවන් බඳවා ගත්තේ කම්කරු කාර්යාලයෙන්ද? නොඑසේනම්, ඇයි?

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා. (කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. டப்ளியு. பீ. ஜீ. ஆரியதாஸ—தொழில், உள்நாட்டு, கலாச்சார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. W. P. G. Ariyadasa—Parliamentary Secretary to the Minister of Industries, Home and Cultural Affairs)

(අ) ජාතික පේස කර්මාන්ත සංස්ථාවේ වේයන්ගොඩ මෝලට කම්කරුවන් බඳවා ගත්තේ සංස්ථාව යටතේ වැඩ කිරීමට ඉල්ලුම්පත් එවූ විශාල කම්කරු සංඛ්‍යාවක් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමෙන් පසුවයි. (ආ) තෝරා ගනු ලැබූ සෑම කම්කරුවෙක්ම කොළඹ රැකීරක්ෂා කාර්යාලයේ හෝ මීගමුවේ රැකීරක්ෂා කාර්යාලයේ හෝ ලියා පදිංචි වී සිටියේය.

ගාමනී ජයසූරිය මයා. (හෝමාගම)

(திரு. காமனி ஜயசூரிய—ஹோமகம)

(Mr. Gamani Jayasuriya—Homagama)

මෙවැනි කර්මාන්ත ශාලා ඇති කරන විට ඒවාට කම්කරුවන් බඳවා ගන්නේ කොයි ආකාරයටද? ඒ ඒ පළාත්වල අයට විශෙෂ සැලකිල්ලක් දක්වනවාද?

ආරියදාස මයා.

(திரு. ஆரியதாஸ)

(Mr. Ariyadasa)

මෙහි සඳහන් වී තිබෙන්නේ කම්කරු කායර්‍යාල දෙකක ලියාපදිංචි වී සිටින අය ගැනය කියා මා සිතනවා. මේ හේතුව නිසා එම කායර්‍යාලවල ලියාපදිංචි වී ඇත්තේ ඒ අවට ප්‍රදෙශවල අයවලුන්ය කියා මා සිතනවා. කරුණු එසේ හෙයින් ගරු මන්ත්‍රීතුමාගේ අදහස ඒ අනුව ඉටු වෙනවා ඇති.

කහදුමෝදර ආදි ගම්වල ජනයාට ජල පහසුව සැලසීම

1. ලක්ෂ්මන් ද සිල්වා මයා. (බලපිටිය)

(ඩී. ඒ. රාජපක්ෂ මයා. වෙනුවට)

(திரு. லக்ஷ்மன் டி. சில்வா—பலப்பிட்டிய)

(Mr. Lakshman de Silva—Balapitiya)

කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කහදුමෝදර, තිල්ලවටවත්ත ගුරුපොකුණ යන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ද සිල්වා මයා.]

ගම්වල දැනට දිනක් හැර දිනක් එක් අයෙකුට වතුර ගැලුම් බාගයක් පමණ දිසාපතිවරයා විසින් බෙදුදෙන බැව් එතුමා දන්නවාද? (ආ) මේ ප්‍රමාණය එම අයට කිසිසේත් ප්‍රමාණවත් නොවන බැව් එතුමා දන්නවාද? (ඉ) මේ ක්‍රමය වෙනුවට මෙකී ගම්වල මහජනයාගේ නිතිපතා ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ජලය ලබාගැනීමේ සථිර ක්‍රියා මාර්ගයක් අනුගමනය කරනවාද? (ඊ) නොඑසේනම් ඒ ඇයි?

ආරියදාස මයා.
(திரு. ஆரியதாஸ)
(Mr. Ariyadasa)

(අ) නැහැ. බීමට සුදුසු වතුර බෙදා දෙන ලද්දේ එක් අයකුට දිනක් හැර දිනක් සඳහා ගැලුම් 1 බැගිනි. එක් අයකුට එක් දිනකට ගැලුම් බාගයකි. (ආ) එම ප්‍රශ්නය පැන නොනගී. බීම සඳහා එක් අයෙකුට එක් දිනකට ගැලුම් බාගයක් සැහේයයි සැලකේ. (ඉ) සහ (ඊ) ප්‍රදේශය සුළු ජන ගහනයකින් යුක්ත බැවින් හා විශාල දුර ප්‍රමාණයකට වතුර බෙදීම කළ යුතු බැවින් දිනපතා වතුර බෙදා දීමෙන් නුවමනා වැඩි වියදමක් දැරීමට සිදු වන බැවි පෙනෙයි. එසේම දිනක් හැර දිනක් වතුර බෙදා දීමෙන් ගම් වැසියන්ට එතරම් හිරිහැරයකට මුහුණ පාන්ට සිදු නොවන බැවි ද පෙනේ. කෙසේ වුවත් මේ ප්‍රදේශයේ "නල ළිං" (Tube wells) තැනීම ගැන පරීක්ෂා කරගෙන යනු ලැබේ.

තෙල්දෙනිය කොට්ඨාශයට මහලු මඩමක් ගිලන් නිවාසයක් හා අනාථ නිවාසයක්

3. පාරිස් පෙරේරා මයා. (තිස්ස කපුකොටුව මයා. වෙනුවට)
(திரு. பாரிஸ் பெரேரா)
(Mr. Paris Perera)

කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) තෙල්දෙනිය ඡන්ද කොට්ඨාශයට මහලු මඩමක්, ගිලන් නිවාසයක්, හා අනාථ නිවාසයක් නැත්තේ මන්ද? (ආ) මෙම කාර්ය පටන් ගැනීමට එතුමා අදහස් කරන්නේ කවදාද? (ඉ) නොඑසේ නම් ඇයි?

ආරියදාස මයා.
(திரு. ஆரியதாஸ)
(Mr. Ariyadasa)

(අ) රජයේ මහලු-දුබල නිවාස පිහිටුවා තිබෙන්නේ මැතිවරණ කොට්ඨාශ පදනම් කරගෙන නොවේ. එසේ කර ඇත්තේ පලාත් අනුවය. එබැවින් මහලු නිවාස 4ක් රජය විසින් පිහිටුවා ඇත. රජය විසින් මහලු නිවාස පිහිටුවීමේ ප්‍රතිපත්තිය ප්‍රතිශෝධනය කර ඒ වෙනුවට ස්වෙච්ඡා සංවිධාන මගින්, රජයෙන් ආධාර ඇතිව කුටි නිවාස පිහිටුවා ගෙන යනු ලැබේ. මහනුවර දිස්ත්‍රික්කයේ ආදායම් නිලධාරි කොට්ඨාශ 4 ක මේ අන්දමට කුටි නිවාස පිහිටුවන ලදී. තවද, ආදායම් නිලධාරි කොට්ඨාශ 2 ක කුටි නිවාස පිහිටුවීමට නියම කරගෙන තිබේ. අනාථ ළමා නිවාස පිහිටුවීම හා පැවැත්වීම කරනු ලබන්නේ ස්වෙච්ඡා සංවිධාන විසිනි. රජයෙන් කෙරෙන්නේ එම අනාථ නිවාසවලට මුදලින් ආධාර කිරීමයි. (ආ) මහනුවර දිස්ත්‍රික්කයේ ඉතිරි ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශ වන උඩ දුම්බර, මැද දුම්බර හා තුම්පනේ කුටි නිවාස පිහිටුවීම රඳා ඇත්තේ රජයට මුදල් ලබා ගැනීමේ පහසුකම උඩ වේ. (ඉ) ඉහත (ආ) යටතේ සඳහන් කරුණු පරිදි මෙම ප්‍රශ්නය පැන නගින්නේ නැත.

පාරිස් පෙරේරා මයා.
(திரு. பாரிஸ் பெரேரா)
(Mr. Paris Perera)

තෙල්දෙණිය ඡන්ද කොට්ඨාශයට මහලු නිවාසයක් දෙනවද?

ආරියදාස මයා.
(திரு. ஆரியதாஸ)
(Mr. Ariyadasa)

එය ඇමතිතුමාගේ කල්පනාවට යොමු කරවන්නම්.

ඩබ්ලිව්. ජී. ඇම්. ඇල්බට් සිල්වා මයා. (මොණරාගල)
(திரு. டப்ளியு. ஜீ. எம். அல்பேட் சில்வா—மொனராகலை)
(Mr. W. G. M. Albert Silva—Monaragala)

එක එක පලාතට වෙන් වශයෙන් මහලු නිවාස පිහිටුවීමට පාර්ලිමේන්තු ලේකම් තුමා ක්‍රියා කරනවාද? එසේ නම්, උඟව පළාතෙහි මහලු නිවාසයක් පිහිටුවන්නේ කවදාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආරියදාස මයා.
(திரு. ஆரியதாஸ)
(Mr. Ariyadasa)

එය ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන කරවන්නම්.

බෝමුරේ ගල් කුලුණ

4. **පාරිස් පෙරේරා මයා** (තිස්ස කපු කොටුව මයා. වෙනුවට)
(திரு. பாரிஸ் பெரேரா)
(Mr. Paris Perera)

කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) උඩරට රාජධානියේ අවසාන රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ බ්‍රිතාන්‍යයන් විසින් ඉල්වා ගත් ස්ථානය වූ තෙල්දෙණිය ඡන්ද කොට්ඨාශයේ පිහිටි බෝමුරේ නමැති ගමෙහි ගල් කුලුණක් ඉදි කර තිබෙන බවත් යමෙකු විසින් මෙම ස්ථානය සොයා බැලුවහොත් විනා එය හඳුනා ගැනීමට අපහසු බවත්, එතුමා දන්නවාද? (ආ) ඌරගල සිට මෙම ස්ථානයට රථ වාහන යෑමට පුළුවන් පාරක් තනා මෙම ස්ථානය සිහිකටයුතු තැනක් බවට පත් කිරීමට එතුමා නිසි ක්‍රියා මාර්ගයක් ගන්නවාද?

ආරියදාස මයා.
(திரு. ஆரியதாஸ)
(Mr. Ariyadasa)

(අ) ඔව්. (ආ) මේ ගල් කණුව පුරාණ ස්මාරකයක් සේ පුරාවිද්‍යා ආඥා පණතේ 16 වෙනි වගන්තිය අනුව යටත් කිරීමට නුපුළුවන. එම නිසා මෙම අමාත්‍යාංශය මගින් මේ ගල් කණුවට යෑමට පාරක් තැනීමේ ප්‍රශ්නය පැන නොනගී.

කම්කරු වන්දි ආඥාපනත ප්‍රතිශෝධනය කිරීම

7. **ලක්ෂ්මන් ද සිල්වා මයා.** (හෙන්රි ඩබ්ලිව්. දිසානායක මයා. වෙනුවට)
(திரு. லக்ஷ்மன் டி சில்வா)
(Mr. Lakshman de Silva)

කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කම්කරු වන්දි ආඥාපනතේ විධි විධාන යටතේ, කරදරයට පත්වූවන්ට ගෙවිය යුතු වන්දි මුදල්, අවුරුදු 25 කට පෙර මේ රටේ පැවැති තත්ත්වය මත පදනම්ව ඇති බව එතුමා දන්නවාද? (ආ) වන්දි ගෙවීම අද පවත්නා තත්ත්වයට සරිලන පරිදි ප්‍රතිශෝධනය කිරීම සඳහා එතුමා ඉක්මනින් ක්‍රියා කරනවාද?

ආරියදාස මයා.
(திரு. ஆரியதாஸ)
(Mr. Ariyadasa)

(අ) ඔව්. (ආ) වන්දි ප්‍රමාණයන් වැඩි කිරීම පිණිස කම්කරු වන්දි ආඥා පනත සංශෝධනය කිරීම සැලකිල්ලට භාජන වෙමින් පවතී.

අස් වූ බස් සමාගම් සේවකයන්ගේ තැන්පතු ආපසු ගෙවීම

9. **පාරිස් පෙරේරා මයා.** (ඒ. එච්. මාකන් මාකර් මයා. වෙනුවට)
(திரு. பாரிஸ் பெரேரா)
(Mr. Paris Perera)

කම්කරු හා ජනසතු සේවා පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බස් සමාගම්වල සේවය කර අස්වූ සේවකයින්ටත් ඔවුන්ගෙන් යැපෙන්නවුන්ටත්, එකී සේවකයින් විසින් තබන ලද ඇප තැන්පත් මුදල් ආපසු දීමට ඇති ප්‍රමාදය නිසා මහත් කරදර සිදු වන බවත්, 1961 අංක 22 දරන පනතින් සංශෝධනය කළ 1957 අංක 48 දරන මෝටර් රථ ප්‍රවාහණ පනත යටතේ ඇති රෙගුලාසි ගැසට් පත්‍රයෙන් පළ කරන තෙක් මෙම ප්‍රමාද පවතින බවත්, එතුමා දන්නවාද? (ආ) එනිසා මෙම රෙගුලාසි ප්‍රසිද්ධ කිරීම එතුමා ඉක්මන් කරනවාද?

ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන (කම්කරු හා ජනසතු සේවා පිළිබඳ වැඩබලන ඇමති)
(திரு. எம். பீ. டி சொய்ஸா சிரிவர்தன— தொழில், தேசியமய சேவைகள் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(The Hon. M. P. de Zoysa Siriwardena—Acting Minister of Labour and Nationalized Services)

(*a*) I am aware that several ex-bus company employees have requested early payment of security deposited by them in bus companies. Payments of amounts which have been

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන.]

certified by the Commissioner of Labour will be made before the end of the year. Ex-bus company employees whose security deposits have not been certified by the Commissioner of Labour and other ex-bus company employees who have made deposits will have to make their claims when the notice is published calling for these claims. Claims that are disputed by stage carriage permit holders will have to be referred to the Commissioner of Labour for settlement. (*b*) Yes.

1961 අංක 27 දරණ ඉඩම් බදු ආඥාපනතේ බලපෑමෙන් නිදහස් වූ අය

10. **ජයසූරිය මයා.** (ආර්. ඩබ්ලිව්. තෙන්නකෝන් මයා. වෙනුවට)

(திரு. ஜயசூரிய)

(Mr. Jayasuriya)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1961 අංක 27 දරණ ඉඩම් බදු ආඥාපනතේ 2 (බී) දරණ වගන්තිය යටතේ නිදහස් කිරීමක් කර තිබේද, නැත්නම් එසේ කිරීමට අදහස් කර තිබේද? (ආ) එසේ කර ඇත්නම් නිදහස් කරන ලද පුද්ගලයෝ කවරහුද? එම පනත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කරන්නේ කවදාද?

ගරු ජෝර්ජ් රාජපක්ෂ (වැඩ බලන මුදල් ඇමති)

(கௌரவ ஜோர்ஜ் ராஜபக்ஸ—பதில் நிதி யமைச்சர்)

(The Hon. George Rajapaksa—Acting Minister of Finance)

(අ) නිදහස් කිරීම් කර නැත. එවැන්නක් කිරීමට දැනට අදහස් කර නැත. (ආ) මෙය උද්ගත නොවේ.

තාවකාලික සේවකයන් පිළිබඳ භාණ්ඩාගාර චක්‍ර ලේඛන

11. **ජයසූරිය මයා.** (ඉඹුලාන මයා. වෙනුවට)

(திரு. ஜயசூரிய)

(Mr. Jayasuriya)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) අංක 421 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛනය යටතේ, අවුරුදු පහක සේවයක් සම්පූර්ණ කළ තාවකාලික සේවකයින්ට ස්ථිර සේවා තත්ත්වය ප්‍රදානය කරන ලද බවත්, (ii) අංක 508 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනය අනුව මේ අනුග්‍රහ සම්පූර්ණයෙන්ම වාගේ ඉවත්කර ඇති බවත්, (iii) තාවකාලික සේවකයින් අවුරුදු පහක සේවය සම්පූර්ණ කිරීමට පෙර සේවයෙන් පහකර නැවත අනියම් සේවකයන් වශයෙන් බඳවා ගන්නා බවත්, එතුමා දන්නවාද? (ආ) එමනිසා අංක 421 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනය යටතේ තාවකාලික සේවකයින් ස්ථිර වන පරිදි අංක 508 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනය ඉවත් කිරීමට එතුමා වගබලා ගන්නවාද?

ගරු ජෝර්ජ් රාජපක්ෂ

(கௌரவ ஜோர்ஜ் ராஜபக்ஸ)

(The Hon. George Rajapaksa)

(*a*) (i) Yes. The circular applied to temporary employees in the labour grades. (ii) No. Treasury circular No. 508 sought to clarify the definition of "casual employees". (iii) Not aware. (*b*) Temporary employees engaged in work of a continuing and permanent nature could still become permanent. The necessity to withdraw Treasury Circular No. 508 of 12.11.59 does not, therefore, arise.

ඩබ්ලිව්. දහනායක මයා. (ගාල්ල)

(திரு. டப்ளியு. தகனயக்க—காலி)

(Mr. W. Dahanayake—Galle)

If cases are brought to his notice where employees remain temporary even after completing five years of service, will he remedy matters?

ගරු ජෝර්ජ් රාජපක්ෂ

(கௌரவ ஜோர்ஜ் ராஜபக்ஸ)

(The Hon. George Rajapaksa)

The whole question of casual employees is being looked into by the Treasury, because there are in the Public Service a very, very large number of people who have been recruited for a specific job on a casual basis but that job has given them employment, in some instances, for 7 to 8 years continuously. We are trying our best to absorb them into the service by making them temporary in the first instance and permanent later.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)

Is the matter under very active consideration ?

ගරු ජෝර්ජ් රාජපක්ෂ
(கௌரவ ஜோர்ஜ் ராஜபக்ஸ)
(The Hon. George Rajapaksa)

The matter is under very active consideration.

ඒකාබද්ධ සේවාවන්හි ස්ථාන මාරු

12. **පාරිස් පෙරේරා මයා.** (ජේ. ආර්. ජයවර්ධන මයා. වෙනුවට)
(திரு. பாரிஸ் பெரேரா)
(Mr. Paris Perera)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ඒකාබද්ධ සේවාවන්හි ස්ථාන මාරු ක්‍රියාත්මක කරන්නේ කුමන ප්‍රතිපත්තියක් අනුවද? (ආ) ඒවා කරනු ලබන්නේ මණ්ඩලයක් මගින්ද? එසේ නම් ඒ මණ්ඩලය සංස්ථාපනය කරන්නෝ කවරහු ද? (ඉ) අන්‍යොන්‍ය ස්ථානමාරුවලට අවසර දෙනු ලැබේද? එසේනම්, එවැනි මාරු අනුමත කිරීම් අනවශ්‍ය පරිදි ප්‍රමාදවීමට හේතු මොනවාද?

ගරු ජෝර්ජ් රාජපක්ෂ
(கௌரவ ஜோர்ஜ் ராஜபக்ஸ)
(The Hon. George Rajapaksa)

(අ) රජයේ සේවයේ අවශ්‍යතාවන්ට අනුව ස්ථාන මාරුවීම් නියෝග කරනු ලැබේ. මේවා සිරිතක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ අවුරුද්ද අවසානයේදීය. (ආ) ඔව්. මණ්ඩලය භාණ්ඩාගාරයේ නිලධාරීන් තුන් දෙනෙකුගෙන් සමන්විත වෙයි. (ඉ) අනිකුත් නිලධාරීන්ට කරදරයක් නොවන්නේ නම් අන්‍යොන්‍ය ස්ථාන මාරුවලට අවසර දෙනු ලැබේ. එවැනි ස්ථාන මාරුවීම් අනුමත කිරීමේදී අනවශ්‍ය ප්‍රමාදයන් ඇතිවන බැව් මම නොදනිමි.

වෙළෙඳුන්ට බලපත්‍ර නිකුත් කිරීමේ පනතේ බලපෑමෙන් නිදහස් වන්නෝ

13. **පාරිස් පෙරේරා මයා.** (ආර්. ඩබ්ලිව්. තෙන්නකෝන් මයා. වෙනුවට)
(திரு. பாரிஸ் பெரேரா)
(Mr. Paris Perera)

වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: 1961 අංක 62 දරණ වෙළෙඳුන්ට බලපත්‍ර නිකුත් කිරීමේ පනතේ දෙවන වගන්තිය යටතේ නිදහස්වන්නෝ කවරහුද?

ගරු ටී. බී. ඉලංගරත්න (වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමතිනි)
(கௌரவ ரி. பி. இலங்கரத்ன—வர்த்தக, வியாபார, உணவு, கப்பற்றுறை அமைச்சர்)
(The Hon. T. B. Ilangaratne—Minister of Commerce, Trade, Food and Shipping)

නියමිත ව්‍යාපාර ස්ථානයක් නැති තැනින් තැන ඇවිදින වෙළෙඳුන් 1961 අංක 62 දරණ වෙළෙඳුන්ට බලපත්‍ර නිකුත් කිරීමේ පනතේ බලපෑමෙන් දැනට නිදහස් කර තිබේ.

කේ. සෝමසුන්දරම් මහතාගේ ස්ථාන මාරුව

14. **පාරිස් පෙරේරා මයා.** (ජේ. ආර්. ජයවර්ධන මයා. වෙනුවට)
(திரு. பாரிஸ் பெரேரா)
(Mr. Paris Perera)

අධ්‍යාපන හා ගුවන් විදුලි කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) පළමු වන ශ්‍රේණියේ විශේෂ තනතුරක් දැරීම හේතුකොටගෙන කොළඹ/ග්‍රීන්ලන්ඩ්ස් විද්‍යාලයේ උප විද්‍යාලයාධිපති ධුරය දැරූ කේ. සෝමසුන්දරම් මහතා මඩකලපුවේ පාසලක වැඩබලන විද්‍යාලයාධිපති වශයෙන් විදුලි පණිවුඩයක් මගින් මාරු කරන ලද බවත්, (ii) ඔහුගේ ආයාචනය නිසා එම ස්ථාන මාරුව අවලංගුකොට ඒ වෙනුවට ඔහු කොළඹ/කොම්පඤ්ඤවීදියේ රජයේ මුස්ලිම් මහා විද්‍යාලයේ උප ගුරුවරයෙකු වශයෙන් යවන ලද බවත්, එතුමා දන්නවාද? (ආ) සේවයෙන් හා ශ්‍රේණියෙන් ඔහුට වඩා කණිෂ්ඨ විද්‍යාලයාධිපතිවරයෙකු යටතේ සේවය කිරීමට යෙදී ඇති මේ ස්ථාන මාරුව දඬුවමක් ලෙස නොසැලකේද? (ඉ) කොළඹ/ග්‍රීන්ලන්ඩ්ස් විද්‍යාලයේදී ඔහුගේ හැසිරීම සහ වැඩ මේ අන්දමේ ස්ථාන මාරුවකට තුඩු දුන්නේද? (ඊ) ඔහුට විරුද්ධව කිසියම් අන්දමක චෝදනා නගා තිබුණේද? දෙපාර්තමේන්තු පරීක්ෂණයකදී ඒවා ඔප්පුවිද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වී. ටී. ජී. කරුණාරත්න මයා. (අධ්‍යාපන හා ගුවන් විදුලි පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. வீ. ரி. ஜீ. கருணாரத்ன—கல்வி, ஒலி பரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)

(Mr. V. T. G. Karunaratne—Parliamentary Secretary to the Minister of Education and Broadcasting)

(අ) (i) මඩ/පෙරියකල්ලාර් මහා විද්‍යාලයේ වැඩ බලන විද්‍යාලයාධිපති වශයෙන් මාරු කළ අවධියේදී කේ. සෝමසුන්දරම් මහතා කොා/ග්‍රීන්ලන්ඩ්ස් මහා විද්‍යාලයයේ උපගුරුවරයෙකි. (ii) කොළඹ පාසැලක උපගුරුවරයෙකු වීමට වැඩි කැමැත්ත ප්‍රකාශ කළ නිසා ඔහු කොා/කොම්පඤ්ඤවීදිය මුස්ලිම් මහා විද්‍යාලයට මාරු කරන ලදී. (ආ) නැත. සෝමසුන්දරම් මහතා පුහුණු ගුරුවරයෙකි. මේ මහා විද්‍යාලයයේ විද්‍යා ලයාධිපති උපාධිධරයෙකි. (ඉ) මෙය කොා/ග්‍රීන්ලන්ඩ්ස් මහා විද්‍යාලයයේ සුභ සිද්ධිය තකා, පරිපාලන හේතූන් උඩ දෙන ලද ස්ථාන මාරුවකි. (ඊ) නැත. සෝම සුන්දරම් මහතාගේ ස්ථාන මාරුවට මෙම පාඨශාලාව තෝරාගන්ට යෙදුණේ, උප ගුරුවරයෙකු වශයෙන් කොළඹ ඕනෑම පාඨශාලාවක සේවය කිරීමට ඉඩක් ලබා දෙන ලෙස ඒ මහතා කරන ලද ඉල්ලීම නිසාය.

උඟුගමුවේ ඩිංගි මහතාගේ ගෙයි තිබී සොයා ගන්නා ලද ගංජා

15. **පාරිස් පෙරේරා මයා.** (ජේ. ආර්. ජයවර්ධන මයා. වෙනුවට)

(திரு. பாரிஸ் பெரேரா)

(Mr. Paris Perera)

අගමැතිගේත් රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) 1961.3.25 වන දින දික්වැල්ලේ පොලිසිය විසින් උඟුගමුවේ ඩිංගි මහත්මයාගේ ගෙය වටලා රාත්තල් 86ක් බරැති ගංජා මලු දෙකක් අල්ලා ගත් නමුත් පොලිස් වාර්තාවල සඳහන් වන්නේ රාත්තල් හයක් පමණක් අල්ලා ගත් බවත්, (ii) ලබන ලද ආරංචි අනුව 61.3.27 වන දින රාත්‍රියෙහි මාතර උප පොලිස් සුපිරින්ටැන් ඩන්ට් දික්වැල්ලේ පොලීසියට පැමිණ, එහි ගංජා මලු දෙකක් තිබුණත් පොලිස් වාර්තාවේ ගංජා රාත්තල් 6ක් අල්ලා ගත් බව සඳහන් කර තිබූ බවත්, (iii) එහි ප්‍රතිඵලයක් වශයෙන් පොලිස් ඉන්ස්පැක්ටර් ඇතුළු තවත් පොලිස් නිලධාරීන් දෙදෙනා කුගේ වැඩ තහනම් කළ බවත් එතුමා දන්නේද? (ආ) මෙම කරුණ සම්බන්ධව යම්කිසි පරීක්ෂණයක් පවත්වන ලද්දේ ද? එසේ නම් එහි ප්‍රතිඵලය කුමක්ද?

ගරු ඉලංගරත්න (අගමැතිගේත් රාජ්‍යා රක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම් වෙනුවට)

(கௌரவ இலங்கரத்ன)

(The Hon. Ilangaratne)

(අ) (i) 1961.3.25 වන දින දික්වැල්ලේ පොලීසිය ගංජා ඇල්ලීමට වටලෑමක් කරන ලදි. උඟුගමුවේ ඇම්. කේ. පියදාස නොහොත් ඩිංගි මහත්මයාගේ ගෙය වටලා රාත්තල් 81 ක් බර ඇති ගංජා මලු 2 ක් අල්ලා ගත් නමුත් පොලිස් ස්ථානයේ වාර්තාවල සඳහන්වී ඇත්තේ රාත්තල් 6ක් පමණකි. (ii) දික්වැල්ලේ පොලිස් වාර්තාව අනුව ගංජා රාත්තල් 6 ක් පමණක් අල්ලා ගත් බවට සටහන් කර තිබුන බව සහකාර පොලිස් අධිකාරී දැක තිබේ. (iii) මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පොලීසිය භාරව සිටි උප පොලිස් පරීක්ෂකගේ සහ සැරයන් සහ පොලිස් කොස්තාපල් කෙනෙකුගේ ද වැඩ තහනම් කරන ලදී. (ආ) මේ සම්බන්ධයෙන් මොවුන්ට විරුඬව ඉදිරිපත් කරන ලද චෝදනා අනුව විනයානුකූල පරීක්ෂණයක් 1961.8.27 වෙනි දින පවත්වා වැඩිදුර විභාගය 1961.9.10 වෙනි දිනට කල් දමන ලදී.

යුනෙස්කෝ ආයතනයෙන් මෙරටට පැමිණි පුස්තකාල විශෙෂඥයා

2. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර) (පී. එම්. කේ. තෙන්නකෝන් මයා. වෙනුවට)

(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)

(Mr. Leslie Goonewardene—Panadura)

කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1960 සැප්තැම්බර්-ඔක්තෝබර් මාස වලදී සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ආරාධනය පරිදි ලෝක යුනෙස්කෝ ආයතනයෙන් පුස්තකාල පිළිබඳ විශේෂඥයෙක් වන බොනි නමැති මහතෙකු ලංකාවට එවූ බව එතුමා දන්නවාද? (ආ) එම මහතා විසින් ලංකාවේ නොයෙක් ආයතන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරීක්ෂා කොට ජාතික පුස්තකාල ක්‍රමයක් පිහිටුවීමට අදාළ සවිස්තර සන්දේශයක් සංස්කෘතික දෙපාර්තමේන්තුවට පිළිගන්වා ඇති බැව් එතුමා දන්නවාද? (ඉ) එම සන්දේශය අනුව අනුරාධපුර හා නුවර යන දිස්ත්‍රික්කවල ගම්බද පොදු පුස්තකාල ක්‍රමයක් පිහිටුවීමට කර ඇති යෝජනාව ගැන එතුමා මෙතෙක් කර ඇති වැඩ පිළිවෙල කුමක්ද? (ඊ) මෙම ගම්බද පුස්තකාල ක්‍රමය දියුණු කිරීම සඳහා විශේෂ නිලධාරියෙකු පත් කිරීමට එතුමා කල්පනා කරන්නේද?

ආරියදාස මයා.
(திரு. ஆரியதாஸ)
(Mr. Ariyadasa)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) බොනී වාතීාව අනුව පුළුල් වැඩ පිළිවෙලක් සංවිධානය කර ජාතික පුස්තකාල සේවයක් ඇති කිරීම සඳහා කටයුතු කිරීමට බලාපොරොත්තු වන නිසා එහි එක් එක් නිර්දේශය ගැන වෙන ම ක්‍රියා කළ නොහැක. (ඊ) මෙය දැන්ම පැන නගින ප්‍රශ්නයක් නොවේ.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ තුලානේ කාටු කුලියන්කුලමේ ගම්වාසීන් රජයේ ඉඩම් වල වී ගොවිතැන් කිරීම

8. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (පී. එම්. කේ. තෙන්නකෝන් මයා. වෙනුවට)
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාතේ අංක 22 තුලානේ කාටුකුලියන්කුලමේ ගම්වාසීන් 1959-60 වර්ෂයේ මාස් මෝසමට රජයේ ඉඩම්වල කළ වී හේන් ගොවිතැන් කපා පාගන මොහොතේදී අනුරාධපුර දිසාපති තැන එය තහනම් කළ බව එතුමා දන්නේද? (ආ) ඉක්බිති එම ගොවීන්ට වගා කළ අක්කර යකට රුපියල් අසූව බැගින් දඩ නියම කිරීමෙන් පසු සමහරෙක් එම මුදල ගෙවූ නමුත් බොහෝ අය නොගෙවා සිට පසුව ඇමතිතුමාගේ තීරණයක් උඩ ඔවුන් නිදහස් වූ බව දන්නේද? (ඉ) ඔවුන් අතර අක්කර 5 ක් ගොවිතැන් කළ මල්හාමි විදානේගේ කිරිබණ්ඩා නමැති අය තමාට නියම වූ රුපියල් 400 දඩ මුදල ගෙවා ගත නොහැකි වීම් නිසා ඔහුගේ සම්පූර්ණ ගොවි

පළම රජයෙන් කපා පාගා ගත් බව එතුමා දන්නවාද? (ඊ) එසේ කිරීමේදී ලැබූ අස්වැන්න වී බුසල් කීයද? ඒ සඳහා දැරූ වියදම කොපමණද? (උ) ඇමතිතුමාගේ තීරණය උඩ වැඩි හරියක් මෙම චෝදනා වෙන් නිදහස් කර තිබිය දී කලින් දඩ ගෙවූ අයගේ මුදල් ආපසු ගෙවීමට හා ඉහත කී කිරිබණ්ඩා නමැති අයගේ තහනම් කළ ගොවිපලේ ආදායම ඔහුට ආපසු දීමට ක්‍රියා කරන්නේද?

ගරු ඉලංගරත්න (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිවෙනුවට)
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

(අ) ඔව්. අවසර රහිතව වැව් නිම්නයේ ගොවිතැන් කර තිබුණ නිසා මෙම පියවර ගන්නා ලදී. (ආ) මල්හාමි විදානගේ කිරිබණ්ඩා හැර අනිකුත් සියලු දෙනාම දඩ මුදල් ගෙවූ හෙයින් වගාවන් නිදහස් කරන ලදි. මෙම දඩ අත්හැර දැමීමට නියෝගයක් කර නැත. (ඉ) කිරිබණ්ඩා අක්කර යක් පමණක් වගා කර තිබුණ අතර රුපියල් සියයේ දඩය නොගෙවූ නිසා මුළු වගා වම තහනම් කරනු ලැබිය. (ඊ) බුසල් 21 සහ අස්වනු එකතු කිරීමේ වියදම රු. 113. (උ) දඩ මුදල් අත්හැර දමා නැති නිසා මුදල් ආපසු දෙන්ට බැරිය. දඩය සහ අස්වනු එකතු කිරීමේ වියදම අඩු කර ගැනීමෙන් පසු, ගොයම් විකිණීමෙන් ලත් ඉතිරි මුදල දැනටමත් කිරිබණ්ඩාට ගෙවා තිබේ.

ප්‍රකාශනය

පූ. භා. 10.23

ආරියදාස මයා.
(திரு. ஆரியதாஸ)
(Mr. Ariyadasa)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ දී ප්‍රකාශනයක් කිරීමටයි මම අදහස් කරන්නේ. එයට හේතු වූයේ මෙයට දින කීපයකට උඩදී මෙම සභා ගර්භයේ මා නොසිටි අවස්ථාවකදී කෝට්ටේ ගරු මන්ත්‍රීවරයා (ස්ටැන්ලි තිලකරත්න මයා.) මට අස්ථානයේ චෝදනා කර තිබීමයි. ඒ අන්දමින් චෝදනා කිරීමට හේතු වූ කරුණු සම්බන්ධයෙන් යම්කිසි ප්‍රකාශයක් මේ ගරු සභාව ඉදිරියේ තැබීම මගේ යුතුකමක් යයි මට හැඟී ගිය නිසා මේ කාරණය ඉදිරිපත් කිරීමට කැමතියි.

digitized by noolaham foundation
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]

මෙබඳු සිද්ධියක් ඇති වීමට මුල් වූයේ මෙන්න මේ කාරණයයි. ගරු කථානායක තුමනි, චීනයේ සිට මෙරටට සර්වඥ දන්ත ධාතූන් වැඩම කරවීම පිණිස මෙරටින් නියෝජිත පිරිසක් පිටත් කර යවන ලද බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ නියෝජිත පිරිසට මිහින්තලේ රජමහා විහාරයේ ගරු මහා නායක ස්වාමීන් වහන්සේ, ගරු හේන්පිටගෙදර ඤාණ සීහ ස්වාමීන්වහන්සේ, ගරු ධම්මවංශ ස්වාමීන්වහන්සේ, සහ සංස්කෘතික අධ්‍යක්ෂකතුමාද ඇතුළත් වුණා. මේ පිරිසේ නායකයා හැටියට ක්‍රියා කළේ මමයි. ගරු කථානායකතුමනි, මේ කටයුත්තේදී මට පැවරී තිබුණු සෑම කාර්යයක්ම ඉතා මත් හොඳින් කිරීමට මම උත්සාහ ගත්තා. මෙයට අනතුරුව දැන් එක්තරා ප්‍රශ්නයක් පැන නැඟ තිබෙනවා. මා විසින් එක්තරා රැස්වීමකදී කරන ලද ප්‍රකාශයක් ප්‍රවෘත්ති පත්‍රවල වැරදි ලෙස පළ වීම නිසා කෝච්චේ ගරු මන්ත්‍රීවරයා ඒ සම්බන්ධයෙන් මට අස්ථානයේ චෝදනා රාශියක් නගා තිබෙනවා. එම නිසා ඒ සම්බන්ධයෙන් පැහැදිලි විස්තරයක් තමුන්නාන්සේ ඉදිරියේ තැබීමට මම බලාපොරොත්තු වෙනවා.

මෙම කාරණය සම්බන්ධයෙන් තමුන්නාන්සේට පැහැදිලි විස්තරයක් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. මගේ ඡන්ද කොට්ඨාශයේ එක්තරා රැස්වීමක මුලසුන ගැනීමට මට නියමව තිබුණා. ඊට සහභාගි වීම සඳහා මම ඒ ස්ථානයට ගියා. එම රැස්වීමේ කථා කිරීමට නියමිතව තිබූ අයගේ නම් ලැයිස්තුවේ වාමාංශික අදහස් දරණ එක්තරා මහත්මයකුගේ නමක්ද තිබුණා. ඒ මහතා මේ විධියට කථා කරාවිය කියා මම අදහස් කෙළේ නැහැ. ඒ මහතා තම කථාව පටන්ගත්තේ මෙන්න මේ විධියටයි: "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජය මේ රටේ ජනතාවගෙන් තිරිසනුන්ගෙන් මෙන් වැඩ ගන්නවා. මේ රටේ ජනතාවට සෑහෙන වේතනයක් දීම ට මේ රජය බලාපොරොත්තු වන්නේ නැහැ. එසේ සෑහෙන වේතනයක් නොදෙන අතර කම්කරුවන්ගේ තත්ත්වය ගැන සලකන්නෙත් නැහැ. සමාජවාදී රටවල ඇවිදින්නට ගිය තමුන්නාන්සේලාට හොඳට පෙනෙන්න ඇති ඒ රටවල කම් කරුවන්ගේ තත්ත්වය කොහොමද තියෙන එක." ඔය විධියටයයි ඒ මහතා කථාව ආරම්භ කෙළේ. ඔය විධියට කථා කරගෙන යන ගමන් ඒ මහතා මට අභියෝගයක් කළා, "තමුන්නාන්සේ මේ ඊයේ පෙරේදා සමාජවාදී රටවලට ඇවිදින්න ගිය නිසා ඒ රටවල කම්කරුවන්ගේ තත්ත්වය ගැන තමුන්නාන්සේට හොඳ හැටි දැනගන්න ලැබෙන්න ඇති; එම නිසා මේ අවස්ථාවේදී තමුන්නාන්සේ ඒ ගැන අපට විස්තරයක් දෙන්න" කියා. කථානායකතුමනි, මම ඒ අවස්ථාවේදී කිව්වා, එවැනි විස්තරයක් ඉදිරිපත් කිරීමට මම සතුටු නැත, ඒ නිසා මගෙන් ඒ ගැන විස්තර අසන්න එපාය කියා. ඊට අනතුරුව දීර්ඝ ලෙස කථා කළ ඒ මහතා, "එසේ නම් තමුන්නාන්සේලා මේ රටේ මහජනතාව මුළා කරන අදහසින් මහ ජනතාවට ඇත්ත ප්‍රකාශ නොකර එය වසන් කරන්න හදන පිරිසක්" ය ආදී වශයෙන් කියා තම කථාව අවසාන කළා. ඊට අනතුරුව මූලාසනයේ කථාව හැටියට මගේ කථාව පටන් ගත් අවස්ථාවේදී මම කිව්වා, මම විශේෂයෙන්ම මෙම කාරණය ගැන පිළිතුරු දෙන්න සතුටුත් නැත, එසේම වෙන රටක පවතින තත්ත්වයක් ගැන කියන්න කැමතිත් නැත, එම නිසා තමුන්නාන්සේලා ඒ ගැන මගෙන් නොඅසා සිටින වා නම් හොඳය කියා. ඒ අවස්ථාවේදී, "නෑ, නෑ, කියන්නම ඕනෑ" කියා බල කර සිටි විට මෙන්න මේ ආකාරයට මම විස්තරයක් කළා: "අපේ රටේ කම්කරුවන් අද ඉතා පහත් තත්ත්වයක සිටින වාය කියා තමුන්නාන්සේලා අදහස් කරනවා නම් එය වැරදි හැඟීමක්. චීන රටට ගිය අවස්ථාවේදී මට දකින්න ලැබුණා"—මම මේ කාරණය ඉතා හොඳට පැහැදිලි කළා. මෙ කරුණු කිව්වේ කිසි සේත්ම චීන රටට අගෞරවයක් කරන අදහසින් නොවන බව මම තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි—"චීන රටේ ජනතාව ඉතාමත් ඕනෑකමකින් රටේ දියුණුව සඳහා වැඩ කරනවා. ඒ වාගේම ජනතාව බොහෝම ශක්ති සම්පන්න උදවියයි. මම සිටි හෝටලය පිහිටි ප්‍රදේශයට පාන්දර 4 පමණ වන විට එළිය වැටෙනවා. ඒ වේලාවට අංශක 90 ක තරම් උෂ්ණත්වයක් තිබෙන නිසා නිදාගන්න බැහැ. ඒ නිසා, ඒ වේලාවට නැගිට බලා සිටින අවස්ථාවේදී, ඒ රටේ කම්කරු ජනතාව පාන්දර 4 පමණ වන ඒ වේලාවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිටම යම් යම් තැන්වලට ගිහින් වැඩ කරනවා මට දකින්ට ලැබුණා. ඒ වාගේම එහි ඉර බැස යන්නෙ හැන්දෑවේ 7 ට-8 ට පමණයි; අර කම්කරු ජනතාව ඒ වන තුරුත් වැඩ කරනවා. ඒ නිසා, ඒ රටේ ජනතාව ඉතාමත් ඕනෑකමකින්, ආශාවකින් සහ ඇල්මකින් රට වෙනුවෙන් වැඩ කරනවා." මම තවදුරටත් කිව්වා කථානායකතුමනි, "අපේ ඇස් දෙකින් අපට දකින්න ලැබුණ තවත් දෙයක් නම්, ඒ රටේ උදවියගේ ශක්ති සම්පන්න භාවයයි. ඔවුන් කොයි තරම් ශක්ති සම්පන්න ද කියතොත්, සමහර විට විශාල බරක් පටවා ගෙන යන කරත්තය එක පැත්තකින් අශ්වයා අදින විට අනික් පැත්තෙන් ස්ත්‍රීන් තුන්දෙනකු අදිනවා. ඒ නිසා ඒ රටේ දියුණුව සඳහා ආශාවකින් සහ ඇල්මකින් වැඩ කරන පිරිසක් ඒ රටේ සිටිනවා"ය කියා.

කථානායකතුමනි, මම ඉතාමත් ඕනෑ කමින් තමුන්නාන්සේට පැහැදිලි කර දෙන්න සතුටුයි. මම ඒ රටට ගියේ කොම්‌යුනිස්ට් කාරයකු හැටියටවත් වෙන රටක පන්දම් කාරයකු හැටියටවත් නොව මධ්‍යස්ථ අදහස් ඇති කෙනකු හැටියට බව. ඒ රැස්වීමේදී මම තවදුරටත් මෙසේ කිව්වා; "ඒ රටේ ව්‍යවස්ථාදායක සභාව තිබෙනවාද කියා දැන ගැනීම පිණිස ඒ ගැන ප්‍රශ්න කළ විට, ව්‍යවස්ථාදායක සභාව තිබෙන බව කිව්වා. ඒ අයගෙන් මම ප්‍රශ්න කළා, වැඩිපුර කරන වැඩ සඳහා මේ රටේ කම්කරුවන්ට වැඩිපුර වේතන නොහොත් ඕවර්ටයිම් ගෙවනවාද කියා. එසේ ගෙවන්නේ නැත කියා කිව්වා. එසේ කී අවස්ථාවේදී මම ඇසුවා, ව්‍යවස්ථාදායක සභාවලට අයත් ක්‍රියාවන් මොනවාද කියා. ඒ අවස්ථාවේදී මට ඒ අය ප්‍රකාශ කළා, ව්‍යවස්ථාදායක සභාවල ප්‍රධාන කාර්යය මහජනතාව වැඩට උනන්දු කරවීමය, රටේ දියුණුව සඳහා වැඩට උනන්දු කරවීමය, කියා." ඔන්න ඔය විධියටයි, මම එදා ප්‍රකාශ කෙළේ. මේ කාරණා ඉතා හොඳ දේවල් බව තමුන්නාන්සේට වැට හෙනවා ඇති. ඒ විධියට ප්‍රකාශ කළා මිසක් කිසිම විධියකින් ඒ රටට අගෞරව වන විධියේ අදහසක් මම ප්‍රකාශ කළේ නැහැ. මේ පිළිබඳව පළවූ විස්තරයෙන් පසු, "වගතුග" කාරයා මේක ටිකක් අරගෙන ඒ කිව්වට වඩා ටිකක් වෙනස් කර ඉදිරිපත් කළා. ඊට කලින් "දවස" පත්‍රයේත් මේ ගැන කියා තිබුණා. කෙසේ වෙතත්, මා කී හොඳ

දේවල් පත්‍රවල පළ වී තිබුණේ නැහැ. අර විධියට කරුණු උපුටාගෙන "කපුටා අන්ති මේදී සුදු කපුටෙක් වුණාය" කියන්නා වගේ මේ කාරණය ටිකෙන් ටික වෙනස් කරගෙන කියන්න පටන් ගත්තා.

මෙන්න මේ විධියටයි කියා තිබෙන්නේ:

කොම්‌යුනිස්ට් රටවල සැබෑ තොරතුරු එළි කළ කිහිප වතාවකදීම වගතුග තීරයට විරුද්ධව ඇතැමෙක් කඳවුරු බැඳගෙන බැණ වැදුණාහ.....වර්තමාන ආණ්ඩුවේ සංස්කෘතික උප ඇමතිවරයා වූ හපුතලේ මන්ත්‍රීවර ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මහතා ප්‍රසිද්ධ රැස්වීමකදී කියා සිටියේ කොම්‌යුනිස්ට් චීනයේ කරත්තවල එක පැත්තක අශ්වයකුත් අනික් පැත්තට ගැහැණු තුන් දෙනකුත් බැඳ දක්කාගෙන යන සැටි තමන්ගේ ඇස්වලින්ම දුටු බවකි.

මෙසේ කියන අතර වගතුග කාරයා—මා නොවෙයි—තව දුරටත් කියනවා:

කරත්තවල හරකුන් බැඳ වැඩ ගැනීම අප රටේ පෙරසිටම පුරුද්දක් වුවද, කිසිම කලක කිසිම තැනක එළදෙනකු කරත්තයක බැඳ ගැනීමේ පුරුද්දක් නොතිබුණේය. තිරිසන් ගත ගැහැණු සතකුගෙන් පවා බර වැඩ නොගන්නා හැදිල්ලක් අතීතයේ සිටම අපේ ජාතිය සතුව තිබේ. එහෙත් මේ විසිවන සිය වසේ 'සමාජවාදී—ප්‍රගතශීලී' යන වචන වලින් හඳුන්වණු ලබන රතු චීනයේ කොම්‌යුනිස්ට් සහෝදරයෝ සිය සොහොයුරියන් කරත්තවල බැඳ දක්කාගෙන යති. රතු චීනයේ ගැහැණියක වී ඉපදීමට වඩා අප රටේ එළදෙනක වී ඉපදීම වාසනාවකි.

මේ කියන්නේ මා නොවෙයි; වගතුග කාරයායි. මේ අවස්ථාවේදී කෝට්ටේ මන්ත්‍රීතුමා (ස්ටැන්ලි තිලකරත්න මයා.) මෙහි නොමැති වීම ගැන මම කනගාටු වෙනවා. ඒ මන්ත්‍රීතුමා මට මේ අස්ථාන චෝදනා කර තිබෙන්නේ මා මෙහි නොසිටි අවස්ථාවකදීයි. එම නිසා ඒ මන්ත්‍රීතුමා දැන් මා ඉදිරියේ සිටියා නම් මම බොහොම කැමතියි. ඒ මන්ත්‍රීතුමා මෙන්න මෙහෙම කියා තිබෙනවා:

තවත් එක කරුණක් ගරු ඇමතිතුමාට මතක් කරන්න තිබෙනවා. මින් මත්තට සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් එක එක්කෙනා පාර්සල් කර යවන විට සුදුසු අය බලා පාර්සල් කර යවන්න..... එයා කියනවාලු මේ රටේ හරකියක් වන එක හොඳයි, ඒ රටේ මිනිහෙක් වනවාට වඩා කියා. ඔව්, මේ රටේ හරකියක් වන එක හොඳයි ඒ වර්ගයේ පව්පි හරක් සිටිනවා නම් කියා එතුමාට මම කියනවා.

ප්‍රවෘත්ති පත්‍රයේ තිබුණු ප්‍රකාශයක් තේරුම් ගන්ට බැරි, ඒ තරම් සිංහල දැනුමක් නැති කෝට්ටේ මන්ත්‍රීතුමා මට ඒ නගා ඇත්තේ අස්ථාන චෝදනාවක්. වගතුග කාරයා ගොනකු වී ඉපිද, ඒ මන්ත්‍රී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]

තුමා එළදෙනකු වී ඉපදුනත් ඒ මට අයිති කාරියක් නොවෙයි. එය ඒ දෙදෙනාට අයිති කාරියක්. එහෙත් මේ විධියේ අස්ථාන චෝදනා, නින්දනීය නැහැදිච්ච කථා, කෝච්චියේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කිරීම ගැන මම මගේ බලවත් විරෝධයත් කනගාටුවත් ප්‍රකාශ කරනවා.

මෙතෙකින් නොනැවතුණු කෝච්චියේ මන්ත්‍රීතුමා මෙසේත් කියා තිබෙනවා:

ඇත්ත වශයෙන්ම මේ කරුණ ගැන සංස්කෘතික ඇමතිතුමාගේ යුතුකමක් තිබෙනවා, නව චීන තානාපති කාර්යාලයට කනගාටුව ප්‍රකාශ කරන්න.

මගෙන් යම්කිසි වරදක් සිදුවුණේ නම් ඊට මගේ කනගාටුව ප්‍රකාශ කිරීමට මම පසුබට වන්නේ නැහැ. මම යමක් කිව්වා නම් එය නැතැයි කියන්නේ නැහැ. එහෙත් මා කීවේ සත්‍යයක්. මාත් සමග තවත් සතර දෙනෙක් ගියා. ඉන් කෙනකු කියන වානම් ආරියදාස මහත්මයා සම්ඵප්‍රලාපයක් කියනවාය කියා, මම එය පිළිගන්න කැමතියි. නමුත් ඉස්සෙල්ලා ගිය අය නුදුටු යමක් මා දැක්කානම් ඊට මට දෝෂාරෝපණය කිරීම වැරදියි. ඒ රටට අගෞරව කරන අදහසක් මට තිබුණේ නැහැ. ඒ රටට මගේ ලොකු සැලකිල්ලක් තිබෙනවා. ඒ නිසා මගෙන් යම්කිසි වරදක් හෝ අඩුපාඩුවක් සිදු වී තිබෙනවානම් මම ඊට මගේ කනගාටුව ප්‍රකාශ කරන අතර මෙන්න මේ කාරණයට කනගාටුව ප්‍රකාශ කරන්නේ කවුරුන්දැයි දැන ගන්න සතුටුයි. පීකිං නුවර අපේ තානාපති කාර්යාලයේ වැඩ කරන පෙරේරා නමැති ලිපිකරුවෙක් ඉරිදා දවසක තමන්ගේ කැමරාවත් රැගෙන පින්තූර ගන්ට යන අවස්ථාවේදී ඒ රටේ පොලීස් හමුදාව මොහු අල්ලා හිර අඩස්සියේ තැබීම සම්බන්ධයෙන් අපට කනගාටුව ප්‍රකාශ කරන්නේ කවුරුන්ද? නව චීන ආණ්ඩුවද? මෙහි තිබෙන චීන තානාපති කාර්යාලයද? එසේත් නැති නම් ලංකා කොමියුනිස්ට් පක්ෂයද?

කෝච්චියේ මන්ත්‍රීතුමා කී දේ වැනි අදහසක් මම ප්‍රකාශ කළේ නැහැ. ඒ රට දියුණු කරන අදහසින් එහි මහජනතාව වැඩ කරන බවයි මම ප්‍රකාශ කළේ. එය වැරදි නම්, ඒ ගැන කොමියුනිස්ට් පක්ෂයට හිතට අමාරු නම්, ඇයි ඒ කොමියුනිස්ට් පක්ෂය මා කී ඒ සිද්ධියට අපට කනගාටුව ප්‍රකාශ නොකරන්නේ?

එපමණක් නොවෙයි, මේ ගරු මන්ත්‍රීතුමා කියන්නේ හොනලුලු, සිංගප්පූරුව, ආදී රටවල තිබුණු තිප්පලවල් දැන් ඒවා යේ නැති නිසා මා මේ රටට දොස් කියනවාය කියායි. මම නම් කවදාවත් හොනලුලු කියන රටට ගිහිල්ලා නැහැ. චීනයට යන ගමනේදී බැහැලා සිංගප්පූරුවට නම් යන්තම් ගියා තමයි.

මේ රටේ නීතිඥ වෘත්තිය කෙරෙහි මා තුළ ලොකු ගෞරවයක් තිබෙනවා. ඒ අතරම මේ රටේත් නීතිඥයන් සහ නීතිඥයන් සිටින බව මම දන්නවා. මා ඒ විධියට නීතිඥයන් සහ නීතිඥයන් ඉන්නවාය කිව්වේ හේතුවක් ඇතිවයි. උසස් පරමාර්ථවලින් යුක්තව වැදගත් ලෙස තමන් වෙත පැවරෙන වැඩ කොටස අවංක භාවයෙන් යුක්තව කිරීම නිසා නීතිඥ වෘත්තියේ ගෞරවයත් ආරක්ෂා කරගෙන තමනුත් උසස් තත්ත්වයට නැඟ සිටින හොඳ නීතිඥයන් පිරිසක් මේ රටේ ඉන්න බව මා පිළිගන්නවා. ඒ අය ගැන අපි සතුටු වෙනවා. එහෙත් තමන්ගේ වංකකම නිසා අනුන්ගේ මුදල් කොල්ලකෑමට පෙළඹී වැරදිකරුවන් බවට උසාවියෙන් නිගමනය කරනු ලැබ හිරගෙවලට පවා ගොස් සිටින නීතිඥයනුත් මේ රටේ ඉන්නවා. පසුගිය මාර්තු මැතිවරණයේදී ඒ ගරු මන්ත්‍රීතුමාට මේ පාර්ලිමේන්තු මන්දිරයට එන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. එහෙත් ඉන් පසු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආශීර්වාදය ලබාගෙන ජූලි මැතිවරණයේදී ආසනයක් දිනා පාර්ලිමේන්තුවට එන්ට පුළුවන් වුණා. නීතිඥ වෘත්තියට අයත් වැදගත් අය සැලකිය යුතු සංඛ්‍යාවක් ඉන්නවාය කියා මා කීවා. නීතිඥ වෘත්තියේ ගෞරවය රැකගෙන හොඳින් වැඩ කටයුතු කරන නිසා ඒ උසස් නීතිඥයන්ට ලැබෙන නඩු ප්‍රමාණය පවා ඉවර කරගන්ට බැරි තරම් ගොඩ ගැහෙනවා. ඒ අතර හරියාකාර වැඩ නොකරන නිසාත්, අදක්ෂ භාවය නිසාත් උසාවිවල රස්තියාදු වන නීතිඥයනුත් ඉන්නවා. කවදා කොයි වෙලාවේ මිනිහෙක් මැරෙයිද කියා බලා ගෙන ඉන්න මිනී පෙට්ටි වෙළෙන්දන් වාගේ කවදා කොයි වේලේ නඩුවක් ලැබෙයිද කියා නඩු බ්‍රෝකර්ලා තියාගෙන වැඩ කරගෙන යන නීතිඥයනුත් ඒ සමගම ඉන්නවා. කසිප්පු නඩු රාශියක් පසුගිය කාලයේ ලැබුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසා ඉන් පසු යම්කිසි තත්ත්වයක් ඒ මන්ත්‍රීතුමාට ලැබී තිබෙන නිසා වෙන්න ඇති—

කථානායක තුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා ඒ විධියට කථා කිරීම හොඳ නැහැ. එහෙම කථා කරන්න ඉඩ දෙන්න බැහැ. කරුණා කර ඒ කථාව අස් කර ගන්න. එසේ නොකළොත් තමා අදහස් කළ කාරණය කියන්න ලැබෙන්නෙ නැහැ. ගරු මන්ත්‍රීතුමාත් මෙතන නැහැ.

ආරියදාස මයා.
(திரு. ஆரியதாஸ)
(Mr. Ariyadasa)

ගරු කථානායකතුමනි, මා ඒ කියමන ගැන කනගාටු වෙනවා. මම එසේ කියන්නෙ නැහැ. ගරු මන්ත්‍රීතුමා තමන්ගේ තත්ත්වයෙන් මා මැනලා ඒ විධියට මට විරුද්ධව චෝදනා කර තිබෙනවා. නමුත් එසේ කිරීම අද මුළු රටේම ඇතැම් පුද්ගලයින්ගේ දුර්වලකමක් හැටියට මා සලකනවා. ඒ නිසා මීට වඩා ඒ ගැන කියන්න අදහස් කරන්නෙ නැහැ. මට මේ අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා.

APPROPRIATION BILL, 1961-62

කාරක සභාවෙහිදී සලකා බලන ලදි.—[ප්‍රගතිය, සැප්තැම්බර් 6.]

[**කථානායකතුමා මූලාසනාරූඪ විය.**]

Head 148.—Minister of Commerce, Trade, Food and Shipping

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 371,403

Sub-head 1.—Cadre and Salaries, Rs. 236,797

ඉදිරිපත් කරන ලද සංශෝධනය [සැප්තැම්බර් 6]—

"That the Vote be reduced by Rs. 10 in respect of Sub-head 1, item 'Minister'."
[ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා.]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ඇල්බට් සිල්වා මයා.
(திரு. அல்பேட் சில்வா)
(Mr. Albert Silva)

ගරු සභාපතිතුමනි, ඊයේ මා කථා කරමින් සිටියේ පහළ උඟව සමුපකාර සමිති සංගමය ගැනයි. මේ සමුපකාර සමිති සංගමයට හාල් සලාක පොත් 1,20,000 ක් පමණ තිබෙනවා. සමුපකාර තොග වෙළඳ ආයතනය මගින් කරවල බෙදන්න පටන් ගත්තායින් පසු කවදාවත් වරකට කරවල හොඳ්ඩර 22 කට වඩා මේ සමිති සංගමයට ලැබී නැහැ. කරවල ලැබෙන්න පටන් ගත්තෙත් මාස දෙකකට පමණ පසුවයි. ඒ කිසිම වාරයක වරකට හොඳ්ඩර 22කට වඩා ලැබුණේ නැහැ. සංගමයේ සභාපතිතුමා කරවල ගෙන්වනවාද, නොගෙන්වනවාද, කියන්න මා දන්නෙ නෑ. එහෙම නැත්නම් සමුපකාර තොග වෙළඳ ආයතනයේ නිලධාරීන් මේ සංගමයට කරවල දෙනවාද, නොදෙනවාද, කියාත් මා දන්නේ නෑ. අද ලංකාවේ හැම ප්‍රදේශයකටම කරවල දුර්ලභ වස්තුවක් වී තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමා කරුණා කර සෑම ජන්දදායක කොට්ඨාශයකටම කරවල ලබා දෙන මෙන් ඒ නිලධාරීන්ට නියම කරනවා නම් හොඳයි. සෑම ජන්ද කොට්ඨාශයකටම නිසියාකාර කරවල බෙදන ලෙස නියම කරනවා ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. නොයෙක් දේශපාලන මත දරන සභාපතිවරු සමුපකාර සමිතිවලත් සමිති සංගම්වලත් ඉන්නවා. සමහරවිට ඒ ජන්ද කොට්ඨාශවල අයට රජයේ අදක්ෂකම පෙන්වන්න කරවල ගෙන යන්නේ නැතුව ඇති. එම නිසා ඒ ඒ වෙළඳ සංගම්වලට ගෙන යන්න කරවල ප්‍රමාණයක් නියම කරන ලෙස මම ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා. එසේ නියම කර ඒ බව ඒ ඒ කොට්ඨාශවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් දන්වන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මේ සභාපතිවරයාට විරුද්ධව චෝදනා රාශියක් ඔප්පුවෙලා තියෙනවා. අපේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) ආහාර ඇමති වශයෙන් සිටි කාලයේදීත් ඔහුට විරුද්ධව චෝදනා තිබුණු බව ඒ මන්ත්‍රීතුමාත් දන්නවා ඇති. එසේම දැනට සිටින අපේ ගරු ආහාර ඇමතිතුමාත් ඒ බව දන්නවා ඇති. ඒ චෝදනාවලින් සමහරක් මම මතක් කරන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් සිල්වා මයා.]

මීට අවුරුදු දහයකට ඉහතදී මොහු මැදගම සමුපකාර සමිතියේ කළමනාකරු වශයෙන් සිටින කාලයේදී එම සමිතියේ රුපියල් තුන්දහස් ගණනක හිඟයක් තිබුණා. මෑත දී ණය දෙන සමුපකාර සමිතියේ සභාපති වශයෙන් වැඩ කරන කාලයේදී නොයෙකුත් සාමාජිකයන්ගෙන් බොරු අත්සන් අරගෙන රුපියල් හය දහස් ගණනක මුදලක් අරගෙන තිබෙනවා. අද මේ චෝදනා ඔප්පු වී තිබෙනවා. අද පහළ ඌවේ සමුපකාර සංගමයේ සභාපති වශයෙන් සිටින මේ තැනැත්තා මා කලින් කී පරිදි මැදගම සමුපකාර සමිතියේ මැනේජර් වශයෙන් සිටි කාලයේදී රුපියල් තුන් දහසක හිඟ මුදලක් තිබුණා නම්, අද ඔහු මේ සංගමයේ සභාපති හැටියට වැඩ කරන්නේ කෙසේද කියා මම දැනගන්න සතුටුයි.

මීට අවුරුදු දෙකකට පමණ ඉහත දී මේ සභාපතිවරයා කොළඹ සමුපකාර තොග වෙළඳ ආයතනයට පැමිණ පරිප්පු වගයක් අරගෙන ගිහින් තිබෙනවා. ඒ අරගෙන ගිහින් තිබෙන්නේ හොඳ පරිප්පුයි. නමුත් කොළඹදීම ඒවා මාරු කර සංගමයට අරගෙන ගිහින් තිබෙන්නේ බාල පරිප්පු වගයක්. ඒ කාරණයත් ඔප්පු වෙලා තියෙනවා. ඔප්පු වුණත් ඒ සභාපතිවරයා නිදහස් වුණා. ඔහුගේ සේවකයෙක් ඊට වැරදි කරුවා වශයෙන් තීරණය වී මාස 6 කට හිරේට නියම වුණා. සභාපතිවරයායි, අයුතු ලාභ ගත්තේ. නමුත් අසු වුණේ අහිංසක සේවකයෙකුයි. ඔය විධියේ නොයෙකුත් දූෂණ වැඩ සිදුවන නිසා මේ සමිති සංගමය විසුරුවා හරින ලෙස හෝ ඒ නිලධාරීන් ඉවත් කිරීමට ක්‍රියා මාර්ග යක් ඇති කරන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, සමුපකාර සමිතිවලට මැනේජර්වරුන් පත් වන විට මූලදීම ලැබෙන්නේ රුපියල් 120 ක නැත්නම්, 140 ක පඩියක් බව ඔබතුමා දන්නවා ඇති. සමහරවිට පුෂ් බයිසිකල් එකක්වත් නැතිව එන මැනේජර්වරු අවුරුදු දෙකයන විට කාර් අර ගන්නවා. එක මැනේජර්වරයෙකුට කාර් දෙකක් තියෙනවා එනකොට කිසි දෙයක් නැතුවයි, ආවේ. තවත් එක මැනේජර්වරයකුට ට්‍රැක්ටර් දෙකක් තියෙනවා. එසේම ඔහු රුපියල් 90,000 ක පමණ ඉඩම් අරගෙන තියෙනවා. පඩිය වශයෙන් ලැබෙන්නේ ඔසකට රුපියල් 140 යි. මේ පිළිවෙළට බලන විට සමුපකාර සමිතිවල නොයෙකුත් අක්‍රමිකතා සිදු වන බව හොඳින්ම පෙනෙනවා. ගරු ඇමතිතුමාත් මේවා හොඳාකාර දන්නවා ඇති. එම නිසා මේවා ගැන පරීක්ෂණයක් ඇති කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සමුපකාර සමිතිවල සිටින කාරක සභා නිලධාරීන් ඔය මැනේජර් මහත්වරුන්ට ණයගැති වී සිටින බව මම කියන්න කැමතියි. බොහෝම කාරක සභික මහත්වරු මැනේජර්වරුන්ගේ මුදලට වහල් වෙලා අයුතු විධියට වැඩ කටයුතු කරනවා. ඒ සම්බන්ධව සැලකිල්ල යොමු කරන ලෙසත් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මම ගිය සතියේ රෙදි වගයක් මිළට ගැනීමට කොටුවේ තිබෙන සමුපකාර තොග වෙළඳ ආයතනයට ගියා. මා කියන්නේ නැහැ සෑම සේවකයකුම අදක්ෂය, අකාර්‍යක්ෂමය කියා. නමුත් ඇතැම් අය ඉන්නවා. මා බඩු ගැනීමට ගිය අවස්ථාවේ එතැනට පැමිණ සිටි තවත් මහත්මයකුට සිදු වුණු දෙයක් ගැන කියන්න කැමතියි. ඔහු හතර හමාරට පමණ ගියා පවුඩර් ටින් එකක් ගන්න. පහ වනතුරු ඉඳලත් ඔහුට එය ලබා ගන්න බැරි වුණා. මෙවැනි කරුණු ගැන පරීක්ෂණයක් තියන්න ඕනෑ.

වෙළඳ දෙපාර්තමේන්තුව ගැන කියන්න කැමතියි. තමුන්නාන්සේ දන්නවා ඇති, මොණරාගල, බිබිල වැනි ප්‍රදේශවල දෙහි දොඩම් ආදිය බොහොම තිබෙන බව. එවැනි පළාත් දෙහි දොඩම්වලට බොහොම ප්‍රසිද්ධයි. නමුත් මොණරාගල තිබෙන වෙළඳ දෙපාර්තමේන්තුව කිසි විටෙක ඒ පළාතේ දෙහි දොඩම් මිලදී ගන්නේ නැහැ. එම නිසා කුට වෙළෙඳුන්ට ප්‍රයෝජන ලැබෙනවා. ඒ ද්‍රව්‍ය අයිතිකාරයන්ට නියම මිලකට ඒවා විකුණා ගන්න ලැබෙන්නෙ නැහැ. එම නිසා දෙහි දොඩම්, එළවළු යනාදිය වෙළඳ දෙපාර්තමේන්තුවට මිලදී ගන්න විධිවිධාන යොදන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ කළොත් නිපදවන්නන්ට නියම මිලට ඒවා විකුණා ගන්න ලැබෙනවා.

ගරු ඇමතිතුමා දන්නවා ඇති සිල්ලර වෙළෙන්දන් ගැන. පාලන මිලට විකිණීම සඳහා බඩු මිලදී ගැනීමට ඒ අයට අවස්ථාවක් නැහැ. ඒ නිසා පාරිභෝගිකයන්ට පාලන මිලට බඩු විකිණීමට ඔවුන්ට පුළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්කමක් ඇත්තේ නැහැ. තොග වෙළෙන්දා වැඩි ලාබ ගන්නවා. සිල්ලර වෙළෙන්දාට වැඩි මිලටයි බඩු ලැබෙන්නේ. ඒ නිසා ඔහුටත් වැඩි මිලට බඩු විකුණන්න සිදු වන බව පේනවා. මේ හේතුවෙන් නිත රම ඔහු නීතියේ රැහැණට අසු වෙනවා. සමුපකාර පරීක්ෂක මහත්වරුන්ද නිත රම පරීක්ෂාවට යන්නේ සාමාන්‍ය සිල්ලර වෙළෙන්දන් ළඟටයි. හාල් මැස්සන් රාත්තල් දෙක තුනක්, රතු ලුණු රාත්තල් හත රක් පහක් කාරිය තබාගෙන සිටින අය පරීක්ෂා කරන්නයි වැඩිපුර ඔවුන් යන්නේ. එසේ ගොස් හාල් මැස්සන් කාලක් අරගෙන එන්නය කියා කවුරුවත් පිටත් කර යවනවා. එම වෙළෙන්දාගේ බක්කියේ තියෙන්නෙ වැඩිම වුණොත් හාල් මැස්සන් රාත්තල් තුනයි නැතිනම් හතරයි. යම් විධියකින් ශත තුන හතරක් වැඩියෙන් විකුණලා අහුවුණොත් එම වෙළෙන්දාට විශාල තර්ජනයකට මුහුණ පාන්න සිදු වෙනවා. අද රටේ සිල්ලර වෙළෙන්දන් දහස් ගණනින් සිටිනවා. ඔවුන් ළඟ වැඩ කරන සේවකයනුත් ඒවාගේ තුන් හතර ගුණයක් සිටිනවා. තමන්ගේ කටයුතු නිසි යාකාර කරගෙන යාම සඳහා ප්‍රමාණවත් මිලකට බඩු විකුණාගන්න ඒ අයට ඉඩ තිබිය යුතුයි. නමුත් නියම මිලට බඩු විකුණන්න ඒ අයට අවස්ථාවක් නැත්තේ නියම මිලට ඒවා ලබා ගැනීමට බැරි නිසයි. නගරවල මෙන්ම ගම්වල සමහර සිල්ලර වෙළඳ සැල් වසා දමලා. නියම මිලට බඩු විකිණීමට නුපුළුවන්කම නිසා ඒවා වසා දමලා. එම නිසා සිල්ලර වෙළෙන්දා ඉතා අමාරු තත්ත්වයකටයි වැටී සිටින්නෙ. ඔවුන්ගේ යහපත සලසන්න ක්‍රියා කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා. (අවිස්සාවේල්ල)

(திரு. டீ. பீ. ஆர். குணவர்தன—அவிஸ்ஸாவெல)

(Mr. D. P. R. Gunawardena—Avissawella)

I do not want to take much time nor do I want to repeat the criticisms already levelled against various departments under this Ministry, but I want to deal with one or two departments, their working and their shortcomings. In the first place, it must be realized that this is not a development Ministry although undoubtedly the activities of its departments are ancillary to development work. So far as the development of the economic resources of our country, to achieve plenty, is concerned, I do not think this Ministry is very important, but since food is of course a primary need of every one of us, this Ministry which today embraces commerce, trade, food and shipping, must see to it that the people are fed sufficiently and with nutritive foods. The growing of food in this country, its processing and so on, have to be undertaken by other Ministries, but as long as we find it difficult to produce all our food within the country to satisfy the people's needs, as long as we have to import food from other countries, this Ministry must see to it that sufficient quantities of food are brought in and distributed properly so that nobody suffers as a result of a scarcity.

Let me at the very outset say that I am not against the taking over of the *karavadu* trade by the C. W. E. The wholesale *karavadu* trade should have been taken over long ago. As a matter of fact if one studies carefully the proposals contained in the Agricultural Plan of the Ministry of Agriculture and Food, issued in 1958, one will find that we were trying to streamline the Food Department and the C. W. E. for this very purpose. I am not worried at all that Napoleon has lost his business; I am not worried in the least that Boniface Fernando finds it difficult to smuggle gold and opium when he brings in *karavadu* from South India and other places.

The Hon. Minister goes round the country saying that he took over the *karavadu* trade for the purpose of finding gold. I do not know whether he has found any gold bars inside the dried fish. It would be a good thing if he has, because then the Hon. Minister of Finance would find that his problem is half solved.

ගරු ඉලංගරත්න

(கௌரவ இலங்காரத்ன)

(The Hon. Ilangaratne)

I did not make any such statement.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

I have not brought the newspapers here, but he has stated that—

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

May I explain, Sir ?

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

The Hon. Minister will get a chance to reply. If the report is incorrect he can say so. As long as he has not made a statement that what was reported is not correct, we are justified in taking it as a true report of what he said. I do not know why the Hon. Minister should get up all the time to contradict what I say. Let me state what I have to. He will get his chance to reply.

As I was saying, I do not know whether he has found any gold or opium, but from the way things are proceeding I am inclined to think he has found it !

I said that primarily I am interested in seeing that this country gets its food in sufficient quantities and distributes it properly. The distribution machinery must not be disturbed unless you are able to provide an alternative efficient distribution system. I will deal with the Co-operative Department and the C. W. E. in a minute. All I want to say just now is that unless the Ministry has a proper system of distribution, unless it takes over the entire wholesale trade in dried fish, for instance, and the whole of the import trade also—I understand that the decision still is that a certain percentage of the import trade should be handled by private parties—that primary need which I referred to earlier will not be met.

I tried my best during the period I was in charge of these departments as Minister to see that the irregularities, the inefficiency and corruption in the Food Department, in the C. W. E. and the co-operatives were eradicated. We were working on it, but I must confess that after three years, when I gave up office, I was not quite satisfied that we had succeeded in doing it. We tried our best.

What happens is, when you import certain goods and release them to the private trade, the C. W. E. sometimes buys the same stuff at a higher rate and sells it back to the people. There are also other irregularities which I will refer to more specifically before I finish. The hon. Member for Moneragala (Mr. W. G. M. Albert Silva), mentioned what happens in his area.

There you have a very large number of co-operative stores unions which buy provisions and various other goods from the C. W. E. and release them to the Pettah private traders instead of to the members of their unions. This has been established in a number of investigations, So, while importing goods, you are also feeding the blackmarket. How can you get rid of the blackmarket while feeding it ? You are feeding the blackmarket because you have no proper system of checking the ultimate point to which these goods go. The goods reach the hands of various traders after the stuff is bouhgt by the union from the C. W. E. This has been established.

So this idea that you can take over 50 per cent or 75 per cent and release the rest to the private trade means that it is no different from what happens to G. P. S. paddy : sometimes the same cart goes round and round delivering the same paddy to the G. P. S. store. You have only to bribe a few of the people in charge, and the thing is done. So this half and half business is not going to get you anywhere.

You did the same with the Oil Corporation, and you are heading into heavy seas now. You were afraid to take over the entire distribution system. I told you when that Bill was debated that the oil distribution business of this country is over-capitalised, that there is no need for such duplication of distribution machinery and facilities, petrol stations, petrol pumps and all that ; and now you propose to do the same thing and over-capitalise it further

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ රටේ ජාතික ධනය ලැබෙන්නේ තේ, රබර්, සහ පොල්වලින් බවයි, අප පිළි ගෙන තිබෙන්නේ. අප සිටින උඩරට ප්‍රදේශවල කොකෝ, පුවක්, ගම්මිරිස්, සාදික්කා; වසාවාසි ආදී සුළු ද්‍රව්‍ය රාශියක් නිෂ්පාදනය කරන ගම්බද පවුල් රාශියක් සිටිනවා. අපේ උද්ඝෝෂණයක් නිසා මේ ද්‍රව්‍ය සම්බන්ධයෙන් දියුණුවක් ලබා ගන්නේ කෙසේදැයි සොයා බලා කටයුතු කිරීමට ගරු ඇමතිතුමා කාරක සභාවක් පත් කර ඒ කාරක සභාවේ සභාපති හැටියට මාවත් පත්කර තිබෙනවා. අපි ඒ පිළිබඳ ව වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ ද්‍රව්‍ය නියම මිලකට අද විකුණා ගන්න බැහැ. ඒ නිසා ඒවායේ නිෂ්පාදනයටද පහරක් වැදී තිබෙන බව ඇමතිතුමා පිළි ගෙන තිබෙනවා. එම නිසා විදේශික රට වල් සමග සාකච්ඡා කර ඒවාට හොඳ මිලක් ලබා ගැනීමේ වැඩ පිළිවෙලක් ඇති කිරීම අපේ රටේ අර්ථසංරක්ෂණය දියුණු වීමට ඉතා ප්‍රයෝජනවත් වෙනවා ඇති. මෙසේ කටයුතු කිරීමට ඇමතිතුමා පොරොන්දු වී තිබෙනවා. දැනට ඒ ප්‍රදේශ වල කොකෝ මිල නිෂ්පාදනය බොහෝ දුරට බැස තිබෙනවා. ඒවා ගැනීමට ගම්බද ප්‍රදේශවල වෙළඳුන් පවා නැහැ. එම නිසා ඉතාමත් ඉක්මනින් මේ පිළිබඳව සැලකිලිමත් වී ඒ ද්‍රව්‍ය පිටරට යැවීමට ක්‍රියා කරන්නය කියා මම ඇමතිතුමාට නැවතත් මතක් කරනවා. අපේ කොකෝ රුසියාව, ජපානය ආදී රටවලට දෙන්න පුළුවනි. ඒ වාගේම එයින් ලක්ෂ හැට හැත්තෑවක ආදායමක් ලබා ගන්නත් පුළුවනි. කොකෝ රාත්තලක් සඳහා දැන් සත 25ක තීරු බද්දක් අය කරනවා. එතකොට හොඳ්ඩරයකට රුපියල් 28යි. අපි කියා තිබෙනවා ඒ තීරු බද්ද්ත් අඩු කිරීමට ඉතා ඉක්මනින් ක්‍රියා කරන්නය කියා. ඒ වගේම බැංකු ශාඛා පිහිටුවීම ගැනත් සමහරුන් අපට පහර ගසනවා. මහජන බැංකුවේ ශාඛා මහනුවර, මාතලේ ආදී පළාත්වල පිහිටුවීම ගැන පහර ගසනවා. අවුරුදු සිය ගණනක් තිස්සේ අතහැර දමා තුබුණු ප්‍රදේශයක, කිසිම සැලකිල්ලක් නැතිව අතහැර දමා තිබෙන ප්‍රදේශයක, අධිරාජ්‍යවාදීන්ගේ වතුවලින් වට වී ඇති ප්‍රදේශයක ජීවත් වන අපේ ගම්බද ජනතාවට විශේෂ සේවයක් කළ හැකි නම් එහි කිසිම වරදක් නැහැ. මහනුවර මාතලේ වැනි නගරවල ප්‍රථමයෙන්ම මහජන බැංකුවේ ශාඛා පිහිටුවීම ගැන දොස් කීම කිසිසේත් වටින්නේ නැහැ. මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඒ ප්‍රදේශයේ සෑම නගරයකම සෑම ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයකම මෙම මහජන බැංකුවේ ශාඛා පිහිටුවීමට ඉක්මනින්ම කටයුතු කරන ලෙසයි. එසේ පිහිටුවා අපේ දුප්පත් ජනතාව බැංකු ගනුදෙනු වලට සම්බන්ධ කරන්ට කටයුතු සලස්වන්න. ඔවුන්ගේ කෘෂිකර්මාන්තය, හස්ත කර්මාන්තය ආදිය දියුණු කර ගැනීම සඳහා ණය ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන්න.

අ. භා. 2.15

අපේ ප්‍රදේශවල දියුණුවට කටයුතු කර ගෙන යන විට ඇතැම් අයට බොහොම අමාරුයි. නමුත් අප ඒවා ගණන් ගන්න වුවමනා නැහැ. නොදියුණු ප්‍රදේශවලට අනෙක් ප්‍රදෙශවලට වඩා ඉක්මනින් යම් යම් සේවා සැලසීමේ වරදක් නැහැ.

බොහෝ ගරු මන්ත්‍රීවරුන් විසින් පත් වීම් ගැනත් කථා කරන්න යෙදුණා. යම් කිසි කුනතුරක් සඳහා දහයක් දොළහක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රී. පී. වයි. ජීනදාස මයා.]

ඉදිරිපත් වෙනත් තෝරා ගනු ලබන්නේ එක්කෙනයි. එසේ වූ විට නොතේරුණු අය කරන්නේ නොයෙකුත් බොරු ප්‍රචාරය කිරීමයි. මේක මේ රටේ පමණක් සිදු වන දෙයක් නොව මුළු ලෝකයේ හැම තැනම වාගේ සිදු වන දෙයක්. දහ දෙනකු ඉදිරිපත් වූ විට එයින් තෝරා ගන්න පුළුවන් වන්නේ එක් තැනැත්තකුයි. එවිට අනෙක් නව දෙනාම එකතු වී ඒ තෝරා ගැනීම වැරදියයි කියනවා. අප මේවා ගැන කල්පනා කරන්න වුවමනා නැහැ. වෙනත් පක්ෂ කළ දූෂණ අපේ පක්ෂය කරන්නේ නැහැ. කරන්න වුවමනාවකුත් නැහැ. දූෂණ කළ අයට සුදුසු පාඩම් ලැබී තිබෙනවා. අප ඒ ගැන දන්නවා. එම නිසා කවුරුන් මොනවා කීවත් නිර්භයව අවංකව පත්වීම් මෙන්ම අනෙක් වැඩත් කරන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I do not intend to take more than ten or twelve minutes at most. I want to make only one or two casual observations. I remember the hon. Member for Galle (Mr. W. Dahanayake) drew attention to this. There is something unsatisfactory about Mysore dhall. I have already drawn the attention of the Hon. Minister to that.

The problem there is this. The Food Department sells and has been selling Mysore dhall to private parties. There is a regulation which says that no one individual can buy more than 50 tons but I have pointed out that that Regulation is easily circumvented by nominees of big *mudalalis*—some of them backed by banks—buying up the dhall. Still less defencible is the fact that at the time I pointed that out the difference between the market price and the selling price of the Food Department was Rs. 4. The Department was selling at Rs. 48 when the market price was Rs. 52. For doing nothing they were getting a difference of Rs. 4. They were making enormous profits.

Not only that, when there was a shortage almost all the dhall imported by the Food Department was consumed by these big *mudalalis*. If there was a slight delay in a steamer coming in they were able to push up the price a little and sell the dhall in the market. I pointed out that that is a very unsatisfactory state of affairs. I have drawn the attention of the Hon. Minister to this more than once. I cannot tell you what is happening at the present moment, I have not been able to check up for the last two or three days.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்காரத்ன)
(The Hon. Ilangaratne)

It happend, but now we have rectified that state of affairs.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

It happened a few months back.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்காரத்ன)
(The Hon. Ilangaratne)

In the latter part of 1960.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

No, just before I went abroad. How many times did this happen after this Government came into office ? I myself went to see the Hon. Minister to point out what was happening, after this Government came in. As a matter of fact I have drawn the attention of the Hon. Minister personally, and also on the Floor of the House, to what has happened in the past in the Food Department.

This matter was discussed here in 1959 when specific charges were made against the Food Commissioner, and the late Premier, Mr. S. W. R. D. Bandaranaike, undertook to make a full investigation of the whole question. I have got the papers with

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

me here. In reply to the then Member for Colombo North. (Mrs. Vivienne Goonewardene) who raised a number of matters and made a number of charges, the late Premier said :

"I shall have those matters most carefully gone into."

To date we do not know what the result of that inquiry is. Mr. S. F. Amerasinghe was deputed to hold the inquiry. What kind of inquiry did you have ? The Civil Service has at least this much to their credit : they are a very powerful trade union ; they will never put their own men into trouble ; somehow or other they will wangle a thing so that their men will escape. Mr. S. F. Amerasinghe is supposed to have held an inquiry, but the public was not even informed of it ; no safeguards were provided for those who gave evidence, and nobody was prepared to come forward and give evidence. Outside people were involved, and one could not make statements unless immunities were granted. There were people like Smale and others in the business, and it was a gigantic racket involving millions of rupees. There was that case of buying Begmi rice in Pakistan ; 10,000 tons of rice was imported but could not be sold. How many millions did we lose on that ? Then there was the purchase of Egyptian rice, the purchase of sugar, and a whole series of rackets. I appealed to the Hon. Minister and warned his colleague, the Hon. Minister of Local Government, to be careful with this officer. He has now gone into the Housing Department and has started to import cement. He likes that type of business. What has the Housing Department to do with importing cement ? I have no doubt that there will be some commission there. I am a hundred per cent certain of that. Why is he importing cement when he is supposed to be dealing with the question of housing for us ? This is a scandalous state of affairs.

I want to expose another racket that is going on—the eggs racket. This racket goes on through the C. W. E., and I will give you some details which will interest you. In July, 1961—not long ago—the import of eggs to Ceylon by non-nationals was banned by the Government. Up to that time eggs were imported mainly by non-nationals. One of the biggest exporters of eggs is a firm called K.G.E.N. & Co., operating from Trichy and Madras. The C. W. E. started importing eggs from this company. K.G.E.N. & Co., exports eggs not only to the C. W. E. but also to private parties in Ceylon. What are the prices ? The C. W. E. imported at Rs. 18 per basket of 100 eggs, but the same K. G. E. N. & Co. sent eggs to private parties at Rs. 17.10, a difference of 90 cents per basket. Who got the difference ? It is important to find that out. It was a case of loading of invoices. This racket is going on steadily. On the 1st September, 1961, not even a week ago, when the C. W. E. bought at Rs. 18, the price to the private importer was Rs. 16.85. On the 2nd September, the price to the C. W. E. was Rs. 18, but the price to the private importer was Rs. 16.60. Somebody was making money.

That is not all. None of these eggs imported by the C. W. E. was sold by the C. W. E. to the people. The C. W. E. at the railway goods shed here sold the whole lot of eggs back to this same K. G. E. N. Company's men here. I have got the invoice numbers here with me. On 26.8.61, under invoice number RR-024106, a hundred baskets were sold. Mind you, the C. W. E. is importing about 35,000 eggs a day from this company. The delivery pass number given to the company by the C. W. E. is 918. You might also refer to invoices numbers 175538, 175540, 175542 and so on—I have a number of them here. What is the C. W. E. doing ? They are straightway handing over the whole lot of eggs to the K. G. E. N. Company's men here, and they in turn are selling the eggs at 22 cents, 23 cents each. And your top men are getting one cent on each egg per day. This is the racketeering that is going on, and I can give you the names of the individuals concerned.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා.]

I am thoroughly dissatisfied with what is happening in the C. W. E. I have myself tried to intervene with the C. W. E. people in order to encourage certain small people who are manfacturing soap, as against the B. C. C. Even after my intervention, persuading them to provide facilities to these small people to market their product, it took the C. W. E. five to six months to settle their bills. How can people carry on in this way ? These small manufacturers gave up trying to sell their product to the C. W. E., in disgust.

Let me come back to this question of eggs. The usual procedure for the C. W. E., in the matter of payment of customs duty, is to use a pink entry form on which a back entry is made of the amount due to the Customs. They do not pay duty straightway in cash in respect of all their normal imports. But what happens in the case of egg imports ? The C. W. E. has departed from the normal procedure in respect of imports from K. G. E. N. Co. and is paying cash direct to the Customs. Why ? Because there is a peculiar transaction going on all the time. The C. W. E. has not allowed any credit to any Indian exporter, but in the case of K. G. E. N. Company, for eggs, a letter of credit has been opened with the State Bank of India to the tune of Rs. 25,000. I have got all the details. You see what is happening ? I am not blaming the Hon. Minister. Please do not misunderstand me—

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்காரத்ன)
(The Hon. Ilangaratne)

No. I am very grateful to the hon. Member for this information.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(டொக்டர் என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

As a matter of fact, I would have placed these facts before the Hon. Minister personally and requested him to take action, but I thought it necessary to expose these goings on as a warning to a number of other racketeers in the C W. E. in the hope that bringing these into the light of public opinion will be a sufficient deterrent to some of these people and make them aware that we are alive to what is happening in the C. W. E.

අ. භා. 2.30

A lot of racketeering of this type is going on. In this instance it means that some of the top men in the C. W. E. are getting something like Rs. 300 a day on eggs alone. Of course, it is divided between two or three people. When they buy 35,000 eggs a day it means that they get something like Rs. 300 a day. That is what is happening in the C. W. E. But this is nothing compared to the racketeering that is going on in the Government Stores.

It was only last night that another matter came to my notice. The Information Department has ordered 100 golf umbrellas from the Government Stores. They are big multicoloured umbrellas. What was the price ? Delivered to the Information Department, it is Rs. 66 per umbrella. I made enquiries from the market. There is no multi-coloured umbrella the price of which is higher than Rs. 22. The highest price is Rs. 22. The highest price of a multicoloured umbrella with a seat is Rs. 45 ; that is, the golf umbrella with a seat. The ordinary golf umbrella is only Rs. 22. What happened here ? They made Rs. 4,000 on it. Rs. 2,000 went to the shopkeeper and Rs. 1,000 each was received by two fellows in the Government Stores. This is what is happening. I have got more information about the Government Stores, but this is the kind of racketeering that is going on. You have got to cleanse this corruption before you make any progress in this country. How can you build socialism on corruption ? You have got to weed out all these corrupt people.

You are talking of the Co-operative Department. The chief organizer of the U. N. P. in Bibile—my good Friend, the Member for Avissawella will remember that he was a Member of this House for a short period of three months—is the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

President of the Co-operative Stores Union there. He is the President of two Multi-purpose Co-operative Societies. A number of charges have been levelled against him, but inquiries have been pending for months. Nothing is coming out of the department.

It was only the other day that this person obtained Rs. 25,000 from the Co-operative Bank. Nobody knows why the money was taken. He has put in bogus loan chits of dead men, of people who do not live in the area, and he has pocketed Rs. 25,000. Inquiries are still pending. This kind of racketeering is going on. We have got to clean up this corruption if we are going to make any progress. I am sorry to say it, but he is the chief U. N. P. organizer in Bibile. Therefore he is well protected in some ways. You cannot easily bring him to book. He is the man who went in the Assistant Commissioner's car to attend a meeting and charged travelling. When the complaint was made, no inquiry was held by the department. How many cases like that are there? I can give you a number of cases but I will have to spend too much time on that.

May I also beg of you not to let your Oil Corporation into a mess. I am also very worried. I entirely agree with the hon. Second Member for Colombo-Central about this Vitachchi you have appointed. He is a thoroughly—I will not put it any higher, I will not use any strong language—undesirable person. All the workers there know him. As a matter of fact, they have protested to the Oil Corporation against his appointment. If he continued one month more at Caltex, he would have been sacked. Yet this man is being given a higher salary and is now going to be in charge of the whole oil installation there at Kolonnawa. Not only that; he is also ensuring that his cronies should be brought into the State Petroleum Corporation so that along with them he could do all the damage in the oil installation. If this is what you are doing, from the beginning you are going to ruin your oil venture. So please see that you weed out all these undesirable elements. We are all interested in seeing that a good job of work, efficient work, is done. And we cannot do that except in terms of honesty, efficiency and devotion to duty. Those are the essential qualities. So I do want the Hon. Minister to look into these matters.

There are a large number of points that I could mention but I do not want to take too much time. I have said enough, but I do want to appeal to the Hon. Minister to try and cleanse up both the C. W. E. and the Food Department.

චන්ද්‍රසේන මුණවීර මයා. (රත්තොට)
(திரு. சந்திரசேன முனவீர—ரத்தொட்டை)
(Mr. Chandrasena Munaweera—Rattota)

ගරු සභාපතිතුමනි, බොහොම බාධා මැද්දේ මේ රටේ වෙළෙඳ යුද්ධයක් ආරම්භ කිරීම ගැන මා ගරු වෙළෙඳ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ රටේ ධනය කඩා වඩාගෙන නොයෙකුත් අයුරින් පිටරටවලට යවන කුට වෙළෙඳුන්ගෙන් මේ රටේ සාමාන්‍ය ජනතාව බේරා ගැනීමට අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) ලොකු වෙළෙඳ යුද්ධයක් ආරම්භ කළා. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් ආරම්භ කරන ලද එම වෙළෙඳ යුද්ධය තව දුරටත් කරගෙන යෑම සඳහා වීර පුරුෂයෙක් මෙන් ඉදිරිපත් වීම ගැන පළමුකොටම අපේ පළාතේ මහජනතාවගේ ප්‍රශංසාව ගරු ඇමතිවරයාට පුද කරන්න කැමතියි.

විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් නොයෙකුත් චෝදනා එල්ල කරන්න යෙදුණා. ඒවා අතර එක්සත් ජාතික පක්ෂය විසින් නඟන ලද චෝදනා ගැන අප කල්පනා කරන්නේ නැහැ. මේ ගරු සභාවේ සෑම විවාදයකදීම තමන් ජීවත් වන්නේ කෙසේ දැයි ඒ අය අමතක කරනවා. කළුකඩකාරයන්ගේ උදව්වෙන් කටයුතු කරන, ජීවත් වන, එක්සත් ජාතික පක්ෂය ඒ කළුකඩකාරයන්ට ණය ගෙවීම සඳහා හැම තැනම ගොස් මහජනතාව කුලප්පු කරන අතර මේ ගරු සභාවට අවුත් අපට දෙන උපදෙස් ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුණවීර මයා.]

කල්පනා කරන්න අප ලෑස්ති නැහැ. ඒ අය ගමන් කරන මාර්ගය වැරදි බව මේ රටේ ජනතාව දන්නවා.

අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා අපේ වෙළෙඳ ඇමතිතුමාගේ ප්‍රතිපත්තිය ගැන ප්‍රකාශ කළා. වයෝවෘද්ධ මන්ත්‍රීවරුන් අපේ යම් යම් වැඩවල දුර්වල තැන් පෙන්වා දීම ගැන නම් බොහොම සන්තෝෂ වෙන්න ඕනෑ. නමුත් අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රතිපත්තිය ගැනත් ටිකක් මතක් කළොත් හොඳය කියා හිතෙනවා. වර්නන් ගුණසේකර මහතා කඩුගන්නාව ආසනය තරඟ කොට පරාජයට පත් වුණු කෙනෙක්. කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීතුමා (ජීනදාස මයා.) ඒ ගැන මතක් කළා. පැරදුණු අය සී. ඩබ්ලිව්. ඊ. එකට පත් කර තිබෙනවා යයි අපට චෝදනා කරනත් කඩුගන්නාව ආසනය තරඟ කොට පැරදුණු වර්නන් ගුණසේකර මහතාට කුඹුරු පණත යටතේ පත්වීමක් ලැබුණේ නැද්ද කියා අසන්න සතුටුයි.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

වර්නන් ගුණසේකර මහතා මන්ත්‍රී ආසනයක් සඳහා ඉදිරිපත් වුණේ 1947 දී යි. කුඹුරු පණත යටතේ "ඇපිල් කෝට්" එකට ඔහු පත් කරනු ලැබුයේ 1958 දීයි. ඒ නිසා මේවා ගැන කථා කරන කොට පිකක් කල්පනා කොට වෙනස දැනගෙන කථා කරන එක හොඳයි.

මුණවීර මයා.
(திரு. முனவீர)
(Mr. Munaweera)

වර්නන් ගුණසේකර මහතාත් ඇතුළුව 1947 දී කඩුගන්නා ආසනයට ඉදිරිපත් වුණා, නුගවෙල, ප්‍රේමචන්ද්‍ර, රාජපක්ෂ, ජීනේන්ද්‍රදාස, රණරාජ, වල්ගම්පාය, නික තැන්න, ආදි පිරිසක්. ඒ අවස්ථාවේදී තුන්වෙනියා වුණේ කොමියුනිස්ට් පක්ෂයේ අපේක්ෂකයායි. හතරවැන්නා වූයේ වර්නන් ගුණසේකර මහත්මයායි. ගුණසේකර මහතාගේ ඇපයත් නැති වුණා. අපි කියන්නේ 1947 මැතිවරණයෙන් පැරදුණු කෙනකු හැටියට ඒ මහත්මයා ඇපිල් බොට් එකේ සභාපති හැටියට පත් වුණු බවයි.

තොග වෙළෙඳායතන මණ්ඩලයට පත් කර සිටින අයගේ සුදුසුකම් පිළිබඳව අපි කථා කරන්ට යන්නේ නැහැ. දක්ෂකම් අනුව ඒ අයට එහි වගකීම් භාර දී තිබෙනවා. සී. ඩබ්ලිව්. ඊ. එක මගින් ඉදිරි අවුරුදු ගණන තුළ කරන්ට අදහස් කරන වැඩ පිළිවෙළ ලියා ඔප්පු කරන්ටයි, ඒ අය පත් කර සිටින්නේ.

තවත් මහත්මයකු ගැන දෝෂාරෝපණය කළා. කිසිම උපාධියක් ලබා නැති, විශ්ව විද්‍යාලයකට නොගිය, ලොකු විභාග පාස් නොකළ, නවරත්න නම් මහත්මයෙක් ඒ අංශයේ සිටිනවා. ඒ මහත්මයා පත් කිරීම ගැනත් දෝෂාරෝපණය කළා. මාක්ස්වාදී පක්ෂයක නායකයකු හැටියට එතුමා කළ ඒ ප්‍රකාශය ගැන මා කනගාටු වෙනවා. සාමාන්‍ය ජනතාව අතරින් යම් මිනිසකු උසස් පදවියකට පත් වීම එතරම් ඇඟිලි ගස ගසා බැලිය යුතු දෙයක් දැයි මා එතුමාගෙන් ප්‍රශ්න කරනවා.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

පහත් තත්ත්වයක සිටි කෙනෙක් උසස් තත්ත්වයකට පත් වීමක් ගැන මා චෝදනා කළේ නැහැ.

මුණවීර මයා.
(திரு. முனவீர)
(Mr. Munaweera)

ඒ චෝදනාව කළ මන්ත්‍රීතුමකුට එය පැහැදිලි වෙයි. තමුන්නාන්සේ නොවෙයි, ඒ ප්‍රකාශය කළේ.

තොග වෙළඳායතනය ගැන කථා කරද්දී කරවල වෙළඳාම පිළිබඳව බොහොම තදින් ඇමතිතුමාට පහර දුන්නා. සී. ඩබ්ලිව්. ඊ. එක මොකද කරන්නෙ කරවල වෙළඳාම සම්පූර්ණයෙන්ම නොගන්නේ ඇයි? යන විධියේ ප්‍රශ්න ඇසුවා. මට ඒ සම්බන්ධයෙන් පැහැදිලිව එකක් කියන්න පුළුවනි. ඉංග්‍රීසිකාරයන් මේ රටට ඇවිත් මේ රට පාලනය කරන්ට පටන් ගත් දා සිටත්, යූ. එන්. පී. කාරයින් මෙරට පාලනය කළ අවුරුදු 9ක පමණ කාලය තුළත්, දැනට මාස $1\frac{1}{2}$කට පමණ උඩ දී සමුපකාර තොග වෙළඳායතනය මෙම කරවල ව්‍යාපාරයට අත ගසන්ට ලැහැස්ති වන තුරුත්, මේ රටට කරවල ගෙන්වූ වෙළෙන්දන් රට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගසා කෑ අන්දම ගැන අමතක කරන්ට බැහැ. ඒ වෙළෙන්දන් වර්ෂයකට කර වල හොණ්ඩර ලක්ෂ 70 ක් විතර මෙරටට ගෙන්නුවා. කරවල තොග වෙළඳාමේ සම් පූර්ණ අයිතිය ඔවුන් අත තිබුණු අතර සුළු වෙළඳුන් ඇති කර ගැනීමත් තිබුණේ ඔවුන් අතේයි. පාකිස්ථානය ආදි නො යෙක් රටවල සිටින කරවල පිටරට පට වන්නන් සමග ඔවුන්ගේ සංවිධාන තිබුණා. ඒ කරවල සංවිධාන මැදිදෙන් මෙ රට මුදල් පිටරට යැවීමට කටයුතු සකස් කරගෙන තිබුණා. මේ කරවල වෙළඳාම කරන්න බැරිය, මේකෙන් ආණ්ඩුව අමාරු වට වැටෙනවාය, යන විධියේ ප්‍රචාරයන් කරමින් තොග වෙළඳායතනය මගින් මෙම ව්‍යාපාරය කරගෙන යාම පිළිබඳව මහජනයා තුළ විශ්වාසයක් නැති කරන්ට මේ කෝටිපති කරවල වෙළඳුන් ඔවුන්ගේ සම්පූර්ණ බලය යෙදුවා. ඇමති තුමා ළඟට ගෙන යන්න ලක්ෂ ගණනක මුදලක් පිටකොටුවේ කරවල වෙළඳුන් එකතු කළේත් ඒකට බව තමුන්නාන්සේට මතක් කර දෙන්න සතුටුයි, ගරු සභාපතිතුමනි. මේ කරවල වෙළඳාම තොග වෙළඳායතනයට භාර ගත් මොහොතෙම— මාස එකහමාරක් ඇතුළතදී—අංග සම්පූර්ණව, සර්වසම්පූර්ණව ඒ වෙළඳාම කරන්ට පුළුවන්කමක් නැහැ. එහි අඩුපාඩු තිබෙන බව අප දන්නවා. එහෙත් මේ චෝදනා කරන අයට අප කියනවා, වැඩි කල් යන්ට පෙර සමුපකාර තොග වෙළඳායතනය මගින් කරවල මෙරටට ගෙන්වීමේ සම්පූර්ණ අයිතිය පවරාගන්න බව. දැනටමත් අවුරුදු පතා ලංකාවට ගෙන්වන කරවල හොණ්ඩර ලක්ෂ 70 න් ලක්ෂ 40 ක්ම ගෙන්වන්නේ තොග වෙළඳායතනයයි. ඒ වගේම පාකිස්ථානයෙන් ගෙන්වන කර වල සියයට සියයක්ම දැන් ගෙන්වන්නේ තොග වෙළඳායතනයයි. ඒ අධ්‍යක්ෂ මණ්ඩලය ගැන චෝදනා මුඛයෙන් කථා කර මින් එය විවේචනය කරන අයට ඒ මණ්ඩලය විසින් ළඟදීම පෙන්වා දෙනවා ඇති, කරවල වෙළඳාමේ ගරය කුමක්ද, එය කරන්නේ කොහොමද, කියා.

අ. භා. 2.45

මාතලේ සමුපකාර තොග වෙළඳ ආයතන යේ ශාඛාවක් විවෘත කළා. ඒ නිසා මාතලේ දිස්ත්‍රික්කය පිළිබඳව මට මේ ගරු සභාවේ ප්‍රකාශයක් කරන්න පුළුවනි. හැම තැනම කරවල නැතෙයි කියනවා. පාලන මිලට බඩු ගන්න බැරි යයි කියනවා. එක් දිනක් සවස ජනතා පත්‍රයේ මම දැක්කා ලොකු ශිරස්තලයකින් දමා තිබෙනවා මුළු දිවයිනේම සුළු වෙළඳුන් තම කඩ සාප්පු වසා දමනවාය කියා. මේ වාගේ මහජනයා මුලා කරන ප්‍රචාරයන් පවතින අවස්ථාවක දී, හැම පැත්තෙන්ම නොයෙක් විධියේ බල වේගයන් සමුපකාර තොග වෙළඳ ආයතනයේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කිරීමට උත්සාහ කරන වේලාවේදී, මාතලේ දිස්ත්‍රික්කයේ තත්ත්වය පිළිබඳව අපට උදම් අණන්න පුළුවන්කමක් තිබීම මහත් ප්‍රීතියක්. අපේ දිස්ත්‍රික්කයේ සිටින සිය ලුම වෙළඳ මහත්වරුන්ට මම කියා තිබෙ නවා පාලන මිලට ලබා ගැනීමට අවශ්‍ය බඩු මොනවාදැයි ලැයිස්තු සපයා දෙන ලෙස. එසේ දැන් වූ විට සියලුම සුළු වෙළඳ මහතුන්ට තම වෙළඳ සැල්වලට වුවමනා බඩු මාතලයේ තොග වෙළඳ ආයතනයෙන් ලබා ගැනීමට අපි සියලුම ඉඩ ප්‍රස්ථා ලබා දී තිබෙනවා. ඒ නිසා රත්තොට ආඝනයේ නම් කරවල පිළිබඳව කිසිත් හිඟයක් ඇත්තේ නැහැ. ඒ ආඝනයේ කිහිප දෙනෙක් දැන් මෙහි ඇවිත් සිටිනවා. ඔවුන් ඊට සාක්ෂි දරනවා ඇති. එහි හිඟයක් තිබුණා; සුමාන දෙකක් තුනක් පමණ තිබුණා. නමුත් දැන් ඒ හිඟය ඇත්තේ නැහැ. මහජනයාට වුවමනා පමණ කරවල ලබා දෙන්න අපට දැන් පුළුවන්කම තිබෙ නවා. පළාතේ සියලුම සුළු වෙළඳුන් මම සමුපකාර තොග වෙළඳ ආයතනයට හඳුන්වා දී ඔවුන් කුමන පක්ෂයේ වුවත් ඔවුන්ට වුවමනා බඩු දෙන්නය කිව්වා. මේවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උදවිය කරන වැඩයි. ඔවුන් ගම් වටා නගර වටා ගොස් යු. එන්. පී. කාරයින් මෙන් කෑ ගහන්නේ නැහැ. යු. එන්. පී. එකට නම් විවේචනය කරන්න බොහොම ලෙහෙසියි. ඔවුන් හැම අවස්ථාවකදීම මේ රජය විවේචනය කරන්නයි බලන්නේ. අපේ රටේ ප්‍රවෘත්ති පත්‍රත් කවුරු හෝ මොකක් හරි නැතැයි කිව්වොත් එය පත්‍රයේ ලොකු අකුරින් පළ කිරීමට හරි හපන්නු. දැන් කඩකාරයින් කඩ වසා දමනවාය ඔවුන්ට මුහුදට පනින්න සිදු වී තිබෙනවා යයි පත්‍රකාරයෝ ලොකු ප්‍රචාරයක් ගෙන යනවා. නමුත් මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුණවීර මයා.]

රජය කොයි දෙයක්වත් කළ බවක් නම් පත්‍රයේ ප්‍රසිද්ධ වන්නේ නැහැ. ආණ්ඩුව විවේචනය කරන අයගේ ප්‍රකාශ නම් හැම විටම පළ වෙනවා.

බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) ආණ්ඩුව විවේචනය කරමින් සමුපකාර තොග වෙළෙඳ ආයතනය රුපියල් ලක්ෂයක හාල් මැස්සන් ගත්තාය කිව්වා. මේ පිළිබඳව ඒ මණ්ඩලයේ අයගෙන් ඇසූ විට මට දැනගන්න ලැබුණේ ඔවුන් ගත්තේ රුපියල් 35,467.37 ක් වටිනා හාල්මැස්සන් ප්‍රමාණයක් පමණක් බවයි. මේ මුදල තවමත් ගෙවා නැහැ. ඒ හාල්මැස්සන් අරගෙන තිබෙන්නේ නැපෝලියන් ප්‍රනාන්දු මහත්මයාගෙන් නොවෙයි. ටී. ඒ. ජේ. නූර්බෝයි නමැති වෙළඳ මහත්මයාගෙනුයි.

සමුපකාර තොග වෙළඳ ආයතනය ගැන කථා කරන විට ගරු ඇමතිතුමාට මතක් කළ යුතු කරුණක් තිබෙනවා. තොග වශයෙන් සමුපකාර සංගම්වලින් ලබා ගන්න බඩු ඒ තැන්වලින් අපේ පළාත්වල ඉන්න සෑම සිල්ලර වෙළෙන්දකුටම පහසුවෙන් ලබා ගත හැකි විය යුතුයි. එසේ ලැබෙනවා නම් සිල්ලර වෙළෙඳුන්ට පුළුවන් වෙනවා සමුපකාර කඩ සමිතිවල සිටින කළමනාකරුවන් සමග තරඟයකට බහින්න. සමුපකාර ව්‍යාපාරය සමහර ප්‍රදේශවල බොහොම හොඳින් දියුණු වන අතර සමහර ප්‍රදේශවල මහජනයා සමුපකාරය කියන වචනය පවා දැන් අප්‍රිය කරන්න පටන්ගෙන තිබෙනවා. එසේ වී තිබෙන්නේ ඒ සමුපකාර කඩ සමිතිවල සිටින කළමනාකරුවන් කරන වැරදි නිසයි. සමහර විට ඇතැම් විවිධ සේවා සමුපකාර සමිතිවල කළමනාකරුවන් සමුපකාර කොමසාරිස්තුමාට තිබෙනවාටත් වඩා වැඩි බලයක් පාවිච්චි කරනවා ඔවුන් උපයන සල්ලිවල බලයෙන්. මැනේජර්කමට පත් වී අවුරුදු දෙකකින් කාර් පවා මිලට ගන්නා අය සිටින බව මොනරාගල ගරු මන්ත්‍රීතුමා (ඇල්බට් සිල්වා මයා.) කිව්වා. සමුපකාර කඩයකට මැනේජර් කෙනකු පත් කර ගන්නේ සුළු ඇපයක් ගෙන සුළු පඩියක ටයි. සුළු ඇපයක් තබා සුළු වැටුපකට මැනේජර් හැටියට සමුපකාර කඩයකට පත් වන ඇතැම් අය එසේ පත් වී මාස ගණනක් ගත වන විට එම සමිතියේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික පමණක් නොව සමාජිකයන් පවා තමන්ගේ පැත්තට හරවා ගැනීමේ ශක්තියක් ඇති කර ගන්නවා. බොහෝ විට ඒ සියලු දෙනා ගෙන්ම කෙරෙන්නට තිබෙන වැඩ පවා මැනේජර් තමන්ගේ අතටම භාරගෙන කරගෙන යන බව පෙනෙනවා. සමුපකාර කඩයකට මැනේජර් හැටියට පත් වූ තැනැත්තාගේ ආදායම් තත්වය ගැන සමුපකාර දෙපාර්තමේන්තුව පරීක්ෂා කාරී විය යුතුයි. මේ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය තදින්ම යොමු විය යුතු බව ප්‍රකාශ කරන්න කැමතියි. අද සමුපකාර කඩයක මැනේජර් වශයෙන් සුළු පඩියකට පත් වන පුද්ගලයා හෙට රුපියල් විසි තිස් දහක මුදල් වංචාවක් හෝ හොරකමක් සම්බන්ධයෙන් අහු වුණත්, අනිද්දා කොහොම හරි ආණ්ඩුවේ රක්ෂාවක් වුවත් ලබා ගන්නවා. එවැනි තත්ත්වයක් තිබීම කොහොමවත් හොඳ නැහැ. පුංචි කඩයක මැනේජර් හැටියට පත් වූ එක් පුද්ගලයෙක් රුපියල් පණහ බැගින් දී බ්‍රෝකර්ලා යවා මිනිසුන්ට තර්ජනය කර වී මිලට ගන්නවා. ඒ වී සඳහා ඔවුන් ගෙවන්නෙ බුසලකට රුපියල් හයක් නැත්නම් හතක් පමණයි. ඔය විධියට ගොඩ ගසා ගන්නා වී බුසලක් රුපියල් දොළහ බැගින් රජයට විකුණා විශාල මුදලක් හොයා ගන්නවා. මොහු මිනිසුන්ට තර්ජනයක් වී තිබෙනවා. මේ ව්‍යාපාරය සඳහා ඔහු තමන්ගේ නෑදෑයින් විශාල වශයෙන් යොදා ගෙන තිබෙනවා. අවුරුද්දක් යන විට මේ ක්‍රමයෙන් ඔහු විශාල මුදලක් හම්බ කර ගත්තා පමණක් නොව කාර් එකකුත් මිලට ගත්තා. ඔහුට ඒ ප්‍රදේශයේ විශාල බලයක් තිබෙනවා. සමුපකාර පරීක්ෂක නිලධාරියා පවා මේ මැනේජර්ට බයයි. ඔහුට විරුද්ධව කිසිම දෙයක් කරන්න ඔහු ඉදිරිපත් වන්නේ නැහැ. මේ විධියට වැඩ කරගෙන යන අය මැතිවරණයක් ආවාම එක්සත් ජාතික පක්ෂයේ ආයුධයක් බවට පත් වෙනවා.

මාතලේ නගරයේ තිබෙන සමුපකාර සමිති සංගමයේ මාර්ගයෙන් කෙරෙන නොයෙකුත් අකටයුතු සම්බන්ධයෙන් තමුන්නාන්සේ දන්නවා. එහි නිලධාරීන් පසුගිය මැතිවරණ දෙකේදීම මුළු මාතලේ දිස්ත්‍රික්කයේම තිබෙන සමුපකාර කඩවල මැනේජර්ලා එකතු කරගෙන දේශපාලන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පංති පවා පවත්වාගෙන ගියා. ඒ මගින් ඒ අයට මැතිවරණ කටයුතු සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දුන්නා. මේ විධියටයි ගම් වලට යන්න ඕනෑ, මේ විධියටයි සල්ලි දෙන්න ඕනෑ, මේ විධියටයි විරුද්ධ පක්ෂයේ අපේක්ෂකයාට පහර ගහන්න ඕනෑ, යනාදී වශයෙන් ඒ පංතිවලදී කියා දෙනවා. මේ සමුපකාර සමිති සංගමය සේවකයන් තෝරා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවන නමුත් පත්වීම් දීමේදී, යම් අයදුම්කරුවෙක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හිතවත්ය, නැත්නම් වාමාංශික අදහස් දරන්නෙක්ය, කියා දැනගන්න ලැබුණොත් ඔහුට පත්වීම් දෙන්නේ නැහැ. ඒ බව ගරු ඇමතිතුමා පවා දන්නවා ඇති.

මහජනයා ගසා කන කුට වෙළෙන්දන් ගෙන් පාරිභෝගිකයන් බේරාගෙන ඒ අයට සහනයක් ලබා දීම පිණිස ගරු ඇමතිතුමා කරවල බෙදා දීම සමුපකාර තොග වෙළඳ ආයතනයට භාර දුන් නමුත් මෙවැනි අය නිසා ඒ පරමාර්ථය ඉටු කර ගන්න බැරි වී තිබෙනවා. ඒ නිසා ඔවුන්ගෙන් ඇති වන දූෂණ වළක්වන්න වැඩ පිළිවෙලක් ඇති කරන්න ඕනෑ. සමුපකාර පරීක්ෂකවරුන්ට දැනට තිබෙනවාට වඩා බලතල තිබෙන්න ඕනෑ. පරීක්ෂක මහතුන්ගේ ඇස් ඉදිරිපිටම දූෂණ ක්‍රියා සිදු වෙතත් ඒවා සම්බන්ධයෙන් හරියාකාර ක්‍රියා කරන්න ඒ අයට පුළුවන්කමක් නැත්නම් මේ සේවය හරියාකාර ඉටු කරන්න අමාරුයි. සමහර විට සමුපකාර පරීක්ෂක මහත්මයාගේ ඇස් ඉදිරිපිටම මැනේජර් සමුපකාර කඩේ බඩු මුට්ටු තොග පිටින් පිට අයට දී පිටත් කරන තැන් තිබෙන නමුත් ඒවා දකින පරීක්ෂකයාට කරන්න පුළුවන් වන්නේ ඒ ගැන පොලීසියට දැනුම් දීම පමණයි. පොලීසියෙන් ඒ ගැන පරීක්ෂා කළාම සෑහෙන තරම් සාක්ෂි නැති නිසා කිසිවක් කරන්න බැරිය කියනවා. තමන්ගේ රාජකාරි අවංක ලෙස කිරීමට ඉදිරිපත් වන සමුපකාර පරීක්ෂකවරයාට ඒ ප්‍රදේශයේ ජීවත් වන්නට සිදු වන්නේ නොයෙක් තාඩන පීඩන මධ්‍යයේයි. මාතලේ සමුපකාර සමිති සංගමයට සම්බන්ධ බොහෝ දෙනා ධනපතියන් වී සිටින නිසා ඒ අයට ඒ ප්‍රදේශයේ විශාල බලයක් තිබෙනවා. සමහර අය ආණ්ඩුවේ රක්ෂාවල් කරන අතර විශාල වෙළෙඳ ව්‍යාපාරත් කරගෙන යනවා. මේ අයට සම්බන්ධකම් තිබෙන උසස් නිලධාරීන් සමුපකාර දෙපාර්තමේන්තුවේ ඉන්න නිසා අවංක සේවයක් කරන්න උත්සාහ කරන සමුපකාර පරීක්ෂකවරයාට නොයෙක් හිංසා පීඩා, තාඩන පීඩනවලට ගොදුරු වන්න සිදු වෙනවා. ඒ නිසා එවැනි දූෂ්කරතා මධ්‍යයේ ජීවත් වන පරීක්ෂකවරුන් ගෙන් අවංක සේවයක් අපට බලාපොරොත්තු වෙන්නත් අමාරුයි. සමුපකාර සංගම්වල කෙරෙන නොයෙක් දූෂණ ක්‍රියා ආදිය සම්බන්ධයෙන් මට පෙත්සම් ලැබී තිබෙන නමුත් ඒවා දෙපාර්තමේන්තුවට පවා ඉදිරිපත් කරන්න මා කැමති නැහැ. ඒ පෙත්සම්වල ඒ අය තමන්ට රාජකාරි කරන්ට බැරි වී තිබෙන පිළිවෙළ විග්‍රහ කර තිබෙනවා.

මහනුවර නගරයේ එක්තරා සිද්ධියක් ගැන මම දන්නවා. ඒ සමුපකාර පරීක්ෂක මහත්මයා භයේ ඉන්නවා, ඔහුට බින්තැන්නට යන්න සිදු වේය කියා. එම නිසා සමුපකාර පරීක්ෂක මහත්වරුන්ට, සමුපකාර නිලධාරීන්ට, වැඩි බලයක් දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගසා කෑමට සමුපකාර මැනේජර්වරුන්ට ඇති බලය මොන විධියකින් හෝ නැති කරන්ට ඕනෑ. ගසා කා අසු වුනොත් මේ රටේ තව තැනක හොඳ මුහුණුවරකින් පෙනී සිටීමට පුළුවන් තත්ත්වය නැති කරන්ට ඕනෑ. ඒ අය ආණ්ඩුවේ සේවකයන් බවට පත් කර තැනින් තැනට මාරු කර නවා නම් හොඳයි. රුපියල් 100 යේ පඩියට ගොස් 6 මාසයක් ඇතුළතදී රුපියල් 17,000 ක හොර කමක් කළ එක මැනේජර් කෙනකු ගැන මම දන්නවා. ඒ පිළිවෙළට ගසා කෑම සිදු වෙනවා නම් මේ රට සංවර්ධනය කරන්න බැහැ. එම නිසා ඒ ගසා කන්නවුන් සම්බන්ධයෙන් දැනට කරන අන්දමට තදින් ක්‍රියා කිරීමට ගරු ඇමතිතුමාට දේව වරම ලැබේවායි මම ප්‍රාර්ථනා කරනවා. අද පත්‍රයේ තිබුණු එක්තරා වාර්තාවක් දැක මම සන්තෝෂ වුණා.

පාලන මිලට ආහාර ද්‍රව්‍ය විකුණන්නවාද යන්න ඉතාමත් වැරදි පිළිවෙළට පරීක්ෂා කරන නිලධාරීන් සිටිනවා. එක පුද්ගලයකුගේ නමක් සඳහන් කරමින් චෝදනා කරන්න මම කැමති නැහැ. සුරාබදු දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරු තමන් යටතේ වැඩ කරන ගාඩ්වරුන්ට මාසයකට වරක් ගම වටේ යවනවා, ලැයිස්තුවක් දී පුංචි බණ්ඩාගෙන් රුපියල් 50 යි, සියාතුගෙන් රුපියල් 120 යි, අහවලාගෙන් මෙච්චරයි, කියා. ඒ ගාඩ්වරු ගිහින් රා බෝතල දෙක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුණසිංහ මයා.]

තුනකුත් බිලා ඒ ගාස්තුව අරගෙන එනවා. ගාස්තුව සියල්ලන්ම බෙදා ගන්නවා. එසේම කොන්ට්‍රෝල් මිලට බඩු විකිණීම කෙරෙනවාද, නැද්ද, යන්න පරීක්ෂා කිරීමට පත් කරනු ලැබ සිටින නිලධාරීන් ගෙනුත් දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වන සේවාව, මේ රටේ ජනතාව බලාපොරොත්තු වන සේවාව, සියයට සියයක් සිදු නොවන නිසා අප්‍රමාදවම මේ අය ගැන තදින් ක්‍රියා කරන ලෙස මේ රටේ දුප්පත් වැසියන්ගේ නාමයෙන් මම ඉල්ලා සිටිනවා. දුප්පත් ජනතාවට අද කිසිම දෙයක් ගන්න බැහැ. වෙළෙන්දෝ රංචු කෙළියට, තමන්ට ඕනෑ පිළිවෙළට, විශේෂයෙන් පුංචි නගරවල වෙළඳාම කරනවා. ඒ අයට කිසිම කෙනකු ගැන භයක් නැහැ; පීඩාවක් නැහැ. කිසිම කෙනකු ගැන ඒ අයට සැකයක් නැහැ. ඒ අය ගැන බැලීමට පොලීසිය එන්නේත් නැහැ. වෙන නිලධාරියකු එන්නේත් නැහැ. මේ වෙළෙන්දන් අතේ සම්පූර්ණ බලය තිබෙනවා.

පත්වීම් ගැන කියන විට තව එක ලක්ෂණ කාරණයක් මතක් කරන්න කැමතියි. ඒ තාවුස් කොම්පැනියේ සිද්ධිය ගැනයි. තාවුස් කොම්පැනියේ අධ්‍යක්ෂ හැටියට පත් වුණේ ගාමිණී ගුණවර්ධන මහත්මයායි. ඒ ගාමිණී ගුණවර්ධන මහත්මයා කව්ද කියා සොයා බලන ලෙස මම ඉල්ලා සිටිනවා. ඒ මහත්මයා ඉන්න කාලයේ බෝට්ටු ටෙන්ඩර් සම්පූර්ණයෙන්ම භාර දුන්නා ඒ අයට. ඒ කාලයේ ධීවර කටයුතු පිළිබඳ ඇමති වශයෙන් වැඩ කළේ විලියම් සිල්වා මහත්මයායි. ආහාර ඇමති වශයෙන් වැඩ කළේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමායි. (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) යට ගියාව පිළිබඳ නොයෙක් දේවල් ගෙන හැර පාමින් අපට කථා කරන්න පුළුවන්. එක්සත් ජාතික පක්ෂයේ අය සුදනන් වගේ කථා කරනවා. එක්සත් ජාතික පක්ෂය අවුරුදු 9 ක කාලයක් තිස්සේ කළ පත්වීම්වලින් සියයට 90 ක්ම වැරදි සහගත පත්වීම්. අද ඒ අය කියනවා, ඉලංගරත්න ඇමතිතුමා කරන පත්වීම් නරක පත් කිරීම්ය කියා. විරුද්ධ පාර්ශ්වයේ නායක ඩඩ්ලි සේනානායක මහත්මයා සමඟ සටන් කළ පලියට දේශප්‍රිය සේනානායක මහත්මයා මේ රටේ කිසිම වැඩක් කිරීමට නුසුදුසු පුද්ගලයෙක්ද කියා මම අහනවා. ඒ ඒ අයගේ සුදුසුකම් දක්ෂ කම් මනින අතර ඇත්ත වශයෙන්ම අපි මේ ගරු සභාවේ භය නැතිව ප්‍රකාශ කරනවා. ආණ්ඩුවේ වග කිය යුතු පත්වීමක් දෙන්නේ මේ ආණ්ඩුවට පක්ෂපාතිත්වයක් දක්වන පුද්ගලයන්ටය කියා.

තවත් ඉතාම වැදගත් කාරණයක් මතක් කරන්ට තිබෙනවා. සමුපකාර දෙපාර්තමේන්තුවත් ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවත් යන දෙපාර්තමේන්තු දෙකක වැඩ කටයුතු නිසා අද දුප්පත් ගොවීන්ට තමන්ගේ වී ටික නියම මිලට විකුණා ගන්ට බැරි වී තිබෙනවා. සමුපකාර සමිතිවලට වී ගන්ට බලය තිබෙනවා; එහි තවත් කොටසක බලයක් තියෙන්නේ ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවටයි. මේ ගැන හැම දාම මොන තරම් කරුණු ඉදිරිපත් කළත්, මා ඉතා තදින් කියනවා, මේ පිළිබඳව තවමත් කිසිම වෙනසක් සිදු වී නැති බව. ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව යටතේත් සමුපකාර දෙපාර්තමේන්තුව යටතේත් ඇති මේ වැඩේ හරියාකාර ඉටු නොවන නිසා කවදාවත් ගොවීන්ට තමන්ගේ වී බුසල රුපියල් 12 ට විකුණාගන්න ලැබෙන්නේ නැහැ. මේ තත්ත්වය හරිගැස්වීම සඳහා බ්‍රෝකර්ලාට වී මිලට ගන්න දැනට ඇති අවස්ථාව නැති කළ යුතුයි. පෞද්ගලික වෙළඳුන්ට වී මිලට ගැනීමටත්, වී තබා ගැනීමටත්, වී ගෙන යාමටත් දැනට ඇති ඉඩකඩ නීතියෙන් නැති කළ යුතු බව මම ගරු ඇමතිතුමාට ප්‍රකාශ කරන්න කැමතියි. මාතලේ මුත්තලාගු නමැති පෙරකදෝරුවෙක් ඉන්නවා. ඔහුගේ නැගණියයි වී වෙළඳාම කරන්නෙ. වී මූවිට දහස් ගණන් එකතු කරගෙන ඉන්නවා. අද වී වෙළඳාම ඉතාම ලාබ උපදවන වැඩක් වෙලයි තියෙන්නෙ. ඒ නිසා සෑම අතින්ම ඇනෙන්නෙ ගොවියාටයි. ගොවියා සදාකාලිකවම ණයයි. බලාපොරොත්තුව තිබෙන විධියට කුඹුරු පොහොර කරන්න ගොවියාට බැරි වෙනවා. ඔහුට කවදාවත් ණය බරින් නිදහස් වෙන්න බැහැ. සමුපකාර දෙපාර්තමේන්තුව මේ අඩුපාඩු සම්පූර්ණ කරන්න ඕනෑ. එහෙම නැතිනම් මේ ඔක්කෝම කරන්න ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට භාර දෙන්න ඕනෑ. මේ වැදගත් කාරණය වෙනුවෙන් සම්පූර්ණ අවධානය යොමු විය යුතුයි.

අ. භා. 3

කරවල වෙළඳාමෙන් යූ.එන්.පී. එක නැගී සිටියා. කරවල වෙළඳාමෙන් පමණක් කොවෙයි සෑම වෙළඳ බඩුවකින්ම වාගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යූ. එන්. පී. එක නැගී සිටියා. ඔවුන් මේ නලියන්නෙ වෙළෙන්දාගෙන් එන සල්ලි වලිනුයි. විශේෂයෙන් උඩරට වැනි ප්‍රදෙශ වල ජීවත්වන සුළු, දුප්පත් අයට තමන් ගේ ගම්මිරිස් මලු දෙක තුන, පුවක් ගෙඩිය, කොකෝ ඇට ටික සහ කොට්ට ගෙඩිය එදිනෙදා රටේ පවතින නියම මිලට විකුණා ගන්න අවස්ථාවක් නැහැ. ඒවාට මැදි වී ඉන්නෙ මේ රටේ වෙළෙන්දන් නොවෙයි, ඉන්දියානු වෙළෙන්දනුයි. කරවල වෙළඳාම ගෙනිච්චෙත් ඉන්දියන් කාරයෝ. මේ ඉන්දියානු වෙළෙන්දන් ගම්බද ජනතාව මැදින් ඉදගෙන විශාල අන්දමේ ලාබ ලබාගෙන ඒවායින් කොට සක් එක්සත් ජාතික පක්ෂයට දෙනවා. එසේ දෙනවා විතරක් නොවෙයි මැතිවරණ වලදී තමන් සිටින නගරවල ඡන්ද ව්‍යාපාරත් ගෙන යනවා. මෙරට ස්වදේශික යන්ට මැතිවරණවලදී ක්‍රියා කිරීමට ලැබී ඇති බලතල සියල්ලක්ම ඒ අයත් භුක්ති විඳිනවා. ඡන්දය දීම විතරයි නොකරන්නෙ. ඔවුන්ගේ කටහඬට ගම්වල වසන ජනතාව යටපත් වෙනවා. ඉන්දියානු වෙළෙන්දන් අපේ ගම්වලට ගොස් ගම් මුන් නිපදවන ද්‍රව්‍ය මිලට ගැනීමට කට යුතු යොදාගෙන තිබෙන නිසා සමුපකාර තොග වෙළඳ ආයතනය මගින් ඒ සම්බන්ධව ක්‍රියා කරන්න ඕනෑ. මේ බඩු මිලට ගන්න පුළුවන් සමුපකාර වෙළඳ ආයතන සෑම නගරයකම ඇති කරන්න ඕනෑ. ඒ වැනි ආයතන තොග වෙළඳ ආයතන ශාඛාවට යාබදව ඇති කරන ලෙස මා මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, මේ රටේ දැනට සිටින නානා විධියේ විවේචකයන් කොයි කොයි විධියට තේරුම් ගත්තත් නොගත්තත් අද රටේ විශාල වෙළඳ විප්ලවයක් සිදු වේගෙන එන බව කියන්න ඕනෑ. මේ තුවක් මේ රට සූරා කෑ පිරිස මේ රටින් අතුගා දැමීම සඳහා වෙළඳ ඇමතිතුමා තදින් ක්‍රියා කරගෙන යනවා. නොයෙකුත් උපක්‍රමවලින් රට සූරා කෑමට ක්‍රියා කරන, මහජනතාව අමාරුවේ හෙළන පිරිසගෙන් ඉදිරි කාලය තුළදී මේ රටේ ජනතාව බේරා ගැනීමට එතුමා ක්‍රියා කරනවා. ඇතැම් අංශවල වෙළඳාම් පිළිබඳව කියන්න කැමතියි. මා කියන්නම් පයිලට් පෑන් වෙළඳාම ගැන අද පයිලට් පෑනක් රුපියල් හතට අටට තරම විකිණෙනවා. මගේ දැනුමේ හැටියට කියන්න තියෙන්නෙ මේ පයිලට් පෑන් මෙරටට ගෙන්වීමේ බලය දී තිබෙන්නෙ එකම මිනිහාට බවයි. මේ පෑනක් ලංකාවට එන විට එහි වටිනාකම රුපියල් තුනකුත් ශත ගණනකට වඩා වන්නෙ නැහැ. දරුවන් සය දෙනකු සිටින පවුලක පියකු අඩු වශයෙන් පෑන් හතරක් පහක් වත් අරගන්න ඕනෑ. අද මාර්කට් එකේ මේ පෑනක් විකිණෙන්නෙ රුපියල් හතට වැඩියෙනුයි. සෑම වෙළඳ ද්‍රව්‍යයකම තත්ත්වය මේකයි.

අපේ රටේ ධනය ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යෙදීමට නම් ඒ ධනය සූරා කන්නන් අතට යන්න ඉඩ නොලැබෙන ආකාරයට මේ සෑම එකක් ගැනම සොයා බලා කටයුතු කරන්න ඕනෑ. එම නිසා ඒ වෙනුවෙන් ගතවුණු වර්ෂයේදී කරන ලද වැඩ කටයුතුවලදී මෙන්ම ඉදිරි අවුරුදු හතරේදී කරන කටයුතුවලදීත් ඒවා හොඳින් කරන්නට පුළුවන්කම ලැබෙනවාක් මෙන්ම කළ වැඩ වලට වඩා දහසක් වැඩ ඉදිරි කාලයේදී කරන්නට තමුන්නාන්සේට පුළුවන්කම ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මේ කථාවට ඉඩ ලබා දීම ගැන ගරු සභාවටද ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ටී. ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා. (මීගමුව)
(திரு. ரீ. குவெண்டின் பெர்ணாண்டோ—நீர் கொழும்பு)
(Mr. T. Quentin Fernando—Negombo)

Mr. Chairman, the Hon. Minister of Commerce, Trade, Food and Shipping has by legislation taken over the business of dried fish, but he is still in the hands of the middlemen. The importers of dried fish are still there and the Government has to be satisfied with the purchase of dried fish from those importers. I understand now, that action is being taken to import dried fish direct from the exporting countries. I do not know when this would materialize, but until that is done there will definitely be a shortage of this commodity in Ceylon.

The Hon. Minister seems to be of a different view that there is sufficient dried fish to meet the demands of the people, but I say that it is not so. If you go to your co-operative society you will find queues; numbers of people stand there from

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා.]

morning till afternoon to purchase a little dried fish ; sometimes they return home without any dried fish. The scarcity is there, and although the Government view is that there is sufficient dried fish, it is not so.

With regard to this matter, there is the possibility of encouraging the local people to produce as much fish as possible. For that purpose I would like to remind the Hon. Minister that he should encourage the people to purchase mechanized boats. As far as I can see, the Department of Fisheries is not paying sufficient attention in this direction. There are people who are anxious to purchase mechanized boats but they are being denied that opportunity. I could see that in my own electorate, in the Negombo town—

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Is the hon. Member for Negombo speaking on the fishing industry ?

ක්වෙන්ටින් ප්‍රනාන්දු මයා.
(திரு. குவெண்டின் பெர்ணாண்டோ)
(Mr. Quentin Fernando)

I am speaking on the dried fish trade, on the improvement of that industry, so that the Hon. Minister can get more dried fish. I am only drawing his attention to the necessity for the Fisheries Department to improve that industry for the purpose of making more and more dried fish in this island.

I understand from the morning papers that the Marketing Department has launched a scheme to eliminate the middlemen. I know, and I have made reference on many an occasion on the Floor of this House, that, with regard to the purchase of locally grown vegetables it is the middleman who approaches the villager. He buys the vegetables and sells at a profitable price. But as I have pointed out, if the Marketing Department took the initiative to buy direct from the producer in the village, the price that the customer would have to pay will be much less.

On the egg trade I would like to say a few words. We all know that an enormous amount of money is being sent out to India. What has the Government done to improve the egg trade in Ceylon ? They preach that everybody must take to poultry farming, but do you know that unless the price of poultry food is reduced, it is not possible for a poor man to run a poultry farm ? It is true that a one-day old chick could be purchased for 60 cents, but if a man has a hundred chicks, what would be the cost of bringing them up ? It costs Re. 1 per month per chick. Can an average man afford to spend Rs. 100 a month for 100 chicks ? I say it is impossible. I know this because I have tried it. From my own experience I say that it costs Re. 1 per chick per month. One has to buy the poultry food ; one has to possess all the medicines to cure the various ailments in the course of the life of the chick. How can a poor man afford to do that ? So, I would ask the department to see that they have a sort of control on the price of poultry food. If that is done I am certain that even a poor family could afford to run a poultry farm.

With regard to the coconut trade, we all know that there is export of coconut from Ceylon but no rehabilitation scheme has been provided for this industry. There is no vote at all in the Budget for such a scheme. The coconut planter is only given a subsidy for the purchase of manure. That subsidy is nothing very much. For lands over 20 acres in extent, the subsidy allowed is two-thirds the price of manure ; for lands under 20 acres in extent, it is half the price of manure. But, as we all know, there should be continuous cultivation of coconut land if you want more produce. One method of cultivation is to use the harrow. It costs Rs. 25 to Rs. 30 to harrow one acre of land. The Government should therefore come to the rescue of the coconut planter by giving him a subsidy or purchasing harrows and lending them free so that the lands may be cultivated. We know that in the case of the peasants, they are given lands and fields free, houses are put up for them free, utensils are brought for

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

them free. They are provided with everything necessary to cultivate their fields. Unless and until coconut lands are cultivated, you cannot get more produce. I would therefore suggest that some relief be granted to the coconut planter to cultivate his land.

එස්. ඩී. බණ්ඩාරනායක මයා. (ගම්පහ)
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ)
(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු සභාපතිතුමනි, වෙළඳ අමාත්‍යාංශය යටතේ වචන සවලපයක් කථා කිරීමට මා ද අදහස් කරනවා. මෙම විවාදයට සහභාගි වුණ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) සහ යටියන්තොට ගරු මන්ත්‍රීවරයා (ආචාර්‍ය්‍ය එන්. එම්. පෙරේරා) ආහාර අමාත්‍යාංශය වෙත අල්ලස් ආදී චෝදනා සම්බන්ධයෙන් බරපතළ අන්දමේ චෝදනා ඉදිරිපත් කළා. සමාජවාදී වැඩ පිළිවෙළක් අනුව රටක පාලනය ගෙන යන විට අල්ලස් ආදී දූෂණ කටයුතු ඇති වෙන්නට පටන් ගත්තොත් ඒ සමාජවාදී වැඩ පිළිවෙළ හරියාකාර ගෙන යන්න බැරිවේය කියා යටියන්තොට මන්ත්‍රීවරයා කීවා. මෙම ගරු මන්ත්‍රීවරයා ප්‍රකාශ කළ අදහස අප සම්පූර්ණයෙන්ම පිළිගන්නවා. විශෙෂයෙන් ආහාර හා වෙළඳ ඇමතිතුමා සමාජවාදී ප්‍රතිපත්ති අනුව පැහැදිලි ක්‍රියා මාගීයක් ගෙන යන බව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පමණක් නොව අද මුළු රටේම වැඩ කරන ජනතාව පිළිගත් දෙයක් හැටියට මට කියන්නට පුළුවන්.

ගරු සභාපතිතුමනි, මේ රටේ 1956 වන වර්ෂය දක්වා බලයේ සිටි එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව මේ රටේ වෙළඳ හෙළඳාම් සම්බන්ධයෙන් අනුගමනය කළේ මොන විධියේ ක්‍රියා මාගීයක්ද කියා මුළු මහත් ජනතාවම පැහැදිලි ලෙස දන්නවා. විදේශීය වෙළඳුන්ට පමණක් නොව, තාවකාලික බලපත්‍ර ලබා දුන් ඉන්දියානු වෙළෙන්දුන්ට සහ මේ රටේ ධනපති වෙළඳුන්වද තමතමන්ට වුවමනා හැටියට මහජනයාව සූරා කෑමට ඉඩදීමේ ප්‍රතිපත්තියකටයි එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව ඒ කාලයේ පුරුදු වී සිටියේ. මේ පිරිස මේ අන්දමට ආරක්ෂා කළ එක්සත් ජාතික පක්ෂය මැතිවරණය කාලයේදී මොවුන්ගෙන් රුපියල් දශ ලක්ෂ

පහළොස් ලක්ෂ ආදී වශයෙන් විශාල මුදල් සම්භාරයන් අරගෙන තම පක්ෂයේ මැතිවරණ වැඩවලට යෙදූ බව සෑම දෙනාම පාහේ හොඳින් දන්නා කාරණයක්.

අ. භා. 3.15

එනමුත් 1956 න් පසුව, දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමාගේ ආණ්ඩුව පිහිටුවීමෙන් පසුව, අද අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා වශයෙන් මේ ගරු සභාවේ පෙනී සිටින මන්ත්‍රීතුමා එම කැබිනට් මණ්ඩලයේ ආහාර ඇමති ධුරය භාරගෙන අවුරුදු 3 ක කාලයක් මුළුල්ලේ එය දියුණු කිරීමට විශාල වැඩ පිළිවෙළක් ගෙන ගිය බව අප දන්නවා. එම අමාත්‍යාංශය යටතේ ගෙන ගිය යම් යම් වැඩ පිළිවෙලවලට විරුද්ධව එදා එම ඇමති මඩුල්ලේ සිටි ඇමතිවරුන් තුන් දෙනෙක්—මුදල් ඇමති ධුරය ඉසුලූ ස්ටැන්ලි ද සොයිසා මහතා, සහ සෞඛ්‍ය ඇමති ධුරය ඉසුලූ විජයවර්ධන මැතිණියත්, වෙළඳ අමාත්‍යාංශය භාරව සිටි ආර්. ජී. සේනානායක මහතාත්, යන මේ ඇමතිවරුන් තුන්දෙනා—යම් ක්‍රියා මාගීයක් ආරම්භ කළ නිසා ඒ තිදෙනාම ආණ්ඩුවෙන් අස් කර දමන්නටය කියා 1957 දී මා යෝජනාවක් ඉදිරිපත් කළ බව තමුන්නාන්සේට මතක ඇතැයි මා හිතනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ පක්ෂයත් සම්බන්ධ වී සාදාගත් මහජන එක්සත් පෙරමුණ ආණ්ඩුව තිබූ කාලයේදීයි මෙය සිදුවුණේ. මේ රටේ ප්‍රගතිශීලි ක්‍රියා මාගීයට විරුද්ධව, සමාජවාදී වැඩ පිළිවෙළට විරුද්ධව, ඒ ඇමතිවරුන් තුන්පොළ එදා ක්‍රියා කළා. එමෙන්ම අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා කුමන ක්‍රියා මාගීයක් එදා ගෙන ගියාද කියා අප හොඳින් දන්නවා. එදා එතුමාගේ පෞද්ගලික ලේකම් වශයෙන් කටයුතු කළේ එතුමාගේ පක්ෂයේ කෙනෙකු වන ජී. වී. එස්. ද සිල්වා මහතායි. ඒ මහතා ඉතා දක්ෂ ලෙස කටයුතු කළ හැකි කෙනෙකු නිසා ගරු ආහාර ඇමතිතුමා තෙල් සංයුක්ත මණ්ඩලයේ වගකිව යුතු තනතුරකට ඒ මහතා පත් කළා. ඒ මහතා ප්‍රගතිශීලි අදහස් දරන කාර්යශූර මහතෙකු බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්ට ඕනෑ. එමෙන්ම අර්ථ ශාස්ත්‍රය ගැන විශෙෂඥයකු වූ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතා අද ආහාර අමාත්‍යාංශය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

යටතේ උසස් තැනක් දරා කටයුතු කර ගෙන යනවා. එම නිසා අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා, ගරු ආහාර ඇමතිතුමාට විරුද්ධව මේ ආකාරයෙන් චෝදනා ඉදිරිපත් කිරීම වැරදි හැටියට පිළිගන්නවාදැයි මම දන්නේ නැහැ. මගේ කල්පනාවේ හැටියට ඒ ආකාරයෙන් චෝදනා ඉදිරිපත් කිරීම නම් කිසිසේත් සාධාරණ නැහැ.

ගරු සභාපතිතුමනි, අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා 1956 සිට 1959 දක්වා කාල සීමා තුළදී ඉතාමත් දක්ෂ අන්දමින් වැඩ කළ ඇමතිවරයකු හැටියට අප පිළිගන්නවා. එතුමාගේ කාලයේදී ඉදිරිපත් කළ කුඹුරු පණතේ තිබුණු යම් යම් අඩුපාඩු කම් නිසා ගොවීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම පිණිස මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයට නැවත වරක් කුඹුරු පණත සංශෝධනය කොට ඉදිරිපත් කරන්න සිදු වුණා.

ගරු සභාපතිතුමනි, අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා ආහාර ඇමතිවරයා වශයෙන් කටයුතු කරන කාලයේදී—1959 අවුරුද්දේදී—මයිසූර් පරිප්පු ජාවාරමක් ආහාර අමාත්‍යාංශය තුළ සිදු වුණායයි යටියන්තොට ගරු මන්ත්‍රීවරයා (ආචාර්ය එන්. එම්. පෙරේරා) දැන් ප්‍රකාශ කළා. කෙසේ හෝ වේවා, අපේ ගරු ආහාර ඇමතිතුමාට එතුමාගේ අමාත්‍යාංශය යටතේ සේවය කරන උසස් නිලධාරීන් හතලිස් දෙදෙනෙකුගේ වැඩ නතර කිරීමට සිදු වී තිබෙන බව මතක් කරන්න සතුටුයි. දැන් ආහාර ඇමතිතුමා විසින් ඒ නිලධාරීන්ගේ ක්‍රියාකලාපය ගැන පරීක්ෂණයක් පවත්වාගෙන යන බවද කියන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, එදා අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයාට අවුරුදු ගණනාවක් තිස්සේ කරන්න බැරි වුණු දේවල් අපේ ගරු ආහාර ඇමතිතුමා කර ගෙන යන බව එතුමා පිළිගන්නවා ඇති. එපමණක් නොවෙයි, පසුගිය මාස කීපය තුළ ප්‍රගතිශීලි පණත් ගණනාවක් මේ රජයෙන් ඉදිරිපත් කර තිබෙනවා. තෙල් සංයුක්ත මණ්ඩලය හෝ වේවා, මහජන බැංකුව හෝ වේවා, ඉන්ෂුවරන්ස් සංයුක්ත මණ්ඩලය හෝ වේවා, එසේ නැත්නම් නැව් සංයුක්ත මණ්ඩලය හෝ වේවා, මේ සෑම මණ්ඩලයක්ම පත් කර තිබෙන්නේ, මේ සෑම වැඩ පිළිවෙළක්ම ඉදිරිපත් කර තිබෙන්නේ, ගරු ආහාර ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් බව මේ අවස්ථාවේදී ඉතා සන්තෝෂයෙන් මතක් කර සිටිනවා. ඒ අන්දමට ගරු ආහාර ඇමතිතුමා කටයුතු කර තිබෙනවා. මට මතකයි සී. ඩබ්ලිව්. ඊ. එකට විරුද්ධව ඊයේ පෙරේදා කොළඹින්ම චෝදනා රාශියක් පැනනැගුණු බව. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාට මම මතක් කරන්න කැමතියි, සී. ඩබ්ලිව්. ඊ. එකේ නිලධාරීන්ටත් ආහාර ඇමතිතුමාටත් වුවමනා කළා නම් මේ පසු ගිය දින කීපය ඇතුළත කෝටිපතියන් වන්ට ඉඩ තිබුණ බව. ඒ මක් නිසාද? මෙපමණ කාලයක් තිස්සේ තෙල් ජාවාරම ගෙන ගිය ඇමෙරිකානුන් ගෙන් සහ එංගලන්තවාසීන්ගෙන් අල්ලස් ගත්තා නම් ඇමතිතුමාටත් තෙල් සංයුක්ත මණ්ඩලයේ නිලධාරීන්ටත් කෝටිපතියන් වෙන්න තිබුණා. ඒ වාගේම අනෙක් සංයුක්ත මණ්ඩලවල නිලධාරීන්ටත් පොහොසත් වෙන්න ඉඩ තිබුණා. එදා දවසේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ වී මේ පැත්තේ ඉඳගෙන ප්‍රගතිශීලි ක්‍රියා මාර්ගයක් ගෙන ගිය බව අපි පිළිගන්නවා. නමුත් තමුන්නාන්සේ දන්නවා. යම් කිසි බල ප්‍රමාණයකින් වැඩ කරන්න පුළුවන් යම්කිසි යන්ත්‍රයක් තිබෙනවා නම් ඒ ප්‍රමාණයට වැඩි බලයකින් එයින් වැඩ ගන්න පුළුවන්කමක් නැති බව. අපි හිතමු, අශ්ව බල 14ක යන්ත්‍රයක් තිබෙනවාය කියා. ඒ යන්ත්‍රයෙන් අශ්ව බල 20ක වැඩ ගැනීමට ගියොත් ඒ යන්ත්‍රය ඊට ඔරොත්තු දෙන්නේ නැහැ. අතර මග කඩා වැටෙනවා. එම නිසා එදා අවිස්සාවේල්ලේ මන්ත්‍රීතුමාට තිබුණේ ගමන් කළ හැකි වූ ප්‍රමාණය අනුව ක්‍රියා මාර්ගයක් ගැනීමයි.

අවිස්සාවේල්ලේ මන්ත්‍රීතුමා 1956 සිටි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සමග අත්වැල් බැඳ ගෙන, අපේ ආහාර ඇමතිතුමා සහ අනෙක් ඇමතිවරුන් සමග අත්වැල් බැඳ ගෙන රට ජාතිය වෙනුවෙන් ප්‍රගතිශීලි ව්‍යාපාරයක් ගෙන ගිය බව අපි පිළිගන්නවා. එදා එතුමා මේ පැත්තේ ඉඳ ගෙන ඇමතිකම් කරන අවස්ථාවේදී එතුමාට විරුද්ධ විශාල චෝදනා එල්ල වී තිබුණේ නැද්ද කියා මම එතුමාගෙන් අහනවා. විශාල ලෙස චෝදනා තිබුණා. මේ ගරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාවටත් රටටත් මම කියන්න කැමතියි, ගරු අවිස්සාවේල්ලේ මන්ත්‍රීතුමා අනෙක් මන්ත්‍රීවරු වාගේම දුප්පත් කෙනකු වුවත් අල්ලස් ගැනීමේ කටයුතුවල යෙදුනේ නැති බව. ඒත් එදා දවසේ එතුමාට විරුද්ධව නොයෙකුත් අල්ලස් චෝදනා තිබුණා. අහවල් අහවල් අන්දමට අහවල් බෝරකාරයින්ගෙන් අල්ලස් ගත්තාය කියා චෝදනා ඉදිරිපත් වුණා. ඒ වාගේම අදත් අපේ ආහාර ඇමතිතුමාටත් යම් යම් චෝදනා තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ සිටින මැති ඇමතිවරුන්ගෙන් ආහාර ඇමතිවරයා පමණ දුප්පත් කෙනෙක් අද දවසේ නැහැ. ඒ නිසා තමයි, උන්නැහේට අර 208 බී වගන්තිය අනුව ආණ්ඩුවේ සේවයෙන් අස් කිරීම නිසා ලැබිය යුතු වේතනය දෙන්නය කියා අපි සටන් කරන්නේ. ඒ අනුව කල්පනා කරන විට අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා අපේ ගරු ආහාර ඇමතිතුමාට ඔය ආකාරයට චෝදනා කිරීම නුසුදුසුය කියා මම කල්පනා කරනවා.

ඒ එක්කම එතුමා සඳහන් කළා, පැරදුණු මන්ත්‍රීවරු නොයෙක් නොයෙක් මණ්ඩලවලට දමා ගෙන සිටිනවාය කියා. අපි බලමු, ගරු සභාපතිතුමනි, ටී. බී. සුබසිංහ මහත්මයා ගැන. අද ලංකාව ගැන පමණක් නොව, ජාත්‍යන්තර වශයෙන් කල්පනා කළත්, දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ විදේශ ප්‍රතිපත්ති සුදුසු ලෙස ක්‍රියාවේ යෙදීමට, සුබසිංහ මහතා තරම් දක්ෂ කෙනකු ඇතැයි කියා මම හිතන්නේ නැහැ. නමුත් ඒ මහතා මැතිවරණයෙන් පැරදුණාය කියා ඒ මහතාගෙන් ගැනීමට තිබෙන ඉමහත් ප්‍රයෝජනය ගැන සළකන්නේ නැතුව සිටින්න පුළුවන්ද? ඒ මහතා තානාපතිවරයකු වශයෙන් රුසියාවට යවා තිබෙනවා. එම නිසා සුබසිංහ මහතා හෝ වේවා, රත්න දේශප්‍රිය සේනානායක මහතා හෝ වේවා, නුවර පදිංචි නව රත්න මහතා හෝ වේවා, ඒ සෑම මහත්මයෙක්ම රට ජාතිය ආගම වෙනුවෙන් අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා වාගේම දුප්පත් ජනතාව අතර ජීවිත පරිත්‍යාගයෙන් යුක්තව සටන් කළ උදවිය බව මම එතුමාට මතක් කරන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, මෙම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන තිබෙනවා, පැරදුණු මන්ත්‍රීවරු සෙනෙට් සභාවට පත් නොකළ යුතුය කියා. මම හිතනවා, එය පැහැදිලි ප්‍රතිපත්තියක්ය කියා. මැතිවරණයේදී තරඟ කොට පැරදුණු අපේක්ෂකයන් සෙනෙට් සභාවට පත් නොකළයුතුයයි අග මැතිණි ඇතුළු ආණ්ඩු පක්ෂය විසින් තීරණය කරනු ලැබ තිබෙනවා. නමුත් පැරදුණු අපේක්ෂකයන් සෑම අංශයකින්ම අයින් කර තබන්න පුළුවන්ද? අන්න ඒ ප්‍රතිපත්තිය අනුවයි, ගරු ආහාර ඇමතිවරයා වැඩ කරන්නෙ. සමූපකාර තොග වෙළඳ ආයතනය ගැන තෙල් සංයුක්ත මණ්ඩලය ගැන, බොහෝ විවේචන ඇති වුණා. කරවල ජාවාරම ගැන විවේචන එල්ල වුණා. අපේ දඹදෙණියේ ගරු මන්ත්‍රීවරයා (ආර්. ජී. සේනානායක මයා.) විදේශීය වෙළඳුන් ආරක්ෂා කරමින් කටයුතු කරගෙන ගොස් දැන් අළුත් පක්ෂයක් සාදා ඒ විදේශීය ධනවතුන්ගෙන් මුදල් එකතු කර අපට පහර ගැසීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා. අපේ ගරු ආහාර ඇමතිවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ උදවිය දැන් දඹදෙණියේ ගරු මන්ත්‍රීවරයාට එකතු වී ශ්‍රී ලංකා සිංහල පක්ෂය යන නමින් එක්සත් ජාතික පක්ෂයේ අංශයක් පිහිටුවාගෙන යනවාලු. ඒක ඇත්තෙන්ම එක්සත් ජාතික පක්ෂයේ වල්ගයක්. මේ ප්‍රශ්න ඇති වී තිබෙන්නේ මේ ආකාරයටයි. ආහාර ඇමතිවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ උදවිය, විදේශීය ධනවතුන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කඩාකප්පල් කිරීමේ ක්‍රියා මාර්ගයකට ඕනෑ තරම් මුදල් දෙනවා ඇති. මෙවැනි ව්‍යාපාර ඇති වීම පුදුමයක් නොවෙයි. පොඩි අහේතුවක් වී තිබෙන්නේ මෙවැනි හොඳ වැඩ කරන තරමට ආහාර ඇමතිවරයා දුප්පත් වීමයි. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයා (ඩී. පී. ආර්. ගුනවර්ධන මයා.) වගේ අපේ ගරු ආහාර ඇමතිවරයාත් දුප්පත් වෙලා.

"ඩිපාර්මන්ටල් ස්ටෝර්ස්" යනුවෙන් ඒ. ඩබ්ලිව්. ඊ. එකේ එක්තරා අංශයක් තිබෙනවා. සෝවියට් රුසියාවේ මේ විධියේ ක්‍රමයක් ඇති බව එහි ගිය අවස්ථාවේදී අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීවරයාට පෙනී යන්න ඇති. ඒ ක්‍රමය හොඳයි. රත්න දේශප්‍රිය සේනානායක, රාජපක්ෂ, නව රත්න වැනි මහතුන්ගේ සේවය ලබා ගෙන ධනපති ක්‍රියා මාර්ග සම්පූර්ණයෙන්ම අහෝසි කර දැමීමට ක්‍රියා කිරීම ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

ආහාර ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එහෙත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් උත්සාහ කරන්නේ ස්තුති කිරීමට නොව, ඒ ක්‍රියා මාර්ග අහෝසි කිරීමටයි. ඉන්දියාවෙන් ආ ලේගියම්, රත්රන් ආදිය දැන් අහෝසි වී ගොස් තිබෙනවා. මේවාට වග කියන්නේ අපේ ආහාර ඇමතිතුමායි. මෙ පමණ කල් එවැනි දෙයක් සිදු වුණේ නැහැ. දන්නා උදවිය දන්නවා, අපේ ආහාර ඇමතිවරයාගේ වටිනාකම. අඩුපාඩු කම් කොච්චරවත් තිබෙන බව කවුරුත් දන්නවා. පර සුද්දන් රට අල්ලා ගත් දවසේ සිට අවුරුදු 450 ක් තිස්සේ මේ රටේ තිබුණු අඩුපාඩුකම් එක අවුරුද්දකදී ගරු ආහාර ඇමතිතුමාට හරි ගස්සන්ට පුළුවන්ද? අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාත් අවුරුදු තුනක් ආහාර ඇමති වශයෙන් සිටියා. මේ අපේ ආහාර ඇමතිතුමා එක අවුරුද්දක් තුළ කළ වැඩයි. අයුතු ජාවාරම් කරගෙන ගිය හතළිස් ගණනක ගේ වැඩ මේ අවුරුද්ද තුළ ගරු ඇමතිතුමා විසින් තහනම් කර තිබෙනවා. මේ රටේ ජනතාව ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, බඩු මෙරටට ගෙන්වීමේ වෙළඳාමත් පිටරට යැවීමේ වෙළඳාමත් සමුපකාර ආයතනය මගින් නැත්නම් ආණ්ඩුව මගින් කරගෙන යන ලෙසයි. ගරු ඇමතිතුමනි, ඒ කටයුත්ත කිරීමට භය නැතිව තමුන්නාන්සේ ඉදිරියට යන්න.

අ. භා. 3.30

උඩරට ප්‍රදේශයේම ඉන්නේ හොරුය කියන විධියේ නිෂ්ප්‍රයෝජන විවේචනයක් අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් කරන්ට යෙදුණා. ඒ විවේචනය මට තේරුම් ගන්ට බැහැ. මාක්ස්වාදී ධර්මය අනුව බොහොම ප්‍රගතිශීලි ක්‍රම එතුමා ළඟ තිබෙනවා. එහෙත් මේ විවේචනයේ අදහස නම් මට තේරෙන්නේ නැහැ. උඩරට පහත රට භේදයක් ඇති කිරීම මිස වෙන යමක් මට මෙයින් පෙනී යන්නේ නැහැ. බලන්න සභාපතිතුමනි, අප අගමැතිවරිය වුණත් උඩරට කෙනෙක්.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
උඩරට රදල කෙනෙක්.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
මොකක්ද වරද?

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
රදල කෙනෙක්. එච්චරයි, වරද.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
බොරළුගොඩ රදලයන්ට වඩා නම් උසස්.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
අපි කවදත් රදලයො නොවෙයි, අපි ගම්මු. අපට තියෙන්නෙ ගෙවල්, වලව් නොවෙයි. මඩුගස් වලව්ව වගේ ඒව අපට නැහැ.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
තමුන්නාන්සෙත් ඇවිත් තිබෙනවා, අපේ ගෙදරට. ඒකෙ අමුත්තක් තියෙන වද? මම දන්නෙ නැහැ. කෙසේ වුණත් මේ ගරු සභාවට මා එක් කරුණක් මතක් කරන්න කැමතියි. රටේ මුළු ජනතාව වෙනුවෙන්, ඒ වගේම උඩරට ජනතාව වෙනුවෙන්, අද බෙල්ග්‍රේඩ් නගරයට ගිහින් මුළු ලෝකයේම ජනතාව පිළිබඳවත්, විශේෂයෙන් බවලතුන් පිළිබඳවත්, ලෝක සාමය උදෙසා කථා කරන්න එතුමියට පුළුවන් නම්, අයිතිවාසිකම් ඉදිරිපත් කරන්ට පුළුවන් නම්, ඒ රදලකම තිබුණට මොකද?

ඒ වගේම ඒ මන්ත්‍රීතුමා අල්ලස් ගැනීම ගැනත් කථා කළා.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
මම කිව්වේ නැහැ.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
තමුන්නාන්සෙ කිව්ව.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

තමුන්නාන්සෙගෙ කණ ඇහෙන්නෙ නැහැ. කණ ටිකක් හාරාගෙන එන්න.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

තමුන්නාන්සෙ කිව්ව, උඩරට ප්‍රදේශයෙ ඉන්නෙ අල්ලස් ගන්න උදවියය කියා.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

මම කිව්ව, උඩරට සමුපකාර සංගම් වලත් තොග වෙළඳායතනයේත් සිටි හොරුන් අස් කර දැම්මා කියා.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

එහෙම නොකිව්ව නම් හොඳයි. අගමැති වරිය උඩරට නිසාද මම දන්නෙ නැහැ, එතුමා හැම විටම අගමැතිවරිය විවේචනය කරනවා. මෙතැන පුටුව හිස්ව තිබෙනවාය කියනවා.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

බොරුවක් යැ.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

මේ පුටුව ලබා ගැනීමට මේ පැත්තට එන්න දඟලනවා, නමුත් මා හිතන්නෙ නැහැ ඒ අදහස හරියාය කියා. ඒ කෙසේ වෙතත්, ඔය වාගේ විවේචනයන් කරන්නයි, අපේ අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) පටන් ගෙන තිබෙන්නේ. එතුමාට වයස් යත් යත්ම මාක්ස් ධර්මය අමතක වී, ප්‍රගතිශීලි අදහස් අමතක වී, යන බවයි අපට පෙනෙන්නේ. එතුමා පෞද්ගලික විවේචන කරන විට මේ පැත්තේ සිටින අපටත්, කලින් කථා කිරීමට බලාපොරොත්තුවක් නොතිබුණත්, ඒවාට පිළිතුරු දෙන්ට සිද්ධ වෙනවා. මා කලින් කථා කිරීමට බලාපොරොත්තුව සිටියේ නැහැ, නමුත් අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා ගේ අවිචාර චෝදනාවලට පිළිතුරු නොදී සිටිය නොහැකි නිසයි, නැගී සිටියේ. යම් කිසි පැහැදිලි ප්‍රතිපත්තියක් අනුව කථා කරනවා නම්, කොමියුනිස්ට් පක්ෂයේත් ලංකා සමසමාජ පක්ෂයේත් මන්ත්‍රීවරුන් මෙන් පැහැදිලි ක්‍රියා මාර්ගයක් ගැන කථා කරනවා නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව වැනි අදහස් පිළිගැනීමටත්, අනුමත කිරීමටත්, ලෑස්තියි. එසේ නැතිව එහෙන් මෙහෙන් දේශපාලන ගල් මුල් ගැසීමට ලෑස්ති වුණොත් අපටත් නිසොල් මන්ව සිටීමට නොහැකි වෙනවා.

අපේ ගරු ආහාර ඇමතිතුමා විදේශීය ධනපති අධිරාජ්‍යවාදි වෙළෙන්දන්ට මුහුණ දී නිර්භීත ලෙස සටනක් කොට එය ජය ග්‍රහණය කරා ගෙන යෑම සම්බන්ධයෙන් අපි අපේ අවංක ස්තුතිය එතුමාට පුද කරනවා. බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) කීවාක් මෙන්, සමුපකාර තොග වෙළඳ ආයතනය මගින් සම්පූර්ණ වෙළඳාම—පිටරට යවන බඩු හෝ වේවා, මෙරටට ගෙන්වන බඩු හෝ වේවා, ඒ සියල්ලම—නියම අන්දමට කරගෙන යෑමට කටයුතු සලස්වන මෙන් මම ගරු ආහාර ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එවැනි ක්‍රියා මාර්ගයක් ගැනීමේදී එතුමාට සාමාන්‍ය මහජනතාවගේ සහයෝගය ලැබෙන බව ඒකාන්තයි. ප්‍රවෘත්ති පත්‍ර හා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් කොපමණ විවේචනය කළත්, මේ රටේ සාමාන්‍ය ජනතාවත් සුළු වෙළෙන්දනුත් ආරක්ෂා කළේ අපේ ගරු ආහාර ඇමතිතුමායි. එතුමා ගත වූ අවුරුද්ද තුළ ගෙන ගිය ඒ ක්‍රියා මාර්ගය මින් ඉදිරියටත් දිගටම ගෙන යනවා ඇතැයි මහජනයා හොඳින් බලාගෙන ඉන්නවා. එතුමා ගත් ඒ ක්‍රියා මාර්ගය නිසයි, මෙතෙක් පිටරට ඇදී ගිය මේ රටේ මුදල් යම් ප්‍රමාණයක් වත් නවතාගෙන ඒ ඇදී යන දොරටු වසා ගැනීමට පුළුවන් වූයේ. එදා ආහාර ඇමතිව සිටි අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාට කරන්න බැරි වූ දේ අද ආහාර ඇමතිතුමා කරගෙන යන නිසා වෙන්න ඇති, අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා උඩරට පහතරට භේදයක් ඇති කොට එතුමාගේ වැඩ කඩාකප්පල් කිරීමේ ව්‍යාපාරයක් ගෙන යන්නේ. මම ගරු ආහාර ඇමතිතුමාට කියනවා, තමුන්නාන්සේ නොබියව ඉදිරියට යන්න; අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

ජාතියත්, අපේ භාෂාවත්, අපේ රටත්, අපේ ධනයත්, බේරා ගැනීමට ඉදිරියටම යන්න; එදා තමුන්නාන්සේ පටන් ගත් ව්‍යාපාරය නොනවත්වාම නොබියව ගෙන යන්න; මේ රටේ ජනතාව තමුන්නාන්සේගේ පසුපසින් ගමන් කරනවා ඇති; කියා. තමුන්නාන්සේට ස්තුතියි.

ඒ. එච්. සේනානායක මයා. (හිරියාල)
(திரு. ஏ. எச். சேனநாயக்க—ஹிரியால)
(Mr. A. H. Senanayake—Hiriyala)

ගරු සභාපතිතුමනි, මේ වැය ශීර්ෂය යටතේ මෑත් වචන ස්වල්පයක් කථා කරන්න කැමතියි. ඒ ඒ පළාත්වල පාර්ලිමේන්තු මන්ත්‍රීන් කණ්ඩායම් වශයෙන් කැඳවා තමන් කරන්ට බලා පොරොත්තු වන දේවල් ගැන කරුණු පහදා දීම ගැන ප්‍රථමයෙන්ම ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ අදහස් ඉදිරිපත් කර එතුමා අදහස් කර ගෙන සිටින කටයුතු සාර්ථක ලෙස කර ගෙන යාම සම්බන්ධයෙන් උපකාරයක්, උදව්වක් කරන්න අපටත් පුළුවන්ද, ඒ කොයි ආකාරයෙන්ද, යනාදි වශයෙන් අවබෝධ කර දෙන්ට උත්සාහ කිරීම ගැන ගරු ඇමතිතුමාට අපේ ප්‍රශංසාව හිමි විය යුතුය කියා මා කල්පනා කරනවා.

අද උදේ වරුවේ මොනරාගල ගරු මන්ත්‍රීතුමා (ඇල්බට් සිල්වා මයා.) වැදගත් කරුණු චගයක් ගරු ඇමතිතුමාගේ සැල කිල්ලට යොමු කළා. එතුමා සඳහන් කළේ සමුපකාර කඩවල ඉන්න මැනේජර් මහතුන් ගැනයි. ඇත්තෙන්ම මොනරාගල ගරු මන්ත්‍රීතුමා කී සෑම දෙයක්ම මම අනුමත කරනවා. මගේ පළාතේත් මේ විධියේ අය බොහොම ඉන්න නිසයි මා එසේ කියන්නෙ. මා සමුපකාර මැනේජර් වරුන් ලක්ෂපතියන්, කෝටිපතියන්, මහා ධනපතියන්, හැටියට හඳුන්වා දෙන්ට උත්සාහ කරන්නෙ නැහැ. මගේ කොට්ඨාශයේ එක්තරා ධනපති පුද්ගලයෙක් සමුපකාර කඩයකට ඊංගාගෙන ඉන්නවා. එපමණක් නොවෙයි, තමාගේ නෑදෑයින් නමින් කඩ 12 ක් නැතහොත් 15 ක් ඒ ඒ තැන්වල පවත්වාගෙන යනවා. හැබැයි, තමාගේ නමින් නම් එක් කඩයක්වත් නැහැ. වෙනත් අයගේ නමින් වී මෝල් තබාගෙන ඉන්නවා. ඒ මගිනුත් විශාල මුදලක් උපයා ගන්නවා. සමුපකාර කඩවලට සපයන බඩු වෙනත් අයගේ නමින් පවත්වාගෙන යන කඩවලට පිටත් කර හරිනවා. මේ විධියේ දූෂණ ක්‍රියා පවතින නිසා ඒවා සම්බන්ධයෙන් හරියාකාර පරීක්ෂණ පවත්වා ඒවා නියම විධියට කරගෙන යාමට වැඩ පිළිවෙළක් ඇති කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

සිල්ලර වෙළෙන්දාට අකටයුත්තක් කරන්නේ නැහැ කියා ගරු ඇමතිතුමා පොරොන්දු වුණා. ඒ ගැන සන්තෝෂය ප්‍රකාශ කරන අතර එවැනි ප්‍රකාශයක් කිරීම ගැන ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. සමහර තොග වෙළෙන්දන් නොයෙක් විධියේ කූට උපක්‍රම යොදා මුදල් උපයා ගන්න නිසා එයින් දුප්පත් පාරිභෝගිකයාට හිරිහැර වෙනවා. දුප්පත් සිල්ලර වෙළෙන්දෙක් පැමිණිල්ලක් කර තිබෙනවා. ඔහු තොග වෙළෙන්දකුගෙන් හාල් මැස්සන් රාත්තල් 14 ක් ඉල්ලුවාම හාල් මැස්සන් රාත්තල් 14 ක් කිරා දී බිලේ රාත්තල් 28 ක් ලකුණු කර රාත්තල් 28 කට මුදල් අය කර තිබෙනවා. ඉතින් රාත්තල් 28 ක් ය කියා රාත්තල් 14 ක් ගෙන යන මේ දුප්පත් වෙළෙන්දා තමා ගෙවූ මුදල වෙනුවෙන් සුළු ලාභයක්වත් ඇතිව ඒ හාල්මැස්සන් තොගය විකුණන්නෙ කොහොමද? මා චෝදනාවක් කරනවා නොවෙයි. සිදු වන දේ ගැනයි මා සඳහන් කරන්නෙ. රාත්තල් 28 ක් ය කියා බිලේ ලියා දෙන නමුත් රාත්තල් 14 ක් පමණක් ලැබෙනවා නම්, පාලන මිලට වැඩියෙන් විකුණන්නෙ නැතුව ඒ දුප්පත් සිල්ලර වෙළෙන්දා මොනවා කරන්නද? එසේ කළාම දුප්පත් ජනතාව අමාරුවේ වැටෙනවා. මේ ගැන හරියාකාර පරීක්ෂණයක් පවත්වන ලෙස පරීක්ෂක මහත්වරුන්ට නියෝගයක් යවන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමෙක් කීවා සමුපකාර කඩයක මැනේජර් හැටියට පත් වන කෙනෙක් එසේ පත් වී මාස 6 ක් නැත්නම් අවුරුද්දක් ගියාම සෑහෙන ධනවතෙක් වෙනවාය කියා. ඒක ඇත්ත. ඒක පැහැදිලියි. ගරු ඇමතිතුමා ආහාර බෙදා දීම ආදිය සම්බන්ධයෙන් අප සමග සාකච්ඡා කළ අවස්ථාවේ මාත් ඒ ගැන එතුමාට මතක් කර සිටියා. ඒ ගැන කට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යුතු කරන්න නිලධාරීන් සූදානම්ව සිටින වාය කියා එදා කීවා. මගේ පළාතේ මේ විධියේ දේවල් හුඟක් තිබෙනවා. ඒ ගැනත් පරීක්ෂා කරනවා නම් මම බොහොම සන්තෝෂ වෙනවා. නමුත් මේ ගරු මන්ත්‍රීවරු කීප දෙනෙක්ම කීවා, සමුපකාර කඩ කරන අය එක්සත් ජාතික පක්ෂයේ අයය කියා. එය වැරදි මතයක්. තමුන්නාන්සෙලා ඒ වරුදි මතය අස් කර ගන්න ඕනෑ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
වැඩි හරියක්

අ. භා. 3.45

ඒ. එච්. සේනානායක මයා.
(திரு. ஏ. எச். சேனநாயக்க)
(Mr. A. H. Senanayake)

නැහැ, නැහැ, ඒක වැරදියි. මගේ පළාතේ තිබෙන තත්ත්වයයි මම කියන්නේ. රත්තොට ගරු මන්ත්‍රීතුමා (චන්ද්‍රසේන මුණවීර මයා.) ප්‍රකාශ කළා, මාතලේ සිටින සියලුම සමුපකාර කඩ කාරයන් එක්සත් ජාතික පක්ෂයේ අයය කියා. ඒක ඒ මන්ත්‍රීතුමාගේ වැරදි වැටහීමක්. මමත් ඒ ප්‍රදේශයට කිට්ටුව ඉන්න නිසා මම දන්නවා එය වැරදි කීමක් බව. එවැනි වැරදි මතයක් ඇති වීම ගැන මම ඉතාමත්ම කනගාටු වෙනවා. වැරදි කරන අය තමුන්නාන්සෙලාගේ පක්ෂයෙත් සිටිනවා, අපේ පක්ෂයෙත් සිටිනවා. දෙපක්ෂයේම සිටිනවා. එක පක්ෂයකට චෝදනා කිරීම වැරදියි. කාගෙන් හෝ වරදක් වුණත් එක්සත් ජාතික පක්ෂයට දොස් කීම වැරදියි. චෝදනා කරනවා නම් කරුණා කර හොඳට හොයා බලා කල්පනා කර චෝදනා කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මට තමුන්නාන්සේගෙන් ලැබුණේ ඉතා සුළු කාලයයි. ඒ සුළු කාලය තුළ තව වචන ස්වල්පයක් පමණක් කියන්ට අදහස් කරනවා. දවසක් මගදී මට සමුපකාර පරීක්ෂක තුමකු හමුවුණා. මම ඒ මහත්මයාව අඳුනන්නෙ නැහැ. මගදී හමුවෙලා එකට එන විට මම ඒ මහත්මයාගෙන් ඇහුවා, මහත්මයාලා ගිහින් පරීක්ෂා කරන්නේ මොනවාද කියා. අපට නියම කර තිබෙන්නේ පොත් වල තිබෙන ගණන් පරීක්ෂා කිරීමට පමණය කියා ඒ මහත්මයා ප්‍රකාශ කළා. මේ කරුණු ගැන මට හරියට තේරුමක් නැහැ. කෙසේ හෝ මට ඒ මහත්මයාගේ කථා වෙන් තේරුණේ බඩු ගැන පරීක්ෂා කිරීමට ඒ අයට වැඩි බලයක් නැති බවයි. ඒ නිසා ඒ ගැනත් කල්පනා කර ප්‍රදුස්සක් කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මගේ පළාතේ සමුපකාර මැනේජර්වරු හුඟ දෙනෙක් සල්ලි වංචා කරගෙන පැනලා යනවා. කාරක සභිකමහත්වරු හුඟක් ඉන්නේ යමක් තේරෙන්නෙ නැති උදවියයි. ඒ අය පෙත්සමක් දුන්නත් ඒවා යට වෙලා යනවා. ගරු මන්ත්‍රීවරු කීප දෙනෙක්ම මේ කරුණ ගැන ප්‍රකාශ කළා. මගේ පළාතේ ඔය විධියේ සිද්ධි හුඟක් සිදු වී තිබෙනවා. අවුරුදු 2 කට ප්‍රථම ඒ ප්‍රදේශයේ මිනිස්සු මටත් කීවා සමුපකාර උප කොමසාරිස්තුමාට මේ කරුණ පැහැදිලි කර දෙන්නය කියා. මම ඒ සමුපකාරය සමග වැඩි සම්බන්ධයක් නැති නිසා මම ඒ අයව සමුපකාර උප කොමසාරිස්තුමා ළඟට යැව්වා, ඒ කාරණය පරීක්ෂා කර බැලීමට. නමුත් අද වන තෙක් ඒ ගැන කිසිම දෙයක් සිදු වුණේ නැහැ. ඒ මැනේජර්ගේ පවුල සමුපකාර කඩයට හැතැප්මක් එහායින් කඩයක් දමාගෙන ඉන්නවා. සමුපකාර කඩයට උම්බලකඩ ලැබුණත් ඒ කඩෙන් කවදාවත් උම්බල කඩ ගන්න ලැබෙන්නෙ නැහැ. අර සමුපකාර කඩේ මැනේජර්ගේ පවුලගෙ කඩේ උම්බලකඩ තිබෙනවා. මේ විධියේ බොහොමදේ සිදු වෙනවා. මම ඒ කඩේට බැඳිලා නැති නිසා මට ඒකට ගිහින් ඇඟිලි ගහන්න අමාරුයි.

ගරු සභාපතිතුමනි, තව එක කරුණක් මතක් කරන්න කැමතියි. මගේ කොට්ඨාශයේ එකම සමුපකාර පොල් මෝලක් තිබුණා. මමත් එහි සාමාජිකයකු වී සිටි නිසා කොළඹ සිට ගිය කොමසාරිස්තුමකුගෙන් මා ඉල්ලීමක් කළා, පොහොසත් අයව පමණක් නොව පොල් අක්කරයක් පමණ තිබෙන අයත් සම්බන්ධ කරගෙන ඒ මෝල ගෙන ගියොත් දුප්පත් මිනිසුන්ටත් විශාල ප්‍රයෝජනයක් සිදු වන නිසා ඒ පිළිවෙළට කරන්නය කියා. එතුමාත් ඒක පිළිගෙන කටයුතු කළා. අපි සෑහෙන කාලයක් හොඳට ඒ මෝලේ වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එච්. සේනානායක මයා.]

කරගෙන ආවා. නමුත් පසුව අපට ලොකු බාධාවක් ඇති වුණා. මා අර සඳහන් කළ කෝටිපතියාට කරන්න දහයක් පහළොවක් තියෙනවා. ඔහු අර දුප්පත් මිනිසුන්ගේ පොල් කඩවන්නත් මිනිසුන්ව ඇරලා, පොල් එකතු කරගෙන එන්නත් කරන්න ඇරියා. ටික කලකින්ම ඒ මෝල වැහිලා ගියා. ආණ්ඩුවටත් මා හිතන පිළිවෙළට එයින් රුපියල් ලක්ෂ 5 ක් පමණ පාඩුයි. මේ විධියේ දේ සිදු වෙනවා. මා මේ ඇමතිතුමාට චෝදනා කරනවා නොවෙයි. එතුමා මේ අමාත්‍යාංශයට ළඟදී පත් වුණු බව අපි දන්නවා. මේවා ගැන හොඳින් කල්පනා කර මේ අඩුපාඩු හරිගැස්වීමට කටයුතු කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

කේ. එච්. ජී. ඇල්බට් මයා. (බෙන්තර-ඇල්පිටිය)

(திரு. கே. எச். ஜீ. அல்பேட்—பெந்தற-எல்பிட்டிய)

(Mr. K. H. G. Albert—Bentara-Elpitiya)

ගරු සභාපතිතුමනි, මා උදේ සිට වචන ස්වල්පයක් කථා කිරීමේ අදහසින් මේ ස්ථානයේ බලාගෙන සිටියා. උදේ පටන් සෑම ගරු මන්ත්‍රීවරයෙක්ම කථා කර අවසන් වනවිට මා කථා කිරීමේ අදහසින් නැගී සිටියා. නමුත් මේ අවස්ථාවේදී පමණයි තමුන්නාන්සේට මා පෙනී ගියේ. ඒ ගැන තමුන්නාන්සේට බොහොම ස්තුතියි.

සභාපතිතුමා

(அக்கிராசனர்)

(The Chairman)

කරුණාකර ඒ චෝදනාව අස්කර ගන්න.

ඇල්බට් මයා.

(திரு. அல்பேட்)

(Mr. Albert)

හොඳයි මා එය ඉල්ලා අස් කර ගන්නම්.

මේ අමාත්‍යාංශය ගැන කථා කරන්න ඉඩ ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. "පිට රටින් ගෙන්වන කුණු කරවල ගන්න එපා. මේ රටේ උපදින කෙසෙල් කැන් වැනි පළතුරු වර්ගත් කිරි වැනි පෝෂ්‍යදායක දේත් විකුණා ලබාගන්නා සල්ලිවලින් දුප්පත් ගැමි ජනතාව අරගෙන කන්නෙ කුණු කරවලයි. ජාතික ආහාර කෑම ඊට වඩා ගුණයි." යනාදී වශයෙන් අප කාලයක් මහජනතාව අතරේ කියාගෙන ගියා. මෙහෙම කියාගෙන යන කාලයේදී තමයි මේ රටේ නොයෙක් තැන්වල පළාතෙන් යන්න බැරි අන්දමට ගඳ ගහන කුණු කරවල විකිණීමට ඇතැම් වෙළෙන්දන් සූදානම් වුණේ. ඇතැම් විට වෙළඳ පොළවල් එහෙම පිටින්ම වළලෑමට තරම් පුළුවන්කම තිබෙන කරවලයි වෙළෙන්දන් තැනින් තැන ගෙනගොස් විකුණුවේ. මෙහෙම වෙළඳාම් කරද්දීත් මේ රටේ ජාතික වීරවරයන් හැටියට කෑ ගසන අයගේ ඇස් ඒ වෙනුවෙන් ඇරුණේ නැහැ. එසේ ඇස් ඇරී කථා කරනවා මා එක දිනකවත් දුටුවේ නැහැ. රෝග බෝ වන අන්දමේ කුණු කරවල ගෙන්වා විකුණු ආකාරය ගැන එම දෙශප්‍රේමීන් කිසිවෙක් කීවේ නැහැ. ඒ විධියට මේ රටේ ජාතික ධනය විශාල වශයෙන් කඩා ගෙන ඒවා තම තමන්ගේ රටවල් කරා ඇදගෙන ගිය කුට උපක්‍රමකාරයන්ට පහර ගැසීමේ බලාපොරොත්තුවෙන් ඉදිරිපත් වුණු කොටසකට පහර ගැසීමේ බලාපොරොත්තුවෙනුයි මේ බොහෝ දෙනා කථා කරන්නේ. මේ කථා කරන්නේ එවැනි සේවයක් කරන මේ ආණ්ඩුවට පහර ගැසීමේ අදහසකින් මිස මේ රටේ මහජනයාට ඇති ආදරයක් නිසා නොවෙයි. මේ කරවලවල තත්ත්වය නොදැනසි එක එක අය ඇවිත් මේ විධියට කෑ ගහන්නෙ. අවුත් පිටම මේ කරවල ව්‍යාපාරය අතට ගත් අවස්ථාවේදී සමහර විට ඒ මහත්වරුන් අතින් සුළු ප්‍රමාදයක් වන්න ඇති. ඒ ඒ ප්‍රදේශවලට යැවිය යුතු කරවල වෙනස් වෙනස් ආකාරයටයි යැවී තිබෙන්නේ. තලවාකැලේට යවන්න ඕනෑ කරවල ගාල්ලට යැවුණා. ගාල්ලට යවන්න ඕනෑ කරවල තලවාකැලේට යැවුණා. තලවාකැලේ ප්‍රදේශයට ටිකක් ගඳ ගහන කරවල නොගෙනිච්චොත් විකුණන්න අමාරුයි. ඒ ප්‍රදේශයේ හොඳ කරවල විකුණන්න අමාරුයි. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාට (ඩබ්ලිව්. දහනායක මයා.) ගඳ ගහන කරවල අහුවෙලා තියෙනවා. කට යුතු සිදුවන්න ඇත්තේ ඒ විධියට වෙන්න ඇත කියා මා විශ්වාස කරනවා. නමුත් බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයට ලැබී තිබෙන කරවල ඒ අන්දමේ නො

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙයි. අවුරුදු දහයකට මොබ්බෙහිදී කිසි දිනක ඒ පළාතේ මහජනයා මිලදී නොගත්ත අන්දමේ හොඳ කරවල ඒ පළාතට ලැබී තිබෙනවා. ඒවා ඉතා අඩු මිලට ගන්න අවස්ථාව ලැබී තිබෙනවා. ඒ ගැන එම පළාතේ මහජනයා මේ රජයටත් මේ අංශය භාර ගරු ඇමතිතුමාටත් පිං කියනවා. ඒ බව මා විශෙෂයෙන් කියන්න කැමතියි.

එක එක පුද්ගලයා මෙපමණ කල් නොයෙකුත් අන්දමේ ජාවාරම් ගෙන ගියේ කරවල වෙළඳාම මුල් කර ගෙනයි. නමුත් ඒ ජාවාරම් එතරම් බරපතල අන්දමට කෙරෙන්නට ඉඩ දුන්නේ නැහැ. මේ කරවල ව්‍යාපාරය භාර දුන් මහතාගේ දක්ෂකම නිසාත් ගරු ඇමතිතුමාගේ ක්‍රියා ශූරත්වය නිසාත් අද දවසේ මහජනයාට හොඳ කරවල බෙදා හැරීමට හැකි වී තිබෙනවා. විශෙෂයෙන් දකුණු ප්‍රදේශයට හොඳ කරවල ලැබෙනවා. පසුගිය දවස්වල මේ විෂයය යටතේ ම, ඒ කියන්නේ කරවල වෙළඳාම ගැන ම, කථා කරගෙන යද්දී මා විසින් කරන්නට යෙදුණු ප්‍රකාශයක් දැන් මට මතක් වෙනවා. පිටිගල කියන ප්‍රදේශයේ පොළක බඩු මිල අඩු වුණාය කියා මා ප්‍රකාශ කළා. මෙය වරදවා තේරුම් ගත් සමහර උදවිය එවැනි තැනක් නැතැයි කියාත්, තියෙන්නේ කොහෙද කියාත්, සඳහන් කරමින් මට තැපැල් පතක් එවා තිබුණා. පරිප්පු, උම්බලකඩ යන දෙවර්ගය හැරුණාම අනෙක් ද්‍රව්‍ය අපේ පළාත්වල තිබෙන පොළවල්වලින් සහ කඩවලින්ද, විශේෂයෙන් තල්ගස්වෙල සහ පිටිගස්වෙල යන ගම්වලත් නියමිත මිලට වඩා සත තුන හතරක් හෝ අඩුවෙන් ලබා ගන්න පුළුවන් බව මා අදත් ප්‍රකාශ කරන්න සතුටුයි.

මෙම අමාත්‍යාංශය යටතේ අද ගෙන යනු ලබන්නේ ජාතික ව්‍යාපාරයක්. මේ ආණ්ඩුව හොඳ දෙයක් කළාම විරුද්ධ පක්ෂය බණින එක කවදත් සිරිතක්. වඩා හොඳ දෙයක් කළාම වැඩියෙනුත් බණිනවා. මීට හේතුව කුමක්ද? මෙවැනි දේ අප ආණ්ඩුව කිරීමෙන් ආණ්ඩුව ජනප්‍රිය භාවයට, මහජන ගෞරවාදරයට පාත්‍ර වේවිය යන ඊර්ෂ්‍යා සහගත චේතනාවලින් යුක්තවයි මෙවැනි අමූලික, අභූත චෝදනා ඉදිරිපත් කරන්නේ.

පරාජිත වූ ඡන්දාපේක්ෂකයකු තොග වෙළඳ ආයතනයේ මූලික ස්ථානයට පත් කිරීම ගැන යම් යම් චෝදනා ඉදිරිපත් කරනු ලැබුවා. මේ සම්බන්ධයෙන් එක් කාරණයක් පමණක් මම මතක් කර දෙන්න සතුටුයි. භාරකාර ආණ්ඩුවක අග මැතිව සිටි, අගමැතිවරයකු වශයෙන් යොදවන්න පුළුවන් සෑම බලයක්ම යෙදූ, ජාතික ආණ්ඩුවක පවා අගමැතිකම භාර දෙන්න සුදුසු යයි කී පුද්ගලයකුට විරුද්ධව මාර්තු මැතිවරණයේදී ඡන්දාපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වී ඡන්ද 1200 කින් පමණක් පැරදුණු ශ්‍රේෂ්ඨ පුද්ගලයකුයි තොග වෙළඳ ආයතනයේ ප්‍රධානියා වශයෙන් පත් කර සිටින්නේ. සමාජවාදී අදහස් ඇති එවැනි ශ්‍රේෂ්ඨ පුද්ගලයකු මෙවැනි ආයතනයක මුල් ස්ථානයට පත්කර ගන්න පුළුවන් වීම ගැන අප සන්තෝෂ වන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මෙම ප්‍රකාශය කළ අවස්ථාවේදී මා තුළ එක් බියක් හට ගත්තා. බැරිවේලාවත් අපි මැතිවරණයකින් පැරදුණොත් අපට යන කල දසාවක් නැහැ. අපේ සහතික, ක්‍රියා ශූරත්වය, ඡන්දයකින් පැරදුණ පමණින් ගණන් ගන්නේ නැතිව යනවා. ඡන්දයකින් පැරදුණ පමණින් කොතැනකටවත් වැද්ද ගන්න එපාය යන ප්‍රතිපත්තියකුයි ඔය කියන්නේ. එම නිසා ඔය අදහස සම්පූර්ණයෙන්ම වැරදි බව මා කියන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, දූෂණවලින් පිරුණු බොහෝ තැන් මේ රටේ තිබෙනවා. දූෂණ කටයුතු මුල් අවධියේ පටන්ම බහුල වශයෙන් කෙරුණ තැන් තම යි වීගබඩා. අපේ පළාත්වල නිපදවන වී සමුපකාර සමිති මගින් මිලයට රැගෙන යවනු ලබන්නේ බූස්සේ තිබෙන වී ගබඩාවටයි. නොම්මර එකේ දූෂණ කටයුතු කෙරෙන තැනක් තමයි මේ ස්ථානය. මේ පිළිබඳව ක්‍රමවත් පරීක්ෂණයක් පවත්වන්නය කියා කීප වතාවක්ම මා ඉල්ලා සිටි නමුත් තවමත් ඒ පිළිබඳව සතුටුදායක තත්ත්වයක් ඇති වී නැති බව ගරු ඇමතිතුමාට විශේෂයෙන් මතක් කරන්න කැමතියි. අපේ ප්‍රදේශයේ තිබෙන සමුපකාර සමිතිවලින් මෙම ගබඩාවට ගෙන යනු ලැබූ වී ලොරි,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඇල්බට් මයා.]

එතන සිටින අයට ගෙවිය යුතුව තිබෙන පඟා මුදල නොගෙවන ලද නිසා, භාර නොගෙන ආපසු එවූ අවස්ථා කීපයක් තිබෙනවා. මෙම ස්ථානවල මේ අන්දමේ ක්‍රියා කලාපයක් ගෙන යන බව මා ඇමතිතුමාට මතක් කරන්න කැමතියි. වී ගබඩාව බූස්සේ තිබෙන නිසා විවිධ සේවා සමුපකාර සමිතිවලට විශාල කරදරයකට මුහුණ පාන්න වී තිබෙනවා. ඒ නිසා විශාල වශයෙන් වී නිපදවන ඇල්පිටිය වැනි ප්‍රදේශයක වී ගබඩාවක් පිහිටුවීමට කටයුතු සලස්වන්නය කියා ආහාර සහ වෙළඳ ඇමතිතුමාගෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

රැස්වීම අ. භා. 4.30 වනතුරු තාවකාලිකව අත්හිටවනවා. නැවත පටන් ගන්නා විට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇත.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින් අ. භා. 4.30ට කාරක සභා නියෝජ්‍ය සභාපති තැන්පත් ඒ. අදිකාරී මහතාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදි.

ඇල්බට් මයා.
(திரு. அல்பேட்)
(Mr. Albert)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විරුද්ධ පක්ෂයේ ඇතැම් ගරු මන්ත්‍රීවරු කිව්වා, මේ රටේ සිටින උපාධිධාරීන් මේ වෙළඳ ව්‍යාපාරවලට යොදවා ගන්නය, එසේ යොදා නොගත්තොත් සමහර විට අපට දුෂ්කරතාවන්ට මුහුණ පාන්න සිදුවෙන බවය කියා. අත්ත වශයෙන් මා කියන්නට කැමතියි, වෙළඳ ව්‍යාපාරවලට උපාධිධාරීන් පත්කර ගැනීමෙන් එතරම් සාර්ථක ප්‍රතිඵල ලබාගන්න බැරි බව. සමහර විට උපාධිධාරීන් බොහෝ දක්ෂයන් වෙන්න පුළුවනි; පළල් දැනීමක් ඇති අය වෙන්නට පුළුවනි. නමුත් වෙළඳාම වැනි කටයුතුවලට යෙදිය යුත්තේ වෙළඳ කටයුතුවල දක්ෂකම් ඇති, ශූරතාවක් දක්වන, වෙළඳ උපක්‍රම ගැන දන්නා පුද්ගලයන් බව මතක් කරන්න ඕනෑ. විශෙෂයෙන් කරවල වෙළඳාම වැනි ව්‍යාපාරයක්, එය මෙතෙක් කලක් ගෙනගිය විදේශීය වෙළඳුන්ගේ අතින් බලහත්කාරයෙන් වාගේ අරගෙන සාර්ථක අන්දමින් පවත්වාගෙන යාමට නම් වෙළඳාම සම්බන්ධයෙන් අර පුද්ගලයෙකු සිටිය යුතුමයි. ඒ අතින් රාජපක්ෂ මහතාගේ ශූරතාව නිසා අද කරවල වෙළඳාම සාර්ථක කරගෙන යාමට සියළු වැඩ කටයුතු සංවිධානය කර තිබෙනවා. ඇත්ත වශයෙන් එබඳු දක්ෂ නිලධාරීන් මේ අන්දමේ ව්‍යාපාරවලට පත්කර ගැනීමට අවස්ථාවක් සැලසීම ගැන අප සතුටු වෙන්නට ඕනෑ. එමෙන්ම සමාජවාදය කරා ගමන් කරන මේ රජයට එබඳු පුද්ගලයන්ගේ සහාය ලබා ගැනීමට හැකි වීම වාසනාවක් යයි මා කල්පනා කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ ගරු වෙළඳ ඇමැතිතුමාගේ පාලනය යටතේ තිබෙන ද්‍රව්‍ය අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු සාර්ථකවී තිබෙනවාද කියා මා ප්‍රශ්න කරන්න කැමැතියි. අද මේ දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන්නේ අලාභ සහිතවයි. මේ අතින් යම්කිසි තත්ත්වයක් ලබා ඇත්තේ ටිරිපොලි වෙළඳපොළ පමණක් බව කියන්න ඕනෑ. නමුත් මේ දෙපාර්තමේන්තුව පිහිටුවා තිබෙන්නේ මේ රටේ ආහාර ද්‍රව්‍ය නිපදවන්නන්ට තම ද්‍රව්‍යවලට හොඳ මිලක් ලබාදීම සඳහාත්, ඒවාගේම පාරිභෝගිකයාට පහසු මිලකට ආහාර ද්‍රව්‍ය ලබාදීම සඳහාත් බව අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. නමුත් ඒ පරමාර්ථය මේ දෙපාර්තමේන්තුවෙන් හරිහැටි මෙතෙක් ඉටු වී නැහැ. එසේ වී තිබෙන්නේ මේ දෙපාර්තමේන්තුවල සේවය කරන නිලධාරීන්ගේ ඇති ආකාර්යක්ෂමතාව නිසයි. එසේ ඉටු වී නැත්තේ මේ හේතුව නිසයි. ඒ දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරීන් ආකාර්යක්ෂම නිසා නොව, ඔවුන් ප්‍රතිගාමීන් සමග අත්වැල් බැඳගෙන මෙම ව්‍යාපාරය කඩාකප්පල් කිරීමට පටන් ගත් පුද්ගලයන් පිරිසක් නිසයි. මා එසේ කියන්නේ කරුණු කීපයක් අනුවයි. මෙම දෙපාර්තමේන්තුවෙන් නොයෙකුත් ආහාර ද්‍රව්‍ය මිළට ගන්නවා. එලවළු පලතුරු ආදී එම ද්‍රව්‍ය රාත්තල් දහස් ගණනක් මිළට ගැනීමට පුළුවන්කම තිබියදී ඔවුන් ඒ ඒ ගම්වලින් මිළට ගන්නේ රාත්තල් සියයක් හමාරක් පමණයි. තමන්ගේ නිෂ්පාදන විකිණීමට බලාපොරොත්තු වන සාමාන්‍ය ගොවියා මේ හේතුකොටගෙන විශාල කරදරයකට මුහුණ පානවා. ඒ මොකද? ගොවි මහත්වරු තමන් ගොවි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තැන් කළ ආහාර ද්‍රව්‍ය රැස්කරගෙන වෙළඳ දෙපාර්තමේන්තුවට දීම සඳහා බලා සිටිනවා. එහෙත් වෙළඳ දෙපාර්තමේන්තුව ඔවුන්ගෙන් ඒවා ගන්නේ නැහැ. ඔවුන් කියන්නේ වෙළඳ දෙපාර්තමේන්තුවේ මූල ස්ථානය නොහොත් අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ඔවුන්ට නියම කර තිබෙන්නේ සාමාන්‍ය ප්‍රමාණයක් මිළට ගැනීමට පමණක්ය කියායි. එතකොට අර රැස්කර ගෙන සිටින ආහාර ද්‍රව්‍යවලට යන කල දසාව කුමක්ද? ඒවා ඉතාමත් අඩු මිළට පෞද්ගලික වෙළෙන්දාට විකුණන්න සිදු වෙනවා. එයින් සාමාන්‍ය ගොවියාට විශාල අලාභයකුයි, සිදු වන්නේ. එම නිසා, මේ දෙපාර්තමේන්තුවේ ක්‍රියා කලාපය නිසා, සාමාන්‍ය ගොවියාට සිදු වන්නේ විශාල පාඩුවක් බවත්, වෙළඳ දෙපාර්තමේන්තුවෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵල ඒ අනුව ලැබෙන්නේ නැති බවත්, අපට පෙනී යනවා.

ඒ ඒ ගම්වලින් යම්කිසි ප්‍රමාණයක් මිලට ගන්නය කියා නියමයක් තිබෙනවා. නමුත් ඒ ගන්න ප්‍රමාණයත් ගන්නේ තැරැව්කාරයන්ගෙන්ය කියා අපට දැන ගන්න ලැබී තිබෙනවා. මේ තැරැව්කාරයන් විසින් යම්කිසි කොමිස් මුදලක් අර නිල ධාරීන්ට දෙනවාලු. ඒ නිසා ඔවුන් ඒ ආහාර ද්‍රව්‍ය තැරැව්කාරයින්ගෙන්ම ගන්න සූදානම් වී සිටිනවා. එම නිසා බඩු මිලට ගැනීමේ ව්‍යාපාරය ගැන සොයා බලා එහි වෙනසක් කිරීම ඉතාම අවශ්‍ය බව මම මතක් කරන්න කැමතියි.

වෙළඳ දෙපාර්තමේන්තුව නොහොත් අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව වැඩිය බඩු නොගන්නේ අලෙවි කිරීමට බැරිකම නිසාය කියනවා. ගොවියා නිෂ්පාදනය කරන ප්‍රමාණයෙන් සියයට පනහක්වත් ඔවුන් ගන්නේ නැහැ. ඊට හේතුව අලෙවි කරන්න බැරි නිසාලු. අලෙවි කරන්න බැරි ය කියන නමුත් ඊට හේතු අපි සොයා බලමු. 1959 වන තුරු පේරාදෙණියේ විශ්ව විද්‍යාලයට මෙම දෙපාර්තමේන්තුවෙන් බඩු සපයන්න යෙදුණා. එලවළු පළතුරු ආදිය සපයන්න යෙදුණා. එහෙත් ඒ කොන්තරාත්තුව වුවමනාවෙන්ම නුවර පෞද්ගලික වෙළෙන්දෙකුට ගන්න සැලැස්සුවා. ඒ ගැන කොහෙත්ම ප්‍රශ්න නොකර අද දක්වාම නිසොල්මන්ව සිටිනවා. ඒ වාගේම වෙනත් වෙනත් විද්‍යාලවලට මේ දෙපාර්තමේන්තුව මගින් බඩු සපයමින් තිබුණා නමුත් 1959 සිට එය සම්පූර්ණයෙන් නවතා දමා තිබෙනවා. මේවා නවතා දමා ඇත්තේ කුමක් නිසාද කියන ප්‍රශ්නය මෙතෙක් මතු කර නැහැ, කුමක් නිසාද කියා ඔවුන්ගෙන් අසා නැහැ. ඒ නිසා මේ පිළිබඳව සම්පූර්ණයෙන්ම පරීක්ෂණයක් කර ඒ වෙළඳ මහතුන්ට භාර දී ඇති වෙළඳාම හරියට කරන්න බැරි නම් වෙළඳාම ගැන සාමාන්‍ය දැනීමක් ඇති පුද්ගලයන් එයට පත් කරන්නය කියා මම කියන්න කැමතියි. එසේ පත් කර ගොවීන් නිපදවන ද්‍රව්‍යවලට සැහෙන මිළක් ගෙවීමට හැකි වන විධියටත්, පාරිභෝගිකයාට සැහෙන මිළකට ඒ ද්‍රව්‍ය ලබා ගැනීමට හැකි වන විධියටත්, වැඩ පිළිවෙළක් යොදන ලෙස මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් තවත් කරුණක් මතක් කරන්න තිබෙනවා. මට ප්‍රථමයෙන් කථා කළ ගරු මන්ත්‍රීවරයකුගේ ප්‍රකාශයේ හැටියට අපට එක් කාරණයක් පෙනී යනවා. රාමඤ්ඤ නිකායත්, සියම් නිකායත්, ආදි වශයෙන් නිකාය භේද ඇති කරන්ට සමහරුන් ක්‍රියා කරනවා. ඒ වාගේම කුල භේද, උඩ රට පහත රට භේද ආගම් භේද ඇති කිරීමට ක්‍රියා කරනවා. ජාති භේද වපුරන්නටත් ක්‍රියා කරනවා. මෙවැනි භේද ඇති කරන්නේ මේ රටේ බලතල ලබා ගැනීමේ මහා තණ්හාවක් ඇතිවයි. නමුත් එවැනි භේද නිසා රටට සිදු විය හැකි උපද්‍රවය ගැන සලකන්නේ නැහැ. ඔවුන්ගේ බලාපොරොත්තුව විශාල භේද වපුරා හෝ බලතල ලබා ගැනීමයි. අභිප්‍රාය ඒකමයි. වග කිය යුතු තලතුනා මන්ත්‍රීවරුන් පවා, බොහෝ කාලයක් දේශපාලනයේ යෙදුණු අය පවා, මෙම භේද වැපිරීමේ ක්‍රියා මාර්ගය ගෙන යනවා. භේද ඇති කිරීම සඳහා සියුම් වශයෙන් ව්‍යාපාර ගෙන යන බව මේ අවස්ථාවේදී කියන්ට ඕනෑ. නිකාය භේද ව්‍යාපාරයක් මෙන්ම කුල භේද ව්‍යාපාරයකුත්, උඩ රට පහත රට භේද ව්‍යාපාරයකුත්, සියුම් වශයෙන් යටින් ආරම්භ කර තිබෙන බව කියන්නේ කනගාටුවෙන්. මේ රටේ යහපත ගැන නොසලකා පෞද්ගලික බලතල බලාපොරොත්තුවෙන් ගෙන යන මෙම වැඩ පිළිවෙළ ඉතාමත් නින්දනීය බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බර්නාඩ් සොයිසා මයා. (දකුණු කොළඹ දෙවන මන්ත්‍රී)

(திரு. பெர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு இரண்டாம் அங்கத்தவர்)

(Mr. Bernard Soysa—Second Colombo South)

Mr. Deputy-Chairman, at this late stage of the discussion of the Hon. Minister's votes, I have to recall certain subjects which are really within the province of the Hon. Minister and which have escaped the attention of the House so far because hon. Members have been preoccupied, to a very large extent, with the questions of dried fish, the C. W. E. and the rackets in co-operative societies. While I grant that these are all very important matters—the drier the fish, the greater the interest in it—I want to remind the Hon. Minister that he has certain other functions in regard to which changes are very necessary in the course of this year.

The first of these is the reform of company legislation. Our Companies Ordinance is woefully outmoded. It is in no way suited to the conditions which exist today. Since the Companies Ordinance was enacted, various changes have taken place in the capitalist structure of this country, and all kinds of commercial malpractices have become possible on account of the lacunae in company law.

අ. භා. 4.45

Since the formation of companies was recognized by law during the earliest period of the history of capitalism, and association for the purpose of conducting commercial and other functions for the sake of profit was made permissible and legitimate, the law in various countries has undergone changes in order to keep in line with the changes that have taken place in the structure of the business world. From that point of view, we are very sadly lagging behind. Apart from the large metropolitan centres that have changed their company legislation—the United States of America, the United Kingdom, Continental countries like Italy recently—other countries have followed suit. Australia's legislation is very up-to-date. India has followed Australia and has changed her company law in order to meet the requirements of the day. Our company legislation, however, still remains outmoded.

I know that the Hon. Minister has to his credit a large number of Acts of Parliament, adopted by Parliament during the last session, but company legislation is a field in which a great deal of reform is certainly necessary.

There is a valuable contribution on company law reform available to the Hon. Minister for the purpose of making the necessary changes. That is the report of the L. M. D. de Silva Commission. I mentioned this report when the House discussed the Insurance Corporation Bill, and I regretted the fact that this report is not available in print today. It is very difficult to lay one's hands on a copy of it. I would have expected the hon. Member for Wattala (Mr. Jayasinghe) to have a copy, but he does not have one. He has, very generously, volunteered to loan me a copy if I needed one.

The L. M. D. de Silva Commission not only submitted a report on that occasion but they even drafted the necessary legislation. They embodied draft bills in their report in respect of all the changes that were necessary. I am not in complete agreement with all the changes they recommended at that time. I do not happen to share the points of view of Mr. L. M. D. de Silva or of the members of that Commission. Nevertheless, there certainly is a large amount of very valuable material in that report.

I sometimes wonder whether the Ministry—not the Hon. Minister but the Ministry, as it has come down to us through various Governments—is in any way conscious of the existence of this report. When we put up memoranda to the successive Ministers of Trade and Commerce, they were completely unaware of the existence of this report. I am not blaming the officials of the Ministry. It may be that during the term of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

office of certain Ministers there were obstacles in the way of getting certain things implemented.

For instance, the important question of setting up an institute of accountancy in this country had a long and tragic history. The Right Hon. D. S. Senanayake in 1951 wanted to enact legislation for the purpose of establishing an institute of accountancy in the country. He did not live long enough to see that any steps were taken in the matter. The hon. Member for Dambadeniya (Mr. R. G. Senanayake), who was Minister of Commerce at that time, wanted to bring the necessary legislation. He went out of office. Mr. Shirley Corea succeeded him. He tabled a Bill, but went out of office. The Government of 1956, with the hon. Member for Dambadeniya once again as Minister of Trade and Commerce, did nothing for two years. Then the Hon. Minister discussed the Bill with various persons including myself, with the accountants and others interested in accountancy, and tabled the Bill. The Second Reading of that Bill was concluded in this House ; it passed the Committee stage, and was sent up to the Senate. Then Parliament was prorogued. It just managed to get through in 1959. The Hon. Minister of the Government of which the hon. Member for Galle (Mr. Dahanayake) was Prime Minister tried to get the necessary money voted by means of a Supplementary Estimate. Before that could be done Parliament was dissolved. Mr. M. D. Banda succeeded as Minister of the caretaker Government of the present Hon. Leader of the Opposition. He appointed a Board but before the Board could begin to function he went out of office.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

I will shelve it then.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I can well understand the Hon. Minister having grave fears when he thinks of the history that any person who handled this subject of accountancy met with some dreadful fate. There was a suggestion that there was some kind of hoodoo about it. I want to plead with the Hon. Minister not to allow himself in any way, even in this way, to be swayed by any superstitution in this matter.

There are some valuable steps that have to be taken to complete what has been done. The first of these is the restoration of the grant to the Institute of Accountancy. That Institute is doing some useful and valuable work, but it cannot produce the accountants the country needs. These Corporations and Boards that are coming up need the services of accountants. We are always complaining of the losses in various Boards and Corporations and we want to appoint a Select Committee of this House to go into this matter. If these Boards have really competent accountants to advise them from month to month in regard to their activities much of this waste and loss can be avoided.

We do not have enough expert accountants to serve on these Boards and Corporations and advise them. On the other hand we are thinking of the profession of accountancy on the old professional lines for the purpose of conducting a private practice—establishing themselves as Chartered Accountants with an office and staff and being engaged in private practice. I have no objection whatsoever to such persons as may succeed in the profession like that. I do not want to stand in their way or say anything or do anything that is likely to blast these delightful prospects that people envisage for themselves in this profession, but the scope for private practice is extremely limited. They cannot all go through a course in accountancy and set up in private practice.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

Those who go through a course in accountancy get themselves articled in a firm, study for a number of years, pass difficult examinations, obtain a licence and then set themselves up in private practice. There is no scope for all those who aspire to that place to obtain private practice. But there is a valuable and honoured place that can be given to them, and ought to be given to them, both in the private sector as well as the public sector—and what concerns us most is the public sector, in these Boards, Corporations and Government Departments. Why will you not have the services of qualified persons who can advise you ? How many Departments, how many Corporations, have anything like cost accounting that is continually necessary for the purpose of making a check in regard to the financial position of a particular institution ?

I know that Government Departments are supposed to have a system of internal audit. Some local authorities do have an internal audit. The various departments of the Colombo Municipal Council have an internal audit system. But that is not enough. Despite the existence of an internal audit there are a number of departments that waste money even in the Colombo Municipal Council. There is no regular costing in regard to various ventures that we are engaged in.

I will give the Hon. Minister an example. I know that under the Ministry of Agriculture and Lands comes the Department of Irrigation. you have a major public work started, say, the construction of a bund or something. It takes a number of years. Every year we are told that the Vote is exceeded in regard to matters of that kind. Sometimes the Vote is exceeded because the price of materials changes ; sometimes because labour costs have increased as a result of changes in the wage structure ; but sometimes the Vote is exceeded on account of sheer mismanagement and a failure to see that through these loopholes and mismanagement the cost to Government is increased. For instance, when you have to put up a structure you send part of the materials and do not send the other essential materials for beginning the work. The workers cannot work. They are paid every day. They are waiting there till the rest of the materials turn up. In the meantime the cost of the project increases.

If you have a regular accounting system this kind of thing that is passed off as a minor oversight on the part of somebody without due regard to the consequences in the enhancement of the costs, will not be allowed to happen. I am only giving a very minor and elementary example. I say that there is an honoured place that ought to be given to these accountants in our Boards, Corporations and Government Departments. For that purpose I say it is time now that we had a second Institute of Accountancy. All cannot hope to become members of the present Institute.

I know that the present Act under which we are operating allows for a second class of accountants. It is not good that you should have " first class " or " second class " in this business. You will always have a feeling of dissatisfaction among those who are put into the second category. It is therefore necessary to see that that kind of distinction is removed. You should have a parallel institute. You may have an institute of a lower standard to start with and gradually step up the standard until the two can merge at a future time as was done in Italy. But it is time that we had a second Institute of Accountancy and enable all those who have had some service in Government—in the Auditor-General's Department, the Income Tax Department and so on—who want to qualify, and others who have been doing auditing business and who are finding that their practice is now contracting, to qualify. Persons of that kind can qualify in this way and you will have an Institute that will enforce certain standards and see that the auditors and accountants are not engaged in the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

malpractice of helping various people to "cook" their books for the purpose of tax evasion and the like and to see that proper ethical standards are maintained in a profession like that. So let us have a second institute.

These matters have already been brought to the notice of the Hon. Minister and I know he is very sympathetic in the matter. It is necessary that he should get busy in the course of this year to see that something is done.

The third matter which I want to take up with the Hon. Minister is this question of the Insurance Corporation. I do not want to go into a detailed criticism of the appointments that have been made. Certainly there is one appointment about which various persons have expressed grievances both to me as well as to other Members, and that is a matter I would like to state publicly although I am not in any way desirous of criticising any particular officer. I will not mention the name but I would like the Hon. Minister to look into this question of how a particular person known as "Development Manager" came to be appointed and why he was appointed in that way. He is a person who has a dark history both in regard to his association with persons who were opposed to the setting up of the Corporation and in regard to his dealings with subordinates. It is unwise to give persons like that positions of responsibility. I am not asking you to shut him out completely. Perhaps his experience of insurance may be very useful but it is possible to make use of his experience without necessarily putting him in a position in which he may repeat certain offences that he has committed in the past.

I notice that the Hon. Minister has advertised for field organizers. Now, if the Hon. Minister will be so kind as to remember some of the things which were said in the Second Reading Debate here, these field organizers of the existing insurance companies were the target of attack by several Members. Why ? What do they do ? They get an overriding commission ; they organize other people's work ; the poor insurance agent and his sub-agents are the persons who toil for the purpose of getting policies, and the field organizers sitting above them all—some of them may be persons who have done some work——

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

They have served a period of apprenticeship as insurance agents.

අ. භා. 5.0

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Certainly they have served a period of apprenticeship as insurance agents. After they achieve the position of field organizers—they may also be doing some work in regard to the collection of policies—they get an overriding commission. They are persons who are drawing some income out of the work done by others, and, as such, these fields organizers have always been resented by the insurance agents, by those who have to work in the field in that way.

Now, we asked the Hon. Minister, we pleaded with him, in the structure of the new Insurance Corporation not to include field organizers, not to have these organizers in that way. I notice that the Corporation has decided otherwise and has advertised for organizers. They are to be paid an overriding commission. I have to plead with the Hon. Minister that if in its wisdom the Insurance Corporation decides that it is necessary to have these people in the Corporation, instead of paying them this commission in that way they be paid a regular, fixed salary. Then at least that antagonism between the insurance agent who collects the policy and the organizer who gets a commission on the policy obtained by somebody else will at least disappear. If he needs field organizers for the purpose of organizing the business of policy collection in any particular

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

area, well, let him have his organizers, but let that be done in such a way that the antagonism will disappear.

The other matter that I would wish to raise in regard to this Iusurance Corporation is the fate of the insurance agents, the agents of these various companies. Numbers of them have been dismissed and sent away and they are not being absorbed by the Corporation.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

You did not support the amendment that was brought to get this done.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

The amendment wanted it made absolutely obligatory on the part of the Hon. Minister that every person sent away must be taken in. Now, that was not an amendment which it was possible for us to support on that occasion for the very good reason that, all that an insurance company interested in sabotaging the new Corporation—and there were such persons too—had to do was to get rid of those persons whom it wanted to be introduced into the Corporation as saboteurs, and they would promptly have been absorbed by the Hon. Minister into his Corporation. We did not want to saddle the Hon. Minister's new venture with that kind of incubus, and for that reason we did not want to support that amendment. But certainly on the question that those who lose their jobs by virtue of the mere existence of the corporation, that it is taking away that volume of business from the insurance companies and therefore for that reason the business of the companies are contracting, and on the basis of that contraction they cannot continue to offer employment opportunities to such and such a number of persons, that those who are suffering on the basis of that contraction of the field of business of these companies should be absorbed by the Corporation, is a principle that we supported then and we support now.

The Hon. Minister did not envisage at that time some of the difficulties that might spring out of the interpretations of the Act. These insurance agents are not allowed to form a trade union on the ground that they do not come within the definition of "worker" or "employee" as contemplated by the Trade Unions Ordinance. Since the Hon. Acting Minister of Labour is here, I have to ask your permission, Mr. Chairman, to plead with him to see that the necessary amendment is brought early before this House in order to get persons who work on a commission basis brought within the definition of "employee" under the Trade Unions Ordinance. In the meantime these people cannot form a trade union. Secondly, the difficulty of interpretation of who is an employee comes up again in the interpretation under the Insurance Act. And that is the second difficulty about the amendment that the hon. Member for Wattala spoke about; and even if that amendment had been passed those poor people would have been left in exactly the same position.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

How? Will you demonstrate it?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I will demonstrate it to you. Unfortunately the hon. Member for Wattala and I cannot conduct a private debate of our own, but if the hon. Member would give me a few minutes I am prepared to demonstrate how it is so.

The Act contemplates the taking over of staff, and the Attorney-General has ruled that those employed on a commission basis as insurance agents do not belong to the category, "staff". They are not

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

employees. They are not staff. And the amendment which was brought by the hon. Member for Galle (Mr. W. Dahanayake), which is the amendment that the hon. Member for Wattala talked about so much, also contemplated the use of the words "employee" and "staff". Even if that amendment had been passed these poor agents would have been left in the same position where they are today. *Quod erat demonstrandum!*

Mr. Chairman, it is necessary that these persons' interests be looked after. While on the one side I have to plead with the Hon. Minister of Labour to get the Trade Union Ordinance amended to include these people within the definition of "employee", I have to plead with the Hon. Minister of Commerce, Trade, Food and Shipping, to amend the Insurance Corporation Act early to remove this infirmity that has been detected by the Attorney-General to enable relief to be given to these poor agents who are being sent away.

There are some of them who conducted their insurance activities as a sideline, something for the purpose of getting an additional income and enhancing the income they drew from other sources. But there are others who have made it their full-time occupation. There were persons who lived solely upon the earnings on insurance. Now, how are they placed ? Some of them have been taken over by the Hon. Minister's corporation ; some have been sent away or have left the Ceylon Insurance Company. Now, the Ceylon Insurance Company is not prepared to pay them the commission, the provident fund benefits and the like. They have gone to the Labour Department, and this department, even with the powers conferred upon them by the Insurance Corporation Act, is unable to give them their due. That is a matter I would ask the Hon. Minister to correct as soon as possible. It needs amending legislation, but unless that legislation is brought soon it will not be possible to give relief to these people.

I have also to plead with the Hon. Minister in regard to the composition of our Boards and Corporations. This is not a matter that concerns him alone. It might have been necessary to mention this when we discussed the Vote of the Hon. Minister of Industries, Home and Cultural Affairs. It might be necessary to mention it again when we discuss the Vote of the Hon. Minister of Labour and Nationalised Services after this. But I want to place this as a general proposition and the Hon. Minister concerned, including the Hon. Minister of Commerce, Trade, Food and Shipping and the Hon. Acting Minister of Labour and Nationalised Services, might seriously take this matter up with their Colleagues because it is a very serious matter.

When you select personnel for these boards and corporations I notice that the principle is adopted that it is necessary to have persons who would be loyal to the Government. It is possible to concede that you cannot work effectively with persons who may have different political affiliations. It may be that in regard to key persons such as, for instance, the Chairman, or General Manager, or somebody like that, it will be necessary to have persons in respect of whose political affiliation, or at least political thought, Government has complete command. But is it necessary to follow that principle in regard to every person on a board or corporation ? You have not even consistently followed it, because in regard to some of your appointments criticism has been made here that the persons concerned were followers of the party to which my good Friend the Member for Wattala (Mr. Jayasinghe) belongs, and that their position in some of these boards and corporations was comparable to the position of the Trojan Horse ; that this was their Trojan Horse.—[*Interruption.*]—I could talk about Robins or any other kind of bird that the hon. Member for Wattala wishes to discuss.

The position taken up by the Government on this matter is not at all clear. I stated that in regard to the working of corporations it is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

necessary first to see that you have people with the necessary know-how. Even though politically they are not 100 per cent in agreement with the Government of the day, if they are persons of integrity and character, if their integrity and character are beyond question, if they are persons with the necessary know-how, why do you not use them on your boards and corporations when they are willing to serve their country ? If you have to make political appointments because you want persons who are loyal to you, you may do so in regard to your key appointments, such as the Chairman, or General Manager, or somebody like that. But there are other persons who are necessary for the purpose of seeing that these boards and corporations function effectively. In order to choose those persons, it is not necessary to go into their politics. It is not necessary to regard the appointments to these boards and corporations as rewards given for loyalty. There are a number of efficient persons willing to serve their country, capable persons with the necessary know-how in various directions. Why do you not utilize their services ? We are not so rich in man-power and skilled labour in this country that we can afford to neglect the services of those who wish to serve the country with the necessary integrity and capability.

I know that the Hon. Minister is always willing to consider constructive suggestions in that way. But it is necessary that this matter should be looked at from the point of view of Government policy as a whole so that we do not shut out persons with the necessary ability and honesty who want to serve their country and who are capable of serving on these boards efficiently and well. Let us not shut them out. I do not want to mention any particular instance.

I know that this is happening everywhere today. I know, for instance, that it is happening over the appointments to posts in the Local Government Service. The Local Government Service Commission has a headache with regard to the appointment of the Municipal Engineer in Colombo. There are three officers with the necessary degree of seniority. In order of seniority they are the first three but all three are supposed to suffer from some infirmity which has nothing to do with engineering. One is a Tamil and therefore he is unacceptable. Another is a Catholic and therefore he is unacceptable. The third happens to have a father-in-law who was a member of the party to which the hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena) belongs, and therefore he is unacceptable. All this has nothing to do with engineering. I say that it is time we got away from these things. Let us see to it that, if a man is honest and capable and wants to serve his country, he is given the opportunity of serving his country.

අ. භා. 5.15

So much has been said about dry fish that I would be very seriously failing in my duty if I did not add my own quota to the dry fish debate. This is all I have to say. The Hon. Minister's wholesale establishment suffers from a lack of godowns. There is a dearth of storage space, and the C. W. E. is frantically in search of storage space all over. It has tried to commandeer various places and found that there is resistance. Now, may I make a suggestion ? The Ministry of Defence and External Affairs can easily come to the Hon. Minister's rescue. The Army has a large number of hangars which are not put to any use. It is the same kind of hangars that you use for your food stores in Dehiwala and Kalubowila. They are not necessary for the Army ; the Army does not use them. The Navy has a number of hangars ; the Navy does not use them. The Air Force has a number of them ; the Air Force does not use them. Why not make use of them ?

There is enough room within the precincts of the Colombo Port itself. There is enough land available for you to put up these hangars and use them as stores for storage. So, may

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I make this constructive suggestion to the Hon. Minister? If he will pursue it and see that something is done, he will not have to go round commandeering other people's premises. I have no objection to your taking over private property—we are all in favour of it—but that is not the solution. As it is you have a battle on your hands in regard to that matter.

Then the Hon. Minister must have his food stores. I know that he wants to buy dhal at a time when prices are low, that is, just as soon as the crop is harvested. Once he buys that dhal, he wants storage space. Now, there are two suggestions in regard to this matter which I wish to criticise. One suggestion is in regard to the site, namely, to bring these stores to the Anderson Golf Links at Narahenpita. I have privately pleaded with the Hon. Minister not to bring the stores there. I have raised it on an Adjournment Motion. If you bring the stores there, you will find all the rats following. The polongas will follow the rats. And all the racketeers—who are worse than the polongas and the rats—will try to enter into some kind of collusive business for the purpose of robbing the Hon. Minister of the goods he places in these stores. Do not bring these stores to that area. You will have about 4,000 lorries plying up and down. The entire area will be ruined from the point of view of all the residences, to whatever class they may belong. So, please do not bring these stores there.

There are other sites that can be used, if the Government will only use its imagination. I have to plead with the Government: why does it not use the canals that the Dutch built? It it allowing these canals to fall into desuetude. Why not use these canals and send your goods out? It is the cheapest form of water transport available. You do not have to spend on your oil to run your lorries. Send these stores into the wide open spaces outside the City of Colombo. There is ample space available elsewhere. You can use the canals that the Dutch built. Why have you allowed them to run down like this? The maintenance is not very high. If the maintenance was high, the Dutch would not have built them. Consult your Town Planner on the matter and see whether you cannot do something about it. In any case, wherever you site your food stores, all I have to say is: please do not bring them to the Anderson Links.

The second matter is this. The Hon. Minister has asked for tenders for the purpose of constructing food stores at a cost of Rs. 4½ million. I do not know whether I am right in this matter. They are to be prefabricated buildings. I have to plead with the Hon. Minister to look a little more closely into this matter, because that expenditure may turn out to be wasteful unless it is properly supervised. The entire venture is likely to cost some Rs. 16 million, if prefab materials are to cost Rs. 4½ million. Tenders have been called for, I am told, already.

ගරු ද සොයිසා සිරිවර්ධන
(கௌரவ டி சொய்ஸா சிரிவர்தன)
(The Hon. de Zoysa Siriwardena)

All over the country.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

These are for some prinicpal stores, four principal centres that are to be used, I gather, and for that the Hon. Minister wants to spend this money. Now, Mr. Deputy-Chairman, since this is not a temporary venture in any way, while there may be something to be said for stores having to be removed from one place and re-erected in another, I think, it will be more economical from the point of view of the Government to have permanent buildings instead of prefabs. But if you want buildings of a temporary nature then use the hangars I mentioned earlier, those can be dismantled without much cost and erected without much cost. But if you want these stores to last over a period of time, and this is not just a venture that is to end within the lifetime of this Government but something to be handed over to others that

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

may come after, then why not consider a little more closely the value of permanent buildings over prefabs. You use local labour, you provide employment opportunities here ; you do all those things if you think of permanent structures. I do not know how the time factor comes into the matter but in regard to that I have already made a suggestion to the Hon. Minister if he wants something in order to tide over the immediate difficulty.

The last matter I want to mention is in regard to the Marketing Department. It is not a criticism of the department, it is only in relation to the marketing activities of the Marketing Department in so far as they can possibly have a bearing upon the local authority in Colombo. Mr. Deputy-Chairman, the management of the market stalls by the Colombo Municipal Council has been a source of criticism over the years. One Bribery Commissioner, the late Mr. M. W. H. de Silva, made special mention of the fact that the allocation of market stalls in the markets of the City of Colombo, managed by the Colombo Municipal Council, provided the most potent source of corruption in local government in the city.

The allocation of stalls was done according to certain rules and those rules have changed from time to time according to various Councils and some of these matters have been determined by the vote. For instance, there was a rule that the next-of-kin should get the market stall when the allottee died. However, I would have thought that the question of how to decide who the next-of-kin was a matter of fact, but no, Sir, the next-of-kin was decided by a vote in Council by a show of hands ; it was decided that so-and-so was the next-of-kin. Now, Mr. Deputy-Chairman, I have to state that the Hon. Minister should see to it that either the Marketing Department expands its activities or enable the Marketing Department to be the principal source of supplier to the Colombo Municipal Council for the purpose of municipal trading of this reason.

We have fought the tender system in the allocation of stalls and we have failed time and again ; we have fought and we have failed. When the matter is about to be completed the group to which the hon. Member for Wattala belongs sabotages the tender motion somehow or other.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

Let the hon. Member talk about that in the Municipal Council.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I am talking on the Hon. Minister's Votes. If the hon. Member for Wattala does not have the intelligence——

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

He can talk about that in the Municipal Council.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

Order, please !

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I am unable to supply any gaps in the vision of the hon. Member for Wattala in these matters. I can quite understand his resentment at any criticism made against his party but I am only stating the fact. If you look through the history of this tender motion in the Municipal Council you will find that his party has always been blamed in the matter.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

Confine yourself to the Minister's Votes. Why talk about that on the Hon. Minister's Votes ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

The hon. Member for Wattala would understand, if he has not learnt it before I hope he will learn it now, that I make my speech according to the way I like to speak and not according to what he wants me to speak. I have to plead with the Hon. Minister, therefore, to expand the activities of the Marketing Department in order to come to the rescue of the consumer in Colombo. He is now at the mercy of a number of market mudalalis who are in the stall allocation racket; they are the source of corruption of municipal politics. We have to do away with this once and for all; if you cannot succeed on the local government side by introducing the tender system then let the Marketing Department come in. I am not stating that we must take over the entire trading of the Marketing Department, I am not stating that. But today you have exploitation by a number of middlemen from the village right down to the *gala* and the stall itself, a number of middlemen are exploiting the two ends, the producer and the consumer; the producer in the village and the consumer in the city, both are exploited by an unconscionable number of middlemen in between. That is what the municipal trading amounts to today.

Now that has to be broken in some way and the instrument is in your hands, the Marketing Department. I say let the Marketing Department be the sole supplier at least so that the peasant who produces the vegetables may be protected at that end and the consumer in Colombo may be protected at this end in regard to prices. Today, both are exploited by a number of middlemen. Some of them may be honest people, honest persons, but a large number of them constitute a board of evil parasites. In order, therefore, to abolish this parasitism I have to ask the Hon. Minister to expand the activities of the Marketing Department suitably to meet this measure.

I hope the relevance of this argument as well as the benefit that may be derived by the Colombo consumer will penetrate the intelligence of the hon. Member for Wattala. Mr. Deputy-Chairman, I have to plead with the Hon. Minister to give his mind to these matters in the course of the coming year and to see to it that some of these things are done before he hands over the reins of office.

ටී. විලියම් ප්‍රනාන්දු මයා. (නුවරඑළිය)

(திரு. ரி. வில்லியம் பெர்ணாண்டோ—நுவரெலிய)

(Mr. T. William Fernando—Nuwara Eliya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතෙක් වේලා විවාදයට භාජන වූ මෙම ඇමති අංශයට වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය රුපියල් 28,15,43,866 යි. මා කම්කරු පංතියට අයත් කෙනෙක්. මේසා විශාල මුදලක් මේ අමාත්‍යාංශයට වෙන් කර තිබෙන්නේ කම්කරු පංතියේත් ගොවි ජනතාවගේත් අනෙක් අසරණ ජනතාවගේත් මුදල් එකතු කර ගැනීමෙන් බව සඳහන් කරන්නේ ආඩම්බරයෙන්. කොටින්ම කියතොත්, පිං පඩි ලබන්නවුන් පවා මේ මුදලට සම්මාදම් වී සිටිනවා. දුක් විඳින ජනතාව දුකසේ උපයා ගත්, අමාරුවෙන් හම්බ කර ගත්, මුදල් එකතු කරලයි, මේ අමාත්‍යාංශයට මේ තරම් මුදලක් වෙන් කර තිබෙන්නේ. එවැනි මුදල්වලින් වැඩ කිරීමට යෑමේදී ඉතා අරපරිස්සමින් සූක්ෂ්ම අන්දමට නියම ප්‍රයෝජනයක් ලැබෙන අන්දමට එම මුදල් යෙදවිය යුතු බව පළමුවෙන්ම ගරු ඇමතිතුමාටත්, නිල ධාරී මණ්ඩලයටත්, බැගෑපත්ව මතක් කිරීමට කැමතියි. ජාතියේ ජීවය රඳා පවත්නේ වියදම් කිරීම සඳහා වෙන් කර තිබෙන මෙම මුදල උඩයි; එම මුදල් වියදම් කරන ආකාරය උඩයි. එහෙයින් විදේශිකයන් සතු වෙළඳාම සවදේශිකයන් අතට පත් කර හෝ වේවා, සංයුක්ත මණ්ඩල මාර්ගයෙන් හෝ වේවා, නිස්කාරණයේ වියදම් වන සෑම සතයක්ම ඉතිරි කර ගැනීමට ගරු ඇමතිතුමා ක්‍රියා කරනවා ඇතැයි අද දින මුළු ජාතියම බලාගෙන සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. විලියම් ප්‍රනාන්දු මයා.]

මීට ඉහත තිබුණු ආණ්ඩුවේ කම්කරු ඇමති ධුරය මෙම ගරු ඇමතිතුමාට ලැබී තිබුණා. ඒ කාලයේදී කම්කරු ජනතාව සඳහා අර්ථසාධක අරමුදල් ක්‍රමයක් ඇති කිරීමෙන් ඒ වැඩ කරන ජනතාවගේ ප්‍රසාදය දිනා ගැනීමට එතුමාට පුළුවන් වුණා. තමුන්නාන්සේ ලිපිකරුවකු වශයෙන් සිටියදී දුප්පත් සේවක සහෝදරයන්ගේ ඒ උග්‍ර සටනේ පෙරමුණ ගැනීමේ විපාකයක් වශයෙන් එදා තිබුණු ධනපති ආණ්ඩුව විසින් තමුන්නාන්සේට පහර ගසා අයින් කර දමන්ට යෙදුනා. නියම සමාජවාදී නියම ජනසම්මතවාදී අදහස් මුදුන්පත් කර ගැනීමට යෑමේ විපාකයක් වශයෙන් එවැනි ප්‍රතිඵල ලැබීමට සිදු වූ තමුන්නාන්සේට ඊට පසු සෙංකඩගල ඓතිහාසික රාජධානියේ ගරු මන්ත්‍රීවරයා වශයෙන් තේරී පත් වන්ට පුළුවන් වුණා. සෙංකඩගල මහජනතාව විසින් එහි මන්ත්‍රීවරයා වශයෙන් තමුන්නාන්සේ තෝරා ගන්නට යෙදුණා.

එතෙක් මෙතෙක් කරගෙන එන්නා වූ මේ සමාජවාදී ගමන දෙස මහජනතාව ප්‍රසාදයෙන් බලා සිටිනවා. යම් යම් අය විසින් තමුන්නාන්සේට ලැබෙන්නට යන මල් මාලා වෙනුවට ගල් පහරවල් ලබා දෙන්නට උපක්‍රම යොදාගෙන යන බව පෙනෙනවා. අද මේ ගල් පහරවල් ලැබුණත් මේ වැඩ ක්‍රියාත්මක වීමේදී තමුන්නාන්සේට මල් මාල පළඳනවා ඇති. ඒ අවස්ථාව වැඩි කල් නොගොස් එන බව කියන්න කැමතියි. ගරු අවිස්සාවේල්ලේ මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) තව ටිකක් සිටිනවා නම් හොඳයි. තමුන්නාන්සේ ඉදිරිපත් කළ චෝදනා කිපයක් ගැන කියා දෙන්න තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

ඒ මන්ත්‍රීතුමා ගිහින් ඉක්මනින් එනවලු.

අ. භා. 5.30

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

ආහාර බෙදා හැරීම පිළිබඳව පුළුල් වැඩ පිළිවෙළක් තමුන්නාන්සේ විසින් යොදන්නට යන බව අද දින විවාදයේදී පළමුවෙන් මට තමුන්නාන්සේගෙන් දැන ගන්න ලැබුණා. කොළඹ පමණක් නොව අන් නගරවලත් සෑම ආහාර ද්‍රව්‍යයක්ම වගේ ගබඩා කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්න යන බව මට දැන ගන්න ලැබුණා. එය ප්‍රසංශනීයයි. මීට කලින් ඒ විධියේ වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. නැවක් ප්‍රමාද වුණොත් හෝ ගංවතුරකින් යම් විනාශයක් වුණොත් හෝ සුළු වැඩ වර්ජනයක් ඇති වුණොත් හෝ පිට පළාත්වල ජනතාවට කුස ගින්නේ සිටින්න මෙතෙක් සිදු වුණා. ඒ වගේ අවස්ථා එමට ඇති වුණා. ලංකාවේ සෑම නගරවලම ඒ විධියේ ගබඩා ඇති කිරීමෙන් කොළඹට එන නැව් වරායේ පමා නොකර, ඉක්මනින් එම නැව්වලින් බඩු බාගෙන පිටපළාත්වල තිබෙන ගබඩාවල තැන්පත් කරන්න පුළුවනි. ඒ ක්‍රමයෙන් පිටකොටුවේ තද බදයත් අඩු කරන්න පුළුවනි. ඒ ව්‍යාපාරය අනුව සුළු වෙළෙන්දන්ට බඩු බෙදා දී මහජනයාට සාධාරණ මිළකට ඒවා ලබා දෙන්නත් පුළුවනි. අපේ ගරු වෙළෙඳ ඇමතිතුමා වෙළඳ ව්‍යාපාරිකයන්ගේ හතුරකු බව වැඩි දෙනා කියනවා. එහෙත් මේ සැලැස්ම ක්‍රියාත්මක වුණාට පසු එතුමා ඒ අයගේ කල්‍යාණ මිත්‍රයකු වන බව ප්‍රකාශ කරන්න කැමතියි. බොහෝ සුළු වෙළෙන්දන් බඩු ගැනීමට කොළඹ ආවාම ඔවුන් ගන්න බඩු ප්‍රමාණයට වඩා අමතර බඩුවක් දමා මුදල් වැඩි කිරීම තොග වෙළෙන්දන්ගේ සිරිතක්. මේ සැලැස්ම උඩ වැඩ පිළිවෙළ ඇති කිරීමෙන් පසු ඒ ක්‍රමය අහෝසි වෙනවා. අවංක දේශ ප්‍රේමීන් සේවයට ඇතුළු කර ගෙන සමුපකාර තොග වෙළඳායතනයේ ගබඩා රට පුරා ඇති කර නියම අන්දමට බඩු බෙදා හැරීමට කටයුතු සැලැස්සුවොත් සුළු වෙළෙන්දන් තමුන්නාන්සේව ගැළ වුම්කාරයකු හැටියට පිළිගන්නවා ඇති. මේ ගෙන යන්න අදහස් කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට මේ රටේ ජනතාව ප්‍රබෝධවත් වෙනවා ඇති. දැනට මේ ගෙන යන වැඩ පිළිවෙළ කඩාකප්පල් කර දැමීමට වෙළෙන්දන් විසින් නොයෙක් ප්‍රයෝගකාරී ක්‍රම අනුගමනය කරනවා. බඩු ගෙන යන්නේ නැතිව කඩ බක්කි වසා දමනවා. වෙළඳ ව්‍යාපාරිකයන් කටයුතු කරන්නේ එක්තරා කුලයකට හිමි පිරිසක් හැටියටයි. ඒ අයගෙන් වැඩ සංඛ්‍යාවක් තමන් එක් සත් ජාතික පක්ෂයේ ය කීම මහා උදාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කමක්, නම්බුවක් හැටියට සලකනවා. පසු ගිය මැතිවරණයේදී ඒක හොඳහැටි විදහා පෑවා. ඒ කාලයේදී වෙළෙන්දන්ගෙන් සියයට දහ දෙනෙක් වත් නිල් කොඩි දැම්මේ නැහැ. වැඩි වශයෙන්ම ඔවුන් දමා තිබුණේ කොළපාට කොඩියි. රතු කොඩි නම් ඔවුන් කවදාවත්ම දමන්නේ නැහැ. ධනේශ්වර ගතිය ඒකෙන්ම පෙනී යනවා. තමන් එක්සත් ජාතික පක්ෂයේ යයි කියා පෙන්වීම මහා උදාරකමක් ලෙස සලකා ගෙන ඒ ව්‍යාපාරිකයන් දැන් කරගෙන යන්නේ අපේ ව්‍යාපාර කඩා කප්පල් කිරීමයි. එසේ නැති නම් මහජනයා රජය කෙරෙහි කලකිරවා රජය අප්‍රසාදයට භාජන කිරීමයි. නොයෙක් තැන්වලින් ලබාගත හැකිව තිබෙන බඩු ගෙන ඒවා මහජනයාට විකුණන්නේ නැතිව අද මේ ව්‍යාපාරික යන් ප්‍රචාරක අංශයක් ලෙස කටයුතු කර ගෙන යනවා. නොයෙකුත් අසාධාරණ පිළි වෙළට බඩු විකුණා උපයාගත් මහත් ධන සම්භාරයක් ඇති නිසා ඒ ව්‍යාපාරිකයන්ට මාසයක් දෙකක් නොව අවුරුද්දක් හමා රක් වුවත් බඩු නොවිකුණා මහජනයා පීඩා වට පත් කරන්න පුළුවනි. සමහර විට එසේ කරනුයේ ඊළඟ මැතිවරණයේදී බලය අල්ලාගැනීමේ බලාපොරොත්තුවෙන් වෙන්න ඇති. "වැඩි කාලයක් මේ ආණ්ඩුව තියෙන්නේ නැත, නුඹලා පත් කළ ආණ්ඩුව දැන් නුඹලාටම තට්ටු කරනවාය, බඩු ගෙනැවිත් අප විකුණන්නේ කොහොමද, නුඹලාගේ ආණ්ඩුව තමයි, මේවා කරන්නේ", යනාදි දේ කියා ඒවා උපයෝගී කරගෙන මේ ආණ්ඩුව කෙරෙහි මහජනයා කලකිරවා තමන්ගේ බලය තහවුරු කර ගැනීමේ වැඩ පිළිවෙලකුයි, ඔවුන් යොදා ගෙන යන්නේ. එයින් පීඩාවට පත් වන්නේ අසරණ පාරිභෝගිකයනුයි. එම නිසා ඒ සඳහා යුහුසුළුව ආණ්ඩුව විසින් වැඩ පිළිවෙලක් යෙදිය යුතුයි. ගිනිපෙට්ටි නියම අන්දමට බෙදා නොදෙන, කරවල ගැනීමට තිබියදී නොගෙන කරවල නැතැයි කියන, බඩු වසන් කරන, එසේ කොට මහජනයාට පීඩා ගෙන දෙන ඒ ව්‍යාපාරිකයින් අද මහා භයානක උවදුරක් වී තිබෙනවා. ඔවුන්ට බලවත් පහරක් වැදුන නිසා ඔවුන් අද මහා මාරක සටනකුයි ගෙන යන්නේ. අපේ ආහාර ඇමතිතුමා මහත් වීරවික්‍රම ලීලාවකින් සටන් ඇරඹුවේ ඒ මහත් ධනේශ්වර පන්තියට විරුද්ධවයි. එතුමා තෙල් සංයුක්ත මණ්ඩලයක් පිහිටුවීමෙන් කළේ එසේ මෙසේ වැඩක් නොවෙයි. මුළු ලෝකයේම සිටින බලවතුන් පවා තමන් අතට ගත හැකි තරම් අති මහත් ධනේශ්වර පන්තියක් සතුවයි ඒ වෙළඳාම පවතින්නේ. ඒ නිසා ඔවුන් අද නිකම් ඉන්නේ නැහැ. ඔවුන් ආණ්ඩුවට ප්‍රතිවිරුද්ධ පක්ෂයට ඒ නිසා සහයෝගය දෙන්න සූදානම්. ඔවුන්ට කෝටි ගණනක් වුවත් මුදල් වියදම් කළ හැකියි.

කරවල ගෙන්වීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන්ද අපේ ඇමතිතුමා ගත්තේ අනභිභවනීය පියවරකුයි. කරවල ගෙන්වීමේ ව්‍යාපාරයෙහි යෙදී සිටියවුන් තම ව්‍යාපාරය ගෙන ගියේ දෙපැත්තකින්ම විශාල ආදායමක් උපදින ක්‍රමයකටයි. ඔවුන් මේ රටෙන් මුදල් යවන රහස් ක්‍රම තිබුණා. ඒ අනුව ඔවුන් කෝටි ගණනක් ධනස්කන්ධය උපයා ගත්තා. ඒ වාගේම මෙරට මුදල් සම්භාරයක්ද පිට රට යැව්වා. කරවල හොණ්ඩරයක් ගෙන්වීමේදී එහි වටිනාකම මෙන් තුන් හතර ගුණයක් මුදල් ඔවුන් පිට රට යැව්වා. එසේ යවා කරවල සමග එවන වැලි, පැදුරු කැබලි ආදියටත් ගණන් එකතු කළා. ලක්ෂ 10ක් වටිනා බඩු තොගයක් මෙගොඩට ගෙන්වුවහොත් ඔවුන් ලක්ෂ 150ක් එගොඩ යවනවා. වැඩි පුර එහි යන මුදල්වලට මෙහි මුදල් හුවමාරු කරනවා. විශේෂයෙන්ම ඉන්දියානු ජාතිකයින්ට දැන් වෙනත් විධියකින් මුදල් යැවීමට බැරිව තිබෙනවා. ඒ නිසා ඔවුන් මේ ක්‍රමය උපයෝගී කරගෙනයි තම රටට මුදල් යවන්නේ. ඒ විදේශිකයින් මුදල් පිටරට යැවීමට ඒජන්ත වශයෙන් පත් කර සිටින්නේ කරවල මුදලාලියි. ඔහුට මෙහිදී රුපියල් 3,000ක් දුන්නොත් පොල් ගෙඩි 3ක් දෙන්න යයි ඒ රටේ සිටින අනෙක් මුදලාලිට තුණ්ඩුවක් යවනවා. ඒ තුන්ඩුවේ ඇත්තේ පොල් ගෙඩි 3 යි කියා වුවත් එය ඒ රටට ගිය විට ඔහුට රුපියල් 3,000ක් ලැබෙනවා. හැබැයි කරවල මුදලාලි මෙහිදී ඊට ලොකු කොමිස් මුදලක් අය කර ගන්නවා. තවත් සමහර විට තුණ්ඩු කැල්ල දෙන්නේ දෙල් ගෙඩි 2 යි කියායි. මේ මුදල් හුවමාරුවට ඔවුන්ට රහස් 'කෝඩ්' එකක් තිබෙනවා. කරවලවලට වැඩිපුර මිල යොදා එසේ මුදල් පිටරට හරින අතර තවත් නොයෙකුත් විෂම දේත් මොවුන් කරනවා. මේ රටට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

හොර රහසින් අඹින් ගෙන්වනවා. මේ රටෙන් නොයෙක් විධියේ දේ ඒ රටට යවනවා. මෙතරම් බලවත් ව්‍යාපාරයක් අතට ගැනීම සඳහා අපේ ගරු ආහාර ඇමතිතුමා ඉතා ප්‍රබල දස මහා යෝධයකු මෙන් පෙරමුණ ගෙන වීරවික්‍රමාන්විත ලෙස ඒ සටන මෙහෙයවා, නොයෙකුත් විධියේ බලහත්කාරකම්වලටත් නොයෙකුත් විධියේ බලවේගයන්ටත් වසඟ නොවී, නොයෙක් විධියේ අපහාස අසමින් ඒ සියල්ලක්ම ඉවසා දරාගෙන, ජාතියේ ඉදිරි ගමන සඳහා තම ජීවිතය වුවත් කැප කිරීමට සූදානමකින් යුතුව කටයුතු කිරීමෙනුයි, අද යම් කිසි ක්‍රමයක් සලස්වා තිබෙන්නේ. ප්‍රබල කෝටිපති විදේශීය ධනේශ්වරයන්ගේ බලය බිඳ දැමීම සඳහා දශමහා යෝධයන්ගෙන් යුක්ත වූ බල සම්පන්න යුද්ධ හමුදාවක් වැනි ඒ මණ්ඩලයේ අය ගත් පියවර ගැන මා මේ අවස්ථාවේ ඒ මණ්ඩලය වෙත මගේ අවංක ස්තුතිය පුද කරනවා. කරවල පාරිභෝගිකයන් වෙනුවෙන් ඒ මණ්ඩලයට අපේ හෘදයංගම ස්තුතිය පිරිනැමිය යුතුයි. කොයි තරම් උනන්දුවකින් සහ උත්සාහයකින් කටයුතු කරගෙන ගියත් අවුරුදු ගණනක් තිස්සේ කරන ලද අකට යුත්තක් එක් සතියකින්ම නැති කර සම්පූර්ණයෙන් පිරිසිදු කිරීම පහසු දෙයක් නොවෙයි. අංග සම්පූර්ණ වැඩ පිළිවෙළක් ඇති කරන්න පුළුවන් වන්නේ එක්තරා කාල සීමාවක් තුළ ක්‍රමානුකූල ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමේදී ලැබෙන අත්දැකීම් අනුවයි. මීට පෙර ආහාර ඇමතිවරු වශයෙන් සිටි ගරු මන්ත්‍රීතුමා එදා මේ සම්බන්ධයෙන් යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කර තිබුණා නම්, බඩු ගබඩා කරන්නටත් බෙදා හරින්නටත් ක්‍රියා මාර්ගයක් සකස් කර තිබුණා නම්, අද වර්තමාන ඇමතිතුමාට මේ කටයුත්ත වඩාත් ලක්ෂණට කරගෙන යන්න තිබුණා. එහෙත් දැන් ඊට වුවමනා කරන අඩිතාලම දමා තිබෙන නිසා, තාවකාලික වශයෙන් තරමක කරදරයක් හිරිහැරයක් විඳින්ට සිදු විය හැකි වුවත්, යම් යම් ප්‍රමාදයන් ඇති විය හැකි වුවත්, වැඩි කල් නොගොස් සහනයක් ලැබෙන ක්‍රියා මාර්ගයක් සකස් කර ක්‍රියාත්මක කරගෙන යන බව දැන ගන්ට ලැබීම නිසා මහජනයා ඉවසීමෙන් යුක්තව කටයුතු කරනවාට සැකයක් නැහැ.

මෙතෙක් කල් පෞද්ගලික ව්‍යාපාරික යන් අපේ මුදල් සූරා ගත්තේ මේ විධියටය, මින් පසුව ඒ තත්ත්වයෙන් අප ගළවා ගන්නවා ඇත, යන හැඟීමක් ඇති කර ගන්ට පුළුවන් වීම කාටත් සහනයක්. මෙච්චර කල් අපේ රටේ මුදල් සම්භාරයක් නොයෙක් ක්‍රමවලින් එගොඩ කළ අයට ඉදිරියට එසේ කරන්න ඉඩ ලැබෙන්නෙ නැහැ. අප මෙතෙක් කල් මුළා වී සිටියේ ඔය විධියටයි; නමුත් මින් ඉදිරියට නියම තත්ත්වය අවබෝධ කරගෙන වැඩ කරන නිසා අප නැවතත් ඒ අවදානම් තත්ත්වයට වැටෙන්නෙ නැහැ, යන හැඟීමක් ඇති කරන්ට පුළුවන් වෙනවා. තමුන්නාන්සේට පමණක් නොවෙයි, තමුන්නාන්සේගේ ඒ උදාරතර ව්‍යාපාරයේ යෙදී සිටින සත්පුරුෂයන්ටත් මෙලොව වශයෙන් පමණක් නොව පරලොවත් සෙතක්ම සිදු වෙනවා ඇති. ඒකාන්තයෙන්ම දෙලොවම වැඩ සිද්ධ වෙනවා නියතයි. ඒ ගැන අප කාටවත් බිය වෙන්න වුවමනාවක් නැහැ. තමුන්නාන්සේට ඇමති මණ්ඩලයෙන් පමණක් නොව පිටුපස ආසනවල සිටින අප සියලු දෙනාගෙනුත් මේ සමාජවාදී ගමනෙහිදී මුණ ගැහෙන සියලුම ගල් පර්වත ආදිය පෙරළා දමා, කටු කම්බි ගළවා දමා, වසවර්ති මාරයන් වැනි ප්‍රතිගාමීන් අයින් කර ගැනීමට හැම විටම හැම උපකාරයක්ම ලැබෙනවා. තමුන්නාන්සේගේ මේ සද්ව්‍යාපාරයට ජාතිහිතෛෂී, දේශානුරාගී, දේශප්‍රේමී හැම දෙනාගේම සහයෝගය ලැබෙන බව සහතික කර කියන අතරම මගේ කථාව අවසන් කරන්ට පෙර මගේ දැනුමේ හැටියට තවත් වැදගත් කරුණු කීපයක් පමණක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

නගරවල බඩු ගබඩා ඇති කිරීම අත්‍යවශ්‍යයි; කාලෝචිතයි. ඒ සම්බන්ධයෙන් වහ වහා කටයුතු කරන්න ඕනෑ. දුම්රියෙනුත් ලොරිවලිනුත් රටේ හැම නගරයකටම බඩු යවා වුවමනා තරම් ගබඩා කරන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලනවා. පෞද්ගලික වෙළෙන්දෝ ලොරිවලිනුත් වෑන්වලිනුත් බඩු ගෙන ගොස් බෙදා දී මුදලුත් එකතු කරගෙන යාමට වැඩ පිළිවෙළක් යොදා ගෙන තිබෙනවා. එවැනි වැඩ පිළිවෙළක් රජයෙනුත් යෙදිය යුතුයි. ගිනිපෙට්ටිත් කරවලත් වෙනත් අත්‍යවශ්‍ය දේවලුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැතැයි කියන්න ඉඩ නොදී සපයන්න වැඩ පිළිවෙළක් ඉතා ඉක්මනින් යොදන මෙන් කරුණාවෙන් ඉල්ලනවා.

මා නියෝජනය කරන නුවරඑළිය කොට්ඨාශය කලින් තිබුණු ආසන දෙක හමාරක් යා කිරීමෙන් හැදුණු එකක්. කොටගල, තලවකැලේ සහ නුවරඑළිය යනුවෙන් මන්ත්‍රීන් තුන් දෙනකු පෙනී සිටි ප්‍රදේශවලින් කොටස් එකතු වී නුවර එළිය ආසනය සෑදී තිබෙනවා. තලවකැලේ නගරයේ නොග වෙළඳ ආයතනයක් වහාම පිහිටුවන ලෙස ඉල්ලා සිටිනවා. බෝපත්තලාව, තලවකැලේ, කොටගල, වටගොඩ, ආදී ප්‍රදේශ සියල්ලක්ම සම්බන්ධ වී තිබෙන්නේ නුවරඑළිය ආසනය වසි. එක පැත්තකින් හැටින් නගරයටත්, අනෙක් පැත්තෙන් බණ්ඩාරවෙල නගරයටත්, මේ නුවරඑළිය ආසනය විහිදී ගොස් තිබෙනවා. එක පැත්තකින් හෝටින් තැන්න වන තෙක් යනවා. ව්‍යාපාරික යන්ගේ නොයෙකුත් කුට උපක්‍රමවලින් පාරිභෝගිකයන් මුදා ගැනීමට හැකිතාක් ඉක්මනින් සාධාරණ වැඩ පිළිවෙළක් යොදන්ට ඕනෑ.

අ. භා. 5.45

නුවරඑළියේ නිපදවන එලවලු ආරක්ෂා කරගන්ට ක්‍රමයක් සකස් කර ගත්තොත් විශාල මුදලක් ලබාගන්ට පුළුවන්. නුවර එළිය, කඳපොළ, වැලිමඩ ආදි ප්‍රදේශවල එලවලු ඉතා බහුල වශයෙන් නිපදවනවා. නමුත් බොහෝ විට ඒ භෝග නිපදවන්නට වෙහෙසෙන ගොවියාට ඒ වෙහෙස මහන්සියේ තරමට වත් මුදලක් ලැබෙන්නේ නැහැ. භෝග නැති කාලයට ඒ වායේ මිළ බොහෝම වැඩි වෙනවා. මේ මිළ විශාල පරතරයක් ඇති වන පරිදි වෙනස් වීම ඒකාන්තයෙන්ම නැති කර එලවලුවලට සථිර මිළක් ලබා ගැනීමට පුළුවන් තත්ත්වයක් ඇති කරන්ට ඕනෑ. නුවරඑළිය මධ්‍යස්ථානයක් වශයෙන් සලකා, එලවලු ආරක්ෂා කරන්ට පුළුවන් වායු සම්කරණය කරන ලද විශාල ගබඩාවක් එහි ඇති කොට අවට ප්‍රදේශවල එලවලු එම ගබඩාවට රැස් කර, ක්‍රමයෙන් මෙහි එවීමට වැඩ පිළිවෙළක් යෙදුවොත් එය ඉතා ප්‍රයෝජනවත් වෙනවා. එසේ කරනවා නම්, නිපදවන්නාටත් සැනසීමක් ලැබෙනවා; පාරිභෝගිකයාටත් සැනසීමක් ලැබෙනවා; මැදින් ඉදගෙන සුරා කන්නා නැති වෙනවා. තැන්පත් කරන එලවලු වුවමනා ප්‍රදේශවලට එවන්ට පුළුවන්. අද ඒ බඩු නිපදවන ප්‍රදේශවල ඒවා රැස් කර තැබීමට ස්ථානයක් නැහැ. ඒ බඩු එකතු කිරීමට යන ලොරි එලවලු සෑහෙන ප්‍රමාණයක් ලබා ගන්නේ නැහැ. එයින් බඩු නිපදවන තැනැත්තාට බොහෝ පාඩු විඳින්ට සිදු වෙනවා. බඩු ගෙන යාමට ලොරිය එන බව ආරංචි වූ විට එලවලු ගොවියෝ බීට්රූට්, කැරට් විශාල තොගයක් ගළවනවා. නමුත් රාත්තල් සියයකට දෙසියයකට වඩා ගන්නේ නැත කීවාම, අර නිෂ්පාදකයා ලොකු අමාරුවක වැටෙනවා.

පසුගිය සතියේ පාක් එස්ටේට් නමැති වත්තේ එවැනි සිද්ධියක් ඇති වුණා. බීට් රූට් එක්දාහක් පමණ ගළවා තිබුණ නමුත් දෙන්ට පුළුවන් වුණේ සවලපයයි. ඒවායින් කොළඹට ගෙන්වන්නේ සීමා සහිත ප්‍රමාණයක් පමණයි. එම නිසා සතියක් හෝ දෙකක් මේ එලවලු නරක් නොවී තබාගන්ට පුළුවන් ක්‍රමයක් සකස් කර බඩු අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් ඒවා අවශ්‍ය ප්‍රදේශවලට බෙදා දීමට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මම ඉල්ලා සිටිනවා. එලවලු දුම්රියෙන් අනුරාධපුරය වැනි ප්‍රදේශවලට යන විට කැඩී, තැළී, පොඩි වී, කුණු වී, බාගයක් අපතේ ගිහින්. ලොරිවලින් ඒවා ඉක්මනට යවන්ට සලස්වනවා නම්, එසේ අපතේ යෑමක් සිදු වන්නේ නැහැ. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව ඒ ගැන සැලකිල්ල යොමු කළ යුතු බව මම මතක් කරන්න කැමතියි.

නුවරඑළියේ ග්‍රීන් පීස් තියෙනවා, කෝසස් කන අයට මේ ග්‍රීන් පීස් ඕනෑ; අර්තාපල් ඕනෑ. ඕවා තියෙන්නේ ඒ පළාතේයි. අස්වැන්න තිබෙන කාලයේදී ඒවා තෝරා බේරා ටින් කර තබාගෙන අවාර කාලයට ප්‍රයෝජන ගන්ට ක්‍රමයක් යොදවන ලෙස මම ඉල්ලා සිටිනවා. බඩු සුලභ කාලයේදී ඒ වායේ මිළ බොහෝම පහළ බහිනවා. සම්පූර්ණයෙන්ම බඩු නැති කාලයේදී පාරිභෝගිකයන්ට අත පොවන්ටවත් බැරි තරම් ඒ බඩුවල මිළ ඉහළ නගිනවා. කොස් ඇට පැක් කරලා පිටරට යැව්වොත් අපට පිටරටින් විශාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

මුදලක් ලබා ගන්න පුළුවන්. වැළ වරකා පින් කර පිටරට යැව්වොත් එයිනුත් විශාල මුදලක් උපයා ගන්න පුළුවන්. කොස් ඇට අද අපේ කොස් ගස් යට අපතේ වීසි වී යනවා. යුරෝපීය ජාතික යන් කොස් ඇට කන්න බොහෝම සතුටු සි. මා කලින් රක්ෂාව කළ වත්තේ මහත්මයා සෑම සතියකටම කොස් ඇට සේරු දෙකක් ගෙන්වා ගත්තා. ඒ නිසා මම දන්නවා, යුරෝපීය මහත්වරුන් කොස් ඇටවලට කැමති බව. අපේ රටේ නොයෙකුත් විධියේ පළතුරු වර්ග අපතේ යන බව පේනවා. වැල ඉදිලා කපුටන් කොටලා සම්පූර්ණයෙන් විනාශ වෙලා යනවා. ඒවායේ යුෂ අරගෙන යම් යම් පානයන් සකස් කරන්නේ නැහැ. කොස් ඇට එකතු කර ප්‍රයෝජනය සඳහා තබා ගන්නෙත් නැහැ. වෙනත් ජාතියකට එහෙම ඔවැනි වරප්‍රසාදයක් ලැබී තිබුණා නම් ඔවුන් ඒ මගින් විශාල මුදල් සම්භාරයක් උපදවනවා ඇති. ඔවුන් ඒවා එකතු කොට නොයෙකුත් අන්දමේ කෑම වර්ග සාදා පිටරට යවනවා ඇති. ජම්බු, පේර, අඹ, දඹ වැනි වටිනා පළතුරු වර්ග අපේ රටේ තිබෙනවා. කැලෑවල දිවුල් වැවිලා අලින් පොඩි කර දමනවා. ඒවා එකතු කර නොයෙකුත් ආකාරයට සකස් කර පිටරට යවා මුදල් එකතු කර ගන්න පුළුවනි. ඒ ගැන සැලකිල්ල යොමු කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) පත්වීම් වගයක් සම්බන්ධයෙන් කෙරුණු දූෂණ ක්‍රියා කිපයක් ගැන කියන්න යෙදුණා. දැන් තියෙන්නේ ඒ කාරණය ගැන වචන සවලපයක් කියන්නයි. ඊයේ ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) කථා කරන අවස්ථාවේදීත් ඇමතිතුමාට මොකක් ද කිව්වා. මෙන්න මේ පැත්තෙ ඉන්න ඇමතිතුමකුගේ ඥාති සහෝදරයෙක්ද කොහේද තනතුරකට පත් කළාය කියා එතුමා කිවා. අදත් එතුමා එම විවේචනය කළා. අද මේ පැත්තේ සිටින වැඩබලන ඇමතිතුමකුගේ දරුවෙක් එක්තරා රක්ෂාවක් කරනවාය කියා ඒකටත් එක් දිනක් චෝදනා කළා. මන්ත්‍රීවරයකු වුණු පලියට තම හත්මුතු පරම්පරාවටම කිසි දෙයකට ඉදිරිපත් වන්න බැරි වන විධියේ අහෝසි කිරීමක් කරන්න පුළුවන්ද? බැහැ. මා පෙන්නුම් කරන්නම් අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා බලයේ සිටි කාලයේදී කරපු දෙයක්. මා මේ පෙන්නුම් කරන්න හදන්නේ එතුමා ආහාර ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ කළ දෙයක්. අවිස්සාවේල්ලේ—

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
හයියෙන් කියන්න.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

එතුමාගේ ඥාතිවරයෙක් හිටියා. අද නාරාහේන්පිට ගබඩාවේ ඉන්න ඩී. එස්. ගුණතිලක මහතායි, ඒ. එතුමා එක්කෝ පක්ෂයේ හිතවතකු වන්න පුළුවනි, එහෙම නැතිනම් ඥාතිවරයෙක් වන්න පුළුවනි. මොකක්හරි සම්බන්ධ කමක් ඇති. නැතිනම් මෙච්චර දුරට යන්නෙ නැහැ. ඔහු පළමුවෙන් සිටියේ බණ්ඩාරවෙල ගලෙන් බිදුණු වැවේ ගොවිපොළේයි. එතන සිටි කාලයේදී ඔහු යම්කිසි දූෂණ ක්‍රියාවක් කළා. එහි විපාකයක් වශයෙන් දඩුවම් විඳින්න සිදු වුණා. ලංකාවේ වී නිෂ්පාදනය අතින් ප්‍රයෝජනවත් වැඩ කොටසක් කළ, කුඹුරුවල වී වැපිරීම එහෙම කරන්න පුළුවන් ඇදගෙන යන යන්ත්‍රයක් නිපදවා තිබෙන, ජෝන් පිල්ලේ මහතා යටතේයි එදා ඔහු සේවය කළේ. ඔහු එතුමා යටතේ සේවය කළේ ගොවිකම් උපදෙශකයකු හැටියටයි. එදා ඔහු යම්කිසි වැරදි දූෂණ වැඩක් කිරීම නිසා ජෝන් පිල්ලේ මහතා විසින් නියම විධියට පරීක්ෂණයක් පවත්වන්න යෙදුණා. ඒ හේතුවෙන් එවකට එහි උප අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කළ එම්. සිවනන්දන් මහතා විසින් ඔහුට දඩුවම් දෙන්න යෙදුණා. නමුත් අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා ඇමති පදවියක් දරන කාලයේදී අර විධියේ දූෂණ ක්‍රියා කොට බැටකා සිටි පුද්ගලයකු අළුත් තනතුරක් පිහිටුවා එහි සේවය සඳහා තෝරා ගත්තා. නැතෙයි කියන්න බැහැ. මා ඔප්පු කරන්නම්.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

සම්පූර්ණයෙන්ම බොරුවක්. සම්පූර්ණ අසත්‍යයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)
නෑ. නෑ.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
මා ඒ ගැන කිසි දෙයක් දන්නෙ නැහැ. ඔය කඩදාසි මා ඇහින් දැක්කෙත් නැහැ.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)
තමුන්නාන්සේගේ කාලයේ—

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
වෙන්න පුළුවනි. මා දැක්කෙවත් නෑ—

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)
කෘෂිකර්ම අංශයේ—

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
නියෝජ්‍ය සභාපතිතුමනි, කරුණා කර අසත්‍ය දේ කියන්නේ නැතුව ඉන්නෙයි කියන්න.

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதி அக்கிராசனர்)
(Mr. Deputy-Chairman)
ගරු මන්ත්‍රීතුමා—

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)
මේකෙ සත්‍යයක් තිබෙනවා. මේක—

නියෝජ්‍ය සභාපතිතුමා
(பிரதி அக்கிராசனர்)
(Mr. Deputy-Chairman)
සත්‍යයක් නැති බව අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) ප්‍රකාශ කරනවා. කරුණා කර එය භාර ගන්න.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)
හොඳයි [බාධා කිරීම්] එවකට ගවන් මන්ච් ස්ටෝර්ස් එකෙන් එහාට [බාධා කිරීම්] නමුත් මේ සිද්ධිය කියන්න ඕනෑ. කවුරුන් විසින් හෝ වේවා එතුමාගේ කාලයේදී මොකද කළේ? ඒ දූෂණ කළ නිළධාරියා එතැනට තල්ලු කරගන්න විශෙෂ තනතුරක් ඇති කළා. මා අදහස් කරන හැටියට ගබඩාකරුවන්ගේ වෘත්තීය සංගම් අනූ ගණනක් වාගේ තිබෙනවා. ඔවුන්ගේ ඉල්ලීම් පවා ප්‍රතික්ෂෙප කර අන්තිමේදී අර විධියේ දූෂණ ක්‍රියා කර, ඒ වාට දඬුවම් පවා විඳ සිටි, පුද්ගලයකු කිසි ප්‍රසිද්ධ කිරීමක් නැතුව එතැනට තෝරා ගත්තා. අද ඔහු එම ස්ථානයේ ගබඩාකාර ධුරය දරනවා. එදා මෙම ඇමති ධුරයේ සිටි තැනැත්තා කවරකු හෝ වේවා, පිට රට ශිෂ්‍යත්වයකුත් ඔහුගේ බැණාට ලබා දුන්නා. ඒ ශිෂ්‍යත්වය උඩ අමෙරිකාවට ගොසින් දැන් දවස් 14 කට පමණ උඩදී නැවතත් ආපසු ඇවිත් වැඩ සිට ඉන්න වාලු. බඩු ගබඩා කිරීම පිළිබඳව කිසිම පුහුණුවක් නැතිව සිටි වෙල්, හේන්, කුඹුරු ආදිය ගොවිතැන් කිරීම පිළිබඳව උපදෙස් දෙන්නට පුරුදු වී සිටි මේ තැනැත්තා බඩු ගබඩා කිරීම පිළිබඳව පුහුණුවක් ලබා ගන්න අමෙරිකාවට ඇරියා. ගබඩාකරුවන්ගේ වෘත්තිය සමිතිය මීට විරෝධය පළ කළ නමුත් මේ උසස් වීමේ අවස්ථාව ඔවුන්ට ලැබුණේ නැහැ. වෘත්තිය සමිති අයිතිවාසිකම් පාගා දමා පිළිකන්නෙන් ගෙනවුත් මේ පුද්ගලයාව මෙතැනට දැම්මා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජෝන් පුල්ලේ මහතා රක්ෂා වෙන් ඉල්ලා අස්වීමේ ලිය කියවිලි භාර දුන් වේලාවේදී ගොවි ජනතාව කඳුළු හෙලමින් ඇඬුවා. එදා අර තැනැත්තාගේ බැණා පිස්සු බල්ලෙක් මිනිසකු පසු පස එලවන්නාක් මෙන් ජෝන් පුල්ලේ මහතාගේ පසු පස්සේ ගියා.

පේරාදෙණි විශ්ව විද්‍යාලයේ මහාචාර්ය වරුන් පවා මේ පළාතේ අර්තාපල් වගාව කරන්න බැරියයි කී අවධියේදී එහි වගාව ව්‍යාප්ත කරලීමට එවකට ආහාර ඇමති වරයාව සිටි සර් ඔලිවර් ගුණතිලක මහතාට බලවත් සහාය දෙමින් කටයුතු කළ තැනැත්තායි, මේ ජෝන් පුල්ලේ මහතා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் பிரதி அக்கிராசனர்)
(The Deputy-Chairman of Committees)

කරුණාකර නිශ්ශබ්ද වන්න. දැන් ගරු කථානායකතුමා අසුන් ගන්නවා ඇති.

අනතුරුව කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

If it is the Votes of the Ministry of Agriculture that we are discussing now, I have some comments to make.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

අල වගාව සම්බන්ධයෙන් ජෝන් පුල්ලේ මහතා එදා මොකද කළේ?

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

ඔය කාරණා සඳහන් කළ යුතුව තිබෙන්නේ කෘෂි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ යි.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

මෙම අමාත්‍යාංශය සාකච්ඡාවට භාජන වේවිද නැද්ද කියා කියන්න බැහැ. ඒ පැත්තෙන් ඉදිරිපත් කළ තර්කවලට පිළිතුරු වශයෙනුයි, මම ඒවා කියන්නෙ. ඒවාට පිළිතුරු නොදිය යුතු නම් මෙම කාරණා මෙම ගරු සභාවේ සඳහන් කළ යුතුව තිබුණේ නැහැ.

මේ මහතාට නොයෙක් විධියේ තාඩන පීඩනවලට භාජනය කළ නිසා තම මාතෘ භූමියට අවංක ලෙස සේවය කරන්න ඉඩක් නැති බව පෙනී ගිය පසු මොකද එතුමා කළේ? එදාම තම තනතුරෙන් ඉල්ලා අස් වීමේ ලිය කියවිලි භාර දුන්නා.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

ඔහු ලංකාවේ පුරවැසියෙක්ද නැතිනම් ඉන්දියානු පුරවැසියෙක්ද?

අ. භා. 6

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

ඔහු ලංකාවේ පුරවැසියෙක්. ගරු සභාපතිතුමනි, ඒ නිලධාරියාට කළ පාපකර්මයේ විපාකයක් වශයෙන් ඇමතිවරුන් දෙන්නෙක්ම වීසිවී ගියා. නුමුත් අර පුද්ගලයාට වාසනාවක් තිබුණා, ඊට පසුව කෘෂිකර්ම ඇමතිතුමාට කාරණා ඉදිරිපත් කරලා, ඒ ගැන පරීක්ෂණයක් ඇති කරවා, නැවතත් ඒ කටයුතු කරගෙන යන්න. අද ජෝන් පුල්ලේ මහතා අනුරාධපුර ප්‍රදේශයේ සේවය කරන බව මට දැනගන්ට ලැබී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ ජෝන් පුල්ලේ කියන නිලධාරියා අර්තාපල් වගාව සම්බන්ධයෙන් විශාල දැනීමක් ඇති පුද්ගලයකු පමණක් නොවෙයි, ඒ වගාවේ යෙදී සිටින ගොවියන් සමග සම්බන්ධකම් ඇති කරගෙන, ඔවුන්ගෙන් අර්තාපල් වගාව පිළිබඳව යම් යම් දේවල් ඉගෙන ගෙන, තමාගේ දැනීම වැඩි දියුණු කර ගැනීමට උත්සාහ දරා තිබෙන කෙනෙක්. මේ අන් දමින් ඒ නිලධාරියා විශාල පළපුරුද්දක් ලබා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, 1955 දී බෙකර්ස් පාම් කියන ස්ථානයේද 1910දී අල්බියන් කියන ස්ථානයේද, අර්තාපල් ඉතා සරු අන්දමින් වගා කර තිබුණා. මේ වගාව කොතරම් සරු අන්දමට කෙරුණාද යත්, ඒ පළාත්වල වැසියන්ට ඒ අයගේ අවශ්‍යතාවන් එයින් පිරිමසා ගන්න පුළුවන් වුණා. මේ ජෝන් පුල්ලේ මහතා ඒ උදවිය පෞද්ගලිකවම සොයා ගෙන ගොස් අර්තාපල් වගාව සම්බන්ධයෙන් කරුණු රාශියක් දැනගෙන තිබෙනවා. නමුත් මේ ආකාරයෙන් ඉතා උනන්දුවෙන්, උද්‌යෝගයෙන් යුක්තව කටයුතු කළ ඒ නිලධාරිතැනට අවසානයේදී නොයෙක් නොයෙක් අංශවලින් විදින්න සිදු වූ හිරිහැර කරදර නිසා එතෙක් ගෙන ගිය වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම අත්හිටවන්න සිඛ වුණා පමණක් නොවෙයි, අර්තාපල් වගාවද සම්පූර්ණයෙන් විනාශ වී ගියා.

මෙවැනි වැඩ පිළිවෙළකට වගකිව යුතු ගුණරත්න මහත්මයාට ඒ තත්ත්වයෙන් තම කටයුතු ගෙන යන්න පුළුවන් වුණා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පමණක් නොවෙයි—[බාධා කිරීම්] මේ හැර මාරගස්තොට අර්තාපල් ගොවිපළක් පිහිටුවණු ලැබුවා. මෙහි ඉතා සරුසාර අන් දමින් අර්තාපල් වැවුණා. නමුත් ඒ ගොවි පළ භාරව කටයුතු කිරීමට පත් කර එවූ නිලධාරියා කටයුතු කළේ කොයි ආකාරයට ද? එම ගොවිපළෙන් ලැබුණු විශාල අර්තා පල් තෝරා, ඒවා ඒ නිලධාරියා විසින් විකුණාගෙන, කුඩා අල ටික පමණක් දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්ට ඉදිරිපත් කළා. එපමණක් නොවෙයි, අර්තාපල් වගා වට රෝගයක් වැළඳී තිබෙනවාය, එනිසා මෙම වගාවෙන් ප්‍රයෝජනයක් නැත්තේ යයි මේ නිලධාරියා කියා තිබෙනවා. මේ නිසා එතෙක් සරුවට කරගෙන ආ අර්තා පල් වගාව නතර කර දැමීමට සිදු වුණා. ඒ අන්දමින් කටයුතු කළ ඒ නිලධාරියා අද ලොකු ධනපතියෙක් වෙලා. එමෙන්ම එදා ඒ ආකාරයට කටයුතු කළ නිලධාරියාට ඉන් පසුව දුන් තනතුර මොකක්ද? [බාධා කිරීම්].

ගරු සභාපතිතුමනි, එදා ඒ ගොවිපළ භාරව කටයුතු කර ඇත්තේ ඩබ්ලිව්. එච්. එස්. වික්‍රමසිංහ මහතායි. මේ ලිපියේ ඒ බව සඳහන් වෙනවා. මෙහි කියා තිබෙනවා එම ස්ථානය භාරව සිටි ඩබ්ලිව්. එච්. එස්. වික්‍රමසිංහ මහතා ඇතැම් පිරිසකුත් සමග ලොකු අල උගුල්ලා හොර කඩයට වික්කාය කියා. එපමණක් නොවෙයි, ඔහු ලොකු අල ඉතුරුව තිබෙද්දී පොඩි අල උගුල්ලනවා. ඒ ගොවිපළ වසා දමන්න හේතුවී තිබෙන්නේ ද මේ කාරණයයි. ඒ කාලයේ අර්තා පල් වගාවට දමන්න අලු හුණු ටොන් විස්සක් දුම්රියෙන් යවා තිබෙනවා. නමුත් ඒක හොරෙන් විකුණලා තිබෙනවා. ඒ වංචාව අසුවෙලා දඩත් ගහන්න සිදුවෙලා තිබෙනවා. නමුත් 1957 අවුරුද්දේදී මේ කපටි පුද්ගලයාට කෘෂිකර්ම ප්‍රචාරක තන තුරක් දීලා තිබෙනවා..

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

I should like to know whether we are discussing the Ministry of Agriculture or the Ministry of Commerce and Trade.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

But he is speaking about potatoes.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

He is speaking about the activities of the Ministry of Agriculture and its officers. I hope you will give me also a chance to reply, and I want at least an hour to reply to every one of those points.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

ගරු මන්ත්‍රීවරයා මේ වැය ශීර්ෂයට අදාළ කරුණු ගැන පමණක් කථා කරනවා නම් හොඳයි.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

ගරු සභාපතිතුමනි, මම මේ කථා කරන්නේ ආහාර ගැනයි. අර්තාපල්, පැල්පතේ සිටින දුප්පතාගේ ආහාරයට මෙන්ම පොහොසත් උදවියගේ කෝසස් ආහාරය දක්වාම ගන්නවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)

මේ දේවල් අදාළ වෙන්නේ නැහැ. කරුණා කර මෙයට අදාළ දේවල් ගැන පමණක් කථා කරන්න.

විලියම් ප්‍රනාන්දු මයා.
(திரு. வில்லியம் பெர்ணாண்டோ)
(Mr. William Fernando)

තවත් මේ සම්බන්ධයෙන් හුඟක් කාරණා කියන්න තිබෙනවා. නමුත් මම අනික් දවසේ ඒවා ගැන කථා කරනවා.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

ගරු සභාපතිතුමනි, මේ එක් එක් කාරණයක් ගැන පිළිතුරු දෙන්න මට අවසර දෙන්න ඕනෑ. සමහරවිට පැය දෙකක් පමණ ගත වෙන්න පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විලියම් ප්‍රනාන්දු මයා.

(திரு. வில்லியம் பெர்ணாண்டோ)

(Mr. William Fernando)

මා ළඟ ඔය හැම දෙනාගේම කේන්දර කොපි තියෙනවා. [බාධා කිරීම්]

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.

(திரு. டீ. பீ. ஆர். குணவர்தன)

(Mr. D. P. R. Gunawardena)

තමුන්නාන්සේ සේරම කිවත් මට ඇති කාරියක් නැහැ.

විලියම් ප්‍රනාන්දු මයා.

(திரு. வில்லியம் பெர்ணாண்டோ)

(Mr. William Fernando)

මමත් මේ ගුණසිංහ මහත්මයාගේ වෘත්තීය සංගමවල ඒ කාලේ බැට කමින් සිටි කෙනෙක්. වෝකර් සාප්පුවේ සිටියා, මොරටුවේ සිටියා, එදා බොහෝම අමාරුවෙන් තමයි, අපි සටන් කළේ. තමුන්නාන්සේව දේව දුතයෙක් හැටියට සළකගෙනයි, එදා අපි කටයුතු කළේ. [බාධා කිරීම්] මොකක්ද කිව්වේ?

සභාපතිතුමා

(அக்கிராசனர்)

(The Chairman)

බාධා කිරීම්වලට ඇහුම්කන් දෙන්න එපා. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.

(திரு. டீ. பீ. ஆர். குணவர்தன)

(Mr. D. P. R. Gunawardena)

මම පස්සෙ කියන්නම්. ගෙදර ගිහිල්ලා කියවන්න.

විලියම් ප්‍රනාන්දු මයා.

(திரு. வில்லியம் பெர்ணாண்டோ)

(Mr. William Fernando)

එදා එතුමා මට විරුඬව ඉදිරිපත් කළ අපෙක්ෂකයා අද නඩු හබවලට මැදි වී උසාවියට වී සිටිනවා. එදා මට විරුද්ධව දමා "මෙන්න අපේ මහජන එක්සත් පෙරමුණේ අපෙක්ෂකයා; තමුන්නාන්සේලාට වැඩ කරන්න පුළුවන් අපේක්ෂකයා; ඔහුට ඡන්දය දෙන්න; මේ කම්කරුවෙක් එතෙන්ට ගිහින් මොනවා කරන්නද," කියා කිව්වා. එහෙත් උන්නැහේගේ පක්ෂයෙන් දෙපාරක්ම ඉල්ලූ ඒ තලවාකැලේ සභාපති මහත්මයා අද උසාවියේ පෙනී සිටිනවා—

ගරු මන්ත්‍රීවරයෙක්

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

හොරෙක්ද?

විලියම් ප්‍රනාන්දු මයා.

(திரு. வில்லியம் பெர்ணாண்டோ)

(Mr. William Fernando)

හොරෙක් හින්දා නේන්නම් උසාවියෙ ඉන්නේ. ඔන්න මට විරුඬව තරඟ කරන්ට යෙදූ පුද්ගලයා.

සභාපතිතුමා

(அக்கிராசனர்)

(The Chairman)

ගරු මන්ත්‍රීතුමා කරුණා කර නිශ්ශබ්ද වන්න. ඔය කරුණ ගැන කථා කරන්න වුවමනා නැහැ. දැන් ඒ මහතා ගැන නඩුවක් තිබෙනවා. එය උසාවියට සම්බන්ධ දෙයක් නිසා, ඒ ගැන කථා කරන්න එපා.

විලියම් ප්‍රනාන්දු මයා.

(திரு. வில்லியம் பெர்ணாண்டோ)

(Mr. William Fernando)

හොඳයි, සභාපතිතුමනි, ඔන්න ඒකත් පැත්තකින් තිබ්බා.

ඔන්න ඔය විධියේ කුණු ගොඩවල් තමයි, තිබෙන්නෙ. මේවා අවුස්සන විට ගඳ ගහන්න පටන් ගන්නවා. අවුස්සන්න අවුස්සන්න ගඳ ගහන්න පටන් ගන්නවා. තමන් තුළ අවංක පවිත්‍ර භාවයක් තිබෙනවා නම්, අවංකව කථා කරන්න පුළුවනි. නමුත් කථා කරන්න බැහැ. ඔය විධියට තවත් බොහෝ සිද්ධීන් එතුමා ගැන ඉදිරිපත් කරන්න පුළුවනි.

"පෙරමුණ" කියා වෘත්තීය සමිති නිස් ගණනක් පමණ සංවිධානය වූ සංස්ථාවක් තිබෙනවා. පේරාදෙණියේ තිබෙන ඒ පෙරමුණේ නායකයාට මේ පිළිබඳව සම් පූර්ණ වශයෙන් කරුණු ඉදිරිපත් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවා. ඔය කරුණු සියල්ලම සූදානම් කරගෙන ඉදිරි කාලයේදී එතුමා සහ වෙනත් අයගේ යම් යම් කරුණු එළිදරව් කිරීමට කොමිෂන් සභාවක් ඉල්ලීමට අපි බලාපොරොත්තු වෙනවා. මෙම පෙරමුණේ සහෝදරයින්ට මම නිතරම කියා නිබෙනවා, අවංකව ඒ සියලුම තොරතුරු සපයා ගන්නය කියා. ඒ සියලුම කරුණු සපයාගෙන ඊට පසුව ප්‍රසිද්ධ කොමිෂන් සභාවක් මගින් මේවා ගැන සොයා බලන්න ඕනෑ. තමුන්නාන්සේ කළ දේත් අනික් අය කළ දේත් එවිට එළි දරව් වෙනවා ඇති. මේ විධියට මහජන මුදල් නාස්ති කරන්න දෙන්න බැහැ.

අපේ ආහාර ඇමතිතුමා යම් කිසි සමාජවාදී වැඩ කොටසක් දැනට ගෙන යනවා. ඒ වැඩ ක්‍රියාත්මක වන විට, ඒ සැලසුම්වල මල් හටගෙන ගෙඩි කඩා ගැනීමේ අවස්ථාව ඇති වන විට, මහ ජනතාව ප්‍රීතියට පත් වෙනවා ඇති. නමුත් අවිස්සාවේල්ලේ මන්ත්‍රීතුමාට මේ විධියට කටයුතු කරන්න ලැබුණේ නැති නිසාත්, එතුමා ඉදිරිපත් කළ සැලැස්මවල් හරි ගියේ නැති නිසාත් නොයෙක් තැන්වල බලය අල්ලා ගත් නමුත් තමාට ඒ කටයුතු කර ගන්න බැරි වුණ නිසත්, දැන් මේවා පෙනෙන්න බැරිව ගිහින් තිබෙනවා. එදා අවසානයේදී කණ්ඩායමේ සිටින්න බැරි වී දෙදෙනාම මේ පක්ෂයෙන් තල්ලු වී ගියා. ඔය විධියට වැඩ කළ එතුමාට අද මේවායේ ප්‍රතිඵල හොඳින් පෙනෙනවා. ඒ ප්‍රතිඵල මහජනතාවට හිතකර වන බව දන්නවා. එම නිසා දැන් ඊෂ්‍යාවෙන් පුපුරනවා, මට මේ කටයුතු ටික කරගන්න බැරි වුණාය කියා.

මේ ගැන තව තවත් හොඳ හොඳ කේන්දර තිබෙනවා. නමුත් මට ඒවා දැන් ඉදිරිපත් කිරීමට නොහැකි වීම ගැන කනගාටු වෙනවා. ඒ දෙපාර්තමේන්තුවල තිබෙන කුණු ගොඩවල් අවුස්සන්න තමයි, මා පැමිණ සිටින්නේ. සමුපකාර දෙපාර්තමේන්තුවේ හෝ වේවා, අපේ අගමැතිනියගේ දෙපාර්තමේන්තුවේ හෝ වේවා, ඒ කොයි දෙපාර්තමේන්තුවක වුවද අයුතු වැඩ කෙරෙනවා නම් සුළු සේවකයන් ඔස්සේ ගොස් ඒ සියලු කරුණු සොයා බලා අවංකව මේ සභාවට ඉදිරිපත් කිරීම වයි මට වුවමනා කරන්නේ. මේ සුළු කාලයේදී මට යම් කිසි රහස් වැඩ පිළිවෙළක් එළි කරන්න පුළුවන්කම ලැබුණොත් මන්ත්‍රීවරයකු වශයෙන් මේ රටට මම වැඩක් කළාය කියා මට ප්‍රීති වෙන්න පුළුවන්. එපමණයි මට වුවමනා කරන්නේ.

එම නිසා මේ ගරු ඇමතිතුමාගේ අය වැය සම්බන්ධව මගේ සතුට ප්‍රකාශ කරන අතර වැඩි කල් නොගොස් නුදුරු අනාගතයේදී මහජනතාවට සතුටු වන්න පුළුවන් වැඩ පිළිවෙලක් සකස් වේවිය කියා අපි බලාපොරොත්තු වෙනවා. නොයෙක් කණ්ඩායම් ප්‍රසිද්ධියේ ඊෂ්‍යා කරනවා. ඒ ඊෂ්‍යාව අනුව යම් යම් දේ කියා පානවා. මෙතන ඝට්ටන ඇති කරන්න හදනවා. නොයෙකුත් විධියේ ඝට්ටන ඇති කරන්නට බැලුවා. නමුත් අපේ කිසිම භේදයක් නැහැ; කුල භේදයක් නැහැ; ජාති භේදයක් නැහැ; අප සියළු දෙනාම සහෝදරයන් වගේ එක්සත්ව සිටිනවා. අප සියළු දෙනාගේම බලාපොරොත්තුව, පරමාර්ථය අපේ මාතෘ භූමිය දියුණුව කරා ගෙන යන්නයි. යටිකුටිටු වැඩ ඇති කරන්න හැදුවත් අප ඒවාට අසු වන්නේ නැහැ. "උඩ රට—පහත රට භේදයක් තිබෙනවා නේද" යි ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) නිතරම අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමාගෙන් (එස්. ගොඩගේ මයා.) අහනවා. එතුමා හදන්නේ එවැනි භේද උපද්දන්නයි. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් අතර නම් කිසිම උඩ රට—පහත රට භේදයක් නැහැ. ප්‍රගතිය කරා යෑම සඳහා මේ ආණ්ඩුවේ සිටින සියළු දෙනාම පොදු ජනතාවගේ සහයෝගය අපේක්ෂා කරනවා. ජාතිකාභිමානයෙන් යුක්තව පොදු ජනතාවගේ සටනේදී අප පෙරමුණ ගන්නවා; ආත්ම පරිත්‍යාගයෙන් පෙරමුණ ගන්නවා. "එක්කෝ රට හදනවා. එක්කෝ ජීවිතය දෙනවා" යන අදහස ඇතිවයි, අප මේ සටනට බැස්සේ. "පුළුවන් නම් රට හදනවා. බැරි නම් වෙන යම් දෙයක් කර ගන්නවා" යන අදහස ඇතිවයි, අප පෙරමුණට බැස්සේ. කොතරම් ගල් පෙරළුවත් ඒවා උස්සන්න පුළුවන් විශාල යෝධයන් මේ පැත්තේ ඉන්න බව කියන්න කැමතියි. එහෙයින් අප කිසිසේත් භය වන්නේ නැහැ. අපට අවහිර කරන අය, අපට ගල් පෙරළන අය ඒ බව තේරුම් ගන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විලියම් ප්‍රනාන්දු මයා.]

ප්‍රගතිශීලියෙකැයි කියන එතුමා මා මේ ගරු සභාවට පත්වීම ගැන දොස් කීවා. "කම්කරුවෙක් මෙහාට මොනවා කරන්නද? අන්න අරහෙ වැඩ කරන එකයි තියෙන්නෙ" කියා කී බව ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් මා දැක්කා. කමක් නෑ. මාත් මෙහි ආවා. "පේව්මන්ට් එකේ සිටි මිනිහෙක් බෝඩ් එකට දමා තිබෙන්නේ මොකද?" කියා එතුමාගේ අපූරු මල්ලී ප්‍රශ්න කළ බව මට මතකයි. කාටද මේ "පේව්මන්ට් එකේ සිටි මිනිහා" යි කියා තිබෙන්නේ? සී. ඩබ්ලිව්. ඊ. බෝඩ් එකේ නවරත්න මහත්මයා වෙන්න ඇති. පේව්මන්ට් එකේ සිටි අයටත් වඩු කම්මල් කාරයින්ටත් උසස් තැනක් ලැබීමට වැඩ කෙළේ මේ ආණ්ඩුව බව එසින් පෙනී යනවා. ඒවා ප්‍රගතිශීලී වැඩ නොවෙයිද? එවැනි දේ දකින විට ඒ ගොල්ලන්ට ඊෂ්‍යා ඇති වෙනවා. එදා පේව්මන්ට් එකේ ලැග්ග මිනිසකු අද එක්තරා මණ්ඩලයක නිලධාරියකු වී සිටින්නේ මේ ආණ්ඩුව නිසයි. සාමාන්‍ය ජනතාවට තැන දී තිබෙන්නේ කවුද කියා ඒ අනුව පෙනී යනවා ඇති. සමාජවාදීයයි කියන එතුමා ඒ විධියට කීවත් අප නම් එවැනි පහත් කථා කියන්නෙ නැහැ. ඒ අධ්‍යක්ෂතුමා රුපියල් 1,000ක් පඩි ගැනීම දිව්‍ය ලෝකේ ඉන්නවා වගේයයි කියන්නට ඇයදුණා. බාගදා විලියම් ප්‍රනාන්දුත් දිව්‍ය ලෝකයේ ඉන්නවා වගේයයි කියන්න ඉඩ තිබෙනවා. කොහොම වුණත් මේවා කිය කියා කාලය අපතේ යවන්න හොඳ නැහැ. තව හුඟක් කේන්දර බලන්නට පුළුවනි. ඒ වුණත් කාලයක් නැහැ. අපට චෝදනා එල්ල කළ අයට පිළිතුරු දුන්නාට නිකම් සිටි අයට පිළිතුරු දෙන්න කාලය ගත කරන්නට වුවමනා නැහැ.

නියම සමාජවාදී ගමන යෑමේදී අප තමුන්නාන්සේලා සියළු දෙනාගේම සහයෝගය බලාපොරොත්තු වෙනවා. මේ පස් අවුරුද්ද තිස්සේ සමාජවාදී මාර්ගය ඔස්සේ වැඩ කරගෙන යන්න අපට අවසථාව දෙන්න. ජන සම්මතවාදය උරගා බලන්න ඒ පස් අවුරුද්ද ගිය තැන අවසථාව ලැබෙනවා ඇති. නමුත් දැනට ජනතාව දී ඇති තීරණය අනුව වැඩ කරගෙන යෑමට වුවමනායි. එම නිසා ජනතාවගේ තීරණය අනුව පත් වුණු මෙම ආණ්ඩුවට සහයෝගය දී වැඩ කරගෙන යෑම රජයේ සේවකයන්ගේ යුතුකමයි. මහජන ඡන්දයෙන් තේරී පත් වන කුමන ආණ්ඩුවකට හෝ සහයෝගය දීම රජයේ සේවකයන්ගේ යුතුකමයි. අතිකාල වැටුප් අහෝසි කර දමන්න ඕනෑ. ලක්ෂ ගණන් රක්ෂා නැතිව පෝලිම්වල සිටිද්දී, ඔවුන්ට නඩත්තු වන්න ක්‍රමයක් නැතිව සිටිද්දී, ඔවුන්ගේ දරුවන්ට කෑඳ උගුරක් ලබා ගන්න ක්‍රමයක් නැතිව සිටිද්දී, රජයේ සේවකයන් හොඳට කන බොන ගමන්, අඳින පළඳින ගමන්, පික්චර් බැලීමේත්, හනිමුන් යෑමේත් බලාපොරොත්තුවෙන් කරන මේ අතිකාල වැඩ නවත්වන්න ඕනෑ. ලිපිකරුවන් අතර, රජයේ සේවකයන් අතර දේශප්‍රේමින්, ජාතිහිතෛෂින් නැතැයි මා කියන්නේ නැහැ. නමුත් බොහෝ දෙනා කන්තෝරුවට පැමිණී ගමන්ම යන්නේ කැන්ටින් එකටයි. කෝටි ගලවල පුටුවල තියනවා—දැන් කෝටුත් වැඩියෙ නැහැ—මොකක් හරි එතැන ලාංඡනයට තියල කැන්ටිමට යනවා. තේ එක ඉන්න තැනට ගෙනත් බොන්න දිවංගත බණ්ඩාරනායක මහත්මයා අවසර දුන්නා. ඉන්න සථාන යේම සිගරැට් එක බොන්න අවසථාව සලසා දුන්නා. ඉස්සර එළියට වෙලා දුම අදින්න සිදු වෙලා තිබුණත් දැන් එහෙම නැහැ. මේ විධියේ නිදහසක් දී තිබෙද්දීත් කැන්ටිමට ගිහින් දාම් පෙත්තො අදිනවා. අර තවත් කැරම් ද මොකක් ද කියල එකකුත් ගහනවා. කාඩ් කුට්ටමක් තියෙනව, ඒකත් ගහනවා. තවත් රේස් පොතක් තියෙනව නම් ඒකත් බලනවා. මේව සේරම කරළ හැන්දෑවෙ හතර වෙන කොට මොකාද මොකක්ද එක බදාගත්ත වගේ ඕවර් ටයිම් කරන්නට පටන් ගන්නවා. දුප්පත් ජනතාව බොහොම දුකින් උපයන මුදල් ඔය විධියට අරගෙන කෑවොත් මළ පෙරේතයො නැත්නම් අර නුවර වැවේ ඉන්න ඉබ්බන් වාගේ නොයෙක් විධියේ තිරිසන් ආත්මවල ඉපදිල විපාක විඳින්න සිදු වෙයි. හිඟන්නෙක් කඩයකට ගොස් පාන් කාලක් කා තේ කෝප්පයක් බොන විට ඔහුගේ මුදලත් මීට සම්බන්ධ වන බව රජයේ නිලධාරින් දැන ගන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අසරණ භාවය නිසා පිං පඩි ලබන අයත් අපේ මේ සමාජවාදී වැඩවලට අද සම්මාදම් වෙනවා. උසස් පහත් සියලු දෙනාම සම්බන්ධ වෙලා එකතු කර ගත් මුදලකින් වැඩ කරන එකම අවස්ථාව මේකයි. එම නිසා මේක ඉතා වටින අවස්ථාවක්. අප රට නියම තත්ත්වයකට ගෙන යාමේ සැලැස්මක් අනුවයි, මේ මුදල් යොදවන්නේ. මෙයින් පොඩ්ඩක්වත් අපතේ හැරියොත් ඒ අපතේ හරින එකා කල්ප ගණනක් නරක දුක් විඳින බව ඒ කාන්තයි. දුප්පත් ගිහන්නාගෙනුත්, පිං පඩි ලබන්නාගෙනුත්, විශාල වතු අයිතිකාරයාගෙනුත්, දුප්පතාගෙනුත් යන මේ හැම දෙනාගෙන්ම මීට මුදල් එකතු වී තිබෙන බව දැන ගෙන කටයුතු කරන්න ඕනෑ. මෙහි තිබෙන බලගතුකම දුප්පතාගේ මුදල් මීට සම්මාදම් වී තිබීමයි. නියම අන්දමින් මේ මුදල්වලින් වැඩ කරන්න සුළු සේවකයාගේ සිට ප්‍රධාන පුටුවේ වැජඹෙන ප්‍රධාන නිලධාරියා දක්වා සිටින නිලධාරීන් අවංකව සේවය කරන්න ඕනෑ. දේශප්‍රේමයෙන් හා ජාතික අභිමානයෙන් යුතුව මේ මුදල් වියදම් කිරීමට හිතට ගෙන මේ රට සවයංපෝෂිත කිරීමට අදහස් කරන්න ඕනෑ. අප නොයෙක් දුක් විඳගෙන මේ කාලය ගත කළත්, මේ රට වාසනාවන්ත තත්ත්වයකට ගෙනැවිත් ඉදිරියේදී ඇති වන අපේ අනාගත පරම්පරාවට භාර දෙන්න ඕනෑ. හැමදාම හාල් එන තුරු දිව දික්කර ගෙන පිටරටවල් දිහා බලා ඉන්න බැහැ. මහා බලවතුන් දැන් පට පට ගා යුද්ධායුධ හදනවා. ඇමෙරිකාවත්, රුසියාවත් පරමාණු, ජලකර ආදි බෝම්බ හදා ගෙන යනවා. යම් විධියකින් ඒ රටවල් දෙක හැපුනොත් අපට හාමතේ මැරී යන්න සිදු වෙනවා. ඒ මන්ද? පිටරටවලින් අපට බඩු ලැබෙන්නෙ නැහැ. එවිට අපට සිදු වන්නේ අපේ දරුවන් හාමතේ සිටිනවා බලා සිටින්නයි. තත්ත්වය එසේ තිබෙන නිසා ජාති ආලයක් ඇතිව වහාම පිබිදෙන ලෙස මා සියළු දෙනාටම ආයාචනය කරනවා.

අ. භා. 6.15

ගරු සභාපතිතුමනි, අපේ ගරු සවදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් මහා චීනයේ කාන්තාවන් වැඩ කරන අන්දම ගැන කියා සිටියා. ඇත්ත වශයෙන්ම දේශ ප්‍රේමය ඇති මවු කෙනෙක් ගල් රෝලක් ඇදීම ගැන මා පුදුම වන්නෙ නැහැ. මා කියන්නේ අපේ නිදාගෙන සිටින කාන්තා වන්ටත් වැඩ කරන්නට පෙරමුණට එන්න කියායි. එක පැත්තක අශ්වයින් බැඳ අනික් පැත්ත ගෑණුන් විසින් ඇද ගෙන ගියයි කියන එක ලන්ඩන් පත්‍රවලටත් දෙන්න කියා ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) කියා තිබෙන බව මට ආරංචියි. ඒ කාන්තාවන් සිය කැමැත්තෙන් ගල් රෝල් අදින්නේ රට දියුණු කිරීමට ඇති ජාති ආලය උඩයි. පාරවල් හදන්න, කුඹුරු අස්වද්දන්න ඒ විධියට කාන්තාවන් ඉදිරිපත් වීම පහත් වැඩක්ද? ඒක පහත් වැඩක් කියා කාටවත් කියන්න බැහැ. තම රට වෙනුවෙන් දිවි පුදන්න ඉදිරියට එන ඒ ජාතිය ඔවුන්ගේ රට දියුණු කර ගැනීමටයි, ඒ කටයුතු කරන්නෙ. ඒ නිසා ගල් රෝල් ඇද්දත් පාරවල් කැපුවත් ඒ කටයුතු කරන්නේ තමන්ගේ අනාගත දරුවන් සඳහායි. මුහුදු අසබඩ ඇති වතු පිටි ගෙවල් කැඩී යනවා. පාරේ යන ගමන් ගල් ටික ටිකවත් ගෙන දැමුවහොත් තරමක්වත් ඒ මුහුදු කෑම නවතාගන්න පුළුවනි. එසේ කිරීම කාන්තාවන්ට වුවත් අවැඩක් නොවෙයි. චීනයේ කාන්තාවන් පාරවල් හදනවා ය කීම ගැන මෙහි පොඩි කථාවක් ඇති වී තිබෙනවා. නියම ජාති මාමකත්වයකින් යුතුව, නියම දේශ ප්‍රේමීන් ලෙස තම රට දියුණු කර ගැනීම සඳහා සිය කැමැත්තෙන්ම කරන එවැනි වැඩ නරකය කියන්නේ මොන කාලකණ්ණියෙක්ද? මොන තිරිසනෙක්ද? එවැනි දේ පිළිබඳව කෙරුණු වැරදි කථාවක් රට වටා යවන්නත් කෙනෙක් මහන්සි ගන්නවා. අමු කෑල්ලක් ගිනි නියන්න බොහොම දක්ෂ දෙන්නකුයි එකතු වී සිටින්නේ. තමුන්නාන්සේට ස්තුතියි.

සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (මහියංගන)

(திரு. சீ. பீ. ஜே. செனவிரத்ன—மஹியங்கனை)

(Mr. C. P. J. Seneviratne—Mahiyangana)

ගරු සභාපතිතුමනි, මේ වැදගත් අමාත්‍යාංශය යටතේ කෙරෙන මේ විවාදය යට වචන සවලාපයකින් මාත් සම්බන්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

වීමටයි මම අදහස් කරන්නේ. අද අමාත්‍යාංශ දෙකකින් එක්තරා දෙමුහුන් පාලනයක් කෙරීගෙන යනවා. ඒ කම්කරු සමුපකාර සමිති ව්‍යාපාරය සම්බන්ධවයි. කම්කරු සමුපකාර සමිති ව්‍යාපාරය මේ අන්දමින් අංශ දෙකකින් පාලනය වීමේ තත්ත්වය ඇති වූයේ, මට මතක හැටියට, අද සිටින අපේ වෙළඳ ඇමතිතුමා පසුගිය මහජන එක්සත් පෙරමුණ ආණ්ඩුකාල යේදී කම්කරු ඇමති වශයෙන් සිටින විටයි. එතුමා ඒ අවස්ථාවේදී කම්කරු සමුපකාර සමිති පිළිබඳව ගත් උද්‍යොගය ගැන මම එතුමාට ප්‍රශංසා කරනවා. එතුමා එදා සිටි අමාත්‍යාංශය මගින් ඒ සමිති පිහිටුවා මේ ව්‍යාපාරය ඇති කළා. නමුත් අද අළුතින් පිහිටු වන කම්කරු සමුපකාර සමිති ක්‍රියාත්මක කිරීමේදී නොයෙකුත් අවහිර කම් ඇති වී තිබෙනවා. ඒ සමිති සමුපකාර දෙපාර්තමේන්තුව මාර්ගයෙනුත්, කම්කරු දෙපාර්තමේන්තුව මාර්ගයෙනුත්, පාලනය වන නිසයි, එසේ වන්නේ. අළුත් සමිතියක් පිහිටු වන අවස්ථාවේදී ඒ සමිතිය ක්‍රියාත්මක කිරීමට පළමුව අර මුදලක් දෙන්නේ කම්කරු දෙපාර්තමේන්තුවයි. ඒ නිසා කම්කරු දෙපාර්තමේන්තුව මේ සමිති පිළිබඳව යම්කිසි අර්ධ පාලනයක් ගෙන යන අතර, සමුපකාර දෙපාර්තමේන්තුව මගින්ද ඒවා පාලනය කරනවා. නමුත් 1958 ට පෙර කම්කරු සමුපකාර සමිති ව්‍යාපාරය සම්පූර්ණයෙන් පාලනය වූයේ, සමුපකාර දෙපාර්තමේන්තුව මාර්ගයෙනුයි.

මේ කම්කරු සමුපකාර සමිති ව්‍යාපාරය දියුණු කිරීමට ද්විත්ව පාලනයකින් බාධා පැමිණෙනවා. අද තිබෙන නීතිය අනුව, ගම්බද තිබෙන විවිධ සේවා සමුපකාර සමිතියකටත් ඒ පළාතේ ඇති ගොඩ නැගිලි ආදිය සෑදීම කොන්ත්‍රාත් ගැනීමට පුළුවනි. විවිධ සේවා සමුපකාර සමිති සම්පූර්ණයෙන්ම පාලනය වන්නේ සමුපකාර දෙපාර්තමේන්තුවෙනුයි. එසේ තිබියදී කම්කරු සමුපකාර සමිති කම්කරු දෙපාර්තමේන්තුව මගින් පාලනය කිරීමට අවශ්‍යතාවක් නැහැ. කම්කරු යන නම තිබෙනත්, මෙවැනි සමිතිවලින් බලාපොරොත්තු වන්නේ ගොඩනැගිලි අංශයේ වැඩ කිරීමටයි. එම නිසා ඒ කම්කරු සමිති සමුපකාර දෙපාර්තමේන්තුව මගින් පමණක් පාලනය කිරීමට යම්කිසි වැඩ පිළිවෙළක් සැලසිය යුතුයි. දැනට කම්කරු දෙපාර්තමේන්තුව මගින් දෙන ණය මුදල් සමුපකාර දෙපාර්තමේන්තුවේ බැංකු මගින් දෙන්න සැලැස්වීමෙන් සමුපකාර දෙපාර්තමේන්තුවටම ඒ වායේ පාලනය පැවරිය හැකියි. එසේ නොකළොත් අළුතින් පිහිටු වන කම්කරු සමුපකාර සමිතිවලට විශාල කරදරයකට මුහුණ පාන්න සිද්ධ වෙනවා. මම වෂී 12 ක් තිස්සේ කම්කරු සමිති ව්‍යාපාරයට ලැදියාවකින් කටයුතු කළ නිසා, නව සමිතිවලට ඇති වන මේ කරදර තත්ත්වය නැති කරන ලෙස ඉල්ලා සිටිනවා. පැරණි කාලයේ පිහිටුවන ලද ඒ සමිතිය මුදල් තත්ත්වයෙන් තරමක් දියුණු නිසා වැඩි අමාරුවකට මුහුණ පාන්න සිදු වන්නේ නැහැ.

සමුපකාර කම්කරු සමිති සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. ඒ සමිතිවලින් අද ගොඩනැගිලි අංශයේ වැඩ බොහෝ සෙයින් භාර ගෙන වැදගත් අන්දමින් කරගෙන යනවා. එහෙත් ඇතැම් තැන්වල අවස්ථාවාදීන් මේ සමිතිවලට ඇතුළත් වී සිටින නිසා ඇතැම්විට කරදරත් සිදු වෙනවා. සොරබොර වැව කම්කරු සමිතිය නමින් කම්කරු සමුපකාර සමිතියක් තිබෙනවා. ඒ සමිතිය මගින් මිනිපේ වැඩ කටයුතු කරගෙන යනවා. ඒ සමිතියේ ඇතැම් සාමාජිකයින් මා විසින් ආරම්භ කරන ලද සමිතියෙන් අස් වී ගිය පිරිසක්. නමුත් එසේ අස් වී ගිය පිරිසත් ඇතුළුව පටන් ගත් ඒ සමිතියේ පාලනය කරගෙන යන්නේ කවර පුද්ගලයකු විසින්ද, ඔහු කොහේ සිට පැමිණි කෙනෙක්ද, ඒ සමිතියේ වර්තමාන තත්ත්වය කුමක්ද, ඒ මගින් ගෙන යන ව්‍යාපාරයේ අනාගතය කුමක්ද යන්න ගැන සොයා බැලීම අමාත්‍යාංශ සතු වගකීමක්. කම්කරු සමිති ව්‍යාපාරය දියුණු කිරීම සමාජවාදය කරා ගමන් කිරීමේදී ප්‍රයෝජනවත් වෙනවාය කියා හිතනවා නම්, ස්ථිර අධිෂ්ඨානයක් ඇතිව ඒ කට යුත්ත කරනවා නම්, විශෙෂ සැලකිල්ලක් දක්වා ඒ ගැන සොයා බැලිය යුතුයි. සමුපකාර සමිති භාර දෙපාර්තමේන්තුවෙන් ඉටු විය යුතු වගකිව යුතු කාර්යයක් තිබෙනවා. මේ රටේ තිබෙන සෑම සමුපකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමිතියක් මගින්ම කෙරෙන දූෂණ ක්‍රියා ගැන සොයා බැලීම පහසු වැඩක් නොවෙයි. එහෙත් සමාජවාදය කරා යා යුතුය කියනවා නම් වැඩ කරන දුප්පත් කම්කරුවන්ගේ අයිතිවාසිකම් මෙන්ම පොදු වශයෙන් කම්කරු පංක්තියේම අයිතිවාසිකම් සහ ඔවුන්ගේ අනාගත දියුණුව අරභයා ඒ ඒ සමිතිවලින් කටයුතු කෙරෙනවාදැයි සොයා බැලිය යුතුයි.

ඊළඟට, බොහෝ මන්ත්‍රීන් විසින් සඳහන් කරන ලද, ටිකක් ගඳ ගහන මාතෘකාවක් යටතේ වචන සවලංසයක් කථා කරන්න අදහස් කරනවා. කරවල ප්‍රශ්නය ගැනයි යමක් කියන්න මා බලා පොරොත්තු වන්නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
දැන් ගඳ ඉවරයි.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)
තවමත් ගඳ ඉවර නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීන් කෑදවා කරවල ප්‍රශ්නය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම ගැන මා ගරු ඇමතිතුමාට ප්‍රශංසා කරනවා. මේ රටේ කරවල හිඟයක් ඇති වීමට හේතුව, එය නැති කිරීමට ගන්නා පියවර, ඒ සම්බන්ධයෙන් මහජන මන්ත්‍රීන්ගෙන් බලා පොරොත්තු වන සහයෝගය ආදිය ගැන සාකච්ඡා කිරීම ගැන අපි සන්තෝෂ වෙනවා. එතුමා සඳහන් කළ කරුණු අපිත් පිළිගත්තා. කරවල ව්‍යාපාරය සමුපකාර තොග වෙළඳ ආයතනයට භාර කරනවාය කීවා. නමුත් ඒ ගැන නිසි වැඩ පිළිවෙළක් යෙදුවේ නැති නිසා ඇතැම් අවස්ථාවල කරවල හිඟයක් ඇති වුණා. කරවල වෙළඳාම රජයට ගන්නවාය යන බියක් ඇති වීම නිසා පිටරටින් කරවල ගෙන්වන අය කරවල ගෙන්වා ගැනීමට ඕඩර යවා තිබුණේ නැහැ. නමුත් කරවල වෙළඳාම සී. ඩබ්ලිව්. ඊ. ආයතනය භාර ගත්තා. ඉන්පසු කරවල හිඟයක් ඇති වුණා. කරවල නිපදවන රටවල කරවල හිඟයක් තිබෙනවාය කියනවා නම් ඒ කියමන පිළිගන්න විධියක් නැහැ. ගිය අවුරුද්දේවත්, ඊට එහා අවුරුද්දේවත් කරවල හිඟයක් මේ රටේ ඇති වුණේ නැහැ. නමුත් මේ අවස්ථාවේ කරවල හිඟයක් ඇති වුණා. කරවල වෙළඳාම සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී අමාත්‍යාංශයට අමාරුකම් ඇති වන බව අප දන්නවා. නමුත් සමුපකාර තොග වෙළඳ ආයතනයේ කරවල කඩේ ලොකු මුදලාලිලා විසින් අඩු මිලට කරවල බෙදා දීමට පටන් ගැනීම නිසා පාරිභෝගිකයා වෙනදාට වඩා දැන් කරවල තොග පිටින් ගෙදර ගෙන ගොස් තබා ගන්නවාය කියන කියමනේ ඒ තරම් සත්‍යයක් නැහැ. ඒ විධියට කියන කොට අපට ටිකක් තරහ යනවා. එයින් ඔප්පු කරන්න හදන්නේ මේ රටේ ජනතාවගේ නුවණට කරන අපහාසයක්. අන්න එහෙම ඒවා හොඳ නැහැ. සත්‍යය එය නොවන බව අපි දන්නවා. එසේම දැන් ටික කට කලින් බෙන්තර ඇල්පිටියේ ගරු මන්ත්‍රීතුමා (ඇල්බට් මයා.) මේ ගරු සභාවේ ප්‍රකාශ කළා, බෙන්තර ඇල්පිටියට ඕනෑ තරම් කරවල තිබෙනවාය, කිසිම කාලයක නොලැබුණු තරම් ලාභයට කරවල ලැබෙනවාය කියා. එසේ ලැබෙනවා නම් මම ඒ ගැන සන්තෝෂ වෙනවා. නමුත් එතන පොඩි හොරයක් තිබෙනවා වගේ පෙනෙනවා. මසියංගනය, බිබිලේ, මොණරාගල ආදී පළාත්වලට නම් කරවල පොඩි ඩක්වත් නැහැ. කොලොන්නටත් නැත කියා කොලොන්නේ ගරු මන්ත්‍රීතුමා (සී. ඩබ්ලිව්. මැතිව් මයා.) කිව්වා. ඒ ප්‍රදේශයේ කරවල නැති බව ගිය සතියේ මා ඇමතිතුමාට කීවාම එතුමා එය පිළිගත්තා. පොත් 1,00,200 ක් තිබෙන බිබිලේට යවා තිබෙන්නේ කරවල හොණ්ඩර 24 යි. බිබිලේ සමුපකාර කොමසාරිස්වරයාගෙන් මා මේ ගැන ප්‍රශ්න කළාම ඔහු කීවේ බිබිලේ තිබෙන සමුපකාර යුනියන් එක පරීක්ෂා කරන්නය කියායි. බිබිලේ සමුපකාර යුනියන් එක වැඩ කරනවා හොඳ නැද්ද කියා මම ප්‍රශ්න කළා. ඒ අය හොර කම් කරනවාද කියා මම ප්‍රශ්න කළා. හොරකම් කරනවා අල්ලන්න බැහැ කියා පිළිතුරු දුන්නා. ලාභ තිබෙනවාද කියා ඇහුවාම ඔව්, ලාභ තිබෙනවාය කීවා. ලාභ තිබෙනවා නම් තිබෙන වැරැද්ද කුමක්ද කියා මම ඇහුවා. ඒ නිලධාරිතුමා යුනියන් එක හොඳ නැත කීමේ තේරුම කුමක්ද කියා මම දන්නෙ නැහැ. කරවල ප්‍රශ්නය ගැන ඒ අයගෙන් අහලා බලන්නය කියා ඒ නිලධාරියා මට කීවා. හොඳයි කියා මා ගොස් ඒ යුනියන් එකේ පොත් බැලුවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

කරවල හොණ්ඩර 150 කට ඕඩරයක් ලියා ගෙන මැකලම් ස්ටෝරුවට ගොස් එතැනින් ආපසු බන්ගසාල වීදියට ගිය විට ලැබී තිබෙන්නේ කරවල හොණ්ඩර 24 යි. මා කී ඒ කාරණාව පිළිගැනීම ගැන මම ගරු ඇමතිතුමාට ස්තුති කරනවා.

අ. භා. 6.30

ගරු සභාපතිතුමනි, කරවල පමණක් නොව මිල සීමා කරන ලද සෑම බඩුවක්ම පාරිභෝගිකයාට කරදරයක් නැතිව ලබා ගැනීමට සැලැස්වීම රජයේ යුතුකමක්; රජයේ වගකීමක්. එය රජයේ වගකීමක් නම් ඒ වගකීම කුමන මාර්ගයකින් ඉටු කළ යුතුද කියා පළමුවෙන්ම කල්පනා කර බලන්න ඕනෑ. මුළු ලංකාවටම තිබෙන්නේ එක සමුපකාර තොග වෙළඳ ආයතනයයි. දෙවැනි ලෝක මහා යුද්ධය කාලයේදී මේ රටේ ඇති වූ අවශ්‍යතාවයන් අනුව එක්සත් ජාතික පක්ෂය විසිනුයි, එය ඇති කළේ. එක්සත් ජාතික පක්ෂය ඒ සමුපකාර තොග වෙළඳ ආයතනය ඇති කර අවුරුදු 8 ක් 9ක් මේ රටේ අවශ්‍යතාවන් අනුව එය ක්‍රමක්‍රමයෙන් දියුණු කරගෙන ආවා. එදා එක්සත් ජාතික පක්ෂය විසින් ඒ ව්‍යාපාරය කරගෙන යන අවස්ථාවේදී මේ රටේ ජීවන වියදම අද තරම් ඉහළ නැග තිබුණේ නැහැ. අදට වඩා පහසු තත්ත්වයක් එදා තිබුණා. එදා හාල්මැස්සන් රාත්තල ශත 60ට ගත්තා. අද වගේ රුපියලට ගත්තෙ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
කොහෙද ඒ තිබුණේ?

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

ඔය ගරු මන්ත්‍රීතුමා නුවර පළාතේ වෙන්න ඇති. කොළඹ නම් ඒ ගණනට තිබුණා. රුපියල් 5ක් තිබුණා නම් එදා කොළඹ පළාතේ පවුලකට ජීවත් වන්න පුළුවන්කම තිබුණා. අද ජීවන වියදම ඒ වගේ තුන් හතර ගුණයකින් ඉහළ නැග තිබෙන බව පිළිගන්න ඕනෑ.

එක්සත් ජාතික පක්ෂය මේ රට පාලනය කළ අවුරුදු නවයේදී මේ රට සියයට 9 ක් සංවර්ධනය කළා. නමුත් 1956 සිට අද වන තුරුත්, මේ රටේ ජනතාව ලක්ෂ ගණනකින් වැඩි වුණත්, සංවර්ධනය කර තිබෙන්නේ සියයට 9 යි. වර්ධනයෙන් වර්ධනය මේ රටේ ජනගහණය වැඩි වුණත්, ඒ අනුව සංවර්ධනයක් ඇති වුණේ නැහැ. යම් කිසි සංවර්ධනයක් ඇති වුණත් රටේ අවශ්‍යතාවයන් අනුව, ජනගහණය වැඩි වීම අනුව සංවර්ධනයක් ඇති වී නැහැ. 1956 ට කලින්, එසේම 1961 ට කලිනුත් මේ රටේ පාරිභෝගිකයාට අවශ්‍ය කරවල ආදී දේ ස්වදේශිකයන් ගේ හෝ වේවා, විදේශිකයන්ගේ හෝ වේවා ආයතන සිය ගණනක් මගින් ගෙන්නුවා. ඒ ආයතන සිය ගණනක් මගින් ගෙන් වූ බඩු යම්කිසි ක්‍රමයක් අනුව එක ආයතනයක් මගින් සාර්ථක ලෙස ගෙන් වීමට පිළිවෙළක් හරිනොගැස් වීමේ ප්‍රතිඵලයි අද අප භුක්ති විඳින්නේ. පුංචි කටකින් විශාල දෙයක් රිංගවන්න බැහැ. කෙසේ වෙතත් රටේ තත්ත්වය අනුව කරවල ව්‍යාපාරය සී. ඩබ්ලිව්. ඊ. එකට ගත්තා. අප ඒකට ප්‍රශංසා කරන්න ඕනෑ. නමුත් ගත්ත ක්‍රමය වැරදියි. තවමත් ඒ වැරැද්ද හරිගස්සා නැහැ. අප ඒක කියන්න ඕනෑ. රජය විසින් යම් යම් අවස්ථාවන් හිදී නානා අන්දමේ සමාජවාදී පියවරවල් ගන්නවා නම් අප ඒවාට ප්‍රශංසා කරනවා. නමුත් ඒවා වරද්දන විට අප මෙසේ කියනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
වැරදිලා නැහැ.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)

සී. ඩබ්ලිව්. ඊ. එකෙන් හෝ වේවා, රජයේ වෙනත් අංශවලින් හෝ වේවා, මෙවැනි ක්‍රියා මාර්ගයක් ගන්න විට ඒ ඒ අමාත්‍යාංශවල සිටින රජයේ ජේෂ්ඨ නිලධාරීන් විසින් උපදෙස් දිය යුතුයි. රජයද ඒ අනුව ක්‍රියා කළ යුතුයි. ඒ දෙන උපදෙස් අවස්ථාවන්ට අනුව නිසි අන්දමින් දෙන උපදෙස් විය යුතුයි. සත්‍ය උපදෙස් විය යුතුයි. ඒ අනුව ක්‍රියා කළ විට ඔය යන ගමන හරි යාවි. කරවල පිළිබඳ තත්ත්වය පමණක් නොවෙයි, මේ රටේ මිල පාලනය කරන ලද සෑම බඩුවකම තත්ත්වය ඔකයි. පිටිසර පාරිභෝගිකයාට අවශ්‍ය දේවල් බෙදා හරින්නේ සමුපකාර කඩ සමිති මගින් පමණක් නොවෙයි. දුප්පත් සුළු වෙළෙන්දන් විසිනුත් බෙදා හරිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමුපකාර කඩවලින් පමණක් මොනම ගමකවත් ජීවත් වන පාරිභෝගිකයන්ට අවශ්‍ය කරන දේවල් ඒ විධියට බෙදා දෙන්න බැහැ. අද පවතින තත්ත්වයේ හැටියට කියන්න තිබෙන්නෙ ඒකයි.

ඒකට හේතුව මොකක්ද? සමුපකාර කඩ සමිති උදේ නවයට විවෘත කර සවස පහට වහනවා. අපේ දුප්පත් ගැමියා සවස පහට වැඩ ඇරිලා ගෙදර ඇවිත් රුපියල් දෙකකුත් අරගෙන පහමාරට විතරයි කඩේට යන්නෙ. ඒ වෙලාවට සමුපකාර කඩේ වහලා. සෙනසුරාදා සවස්ත්, ඉරිදා දවසත් වහලා. ණයට බඩු දෙන්නෙත් නැහැ. දුප්පත් ගැමියා වැඩි වශයෙන් බඩු ගන්නේ ණයටයි. ඔවුන් හම්බ කරන දෙයින් මුදල් ගෙවන්න ඕනෑ. මෙවැනි සමාජ තත්ත්වයක් අනුව වෙළඳාම් ක්‍රමය සකස් වෙන්න ඕනෑ. එසේ නැතුව කිසිම දිනක මේ අන්දමේ සමුපකාර ප්‍රතිපත්ති අනුව පාරිභෝගිකයාට අවශ්‍ය දේවල් බෙදා හරින්න පුළුවන් වන්නෙ නැහැ.

මාත් සමුපකාර ව්‍යාපාරිකයෙක්. ඒ අංශයට විශාල ලැදියාවක් ඇති කෙනෙක්. අපි කොයි දේ කළත් හොඳින් කරන්න ඕනෑ. මිල පාලනය කරන ලද ද්‍රව්‍ය ඒ අන්දමින්ම පාරිභෝගිකයාට ලැබෙන්නෙ නැත්තෙ සුළු කඩකාරයාට පහර වැදී තිබෙන නිසයි. එම නිසා කරුණා කර ගම් වල සුළු කඩකාරයන්ට ගහන්න එපාය කියා මා ඉල්ලා සිටිනවා. ඔහු ස්වොත්සාහයෙන් ජීවත් වෙන කෙනෙක්. ඔහු තොග වෙළඳසැලකට ගිහිල්ලත් වෙළඳාම් කිරීම පිණිස බඩු ගෙන එන්නේ ණයටයි. එසේ ගෙනැවිත් සතියේ වෙළඳාම කරලයි අර ණය ගෙවන්නෙ. එසේ කොට ඔහු ස්වොත් සාහයෙන් දියුණු වෙනවා .එපමණක් නොවෙයි, ඔහු පළාතේ ගැමියාට අවශ්‍ය බඩු බාහිරාදියත් ලබා ගැනීමට උදව් කරනවා. එපමණක්ද? ගමේ රක්ෂා නැති කීප දෙනකුටත් රක්ෂාව දෙනවා. ඔහුගේ වෙළඳ සැල තමයි ගම්බදව නිපදවන ද්‍රව්‍ය පිට පළාත්වලට යැවීම සඳහා ගෙනැවිත් තබන මධ්‍යස්ථානය. එම නිසා කරුණා කර මේ මිල පාලනය කරන ද්‍රව්‍ය ඒ මිල ගණන් වලටම දුප්පත් කඩකාරයාටත් ගැනීමට පිළිවෙළ යොදන්න.

උඟව වැනි පළාත්වල සී. ඩබ්ලිව්. ඊ. අංශ යක් නැහැ. යුනියන් අංශ නම් තිබෙනවා. ඒවාට බඩු ගෙන යන්නත් කෙළින්ම කොළඹ එන්න ඕනෑ. සුළු කඩකාරයන්ටත් තමන්ට අවශ්‍ය බඩු බාහිරාදිය ඒ යුනියන් මාර්ගයෙන් ලබාගන්න පුළුවන් වන විධියට කටයුතු යොදනවාද? එසේ කළ විට මිල පාලනය කළ බඩු කාටත් ලබාගන්න පුළුවන් වේවි.

ගොවියා විසින් නිපදවනු ලබන වී සහ තික මිළට ආණ්ඩුව ගන්නේ සමුපකාර දෙපාර්තමේන්තුවත්, ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවත් යන දෙක මගින්. යම් කිසි ගොවියකුට ගොවිකම් කිරීමට මුදල් අවශ්‍ය වූ විට ගොවි සංගමය මගින් සමුප කාර කොමසාරිස්වරයාට දැනුම් දී ඒ ගොවි යාගේ ආර්ථික තත්ත්වය අනුව, ඔහුගේ අවශ්‍යතාවන් අනුව, යම්කිසි මුදලක් කොම සාරිස්තුමා රෙකමදරු කරනවා. එය අනු වයි, ගොවිජන සේවා කොමසාරිස්තුමා ණය දිය යුත්තේ. සමුපකාර උප කොම සාරිස්තුමා තමන්ගේ හිතුමතේ හැටි යට ගොවියාට අවශ්‍ය මුදලට වඩා අඩු මුදලක් රෙකමදරු කළාම ඔහුට සිදු වන්නේ කුමක්ද? එවැනි අවස්ථාවලදී ඔහුට සිදුවන්නේ වැපුරූ වී කපාගන්නත් කලින් එය වෙළෙන්දාට දෙන බවට පොරොන්දුවක් වී ඔහුගෙන් ණයට මුද ලක් ලබා ගැනීමටයි.

මෙවැනි තත්ත්වයක් මගේ කොට්ඨාශ යේ තිබෙනවා. ඒ පළාතේ සෑම ගොවියකු ටම රුපියල් සියයක ණය මුදලක් දිය යුතුය කියා සමුපකාර උප කොමසාරිස් තුමා ගොවිජන සේවා කොමසාරිස්තුමාට රෙකමදරු කළා. නමුත් ගොවියාට අවශ්‍යව තිබුණේ අඩුම ගණනේ රුපියල් එකසිය පනහක මුදලකුයි. නමුත් අවසානයේදී ගෙවන්න තීරණය වූයේ රුපියල් පනහක මුදලකුයි. රුපියල් එකසිය පනහකින් කළ යුතුව තිබෙන වැඩක් රුපියල් පනහක් අර ගෙන කරන්නේ කොහොමද? මේ අන්ද මට වැඩ කටයුතු කොට, ගොවියා පුද්ගලික වෙළෙන්දෑ ළඟට යනවායයි කීම වැරදියි. ඒ නිසා ගොවියාට තමුන්නාන්සේලා ගෙවන්න නියම කරන රුපියල් 12 ඔහුටම ලැබෙන්න කටයුතු සලස්වන්න ඕනෑ කමක් දක්වනවා නම්, කළ යුත්තේ මේ දෙමුහුන් පාලනය ඉවත් කොට මෙහි පාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

නය එක් දෙපාර්තමේන්තුවක් අතට ගැනීමයි. එසේ නොකරන තෙක් කවරදාවත් අවංකව ගොවියාට සේවයක් සිදු කරන්න පුළුවන් වේවිය කියා, හිතන්න එපා. කවරදාවත් ඔහුට වීවලට ගෙවනු ලබන රුපියල් 12 සහතික මිළ ලැබෙන්නේ නැහැ.

ගොවිජනපදවලින් වී බුසල් දහස් ගණින් නිපදවා වී ගබඩා කරන ස්ථානයට ගියාම ඒ අය කියනවා, ගබඩාවේ ඉඩ නැති නිසා, අපට වී ගන්නට පිළිවෙළක් නැත කියා. මෙවැනි අවස්ථාවලදී ගොවියා කුමක්ද කරන්නේ? කෙලින්ම ගොසින් බුසල රුපියල් අට බැගින් පුද්ගලික වෙළෙන්දාට වී ටික දී මුදල් ලබා ගන්නවා. මේ ක්‍රමයේ මේ ආදී අඩුපාඩුකම් තැබුවාම කොහොමද මහන්සි වී වී නිපදවන ගොවියාට සහතික මිළ ලැබෙන්නේ? මෙවැනි අඩුපාඩුකම් තිබෙන නිසා, අද තිබෙන ක්‍රමය අනුව අප බලාපොරොත්තු වන යහපත හෝ ආණ්ඩුව බලාපොරොත්තු වන සේවය හෝ ගොවියාට ලැබෙන්නේ නැහැ. ගොවි සමිති විසින් මිළයට ගන්නාවූ වී ගොවිජන සේවා කොමසාරිස්තුමාගේ මාර්ගයෙන් ගබඩාවට අරගෙන එතුමා ඕඩරයක් දෙනවා. එම ඕඩරය රැගෙන කච්චේරියට යන්න ඕනෑ. කච්චේරියට ගියාම කියන්නේ මේවාට ගෙවන මුදල් තව මාස දෙකකින් ගෙවනවාය කියායි.

හොඳයි, දැන් ඊළඟට යැපෙන ගොවියාගේ තත්ත්වය මොකක්ද? ඊළඟ කන්නයට වපුරන්න වුවමනා කරන බිත්තර වී ටික ගන්න ඔහු ළඟ හෝ ඔහුගේ සමුපකාර සමිතියේ හෝ මුදල් නැහැ. සමුපකාරය ඊළඟට කරන්නේ සියයට හයේ පොලියට බැංකුවෙන් ණය මුදලක් ගැනීමයි. රජය විසින් මේ අයට දිය යුතු මුදල එවේලේම නොගෙවා ණය හිටවන නිසා මේ අන්දමට දුප්පත් සමුපකාර සමිතියට සියයට හයේ පොලියක් බැංකුවට ගෙවන්න සිදු වෙනවා. මෙවැනි දේ සිදු වන්න ඉඩ තැබුවාම අපි කරන වැඩවලින් කිසිම තේරුමක් නැතිව යනවා. ඒ නිසා පුළුවන් තරම් ඉක්මනින් මේ අඩුපාඩු සකස් කරන්න කටයුතු යෙදිය යුතු බව මා ඉතා ඕනෑකමින් මතක් කර සිටිනවා.

මගේ කොට්ඨාශයේ විශාල ගොවි ජනපද පහක් හයක් පමණ තිබෙනවා. මෙතරම් විශාල ප්‍රදේශයක නිපදවන වී ප්‍රමාණය කෙතරම්ද කියා තමුන්නාන්සේටම කල්පනා කර ගන්න පුළුවන්. නමුත් සහතික මිළයට වී ගැනීමේ ක්‍රමය නියම අන්දමට ක්‍රියාවේ යෙදෙන්නේ නැති නිසා, මගේ පළාතේ ගොවි ජනතාවට නියම ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැති බව සඳහන් කරන්නේ බලවත් කනගාටුවකිනුයි.

අ. භා. 6.45

අපේ පිටිසරබද උදවියට කරවල නැති වීම නිසා, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ට වේදනාවක් ඇති වී තිබෙනවාය කියා කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීවරයා (ජීනදාස මයා.) ප්‍රකාශ කළා. ඇත්ත වශයෙන්ම කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීවරයාට පමණක් නොවෙයි, විශේෂයෙන්ම පිටිසරබද නොදියුණු පළාතක ජනතාව වෙනුවෙන් පෙනී සිටින නියෝජිතයකු වශයෙන් මම කියන්න කැමතියි, අපේ පළාත්වල ජනතාව වෙනුවෙන් අපට ලොකු වේදනාවක් ඇති වී තිබෙනවාය කියා.

ගරු සභාපතිතුමනි, අප ඉදහිට කොළඹ දිහාවට එන විට අපට පෙනී යනවා, ගම්බද උදවියට පමණක් නොවෙයි, මේ හැම දාම කුකුල්මස් කන සෙසිලමේ උදවියටත් ඉදහිට කරවල කෑල්ලක රස බලන්ට ආශාවක් තිබෙන බව. [බාධා කිරීම්] ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීන් තවත් කරවල ගඳ ගස්සන්ට එපා.

බෙන්තර-අල්පිටියේ ගරු මන්ත්‍රීවරයා (ඇල්බට් මයා) එතුමාගේ කථාවේදී කීවා, ඒ අය ඡන්ද ව්‍යාපාර ගෙන යන අවස්ථාවේදී ගම්බද මහජනතාවට කරවල පාවිච්චි කරන්න එපාය, ගමේ උපදින හොඳ ආහාර ද්‍රව්‍ය තිබෙනවාය කියා කිව් බව. මට භය සිතෙනවා, අපේ ආණ්ඩු පක්ෂයේ උදවිය අප කන බොන දෑ අපට කියන්න හදනවාය කියා. ඔය විධියට යනකොට අඳින පළඳින දේවල් පමණක් නොවෙයි, කෑ යුතු දේ මේවාය කියන්නට බැරිකමකුත් නැහැ. නමුත් මට කියන්න පුළුවනි, එබඳු වැඩ පිළිවෙළක් ගැන අපේ කිසිම කැමැත්තක් නැතිවා පමණක් නොවෙයි, මේ රටේ මහජනතාවගෙන් ඒවාට නම් කිසිම ලෙසකින් ඉඩ ලැබෙන්නේද නැති බව. ඔය විධියේ වැඩ පිළිවෙළක් අනුගමනය කළ, ඔය විධියේ අණක් දුන්, රටක ජනතාව අද නැගෙනහිර සිට බටහිරට දුවනවා. එම තත්ත්වය මේ රටේ ඇති කරන්ට ඉඩ දෙන්න බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
කිරිබත්ගොඩ කම්කරු සමිතියට මොකද උනේ ?

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)
රජයෙන් ශතයකින්වත් ආධාරයක් නැතුව කම්කරුවන් 500 කට, 600 කට පමණ ජීවනෝපාය මාර්ගය සලසමින්, ලක්ෂ 8 ක සාමාන්‍ය කොන්ත්‍රාත් අරගනිමින්, අවුරුදු 11 ක් තිස්සේ ලංකාවේ කම්කරු සමුපකාර සමිතියක් ගෙන ගියා නම්, ඒ මෙම කිරිබත්ගොඩ සේවාමුක්ත කම්කරු සමිතිය පමණක් බව මම ඉතා සන්තෝෂයෙන් ප්‍රකාශ කර සිටිනවා.

ආර්. එස්. පෙරේරා මයා. (කැලණිය)
(திரு. ஆர். எஸ். பெரேரா—களனி)
(Mr. R. S. Perera—Kelaniya)
මැරවරයන් දාලා පාලනය කරනවා.

සෙනෙවිරත්න මයා.
(திரு. செனவிரத்ன)
(Mr. Seneviratne)
මැරවරයන් දාලා පාලනය කරන්ටවත් කැලණියේ ගරු මන්ත්‍රීවරයාට බැහැනේ. මට මැරවරයින් දමා උනත් පාලනය කරන්ට පුළුවනි. [බාධා කිරීම්] නමුත් මැරවර පාලනයෙන් 11 අවුරුද්දක් මේ විධියේ ව්‍යාපාරයක් ගෙන යන්න බැරි බව මම ඉතා සන්තෝෂයෙන් මතක් කර සිටිනවා. අපක්ෂපාත, දූෂණවලින් තොර, එඩිතර පාලනයකින් විනා මැරවර පාලනයකින් 11 වර්ෂයක් තිස්සේම පාලනය කරන්ට බැරි බව මම නැවත වරක් කියන්න කැමතියි. [බාධා කිරීම්]

ගරු සභාපතිතුමනි, එක් අවස්ථාවකදී යම්කිසි පුද්ගලයන් කොටසක් මේ කර්මාන්ත ශාලාවේ එක්තරා විපලවයක් ඇති කිරීමට උත්සාහ කළා. නමුත් ගරු වෙළඳ ඇමතිතුමා ඒ අවස්ථාවේදී අපක්ෂපාත තීරණයක් ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් තවමත් කම්කරුවන් පන් සිය යක්, හය සියයක් අවුරුදු ගණනාවක් තිස්සේම රක්ෂා වෙනවා. ඇත්ත වශයෙන් ගරු ඇමතිතුමාට මේ ගැන ප්‍රශංසා කරන්ට ඕනෑ. [බාධා කිරීම්] ගරු ඇමතිවරයා මේ ගත් පියවර වැරදි ලෙස සමහර ගරු මන්ත්‍රීන් කල්පනා කරන්න පුළුවනි; නමුත් අප කරන වැරදිවලින් අළුතින් සමුපකාර සමිති පිහිටුවන උදවියට හොඳ පාඩමක් ගත හැකි වෙනවාට කිසිම සැකයක් නැහැ. ගරු සභාපතිතුමනි, අප අතින් වැරදි සිදු වෙනවා. අපි ඒවා හදා ගන්නවා. කා අතිනුත් වැරදි සිදු වෙනවා. වරදි නැති මනුෂ්‍යයෙක් මේ ලෝකේ සොයාගන්න අමාරුයි. ඒ වාගේම අප වරදක් කළොත් එය වරද බව පිළි ගන්නවා.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීවරයා ගම්බද දුප්පත් ජනතාවට කරවල නැති වීම නිසා අප දක්වන විරුද්ධත්වයට විරුද්ධ වුණත්, දුප්පත් ජනතාවට වැඩි වැඩියෙන් කරවල ලැබෙවාසි ප්‍රාර්ථනය කරමින් මගේ වචන සවලපය අවසන් කරනවා.

ශ්‍රීමත් රසික් fපරීඩ් (මැද කොළඹ පළමුවෙනි මන්ත්‍රී)
(சேர் ராஸீக் பரீத்—கொழும்பு மத்தி முதலாம் அங்கத்தவர்)
(Sir Razik Fareed—First Colombo Central)
I shall be very brief. I must congratulate the Hon. Minister of Commerce, Trade, Food and Shipping for the great stand he took in regard to the taking over of the dry fish trade from the hands of non-Ceylonese. It is a step in the right direction, there is not the least doubt about it.

Trade no doubt is on the downward trend at the present juncture and I do want the Hon. Minister to give a helping hand to trade at the moment so that the people in the country, especially the *goviyas* in the country, may be able to get their food cheaper. In the good old days when the Indian traders were actually doing this dry fish business they were able to make millions of rupees while the poor man in the street was hardly able to get his $\frac{1}{4}$ lb. of dry fish. But I think although the position is not rosy yet, I am sure as time goes on trade will get better and better, and the people will be able to appreciate the great doings of this Hon. Minister, especially where food

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රීමත් රසික්ෆපරීඩ්]

is concerned. The private sector, not only where food is concerned but in other trade too, must be given greater encouragement.

I never intended to speak on this Vote but I was dragged into this because of some remarks that were made about wristlet watches. During the few months that I was the Minister of Commerce and Trade I found that a great injustice had been done to the poor traders who were not so rich as the *mudalalis* ; I do not want to call them U. N. P. *madalalis,* but they were men of the type of Mr. U. N. Wijetunge, Wimaladharma Bros., and the Golden Restaurant. I am referring to these three especially because they had a monopoly of the wristlet watch trade worth not less than 25 lakhs of rupees. The smaller traders actually had to go to these big *mudalalis* and endeavour to buy the wristlets from them but they would not sell the watches to them. Instead they sold their quotas at 200 to 300 per cent., so that a case was really made out to me by these smaller traders.

I went into this question with one who was really immersed in that direction, one Mr. E. S. de Silva, who very kindly gave me the advice that the best thing to do would be to allow wristlet watches to come under O. G. L., that is, open general licence. I did so, but the step that was to follow could not have been taken because Parliament was not in session. So that you will see, Sir, that what I did was in the best interest of the country and of the poor man, to break the monopoly that existed at that time. As a matter of fact, one of them had about 8 or 9 race horses ; I do not mind mentioning who it is, it was Mr. U. N. Wijetunge, today he has none. In the case of the Golden Restaurant it had no place as a wristlet watch dealer because it was only a eating house. However, it was given a quota which was worth about 10 or 12 lakhs of rupees. That was the position in which the wristlet watch trade was.

Yesterday an uncalled for remark was very unfortunately made by the hon. Third Member for Colombo Central (Dr. Kaleel) in reference to Colonel Nasser. As a Mussalman and as the head of the Ceylon Muslim League, I consider it almost blasphemous to refer to the head of a foreign State in such disparaging terms. Colonel Nasser is one of the few practical reformers after our Holy Prophet of Islam—on whom be peace. I do hope that the hon. Third Member for Colombo Central will withdraw that sudden, impulsive, remark that he made yesterday.

I have often brought to the notice of the Hon. Minister and also our worthy Prime Minister that the coconut industry must be given a helping hand. Ninety-five per cent of this industry is in the hands of Ceylonese and almost 90 per cent. in the hands of small-holders. So that you will see, Sir, that this is the one and only industry which really should be helped by the Hon. Minister. I do hope that the Hon. Minister will see to it that this industry is given the share of attention it should really get.

එල්. බී. දසනායක මයා. (ගම්පොල)
(திரு. எல். பி. தஸநாயக்க—கம்பஹா)
(Mr. L. B. Dassanayake—Gampola)

ගරු සභාපතිතුමනි, මම දීර්ඝ කථාවක් කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. මට වුවමනා කරන්නේ මිනිත්තු 5 ක 6 ක කාලයක් පමණයි. මෙම අයවැය ශීර්ෂය යටතේ ගරු වෙළඳ ඇමතිතුමා කටයුතු රාශියක් අළුතෙන් ආරම්භ කිරීමට යන අවස්ථාවේදී එතුමාට විශාල කරදර රාශිය කට මුහුණ පාන්නට සිදු වීම පුදුමයක් නොවේ. මහජන නියෝජිතයන් හැටියට ඊට යම්කිසි සහයෝගයක් දීම අප කාගේත් යුතුකමක්ව තිබෙනවා. නමුත් එක් කරුණක් කෙරෙහි වෙළඳ ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට මම බලාපොරොත්තු වෙනවා.

මේ රටේ සමුපකාර ව්‍යාපාරය ඒ තරම්ම ප්‍රතිඵලදායක පරිදි ව්‍යාප්තවී නැති නිසාත්, පාරිභෝගිකයාට බඩු ගැනීම සඳහා සමුපකාර කඩවල ඇති අවහිර නිසාත්, සාමාන්‍ය පෞද්ගලික වෙළෙන්දාගේ තත්ත්වය තව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දුරටත් ආරක්ෂා කිරීමට අපට සිදු වී තිබෙනවා. සාමාන්‍ය පෞද්ගලික වෙළෙන්දාට තැනක් දිය යුතුව තිබෙන්නේ කරුණු කීපයක් නිසයි. අපේ ගම්බද ප්‍රදේශවල කම්කරුවන් හැටියට වැඩ කරන කම්කරුවන් ගොවි කම්මන්තයේ යෙදී සිටින ගොවිරාළත් යන හැම කෙනකුටම ලැබෙන්නේ ඉතා සුළු ආදායමක් බව තමුන්නාන්සේ දන්නවා ඇති. එම නිසා ඉතා සුළු ආදායමක් ලබන ඔහුට කෑම බීම් ඇඳුම් පැළඳුම් ආදිය දීමෙන් ඔහුගේ දරුමල්ලන් හා ඇඟෑණියන් ආරක්ෂා කරන්නට සිදු වී තිබෙනවා. එදිනෙදා මුදල් දී යම්කිසි ද්‍රව්‍යයක් ගැනීමට ඔහුට පුළුවන් කමක් නැහැ. එම නිසා මේ මුළු ලංකාවේම ජීවත් වන කම්කරු පංක්තියත් ගොවි පංක්තියත් යන දොගොල්ලම කඩයට ගොස් ණයට බඩු ගැනීමටයි අද ඇබ්බැහි වී තිබෙන්නේ. ඒ සඳහාම අවසථාවක් ලැබෙන පරිදි සමුපකාර බැංකු ක්‍රමයක් ඇති කිරීම ගැන අපි සන්තෝෂ වෙනවා; නමුත් එය ව්‍යාප්ත වී හරියාකාර ක්‍රියාත්මක වන්ට තව දීර්ඝ කාලයක් ගත වෙනවා ඇති. එම නිසා දුප්පත් අසරණ ජනතාවට එතෙක් අර පරණ පුරුදු ක්‍රමයටම ජීවත් වීමට සැලැස්විය යුතුයි. සාමාන්‍යයෙන් අසරණ ජනයා ජීවත් වන්නේ කෙසේද යනු වෙළඳ ඇමතිතුමාට අප කවුරුන්වත් කිය යුතුය කියා මම සිතන්නේ නැහැ. මක්නිසාද? සාමාන්‍ය ගම්බදව ජීවත් වන මිනිසා බඩු ගන්න හැටි කන බොන හැටි ආදී සෑම දෙයක් ගැනම ගරු වෙළඳ ඇමතිතුමා හොඳින් දන්න නිසයි.

එමෙන්ම ලාංකික වෙළෙන්දෘ සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන්ගේ යම් යම් ප්‍රකාශ නිසා අද ලාංකික වෙළෙන්දෘ සම්පූර්ණයෙන්ම බයේ සිටිනවා ඔහුගේ අනාගත තත්ත්වය කුමන අතට හැරේද කියා නොදනී. මේ දක්වා නිදහස්ව ගෙන ගිය ව්‍යාපාරය තව දුරටත් නිර්භයව ගෙන යන්ට ඔහුට අද පුළුවන් කමක් නැතිව තිබෙනවා. එම නිසා විශේෂයෙන්ම ලාංකික වෙළෙන්දාට අද තිබෙන තත්ත්වයත් අනාගතයේදී අවුරුදු 5 කින් 6 කින් හෝ ඇති වන්ට යන තත්ත්වයත් පිළිබඳව ප්‍රසිද්ධ ප්‍රකාශයක් දැන් වෙළඳ ඇමතිතුමා විසින් කළ යුතුව තිබෙනවා.

අපි කවුරුත් දන්නවා අද ගම්බද-නගර බද ජීවත් වන දුප්පත් අසරණ මහජනයා අතර රැකීරක්ෂා හිඟයක් තිබෙන බව. රැකීරක්ෂා නැතිව සිටින ඒ උදවිය හැම වේලේම "අපට අහවල් රක්ෂාව ලැබෙන්න පුළුවන්. අහවල් රක්ෂාව ලැබෙන්න පුළුවන්" කිය කියා හිතමින් ඒ සඳහා සෑම උත්සාහයක්ම දරමින් සිටිනවා.

අ. භා. 7.

සිය දෙනකු උත්සාහ කරනවා නම් එයින් දෙතුන් දෙනාටයි රක්ෂා ලැබෙන්නේ. ඉතිරි වන 98 දෙනා ඊළඟට කරන්නේ මොකද? 10 ක් 15 ක් වෙළඳාමට හිත යොමු කරනවා. මේ විධියට අසරණ කමින් තමයි, වෙළඳාම උපන්නෙ. රැකී රක්ෂා ලබා ගන්න බැරිකම නිසා, සිවිල් සර්විස් වැනි විභාග සමත් කර ගන්න බැරි නිසා දොස්තර විභාගය සමත් වන්න බැරි නිසා මිනිසුන් වෙළෙඳාමට බසිනවා. මා මේ කියන්නේ කොළඹ සිටින වෙළඳුන් ගැන නොවෙයි. ඈත පිටිසර කිසියම් වෙළඳුන් කොටසක් සිටිනවා නම් ඔවුන් එම වෙළඳාම පටන් ගත්තේ මෙකී පදනම මේ සිටයි. දෘඪතර උත්සාහයක් ඇතිව වෙළඳාම ආරම්භ කරනවා. අතේ තියෙන්නේ සුළු මුදලයි. ටවුමට ගොස් ඒ සුළු මුදලට බඩු ගෙන පසුව ණයටත් ගන්නවා. මේ විධියටයි, ගම්බද වෙළෙන්දා වෙළඳාම පටන් ගන්නෙ. දියුණු වූ වෙළඳුන්ට නම් මොනවා වුණත් කමක් නැහැ. ඔවුන් ඉඩකඩම් මිළට ගෙන ඇති; ගෙවල් දොරවල් සාදා ගෙන ඇති; පවුලේ නඩත්තුව සඳහා කිසියම් මුදලක් ඉතිරි කර ගෙන ඇති. වෙළඳාමක් ආරම්භ කිරීම සඳහා අසරණයකු තුළ කැමැත්තක් ඇතත් දැන් තිබෙන ත්ත්වය අනුව ඔහු ඊට ඉදිරිපත් වන්නේ නැහැ. ඔහු තුළ ලොකු භයක් තිබෙනවා. එම නිසා කිසියම් ප්‍රකාශයක් කොට ලාංකික වෙළෙන්දාගේ, දුප්පත් වෙළෙන්දාගේ ඇති භය නැති කර වන්න ඕනෑ. ඔවුන්ට කිසියම් අවබෝධයක් ලැබෙන පරිදි ස්පිර නිගමනයක එළඹිය හැකි වන පරිදි කිසියම් ප්‍රකාශයක් කරන්න.

මා කරවල ගැන කථා කරන්න බලා පොරොත්තු වන්නේ නැහැ. කරවල තිබෙනවායයි සමහර ගරු මන්ත්‍රීවරු කියන අතර, සමහරු නැතැයි කියනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. බී. දසනායක මයා.]

අලි දෙනවා, කොටි දෙනවා, රට ස්වයං පෝෂිත කරනවා, කිරියෙන් පැණියෙන් උතුරුවනවා කියමින් දුප්පත් ගම්බද ජනතාවගේ ඡන්දය ලබා ගෙන අවුත් දෙපැත්තට බෙදී යට තිබෙන භෝජනා ගාරයට ගොස් බඩ පුරා කුකුල් මස් කා මේ සභා ගර්භයට අවුත් එක එක්කෙනා එක එක දේවල් කියනවා. කරවල තිබෙන වායයි සමහරු කියනවා; නැතැයි සමහරු කියනවා. එහෙත් අද දින මේ රටේ ජනතාවට විඳින්න සිදු වී තිබෙන ගැහැට ගැන සොයා බැලුවේ කවුද? එක එක දේවල් කථා කරන්නේ ඔවුන්ගේ නියම තත්ත්වය ගැන සොයා බලාද? මේ පැත්තෙන් එකක් කියන කොට ඔය පැත්තෙන් ඒකට පිළිතුරු දෙනවා. ඔය පැත්තෙන් එකක් කියන කොට මේ පැත්තෙන් ඒකට පිළිතුරු දෙනවා. එහෙත් අප සමජවාදය කරා ගමන් කරන නියම සමාජවාදීන් නම් රටේ ජනතාවගේ තත්ත්වය තේරුම් ගෙන කථා කරනවා මිස සම්ප්‍රලාප දොඩවන්න හොඳ නැහැ. රටේ ජනතාව ජීවත් වන හැටි, කන බොන හැටි, අදින පළඳින හැටි දැන ගෙනද කථා කරන්නේ? නැහැ. මා හිතන්නේ එකක් කථා කළත් හිත ඇතුළේ වෙන එකක් තිබෙන බවයි. දේශපාලන වේදිකාවේදී මෙන් මේ ගරු සභාවේ සිටත් ජනතාව මුළාවෙන් මුළාවට පත් කරවන කථා පැවැත්වීම මේ ගරු සභාවේ ගෞරවයට හේතු වෙනවාද? මේ ගරු සභාවේ සිට දේශපාලන බොරු ප්‍රචාර කරන්න එපා. මේ ගරු සභාවේ ගෞරවය ආරක්ෂා කරන ලෙස මා මේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට ඉතාම වැදගත් කාරණයක් කිය යුතුව තිබෙනවා. මේ රටේ ආර්ථික තත්ත්වයේ කොඳු ඇටය තේ බව අපි දන්නවා. තේ ගඟ තමා භාණ්ඩාගාරයට ගලන ලොකුම ආදායම් ගංගාව. එහෙත් අද දින කන්ද උඩ රට ප්‍රදේශයේ අමු තේ කොළ රාත්තලක මිල ශත 12 යි. එයින් අමු තේ දළු රාත්තලක් කඩන්ට ශත 6 ක් ගියාම තවත් ඉතිරි වන්නේ ශත 6 යි. එයින් වත්තට පෝර දාන්න ඕනෑ. වත්තේ කාණු කප්ප වන්න ඕනෑ. මුල්ලු කර වන්න ඕනෑ. කප්පාදු කර වන්න ඕනෑ. ඒ හැමෝටම පඩි නඩි ගෙවන්නත් ඕනෑ. මේ රටේ ආදායමෙන් අර්ධයක් විතර ලැබෙන මෙම ව්‍යාපාරයේ යෙදී සිටින සිටින අයට ඒ කටයුතු කරන්න සැහෙන මුදලක් ලබා දෙන මාර්ගයක් ගැන සොයා බලා වහ වහා කටයුතු නොයෙදුවොත් සිදු වන්නේ කුමක්ද? අඳින පළඳින රෙද්දේත්, ඒ වගේම නොයෙක් බඩුවලත් මිළ ඉහළ ගිහින් තිබෙන අතර මෙ රටට ආදායම් ලැබෙන දේවල මිළත් පහළ බහිනවා නම් මේ රටේ ජනතාව කොතැනින්ද ශාන්තියක් ලබා ගන්නේ? කොතැනින්ද විමුක්තියක් ලබා ගන්නේ? තේ සම්බන්ධයෙන් මට වැඩිපුර යමක් කියන්න පුළුවන්කමක් නැහැ. තේ කර්මාන්ත ශාලා ගැන, තේ කපන ක්‍රම ගැන අපේ ගලගෙදර ගරු මන්ත්‍රීතුමා (කේ. අබ්දුල් ජබාර් මයා.) හොඳහැටි දන්නවා. එක්සත් ජාතික පක්ෂය අවුරුදු 9 ක් තිස්සේ කළේ මොනවාද කියා මහියංගනයේ ගරු මන්ත්‍රීතුමාගෙන් (සී. පී. ජේ. සෙනෙවිරත්න මයා.) ප්‍රශ්න කළා. මම නම් එක්සත් ජාතික පක්ෂයට බැඳුණේ මේ ළඟදීයි. ගලගෙදර මන්ත්‍රීතුමා ඊට කලින් බොහෝ කාලයක් එක්සත් ජාතික පක්ෂයේ සිටි නිසා එක්සත් ජාතික පක්ෂය කළ වැඩ ගැන හොඳින් දන්නවා ඇති.

කේ. අබ්දුල් ජබාර් මයා. (ගලගෙදර)
(ஜனாப் கே. அப்துல் ஜபார்—கலகெதர)
(Mr. K. Abdul Jabbar—Galagedara)

ඒ ප්‍රතිගාමී අදහස් අත්හැරල ප්‍රගතිශීලී වැඩ කරන්නයි, මේ පැත්තට ආවෙ.

දසනායක මයා.
(திரு. தஸநாயக்க)
(Mr. Dassanayake)

භාණ්ඩාගාරයට ගලා ගෙන එන ඒ වැදගත් මුදල නවතින්න ඉඩ හරින්නේ නැතිව නවත් ලැබෙන අයුරුත් ඒ වගේම ඒ ඉඩම් අයිතිකාරයන්ටත්, එ්වායේ සේවය කරන පිරිසටත් සෑහෙන ආදායමක් ලැබෙන විධියටත් යම්කිසි මාර්ගයක් ඇති කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. තවත් කරුණක් ගැන කියන්නට තිබෙනවා.

ගම්පොළ පළාතේත්-ගරු කථානායකතුමාගේ කොට්ඨාශය කියා කියන්න මා සමාව අයැද සිටිනවා-නාවලපිටිය කොට්ඨා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නවා. ඒවා පාලනය වන්නේ, සමුපකාර ප්‍රතිපත්තිය කියා එකක් තිබෙනවා නම් ඊට සම්පූර්ණයෙන්ම විරුද්ධ පිළිවෙළ කටයි. සමුපකාර ව්‍යාපාර කියා කියන්නේ මහජන සංවිධානවලටයි. ගම්පොළ සහ උඩ පළාත කියන සමුපකාර සංගම් දෙක පාලනය කරන්නේ පළාතේ ඩී. ආර්. ඕ. මහත්මයා සහ තවත් ආණ්ඩුවේ නිලධාරීන් දෙදෙනකු විසිනුයි. ඒ බෝඩ් එකේ මහත්වරු උත්සාහයෙන් වැඩ කරනවා. ප්‍රයෝජනවත් වැඩකොටසක් මහජනයාට එයින් සිදු වී තිබෙනවා. නමුත් ඒ වැඩ කිරීම නිසා ඩී. ආර්. ඕ. මහත්මයාට ඩී. ආර්. ඕ. තනතුරේ වැඩ කටයුතු හරියාකාර කරන්න බැරිව තිබෙනවා. ගම්පොළ ඩී. ආර්. ඕ. මහත්මයා දක්ෂ, හුරුබුහුටි, හොඳින් කටයුතු කරන මහත්මයෙක්. නිදර්ශනයක් වශයෙන් මම මේ කාරණය පෙන්වා දෙන්න සතුටුයි. පසුගිය කාලයේ ඡන්ද කොට්ඨාශ අනුව ජ්‍යෙෂ්ඨ සමතුන් 25 දෙනකු බැගින් පත් කිරීමට ගිය අවස්ථාවේදී නියමයක් කර තිබුණා, ඉල්ලුම් කරුවාගේ නම ඒ පළාතේ ගෘහ මූලික ලැයිස්තුවේ තුන් අවුරුද්දක් තිබුණු බවට සහතිකයක් ඉදිරිපත් කරන්නටය කියා. ඉල්ලුම්කරුවන් කීප දෙනෙක් ඒ සහතිකය ලබා ගන්නට ගම්පොළ ඩී. ආර්. ඕ. මහත්මයාගේ කාර්යාලයට ගියා, නමුත් එතුමා සිටියේ නැහැ. මොකද කියා සොයා බැලුවාම පෙනී ගියේ සමුපකාර වැඩ පිළිවෙළක් දැනගැනීම සඳහා ජර්මනියට ගොස් තිබෙන බවයි. ඒ පැත්තේ අධ්‍යාපන නිලධාරියාත් සෑහෙන ආඥාදායකයෙක්. මෙම සහතිකය ගෙන යන්න බැරි වූ අසරණයන් හත් අට දෙනකුට ලබා ගන්න පුළුවන්කම තිබුණ රක්ෂා ලබා ගන්න බැරිව ගියා. ඒ විධියට සිදු වුණේ අධ්‍යාපන නිලධාරියාගේ ආඥාදායකකමත්, ඒ වගේම ඩී. ආර්. ඕ. මහත්මයා සමුපකාර ක්‍රම ඉගෙනීමට ජර්මනියට යාමත් නිසයි. කීප දෙනෙකුට රක්ෂාව නැති වුණා. සල්ලි තිබෙන මිනිසුන්ට නම් අමාරුවක් නැහැ. ලොකු ලොක්කන්ට නම් අමාරුවක් නැහැ. අසරණයින්ට ලොකු අමාරුවක්. දෙමව් පියන් කොයි තරම් බඩගින්නේ ඉඳලද, කොයි තරම් මහන්සි වෙලාද, කොයි තරම් කරඩි උදලුගාලාද තම ළමයින් ජ්‍යෙෂ්ඨය සමත් වන තුරු ඉගැන්වූයේ? ඒ නිසා මෙය ඔවුන්ට වන මහත් අසාධාරණයක් නොවේ? [බාධා කිරීමක්] මම කියන්නේ මට ලැබී තිබෙන පැමිණිල්ලකුයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
එය වැරදි පැමිණිල්ලක්.

දසනායක මයා.
(திரு. தஸநாயக்க)
(Mr. Dassanayake)
අසරණයින් වෙනුවෙන් ඉදිරිපත් වෙනවා නම්, අසරණයින් වෙනුවෙන් කථා කරනවා නම්, මහනුවර අධ්‍යාපනය කාර්යාලයට එන්න මාත් සමග, එහි සිදු වන දේ පිළිබඳව මම පෙන්නා දෙන්නම්. කල් තැබීමේ යෝජනා කාලයේදී ඒ පිළිබඳව ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීම සඳහා මම දැන් ලියකියවිලි ගෙනවුත් තිබෙනවා.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමා කරුණා කර මේ වැය ශීර්ෂය යටතේ කථා කරන්න.

දසනායක මයා.
(திரு. தஸநாயக்க)
(Mr. Dassanayake)
ගම්පොල තිබෙන සමුපකාර යුනියන් එකෙන් ඒ ප්‍රදේශයේ වෙළඳුන්ට වුවමනා පමණ බඩු ලැබෙන්නේ නැතිලු. දැනට සති දෙකකට පමණ පෙර මා දුම්රියේ නැගී කොළඹ එන විට ඒ යුනියන් එක පාලනය කරන මහත්මයාත් මාත් සමග ආවා. ඒ මහත්මයා මට කිව්වා, කරුණා කර ඇමතිතුමාට දන්වන්න, අපට ලැබුණු කරවල හොණ්ඩර 10 මදිය කියා. ඒ මහත්මයා එසේ කියන විට ඒ අසලම වාසනාවකට මෙන් ඇමතිතුමාගේ පෞද්ගලික ලේකම් මහත්මයාත් සිටියා. මේ පුවත ඇසූ ඒ ලේකම් මහත්මයා වුවමනා කරවල ලබා දීමට බාර ගත්තා. අද තිබෙන පැමිණිල්ල ඒ යුනියන් එකෙන් පෞද්ගලික වෙළඳුන්ට බඩු ලැබෙනවා මදිය කියන එකයි. එසේ බඩු ලබා දීමට යම් කිසි අපහසුවක් තිබෙනවා නම් ගම්පොළත් සමුපකාර තොග වෙළඳ ආයතනයේ ශාඛාවක් විවෘත කරන්ටයයි මම ඇමතිතුමාගෙන් කරුණා වෙන් ඉල්ලා සිටිනවා. ඒ සම්බන්ධයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දසනායක මයා.]

ගම්පොළ නගර සභාවත් ලියවිලි ඉදිරිපත් කොට තිබෙන බව මට ආරංචියි.

අවසාන වශයෙන් තව කාරණයක් කියන්න තිබෙනවා. මේ රට දැන් පාලනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු අග මැතිනියත්, ඇමති මණ්ඩලයත්, අනෙක් මන්ත්‍රීවරුනුත්, සියලු දෙනාම වාගේ රටේ ආර්ථික තත්ත්වය ඉතා බැරුරුම් යයි පවසමින් පරිත්‍යාගයක් කරන්ටයයි රට වැසියාගෙන් ඉල්ලනවා. මීට පෙර කථා කළ නුවරඑළියේ ගරු මන්ත්‍රීවරයාත් ආණ්ඩුවේ සේවකයින්ගෙන් ඉල්ලා සිටිය, මේ රටේ විමුක්තිය සඳහා යම් කිසි වැද ගත් පරිත්‍යාගයක් කරන ලෙස. මම මේ සම්බන්ධයෙන් යෝජනාවක් කරන්න සතුටුයි . අපි අනුන්ට පරිත්‍යාගයක් කරන්න යයි කියන්න පෙර අපිම එසේ කිරීමට සූදානම් වෙමු. සෑම මන්ත්‍රීවරයකුම තමන්ගේ අවුරුද්දක පඩිය රට වෙනුවෙන් පරිත්‍යාග කරමුයයි යෝජනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

අබ්දුල් ජබ්බාර් මයා.
(ஜனூப் அப்துல் ஜபார்)
(Mr. Abdul Jabbar)
අපි ලෑස්තියි.

අ. භා. 7.15

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

Sir, I rise to a point of Order to ask you whether the procedure that is being adopted now is leading us anywhere. Very specific and concrete charges were made about certain appointments in the C. W. E. Hon. Members of the Government party got up and started slinging mud at some of us and some of those who made those charges. That is not what we except from a responsible Government. Let the Hon. Minister get up and explain why those appointments were made and whether there is anything in those charges. That is the duty of this Government, and not to ask a back-bencher to get up and sling made. You can sling any amount of mud but we can answer if we are given the time. Let the Hon. Minister give a reply because very serious charges have been made.

The hon. Member for Bulathsinhala (Mr. Edmund Samarakkody) made those charges, I made those charges and the hon. Member for Galle (Mr. W. Dahanayake) made those charges. They were specific charges, that irregular appointments have been made, appointments which do not conform to any principle. It is the duty of the Hon. Minister to answer them and not to ask a back-bencher who knows nothing to sling mud which has been lent to him. So I would ask you that it would be much better, we would be saving time, and the discussion and Debate would lead to some purpose if, when concrete, specific, charges are made, the Hon. Minister gets up and explains the position. Either he should take responsibility for those irregular appointments or he should say he would hold an inquiry and take the necessary action.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

Mr. Chairman, may I explain the position ? When reference was made to certain appointments in the C.W.E. I wanted to intervene and clear certain doubts. But I will have an opportunity of replying to the charges that were made and I am waiting for that opportunity. I shall reply at the proper time and then I will meet the arguments adduced. I shall try to make a definite statement, otherwise I shall have the necessary information made available to the House. It is not proper to anticipate that I might not perform my duty.

ජී. ඩබ්ලිව්. සමරසිංහ මයා. (කුලියාපිටිය)
(திரு. ஜீ. டப்ளியு. சமரசிங்ஹ—குளியாப்பிட்டிய)
(Mr. G. W. Samarasinghe—Kuliyapitiya)

ගරු සභාපතිතුමනි, පොල් ප්‍රදේශයකින් සිට එන මන්ත්‍රීවරයකු හැටියට මේ අවස්ථාවේදී මාත් වචන ස්වල්පයක් කිව්ව කරන්න විශේෂයෙන් බලාපොරොත්තු වන්නේ කුලියාපිටිය සහ අවට ප්‍රදේශයේ ජනතාවට පොල් මිල පහළ යාම නිසා දැන් දුෂ්කර තත්ත්වයකට පත්වන්නට සිදු වී තිබෙන නිසයි. මේ ප්‍රදේශයේ තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රධාන වැවිල්ල පොල් බව තමුන්නාන්සේ දන්නවා ඇති. පොල් මිල අඩු වීම නිසා පොල් ගස් 50ක් 60ක් තිබෙන ගැමියන්ට එසින් ලැබෙන ආදායම එදිනෙදා ජීවිතය ගෙන යාමට කොහෙත්ම මදි. සමහර අයට තමන්ගේ සුළු ඉඩ කඩම් ටික පවා විකුණන්ට සිදුවේගන එනවා. මීට අවුරුදු කීපයකට පෙර පොල් මිල සම්බන්ධයෙන් මේ විධියේ අසතුටුදායක තත්ත්වයක් තිබීම නිසා ගම්වල දුප්පත් ජනයාගේ කුඩා ඉඩම් දැන් විශාල වතු යායවල් බවට හැරී තිබෙනවා. ණය වීම නිසා හෙට්ටින් ටත් ධනපතියන්ටත් තමන්ගේ ඉඩ කඩම් අයිති වී සුළු ඉඩම් හිමි ගැමියන් දැන් දුඃඛිත තත්ත්වයක සිටින බව කියන්නේ කනගාටුවෙනුයි. දැන් ඔවුන් ඉඩම් හිඟය කින් පෙළෙනවා. එවැනි අවස්ථාවකදී ඒ ප්‍රදේශයේ ප්‍රධාන ද්‍රව්‍යය මෙවැනි තත්ත්ව යකට වැටී තිබීම නිසා නැවතත් ඒ අය මීට අවුරුදු ගණනකට පෙර වැටුණු තත්ත් වයටම වැටෙනවාට කිසිම අනුමානයක් නැහැ.

දසනායක මයා.
(திரு. தஸநாயக்க)
(Mr. Dassanayake)

Mr. Chairman, I rise to a point of Order. An hon. Member of this House is in the Public Officers' Box.

ජී. ඩබ්ලිව්. සමරසිංහ මයා.
(திரு. ஜீ. டப்ளியு. சமரசிங்ஹ)
(Mr. G. W. Samarasinghe)

ගරු ඇමතිතුමා මේ ගැන සලකා බලා සියුම් ක්‍රියා මාර්ගයක් ගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා. ලාංකිකයන් සතුව පව තින මේ වෙළඳාම ගැන මහජන රජය කල් පනාකාරීව සුදුසු ක්‍රියා මාර්ගයක් ගන්නවා නම් හොඳයි.

ගරු සභාපතිතුමනි, අද තේ, රබර් යන ද්‍රව්‍ය දෙකේ මිල සම්බන්ධව ක්‍රියා කිරීමට මණ්ඩල පත් කර තිබෙන බව අපි දන්න වා. එසේම පොල් සම්බන්ධයෙනුත් දෙපාර්තමේන්තුවක් පිහිටුවා පොල් සම් බන්ධව පිට රට ප්‍රචාරය කර පොල්වලට සෑහෙන මිලක් ලබා දුන්නොත් එමගින් ඒ ප්‍රදේශයේ තිබෙන රැකීරක්ෂා ප්‍රශ්නය බොහෝ දුරට විසඳා ගන්න පුළුවන් වේ යයි මම විශ්වාස කරනවා.

ඒ සමගම මතක් කළ යුතු තවත් වැද ගත් ප්‍රශ්නයක් තිබෙනවා. වයඹ පළාතේ පොල් මෝල් 9ක් ක්‍රියාත්මක වෙමින් තිබුණා. නමුත් අද ඒ පොල් මෝල් 9 යේ ම වැඩ සම්පූර්ණයෙන් අත් සිටුවා තිබෙන බව මට දැන ගන්න ලැබුණා. ඒ මෝල් ගෙන ගිය සමාගම් අනුගමනය කළ අයථා ක්‍රම නිසා සමහර විට මේවා වැහෙන්නට ඇති. නමුත් මේ අවස්ථාවේදී මේ මෝල් 9ට රජයෙන් රුපියල් 20 ලක්ෂයක පමණ ආධාර මුදලක් දෙන්න බලාපොරොත්තු වන බව මම පත්‍ර මාර්ගයෙන් දැක්කා. යම් කිසි විධියකින් ඒ මෝල් සඳහා ආධාර මුදලක් දෙනවා නම්, අලුත් සංගම් ඇති කර මේ වැදගත් ව්‍යාපාරය ක්‍රියාත්මක කරන ලෙස මම ඉල්ලා සිටිනවා. මේ මෝල් 9 යෙන් හොරොම්බාව මෝල පිහිටා තිබෙන්නේ මගේ ප්‍රදේශයෙයි. මේ මෝල ක්‍රියාත්මක කළ අවස්ථාවේදී ඒ මගින් 1,500කට පමණ තමන්ගේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා ගන්නට පුළුවන් වුණා. අද යකඩගොඩ පමණයි, එහි ඉතිරි වී තිබෙන් නෙ. මා දෙපාර්තමේන්තුවට ඒ බව පෙන් වා තිබෙනවා. අලුතෙන් සංගමයක් ඇති කර ඒ මෝල් ක්‍රියාත්මක කර ඒ ප්‍රදේශ යේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට කටයුතු කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා. එම නිසා මම ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා, ඒ මෝල් 9 ට මුද ලක් දෙන්න බලාපොරොත්තු වෙනවා නම් එම මුදල හොරොම්බාව මෝලට ලැබෙන්න සලස්වන ලෙස. හොරොම්බාව, ගොකරැල්ල, බත්තුළුඔය, කුරුණෑගල ආදි ප්‍රදේශවල ඇති මේ මෝල් 9ය නියම විධියට ක්‍රියාත් මක කිරීමට වැඩ පිළිවෙළක් ඇති කළොත් අඩු ගණනේ 9,000 කටවත් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් වන බව මම ප්‍රකාශ කරන්න කැමතියි.

මේ ප්‍රදේශයේ මහජනයාට තමන්ගේ ජීවන තත්ත්වය උසස් කර ගැනීමට තිබෙන මාර්ගය පොල් කර්මාන්තය සහ කොහු කර්මාන්තය යන කර්මාන්ත දෙකයි. පසුගිය දවස්වල ගරු ඇමතිතුමා පොල් කර්මාන්තය පිළිබඳව කටයුතු කිරීමට නියෝජිත පිරිසක් පිට රට යැවූ බව අපි දන්නවා. නමුත් නියෝජිත පිරිසක් පිට රට යැවූ පමණින් මේ වැදගත් කර්මාන් තය සම්බන්ධයෙන් සැලකිය යුතු දෙයක් ඉටු වේය කියා මම විශ්වාස කරන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. ඩබ්ලිව්. සමරසිංහ මයා.]

නැහැ. එම නිසා ගරු ඇමතිතුමා පිට රට ගොස් වෙනත් රටවල් සමග සාකච්ඡා කර බඩු හුවමාරු කර ගැනීමෙන් මේ වැදගත් ව්‍යාපාරයට ආධාර දෙනවා ඇතැයි මම බලා පොරොත්තු වෙනවා. මේ ප්‍රදේශයේ පොල් හැර වෙන කිසිම වැවිල්ලක් සාර්ථකව කරන්න බැහැ. එකම ප්‍රධාන වැවිල්ල තමා පොල්. වී ගොවිතැන ගැන විශ්වාසයක් තියන්න බැහැ. ඊට හේතුව, අහස් වතුරෙන් ගොවිතැන් කරන්න බලාගෙන ඉන්න සිදුවී තිබීමයි. බීජ වැපුරුවාට පසුව ඒවා කපාගන්න ලැබේදෝ නොලැබේදෝ කියන එක ගැන කිසිම විශ්වාසයක් තබන්නත් බැහැ. කන්න දෙක තුන කුඹුරු පාලු වෙනවා. පොල් කර්මාන්තයෙන් පමණයි යැපෙන්න පුළුවන්කම තියෙන්නෙ. මෙයින් පහර වදින්නේ පොහොසතුන්ට පමණය කියා සිතන්න එපා. මේ විධියට පොල් මිල අඩු වුණොත් වතු හිමියන් කරන්නෙ වතුවල වැඩ නතර කිරීමයි. මෝල් කාරයනුත් වැඩ නතර කරනවා. එවැනි අවස්ථාවන්හිදී ගම්බද දුප්පත් අය වයි පහර වදින්නෙ. එම ප්‍රදේශයේ මන්ත්‍රීවරයකු වශයෙන් මා කියා සිටින්නේ මේ ගැන හොඳින් කල්පනා කර බලන ලෙසයි. ගම්බද දුප්පත් අයට හානියක් සිදු වී ඇති බව පෙන්වන්නයි මා මේ කරුණු ඉදිරිපත් කළේ. මගේ කථාව අවසාන කරනවා.

ආර්. ජී. සේනානායක මයා. (දඹදෙණිය)
(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)
(Mr. R. G. Senanayake—Dambadeniya)

මා වැඩි කාලයක් ගන්න අදහස් කරන්නෙ නැහැ. වෙළඳ ඇමති අංශය ගැන දින දෙකක් තිස්සේ විවාද වෙලා තියෙනවා. එම නිසා පළල් අදහස් ටිකක් වචන සවලපයකින් ප්‍රකාශ කරන්න මා කල්පනා කරනවා. මෙසේ කථාවක් කරන්න අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා.

අපේ රටේ පමණක් නොවෙයි, මෙලොව ඕනෑම රටක් දෙස බැලුවොත් ජීවත් වීම සඳහා වැයම් කරන ජනතාව, එසේ ජීවත් වීම සඳහා රක්ෂාවල යෙදෙන ප්‍රධාන මාර්ග කොටස් හතරකට බෙදන්න පුළුවනි. පළමුවැන්න ගොවිතැනින් ජීවත් වීමයි. දෙවැන්න කර්මාන්ත වලින් ජීවත් වීමයි. වෙළඳාමෙන් ජීවත්වන කොටසක් ඊළඟට සිටිනවා. ඊළඟට පාලන අංශයෙහි රැකියාවක් කිරීමෙන් ජීවත්වන කොටසක් සිටිනවා. මා අන්තිම වශයෙන් සඳහන් කළ පාලන අංශයෙහි යම් කෙනෙක් රැකියාවක් කරනවා නම් ඒ සඳහා ඔහුට යම්කිසි වේතනයක් දෙන්නේ ආණ්ඩුවෙනුයි. එම නිසා පාලන කටයුතුවලින් රක්ෂා වෙන අයගේ බර සම්පූර්ණයෙන්ම ආණ්ඩුව මතා පැට වී තිබෙන බරක් හැටියට අප සලකන්න ඕනෑ. ඊළඟට ගොවිතැන්වලින් ජීවත්වන කොටස ගැන කියන්න කැමතියි. එම සංඛ්‍යාව ඉතා විශාලයි. රටේ වැදගත් සංවර්ධනයක් කරන කොටසක් තමා ඒ. ඒ අයටත් ආණ්ඩුවෙන් එක එක අන්දමට ආධාර උපකාර දෙන බව අප දන්නවා. ගොවි කර්මාන්තය දියුණු කිරීම සඳහා ආණ්ඩුවෙන් විශාල මුදලක් වැය කරන බව තමුන්නාන්සේ දන්නවා. අය වැය ලේඛනය දෙස බලන විට ආණ්ඩුව ගොවිතැන් කටයුතු සඳහා කොයිතරම් මුදලක් වියදම් කරනවාද කියන එක පේනවා. ඒ බරත් දරන්නේ ආණ්ඩුවයි.

ඊළඟට මා මතක් කළ කර්මාන්ත අංශය ගැන බලමු. කර්මාන්ත දියුණුව සඳහා ආණ්ඩුව අළුත් වැඩ පිළිවෙළවල් කීපයක් යොදා තිබෙන බව අප දන්නවා. කර්මාන්ත සඳහා නානාවිධ ආධාර මුදල් මෙන්ම ණය මුදල්ද ගෙවනවා. කර්මාන්ත දියුණුව සඳහා විදේශ රටවලින් විශේෂඥයන් ගෙන්වීමට එක්තරා වියදමක් යනවා. ඒ වියදමත් දරන්නේ ආණ්ඩුවයි. ඊළඟට බලමු මේ වෙළඳ අංශය ගැන. වෙළඳ අංශයට ආණ්ඩුවෙන් කරන උදව්ව මොකක්ද? වෙළඳ ව්‍යාපාරිකයන් තමන්ගේ ස්ව ශක්තියෙන් දියුණු වන කොටසක් නොවෙයිද? ආණ්ඩුව ඔවුන්ට ණය මුදල් දෙනවාද? කඩ කාමර ලබා දෙනවාද? බඩු බාහිරාදිය ලබාගන්න මාගී සලස්වා දී තිබෙනවාද? ඒ අය එම කටයුතු සියල්ලම කරගෙන යන්නේ ස්ව ශක්තියෙනුයි. ස්ව ශක්තියෙන්ම හැදී වැඩී රක්ෂාව කරගෙන යන කොටසක් තමා ඒ. වෙළඳ ව්‍යාපාරිකයන් ස්වකීය ව්‍යාපාර පවත්වාගෙන යන්නේ ආණ්ඩුවෙන් තුට්ටුවකවත් ආධාරයක් නැතුවයි. මුදල් අතින්වත්, වෙළඳ සැල් ආදී ස්ථාන පහසුකම් අතින්වත්, ඒ අයට ආධාරයක් නැහැ. වෙළඳ අංශය පිළිබඳ අධ්‍යාපන පුහුණුවක්වත් නැහැ. ස්ව ශක්තියෙන්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමන්ගේ දහඩිය මහන්සියෙන්, තමන්ගේම මුදල් වියදම් කරගෙන, තමන් විසින්ම කඩ කාමර සොයාගෙන නානා ප්‍රකාර කරදර රාශියක් මැදයි වෙළෙන්දන් තම රක්ෂාව කරන්නේ.

පසුගිය යුද්ධයට කලින් සෑම ගමකම පාහේ බහුල වශයෙන් විදේශිකයන් සිල්ලර වෙළඳාමේ යෙදී සිටි බව තමුන්නාන්සේ දන්නවා. ක්‍රම ක්‍රමයෙන් අපේ ජාතිකයන් තමන්ගේ තනි මහන්සියෙන්, ආණ්ඩුවෙන් හෝ වෙන අන් කවරෙකුගෙන් හෝ කිසිම ආධාරයක් නොමැතිව, ස්ව ශක්තියෙන් මෙම විදේශිකයන් වෙළඳාම් කරමින් සිටි ස්ථාන අරගෙන තමන්ගේ වෙළඳාම පටන්ගත් බව අප පිළිගන්න ඕනෑ. තනි මහන්සියෙන්, විදේශිකයන් සමග සටන් කොට, වෙළඳාමට බැස්ස අපේ ජාතිකයන් විශාල සංඛ්‍යාවක් ආණ්ඩුවට කිසිම බරක් නැතුව, ආණ්ඩුවෙන් කිසිම ආධාරයක් ඉල්ලන්නේ නැතුව ජීවත් වන බව අප කවුරුත් අවිවාදයෙන් පිළිගත යුතු කාරණයකි. ඒ උදවිය ආණ්ඩුව කර පිට බරක් දමනවා වෙනුවට ආණ්ඩුවේ සමහර බරද තමන්ගේ කර පිටට ගෙන වැඩ කටයුතු කර ගෙන යන බව මම මතක් කරන්න ඕනෑ. තමන් හම්බ කරන්නාවූ මුදලින් එක්තරා ප්‍රමාණයක් අය බදු වශයෙන් ආණ්ඩුවට දීලයි මේ අය ජීවිකාව කර ගෙන යන්නෙ. ඒ නිසා මේ අයට උපකාරයක් කිරීම ආණ්ඩුව සතු එක්තරා යුතුකමක් බව මා ගරු ඇමතිතුමාට මතක් කර දෙන්න කැමතියි. ඒ අන්දමට වැඩ කරන උදවියට තමුන්නාන්සේලා අද කර තිබෙන්නේ කුමක්ද? ආණ්ඩුව ඒ උදවියට කෙතරම් හිරිහැර කරනවාද? කොහේ ගියත් වෙළඳ පිරිසගෙන් මට අසන්නට ලැබෙන්නේ ඔවුන්ට විඳින්න සිදු වී තිබෙන අනන්ත ප්‍රමාණ දුක් කරදර ගැනයි. සමහර වෙළඳුන් තමන්ගේ වෙළඳ සැල් සම්පූර්ණයෙන්ම වසා දමා තිබෙනවා. "අපි ආණ්ඩුවෙන් විශේෂ උදව් උපකාර ඉල්ලන්නෙ නැහැ. අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ කවරෙකුගේවත් පිහිටක් නොමැතිව තනි ශක්තියෙන් සාදා ගත් වෙළඳ ව්‍යාපාරයන් පවත්වා ගෙන යන්නට ඉඩ දෙන හැටියටයි" මෙයයි ඔවුන්ගේ ඉල්ලීම.

අ. භා. 7.30

මෙපමණ කල් ස්වෝත්සාහයෙන් කට යුතු කර ගෙන ආ මේ උදවියට තමුන්නාන්සේලා මෙතෙක් කල් කර තිබෙන උපකාරය කුමක්ද? වෙළෙන්දෙකුගේ මූලික යුතුකම කුමක්ද? ඔහුගේ මූලික යුතුකම නම් බඩු බෙදා හැරීමයි. කුමන රටක හෝ වේවා නිපදවනු ලබන්නාවූ බඩු බෙදා හැරිය යුතුයි. ඒ නිසා රටක නිෂ්පාදනය බෙදා හැරීම, කුමන ක්‍රමයක් යටතේ හෝ වේවා, වෙළඳ ව්‍යාපාරිකයා ගෙන් කෙරෙන යුතුකමක් බව අප පිළිගන්න ඕනෑ. නිෂ්පාදනය කෙරෙන බඩු නියම විධියට බෙදා හරින්නේ නැත්නම් කවරදාවත් පාරිභෝගිකයාට නියම විධියට බඩු ලැබෙන්නේ නැහැ. ඒ නිසා නිෂ්පාදකයාට මෙන්ම පාරිභෝගිකයාටද උපකාර වන්නේ මේ මැද සිටින වෙළෙන්දා බව තමුන්නාන්සේලා කල්පනා කරන්න ඕනෑ.

සෑම වෙළෙන්දෙකුම පාහේ අද දින කළුකඩකාරයකු වශයෙන් හංවඩු ගසා තිබෙනවා. දූෂණ වැඩ කොහෙත් කෙරෙන බව පිළිගන්න ඕනෑ. ආණ්ඩුවේ පාලන අංශවල දූෂණ කටයුතු කෙරෙන්නේ නැද්ද? කර්මාන්ත අංශය, ගොවිකම් අංශය, නිෂ්පාදන අංශය, පාලක අංශය මේ ආදි වශයෙන් සෑම අංශයකම දූෂණ වැඩ කෙරෙන අවස්ථා තිබෙනවා නේද? ඒ නිසා කළුකඩකාරයන් යයි කියා ඒ සෑම දෙනාම තාර ගා හැඳින්වීම සුදුසුද? නිෂ්පාදකයාට මෙන්ම පාරිභෝගිකයාටද මුදින් සිටින වෙළෙන්දාට සෑම ආණ්ඩුවක්ම පාහේ උපකාර කරන අවධියකදී අපේ රටේ පමණක් පුළුවන් තරම් හිරිහැර කිරීම හරිද? මේ අය තමන්ගේ වෙළඳ සැල් වසා දමාගෙන යන බව තමුන්නාන්සේද දන්නවා ඇතැයි මම විශ්වාස කරනවා.

තමුන්නාන්සේ කොළඹ සිට නුවරට යන විට ඔය පාර දෙපස කෙතරම් වෙළඳ සැල් සංඛ්‍යාවක් දකින්න තිබෙනවාද, මේ වාසින් කී දෙනෙකු රක්ෂා වෙනවාද කියා මදක් කල්පනා කර බලන්න. නමුත් මේ වෙළඳුන් කළුකඩකාරයින්ය කියා නම්කර, අළුතින් බදු පනවා ඔය අන්දමට කරදර කරන්න කල්පනා කරනවා නම්, ඒ අයට මේ හැටි කරදර විඳින්න නොහැකිව, තම වෙළඳ ව්‍යාපාර සම්පූර්ණයෙන්ම නවතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

දැම්මොත් ඒ අයට රැකීරක්ෂා ලබාදෙන්න තමුන්නාන්සේට පුළුවන්ද? අද රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්න බැරි තරම් උග්‍ර වී තිබෙන මේ අවස්ථාවේදී, මේ ප්‍රශ්නය නිසා තව තවත් උග්‍ර වෙනවා නොවේදැයි කල්පනා කර බලන ලෙස මම තමුන්නාන්සේගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, අද කොයි අතින් බැලුවත් අපට පෙනෙන්නේ රැකීරක්ෂා ප්‍රශ්නයේ ඇති උග්‍ර තත්ත්වයයි. දවසින් දවසම රැකීරක්ෂා නැති අයගේ සංඛ්‍යාව ඉහළ යනවා. නමුත් තමුන්නාන්සේලාට, ඒ අයට රක්ෂා දීම සඳහා අළුතින් තව තවත් කර්මාන්ත ආරම්භ කරන්න මුදල් නැහැ. ඒවාගේම ගොවිතැන ආදියෙහි නිෂ්පාදන කටයුතු දියුණු කිරීමට මුදල් නැහැ. මේ විධියේ තත්ත්වයක් ඇති වී තිබෙද්දී තව තවත් බදු පනවා ඒ වෙළඳුන්ට පහර ගැසීමට සූදානම් වීම සාධාරණ දැයි සිතා බලන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, නොයෙකුත් කර්මාන්ත සඳහා මුදල් යෙදවීමට කල්පනා කිරීම ගැන ප්‍රශංසා කරන්න ඕනෑ. අප පිළිගන්නවා, රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට තමුන්නාන්සේලාගේ ආශාවකුත් තිබෙන බව. නමුත් මේ විධියේ ක්‍රියා කලාපයක් අනුගමනය කිරීමෙන් නම් ඒ ප්‍රශ්නය කවදාවත් විසඳන්න ලැබෙන්නේ නැහැ. සමහර විට තව අවුරුදු පහක් ගතවන විට මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්න පුළුවන් යයි මේ ආණ්ඩුව කියන නමුත් මේ විධියේ පාලන ක්‍රමයක් ගෙන යන තාක් කල් මෙතරම් බැරෑරුම් ප්‍රශ්නයක් විසඳන්න පුළුවන් වේයයි මම නම් කිසි සේත් සිතන්නේ නැහැ. දැනට මෙම බදු පැනවීම නිසා වෙළෙන්දාට රක්ෂාව නැති වී ගියොත් ඒ ගැන වගකිව යුත්තේ තමුන්නාන්සේ නොවෙද? තමුන්නාන්සේට පුළුවන්ද ඒ අයට රැකීරක්ෂා සපයා දෙන්න? ඒ අයට යම් ලෙසකින් රක්ෂා නැතිවුණොත් රක්ෂා සපයා දෙන්න පුළුවන් කමක් නිබෙනවා නම් මෙබදු පියවරක් ගන්නාට කමක් නැහැ. එසේ නැතුව නිකම් හිතුමනාපයේ මෙවැනි ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීම සාධාරණදැයි නැවත වරක් සිතා බලන ලෙස මම මතක් කර සිටිනවා. මේ ආකාරයෙන්ද තමුන්නාන්සේලා අපේ රටේ මහජනතාවට සේවය කරන්නේ කියා මම ප්‍රශ්න කරන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, අපේ මිනිසුන් වෙළඳ ව්‍යාපාර ගැන උනන්දුවක් දක්වන්නේය යන හැඟීමක් මේ රටේ එක් තරා කාල සීමාවකදී ඇති වුණා. එතෙක් විදේශීය වෙළඳුන් අතෙහි තිබුණු වෙළඳ ව්‍යාපාර ක්‍රම ක්‍රමයෙන් දේශීය වෙළඳුන් අතට ගැනීමට හැකිවීම නිසාත්, සව උත්සාහයෙන් වෙළඳ ව්‍යාපාර දියුණු කර ගැනීමට හැකිවීම නිසාත්, එබඳු හැඟීමක් මහජනතාව කෙරෙහි ඇති වුණා. එමෙන්ම පාසැල්වල පවා වාණිජ විෂයයන් උගැන්වීමට ආරම්භ කිරීමත්, ඒ පිළිබඳව ශිෂ්‍යයන් තුළ උනන්දුවක් ඇතිවීමත්, මේ රටේ වෙළඳ ව්‍යාපාර නගා සිටුවීමට ලොකු ධෛර්යයක් සේ සලකන්න පුළුවනි. කෙසේ හෝ වේවා මෙතෙක් විදේශීයයන් අතේ තිබුණු වෙළඳාම ක්‍රමක්‍රමයෙන් දේශීය වෙළඳුන් අතට ගැනීමට උත්සාහ දරන මේ අවස්ථාවේදී, එක්තරා සටනක් ගෙනියන මේ අවස්ථාවේදී, ඔවුන්ට මේ රජයෙන් පහර ගැසීමට කල්පනා කිරීම යුක්ති සහගත ක්‍රියා මාර්ගයක්දැයි මම ප්‍රශ්න කරන්න කැමතියි. කොටින්ම මේ ව්‍යාපාරයට පහර ගසනවා නම්, ඒ වෙනුවට තවත් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔවුන්ට මාර්ගයක් පාදා තිබෙනවා නම්, එහි යම්කිසි සාධාරණයක් ඇතැයි අපට කල්පනා කරන්න පුළුවනි. නමුත් ඒ කිසිවක් නැතිව කළුකඩකාරයින් යයි නම් කර, ස්ව උත්සාහයෙන් කරගෙන ආ වෙළඳ ව්‍යාපාර කඩාකප්පල් කර දැමීමට රජය ගන්න මේ පියවර ගැන අපට කිසි සේත් එකඟ වන්න බැහැ. මේ වෙළඳුන්ට දැන් විදේශිකයන්ගෙන් පමණක් නොවෙයි පහර වදින්නේ. වදින්න ගිය දේවාලේ හිස පිට කඩා වැටුණා වාගේ ගම්බද සුළු වෙළෙන්දාගේ පටන් සෑම කෙනෙකුගේම සහයෝගය ඇතිව පිහිටුවා ගත් මේ රජයෙන්ම ඒ වෙළඳුන්ට පහර වදිනවා. නමුත් දිවංගත ගරු බණ්ඩාරනායකතුමාට විශාල සහනයක් ලබාදීමට මේ වෙළඳුන් කටයුතු කළ බව අප අමතක කරන්න නරකයි. එමෙන්ම එතුමාගෙන් සහනයක් ඒ අයට සැලසුනු බවද කියන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කැමතියි. මම කියනවා වෙනුවට මේවා පිළි ගන්න එපා. මේවා ඇත්තද නැත්තද කියා තමුන්නාන්සේලාම කල්පනා කර වටහා ගන්න. යටියන්තොට ගරු මන්ත්‍රීවරයා (ආචාර්ය එන්. එම්. පෙරේරා) විශෙෂ යෙන් මේ කාරණය ගැනත් එතුමාගේ කථාවේදී සඳහන් කළා. ගරු සභාපති තුමනි, මේ වෙළඳුන් එක්තරා ජාතික හැඟී මකින් යුක්තව, විදේශිකයන්ට අයත්ව තිබෙන වෙළඳාම කෙසේ හෝ සවදේශික යන් අතට පත් කරන්න ඕනෑය කියන හැඟීමෙන් යුක්තව, කටයුතු කරගෙන යන අවස්ථාවේදී මේ අන්දමට සැලකීම කිසි සේත් සුදුසු නැති බව මට කියන්න සිදු වී තිබෙනවා. කොටින්ම මේ බලා පොරොත්තුව සාර්ථක කර ගැනීමට තමයි, එදා ගරු බණ්ඩාරනායකතුමා වැනි අයගේ නායකත්වයෙන් සිංහල මහා සභාව පිහි ටුවා ගත්තේ. එතුමාගෙන් මේ රටේ වෙළ ඳුන්ට හැම වේලේම ධෛර්යයක් ලැබුණා, සහයෝගයක් ලැබුණා. නමුත් අද, එතුමා ගේ නායකත්වයෙන් පිහිටුවා ගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවෙන්මයි, ඒ අයට පහර වදින්නේ.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ අද පිටකොටුව—කොටුව දිහාවට ගිහින් බලන්න. තමුන්නාන්සේට පෙනේවි මේ රටේ වෙළඳාම සම්පූර්ණයෙන්ම වාගේ අල්ලා ගෙන සිටින්නේ විදේශිකයින් බව. මේ වැඩ පිළිවෙළට විරුද්ධව අප විශාල සටනක් ගෙන ගිය බව මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමතියි. නමුත් අපේ උත්සාහය සම්පූර්ණයෙන්ම අසාර්ථක වුණේ නැහැ. එයින් තරමක් දුරට සතුටු දායක ප්‍රතිඵල ලබාගන්න පුළුවන් වුණු බව මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමතියි. සමහර විට ගරු මන්ත්‍රීවරුන් ප්‍රශ්න කරන්න පුළුවනි, මම කර තිබෙන්නේ මොනවාද කියා. විදේශිකයන් අතේ තිබුණු වෙළඳාම සම්පූර්ණයෙන්ම සවදේ ශිකයන් අතට පත්කරන්න බැරි වුණත්, එදා ගෙන ගිය ව්‍යාපාරයෙන් සතුටුදායක ප්‍රතිඵල ලැබුණු බව, එයින් දේශීය වෙළ ඳුන්ට සහනයක් සැලසුණු බව, කවුරුත් දන්නවා. එය ඒ වෙළඳුන් පවා පිළිගන් නවා. අද පිටකොටුවේ බැලුවොත් හැම කඩයකම විදේශිකයෝයි සිටින්නේ. අපේ සිංහල ජනතාව සිටින්නේ කොහේද? ඉතාමත් අමාරුවෙන් දුකෙන් වෙළඳාම් කරගෙන සිටින්නේ පේවිමන්ට්වලයි. තම වෙළඳාම කරගැනීමට ඔවුන් කොතරම් මහන්සි දරාගෙන වැඩ කරනවාද කිය තොත්, ඒ ලාංකික වෙළෙන්දෝ පේවි මන්ට්වල සෑම තැනම පිරිලා සිටිනවා. කඩ වල සිටින මහ වෙළෙන්දන් සියල්ලම විදේශිකයෝයි. වැස්සට තෙමී තෙමී අවි වට වේලි වේලී ඒ වෙළඳාම කරගෙන යනවා මදිවාට පොලිස්කාරයා එනවා දකින විට බඩු ටිකත් බැඳගෙන ඔවුන්ට දුවන්න සිඹ වෙනවා. එම නිසා පේවිමන්ට්වල හැම කොන්වලම සිල්ලර බඩු ටිකත් වෙන්ත් සුළු සුළු බඩුත් තබාගෙන ඉතාමත් අමාරු වෙන් වෙළඳාම් කරගෙන සිටින්නේ ලාංකික වෙළඳුන් බව තමුන්නාන්සේ දකින්න ඇති. ඒ වාගේම මහ කඩවල සිටින විශාල කඩකාරයන් සියලු දෙනාම විදේශිකයන් බව තමුන්නාන්සේ පිළි ගන්න ඕනෑ. ඒ පේවිමන්ට්වල වෙළඳාම් කරන අසරණ වෙළෙන්දා ටික කාලයක් පේවිමන්ට් එකේ වෙළඳාම් කරගෙන සල්ලි ටිකක් හම්බ වුණාට පසු, බොහෝම අමාරුවෙන් මුදල් ටිකක් දී විදේශිකයන් සතු කඩ කෑල්ලක් ගන්න ඔහුට පුළුවන් වෙනවා. එසේ කරන්න පුළුවන් වන්නේ කීයෙන් කී දෙනෙකුටද? එම නිසා අද මෙයින් වැඩි වශයෙන්ම පහර වැදී තිබෙන්නේ ලාංකික සුළු වෙළෙන්දාටයි. තමුන්නාන්සේ කරුණා කර ඔය පේවි මන්ට්වල ඇවිදින ගමන් ටිකක් බලන්න සථානයක් නැතිකමින්, ආධාර නැති කමින්, ණය මුදල් නැති කමින්, ඒ උදවිය වෙළඳාම් කරගෙන යන්නේ කොයි තරම් අමාරුවෙන්ද කියා. ඒ උදවියගේ වෙළඳාම කරගෙන යෑමට අපේ ආණ්ඩුවෙන් ලැබෙන උදව් මොනවා ද? ඒ ජනතාවට ණය මුදල් දෙන්ට යම් කිසි සැලැස්මක් සලස්වා තිබෙනවාද? ඔහුට වෙළඳාම් කිරීමට මධ්‍යසථානයක් ඇති කර තිබෙනවාද? ඔහුට බඩු ලබාගැනීමට අවසථාවක් ඇති කර තිබෙනවාද? මෙලොව දෙයක් නැතිව අමාරුවෙන් තනි වම සොයා ගත් දේ විකුණා ගැනීමට යන අවස්ථාවේදී අමුතු නීති, අමුතු බදු, අමුතු රෙගුලාසි දමා ඔහු ඒ කරන සුළු රක්ෂාව අහෝසි කරන එක යුතුකමක්ද?

මම ඔය කටයුතු භාරව සිටි කාලයේදී සිංහල වෙළඳ මණ්ඩලය මගින් විශේෂ යෙන්ම පේවිමන්ට්වල වෙළඳාම කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

උදවිය සඳහා නුවර වෙළඳපොළ වාගේ විශාල වෙළඳපොළක් ඇති කිරීමට ඉඩමක් වෙන් කර තිබුණා. එය පිටකොටුවේ බස් නැවතුම් පොළ ඉදිරිපිට ඇති ඉඩමයි. ඒ වටිනා ඉඩමේ සිංහල වෙළඳ මණ්ඩලය විශාල ගොඩනැගිල්ලක් හැදුවා. ඉතා දුකෙන් අමාරුවෙන් වෙළඳාම කරගෙන යන මේ පේවිමන්ට්වල වෙළෙන්දන් වෙනුවෙන් ඒ ගොඩනැගිල්ල විවෘත කර ඒ උදවියට වෙළඳාම කරගෙන යාමට සැලැස්වීම පිණිස වැඩ පිළිවෙළක් ලෑස්ති කර තිබුණා. සිංහල වෙළඳ මණ්ඩලයට දිවංගත අගමැතිතුමාගේ ආණ්ඩුවෙන් දුන් ඒ ඉඩමත් දැන් උදුරාගැනීමට යන වාය කියා අපට දැන් ආරංචියක් ලැබී තිබෙනවා.

මම ඉතාමත් කනගාටුවෙන් කියන්න කැමතියි, යම්කිසි දෙයක් යම් කිසි කෙන කුගෙන් ඉල්ලනවා නම්, ඒ අය ආණ්ඩු වෙනුත් යම් යම් පහසුකම් සහ උදව් ලබා තිබෙන කොටසක් විය යුතුයි. ගොවියාට යම් යම් උදව් කර තිබෙන නිසා, අපි තමුන්නාන්සේලාට මේ මේ දේ කළාය කියා කොවීන්ගෙන් යමක් ඉල්ලීමට තමුන්නාන්සේලාට යුතුකමක් තිබෙනවා. උදව් දීමෙන් පසු උදව් ඉල්ලීමයි යුතුකමව තිබෙන්නේ. අපි මේ විධියේ ආධාර රාශියක් කර තිබෙනවාය, ඒ නිසා ආණ්ඩුවටත් පිහිට වන්නය, කියා ඉල්ලන්න යුතුකමක් තිබෙනවා. රටක් පාලනය කරන නිලධාරීන්ට කියන්න පුළුවනි, තමුන්නාන්සේලාට ආණ්ඩුවේ ආදායමින් මේ විධියේ වැඩ කර තිබෙනවාය, හැම තුට්ටුවක්ම තමුන්නාන්සේලා ලැබුවේ ආණ්ඩුවෙන්ය, දැන් මේ ආණ්ඩුවට උදව් අවශ්‍ය වී තිබෙන අවස්ථාවේදී සහාය දෙන්නය, කියා. නමුත් වෙළෙන්දාට මෙලොව දෙයක් නොකර, කිසිම උදව්වක් නොදී හැම පැත්තෙන්ම වෙළෙන්දා ඉදගෙන ආණ්ඩුවට උදව් කරන විට, නොයෙකුත් බදු ගෙවමින් සිටින විට, තමුන්නාන්සේලා මේ විධියේ පහරක් ගැසීම යුතුද කියා මම ප්‍රශ්න කරන්න කැමතියි.

දැන් වෙළඳ ව්‍යාපාර ක්‍රමක්‍රමයෙන් අඩු වේගන යන බව මම නොකීවාට ගම් ගැන දන්න තමුන්නාන්සේලා දන්නවා ඇති.

පී. ආර්. රත්නායක මයා.
(திரு. பீ. ஆர். ரத்னாயக்க)
(Mr. P. R. Ratnayake)
ඒ පළාතේ එක කඩයක්වත් වැසී නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
එහෙම නම් මාවනැල්ලේ වෙන්න ඇති. නමුත් බොහෝ ප්‍රදේශවල කඩ වැසී ගොස් තිබෙනවා. මාවනැල්ලේ නොවැසුණේ කුමන හේතුවක් නිසාද කියා මා දන්නේ නැහැ.

සභාපතිතුමා
(அக்கிராசனர்)
(The Chairman)
මාවනැල්ලේ ගරු මන්ත්‍රීතුමා කරුණා කර ආසනයට යන්න.

අ. භා. 7.45

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
සභාපතිතුමනි, තවත් එක් කාරණයක් මතක් කරන්න කැමතියි. තෙල් සංයුක්ත මණ්ඩලයක් ඇති කරන්න ගියේ ඉතා මත්ම වැදගත් අදහසක් නිසයි. තෙල් ගෙන්වීම සහ බෙදා හැරීම තනිකරම කොම්පැනිවලට භාර දෙන්නේ නැතිව ඒ පිළිබඳව තරඟයක් ඇති කළ යුතු නිසා තෙල් සංයුක්ත මණ්ඩලයක් පිහිටුවන්න අදහස් කළා. තෙල්වලට තරඟය හොඳ නම්, කර වලවලට නරක ඇයි? ලුනු වලට නරක ඇයි? අර්තාපල්වලට නරක ඇයි? ඒවාට නම් තරඟයක් නැහැ. ඒවා පිළිබඳ ඒකාධිකාරය තියෙන්නේ සී. ඩබ්ලිව්. ඊ. එකටයි. තරඟයෙන් ප්‍රයෝජනයක් ලැබෙනවා නම්, ඒ ද්‍රව්‍ය සඳහා තරඟයක් උවමනා නැත්තේ ඇයි?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)
තරඟයක් දෙනවා කියා කවදාවත් කිව්වෙ නැහැ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)
තෙල් සංයුක්ත මණ්ඩලයක් ඇති කළේ තරඟයක් දෙන්න නොවෙයිද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

නැහැ; ඒක කළේ අපේ යුතුකමක් ඉෂ්ට කිරීමේ පියවරක් වශයෙන්.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

මොකක්ද යුතුකම?

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

පාරිභෝගිකයාට අවශ්‍ය දේ ලබාදීම.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

වෙළඳාම තිබෙන්නෙ මොකටද? මෙච් චරකල් පාරිභෝගිකයාට අවශ්‍ය දේ ලැබු ණේ නැද්ද? ඇමතිතුමා ආවට පස්සෙද පාරිභෝගිකයාට වුවමනා දේ ලැබෙන්න පටන් ගත්තෙ?

අබ්දුල් ජබාර් මයා.
(ஜனூப் அப்துல் ஜபார்)
(Mr. Abdul Jabbar)

ඉස්සර කරවල රාත්තලක් රුපියල් 2.50 යි. නමුත් දැන්?

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ලක්ෂ තුනහමාරක් කරවල කාරයන් කනවා. ඉස්සර කරවල වෙළඳාම ආණ්ඩු වට ගන්නවායයි කීවා. අත්හදා බැලීමක් වශයෙන් එසේ කරන්න අදහස් කළා. ටික කලක් ගියාට පසු, එයින් භාගයක් කරවල වෙළඳුන්ට දෙන්න අදහස් කළා. දැන් සියයට 75 ක් කරවල වෙළෙන්දන් ටම දෙන බවත්, සියයට 25 ක් පමණක් ආණ්ඩුව භාර ගන්නා බවත් ආරංචියි.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

සම්පූර්ණයෙන්ම වැරදියි.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

හොඳයි, ආණ්ඩුව සියයට 75 ක් ගන්න වාදයි අසන්න කැමතියි. [බාධා කිරීමක්] සාර්ථක වෙනවාද නැද්ද කියා බලමු. සාර් ථක වෙනවා නම්, අප විරුඬ වන්නෙ නැහැ.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

කරලා බලන්න ඕනෑ.

ආර්. ජී. සේනානායක මයා.
(திரு. ஆர். ஜீ. சேனநாயக்க)
(Mr. R. G. Senanayake)

ඒක තමයි, අපිත් කියන්නේ. දැන් කරන හරිය අපට පෙනෙනවා. ඒ නිසා මා මතක් කරන්නේ යුතුකම ඉෂ්ට කරනවා කීමෙන් අදහස් කළ යුත්තේ පාරිභෝගික යාට පුළුවන් තරම් අඩු මිලට බඩු ලබා දීමයි. ඒ මිස පාරිභෝගිකයාගෙන් හම්බ කර ගැනීමට බලාපොරොත්තු වීම ආණ් ඩුවේ යුතුකම නොවෙයි.

මොකද මේ ලුණු නැත්තෙ? මනුෂ්‍ය වගීයා ඇති වන්නටත් පෙර ලුණු තිබුනා. අවුරුදු දෙදහස් පන්සීයකට එහා නොව, භාරදහකට එහාදීත් ලුණු තිබුණා. ලුණු නැතිවුණේ මේ 1961 දීයි. වැඩි ලුණු පටවන්න ජපන් රටත් සමග සාකච්ඡා කළා. ලුණු පිටරට පටවන්න සාකච්ඡා කරන කාලයේදීමයි, ලංකාවට කන්ටවත් ලුණු නැති වුණේ. තමුන්නාන්සේගේ අදක්ෂකම එයින්ම කැපී පෙනෙනවා.

මුදල් රැස් කිරීමට තමුන්නාන්සේලා ගේ මුදල් ඇමතිතුමා වීර්ය කරන බව අප පිළිගන්නවා. රට පාලනය කරන්ට සල්ලි ඕනෑ නිසා ආප්පයෙනුයි තේ කෝප්පයෙ නුයි පාන් පෙත්තෙනුයි බදු අය කරනවා. සල්ලි නැති වන්ට හේතුව කුමක්ද? අපේ රට මුදල් හම්බ කරන මූලික ද්‍රව්‍යවල මිළ සම්පූර්ණයෙන්ම පහත බැසීම නිසා නොවේද? මේ සියලුම අවුල් ඇති වී තිබෙන්නේ වෙළඳ ඇමතිතුමාගේ අදක්ෂ කම නිසයි. මා කලින් කිව්වා වගේ පාන් පෙත්තෙනුයි ආප්පයෙනුයි ඉදි ආප්පයෙ නුයි තේ එකෙනුයි බදු අය කරන්ට මුදල් ඇමතිතුමාට සිදු වී තිබෙන්නේ ඒ නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

මා මුදල් ඇමතිතුමාට දොස් කියන්නේ නැහැ. අද රට දුප්පත් තත්ත්වයකට වැටී තිබෙනවා. දුප්පතා මිරිකා මුදල් ලබා ගෙන රට කරන්න සිදු වී තිබෙන්නේ මුදල් මෙරටට එකතු වන ආකාරයට වෙළඳ ඇමතිතුමා කටයුතු නොකරන නිසා මෙහි තිබෙන මුදල් දියවෙන නිසයි.

පොල්වල රබර්වල තේවල මිළ බැහැල. කොහු නැහැ. කපාපු පොල් විකුණන්ට බැහැ. ලුණු නැහැ. පැපොල් කිරිත් විකුණන්ට බැරිය කියා අපේ දොඩම්ගස් ලන්දෙ ගරු මන්ත්‍රීතුමා (රොමානිස් මයා.) කියනවා. කුරුඳු විකුණන්ට බැරි බව දකුණු පළාතේ මන්ත්‍රීවරු කියනවා. තවත් මන්ත්‍රීවරු කියනවා, පැණිරි විකුණන්ට බැහැ කියා. ඇමතිතුමාට පුළුවන්කම තිබෙන්නේ තමාගේ වැඩියන්ට විකුණන්ට පුළුවන් කරවල විකිණීම විතරයි. තමුන්නාන්සේගේ යුතුකමව තිබෙන්නේ රටේ කරවල විකුණ විකුණා ඉදීම නොවෙයි, ලොව පුරා ගිහින් අපේ මූලික ද්‍රව්‍යවලට හොඳ මිලක් ලබා ගැනීමට කට යුතු කිරීමයි. එසේ නැත්නම් රට දුර්වල වෙනවා; මුදල් තත්ත්වය හීන වෙනවා; ඒ වගේම දුප්පතා මිරිකා රට ගෙන යන්ට පාන් පෙත්තේ මිළ වැඩි කරන්ට සිදු වෙනවා. තමුන්නාන්සේගේ කාලයේදී රට ආර්ථික පරිහාණියකට පත් වී රට දුප්පත් වී ගියොත් "තුම්පනේ ව්‍යාපාරයෙන් රට අහෝසි වුණා" කියා මහජනයාට කියන්න පුළුවන්කම තිබෙනවා.

දුප්පත් ජනයා කන බොන අඳින පළඳින දේවලින් මින් පෙර කවදාවත් මේ විධියට බදු අය කළේ නැහැ. තමුන්නාන්සේගේ දක්ෂකම මොකක්ද—කරවල බෙදන එකද? කරවල, පරිප්පු, අර්තාපල්, ලුණු ආදිය බෙදා ඉන්නෙ නැතිව—පොල් ගෙඩිය සත 5ට බැස තිබෙනවා—මිළ පහත වැටී තිබෙන පොල් සහ රබර්වල මිළ විකක් නඟා සිටුවීමට උත්සාහ කළොත් තමුන්නාන්සේගෙන් රටට යම් කිසි සේවයක් සිදු වන බව කියන්න කැමතියි. එසේ නැතිව කරවල ප්‍රශ්නය ගැන පමණක් තමුන්නාන්සේ ක්‍රියා කළොත් "කරවල ඇමතිවරයා" වශයෙන් තමුන්නාන්සේගේ නම ඉතිහාසගත වෙයි. එයින් සේවයක් වෙනවාද? රටේ මුදල් නැතිව තිබෙද්දී කරවල බෙදීමෙන් පමණක් සේවයක් ගෙන ගිය හැකිද? මේ විධියේ සුළු ප්‍රශ්න සම්බන්ධව පන්නන්නේ නැතිව පළල් ලෙස රට ගැන කල්පනා කර අපේ ප්‍රධාන ආදායම් මාර්ග වන තේ, පොල්, රබර් යන මූලික ද්‍රව්‍ය තුනට වැඩි මිළක් ලබාගන්ට කටයුතු කරන්නය කියා මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අබ්දුල් ජබ්බාර් මයා.
(ஜனூப் அப்துல் ஜபார்)
(Mr. Abdul Jabbar)

ගරු සභාපතිතුමනි, ගිය අවුරුද්දේ අය වැය කථා අවස්ථාවේදී කෙරුණු කථා මේ අවුරුද්දේ කථාවලට වඩා වෙනස් ආකාරයක් ගත් බව පළමුවෙන්ම මා මතක් කරන්න කැමතියි. මේ වර්ෂයේ වෙළඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කළ බොහෝ මන්ත්‍රීවරු වැඩි වශයෙන්ම කථා කළේ කරවල පිළිබඳ ප්‍රශ්නය ගැනයි. කරවල ගැන සඳහන් කරමින් දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) අපේ වෙළඳ ඇමතිතුමාට කරවල ඇමතිතුමා යයි නමක්ද දුන්නා. ඒ ගරු මන්ත්‍රීතුමා වෙළඳ ඇමති වශයෙන් මේ ගරු සභාවේ අවුරුදු ගණනක්ම වැඩ කළ බව මට මතකයි. 1940 දී සත 35ට තිබුණු කරවල රාත්තලේ මිල 1958 වන විට—ඒ කියන්නේ එතුමාගේ කාලයේදී රුපියල් 2.50 දක්වා ඉහළ ගොස් තුබුණා. එදා ඒ ඇමතිතුමා මේ රටේ දුප්පත් ජනතාවට සහනයක් ලබා දීම සඳහා කිසි යම් ප්‍රගතිශීලී වැඩ පිළිවෙළක් ඒ පිළිබඳව නොගත් බව අපි කවුරුත් දන්නවා. මේ රටේ දුප්පත් ජනතාවට සේවයක් කිරීම සඳහා ස්ථිරාධිෂ්ඨානයකින් යුතුව ප්‍රගතිශීලී වැඩ පිළිවෙළක් ගෙන යන අපේ ඇමතිතුමාට යම් මන්ත්‍රීවරයකු චෝදනා කරනවා නම් ඒ ප්‍රතිගාමී අදහස් ඇති මන්ත්‍රීවරයකු බව මම කෙලින්ම කියනවා. මේ රටේ දුප්පත් ජනතාවට සේවයක් කිරීමට ඉදිරිපත් වී සිටින අපේ මේ තුම්පනේ ඇමතිතුමාට කොයි තරම් විරුද්ධව කථා කළත්, කොයි තරම් අපහාස වන අන්දමින් කථා කළත් එතුමාගේ වැඩ පිළිවෙළ කාටවත් නවත්වන්න බැරි බව මම කියන්නේ ඉතා ප්‍රීතියෙනුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරවල පිළිබඳව මෙතෙක් ගෙන යන ලද වැඩ ගැන මට සුළු විස්තරයක් දෙන්න පුළුවනි. මේ රජය කරවල වෙළඳාම ආණ්ඩුව අතට ගැනීමට කල්පනා කළේ මේ රටේ දුප්පත් ජනතාවට අඩු මිලට කරවල ලබාදීමට පමණක් නොව, මේ රටින් පිට රට ඇදී යන විශාල මුදල් සංඛ්‍යාවක් නවත්වා ගන්නා අදහසින්. 1958 වන විට කරවල සම්බන්ධයෙන් පමණක් රුපියල් 90 කෝටියක් පමණ පිටරට යවා තිබෙනවා. නමුත් මේ පිළිබඳව අප විසින් කරන ලද පරීක්ෂණයේ වාර්තාව අනුව ගරු ඇමතිතුමා විසින් යොදා ඇති ප්‍රගතිශීලී වැඩ පිළිවෙළ නිසා ඒ යන මුදලින් කෝටි 30 ක් පමණ මේ රටේ නවත්වා ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ අතර එදා රුපියල් 2.50ට විකුණූ කරවල රාත්තල අද රුපියලකට ලබා ගැනීමට රටවැසියාට පුළුවන්කම තිබෙනවා. රු. 1.40 ට පසුගිය දවස්වල විකුණූ හාල්මැස්සන් රාත්තල අද සත 72කට ලබා ගන්න පුළුවන්කම තිබෙනවා.

1945 දී ලංකාවට කරවල හොන්ඩර 4,25,675ක් ගෙන්වා තිබෙනවා. 1960 දී කරවල හොණ්ඩර 8,18,826ක් ගෙන්වා තිබෙනවා. 1945 දී රුපියල් 35ට තිබුණූ කරවල හොන්ඩරයේ මිල 1960 වන විට රුපියල් 105 ක් වී තිබෙනවා. ඒ අතර "තොන්ඩයා" කියන කරවල හොන්ඩරයක් ගෙන්වීම සඳහා රුපියල් 100 ගණනේ ඉන්දියාවට මුදල් පිටත් කර තිබෙනවා. ඒ කරවලම මෙහි විකුණා තිබෙන්නේ රුපියල් 40ගණනේයි. ඔය වියධිට දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා වෙළඳ ඇමතිව සිටි කාලයේදියි, ඒවා සිදු වී තිබෙන්නෙ. ඒ තත්ත්වය නැති කිරීමට අපි කටයුතු යොදන විට අපට චෝදනා කරන්නේ කුට වෙළෙන්දන්ට උදව් දී ඇති ප්‍රතිඟාමීන් යයි කීම වරදක් නැහැ.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන් ප්‍රගතිය වාතීා කරනු පිණිස සභාපති මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස් වීම 1961 සැප්තැම්බර් 8 වන සිකුරාදා.

කල්තැබීම

යෝජනාව ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභි මුඛ කරන ලදි. "මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය."—[ගරු ඉලංගරත්න]

ජේ. පී. ඔබේසේකර මයා. (සෞඛ්‍ය කට යුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. ஜே. பீ. ஒபயசேக்கர—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. J. P. Obeyesekere—Parliamentary Secretary to the Minister of Health)

I would like to make a statement regarding the question raised by the hon. Member for Galle (Mr. W. Dahanayake) two evenings ago during the Adjournment Motion, that is, on the 5th of September. He referred to the death by accidental drowning of Mr. Ariyathurai. He almost mentioned that possibly there might have been a delay or neglect on the part of the hospital authorities with regard to attention on this patient when he was brought into the hospital for treatment, and he, therefore, wished me to enquire into this and find out whether in fact there was any neglect or delay.

I have made the necessary enquiries and I would like to make this statement :

On Sunday the 3rd September this patient was brought in to the General Hospital at about 1.15 p.m. in an ambulance. The doctor in charge of the O. P. D. met the patient and examined him straightway and discovered that he had no pulse at all. Whereupon she straightway gave the patient a coramine injection and within the space of three minutes the patient was put in the iron lung and treatment given. Although there was no pulse, within the space of three minutes the patient was in the iron lung and was receiving treatment.

I believe it has been said that there was a delay of just over half an hour. As far as I can see—possibly that talk got around—that half an hour was from the time the patient was put in the ambulance on the sea-shore to the time he arrived and was placed in the iron lung. I have made exhaustive enquiries. The iron lung is placed on the verandah near where the ambulance comes, especially for emergencies of this nature, and there is a trained squad of people to work and operate that iron lung throughout the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. පී. ඔබේසේකර මයා.]

twenty-four hours of the day, specially for these emergencies. And my enquiries show that there was no time lag at all before the patient was treated in hospital.

I would also like to say that this particular Medical Officer, Dr. (Mrs.) Kumaradevan by coincidence happened to be a relation of Mr. Ariyathurai, and she took all possible care to see that the patient was given this treatment promptly. I am also given to understand that the relations who were present there were very thankful to her for the immediate action that she had taken. I would like to add further that I have conferred with various doctors and they are of the opinion that it is quite useless bringing these very serious cases to the hospital; that similar facilities could easily be provided on the spot. Now, this Life Saving Squad is always on duty at this place on certain days. I do not know whether it is on duty there on week days, but it is certainly on duty on Sundays. These doctors tell me that a certain apparatus could be easily installed on the spot, for it is quite useless bringing these cases to the hospital. We shall try to do everything possible and see that this equipment is installed there so that lives may be saved thereby.

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.

(திரு. எட்மன் சமரக்கொடி)

(Mr. Edmund Samarakkody)

I have two very important matters to raise, one with the Hon. Leader and one with the Hon. Minister of Education. I am sorry that the Hon. Leader is not here. I understand that he is ill. If that is so, I have nothing to say against his absence. However, I would ask the Hon. Minister of Commerce, Trade, Food and Shipping to answer my question in full. We are aware that from time to time Ministers have to leave the country for certain purposes of State. We know that very soon some more Ministers are due to go abroad. We have taken it for granted that these visits are for purposes of State and have been necessary. But I think the time has come to look more carefully into these decisions of Ministers to visit other countries, because I have certain information which I now want to place before the House.

The Hon. Minister of Local Government and Housing is due to visit London for the Commonwealth Conference and the Hon. Minister of Industries, Home and Cultural Affairs is due to visit Brussels to attend the Inter-Parliamentary Union Conference. I have nothing to say with regard to those visits. But I understand that thereafter these two Hon. Ministers will be visiting other countries at State expense. We are entitled to ask for what purposes these two Hon. Ministers will be visiting other countries at State expense.

I am aware that the Hon. Minister of Local Government and Housing is leaving together with the Commissioner of National Housing for the purpose of seeing whether they could purchase cement. If that is the reason, we are entitled to probe into the matter. Every Minister of State will require cement for work connected with his Ministry. The Minister of Commerce, Trade, Food and Shipping will require cement for the construction of his food stores; the Minister of Education and Broadcasting, for his school buildings; the Minister of Transport and Works, for his P. W. D. construction; and even the Minister of Finance may need cement——

ඩබ්ලිව්. දහනායක මයා.

(திரு. டப்ளியு. தகனயக்க)

(Mr. W. Dahanayake)

They want to cement friendship!

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.

(திரு. எட்மன் சமரக்கொடி)

(Mr. Edmund Samarakkody)

All development work will need cement. If every Minister says, "want cement. I want to visit various countries for the purpose of seeing how much cement I could purchase," then it would be a serious matter. I would like to remind hon. Members

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

that we have various Government trade organisations. There is the C. W. E. which is importing various things. There is the Government Cement Corporation which is supposed to be specially concerned with the production of cement. This Corporation is also entitled to import cement for various purposes of the State. I see no reason whatsoever for any particular Minister and another head of department to go in search of cement. In that connection, I would like to remind this House and this Government that during the time of the Prime Minister he refused to sanction a visit of the Minister of Posts, Mr. Marikkar, to Japan in search of telephones. Now in that situation, we are entitled to get an answer because these Ministers are due to leave very shortly. This matter cannot, therefore, be put off. I think the Hon. Minister of Food should be able to give us an answer because these visits have been sanctioned by the Cabinet. Now, for instance, the question of going to the Commonwealth Conference would have been discussed at Cabinet level and, therefore, we should be able to get an answer from the Government on this question. I am hoping that before we leave today we would be able to get an answer from the Hon. Minister of Food. But if he cannot give us an answer then the time has come for us to take a decision that these Ministers should not be allowed to visit those countries at State expense. We cannot afford that luxury at a time when we are trying to save every red cent for developmental purposes and when we are squeezing money out of the small man in the name of development. This is a serious matter. I shall await an answer to that.

Then, Sir, one other matter while I am on my feet, that is, a matter for the Minister of Education. I would ask the hon. Parliamentary Secretary who, I find, is here, to take note of this question. It is with regard to the appointment of S.S.C. students as teachers. We know that 25 people are to be chosen from each electorate and we were also informed of the method of selection. We were told that a certain number of people will be chosen from the Sinhalese list and a certain number from the English list. Now I have got information that so far as Bulathsinhala is concerned, there is very serious dissatisfaction with regard to this matter of selection.

I am not making any allegations but, I think, this is a matter for investigation. From the infromation I have received I find that it is necessary to look into the selections that have been made at the education officer level, because two or three of these officers have been asked to make these selections. In view of the serious allegations that I have received from my elctorate, I would ask the hon. Parliamentary Secretary to investigate these selections.

වී. ටී. ජී. කරුණාරත්න මයා.
(திரு. வீ. ரி. ஜீ. கருணரத்ன)
(Mr. V. T. G. Karunaratne)

Will the hon. Member be able to let me know in what way this dissatisfaction has arisen ?

එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.
(திரு. எட்மன் சமரக்கொடி)
(Mr. Edmund Samarakkody)

Now, for instance, there is the case of a person who was selected and who got a letter of appointment but whose appointment was cancelled 3 days later. That is one. Then there is the case of another person who was 58th on the Sinhalese list who has been appointed. Now in the case of my electorate I was told that only 16 will be taken from the Sinhalese list and that if those 16 are not suitable they will go down the list. But I just cannot believe that it was necessary for them to go so far down the list as to appoint the 58th man. That is another thing.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனுயக்க)
(Mr. W. Dahanayake)

Allow me first of all to express my own thanks and that of the House to the Honourable Acting Minister

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

]ඩබ්ලිව්. දහනායක මයා.[

of Health for his excellent statement on the case of the late Mr. Ariathurai. We are thankful to him for the explanation he has given and we are very much beholden to him for the steps he proposes to take in regard to such future cases.

Mr. Speaker, I want to direct a question at the Honourable Acting Minister of Finance who, I believe, is also the acting Parliamentary Secretary to the Minister of Defence and External Affairs.

ගරු ජෝර්ජ් රාජපක්ෂ
(கௌரவ ஜோர்ஜ் ராஜபக்ஸ)
(The Hon. George Rajapaksa)

No.

ඩබ්ලිව්. දහනායක මයා.
(திரு. டப்ளியு. தகனயக்க)
(Mr. W. Dahanayake)

If that is not so, I would ask him to convey this matter to the proper quarters. From the 1st of October, I learn that 5 of the resthouses which now belong to the Tourist Bureau, namely, those at Kalkudah, Ella, Hingurakgoda, Hanguranketa and Habarana are to be handed over to the Ministry of Home and Cultural Affairs on the ground that they are being run at a loss. I learn on very good authority that three of them, that is, the rest houses at Kalkudah, Ella and Hingurakgoda are not being run at a loss. I learnt that they are being run at a profit. Therefore, the decision to transfer these five rest houses from the Tourist Bureau to the Ministry of Industries, Home and Cultural Affairs is a reactionary one. I would request the Honourable Acting Minister of Finance to re-examine this question and order that for the present these rest houses should not be handed over.

අ. භා. 8.16

බී. එච්. බණ්ඩාර මයා. (බදුල්ල)
(திரு. பி. எச். பண்டார—பதுளை)
(Mr. B. H. Bandara—Badulla)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන හා ගුවන් විදුලි කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම් තුමාගෙන් ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. පිරිවෙන්වලට පසුගිය අවුරුද්දේ දී තිබුණු ග්‍රාන්ට් මුදල හෙවත් ආධාර මුදල මෙතෙක් ලැබී නැහැ. මෙය දැන් භාරදූර ප්‍රශ්නයක් වී තිබෙනවා. ඒ නිසා පිරිවෙන් විශාල කරදරයකට භාජන වී තිබෙනවා. පිරිවෙන් වෙනුවෙන් පසුගිය වර්ෂයේ දුන් ආධාර මුදල මෙතෙක් මේ අවුරුද්දේ නොලැබුණේ මන්ද කියාත්, එය කවදා දෙන්න බලාපොරොත්තු වෙන වාද කියාත් දැන ගන්න කැමතියි.

අ. භා. 8.17

එල්. බී. දසනායක මයා.
(திரு. எல். பி. தஸனயக்க)
(Mr. L. B. Dassanayake)

ගරු කථානායකතුමනි, බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) ඉදිරිපත් කළ කාරණයට කිව්වු කාරණයක් ගැන ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් දැන ගන්න ඕනෑ කරනවා. මහනුවර අධ්‍යාපන නිලධාරිතුමා ජ්‍යෙෂ්ඨ සමතුන් ලියා පදිංචි කළායින් පසු ගුරුවරුන් වශයෙන් පත්වීම් දීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට ඒ අයදුම් කරුවන් කැඳවා තිබෙනවා. පසුගිය මාසයේ ගම්පොළ ඡන්දදායක කොට්ඨාශයේ ජ්‍යෙෂ්ඨ සමතුන්ට ලියුම් යැව්වෙ 23 වැනිදා. 25 වන සිකුරාදා සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන ලෙස දන්වමින් යවන ලද ඒ ලියුම් ලැබුණේ 25 වනදා දවල් 11 න් පසුවයි. 24 වන දා රජයේ නිවාඩු දවසක්. නියමිත වේලාවට සම්මුඛ පරීක්ෂණය සඳහා යන්න බැරි වූ නිසා ඒ අය පසුව අධ්‍යාපන කාර්යාලයට ගියා. ඒ අවස්ථාවේ අධ්‍යාපන නිලධාරියා ඔවුන් එළවා ගෙන තිබෙනවා. ඒ නිසා මම මේ ප්‍රශ්නය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දැන් ඉදිරිපත් කරනවා. මේ විධියට ක්‍රියා කරන්න වුවමනාවක් නැහැ. එය අසාධාරණයි. මෙන්න ඒ දෙන්නාගේ ලිපිනය: ඊ. ඒ. වික්‍රමාරච්චි, මුල්ගම, පුපුරුස්ස. අනෙක් තැනැත්තාගේ ලිපිනය: ඩී. ජී. සෝමපාල, මුල්ගම, පුපුරුස්ස. ඒ අයගේ ලියුම් මම තමුන්නාන්සේට ඉදිරිපත් කරනවා. කරුණාකර පරීක්ෂණයක් පවත්වා ඒ දෙදෙනාට පත්වීම් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I have to ask a question which concerns both the Hon. Acting Minister of Finance and the hon. Parliamentary Secretary to the Minister of Education. This is a matter relating to the payment of acting salary to the acting principals of Central Schools and Senior Schools in accordance with Financial Regulations.

It would appear that somebody in the Ministry of Education has taken upon himself to override the decision of the Salaries Anomalies Commission and a direction given by the Minister of Finance.

This is a question asked by the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) on 6th September 1960. :

CENTRAL AND SENIOR SCHOOOLS : ACTING PRINCIPALS

14. DR. N. M. PERERA asked the Minister of Finance : (*a*) Is he aware that—(i) the Salary Anomalies Commission recommended the payment of acting salary to Acting Principals of Central and Senior Schools in accordance with the Financial Regulations, and (ii) this is the only recommendation that has not been implemented so far ? (*b*) Does he propose to implement the recommendation ? (*c*) If so, when and from what date ? If not, why ?

THE HON. F. R. DIAS BANDARANAIKE (MINISTER OF FINANCE AND PARLIAMENTARY SECRETARY TO THE MINISTER OF DEFENCE AND EXTERNAL AFFAIRS) : The answer is, (*a*) (i) Yes. (ii) No. (*b*) Instructions were issued by Treasury Circular No. 443 of 19th April, 1958, to implement this recommendation of the Salary Anomalies Commission with effect from 1st October, 1957. I think (*c*) does not really arise in view of the answer to (*b*).—[OFFICIAL REPORT, 6th September, 1960 ; Vol. 39, c. 962.]

Now Treasury Circular 443 directed that the recommendations in the report be implemented with retrospective effect from 1st October 1957. That is also the position taken up by the Minister of Finance in 1960. These salaries have not yet been paid. Not only that, but I understand that in the Ministry of Education today a scheme is being drawn up to fob off these people who were on acting appointments with payments of Rs. 40, Rs. 50 and so on, on some scale to which these various schools have been fitted arbitrarily on an internal decision.

I have no objection to the grading of schools for the future by the Education Ministry and the department, but these recommendations made in respect of people who ought to get these salaries with effect from 1957 must be implemented. You cannot ignore the principle that has already been laid down. I want to appeal to the hon. Parliamentary Secretary to the Minister of Education to see—these arrangements have not been made by the Ministry itself—that the earlier recommendation in respect of these acting appointments is implemented, and to the Hon. Acting Minister of Finance to see that Treasury directives are carried out.

We all know that the Treasury is more anxious to take than to give, and if one cent is due from a person they will pursue him to the last to get that one cent ; but when it comes to giving what is due, they are extremely niggardly. However, here is a directive of the Treasury itself that is being disobeyed.

One other matter, and that concerns the Minister ouf Health. I know he is very anxious to develop ayurveda in this country, but the Hospital of Indegenous Medicine does not have a sufficient cadre of physicians for the purpose of expanding the Hospital Russian aid was obtained for his Hospital and there are 45 beds. A building has been put up, minor staff has been recruited. but you still do not recruit the physicians. Persons of ability who had served an internship have been making up the deficiency in the cadre, and these physicians seem to have

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බරීනාඩ් සොසිසා මයා.]

been sent away in order to make room for other internees, but you are not appointing the physicians. Will the hon. Parliamentary Secretary please see that the cadre is filled and that all the beds are made use of?

අ. භා. 8.22

මුණවීර මයා.

(திரு. முனவீர)

(Mr. Munaweera)

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමා නැති නිසා එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ප්‍රශ්නයක් අහන්න බලාපොරොත්තු වෙනවා. සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් සාහිත්‍ය දිනයක් ඇති කර රජයේ පාඨශාලාවලට නිවේදනයක් යවා තිබෙනවා සාහිත්‍ය දිනය පැවැත්වීමට කටයුතු කරන ලෙස. රජයේ පාඨශාලා නැති සමහර නගර, ගම් තිබෙනවා. එවැනි තැන්වල ආධාර ලබන පාඨශාලා පාවිච්චි කරන්න සිදු වෙනවා, සාහිත්‍ය සංගම්වල රැස්වීම් පැවැත්වීමට.

මාතලේ සාහිත්‍ය සංගමය රැස්වීමක් පැවැත්වීම සඳහා පාසැල ලබා ගැනීමට මහනුවර අධ්‍යාපන නිලධාරිතුමාගෙන් අවසර ඉල්ලා තිබෙනවා. ඒ අවසරය නොමිලයේ දෙන්න බැරිය කියා තිබෙනවා. සාහිත්‍ය සංගමයක් පවත්වාගෙන යන්නේ බොහොම අමාරුවෙන්. සාහිත්‍ය සංගමය කට කාගෙන්වත් ආධාර ලැබෙන්නෙ නැහැ. සාහිත්‍ය සංගමයක් කරගෙන යන අය තමන්ගේ කාලය මිඩංගු කරලා ඒ වෙනුවෙන් මුදලුත් වියදම් කරන්න ඕනෑ. ප්‍රජාමණ්ඩලවලට ග්‍රාම සංවර්ධන සමිතිවලට, සමුපකාර සමිතිවලට, ගුරු දෙගුරු සමිතිවලට, මේ පාඨශාලාවල රැස්වීම් පවත්වන්න නොමිලේ අවසර දෙනවා නම්, සාහිත්‍ය සංගම් ඇති කරන්න, සාහිත්‍ය සේවයක් කරන්න, මේ රජය බොහෝම වැයම් කරන මේ කාලයෙහ, සාහිත්‍ය සමිතිවලට මේ පාඨශාලාවල රැස් වීම් පවත්වන්න නොමිලේ අවසර නොදෙන්නේ කුමක් නිසා දැයි මම ප්‍රශ්න කරනවා. මේ පිළිබඳව මහනුවර අධ්‍යාපන නිලධාරිතුමා එවා ඇති ලිපියේ මෙසේ කියා තිබෙනවා:

ඉහත සඳහන් කාරණය ගැන එවන ලද ලිපිය සම්බන්ධවයි.

මාතලේ සී. සී. පාඨශාලාව 61.9.3 වැනි දින පස්වරු 3-5 දක්වා පාවිච්චි කිරීමට ලබා දිය හැක්කේ පහත සඳහන් මුදල් කවිවේරියේ තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් පසුවයි.

			රු. ශ.
ශාලාව පාවිච්චියට පැය 3කට හෝ කොටසකට	...	...	10 00
පුටු මේස පාවිච්චියට	...	...	10 00
විදුලි එළිය සඳහා	...	...	— —
ඇප මුදල	...	...	25 00

මේ වගේ දේ නිසා සාහිත්‍ය සංගම් නැත්තටම නැතිවන්නත් ඉඩ තිබෙනවා. ඊළඟට මේ අධ්‍යාපන නිලධාරිතුමා මාතලේ දිසාපතිවරයාට කුවිතාන්සියක් යවා තිබෙනවා, මාතලේ සාහිත්‍ය සංගමයේ ලේකම්ගෙන් මේ විධියට සල්ලි ගන්නය කියා.

Please receive to the credit of the Government of Ceylon from Mr. R. M. R. Bandara, Secretary, Sahitha Sangamaya, CC/Sinhalese School, Matale, Rs. 20 only.

The rent for the use of empty Matale CC/Sinhalese School hall on 3rd September, 1961 from 3 p.m. to 5 p.m.	Rs. 10.00
The rent for the use of furniture in the same hall	Rs. 10.00
Total	**Rs. 20.00**

තවත් මෙවැනි ලියවිල්ලක් තිබෙනවා. වේලාව නොමැති නිසා එය කියවන්න මා අදහස් කරන්නෙ නැහැ.

කථානායකතුමා

(சபாநாயகர்)

(Mr. Speaker)

කථාව කෙටි කළේ නැති නම් පිළිතුරු ලබාගන්න වේලාවක් නැහැ.

මුණවීර මයා.

(திரு. முனவீர)

(Mr. Munaweera)

මා අධ්‍යාපන අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳව සුදුසු පරිදි යමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නය කියා. මේ රටේ සාහිත්‍ය සංගම් වල රැස්වීම් රජයේ පාසැල්වල හෝ අධ්‍යක්ෂ පාලිත පාසැල්වල හෝ පවත් වන්න අවස්ථාව නොලැබෙනවා නම් එය ඉතාම කනගාටුදායක කරුණක්. සංස්කෘතික දෙපාර්තමේන්තුවේ සාහිත්‍ය සංගම් නගා සිටුවීමේ කටයුතු කරන්නෙ සාහිත්‍ය ගැන කිසි දැනුමක් නැති අයයි. සාහිත්‍ය සංගම් පිළිගත් සංගම් කොටසක් හැටියට වහාම ගණන් ගන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් සුදුසු පරිදි ක්‍රියා කරනවාද කියන එක සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් දැනගන්න කැමතියි. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා මෙහි නොමැති නම් ඒ වෙනුවෙන් පෙනී සිටින ගරු ඇමති වරයකුගෙන් මා ඒ ගැන ප්‍රශ්න කරනවා.

අ. භා. 8.25

වී. ටී. ජී. කරුණාරත්න මයා.
(திரு. வீ. ரீ. ஜீ. கருணாரத்ன)
(Mr. V. T. G. Karunaratne)

බුලත්සිංහල ගරු මන්ත්‍රීතුමා (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු සැපයිය යුතුව තිබෙනවා. ජ්‍යෙෂ්ඨ සමතුන්ට පත්වීම් දීමේදී බුලත්සිංහල කොට්ඨාශයට ආසාධාරණයක් කෙරී ඇති බවත් එම නිසා ඒ කොට්ඨාශයේ අය තුළ යම්කිසි අප්‍රසාදයක් ඇති වී තිබෙන බවත් එතුමා විසින් කියන්නට යෙදුණා. අසුවල් කරුණය කියා නම් වශයෙන් සඳහන් නොකළත් එවැනි පත්වීම් දීමේදී යම් අකටයුත්තක් සිදු වී තිබෙනවා නම් ඒ ගැන සොයා බලා දන්වන්න මා පොරොන්දු වෙනවා.

බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා (බී. එච්. බණ්ඩාර මයා.) පිරිවෙන්වලට ආධාර දීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැගුවා. පිරිවෙන් ආධාර සඳහා වෙන් කරන ලද මුදල් මේ අවුරුද්දේ මදි වුණා. කලින් අවුරුදු වලට වඩා එම ආධාර මුදල් ප්‍රමාණය වැඩි කරන්න යෙදුණු නිසාත්, එම වෙන් කරන්න යෙදුණු ක්‍රමය අනුව පසුගිය අවුරුද්දේ මුදලක් වෙන් කර තිබුණේ නැති නිසාත්, බලාපොරොත්තු නොවූ පරිදි ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි වුණු නිසාත් ඒ තත්ත්වය ඇති වුණා. මේ සම්බන්ධයෙන් අතුරු අය වැය ලේඛනයක් මීළඟ රැස් වීම් වාරයේදී පාර්ලිමේන්තු කරනවා. එය සම්මත වූ මාසය තුළදීම වාගේ ඒ ක කටයුතු සලස්වනවා.

ගම්පොළ කොට්ඨාශයේ එ . එස. සී. ගුරු පත්වීම් දීම සම්බන්ධයෙන් ගම්පොළ ගරු මන්ත්‍රීතුමා (එල්. බී. දස නායක මයා.) විසින් ප්‍රශ්නයක් අසන්නට යෙදුණා. ලිපි ලැබීමේ ප්‍රමාදය නිසා අපේක්ෂකයන් දෙදෙනකු ප්‍රමාද වී පැමිණි බවත් ඒ හේතුව නිසා ඔවුන්ට පත්වීම් දුන්නේ නැති බවත්, ඔවුන් වෙනුවට වෙනත් අයට පත්වීම් දී තිබෙන බවත් එතුමා විසින් කියන්නට යෙදුණා. මා ඒ ගැන සොයා බලනවා. යම් විධියකින් අසාධාරණයක් සිදු වී තිබෙනවා නම් සුදුසු කම් අනුව ඔවුන්ට පත්වීම් ලබා දීමට කටයුතු සලස්වනවා.

දකුණු කොළඹ දෙවන ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) වැඩ බලන විද්‍යාලයාධිපතිවරුන් ගැන ප්‍රශ්නයක් නැගුවා. ඔවුන්ට ලැබිය යුතු දීමනා නොලැබීම ගැන වෙනම ක්‍රමයක් යෙදීමට දෙපාර්තමේන්තුව මගින් අදහස් කිරීම සම්බන්ධයෙන් එතුමා ප්‍රශ්න කළා. ඒ ගැන නියම පිළිතුරක් මේ අවස්ථාවේදී දෙන්න අමාරුයි. ගරු ඇමතිතුමාගේ කල්පනාවටද භාජන කර ඒ සම්බන්ධයෙන් සුදුසු වැඩ කටයුතු යොදනවා.

රත්තොට ගරු මන්ත්‍රීතුමා (මුණවීර මයා.) සාහිත්‍ය දින රැස්වීම් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැගුවා. මාතලේ සී. සී. පාඨශාලාවේ එම රැස්වීම් පවත්වන්න ඉඩ නොදීම ගැනයි එතුමා ප්‍රශ්න කළේ. එවැනි දෙයක් සිදුවී තිබෙනවා නම් ඒ ගැන මා කනගාටුව ප්‍රකාශ කරනවා. එවැනි අවහිර ඉවත් කිරීමට කටයුතු කරනවා.

ගරු ඉලංගරත්න
(கௌரவ இலங்கரத்ன)
(The Hon. Ilangaratne)

ගරු ඇමතිවරුන් දෙදෙන ජාත්‍යන්තර සම්මේලන දෙකකට සහභාගී වන බව දැනගන්න ලැබී තිබෙනවා. ඒ ගැන අවසාන තීරණය ගරු අගමැතිනිය පැමිණියාට පසුව ගන්නවා ඇති. [බාධා කිරීමක්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බ[illegible]
beer[illegible] [illegible]ஜபக்ஸ)
for [illegible]ge Rajapaksa)
app[illegible] [illegible] මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. [illegible]) දෙරිපත් කළ ප්‍රශ්නය [illegible] කටයුතු භාර ගරු ඇමතිතුමාට [illegible]වන බවට පොරොන්දු වෙනවා. [illegible]කුණු කොළඹ දෙවන ගරු මන්ත්‍රීතුමාට (බර්නාඩ් සොයියා මයා.) පිළිතුරු වශයෙන් කියන්න තියෙන්නෙ, භාණ්ඩාගාර චක්‍ර ලේඛනයකට පටහැනිව යම් කෙනෙක් ක්‍රියා කර තිබෙනවා නම් ඒ ගැන සොයා බලා සුදුසු පරිදි ක්‍රියා කිරීමට කටයුතු සලස්වන බවයි.

කල් තැබීම

ඔබේසේකර මයා.
(திரு. ஒபயசேக்கர)
(Mr. Obeyesekere)

In regard to the question by the hon. Second Member for Colombo South (Mr. Bernard Soysa), as requested by him I shall be very happy to inquire into this matter about the physicians and do all I can.

එකල්හි වේලාව අ. භා. 8.30 වූයෙන් කථානායක තුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදි.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 8.30 ට, 1961 සැප්තැම්බර් 1 වන දින සභාසම්මතිය අනුව, 1961 සැප්තැම්බර් 8 වන සිකුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.

3014

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org